# පාලි – සිංහල ශබ්දකෝෂය

# PĀLI - SINHALESE DICTIONARY.

ශ්‍රී ලඞ්කා විද්‍යෝදය විශ්ව විද්‍යාලයයේ සහකාර පුස්තකාලයාධිපති හා
විද්‍යෝදය පිරිවෙණේ ආචාර්ය්‍ය පණ්ඩිත

මඩිතියවෙල සිරි සුමඞ්ගල ස්ථවිරපාදයන් වහන්සේ විසින්
සම්පාදිතයි.

බු: ව: 2508
ක්‍රි: ව: 1965

සියළු හිමිකම් සම්පාදකවරයා සතුයි.

# භූමිකා

ක්‍රිස්තු පූර්ව 1000 දී පමණ පළමුවෙන්ම ඉතිහාසයෙහි දැක්වෙන **භාරත වර්ෂය** පටන් අත්ලාන්තික් මහ සයුර දක්වාද **ස්කැන්ඩිනේවියා** පටන් **මධ්‍යධරණී** මහ සයුර දක්වාද පිහිටි ප්‍රදේශයන්හි ප්‍රචලිත භාෂා සමූහය එක් මූල භාෂාවකින් හැඩ ගැස් වුනු බව පැහැදිලියි. මෙයට **"ඉන්දු-යුරෝපීය භාෂා"**යයි වාග්විද්‍යාඥයෝ නම් කළහ. මීට ප්‍රධාන හේතුව වූයේ ඒවායේ එකිනෙකට ඇති සාම්‍යය බව දතයුතුයි. නිදර්ශන වශයෙන් දක්වතොත් **සංස්කෘත-අස්ති, ග්‍රීක්-එස්ති, ලතින්-එස්ත්, ඉංග්‍රීසි-ඉස්, සංස්කෘත-මාම්, ග්‍රීක්-එමේ, ලතින්-මේ, ඉංග්‍රීසි-මී** යනාදිය පෙන්විය හැක.

ඉන්දු-යුරෝපීය පවුලේ වැදගත් පුරාණ ශාඛාවකට **ඉන්දු-ආර්ය** භාෂායයි ව්‍යවහාර කරනු ලැබේ. ආර්යයෝ භාරත වර්ෂයට පැමිණි වකවානුව තවම විනිශ්චය වී නැත. එහෙත් ආර්යයෝ ක්‍රම ක්‍රමයෙන් භාරත වර්ෂය මුළුල්ලේම පැතිරී ගියහ. ඉන්දු-ආර්ය නමින් දැනට භාවිත වන ආර්ය වර්ෂ හා මාසාදිය දැක්වෙන පැරණි තම ලිපි ලෙඛන **"අශෝක ශිලාලිපි"**යයි හැඳින්වෙයි. මේ අතර ඍග් වේද පද්‍යයෝ ආර්යයන්ගේ පැරණිතම ලෙඛනයයි ද කියති. ලන්ඩන් විශ්වවිද්‍යාලයයේ **වර්නර්** විද්වතුන්ගේ මතය අනුව ඍග්වේද කාලය ක්‍රිස්තු පූර්ව 1200–1500 අතර යුගයකයයි ද නිගමනය වී ඇත.

**සංස්කෘත භාෂාව:-** මධ්‍ය දේශයට පැමිණි ආර්යයෝ හොමපූජා, ධර්ම ශාස්ත්‍ර, මහා කව්‍ය, වීරචරිත ආදිය ඇතුළත් වටිනා ශාස්ත්‍රීය සංග්‍රහයන් ඇති කළහ. මෙහි විසූ පුරාණ මත ධාරී බ්‍රාහමණ පඬිවරු මේ භාෂාව හොඳ හැටි දියුණු කළහ. ශාස්ත්‍රීය භාෂාවක් වශයෙන් මෙසේ ගොඩනැගුනු මේ භාෂාව **පාණිනී** විසින් ව්‍යාකරණ ආදිය සපයා සකස් කළ හෙයින් මෙය සංස්කෘත භාෂාව නමින් පළ විය. **ප්‍රාකෘත භාෂාව:-** සංස්කෘත හැර අනික් දේශීය භාෂාවන් ප්‍රාකෘත යන නමින් මෙකල හැඳින්විත. **පාලි භාෂාව** මෙනමින් ප්‍රසිද්ධ භාෂාවද ප්‍රාකෘත විශේෂයකි. එහෙත් මගධ රටට වැඩම කර එහිදී චතුරාර්ය සත්‍යයන් අවබෝධකර වදාළ තථාගත සම්මා සම්බුදු රජාණන්වහන්සේ උන්වහන්සේ ප්‍රත්‍යක්ෂකර වදාළ උසස් ධර්මය මේ පාලි භාෂාවෙන් දේශනා කිරීම ඇරඹූ පසු මීට උසස් තත්වයක් ලැබින.

**පාලිභාෂාවේ මූල:-** පාඨ ශබ්දයෙන් **පාලි** යයි බිඳී ආ බවක් තත්වඥයෝ පවසති. ඇතැමෙක් මෙහි මූල ප්‍රාකෘතයයිද කියති. ඉන්දියානුජාතික ආචාර්ය **ජහගීර්දාර්** මහතාගේ අදහස් අනුව **ප්‍රාලෙය** ශබ්දයෙන් **පාලි** යයි බිඳී ආ බවක්ද කියති.

මේ පාලි ශබ්දය **පඞ්ක්ති පාඨ පල්ලි** පලාස **පලිපාඨලී** යන ශබ්දයන්ගෙන් බිඳී ආයේයයි නොයෙක් දෙනා නොයෙක් අයුරින් පවසති. දැනට ව්‍යවහාර වන පරිදි **පාලි** යන්නෙහි මූලික අර්ථය ලෙස ගණන්ගත හැක්කේ ත්‍රිපිටක ධර්මය පිළිබඳ මූල ග්‍රන්ථයන්ටය. මේ නිසාම ඊට පෙලපොත් යයිද ව්‍යාවහාර කිරීමට පුරුදු වූ බව සැලකිය යුතුය.

සම්බුද්ධ පරිනිර්වාණයෙන් දෙසිය සතිස්වන අවුරුද්දෙහි රජපැමිණි **දේවානම් පියතිස්ස** මහරජුන්ගේ රාජ්‍ය සමයෙන් පෙර පවා බුද්ධ ධර්මය පිළිබඳ ආලෝකය ලක්දිව පැතිර තුබුබව සත්‍ය වශයෙන් සිතිය හැකි වුවද බෞද්ධාලෝකය හරිහැටි පහළ වූයේ මිහිඳු මාහිමියන්ගේ ලඞ්කාවතරණයෙන් පසුවය. අනුරාධපුරයෙහි ලක් බුදුසසුන් පිහිටුවා **මහාරිට්ඨාදී** රහතුන් වහන්සේලා ගේ ප්‍රධානත්වයෙන් **විනය සංගායනාවක්** ද පවත්වා ඇත.

# ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය.

| ග්‍රන්ථය | කර්තෘ - ශොධක - සම්පාදක | මුද්‍රිත වර්ෂය |
|---|---|---|
| අඞ්ගුත්තර නිකාය. | බෝරුග්ගමුවේ සිරි රේවත නාහිමි සංස්කරණය | 1924 |
| අඞ්ගුත්තර නිකායට්ඨකථා 1, 2, | රත්මලානේ සිරි ධම්මානන්ද නාහිමි | 1920 |
| අඞ්ගුත්තර ටීකාව | මොරොන්තුඩුවේ සිරි ධම්මානන්ද නාහිමි | 1935 |
| අත්ථසාලිනී. | කපුගම සෝභිත හිමි | 1916 |
| අපදානට්ඨකථා (හේ. වි. මු) | වැලිවිටියේ සිරි සෝරත නාහිමි සහ වලගෙදර සෝමාලෝක නාහිමි | 1945 |
| අපදාන පාළි 1. (හේ. වි. මු) | වලගෙදර සෝමාලෝක නාහිමි | 1960 |
| අභිධර්ම කෝෂය. | මොරටුවේ සාසනරතන හිමි | 1948 |
| අභිධර්ම චන්ද්‍රිකා 1, 2, 3, 4, 5, 6. | මාතර ධම්මවංස හිමි | 1930 - 1940 |
| අභිධර්ම ප්‍රදීපිකා. | මොරටුවේ මේධානන්ද නාහිමි | 1950 |
| අභිධර්මාර්ථ සංග්‍රහ සාරය. | තොටගමුවේ පඤ්ඤාමොලිතිස්ස නාහිමි | 1936 |
| අභිධම්මත්ථ සංගහ. | කුකුල්නාපේ සිරි දේවරක්ඛිත හිමි | 1937 |
| අභිධම්මත්ථ සඞ්ගපපකරණං. | යෝගියානේ නන්දාරාමතිස්ස හිමි | 1909 |
| අභිධම්මත්ථවිභාවිනී ටීකා. | වැලිතර පඤ්ඤානන්ද හිමි | 1898 |
| අභිධානප්පදීපිකා සන්නය. | තොටගමුවේ පඤ්ඤාමොලි තිස්ස නාහිමි | 1895 |
| උදානට්ඨකථා. (හේ. වි. මු) | බිහල්පොල දේවරක්ඛිත නාහිමි | 1920 |
| උභය පාතිමොක්ඛ සන්නය. | වැලිතර ධම්මකුසල හිමි | 1927 |
| ඉතිවුත්තකට්ඨ කථා. (හේ. වි. මු) | මොරොන්තුඩුවේ ධම්මානන්ද නාහිමි | 1937 |
| කඞ්ඛාවිතරණී. (හේ. වි මු) | කරදත ජිනරතන නාහිමි | 1930 |
| කඞ්ඛාවිතරණී පිටපත. | කළුකොඳයාවේ පඤ්ඤාසේඛර නාහිමි | 1926 |
| කඨිනවංසය. | කිරිවත්තුඩුවේ පඤ්ඤාසාර නාහිමි | 1950 |
| කලහණී ප්‍රකරණ. | ගින්තොට මේධඞ්කර හිමි | 1924 |
| කුදුසික පුරාණ සන්නය. | මොරගල්ලේ ඤාණෝභාෂ තිස්ස හිමි | 1954 |
| කුදුසික විවරණය. | වැලිගම ඤාණරතන හිමි | 1954 |
| ඛුද්දක පාඨට්ඨකථා. (හේ. වි. මු) | වැලිපිටියේ දේවානන්ද නාහිමි | 1920 |
| ඛුද්දකපාඨ - ධම්මපද පාළි. (හේ. වි. මු.) | හල්ගස්තොට දේවානන්ද නාහිමි | 1960 |
| ඛුද්දසික්ඛා ටීකා. | ගාල්ලේ සුමනජෝති හිමි | 1958 |
| ගරු භණ්ඩවිනිච්ඡය. | කළුකොඳයාවේ පඤ්ඤාසේඛර නාහිමි | 1930 |
| චතුභාණවාරට්ඨ කථා (හේ. වි. මු) | දෙරණෑගොඩ ඤාණසේන හිමි | 1935 |
| චතුභාණවාර පාළි. (හේ. වි. මු) | පාතේගම-වල්පිට විමලසිරි නාහිමි | 1959 |
| චරියාපිටක පාළි. (හේ. වි. මු) | විලේගොඩ ධම්මානන්ද හිමි | 1960 |
| චරියාපිටකට්ඨකථා. | කුකුල්නාපේ සිරි දේවරක්ඛිත හිමි | 1936 |
| චූලනිද්දේසට්ඨකථා | බෝරුග්ගමුවේ සිරි රේවත නාහිමි | 1927 |
| ජාතකට්ඨකථා. 1, 2, 3, 4, 5, 6, 7, | විදුරුපොල පියතිස්ස මහ නාහිමි | 1937-1955 |
| ජාතක අටුවා ගැටපදය. | ඩී. බී. ජයතිලක මහතා | 1909 |

සූත්‍ර විනයාදිය පිටක ග්‍රන්ථ වශයෙන් බුද්ධ කාලයෙහි පැවැති බවත් පාලි අට්ඨකථා පසුව ඇතිවූ බවත් නිශ්චය කළ හැකිය. බුද්ධ භාෂිත යයි පිළිගන්නා සතළොස් මූල පාලි ග්‍රන්ථයන්ගේ පරමාර්ථ ධර්ම ස්වරූපාදිය විස්තර කළ ධර්ම විනිශ්චය මාර්ගය **අට්ඨකථා** නම් වේ. මිහිඳු මා හිමියෝ මේ අට්ඨකථාවන් ලක්දිවට ගෙණවුත් සිංහල භාෂාවෙන් ඒවා ලියා තැබූ බව ද ප්‍රකට යි. **මහට්ඨකථා-මහාපච්චරිය=කුරුන්දි සීහලට්ඨකථා-ආගමට්ඨකථා-සංඛෙපට්ඨකථා-අන්ධකට්ඨකථා - සමන්තපාසාදිකා** යනු ඒ සිංහල අටුවාවෝය. මෙයින් 1. මහාපච්චරිය, 2. කුරුන්දි 3. අන්ධක 4. සඞ්ඛෙප යන අටුවා සතර ප්‍රධානත්වයෙහි පවතී.

**මහාට්ඨකථා**- මහ (මුල්) අටුවාව, සූත්‍ර-අභිධර්ම විනය යන ත්‍රිපිටකාර්ථ කථාව මෙහි අඩංගු බව සිතිය හැකියි. මෙහි අඩංගු **කරුණු** ප්‍රථම සංගායනාවටද අඩංගු වී ඇති හෙයින් මීට මහාට්ඨ කථායයි ද ව්‍යවහාර වූ බව සැලකිය යුතුයි. බුදුන්වහන්සේගේ කාලයේ පටන් මහාක්ෂීණාශ්‍රව පරම්පරාවෙන් ගෙණ ආ මේ අට්ඨකථාව සිංහල භාෂාවට පරිවර්තනය කරණ ලදුව එයින් පස්මහ සඟි අටුවා ඇති වූයේ යයිද මතයකි.

**කුරුන්දි අටුවාව**- විනය මහ අටුවාව නම් වූ සමන්තපාසාදිකාව සිංහලට පරිවර්තනය කර ඊට කුරුන්දි අට්ඨකථා යයි නම් කළ බැව් ප්‍රසිද්ධය- කුරුන්දිවෙල්ලී මහ වෙහෙරෙහිදී කළ අටුවාව කුරුන්දි අටුවාව යයිද කියති.

**මහපච්චරී අටුවාව**- ලක්දිව චොරනාග රජු දවස මෙහි ඇතිවූ චණ්ඩාලතීය නම් මහා භය පැමිණි කල සිංහල රට වැසි භික්ෂූන් පරතෙරට යවනු සඳහා ශක්‍රයන් මැවූ පසුරක සිට මෙය **කරණ** ලදැයිද මතයකි.

**අත්ථසාලිනී**- ආදි සප්ත ප්‍රකරණ අටුවාවන්ගේ මූල ග්‍රන්ථය මෙය යයි ද පසුරක සැදි ආවාසයක සිට කළ මේ අටුවාව මේ නම ලැබුණු බවද සමහරුන්ගේ මතයකි.

**අන්ධකට්ඨකථා**- බුද්ධඝොෂ හිමියෝ ලක්දිව වැඩමවත අතරතුර අන්ධක රටෙහිදී මේ අටුවාව සොයාගෙණ ආ බවක්ද පැවසෙයි. **සංඛෙපට්ඨ කථා**- මෙය මිහිඳු හිමියෝ කාංචිපුරයෙහි වැඩ සිටි කාලයේදී උන්වහන්සේට එහිදී හමුවී එයත් රැගෙන ලක්දිවට ආ බවක් කියවේ.

අශොක අධිරාජයාගෙන් පසුව මෞර්ය අධිරාජ්‍යය පිරිහෙන්නට වීය. මේ කාලය වන විට ආන්ධ්‍ර රාජ බලය ගොධාවරී හා කෘෂ්ණා ගංගා අසල වැඩෙමින් පැවතින මෞර්ය අධිරාජයාගේ වැටීමක් සමගම ආන්ධ්‍රරාජබලය පැතිරෙන්නට පටන් ගත්තේය. මේ නිසා **ඩෙකාන්, අමරාවතී, ගුන්තූර්, හයිද්‍රාබාද්,** හා **නාසික්** ආදි දිස්ත්‍රික්ක හා පළාත්ද ආන්ධ්‍ර රාජ බලයට යටත් වීය. මෙසේ බලවත් වූ ආන්ධ්‍රරාජ්‍යය අවුරුදු 450 ක් පමණ කාලයක් බලවත්ව පැවැත්තේය. මේ රාජ්‍ය කාලය තුළ මෙහි පැවැති බෞද්ධ නිකායයන් අන්ධක නමින් ප්‍රසිද්ධ විය. කථාවත්ථු අටුවාවෙහි දැක්වෙන පරිදි- **"අන්ධකා නාම පුබ්බසෙලියා අපරසෙලියා රාජගිරියා සිද්ධත්ථිකාති පච්චා උප්පන්න නිකායා"** (කථාවත්ථු අට්ඨකථා 116 පිට) කියා ඇත. **අන්ධකයෝ නම්**- පුබ්බසෙලී, අපරසෙලි, රාජ ගිරික සිද්ධත්ථික යන නිකායිකයන් බව ඉහත කියමනෙන් ඔප්පු වෙයි.

මිහිඳු මාහිමියන් ලක්දිවට වැඩමවා මහාපච්චරිය ආදී සියලුම සිංහල අටුවාවන්ගේ ආධාරයෙන් මෙහි බුද්ධශාසනය ඇති කරවූ තැන් සිට ක්‍රි: පූ: 259 - ක්‍රි: පූ: 412 දක්වා වූ අවුරුදු 700 කට සමීප කාලයක් මෙරට ජනතාව මහාට්ඨකථා ඇතුළු හෙලටුවාවන්ගෙන් ධර්ම - විනය අවබෝධකර ගත් බව සැබෑය. ක්‍රි: ව: 412 - 434 අතරතුර කාලයේදී මෙහි රජකම් කළ **මහානාම** රජු දවස ලක්දිවට වැඩම කළ **බුද්ධඝොෂ** හිමියන් නිසා පාලි සාහිත්‍යයට මහත් සෙතක් සැලසින. බුද්ධඝොෂ මාහිමියෝ අනුරාධපුරයට පැමිණ මහ වෙහෙර වැසි **සඞ්ඝපාල** හිමියන්ගෙන් පෙළ - අටුවා ඉගෙණ ගෙණ මහා සඞ්ඝයාගේ අනුදැනුම ඇතිව සිංහල අටුවා පොත් ක්‍රිපයක්ම පාලියට නැගූහ. ඒවා නම්:-

# පාලි ත්‍රිපිටක ග්‍රන්ථ

## සුත්ත පිටක

| පෙළ | අටුවාව | කතෘ |
|---|---|---|
| 1. දීඝ නිකාය | සුමඞ්ගල විලාසිනී | බුද්ධඝෝෂ හිමි |
| 2. මජ්ඣිම නිකාය | පපඤ්චසූදනී | -එම- |
| 3. සංයුත්ත නිකාය | සාරත්ථප්පකාසිනී | -එම- |
| 4. අඞ්ගුත්තර නිකාය | මනෝරථ පූරණී | -එම- |
| 5. ඛුද්දක නිකාය | | |

**පහත සඳහන් 15 ක් ග්‍රන්ථයනට අයත් වෙයි.**

| | | |
|---|---|---|
| 1. ඛුද්දක පාඨ | පරමත්ථජෝතිකා | බුද්ධඝෝෂ හිමි |
| 2. ධම්මපද | -එම- | -එම- |
| 3. උදාන | පරමත්ථදීපනී | ධම්මපාල හිමි |
| 4. ඉතිවුත්තක | -එම- | -එම- |
| 5. සුත්තනිපාත | පරමත්ථජෝතිකා | බුද්ධඝෝෂ හිමි |
| 6. විමාන වත්ථු | පරමත්ථදීපනී | ධම්මපාල හිමි |
| 7. පෙතවත්ථු | -එම- | -එම- |
| 8. ථේරගාථා | -එම- | -එම- |
| 9. ථේරීගාථා | -එම- | -එම- |
| 10. ජාතක | පරමත්ථජෝතිකා | බුද්ධඝෝෂහිමි |
| 11. චූල නිද්දෙස | | |
| මහා නිද්දෙස | සද්ධම්මජෝතිකා | උපසෙන හිමි |
| 12. අපදාන (ථේර - ථේරී) | විසුද්ධජන විලාසිනී | මහානාම හිමි |
| 13. පටිසම්භිදා | සද්ධම්මප්පකාසිනී | ධම්මපාල හිමි |
| 14. බුද්ධවංස | මධුරත්ථප්පකාසිනී | බුද්ධදත්ත හිමි |
| 15. චරියා පිටක | පරමත්ථදීපනී | ධම්මපාල හිමි. |
| නෙත්තිප්පකරණ | නෙත්ති අට්ඨකථා | -එම- |
| චතුභාණවාර පාලි | චතුභාණවාර අට්ඨකථා | ආනන්දවනරතන හිමි |

**මූළ සූත්‍ර පිටකය** 1. වොහාර දෙශනා 2. යථානුලොම සාසන 3. දිට්ඨි විනිවෙඨන කථා යයි විශෙෂ කොටස් තුණකට බෙදෙයි.

## විනය පිටකය

| | පෙළ | අටුවාව | කතෘ |
|---|---|---|---|
| උභය විභඞ්ග | 1. පාරාජික පාලි | සමන්තපාසාදිකා විනයට්ඨ කථා | බුද්ධඝෝෂ හිමි. |
| | 2. පාචිත්තිය පාලි | | |
| ඛන්ධක | 3. චුල්ලවග්ග පාලි | | |
| | 4. මහා වග්ග පාලි | | |
| පරිවාර | 5. පරිවාර පාලි | | |
| | 1. භික්ඛුපාති මොක්ඛ | කඞ්ඛාවිතරණී මාතිකට්ඨ කථා | බුද්ධඝෝෂ හිමි. |
| | 2. භික්ඛුණී පාතිමොක්ඛ | | |

**විනය පිටකය.**- 1. ආණා දෙසනා, 2. යථාපරාධ සාසන. 3. සංවරාසංවර කථා යයි විශෙෂ කොටස් තුණකි.

මේවායේ කාලය වශයෙන් බලන විට ක්‍රි. ව. පස්වන ශතවර්ෂයට ඇතුළත් යයි නිගමනය කළ හැකිය.

මෙයින් II. චූල නිද්දෙස හා මහා නිද්දෙසයන්ට උපසෙන හිමියන් විසින් සද්ධම්මජෝතිකා නම් අටුවාව රචනා කරණ ලද්දේ 6 වන ශතවර්‍ෂයේය. 12. අපදාන (ථෙර - ථෙරී) යට විසුද්ධ ජන විලාසිනී නම් අටුවාව මහානාම හිමියන් විසින් කරණ ලද්දේ 7 වන ශත වර්‍ෂයේය. චතු භාණවාර පාළියට චතුභාණවාර අට්ඨකථාව සම්පාදනය කරණ ලද්දේ 8 වන ශත වර්‍ෂයේය.

විනය - අභිධර්‍ම හා සූත්‍ර පිටකයේ ඛුද්දක නිකාය හැරුණු විට අනිත් පාඨ ග්‍රන්ථයන්ට අටුවා සපයා ඇත්තේ බුද්ධඝොෂ හිමියන් විසිනි. ඛුද්දක නිකායේ උදාන - විමාන වත්ථු ථෙරගාථා - ථෙරී ගාථා - පටිසම්භිදා - චරියා පිටකයන්ට හා නෙත්තිප්පකරණයට අටුවා රචනා කරණ ලද්දේ ධම්මපාල හිමියන් විසිනි. චූල හා මහා නිද්දෙසයන්ට උපසෙන හිමියන් විසින් අටුවා සපයන ලදී. බුද්ධවංසයට අටුවාව සම්පාදනය කර ඇත්තේ බුද්ධදත්ත හිමියන් විසිනි

## අභිධර්‍ම පිටකය

| පෙළ | අටුවාව | කර්‍තෘ |
|---|---|---|
| 1. ධම්මසඞ්ගණිප්පකරණ | | |
| 2. විභඞ්ගප්පකරණ | අත්ථසාලිනී සම්මොහ විනොදනී | බුද්ධඝොෂ හිමි |
| 3. කථා වත්ථුප්පකරණ | | |
| 4. පුග්ගල පඤ්ඤත්තිප්පකරණ | | |
| 5. ධාතුකථාප්පකරණ | | |
| 6. යමකප්පකරණ | පරමත්ථදීපනී (පඤ්චප්පකරණට්ඨ කථා) | බුද්ධඝොෂ හිමි. |
| 7. පට්ඨානප්පකරණ | | |
| විසුද්ධිමග්ග | | බුද්ධඝොෂ හිමි |

**අභිධර්‍ම පිටකය:-** 1. පරමත්ථ දෙසනා, 2. යථා ධම්ම සාසන, 3. නාමරූප පරිච්ඡෙද කථා යයි කොටස් තුණකට බෙදෙයි.

බුද්ධඝොෂ හිමියන් විසින් කරණ ලද අටුවා රාශියට ආශ්‍රය කරගෙණ ඇත්තේ මහාට්ඨකථා, මහාපච්චරියට්ඨකථා, කුරුන්දට්ඨකථා, සඞ්ඛෙපට්ඨකථා, අන්ධකට්ඨකථා යන මේ හෙලටුවා පසය. එයිනුත් මහාට්ඨ කථාව විශෙෂ වශයෙන් උපකාර කරගෙණ ඇති බව පෙණේ. බුද්ධඝොෂ හිමියන්ගේ අටුවාවන්හි "අට්ඨකථාසු වුත්තං" කියා සඳහන් වූයේ මේ මහාට්ඨකථාව ගැණය.

මේ පාලි - සිංහල ශබ්දකොෂයේ ප්‍රථම භාගය පාලි සිංහල අකාරාදිය නමින් වර්‍ෂ 1934 (2474) දී මාගේ ආචාර්‍ය පාදෙත්තම ගංගොඩවිල සුභද්‍රාරාම පරිවෙණාධිපති අතිගෞරවාර්‍හ බෝරුග්ගමුවේ ශ්‍රී රෙවතාභිධාන නායක මාහිමියන් වහන්සේ විසින් ප්‍රසිද්ධියට පත් කරණ ලදහ. ඊට තවත් ඇතුලත් වියයුතු වචන රාශියක් ද එකතු කර අනිත් සියළු කොටස් සම්පූර්‍ණ කොට එකම පොතක් වශයෙන් මේ වර ප්‍රසිද්ධියට පමුණුවන්ට ලැබීම අපගේ මහත් ප්‍රීතියට හේතුවකි. උන්වහන්සේ මට දුන් අවවාද - අනුශාසනා පරිදිම මුල් කාණ්ඩයට සරිලන අයුරු ඉතිරි කොටස සම්පූර්‍ණ කළ බැව් මෙහිලා සඳහන් කරණු කැමැත්තෙමි. උන්වහන්සේ මාව මේ කාර්‍යයෙහි දිරි ගැන්වීම නිසා මේ ශබ්දකොෂය මෙසේ මුද්‍රණද්වාරයෙන් බිහිවිය. අප ගරුතර නායක මාහිමියන් වහන්සේ විසින් ප්‍රථම භාගයට සපයන ලද සංඥපනය හා උප ක්‍රමණිකාව ද උන්වහන්සේට ගෞරවයක් වශයෙන් මෙහිද එසේම පළකිරීමට අදහස් කෙළෙමි.

මෙවැනි භාරදූර ග්‍රන්ථකරණයකදී සිදුවිය හැකි ප්‍රමාද දොෂ බොහෝ විය හැකියි. එවැනි යමක් හමුවුවහොත් ඒවාද, මේ සඳහා දියහැකි උපදෙශ ඇතොත් ඒ සියල්ලද ශාස්ත්‍රානති-කාමිත්වයෙන් හා කරුණා - මෛත්‍රියෙනුත් අප වෙත දන්වන මෙන් පාඨක භවතුන්ගෙන් ඉල්ලමු. එවැනි සදුපදෙශයන් පොත පිළිබඳ දෙවැනි සංස්කරණයකදී අපට මහත්සේ ප්‍රයෝජන විය හැකියි.

බොහෝ වෙහෙස මහන්සි දරා මේ ග්‍රන්ථය නිෂ්පාදනය කිරීමෙන් ලබාගන්නා ලද පුණ්‍ය ස්කන්ධය බුද්ධ ශාසනයට මහඟු සේවාවක් සිදුකළ අපවත් වී වදාළ මාගේ ආචාර්‍යෝත්තම සුභද්‍රාරාම පරිවෙණාධිපති ධර්මකීර්ති ශ්‍රී රේවතාභිධාන නායක මාහිමියන් වහන්සේට හා විද්‍යෝදය පිරිවෙණේ උපප්‍රධානාචාර්‍ය වූද වල්බෝලානේ වික්‍රමශිලා විදර්ශනා පිරිවෙණේ ආදී කර්තෘ වූද මහෝපාධ්‍යාය කුකුල්නාපේ ශ්‍රී දේවරක්ෂිතාභිධාන මාහිමියන් වහන්සේටද පින් පඬුරු වශයෙන් පිළිගන්වමි. දැනට ජීවත්ව වැඩ සිටින මාගේ ආචාර්‍යවරයෙකු වූ ගරුතර දම්පිටියේ සරණතිස්ස මාහිමියන් වහන්සේට ද මේ පින් අත්පත් වේවා.

මා එංගලන්තයේ ලංඩන් නුවර සිටින විට මේ පොතේ ශුද්ධිපත්‍රාදිය බැලීමෙන් මට උපකාර කළ විද්‍යා විශාරද පණ්ඩිත රද්දූල්ලේ පඤ්ඤාලෝක පණ්ඩිත අඹන්වැල්ලේ පඤ්ඤාශේඛර, කහවෙ දේවරක්ඛිත යන ස්ථවිරපාදයන් වහන්සේලා කෘතඥතා පූර්වකව මෙහි සඳහන් කරමි. ඇන්. වී. චන්ද්‍රරත්න මහතාගෙන් ලැබුනු සහයෝගයද කෘතඥතාවයෙන් සිහිකරමි.

මේ ග්‍රන්ථය අලංකාර ලෙස මුද්‍රණය කර ප්‍රසිද්ධ කිරීමට උපකාර වූ කොළඹ ඇම්. ඩී. ගුණසේන සහ සමාගමයට ද මගේ අවංක ස්තූතිය මෙයින් පිරිනැමෙයි.

මීට, ශාසනෝන්නතිකාමී,

**මඩිහියවෙල සුමඞ්ගල ස්ථවිර.**

2508/1965. 9. 25 වැනි දින.

ලන්ඩන් බෞද්ධ විහාරයේදීය.
5, හෙල්ත්පීල්ඩ් ගාර්ඩන්,
ලන්ඩන්.

| ග්‍රන්ථය | කර්තෘ-ශෝධක-සම්පාදක | මුද්‍රිත වර්ෂය |
|---|---|---|
| ජාතක පාළි. 1, 2, (හේ. වි. මු) | විදුරුපොළ පියතිස්ස මහ නාහිමි | 1955 |
| ජාතකපාළි iii (හේ. වි· මු) | නුවරඑළියේ සෙනානන්ද හිමි | 1960 |
| ථෙරගාථාට්ඨකථා i, (හේ. වි. මු) | සූරියගොඩ සුමඞ්ගල හිමි, හා වැබොඩ සංඝරතන හිමි | 1925 |
| ථෙරගාථාට්ඨකථා 2. (හේ. වි. මු) | රේරුකානේ අරියඤාණ හිමි | 1935 |
| ථෙරීගාථාට්ඨකථා (හේ. වි. මු) | බිහල්පොල දෙවරක්ඛිත නාහිමි | 1926 |
| දීඝනිකායට්ඨකථා 1. (හේ. වි. මු) | හෙය්යන්තුඩුවේ දෙවමිත්ත නාහිමි | 1927 |
| දීඝනිකායට්ඨකථා 2 (හ්. වි. මු) | බෝරුග්ගමුවේ සිරි රේවත නාහිමි | 1936 |
| දීඝනිකාය. | වලගෙදර සෝමාලෝක තිස්ස නාහිමි | 1942 |
| ධම්මපදපාළිය | මොරොන්තුඩුවේ ධම්මානන්ද නාහිමි | 1937 |
| ධම්මපදට්ඨකථා i, ii, (හේ. වි. මු) | කහවේ රතනසාර නාහිමි | 1926-1938 |
| ධම්මසඞ්ගණිප්පකරණ. (හේ. වි. මු) | හපුවලානේ ඤාණාලෝක හිමි | 1960 |
| ධම්මසඞ්ගණිප්පකරණට්ඨකථා (හ්. වි මු) | යගිරල පඤ්ඤානන්ද නාහිමි | 1948 |
| නාමරූපසමාසය. | බටපොලේ ධම්මපාල හිමි | 1908 |
| නාමරූප පරිච්ඡේදය. | කරපාගල ධම්මතිලක හිමි | 1912 |
| නෙත්තිප්පකරණය. | කිරිඇල්ලේ ඤාණවිමල හිමි | 1952 |
| නෙත්තිප්පකරණට්ඨකථා. (හේ. වි. මු) | විදුරුපොල පියතිස්ස මහ නාහිමි | 1928 |
| පට්ඨානප්පකරණ සන්නය. | රේරුකානේ චන්දවිමල | 1953 |
| පඤ්චප්පකරණට්ඨකථා 1, 2, (හේ. වි. මු) | රේරුකානේ අරියඤාණ | 1937-1943 |
| පට්ඨානප්පකරණය 1. | කිරිඇල්ලේ ඤාණවිමල හිමි | 1954 |
| පටිසම්භිදාමග්ගට්ඨකථා (හේ. වි. මු) | ඇම් ශ්‍රී ජිනරතන නාහිමි, ඇම්. ශ්‍රී අනොමදස්සී නාහිමි හා වැලිවිටියේ සෝරත නාහිමි | 1948 |
| පරිවාරපාළි. (හේ. වි. මු) | වේරගොඩ අමරමෞලි නාහිමි | 1962 |
| පරිවාර ගණ්ඨිපදය. | බැන්ඩියමුල්ලේ ධම්මරතන හිමි | 1914 |
| පාචිත්තිය පාළි. | බෙන්තර සද්ධාතිස්ස හිමි හා කාලවිල ඉන්දරතන හිමි | 1926 |
| පාතිමොක්ඛ ගණ්ඨි. | ඕ. ගුණරතන හිමි | 1890 |
| පාරාජික පාළි. (හේ. වි. මු) | පලන්නරුවේ විමලධම්ම නාහිමි | 1950 |
| පාළිමුත්තක විනය විනිච්ඡය. | පානදුරේ ඤාණවිමල තිස්ස නාහිමි | 1908 |
| පාළිමුත්තක විනය විනිච්ඡය සන්නය. | කරගම්පිටියේ ජොතිරතන නාහිමි | 1918 |
| පාළිමුත්තක විනය විනිච්ඡය සඞ්ගහ ටීකා, | කහඳමෝදර පඤ්ඤාසාර නාහිමි | 1908 |
| පාලිබොධිවංස ගැටපදය. | රත්මලානේ ධර්මාරාම නාහිමි | 1910 |
| පෙතවත්ථු අට්ඨකථා. | ශ්‍රී ධර්මාරාමතිස්ස නාහිමි සහ මාපලගම චන්දජොති හිමි | |
| ප්‍රාතිමොක්ෂ වර්ණනාව. | පණාම්ගල ජිනරතන නාහිමි | 1948 |
| ප්‍රාතිමොක්ෂ පුරාණ සන්නය. | කොලොන්නාවේ සුගුණසාර නාහිමි | 1927 |
| බුද්ධවංසට්ඨකථා (හේ. වි. මු) | යගිරල පඤ්ඤානන්ද නාහිමි | 1938 |
| භික්ෂුසීලය. | උඩුගම්පොල සුවර්ණජෝති හිමි | 1893 |
| මජ්ඣිමනිකාය. | කිරිඇල්ලේ ඤාණවිමල හිමි | 1940 |
| මජ්ඣිම නිකායට්ඨකථා 1, 2, (හේ. වි. මු) | රත්මලානේ ධම්මානන්ද නාහිමි | 1935-1945 |
| මජ්ඣිම නිකායට්ඨකථා 3, 4, (හේ. වි. මු) | කිරිවත්තුඩුවේ පඤ්ඤාසාර නාහිමි | 1948-1950 |

| ග්‍රන්ථය | කර්තෘ-ශෝධක-සම්පාදක | මුද්‍රිත වර්ෂය |
|---|---|---|
| මහානිද්දෙසට්ඨකථා (හේ. වි. මු) | බෝරුග්ගමුවේ රේවත නාහිමි | 1936 |
| මහාවග්ග පාළි 1. (හේ. වි. මු) | දෙහිගස්පේ පඤ්ඤාසාර නාහිමි | 1960-1963 |
| මූලසික සන්නය. | මුල්ලපිටියේ ධම්මකිත්ති හිමි | 1912 |
| වත්තක්ඛන්ධකය. | බලපිටියේ උපරතන හිමි | 1905 |
| විනය කෝෂය. | මොරටුවේ සාසනරතන හිමි | 1955 |
| විනයත්ථමඤ්ජූසා. | යූ පී. ඒකනායක මහතා | 1912 |
| විනය විනිච්ඡය. | පොල්වත්තේ බුද්ධදත්ත නාහිමි | 1952 |
| විනය විනිච්ඡය සන්නය. | තලල්ලේ ධම්මරක්ඛිත නාහිමි | 1937 |
| විභඞ්ගට්ඨකථා. (හේ. වි. මු) | යගිරල පඤ්ඤානන්ද නාහිමි | 1938 |
| විභඞ්ගප්පකරණය. | මාම්පේ සෝභිත හිමි හා වැලිවිල්ලේ රතනජෝති හිමි | 1913 |
| විමානවත්ථු අට්ඨකථා (හේ. වි. මු) | මඩුගල්ලේ සිද්ධත්ථ නාහිමි හා මොරොන්තුඩුවේ ධම්මානන්ද නාහිමි | 1930 |
| විමති විනෝදනී ටීකා. | බේරතුඩුවේ ධම්මාධාර හිමි | 1935 |
| විසුද්ධිමග්ගට්ඨ කථා. (හේ. වි. මු) | පමුණුවේ බුද්ධදත්ත | 1939 |
| විසුද්ධිමග්ග ටීකා. | මොරොන්තුඩුවේ ධම්මානන්ද නාහිමි | 1935 |
| විසුද්ධිමාර්ග සන්නය | බෙන්තර සද්ධාතිස්ස හිමි | 1949 |
| ශ්‍රී සුමඞ්ගල ශබ්දකෝෂය. | වැලිවිටියේ සෝරත නාහිමි | 1958 |
| සද්ධර්මසාගරය. | අම්බලන්ගොඩ ධම්මකුසල හිමි | 1954 |
| සමන්තපාසාදිකා විනයට්ඨ කථා 1, (හේ. වි. මු) | බද්දේගම පියරතන නාහිමි හා වැලිවිටියේ සෝරත නාහිමි | 1929 |
| සමන්තපාසාදිකා විනයට්ඨකථා 2, 3, 4, (හේ. වි. මු) | වැලිවිටියේ සෝරත නාහිමි | 1928-1935 |
| සම්මෝහ විනෝදනී. (හේ. වි. මු) | යගිරල පඤ්ඤානන්ද නාහිමි | 1932 |
| සංයුත්ත නිකාය. | කිරිඇල්ලේ ඤාණවිමල හිමි | 1953 |
| සංයුත්ත නිකායට්ඨකථා 1, 2, 3, (හේ. වි. මු) | විදුරුපොල පියතිස්ස මහ නාහිමි | 1938-1948 |
| සාරත්ථදීපනී. | බිහල්පොල දේවරක්ඛිත නාහිමි | 1915 |
| සාරාර්ථදීපනී විනය අටුවා ගැටපදය | වේරගොඩ අමරමෝලි නාහිමි | 1946 |
| සික්ඛාපදවලඤ්ජනී. | වෑකඩ පඤ්ඤානන්ද හිමි | 1901 |
| සුජනප්පමෝදනී. | වටද්දර මේධානන්ද හිමි | 1929 |
| සුත්තනිපාතට්ඨ කථා (හේ. වි. මු) | සූරියගොඩ සුමඞ්ගල හිමි හා මාපලගම ඡන්දජෝති හිමි | 1918 |
| සුත්තසඞ්ගහට්ඨකථා (හේ. වි. මු) | බද්දේගම පියරතන නාහිමි | 1930 |

1. A Dictionary of Buddhist proper names by prof. C. Akanuma, nagoya Japan.
2. Bodes pali Literature of Burma
3. Dictiornary of pali proper names Dr. by. G. P. Malalasekara vol. i. ii.
4. Pali Literature of Ceylon, by Dr, G. P. Malalasekara.
5. Pali- English Dictionary ed by. T. W. Rhys Davids and William Stede.
6. Pali- English Dictionary ed. by Clildrs.

# සංඥාපනය.

පාලිභාෂාව වනාහි ආදියෙහි පටන් ලොකයෙහි සියලුම පඬිවරුන් විසින් අත්‍යන්ත-සමාදෘත භාෂාවකි. ලොකයෙහි විද්‍යමාන භාෂා අතුරෙහි පාලිභාෂාව මෙන් ලෝවැස්සන්ගේ උභයාර්ථයට ම ඉවහල් වන තවත් භාෂාවක් නොමැතියි. එහෙයින් ම මේ භාෂාතොමෝ දැන් මුළුලොව ම පැතිර පවත්නීය. ලොකයෙහි සෑම රටකම මේ භාෂාව ඉගෙණීමෙහි අභිලාෂ ඇත්තවුන්ගේ සඞ්ඛ්‍යාව දිනෙන් දින ම වැඩෙන්නීය. මේ නිසාම නිර්මල පාලිභාෂාව ලක්දිව පවත්නා බව ලක්වැස්සන්ගේ ගෞරවයට හෙතුභූත කාරණයන් අතුරෙහි ප්‍රධාන කාරණයක් වී තිබේ. එහෙයින් ලක්වැසි බෞද්ධාබෞද්ධ කවුරුන් විසිනුත් මේ භාෂාවට ගෞරව කටයුතුමය.

ලඞ්කාවේ වනාහි මේ භාෂාවගේ ව්‍යාප්තිය මීට අවුරුදු දෙදහකටත් දූරාතීතයෙහි පටන්ය. එහෙත් මේ තාක් මේ අත්‍යුත්තම භාෂාව පිළිබඳව ලක්දිව නිපදවූ සෑහෙන පාලි-සිංහල කොෂග්‍රන්ථයක් නොමැති බව ලක්දිවට මහත් පාඩුවක්ව පැවැත්තේය. බුද්ධාගම පවත්නා අනික් සෑම රටකම පාහේ ඒ ඒ රට වැස්සන් විසින් නිපදවා ගත් පාලි කොෂ ග්‍රන්ථයෝ වෙත්. ටිබෙට්රටෙහි අභිධර්මකොෂය, මහා ව්‍යුත්පත්තියයි ඉතා වැදගත් කොෂග්‍රන්ථ දෙකක් විද්‍යමාන බැව් ඇසීමු. බුරුම රටෙහි ද බුරුම ස්ථවිර කෙනෙකුන් විසින් නිපදවූ පාලි බුරුම අකාරාදියක් තිබේ. සියම් රටෙහි සියම් පාලි-අකාරාදියක් ඇති බව ඇසීමු. යුරොපයෙහි ද පාලි-ඉංග්‍රීසි අකාරාදි දෙකක් නිපදවා තිබේ. මොවුනතුරෙන් පාලි-ඉංග්‍රීසි අකාරාදි දෙක හා බුරුම-පාලි අකාරාදියත් අපි මේ කෘතියට පිටුවහල් කර ගතිමු. මහා ව්‍යුත්පත්තිය හා අභිධර්මකොෂයත් ලබාගන්නට ක්‍රියා කර ගෙණ යන්නෙමු. ලද හොත් ඒ ග්‍රන්ථයන් ද ඇසුරු කොට මේ ග්‍රන්ථය පිළිබඳ උපග්‍රන්ථයක් සම්පාදනය කරන්නට බලාපොරොත්තු වන්නෙමු.

ලොකයේ ව්‍යාප්ත සෑම භාෂාවකට ම අභිනව ක්‍රමයේ ශබ්දකොෂ සම්පාදනය කරණ මේ කාලයේ පාලිභාෂාවට මෙබඳු කොෂග්‍රන්ථයක් ලක්වැස්සෙකු විසින් නොම නිපදවනු ලැබී නම් එය ලක්දිවට මහත් මදිකමකි. එබැවින් ලක්දිව පාලි උගතුන් විසින් මීට බොහෝ කලකට පෙර සිදුකටයුතුව තුබූ උදාර මෙහෙයක් මේ මගින් ඉටුකරන්නට අපට අවකාශ ලැබීම බලවත් ප්‍රීතියට කරුණකි. සිංහල භාෂාවට පැවති බලවත් පාඩුවක් අපේ ශබ්දාර්ථ-රත්නාකර නම් සිංහල මහා අකාරාදියෙන් බොහෝ දුර පිරිමැසීමු. එසේම ලංකාවේ පාලි හදාරන්නවුන්ට පැවති බලවත් පාඩුවක් මේ ග්‍රන්ථයෙන් බොහෝ දුර පිරිමැසේ යයි කල්පනා කරමු.

පාලිභාෂාව වැනි අතිවිශාල වූ ද ඉතා සියුම් ධර්ම පැවසෙන්නා වූ ද භාෂාවකට මෙබඳු කොෂග්‍රන්ථයක් නිපදවීමේදී කෙබඳු නම් ප්‍රයාසයක් දැරිය යුතු ද, කොතරම් නම් සාවධාන වියයුතු ද යනු මේ විධියේ කෘත්‍යයෙක්හි යෙදුනවුන්ට ම මුත් අන්‍යයන්ට අවබොධ වේයයි නොසිතමු. ලොකයෙහි ව්‍යාප්ත භාෂා අතුරෙන් කොෂග්‍රන්ථ අඩු භාෂාව පාලිභාෂාවයයි කිව යුතුය. මේ තාක්ම පාලිභාෂාව පිළිබඳව අපරට පැවැති සම්භාව්‍ය එකම කොෂග්‍රන්ථය නම් පාලි නිඝණ්ඩුවයි. එය ග්‍රහණ-ධාරණ සෞකර්යය සැලකීමෙන් ද්‍රෙ කොෂග්‍රන්ථ නිපද-වීමේ පෙර පැවති සිරිතට අනුව ගාථාබන්ධනයෙන් සම්පාදිත වූවකි. එහි ඇතුලත්ව තිබෙන වචන සඞ්ඛ්‍යාව ද ස්වල්පයි. එහෙත් එය සංස්කෘත භාෂාවට අමරකොෂය මෙන් පාලි භාෂාවට මහොපකාරීය. මේ හැර අත්තරගම රාජගුරු බණ්ඩාර මහතා විසින් සම්පාදිත යයි සලකනු ලබන පුස්කොළ පත්ඉරු 30 කින් පමණ යුත් ඉතා කුඩා පාලි අකාරාදියක් ද මහනුවර මල්වතුවිහාරයේ සඞ්ඝරාජාරාමාධිපති වැලිවිට ශ්‍රී සරණඞ්කර මහාස්ථවිරපාදයන් වහන්සේගෙන් අපට ලැබුනේය. එහි වචන හත්අට සියයකට වඩා ඇතුලත් නොවේ. ගත්රුම් ද බොහෝ සදෙස්ය. එබැවින් මේ අකාරාදිය සම්පාදනය කිරීමේදී අපට ගුරුකමට ගන්නට හෝ පිළිසරණ කරගන්නට ප්‍රාචීන වූ හෝ කිසිවකුත් නොවීය. පෙළ-අටුවා-ටීකා-

අනුටීකා ආදිය හා පාලිභාෂාවෙන් ලියන ලද වෙනත් ග්‍රන්ථයන් ද පරීක්‍ෂාවෙන් බලමින් වචන සපයන්නට හා අර්ථ දක්වන්නටත් සිදු විය. එය අතිශයින් ම පරිශ්‍රම ඵලවත්තකි. බොහෝ කලක් දිවා-රූ දෙක්හි මෙසේ බලවත් පරිශ්‍රමයක් උසුලමින් මේ ග්‍රන්ථය සම්පාදනය කෙළෙමු. ලඞ්කාවේ පාලිභාෂාව පඨන-පාඨනාදිය කරණුවන්ට මෙයින් මඳවූත් පලක් වී නම් එයම අපගේ පරිශ්‍රමසාඵල්‍යය කොට සලකමු.

පෙරදිග භාෂා පිළිබඳ අකාරාදිකෝෂග්‍රන්ථයන්හි ආඛ්‍යාත ක්‍රියාරූප පෙන්වීමේ සිරිතක් නැත. එහෙත් ආධුනිකයන්ට ක්‍රියාරූප හැඳින ගැණීමේ හා ඔවුන් සිදුවන අයුරු දැන ගැණීමෙන් සෞකර්‍ය්‍යය ඇති කරණු සඳහා අපි මෙහි ක්‍රියාවන්ගේ වර්‍තමාන රූපය හා සිඬ කිරීමට දුෂ්කරයයි පෙණෙන වෙනත් ක්‍රියාරූප ද ඔවුන්ගේ නිෂ්පත්තීන් ද යෙදීමු. රයිස් ඩේවිඩ්ස් මහතා උන්නැහේගේ පාලි ඉංග්‍රීසි අකාරාදියේ ඇතැම් ක්‍රියාරූප පෙන්වා තනානිෂ්පත්තිය පෙන්වීමේදී සංස්කෘත ධාතු පෙන්වා තිබේ. පාලි ක්‍රියාරූප ඇඳින්වීමේදී සංස්කෘත ධාතු පෙන්වීම රයිස් ඩේවිඩ්ස් මහතා සවකීය අකාරාදියේ කර තිබෙන වරදකි. එසේ කිරීමට හෙතු ද උන්නැහේ පෙන්වා තිබේ. නමුත් ඒ හෙතු මෙබඳු වරදක් කිරීමට තරම් යයි අපි නොසිතමු. මේ හැර උන්නැහේගේ ඒ අකාරාදියේ තවත් බලවත් වරදක් දක්නා ලැබේ. එනම්:- මහායාන බෞඬ සංස්කෘත වචන පාලි වචන මෙන් සලකා එහි යෙදීමයි. බෞඬ ධර්‍මය පැවසෙන පමණකින් පාලි අකාරාදියක සංස්කෘත වචන යෙදීම යුතු නොවේ.

මේ දුෂ්කරකාර්‍ය්‍යයේදී විද්‍යෝදය පිරිවෙණේ සම්භාවනාර්හ ආචාර්‍ය්‍ය වරයන් කිහිප දෙනෙකුන් වහන්සේගෙන් විශිෂ්ටෝපකාර ලදීමු. විශෙෂයෙන් අපෙන් ඇතිවූ ලොකු කුඩා දොෂයන් ශුඬ කරදීමෙන් හා මුද්‍රණයේදී ශොධ්‍යපත්‍ර බලා දීමෙනුත් විද්‍යෝදය පිරිවෙණේ උපප්‍රධානාචාර්‍ය්‍ය **බද්දේගම පියරතන** ස්ථවිරපාදයන්ගෙන් හා උපචාර්‍ය්‍ය **කළුකොඳයාවේ ප්‍රඥාශෙඛර, පණ්ඩිත වැලිවිටියේ සොරත** යන ස්ථවිර වරුන්ගෙනුත් මගේ සුවච ශිෂ්‍ය ආභිධර්‍මික වාගීශ්වරාචාර්‍ය්‍ය **කුකුල්නාපේ දෙවරක්‍ෂිත** තැනගෙනුත් බලවත් උපෂ්ටම්භයක් ලැබුනු බව කෘතඥතා පුරඃසරව සඳහන් කරම්හ. එසේම විද්‍යෝදය පරිවෙණාධිපති පණ්ඩිත ශිරෝමණී **කහවේ ශ්‍රී සුමඞ්ගල රතනසාරාභිධාන** ප්‍රධාන නායක ස්ථවිරපාදයන් වහන්සේ විසින් අවසාන ශොධ්‍යපත්‍ර බලා දීමෙන් ඉතා මහත් අනුග්‍රහයක් කරණ ලද බව ද ගෞරවයෙන් සඳහන් කරම්හ. අපේ ශිෂ්‍ය නමක් වන **මොරොන්තොඩුව මේධඞ්කර** තැනගෙනුත් මීට බොහෝ උපකාර ලැබුනු බව සන්තොෂයෙන් සඳහන් කරම්හ.

මෙබඳු ග්‍රන්ථ සම්පූර්ණකොට ම ප්‍රසිඬ කිරීම උචිත නමුත් එසේ කරන්නට ඉතා දීර්ඝ කාලයක් ගතවන හෙයිනුත්, කොටස් වශයෙන් ප්‍රසිඬ කිරීම පහසු හෙයිනුත්, එසේ කරණ ලෙස අපේ හිතවතුන් ඉල්ලූ හෙයිනුත් මේ වර මෙසේ වචන 3600 කින් මේ කාණ්ඩය ප්‍රසිඬ කරන්නට කල්පනා කෙළෙමු.

මෙහි අප අතින් සිදුවූ ප්‍රමාද දොෂයන් බොහෝ විද්‍යමාන විය හැකියි. එබඳු තැන් දුටහොත් ඒවාත්, මේ කෘතිය පිණිස උපදෙශ වශයෙන් කියයුතු යමක් ඇතහොත් ඒ සියල්ලත්, ශාස්ත්‍රසඞ්ග්‍රහකරණාභිලාෂයෙන් හා කරුණාවෙනුත් අපවෙත දන්වන ලෙස සුධීන් අයදුම්හ.

ශාසන සඞ්ග්‍රහයක් වශයෙන් මේ ග්‍රන්ථය කිරීමෙන් අප විසින් අත්පත් කරගත් කුශලස්කන්ධය අපගේ ආචාර්‍ය්‍ය ත්‍රිපිටක වාගීශ්වරාචාර්‍ය්‍ය **හික්කඩුවේ ශ්‍රී සුමඞ්ගලාභිධාන** ප්‍රධාන නායක මාහිමියන් වහන්සේ වෙත හා ත්‍රිපිටක වාගීශ්වරාචාර්‍ය්‍ය ධර්‍මකීර්ත්ති **හෙසියන්තුඩුවේ ශ්‍රී දෙවමිත්‍රාභිධාන** ප්‍රධාන නායක මාහිමියන් වහන්සේ වෙතත් හාපිටිගම් කෝරළේ ගස්පේ පුරාණ විහාරාධිපතිව වැඩ විසූ **වෑකුඹුරේ ශ්‍රී සිඬාර්ථ** ස්ථවිරපාදයන් වහන්සේ වෙතත් පුණ්‍යප්‍රාභෘත වශයෙන් පිරිණමම්හ.

මීට,

**බෝරුග්ගමුවේ රෙවත ස්ථවිර.**

ශ්‍රී බුඬ වර්‍ෂ දෙදහස් සාරසිය සිවූ සැත්තෑවට පැමිණි
දුරුතු මස පුරදෙළොස්වක් නම් තිථිය ලත් ගුරුදින
ගංගොඩවිල සුභද්‍රාරාම රජමහ පිරිවෙණේදීය.

1. ජනවාරි, 1931.

# උපක්‍රමණිකා.

**පාලි භාෂාව.**

සකලලෝකහිතවිධාතෘවූ අපගේ ලෝකස්වාමී තථාගතයන් වහන්සේ විසින් ස්වයම්භූඥානයෙන් අවබෝධකරගත් නව ලොවුතුරු දහම් මෙරමාහට අවබෝධ කරවනු පිණිස දෙශනා කර වදාළ භාෂා තොමෝ 'පාලි' නම් වන්නීය.

**පාලි යයි නම් කිරීමේ හේතුව.**

කුමක් හෙයින් ඕ තොමෝ 'පාලි' යයි නම් කරණ ලද්දී ද? යනු මේ භාෂාව පිළිබඳ විමර්ශයක් කරන්නවුන්ගේ සිත් තුළ පළමුකොට පහළවන ප්‍රශ්නයයි. 'පාලි' යන්නෙහි මුඛ්‍යාර්ථය නම් ත්‍රිපිටක ධර්මය පිළිබඳ මූලග්‍රන්ථ යනුයි. සංස්කෘත සාහිත්‍යයෙහි යම්කිසි මූලග්‍රන්ථයක් හෝ තදෙකදෙශයක් සඳහන් කටැටි තන්හි "තථා ච සූත්‍රපඞ්ක්තිඃ" "ඔමනතු ඉති ආස්තාරපඞ්ක්තිඃ" යනාදීන් 'පඞ්ක්ති' ශබ්දය ව්‍යවහාර කිරීම තද්විබුධයන්ගේ සිරිතක් ලෙස අද දක්වාත් පැවත එයි. ඒ අනුව බෞද්ධ සාහිත්‍යයෙහි ද ත්‍රිපිටක මූලග්‍රන්ථයන් ඇඳින්වීමේදී ඊට පුරාතනාචාර්‍යවරයෝ 'පාලි' යයි ව්‍යවහාර කළහ.

**උදාහරණ.**

"නෙව පාලියං න අට්ඨකථායං දිස්සති"[1] - (පෙළේ හෝ අටුවාවෙහි නොදක්නා ලැබෙයි.) "යො පන අත්ථමෙව සම්පාදෙති, න පාලිං"[2] - [යමෙක් අර්ථය (=අටුවා) පමණක් උගණියි ද, පෙළ තොම උගණිද] "ඉති ආදිසු අයං පාලි"-[3] (මේ ආදීන්හි මේ පෙළයි) "සෙසං යථා පාලිං එව නීයති"[4] - (සෙස්ස පෙළවූ පරිද්දෙන්ම වේ.) "පාලි මත්තමිධානීතං නත්ථි අට්ඨකථා ඉධ"[5] - (මෙහි පෙළ පමණක් ගෙණ එන ලදී, අටුවා මෙහි නැත.) යනාදීන් අටුවාහි හා වෙනත් ග්‍රන්ථයන්හිත් එන බොහෝ උදාහරණයන්ගෙන් ඒ බව ස්ඵුට වේ.

මේ 'පාලි' ශබ්දය 'පඞ්ක්ති' ශබ්දයෙන් බිඳී ආයේ යයි ඇතැම්හු කියති. ඇතැම්හු 'පාඨ' ශබ්දයෙන් බිඳී ආයේ යයි ද, ඇතැම්හු 'පල්ලි' ශබ්දයෙන් බිඳී ආයේ යයි ද, ඇතැම්හු 'පලාස' ශබ්දයෙන් බිඳී ආයේ යයි ද, ඇතැම්හු 'පලි' ශබ්දයෙන් බිඳී ආයේ යයි ද, ඇතැම්හු 'පාටලි' ශබ්දයෙන් බිඳී ආයේයයි ද කියති. දඹදිව බෝල්පූර්හි **ශාන්තිනිකේතන** විශ්වවිද්‍යාලයාධිපති **විධූශෙඛර ශාස්ත්‍රී** මහතා උන්නැහේගේ පාලිප්‍රකාශප්‍රවෙශයෙහි 'පාලි' ශබ්දය සංස්කෘත 'පඞ්ක්ති' ශබ්දයෙන් බිඳී ආයේයයි කියා එහි ව්‍යුත්පත්තියද දක්වයි. ඒ මෙසේයි:- පඞ්ක්ති = පන්ති=පණ්ටි (ත=ට) = පංළි (ට = ළ) = පල්ලි = **පාලි**, නැතහොත් පඞ්ක්ති (ඞකාර ලොප) = පක්ති පට්ටි = පල්ලි = **පාලි**.

වෛයාකරණයන්ගේ ශබ්දසාධනශක්තිප්‍රභාවයෙන් 'පාලි' ශබ්දය මෙසේ මෙකී ශබ්දයන්ගෙන් බිඳගත හැකිවූවද එය යුක්ති යුක්ත නොවේ. කුමක් හෙයින්ද? යත්:-මේ භාෂාවට 'පාලි' නාමය ලැබෙන කාලයෙහි සංස්කෘත භාෂාවෙන් ශබ්ද බිඳගෙණ මේ භාෂාවට ඇතුළත් කර ගැණීමේ සිරිතක් නොපැවති හෙයිනි.

**පාලිනාමය ව්‍යවහාරප්‍රාප්ත වූ කාලය**

පාලි භාෂාවට පාලි නාමය කොයි කාලයේ සිට ව්‍යවහාරප්‍රාප්ත වූයේද යනු නිශ්චය කිරීම දුෂ්කරය. ඉහත දැක්වූ උදාහරණයෝ ක්‍රිස්තු වර්ෂ පස්වෙනි ශතවර්ෂයේ හෝ ඊට මෑතදී ලියන ලද ඒවා වෙති. මේ ව්‍යවහාරය ක්‍රිස්තු වර්ෂයෙන් ප්‍රථම හෝ ද්විතීය ශතවර්ෂයේදී පමණ ඇරඹුනේ යයි මීට අවුරුදු පණස් තවයකට පෙර ඉංග්‍රීසියෙන් පාලි අකාරාදියක් ලියූ චිල්ඩර්ස් මහතා කියයි. සංස්කෘත භාෂාවෙන් ශබ්ද බිඳගෙණ පාලි භාෂාවට ඇතුළත් කරගැණීමේ සිරිත ඇරඹී තිබෙන්නේ බුද්ධ වර්ෂයෙන් අටවැනි ශතවර්ෂයෙන් මෙපිටය. සද්ධම්මොපායනය, දාඨාවංසය, මහාබෝධිවංසය යනාදි ග්‍රන්ථයන්හි මෙසේ බිඳගත් ශබ්ද ඉතා ස්වල්පයක් දක්නා ලැබේ. ඉන් පෙර ලියනලද එකද ග්‍රන්ථයක වත් එබඳු ශබ්ද දක්නා නොලැබේ. (මෙසේ බිඳගත් ශබ්දයන්ගේ සඞ්ග්‍රහයක් දක්නට පාලි උගත් යුරෝපීය පඬිවරයෝ බලාපොරොත්තුවෙත්. අපේ යම් පඬිවරයෙකු මේ ගැණ කල්පනා කළහොත් යෙහෙකි.)

---

1. සුමඞ්ගල විලාසිනී 2. ධම්මපදට්ඨකථා. 3. විසුද්ධිමග්ග 4. කථාවත්ථුඅට්ඨකථා. 5. මහාවංස

මෙසේ හෙයින් 'පාලි' ශබ්දය සංස්කෘත 'පඞ්ක්ති' ශබ්දයෙන් හෝ අනික් සංස්කෘත ශබ්ද යකින් බිඳී ආයේය යනු හේතු රහිත කීමකි. මේ වැරදි හැඟීම නිසාම 'පාලි' ශබ්දයේ 'ල' කාරය 'ළ' කාරය කොට සලකන්නටද ඇතැම් පඬිවරයන්ට සිදුවිය. 'පාලි' ශබ්දයේ පෙර පටන් ව්‍යවහෘත 'ල' කාරය 'ළ' කාරය කරන්ට එකද යුක්තියක් වත් නොපෙණේ. සංස්කෘත 'පඞ්ක්ති' ශබ්ද ව්‍යවහාරය අනුව 'පාලි' ශබ්ද ව්‍යවහාරයද පැමිණ තිබෙයයි සැලකීමට කරුණු දුලීභ නොවේ. සංස්කෘත 'පඞ්ක්ති' ශබ්දයෙන් වෛදික මූල ග්‍රන්ථයන් වාච්‍යවන්නාක් මෙන් 'පාලි' ශබ්දයෙන්ද ත්‍රිපිටක පෙලම වාච්‍යවිය. ඒ ත්‍රිපිටක පෙලේ භාෂාව පාලිභාෂා නම් වූවාය. ත්‍රිපිටකයට සම්බන්ධයක් නොමැති ග්‍රන්ථයන්ට පාලි නාමය ව්‍යවහාර ප්‍රාප්තව තිබෙන්නේ ඉතා මෑතකසිටය. පෙරදී ඔවුනට 'ග්‍රන්ථාන්තර'යයි ව්‍යවහාර කළහ. "එතෙ පාලිමුත්තක-වසෙන වුත්තත්තා ගන්ථන්තරාති වුච්චන්ති.[1]" (මොහු ත්‍රිපිටක පාලියෙන් මුක්ති හෙයින් ග්‍රන්ථාන්තරා-යයි කියනු ලැබෙත්.) යනාදි උදාහරණයන් ගෙන් ඒ බව පෙණේ.

**පාලිභාෂාවට ව්‍යවහෘත අන්‍ය නාම තන්ති.**

පාලි භාෂාවට ව්‍යවහෘත තවත් නමක් නම් 'තන්ති' යනුයි. සංස්කෘත භාෂාවෙහි තන්ත්‍ර හෝ තන්ත්‍රි යනු මීට සමාන නාමයෝයි. 'තන්ත්‍ර' - 'තන්ත්‍රි' ශබ්දයන්ගෙන් වෙදයෙහි මූලග්‍රන්ථයෝ අඳුන් වනු ලැබෙත්. එලෙසින් පාලියෙහි 'තන්ති' ශබ්දයෙන්ද ත්‍රිපිටක බුද්ධවචනය අඳුන් වනු ලැබේ. "සුඛුමඤාණගොචරං තන්තිං සඞ්ගායිත්වා[2]." (සියුම් නුවණට ගොදුරවන පෙල සඞ්ගායන, කොට) "තත්ථ ධම්මොති තන්ති[3]" (එහි ධර්මය නම් පෙලයි) "තන්තියා මාතිකං ඨපෙසි" (පෙලට මාතෘකා තුබූසේක.) "තන්ති වසෙනෙව විභාවිතො[4]." (පෙලෙහි ආ අයුරින්ම වර්ණනා කරණ ලදී.) "ධම්මදෙසනාති තන්තිඨපනා[5]" (ධර්මදෙශනාව නම් පෙල දෙශනා කිරීමයි) යනාදි උදාහරණයන්ගෙන් ඒ බව පෙනේ. මෙය ද සංස්කෘත තන්ත්‍ර 'තන්ත්‍රි' ශබ්දයන්ගෙන් බිඳගෙණ ව්‍යවහාර කරණ ලද්දකැයි සිතීම යුතුනොවේ. ඒ ව්‍යවහාරයන් අනුව ව්‍යවහාර කරණ ලද්දකැයි සැලකිය යුතුවේ.

**මාගධී.**

මේ වනාහි පාලිභාෂාවට ව්‍යවහෘත භෞගොලික නාමයයි මේය 'තන්ති' 'පාලි' යන නාමයන්ට පැරණිවේ. **මගධ** දෙශයෙහි භාෂාව හෙයින් මීට 'මාගධී' යයි නම් කරණ ලද්දේය. "සො ච භගවා මාගධො මගධෙ භවත්තා, සා ච භාසා මාගධා, මාගධස්ස තථා-ගතස්සා'යං භාසා ති ච කත්වා සම්පවෙචන්ති" (ඒ භාග්‍යවතුන් වහන්සේද මගධයෙහි උපන් හෙයින් මාගධය, ඒ භාෂාව තථාගතයන් වහන්සේගේ භාෂාව වී නුයි 'මාගධා' නම් වූවාය)යි ඇතැම්හු සලකති. යම් කිසි පුද්ගලකෙනෙකුගේ නමකින් භාෂාවකට නමක් ඇතිවීම සිදු නොවන්නකි. භාෂාවලට නම් ලැබෙන්නේ දෙශනාමයෙනි. දැනට ප්‍රචලිත භාෂාවන්ට නම් ලැබී තිබෙන ආකාරය සලකා බලන විට මෙය පැහැදිලි වෙයි. එබැවින් මේ භාෂාතොමෝ මගධ දෙශයෙහි භාෂාව වූ හෙයින් 'මාගධි' නම් වූවායයි සැලකිය යුතු වේ.

**මාගධී නිරුක්ති.**

ඇතැම් විට මෙය "මාගධී නිරුක්ති" නාමයෙන් ද ව්‍යවහාර කර තිබෙන බැව් පෙණේ. "**නිරුත්තියා මාගධිකාය** වුඩියා කරොමි දීපන්තරවාසිනං අපි"[1] යනාදි උදාහරණයන්ගෙන් ඒ බැව් පෙණේ. ප්‍රාකෘතව්‍යාකරණයන්හි හා සංස්කෘත දෘශ්‍යකාව්‍යයන්හි ද මාගධි නාමයෙන් ප්‍රසිද්ධ ප්‍රාකෘත විශෙෂයක් වෙයි. එහෙත් මේ පාලිභාෂාව ඒ ප්‍රාකෘතය නොවේ. මේ භාෂා දෙක එකිනෙකට බොහෝ සෙයින් වෙනස්ය. පාලිභාෂාවේ මුල් භාෂාව වූ මාගධිය 'බෞද්ධ මාගධි' නාමයෙන්ද ඉතරය 'ප්‍රාකෘත මාගධී' නාමයෙන්ද හඳුන්වනු ලැබේ. මේ උභය-මාගධීන්ගේ භෙදය මඳක් තේරුම් ගැණීම සඳහා ඒ භාෂාවන්ගෙන් විරචිත පද්‍යවයයක් මෙහි දක්වමු:—

ප්‍රාකෘත මාගධි.

ලහශවශන මිල ශුලශිල - විඅලිද මන්‍දලලායිදං හියුගෙ,
විලයිණෙ පකබාලදු - මම ශයල මවයා යම්බාලං.

1. සාසනවංස. 2. සුමඞ්ගලවිලාසිනී. 3. අත්ථසාලිනී. 4. කථාවත්ථු අට්ඨ කථා 5. පපඤ්චසූදනී. 1. දාඨාවංස.

මෙය බෞද්ධමාගධියෙහි මෙසේයි:—

රහස වසනසම සුර සිර-විගලිත මන්දාර රාජිතඞ්ඝියුගො
වීරජිනො පක්ඛාලෙතු-මම සකලමවජ්ජ ජම්බාලං.

‘අර්ධමාගධී’ නාමයෙන් ව්‍යවහෘත තවත් මාගධී විශෙෂයක් වෙයි. එය බෞද්ධමාගධිය හා සම්බන්ධය ඇත්තක් නොවේ. අර්ධ මාගධී නාමයෙන් ඒ භාෂාවේ වචනයන්ගේ අඩක් පමණක් මාගධී බව අඟවනු ලැබේ. ඒ අර්ධය නම් ප්‍රාකෘත මාගධියයි. අපරාර්ධය මහාරාෂ්ට්‍රිය යයි. සෞරසෙනී භාෂාවට බෙහෙවින් සමීප හෙයින් මීට ‘අර්ධමාගධී’ යයි කියනු ලැබෙයි යනු සමහරුන්ගේ මතයයි.[2] සංස්කෘත දෘශ්‍යකාව්‍යයන්හි ව්‍යවහෘතවූයේ ප්‍රාකෘත මාගධිය හා අර්ධ මාගධියයි. ඉහත දක්වූ පද්‍යය අර්ධමාගධියෙයි මෙසේයි:-

ලහශ වශන මිල ශිල-විදලිද මන්දාල ලාජිදං හියුගෙ,
වීලජිණෙ පක්ඛාලදු-මම ශයල මවජ්ජ ජම්බාලං.

**මූලාභාසා**

මූලාභාසා යනුද පාලිභාසාවට නමෙකි. බෞද්ධමාගධී නාමයෙන් ඉහත සඳහන් කළ ප්‍රාකෘතය අප තථාගතයන් වහන්සේගේ භාෂාවයි. එවකට එරට වැස්සන් කථා කරණ ලද්දේ ‘බෞද්ධමාගධී’ යයි නම් ලත් මේ ප්‍රාකෘතයෙහි

**අශුද්ධ මාගධී.**

රට වැස්සන්ගේ කථ්‍යභාෂාව හෙයින් ඕ රීත්‍යනුකූල නොවූවාය, එහෙයින්ම අශුද්ධ වූවාය. තථාගතයන් වහන්සේ සම්‍යක්සම්බොධියට පැමිණි ඉක්බිති ඒ අශුද්ධ මාගධිය ශුද්ධකොට ඉන් ධර්මදෙශනා කළසේක. ඒ බැව් “අනුජානාමි භික්ඛවෙ සකාය නිරුත්තියා බුද්ධ වචනං පරියාපුණිතුං[1]” (මහණෙනි! ස්වකීය භාෂාවෙන් බුද්ධවචනය ඉගෙණ ගන්නට අනුදනිමි.) යන්නෙන් පැහැදිලි වේ. මෙහි ස්වකීය නිරුක්තිය නම් ශුද්ධමාගධියයි. මෙවක් පටන් පෙර පැවැති කථ්‍ය භාෂාව ‘අශුද්ධමාගධී’ නාමයෙන්ද ධර්මදෙශනාකර වදාළ භාෂාව ‘ශුද්ධමාගධී’ නාමයෙන් ද ව්‍යවහාර ප්‍රාප්ත වූවාය. මේ බෞද්ධමාගධී ප්‍රාකෘතය ආදිම ප්‍රාකෘතයයි හෙවත් සියලුම ප්‍රාකෘත විශෙෂයන්ගේ ආදියයි. මෙය සියලුම භාෂාතත්ත්වඥයන් විසින් පිළිගත් කරුණකි. එබැවින් එය ස්ඵුට කිරීමට කරුණු පෙන්වීම අනවශ්‍යයි. මේ හෙයින්ම ඒ බෞද්ධ මාගධී තොමෝ ‘මූලභාෂා’ යයි නම් කරණ ලද්දීය. කල් යත් යත් ශුද්ධමාගධී සඞ්ඛ්‍යාත පාලිභාෂාව බහුල ප්‍රචාරයට පැමිණි හෙයින් ඕ තොමෝ ම ‘මූලාභාසා’ නාමයෙන් හැඳිනිත. ආදි කල්පික මිනිසුන් ද බ්‍රහ්මයන් ද අන්බසක් නො ඇසූවිරූ ලදරුවන් ද මේ මූලභාෂා සඞ්ඛ්‍යාත ආදිම ප්‍රාකෘතයෙන් කථා කරණ බැව් සම්මතය. මේ සම්මතයට විරුද්ධවීමට භාෂාතත්ත්වවෙදීන්ට අවකාශයක් නොමැතියි. අන්බසක් නො ඇසූවිරූ ලදරුවෙකු යමක් කථාකරතොත් එය ප්‍රකෘතිහුගේ අනුභාවවිශෙෂයෙන් සිදුවන්නකි.

ප්‍රාකෘත යන්නෙහි තේරුම ප්‍රාකෘතඥයෝ මෙසේ දක්වත්:—

1. “ප්‍රාකෘත්‍යා ස්වභාවෙන සිද්ධමිති ප්‍රකෘතම්.”
(=ප්‍රකෘතියෙන් හෙවත් ස්වභාවයෙන් සිද්ධනුයි ප්‍රාකෘත නම්.)
2. “ප්‍රකෘතජනානාං භාෂා ප්‍රාකෘතම්” (ප්‍රකෘත ජනයන්ගේ හෙවත් අන් බසක් නොඇසූවන්ගේ භාෂාව ප්‍රාකෘත නම්.)
3. “ප්‍රකෘෂටඃ අකෘතඃ අකාර්යෙෂු යස්මින් තත් ප්‍රාකෘතම්.”
(නොකරණලද කාර්ය්‍ය ඇත්ත හෙවත් ස්වභාවයෙන් ඇතිවූව ප්‍රාකෘත නම්.)

ප්‍රාකෘත යනු ස්වභාවයෙන් සිද්ධවන්නක් බවද, අන් බසක් නොඇසූ විරූ ප්‍රකෘත මනුෂ්‍යයන්ගේ භාෂාව බවද, යමෙකු විසින් ඇති කරණ ලද්දක් නොවන බවද මේ විග්‍රහයන්ගෙන් ස්ඵුට වේ. එබැවින් ආදිකල්පිකයන් විසිනුත් අන්බසක් නො ඇසූ විරූ ලදරුවන් විසිනුත් කථාකරණ භාෂාව ප්‍රාකෘතය යනු සිද්ධාන්තය. බෞද්ධමාගධිය ඒ ප්‍රාකෘතයන්ගේ ආදිය හෙවත් මූල[illegible] නම් ඊට ‘මූලභාෂා’ යයි නම් කිරීම ගැණ මැතක සිට අපරට ඇතමුන්ගේ විරෝධයක්

1. “සෞරසෙන්‍යා අවිදූරත්වාදේ ඉයම් (මාගධී) අර්ධමාගධීති භරතඃ” 2. චූලවග්ග-ඛුද්දකවත්ථුක්ඛන්ධක.

දක්නා ලැබේ. එය අවිචාරයෙන් ඇතිවූවක් සේ හැඟේ. ලක්දිව විසූ සියලුම පැරණි පඬිවරයන් විසින්ද; කච්චායන ව්‍යාකරණය ඉංග්‍රීසියට නැගුවාවූද දඹදිව කලිකාතා විශ්ව-විද්‍යාලයේ පාලිභාෂාව පිළිබඳ කොටසේ ප්‍රාධාන්‍යය ඉසුලූවාවූද මහා මහොපාධ්‍යාය **සතීශචන්ද්‍ර විද්‍යාභූෂණ** (ඇම්. ඒ., පී. එච්. ඩී.) මහතා, වඞ්ග භාෂාවෙන් අගනා පාලිව්‍යාකරණයක් ලියූ බෝල්පුර්හි ශාන්ති නිකේතන විශ්වවිද්‍යාලයාධිපති **ශ්‍රී විධුශෙඛර භට්ටාචාර්‍ය්‍ය** ශාස්ත්‍රී මහතා, වරරුචිහුගේ ප්‍රාකෘතප්‍රකාශයට වඞ්ගභාෂාවෙන් විස්තර වර්‍ණනාවක් ලියූ **වසන්තකුමාර චට්ටොපාධ්‍යාය** (ඇම්. ඒ.) මහතා යන ආදී දඹදිව උසස් පඬිවරයන් විසින්ද; රයිස් ඩේවිඩ්ස්, විල්ඩර්ස් ආදී ප්‍රසිද්ධ යුරෝපීය පඬිවරයන් විසින්ද පාලිභාෂාව මූලභාෂාව බැව් අවිවාදයෙන් පිළිගන්නාලදී. එබැවින් ලඞ්කාවේ ඇතැම් පඬිවරයන් අතර පවත්නා ඒ විරොධය සැලකිය යුත්තක් නොවේ.

**ගාථාභාෂා.**

පාලිභාෂාව ගාථාභාෂාවෙන් ඇතිවූවකැයි ද ඇතැම් පඬිවරයෝ කියත්. එයද පිළිගත යුක්තක් නොවේ, ආදියෙහි බෞද්ධයන්ගේ ධර්‍මය පාලිභාෂාවෙන්ද, ජෛනයන්ගේ ධර්‍මය ප්‍රාකෘතයෙන්ද, බ්‍රාහ්මණයන්ගේ ධර්‍මය සංස්කෘතයෙන්ද ව්‍යවහෘත විය. ගාථාභාෂා නාමයෙන් පවත්නේ මේ සම්ප්‍රදායයන් මිශ්‍රවීමේදී පාලි-සංස්කෘත-ප්‍රාකෘත යන ත්‍රිභාෂාවන්ගේ සංකලනයෙන් ඇතිවූ අපභ්‍රංශ ප්‍රාකෘතයෙන් නිපන් අර්‍වාචීන භාෂාවකි. ඒ භාෂාවේ තත්ත්වය තේරුම් ගැණීම සඳහා එයින්ද පද්‍යප්‍රබන්ධයක් මෙහි දක්වමු:-

"අධ්‍රැවං ත්‍රිභවං ශරදභ්‍රනිභං
නටරඞ්ග සමාජගි ජන්මි ච්‍යුති
ගිරිනද්‍යසමං ලඝුශීඝ්‍රජවං
ව්‍රජතායු ජගෙ යථ විද්‍යු නභෙ.

උදක චන්ද්‍රසමා ඉමි කාම ගුණාඃ
ප්‍රතිබිම්බ ඉවා ගිරිඝොෂ යථා
ප්‍රතිභාස සමා නට රඞ්ගසමා-
ස්තථ ස්වප්නසමා විදිතාර්‍ය්‍ය ජනෛඃ.

(ලලිතවිස්තර)

ඒ භාෂාව පාලිභාෂාවට බොහෝ මෑත කලකදී ඇතිවූවක් බව විධුශෙඛර ශාස්ත්‍රී මහතා කරුණු සහිතව පෙන්වයි. එය අපිදු එසේම පිළිගණුම්හ. පාලිභාෂාව මේ භාෂාවෙන් ඇතිවූවක් නොවන බව මේ ඉහත සඳහන් කළ පද්‍යය නැරඹීම පමණින් මත් පාලිභාෂාභිඥයන්ට අවබොධ කරගත හැක. එබැවින් ඒ ගැණ වැඩියක් කරුණු පෙන්වීමට අපි නොවෙහෙසෙමු.

මෙහි අපි භාෂාවේ නිෂ්පත්තිය පිළිබඳ කරුණු ස්වල්පයක් දැක්වීමු. මේ භාෂාව පිළිබඳව ලියයුතු දේ තවත් බොහෝයි. ඒ සියල්ල එක වරක දී අපේ පාඨකයන් හමුවෙහි තැබීම දුෂ්කරය. මේ අකාරාදියේ කලාපයක් පාසා කොටස් වශයෙන් ඒ සියල්ල පළකරවන්නට බලාපොරොත්තු වන්නෙමු. මෙහි සඳහන් කරුණු සම්පාදනය කර ගැන්මේදී **සතීශචන්ද්‍ර විද්‍යාභූෂණ** (ඇම්. ඒ., පී. එච්. ඩී) මහතාගේ පාලි ව්‍යාකරණ සංඥපනයද, **ශ්‍රී විධුශෙඛර භට්ටාචාර්‍ය්‍ය** මහතාගේ පාලිප්‍රකාශ ප්‍රවෙශයද, **වසන්තකුමාර චට්ටොපාධ්‍යාය** (ඇම්. ඒ) මහතාගේ ප්‍රාකෘතප්‍රකාශ උපක්‍රමණිකාවද **රයිස් ඩේවිඩ්ස්** මහතාගේ පාලි-ඉංග්‍රීසි අකාරාදියේ සංඥපනය හා **විල්ඩර්ස්** මහතාගේ පාලි-ඉංග්‍රීසි අකාරාදියේ සංඥපනයද **ඊශාන් චන්ද්‍රඝොෂ්** මහතාගේ වඞ්ග ජාතකපොත් වහන්සේගේ සංඥපනයද බෙහෙවින් උපකාරී වූ බව තත්කර්‍තෘවරයන් කෙරෙහි ප්‍රශංසාපුරඃසරව සඳහන් කරම්හ.

**බෝරුග්ගමුවෙ රෙවත ස්ථවිර.**

2474 / 1931 ජනවාරි 1.

# සඞ්කෙතනිරූපණය.

අ = අව්‍යය සද්ද.
පු = පුල්ලිඞ්ගික.
ඉ = ඉත්ථි ලිඞ්ගික.
න = නපුංසක ලිඞ්ගික.
එ = එකක නිපාත.
දු = දුකනිපාත.
ත = තතිය.
නි = නිපාත.
ප = පණ්ණාසක.
දී, නි = දීඝ නිකාය.
ති = තිලිඞ්ගික.
— = ආදෙස.
+ = එකතු කිරීම.
= = සමාන.
, = එම අත්ථ
. = අන්‍යාත්ථ.
ක්‍රි = ක්‍රියා.
වි = විභාවිනී.
ම. පූ = මනොරථ පූරණී.

සු. වි = සුමඞ්ගලවිලාසිනී.
ව = වණ්ණනා.
පු. ක්‍රි = පුබ්බ ක්‍රියා.
d = ධාතු.
භූ = භූවාදිගණය.
රු = රුධාදි ,,
දි = දිවාදි ,,
සු = සවාදි ,,
කි = කියාදි ,,
ත = තනාදි ,,
චු = චුරාදි ,,
අ = එනම් විකරණය.
අං = ,,
ය = ,,
ණු ණා, යිර = ,,
ණා = ,,
ඔ, උණා = ,,
ණෙ, ණය = ,,
ත්‍රි. මූ = ත්‍රිපිටක මුද්‍රණය.

# පාලි-සිංහල ශබ්දකෝෂය

**සම්මා සම්බුද්ධ මතුලං — වන්දිත්වා මුනිපුඞ්ගවං**
**සද්දකොසං ලිඛිස්සා'හං — පාලි සීහල සංයුතං.**

## අ

**අ** – වර්ණමාලාවේ ආදි අකුරයි. අටවැදෑරුම් ස්වර අතුරෙන් ප්‍රථම ස්වරයයි. කණ්ඨජයි. ඒකස්ථානජයි, විවෘත සංවෘත කියා දෙ ආකාරයි. ප්‍රකෘති – ආදෙස – ආගම – විකරණ – ප්‍රත්‍යය – ශබ්දාන්ත කියා අකාරය ස වැදෑරුම්ය. ප්‍රතිෂෙධ, වෘද්ධි, තද්භාව, සමාන, විරුද්ධ, නින්දා, ශූන්‍ය, වියොග, අල්ප, තද්භාවාදියෙහි පවත්නා අව්‍යය. න නිපාත යට වන ආදෙශය.

**අං.** පු-විෂ්ණු. අකාරස්වරය.

**අංස.** d චු සංඝාතෙ, රැස්වීමෙහි. අංසෙති, රැස්වෙයි. අංසයති, අංසෙසා, අංසා, අංසාති, අරිසරොගො.

**අංස** පු. න-අංශය, කොටස. කොණ දසරුව, උරහිස.

**අංසකූට.** න-දසරුව.

**අංසබන්ධන.** න-එක් අංශයක් බඳනා පටිය. උරයක් පලා වැළඳ පරිහරණය කරණ පසුම්බිය, අංසකඩය.

**අංසවට්ටක.** න අංසකඩය, ශරීරයෙහි එක් පැත්තක් වසන වස්ත්‍රය. උරයක් පලා වැළඳ පරිහරණය කරණ පසුම්බිය. අස් වැටිය.

**අංසවද්ධක.** න අංසයෙහි බඳින පටිය, පාත්‍ර පසුම්බිය එල්ලා ගණු පිණිස අංශයෙහි බඳිනා පටිය. "අනුජානාමි භික්ඛවෙ අංස වද්ධකං බන්ධන සුත්තං"

**අංසි.** න-කොණ. ගැටිය. මූවාත.

**අංසු.** පු. න-රශ්මිය. නූල.

**අංසුක.** න-වස්ත්‍රය, රෙද්ද.

**අංසුමතී.** ඉ අස්වැන්න.

**අංසුපති**
**අංසුමාලී** } පු-සූර්‍ය්‍යයා.

**අක්ක** d චු-ස්තුතියෙහි. අක්කෙති, අක්කායති. ස්තුති කරයි.

**අක්ක.** පු සූර්‍ය්‍යයා. වරාගස.

**අක්කන්ත.** ති-(ආ + කමු + ත) ආක්‍රමණය කළ, පාගනලද, යටත්කළ.

**අක්කමණ.** න-(ආ + කමු + යු=අන) ආක්‍රමණය, පෑගීම. ලඟාවීම.

**අක්කවාට.** න-දෙරක් වෙනුවට වලඳිනා පැලැල්ල, පැලැලි දොර.

**අක්කුට්ඨ.** ති-(ආ + කුස + ත=ට්ඨ) ආක්‍රොශ කරණලද, නින්දා කරණලද, පරිභව කරණ ලද.

**අක්කුද්ධ**. ති-(න + කුද්ධ)-නොකිපුනු.

**අක්කුල**. ති-ආකුල, අවුල් වූ. පටලැවුනු.

**අක්කොධ**. පු. (න + කොධ) ක්‍රොධයට ප්‍රතිපක්‍ෂධර්මය, මෛත්‍රිය. න-කොධ නොකිරීම.

**අක්කොධ**. ති-(නත්‍ථි කොධො යස්‍ස සො) ක්‍රොධ නැති, නොකිපෙන.

**අක්කොස** පු-(ආ + කුස + භාවෙ-ණ) ආක්‍රොශය, අපහාස්‍යය, නින්‍දාව.

**අක්කොසක.** ති-(ආ + කුස + ණවු = අක) ආක්‍රොශ කරණ, නින්‍දා කරණ.

**අක්කොසක භාරද්වාජ**. පු - මේ නම ඇති බමුණා බුදුරජාණන් වහන්සේට නින්‍දා පරිභව කළ හෙයින් 'අක්කොසක භාරද්වාජ නම් විය. "අක්කොසං වධ බන්‍ධං ච අදුට්ඨො යො තිතික්ඛති - ඛන්ති බලං බලානීකං තමහං බ්‍රෑමි බ්‍රාහමණං"

**අක්කොසන**. න (ආ + කුස + භාවෙ-යු=අන) ආක්‍රොශ කිරීම, පරිභව බිණීම.

**අක්කොසවත්‍ථු.** න-ඔට්ඨොසි, ගද්‍රභොසි (=ඔටුවෙක් වෙහි ය, කොටළුවෙක් වෙහි ය) යන මේ ආදි වශයෙන් ආක්‍රොශ පිණිස ව්‍යවහාර කරණ දශවිධ කරුණු. "දසවිධ අක්කොසවත්‍ථු" බලනු.

**අක්ඛ** d ව්‍යත්ති සඞ්ඛාතෙසු (භූ) ව්‍යත්ති සංඛ්‍යාත අර්‍ථයෙහි, අක්ඛති.

**අක්ඛ**. පු-රථයෙහි රෝදදෙක එකාබද්ධකරණ යකඩය, අලවංගුව විසිවියටක බර. හුණිඳු පසෙක බර පසඇට. බුළුගස. සුවස ලූණු. පත්දුකෙළිය. න-චක්‍ෂුරාදි ඉන්‍ද්‍රිය.

**අක්ඛක** පු-ගලග ඇටය, කණ්ඨයේ (බෙල්ලේ) කෙළවර පිහිටි ඇටය, ගලසර ඇටය. පසඇටින් කරණ ක්‍රීඩාව සුදුකෙළිය

**අක්ඛඛන්ති**. පු-නො ඉවසීම.

**අක්ඛකලා** ඉ-අක්‍ෂක්‍රීඩාව (=දුදුකෙළිය).

**අක්ඛගණ්ඩිල** පු රිය අකුර අග ගසන ඇණය, කඩඇණය, රථරෝද සවිවීමට අලවඩ්ගු කෙළවර ගසන ඇණය.

**අක්ඛණ.** පු-නුසුදුසු කාලය.

**අක්ඛණා.** ඉ විදුලිය, අකුණ, විදුලියක් පවත්නා කාලය. අභාග්‍යය.

**අක්ඛණවෙධී,** පු-විදුලි එළියෙන් විදිනසුලු තැනැත්තා, විදුලි එළිය පහවන්නට ප්‍රථම එම එළියෙන් ඉලක්කාදිය විදීමට සමර්‍ථයා.

**අක්ඛත**. ති-(න + ඛත) උපද්‍රවරහිත. නොසාරණලද. ක්‍ෂය නොකළ. තුවාල නොවූ. නිදොස්. පු-විලඳ. න-නිවණ. නොගෙවීම.

**අක්ඛදස්ස**. පු-ධර්‍මාධිකරණ ඇමතියා, විනිශ්චය කාරයා, දුදුකෙළියෙහි වියවුල් බේරා දෙන තැනැත්තා, තෝත්කාරයා.

**අක්ඛදෙවී** පු-දූකෙළින තැනැත්තා, සුදු කාරයා.

**අක්ඛධුත්ත**. පු අක්‍ෂධූර්තයා, දුදුකෙළියෙහි ලොල් වූ තැනැත්තා.

**අක්ඛම**. ති-(නත්‍ථි ඛමා යස්‍ස) නොඉවසන, ඉවසීම් නැති. අසමර්‍ථ. පු විකුරුල්ලා. ඉ (න + ඛමා) නොඉවසීම, ක්‍ෂමා නොකිරීම.

**අක්ඛය**. ති-(න + ඛය) ක්‍ෂය නොවන. නොදිරණ. න-නිවණ.

**අක්ඛර** පු-(න + ඛර.) නක්ඛරතීති අක්ඛරා-නොගෙවීම. පු න-අ ආදි අක්‍ෂර. නිවණ. ති-ස්ථිර, ක්‍ෂය නොවනදෙය. ප්‍රඥප්තිය, ව්‍යවහාරය.

**අක්ඛරචඤ්චු**. පු-අකුරුලියන තෙලිකූර, පන්හිඳ, පෑන් පැන්සල් ආදිය.

**අක්ඛරකොසල්ල.** න-ස්ථාන කරණ ප්‍රයත්නාදියෙන් ද සිථිල ධනිතාදි දසවිධ ව්‍යඤ්ජනයන් නොපිරිහෙලා කීම් වශයෙන් ද අක්‍ෂරයන්හි දක්‍ෂ බව අක්‍ෂර කෞශල්‍ය නම්.

**අක්ඛර විපත්ති**. පු-සිථිල ධනිතාදි දශ විධ ව්‍යඤ්ජනයෙන් අසම්පූර්ණ බව.

**අක්ඛර විපල්ලාස.** පු-අක්‍ෂර විපර්‍යාසය, එක් අකුරක් පෙරලා තව අකුරක් යෙදීම.

**අක්ඛර රචනා** පු-ලිවීම. අක්‍ෂර වින්‍යාසය. අකුරු රචනා කිරීම, අකුරු ඇමිණීම.

**අක්ඛරචින්තක**. පු-වෛයාකරණයා, වියරණ දත් තැනැත්තා. අකුරු ගැන සිතන්නා.

**අක්ඛර සන්නිපාත.** පු-අක්‍ෂර සන්නිපාතය, අකාර කකාරාදී අක්‍ෂරයන්ගේ එක් රැස් වීම.

**අක්ඛරාවයව**. පු-අක්‍ෂරයන්ගේ අවයවය, එකාදිමාත්‍රාවයව.

**අක්ඛරික** පු-අහසෙහි හෝ පිටෙහි අකුරු ලියවෙන සේ ක්‍රීඩා කරන්නා.

**අක්ඛරිකා.** ඉ-අහසෙහි හෝ පිටෙහි අකුරු ලියවෙන පරිදි කරණ ක්‍රීඩාවක්.

**අක්ඛවාට.** න-ක්‍රීඩාභූමිය අවට කරණ ආරක්‍ෂාව, වැට

**අක්ඛාත** ති-(ආ+ඛා+ත) ප්‍රකාශකළ, කියන ලද

**අක්ඛාතු** පු-කියන්නා, ප්‍රකාශකරන්නා, දෙසන්නා

**අක්ඛාන.** න-(ආ+ඛා+යු=අන) කීම, ප්‍රකාශය, කථාව, කථා කිරීම.

**අක්ඛායික.** ති ප්‍රකාශකරණ, කියන. 'ලොකක්ඛායික' බලනු.

**අක්ඛායී** ති-(ආ+ඛා+ණී) කියන, ප්‍රකාශ කරණ, කථා කරණ.

**අක්ඛාහත.** ති (අක්ඛ+ආ+හන+ත) අකු-රෙහි ප්‍රවෙශ කළ, අලවඞ්ගුවෙහි ගසනලද "යං පන තං චක්කං ඡහි මාසෙහි නිට්ඨිතං ඡාරත්තූනෙහි තං පවට්ටෙසි. තං පවිට්ටිතං සමානං යාවතිකා අභිසඞ්ඛාරස්ස ගති, තාවතකං ගනත්වා **අක්ඛාහතං** මඤ්ඤෙ අට්ඨාසි"

**අක්ඛි.** න නයනය, නෙත්‍රය, ඇස.

**අක්ඛිඅඤ්ජන.** න-ඇසගානා අඳුන්, නෙත්‍රාඤ්ජනය, ඇසඳුන.

**අක්ඛික.** ති-ඇස් ඇති. දූල් ඇසි (=ජාලාක්‍ෂි.)

**අක්ඛිකූප.** පු අක්‍ෂිකූපය, ඇස්ගෙඩි පිහිටි වළ, (ඇස්වළ.)

**අක්ඛිගණ්ඩ.** පු-ඇස්ගුලිය, ඇස්ගෙඩිය. ඇස.

**අක්ඛිගූථ.** පු-ඇස්කබ. (ඇසෙන් පිට වන මල.)

**අක්ඛිච්ඡිද්ද.** න-අක්‍ෂිකූපය, (ඇස්වළ.)

**අක්ඛිත්ත.** ති-(න=අ+ඛිප+ත) හෙළා නො දක්නා ලද, නොපිරිහෙළනලද. "**අක්ඛිත්තො** අනුපක්කුට්ඨො ජාතිවාදෙන" වීසි නො කරණලද, ඉවත නොදැමූ.

**අක්ඛිදල.** න-ඇසිපිය, ඇස්පිහාටු.

**අක්ඛිපාත.** පු-ඇස් හෙළීම, නිරීක්ෂණය, බැලීම.

**අක්ඛිපුත්තලිකා,** ඉ-ඉඟිරියාව, ඇගේ බබා.

**අක්ඛිමණ්ඩ.** පු=ඇගේ මැද, පිහිනිය, කලු ඉඟිරියාව.

**අක්ඛිමල.** න-කබ, අක්ඛිගූථය.

**අක්ඛිරොග** පු නෙත්‍රරෝග, ඇස්ලෙඩ.

**අක්ඛීව.** පු මුහුදුලුණු, සහිඳලුණු, මුරුංගා ගස. ලුණුමිදෙල්ලගස

**අක්ඛුණ්ඩ** - දූවකඩ දෙක, ගැල්බා දෙකෙහි අලවංගුව සවිකරණ ඇණ

**අක්ඛු** d භූ ව්‍යාපතියෙහි, රැස්කිරීමෙහි. අක්ඛති, ව්‍යාපත කෙරෙයි, රැස් කෙරෙයි.

**අක්ඛොභ.** පු (න+ඛොභ) කම්පා නොවීම, නොකැලඹීම, චඤ්චල නොවීම.

**අක්ඛොභන.** ති කම්පාරහිත, චඤ්චල නොවන න-නොකැලඹීම.

**අක්ඛොභී** ති නොකැලඹෙන. නොකැලඹෙන සුළු.

**අක්ඛොභිණී.** ඉ අක්‍ෂෞහිණිය. 21870 ඇත් සේනාවද, 21870 රියසේනාවද 65610 අස් සේනාවද, 109350 පාබලසේනාවද ඇති යුධ හමුදාව.

"සට්ඨිවංසකලාපෙසු පච්චෙකං සණ්ඩදණ්ඩිසු ධූලීකතෙසු සෙනාය ගනතියාකෙඛා හිණීතියං"

එක එක මිටියෙහි හුණ්දඹු සැට සැට ඇති සැට මිටියක්, යන්නාවූ සේනාව විසින් දූලි කළ කල්හි, එපමණ සේනාව, අක්ඛොභිණී යයි කියති.

1000000000000000000000000000000000000 0000000

**අක** d භූ-කුටිල ගමනෙහි, වක්ව යාමෙහි. අකති, වක්ව යෙයි.

**අකක්කස.** ති-කර්කශ නොවන, රළු නොවන, මෘදු.

**අකච්ච.** ති-කථාවට නුසුදුසු, කථාවට අයොග්‍ය.

**අකට** / **අකත** } ති-(න+කට) නොකළ, අභිනව, "අකටවිසමුට්ඨානං" (88)

**අකටභාග**. න-ආගන්තුක කොටස, අනුමෝදනා බණ සඳහා දෙනලද පිරිකර, නුදුන් පූර්වභාගය.

**අකට්ඨපාක**. ති-(න + කට්ඨපාක) කෘෂිකර්මාන්ත නො කළ භූමිප්‍රදේශයෙහි පැසෙන. පු-දර නැතුව පැසීම.

**අකණ්ටක**. ති- (න + කණ්ටක) කටුරහිත. රාජද්‍රෝහීන් රහිත, කුමන්ත්‍රණකාරයන් රහිත.

**අකඨින**. න-කඨිනය නොවූ, කඨින සිවුර නොවන.

**අකණ**. ති-(න + කණ) කුඩුරහිත, කුඩුනැති. "අකණං අථුසං සුද්ධං සුගන්ධං තණ්ඩුලප්ඵලං"

**අකත**. ති-නොකළ. ස්වාභාවික. න-නිබ්බාණ

**අකත්තු**- පු-නොකරන්නා, කර්තෘ නොවන්නා.

**අකණ්හ** ති-(න + කණ්හ) කලු නොවූ. පාපයක් නොවන. නොකිලිටි.

**අකතඤ්ඤු**. ති-(න + කතඤ්ඤු) කළගුණ නොදන්නා, කළ උපකාර නොසලකන.

අකතඤ්ඤුස්ස පොසස්ස
නිච්චං විවර දස්සිනො-
සබ්බං මෙ පඨවිං දජ්ජා
නෙව නං අභිරාධයෙ.

**අකතවේදී**. ති-(න + කතවේදී) කළ උපකාරය ප්‍රකටකොට නොදන්නා සුළු, කළගුණ නොදන්නා.

**අකථංකථී**. පු-(න + කථංකථී) කොසේද යන සැකනැත්තා.

**අකථිත**. ති-කර්මාදි ෂට්කාරක සංඥාවන් විසින් අසවල් කාරකයයි නොකියන ලද.

**අකන්තික**. ති-(න + කන්තික) කැමති නොවන, රිසි නොකරණ.

**අකනිට්ඨ**. පු-බුදුරජ. ති-බාල නොවන, ශ්‍රේෂ්ඨ.

**අකනිට්ඨ** (ක) පු-එනම් බ්‍රහ්මලෝකය, අකනිටාබඹලොව.

**අකප්පිය**. ති (+ න + කප්පිය) කැප නැති, අයුතු, නුසුදුසු, කප්පන්තීති කප්පියො, න කප්පියො, අකප්පියො, ශ්‍රමණ පරිභෝගයට නුසුදුස්ස අකැප ය. ඒවා එක්විස්සෙකි.

"දාරුං වෙළුං ඵලං පුප්ඵං චුණ්ණං නහාන මුඛොදකං - මත්තිකා දන්ත කට්ඨංච තදදෙකුල සංගහං."

**අකම්මක**. ති- කර්මයක් නැති, භූ, ඨා, ආදිවූ ධාතුන්ට කර්මයන් නැත,

**අකප්පකත**. ති- කප්බින්දු නො තබනලද, එසේ නො කළ සිවුර,

**අකප්ප**. ති-(න + කප්ප) නොකැප, කැප නැති, අයුතු.

**අකප්පිත**. ති (න + කප්පිත) නොකපනලද නොසරසනලද, පිළියෙල නොකළ.

**අකප්පිය**. ති-(න + කප්පිය) කැප නැති. අයුතු, නුසුදුසු.

**අකම්ප**. ති-(න + කම්ප) කම්පිත නොවන, අචල, නිශ්චල.

**අකම්පිය**. ති-(න + කම්පිත) කම්පිත නොවන, සොලවන්ට නොහැකි.

**අකම්පියත්ත**. න-(න + කම්පියත්ත) නොසැලෙන බව, නිශ්චල බව.

**අකම්ම**. න-(න + කම්ම) අක්‍රියාව, කටයුතු නොකිරීම, ක්‍රියා නොකිරීම.

**අකම්මඤ්ඤ**. ති-(න + කම්මඤ්ඤ) අකර්මණ්‍ය, කර්මයට නුසුදුසු, ක්‍රියාවට අයෝග්‍ය.

**අකම්මඤ්ඤතා**. ඉ-(න + කම්මඤ්ඤතා අකර්මණ්‍යභාවය, කර්මයට නුසුදුසු බව.

**අකම්මණීය**. ති-(න + කම්මණීය) අකර්මණ්‍ය, කර්මයට නුසුදුසු, ක්‍රියාවට අයෝග්‍ය, කර්මානුරූප නොවන.

**අකම්මාස**. ති- අතරතුර කැලල් නැති, සිල් නො බිඳුනු,

**අකරණ**. න-(න + කරණ) නොකිරීම. නො ඉපදවීම.

**අකරණීය**. ති-නොකටයුතු, සිදු නොකට යුතු.

**අකල්ල**. න-(න + කල්ල) රෝගය. ති-නුසුදුසු. අදක්ෂ. අනිපුණ.

**අකල්‍ය**. ති-(න + කල්‍ය) රෝගීබව, සුව නැති බව. නුසුදුසු බව. අදක්ෂබව. අනිපුණබව.

**අකළු**. න-අගිල්, අඤ්ජනම. (122)

**අකසිර**. ති-(නි + කසිර) හිරිහැර රහිත, නිදුක්, පීඩා නැති. අනායාසයෙන්,

**අකසිරලාභ**. පු-(න + කසිරලාභ) නිදුකින් ලැබීම, හිරිහැර රහිතව ලැබීම, සුවසේ ලැබීම, කැමතිපරිදි ලැබීම.

**අකාච**. ති-(න + කාච) නිර්මල, පිරිසිදු, මලරහිත.

**අකාචි** ති-(න + කාචි) නිදෙස්, කැලැල් නැති.

**අකාපුරිස**. පු-(න + කාපුරිස) නින්දිතපුරුෂ නොවන්නා, උත්තම පුරුෂයා.

**අකාම**. ති-(න + කාම) කැමති නොවන, රුචිනොවන, නොරිසි, න-නොකැමැති බව.

**අකාර**. ති-(න + කාර) නොකරණ, ක්‍රියා නොකරණ.

**අකාර** පු-අකාරය, (අ යන ස්වරාක්ෂරය.) (අ එව අකාරො)

**අකාරක**. ති-(න + කාරක) නොකරණ, කාරක නොවන, කර්ම කර්තෘ ආදී වූ කාරක සංඥවක් නොලබන්නා.

**අකාරන්ත**. ති- අකාරය අන්ත කොට ඇති,

**අකාරාදි**. පු-අ යන අක්ෂරය ආදිකොට ඇති ශබ්ද, අකාරය ප්‍රධාන කොට අකුරුපිළිවෙළ ඇති ග්‍රන්ථවිශේෂය.

**අකාරිත** ති - නො කරණ ලද,

**අකාරී**. ති-(න + කාරී) නොකරණසුලු.

**අකාරිය**. ති-(න + කාරිය) නොකට යුතු, සිදු නොකට යුතු. නොකටහැකි.

**අකාල**. පු-(න + කාල) නොකල, අවාරය, අවේලාව, අසමය, නුසුදුසු කාලය.

**අකාලගහණ**. ති- එනම් නිසගි පචිති ශික්ෂාපදය,

**අකාලික** ති-(න + කාලික) කල් නොයවා විපාක දෙන, විහා විපාක දෙන.

**අකාසික** ති (න + කාසික) කසීරටට නො අයත්, කශිදෙශයෙහි නූපන්, බරණැස් නුවරට අයිති නොවන.

**අකාසික** (ය) පු-රජුන්ගේ අයබදු අයකරණ පුරුෂයා, සුංකම් අය කරණ තැනැත්තා.

**අකි d චු**. ලකබණෙ - සලකුණුකිරීමෙහි. අඞෙකති, අඞකයති, සලකුණු කෙරෙයි.

**අකි d කු**. ලකබණෙ - සලකුණු කිරීමෙහි, අඞකති-ලකුණු කෙරෙයි.

**අකිඤ්චන**. ති-(න + කිඤ්චන) රාගාදි කිසි පළිබොධයක් නැති, හිරිහැර නැති. දිළිඳු. "අකිඤ්චනං අනාදනං තමහං බ්‍රෑමි බ්‍රාහමණං."

**අකිච්ච**. න - (න + කිච්ච) නොකටයුතු, කරන්නට නුසුදුසු දෙය.

**අකිච්චකාර**. ති-න + කිච්චකාර) කටයුතු නොකරණ. අකටයුතු කරණ, යුතුකම නොකරණ.

**අකිච්ඡ**. ති-(න + කිච්ඡ) පීඩාරහිත, වෙහෙස රහිත, දුක්නැති.

**අකිච්ඡලාභ**. පු- (න + කිච්ඡලාභ) පීඩාරහිත ලාභය, නිදුකින් ලැබීම.

**අකිච්ඡලාභී**. පු-(න + කිච්ඡලාභි) නිදුකින් ලබන සුලුතැනැත්තා, කැමති පරිදි ලබන තැනැත්තා, ඇතිතාක් ලබන තැනැත්තා.

**අකිත්ති**. ඉ- (න + කිත්ති) අපකීර්තිය, නුගුණ ප්‍රකාශය, අවගුණය.

**අකිරිය**. න-(න + කිරිය) අක්‍රියාව, නොකිරීම. කටයුතු නොකිරීම. ති-නොකටහැකි. නොකටයුතු.

**අකිරියදිට්ඨි**. ඉ-අක්‍රියාදෘෂ්ටිය, කර්මයට ඵලයක් විපාකයක් නැතැයි යන දෘෂ්ටිය, අක්‍රියවාදය.

**අකිරියවාද**. පු-අක්‍රියවාදය, ක්‍රියාවෙන් ඵලයක් විපාකයක් නැතැයි යන මිථ්‍යාවාදය.

**අකිරියරූප**. න-අක්‍රියස්වභාවය.

**අකිරියසමුට්ඨාන**. ති - සියලු ආපත්තීහු ක්‍රියා වශයෙන් පස්වැදෑරුම් වෙති. කයින් හෝ, වචනයෙන් කටයුතු ඉටීම් ආදිය නොකරන්නාට වන ආපත්තිය.

**අකිලන්ත**. ති-(න + කිලන්ත) ක්ලාන්ත නොවූ, වෙහෙස නොවූ.

**අකිලාසු**. පු-(න + කිලාසු) නොමැලි, කඩිසර, බුහුටි.

**අකුකකුච්ච**. ති-කුකුස්නැති. න-කලනොකල පින්පව් උදෙසා පසු තැවිලි නොවීම. "කළ නොකළ උදෙසා පසුතැවිලි වනු කුකුස" (158)

**අකුටිල.** ති-(න + කුටිල) අවඞ්ක; වක් නොවූ, ඇද නොවූ, ඍජු.

**අකුතොභය.** ති-බියරහිත, කොයිනුත් භය නැති.

**අක්කකුක්ත** න - තාවකාලික නොවූ එබඳු වස්ත්‍රය, කඨිනානන්තරයෙහි දී ලැබෙන්නා වූ සම්පත් 47 න් එකක්

**අකුප්ප** ති නොකිපෙන, කොප්‍ය නොවන, කුපිත නොවන, නො සෙල්වෙන

**අකුසල** න-(න + කුසල) කුසල් නොවූව, පාපය. ති-අදක්ෂ, අසමර්ථ, අනිපුණ

**අකුසලකම්ම** න-පාපකර්මය, පව්කම. කුසල් නොවන කර්මය.

**අකුසලකම්මපථ** පු ප්‍රාණඝාතාදි දශ අකුශල-කර්ම, ප්‍රතිසන්ධි විපාක දෙන අකුශලකර්මය.

**අකුසලපක්ඛික.** ති-අකුශල පක්ෂයෙහි වූ, අකුසල්වලට අයත්.

**අකුසලභාගිය** ති අකුසල් භජනය කරණ, අකුසල් කොටසට අයිති.

**අකුසලමූල** න-අකුසල්මූල, අකුසලයට මූල් වන ලොභ දෙස මොහ යන හෙතු තුණ.

**අකුසීත.** ති (න + කුසීත) කුසීත නොවන, නොකම්මැලි.

**අකුහක** ති - (න + කුහක) කුහක නොවන. නැත්ගුණ නොපෙන්වන.

**අකොසල්ල** න + කොසල්ල) මොහය, අසමර්ථ බව, නොවියත් බව.

**අක්‍රිය.** ති නොකිරීම, අධිෂ්ඨාන නොකිරීමෙන් වන අක්‍රිය ආපත්ති.

**අඛණ්ඩ.** න (න + ඛණ්ඩ) කඩනොවන නො-කැඩුනු

**අඛණ්ඩඵුල්ල** ති නොසිදුරු

**අඛත** ති (න + ඛත) නොසාරණලද, නොනසනලද, නොම උගුලන ලද.

**අඛාත.** න-වැස්සෙන් හැරුණු වළ.

**අඛිල.** ති-සියලු, සකල බිලරහිත, රළුනැති.

**අඛෙත්ත.** න-(න + ඛෙත්ත) අක්ෂෙත්‍රය' නොකෙත, නිසරුබිම, නුසුදුසුකෙත.

**අගගර් භූ.** ගතිකොටිලෙල වක්ව යාමෙහි, අගගති, වක්ව යෙයි.

**අග්ග.** ති-උතුම්, ප්‍රධාන. න-ආදිය. භාගය, කෙළවර, ඉදිරිපිට, දලුව, රාහුය, මහාමණ්ඩාතුය, මාරයා, තථාගතය යන වීර පුරුෂයෝ අග්‍රයෝ යයි පිළිගනිති, ඒ ඒ අයගේ ගතිගුණ ඇතිව මෙසේ අග්‍රවීය යි ද කියති.

**අග්ගඅඞ්ගුලි** ඉ-ප්‍රධාන ඇඟිල්ල, ඩබර-ඇඟිල්ල. ඇඟිලිඅග.

**අග්ගඋපට්ඨාක.** පු-ප්‍රධාන සෙවකයා, උපස්ථාන කරන්නවුන් ගෙන් ප්‍රධානයා, පළමුවෙනි උවටා.

**අග්ගකාරික.** න-ආදශීභාණ්ඩය, සැම්පල්බඩුව.

**අග්ගකුල.** න උසස් කුලය, ප්‍රධාන කුලය, උතුම් කුලය.

**අග්ගකුලික.** පු-උසස්කුල ඇත්තා, කුලවතා වංශවතා, කුලීනයා

**අග්ගජ.** ති-පළමුව උපන් පු ශ්‍රෙෂ්ඨව උපන් තැනැත්තා වැඩිමහල්ලා, වැඩිමහලු සහොදරයා

**අග්ගඤ්ඤ** ති අග්‍රයයි දැනගතයුතු, උතුම්. ශ්‍රෙෂ්ඨ

**අග්ගතා** ඉ-ප්‍රධානබව, ශ්‍රෙෂ්ඨබව, දෙවූගතිය.

**අග්ගත්ත.** න-අග්‍රබව, ප්‍රධානබව.

**අග්ගතො.** අ-අභිමුඛයෙන්, ඉදිරියෙන්.

**අග්ගතොසර.** පු පෙරටුව යන්නා, පෙරටුව යන යොධයා.

**අග්ගද්වාර.** න - ප්‍රධානදොර, ඉදිරිදොර. අග්දෙරිය. නිසවත්ත.

**අග්ගදාන** න-අග්‍රදානය, උතුම්දානය, ධර්මදානය

**අග්ගධම්ම** පු-අග්‍රධර්මය, ප්‍රධානධර්මය, උතුම් ධර්මය, නිර්වාණධර්මය.

**අග්ගනඛ.** පු-නඛාග්‍රය, නියඅග.

**අග්ගනික්ඛිත්ත.** ති-උසස් කොට ප්‍රශංසා කරුණු ලැබූ. උසස් කොට තබනලද.

**අග්ගපිණ්ඩ.** න-ප්‍රධානපිණ්ඩය, උතුම්බත, ප්‍රණීතාහාරය.

**අග්ගපුග්ගල.** පු-අග්‍රපුද්ගලයා, බුදුරජානන් වහන්සේ.

**අග්ගඵල**. න-අග්‍රඵලය, රහත්ඵලය.

**අග්ගපුරෝහිත**. පු-ප්‍රධාන පුරෝහිතයා, ප්‍රධාන අනුශාසකයා, රජුන්ට අනුශාසනා කරණ ප්‍රධාන ඇමතියා,

**අග්ගමග්ග**. පු-අග්‍රමාර්ගය. ප්‍රධානමාර්ගය. අර්හත් මාර්ගය ආර්‍යමාර්ගය, ආර්‍යඅෂ්ටාඞ්ගිකමාර්ගය.

**අග්ගමහෙසී** ඉ-අගමෙහෙසිය, අගබිසව, රජහුගේ ප්‍රධාන දෙවිය.

**අග්ගරාජ**. පු-ප්‍රධානරජ, මහරජ. සක්විතිරජ.

**අග්ගවාද**. න-මූලවාදය, ථෙරවාදය, ස්ථවිර-වාදය.

**අග්ගල**. න-අගුල, කෙස්ස. පරෙස්සම.

**අග්ගලකවාට**. න-යතුරුකපල්ල, අගුල්සිදුර, කෙසිසිදුර, යතුරු සිදුර.

**අග්ගලතුම්බ**. පු-අගුලුකණුව, අගුල සවිවන කණුව.

**අග්ගලදාන**. න-අමුතු පටක් ඇල්ලීම' අගුල් දැමීම, යතුරු දැමීම.

**අග්ගලඵලක**. න-අගුල් පුවරුව.

**අග්ගලසූචි**. න-යතුරුමුදුව, යතුරු, කුඤ්චි-කාව, කෙස්ස.

**අග්ගලවට්ටි**. ඉ-අගුල්වැට, අගුල්පුවරුව.

**අග්ගසාවක**. පු- අග්‍රශ්‍රාවක, අගසවු, සැරියුත් -මුගලන් දෙදෙනා වහන්සේ බුදුන් වහන්-සේගේ අගසවු වූවෝ ය.

**අග්ගළ**. පු-අරළු.

**අග්ගි**. පු-ගින්න. ගිනිපුපුර. කරඹගස. "රාගොහි තිබ්බො හුත්වා උපපජ්ජමානො සත්තෙ අනුදහති ඛාපෙති, තස්මා අග්ගීති වුච්චති."

**අග්ගිඅගාර**. න-ගිනිහල්ගෙය, ගිනි දල්වන ගෙය.

**අග්ගික්ඛන්ධ**. පු-ගිනිකඳ, ගිනිගොඩ, ගිනිමැලය.

**අග්ගික**. පු-ගිනි ඇත්තා. ගිනි පුදන්නා. "අථ ඛො අග්ගික භාරද්වාජො බ්‍රාහ්මණො"

**අග්ගිට්ඨාන**. න-අග්නිස්ථානය, ගිනි තිබෙන තැන, ලිප, උදුන.

**අග්ගිජාලා**. ඉ - ගිනිජාලාව, ගිනිදැල්ල මලයිත්තු.

**අග්ගිජුහන**. න-ගිනි පිදීම.

**අග්ගිදත්ත**. පු- මහ කොසොල් රජුගේ පෙරෙවි බමුණු.

**අග්ගිදීපන** ති-ගිනිදල්වන, සම්පයිය, මයිනා-හම. න-ගිනි දැල්වීම.

**අග්ගිනි**. න-ගිනි, ගින්න, ගින්දර.

**අග්ගිනිකාස**. පු - ගිනිවැනි තැනැත්තා. (සූර්‍යයා) ති-ගිනිවැනි.

**අග්ගිපජ්ජෝත** පු - ගිනිඑළිය න-ගිනි දැල්වීම

**අග්ගිපරිචරණ**. න-ගිනි පිදීම, ගිනිදෙවියා පිදීම.

**අග්ගිමන්ථ** පු-සිහින් මිදිගස.

**අග්ගිමුඛ** පු-දෙවියා. බදුල්ලගස. න-ගිනිසිළුව.

**අග්ගිසඤ්ඤිත**. පු-රත්නිටුල්ගස.

**අග්ගිසාලා**. ඉ ගිනිහල්ගෙය, ගිනි දල්වන ගෙය.

**අග්ගිසිඛ**. පු-එනම් නාගරාජයා කොකුම්.

**අග්ගිසිඛා**. ඉ-ගිනිසිළුව, ගිනිදළුව.

**අග්ගිහුතන**. / **අග්ගිහොත්ත**. } න-ගිනි පිදීම, අග්නිහොමය, ගිනිදෙවියා පිදීම.

**අග්ගිහොම** පු-ගිනිදෙවියා පිදීම, ගිනි පිදීම.

**අග්ඝ** d භූ. මිල වැඩීමෙහි හෙවත් ඇගීමෙහි. අග්ඝති.

**අග්ඝ**. පු-ආගන්තුක සත්කාරය, අතිථි සත්-කාරය, අමුත්තන්ට කරණ සත්කාරය.

**අග්ඝ**. පු-මිල. සත්කාරය, අගය, අමුත්තන් පිදියයුතු දේ.

**අග්ඝක**. ති-වටිනාකම ඇති, අගය ඇති.

**අග්ඝකාරක**. පු-(කර + ණවා = අක) අගය නියම කරන්නා, වත්තකුරාළ, තක්සේරු කාරයා, කුමතේරුකාරයා.

**අග්ඝති**. ක්‍රි (අග්ඝ d භූ. අග්ඝතෙ, ඇගීමෙහි, මිල නියම කිරීමෙහි + ති) අගී, වටී, සුදුසුයි, මිල නියම කරයි, මිල වඩයි, වටිනාකම නියම කරයි.

**අග්ඝනක**. ති-(අග්ඝ + යු = අන + ක) වටිනා, අගනා, වටිනාකම ඇති. (242)

**අග්ඝනීය.** ති-අගයකට හැකි, වටිනා, වටිනා-කම ඇති, අගය ඇති

**අග්ඝාපනක.** පු-මිල නියම කරන්නා, වත්තනකුරාළ.

**අග්ඝාපනීය.** ති-මිල නියම කටයුතු, වටිනා-කම නියම කටයුතු, තක්සේරු කටයුතු.

**අග්ඝක.** න-ඇගෑ, තොරණ.

**අග්ඝහානි.** න-වටිනාකම අඩුවීම, අගය අඩුවීම.

**අග්ඝය** පු-අතිථිසත්කාරය. ති-වටිනා.

**අග්ඝසමොධාන.** න-(සං+අව, ධා+යු=අන) තෙවදෑරුම් සමොධාන පරිවාසයන්ගෙන් එකක්, පටිච්ඡන්න ඇවැත් ගණනින් දෙන පරිවාසය.

**අග්‍යාගාර.** න-ගිනිහල්ගෙය, ගිනි දල්වන ගෙය.

**අග.** d භූ-වක්ව යාමෙහි. (කුටිල ගතියං) අගති.

**අග.** පු-(න ගච්ඡතීති) වෘක්ෂය. පර්වතය, කන්ද.

**අගඤ්ඡි.** ක්‍රි-(අ+ගමු d භූ. ගතියං, යාමෙහි +ච්ඡ=ඤ්ඡ+ඊ. ඊහට හ්‍රස්වයි.) ගියේය.

**අගත.** ති-(න=අ+ගමු d භූ. ගතියං, යාමෙහි +ත) නොගිය, නො පැමිණි, අසම්ප්‍රාප්ත.

**අගති.** ක්‍රි-(අග d භූ. කුටිලගතිම්හි, වක්ව යාමෙහි+ති) වක්ව යෙයි, ඇදව යෙයි.

**අගති.** ඉ-ඡන්ද - දේස - භය - මෝහ යන චතුර්විධ කරුණුවලින් නොමග යාම, නපුරු පුරුදුකිරීම, නපුරු ගතිය, ති-පිහිටක් නැති.

**අගථිත.** පු-ග්‍රථිත නොවූ, ගැට නොගැසූ, ගැට නොගසනලද. 'ගථිත' බලනු.

**අගද.** පු-බෙහෙද, බෙහෙත, විස නසන බේත්.

**අගදකාර.** පු බෙහෙත් කරන්නා, වෛද්‍යවරයා.

**අගන්ධ.** ති-ගඳ නැති, සුවඳ නැති. 'ගන්ධ' බලනු.

**අගහෙද.** පු-කරගස.

**අගමා.** ක්‍රි-(ආ+ගමු d භූ. ගතියං, යාමෙහි +ආ) ගියේය.

**අගරු.** ති-නොබර, සැහැල්ලු.

**අගරු.** න-අගිල්යයි ප්‍රසිද්ධ සුගන්ධ ද්‍රව්‍යය.

**අගහණ.** ති-(න=අ+ගහණ) කෙලෙස් දෘෂ්ටි ආදී ග්‍රහණ රහිත, ගැණීම නැති. න-නොගැණීම.

**අගළු.** න-අගිල් 'අගරු' බලනු.

**අගා.** d තු-හැඳෑරීම් ආදියෙහි

**අගා.** ක්‍රි-(අ+ගමු d භූ. ගතියං, යාමෙහි. ගමුහට ගා ආදෙශයි+ඊ.) ගියේය.

**අගාධ.** ති-පතුල නොදැක්ක හැකි ගැඹුර ඇති, නොපොච්චන ජලය ඇති.

**අගාර.** න-ගෙය, ගෘහය වාසස්ථානය. ගිහි-ගෙය.

**අගාරක.** න-කුඩාගෙය, පැල, කුටිය, කිළිය.

**අගාරමුනි.** පු-ගෘහවාසී මුනියා, ගිහිගෙයි වැසි සිල්වතා, ගෙයි වෙසෙමින් ශීලව්‍රතාදිය රකින තැනැත්තා

**අගාරව.** න-අගෞරවය, බුහුමන් නොකිරීම, අගරු කිරීම.

**අගාරික.** ති-ගෙට අයත්, ගිහිගෙට අයිති, අනගාරික නොවන.

**අගාරිය.** ති-'අගාරික' බලනු.

**අගාරිනී.** ඉ-ස්වාමිදුව, ගෘහිණිය, ගෙහිමි-තැනැත්ති.

**අගි.** d ගමනෙ (රු) යාමෙහි. අඩගති.

**අගිද්ධ.** ති-(න=අ+ගිද්ධ) ගිජු නොවන, කෑදර නොවන, කෑබෑහි නොවන, ලොල් නොවන.

**අගුත්ත.** ති-(න=අ+ගුත්ත) ගොපනය නො-කළ, සංවරණය නොකළ, නොවසනලද.

**අගොචර.** පු-(න = අ + ගොචර) ගොචර නොවන, විසය නොවන, ගොදුරු නොවන, ගුණවතුන්ට යුතු නොවන. බ්‍රහමචාරීන් විසින් නොහැසිරියයුතු වෙසියගොචරාදි ස්ථාන.

**අගොචරට්ඨාන.** න - අගොචරස්ථානය, භික්ෂූන් විසින් පිණ්ඩපාතාදිය සඳහා නො එළඹිය යුතු තැන. එබඳු තැන් සයකි. 1. ගිම් නැති කුලය, 2. පණ්ඩක නපුංසකාදීන් ඇති තැන. 3. මෙහෙණින් වසන තැන. 4. සුරා සොඬුන් වසන තැන, 5. තීර්ථකයන් වසන තැන. 6. තීර්ථකප්‍රත්‍යයදායකයන් වසන තැන.

**අඝ.** d චු-(පාප කරණෙ) පව් කිරීමෙහි. අඝෙති, අඝයති.

**අඝ.** න-ආකාශය, නිත්‍යවිවෘතවස්තු, පාපය, දුක, විපත, පඤ්චස්කන්ධය, දුඃඛවේදනාව.

**අඝට්ටන.** න-(න=අ+ඝට්ටන) නොගැටීම, ඝට්ටනය නොකිරීම, එකට එක නොගැටීම, ස්පර්ශනොවීම.

**අඝට්ටිත.** ති-(න=අ+ඝට්ටිත) නොගැටුනු, නොහැපුනු, ඝට්ටනය නොකළ.

**අඝාවී.** පු-දුක්ඛිතයා, දුක්ඇත්තා, විපතට පැමිණි තැනැත්තා.

**අඝෙති.** ක්‍රි-(අඝ+d චු. පාපකරණෙ, පව්කිරීමෙහි+ණෙ+ති) පව් කෙරෙයි.

**අඝොස.** පු-අඝොෂාක්ෂර, කඛ චඡ ටඨ තථ පඵ ස යන අකුරුවලට අඝොෂාක්ෂර යයි කියති.

**අඞ්ක.** පු-සලකුණ. ඇකය. එනම්බෙරය. අංකරය.

**අඞ්කති.** ක්‍රි-(අකි හෝ අඞ්ක d භූ. ලක්ඛණෙ, සලකුණු කිරීමෙහි+ති) ලකුණු කෙරෙයි.

**අඞ්කයති.** ක්‍රි-(අකි හෝ අඞ්ක d චු. ලක්ඛණෙ, ලකුණු කිරීමෙහි, + ණය + ති) ලකුණු කරයි.

**අඞ්කිත.** ති-(අකි හෝ අඞ්ක d භූ ලක්ඛණෙ, සලකුණු කිරීමෙහි+ත) සලකුණු කළ. මුද්‍රණය කළ. සටහන් කළ.

**අඞ්කුර.** පු. න-දලුව. මොටෙයියා ඉතා ලා පැලැටිය.

**අඞ්කුස.** පු. න-අකුස්ස, හෙණ්ඩුව. ඇතුන්ගේ මස්තකය විදිනා කවුව.

**අඞ්කුසක.** න-මල්ගෙඩි ආදිය කඩන කෙක්ක, පොල් ආදිය කඩන අඞ්කුසාකාර යෂ්ටි කෙක්ක. පු-අකුසු දරන්නා.

**අඞ්කුසපච්ඡි.** ඉ-අකුස්ස හා පැස, කෙක්ක හා කූඩය.

**අඞ්කුසග්ගාහ** පු-අකුසු ගන්නා තැනැත්තා, ඇත්ගොව්වා, හස්ත්‍යාචාර්‍ය්‍යයා, කුරුණෑයකයා.

**අඞ්කුසඤාය.** පු-සීහවික්කීළිතාදි අර්ථනයත්‍රයට දිසාභූත කුසලාකුසල ධර්මයන් දිශාලොචන න්‍යායයෙන් බලාගෙණ ඒ අලෞකික ධර්මයන් වෙන් වෙන්ව ගෙණ අර්ථනයත්‍රයෙහි යෙදීම.

**අඞ්කෙති.** ක්‍රි-(අඞ්ක හෝ අකි d චු. ලක්ඛණෙ, සලකුණු කිරීමෙහි+ණෙ+ති) සලකුණු කෙරෙයි.

**අඞ්කොල(ක).** පු-රුක්අගුන.

**අඞ්ක්‍ය.** පු-අරඑගෙඩියකට බඳු ආකාර ඇති මිහිඟු බෙරයක්.

**අඞ්ග.** පු-අගුජනපදය. කොණ. මුල්ල.

**අඞ්ග.** න-ශරීරාවයවය. අවයවය. කාරණය. ආමන්ත්‍රණාර්ථයෙහි නිපාතයක්, කොට්ඨාසය, ප්‍රභෙද, එනම් විද්‍යාව, එනම් දෙශය, අතීත් ඵලය උපදවනු කැමැති යොගාවචර සත්වාදීන්ගෙන් කරුණු 250 ක්ද සම්පූර්ණ විය යුතුයි, ඒවාටද අඞ්ගයයි කියති "මිලින්ද ප්‍රශ්නය"

**අඞ්ගජ.** න-ස්ත්‍රී පුරුෂ නිමිති.

**අඞ්ගජාත.** න-ස්ත්‍රී පුරුෂ නිමිති.

**අඞ්ගණ.** න-මිදුල, කුඩාලපය, කලුෂය, ලොභාදී කෙලෙස්.

**අඞ්ගණට්ඨාන.** න-මිදුල, මඩුව, මිනිසුන්ගේ සඤ්චරණස්ථාන වූ අනාවෘත භූමිභාගය, කැලෑවල හෝ පිට්ටනිවල එළි කළ භූමිභාගය.

**අඞ්ගද.** න-අගුපලඳනාව, වැලමිටෙන් මතුභාගයෙහි පලඳින ආභරණය, කේයූරය

**අඞ්ගනා.** ඉ-ස්ත්‍රිය, අඟන, කාන්තාව.

**අඞ්ගපච්චඞ්ග.** න-අඟපසඟ, ලොකුකුඩා ශරීරාවයව.

**අඞ්ගලට්ඨි.** න-අඞ්කුරය, සාඛාව, පාරොහ, නුග ආදි අරළු.

**අඞ්ගරක්ඛ(ක)** පු-අඞ්ග රක්ෂා කරන්නා, රජුන්ගේ ශරීරාරක්ෂක ඇමතියා

**අඞ්ගරාග.** පු-ශරීරයෙහි ගාන විලවුන්, ඡවිරාගය පිණිස ශරීරයෙහි ගල්වන කොකුම් ආදිය.

**අඞ්ගවිජ්ජා.** ඉ-ශරීරාවයවයන් බලා ශුභාශුභ දැනගන්නා (කියන) විද්‍යාව. (314)

**අඞ්ගවාත.** පු-ශරීරාවයවයන්හි පවත්නා වාතය.

**අඞ්ගවෙකල්ල.** න-ශරීරාවයවයන්ගේ විකල බව, ඇස් - කන් - නාසාදී අවයවයන්ගේ විකාරය.

**අඞ්ගසත්ථ.** න අඞ්ගවිද්‍යාව, ලක්ෂණවිද්‍යාව, ශරීරාවයවයන් බලා ශුභාශුභ දැනගන්නා විද්‍යාව.

**අඞ්ගාර.** පු-නිවි අඟුරු, ඇවිලෙන ගිනිඅඟුරු කුජග්‍රහයා.

**අඞ්ගාරක.** පු ගිනිඅඟුරු වැනි පැහැය, රත්-පැහැය, අඟහරුවා.

**අඞ්ගාරකපල්ල.** න-අඟුරුකබල, ගිනිඅඟුරු-කබල.

**අඞ්ගාරකටාහ.** පු අඟුරුවළ අඟුරුකබල

**අඞ්ගාරකාසු.** න-අඟුරුවළ, ගිනිඅඟුරු සහිත වළ.

**අඞ්ගාරපබ්බත.** පු-අඟුරුපර්වතය, ගිනිඅඟුරෙන් යුත් පර්වතය, ගිනිඅඟුරුගොඩ

**අඞ්ගාරමංස.** න බැදපුමස්, පුලුස්සනලද මස්.

**අඞ්ගාරමසි.** ඉ අලු, ගිනිඅලු.

**අඞ්ගාරවස්ස.** න-ගිනිඅඟුරු වැස්ස, වර්‍ෂාකාර-යෙන් අඟුරු වැටීම.

**අඞ්ගාරි** ති-අවයවයන්හි පවත්නා, ගිනිඅඟුරු වැනි.

**අඞ්ගාරික** පු-ගිනිඅඟුරුවලින් කටයුතු කරන්නා, අඟුරුපුලුස්සන්නා, න-අඟුරු පුලුස්සන තැන.

**අඞ්ගී** (ක). පු-අවයව ඇත්තා, කොටස් ඇත්තා. ති-අඟුජනපදයෙහි වූ.

**අඞ්ගීකාර.** පු-ප්‍රතිඥාව, පොරොන්දුව, ගිවි-සිල්ල, පිළිගැණීම,

**අඞ්ගීරස.** පු - ශරීරයෙන් රැස් විහිදෙන තැනැත්තා, බුදුරජ. වේද කතෘවූ එනම් ඍෂියා

**අඞ්ගුට්ඨ.** පු-මාපටඇඟිල්ල. හස්තපාදයන්ගේ මහඇඟිලි.

**අඞ්ගුට්ඨක.** පු පයේ මාපට ඇඟිල්ල.

**අඞ්ගුත්තරනිකාය.** න-දීඝ-මජ්ඣිම-සංයුත්ත-අඞ්ගුත්තර - ඛුද්දක යන නිකාය පසින් අඞ්ගුත්තරනිකාය. මීට අඞ්ගුත්තර සඞ්ගහ, අඞ්ගුත්තර ආගම යයිද කියති. අඞ්ගෙහි උත්තරො, අඞ්ගුත්තරො, නිබ්බිසෙසෙන විනොතීති නිකායො, අඞ්ගුත්තරොච සො නිකායො චෙති අඞ්ගුත්තරනිකායො. අඞ්ග-යන් ගෙන් මතුමත්තෙහි අධිකව සිටි නිසා අඞ්ගුත්තර යයි කියති.

**අඞ්ගුල** (ක). න-අඟල, ධාන්‍යමාසකසතක්. 'ධඤ්ඤමාස' බලනු

**අඞ්ගුලි** (ලී). ඉ-ඇඟිල්ල.

**අඞ්ගුලික.** න-ඇඟිල්ල. ති-ඇඟිල්ලට අයත්.

**අඞ්ගුලිකවාමික.** න-දිදුලය, ඇඟිලි කස්ස.

**අඞ්ගුලිකා.** ඉ-රාජමුද්‍රාව, මුද්ද.

**අඞ්ගුලිමාන.** න-අඟල් පමණ, ඇඟිලි ප්‍රමාණය.

**අඞ්ගුලිමාල.** පු අඞ්ගුලිමාල නමින් ප්‍රසිද්ධවූ බිහිසුණු පුරුෂයා, පෙර ඔහු අහිංසක කුමාරයාය. කොසොල් රජුගේ පුරොහිත බමුණාගේ පුතා, ගුරු පූජාව සඳහා මිනිසුන් 1000 ක් මරා ඇඟිලි ගැනීමට සූදානම් වූ අහිංසක කුමරා, ඇඟිලි මාලයක් කරේ ඇත්තා.

**අඞ්ගුලිපතොදක.** පු-ඇඟිලිවලින් ඇණීම, ඇඟිලිවලින් ගිරිති (=කිති)කැවීම. "**අඞ්ගුලිපතොදකෙ** පාචිත්තියං"

**අඞ්ගුලිපද** න ඇඟිලිලකුණ

**අඞ්ගුලිපොඨ.** පු අසුර ගැසීම.

**අඞ්ගුලිමුද්දා** ඉ-ඇඟිලිමුද්ද, පේරුස්මුද්ද, ගල්බැඳිමුද්ද.

**අඞ්ගුලිසඞ්ඝට්ටන.** න-ඇඟිලි එකට ගැසීම, අසුරු ගැසීම.

**අඞ්ගුලියක.** න-මුද්ද, මුදුහිරුව.

**අඞ්ගුල්‍යාභරණ.** න-ඇඟිලි අබරණ, ඇඟිලි මුද්ද.

**අඞ්ගුලිමාල පිටක.** න-තථාගත පරිනිර්වාණ යෙන් අවුරුදු 235 ට පසුව ඇතිවූ රාජගිරි නම් තීර්ථක නිකායක් ධම්විනය විනාශ කිරීම සඳහා **අඞ්ගුලිමාල පිටක** නම් ග්‍රන්ථයක් ඇතිකෙළේය එය අඞ්ගුලිමාල පිටක නමින් ප්‍රසිද්ධවිය.

**අචච.** d භූ. අගතිනැසීමෙහි, අච්චති.

**අච්ච.** d චු-පිදීමෙහි, අච්චෙති=අච්චයති.

**අච්ච.** d භූ (පූජායං-පිදීමෙහි) අච්චති.

**අච්ච.** පු-පූජාව, යාගය.

**අච්චගමා.** ක්‍රි-(අති + අ + ගමු d භූ. ගතියං, යාමෙහි + ආ) ඉක්ම ගියේය, ඉවත්ව ගියේය "අච්චයො මං හනෙන අච්චගමා."

**අච්චගා.** ක්‍රි-(අති + ආ + ගමු d භූ ගතියං, යාමෙහි, 'ගමු'හට 'ගා' ආදෙශයි.) ඉක්ම ගියේය, පසුකර ගියේය. 'උපච්චගා' බලනු.

**අච්චති** ක්‍රි (අච්ච. d භූ. පූජායං, පිදීමෙහි + ති) පුදයි. වර්ණනා කෙරෙයි.

**අච්චට්ඨි** පු එනම් ඡන්දස, "අච්චට්ඨියං විසතතතාධික එකතිංස සහස්සානි ච ලක්ඛමෙකං" යනාදීන් දක්වන සතළොස් අකුරකින් යුත් ඡන්දස.

**අච්චන.** න-(අච්ච. d භූ. පූජායං, පිදීමෙහි + යු=අන) අර්චනය, පූජාව, යාගය.

**අච්චනා.** ඉ පූජාව, යාගය.

**අච්චඞ්කුස.** පු-(අති + අඞ්කුස) අඞ්කුසය ඉක්මවූ ඇතා, අඞ්කුසයට සමීප නොවන්නා, හික්මුනු ඇතා.

**අච්චත්‍ථ.** න-(අති + අත්‍ථ) අත්‍යර්ථය, අතිශය, ඉතා, බොහෝ.

**අච්චතරී.** ඉ ඉක්මන්ගමන් ඇත්තී, වෙගවත් ගමන් ඇත්තී

**අච්චන්ත.** ති-ඒකාන්ත, නිශ්චිත, අවසාන, සම්පූර්ණ, බොහෝ, නිරන්තර

**අච්චන්තකොධන.** ති-(අති + අන්ත + කොධන) නොසන්සිඳෙන ක්‍රෝධ ඇති, කෙළවරකට නොයන ක්‍රෝධ ඇති, නිතර කිපෙන.

**අච්චන්තතණ්හා.** ඉ-ප්‍රහීණනොවූ තෘෂ්ණාව, නොසන්සිඳුනු තෘෂ්ණාව.

**අච්චන්තදුස්සීල.** පු-ඒකාන්තදුශ්ශීලයා.

**අච්චන්තදුස්සීල්‍ය.** න-ඒකාන්ත දුශ්ශීලබව.

**අච්චන්තනිට්ඨා.** ඉ-අවසානනිෂ්ඨාව, සම්පූර්ණ යෙන් කෙළවර වීම, නිවණ.

**අච්චන්තසුකුමාල.** ති-ඉතා සිවුමැලි, ඉතා සෑපසේ වැඩුනු.

**අච්චන්තයොගක්ඛෙම.** පු-අවසානය වූ නිර්වාණය.

**අච්චන්තසංයොග.** පු නිරන්තර සංයෝගය, කාල මාර්ග දෙදෙනා ද්‍රව්‍ය ගුණ ක්‍රියාවන් හා අතරක් නැතිව යෙදීමයි.

**අච්චන්තයොගක්ඛෙමී.** පු-අවසානය වූ නිර්වාණය ඇත්තා.

**අච්චන්තාභාව.** පු-අත්‍යන්ත අභාවය, අතිශයින්ම නොවීම.

**අච්චන්තානුපපත්ති,** පු-අත්‍යන්ත අනුපපත්තිය, අතිශය අයෝග්‍යත්වය.

**අච්චය.** පු-මරණය, අපරාධය, අතික්‍රමය, ඇවෑම.

**අච්චයාභාව.** පු-(අච්චය + අභාව) නිදොස් බව, නිරවද්‍ය බව, නිවැරැදි බව.

**අච්චසරී.** ක්‍රි-(අති + ආ + සර d භූ. ගතියං, යාමෙහි + ඊ) ඉක්ම ගියේය.

**අච්චා.** ඉ-ප්‍රතිරූපය, පිළිරුව.

**අච්චාධාන.** න-මදක් ආපසු ඇදීම, ටිකක් පසුපෙදෙසට ඇදීම.

**අච්චාධාය.** පූ. ක්‍රි-(අති + ආ + ධා d භූ. පතිට්ඨායං, පිහිටීමෙහි + ත්වා=ය) මදක් ආපසු ඇද තබා. "දක්ඛිණෙන පස්සෙන සීහසෙය්‍යං කප්පෙති පාදෙ පාදං අච්චාධාය"

**අච්චාභික්ඛණ.** න-(අති + අභික්ඛණ) නිතොර, සෑමවේලේම.

**අච්චායත.** ති-(අති + ආයත) ඉතා දිග.

**අච්චාසික.** ති-ඉක්මන්, යුහුසුලු, වහා කටයුතු පිළිවෙළකට නැති, කඩිසර.

**අච්චාරද්ධ.** ති-(අති + ආරද්ධ) අධිකව පටන් ගන්නාලද, මහත් කොට ආරම්භ කළ.

**අච්චාවදති.** ක්‍රි-(අති + ආ + වද d භූ. වචනෙ, බිණීමෙහි + ති) බොහෝ කොට කියයි, අනුන් මැඩපවත්වා කියයි.

**අච්චාසන.** න-(අති + ආසන) සමීපය, සමීපයෙහි හිඳීම, ඉතාකිට්ටුව හිඳීම.

**අච්චාසන්න.** ති (අති + ආසන්න) ඉතා සමීප, ඉතාකිට්ටු, ඉතා ළඟ.

**අච්චාභිත.** ති-(අති + ආභිත) ඉතා බිහිසුනු, අතිශය භයානක, ඉතාලං වූ. (३८८)

**අච්ඡි.** පු-ඉ-ගිනිසිළ, ගිනිදළුව. රශ්මිය.

**අච්ඡි.** ක්‍රි-(අච්ච d භූ. පූජායං, පිදීමෙහි+ඉ) පිදීය.

**අච්ඡිකා.** ඉ-ගිනිදළුව.

**අච්චිත.** ති-පුදනලද, යාග කළ.

**අච්චිබද්ධ.** න-ලියැදිබැඳි කෙත, කුඹුර.

**අච්චිමන්තු.** පු-ගින්න.

**අච්චුග්ගච්ඡති.** ක්‍රි-(අති+උ+ගමු d භූ. ගතියං, යාමෙහි+ති. ධාතුහුගේ අන්තයට 'ච්ඡ' ආදෙශයි. අති+උග්ගච්ඡති) උස්ව නගී, ඉතා ඉහලට නගී.

**අච්චුග්ගත.** ති (අති+උග්ගත) ඉතා උස්ව නැගි, ඉතා ඉහලට නැගි.

**අච්චුග්ගමන.** න-(අති+උග්ගමන) ඉතා උස්ව නැගීම. උස්ව යාම.

**අච්චුත.** න-(න=අ+චු d භූ චවනෙ, චුත වීමෙහි+ත) චුත වීමක් නැති තැන, නිවණ. පු-විෂ්ණු. "තත්‍ථ එතසම්ං අධිගතෙ චුතං චවනති අච්චුතං." නිවණට පැමිණි කල්හි නැවත එයින් චුතවීමක් නොමැති හෙයින් අච්චුත යයි කියනු ලැබේ.

**අච්චුති.** ති-(න=අ+චුති) චුතිරහිත, මරණ රහිත, නිවණ. න-චුත නොවීම.

**අච්චුත්තා.** ඉ-අකුරු දෙකකින් යුත් ඡන්දස, අත්‍යුක්තා ඡන්දස.

**අච්චුණ්හ.** ති-(අති+උණ්හ) ඉතා උණු, න-අධික උෂ්ණය.

**අච්චුස්සන්න.** ති-(අති+උස්සන්න) ඉතා උසස්, ඉතා පිරුණු, ඉතා ඝන.

**අච්චුළාර.** ති-(අති+උළාර) ඉතා උදාර, ඉතා ප්‍රෞඪ.

**අච්චෙක.** ති-(අති+එක) ඉතිරි, වැඩි, බොහෝ, විශෙෂ, අතිරේක.

**අච්චෙකචීවර.** න-වැඩිසිවුර, ඉතිරිසිවුර.

**අච්චෙන්ති.** ක්‍රි-(අති+ඉ d භූ. ගතියං, යාමෙහි+න්ති)-ඉක්මවා යෙයි, පසුකර යෙයි. "අච්චෙන්ති කාලා තරයන්ති රත්තියො."

**අච්චොගාළ්හ.** ති-(අති+අව+ගාළ්හ) ඉතා ගැඹුරු, ඉතා යටට බැස ගත්, ඉතා අධික. 'අජ්ඣොගාළ්හ' බලනු.

**අච්චොදක.** න-(අති+ඔදක) අධිකජලය, වැඩිවතුර.

**අච්චොදර.** පු-(අති+උදර) මහබඩක් ඇති තැනැත්තා, බොහෝ ආහාර අනුභව කරන්නා, කෑදරයා (=බඩජාරියා).

**අච්චොදාත.** ති-(අති+අවදාත) ඉතාසුදු.

**අච්ඡ.** ක්‍රි-(ආස d භූ. උපවෙසනෙ, හිඳීමෙහි+හි. ධාතුවන්තයට 'ච්ඡ' ආදෙශයි. ආදියට හ්‍රස්වයි. ප්‍රත්‍යයට ලොපයි.) සිටුව, නවතුව. "අච්ඡ තාව භන්තෙ යාව මමාගමනා".

**අච්ඡ.** ති-ප්‍රසන්න, ඝනනොවන, තුනී. 'අච්ඡොදක' බලනු.

**අච්ඡ.** පු-වලහා,. වලසා.

**අච්ඡක.** පු-වලසා.

**අච්ඡති.** ක්‍රි-(ආස d භූ. උපවෙසනෙ, හිඳීමෙහි +ති ධාතුවන්තයට 'ච්ඡ' ආදෙශයි, ආදියට හ්‍රස්වයි.) හිඳියි, ළඟ හිඳියි.

**අච්ඡන්න.** ති-(අ+ඡන්න) වැසුනු, ප්‍රතිච්ඡන්න වූ. නොවැසුනු, නොවසනලද.

**අච්ඡම්භී.** ති-(න=අ+ඡම්භී) බිය රහිත, තැති ගැණීම් රහිත. 'ඡම්භී' බලනු.

**අච්ඡරා.** ඉ-අප්සරාව, දෙවඟන. "අථෙත්‍ථ අච්ඡරා ඔභාසයන්ති". අසුර, ඇඟිලිදෙක එකතුකර නගන ශබ්දය. "කුක්කුච්ච-මත්තම්පි තෙ තත්‍ථිනී අච්ඡරං පහරි".

**අච්ඡරාසඞ්ඝාත.** න-අසුරු ගැසීම, ඇඟිලිදෙක එකතු කර ශබ්ද නැගීම.

**අච්ඡරාසද්ද.** පු-අසුරුසන, අසුරු ගැසීමේ ශබ්දය.

**අච්ඡරික.** පු-දිව්‍යගන්ධර්වනාදයක්.

**අච්ඡරිය.** ති-ආශ්චර්යය, මොහොතකදී සිදුවන පුදුමය.

**අච්ඡාදන.** න-(ආ+ඡාදන) වස්ත්‍රය, ඇඳුම. වැසීම, ඇඳීම.

**අච්ඡාදෙති.** ක්‍රි (ආ+ඡද d චු. අපවාරණෙ, මුවහකිරීමෙහි+ණෙ+ති) හඳියි, වස්ත්‍ර පරිධානය කෙරෙයි, රෙදි අඳියි.

**අච්ඡි.** ක්‍රි-(ආස d භූ. හිඳීමෙහි+ඊ. ධාතුවන්තයට 'ච්ඡ' ආදෙශයි. ආදියට හ්‍රස්වයි. සිටියේය, නැවතුනේය.

**අච්ඡ.** න-ඇස. විස්මය, පුදුමය.

**අච්ඡිද්ද.** ති-සිදුරු රහිත, කුහර නැති, එක ඝන.

**අච්ඡින්දති.** ක්‍රි-(ආ + ඡිදි d රු. වෙධාකරණෙ, දෙකඩ කොට කැපීමෙහි + ති) කඩා ගණී, පැහැර ගණී, බලාත්කාරයෙන් ගණී.

**අච්ඡින්දන.** න-(ආ + ඡිදි d රු. වෙධාකරණෙ, දෙකඩ කොට කැපීමෙහි + යු + අන) පැහැර ගැණීම, බලෙන් ගැණීම.

**අච්ඡින්න.** ති-පැහැර ගත්, පැහැර ගන්නා ලද. "**අච්ඡින්න** චීවරෝ වා හොති." නො සුන්, නොකැපූ.

**අච්ඡුපති.** ක්‍රි-(ආ + ඡුප d තු. ඵස්ස, සිපගැන්මෙහි හෝ සපශී කිරීමෙහි + ති) සපශී කෙරෙයි, පිසදමයි, බාධා කරයි.

**අච්ඡුපන.** න-(න=අ + ඡුපන) සපශී නොකිරීම, නොහැපීම, නොගැටීම.

**අච්ඡෙච්ඡි.** ක්‍රි-(අ + ඡිදි d රු. වෙධාකරණෙ, දෙකඩ කොට කැපීමෙහි + ඊ) සින්දේය. "**අච්ඡෙච්ඡි** තණ්හං ඉධ නාමරූපෙ."

**අච්ඡේදන.** න-(ආ + ඡේදන) සිඳීම, කැපීම, පැහැර ගැණීම.

**අච්ඡර.** න-ආශ්චර්‍ය්‍යය, විස්මය, පුදුමය.

**අච්ඡරක.** පු-න- ප්‍රාතිහාය්‍ය්‍යය, ආශ්චර්‍ය්‍ය ක්‍රියාව

**අච්ඡෝදක.** න-(අච්ඡ + උදක) ප්‍රසන්නජලය, පිරිසිදු වතුර.

**අච්ඡෝදික.** ති-පිරිසිදුජලය ඇති, පැහැදුනු ජලය ඇති.

**අචක්ඛු.** පු-අන්ධයා, ඇස්නැත්තා. ප්‍රඥානැත්තා.

**අචඞ්කම.** න-සක්මනට නුසුදුසුබිම.

**අචත්ත.** ති-(න=අ + චත්ත) නොහරිණලද, පරිත්‍යාග නොකළ.

**අචරණ.** ති-නොහැසිරෙණ, සංවරණය නො කරණ. න-නොහැසිරීම.

**අචරි.** ක්‍රි-(අ + චර d භූ. ගතියං, යාමෙහි, + ඊ) හැසුරුණේය. "**අචරි** චනායං විතුදං වනානි."

**අචරිම.** න-(න=අ + චරිම) පසුනොවන. 'චරිම' බලනු.

**අචල.** පු-පර්වතය. ති-නිශ්චල.

**අචලධිති.** පු-එක පාදයක ලැබු 16 බැගින් ඇතිවෘත්තය, එනම් වෘත්තය.

**අචලිත.** ති-(න=අ + චලිත) නොසෙල්වුනු, චඤ්චල නොවන.

**අචලාපාදන.** පු-අපාදන භෙදයක්, රුක්ඛස්මා ඵලං පතති — මෙහි රුක්ඛස්මා යනු අචලාපාදනයි.

**අචාලෙති.** ක්‍රි (න + d චල + ණෙ + ති) නො සෙල් වෙයි. නොසැලෙයි.

**අචින්තක.** ති-(න=අ + චින්තක) සිත්නැති, කල්පනාරහිත.

**අචිත්තීකත.** ති-(න=අ + චිත්තීකත) විසිතුරු නොකළ, සිතියම් නොකළ.

**අචිත්තීකාර.** පු-චිත්තීකාර නොවූ, විසිතුරු නොවූ.

**අචිර.** න-(න=අ + චිර) නොබෝකාලය, ටික කාලය.

**අචිරප්පභා.** ඉ-(න=අ + චිර + පභා) ටික කාලයක් පවත්නා ආලෝකය, විදුලිය.

**අචින්තනීය.**
**අචින්තිය.**
**අචින්තෙය්‍ය.** } ති-(න=අ + චින්තනීය) නො සිතිය හැකි. නොසිතිය යුතු. බුද්ධ - ඝෘඩි - ධම් - ලොක විෂයන් නොසිතිය හැකි කරුණු සතරෙකි.

**අචිරවතී.** ඉ - පඤ්චමහා ගඞ්ගාවන්ගෙන් එකක් වූ එනම් නදිය.

**අචීවර.** ති-(න + අ + චීවර) සිවුරු නැත්තා. සිවුරු නැති.

**අචෙල (ක).** පු-(න=අ + චෙල) අචෙලකයා, නග්නයා, නග්නව සිටින තාපසයා.

**අඡි.** d රු-ආයාමෙ, දිගට සැසීමෙහි, අඤ්ඡති.

**අජ.** d භූ-ඛෙපනෙ, දැමීමෙහි, ගමන්හි. අජති.

**අජ්ජ.** d භූ සජ්ජනෙ, සැදීමෙහි, අජ්ජති.

**අජ්ජ.** d චු-අජ්ජනෙ, සැදීමෙහි, සැපයීමෙහි, අජ්ජෙති.

**අජ්ජ.** අ-වත්මන්කල, මේ දවස, අද

**අජ්ජක.** පු හෙලබටු, එලබටු, තලතබටු.

**අජ්ජතග්ග.** පු-(අජ්ජතො + අග්ග) අද පටන් මතු, අද සිට ඉදිරියට, "අජ්ජතග්ගෙදානි ථෙරො මය්හං භාරො."

**අජ්ජතන.** ති-(ඉම=අ + ජ්ජ + තන) අද වූ, අදට අයත්, වර්තමානික.

**අජ්ජතනී.** ඉ-අද වූ, අදට අයත්. එනම් ආඛ්‍යාත විභක්තිය.

**අජ්ජතා.** ඉ-අදට අයත්, මේ කාලය.

**අජ්ජති.** ක්‍රි-(අජ්ජ + ති) සාදයි, සපයයි.

**අජ්ජව.** න-(උජු + ණ. පූර්ව 'උ' හට ආ හා සංයොගාදිය හෙයින් හ්‍රස්වයි. පර 'උ' හට 'අව' ආදෙශයි.) සෘජුබව, ඇදනැතිබව.

**අජ්ජවතා.** ඉ-සෘජු බව, ඇදනැතිබව.

**අජ්ජිත.** ති-රැස්කළ, එකතුකළ.

**අජ්ජුක.** පු. කුඹුක්ගස, අර්ජුන වෘක්ෂය.

**අජ්ජුකණ්ණ** - පියාගස.

**අජ්ජුණ්හ.** පු සඳරැසින් යුත් මේ රාත්‍රිය.

**අජ්ජුන.** පු-කුඹුක්ගස.

**අජ්ඣක්ඛ.** පු-(අධි=අජ්ඣ + අක්ඛ) අධ්‍යක්ෂයා, කර්මාධ්‍යක්ෂයා, ක්‍රියාවෙහි ප්‍රධානයා, අදිකාරම, සතිස්වැදෑරුම් කර්මයෙහි නියුක්තයා. කිරිපලුරුක.

**අජ්ඣගා.** ක්‍රි-(අධි = අජ්ඣ + ගමු=ගා + ආ) පැමිණියේය, ගියේය. අධිගම කෙළේය.

**අජ්ඣත්ත.** න-(අධි=අජ්ඣ + අත්ත) තමාගේ සන්තානය, තමා පිළිබඳ දෙය.

**අජ්ඣත්තරූප.** න-අධ්‍යාත්මිකරූපය, තමා පිළිබඳ රූපය.

**අජ්ඣත්තසංයොජන.** න-අධ්‍යාත්මසංඛ්‍යාත කාමභවය පිළිබඳව පවත්නා ඡන්දරාගය, ඔරම්භාගයයි කියනලද කාමධාතුව ආශ්‍රය කරණ සක්කායදිට්ඨි, විචිකිච්ඡා, සීලබ්බත පරාමාස, කාමරාග, ව්‍යාපාද යන සංයෝජන පස. ති-ඒ සංයොජන පස ඇති.

**අජ්ඣත්තාරම්මණ** න-තමා පිළිබඳ අරමුණ.

**අජ්ඣත්තකරණ** න-අධ්‍යාත්මකරණය, ඇසින් රූප දැක්මෙහි ආධාර වන්නාවූ ඒ ඒ ක්‍රියාකරණයෙහි නියුක්තවූවහුගේ ආත්ම සම්බන්ධය ඇතිකිරීම.

**අජ්ඣත්තසමුට්ඨාන.** න-තමා පිළිබඳව උපදින තමාට අයිතිව පවතින.

**අජ්ඣත්තික.** ති (අධි=අජ්ඣ + අත්ත + ණික) තමාට අයත්, තමාසතු.

**අජ්ඣප්පත්ත** ති (අධි=අජ්ඣ + ආ + පත්ත) අධිපති බවට පැමිණි.

**අජ්ඣභවි.** ක්‍රි-(අධි + ආ + භූ. d භූ. සත්තායං, වීමෙහි, අව + ඊ) මැඩ පැවැත්වීය, යටත් කෙළේය.

**අජ්ඣභාසි.** ක්‍රි-(අධි=අජ්ඣ + භාස + ඊ) කීයේය, මොනවට කීයේය.

**අජ්ඣභූ.** පු (අධි + අ + භූ) මැඩපවත්වන්නා, අභිභවනය කරන්නා.

**අජ්ඣයන** න (අධි=අජ්ඣ + ඉ. d භූ. අජ්ඣයනෙ, හැදෑරීමෙහි + යු=අන) අධ්‍යයනය, හැදෑරීම, ඉගෙණීම.

**අජ්ඣාගමන.** න-(අධි=අජ්ඣ + ආ + ගම + යු=අන) ඊම, ඉදිරියට ඊම, සම්මුඛයට පැමිණීම.

**අජ්ඣාගාර** න-(අධි=අජ්ඣ + අගාර) ස්වකීය ගෘහය, ගෙය.

**අජ්ඣාචරති.** ක්‍රි-(අධි=අජ්ඣ + ආ + චර d භූ. ගතියං, යාමෙහි + ති) ඉක්ම හැසිරෙයි.

**අජ්ඣාචාර.** පු-(අධි=අජ්ඣ + ආ + චාර) ශික්ෂා පද මැඩලීම, ඉක්ම හැසිරීම. වැරදි දේ කිරීම.

**අජ්ඣාචිණ්ණ.** ති-(අධි=අජ්ඣ + ආ + චිණ්ණ) බෙහෙවින් පුරුදුකළ, ප්‍රගුණ කළ.

**අජ්ඣාජීව.** පු-දුෂ්කර ජීවිකාව, හිරිහැර සහිත ජීවිකාව.

**අජ්ඣාපජ්ජති.** ක්‍රි-(අධි=අජ්ඣ + ආ + පද. d දි. ගතියං, යාමෙහි + ති) වරද කරයි. වරදට පැමිණෙයි.

**අජ්ඣාපත්ති** ඉ-(අධි=අජ්ඣ + ආ + පද + ති) වරදට පැමිණීම.

**අජ්ඣාපන්න.** ති-(අධි=අජ්ඣ + ආපන්න) ඇතුළත්, ඇතුළට පැමිණි. වරදට පැමිණි

**අජ්ඣාපන.** න-අධ්‍යාපනය, හැදෑරවීම.

**අජ්ඣාපන.** න-(ආ + ඣාපන) දැවීම, පිළිස්සීම.

**අජ්ඣාපර.** පු-පරිවාර, පිරිවර. (504)

**අජ්ඣාපීළන**. න (අධි=අජ්ඣ + ආ + පීළ d චු අවගාහනෙ, පෙළීමෙහි + යු=අන) පීඩා කිරීම, හිරිහැර කිරීම.

**අජ්ඣාපීළිත**. ති (අධි=අජ්ඣ + ආ + පීළ d චු. අවගාහනෙ, පෙළීමෙහි + ත) පීඩා කළ, වෙහෙස කළ, පීඩාවට පැමිණි.

**අජ්ඣාභව**. ති-ප්‍රධාන, ශ්‍රේෂ්ඨ.

**අජ්ඣාභවති**. ක්‍රි-(අධි=අජ්ඣ + ආ + භූ d භූ සත්තායං, වීමෙහි, ඕ=අව + ති) ප්‍රධාන වෙයි, උතුම් වෙයි.

**අජ්ඣාය** පු අධ්‍යායය, පරිච්ඡේදය, කාණ්ඩය, පාඩම.

**අජ්ඣායක**. පු හදාරන්නා, උගන්වන්නා, වේදය හදාරන්නා හෝ හදාරවන්නා.

**අජ්ඣායකකුල**. න-මන්ත්‍ර හදාරණ බ්‍රාහ්මණ කුලය.

**අජ්ඣාරූහ**. ති-නගින, ආරූඪ වන

**අජ්ඣාරූහති**. ක්‍රි-(අධි=අජ්ඣ + ආ + රුහ d භූ. ජනනෙ, හටගැණීමෙහි නොහොත් ඉපදීමෙහි + ති) ඉහළට නගී. අතිශයින් වැඩෙයි.

**අජ්ඣාරූළ්හ**. ති-(අධි=අජ්ඣ + ආ + රුහ d භූ. අනනෙ, හටගැණීමෙහි + ත=හ, ධාත්වන්ත හකාරයට ළකාරාදෙශ හා ළකාර හකාරයන්ට විපයඨාසයි) ඉතාවැඩුනු, බොහෝසේ වර්ධනය වූ, වෘක්ෂාදියට නැගි.

**අජ්ඣාරෝහ**. පු-(අධි- අජ්ඣ + රුප) එක් පදාර්ථයක සවභාවය තවත් පදාර්ථයක් කෙරෙහි තගාලීම- අධ්‍යාරෝපණයකිරීම.

**අජ්ඣාරෝප** පු නැගීම. එනම් මහාමත්ස්‍යයා.

**අජ්ඣාවසති**. ක්‍රි-(අධි=අජ්ඣ + ආ + වස. d භූ. නිවාසෙ, වාසය කිරීම මෙහි + ති) වාසය කෙරෙයි. අධිපතිව වෙසෙයි.

**අජ්ඣාවුත්ථ**. ති-අධි=අජ්ඣ + ආ + වස. d නිවාසෙ, වාසය කිරීමෙහි + ත=උත්ථ) වාසය කළ. අධිපතිව විසූ.

**අජ්ඣාසය**. පු අදහස, අභිප්‍රාය, ආශාව.

**අජ්ඣාසිත**. ති - (අධි = අජ්ඣ + අසා d භූ උපවෙසනෙ, ඉඳීමෙහි + ත) අදහස් කළ, අරමුණුකළ. හුන්.

**අජ්ඣාහාර**. පු (අධි=අජ්ඣ + ආ + හර) අධ්‍යාහාර කිරීම, අවශ්‍යයෙන් කිවයුතු වූ පදයක් අමුතුවෙන් යොදා කීම,

**අජ්ඣිට්ඨ**. ති-(අධි=අජ්ඣ + ඉස d භූ. පරියෙසනෙ, සෙවීමෙහි + ත=ට්ඨ) ආරාධනය කළ, අරමුණු කළ.

**අජ්ඣුපගච්ඡති** ක්‍රි-(අධි=අජ්ඣ + උප + ගමු = වඡ + ති) ලඟට පැමිණෙයි. කැමැති වෙයි.

**අජ්ඣුපගත**. ති-(අධි=අජ්ඣ + උප + ගම d භූ. ගතියං, යාමෙහි + ත) ලබනලද. ලඟට පැමිණි, ආශ්‍රයට පැමිණි.

**අජ්ඣුපගමන**. න-ලඟට පැමිණීම, සමීපයට යාම, එකඟ වීම, ගිවිස ගැණීම.

**අජ්ඣුපහරති**. ක්‍රි-(අධි=අජ්ඣ + උප + හර d භූ හරණෙ, හැරීමෙහි + ති) උදාහරණ කෙරෙයි. කරුණු දක්වයි. තෙමේම කයි.

**අජ්ඣුපෙක්ඛති**. ක්‍රි-(අධි=අජ්ඣ + උප + ඉක්ඛ-+ ති) මධ්‍යස්ථව බලාපොරොත්තු වෙයි, මධ්‍යස්ථ වෙයි, මැදහත් වෙයි.

**අජ්ඣුපෙක්ඛණ**. න-(අධි + උපෙක්ඛණ) බැලීම, නිරීක්ෂණය, මධ්‍යස්ථව කල්පනා කිරීම.

**අජ්ඣුපෙක්ඛා**. ඉ-මධ්‍යස්ථභාවය, බැලීම, බලාපොරොත්තුවීම.

**අජ්ඣුපෙති**. ක්‍රි-(අධි=අජ්ඣ + උප + ඉ. d භූ. ගතිමහි, යාමෙහි + ති) යුක්ත වෙයි. බලාපොරොත්තු වෙයි, මධ්‍යස්ථ වෙයි.

**අජ්ඣෙති**. ක්‍රි-(අධි=අජ්ඣ + ඉ d භූ. අජ්ඣානෙ, හැදෑරීමෙහි + ති)ආසා කෙරෙයි. බලා සිටියි. ප්‍රාර්ථනා කෙරෙයි.

**අජ්ඣෙසති**. ක්‍රි-(අධි=අජ්ඣ + ඉස. d භූ. පරියෙසනෙ, සෙවීමෙහි + ති) ආරාධනා කෙරෙයි. සතුටු කෙරෙයි, යාච්ඤා කෙරෙයි.

**අජ්ඣෙසන**. න-(අධි=අජ්ඣ + එස) මෙය කළ මැනවැයි ගෞරව පූර්වකව ආරාධනා කිරීම.

**අජ්ඣෙසනා**. ඉ-(අධි=අජ්ඣ + ඉස. d භූ. ගවෙසනෙ, සෙවීමෙහි + යු = අන + ආ) - සත්කාර පෙරදැරිකොට කරණ ආරාධනාව. ප්‍රාර්ථනාව, යාච්ඤාව.

**අජ්ඣෙසිත**. ති-ආරාධනා කළ, සතුටු කළ. පැතූ.

**අජ්ඣොකාස.** පු-(අධි=අජ්ඣ + අව=ඔ + කාස) අනාවරණස්ථානය, අහස, හිස්තැන, අභ්‍යවකාශය.

**අජ්ඣොගාළ්හ.** ති - (අධි = අජ්ඣ + අව = ඔ + ගාළ්හ) බැසගත්, ප්‍රවිෂ්ට වූ, දියේ ගිලුනු.

"වත්තුකාමො අහං අජ්ජ
පච්චයාකාරවණ්ණනං,
පතිට්ඨං නාධිගච්ඡාමි
අජ්ඣොගාළ්හොව සාගරං."

**අජ්ඣොකිරති.** ක්‍රි අධි=අජ්ඣ + අව=ඔ + කිර d භූ. විකිරණේ, විසිරීමෙහි + ති) වගුරුවයි, විසුරුවයි.

**අජ්ඣොගාහති.** ක්‍රි (අධි=අජ්ඣ + අව=ඔ + ගාහ. d භූ. විලොළනෙ ඇලළීමෙහි + ති) බැසගණී, ඇතුලත් වෙයි.

**අජ්ඣොත්ථට.** ති-(අධි=අජ්ඣ + අව=ඔ + ථර d භූ. සත්ථරණෙ, ඇතිරී මෙහි + ත=ට) වැසූ. යටත් කළ පොඩිකළ.

**අජ්ඣොත්ථරති.** ක්‍රි-(අධි=අජ්ඣ + අව=ඔ + ථර d භූ. සත්ථරණෙ, ඇතිරී මෙහි + ති) යටත් කෙරෙයි, පහත් කෙරෙයි, පෙළයි.

**අජ්ඣොපන්න.** ති-(අධි=අජ්ඣ + අව=ඔ + පද. d භූ ගතියං, සාමෙහි + ත=අන්න) පැමිණි, ඇතුලත්.

**අජ්ඣොහවති.** ක්‍රි-(අධි=අජ්ඣ + අව=ඔ. d භූ. සත්තායං, විමෙහි. ධාත්වන්ත 'ඌ' හට 'ඔ' වෘද්ධියි. ඔහට අව ආදේසයි + ති) යටත් කෙරෙයි, පීඩා කෙරෙයි.

**අජ්ඣොමුච්ඡිත** ති (අධි=අජ්ඣ + අව=ඔ + මුච්ඡ + ඉ + ත) අතිශයින් මූර්ජිත වූ.

**අජ්ඣොලම්බති.** (ක්‍රි-අධි=අජ්ඣ + අව=ඔ + ලම්බ. d භූ. අවසංසනෙ, එලීමෙහි + ති) එල්බෙයි, එල්ලෙයි, අරමුණු ගණී.

**අජ්ඣොලම්බන.** න-එල්ලෙන, එල්ලීම.

**අජ්ඣොමද්දති.** ක්‍රි-(අධි=අජ්ඣ + අව=ඔ + මද්ද. d චු මද්දනෙ, මැඩීමෙහි + ති) මිරිකයි. පාගයි පොඩිකරයි.

**අජ්ඣොසාන.** න-අවසානය, කම්මුතුවීම, කෙළවර, කොණ.

**අජ්ඣොසාය.** පු-එල්ලීම, ආලම්බනය. නිමවීම.

**අජ්ඣොසිත.** ති-(අධි=අජ්ඣ + අව=ඔ + සි. d භූ. ගතියං, යාමෙහි + ත) අවසන්කළ, නිමවනලද, සමාප්ත කළ.

**අජ්ඣොහට.** ති-(අධි=අජ්ඣ + අව=ඔ + හර. d භූ. ආදානෙ, ගැණීමෙහි + ත=ට) අනුභව කළ, වළඳනාලද, කනලද.

**අජ්ඣොහත.** ති-අනුභව කළ, ගිලිනලද, වැළඳු.

**අජ්ඣොහරණ.** න-ආහාරය අනුභවය.

**අජ්ඣොහරති.** ක්‍රි-(අධි=අජ්ඣ + අව=ඔහර. d භූ ආදානෙ, ගැන්මෙහි + ති) අනුභව කරයි, වළඳයි.

**අජ්ඣොහරණීය.** ති-(අජ්ඣොහර + අනීය) බුදියයුතු, අනුභව කටයුතු.

**අජ්ඣොහාර.** පු-ආහාරය, අනුභවය, බත්පිඩ, යැපෙන පමණ අහර.

**අජ.** d භූ-බැහැරලීමෙහි. යාමෙහි. අජති.

**අජ.** පු-එළුවා, තිරෙළුවා, පළෙළුවා.

**අජක.** පු-එළුවා.

**අජගර.** පු එළුවන් ගිලින්නා, පිඹුරා.

**අජගල.** පු-අජගරයා, පිඹුරා.

**අජච්ච.** පු-(න=අ + ජච්ච) උතුම්ජාති නැත්තා, නීචයා, උසස්කුල නැත්තා.

**අජජ්ජර.** ති නොදිරණ, ස්ථිර, ශක්තිමත්.

**අජඤ්ඤ.** ති-උපද්‍රවරහිත, උවදුරුනැති.

**අජණ්ණුක.** න-එළුකුරයක ආකාරඇති අඹුව.

**අජඩුමාර.** පු-අනාථමරණය.

**අජපථ.** පු-එළුවන්ගෙන් යා යුතු මාර්ගය, එළුවන්පිට නැගී හෝ එළුවන්පිට තවලම් පටවා හෝ යායුතු මාර්ගය.

**අජපාල.** පු-එළුවන් පාලනය කරන්නා, එළුවන් බලන්නා, උරුවෙල් දනවුවෙහි සෙනානි නම් නියම්ගම පිහිටි නුග ගස.

**අජපාලක.** පු-එළුවන් බලන්නා, උපුල්කොල.

**අජමොද.** පු-අසමොදගම්.

**අජර.** ති-(න=අ + ජර) ජරා නැති. න-නිවණ.

**අජරාමර.** ති-(අජර + අමර) නොදිරීම හා නොමැරීම, මේ ගුණ දෙක ඇත්තේ නිවණෙහි පමණක්ය. (572)

**අජලක්ඛණ**. න-එළුලකුණු, එළුවන්ගේ ලකුණු බලා ගුණාගුණ හෙවත් පලාපල කීම.

**අජලණ්ඩිකා**. ඉ එළුබෙටි, එළුවසුරු.

**අජවත**. න-අජව්‍රතය, එළුවෙකු මෙන් හැසිරීමේ හා ක්‍රියා කිරීමේ ව්‍රතය, එළුගතිය.

**අජා**. ඉ-අජධෙනුව, එළුදෙන.

**අජාත**. ති-(න=අ + ජාත) නූපන්, හටනොගත්, නොඉපදුනු.

**අජාතසත්තු** පු-එනම්රජ. (මොහු බිහි-වන්නටත් පළමු පියාට සතුරුවූයෙන් මේ නම ව්‍යවහෘත විය). මගධ දෙශාධිපති මහරජ.

**අජාති**. ඉ-නොඉපදීම. ති-ජාතිරහිත, හීන ජාතික, උසස් කුලනැති.

**අජානන්ත**. ති-(න=අ + ජානන්ත) නොදන්නා, නොදත්.

**අජානන** න-(න=අ + ජානන) නොදැන්ම, අඥානකම.

**අජිකා**. ඉ-එළුදෙන.

**අජින**. පු-අඳුන් දිවියා. න අඳුන් දිවිසම.

**අජිනක්ඛිප**. න-දෙකට පලනලද කුරලොම් සහිත අඳුන් දිවිසම.

**අජිනචම්ම**. න-අඳුන් දිවිසම.

**අජිනප්පවෙණි**. ඉ-අඳුන් දිවිසමින් කළ ඇතිරිල්ල.

**අජිනපත්තා**. ඉ-වවුලා, දුවා.

**අජිනයොනි**. පු-මුවා

**අජිනසාටි**. ඉ අඳුන් දිවිසමින් කළ ඇඳුමක්. සම්ඇඳුමක්.

**අජිනි**. ක්‍රි-(අ + ජි. d භූ. ජයෙ, දිනීමෙහි + නා + ඊ) දිනී, ජය ගත්තේය.

**අජිම්හ** ති-(න=අ + ජිම්හ) ඇදනැති, වක්නැති, සෘජු.

**අජිම්හග**. ති සෘජුව යන (ඊය). පු-ශරය.

**අජිර**. න-මිදුල, අඞ්ගණය.

**අජී**. ඉ-එළුදෙන.

**අජීරක**. පු-අජීර්ණරොගය. න-අහර නොදිරීම.

**අජීවාලපන**. න-(අජීව + ආලපන) හො රුක්ඛ, හො පබ්බත යනාදීන් ජීවිතෙන්ද්‍රිය නැති දෙයකට කරණ ආමන්ත්‍රණය.

**අජෙගුච්ඡ**. ති-(න=අ + ජෙගුච්ඡ) නොපිළිකුල්, පිළිකුල්නොවන, ජුගුප්සා නොකටයුතු.

**අජෙය්‍ය**. ති-(න=අ + ජෙය්‍ය) නොදිරණ, ස්ථිර. නොදිනිය හැකි, නොපැරදවිය හැකි.

**අඤ්ච**. d භූ. පූජායං, පිදීමෙහි, අඤ්චති.

**අඤ්ච**. d චු. විසෙසනෙ, විශෙෂණයෙහි, අඤ්චෙති, අඤ්චයති.

**අඤ්චු**. d භූ. ගතිපූජාසු, යාමෙහි හා පිදීමෙහි. අඤ්චති.

**අඤ්චති**. ක්‍රි-(අඤ්චු d ගතිමහි, පූජායං, යාමෙහි හෝ පිදීමෙහි + ති) යෙයි, පුදයි.

**අඤ්ජ**. d භූ-ලක්ඛණෙ පූජායං ච, ලකුණු කිරීමෙහි, ඇඳිනීමෙහි, පිදීමෙහි. අඤ්ජති.

**අඤ්ජති**. ක්‍රි-අඤ්ජ. d භූ + ති. ලකුණු කරයි. පුදයි.

**අඤ්ජි**. d භූ-අඤ්ජනෙ, ඇඳීමෙහි, ලකුණු කිරීමෙහි, අඤ්ජති.

**අඤ්ජු**. d භූ. ලක්ඛණාදිසු, ලකුණු කිරීමෙහි, ප්‍රකාශ කිරීමෙහි, යාමෙහි, බැලීමෙහි.

**අඤ්ජති**. ක්‍රි-(අඤ්ජු. d භූ. ව්‍යත්ති ගති-කන්ති-මක්ඛණෙසු, ප්‍රකාශ කිරීම, යාම, බැබලීම, ගෑම යන මෙහි + ති) ප්‍රකාශ කෙරෙයි, යෙයි, බබලයි, ගායි.

**අඤ්ජන**. න-අඳුන, ඇස ගාන අඳුන්.

**අඤ්ජන**. පු-එනම් දිග්ගජයා. කලුපාට.

**අඤ්ජනක්ඛි**. ති-අඳුන් ගානලද ඇස් ඇති.

**අඤ්ජනකරණ්ඩ**. පු-අඳුන් දමන භාජනය, අඳුන් හෙප්පුව දමන භාජනය.

**අඤ්ජනනාළි**. ඉ-අඳුන්දමන කුලාව, අඳුන් කුප්පිය.

**අඤ්ජනරුක්ඛ**. පු-එනම්ගස, අඳුන් රුක.

**අඤ්ජනවණ්ණ**. පු-අඳුන්වර්ණය, කලුපැය. ති ඒ ඇති.

**අඤ්ජනිසලාකා**. පු-අඳුන්ලහ, අඳුන්ගාන කූර,

**අඤ්ජනිසාකා** ඉ-අඳුන් කූර, අඳුන් ගාන පිත්සලය.

**අඤ්ජනී.** ඉ-අඳුන් කුලාව, අඳුන් පෙට්ටිය, අඳුන්කූර.

**අඤ්ජලි.** පු-ඇඳිලි, න-ඇඳිලි බැඳීම.

**අඤ්ජනිසිපාටි.** න-අඳුන් කරබියලිය, වෑ ආදි භාණ්ඩ දමන පසුම්බිය.

**අඤ්ජලිකරණීය.** ති-(අඤ්ජලි + කර + අනීය) ඇඳිලි බැඳිය යුතු, ඇඳිලි කිරීමට සුදුසු

**අඤ්ජලිකම්ම.** න-ඇඳිලි බැඳීම, දෙ අත් එකතු කොට ආචාර කිරීම, දසනඛසමොධානයෙන් කරණ වැඳීම.

**අඤ්ජලිකා.** ඉ-ඇඳිලි බැඳීම, අඤ්ජලිකර්මය.

**අඤ්ජස.** ති සෘජු, ඇද නැති.

**අඤ්ජස.** පු-මාර්ගය, පාර, සෘජුමාර්ගය, කුණු කටු නැති මඟ.

**අඤ්ජිත.** ති (අඤ්ජ් d හු ඉ + ත) අඳිනලද. අඳුන් ගානලද, හු කවිත ලද.

**අඤ්ඤ.** ති-අන්‍ය, අනික්, වෙන.

**අඤ්ඤතම.** ති-එක්තරා, සමූහයකින් එකෙක්, ඇතැම්.

**අඤ්ඤතර.** ති-එක්තරා, ඇතැම්.

**අඤ්ඤතිත්ථිය.** පු-(නිගණ්ඨාදී) අන්‍යතීර්ථකයෝ.

**අඤ්ඤත්ථ.** අ අන්‍යස්ථානයක, අන් තැනෙක, වෙන තැනෙක.

**අඤ්ඤත්ථික** ති-දැනගණුකැමැති, අවබොධකරගණු කැමැති.

**අඤ්ඤත්‍ර.** අ-අන්තන්හි, මෙයින් පිටත් තන්හි, ඇර, හැර.

**අඤ්ඤත්‍රඅධිමානා.** ඉ-අධිගත ධර්ම ඇත්තෙමි යන තද මාන නැතිව.

**අඤ්ඤථත්ත.** න-අන්‍යථාභාවය, අන්පරිද්දකින් වූව, සැකය.

**අඤ්ඤථා.** අ අන්පරිද්දකින්, අන්‍යාකාරයකින්.

**අඤ්ඤථාභාව.** පු අන්පරිද්දකින් වීම, විපර්‍යාසය.

**අඤ්ඤදත්ථු.** අ එකාන්ත යෙන් යන අර්ථයෙහි, සහතිකලෙස යන අර්ථයෙහි.

**අඤ්ඤදිට්ඨික.** ති-ශාසනයෙන් පිටත් අන්‍යලබ්ධි ගෙණ සිටින.

**අඤ්ඤදා.** අ-එක්කලෙක, වෙනකාලයක.

**අඤ්ඤබ්‍යාකරණ.** ති-රහත්බව පැවසීම.

**අඤ්ඤපදත්ථපධාන.** පු-සමාස වන පදයන්ගේ අර්ථය නොගෙණ වෙන පදයක අර්ථය ගැනීම, අන්‍යපදාර්ථ ප්‍රධාන බහුව්‍රීහි සමාසය.

**අඤ්ඤමඤ්ඤ.** න-අන්‍යොන්‍ය, එකිනෙක.

**අඤ්ඤවාද.** පු-අන්‍යවාදයක්, වෙනින් වාදයක්.

**අඤ්ඤවිහිත.** ති-අන්තන්හි පවත්වන ලද, අන්අරමුණුවල පවත්වනලද. නොයෙක් අරමුණුවල පැවැති.

**අඤ්ඤා.** ඉ-රහත්පලය, රහත්බව "අඤ්ඤා තු අරහත්තඤ්ඤාව"

**අඤ්ඤාකොණ්ඩඤ්ඤ.** පු-එතම් 1 වෙනි රහතන්වහන්සේ, කොණ්ඩඤ්ඤ තෙමේ චතුසත්‍යාවබොධය කළ හෙයින් අඤ්ඤා කොණ්ඩඤ්ඤ නම් විය.

**අඤ්ඤාචිත්ත.** න-රහත්සිත, අර්හත්ඵල සිත, දැනගැණීම පිණිස යොදනලද සිත.

**අඤ්ඤාණ.** න-(න-අ + ඤාණ) මොහය, නොදැන්ම, අවිද්‍යාව.

**අඤ්ඤාණක.** පු-නොදන්නා තැනැත්තා

**අඤ්ඤාණී.** පු-අඥයා, නොදන්නා තැනැත්තා, අඥානයා.

**අඤ්ඤාත.** ති (ආ + ඤා. d හු අවබොධෙ, දැනගැන්මෙහි + ත) දැනගන්නාලද, අවබොධකළ, දැනගත්.

**අඤ්ඤාත.** ති (න=අ + ඤා. d හු අවබොධෙ, දැනගැන්මෙහි + ත) නො දැනගත්තාලද, අවබොධ නො කළ, අප්‍රකට

**අඤ්ඤාතක.** ති - (න—අ + ඤාතක) අප්‍රසිද්ධ. නොනෑ, ඤාති නොවන. 'ඤාත' බලනු.

**අඤ්ඤාතකවෙස.** පු-අප්‍රසිද්ධවෙශය, රහසිගතව හැසිරීමේ ආකාරය, වෙස්වලාගැන්ම.

**අඤ්ඤාතාවී.** පු-දැනගත් තැනැත්තා, ප්‍රාඥයා

**අඤ්ඤාතු.** පු-දැනගත් තැනැත්තා. "ධම්මස්ස අඤ්ඤාතාරො භවිස්සන්ති."

**අඤ්ඤාතුකාම.** ති-දැනගණු කැමැති.

**අඤ්ඤාය.** පූ. ක්‍රි-(අ + ඤා d භූ. අවබොධෙ, දැනගැන්මෙහි + ත්වා + ආය) දැන, අවබොධ කොට, ති-න්‍යාය නොවන, (ඇත්නැව)

**අඤ්ඤාතාවින්ද්‍රිය.** න-අග්‍රීත්ඵලඥානය.

**අඤ්ඤාපටිවෙධ.** පු-රහත්බව ප්‍රතිවෙධ කිරීම.

**අඤ්ඤාවිමොක්ඛ.** පු-අඤ්ඤින්ද්‍රියයාගේ පයතීවසානයෙහි උපදනා විමොක්ෂය, ප්‍රඥාවිමුක්තිය, අග්‍රීත්ඵලය.

"පහාණං කාමසඤ්ඤානං
දෙමනස්සානචූභයං,
පිනස්ස ච පනුදනං
කුක්කුච්චානං නිවාරණං,
උපෙක්ඛාසතිසංසුද්ධං
ධම්මතක්කපුරෙ ජවං,
**අඤ්ඤාවිමොක්ඛං** පබ්‍රෑමි
අවිජ්ජායපපභෙදනං".

**අඤ්ඤින්ද්‍රිය.** න-ස්‍රොතාපත්තිඵලඥානය, සකෘදගාමි මාර්ගඥානය, සකෘදගාමිඵලඥානය, අනාගාමිමාර්ගඥානය, අනාගාමිඵල ඥානය, අර්හත්මාර්ගඥානය යන ඥාන සය.

**අඤ්ඤුද්දිස්ස.** ති-අනිකෙකු උදෙසා, අන්කෙනෙකු නිසා, වෙනකෙනෙකු වෙනුවෙන් දුන්.

**අඤ්ඤමඤ්ඤං.** න (අඤ්ඤ + අඤ්ඤ) අන්‍යොන්‍ය, එකිනෙකා.

**අට්ට** d චු-අනාදරෙ, අනාදරයෙහි අටෙට්ති, අට්ටයති.

**අට්ට.** පු-අටල්ල, අටලුගෙය, යුක්තිය, ඩබරය, පීඩාව, මහත.

**අට්ටක.** පු-අටල්ල, මහත, වෙදකර්තෘ වූ එනම් සෘෂියා.

**අට්ටති.** ක්‍රි (අට්ට d චු පීළායං. පීඩා වෙහි + ති) පීඩාකෙරෙයි, ඩබර කෙරෙයි.

**අට්ටස්සර.** පු (අට්ට + සර)මහානාදය, දුක්මුසු මහහඬ, "අට්ටස්සරං කරොන්තො විචරති".

**අට්ටාල(ක)** පු අටල්ල.

**අට්ටිත.** ති-පීඩිත, පෙළුනු, පිඩාවට පැමිණි.

**අට්ටීයති.** ක්‍රි-(අට්ට d චු. අනාදරෙ, අනාදරයෙහි. ණය + ඊ + ති) පෙළෙයි, දුක් වෙයි.

**අට්ඨ.** ති අට, අෂ්ට සඞ්ඛ්‍යාව.

**අට්ඨ.** පු අර්ථය, අරුත.

**අට්ඨඅභිභායතන.** න-විඤ්ඤාණ-ආකාස කසිණයන් හැර ඉතිරි අට, කසිණයන්හි අරමුණු අභිභවා උපදවාගත් රූපධ්‍යාන අට. "අභිභායතන" බලනු.

**අට්ඨක.** න-අෂ්ටකය පු-එනම් පසේබුදුවරයන් වහන්සේ.

**අට්ඨකථා** ඉ-අර්ථකථාව, අටුවාව, අර්ථප්‍රකාශ කරණ ග්‍රන්ථය. "යාය අත්ථං අභිවණ්ණයන්ති බ්‍යඤ්ජනත්ථං පදානුගං නිදානවත්ථු සම්බන්ධං එසා අට්ඨකථාවතා."

**අට්ඨකවග්ග.** පු-සූත්‍ර නිපාතයෙහි ගාථා අට අට ඇති කාමසූත්‍රය ආදී සූත්‍ර සොළසකින් යුත් වර්ගය.

**අට්ඨඞ්ග.** න-අඞ්ගඅට, අවයව අට, ති-අඞ්ග අටක් ඇති.

**අට්ඨඞ්ගඋපොසථ.** පු-අෂ්ටාඞ්ගශීලය, ශික්ෂාපද අටක් රක්ෂා කිරීම් වශයෙන් පොහෝදිනයන්හි රක්නා ශීලය.

**අට්ඨඞ්ගික.** ති (අට්ඨ + අඞ්ග + ඉක) අඞ්ගඅට කින් යුත්, කරුණු අටක් ඇති.

**අට්ඨඞ්ගිකස්සර.** පු අඞ්ගඅටක් ඇති ස්වරය.

විස්සට්ඨමඤ්ජුවිඤ්ඤෙය්‍යා
සවණීයා'විසාරිනො,
බින්දුගම්භීරනින්නාදිනෙවමට්ඨඞ්ගිකො
සරො.

විස්සට්ඨය, මඤ්ජුය, විඤ්ඤෙය්‍යය, සවණීයය, අවිසාරීය, බින්දුය, ගම්භීරය, නින්නාදීය යනු ස්වරයෙහි අඞ්ග අටයි.

**අට්ඨචත්තාළීසා.** ඉ-අටසාළිස, 48,

**අට්ඨතිංසති** / **අට්ඨතිංසා.** } ඉ-අටතිස. 38.

**අට්ඨනඛ** පු එක එක පාදයෙහි නියපොතු දෙක බැගින් පා සතරෙහි නියඅටක් ඇති සතා

**අට්ඨ(ට්ඨ)නවුති** ඉ-අටඅනූව, 98.

**අට්ඨපද.** න-එක එක පෙළට පද (=අල්ලී) අට අට සිටින්ට තනන ක්‍රීඩාපුවරුවක්, දූ පෝරුවක්.

**අට්ඨපදක.** න-අෂ්ටපදය, පා අටක් ඇත්ත.

**අට්ඨපාද.** පු-පා අටක් ඇත්තා, මකුළුවා, ශරභමෘගයා. ‘‘සරභ’’ බලනු.

**අට්ඨම(ක.)** ති-අටවෙනි. එනම් පසේබුදුන් වහන්සේ.

**අට්ඨමඞ්ගල** න-අටමඟල; සඞ්ඛ, චක්ක, පුණ්ණකුම්භ, ගදා, සිරිවච්ඡ, අඞ්කුස, ධජ, සොවත්ථික යයි කියන ලද සක්ගෙඩිය, චක්‍රලක්ෂණය, පුන්කලසය, ගදායුධය, සිරිවසය, අකුස්සය, ධවජය, සෝවැතිය යන මගුල් ලකුණු අට. බ්‍රාහමණ, ගො, හුතාශන, සවර්ණ, ඝෘත, ආදිත්‍ය, ජල, රාජ යන අට හෝ සිංහ, වෘෂ, හස්ති, ජලකුම්භ, ව්‍යඥ්ජන, ධවජ, සඞ්ඛ, දීප යන අට, පු-මගුල් ලකුණු අටක් පිහිටි අශ්වයා.

**අට්ඨමඞ්ගලස්ස** පු-ඔලුව, වාලධිය, බෙල්ල, දෑලවර, සිවුකුරය යන අටතන්හි සුදු ලප පිහිටි ශ්‍රෙෂ්ඨ අශ්වයා.

**අට්ඨමහාපුරිසවිතක්ක.** පු-1. අප්පිච්ඡස්සායං ධම්මො, නායං ධම්මො මහිච්ඡස්ස; 2. සන්තුට්ඨස්සායං ධම්මො, නායං ධම්මො අසන්තුට්ඨස්ස; 3. පවිවිත්තස්සායං ධම්මො, නායං ධම්මො සඞ්ගණිකාරාමස්ස; 4. ආරද්ධවිරියස්සායං ධම්මො, නායං ධම්මො කුසීතස්ස; 5. උපට්ඨිතසතිස්සායං ධම්මො, නායං ධම්මො මුට්ඨස්සතිස්ස; 6. සමාහිතස්සායං ධම්මො, නායං ධම්මො අසමාහිතස්ස; 7. පඤ්ඤවතො අයං ධම්මො, නායං ධම්මො දුප්පඤ්ඤස්ස; 8. නිප්පපඤ්චාරාමස්සායං ධම්මො නිප්පපඤ්චරතිනො, නායං ධම්මො පපඤ්චාරාමස්ස පපඤ්චරතිනො; යන විතර්ක අට. (අඞ්ගුත්තර. 8. නි.)

**අට්ඨමිච්ඡත්ත.** න-මිච්ඡාදිට්ඨි, මිච්ඡාසඞ්කප්ප, මිච්ඡාවාචා, මිච්ඡාකම්මන්ත, මිච්ඡාආජීව, මිච්ඡාවායාම, මිච්ඡාසති, මිච්ඡාසමාධි යන අට.

**අට්ඨවිජ්ජා.** ඉ-විදර්ශනාදී ඥාණ අට.

විපස්සනාඤාණමනොමයිද්ධි
ඉද්ධිප්පභෙදො ‘පිච දිබ්බසොතං,
පරස්ස චෙතොපරියායඤාණං
පුබ්බෙනිවාසානුගතඤ්ච ඤාණං,
දිබ්බඤ්ච චක්ඛාසවසඞ්ඛයො ච
එතානි ඤාණානි ඉධට්ඨවිජ්ජා.

විදර්ශනාඥානය, මනොමයඍද්ධිය, ඍද්ධිප්‍රභෙද ඥානය, දිව්‍ය ශ්‍රොත්‍රඥානය, පරචිත්තවිජානනඥානය, පූර්වෙනිවාසානුස්මෘති ඥානය, දිව්‍යචක්ෂුරභිඥානය, ආශ්‍රවක්ෂයකරඥානය යන නුවණ අට.

**අට්ඨවිධ.** ති-අෂ්ටප්‍රකාර, අටවැදෑරුම්.

**අට්ඨවිධකායපාගබ්භිය.** න-කය පිළිබඳ බුහුටි බැව් (=නොහික්මුනු කම්) අට. ‘කායපාගබ්භිය’ බලනු.

**අට්ඨවිධදුක්කට.** න-1. පුබ්බපයොග දුක්කට, සහපයොගදුක්කට, අනාමාසදුක්කට, දුරූපචිණ්ණදුක්කට, විනයදුක්කට, ඤාතදුක්කට, ඤත්තිදුක්කට, පටිස්සවදුක්කට යන අට.

**අට්ඨවිධපාන.** න-අෂ්ටප්‍රකාර පානවර්ග. මී, මුද්දිරප්පලම්, බොරළුදමුනු, උපුල්අල, ඇටකෙසෙල්, මස්කෙසෙල්, අඹ, දඹ යන අෂ්ටවර්ගයෙන් කළ පානවර්ග අට.

**අට්ඨවිමොක්ඛ.** පු-විඤ්ඤාණ ආකාසකසිණයන් හැර ඉතිරි අට කසුණුහි විමොක්ඛ වසයෙන් උපදවාගත් රූපාවචරධ්‍යාන අට. (අත්ථසාලිනී විමොක්ඛ කථා බලනු.)

**අට්ඨවීසති.** ඉ-අටවිස්ස. 28.

**අට්ඨසත.** න-එකසිය අට, 108.

**අට්ඨසතතණ්හා.** ඉ එකසිය අටක් ප්‍රභෙද ඇති තෘෂ්ණාව.
රූපතණ්හා, සද්දතණ්හා, ගන්ධතණ්හා, රසතණ්හා, ඵොට්ඨබ්බතණ්හා, ධම්මතණ්හා යන සය කාම රූප අරූප යන තුණෙන් ගුණ කළ කල්හි 18 ක් වේ. එය ආධ්‍යාත්මික බාහිර දෙකින් ගුණ කළ කල්හි 36 ක් වේ. එය නැවත අතීත අනාගත වර්තමාන යන තුණෙන් ගුණ කළ කල 108 ක් වේ.

**අට්ඨංස.** ති-(අට්ඨ + අංස) අටැස්, අටපැති ඇති, අටපට්ටම්.

**අට්ඨාදස.** ති-දස අට, 18.

**අට්ඨාන.** න-නිකරුණ, සිදුනොවන කාරණය, හෙතුරහිත කාරණය.

**අට්ඨානරියවොහාර.** පු-අනාර්‍ය්‍යව්‍යවහාර අට, සදොස් කථා අට. එනම්: අදිට්ඨෙ දිට්ඨවාදිතා, අසුතෙ සිතවාදිතා, අමුතෙ මුතවාදිතා, අවිඤ්ඤාතෙ විඤ්ඤාතවාදිතා, දිට්ඨෙ

අද්දිට්ඨවාදිතා, සුතෙ අසුතවාදිතා, මුතෙ අමුතවාදිතා, විඤ්ඤතෙ අවිඤ්ඤතවාදිතා =නොදක්නා ලද්ද දක්නා ලදැයි කීම, නො අසන ලද්ද අසනලදැයි කීම, ඝාණ ජිව්හා කාය යන තුණෙන් සපශී කොට නො දැනගන්නා ලද්ද එසේ දැනගත්තා ලදැයි කීම, මනො විඤ්ඤණයෙන් නො දැනගත්තා ලද්ද එසේ දැනගත්තා ලදැයි කීම යන සතර හා දත්තා ලද්ද නො දන්නා ලදැයි කීම යනාදී වූ මීට ප්‍රතිපක්ෂ කීම් සතරද යන අටයි.

**අට්ඨාන සමපයොගනය.** පු-පදලාලිත්‍යාදිය සඳහා යෙදිය යුත්තන් නුසුදුසු තැනෙක්හි යෙදීමේ නීතිය.

**අට්ඨාසි** ක්‍රි-(අ + ඨා. d. භූ. ගතිනිවුත්තියං= ගමන් නැවැත්මෙහි-ස + ඊ) සිටියේය.

**අට්ඨි.** d රු-ගතියං, ගමන්හි, අණ්ඨති, ගමන් කෙරෙයි.

**අට්ඨි.** ති-(අට්ඨ + ඉ) අඩිවත්, අඩි ඇති.

**අට්ඨි.** න-අස්ථි, ඇට, එලාදීන්ගේ බීජ.

**අට්ඨි.** පු-අකුරු දහසයකින් යුත් ඡන්දස, අෂ්ටි නම් ඡන්දස.

**අට්ඨික.** න-ඇටය, අස්ථිකය, ඇටසැකිල්ල.

**අට්ඨිකදලි.** ඉ ඇටකෙහෙල්, ඇටවලින් යුත් කෙහෙල්.

**අට්ඨිකඞ්කල.** පු-ඇටසැකිල්ල, අස්ථිපුඤ්ජය.

**අට්ඨිකල්‍යාණ.** න-උත්තම සත්‍රීන්ගේ ශරීරයෙහි පිහිටන කල්‍යාණ ලක්ෂණවලින් එකක්- "පඤ්චකල්‍යාණ" බලනු.

**අට්ඨිකසඞ්ඛ.** ඉ-ඇටසැකිල්ලය යන සංඥව.

**අට්ඨිත.** ති (අ + ඨා d. භූ. ගතිනිවුත්තියං= ගමන් වැළැක්මෙහි-ඉ + ත) නො සිටි.

**අට්ඨිමය** ති-ඇටමුවං, ඇටවලින් නිපදවන ලද, ඇටවලින් කළ.

**අට්ඨිමිඤ්ජ.** න-ඇටමිදුලු, ඇටතුළ පවත්නා මොලය,

**අට්ඨිල්ල.** න-වටකුරු කුඩාගල, වටකුරු බොරළුකැටය.

**අට්ඨි(ක)සඞ්ඛලිකා.** ඉ-ඇටසැකිල්ල.

**අට්ඨිසඞ්ඝාට.** පු-ඇට ගැළපීම, ඇටසැකිල්ල.

**අට්ඨිසඤ්චය.** පු-ඇටරැස, ඇටගොඩ.

**අට.** d භූ-ගතියං, යාමෙහි, අටති.

**අට.** d තු-අටනෙ, හැසිරීමෙහි, අටති.

**අටට** න-එනම් නිරය. එනම් ගණන, අබබ. කෝටි සියක් ලක්ෂය. 'අබබ' බලනු.

**අටන.** න-හැසිරීම, ඉබාගාතේ යාම, එහෙ මෙහෙ යාම.

**අටනි(නී).** ඉ-ඇඳ, ඇඳවත, ඇඳවියල, ඇඳ-විට්ටම.

**අටල.** න-සනදෙය, තුනී නො වන දෙය. ති-ශක්තිමත්, බලවත්.

**අටලි.** ඉ-ගණ්ඩගණ්ඩුපාහනය, සම්පටකිපයක් ඇති වහන, ශක්තිමත් මිරිවැඩිය.

**අටවිරක්ඛිත.** පු-කැලය රකින්නා, කැලෑ-මුලාදෑනියා.

**අටවිසංකොප.** පු-වනචර සොරුන්ගේ කොපය, පල්හොරුන්ගේ කිපීම, වල්-හොරුන්ගේ කිපීම.

**අටවි.** ඉ-වනය, අරණ්‍යය, කැලෑව.

**අටවිමුඛ.** න-වන දොර, වනයට ඇතුල්වන තැන.

**අඩ්ඩ.** d. භූ-අභියොගයෙහි, මනා යෙදීමෙහි, අඩ්ඩති, උත්සාහ කෙරෙයි, මනාව යොදයි.

**අඩ්ඪ.** ති-ආඪ්‍ය, උපභොග පරිභොග වස්තූන් ගෙන් සම්පූර්ණ, ධනවත්, පු-ඊශ්වරයා, ආඪ්‍යයා, කොටස. න-සමභාගය.

**අඩ්ඪක.** පු-ආඪ්‍යයා, ඊශ්වරයා, මහත් සම්පත් ඇත්තා.

**අඩ්ඪක්ඛික.** පු-අඩියක් ඇස් ඇත්තා, කණා, එක ඇසක් නැත්තා.

**අඩ්ඪකුසි** ඉ-සරස්නුවාව, සිවුරෙහි සරස් අතට ඇති නුවාපටිය.

**අඩ්ඪට්ඨ** න-අටෙන් අඩිය, සතර, අඩකින් අට පිරෙණ ගණන, හතහමාර.

**අඩ්ඪතිය.** } ති-අඩියක් අඩුතුණ, දෙකහමාර.
**අඩ්ඪතෙය්‍ය** } "අඩ්ඪතියසික්ඛාපද සතානි."

**අඩ්ඪතෙය්‍යහත්ථ.** න-දෙරියන් වියත.

**අඩ්ඪතෙළස.** ති-අඩියක් සහිත තෙළෙස, අඩතෙළෙස, දොළහමාර.

**අඩ්ඪදණ්ඩ(ක)**. පු-දෙරියන් පමණ වූ මුගුර. "අඩ්ඪදණ්ඩකෙහිපි තාළෙන්ති".

**අඩ්ඪමාස**. පු අර්ධමාසය, දින පසළොස.

**අඩ්ඪමාසක**. න-අර්ධමාසකය, මාසක භාගය. 'මාසක' බලනු.

**අඩ්ඪමාසික**. ති-අඩමසකට සෑහෙන, අඩ-මසකට අයත්.

**අඩ්ඪමුණ්ඩක**. පු-හිස අඩක් මුඩු තැනැත්තේ. ති-අඩක්මුඩු, පැත්තක ඉසකෙස් කැපීම ඇති.

**අඩ්ඪයොග**. පු-ගරුඩපක්ෂාකාර සෙවෙනි ඇති ගෘහය, ගුරුළා දෙපැත්තට තටු විදහාගත් පරිදි වූ පියස්සෙන් යුත් ගෘහය, පලදෙකේ ගෙය.

**අඩ්ඪයොජන**. න අඩයොදුන, යොදුනෙන් බාගය, දෙගව්ව.

**අඩ්ඪරත්ත**. පු-අර්ධරාත්‍රිය, මධ්‍යම රාත්‍රියෙන් කොටසක්.

**අඩ්ඪරත්ති**. ඉ-අර්ධරාත්‍රිය, මධ්‍යමරාත්‍රිය.

**අඩ්ඪාළ්හක** පු-ආළ්හකයෙන් අර්ධය, දෙපත.

**අඩ්ඪුඩ්ඪ**. ති-අර්ධයක් අඩු සතර, තුනහමාර. "අඩ්ඪුඩ්ඪානි පාටිහාරිය සහස්සානි දස්සෙත්වා".

**අඩ්ඪුරක** න උදරයෙහි රොමරාජිය තැබීම.

**අඩි**. d. රු අණ්ඩත්තෙ, අණ්ඩසංඛ්‍යාත ලිඞ්ගාර්ථයෙහි, අණ්ඩති,

**අණ්ඩ** පු න-අණ්ඩකොෂය, පක්ෂි ආදීන්ගේ බිජුවට, පුරුෂ නිමිත්ත, දිය පසුම්බිය.

**අණ්ඩක**. පු-බිජුවටින් උපන් සත්වයා, පක්ෂියා, මත්ස්‍යයා. ති-රළු.

**අණ්ඩජ**. පු-බිජුවටින් උපන්නහු, පක්ෂි සර්ප ආදීහු

**අණ්ඩජ**. ති-බිජුවටින් උපදනා (සත්වයා.)

**අණ්ඩසම්භව**. පු-අණ්ඩජයා.

**අණ්ඩූපක**. න-දරණුව, සුඹුළුව

**අණ්ණ**. න-ජලය, දිය.

**අණ්ණව**. පු-සමුද්‍රය, මුහුද, යටත්පිරිසෙයින් යොදුනක් ගැඹුර හා පළල ඇති ජලාශයද අර්ණව යයි කියනු ලැබේ.

**අණ්ණවකුච්ඡි**. ඉ-අර්ණවකුක්ෂිය, සමුද්‍රය, මුහුද, "අණ්ණව කුච්ඡිං ඔභාසයමානො බාලසුරියො විය."

**අණ**. d භූ-සද්දෙ, ශබ්ද කිරීමෙහි, අණති, ශබ්ද කරයි.

**අණ** න-ඍණ, නය.

**අණිම**. පු-සෘද්ධියෙන් ශරීරය කුඩා බවට පැමිණවීම.

**අණී** (නී) **ක** න-බලසෙනඟ, යුධහමුදාව, ඇනිය.

**අණීකට්ඨ**. පු-රජුන්ගේ ශරීරාක්ෂක සමුදාව, රජුන්ගේ ආරක්ෂක හමුදාව.

**අණීකිනී**. ඉ-සෙනාව, සෙනාභෙදය.

**අණු**. ති-ස්වල්පය. පු-පරමාණු. "පරමාණු" බලනු.

**අණුක** ති-ස්වල්පමාත්‍රය, ටිකදෙය, මදපමණ.

**අණුමත්ත**. ති-ස්වල්පමාත්‍රය, ස්වල්පප්‍රමාණය, මදපමණ.

**අණුසහගත**. ති-එකාබද්ධ, එකට බැඳී පවත්නා.

**අත්ත**. පු-විඥානය, සිත. ශරීරය. ස්වභාවය. පරපරිකල්පිත ආත්මය. පරමාත්මය.

**අත්තකත**. ති-තමා විසින් කළ, තමා විසින් උපදවන ලද.

**අත්තකාම**. පු-තමාට වැඩ කැමැති තැනැත්තා.

**අත්තකාර**. පු-අහඞ්කාරය.

**අත්තකිලමථ**. පු-ආත්මක්ලමථය, තමාගේ ශරීරයට වෙහෙස දීම.

**අත්තකිලමථානුයොග**. පු-ශරීරය ක්ලාන්ත කිරීමෙහි යෙදීම, ශරීරයට දුක් දීමේ යෙදීම, පූරාණ කාශ්‍යපාදි තීර්ථකයන් විසින් කෙලෙස් නැවීමේ උපායයි ලොව ප්‍රකට කළ තමාට පීඩා පමුණුවන තවුස් දම්හි යෙදීම්, අත්තකිලමථානුයොගය හා කාම-සුඛල්ලිකානුයොගයත් අත්හලයුතු අන්ත දෙකකැයි බුදුහු වදාළ සේක.

**අත්තගුත්ත** . ති-තමා පිණිස රැකගන්නාලද

**අත්තගුත්තා**. ඉ-වඳුරු මෑ.

**අත්තගුත්ති.** ඉ-ආත්මගොපනය, තමා රැක ගැණීම.

**අත්තසඤ්ඤ.** ති-ආත්මවධය, තමා නැසීම.

**අත්තඝොෂ.** පු-තමාගේ නාමය ඝොෂා කරන්නා, තමාගේ නම කියා ගන්නා, කොහා, කවුඩා.

**අත්තජ.** පු-තමාගෙන් උපන් දරුවා, තමාට දා දරුවා.

**අත්තඤ්ඤූ.** පු-තමන් දන්නා තැනැත්තා, තමාගේ තත්ත්වය දත් තැනැත්තා.

**අත්තත්ථ.** පු-(අත්ත + අත්ථ) ආත්මාර්ථය, දිට්ඨධම්මික - සම්පරායික - ලෞකික ලොකොත්තර වූ තමා පිළිබඳ ව පවත්නා අර්ථය

**අත්තදණ්ඩ.** පු-තමාට දඬුවම් දීම, තම ශරීරයට දුක් දීම.

**අත්තදමන** පු-ආත්මදමනය කළ තැනැත්තා.

**අත්තදිට්ඨි.** ඉ-ආත්මදෘෂ්ටිය, සක්කායදිට්ඨිය.

**අත්තදීප.** පු-තමාගේ ප්‍රතිෂ්ඨාව. ති- තමාම පිහිටකොට ඇති.

**අත්තන්තප.** පු-තමා තැවීම කරන්නේ, අත්මකලමථය කරන්නේ.

**අත්තනිය.** ති-තමා අයත්, සවකීය, තමා සතු.

**අත්තනො පද** න- වත්තමානාදි අට්ඨවිභක්තීන් ගේ පරව ඇති පද සය සවකීය ප්‍රයොජනය සඳහා වූ පද අත්තනො පද නම්. මේ වෛයාකරණයන්ගේ ව්‍යවහාරයකි.

**අත්තපටිලාභ.** පු- ආත්මභාව ප්‍රතිලාභය, උත්පත්තිය ලැබීම.

**අත්තපරිත්ත** න-ආත්මාරක්ෂාව, තමා රැකීම.

**අත්තපරිතාපන** න-ආත්මකලමථානුයොගය, තමා තැවීම.

**අත්තපරිභව** පු-තමාට ලැබෙන පරිභවය.

**අත්තභාව.** පු-ආත්මභාවය, උත්පත්තිය, ශරීරය.

**අත්තභූ.** පු-බ්‍රහමයා. මහාබ්‍රහමයා.

**අත්තමන** ති-සතුටුසිත් ඇති, ප්‍රසන්නසිත් ඇති.

**අත්තමනතා.** ඉ-ප්‍රසන්නසිත් ඇතිබව, සතුටු-සිත් ඇතිබව.

**අත්තමාන.** පු-"මම මෙබඳු කෙනෙක්මි"යි තමා කෙරෙහි පවත්නා මානය.

**අත්තවධ.** පු-ආත්මවධය, ශරීරයට හෝ තමාට ලැබෙන වධය.

**අත්තවාද.** පු-ආත්මවාදය, ආත්මදෘෂ්ටිය, සක්කායදිට්ඨිය.

**අත්තව්‍යාබාධ.** පු-ශරීරපීඩාව. තමාට ලැබෙන පීඩාව.

**අත්තවෙතනභත.** පු-තමාගේම මහන්සියෙන් ජීවත් වන තැනැත්තා.

**අත්තසම්භව.** ති-තමාගෙන් උපන්, තමාගෙන් හටගත්. පු-ආත්මභාවලාභය.

**අත්තසම්භූත.** ති-තමාගෙන් උපන්.

**අත්තසරණ.** න-තමාගේ හෝ තමාට පිහිට කොට ඇති.

**අත්තහිත** ති-තමාට වැඩ කැමති, තමාගේ අභිවෘද්ධිය කැමති.

**අත්තාධිප.** පු-තමාම අධිපති කොට පවත්වන තැනැත්තා.

**අත්තාධිපක.** පු-තමා අධිපති කොට ඇත්තා.

**අත්තාධිපතෙය්‍ය.** න-තමා අධිපති කොට පවත්නා බව, පු-තමාගේ ගුණය අධිපති කොට (ප්‍රධාන කොට) ගෙණ දුසිරිතෙන් මිදී සුසිරිතෙහි යෙදී වාසය කරණ තැනැත්තා.

**අත්තාධීන.** ති-තමාට අයිති, තමා පිළිබඳ.

**අත්තානත්ථ.** පු-(අත්ත + අනත්ථ) ආත්මානර්ථය, තමහට අවැඩ.

**අත්තානුදිට්ඨි.** ඉ-ආත්මදෘෂ්ටිය, සක්කායදිඨිය.

**අත්තානුයොග.** පු-තමා යෙදීම, තමා ක්‍රියාවක යෙදවීම.

**අත්තානුවාද.** පු-තමාට අපවාද කීම, තමාට දොස් පහළ කිරීම.

**අත්තානුවාදභය.** න-තමාට අන්‍යයාගෙන් ලැබෙන ගැරහීම් ආදියට බිය වීම.

**අත්තිච්ඡක.** පු-තමන් පිණිස යමක් කැමැති වීම,

**අනතිලිඞ්ග** ති-(නත්ථි ලිඞ්ගං = අනත්ථිලිඞ්ගං) පුල්ලිඞ්ග ස්ත්‍රී ලිඞ්ගාදි ව්‍යවහාරයක් නැති දෙය, ආඛ්‍යාතය.

**අනත්තුක්කංසන.** න-(අත්ත + උ + කංසන)තමා උසස් කිරීම.

**අනත්තුද්දේස.** ති-තමා උදෙසා පැවති, තමා නිසා පවත්නා.

**අත්තූපනායික.** පු-(අත්ත + උප + නායික) තමා වෙත එළවන ලද, තමා වෙත පමුණු වන ලද.

**අතෙතසා.** ඉ-ඔසප් වූ ස්ත්‍රී, මල්වර වූ තැනැත්තී.

**අත්ථ.** d. චු-යාචනෙ, ඉල්ලීමෙහි. අත්ථේති, අත්ථයති, ඉල්වයි.

**අත්ථ.** අ-මෙහි.

**අත්ථ.** පු-ප්‍රයෝජනය, ශබ්දාර්ථය, අභිවෘද්ධිය, ධනය, ද්‍රව්‍යය, ගුණය. කර්මාදිපදාර්ථ, කරුණු, විනාශ, පථ්‍ය, අවරපර්තය යනාදියෙහි. න-අස්තයට යාම.

**අත්ථං.** අ-විනාශය, නැසීම.

**අත්ථංගම.** පු-අස්තයට යාම. ඉරහඳ බැසීම.

**අත්ථකථා.** ඉ-අටුවාව, පදාර්ථ වර්ණනාව.

**අත්ථකර.** පු-වැඩකරු, හිතවත් තැනැත්තා, යහපත කරන්නා.

**අත්ථකරණ.** ති-වැඩ කරණ, අභිවෘද්ධිය සිදුකරණ.

**අත්ථකාම.** ති-වැඩ කැමැති, හිතකැමැති.

**අත්ථකුසල.** ති-අර්ථයෙහි දක්ෂ, වැඩෙහි දක්ෂ.

**අත්ථගම.** පු-අස්තයට යාම, ඉරහඳ බැස යාම. විනාශය.

**අත්ථගමන.** න-අස්තයට යාම, විනාශයට යාම.

**අත්ථග්ගහණ.** න-සූත්‍රයන්හි අත්ථ ශබ්දයාගේ ගැණීම.

**අත්තඝාත.** ති-සිය පණ නැසීම, තමා මැරීම.

**අත්ථචර.** පු අභිවෘද්ධියෙහි හැසිරෙණ තැනැත්තා.

**අත්ථජෝතක.** පු-අර්ථය බබුලුවන්නා.

**අත්ථචරියා.** ඉ-යහපතෙහි හැසිරීම.

**අත්ථඤ්ඤූ.** පු-අර්ථය දත් තැනැත්තා.

**අත්ථත.** ති-අතුළ, අතුරණලද.

**අත්ථමත්ත** න-පුරුෂ, රුක්ඛ ආදි ලිඞ්ග අභිධෙය මාත්‍රය.

**අත්ථත්ථනය.** පු-නිද්දෙස වශයෙන් දක්වන ලද අර්ථයෙහි විස්තර ප්‍රතිනිර්දේශ වශයෙන් දැක්වීමේ ක්‍රමය.

**අත්ථබ්‍යත්ති.** ඉ-අර්ථයාගේ පැහැදිලි බව

**අත්ථදස.** පු-හිත අනුව බලන්නා, වැඩක් දන්නා තැනැත්තා.

**අත්ථදස්සී.** පු-අර්ථය දක්නා සුලු තැනැත්තා

**අත්ථධම්ම.** පු-අර්ථය හා ධර්මය.

**අත්ථනය.** පු-අර්ථ වශයෙන් ශබ්දයන් දැනගැනීම හා ප්‍රත්‍යක්ෂ, අවකල්පන, අනුමාන වශයෙන් අර්ථය දැන ගැණීමේ ක්‍රමය-රීතිය-නියමය.

**අත්ථ්‍යත්ථතද්ධිත.** න-අස්ත්‍යර්ථ ප්‍රත්‍යයන් ගේ තද්ධිතය.

**අත්ථසඞ්ඛ.** පු-ක්‍රියා කාරක ආදිවශයෙන් අර්ථයා ගේ සංඛ්‍යාතය.

**අත්ථන්තර.** න-අර්ථාන්තරය, අනික් තේරුම.

**අත්ථන්තර විඤ්ඤාපන.** න-වෙන අර්ථයක් ඇඟවීම.

**අත්ථනා.** ඉ-යාච්ඤාව, ඉල්ලීම.

**අත්ථපටිසම්භිදා.** ඉ-අර්ථාවබෝධය, අර්ථයෙහි ඥානය.

**අත්ථපටිසංවේදී.** පු-අර්ථය දන්නාසුලු තැනැත්තා.

**අත්ථපද.** න-අර්ථ හා පද. අර්ථය පිළිබඳ ෂඩ්විධ පද. සඞ්කාසනා, පකාසනා, විවරණා, විභජනා, උත්තානීකම්ම, පඤ්ඤත්ති යන සය.

**අත්ථපදත්ථකනය.** පු-ඉති ශබ්දය හා නොයෙදී තනිව යෙදෙන අර්ථාවබෝධක පද ක්‍රමය.

**අත්ථපූරණ.** න-අපි, සක්කා, අඤ්ඤදත්‍ථු, එව ආදී අර්ථ පූරණය සඳහා යෙදෙන නිපාත.

**අත්ථභඤ්ජන.** න-අර්ථය නැසීම, වැඩ නැසීම, අභිවෘද්ධිවිනාශය.

**අත්ථමිත**. ති-අස්තයට පැමිණි, අවරගිරට ගිය.

**අත්ථමත්ත**. න-පුරිසආත්ම ආදී වූ ලිඞ්ගයාගේ අභිධෙය්‍ය මාත්‍රය.

**අත්ථරක**. පු ඇතිරීම කරන්නා.

**අත්ථරණ**. න-ඇතිරීම, ඇතිරිල්ල, ඇතුන් පිට අතුරණ චිත්‍ර කම්බිලිය.

**අත්ථරති**. ක්‍රි (අ + ථර d. භූ + ති) අතුරයි, ඇතිරිලි එලයි.

**අත්ථරස**. පු-අර්ථ රසය, අර්ථය දැනගැණීමෙන් ඇතිවන ප්‍රීතිරසය. සෝවාන් ආදි සතරමග-පල ලැබීමෙන් ඇතිවන රසය.

**අත්ථවසික**. ති-අර්ථයට වසඟ, කාරණයෙහි ඇලුනු.

**අත්ථවාදී**. පු-අර්ථවාදියා, අර්ථය කියන සුලු තැනැත්තා.

**අත්ථසත්ථ**. පු-අර්ථශාස්ත්‍රය, ධන ඉපයීම පිළිබඳ ශාස්ත්‍රය.

**අත්ථසන්දස්සන**. න-අර්ථ දැක්වීම, අර්ථය ප්‍රකාශ කර දීම.

**අත්ථසංවණ්ණනා**. ඉ-අර්ථවණ්ණනාව අර්ථ-කථාව, අටුවාව.

**අත්ථසමපච්චය**. පු-අර්ථය හොඳ හැටි තේරුම් ගැණීම,

**අත්ථසංහිත**. ති-අර්ථයෙන් යුක්ත, අර්ථය හා සෙදී පවත්නා.

**අත්ථසිද්ධි**. ඉ-අර්ථසිද්ධිය. මනොරථ සිද්ධිය. අදහස් සම්පූර්ණ වීම.

**අත්ථසො**. අ-අර්ථවශයෙන්, කරුණුවසයෙන්, හෙතුවසයෙන්.

**අත්ථාභිසමය**. පු-අර්ථාවබොධය. අර්ථඥානය.

**අත්ථාලඞ්කාර**. පු-එනම් අලඞ්කාරය.

**අත්ථාර**, පු-ඇතිරීම, පතුරුවා හැරීම, දිග හැරීම.

**අත්ථානතිදෙස**. පු-අර්ථය නො කියා හැරීම.

**අත්ථි**. අ-ඇත, ඇත්තේය, විද්‍යමානභාවයෙහි.

**අත්ථික**. පු-යාචකයා. ති-අර්ථ ඇති, පල ඇති, ප්‍රයොජන ඇති.

**අත්ථිතා**. ඉ-විද්‍යමානභාවය, ඇතිබව.

**අත්ථිභාව**. පු-විද්‍යමානභාවය, ඇතිබව.

**අත්ථිය**. පු-'අත්ථික' බලනු.

**අත්ථී**. පු-යාචකයා. ති-ඉල්වන.

**අත්ථු**. අ-ඊෂත්පූර්වක උපගමනයෙහි.

**අත්ථු**. ක්‍රි (අස d භූ. භුවි, වීමෙහි + තු=ත්ථු. ධාත්වන්තයට ලොපයි.) වේවා, සිදු වේවා.

**අත්ථුද්ධාර**. පු අර්ථොද්ධාරය, අර්ථ උපුටා ගැන්ම.

**අත්ථුප්පත්ති**. ඉ-අර්ථොත්පත්තිය, කාරණයක් ඇති වීම.

**අත්ථුපපරික්ඛා**. ඉ-අර්ථ පරීක්ෂා කිරීම.

**අත්ථුපසංහිත**. ති-අර්ථයෙන් යුක්ත, අර්ථවත්.

**අත්‍ර**. අ-මෙහි යන අර්ථයෙහි.

**අත්‍රජ**. පු-තමාට දාව උපන් තැනැත්තා, දරුවා.

**අත්‍රිච්ඡ**. ති අධික ආශා ඇති.

**අත්‍රිච්ඡා** ඉ අධිකාශාව, බලවත් තෘෂ්ණාව.

**අත්‍රිච්ඡතා** ඉ-අධිකආශා ඇතිබව, බලවත් ආශා ඇතිබව.

**අත**. d භූ. සාතත්‍යවගමනෙ, නිත්‍යගමනයෙහි; අතති, නිත්‍යයෙන් යෙයි.

**අතක්ක**. ති-තර්කරහිත, තර්කණය කිරීම නැති.

**අතක්කාවචර**. ති-තර්කයෙන් බැසගත නොහැකි.

**අතක්කික**. ති-තර්කණය නොකරණ, තාර්කික නොවන.

**අතක්කිත**. ති-තර්කණය නොකළ, තර්කණ රහිත ව පැවති.

**අතග්ගුණ සංවිඤ්ඤාණ**. පු-බහුව්‍රීහි සමාස යෙහි විශෙෂණවූ අර්ථය අන්‍ය පදාර්ථ ග්‍රහණ යෙන් නොගන්නා ලැබේ නම් එයයි.

**අතච්ඡ**. ති-අසත්‍ය, බොරු.

**අතන්තතා**. ඉ (න=අ + තන්ත) අප්‍රධාන භාවය.

**අතන්දි** ති-(අ + තන්දි) අකුසීත, තෙමිරි නැති.

**අතප්ප**. න-බ්‍රහ්මලෝක 16 න් 13 වැන්න අතප්පයි. තැවීමක් නැති නිසා අතප්ප යයිද කියති. මහා කල්ප 2000 ක් මෙහි ආයුෂ වෙයි.

**අතප්පිය.** ති-තෘප්තියට නො පැමිණවිය හැකි, තෘප්තිරහිත.

**අතමමය.** පු-තෘෂ්ණාදෘෂ්ටිමානරහිත, තෘෂ්ණා දිට්ඨිමානයෝ තමමය නම් වෙත්. ඔවුන්ගේ අභාවය අතමමය නම් වේ.

**අතලම්පස්ස.** ති-පතුල නො දතහැකි ගැඹුරු, ඉතාගැඹුරු.

**අතාණ.** ති-රක්‍ෂාස්ථානයක් නැති, ආරක්‍ෂා නැති

**අතාරණ.** න-තරණය නොකිරීම, එගොඩ නොවීම, එතර නොවීම.

**අතරමාන.** ති-ඉක්මන් නොවන, කඩිසර නොවන. 'තරමාන' බලනු

**අතරි.** ක්‍රි-(අ + තර. d භූ තරණෙ, එතර වීමෙහි + ඊ) එතෙර වූයේ ය, පීනුයේ ය.

**අතාරි.** ක්‍රි-'අතරි' බලනු.

**අති.** අ-අතිශය, අනතිභාව, භෘශාර්ථ, පූජා, අතික්‍රමණ, අතීතත්‍ව, ප්‍රශංසා, දෘඪ යනාදියෙහි.

**අති.** d භූ. බන්ධනෙ, බැඳීමෙහි. අතති, බඳියි.

**අතිඉස්සර.** පු-අධිකෙශ්වරයා, ඉතා ඉසුරු ඇත්තා.

**අතිඋස්සූර.** පු ඉර ඉතා ඉහලට නැගි උදය කාලය.

**අතිකඩ්ඪති.** ක්‍රි-(අති + කඩ්ඪ. d භූ කඩ්ඪනෙ, ඇදීමෙහි + ති) ඉතා තදින් අදියි. වෙගයෙන් අදියි පස්සට අදියි.

**අතික්කන්ත.** ති-ඉක්මවනලද, පහව ගිය. ඉක්මවූ.

**අතික්කම.** පු-අතික්‍රමය, ඉක්මවා යාම.

**අතික්කමණ.** න-ඉක්මවීම. ඉක්මවා යාම.

**අතික්කමති.** ක්‍රි-(අති + කමු. d භූ. පදවික්ඛෙපෙ, පය තගා යාමෙහි + ති) ඉක්මවයි, පසුකර යෙයි.

**අතික්කමි.** ක්‍රි-(අති + කමු. d + ඊ. ඊහට හ්‍රස්ව යි.) ඉක්මවූයේ ය, ඉක්ම ගියේය.

**අතික්කමිතුං.** අ-ඉක්මවන්ට, වෙනස් කරන්ට, කඩ කරන්ට.

**අතික්ඛණ** න (අති + ඛණ) ඉතා සෑරීම. වේලාව ඉක්මවීම.

**අතිකත.** ති-අධික ව කළ, කළ උපකාරයට වැඩියක් කළ.

**අතිකස්සන.** න-ඉතා ඇදීම, නොතවත්වා ඇදීම, ඇදගෙණයාම.

**අතිකාල.** ති-ඉතාකලු, අධිකකලුපැහැය ඇති. ඉතාකල්ඇතිව, වේලාසන.

**අතිඛාත.** ති-ඉතා සාරණලද.

**අතිඛිණ.** ති-(අ + තිඛිණ) අතක්‍ෂ්ණ, තියුණු නොවන.

**අතිඛිප්පං.** අ-(අති + ඛිප්පං) වහා, ඉතා ඉක්මනට.

**අතිග.** ති-ඉක්ම ගිය, ඉවත්ව ගිය.

**අතිගච්ඡති.** ක්‍රි (අති + ගමු. d =ගච්ඡ + ති) ඉක්මවා යෙයි.

**අතිගාළ්හ.** ති ඉතා දෘඪ, ඉතා තද, ඉතා සැර.

**අතිඝොර.** ති-ඉතා රළු, ඉතා කුරිරු, ඉතා නපුරු.

**අතිචරණ.** න-ඉක්මවා හැසිරීම, සීමා ඉක්මවා හැසිරීම, ස්වකීය ස්ත්‍රීපුරුෂයන් ඉක්මවා හැසිරීම, නොසිරිතෙහි යෙදීම, අනාචාරයෙහි හැසිරීම.

**අතිචරති.** ක්‍රි-ඉක්මවා හැසිරෙයි. කාමයෙහි වරදවා හැසිරෙයි.

**අතිචරියා** ඉ ඉක්මවා හැසිරීම.

**අතිචාර.** පු අතිචරණය. ඉක්ම පැවැත්ම. වරදවා හැසිරීම.

**අතිචාරිණී.** ඉ-සියහිමියා ඉක්මවා හැසිරෙන්නී, සොරහිමියන් සොයන්නී.

**අතිචිරං.** අ-ඉතා බොහෝකාලය, ඉතා දීර්ඝ කාලය.

**අතිච්ච.** අ-ඉක්මවා, අතික්‍රාන්ත කොට.

**අතිච්ඡති.** ක්‍රි-(අති + ඉච්ඡ. d භූ. ඉච්ඡායං, කැමැත්තෙහි + ති) ඉක්ම කැමති වෙයි. වෙන් ව යෙයි.

**අතිච්ඡ(ත්ත)ත්‍ර.** න-මහකුඩය, මහහිරවරණය.

**අතිජගති.** ඉ-එතම් ඡන්දස, පාදයෙක්හි අකුරු තෙළෙසෙක් ඇති ඡන්දස

**අතිජාත** ති-පියාට වඩා අධිකගුණයෙන් යුක්ත ව උපන්.

**අතිතණ්හ** ති-අධිකතෘෂ්ණා ඇති, එක අරමුණක නොයෙක්වර අධික ආසා උපදවන.

**අතිතත්ත.** ති-තෘප්තියට නොපැමිණි, තිත්ත නොවන.

**අතිත්ථ.** න-(න=අ + තිත්ථ) නොතොට, වැරදි තීර්ථය.

**අතිතරති.** ක්‍රි-(අති + තර d භූ. තරණෙ. එතෙර වීමෙහි + ති) පසු කර යයි. එගොඩ යයි.

**අතිථි.** පු-ආගන්තුගයා, අමුත්තා.

**අතිතුච්ඡ.** ති-ඉතාහීනිදිත, ඉතාහිස්.

**අතිතුට්ඨි.** ඉ-මහත්සන්තොෂය, ඉතා සතුට.

**අතිදාන.** න-මහාදානය. අධික කොට දීම.

**අතිදාරුණ.** ති-ඉතා දරුණු, ඉතා කුරිරු.

**අතිදිවා.** අ-ඉතා දවල.

**අතිදිසති.** ක්‍රි-(අති + දිස + ති) බොහෝ විස්තර දක්වයි. එවැනි කොට දක්වයි.

**අතිදිට්ඨි** ඉ-මිථ්‍යාදෘෂ්ටිය.

**අතිදුක්ඛ.** න-ඉතාදුක, මහදුක.

**අතිදූරෙ.** ති-ඉතාදුර.

**අතිදෙව.** පු-දෙවාතිදෙව, දෙවියන්ට දෙවි වූ තැනැත්තා. දෙවෙන්ද්‍රයා. සර්වඥයන්වහන්සේ.

**අතිදෙස.** පු-(අති + දිස-උච්චාරණෙ)කියාලීම කියාපෑම. ව්‍යපදෙශාතිදෙශ, නිමිත්තාදි දෙශ, තද්රූපාතිදෙශ, තත්සවභාවාතිදෙශ, සූත්‍රාතිදෙශ, කාර්‍ය්‍යාතිදෙශ යයි අතිදෙසය සවැදෑම්වේ.

**අතිධාවන.** න- } ඉක්මවා දිවීම, සීමා ඉක්මවා
**අතිධොන.** න- } යාම, කරුණ ඉක්මවා යාම.

**අතිධිති.** පු-අකුරු දහනවයකින් යුත් ඡන්දස, අතිධෘති නම් ඡන්දස.

**අතිධොනචාරී.** ති-පු-සිවුපසය පස්විකා වළ දන, නුවණ ඉක්ම හැසිරෙණ,

**අතිධොවන.** න ඉතා සේදීම.

**අතිනාමෙති** ක්‍රි-(අති + නමු d භූ. නමනෙ, නැමීමෙහි + ති) කල් ගත කරයි.

**අතිනීච.** පු-ඉතා නීච, ඉතා පහත්, ඉතා මිටි.

**අතිනෙති.** ක්‍රි-(අති + නී. d චු නයෙ, පැමිණ වීමෙහි + ති) ගෙණ එයි, සපයයි.

**අතිප්පගෙ.** අ-වැඩි කාලය, අධිකකාලය, ඉතා වේලාසන.

**අතිප්පදාන.** න-ඉතා දීම, බොහෝකොට දීම.

**අතිප්පසඞ්ග.** පු-කාර්‍ය්‍යිකගේ වැඩිපුර පැනීම.

**අතිප්පසත්ථ.** ති-අතිප්‍රශස්ත, බොහෝ කොට පසස්නලද.

**අතිප්පපඤ්ච.** පු-අධිකප්‍රමාදය. බොහෝ පමාවීම. අධික විස්තරය.

**අතිපතති.** පු-(අති + පති ගමනෙ) සළ පැනීම.

**අතිපරිච්චාග.** පු-අධික කොට දීම, මහාදානය.

**අතිපස්සති.** ක්‍රි-(අති + දිස d භූ=පස්ස + ති) සොයා බලයි, පරීක්ෂා කරයි.

**අතිපාත.** පු-හෙළීම, අතික්‍රමය, ඉක්ම යාම.

**අතිපාතෙති.** ක්‍රි-(අති + පත d චු. ගමනෙ, යාමෙහි + ණෙ + ති) හෙළියි, නසයි, වනසයි.

**අතිපිඞ්ගලක්ඛි.** ති-බළල් ඇස් ඇති.

**අතිබහල.** ති-ඉතා ඝන, බොහෝ ගනකම ඇති.

**අතිබාධෙති.** ක්‍රි-(අති + බාධ d. භූ. බාධායං-පෙළීමෙහි + ණෙ + ති) අධික කොට පෙළයි.

**අතිබාහෙති.** ක්‍රි-(අති + වහ + ණෙ + ති) ඉක්මවයි. දුරට එළවයි.

**අතිබාළ්හ.** ති-ඉතා දැඩි, ඉතා මහත්.

**අතිබ්‍යත්ති.** පු-(අති + වි + අප පාපුණනෙ) ප්‍රමාණය ඉක්මවා පැතිරී යාම

**අතිබ්‍යාපනදෙස.** පු-වාක්‍යයෙක්හි අදහස් කළ කාර්‍ය්‍ය ඉක්මවා පැවැති දෝෂය.

**අතිබ්‍රහ්ම.** පු-බ්‍රහ්මයාටත් වඩා ශ්‍රෙෂ්ඨයා. බුදුරජ.

(999)

**අතිබෲංහෙති**. ක්‍රි-(අති+බෘහ d. භූ වඩ්ඪනෙ, වැඩීමෙහි+ණෙ+ති) අධික කොට වඩයි. මහානාද කරයි.

**අතිභාර**. පු-ඉතාබර, අධිකබර.

**අතිභාරිය**. ති-ඉතා බර ඇති, ඉතා බරපතළ වූ. නපුරු.

**අතිභුඤ්ජති**. ක්‍රි-(අති+භුජ d. රු. භොජනෙ, අනුභවයෙහි+ති) බොහෝ කොට බුදියි. අධික කොට අනුභව කරයි.

**අතිභුත්ත**. ති-බොහෝ අනුභව කළ.

**අතිභොති**. ක්‍රි-(අති+භූ d. භූ. සත්තායං, වීමෙහි+ති) අභිභවනය කරයි, ජය ගණියි. රවටයි.

**අතිමඤ්ඤති**. ක්‍රි-(අති+මන d. දි. ඤාණෙ, දැනීමෙහි+ති) ඉක්මවා සිතයි. නොසලකා සිතයි. අතිමානය කෙරෙයි.

**අතිමඤ්ඤනා**. ඉ-ඉක්මවා සිතීම. අතිමානය.

**අතිමත්ත**. න-අතිශය, ඉතා බොහෝ, අධික, ද්‍රව්‍යවාචිකල-ති.

**අතිමනාප**. ති-ඉතා මන වඩන, ඉතා සතුටු එළවන.

**අතිමනොහර**. ති-ඉතා සිත් අලවන, ඉතා අගය ඇති.

**අතිමමායති**. ක්‍රි-ඉතා ආදරය කරයි, අතිශයින් ප්‍රෙම කරයි.

**අතිමහන්ත**. ති-ඉතා මහත්, ඉතා ලොකු 'ඉ-අතිමහතී(න්තී)'

**අතිමාන**. පු-අධිකමානය.

**අතිමානී** පු-ඉතා මානය ඇත්තා.

**අතිමානුස්සක**. පු-මිනිස්ගතිය ඉක්මවූ උත්තමයා.

**අතිමාපෙති**. ක්‍රි-(අති+මප. d. චු. මාපනෙ, මැවීමෙහි+ණෙ+ති+) මවයි.

**අතිමුඛර**. ති-ඉතා දෙඩමලු, ඉතා රළුවචන ඇති, අතිශයින් මුඛර.

**අතිමුත්තක**. පු-යොහොඹු.

**අතියක්ඛ**. පු විජ්ජාකාරයා, යකදුරා, මන්ත්‍රකාරයා.

**අතියාචන**. න-අධික කොට ඉල්ලීම.

**අතියුව**. පු-ඉතා තරුණයා.

**අතිරත්ති**. ඉ-මහරෑ, මධ්‍යම රාත්‍රිය

**අතිරස්ස**. ති-ඉතා මිටි, ඉතා කෙටි.

**අතිරාජ**. පු-මහරජ, රාජාධිරාජයා

**අතිරිච්ච**. අ-ඉතිරිකොට.

**අතිරිච්චති** ක්‍රි-(අති+රිච d. චු. වියොජනාදිසු, වෙන්වීම් ආදියෙහි+ති) ඉතිරි වෙයි.

**අතිරිත්ත**. ති-අධික, වැඩි. ඉතිරි.

**අතිරිව**. අ (අති+ඉව) ඉතා ම.

**අතිරෙක**. පු-වැඩිපුර, අධික, වැඩි.

**අතිරොචති**. ක්‍රි-(අති+රුච d. භූ. දිත්තියං, බැබලීමෙහි+ති) බබලයි, අධික ව බබලයි. කැමති වෙයි.

**අතිරොචන**. න-ඉතා බැබලීම. ඉතා දිලිසීම.

**අතිලීන**. ති-ඉතා ඇලුනු, ඉතා ම සැඟවුනු.

**අතිලූඛ**. ති-ඉතා රළු, ඉතා දුෂ්කර.

**අතිලොම**. ති-අධික ලොම් ඇති.

**අතිව්‍ය**. අ-(අති+විය) ඉතාම, අධික.

**අතිවත්තති**. ක්‍රි-(අති+වතු d. භූ. වත්තනෙ, පැවැත්මෙහි+ති) ඉක්ම පවතියි.

**අතිවස**. පු යටත් ව විසීම.

**අතිවාක්‍ය**. න-අටවැදෑරුම් අනාශ්‍රීවචන, ව්‍යතික්‍රම, ප්‍රකාශකවචන, නින්දාපෙරදූරි වචන කීම.

"**අතිවාක්‍යං** තිතික්ඛිස්සං
දුස්සීලො හි බහුජ්ජනො."

**අතිවාත**. පු.-අධිකවාතය, වෙගවත්වාතය, කුණාටුව.

**අතිවායති**. ක්‍රි-(වා. d. දි ගතිබන්ධනෙසු, ගමය, හැමීමය යන මෙහි+ති) අධික ව හුලං හමයි.

**අතිවාහ**. පු-ඉසිලීම, ඉක්මවීම, උසුලන්නා.

**අතිවිකාල**. පු-ඉතා අවේලාව, සවස.

**අතිවිජ්ඣති**. ක්‍රි-(අති+විධ d දි+විජ්ඣනෙ, විදීමෙහි+ති) විනිවිදියි, සිදුරු කෙරෙයි- "යථාගාරං දුච්ඡන්නං වුට්ඨී සමතිවිජ්ඣති, එවං අභාවිතං චිත්තං රාගො සමතිවිජ්ඣති."

**අතිවිජ්ඣන**. න-විනිවිදීම. සිදුරු කිරීම.

**අතිවිය**. අ-ඉතා ම, වැඩියක්.

**අතිවිස්සට්ඨ** ති-ඉතා බහුලව හරණ ලද.

**අතිවිස්සාස**. ති-ඉතා විශ්වාස ඇති, පු-ඉතා ඇදහිල්ල, ඉතා විශ්වාසය.

**අතිවිස්සාසික** ති-ඉතා විස්වස් ඇති.

**අතිවිස්සුත**. ති-අති ප්‍රසිද්ධ, ඉතා පතළ.

**අතිවුද්ධ**. ති-ඉතා වෘද්ධ, ඉතා මහලු.

**අතිවෙඨෙති**. ක්‍රි-(අති+වෙ+d චු. වෙඨනෙ, වෙළීමෙහි+ති) ඉතාම වෙළයි. අධික කොට ගෙතීම කරයි.

**අතිවෙලා**. ඉ-බොහෝවේලා.

**අතිසක්කරී**. ඉ-අකුරු පසළොසකින් යුත් ඡන්දස, අතිසක්කරී නම් ඡන්දස.

**අතිසඤ්චර**. පු-එහෙ මෙහෙ ඇවිදීම.

**අතිසඞ්ග**. පු-(අති+සජ - සඞ්ග) ම විසින් කුමක් කළයුතුදැයි විචාරණ ලද්දහුව මෙනම් දේ කරවයි කටයුත්ත පමණක්ම අනුදැනීම.

**අතිසණ්හ**. ති-ඉතා සිලුටු.

**අතිසන්ත**. ති-ඉතා සන්සිඳුනු, අතිශයින් සන්සුන් වූ.

**අතිසය**. පු-අත්‍යර්ථය, ප්‍රකර්ෂය, වැඩිබව.

**අතිසයති**. ක්‍රි-(අති+සි. d. භූ. සයෙ, සයනය කිරීමෙහි+ණය+ති) ඉක්ම යෙයි.

**අතිසර**. පු-අතිචාරය, ඉක්මවා හැසිරීම.

**අතිසරති**. ක්‍රි-(අති+සර d. භූ-ගතියං, යාමෙහි +ති) අතිචාර කෙරෙයි.

**අතිසායං**. අ-ඉතා සවස, ඉතා හැන්දෑව.

**අතිසායණ්හ**. පු-ඉතා සවස.

**අතිසායන**. න-(අති+සී-සයෙ) විශෙෂය හෝ අත්‍යර්ථය.

**අතිසාර**. න-ඉක්මීම. පු-අතීසාරරෝගය.

**අතිසිථිල** ති-ඉතා ලිහිල්, ඉතා බුරුල්.

**අතිසීත(ල)**. ති-ඉතා සීතල, අධික සිත.

**අතිවුත්ත**. පු-(අති+වච-ව්‍යක්තියං) අලඞ්කාර ශාස්ත්‍රයෙහි දැක්වෙන වාක්‍ය දෝෂයක්, ලෞකික අර්ථය ඉක්මවා කියනලද්ද අත්‍යුක්ත නම් වේ.

**අතිසූණ(න)**. පු-උමතු සුනඛයා.

**අතිසූර**. ති-ඉතා සූර, පු, ඉතා සූරයා, ඉතා දක්ෂයා.

**අතිසූරතා**. ඉ-ඉතා සූර බව.

**අතිහට්ඨ**. ති-ඉතා සන්තොෂ ඇති.

**අතිහරණ**. න-බැහැර කිරීම, ඉවත ගෙණ යාම.

**අතිහරති**. ක්‍රි-(අති+හරd. භූ. හරණෙ, හැරීමෙහි+ති) බැහැර ගෙණයයි.

**අතිහිත**. ති-බැහැර කළ, ඉවත් කළ, ගෙණ එනලද.

**අතිහීන**. ති-ඉතාලාමක, ඉතා පහත්.

**අතිහීළයති**. ක්‍රි-(අති+හීළ+d. චු. අනාදරෙ, අනාදරයෙහි+ණය-ති) අතිශයින් නිඳා කරයි.

**අතීත** ති-අතික්‍රාන්ත, ඉක්ම ගිය, පසු වී ගිය, ඉකුත්.

**අතීතංස** පු-අතීතකොටස, පසු ගිය කාණ්ඩය.

**අතීතයොබ්බන**. ති-ඉක්ම ගිය තරුණභාවය ඇති.

**අතීතාරම්මණ**. න-පසුගිය දේ අරමුණු කිරීම.

**අතීරක**. ති-පරතෙරක් නැති. මහත් පිරිසිඳීමක් නැති.

**අතීරදස්සී**. ති-පරතෙර නොදක්නාසුලු

**අතීරිත**. ති-තීරණය නොකළ, නිශ්චය නොකළ.

**අතීව**. අ-ඉතා ම, අතිශයින්.

**අතුරිත චාරිකා**. ඉ-බුදුරජාණන් වහන්සේ ගම් නියම්ගම් දනවු ආදියේ දිනකට යොදුන, අඩ යොදුන බැගින් පිඬු සිගීම් ආදියෙහි යම් ගමනක් වැඩමවන සේක්ද ඒ ගමන අතුරිතචාරිකා නම් වේ.

**අතුල**. ති-අසමාන, අසදෘශ.

**අතුලතෙජ**. ති-අසමාන තෙදැති.

**අතුලිත**. / **අතුලිය**. } ති-අසමාන, සම නොකටහැකි.

**අත්තුක්කංසන**. න-බහුශ්‍රැත බවක් හෝ සමාදන්වූ ධුතඞ්ගාදි ගුණයක් නිසා මා වැනි කවරෙක් ඇද්දැයි තමා උසස් කොට ගැනීම.

**අතෙකිච්ඡ.** ති-පිළියම් කිරීමට නොහැකි, පිළියම් නොකට හැකි ආනන්තරිය වැනි පව්කම්ද මේ ගණයට වැටේ.

**අතො.** අ-මෙහෙන්, මොහුගෙන්, මොහු කෙරෙන්.

**අථ.** අ-අනන්තරාර්ථ, පදපූරණ, ප්‍රාරම්භ, ප්‍රශ්න, යනාදියෙහි.

"අධිකාරෙ මඞ්ගලෙ චෙව
නිපඵන්නෙ අවධාරණෙ,
අනන්තරෙ චපාදනෙ
අථ සද්දො පවත්තති"

**අථබ්බණ.** න-චතුර්වෙදයෙන් එකක්වූ අථර්වණ වේදය, "ආථබ්බණ මන්තො නාම ආථබ්බණක වෙද විහිතො පරූපඝාත කරො මන්තො" අශ්වාදි සතුන් මරා යාග කරණ පිළිවෙළ උගන්වන වෙදයෙකි. තිරශ්චීන විද්‍යාවක් ලෙස බුදුසමය උගන්වයි.

**අථබ්බ.** න-අථර්වවෙදය, චතුර්වේදයෙන් සතර වන වෙදය.

**අථවා.** අ-අනියමාර්ථයෙහි, නොහොත් නැත හොත් යන අර්ථයෙහි.

**අථෙන.** ති-නොසොර, පවිත්‍ර- "අථෙනෙන සුචිභූතෙන අත්තනා විහරති"

**අථො.** අ-අනන්තරාර්ථ, ප්‍රාරම්භ, ප්‍රශ්න, පද පූරණ යන මෙහි.

**අථුල්ලවජ්ජ.** න-(න + ථුල්ලවජ්ජ) d විද + ණ්‍ය, ද + ණ්‍ය ජ්ජ.) අථුල්ලවජ්ජාති ලහුකා ආපත්ති යයි කියූ බැවින් සුළු වරදෙහි පැණවූ ඇවැත් විශෙෂයෙකි. එනම්:- ථුල්ලච්චය, පාචිත්තිය, පාටිදෙසනීය, දුක්කට, දුබ්භාසිත යන පඤ්චාපත්තීන් අථුල්ලවජ්ජ නමින් කියවෙයි.

**අද්ද** d. භූ. ගමනයාචනෙ, ගමනෙහි, ඉල්ලීමෙහි. අද්දති, යෙයි. ඉල්ලයි.

**අද්ද** d. චු හිංසායං, හිංසාවෙහි, අද්දෙති, අද්දයති, හිංසා කරයි. පෙළයි.

**අද්ද** ති-ආර්ද්‍ර, තෙත්. න-ඉඟුරු.

**අද්දක.** න-ආර්ද්‍රක, අමු ඉඟුරු.

**අද්දක්ඛි.** ක්‍රි-(දිස d. භූ. පෙක්ඛණෙ-බැලීමෙහි + ඊ. දිසධාතුවට. 'දක්ඛ' ආදෙශ යි. ආදියෙහි අකාරය ආගම යි.) දුටුයේ ය, බැලූයේ ය.

**අද්දබ්බවුත්ති.** පු-ද්‍රව්‍යයෙහි නො පවත්නේ අද්‍රව්‍ය වෘත්ති නම්. ආඛ්‍යාත භාවයයි.

**අද්දස(සා).** ක්‍රි-දුටුයේ ය, දුක්කේ ය.

**අද්දා.** ඉ අදනැකත.

**අද්දයති.** ක්‍රි (අද්ද d චු. තෙමනෙ, තෙත් කිරීමෙහි + ණය + ති) තෙමයි, තෙත් කෙරෙයි.

**අද්දාවලෙපන** න-(අද්ද + අව + ලෙපන) තෙත් දෙයින් ආලෙප කිරීම, දියසෙමෙල් ආදිය කෑම. ති-එය ඇති. "අද්දාවලෙපනා උපධාරියො පක්ඛන්දන්ති"

**අද්දාරිට්ඨක.** න-පෙනෙල මල්, කළුපැහැය.

**අද්දි.** පු පර්වතය, පව්ව.

**අද්දිත.** පු-අර්දිතයා, පීඩිතයා. ති-මඩනාලද.

**අද්ධ.** පු අර්ධය, අසමභාගය, මාර්ගය, කාලය, අඩාළ, න-සමභාගය.

**අද්ධගත** ති-කල් ගිය, වයස් ගිය, පරණ වූ.

**අද්ධග.** }
**අද්ධගූ.** } පු-මගියා, පථිකයා.

**අඩ්ඪචන්ද.** -අර්ධචන්ද්‍රයා, අඩසඳ, අටවක් දින සඳ.

**අඩ්ඪචන්ද්‍ර,** ඉ-කලුතිරුස්සවාලු.

**අඩ්ඪදණ්ඩ.** පු-අර්ධදණ්ඩ, සතර රියන් දිග දණ්ඩක් දෙකට පලාගත් දඬුකඩ.

**අද්ධනිය** ති-මාර්ගයෙහි වූ, මග නියුතු, මාර්ගයෙහි යෙදුනු, කලක් පවත්නා.

**අඩ්ඪමත්ත.** පු-අර්ධමාත්‍රය, අඩමින, ව්‍යඤ්ජනාක්ෂරය.

**අඩ්ඪමණ්ඩල.** න-කුඩාමැඩිලි, සිවුරේ කුඩා අතුකැබලි.

**අඩ්ඪමාස.** පු-මාසාර්ධය, අඩමස, 15 දවස අඩමස්ස.

**අඩ්ඪමාසික.** ති-අඩමසකට (හෝ අඩමස්සකට) සුදුසු.

**අඩ්ඪයොග.** පු-ඒ ඒ ඡන්දසුන්ගේ ප්‍රසාර ගමන මාර්ගය.

**අඩ්ඪයොජන.** න-අඩයොදුන, යොදුන්බාගය- "යොජන" බලනු.

**අඩ්ඪසමවුත්ත** න-සතර පාදයන්ගෙන් පාද දෙකක් දෙකක් සමව සිටින ලෙස බඳින වෘත්තය, අර්ධසමවෘත්තය.

**අද්ධා**. අ-ඒකාන්තයෙහි, නිශ්චිතාර්ථයෙහි.

**අද්ධාන** න මාර්ගය, පාර, දීර්ඝමාර්ගය, කාලය.

**අද්ධානදරථ**. පු-මාර්ගක්ලාන්තභාවය, ගමන් වෙහෙස, ගමන්විඩාව.

**අද්ධානපරිස්සම** පු ගමන් වෙහෙස, අද්ධානදරථය.

**අද්ධානමග්ග**. පු-දීර්ඝමාර්ගය

**අද්ධාර**. න-දෙරනැති සෙනසුන,

**අද්ධි**. ඉ-විනිවිද ගිය හැකි වීථිය

**අද්ධික**. පු-මාර්ගිකයා, මගියා

**අද්වය**. ති-දෙපරිද්දකින් නොවන, එකක් ම වන, සත්‍ය

**අද්වයවාදී**. පු-දෙපරිද්දකින් පවත්නා කථා නොකියන තැනැත්තා, සත්‍යකථා ඇත්තා, තථාගතයන් වහන්සේ.

**අද්දුභක**. ති-ද්‍රෝහ නොකරණ.

**අද්ධුව**. ති-අස්ථිර, ශාශ්වත නොවන, තිරනැති.

**අද්ධෙන්දුපාසාණ**. පු-(අද්ධ + ඉන්දු + පාසාණ) අර්ධචන්ද්‍රාකාරපාෂාණය. සඳකඩපහණ.

**අද්වෙජ්ඣමනස**. පු-(අ + වෙජ්ඣ + මනස) දෙපරිද්දකින් නොවන සිත් ඇත්තා

**අද්වෙජ්ඣවචන**. පු එකාකාරයකින් පවත්නා වචන ඇත්තා, සත්‍ය වචන ඇත්තා.

**අද්වෙළ්හකවචන**. පු- සැකරහිත වචන ඇත්තා, සත්‍යවාදියා.

**අධ්‍යත්ථ**. න-විශේෂණය හේතු කොටගෙණ විශේෂ්‍යයාගේ අර්ථය අධික වීම.

**අද**. d භූ-භක්ඛණෙ, කෑමෙහි. අදති, කයි, අනුභව කරයි.

**අදක**. පු-අනුභව කරන්නා, කන්නා.

**අදඩ්ඪ**. ති-ගින්නෙන් දනලද, පිලිස්සුනු දේ.

**අදණ්ඩ** පු-නො දඬුවම. ති-දඬුවම් නොවන. දඬුවමට නුසුදුසු.

**අදන්ත**. ති-අදමිත, දමනය නොකළ, නොදැමුනු.

**අදත්තාදාන**. න-වස්තු හිමියා විසින් කයින් හෝ වචනයෙන් නොදෙන ලද යම් කිසිවක් ගැණීම, අදින්නාදාන ශික්ෂාපද මීටම නමකි.

**අදන**. න-අනුභවය. ආහාරය.

**අදස්සන** න-අදර්ශනය, නොදැක්ම, විනාශය, ලෝපය.

**අදසක** න-(අ + දසක) දෑවුලු රහිත වස්ත්‍රය.

**අසන**. න-ආහාරය, අනුභවය. පු-පියාගස.

**අදා**. ක්‍රි-දානය කෙළේය, දුන්නේය - "දානං අදා බාරයි නිච්චසීලං"

**අදාන**. න-නොදීම, පරිත්‍යාග නොකිරීම.

**අදාස**. පු-දාසකමින් මිදුනු තැනැත්තා, නිදහස් වූ තැනැත්තේ, ස්වෙච්ඡාචාරියා.

**අදි**. d භූ. බන්ධනෙ, බැඳීමෙහි අඳති, බඳියි.

**අදිට්ඨ**. ති-නොදක්නාලද, නුදුටු.

**අදිට්ඨජෝතනා**. ඉ-නොදක්නා ලද්දහුගේ ප්‍රකාශය, පිළිවිසීම් වෙසෙසක්.

**අදිට්ඨසහාය(ක)**. පු-නුදුටු යහළුවා, සන්දේශ-ආදිය ගණුදෙනු කර ගැණීමෙන් මිත්‍ර ව සිටින්නා.

**අදිති**. ඉ-සුරමව, දෙවමාතාව.

**අදිතිනන්දන**. පු-සුරමවගේ පුතා, දෙවියා.

**අදින්න** ති-දානය නොකළ, නුදුන්, පරිත්‍යාග නොකළ.

**අදින්නපුබ්බ** ති-නුදුන්විරූ, පෙර නොදෙන-ලද, දානය නොකළ.

**අදින්නාදාන**. න-(අ=න + දින්න + ආ + දාන) නුදුන්දෙය ගැණීම.

**අදින්නාදායී**. පු-හිමියන් විසින් නුදුන්දෙය ගන්නා තැනැත්තා.

**අදීන** ති-(අ=න + දීන) ජඩ නොවන, බැගෑ නොවන, දිළිඳු නොවන, කෙලතොලු නොවන

**අදු**. අ-නොහොත්, නැතහොත්

**අදුක්ඛ**. ති-දුක් නොවන, නිදුක්.

**අදුක්ඛමසුඛ**. ති (අ=න + දුක්ඛ + අ + සුඛ) දුක්සැප නොවන, සැපත් නොවූ දුකත්-නොවූ, උපෙක්ෂාවෙදනාව.

**අදුට්ඨුල්ල**. ති-දෙව්ආපත්තික්ඛන්ධා දුට්ඨුල්ලා, අවසෙසා අදුට්ඨුල්ලා, ථුල්ලච්චය, පාචිත්තිය, පාටිදෙසනීය, දුක්කට, දුබ්භාසිත යන ඇවැත් පස අදුට්ඨුල්ල නම්.

**අදුතිය**. ති-තමාට දෙවැනියෙක් නැති, දෙවැනි නොවන. තෘෂ්ණා රහිත. "දුතිය" බලනු.

**අදුබ්භ**. ති-මිත්‍රද්‍රෝහි නොවූ, පොරොන්දු කඩ නොකරණ.

**අදූභක**. ති-අහිංසක, පීඩා නොකරණ. ද්‍රෝහ නොකරණ.

**අදූර** ති-දුරනොවන, සමීප, ලඟ.

**අදූසක**. ති-නොකෙලෙසන. නිරපරාධ.

**අදූසිය**. ති-දූෂණය නොකටයුතු. නිදෙස්. නිරපරාධ

**අදූහල**. න-සතුන් ඇල්ලීමට යොදන උගුලක්.

**අදෙය්‍ය** ති (අ=න + දා + ණ්‍ය) නොදියයුතු, දෙන්නට නොවටින.

**අධම**. ති-නින්දිත. නීච. පහත්. අසම්පූර්ණ.

**අධමණ්ණ**. පු-නය ගත් අය, නය ගැතියා.

**අධමර්ණ**. පු-අනුන්ට නයගැති වන්නා.

**අධම්ම**. පු-න-අධර්මය, පාපය, ධර්මනොවන පදාර්ථය.

**අධම්මකම්ම**. න-අධර්මකර්මය, ධර්මයට විරුද්ධ-කර්මය.

**අධම්මචරියා**. ඉ-අධර්මයෙහි හැසිරීම, ධර්මයට විරුද්ධ හැසිරීම.

**අධම්මරාග** පු-අධර්මරාගය, අයුතුරාගය, අන්-සතුදෙයෙහි ආලය ඉපදවීම.

**අධම්මවාදී**. ති අධර්මවාදි, අධර්මය කියනසුලු.

**අධම්මික**. ති අධාර්මික අන්දමින් යුත්.

**අධර**. ති-යට, නීච. පහත්.

**අධර**. පු-දන්තාවරණය, ඔෂ්ඨය, තොල.

**අධි**. අ-අධික, ප්‍රධාන, අධ්‍යයන, අධිෂ්ඨාන, ප්‍රාප්ති, නිශ්චය, උපරිභාව, අභිභවන, යන අර්ථයන්හි

**අධික** ති-වැඩි, ඉතා, බොහෝ.

**අධිකත**. පු-අධිකාරම, සතිස්වැදෑරුම් කර්මයෙහි නියුක්තයා, ති-අධිකාර කරණලද, සම්බන්ධ කරණලද.

**අධිකතර**. ති-ඉතා වැඩි, ඉතා බොහෝ.

**අධිකතාපරවචන** පු-ප්‍රස්තුත සම්මුඛයා හැර අනිකෙකු කීම සම්බන්ධ වචන.

**අධිකත්ථවචන**. න-නින්දා, ප්‍රශංසා පිණිස වැඩිය ආරොපනය කරණලද වචන.

**අධිකරණ**. න-ආධාරය. හෙතුව, විනිශ්චය, නඩුව, විවාදාධිකරණ, අනුවාදාධිකරණ, ආපත්තාධිකරණ, කිච්චාධිකරණ යන සතර. "යං අධිකිච්ච සමථා වත්තන්ති තං අධිකර-ණන්ති වෙදිතබ්බං

**අධිකරණකාරක**. ති-නඩුකියන, න-සත්වන ආධාරකාරකය.

**අධිකරණසමථ**. පු-අධිකරණ (=නඩු) සන්සිඳ-වීම. 'සත්තාධිකරණ සමථ' බලනු.

**අධිකරණික**. පු - විනිශ්චයකාරයා, නඩු විසඳන්නා.

**අධිකරණී**. ඉ-කිණිහිර.

**අධිකවචන**. න-ව්‍යාකරණ සූත්‍රාදියෙහි දැක්-වෙන අසිම්හි, අනන්තගගහණ ආදිය.

**අධිකාර**. පු-අධිකක්‍රියාව, අධ්‍යක්ෂකම, කළ මනාකාරකම, අධික කොට කිරීම, පරිත්‍යා-ගය, ප්‍රාර්ථනාව.

**අධිකාර** පු-න-ධුරය, තනතුර, ව්‍යාකරණ-යෙහි සවැදෑරුම් සූත්‍රයන් අතුරෙන් එක් සූතුරක් හා අනික් සූතුරක් හෝ පදයක් සම්බන්ධ කිරීම.

**අධිකාරික** } පු-අධ්‍යක්ෂයා, ඒ ඒ කටයුත්තෙහි
**අධිකාරී** } ප්‍රධානයා.

**අධිකුට්ටන**. න-කෙටීම. දත්ගෙඩිය. මස්-ලොඹුව, මස් කපන කොළොම්බුව.

**අධිකිච්ච**. ති-(කර + රිච්ච) අරභයා, උදෙසා.

**අධිකුසල**. න-ශ්‍රෙෂ්ඨකුශලය. සමථවිපස්සනා අධිකුසලතාව.

**අධිකොට්ටන**. න-කෙටීම. මස්ලොඹුව, දත්ගෙඩිය.

**අධිකොට්ටිත**. ති-කෙටූ, කොටනලද. මස් කරණලද.

**අධික්‍රෝධිත**. ති-ඉතා කුපිත කළ, අධිකලෙස කොප කළ.

**අධිග්ගහ.** පු-අධිපති වීම, ප්‍රධාන වීම, අධිගෘහීත වීම.

**අධිග්ගහිත.** ති (අධි+ගහ-ත) අධිගෘහීත වූ, ආවිෂ්ටවූ, අධිපති භාවයට පැමිණි.

**අධිගච්ඡති.** ක්‍රි-(අධි+ගමු d. භූ ගතිමහි-යාමෙහි (ධාත්වන්තයට 'ච්ඡ' ආදෙශය+ති) පැමිණෙයි, ලබයි.

**අධිගණ්හාති.** ක්‍රි-(අධි+ගහ d කි. උපාදානෙ ගැණීමෙහි+ණ්හා+ති) පිළිගණියි, අධිගෘහිත වෙයි.

**අධිගත** න-පැමිණීම පු-ආගමයා. ති-ලොකොත්තරධර්මාධිගමය කළ, පැමිණෙන ලද, ප්‍රතිවෙධ කළ.

**අධිගම.** පු-අවබොධය, මාර්ගඵලාවබොධය ඥාණය, පිළිගැණීම.

**අධිගමන්තරධාන.** න අධිගම නම් වූ සතර-මගය සතරපලය සිව්පිළිසිඹියාය ෂඩභිඥය ත්‍රිවිද්‍යාය යන මොවුන්ගේ අතුරුදන් වීම. අධිගමය විනාශ වීම.

**අධිගමෙති.** ක්‍රි-(අධි+ගමු d භූ. +ණෙ+ති) ලබවයි. පමුණුවයි.

**අධිච්ච.** අ-නිසා ඉහෙණ.

**අධිච්චකා.** ඉ-පර්වතමුදුන, පර්වතශිඛරය.

**අධිච්චසමුප්පත්ති.** ඉ හෙතුආදියක් නොමැතිව නිකරුණේ හටගැණීම, ඉබේම ඉපදීම.

**අධිච්චසමුප්පන්න** ති-(අධිච්ච+සං+උප්පන්න) නිකරුණේ උපන්, පු හෙතුප්‍රත්‍යය රහිතව තමාද ලොකයද උපන්නේය යන වාදය.

**අධිච්චාපත්තික.** පු-කලින්කල ඇවතට පැමි-ණෙන භික්ෂුව, "අධිච්චාපත්තිකොති යො කදාචි කදාචි ආපත්තිං ආපජ්ජති."

**අධිචිණ්ණ.** ති-පුරුදු කළ, රැස්කළ.

**අධිචිත්ත.** න-උත්තම චිත්තය, භාවනාසිත, විදර්ශනාපාදක අෂ්ට සමාපත්ති සිත, මාර්ග-ඵලසම්ප්‍රයුක්ත සිත

**අධිචිත්තසික්ඛා.** ඉ-අධිචිත්තය පිළිබඳ ඉගැන්වීම, සූත්‍රපිටකය.

**අධිචෙත.** න-උසස්සිත, අර්හත්ඵල චිත්තය.

**අධිජෙගුච්ඡ.** ති-ඉතාපිළිකුල්, ඉතාකැත.

**අධිට්ඨක.** පු-ඉටාගන්නා තැනැත්තා.

**අධිට්ඨාති.** ක්‍රි-අධි+ඨා. d. භූ. ගතිනිවෘත්තියං=ගමන්නැවැත්මෙහි+ති) ඉටාගණී.

**අධිට්ඨාන.** න-ඉටාගැන්ම, ස්ථිරව සිතාගැන්ම, ආධාරය, සිටීම.

**අධිට්ඨානාහාර.** පු-සූත්‍රාගත දුක්ඛ, සමුදය, ජාති, ජරා, කාමතණ්හා, භවතණ්හාදී ධර්මයන්ගේ අවිකල්පන සංඛ්‍යාත විශෙෂ-යෙන් විකල්පනය නොකොට දක්වීම අධිට්ඨානාහාර නම්.

**අධිට්ඨායක.** පු-අධිෂ්ඨාන කරන්නා, අධ්‍ය-ක්ෂයා.

**අධිට්ඨිත.** ති-ඉටාගත්, අධිෂ්ඨාන කළ.

**අධිට්ඨිති.** ඉ-ඉටීම, අධිෂ්ඨාන කරගැන්ම.

**අධිදෙව** පු-දෙවාතිදෙවයන්වහන්සේ, දෙවි-යන්ගේ දෙවියා, බුදුරජ

**අධිපත.** පු-හෙලීම, වැටීම.

**අධිප(ක)** / **අධිපති.** } පු-අධිපති, නායක, ප්‍රධාන වූ, ඉසුරු ඇති.

**අධිපඤ්ඤා.** ඉ උත්තමප්‍රඥාව, තිලකුණුආකාර පිරිසිදීම ඇති විදර්ශනා ප්‍රඥාව, මාර්ගඵල සම්ප්‍රයුක්තප්‍රඥාව.

**අධිපඤ්ඤාසික්ඛා.** ඉ-උත්තමප්‍රඥාව පිළිබඳ ශික්ෂාව, අභිධර්මපිටකය.

**අධිපජ්ජති.** ක්‍රි-(අධි+පද. d. දි ගතියං=යාමෙහි+ය (ධාත්වන්තය සහිත'ය' හට 'ජා' ආදෙශ හා ද්විත්වයි.)=ජ්ජ+ති පැමිණෙයි.

**අධිපත්ථිත.** ති-අධිකව ප්‍රාර්ථනා කළ, නිතර පැතූ

**අධිපතති.** ක්‍රි (අධි+පත. d. භූ. ගමනෙ=යාමෙහි+ති)හෙයි, වැටෙයි.

**අධිපතන.** න-වැටීම, පහත්වීම, පාතට වැටීම.

**අධිපතිකා.** ඉ-මදුරුවා.

**අධිපන්න.** පු-සම්ප්‍රාප්ත, පැමිණි, යටත් කළ.

**අධිපාත.** පු-කැඩීම, වැටීම, හෙලීම.

**අධිපාතෙති.** ක්‍රි-(අධි+පත. d. භූ. ගමනෙ=යාමෙහි+ණෙ+ති)හෙළයි, කඩයි.

**අධිප්පාය.** පු-අභිප්‍රාය, අදහස.

**අධිප්පායපථ.** පු-ව්‍යාකරණ සූත්‍රයන්හි දක්වෙන ප්‍රධාන අර්ථය පමණක් නොගෙණ වෘත්තිකාරකයන් විසින් අදහස් කරණලද අර්ථය.

**අධිප්පෙත.** ති-අදහස් කරණලද.

**අධිබ්‍රහ්ම** පු-ප්‍රධානබ්‍රහ්මයා, මහබඹා.

**අධිබාධෙති** ක්‍රි-(අධි+බාධ d. චු. බාධායං=පෙළීමෙහි+ණෙ+ති) බාධා කෙරෙයි, පෙළයි.

**අධිභවති.** ක්‍රි (අධි+භූ d. භූ සත්තායං=වීමෙහි, උ ඔ=අව+ති) අභිභවනය කරයි, මැඩපවත්වයි, ප්‍රධාන වෙයි.

**අධිභවන.** න අභිභවනය, මැඩපැවැත්වීම.

**අධිභාසති.** ක්‍රි (අධි+භාස d. භූ වාචායං=කීමෙහි+ති) කියයි, මනාකොට ප්‍රකාශ කරයි.

**අධිභූ** පු-ඉසුරුඇත්තා, ප්‍රධානයා.

**අධිභූත.** ති අධිපතිබවට පැමිණි.

**අධිභොසි.** ක්‍රි-(අධි+භූ. d. භූ. සත්තායං=වීමෙහි, ඌ=ඔ+ඊ) අභිභවනය කෙළේය. සි-අභිභවනය කෙරෙහි.

**අධිමත්ත.** ති-අධික, බොහෝ, පමණ ඉක්ම ගිය.

**අධිමත්තෙහා.** ඉ-අධික උත්සාහය.

**අධිමන.** න-අධිචිත්තය.

**අධිමාන.** පු-අධිකමාන්‍යය, මාර්ගඵලයන්ට නො පැමිණ ද විදර්ශනොපක්ලෙශයන් නිසා රැවටී මාර්ගඵලයන්ට පැමිණියෙමියි සිතා ගැණීම.

**අධිමානික.** ති-(අධි+මාන+ඉක) අධිමානය ඇති.

**අධිමාස.** ති අධිකවූ මාසය, සමහර අවුරුදු වලදී පසළොස්වක් පොහොය දෙකක් වෙති, එසේ වූ විට අධිමාසයයි කියති අධික අවුරුද්ද අවුරුදු 4 කට වරක් එයි. අධි එති ගච්ඡතීති අධිකො, අධිකො මාසො අධිමාසො.

**අධිමුච්චති.** ක්‍රි-(අධි+මුච. d. දි. මොචනෙ=මිදීමෙහි+ති) මිදෙයි. නිශ්චය කෙරෙයි.

**අධිමුච්චන.** න-මිදීම, බන්ධනයෙන් මිදීම. නිශ්චය කිරීම.

**අධිමුච්චිත** ති-නිශ්චය කරණලද, ඉටනලද.

**අධිමුච්ඡිත.** ති-මූර්ච්ඡා වූ, අධිගෘහීත වූ.

**අධිමුත්ත.** ති-මිදුනු, බන්ධනමොචනය කළ. නිශ්චය කළ.

**අධිමුත්ති.** ඉ-ඉගැණීම, ප්‍රාර්ථනාව, අභිප්‍රාය, ඡන්දය, ඊට නැමුනු බව, නිශ්චය.

**අධිමුත්තික කාලකිරියා** ඉ-බොධිසත්ත්වවරයන්ට පමණක් සාධාරණ කළුරිය කිරීම මෙයින් හඟවයි. බොහෝ ආයු ඇති දෙව් ලොවක උපන් බුදුවන බෝසත්වරයෙකු බොහෝ කලක් දිව සැප විඳීම සත්ත්වයන්ට හිත පිණිස වැඩ කිරිමට බාධකයයි කල්පනා කොට එයින් චුතවනු කැමතිව තම දෙව් විමනට පිවිස දිව යහන්හි සැතපී මෙයින් මතු මාගේ මේ දෙව්ලොව ජීවිතය නො පවතීවයි අදිටන් කොට ඇස වසා ගැනීමත් සමගම වන කාලක්‍රියාවට – කළුරිය කිරීමට අධිමුත්තික කාලකිරියා යයි කියනු ලැබේ. මේ විශෙෂ කාලක්‍රියාව සර්වඥ බොධිසත්ත්වයන්ට පමණක්ම සිදුවන හෙයින් අනික් පසේ බුදුවරයන් වහන්සේලාට සාධාරණ නොවන බවත් දෙශනාවෙන් පෙණේ. මේ නිසා මේ අධිමුත්තික කාලකිරියාව සර්වඥ බොධිසත්ත්වවරයන්ට පමණක් සීමිතයි.

**අධිමොක්ඛ.** පු-නිශ්චය. අධිකශ්‍රද්ධාව. ඉටා ගැන්ම.

**අධිමොක්ඛතා.** ඉ අධිමොක්ෂබව.

**අධිරොහ** පු-ආරොහණය, නැඟීම.

**අධිරොහිණී.** ඉ-හිණ, ඉණිමග.

**අධිවචන.** න-නාමය, ප්‍රඥප්තිය, නාමාන්තරය, සංඥාව.

**අධිවචනපථ** පු-අර්ථය නොසලකා ආරූඪ වශයෙන් කරණ නාම ව්‍යවහාරය.

**අධිවත්තති.** ක්‍රි-(අධි+වතු+ති) පවතී. නික්මෙයි.

**අධිවත්තන.** න-ඉවසීම.

**අධිවත්ථ.** ති-අධිපතිව විසූ.

**අධිවර.** ති-ඉතාහොඳ, අත්‍යුත්තම.

**අධිවාස.** පු-නිවාසය, සුවඳ කැවීම් ආදී සංස්කරණය, ශිවිසීම, උපද්‍රවය, අනර්ථය, ඉවසීම, විඳීම. (1267)

**අධිවාසක**. පු-ඉවසන්නා.

**අධිවාසන**. න-ඉවසීම, සහනය, ක්‍ෂමාව.

**අධිවාසනතා**. ඉ-ඉවසනබව, ක්‍ෂමා කරණබව.

**අධිවාසෙති**. ක්‍රි (අධි+වස d. චු සිනෙහාදිසු= සෙනහාදියෙහි + ණෙ + ති) ඉවසයි.

**අධිවාසෙති**. ක්‍රි-(අධි+වස. d චු උපවාසෙ= සමීපවාසයෙහි + ණෙ + ති) වාසය කරයි.

**අධිවාහ**. පු ඉසිලීම.

**අධිවාහන** න-ඉසිලීම.

**අධිවුත්ති**. ඉ-කීම, අදහස.

**අධිවුත්තිපද** න-අධිවචන පද, භූතාර්ථය මැඩ යථාස්වභාය නො ගෙණ පවත්නා දෘෂ්ටීන් පිළිබඳ පද, දෘෂ්ටි ප්‍රකාශක වචන

**අධිවුත්ථ**. ති ප්‍රධානව වාසය කළ, විසූ.

**අධිසයන**. න-වැතිරගෙණ හොවීම, සයනා සනයෙහි වැතිර නිදීම.

.**අධිසීල** න-උතුම් සීලය, මහාසීලය, ප්‍රාති-මොක්‍ෂසංවරශීලය, මාර්ග ඵල සම්ප්‍රයුක්ත ශීලය.

**අධිසෙති** ක්‍රි-(අධි+සි d භූ. සයෙ=සයනය කිරීමෙහි + ති) සයනය කරයි, හොවියි

**අධීයති**. ක්‍රි-(අධි+ඉ d. භූ අජ්ඣයනෙ= හැදෑරීමෙහි + ය + ති) හදාරයි.

**අධීර**. ති (න=අ+ධීර) බැගෑපත්වූ

**අධුනා**. අ මේ කාලයෙහි, දැන්.

**අධුර**. ති-ධුර රහිත, ඉසිලිය යුතු බරරහිත.

**අධො** අ-යට, පහත.

**අධොත** ති-නොසේදූ.

**අධොඅක්ඛක**. පු-යටි හක්ක.

**අධොක්ඛජ**. පු-යටි හක්කෙන් උපන් තැනැත්තහු, විෂ්ණු.

**අධොගම**. පු-ශරීරයෙහි පහතට බස්නා වාතය, පහතට යාම.

**අධොගල**. න බෙල්ලෙන් පහල.

**අධොසිත**. ති-යට සිටියක් කොට.

**අධොදෙස**. පු-පහත්දෙසය, මිටි දෙසය.

**අධොභාග**. පු-යට භාගය, පහත කොටස.

**අධොභාව**. පු-යටභාවය, පහත් වීම.

**අධොභුවන**. න-යට ලොකය, නාගභවනය. පාතාලය.

**අධොමුඛ**. ති-මුහුණ පාතට හෙළූ, බිම බලාගත්.

**අධොවිරෙචන**. න-ශරීරයාගේ යටභාගය පිළිබඳ විරෙචනය, විරෙක කිරීම.

**අන්ත**. පු-න සමීප, අවසාන, පරභාග, පද පූරණ, අතුණු, කොටස, කෙළවර, මරණ, මර්‍යාදා, ලාමක, නිබ්බාණ, ස්වාමී යන මෙහි.

**අන්තක**. පු වශවර්තිමාරයා, ජීවිතය කෙළවර කරන්නා, මරණය.

**අන්තකිරියා**. ඉ-අවසන් කිරීම, කෙළවර කිරීම, මරණය.

**අන්තකර**. පු අවසානය කරන්නා, මරු.

**අන්තගත**. ති-අන්තර්ගත, ඇතුළත්.

**අන්තග්ගහණ**. න-ව්‍යාකරණ සූත්‍රයන්හි අන්ත ශබ්දයා ගැනීම.

**අන්තග්ගාහිකාදිට්ඨි**. ඉ-"සස්සතො ලොකො ඉදමෙව සච්චං, මොඝමඤ්ඤන්ති" යනාදි ක්‍රමයෙන් එක එක අන්තයක් ඇති දෘෂ්ටිය

**අන්තගත** ති-අන්තයට ගිය.

**අන්තගූ**. ති-අවසානයට ගිය.

**අන්තගුණ** පු. න-අතුණුබහණ, අතුණු වැල,

**අන්තචර**. පු-ඇතුළත හැසිරෙන්නා, අභ්‍යන්තරිකයා.

**අන්තට්ඨ** ඉ-වර්ගයන් කෙළවර පවත්නා ය ර ල ව යන අකුරු සතර.

**අන්තර** න අන්තය, අතර, මධ්‍යය.

**අන්තද්වය**. න-කාමසුඛල්ලිකානු යොගය හා අත්තකිලමථානු යොගය යන දෙක.

**අන්තරකප්ප**. පු-අන්තඃකල්පය. දස හවුරුදු මිනිසුන් කෙරෙහි පටන් ගෙණ මනුෂ්‍යයන්ගේ ආයුෂ අසංඛ්‍යය දක්වා ක්‍රමයෙන් වැඩී එතැන සිට ක්‍රමයෙන් බැස දස අවුරුදු වන තැන් දක්වා ඇති වන මේ දෙඅතර කාලයයි. අවුරුදු දහසකින් අඟලක් වැඩෙන්නාවූ පෘථිවිය එක් යොදුන් තුන්-ගවුවක් පමණ වැඩෙන කාලයයි.

**අන්තරඞ්ගවිධි.** පු-ප්‍රකෘතිය ආශ්‍රය කොට පවත්නා කායශීය.

**අන්තරඝර.** න-ඇතුළුගම, ගම.

**අන්තරට්ඨ.** න-(අන්තර + අට්ඨ) අතර වූ අට, වස්තු දෙකක් අතර පිහිටි අටක්.

**අන්තරට්ඨක.** පු-නවම් මැදින් යන දෙමස අතර අට දවස, හිම වැටෙන කාලය, නවම් මස අගසතර දවසද මැදින් මස මුල සතර දවසද යන අට දවස.

**අන්තරධා.** d. භූ-අදස්සනෙ, නොපෙණීමෙහි අන්තරධායති, අතුරුදහන් වෙයි.

**අන්තරධාන.** න අන්තර්ධානය, අතුරුදහන්වීම.

**අන්තරන්තර.** න-(අන්තර + අන්තර) අතර අතර, අතරතුර.

**අන්තරබාහිර.** න ඇතුළත පිටත ති ඇතුළත පිටත හැසිරෙණ

**අන්තරභත්ත.** න-අතුරුබත, දවල්බත, උදය වරුව.

**අන්තරවාස** න-යටට හඳනා වස්ත්‍රය, ඉන යටට හඳනා රෙද්ද.

**අන්තරවාසක** පු-අන්තරවාසය, භික්ෂූන්ගේ අඳනය.

**අන්තරවුඩ්ඪි** ඉ-අන්තරවෘද්ධිරොගය, බඩවැල වැඩීමෙන් වන රොගයක්.

**අන්තරංස** න-උර අතර, ලය, හෘදය.

**අන්තරංස.** පු.(අන්තර + අංස) යමක් අතර පිහිටි කොටස.

**අන්තරහිත.** ති-අන්තර්ධාන වූ, ප්‍රතිච්ඡන්න, සැඟවුනු.

**අන්තරා.** අ-අන්තරාලය, අතර, මැද, කාරණ, ක්ෂණ, සිත, විවර යන අර්ථයන්හි.

**අන්තරාකථා.** ඉ-අතුරු කථාව, පිළිවෙළ කථාවෙන් වෙනස් වූ අන්‍ය කථාව.

**අන්තරාධාන.** න-පියන, පියන්පත, වහන්තරාව.

**අන්තරාපණ.** න-සල්පිල, ද්‍රව්‍ය විකුණන ශාලාව, කඩය, සාප්පුව.

**අන්තරාපරිනිබ්බායී.** පු-ආයුෂයාගේ මැද කොටස නොගෙවා අතරදී ක්ලෙශපරිනිර්වාණයෙන් පිරිනිවන්පානා පුද්ගලයා.

**අන්තරාය.** පු-විඝ්නය, උපද්‍රවය, හානිය.

**අන්තරායක.** පු-උපද්‍රවය, හානිය.

**අන්තරායකර.** ති-උපද්‍රව කරණ, අවැඩ සිදු කරණ.

**අන්තරායික** ති-අන්තරායකර, උවදුරු එලවන

**අන්තරාල** න-ඇතුළත, අභ්‍යන්තර, අතර

**අන්තරික.** ති-අතර, අතර පවත්නා, මධ්‍යගත

**අන්තරීප.** (දීප)න-දියෙන් වට වූ ගොඩබිම, දූව.

**අන්තරීය.** න-යට හඳනා පිළි, ඉනට හැඳිය යුතු පිළි.

**අන්තරෙණ.** අ-වර්ජනාර්ථයෙහි, අන්තරාලය

**අන්තලික්ඛ.** න-අන්තරීක්ෂය, අහස.

**අන්තවණ්ණ.** පු-අන්තිම මනුෂ්‍යජාතිය, ශූද්‍රවර්ණය, නීචජාතිය, අග පිහිටි අක්ෂරය.

**අන්තානන්තික.** පු-(අන්ත + අනන්ත + ණික) ලොකයාගේ අන්තයක් ඇත්තේයයි ද අන්තයක් නැත්තේයයි ද පවත්නා වාදය.

**අන්තික.** ති-අන්තයෙහි නියුක්ත, සමීපය, ලඟ.

**අන්තිකා.** ඉ-උඳු නම් ධාන්‍යය.

**අන්තිම.** ති-කෙළවරෙහිවූ, අවසානයෙහි වූ, පසුවූ.

**අන්තිමවත්ථු.** න-අවසානවස්තුව, පාරාජිකාපත්තිය.

**අන්තිමසරීර.** න-අවසාන ශරීරය, රහත් අත් බව. ති-අවසන් ශරීරයක් ඇති.

**අන්තෙපුර.** න-අන්තඃපුරය, රාජස්ත්‍රීන්ගේ වාසස්ථානය, ඇතුළු නුවර, නගරාභ්‍යන්තරය.

**අන්තෙපුරිකා.** ඉ-අන්තඃපුරස්ත්‍රීහු, ඔරොධය.

**අන්තෙවාසික.** ති-කෙළවර යෙදුනු.

**අන්තෙවාසික.** පු-අතවැස්සා, සමීපයෙහි වසන්නා.

**අන්තෙවාසි.** පු-අන්තෙවාසිකයා, අතවැස්සා. සමීපාවචරයා.

**අන්තො.** අ-අන්තරාලය, ඇතුළත.

**අන්තොකුච්ඡි** ති-ඇතුල්කුක්ෂිය, උදරාභ්‍යන්තරය.

**අන්තොගධ**. ති-ඇතුළත්, ඇතුළට පැමිණි.

**අන්තොඝර**. න-ඇතුළුගෙය, ඇතුළුගම, ග්‍රාමය

**අන්තොජාත** ති-ඇතුළත උපන්, ඇතුළත හටගත්. පු-ගෙයි උපන් දාසයා.

**අන්තොජාල**. න-ජාලාභ්‍යන්තරය, දැලතුළ, දැලේ.

**අන්තොජාලිකත**. ති-ජාලාභ්‍යන්තර කළ, දැලට ඇතුළත්, දැලතුළවූ.

**අන්තොනිජ්ඣාන** න-ඇතුළත දැවීම, ඇතුළත පිලිස්සීම.

**අන්තොනිමුග්ග**. පු-න ඇතුළත ගිලුනු, ඇත්ළට බැසගත්.

**අන්තොපරිසොක**. පු-හෘදයාභ්‍යන්තර ශොකය, ඇතුළේ වූ ශොකය.

**අන්තොභවික**. ති-ඇතුළත්, අභ්‍යන්තරික.

**අන්තොභාග**. පු-අන්තර්භාගය, අභ්‍යන්තර කොටස.

**අන්තොභාව**. පු-අන්තර්භාවය, ඇතුළත් බව.

**අන්තොවස්ස**. න වර්ෂාකාලය තුළ, වැහිකාලය ඇතුළත.

**අන්දු**. d භූ, බන්ධනෙ-බැඳීමෙහි, අන්දති=බඳියි.

**අන්දු**. පු-ඇතුන් බඳින දම, දම්වැල.

**අන්දුක**. න-ඇතුන් බඳින දම.

**අන්දුඝර** න බන්ධනාගාරය, හිරගේ.

**අන්දුබන්ධන** න-සිරගෙයි බැඳීම, සිරේ තැබීම.

**අන්ධ**. d. චු-දිට්ඨූපසංහාරෙ=දෘෂ්ටිය නැසීමෙහි, අන්ධෙති=අන්ධීනවෙයි, නොපෙණියයි.

**අන්ධ**. පු-අන්ධයා, දෘෂ්ටි නැත්තා, ඇස් දෙකම නැත්තා.

**අන්ධක**. න-එනම් මැසි වර්ගය, පිඹගල මැස්සා

**අන්ධකරණ**. න-අන්ධ කිරීම, ඇස් නැසීම.

**අන්ධනළිපු**. පු-ඊශ්වරයා.

**අන්ධකවින්ද**. න-එනම් පෙදෙස.

**අන්ධකාර**. පු-අඳුර, කළුවර.

**අන්ධකාරතිමිස** න-බහලාන්ධකාරය, දැඩි කළුවර

**අන්ධතම**. පු ඝනඳුර, මහා අන්ධකාරය.

**අන්ධපඞ්ගු**. පු-අඳපිළු දෙදෙනාගේ ගමන, එම න්‍යායය.

**අන්ධයට්ඨිඤාය**. පු-අන්ධයෂ්ටින්‍යායය, ඇස් ඇත්තෙකු අන්ධයෙකු ලවා ලීයක් ගන්වා ඔහු ලවා තව එකෙකු ද ඔහු ලවා තව එකෙකු දැයි මෙසේ පිළිවෙළින් අන්ධයන් රැසක් ගෙණ යාමට සමාන න්‍යායය (නොවිමසා ගතානුගතික වන්නන් සඳහා මෙය යෙදේ.)

**අන්ධවන**. න-එනම් උයන, සැවැත් නුවරට නුදුරෙන් දෙව්රම් වෙහෙර පිටිපස පිහිටි භාවනානුයොගීන් දිවාවිහරණය කරණ වනය.

**අන්ධවේණි**. ඉ-හුණදඬුවලින් අන්ධයන් සමූහයක් ගෙණ යාම. 'අන්ධයට්ඨිඤාය, බලනු.

**අන්න**. න-බත, ආහාරය.

**අන්නපාන**. න-ආහාර හා පානය කරණදේ, කනබොනදේ.

**අන්නභාර**. පු-එනම් තැනැත්තා. දිළිඳු දුප්පතුනට ඔහු තෘණ විකුණා ජීවත් විය. ඒ නිසා අන්නභාර නම් විය.

**අන්නසන්නිධි**. පු-ආහාර රැස් කර තබා ගැණීම.

**අන්නාදි**. පු-(අන්න + ආදි) ආහාරදිය.

**අන්වකාසි**. ක්‍රි-(අනු + අකාසි) අනුව කෙළේය, සිදු කෙළේය

**අන්වගා**. ක්‍රි-(අනු + ගමු. d. භූ. ගතියං=යාමෙහි 'ගමු 'හට' ගා' ආදෙශයි) අනුව ගියේය.

**අන්වගූ**. ක්‍රි-අනුව ගියහ.

**අන්වත්ථ**. ති-අනු + අත්ථ) අන්වර්ථ, අර්ථානුගත, අර්ථානුරූප, අර්ථය අනුව ගිය.

**අන්වත්ථනය**. පු-ශබ්දයන් අර්ථයට අනුගත කොට දැක්වීමේ නීතිය, අන්වර්ථනය.

**අන්වත්ථනාම**. පු-අර්ථය අනුව පවත්නා ක්‍රමය. සුත්තන්තික-පංසුකූලික යනාදීය.

**අන්වත්ථව්‍යපදෙස**. පු-අර්ථයට අනුගත වූ ව්‍යවහාරය.

**අන්වත්ථසඤ්ඤා**. පු-අර්ථයට අනුගතවූ සංඥව අර්ථානුගත සංඥව අක්ඛර සඤ්ඤා ආදියයි.

**අනුඩ්ඪමාසං.** න-(අනු + අඩ්ඪ + මාස) අඩමසක් පාසා.

**අනුදෙව.** අ-(අනු + එව) අනුවම, සමග, කැටිවම.

**අන්වය.** පු-වංශය, කුලය, පරම්පරාව, ප්‍රත්‍යය අවබොධය, ලක්ෂණය. සාධන සාමාන්‍යයෙන් සාධ්‍ය සාමාන්‍යයාගේ ව්‍යාප්තිය අන්වයයි තාර්කිකයෝ පවසත්.

**අනජ්ජතන.** පු-අද නොවන, අවිද්‍යමානා-ද්‍යතනයයි ප්‍රසිද්ධ අද්‍යතන කාලය.

**අනත්ථක.** න-අර්ථයක් නොසලකා පදයාගේ සතරවන අංගය සම්පූර්ණ කිරීමට පමණක් යොදන පදය.

**අන්වහං.** අ-(අනු + අහං) දවසක් පාසා, දවස ගානේ.

**අන්වාගච්ඡති.** ක්‍රි-(අනු + ආ + ගච්ඡති) අනුව එයි.

**අන්වාගත.** ති-(අනු + ආ + ගත) අනුව පැමිණි, කැටුව ආ.

**අන්වාචය.** පු-අන්වාචයාර්ථය. ප්‍රධානවශයෙන් එකක් කියා අප්‍රධාන වශයෙන් අනිකක් කීම. "පුඤ්ඤඤ්ච කරොහි පුත්තදාරඤ්ච පොසෙහි" පින්කරව, පුතුන්ද රකුව යන මෙහි ච ශබ්දය අන්වාචයාර්ථයි.

**අන්වාදිසති.** ක්‍රි-(අනු + ආ + දිසති) දක්වයි. කියයි.

**අන්වාදෙස** පු-ආදිදක්වූවා නැවත දක්වීම, කථිතානුකථනය, කියනලද්ද නැවත කීම.

**අන්වාධික.** ති-අනුව පවත්නා. අඩුවැඩි නැති.

**අන්වාමද්දති.** ක්‍රි-(අනු + ආ + මද්දති) මඩියි, මිරිකයි.

**අන්වාය.** අ-පැමිණ, (වුඩ්ඪිමන්වාය=වුඩ්ඪිං + අන්වාය, වෘද්ධියට පැමිණ)

**අන්වාරොහති** ක්‍රි-(අනු + ආ + රොහති) ආරූඪ වෙයි, නගියි.

**අන්වාරොහණ.** න-ආරූඪ වීම, නැගීම, ආරොහණය.

**අන්වාවිට්ඨ.** ති-(අනු + ආවිට්ඨ) ආවෙස වනු ලැබූ, අධිගෘහීත වන ලද.

**අන්වාවිසති.** ක්‍රි (අනු + ආවිසති) ඇතුලත් වෙයි, ආවෙශ වෙයි.

**අන්වාවෙස.** පු-ආවෙශය.

**අන්වාසත්ත.** ති-(අනු + ආසත්ත) අනුව ඇලුනු, ආලය කල.

**අන්වාස්සවති.** ක්‍රි-(අනු + ආ + සවති) වැගිරෙයි, වැක්කෙරෙයි.

**අන්වාහිණ්ඩති.** ක්‍රි- සක්මන් කරයි, ඇවිදියි.

**අන්වාහිණ්ඩන.** න (අනු + ආහිණ්ඩන) අනුව හැසිරීම, ඇවිදීම, සක්මන් කිරීම.

**අන්වාහිත.** ති-(අනු + ආ + හිත) පිහිටුවන ලද, කරණ ලද.

**අන්වෙති.** ක්‍රි-(අනු + එති) අනුව එයි, කැටුව එයි.

**අන්වෙසති.** ක්‍රි-(අනු + එසති) සොයයි, බලයි.

**අන්වෙසනා.** ඉ-සෙවීම, ගවෙසනය, බැලීම.

**අන්වෙසිත.** ති-සොයන ලද, බලන ලද.

**අන්වෙසී.** ති-සොයන, පරීක්ෂා කරණ.

**අන්හ.** පු-දවස, දිනය. (සායන්හ, 'මජ්ඣන්හ, යනාදියෙහි සමාසයෙහි පරපද වූ 'අහ' ශබ්දයට මේ ආදෙශ වේ.)

**අන** d භූ. ජීවත් වීමෙහි. අනති, ජීවත් වෙයි.

**අන.** d. භූ. සුසුම් හෙලීමෙහි, අනති, සුසුම් හෙලයි. "අථො අපාණං පස්සාසො අස්සාසො ආනමුච්චතෙ".

**අන** න-ගැල, ගොවුද.

**අනක්ඛාත.** ති-නොකියන ලද, 'අක්ඛාත' බලනු.

**අනඞ්ග.** පු-කාමදෙවයා.

**අනඞ්ගන.** ති-අඞ්ගන රහිත, පව් රහිත, කෙලෙස් රහිත.

**අනගාර.** ති-ගෘහ නැති, ගෙයක් නැති, ගෘහොපකරණ රහිත.

**අනගාරික.** පු-ගිහිකටයුතු රහිතයා, තාපසයා.

**අනගාරිය.** පු-අනගාරිකයා. ති-ගිහිගෙට නො අයත්. න-ශාසනය, ශාසන ධර්මය. "නත්ථි එත්ථ අගාරියන්ති අනගාරියං පබ්බජ්ජාය එතං අධිවචනං."

**අනඞ්ගණ**. ති කෙළවරක් නැති,

**අනග්ගි**. ති-ගිනිරහිත, ගිනි නැති.

**අනග්ගිපක්කික**. පු-ගින්නෙන් පිසූ ආහාර නොවළඳන කොල ගෙඩි ආදියෙන් යැපෙන තාපස කොටසක්.

**අනච්ඡ** ති නොපැහැදුනු, කිලුටු, නොපෑදි.

**අනච්ඡරිය**. ති ආශ්චර්‍ය්‍ය නොවන, පුදුම නොවන.

**අනජ්ඣාපන්න**. ති-යටත් වීමට නොපැමිණි.

**අනජ්ඣිට්ඨ** ති-ආරාධනා නොකළ, නිමන්ත්‍රණය නොකළ.

**අනඤ්ඤජ**. පු-අනඬගයා.

**අනඤ්ඤථා** අ-අන්පරිද්දකින් නොවන, වෙනස් නොවන.

**අනඤ්ඤනෙය්‍ය**. ති-අනිකෙකු විසින් නො-පැමිණ වියයුතු.

**අනඤ්ඤපොස**. ති-අනුන් පොෂණය නොකරණ.

**අනඤ්ඤාත** ති නොදැනගන්නා ලද, අවබොධ නොකළ.

**අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රිය**. න-සෝවාන් මාර්ගඥානය.

**අනණ**. ති-ණය නැති.

**අනත්ත**. පු-අනාත්මය, ආත්මයක් නැති.

**අනත්තමන**, ති-(අන්=න+අත්තමන) නො සතුටුසිත් ඇති 'අත්තමන' බලනු

**අනත්තමනතා** ඉ නොසතුටුසිත් ඇතිබව.

**අනන්ත** ති අන්තරහිත. න-නිවණ පු-අහස. අනන්තනාරජ.

**අනන්තර** පු අතරක් නැති, ව්‍යවධාන රහිත, අනතුරු.

**අනන්තනෙය්‍ය**. පු-කෙළවරක් නැති දැනගත යුතු ධර්මය. ති-එය ඇති.

**අනන්තා**. ඉ ගීතණ, කුසතණ.

**අනතිමාන**. ති-අතිකමානය නැති, වැඩියක් මානය නැති.

**අනතිමානී**. පු-තමන් උසස් කොට හෝ අනුන් පහත් කොට නොසිතන තැනැත්තා.

**අනත්ථ**. පු-අනර්ථය, අවැඩ, විපත, අහිත දේ.

**අනද්ධනික(ය)** ති-(අන්=න+අද්ධ+ඉක) දීර්ඝ කාලයක් නො පවතින, වැඩිකාලයක් නොතිබෙන.

**අනධිවර**. පු-බුදුරජ, තමාට වඩා උත්තමයෙකු නැත්තා.

**අනධිවාසන**. න-නොඉවසීම, නොපිළිගැන්ම.

**අනන්තර**. ති-අතරක් නැති.

**අනන්තරජාති**. ඉ-අනතුරු අත්බව, දෙවන ජාතිය.

**අනන්තරිත**. ති-අතර ඇති නොකළ.

**අනන්වය**. ති-අනුගත නොවන. 'අන්වය' බලනු.

**අනන්තරභව**. පු-අනන්තරජාතිය, අනතුරු අත්බව.

**අනන්දන**. න-අසන්තොෂය, නොසතුට, අමනාපය.

**අනන්වාහත**. ති-නොනසන ලද. "අනවස්සුත-චිත්තස්ස අනන්වාහත චෙතසො."

**අනනුගිද්ධ**. ති-ගිජු නොවූ, ලොල් නොවන, කෑදර නොවන.

**අනනුබොධ**. පු-අනවබොධය, නොදැන්ම.

**අනනුයොග**. පු-නොයෙදීම.

**අනනුලොම**. ති-අනුලොම් නොවන, එකඟ නොවන, සුදුසු නොවන, පිළිවෙළට නො-පවතින.

**අනනුවජ්ජ**. ති-(අන්=+අනු+වජ්ජ) නොකියයුතු, උපවාද රහිත, නින්දා නොකටයුතු, නොගැරහියයුතු.

**අනනුවිච්ච**. අ-(අන්=න+අනුවිච්ච) නොදැන, නොසලකා.

**අනනුස්සුත**. ති-අනුශ්‍රව (ආරංචි) යෙන් වත් නො අසන ලද.

**අනප්පක**. ති-අල්ප නොවන, අධික, බොහෝ.

**අනපාය**. ති-ප්‍රදූෂ්‍ය නොවූ. පු-දූෂ්‍යනොවූ සිත් ඇත්තා.

**අනපායිනී**. ඉ-නොහැර පවත්නා, අත්නො-හැර පවතින. "ඡායාව අනපායිනී."

**අනපෙක්ඛ**. ති-අපෙක්ෂා රහිත, බලාපො-රොත්තු නැති.

**අනපුංසක.** න-නපුංසක නොවූ ලිඞ්ග, පුල්ලිඞ්ග ස්ත්‍රී ලිඞ්ගද්වය.

**අනභිහත.** ති-(අන්=න + අභිහත) නැවත ඇතුළත් කර නොගන්නා ලද, අභිහත කර්මය නොකළ.

**අනභාව.** පු-නැවත නොවීම, සිදුනොවීම.

**අනභිජ්ඣා** ඉ-දැඩිලොභයට ප්‍රතිපක්ෂ ධර්මය

**අනභිජ්ඣාලු.** ති-අභිධ්‍යා බහුලකොට නැත්තහු.

**අනභිජ්ඣිත.** පු-(අන්=න + අභිජ්ඣිත) දැඩි ලොභ නොකළ, අභිධ්‍යා නොකළ.

**අනභිනන්දන.** න-නොසතුට.

**අනභිනිවෙස.** පු-අභිනිවෙස රහිත. 'අභිනිවෙස' බලනු,

**අනභිරත.** ති-නොඇලුනු, අභිරති නොකළ.

**අනභිරති.** ඉ-නොඇලීම, උකටලී වීම, ශාසනශික්ෂාවෙහි නො ඇල්ම,

**අනභිරද්ධ** ති-නොසතුටුවූ, නොඇලුනු.

**අනභිරද්ධි.** ඉ-අන්සැපතෙහි නොඇල්ම, කොපය, නොඇලීම.

**අනභිරාම.** පු-නොඇල්ම, සිත් නොඇලවීම.

**අනභිසම්බුද්ධ.** ති-අවබොධ නොකළ, ප්‍රතිවෙධ නොකළ, නොදත්.

**අනභිසම්භුණමාන.** ති-නොලැබෙන, නොහැකිවන.

**අනභිසමය.** පු-අනවබොධය, අවබොධ නොවීම.

**අනභිසිත්ත.** ති-අභිෂෙක නොකළ, කිරීටධාරණය නොකළ.

**අනමතග්ග.** ති-(අනු + අ + මත + අග්ග) අනවරාග්‍ර, කෙළවර නැති.

**අනය.** පු-(අන්=න + අය) අයනැති, අනර්ථය, උවදුර.

**අනතිසාර.** ති-නිදොස්, වරදක් නැති.

**අනයබ්‍යසන.** න-අනය හා ව්‍යසනය, අභාවය හා විනාශය.

**අනරහ.** ති-රහත් නොවන, නො රහත්. 'අරහන්ත' බලනු.

**අනරිය.** ති-(අන්=න + අරිය) ආර්‍ය්‍ය නොවන; උත්තම නොවන, පෘථග්ජන.

**අනරියවොහාර.** පු-අටවැදෑරුම් වූ අනාර්‍ය්‍යව්‍යවහාරය.

**අනල්ලීයන.** න-නො ඇලෙන.

**අනල.** පු-ගින්න.

**අනව.** ති-අළුත් නොවූ, පරණ.

**අනලස.** ති-(අන්=න + අසල) අලස නොවන, කුසීත නොවන.

**අනවකාස.** ති-අවකාශරහිත, අවකාශ නැති, ඉඩ නැති.

**අනවකාසවිධි.** පු-පෙරකී කාර්‍ය්‍යයාගේ විෂය පසුව කියන කාර්‍ය්‍යයෙහි නොලැබෙන ක්‍රමය, අනවකාස නය යනුද මෙම අර්ථයි.

**අනවජ්ජ.** ති-අනවද්‍ය, නිරවද්‍ය, නිවැරදි දොෂ නැති.

**අනවඤ්ඤත්ති.** ඉ-අවමන් නොකිරීම.

**අනවට්ඨිත.** ති-අනවස්ථිත, එක් අරමුණක නොපිහිටන.

**අනවය.** ති (අන්=න + අවය) අනූන, සම්පූර්ණ.

**අනවබොධ.** පු (අන්=න + අවබොධ) අවබොධ නොවීම, නොතේරීම.

**අනවරත.** ති-නිරන්තරය, නිතර.

**අනව (වො)සිත.** පු-අවසන් නො කළ, නො නිම වූ.

**අනවසෙස.** ති-(අන්=න + අවසෙස) ශෙෂරහිත, ඉතුරු නැති.

**අනවස්සුත.** ති-නොතෙත්, ආර්ද්‍ර නොවන. "අනවස්සුත චිත්තස්ස."

**අනවහය.** ති-ආවාහයට නුසුදුසු.

**අනව්හිත.** ති-නොකැඳවනලද, ආමන්ත්‍රණය නොකළ.

**අනවාහ.** පු-ගොණා.

**අනසන.** පු-නොකන තැනැත්තා, බඩගින්නේ සිටින අය, නිරාහාරව සිටින අය.

**අනසන.** න-අනුභව නොකිරීම, නොකෑම.

**අනසනාදික.** පු-අභොජනාදිය.

**අනභිසඩාවන**. අ-නොකා, අනුභව නොකොට.

**අනසසන**. ති-අනතුරට නොපැමිණෙන, අනතුරු නොවන න-නොනැසීම.

**අනසසාසික**. ති-සැනසිලි නැති.

**අනස්සාසී**. පු-සැනසිලි නැත්තා.

**අනස්සුං**. ක්‍රි-(අ+නස d දි. අදසසනෙ, නොදක්මෙහි+උං) විනාශ වූහ, නැසුනාහ, නොපෙණී ගියාහ.

**අනාකිණ්ණ**. ති-ආකීර්ණ නොවන, සමූහයා හා එකට හැනී නොපවතින.

**අනාකුල**. ති-ආකුල නොවන, පටලැවිලි රහිත.

**අනාගත**. පු-මතුකාලය. ති-නොපැමිණි.

**අනාගතකාල**. පු-අනාගතකාලය, මතු ලැබෙන කාලය.

**අනාගමන**. න-නොඊම, නොපැමිණීම.

**අනාගාමි** පු-(න+ආගාමි) අනාගාමිපුද්ගලයා, උත්පත්තිවශයෙන් කාමභවයට නොඑන සවභාව ඇත්තා.

**අනාගාමිමග්ග** පු-අනාගාමිමාර්ගය.

**අනාගාමිඵල**. න-එනම් ඵලය, තුන්වැනි ලොකොත්තරවිපාකසිත.

**අනාගාමිතා** ඉ-නොඑන ගතිය, උත්පත්ති වශයෙන් කාම භවයට නොඑන බව.

**අනාගාර**. න-ශ්‍රමණභූමිය, තාපසභූමිය, පු-ගෙයක් නැත්තා.

**අනාඝාත**. ති-ක්‍රොධ නැති, විෂ්කම්භන වශයෙන් ක්‍රොධය නසන ලද.

**අනාචාර**. ති-ආචාර රහිත, යහපත් හැසිරීම් නැති. පු-නරක හැසිරීම.

**අනාචිණ්ණ**. ති-පුරුදු නොකළ, ප්‍රගුණ නොකළ

**අනාජානීය**. ති-උත්තම නොවන, ශ්‍රෙෂ්ඨ නොවූ. 'ආජානීය' බලනු.

**අනාත්ම**. ති-න අත්තානි=අනත්තා. ආත්මය නොවන්නේ අනාත්ම නම්. එය තමන් වශයෙහි නො පවත්නාවූ අර්ථයෙන්ද සවාමියෙක් නැති අර්ථයෙන්ද ශූන්‍යතා අර්ථයෙන්ද ආත්මය ප්‍රතික්ෂෙප කරන්නාවූ අර්ථයෙන් දූසි අනාත්ම නම්.

**අනාථ**. ති-(අ=න + නාථ) නාථ රහිත, අසරණ.

**අනාථපිණ්ඩික**. පු-(අ=න + නාථ + පිණ්ඩ + ඉක) අනාථයින්ට දියයුතු පිඩුඇත්තා, එනම් සිටුතුමා.

**අනාදර**. ති-ආදර රහිත. පු-පරිභවය, නොසැලකීම.

**අනාදරිය**. ති-ආදර නැති. න-ආදරනැතිබව.

**අනාදාතු**. පු-නොගන්නා.

**අනාදාය**. අ-නොගෙණ.

**අනාදාන**. න-නොගැන්ම.

**අනාදියන**. න-නොගැණීම.

**අනාදියිත්වා**. අ-නොගෙණ, ග්‍රහණය නොකොට.

**අනාදීනවදස්සාවී**. ති-දොෂ නොදක්නාසුලු.

**අනාපත්ති**. ති-ආපත්ති රහිත, ඇවැත් නැති. නිරවද්‍ය. ඉ-නොපැමිණීම.

**අනාපාථගත**. ති-(අන්=න + ආපාථගත) ආපාථයට නොපැමිණි, ඉදිරියට නොපැමිණි.

**අනාපාථගත**. ති-ආපාථගත නොවූ.

**අනාපාද**. ති-අවිවාහක

**අනාපායික**. ති-අපායෙහි නූපදින, ආපායික නොවන.

**අනාපුච්ඡන**. න-නොවිචාරීම, නොපිළිවිසීම.

**අනාපුච්ඡිත**. ති-නොවිචාළ, නොපිළිවිසි.

**අනාබාධ**. ති-ආබාධරහිත, නීරොගි.

**අනාමට්ඨ**. ති-සපර්ශනොකළ, ආමර්ශනය නොකළ.

**අනාමත**. ති-නොමළ, කාලක්‍රියා නොකළ.

**අනාමන්තචාර**. පු-දෙලොස්රියනකින් සමීපයෙහි සිටින උපසපත් කෙනෙකුන්ට නොදන්වා ආරාමයෙන් බැහැර යාම, අවසර නොමැතිව හැසිරීම.

**අනාමන්තනා**. ඉ-අනාමන්ත්‍රණය, අනාරාධනාව, නොපැවරීම.

**අනාමය**. ති-(අන්=න + ආමය) ආමයරහිත, නීරොගි.

**අනාමසන**. න-සපර්ශ නොකිරීම.

**අනාමස්ස.** } **අනාමාස.** } ති ස්පර්ශ නො කටයුතු, අත නො ගෑයුතු. භික්ෂූන් විසින් ඇල්වීමට අයෝග්‍ය වස්තු:- එනම් දශවිධ රත්න, ස්ත්‍රීරූප, සප්තවිධ ධාන්‍ය, ස්ත්‍රීපළඳනා, පිඹිනා සක්කුලල් බෙර ආදිය හා අවශේෂ ක්‍රීඩා භාණ්ඩ, කඩු දුනු ආදිය.

**අනාමසිත.** ති-ස්පර්ශ නොකළ, අත නොගෑ.

**අනානාකථික.** පු-(න + නානා + කථා + ඉක) නත්වැදූරුම් අනර්ථ කථා නොකරන්නා, එවැනි කථා නොකරන්නා.

**අනාමිකා** ඉ-නමක් නැති ඇඟිල්ල, වෙදැඟිල්ල, මුදුඇඟිල්ල.

**අනායතන.** න- ආයතන නොවන ධර්මය. 'ආයතන' බලනු.

**අනාරක්ඛා.** ඉ-නොරැක්ම.

**අනායස.** ති-සැපනොවන, නොසැප. (නත්ථි අයො සුඛනති=අනායසො.)

**අනායාස.** ති-හිරිහැර රහිත. පු-නොවෙහෙසීම.

**අනාරම්භ.** පු පටන් නොගැන්ම, ආරම්භ නොකිරීම.

**අනාරාධක.** ති-සතුටු නොකරණ.

**අනාරිය.** ති ආර්ය නොවන, උත්තම නොවන.

**අනානුවජ්ජ.** ති-චෝදනා නොකළ.

**අනාලම්බන.** න-අරමුණු නැති, නොඑල්ලෙන, ප්‍රතිෂ්ඨාරහිත.

**අනාලය.** ති-ආලය නැති, තෘෂ්ණා රහිත. න-නිවණ.

**අනාලොචන.** න-ඇසින් නොදැකීම.

**අනාවට.** ති-අනාවෘත, නොවැසූ, නොවසන ලද.

**අනාවත්තන.** න-නොනැවතීම, නොපැවතීම.

**අනාවත්ති** ති-පෙරළා නොඑන, ආපසු නොඑන.

**අනාවාස.** ති-ආවාසරහිත, වාසයක් නැති. පු-නොවැසීම.

**අනාවිකත.** ති-ප්‍රකාශ නොකළ, නොදක්වන ලද.

**අනාවිකම්ම.** න-ප්‍රකාශ නොකිරීම.

**අනාවිල.** ති-නොකැලඹුනු, චඤ්චල නොවන මඩරහිත, කෙලෙස් රහිත.

**අනාවුත්ථ.** ති-වාසය නොකළ, නොවිසූ

**අනාසක.** ති-නිරාහාරව වසන. පු-ආහාර නොගන්නා තැනැත්තා.

**අනාසන්න.** ති-ආසන්න නොවන, සමීප නොවන. න-අසමීපය.

**අනාසව.** ති-ආශ්‍රව රහිත, කෙලෙස් නැති. න-නිවණ.

**අනාසවසුඛ.** න-ආශ්‍රව රහිත සැපය, නිවන් සැපය.

**අනාහාර.** පු-ආහාර නොගැන්ම. ති-ආහාර නැති.

**අනාහට.** ති-ලඟට නොපැමිණි, වෙත නොපත්.

**අනාළ්හික(ය)** ති-කාලකණ්ණි, පින්මද.

**අනික්කඩ්ඪන** න-නොකැඩීම, නොඇදීම.

**අනික්කසාව.** ති-බැහැර නොකළ කසට ඇති, මාර්ගපරිපාටියෙන් බැහැර නොකළ කෙලෙස් ඇති.

**අනික්ඛිත්ත.** ති-නොදමනලද, බැහැර නොකළ.

**අනික්ඛිත්තධුර** න නොහරිණලද වීර්යය. ති-එය ඇති.

**අනිකාම.** ති-නොකැමැති, අරුචි.

**අනිකෙත.** ති-කෙලෙස් රහිත, නිකෙලෙස්.

**අනිකෙතසාරී.** ති-පලිබොධරහිත. පු-තෘෂ්ණා රහිතව හැසිරෙන්නා, බුදුරජ.

**අනිච්ච.** ති-නිත්‍ය නොවන, සැමකල්හි නොපවතින.

**අනිච්චවිධි.** පු-නිත්‍ය නොවන කාර්යය පිළිබඳ නියමය.

**අනිච්චසමාස.** පු-සවපද විග්‍රහ ඇති මහාවීර ආදිය අනිත්‍ය සමාස නම්.

**අනිච්චසඤ්ඤා.** ඉ-සියලු සංස්කාරයන් අනිත්‍යයයි සැලකීම.

**අනිච්ඡ.** ති-ආසා රහිත, තෘෂ්ණා නැති.

**අනිච්ඡය**. ති-නිශ්චය නැති, නියම නැති, ඒකාන්ත නොවන.

**අනිච්ඡිත**. ති-අභිමත නොවූ, නොකැමැති.

**අනිච්ඡිතකම්ම**. න-කර්තෘ ක්‍රියාව හා සම්බන්ධ කිරීමට නොකැමැති කර්මය, අනීප්සිත කර්මය.

**අනිඤ්ජන**. ති-කම්පා නොවන, නොසෙල්වෙන.

**අනිඤ්ජිත** ති කම්පා නොවන, නොසෙල්වෙන 'ඉඤ්ජිත' බලනු

**අනිට්ඨ** ති-නොනිමි, සමාප්ත නොවූ.

**අනිට්ඨඞ්ගත**. ති-නිමාවට නොපැමිණි, සමාප්ත නොවූ.

**අනිට්ඨප්පසඞ්ග**. පු-අභිමත නො වූ කාර්‍යයීකාගේ පැමිණීම, අනිෂ්ටප්‍රසඞ්ගය.

**අනිට්ඨිත**. ති-නිම නොකළ, නොනිමි.

**අනිට්ඨගන්ධ** පු-දුර්ගන්ධය, දුගඳ.

**අනිට්ඨුර**. ති ක්‍රෑර නොවන

**අනිත්ථි**. පු-ස්ත්‍රීලිඞ්ග නොවූ නාමය, පුල්ලිඞ්ග නපුංසකලිඞ්ගද්වය.

**අනිත්ථිගන්ධ** පු-ස්ත්‍රීගන්ධය නොකැමැත්තා පු-එනම් කුමාරයා

**අනිත්ථී** ඉ-ස්ත්‍රීගති නැති ස්ත්‍රී, ස්ත්‍රීස්වභාව නැත්තී

**අනිද්ධන්ත**. ති-පිඹ නොහළ, පිරිසිදු නොකළ

**අනිදස්සන**. න-නොදක්වියහැකි පදාර්ථය, නිවණ.

**අනිද්දෙස**. ති-නොදක්වනලද, නිර්දේශ නො කරණ ලද.

**අනිධානගත**. ති-නිදන්ගත නොවූ තැන්පත් නොවූ.

**අනින්දි**. ක්‍රි-(අ+නින්ද d භූ ගරහායං, ගැරහීමෙහි+ඊ) නින්දා කෙළේය, ගැරහීය.

**අනින්දිත**. ති-(අ=න+නින්දිත) නින්දා නොකළ, නිගා නොකළ.

**අනිප්ඵන්න** ති-නූපන් නිෂ්පන්න නොවූ

**අනිප්ඵල** ති-නිෂ්ඵල නොවන, ඵලසහිත, ප්‍රයොජනවත්,

**අනිබද්ධ**. ක්‍රි-නොබඳනා ලද

**අනිබ්බිද්ධ**. ති-විනිවිද නොගිය, පසාරු කරගෙණ නොගිය, දෙපලු නොකළ.

**අනිබ්බිද්ධා**. ඉ-විනිවිද නොගිය වීපිය, හරස්-වීපිය.

**අනිබ්බිස** ති-පච්චිරහිත, පීඩාරහිත, නිදුක්.

**අනිමිත්ත**. න-විපල්ලාස හෙවත් නිත්‍යය යන වැටහීමෙන් මුදන මාර්ගය, අනිත්‍යාදිවශයෙන් විදර්ශනා කරන්නාහට උපදනා මාර්ගය ති-නිමිති රහිත.

**අනිමිත්තවිමොක්ඛ**. පු-සංස්කාරයන් අනිමිත්තවශයෙන් හෙවත් අනිත්‍යවශයෙන් විදර්ශනා කොට ලැබගත් මාර්ගය.

**අනිමිස**. ති-ඇසිපිය හෙලීම් රහිත, ඇසිපිය නොගසන. පු-දෙවියා, මත්ස්‍යයා.

**අනිමිසලොචන**. න ඇසිපිය නොහෙලන ඇස.

**අනිමිසලොචනපූජා**. ඉ-ඇස්පිය නොහෙලා ගෞරවයෙන් බලා සිටීම, තථාගතයන් වහන්සේ බුදුව දෙවනසතියෙහි දී අනිමිසලොචනයෙන් කළ බොධි පූජාව.

**අනියත** ති-නියත නොවූ, නිශ්චයක් නැති, ඒකාන්ත නොවන.

**අනියතමිච්ඡාදිට්ඨි**. ති-නියතමිථ්‍යාදෘෂ්ටි නොවන, කම්මස්සකතා සච්චානුලොමික යන ඥානවයෙන් කම්මස්සකතාඤාණය පමණකින් සම්‍යක්දෘෂ්ටි ඇති.

**අනියමප්පසඞ්ග**. පු-අනියමින් පැමිණීමේ කාර්‍යය.

**අනියම**. පු-නිශ්චිත නොවූ කාර්‍යය. නියම නොවූ වැඩය.

**අනියමවිධි**. පු-අනියම විධිය.

**අනියමත්ථ**. ති-නියම අර්ථයක් නැති.

**අනියතද්වය**. න-"න නියතො අනියතො" යන අදහස අනුව ඒකාන්තින් වන බවක් නැති හෙයින් නියත නොවේනුයි අනියත නම් වේ, ඉමෙඛොපනා යස්මනො ද්වෙ අනියතා ධම්මා උද්දෙසං ආගච්ඡන්ති, යනුවෙන් දක්වෙන ප්‍රාතිමොක්ෂයෙහි එන ඇවැත් දෙකකි.

**අනියමිත**. ති-නියම නොකළ, පමණ නොකළ හැකි.

**අනියාමිත**. ති-නියම නැති, නිශ්චය නැති, අනිශ්චිත.

**අනිරාකත්තු**. පු-කතෘහු විසින් දෙනුලබන දෙය ප්‍රතික්ෂෙප නොකරන්නා, සම්ප්‍රදාන විභක්තිය.

**අනිරාකත**. ති-(අ=න + නිරාකත). බැහැර නොකළ, නොවැළැක්වූ.

**අනිරාකතජ්ඣාන**. ති-බැහැර නොකළ ධ්‍යාන ඇති.

**අනිල**. පු-වාතය, සුළඟ.

**අනිලඤ්ජස**. න-(අනිල + අඤ්ජස) වාතමාර්ගය, අහස.

**අනිලපථ**. පු-වාතමාර්ගය, අහස.

**අනිලොබ්භූත**. ති-අනිල + උ + භූත) වාතයෙන් ඔසවනලද, පවනින් කම්පිත, සුළඟින් සෙලවෙන.

**අනිවත්තන**. ති-නොනවත්නා, නොපවතින.

**අනිවත්ති**. ති-නොනවතින, එකතැනක නැවතී නො සිටින.

**අනිස්සට්ඨ**. ති-බැහැර නොකළ තුබූ තැනින් වෙනස් නොකළ ඇස.

**අනිස්සය**. ති-නිරාශ්‍රය, පිහිට නැති, ආධාර රහිත.

**අනිස්සර**. ති-ප්‍රධානයෙක් නැති, ඊශ්වර රහිත.

**අනිස්සුකී**. පු-ඊෂ්‍යා නොකරන්නා. 'ඉස්සුකී, බලනු.

**අනිස්සරණපඤ්ඤ**. ති-ඡන්දරාගය ප්‍රහීණ කරණ ප්‍රඥ නැති.

**අනිසම්මකාරී**. ති (අ=න + නි + සම්මකාරී) අපරීක්ෂාකාරී, අපරීක්ෂාවෙන් ක්‍රියා කරණ.

**අනිස්සිත**. ති-ආශ්‍රය නොකළ, සෙවනය නොකළ,

**අනීක**. න-යුද්ධසෙනාව, භටහමුදාව.

**අනීකදස්සන**. ති-බලසෙන් දැක්ම.

**අනීකග්ග**. පු-යුද්ධසෙනාවගේ පෙරමුණ, යුද්ධයෙහි ඉදිරියෙහි යන්නා.

**අනීකට්ඨ**. පු-රජුන්ගේ ශරීරාරක්ෂකහමුදාව.

**අනීඝ**. ති-දුක් නැති, පව් නැති.

**අනීති**. ති-(අන්=න + ඊති) උවදුරු නැති, විපත් නැති.

**අනීලක**. ති-මැස්සන් නැති,

**අනීතික**. ති-කෙලෙස්බිය නැති, නිරුපද්‍රැත. න-නිවණ.

**අනු**. අ-පශ්චාදර්ථ, අතිශය, සදෘශත්ව. අනුපවජිතත්ත, අනුවෘත්ති, හීන, විතියාර්ථ, අධොභාව, අනුගතාර්ථ, හිතාර්ථ, දෙශ, ලක්ෂණ, වීප්සා, ඉත්ථම්භූත, භාග යන මෙහි.

**අනුක්කණ්ඨන**. න-උකටලී නොවීම, නොකලකිරීම.

**අනුක්කම**. පු-අනුක්‍රමය, පිළිවෙළ, පටිපාටිය.

**අනුක්කමති**. ක්‍රි-(අනු + කමු. d. භූ. පද-විකෙඛපෙ, ගාමෙහි + ති) පිළිවෙළින් යයි. ඉක්මවයි.

**අනුක්ඛිපන**. න-උත්ක්ෂෙප නොකිරීම, නොඑසවීම.

**අනුක**. පු-කාමියා.

**අනුකඞ්ඛී**. පු-සැක කරන්නා.

**අනුකඩ්ඪන**. න සූත්‍රයකින් සූත්‍රයකට අනුවර්තනය වූ පදයක් මතු අනුවර්තනය නොවන පරිදි ආපසු ගැණීම අනුකර්ෂණය.

**අනුකන්තති**. ක්‍රි-(අනු + කති. d. රු. ඡෙදෙ, සිදීමෙහි. + ති) කැබලි කරයි, තීරු කරයි.

**අනුකම්පක**. ති-(අනු + කම්ප d, භූ. කම්පනෙ. කම්පාවීමෙහි + ණ්වු=අක) අන්‍යයා කෙරෙහි අනුකම්පා කරණ, දයාව පෙන්වන, කරුණා ඇති.

**අනුකම්පති**. ක්‍රි-අනුකම්පා කෙරෙයි, දයා කෙරෙයි.

**අනුකම්පන**. න-අනුකම්පාව, දයාව, කරුණා කිරීම.

**අනුකම්පා**. ඉ-කරුණාව, දයාව

**අනුකම්පිත**. ති-අනුකම්පා කළ, කරුණා කළ.

**අනුකම්පී**. ති-අනුකම්පා ඇති, දයා ඇති.

**අනුකරණ**. න-අනුව කිරීම, එකගව කිරීම, යමක් සමානව කිරීම. 'චිටි' 'චිටි' යනාදි ශබ්දමාත්‍රයක් කිරීම.

**අනුකරණසද්ද.** පු-අර්ථ විරහිත ශබ්දමාත්‍රය. 'චිට්' 'චිට්' යනාදිය, අර්ථය නොසලකා ගතයුතු ශබ්දමාත්‍රය.

**අනුකරොති.** ක්‍රි-(අනු+කර d. ත. කරණෙ, කිරීමෙහි. විකරණ ඔ+ති) අනුව කරයි, එකඟව කරයි.

**අනුකස්සති.** ක්‍රි-(අනු+කස්ස. d. භූ. ගතියං, යාමෙහි+ති) ආපසු අදියි. පස්සට අදියි.

**අනුකාම.** පු-ආදරයට ආදරය දක්වීම.

**අනුකාර.** පු ප්‍රත්‍යුපකාරය. අනුකරණය. සමාජීක්‍රියාව.

**අනුකාරී.** ති-අනුව ක්‍රියා කරණ.

**අනුකිණ්ණ.** ති ආකීර්ණ, ගැවසිගත්.

**අනුකුබ්බති.** ක්‍රි-(අනු+කර. d. ත. කරණෙ, කිරීමෙහි. රකාර අ=උ. ර් ලොප. විකරණ-ඔ=උ=ව්. ව්=හට විත්ත=වව=බබ+ති) අනුව කරයි.

**අනුකූල.** ති-එකඟ, යමෙකුගේ ක්‍රියාවට එකඟ වන.

**අනුඛනති.** ක්‍රි-(අනු+ඛන. d. භූ. අවදාරණෙ, සෑරීමෙහි+ති) අනුව සාරයි.

**අනුඛනන.** න-අනුව සෑරීම, කැනීම.

**අනුඛුද්දක.** ති-අනුක්‍ෂුද්‍රක. ඉතා කුඩා. "ඛුද්දානුඛුද්දකසික්ඛා."

**අනුග්ගහ.** පු-(අනු+ගහ) අනුග්‍රහය, උදව් කිරීම.

**අනුග්ගහණ.** න-අනුග්‍රහ කිරීම, උදව් කිරීම.

**අනුගණ්හාති.** ක්‍රි-(අනු + ගහ+ණ්හා + ති) අනුග්‍රහ කරයි.

**අනුග්ගහබුද්ධි.** ඉ අනුග්‍රහ කිරීම පිණිස පවත්නා අදහස, අනුග්‍රහ බුද්ධිය.

**අනුග්ගහිත.** ති අනුග්‍රහ කළ.

**අනුග්ගාහක.** ති-අනුග්‍රහ කරණ, උදව් කරණ.

**අනුග්ඝාත.** පු-(අන්=න+උ+ඝාත)නොසෙල් වියහැකි, නොඉදිරියහැකි.

**අනුග.** ති-අනුගමනය කරණ, අනුව යන, සහචර.

**අනුගත.** ති-අනුගතාර්ථ, අනුකූල, අනුව ගිය, අනුව උපන්.

**අනුගති.** ඉ-අනුව යාම, අනුකූලගතිය.

**අනුගච්ඡති.** ක්‍රි-(අනු+ගමු. d. භූ. ගතියං, යාමෙහි+ච්ඡ+ති) අනුව යෙයි, කැටුව යෙයි, එක්ව යෙයි.

**අනුගම.** පු }
**අනුගමන.** න } අනුව යාම, කැටුව යාම, ගියවුන් අනුව යාම, පසුපස්සේ යාම, සහාය වීම, එළඹීම.

**අනුගාමික.** ති-අනුව යන්නා, අනුව යන පින, අනුගච්ඡතීති අනුගාමිකො.

**අනුගාමිකනිධාන.** න-කැටුව යන නිධානය, කුශලක්‍රියාව.

**අනුගාමිනී.** ඉ-අනුව යන්නී.

**අනුගාමී** ති-කැටුව යන, අනුව යන.

**අනුගායති** ක්‍රි (අනු+ගායති) අනුව ගායනා කරයි, ගායනා කළ පරිදි ගායනා කරයි.

**අනුගායන.** න-අනුව ගායනා කිරීම.

**අනුගාහති.** ක්‍රි-(අනු+ගාහ. d. භූ. විලොළනෙ, කැලඹීමෙහි+ති) දියට බැසගණී. ඇතුළත් වෙයි.

**අනුගිජ්ඣති.** ක්‍රි (අනු+ගිධු d. දි. අභිකඛායං, ගිජු වීමෙහි+ති) ගිජු වෙයි, ලොල් වෙයි, කෑදර වෙයි.

**අනුගිජ්ඣන.** න-ගිජු වීම, ලොල් වීම,

**අනුගිද්ධ.** ති-ගිජු වූ, ලොල් වූ, සොඬ වූ.

**අනුගීති.** ඉ-අනුව ගැයීම, පදයෙන් කීවක් ගාථාවෙන් කීම,

**අනුඝර.** න-ගෙයක් පාසා, ගෙපිළිවෙළ.

**අනුච්චාවච.** න-(අන්=න+උච්චාවච) උස් පහත් නොවන, හීන ප්‍රණීත නොවන.

"අනුච්චාවචසීලස්ස නිපකස්ස ච ඣායිනො."

**අනුච්චාරණ.** න-(අන්=න+උච්චාරණ) උච්චාරණය නොකිරීම, නොකීම, නොඋසුරුවීම.

**අනුච්චාරිත.** ති-උච්චාරණය නොකළ, නොකී, නොඋසුරුවනලද.

**අනුච්ඡවික.** ති }
**අනුච්ඡවිය.** ති } -සුදුසු, සුතු, යොග්‍ය.

**අනුච්ඡිට්ඨ**. ති-(අන්=න + උච්ඡිට්ඨ)ඉඳුල් නොකළ, පරිභොගයෙන් ඉඳුල් නොවූ.

**අනුචඞ්කමණ**. න-අනුචඞ්ක්‍රමණය, අනුව සක්මන් කිරීම.

**අනුචඞ්කමති**. ක්‍රි-අනුව සක්මන් කෙරේ, කෙණ්ඩාවල ආබාධ වළකනු පිණිස ඔබමොබ සක්මන් කරයි.

**අනුචර**. ති-අනුචරයා, අනුව හැසිරෙන්නා, පසුපස්සේ යන්නා.

**අනුචරණ**. න-අනුසඤ්චරණය, අනුව හැසිරීම.

**අනුචරති**. ක්‍රි-(අනු + චරති) හැසිරේ, එක්ව හැසිරේ.

**අනුචරිත** ති-හැසිරෙණලද, න-නැවත නැවත හැසිරීම.

**අනුචාරිකා** ඉ-අනුව හැසිරෙන්නී, භාය්‍යාව.

**අනුචිණ්ණ**. ති-හැසිරෙණලද. පුරුදු කළ, පැමිණි.

**අනුචින්තන**. න-අනුව සිතීම, අනුමානඥනයෙන් සැලකීම.

**අනුචින්තෙති**. ක්‍රි-(අනු + චින්ත d. චු. චින්තායං, සිතීමෙහි + ණෙ + ති) අනුව චින්තනය කරයි, කරුණු අනුව සිතයි.

**අනුජ්ජු(ක)**. ති-(අන්=න + උජු(ක). සෘජු නුවූ, ඇද, වඞ්ක.

**අනුජ්ඣාන**. න-(අනු + ඣාන ) නැවත නැවත සිතීම, අනුව සිතීම, (අන්=න + උජ්ඣාන) අවඥ නොකිරීම.

**අනුජ**. පු-බාලසහෝදරයා ඉ-බාලසහෝදරී.

**අනුජග්ඝති**. ක්‍රි-(අනුජග්ඝ d භූ. හසනස්මිං, සිනාවෙහි + ති) සිනාසෙයි, යමක් අනුව සිනාසෙයි, කවටකම් කරයි.

**අනුජග්ඝන** න-සිනාසීම, කවටකම් කිරීම.

**අනුජවති**. ක්‍රි-(අනු + ජු d. භූ ජවෙ, ශීඝ්‍ර ගමනෙහි + ති) අනුව දුවයි. කැටුව යෙයි.

**අනුජවන**. න-පස්සෙන් දිවීම, කැටුව දිවීම.

**අනුජාත**. ති පියාට සමාන ගුණ ඇතිව උපන්.

**අනුජානන**. න-අනුදැනීම, අවසරදීම.

**අනුජානාති**. ක්‍රි-අනු + ඤා d. කී. 'ඤා' හට 'ජා' ආදෙශ යි. + විකරණ-නා + ති) අනුදනී. අවසර දෙයි.

**අනුජීවති**. ක්‍රි-අනු + ජීව. d. භූ. පාණධාරණෙ, ජීවත්වීමෙහි + ති) අනුව ජීවත් වෙයි, යමෙකු නිසා ජීවත් වෙයි.

**අනුජීවන**. න-අනුව ජීවත්වීම, මවුපිය ආදීන් නිසා ජීවත්වීම.

**අනුජීවිත**. න-අනුව ජීවත්වීම.

**අනුජීවී**. ති-යමෙකු ඇසුරු කොට ජීවත් වන්නා, දාසයා, සෙවකයා.

**අනුජු**. ති-සෘජු නැති, ඇද ශඨ.

**අනුඤ්ඤා**. ඉ-අනුඥව, අනුදැනීම.

**අනුඤ්ඤාත**. ති-අනුදන්නාලද

**අනුඤ්ඤාතත්ත**. න-අනුදත්බව, අවසර ගත් බව.

**අනුට්ඨහන**. න-නොනැගිටීම, මැලිව සිටීම, වීය්‍ය නොකිරීම.

**අනුට්ඨාතු**. පු-නොනැගිටින්නා, වීය්‍ය නොකරන්නා.

**අනුට්ඨාන**. න-නොනැගිටීම, නැගී නොසිටීම, මැලිව සිටීම.

**අනුට්ඨිත**. ති-{(අනු + ඨිත) කරණලද, (අන්=න + උට්ඨිත) නොනැගිටි.

**අනුත්ථුනන**. න-අනුශොචනය, යමක් නිසා වැලපීම.

**අනුත්ථුනාති**. ක්‍රි-(අනු + ථු. d. කී. නිත්ථුනනෙ, වැලපීමෙහි + විකරණ-නා + ති) යමක් නිසා කණගාටු වෙයි, ශොක කරයි.

**අනුට්ඨුභ**. ඉ-අකුරු අටකින් යුත් එනම් ඡන්දස.

**අනුට්ඨුභති**. ක්‍රි-(අනු + ථුභ d. තු. නිට්ඨුභනෙ, කාරා දැමීමෙහි + ති) කාරා දමයි, කෙලගසයි.

**අනුට්ඨුභන**. න-කාරා දැමීම.

**අනුට්ඨුභී**. පු-කාරා කෙල ගසන්නා.

**අනුට්ඨුභි**. ක්‍රි-(අනු + ථුභ d. තු + ඊ) කෙල ගැසීය.

**අනුඩහති**. ක්‍රි (අනු + දහ. d. භූ. භස්මීකරණෙ දිසු, හළු කිරීම් ආදිසෙහි + ති. 'ද' හට 'ඩ' ආදෙශයි) අනුදහනය කරයි, අනුව දවයි.

**අනුඩසති.** ක්‍රි-(අනු+ඩංස. d. භූ. ඩංසනෙ, දෂ්ට කිරීමෙහි+ති) ඩැහැ ගණී, හපා කයි, දෂ්ට කරයි.

**අනුණ්හ** පු-අලසයා.

**අනුත්තකාල.** පු-නොකියන ලද කාලය, ආඛ්‍යාත පඤ්චමීසප්තමී විභක්තීන්ගේ කාලය, වර්තමාන කාලය, කියනලද කාලය.

**අනුත්තර.** ති-උත්තර රහිත, ශ්‍රෙෂ්ඨ, තමාට වඩා උසස් කෙනෙකු නැති, උත්තරදිසාවට විරුද්ධ දිසාව නොහොත් දකුණ.

**අනුත්තරිය.** පු-ඊට වඩා උසස් ධර්මයක් නැති ජ්‍යෙෂ්ඨ ධර්ම සය. එනම්:- 1 දස්සනානුත්තරිය, 2, සවණානුත්තරිය, 3. ලාභානුත්තරිය, 4. සික්ඛානුත්තරිය, 5 පාරිචරියානුත්තරිය, 6. අනුස්සතානුත්තරිය. (සූ: ව: සඞ්ගීතිසූත්‍ර: මූ: 759. ම: පූ: එ: නි: ව:).

**අනුත්තසමුච්චය.** (අනුත්ත+සං+උ+චි) නොකීවක් පිඩුකර ගැනීම, අනුක්තාර්ථය පිණ්ඩණය කිරීම.

**අනුත්තාන.** ති-(=අන්+න+උත්තාන) උඩුකුරු නොවන, අප්‍රකට.

**අනුත්තානීකත.** ති-(අන්+න+උත්තාන+ඊ+කත) උඩුකුරු නොකළ.

**අනුත්ති.** ති-නොකීම

**අනුත්ථුත.** ති-පිළිවෙළින් ස්තුති කළ. පිළිවෙළින් පසසන ලද.

**අනුත්ථුනන** න අනුශොචනය, විලාපය.

**අනුත්ථුනාති.** ක්‍රි (අනු+ථු d. කි. නිත්ථුනනෙ, වැලපීමෙහි+විකරණ. -නා+ති) විලාප කියයි, තත් දෙඩයි.

**අනුත්‍රා(ත්තා)ස.** ති-(=අන්+න+උත්‍රාස) තැති ගැණුම් රහිත, මහ බිය නැති.

**අනුත්‍රා(ත්තා)සී.** පු උත්‍රාස නැත්තා, තැති ගැණිම් නැත්තා.

**අනුතප්පති.** ක්‍රි-(අනු+තප. d. භූ. සන්තාපෙ, තැවීමෙහි+ති) තැවෙයි, අනුව තැවෙයි, කර්මානුරූපව තැවෙයි.

**අනුතප්පන.** න තැවීම, අනුතාපය, පසුතැවිල්ල,

**අනුතපති.** ක්‍රි-(අනු+තප. d. භූ. සන්තාපෙ, තැවීමෙහි+ති) පසුතැවිලි කරයි.

**අනුතස්සන.** න-රා බොන ඔඩම, රා බොන භාජනය.

**අනුතාපිය.** ති-අනුව තැවිය යුතු.

**අනුතාපී.** ති-පශ්චාත්තාප වන්නා, පසුතැවිලි කරන්නා.

**අනුතාළෙති.** ක්‍රි-(අනු+තාළ. d. චු. තාඩනෙ, තැළීමෙහි+ණෙ+ති) තාඩනය කරයි, තළයි, පහර දෙයි.

**අනුතිට්ඨති.** ක්‍රි-(අනු+ඨා. d. භූ. ගතිනිවුත්තියං, ගමන් නැවැත්මෙහි, 'ඨා' හට 'තිට්ඨ' ආදෙසයි+ති) සිටියි, රකියි.

**අනුතීර.** න-තීරය, ගං හෝ ආදීන්ගේ ඉවුර, සමීපය; ඉවුරක් පාසා.

**අනුථෙර.** පු-විතීය ස්ථවිර, දෙවෙනි තෙර, න-ථෙරපටිපාටිය.

**අනුද්දයතා.** ඉ-අනුකම්පා ඇති බව.

**අනුද්දයා.** ඉ-අනුකම්පාව, කරුණාව.

**අනුද්ධත.** ති-උඩගු නොවූ, උද්ධත නොවූ, උද්ධච්චයට නො පැමිණි.

**අනුද්ධරී.** ක්‍රි (අනු+උ+ධර d. භූ ධාරණෙ, දරීමෙහි+ඊ. ඊ හට හ්‍රස්වයි.) අනුව උද්ධරණය කෙළේය.

**අනුද්ධස්ත.** ති-ආක්‍රොශ පරිභව කරණු ලැබූ (න=අන්+උද්ධස්ත) නොනැගි.

**අනුද්ධංසති.** ක්‍රි-(අනු+උ+ධංස d භූ ගතියං, යාමෙහි+ති) පරිභව කරයි, අබිබවයි, චොදනාදිවසයෙන් දොෂාරොපණය කෙරෙයි.

**අනුද්ධංසන.** න-ආක්‍රොශය, පරිභවය, අභිභවනය, පීඩාව, නැසීම.

**අනුද්ධංසිත.** ති-උද්ධංසනය නොකළ, පීඩා නොකළ. නොනැසූ.

**අනුද්ධංසෙති.** ක්‍රි-(අනු+ධංස. d චු පධංසනෙ, නැසීමෙහි+ණෙ+ති) අබිබවයි, චොදනාදි වසයෙන් දොෂාරොපණය කරයි, අනුද්ධංසනය කරයි.

**අනුද්දදාති.** ක්‍රි-(අනු+දදාති) දෙයි, අනුදානය කරයි, දුන් දෙයට අනුව දෙයි.

**අනුද්දයතා.** ඉ-අනුද්දයාව.

**අනුද්දස්සිත.** ති-අනුව දක්වනලද, පෙන්වන ලද

**අනුදස්සෙති**. ක්‍රි-(අනු+දස්සෙති) (යම් අරමුණක්) අනුව දක්වයි.

**අනුදහති**. ක්‍රි-(අනු+දහති) දවයි, පුලුස්සයි.

**අනුදහන**. න-දැවීම, තැවීම.

**අනුදාන**. ක්‍රි-අනුව දීම, දානය.

**අනුදිට්ඨ**. ති-දක්නාලද, දැනගත්.

**අනුදිස්සති**. ක්‍රි-(අනු+දිස්සති) දක්නා ලැබෙයි, පෙණෙයි.

**අනුදිසති**. ක්‍රි-(අනු+දිස d. තු. අතිසජ්ජනෙ, දීමෙහි+ති )අනුව දක්වයි, පෙන්වයි.

**අනුදිසා**. ඉ-විදිසාව, අනුදිග, ගිනිකොණ නිරිත වයඹ ඊශාන යන සිවුදිගුන් අතර පිහිටි අනුදිසා සතර

**අනුදීපෙති**. ක්‍රි-)අනු+දීපෙති) අනුව දක්වයි, ප්‍රකාශ කරයි.

**අනුදූත**. පු-දෙවෙනි දූතයා, දෙවැනිව යන්නා, කැටුව යන පණිවුඩකාරයා.

**අනුධම්ම**. පු-අනුධර්මය, ධර්මයට අනුව පැවැති, ධර්මානුකූල.

**අනුධම්මචාරී**: ති-ධර්මානුකූලව හැසිරෙණ.

**අනුධම්මතා**. ඉ-අනුධර්මතාව, ධර්මානුකූල බව.

**අනුධාරණ**. න-අනුව දැරීම.

**අනුධාරිත** ති-අනුව දරණ ලද, උසුලන ලද.

**අනුධාරෙති**. ක්‍රි-(අනු+ධාරෙති) අනුව දරයි, උසුලයි.

**අනුධාවති**. ක්‍රි-(අනු+ධාවති) අනුව දුවයි.

**අනුධාවන**. න-අනුව දිවීම, පස්සෙන් දිවීම.

**අනුධාවී**. ති-අනුව යන, අනුව දුවන.

**අනුපබ්බජි**. ක්‍රි-(අනු+ප+d වජ+ඉ. ව=බ) අනුව පැවිදිවීය, පැවිදිබව අසා පැවිදිවීය.

**අනුපරිවෙණිය**. ති-පිරිවෙණක් පාසා,

**අනුන්නත**. ති-උන්නත නොවන, උඩගු නොවන.

**අනුනදි**. ක්‍රි-(අනු+නදි) අනුව නාද කෙලේය.

**අනුනමති**. ක්‍රි-(අනු+නමති) අනුව නැමෙයි.

**අනුනමන**. න-නැමීම.

**අනුනය**. පු-නැළවීම, ඇලීම.

**අනුනයති**. ක්‍රි-(අනු+නී d. භූ. පාපුණනෙ, පැමිණවීමෙහි. ඊ=එ= අය+ති) පමුණුවයි. ගෙණ යයි.

**අනුනයන**. න-පැමිණවීම, ගෙණ යාම.

**අනුනාසික**. පු-නාසිකාව අනුව පවත්නා හඬ. අනුනාසිකාක්ෂර.

**අනුනීත**. ති-පමුණුවනලද, ගෙණ යනලද

**අනුනෙති**. ක්‍රි-(අනු+නී. d භූ. පාපුණනෙ, පැමිණවීමෙහි. ඊ=එ+ති) පමුණුවයි.

**අනුනෙතු**. පු-පමුණුවන්නා, නායකයා.

**අනුප්පත්ත**, ති-පිළිවෙළින් පැමිණි - "**අනුප්පත්ත**සදත්ථො."

**අනුප්පත්ති**. ඉ-අනුප්‍රාප්තිය, පැමිණීම.

**අනුප්පදාන**. න-අනුව දීම, අනුදානය, පොලී දීම.

**අනුප්පන්න** ති-(අන්=න+උප්පන්න) නූපන්, හටනොගත්.

**අනුප්පවෙච්ඡති**. ක්‍රි-(අනු+ප+වෙසු. d. භූ. දානෙ, දීමෙහි ධාත්වන්තයට ‘ච්ඡ’ ආදෙසයි+ති) දෙයි, ප්‍රදානය කෙරෙයි, සපයයි.

**අනුප්පවෙච්ඡන**. න-අනුප්‍රවේශය, අනුව ඇතුලත් වීම, දීම.

**අනුප්පාස**. පු-ගද්‍යපද්‍යයන් පිළිබඳ වර්ණයන්ගේ පුනරාවෘත්ති වශයෙන් නොලංවූ උච්චාරණය. මෙය දශ විධ කාව්‍ය ප්‍රාණයන් අතුරෙන් මාධුර්‍යයයෙහි අඩංගුය.

**අනුප්ලව**. පු-ඉල්පීම, ඉලිප්පීම, අනුචරයා, යහළුවා, දූසයා.

**අනුපක්කම**. පු-උපක්‍රමරහිත, ප්‍රයොගරහිත.

**අනුපක්කුට්ඨ**. ති-(අන්=න+උප+කුස. d.භූ. න=ට්ඨ) උපවාද රහිත, නින්ද රහිත. "**අනුපක්කුට්ඨො** ජාතිවාදෙන."

**අනුපක්ඛන්දති**. ක්‍රි-(අනු+ඛදි. d. භූ. පක්ඛන්දනාදිසු, පැනයාම් ආදියෙහි) අනුව පැන යයි.

**අනුපබ්බජ්ජ**. අ-ලඟට පැමිණ, ලඟට වැද,

**අනුපඝාත**. පු-(අන්=න+උප+ඝාත) පහර නොදීම, නොනැසීම.

**අනුපචය**. පු-(අන්=න+උප+චය) නොවැඩීම, රැස් නොකිරීම.

**අනුපචිත**. ති-නොවැඩුනු, රැස් නොකළ.

**අනුපචිනන**. න-රැස් නොකිරීම.

**අනුපචජ්ජනන**. ති-(අන්=න + උපචජ්ජන) උප-චජ්ජන නොවූ, නොසිඳි, නොසිඳිනලද.

**අනුපජ්ජති**. ක්‍රි-(අනු + පද. d. දි. ගතියං, යාමෙහි, පද=ජ්ජ + ති) අනුව යෙයි.

**අනුපපත්ති**. පු - සිදුනොවීම, නොලැබීම, අයොග්‍යත්වය,

**අනුපපන්න**. න-අයොග්‍යය, අයුක්තය.

**අනුපජගඝන**. න-මහත් කොට නොසිනාසීම.

**අනුපඤ්ඤාහ**. න-පස්දිනක් පාසා.

**අනුපඤ්ඤත්ති**. ඉ - අනුප්‍රඥප්තිය, පළමු පැණවූ ශික්ෂාවට අනුව කළ පැණවීම.

**අනුපටිපාටි**. ඉ-අනුපිළිවෙළ,

**අනුපට්ඨිත**. ති එළඹ නොසිටි.

**අනුපතති**. ක්‍රි-(අනු + පතති) වැටෙයි, ළඟට පැමිණෙයි.

**අනුපතිත**. ති-පතනය වූ, වැටුනු.

**අනුපද්දව**. ති උවදුරු රහිත.

**අනුපද්දුත**. ති උපද්‍රවයට නොපැමිණි, උපද්‍රැත නොවූ.

**අනුපද**. න පාඅනුව, දෙවෙනි පාදය, පදයක් පාසා.

**අනුපදජ්ජති**. ක්‍රි-(අනු + උප + දා. d. භූ. දානෙ, දීමෙහි. දා=ජ්ජ + ති) අනුව දෙයි, දානය කරයි.

**අනුපදජ්ජන**. න-දීම, ආපසු දීම, අනුව දීම.

**අනුපදාතු**. පු-අනුව දෙන්නා, දුන්දෙය අනුව දෙන තැනැත්තා.

**අනුපදාන**. න-අනුව දීම, වෙනුවට දීම.

**අනුපදිට්ඨ**. ති-නොකියන ලද්ද, ප්‍රකාශ නොකළ දෙය.

**අනුපදින්න**. ති-දෙනලද, පරිත්‍යාග කළ.

**අනුපදෙති**. ක්‍රි-(අනු + උප + දෙති) අනුව දෙයි.

**අනුපධාරණ**. න-නොබැලීම, නොසැලකීම, පරීක්ෂා නොකිරීම.

**අනුපධික**. ති-උපධිරහිත, කරදර නැති, දුක් නැති.

**අනුපබ්බජ්ජා**. ඉ-පළමු පැවිදි වූවෙකු අනුව පැවිදි වීම.

**අනුපරත**. ති-නොවැළැකුනු.

**අනුපරිගමන**. න-අනුසඞ්ක්‍රමණය.

**අනුපරිධාවති**. ක්‍රි-(අනු + පරි + ධාවති) අනුව දුවයි, කැටුව දුවයි.

**අනුපරියාති**. ක්‍රි-(අනු + පරි + යාති) කැටුව යෙයි, යෙයි.

**අනුපරියායති**. ක්‍රි-(අනු + පරි + යායති) යෙයි, කැටුව යෙයි.

**අනුපරියාය**. පු-අනුව පිරිවැරීම, සම්පව පිරිවරා ගැනීම.

**අනුපරිවත්තක**. පු කෙනෙකුත්ගේ ධුරයක් ලැබ එලෙස කටයුතු කරන්නා.

**අනුපරිවත්තති** ක්‍රි (අනු + පරි + වත්තති) අනුව පිරිවරයි, අනුව පෙරළෙයි.

**අනුපරිවත්තන**. න අනුව පිරිවැරීම, අනුව පෙරළීම.

**අනුපරිවත්ති**. ති-අනුව පෙරළෙන.

**අනුපරිවාර**. පු-කැටුව සිටින පිරිවර.

**අනුපරිවාරෙති**. ක්‍රි-(අනු + පරි + වර. d. චු. ආවරණෙ, වැළැක්මෙහි + විකරණ-ණෙ + ති) අනුව පිරිවරයි.

**අනුපරිවෙණ**. න-පිරිවෙණක් පාසා.

**අනුපරිසක්කති**. ක්‍රි (අනු + පරි + සක්කති) උත්සාහ කෙරෙයි, තැත්කෙරෙයි.

**අනුපරිසක්කන**. න-වීර්‍ය්‍ය කිරීම, තැත් කිරීම. "වධාය පරිසක්කනං පනස්ස ආරබ්භ කථෙසි."

**අනුපරිහරණ**. න-අනුපරිභොගය.

**අනුපරිහරති**. ක්‍රි-(අනු + පරි + හරති) පිළිවෙළින් පරිහරණය කරයි.

**අනුපරොධ**. පු-අවිරුද්ධ, අනුකූල, අනුගත.

**අනුපවජ්ජ**. ති-උපවාද රහිත, නින්දා රහිත.

**අනුපවාද**. ති-උපවාද රහිත. "අනුපවාදො අනුපඝාතො පාතිමොක්ඛෙ ච සංවරො."

**අනුපවාදක**. පු - නොගරහන්නා, නින්දා නොකරන්නා.

**අනුපවාදී**. ති-උපවාද නොකරන්නා.

**අනුපවිට්ඨ**. ති- අනුව ප්‍රවෙශ කළ, ඇතුළත් වූ.

**අනුපවිසති**. ක්‍රි-(අනු + ප + විසති) ප්‍රවිෂ්ට වෙයි. ඇතුළත් වෙයි.

**අනුපවිසන**. න-අනුප්‍රවෙශය, ඇතුළත් වීම.

**අනුපවෙසෙති**. ක්‍රි-(අනු + ප + විස d. භූ. පවෙසනෙ, ප්‍රවෙශයෙහි, ණෙ + ති) ප්‍රවෙශ කරයි, ඇතුළත් කරයි.

**අනුපස්සක**. පු-බලන්නා, අනුව බලන්නා.

**අනුපස්සති**. ක්‍රි-(අනු-දිස. d. භූ පෙක්ඛණෙ, බැලීමෙහි, දිස=පස්ස + ති) දකී, බලයි.

**අනුපස්සනා** ඉ-බැලීම, අනුව බැලීම, කායානුපස්සනාදිය. "අනුපුනප්පුනං පස්සනති එතායාති අනුපස්සනා." නාමරූප ධර්මයන්ගේ දිරීම් සවභාවය දන්නා චින්තාමය ඤාණයද, නාමරූපයන්ගේ පීඩාකරන බව දැන ගන්නා චින්තාමය ඤාණයද, නාමරූපයන්ගේ අනාත්මතාව දැනගන්නා, චින්තාමය ඤාණයද යන ත්‍රිවිධ ඤාණය අනුපස්සනා නම්.

**අනුපස්සී**. පු-අනුව බලන්නා, කායානුපස්සනාදිය කරන්නා.

**අනුපසඞ්කමණ**. න-සමීපයට නො එළඹීම

**අනුපසණ්ඨපන**. න-නොතැබීම, නොපිහිටුවීම.

**අනුපහත**. ති-(අන්=න + උප + හත) නොනසන ලද, නොනැසූ.

**අනුපාත**. පු-වැටීම, පතනය.

**අනුපාතී**. ති-කෙනෙක් අනුව යන්නා. කොන් තබන්නා ඇනුම්පද කියන්නා.

**අනුපාද** න-පු-පා අනුව, පාදයක් අනුව, පියවරක් පාසා

**අනුපාදන**. න-සම්පාදනය, පිළියෙල කිරීම.

**අනුපාදනීය**. ති තෘෂ්ණාදිවශයෙන් නොගත යුතු.

**අනුපාදපරිනිබ්බාණ**. න-උපාදාන රහිතව පිරිනිවීම.

**අනුපාදාය**. අ-නොගෙණ, ග්‍රහණය නොකොට.

**අනුපාදින්න**. ති-උපාදාන ග්‍රහණය නොකළ.

**අනුපාදිත**. ති-පමුණුවනලද, ගෙණයනලද

**අනුපාදියති** ක්‍රි-(අන්=න + උප + ආ + දා. d. දී. දානෙ, දීමෙහි + ය + ති) තෘෂ්ණාදිවශයෙන් නොගණී.

**අනුපාදියාන**. ති-ග්‍රහණය නොකිරීම, තෘෂ්ණාදි වශයෙන් නොගැණීම. "අනුපාදියානො ඉධ වා හුරං වා."

**අනුපාදිසෙස**. ති-(අන්=න + උපාදිසෙස) උපාදි සඞ්ඛ්‍යාත සකන්ධ ශෙෂය රහිත, උපාදිශෙෂ නැති.

**අනුපාදිසෙස පරිනිබ්බාණ ධාතු**. ඉ-සකන්ධ පරිනිර්වාණය, රහතුන් වහන්සේලාගේ කාලක්‍රියා සඞ්ඛ්‍යාත පිරිනිවීම. (උපාදීයති කාමුපාදානාදීහීති උපාදි, පඤ්චක්ඛන්ධසෙසං අධිවචනං; උපාදි යෙව සෙසො කිලෙසෙහීති උපාදිසෙසො; නෙත සහ වත්තතීති සඋපාදිසෙසා, සා එව නිබ්බාණධාතූති සඋපාදිසෙස නිබ්බණධාතු. වි. ටීකා.)

**අනුපාපුණන**. න-පැමිණීම, එළවීම.

**අනුපාපුණාති**. ක්‍රි-(අනු + ප + අප. d. පු. පාපණෙ, පැමිණීමෙහි, + උණා + ති) පමුණුවයි, එළවයි.

**අනුපාපෙති**. ක්‍රි-(අනු + අප. d. චු. පාපණෙ පැමිණීමෙහි + ණෙ + ති) පමුණුවයි, සමීපයට එළවයි.

**අනුපාය**. ති-(අන්=න + උපාය) උපාය රහිත,

**අනුපායාස**. ති-(අන්=න + උප + ආයාස) වෙහෙස රහිත, දැඩි ආයාස නැති.

**අනුපාලක**. ති-පාලනය කරණ, රක්ෂා කරණ

**අනුපාලන**. න-ආරක්ෂාව, පාලනය කිරීම.

**අනුපාලිත**. ති-පාලනය කළ, රක්ෂා කළ.

**අනුපාලෙති**. ක්‍රි-(අනු + පාල d චු. රක්ඛණෙ, රැකීමෙහි + ණෙ + ති) පාලනය කරයි, රකී

**අනුපාහන**. ති (අන්=න + උපාහන) වහන් රහිත, මිරිවැඩි නැති.

**අනුපියඹාවන**. න-මල්ල රජුන්ගේ අනුපිය නම් අඹ උයන.

**අනුපීලන**. න-අනුපීඩනය, පෙළීම, මිරිකීම.

**අනුපීළිත**. ති-පීඩා කළ, පෙළූ.

**අනුපීළෙති.** ක්‍රි-(අනු+පීළ. d. චු. පීළනෙ, පීඩා කිරීමෙහි+ණෙ+ති) පෙළයි, පීඩා කරයි.

**අනුපුච්ඡති** ක්‍රි (අනු+පුච්ඡ. d භූ. සම්පුච්ඡනෙ පිළිවිසීමෙහි+ති) අනුව විචාරයි, අනුව පිළිවිසී.

**අනුපුච්ඡා.** ඉ-අනුපිළිවිසීම, ප්‍රතිපෘච්ඡාව.

**අනුපුට්ඨ** ති-(අනු+පුච්ඡ+ත - ධාත්වන්තය සහිත 'ත' හට 'ට්ඨ' ආදෙසයි) විචාළ, විචාරණලද, පිළිවිසූ.

**අනුපුබ්බ** (ක) ති-අනුපටිපාටිය, අනුපිළිවෙළ, අනුක්‍රමය.

**අනුපුබ්බනින්න** ති-ක්‍රමයෙන් පහත්ව නැමුනු

**අනුපුබ්බනිරෝධ.** පු-පිළිවෙළින් නිරුඩවීම, ප්‍රථමධ්‍යානයට සමවත්නහුට නිරුඩවන **1. කාමසංඥාව,** විතීයධ්‍යානයට සමවත්න හුට නිරුඩවන **2. විතක්කවිචාර,** තෘතීය ධ්‍යානයට සමවත්නහුට නිරුඩවන **3. ප්‍රීතිය,** චතුර්ථධ්‍යානයට සමවත්නහුට නිරුඩ වන **4. ආශ්වාස-ප්‍රශ්වාස,** ආකාසානඤ්චා යතනයට සමවත්නහුට නිරුඩවන **5. රූපසංඥාව,** විඤ්ඤාණඤ්චායතනයට සම වත්නහුට නිරුඩවන **6. ආකාසානඤ්චා යතන සංඥාව,** ආකිඤ්චඤ්ඤායතනයට සම වත්නහුට නිරුඩවන **7. විඤ්ඤාණඤ්චා යතන සංඥාව,** නෙවසඤ්ඤා නාසඤ්ඤා යතනයට සමවත්නහුට නිරුඩවන **8. ආකිඤ්චඤ්ඤායතන සංඥාව,** සඤ්ඤා වෙදයිත නිරෝධයට සමවත්නහුට නිරුඩ වන. **9. සංඥා - වෙදනා** යන නවය. මොව්හු පිළිවෙළින් නිරුඩවෙත්නුයි **අනු පුබ්බනිරෝධ** නම් වෙත්. (දී. නි. සඞ්ගීති සුත්ත)

**අනුපුබ්බපටිපදා** ඉ-1. දුක්ඛාපටිපදා දන්ධා භිඤ්ඤා, 2. දුක්ඛාපටිපදා ඛිප්පාභිඤ්ඤා, 3. සුඛාපටිපදා දන්ධාභිඤ්ඤා, සුඛාපටිපදා ඛිප්පා භිඤ්ඤා යන ප්‍රතිපදා සතර. (දී. නි. සඞ්ගීති සුත්ත.)

**අනුපුබ්බවිහාර.** පු
**අනුපුබ්බවිහාරසමාපත්ති.** ඉ } - රූප ධ්‍යාන සතරය, අරූපධ්‍යාන සතරය, සඤ්ඤාවෙද යිත නිරෝධය යන නවය. (දී. නි. සඞ්ගීති සුත්ත.)

**අනුපෙක්ඛති.** ක්‍රි-(අනු+ප+ඉක්ඛ d. භූ. දස්සන අඞ්කෙසු, දැකීමෙහි හා සලකුණු කිරීමෙහි+ති) බලයි, අනුව බලයි.

**අනුපෙක්ඛණ.** න-අනුව බැලීම, බැලීම.

**අනුපෙසේති.** ක්‍රි-(අනු+පිස. d. චු. පෙසනෙ, යැවීමෙහි+ති) අනුව යවයි, පසුව යවයි, පිළිවෙළින් යවයි.

**අනුපෝසථ.** පු-(අන්=න+උපෝසථ) උපෝ-සථ (=පෝය) නොවන දවස.

**අනුඵරති.** ක්‍රි (අනු+ඵර d. භූ. ඵරණෙ, පැතී-රීමෙහි+ති) පැතිරෙයි, පුරා පැතිරෙයි.

**අනුඵරණ.** න-අනුව පැතිරීම, පැතිර යාම.

**අනුඵුසති.** ක්‍රි-(අනු+ඵුස. d. භූ. සම්ඵස්සෙ, ස්පර්ශයෙහි+ති) ස්පර්ශ කෙරෙයි, ගටයි.

**අනුඵුසන.** න-අනුස්පර්ශය, පහස, ගැටීම.

**අනුඵුසිත.** ති-අනුස්පර්ශය කළ, ස්පර්ශ කළ.

**අනුඵුසීයති.** ක්‍රි (අනු+ඵුස. (d. භූ. සම්ඵස්සෙ, ස්පර්ශ කිරීමෙහි) ඊ+ය+ති) අනුස්පර්ශ කරණු ලබයි.

**අනුබජ්ඣති.** ක්‍රි-(අනු+බධ, d. දි. බන්ධනෙ, බැඳීමෙහි, ධ=ජ්ඣ+ති) බඳියි.

**අනුබන්ධ.** පු-අනුව බැඳීම, ලුහුබැඳීම, කාර්‍ය්‍ය කාලයෙහි ලොප්වන අකුර. වෘද්ධි ආදි කාර්‍ය්‍යයක් පිණිස පමණක් කියනු ලබන් නාවූ ණකාරාදි අක්‍ෂරය අනුබන්ධ නමි.

**අනුබන්ධ.** න-අනුව බැඳීම, කාර්‍ය්‍යකාලයෙහි ලොප්වන අකුර.

**අනුබන්ධති** ක්‍රි-(අනු+බන්ධ. d. භූ. බන්ධනෙ, බැඳීමෙහි+ති) අනුබඳියි, ලුහුබඳියි.

**අනුබල.** න-උදව්ව, පශ්වාද් බලය, රුකුල් දීම.

**අනුබුජ්ඣති.** ක්‍රි-(අනු+බුධ d. දි. අවගමනෙ, අවබෝධයෙහි, ධ=ජ්ඣ+ති) අවබෝධ කෙරෙයි.

**අනුබුජ්ඣන.** න-අවබෝධ කිරීම, දැනගැණීම.

**අනුබුද්ධ.** පු-දෙවෙනි බුදුරජ, බුදුවරයෙකුට දෙවැනි තැනැත්තා. ති ප්‍රතිවෙධ කළ.

**අනුබෝධ.** පු-අවබෝධය, ප්‍රතිවෙධය, දැනීම, ඥානය.

(1994)

**අනුබොධති**. ක්‍රි (අනු + බුධ. d. භූ. බොධනෙ, අවබොධයෙහි + උ=ඔ + ති) අවබොධ කරයි, ප්‍රතිවෙධ කරගණියි.

**අනුබොධන**. න-අවබොධය, ප්‍රතිවෙධය, ඥානය.

**අනුබ්බජති**. ක්‍රි-(අනු + වජ. d. භූ. ගතියං, යාමෙහි, ව=බ=බ්බ + ති) අනුව යෙයි.

**අනුබ්බත**. න-(අනු + වත + ව=බ) අනුව්‍රතව, ව්‍රතය අනුව, ව්‍රතානුකූලව, ව්‍රතයට සුදුසු පරිදි.

**අනුබ්බිල්ලාවිතත්ත**. න-(අන්=න + උබ්බිල්ල-විත + තත්ත) උඩඟු ගති නැති බව.

**අනුබ්‍යඤ්ජන**. න-කුඩාලකුණු.

**අනුබ්‍රෑහණ**. න-වැඩීම, නැවත නැවත වැඩීම, මනසිකාරය

**අනුබ්‍රෑහිත**. ති-වඩනලද, නැවත නැවත මෙනෙහි කළ.

**අනුබ්‍රෑහෙති**. ක්‍රි-(අනු + බ්‍රෑහ. d භූ. වඩ්ඪනෙ, වැඩීමෙහි + ණෙ + ති) වඩයි, නැවත නැවත මෙනෙහි කරයි.

**අනුභණන**. න-අනුකථනය, අනුව බිණීම, එකට එක කීම.

**අනුභවති**. ක්‍රි (අනු + භූ. d. භූ. සත්තායං, වීමෙහි ඌ=ඔ=අව + ති) වලඳයි, අනුභව කරයි, ප්‍රයොජනය ගණියි. පරිභොග කරයි.

**අනුභවන**. න-අනුභවය, වැලඳිම.

**අනුභාග**. පු-දෙකෙන් කොටස, දෙකෙන් පංගුව.

**අනුභායති**. ක්‍රි-(අනු + භී, d. භූ. භයෙ, බිය වීමෙහි + ඉ=එ=අය + ති) බියපත් වෙයි.

**අනුභාව**. පු බලය, තෙජස, ආනුභාවය නව නාට්‍ය රසාත්මකවූ ස්ථායී භාව ආදී ත්‍රිවිධ භාවයන් අවබොධ කරවීම අනුභාව නම්.

**අනුභාසති**. ක්‍රි-(අනු + භාස, d. භූ. වාචායං, කීමෙහි + ති) කියයි, ප්‍රකාශ කරයි. අනුව කියයි.

**අනුභාසන**. න-අනුකථාව, කථාවකට අනතුරුව කරණ කථාව.

**අනුභාසිත**. ති-අනුභාෂනය කළ.

**අනුභූත**. ති-අනුභව කළ, අවබොධ කළ, ප්‍රයොජන ගත්.

**අනුභූතවිසය**. පු-අනුභූතාර්ථය විෂය කොට පවත්නා 'ත' ශබ්දය 'ය' ශබ්දයා අපෙක්ෂා නොකිරීම. ත ශබ්ද යොග ප්‍රභෙද ව්‍යාකරණ විධිය.

**අනුහොති**. ක්‍රි-(අනු + භූ. d. භූ. සත්තායං, වීමෙහි + ඌ=ඔ + ති) අනුභව කරයි.

**අනුම්මත්ත**. ති-(අන්=න + උ + මද. d. දි. උම්මාදෙ, උමතු වීමෙහි + ත) උමතු නොවන, පිස්සු නොවන.

**අනුම**. පු සවල්පය, ටික.

**අනුමග්ග**. පු-අනුමාර්ගය, අඩමග, මාර්ගය අනුව.

**අනුමජ්ජති**. ක්‍රි-(අනු-මජ්ජ. d. භූ සංසුද්ධියං, පිරිසිදු බැව්හි + ති) පිරිමදියි, මිරිකයි.

**අනුමජ්ජන**. න-පිරිමැදිම, ඔප දැමීම.

**අනුමජ්ඣ**. පු-මධ්‍යය, මැදභාගය.

**අනුමඤ්ඤති**. ක්‍රි-(අනු + මන. d. දි. ඤාණෙ, දැනීමෙහි + ය=ඤ්ඤ + ති) අනුමත කෙරෙයි.

**අනුමඤ්ඤන**. න-අනුදැනීම, සම්මත කිරීම.

**අනුමත**. ති-අනුදන්නාලද. න-අනුමත කිරීම.

**අනුමති**. ඉ-අනුමතිය, අනුදැනීම, ආඛ්‍යාත සප්ත විභක්තීන්ගේ විෂය භෙදයක්.

**අනුමනත්තු**. පු-ඔබට මේ දෙය දෙමියි. කී කල යහපත එසේ කරවයි දන්දෙන්නහුට අනු දැනීම. අනුමනත්තු, සම්ප්‍රදාන විශෙෂයක්.

**අනුමසති**. ක්‍රි-(අනු + මස. d. භූ. ආමසනෙ, ස්පර්ශ කිරීමෙහි + ති) ස්පර්ශ කරයි. ගටයි.

**අනුමාන**. ති-අනුව කල්පනා කිරීම, අනුව ප්‍රමාණ කිරීම, අනුමාන ඥානය, එකට එක ගලපා කල්පනා කිරීමේ ඥාණය, ව්‍යාප්ති ඥානය.

**අනුමිත්ත**. පු-දෙවැනි මිත්‍රයා. න-මිත්‍රයා අනුව.

**අනුමිත**. ති-අනුව ප්‍රමාණ කරණ ලද්ද, අනුමත කරණ ලද්ද.

**අනුමිති**. ඉ-අනුව ප්‍රමාණ කිරීම. පර්වතය ගින්නෙත් ව්‍යාප්‍යවූ දුම් ඇත්තේයයි පැතුරුනාවූ ධූමයාගේ පක්‍ෂවෘත්තිත්වයෙහි පවත්නා ඥානය පරාමර්ශී නම්. ඒ පරාමර්ශී යෙන් උපදනා නුවණ අනුමිති නම්වේ.

**අනුමිනාති**. ක්‍රි-(අනු+මා d. කි. පරිමාණෙ, ප්‍රමාණ කිරීමෙහි-ආ+ඉ+නා+ති) අනුව ප්‍රමාණ කරයි, මණියි.

**අනුමියති**. ක්‍රි-(අනු+මා. d. භූ. පමාණෙ, මිණීමෙහි+ආ=ඊ+ය+ති) ප්‍රමාණ කරණු ලැබේ.

**අනුමෙය්‍යවිෂය**. න-අපාදානයාගේ ක්‍රියා විශෙෂය අනුමානයෙන් ගැණීම, අපාදාන ප්‍රභෙදයෙකි.

**අනුමොදක**. පු-අනුමෝදන් වන්නා, සමාදන් වන්නා.

**අනුමොදති**. ක්‍රි-(අනු+මුද d. භූ. සන්තොසෙ සතුටුවීමෙහි+ති) අනුමොදන් වෙයි.

**අනුමොදන**. න-අනුමෝදන් වීම.

**අනුමොදනා**. ඉ-දන්දී අවසන්හි දෙසන ධර්මය, අනුමෙවැනි බණ.

**අනුමොදනීය**. ති-අනුමෝදන් වියයුතු.

**අනුමොදිත**. ති-අනුමොදන් කරවනලද.

**අනුයාගී**. පු-අනුව යාග කරණ තැනැත්තා.

**අනුයාත**. ති-අනුව යනලද, අනුගමනය කළ.

**අනුයාති**. ක්‍රි-(අනු+යා. d භූ. ගතියං, යාමෙහි+ති) අනුව යෙයි. කැටුව යෙයි.

**අනුයායී**. ති-අනුව යන, නොහැර යන.

**අනුයුඤ්ජන**. න-අනුයොගය, අනුව යෙදීම.

**අනුයුඤ්ජති**. ක්‍රි-(අනු+යුජ. d රු. යොගෙ, යෙදීමෙහි+ති) අනුව යෙදෙයි.

**අනුයුඤ්ජියමාන**. ති-අනුයොග කරණු ලබන, යොදනු ලබන, ප්‍රශ්න කරණු ලබන.

**අනුයුත්ත**. ති-අනුව යොදනලද, ප්‍රශ්න කරණලද.

**අනුයොග**. පු-ප්‍රශ්නය. අනුව යෙදීම.

**අනුයොගවන්තු**. පු-අනුයොග ඇත්තා.

**අනුයොගී**. ති-අනුයොග ඇති.

**අනුරක්ඛක**. ති-ආරක්‍ෂා කරණ, රකින.

**අනුරක්ඛණ**. න-රැකීම, අනුරක්‍ෂණය.

**අනුරක්ඛති**. ක්‍රි-(අනු+රක්ඛ. d. භූ. රක්ඛණෙ, රැකීමෙහි+ති) අනුරක්‍ෂණය කරයි.

**අනුරක්ඛා**. ඉ-අනුව රැකීම.

**අනුරක්ඛිය**. ති-අනුව රැක්කයුතු, අ-රක්‍ෂා කොට, රැක, ගොපනය කොට.

**අනුරක්ඛී**. ති=රකින, අනුව රකින.

**අනුරඤ්ජිත**. ති-අනුව රැඳුනු.

**අනුරත්ත**. ති-අනුරක්ත, රාගයෙන් රත්, ඇලුනු.

**අනුරමති**. ක්‍රි-(අනු+රමු. d. භූ. කීලායං, ක්‍රීඩාවෙහි+ති) ඇලෙයි.

**අනුරවති**. ක්‍රි-(අනු+රු. d. සද්දෙ, ශබ්ද කිරීමෙහි+ති) ප්‍රතිශබ්ද කරයි, පිළිරැව් දෙයි.

**අනුරහො**. අ-රහස, රහසෙහි.

**අනුරාව**. න-පිළිරැව්, ප්‍රතිනාදය, ධ්වංකාර ශබ්දය.

**අනුරාධපුර**. න-අනුරනැකතින් රාධ නම් ඇමතියා විසින් පිහිටුවනලද ලක්දිව පිහිටි එනම් නුවර.

**අනුරාධා**. ඉ-අනුරේ නැකත.

**අනුරුජ්ඣති**. ක්‍රි-(අනු+රුධි. d. දි. ආවරණෙ, වැළකීමෙහි+ය+ති) ආවරණය කෙරෙයි.

**අනුරුධ**. d. දි-කාමෙ, කැමතිවීමෙහි, අනු-රුජ්ඣති (අනු+රුධ-අනුපූර්ව රුධ ධාතුව මයි) කැමැති වෙයි.

**අනුරුද්ධ**. ති-ආවරණය කළ, වළකනලද.

**අනුරූප**. ති-සුදුසු, යොග්‍ය, අභිමත වන, යොග්‍ය ස්වරූපය.

**අනුරොදති**. ක්‍රි-(අනු+රුදි. d. භූ. අස්සු විමොචනෙ, කඳුලු හෙළීමෙහි+ති)කඳුලු හෙලයි, හඬයි.

**අනුරොධ**. ති-අනුකූල, එකඟ. අනුව පැවතීම පු-ආවරණය.

**අනුරොධති**. ක්‍රි-(අනු+රුධි. d. දි. ආවරණෙ, වැළැක්මෙහි+ති) වළක්වයි, ආවරණය කරයි.

**අනුල්ලපන**. ති-(අ + න + උ + d ලප + යු=අන) නොකීම, චොදනා නොකිරීම. අනාපත්ති භික්ඛු අනුල්ලපනාධිප්පායස්ස.

**අනුලපන**. න-අනුකථාව, අනුලාපය, දෙවෙනි කථාව.

**අනුලාප**. පු-කී තෙපුල් නැවත කීම, කෙණෙහි කෙණෙහි බිණීම.

**අනුලාසී**. පු-මොනරා.

**අනුලිත්ත**. ති-සඳුන් ආදිය ගානලද, සුණු ආදිය ආලෙප කළ.

**අනුලිම්පති**. ක්‍රි-(අනු + ලිප. d. රු. ලිම්පනෙ, ආලෙප කිරීමෙහි + ති) ආලෙප කරයි, තවරයි.

**අනුලිම්පන**. න-ආලෙපනය, ලෙපනය.

**අනුලෙප**. පු-තැවරීම, ගෑම, ආලෙප කිරීම.

**අනුලොකන**. න-අවලොකනය, බැලීම.

**අනුලොකී**. පු-අනුව බලන්නා- "සීසානුලොකී පච්ඡතො පච්ඡතො අනුබන්ධි."

**අනුලොම**. න-අනුලොම් බව, එකඟ බව, පු-පිළිවෙළ.

**අනුලොමඤාණ**. න-අනුලොමඥානය.

**අනුලොමික**. ති-අනුලොම්ව පවත්නේ.

**අනුලොමෙති**. ක්‍රි-(අනුලොම + ණෙ + ති) අනුලොම් කෙරෙයි.

**අනුවජ්ජ**. පු-උපවාදය, පරිභවය, නින්දාව, අනුවදනය.

**අනුවත්තක**. පු-අනුව පවතින තැනැත්තා.

**අනුවත්තති**. ක්‍රි-(අනු + වතු. d. භූ. වත්තනෙ, පැවතීමෙහි + ති)අනුව පවතී.

**අනුවත්තන**. න-අනුව පැවැත්ම, අනුවර්තනය. ව්‍යාකරණයෙහි යම් සූත්‍රයකින් තව සූත්‍රයකට කිසි පදයකගේ වැටීම අනුවර්තන නම්.

**අනුවත්ති**. ඉ-අනුවෘත්තිය. අනුව පැවැත්ම.

**අනුවත්තිත**. ති-අනුවර්තනය කළ, අනුව පැවති.

**අනුවත්තෙති**. ක්‍රි-(අනු + වතු. d භූ. වත්තනෙ, පැවැත්මෙහි + ණෙ + ති)පවත්වයි.

**අනුවදති**. ක්‍රි-(අනු + වද, d. භූ. වචනෙ, කීමෙහි + ති) කියයි, බිණියි.

**අනුවදන**. න-අනුවාදනය, අනුකථනය.

**අනුවසති**. ක්‍රි-(අනු + වස. d. භූ. නිවාසෙ, විසීමෙහි + ති) වාසය කෙරෙයි.

**අනුවසන**. න-වාසය කිරීම, විසීම.

**අනුවස්ස**. න-වර්ෂයක් අනුව, අවුරුද්දක් පාසා.

**අනුවාචෙති**. ක්‍රි-(අනු + වච. d. චු. භාසනෙ, කීමෙහි + ණෙ + ති) අනුව කියයි.

**අනුවාත**. න-අනුවාතය, යටිසුළඟ, සිවුරෙහි නුවාව.

**අනුවාද**. පු-නු(අ)ගුණ කීම, අනුකථනය. එකභාෂාවකින් පැවැති වාක්‍යාදියක් අන්‍ය භාෂාවකින් කීම.

**අනුවාදාධිකරණ**. න-'චතුබ්බිධ අධිකරණ' බලනු.

**අනුවාස(න)**. න-සුවඳ කැවීම, සුවඳ ගැල්වීම.

**අනුවාසෙති**. ක්‍රි-(අනු + වස d. චු. සිනෙහාදිසු. සෙනහාදියෙහි + ණෙ + ති) සුවඳ කවයි.

**අනුවික්ඛිත්ත**. ති-(අනු + වි + ඛිප. d. භූ. ඛෙපනෙ, දැමීමෙහි 'ප' ලොප් + ත=ත්ත) විසුරුවනලද, විවිධ දිසාවන්හි දමනලද, එක අරමුණක නොපිහිටුවනලද.

**අනුවිච්ච**. අ-දැන.

**අනුවිචරණ**. න-හැසිරීම, සඤ්චාරය, අනුව හැසිරීම.

**අනුවිචරති**. ක්‍රි-(අනු + වි + චර d. භූ. චරණෙ, හැසිරීමෙහි. + ති) හැසිරෙයි, සක්මන් කරයි

**අනුවිචරිත**. ති-හැසිරෙණලද, අනුව හැසිරෙණ ලද.

**අනුවිචාර**. පු-හැසිරීම, පරීක්ෂාව.

**අනුවිචිනක**. පු-සොයන්නා, පරීක්ෂා කරන්නා.

**අනුවිජ්ජක**. පු-විසඳන්නා, විනිශ්චය කරන්නා පරීක්ෂා කරන්නා.

**අනුවිජ්ජති**. ක්‍රි-(අනු + විද d. දි. සත්තායං, වීමෙහි, ද=ජ=ජ්ජ + ති) විද්‍යමාන වේ. ඇති වේ.

**අනුවිජ්ඣති.** ක්‍රි-(අනු+විධ. d. දී. වේධනෙ, විදීමෙහි, ධ=ජ්ඣ+ති) විදියි.

**අනුවිතක්ක.** පු-අනුව සිතීම, නැවත නැවත සිතීම.

**අනුවිතක්කෙති.** ක්‍රි (අනු+වි+තක්ක d චු. විතක්කනෙ, විතර්කණයෙහි+ණෙ+ති) අනුවිතර්කණය කරයි, සිතයි.

**අනුවිදිත.** ති-දන්නාලද, අවබොධ කළ.

**අනුවිධ.** ති-විදිනලද, සිදුරු කළ.

**අනුවිධායති.** ක්‍රි (අනු+වි+ධා. d චු. ධාරණෙ දූරීමෙහි+ණය+ති) විධාන කරයි, නියම කරයි.

**අනුවිධාන.** න-විධානය, නියොගය, නියම කිරීම.

**අනුවිධීයති.** ක්‍රි-(අනු+වි+ධා. d. භූ. ධාරණෙ දූරීමෙහි + ආ=ඊ + ය+ති) අනුවිධානය කරණු ලබයි, නියම කරණු ලබයි.

**අනුවිධීයන** න-විධානය කිරීම, නියොග කිරීම.

**අනුවිලොකන.** න-බැලීම, නැවත නැවත සෙවීම, පරීක්‍ෂා කිරීම.

**අනුවිවට්ට** පු-සිවුරේ නුවාව.

**අනුවිසට** න-පැතිරෙණ ලද, පතළාවූ- "විසටං සප්පවිසංව ඔසධෙහි"

**අනුවුට්ඨ.** ති-වාසය කළ, විසූ.

**අනුවුත්ති.** ති-අනුවැ වැටීම, සූත්‍රයෙක්හි නොපෙණෙන කාර්‍ය්‍ය කාර්යී නිමිත්ත පද යන්ගෙන් එකක් හෝ කීපයක් අන්‍යසූත්‍රයකින් වැටීමයි.

**අනුව්‍යඤ්ජන.** න-ව්‍යඤ්ජන අනුව, කුඩා ව්‍යඤ්ජන, කුඩා ලකුණු.

**අනුව්‍යඤ්ජනග්ගාහී.** ති-ව්‍යඤ්ජන අනුව ගන්නා.

**අනුස්සති.** ඉ-සිහිකිරීම, ආවර්ජනා කිරීම,- "දසානුස්සති" බලනු.

**අනුස්සද.** ති-උඩත නොවූ, උඩඟු නොවූ.

**අනුස්සරණ.** න-සිහිකිරීම, මෙනෙහි කිරීම.

**අනුස්සරති.** ක්‍රි-(අනු+සර. d. භූ. චින්තායං, සිතීමෙහි+ති) සිහිකරයි

**අනුස්සරිත.** ති-සිහිකළ, මෙනෙහි කළ.

**අනුස්සව.** පු-ආශ්‍රව, ආරංචියෙන් ඇසීම, පරම්පරා කථාව.

**අනුස්සවණ.** න-මේ මෙසේලුයි ආරංචියෙන් ඇසීම,

**අනුස්සවික.** ති-ආරංචියෙන් අසන.

**අනුස්සාර.** පු-නිග්ගහීතයට පරියාය නාමයකි.

**අනුස්සාවක.** පු-අස්වන්නා, කර්‍මිකයා, මෙරමාහට කියන්නා.

**අනුස්සාවණ.** න-ඇස්වීම, ශ්‍රවණය කරවීම.

**අනුස්සාවික.** පු-(අනුස්සාව+ඉක) අස්වන්නා.

**අනුස්සාවිත.** ති-අස්වනලද, ඇස්වූ.

**අනුස්සාවෙති.** ක්‍රි-(අනු+සු. d. සු. සවණෙ, ඇසීමෙහි+උ=ඔ=ආව+ණෙ+ති) අස්වයි.

**අනුස්සාහික.** පු-උත්සාහ නැත්තා, වීර්‍ය්‍ය නැත්තා.

**අනුස්සාහිත.** ති-උත්සාහ රහිත, අලස, නොඔසවනලද.

**අනුස්සුක.** ති-(අ=න+උස්සුක) උත්සාහ නැති, වීර්‍ය්‍ය රහිත.

**අනුස්සුත.** ති-(අනු+සුත) අසනලද, ඇසූ.

**අනුස්සුති.** ඉ-අනුස්මෘතිය, යමක් අනුව උපන් සිහිය.

**අනුස්සුතික.** පු-(අනු+සු+ණික) ආරංචියෙන් කියන්නා.

**අනුස්සූයක.** පු-'අනුසූයක' බලනු.

**අනුසඞ්චරති.** ක්‍රි (අනු+සං+චර. d. භූ. චරණෙ, හැසිරීමෙහි+ති) හැසිරෙයි.

**අනුසඞ්චරිත.** ති-හැසිරෙණ ලද.

**අනුසඤ්චෙතෙති.** ක්‍රි-(අනු+සං+චිත. d. චු. සඤ්චෙතනෙ, සිතීමෙහි+ණෙ+ති) සිතයි, අනුසමරණය කරයි.

**අනුසන්දති.** ක්‍රි-(අනු+සං+ධා. d. භූ. ධාරණෙ, දූරීමෙහි+ධ=ද+ති) සංසන්දනය වෙයි.

**අනුසංපවඞ්ක.** න-අව්වාදයට අනුව නැමීම.

**අනුසංයායති.** ක්‍රි-(අනු+සං+යායති) අනුසඤ්චරණය කරයි, ඇවිදියි.

**අනුසංඝායන**. න- හැසිරීම, අනුසඤ්චාරණය.

**අනුසංවච්ඡර.** න-අවුරුද්දක් පාසා, අවුරුද්දක් ගානේ.

**අනුසංසරණ.** න-හැසිරීම, අනුසඤ්චාරය.

**අනුසඤ්ඤත්ති.** ඉ-විධානය, නියොගය.

**අනුසඤ්ඤාති.** ක්‍රි-(අනු + සං + ඤා. d. භූ. අවබොධසම්ං, දැන්මෙහි + ති) අඟවයි, මෙහෙයයි

**අනුසඤ්ඤායමාන.** ති-අඟවනු ලබන, දන්වනු ලබන.

**අනුසන්ධති.** ක්‍රි-(අනු + සං + ධා. d. භූ. ධාරණෙ දැරීමෙහි + ති) සන්ධි කෙරේ, ගැලපීම කෙරෙයි.

**අනුසන්ධි**. ඉ-සන්ධිය, ගැලපීම, මූට්ටු කිරීම, දෙකක් එකට හැමැත්තවීම.

**අනුසන්ධිවචන.** පු-බුද්ධවචනයට ගළපා-සුදුසු ලෙස පවත්නා වචනය, ශ්‍රාවක භාෂිතය.

**අනුසය.** පු-අනුසහගතරාගාදීය, පසුතැවිල්ල ප්‍රසතුතයාගේ අතිවෘත්තිය, සත්ත්වයන්ගේ සිත්තුළ නැවත නැවත උපදනා කාමරාග, පටිඝ, මාන, දිට්ඨි, විචිකිච්ඡා, භවරාග, අවිජ්ජා යන කෙලශයෝ සත්දෙන අනුසයෝය. අප්පහීනට්ඨෙන අනු අනු සන්තානෙ සෙනතීති = අනුසයා.

**අනුසයිත.** ති-අනුව සයනය කළ, නොහැර පැවති.

**අනුසරති.** ක්‍රි-(අනු + සර. d. භූ. චින්තායං, සිතීමෙහි + ති) සිහිකෙරෙයි, ගමන් කෙරෙයි

**අනුසරණ**. න- අනුසමරණය, සිහිකිරීම.

**අනුසම්පවඞ්ක**. ති-අවනතවීම, කයින් සිතින් හා වදනින් නැමීම.

**අනුසවති.** ක්‍රි-(අනු + සව d. ගතියං, යාමෙහි + ති) වැගිරෙයි, ගලාබසියි.

**අනුසවන**. න-වැගිරීම, ගලා බැසීම.

**අනුසහගත.** ති-කුඩා ව පැවති, එක්ව පැවති.

**අනුසාර**. පු-අනුව යාම, අනුව පැවැත්ම, අනුව විසීම.

**අනුසාරී.** ති-අනුව පවතින, අනුව යන.

**අනුසාරෙති.** ක්‍රි-(අනු + සර. d. භූ. ගතියං, යාමෙහි + ණෙ + ති) අනුව යෙයි, අනුව පවතියි.

**අනුසාසක**. පු- අනුශාසනා කරණ තැනැත්තා.

**අනුසාසති**. ක්‍රි-(අනු + සාස. d. භූ. අනුසිට්ඨියං, අනුශාසනා කිරීමෙහි + ති) අනුශාසනා කරයි.

**අනුසාසන**. න-අනුශාසනා කිරීම, නැවත නැවත අවවාද දීම.

**අනුසාසනී** ඉ-අනුශාසනාව, නැවත නැවත කරණ අවවාදය.

**අනුසාසිත**. ති-අනුශාසනා කරණලද.

**අනුසාවන.** ති-කර්ම වාක්‍යය ඇස්වීම.

**අනුසික්ඛති**. ක්‍රි-(අනු + සික්ඛ. d භූ. සික්ඛණෙ, හික්මීමෙහි + ති) හික්මෙයි, ඉගෙණ ගණී.

**අනුසික්ඛමාන**. ති-හික්මෙන.

**අනුසික්ඛී**. ති-ශික්‍ෂා අනුව හික්මෙන.

**අනුසිට්ඨ**. ති-අනුශාසනා කරනුලැබූ. "අනුසිට්ඨො සො මයා." අනුශ්‍රවණය කළ.

**අනුසිට්ඨි**. ඉ-අවවාදය, අනුශාසනාව.

**අනුසිබ්බති**. ක්‍රි-(අනු + සිවු. d. දි. තන්තුසන්තානෙ, විවීමෙහි + ති) වියයි, නූල් කටියි.

**අනුසුණාති**. ක්‍රි-(අනු + සු. d. සු සවණෙ, ඇසීමෙහි + උණා + ති) අසයි. ශ්‍රවණය කරයි.

**අනුසුම්භති**. ක්‍රි (අනු + සුම්භ d භූ. භාසනෙ, බැබලීමෙහි + ති) සරසයි, බබලයි.

**අනුසූයක**. ති-(අන්=න + උසූයක) ඊෂ්‍යා නො කරණ.

**අනුසූයන**. න-ඊෂ්‍යා නොකිරීම.

**අනුසෙට්ඨි**. පු-ධනවතා, ධන රැස්කරන්නා, සිටුවරයා.

**අනුසෙති.** ක්‍රි (අනු + සි. d. භූ. සයෙ, සයනය කිරීමෙහි + ති) සයනය කරයි.

**අනුසො**. අ අනුව, එකඟව.

**අනුසොත**. ති-ශ්‍රොතස අනුව.

**අනුසොතගාමී**. ති-ශ්‍රොතස අනුව යන.

යෙ කෙචි කාමෙසු අසඤ්ඤතා ජනා
අවීතරාගා ඉධ කාමභොගිනො,
පුනප්පුනං ජාති විරූප ගාමිනො
තණ්හාධිපන්නා අනුසොතගාමිනො.
(2197)

**අනුසොචති.** ක්‍රි-(අනු + සොච + d. භූ සොකෙ, ශොක කිරීමෙහි + ති) තමාගේ අපරාධය අනුව ශොක කරයි, විපාකය අනුව ශොක කරයි.

**අනුසොචන.** න-පාපකර්මයට අනුව ශොක කිරීම.

**අනූන**
**අනූනක** } ති-(අන්=න + ඌන). නො අඩු, සම්පූර්ණ, පිරුණු.

**අනූනතා.** ඉ-අනූනතාව, පිරුණුබව.

**අනූනාධික** ති-අඩුවැඩි නැති.

**අනූප.** පු ජලබහුල භූමිය, දෙනියාවත, දියාරු බිම.

**අනූපජ.** ති-ජලබහුල පෙදෙස්හි උපන්.

**අනූපඝාත=අනුපඝාත.** ති-නො නසන ලද, හිංසා නොකළ.

**අනූපධික=අනුපධික.** ති-උපධිරහිත. 'උපධි' බලනු.

**අනූපනාහි=අනුපනාහි.** ති-උපනාහ රහිත, බද්ධවෛර නැති.

**අනූපනීත=අනුපනීත.** ති-(අන්=න + උපනීත) නොපමුණුවන ලද.

**අනූපම=අනුපම.** ති-උපමාරහිත, උපමා කිරීමට අනෙකෙකු හෝ අනෙකක් නැති.

**අනූපලිත්ත=අනුපලිත්ත.** ති-නොතැවරුණු, නොගැවුනු.

**අනූපවාද=අනුපවාද.** ති උපවාද රහිත, නින්දා නො එලවනලද.

**අනූහත.** ති-(අන්=න + ඌහත) නොනසන ලද, නොනැසූ.

**අනෙක.** ති-(අන්=න + එක) එකසංඛ්‍යාවක් නොවන, එකක් නොවන.

**අනෙකකම්මක.** පු-දුහාදි හා න්‍යාදි විකර්මක ධාතුහු අනෙකකර්මක නම්.

**අනෙකත්ථ.** පු නොයෙක් අර්ථ ඇත්තා, උපසර්ග නිපාත ධාතුප්‍රත්‍යය ආදිය.

**අනෙකංස.** පු-(අන්=න + එකංස) එකක් නියම කරගත නොහැකි, එකක් නියම නැති, සැකය, ඒකාන්ත නොවන කරුණ.

**අනෙකපරියාය.** පු (අන්=න + එකපරියාය) නොයෙක් ප්‍රකාරය, බොහෝ ක්‍රමය.

**අනෙකන්තික.** පු-ඒකාන්ත නොවන්නේ අනෙකාන්තිකයි. පඤ්චවිධ හේත්වාභාෂයන් අතුරෙන් ප්‍රධානවූයේ අනෙකාන්තිකය.

**අනෙකවිධ** ති-එකවිධියක් නොවන, නානා ප්‍රකාර.

**අනෙකවිහිත.** ති- (අන්=න + එක + විහිත) නානාතැන පිහිටි, නානාප්‍රකාර.

**අනෙකසඞ්ඛ්‍යා.** ඉ-මිසසක ගුණිත ආදි පඤ්චවිධ සංඛ්‍යා අතුරෙන් අනෙක අර්ථයන් ප්‍රකාශ කරණ සංඛ්‍යා-සහස්සරංසි සතතෙජ ආදියයි.

**අනෙජ.** ති-(අන්=න + එජ) එජා විරහිත, ආශා නැති, තෘෂ්ණා නැති.

**අනෙධ** පු-(අන්=න + එධ) දර රහිත.

**අනෙරිත.** ති-(අන්=න + ඊරිත) කම්පා නො කළ, චඤ්චල නොවූ.

**අනෙල.** ති-(අන්=න + එල) කෙලතොලු නො වන, ජඩ නොවන, නිදොස්.

**අනෙලක.** ති-ජඩ නොවන, නිවැරදි, නිදොස්.

**අනෙලගල.** ති-(අන්=න + එල + ගල) කෙල වැගිරෙන තොල් නැති, ජඩ නොවන, නිදොස්වචන ඇති.

**අනෙලමූග.** ති-(අන්=න + එලමූග) කෙලතොලු නොවූ, නිදොස් බස් ඇති.

**අනෙසනා.** ඉ-සෙවීම, අන්වෙසනය, වැරදි ලෙස ප්‍රත්‍යය සෙවීම.

**අනෙසනා.** ඉ-භික්ෂූන්ට අයොග්‍ය ප්‍රත්‍ය සෙවීම අනෙසනා නමින් හඳුන්වයි. එනම් 21 ආකාර වූ අනෙසනයි. 1. හුණ දඬු දීම. 2. තාම්බූලාදි පත්‍ර දීමය. 3. මල් දීමය. 4. ඵල වර්ග දීමය. 5. දැහැටි දඬු දීමය. 6. මුවදෝනා පැන් දීමය. 7. නහන පැන් දීමය. 8. ඇඟ උලන සුණු ආදිය දීම. 9. මැටි දීමය. 10. චාටු කමින් උපස්ථායකයන් ඉදිරියෙහි සිටීම. 11. මුග්ගසූපතාවය, පිසූ මුං මෙන් මඳක් සැබෑත් වැඩියත් බොරුත් කීමය. 12. පාරිභටටතා නමින් දක්වූ කුලදරුවන් නැලවීම ආදිය. 13. ජඞ්ඝපෙසනිකා නම් ලද ගිහියන්ගේ ලියුම් කියුම් හුවමාරු කිරීම. 14. ගිහියන්ට වෙදකම් කිරීම. 15. දූත කම් වූ ගිහියන්ගේ පණිවුඩ කීමය 16. පහෙණ

(2231)

ගමන තමවූ මෙහෙවර පිණිස කෙත්වත් ආදිය ලබාගැණීම. 17. පිණ්ඩ ප්‍රතිපිණ්ඩතයයි කියනු ලබන තමා ලද දෙය ගිහියන්ට දී ඔවුන් ලද දෙය තමා ලබාගැනීම. 18 ලාභා ශාවෙන් අල්ලස් දීම. 19. ගෙබිම් ආදිය පෙන්වන වාස්තුවිද්‍යාව දක්වීම. 20. තිථි හෝරාදිය දක්වන නක්ෂත්‍ර විද්‍යාවෙහි යෙදීම. 21. අඞ්ගප්‍රත්‍යඞ්ගයන්ගේ ලක්ෂණාදිය විස්තර කර දෙන අඞ්ග විද්‍යාවෙහි යෙදීමය යන මේ 21 ක්‍රමයකින් ප්‍රත්‍යය සෙවීම අනෙසන නම් වේ.

**අණෝක**. පු-(අන්=න + ඔක) ඔක රහිත, අන ගාරික, වාසස්ථාන නැති, ආලය රහිත, අවකාශ නැති. 'ඔක' බලනු.

**අණෝකප්පන**. ති-නො අදහන, විශ්වාස නො කරණ.

**අණෝඝ**. පු-(අන්=න + ඔඝ) ඔඝ විරහිත, චතුර් විධ කාමෞඝාදිය නැති.

**අණෝජක**. පු-එතම් ගස.

**අණොජග්ඝති**. ක්‍රි-(අනු + උ + ජග්ඝ. d. භූ. හසනසම්ං, සිනාසීමෙහි + ති) උජ්ජග්ඝනය නොකරයි, අත්පොළසන් ගසා මහත් කොට සිනා නො වෙයි.

**අණොජග්ඝන**. න-උජ්ජග්ඝනය නොකිරීම, මහත්කොට සිනා නොවීම.

**අණොජව**. ති-තෙජස් රහිත, තෙද නොමැති.

**අණොජා**. න-එතම් ගස.

**අණොතත්ත**. පු-රත්නොවන ජලය ඇති එතම් විල. හිරු රැසින් නො තැවෙන දිය ඇති හෙයින් අනොතත්ත නම් ලද මේ විල හිමාල වනයෙහි මහ විල් සත අතුරෙන් ප්‍රධාන එකයි, ගැඹුරින් හා පළලින් පනස් යොදුන් වෙයි. පඤ්ච පර්වතයන්ගෙන් වටවී තිබේ. එනම්:- සුවර්ණමය සුදර්ශන පර්වතය, සර්වරත්නමය චිත්‍රකූට පර්වතය, අඤ්ජනමය කාලකූට පර්වතය, මාණික්‍ය්ජමටමය ගන්ධමාදන පර්වතය, රජතමය කෛලාස කූට පර්වතය යන පඤ්ච පර්වතයන්ගෙන් වට වී තිබේ. මේ විලෙහි සතර පැත්තේ සිංහ මුඛය, අශ්ව මුඛය, හස්තිමුඛය, වෘෂභ මුඛයයි ජලය නික්මෙන සොරොව් සතරක් වෙත්. ප්‍රභාරා ද සූත්‍ර අටුවාව බලන්න.

**අණොත්තප්ප**. පු-(අන්=න + ඔත්තප්ප) පාපයට බිය නැති, ඔතප් නැති. න ඔත්තප්පං= අනොත්තප්පං.

**අණොත්තප්පන**. න-පාපයට බිය නොවීම.

**අණොත්තප්පී**. ති-පාපයට බිය නැති, ඔතප් නැති.

**අණොදක**. ති-(අන්=න + උදක) ජලය රහිත, දිය නොමැති.

**අණොදිස්සක**. පු-කොටස් නොමැති. භාග වශයෙන් නොබෙදන ලද.

**අණොධි**. පු-(අන්=න + ඔධි) අභිනිෂ්ක්‍රමණීය. (කෙලෙසුන් ඉතිරි නො කොට නසන හෙයින් අභිනිෂ්ක්‍රමණීය 'අනොධි' නම් වේ.) 'ඔධි' බලනු.

**අණොපම**. ති-(අන්=න + උපම) උපමා රහිත.

**අණොම**. ති-(අන්=න + ඔම) අලාමක, නීච නොවන, උතුම්.

**අණොමගුණ**. පු-අලාමකගුණය, උත්තම ගුණය.

**අණොමජ්ජති**. ක්‍රි-(අන්=න + අව + මජ්ජ d. භූ. මද්දනෙ, මැඩීමෙහි + ති)නොමඩියි, නො-මිරිකයි, නොපාගයි.

**අණොමජ්ජන**. න-නොමැඩීම, නොමිරිකීම.

**අණොමදස්සී**. පු-අලාම්ක දැකුම් ඇත්තා.

**අණොමපඤ්ඤ**. ති අලාමකප්‍රඥා ඇති, උත්තම ප්‍රාඥ ඇති.

**අණොරපාර**. න-(අන්=න + ඔරපාර) එතෙර මෙතෙර නැති.

**අණොරමති**. ක්‍රි-(අන්=න + ඔරමති) නො-ඇලෙයි; නොනවතී.

**අණොවට්ඨ**. **අණොවස්ස**. } ති-වැහි නැති, වියලි, ශුෂ්ක.

**අණොසිත**. ති-(අන්=න + අවසිත. අවඃඛ) යටත් නොකළ.

**අණොස්සක්කන**. න-පසුනොබැසීම, පසුබට නොවීම.

**අපඤ**. d. භූ. පාප්‍රණනෙ, පැමිණීමෙහි, අපපොති, පැමිණෙයි.

**අප්ප.**
**අප්පක.** } ති-ස්වල්ප, මඳ, ටික, කුඩා.

**අප්පකත.** ති-තැනට නො ගැළපෙන, ප්‍රස්තාවොචිත නොවූ.

**අප්පකසිර.** න-(අප්ප + කසිර) මඳහිරිහැරය, හිරිහැර නැති.

**අප්පකාර.** ති-(අ + පකාර) ප්‍රකාර රහිත, විධි විරහිත, පිළිවෙළ නැති.

**අප්පකාරක.** පු-(අ + පකාරක) එක් ප්‍රකාරයකට ක්‍රියා නොකරන්නා.

**අප්පකාරක.** පු-උපකාර නැත්තා, අනුපකාර කරන්නා.

**අප්පකිච්ච.** ති-ස්වල්ප කටයුතු ඇති, මඳ කිස ඇති.

**අප්පකිණ්ණ.** ති-ආකීර්ණතා විරහිත, සමූහයා හා එකට ගැටීමක් නැති.

**අප්පග්ඝ.** ති-(අප්ප + අග්ඝ) මඳ වටිනාකම, බොහෝ නොවටින.

**අප්පකොපෙති.** ක්‍රි-(න=අ + ප + කුප d. දි. කොපෙ, කිපීමෙහි + ති) නොකිපෙයි.

**අප්පගන්ධ** පු-මඳගඳ, ටිකසුවඳ.

**අප්පගන්ධක.** ති-මඳ සුවඳ ඇති.

**අප්පගබ්භ.** ති-(අ + පගබ්භ) ප්‍රගල්භ රහිත, නුබුහුටි, කඩිසර නැති.

**අප්පගබ්භ.** ති-(අප + ගබ්භ) පහවූ ගර්භශය්‍යා ඇති.

**අප්පච්චය.** ති-ප්‍රත්‍යය රහිත, හෙතු රහිත, කරුණු නැති.

**අප්පඤ්ඤත්ත.** ති නොපණවනලද, නියොග නොකළ.

**අප්පටිකාරික.** ති-ප්‍රත්‍යුපකාර නොකරණ.

**අප්පටිඝ.** ති-(අ=න + පටිඝ)ප්‍රතිඝ රහිත

**අප්පට්ඨ.** ති-(අප්ප + අට්ඨ=අප්පත්ථ) අර්ථ රහිත, ඵල රහිත,

**අප්පට්ඨතර.** ති-බොහෝ උපකරණයන්ගෙන් හෝ වතාවත් කරන්නන්ගෙන් ප්‍රයොජන නැති.

**අප්පථාම.** පු-ස්වල්පශක්තිය. ති-ශක්තිය නැති, දුර්වල,

**අප්පදුස්ස.** පු-මඳ නුවණැත්තා, අඥයා.

**අප්පනිග්ඝොස.** ති-(අප්ප + නි + ඝොස) මඳ ඝොෂ ඇති, මහත් ශබ්ද නැති.

**අප්පටිනිස්සග්ග.** ති-(අ=න + පටි + නි + සග්ග) නොහරිණ, දුරු නොකරණ, ඉවත් නොකරණ.

**අප්පටිපුග්ගල.** පු-අප්‍රතිපුද්ගලයා, අසමාන පුද්ගලයා.

**අප්පටිබද්ධ.** ති-ප්‍රතිබද්ධ නොවන, නොපිළිබඳ, නොබැඳුනු.

**අප්පටිභාග.** ති-ප්‍රතිභාග රහිත.

**අප්පටිභාති.** ක්‍රි-(අ=න-පටි + භා d. භූ. දිප්තියං, බැබලීමෙහි + ති) නොවැටහෙයි, අවබොධ නොවෙයි.

**අප්පටිභාන.** ති-ප්‍රතිභාන රහිත, වැටහීම් නැති.

**අප්පටිම.** ති-අසමාන. පු බුදුරජ.

**අප්පටිවත්තිය.** ති-විරුඬව පවත්වන්ට නොහැකි.

**අප්පටිවාන.** න-නොපසුබස්නා වීය්‍ය්‍යීය, උත්සාහවීය්‍ය්‍යීය.

**අප්පටිවානිතා.** ඉ නොපසුබස්නා වීය්‍ය්‍යී ඇති බව.

**අප්පටිවානිය.** න-නොපසුබස්නා වීය්‍ය්‍යීය.

**අප්පටිවානී.** ති-නොපසුබස්නා වීය්‍ය්‍යී ඇති.

**අප්පටිවිද්ධ.** ති-ප්‍රතිවෙධ නොකළ, අවබොධ නොකළ.

**අප්පටිවිභත්ත.** ති-නොබෙදනලද, විභාග නොකළ, කොටස් නොකළ.

**අප්පටිවෙක්ඛණා.** ඉ-ප්‍රත්‍යවෙක්ෂා නොකිරීම.

**අප්පටිවෙක්ඛිය.** පූ. ක්‍රි - ප්‍රත්‍යවෙක්ෂා නොකොට, නොපස්විකා.

**අප්පටිසඞ්ඛාය.** පූ. ක්‍රි-නොසලකා, නොපස්විකා

**අප්පටිස්සවන.** න-(අ=න + පටි + සවන) නොවැගිරීම, නොවැස්සීම.

**අප්පටිස්සවනතා.** ඉ-නොවැගිරෙනබව, ගලා නොබසිනබව.

**අප්පටිසන්ධි.** ති-සන්ධිවීම් රහිත, ප්‍රතිසන්ධිරහිත, පිළිසඳ නැති.

**අප්පඨම.** ති-ප්‍රථම නොවන, පළමුවෙනි නොවන.

**අප්පණා.** ඉ-පැමිණවීම. අයිතිකර දීම.

**අප්පණාචිත්ත.** න-ධ්‍යානචිත්තය.

**අප්පණාඣාන** න-රූපාවචරාදිධ්‍යානය.

**අප්පණාසමාධි.** පු-රූපාවචරාදි සමාධිය, 'උපචාරසමාධි' බලනු.

**අප්පණිහිත** ති-(අ=න + පණිහිත) "එතං මම එතං සුඛං" යනාදින් ප්‍රවෘත්තවූ තෘෂ්ණා-සඞ්ඛ්‍යාත ප්‍රණිධිය බැහැර කරණලද තෘෂ්ණා රහිත.

**අප්පණිහිතවිමොක්ඛමුඛ** න-යම් කලෙක ව්‍යුත්ථානගාමිනීවිදර්ශනාව දුඃඛ හෙයින් විදර්ශනා කෙරේ නම් එසමයෙහි මාර්ගය තෙම අප්‍රණිහිත විමොක්ෂමුඛ නම් වේ.

**අප්පත්ථ.** ති-අල්පය යන අර්ථ ඇති.

**අප්පතිකුට්ඨ-** ති-උපවාද රහිත, නින්‍දා රහිත.

**අප්පතිට්ඨ.** ති-ප්‍රතිෂ්ඨා රහිත, පිහිටීම් නැති පිහිට නැති.

**අප්පතිස්ස.** ති-යටත් නොවූ පැවතුම් ඇති, බුද්ධ ධම්ම සඞ්ඝ සික්ඛා අප්පමාද පටිසන්ථාර යන සතැන අගරුලෙස හැසිරීම් ඇති.

**අප්පතිහ.** න-ස්වල්පකාලය. මඳකාලය.

**අප්පතිහත.** ති-(අ=න + පති + හත) අප්‍රතිහත නොමැඩිය හැකි, නොතැසිය හැකි, යටත් නොකටහැකි.

**අප්පතීත.** ති-නොපතළ, නොසතුටු.

**අප්පතීති.** ඉ-අප්‍රසිද්ධිය, නො හැඟීම.

**අප්පදුට්ඨ.** ති-(අන + ප + දුස d දී අප්‍රීතිමහි අප්‍රීතියෙහි + ත=ට්ඨ)ප්‍රදුෂ්ට නොවන, ක්‍රොධ රහිත, අපරාධ රහිත.

**අප්පධංස.**
**අප්පධංසික.** } ති-විනාශ නොවන, නැති නොවන.

**අප්පධංසිත.** ති-අවිනාශිත, විනාශ නොකළ.

**අප්පධංසිය.** ති-විනාශ නොවිය යුතු, නැති නොවිය යුතු.

**අප්පධාන.** ති-ප්‍රධාන නොවන, ස්වතන්ත්‍ර නොවූ.

**අප්පනිග්ඝොස.** ති-ඝොෂ රහිත, ස්වල්පශබ්ද ඇති.

**අප්පපඤ්ඤ.** ති-ස්වල්ප ප්‍රඥා ඇති, ප්‍රඥා නැති.

**අප්පපුඤ්ඤ.** ති-පින් නැති, මඳපින් ඇති.

**අප්පභක්ඛ.** ති-ටිකක් කන,මඳක්අනුභව කරණ.

**අප්පභොග.** පු-ස්වල්පභොගය, මඳ අනුභවය, ති-දුප්පත්.

**අප්පමඤ්ඤ.** ඉ-සතරබ්‍රහ්මවිහරණය, මෛත්‍රී කරුණා, මුදිතා, උපෙක්ඛා යන ධර්මසතර.

**අප්පමත්ත.** ති (අ=න + පමත්ත)පමා නොවූ, එළඹසිටි සිහි ඇති.

**අප්පමත්තක.** ති-(අප්ප + මත්ත) ස්වල්පප්‍රමාණ, මඳපමණ.

**අප්පමාණ.** ති-ප්‍රමාණ රහිත, අපමණ.

**අප්පමාණ සුභ.** පු-මෙය තෘතීය ධ්‍යාන භූමියට අයත් බඹලෝ තුනෙන් දෙවැන්නය. ප්‍රමාණ රහිත ශරීර ආලෝකයක් මෙවුන්ට ඇත. මහා කල්ප 32 ක් ආයුෂය වෙයි.

**අප්පමාද.** පු-අප්‍රමාදය, සමෘති අවිප්‍රවාසය, නොපමාව.

**අප්පමාදවිහාර.** පු-(අ=න + පමාද + විහාර) අප්‍රමාද විහරණය.

**අප්පමිස.** පු-සුළුකුර.

**අප්පමිද්ධ.** ති-නිදි නැති.

**අප්පමෙය්‍ය.** ති-ප්‍රමාණ නොකට හැකි, පමණ නොකට හැකි,

**අප්පයොග.** පු-ක්‍රියාවෙහි නොයෙදීම. අප්‍රයොගය.

**අප්පරජක්ඛ.** ති-ප්‍රඥාචක්ෂුසෙහි ස්වල්පවූ රාගාදී රජස් ඇති.

**අප්පවත්ත.** ති-නොපැවැති.

**අප්පවත්ති.** ඉ-අප්‍රවෘත්තිය, නො පැවැත්ම.

**අප්පවත්තිත.** ති-නොපවත්වනලද.

**අප්පවත්තිතා.** ඉ-නොපවත්නාබව.

**අප්පස්සක.** ති-(අප්ප + සක) තමා පිළිබඳ ස්වල්පවූ අයිතිය ඇති.

(2347)

**අප්පස්සාද.** ති (අප්ප + අස්සාද) ස්වල්පවූ ආස්වාද ඇති. පු-මඳරස විඳීම.

**අප්පස්සුත.** ති-අල්පශ්‍රැත, බහුශ්‍රැතනොවූ, බොහෝ ඇසූපිරූ තැන් නැති

**අප්පසඞ්ග.** පු-නොපැමිණීම, ප්‍රසඞ්ග නොවීම අප්‍රසඞ්ගය.

**අප්පසත්ථ.** ති (අප්ප + සත්ථ) සත්ථවාහකයෙකු රහිත, සාත්තුවෙකු නොමැති (ගැල්සමූහයක් සාත්තු නම් වේ.

**අප්පසන්න** ති-ප්‍රසන්න නොවූ, නොපැහැදුනු.

**අප්පසමාරම්භ.** ති-ස්වල්පාරම්භ ඇති, ස්වල්පවූ පටන්ගැන්මක් ඇති.

**අප්පසාද.** පු-අප්‍රසාදය, නොසතුට, නොපැහැදීම.

**අප්පසාදිත.** ති-නො පහදවනලද.

**අප්පසාවජ්ජ.** න-ස්වල්ප වරද. ති-සුලු වරද සහිත.

**අප්පසිද්ධ** පු-ව්‍යාකරණයෙහි දක්නට නොලැබෙන දෙය, ස්ත්‍රීලිඞ්ග අකාරාන්ත ශබ්ද ආදිය.

**අප්පහරිත.** ති-තිල්තණ රහිත.

**අප්පහාණ** න-ප්‍රහීණ නොවීම.

**අප්පහීන.** ති-ප්‍රහීණ නොවූ, ක්‍ෂය නොවූ.

**අප්පාණක** ති-ප්‍රාණ රහිත, පණුවන් නැති.

**අප්පාතඞ්ක.** ති (අප්ප + ආතඞ්ක) ස්වල්පාබාධ ඇති, නිරොගි, ලෙඩ නැති, අධික ලෙඩ නැති.

**අප්පාතුම.** පු-ස්වල්ප ආත්මය.

**අප්පිකා** ඉ-කුඩා තැනැත්ති.

**අප්පිච්ඡ.** ති අල්පෙච්ඡ. ලදදෙයකින් සතුටුවන.

**අප්පිච්ඡතා** ඊ-අල්පෙච්ඡතාව, ලදදෙයකින් සතුටු වන බව.

**අප්පිත.** ත-පැමිණි, සමවැදුනු, ඇතුලත් වූ.

**අප්පිය.** ති-ප්‍රිය නොවූ,

**අප්පියවාදී.** පු-අප්‍රියවාදියා, ප්‍රියනොවන කථා කියන සවභාව ඇත්තා.

**අප්පියසම්පයොග.** පු-අප්‍රිය තැනැත්තන් හා එකතු වීම.

**අප්පෙකදා.** අ-(අපි + එකදා) සමහර දවසක, ඇතැම් දිනයක.

**අප්පෙව** අ-සංසයෙහි, සැකයෙහි.

**අප්පෙවනාම.** අ-සංසයෙහි, ඉතායෙහෙක යන අර්ථයෙහි- "අප්පෙව නාම මයම්පි ආයස්මන්තානං කිඤ්චිමත්තං අනුපදජ්ජෙය්‍යාමාති."

**අප්පෙසක්ඛ.** ති-අල්පෙශාඛ්‍ය නොවන, උදාරම් නොවන, තෙජස් නැති.

**අප්පොස්සුක්ක** ති-(අප්ප + උස්සුක්ක) මඳඋත්සාහ ඇති, මන්දවීර්‍ය්‍ය ඇති.

**අප්ඵුට.** ති-ස්පර්ශ නොකළ, නොතැවරුණු, නොගැවුනු.

**අප්ඵොටා.** ඉ-වැලිද්ද, කටරොළු.

**අප්ඵොටිත.** ති-අත්පොලසන් දුන්, අප්පිඩි ගසනලද.

**අප.** අ-නිර්දේශ, පරිවර්ජන, පූජා, අපගතාර්ථ, වැලකීම්, අප්‍රීති, ගර්හා, සොරකම් යන මෙහි.

**අප.** d පු-පාපණෙ, පැමිණවීමෙහි. අපුණාති, පැමිණෙයි.

**අප.** d පු-පාපණෙ. පැමිණවීමෙහි අපොති, පැමිණෙයි.

**අපක්කම.** පු පැරදයාම, බැහැර යාම.

**අපක්කම.** ති-පැරද පලා යාම, වෙන්ව යාම, බැහැර යාම, වාක්‍යාර්ථ දෙෂයක්, උපිළිවෙළ,

**අපක්කමති.** ක්‍රි-(අප + කමු d භූ. පදවික්ඛෙප, යාමෙහි + ති) පැරද යෙයි, පලා යෙයි, බැහැර යෙයි.

**අපක්ඛර.** පු රථ අකුර මත්තෙහි වූ ඇණ-විශෙෂයක්, කඩ ඇණය, අකුර අග ගසන කණුව.

**අපකඩ්ඪති** ක්‍රි-(අප + කඩ්ඪ d භූ. කඩ්ඪනෙ, ඇදීමෙහි + ති) අහකට අදියි, ආපසු අදියි.

**අපකඩ්ඪන.** න-ඉවත් කිරීම, අහකට ඇදීම.

**අපකත** ති-වරදවා කළ, සදොස්ව කළ. බැහැර කළ.

**අපකතඤ්ඤු** ති-(අප + කතඤ්ඤු d + ඌ=රූ) අකෘතඥ, කළගුණ නොදන්නා, පකතඤ්ඤු නොවන.

**අපකනනති**. ක්‍රි-(අප + කනි d භූ. ඡේදෙ, සිඳීමෙහි + ති) කපාදමයි, කපා හරියි.

**අපකරොති**. ක්‍රි-(අප + කර d භූ + ඔ + ති) වරදවයි, වරදවා කරයි.

**අපකසසති**. ක්‍රි-(අප + කසස d භූ ගතියං, කසසනෙ, ඇදීමෙහි + ති) ආපසු අදියි. ලඟට අදියි.

**අපකසති**. ක්‍රි-(අප + කස. d භූ. හිංසායං, විලෙඛනෙ, පෙළීමෙහි. ඉරි ඇදීමෙහි + ති) ආපසු අදියි, පෙළයි, ඉරි අඳියි.

**අපකාර**. පු-අනුපකාරය, අහිත කිරීම.

**අපගච්ඡති**. ක්‍රි-(අප + ගමු. d. භූ. මු=ච්ඡ + ති) ඉවත යෙයි.

**අපගත**. ති-පහව ගිය, බැහැර ගිය, මැරුණු

**අපගතවිඤ්ඤාණ**. න-පහ වූ විඥානය. ති-විඥතයෙන් තොර, විඥනය නැති.

**අපගබ්භ**. පු-(අප + ගබ්භ) පහවූ ගර්භශය්‍යා ඇති, උත්පත්ති වශයෙන් නැවත මවු-ගැබකට නොපැමිණෙන, උත්පත්තිය නැති

**අපගම**. පු-අපගමය, පහ වීම, ඉවත්ව යාම.

**අපගමන**. න-පහව යාම, ඉවත්ව යාම.

**අපච්ච**. න-දරුවා, වංශය, වංශානුගත, දරුමුනුබුරු පරපුර.

**අපච්චක්ඛ**. ති-(අ=න + පති + අක්ඛ) අප්‍රත්‍යක්‍ෂ, ඉන්ද්‍රියහමුනොවන, ආරක්‍ෂියෙන් දුනගත්, ප්‍රත්‍යක්‍ෂ නොවූ, ඉන්ද්‍රිය ග්‍රාහ්‍ය නොවූ.

**අපච්චොරොහතා**. ඉ-නොපෙරළෙන සවභාව.

**අපච්චුද්ධාරක**. ති- පච්චුද්ධාරණය නොකළ, පරිභොග කරවයි පෙරළා නො දුන්.

**අපච්ඡාපුරිම**. ති-පෙරපසු නොවන, එකවිට.

**අපචය**. පු-විනාශය. නිර්වාණය.

**අපචයගාමී**.ති-නිර්වාණගාමී,නිවණටපමුණුවන.

**අපචයති**. ක්‍රි-(අප + චය. d. භූ. ගතියං, යාමෙහි + ති) පුදයි, යාග කරයි.

**අපචයන**. න-පිදීම, දානය.

**අපචර**. පු-සාවද්‍ය හැසිරීම, වැරදි හැසිරීම.

**අපචායති**. ක්‍රි-පුදයි, යාග කරයි, දෙයි.

**අපචායන**. න-පිදීම, යාගය, දීම. වයස හා ගුණ යෙන් යුත් වැඩි සිටි අය දැක ලාභාපෙක්‍ෂා ආදියක් නැතිව පිරිසිදු සිතින් හුනස්නෙන් නැගිටීම් ආදියෙන් බහුමාන කිරීම,

**අපචායික**. පු-පුදන්නා, යාග කරන්නා.

**අපචායිත**. ති-පුදනලද, දෙනලද.

**අපචායී**. ති-පුදන්නා, යාග කරන්නා.

**අපචිණාති**. ක්‍රි-(අප + චි. d. කි. චයෙ, රැස් කිරීමෙහි + ණා + ති) රැස් කෙරේ.

**අපචිත**. ති-පුදනලද, දෙනලද, රැස් කළ.

**අපචිති**. ඉ-පූජාව, විනාශය, පූජා කිරීම.

**අපචිති**. ඉ -⎫ රැස් කිරීම.
**අපචිනන**. න-⎭

**අපජ්ඣායති**. ක්‍රි-(අප + ඣෙ, d භූ. චින්තායං, සිතීමෙහි + ති) සිතයි, මෙනෙහි කරයි.

**අපජහන**. න-(අප + ජහන - අ + ප + ජහන) පහ නොකිරීම, බැහැර නොකිරීම.

**අපඤ්ඤ**. ති-ප්‍රඥ නැති, මූඪ, දඟඩ.

**අපඤ්ඤත්ත**. ති-නොපණවනලද, ව්‍යවහාර නොකළ, ප්‍රඥප්තියට නොනගතලද.

**අපටිඤ්ඤ**. ති-පොරොන්දුවක් නැති, ප්‍රතිඥ-වක් නැති,

**අපටිජාන**. ති-පිළිනොගන්නා, ප්‍රතිඥ නො කරණ.

**අපටු**. ති-අව්‍යක්ත, නොපටු, අවිසාරද, අපණ්ඩිත, ලෙඩ ඇති.

**අපණ්ණක**. ති-අවිරුඬ, වැරදි නැති, නිදෙස්, නෛර්‍යාණික.

**අපණ්ණකපටිපදා**. ඉ - අවිරුඬ ප්‍රතිපදාව, නිවැරදි පිළිපැදීම.

**අපණ්ණකමණී**. න-සපැතිපසඇටය, පැති-සය එකාකාරව සිටින්ට තනනලද දුදුඇටය ඇටස් දුදුඇටය. (මෙය කොයිඅතට පෙර එතත් මනාව පිහිටන්නේය.)

**අපණ්ඩක**. ති-පණ්ඩක නොවූ.

**අපණ්ඩිත** පු-පණ්ඩිත නොවන, අවිසාරද, අඥන.

**අපණිධාන**. න-සිත නොපිහිටුවීම. ති-ප්‍රාණීනා රහිත.

**අපත්ථිත**. ති-නොපතනලද, නොපැතූ.

**අපත්ථිය**. ති නො පැතියයුතු, ප්‍රාර්ථනාවට නුසුදුසු.

**අපතන**. ති-(න=අ + පතන) නොවැටෙන. න-නොවැටීම.

**අපථ**. පු-අමාර්ගය, නොමග.

**අපද**. ති-පාද රහිත, කකුල් නැති, පිහිට නැති, ආකාශය,

**අපදාන**. න-චරිතය, යමෙකුගේ ජීවනචරිතය. පුරාවෘත්තාවයනීාව, හෙදය.

**අපදිසති**. ක්‍රි-(අප + දිස. d භූ. පෙක්ඛණෙ, බැලීමෙහි + ති) දක්වයි, බලයි.

**අපදෙස**. පු කාරණය, ලෙසය, කීම, අවකාශය. සතර අපදෙස. එනම්:- බුද්ධාපදෙසය, සංඝාපදෙසය, සම්බහුලථේරාපදෙශය, එකථේරාපදෙසය, යනු ඒ සතරයි. ධර්මාන්විත කරුණක් විනිශ්චයේදී මේ සතර ප්‍රයෝජන වෙයි.

**අපධාරණ** න-පියන, වහන්තරාව.

**අපනත**. ති-නැමුණු, අවනත.

**අපනමති**. ක්‍රි-(අප + නම. d භූ. නමනෙ, නැමීමෙහි + ති) නමයි, අවනත කෙරෙයි

**අපනමන**. න නැමීම, පහතට එබීම.

**අපනාමෙති**. ක්‍රි-(අප + නම. d. භූ නමනෙ, නැමීමෙහි + ති) නමයි, පහතට ඔබයි.

**අපනිහිත**. ති-සඟවනලද. බැහැර කළ.

**අපනීත**. ති-ඉවත් කළ, බැහැර කළ, එපා කළ.

**අපරගඞ්ගා**. ඉ-ගඟින් මෑතභාගය, මෙගොඩ.

**අපනුදති**. ක්‍රි-(අප + නුද. d භූ. ඛෙපෙ, දැමීමෙහි + ති) පහ කරයි, බැහැර කරයි.

**අපනුදන**. න-බැහැර කිරීම, ඉවත් කිරීම.

**අපම්මුට්ඨ** ති-නොමුළා වීම, නොමුළාව.

**අපමාර**. පු-අපස්මාර රොගය, මීමස්මොරය, මූර්ච්ඡාරොගය.

**අපයාති**. ක්‍රි-(අප + යා d. භූ. ගතියං, යාමෙහි + ති) පහව යෙයි.

**අපයාන**. න-අපගමනය, පහව යාම.

**අපර**. ති-අන්‍ය, වෙන, තමා අයත් නොවන.

**අපරගොයාන**. න-සතරමහාවීපයෙන් එකක් වූ එනම් වීපය.

**අපරජ්ඣති**. ක්‍රි-(අප + රාධ. d. දි. හිංසායං, හිංසාවෙහි + ති) අපරාධ කෙරෙයි.

**අපරජ්ජු**. අ-අපරකාලයෙහි, දෙවැනි දිනයෙහි.

**අපරජ**. ති-පසුව උපන්, බාල.

**අපරද්ධ**. ති-අපරාධ කළ, වැරදි කළ, වරදවනලද.

**අපරන්ත**. පු-අපර කෙළවර, අනාගතයාගේ කෙළවර.

**අපරන්න**(ණ්ණ). න-පසුව ඇතිවූ ආහාරය, ආදිකල්පයෙහි ප්‍රථමාහාරයෙන් මෑතභාගයෙහි වූ මුං උඳු ආදිය. (අපරන්නයට මුලින් ඇතිවූ හැල්ආදිය පුබ්බන්න නම්.)

**අපරප්පච්චය**. ති-(අ + පර + පච්චය) පරප්‍රත්‍යය රහිත, අනුන්ගේ කීම නිසාම නොඅදහන.

**අපරභාග**. පු-අන්‍යභාගය, මෑතකාලය, පසුකාලය.

**අපරසෙල**. පු-අස්තපර්වතය, අවරගිර.

**අපරාජිත**. ති-නොපරදනලද, නොපැරදවිය හැකි, පරදවන්ට බැරි.

**අපරාජිතා**. ඉ - කටරොළු, එලකටරොළු, සෙඑාලිකා.

**අපරාධ**. පු-අපරාධය, වැරැද්ද, ද්‍රෝහය, වැරදි ක්‍රියාව.

**අපරාධික**. ති-අපරාධ කාරයා, වැරදි කාරයා.

**අපරාධිත**. ති-අපරාධ කළ, වැරදි කළ.

**අපරාධී**. පු-අපරාධ ඇත්තා.

**අපරාන්තිකා**. ඉ-ප්‍රවාන්තක නම් වෛතාලීය වෘත්තයාගේ සම පාදයෙන් රචනා කළ අපරාන්තිකා වෘත්තය.

**අපරාපරිය**. ති-(අපර + අපර + ඉය) අතික් අතික් භවයකට අයිති, අන්‍ය අන්‍ය ආත්මභාව පිළිබඳ.

**අපරාපරියවෙදනීයකම්ම**. න - තුන්වෙනි සතරවෙනි ආදීවූ අන්‍ය අන්‍ය ආත්මභාවයකදී විපාකදෙන කර්මය.

**අපරාසී.** ති-පිළිසරණ නැති, ප්‍රතිෂ්ඨා රහිත, පිහිට නැති.

**අපරිග්ගහිත.** ති-(අ=+පරි+ගහන) පරිගෘහිත නොවන, අයත් නොවන.

**අපරිච්චත්ත.** ති-(න+පරිච්චත්ත) අත් නොහළ, අයිතිය මුදා නොදුන් දෑය

**අපරිච්ඡින්න.** ති-නොපිරිසුන්, වෙන් නොකළ.

**අපරිඤ්ඤාත** ති-නොදත්, අවබෝධ නොකළ, ස්වභාවාදීනව නොදත්.

**අපරිත්ත** ති-(අ=න+පරිත්ත) අනල්ප, නොමද, ටික නොවන.

**අපරිණත.** ති-නොපැසුනු, නොමේරූ.

**අපරිපක්ක.** ති-නුමුහුකළ, නොපැසුණු, නොම ඉදුනු.

**අපරිභොග.** පු-පරිභොග නොකිරීම, ති-ප්‍රයොජන නොගත හැකි.

**අපරිමණ්ඩල** ති-අසම්පූර්ණ, පරිමණ්ඩල ලක්ෂණ නොමැති.

**අපරිමාණ.** ති-අප්‍රමාණ, ප්‍රමාණ රහිත, අපමණ.

**අපරිමිත.** -ති-ප්‍රමාණ නොකළ, පමණ නොකළ, අපමණ.

**අපරියන්ත.** ති-(අ=න+පරි+අන්ත) සීමා රහිත, කෙළවරක් නැති

**අපරියොගාහණ.** න-අන්තර්ගත නොවීම, ඇතුළත් නොවීම.

**අපරියොනද්ධ.** ති-යටත් නොකළ, නොවසන ලද.

**අපරිසක්කන.** න-වීර්‍ය්‍ය නොකිරීම, උත්සාහ නොකිරීම.

**අපරිසෙස.** ති-(අ=න+පරි+සෙස) සෙස රහිත, ඉතුරු නැති.

**අපරිහාන** න-නොපිරිහීම. ති-පිරිහීමක් නැති.

**අපලාප** පු-සඟවා කීම, ප්‍රතිච්ඡන්න කොට කීම. ති-පලාප රහිත.

**අපලාපී.** පු ප්‍රලාප රහිතයා. 'පලාපී' බලනු.

**අපලායන.** න-පැන නොයෑම, පලා නොයෑම.

**අපලායී.** ති-පලා නොයන, පැන නොයන.

**අපලාළෙති.** ක්‍රි-(අප+ලල d. චු. උපසෙවායං, තැලවීමෙහි+ණේ+ති) නොතළවයි. නොපොලඹවයි.

**අපලාස** පු-යුගග්‍රාහ නොවන, උතුමන් හා සරිකොට ග්‍රහණය නොකරණ

**අපලාසී.** ති-යුගග්‍රාහ නැති-'පලාසී' බලනු.

**අපලිබුද්ධ.** පු-(අ=න+පලිබුද්ධ) නිදහස්, පීඩා රහිත, නොදූවටුනු.

**අපලිබොධ.** පු-පලිබොධ නැතිබව, හිරිහැර නොවීම.

**අපලෙඛති.** ක්‍රි (අප+ලිඛ. d. භූ. ලෙඛනෙ, ලිවීමෙහි, ඉරි ඇඳීමෙහි-පිසදැමීමෙහි+ති) ලියයි, ඉරිගසයි, පිසදමයි.

**අපලෙඛන.** න=ඉරි ඇඳීම, පිසදැමීම, ලෙවකෑම.

**අපලොකන.** න-නිරීක්ෂණය, බැලීම, අවසර ගැණීම. එනම් විනයකර්මය.

**අපලොකිත.** ති-(අප+ලොකිත) බලන ලද, අවසර ගත්.

**අපලොකී.** ති-බලන, පරීක්ෂා කරණ.

**අපලොකෙති.** ක්‍රි-(අප+ලොක. d. චු. දස්සනෙ දැකීමෙහි+ණේ+ති) බලයි, අවසර ගණියි.

**අපවග්ග.** පු-නිර්වාණය, පරිත්‍යාගය, අවසානය.

**අපවජ්ජන.** න-ත්‍යාගය, හැරීම, දුරු කිරීම.

**අපවත්තති.** ක්‍රි-(අප+වතු. d. භූ. වත්තනෙ, පැවැත්මෙහි+ති) පෙළයි, ඉවත්ව යෙයි.

**අපවදති** ක්‍රි-(අප+වද. d. භූ. වචනෙ, කීමෙහි+ති) නිඳා කෙරෙයි. පරුෂ බණියි, ගරහයි.

**අපවහති.** ක්‍රි-(අප+වහ. d. භූ. පාපණේ, පැමිණීමෙහි+ති) ඉවත් කරයි, බැහැර කරයි.

**අපවාද.** පු-නුගුණ කීම, අගුණ කීම, කාර්‍ය්‍යය කිත් කාර්‍ය්‍යයක් වළක්වාලීම.

**අපවාරණ.** න-පිධානය, පියන, වහන්තරාව.

**අපවාරිත.** ති-නොපවරණලද.

**අපවිද්ධ.** ති-වීසිකළ, දමනලද, ඉවත්කළ.

**අපවිය්‍යූහති.** ක්‍රි-(අප+වි+ඌහ. d. භූ. විතක්කෙ, විතර්කයෙහි, 'ය' ආගම+ති) විතර්ක කරයි, සිතයි.

**අපස්මාර**. පු-අපමාර රෝගය, මූර්ඡාරෝගය, මීමැස්මොරය.

**අපස්සය**. පු-න-හේත්තුවන පුවරුව (සත්තබෙගා නාම පිටකී අපස්සයෙන ච උභතො පසෙසසු අපස්සයෙහි ච සඞ්ං කතො.)

**අපස්සයන**, න-හේත්තුවීම, හාන්සිවීම, නිද්‍රාව.

**අපස්සයික**. පු නිදන්නා, හාන්සිවන්නා.

**අපසෙසති**. ක්‍රි (අප + සි. d. භූ. සයෙ, නිදීමෙහි + ති. අප + සෙති=අපසෙසති) නිදයි, සැතපෙයි. හාන්සිවෙයි.

**අපසෙසන**. න-පිටාවුව, පිට ඇන්ද, හාන්සිවන පිණිස තැනූ දෙය.

**අපසෙසන**.
**අපසෙසන ඵලක** } න-හේත්තුවන ලෑල්ල, හාන්සිවන පුවරුව.

**අපසක්කති**. ක්‍රි (අප + සක්ක d. භූ ගමනෙ, යාමෙහි + ති) ඉවත්ව යෙයි, බැහැර යෙයි.

**අපසක්කන**. න-ඉවත්ව යාම, බැහැර යාම.

**අපසද**. පු-හීනයා, පහත් ගති ඇත්තා.

**අපසපස**. පු-චරපුරුෂයා, ඔත්තුකාරයා.

**අපසව්‍ය**. න-දකුණු ශරීරය, දකුණුපැත්ත (උදාන අටුවා ත්‍රි. මු 195 පිට.)

**අපසව** පු-විපරීතාර්ථය, වැරදි අර්ථය.

**අපසාද**. න=ගැරීම, දෙෂාරොපනය කිරීම, බැණීම.

**අපසාදිත**. ති-බැහැර කළ, ගටනලද.

**අපසාදෙති**. ක්‍රි-(අප + සද. d. චු. අස්සාදෙ, ආස්වාදයෙහි + ණෙ + ති) නිඤු කෙරෙයි, බණියි, දෙස් නගයි, ගටයි.

**අපහර**. පු-සොරකම, ඉවත් කිරීම, බැහැර කිරීම.

**අපවිනාශ**. ති-ලබනු කැමැති දේ තිබේද්දී, තමන්ට ලැබිය යුතු පිරිකර කොටස ලබන කැමැත්ත අත නොහැර.

**අපහරණ**. න-සොරකම් කිරීම. බැහැර කිරීම.

**අපහරති**. ක්‍රි (අප + හර. d. භූ. හරණෙ, හැරගැණීමෙහි + ති) සොරකම කෙරෙයි. පැහැර ගණියි.

**අපහාර**. පු-පහකොට ගැන්ම.

**අපාක**. ති-නොපැසුනු, නොඉදුනු. පු-නොපැසීම.

**අපාකට**. ති-ප්‍රකට නොවන, අප්‍රසිඬ.

**අපාකටතා**. ඉ-අප්‍රකටබව, අප්‍රසිඬබව, ප්‍රසිඬ නොවනබව.

**අපාකතික**. පු ප්‍රකෘතිමත් නොවන, ප්‍රතිසංස්කරණ රහිත.

**අපාඞ්ග**. න-නෙත්‍රාන්තය, නෙත්කෙළවර.

**අපාචී**. ඉ-දක්ෂිණදිශාව, දකුණුදිග.

**අපාචීන**. ති ප්‍රාචීන නොවන, පූර්වනොවන, බටහිරට අයත්

**අපාඨ**. පු (අ + පාඨ) අපපාඨය, වැරදිපාඨය, වැරදි වාක්‍යය.

**අපාතුභූත** ති-නොහටගත්. පහළනොවූ. නොඋපන්.

**අපාද(ක)**. ති-පාද රහිත, පා නැති, කකුල් නැති, බඩගා යන (සතා).

**අපාදාන**. න-වෙන්කොට ගැණීම, අවධිකාරකය.

**අපාන**. න-ප්‍රශ්වාසය, නාසිකාවෙන් පිටවෙන වාතය. 'ආනාපාන' බලනු.

**අපානක**. පු-පැන් නොබොන තැනැත්තා.

**අපාපුරණ**. න-අවාපුරණය, යතුර, කෙස්ස, දොරයතුර.

**අපාපුරති**. ක්‍රි-(අප + ආ + පුර. d. භූ. අග්ගගමනෙ, ඉදිරිගමනයෙහි + ති) විවෘතකෙරෙයි, දොර හරියි.

**අපාමඟ්ග** පු-සැබෝ්ගස, කරල්හැබ.

**අපාය**. පු-සැප රහිත ස්ථානය, නිරය, විනාසය. අපාය සතරකි. එනම්:- නරකය, තිරිසන් අපාය, ප්‍රෙත යොනිය, අසුර නිකාය යන සතරයි. ''පුඤ්ඤ සම්මතා අයා යෙහුයෙයන අපගතොති' අපායො.''

**අපායමග්ග**. පු-නිරයට යන මාර්ගය, අකුශල ක්‍රියාව.

**අපායමුඛ**. පු-විනාසයේ දොර, පරදාරසෙවනාදිය.

**අපායසහාය**. පු-අපාය(=විනාශය) පිණිසවූ, අපායගාමි දුශ්චරිත පිණිස සහාය වන්නා.

**අපායී**. පු-පිටත යන්නා, ඉවත්ව යන්නා.

**අපාර**. න-මෙතෙර, මෙගොඩ. ති-පරතෙරක් නැති.

**අපාරනෙය්‍ය**. පු නොතොටට ගෙණ යන්නා, නොමග ගෙණ යන්නා.

**අපාරුත**. ති-නොපොරවනලද, නොවසනලද, නොපියනලද– "අපාරුතා තෙසං අමතස්ස ද්වාරා යෙ සොතවන්තො පමුඤ්චන්තු සද්ධං"

**අපාලම්බ**. න-හේත්තුවන පුවරුව, ඇන්ද.

**අපාහත**. ති-නසනලද. නිඳා කළ, ගරහන ලද.

**අපි** අ-සම්භාවනා, ගර්හා, අපෙක්ෂා, සමපිණ්ඩන, ප්‍රශ්න, සංවරණ, ආසිංසන යන මෙහි.

**අපිග්ගහණ**. න-ව්‍යාකරණ සූත්‍රයන්හි අපි යන උපසර්ගයාගේ ප්‍රයොගය.

**අපිතික** ති-(අ + පිතු + ණික) පියෙක් නැති, අවජාතක.

**අපිථියති**. ක්‍රි-(අපි + ථෙ. d භූ. සද්දසඞ්ඝාතෙ, ශබ්දයෙහි හා රැස්කිරීමෙහි + ය + ති) පියනු ලැබේ, වසනු ලැබේ.

**අපිදහති**. ක්‍රි-(අපි + ධා. d. භූ. ධාරණෙ, දැරීමෙහි. ධ=ද, හ + ති) වසයි, පියයි.

**අපිදහන**. න-වහන්තරාව, පියන.

**අපිධාන**. න-පියන, වහන්තරාව.

**අපිනාම** අ-ප්‍රශංසා, ගර්හා, සංශය, අභ්‍යුපගමාදි යෙහි.

**අපිලාපන**. ති නොඉල්පෙන, නොඉලිප්පෙන ජලයෙහි නොපාවෙන. න-නොඉල්පීම.

**අපිලාපනතා**. ඉ-නොඉල්පෙන (=නොඉලිප් පෙන) බව.

**අපිලාපනසද්ධා**. ඉ-නොඉල්පෙන ශ්‍රද්ධාව, අචලශ්‍රද්ධාව, ස්ථිරශ්‍රද්ධාව.

**අපිලාපෙති**. ක්‍රි-(අපි + ප්ලු. d. භූ. ගතියං, යාමෙහි + ණෙ + ති) ඉල්පෙයි.

**අපිස්සු**. අ-අනුබ්‍රෑහණාර්ථයෙහි.

**අපිහාර** පු-නැවත ගැන්ම.

**අපිහාලු** පු-(අ=න + පිහ. d. ආලු) ආසා නැත්තා, ප්‍රාර්ථනා නැත්තා.

**අපිහිත** ති-වසනලද, පියනලද.

**අපිහිත**. ති-(අ=න + පිහිත) නොවසනලද, නොපියනලද.

**අපුච්චණ්ඩ**. න-(අ= + පූති + අණ්ඩ) කුණුනොවූ බිජුවට.

**අපුඤ්ඤ**. න-අකුශලය, පාපය.

**අපුඤ්ඤාභිසඞ්ඛාර**. පු-චාදසවිධ අකුසල චෙතනා.

**අපුට්ඨ**. ති-(න + d. පුච්ඡ + ත, ච්ඡ + ත=ට්ඨ) නොඇසූ, නොවිචාල,

**අපුණාති**. ක්‍රි-(අප. d. සු. පාපණෙ, පැමිණී මෙහි + උණා + ති) පැමිණෙයි.

**අපුථුජ්ජන**. ති-පෘථග්ජන නොවන පු මාර්ග ඵල ලාභියා.

**අපුත්තක**. ති-දරුවන් නැති, අපුත්‍රක.

**අපුබ්බ**. ති-පෙරනොවන, පූර්වනොවන.

**අපූති**. ති-කුණුනොවන, හරසහිත.

**අපෙක්ඛති**. ක්‍රි-(අප + ඉක්ඛ. d. භූ. දස්සනෙ, දැකීමෙහි + ති) අපෙක්ෂා කෙරෙයි, බලයි, බලාපොරොත්තුවෙයි.

**අපෙක්ඛන**. න-අපෙක්ෂාව, බලාපොරොත්තු වීම.

**අපෙක්ඛා**. }
**අපෙඛා**. } ඉ අපෙක්ෂාව, බලාපොරොත්තුව.

**අපෙක්ඛිත**. ති-අපෙක්ෂා කළ, බලනලද, බැලූ.

**අපෙතත්ථ**. න-සමුදාය අර්ථයෙන් තොර වූ වාක්‍යය. අපෙතාර්ථ නම් වාක්‍ය දොෂය.

**අපෙක්ඛී**. ති-බලන, බලනසුලු.

**අපෙඛා**. ඉ-අපෙක්ෂාව, බලාපොරොත්තුව.

**අපෙත**. ති-යුක්තනොවූ, පහව ගිය

**අපෙති**. ක්‍රි-(අප + ඉ. d. භූ. ගතියං, යාමෙහි + ති) පහවෙයි, දුරුවෙයි.

**අපෙතෙය්‍ය**. ති-පියා කෙරෙහි නිසිලෙස නොපිළිපන්.

**අඵල**. ති-ඵල රහිත, විපාක නැති, ප්‍රයෝජන නැති.

**අපසසිත**. ති-සපශී නොකළ, නොඔබ්බනලද, ගේත්තු නුවූ.

**අඵාසු(ක)** න-අපහසුව, අසනීපය ති-පහසු නොවන.

**අඵෙග්ගුක**. ති-ඵෙග්ගු රහිත, ඵලය නොමැති.

**අබබ**. -d. භූ. පීළායං, පෙළීමෙහි, අබබති, පෙළයි.

**අබබ**. -d. භූ. ගමනෙ, යාමෙහි. අබබති, යෙයි, ගමන් කෙරෙයි.

**අබබ**. -d භූ ගුම්බනෙ, ගෙතීමෙහි, මුවහ කිරීමෙහි අබබති, ගොතයි, මුවහ කරයි.

**අබබ**. පු-අශ්වයා.

**අබබණ**. ති-(අ + වණ)ව්‍රණ රහිත, වණ නැති, තුවාල නැති

**අබබත**. ති-(අ=න + වත) ව්‍රතයක් නැති. "අබබතො අලිකං භණං."

**අබබති**. ක්‍රි-අබබ. d භූ. හිංසායං, පෙළීමෙහි + ති) පෙළයි, හිංසා කෙරෙයි.

**අබබය**. පු-(අ=න + වය) අව්‍යය. ති-වැය නැති.

**අබබහති**. ක්‍රි(ආ + වහ. d. භූ. පාපනෙ, පැමිණී මෙහි, ව=බ + ති) පිටත දමයි, ඉවත දමයි.

**අබබහන**. න-ඉදිරීම, උද්ධරණය කිරීම, ඉදිරියට ඇදීම.

**අබබුද**. පු-එනම් ගණන, බින්දු සියක්ලක්‍ෂය, අඞ්ක 56 කින් යුත් සඞ්ඛ්‍යාව, විනාශකරුණ, අර්බුදනම් රෝගය, පිළිකාව, සොරකම, උපද්‍රවය, පිළිසිඳගත් සත්ත්වයාගේ කලලා වස්ථාවෙන් සතියකට පසු මස් සේදූ දියත්තක් බඳු අවස්ථාවට පැමිණි සත්ත්වයා.

**අබ්බූළ්හ**. ති උද්ධරණය කළ, උදුරණලද.

**අබ්බූළ්හසික**. ති-(අබ්බූළ්හ + එසික) උදුරණ ලද එසිකාස්ථම්භඇති, උදුල තෘෂ්ණාමූලය ඇති.

**අබ්බොකිණ්ණ**. ති-අසම්මිශ්‍ර, අනාකීර්ණ.

**අබ්බොච්ඡින්න**. ති-නොසිඳිනලද, නොකැඩී පවත්නා. එකාබද්ධව පවත්නා, එකට බැඳී පවතින.

**අබ්බොහාරික**. ති-අප්‍රකට, අප්‍රසිද්ධ, ව්‍යවහාර යට නොපැමිණි.

**අබ්‍රහ්ම**. න-(අ=න + බ්‍රහ්ම) අශ්‍රෙෂ්ඨ, උතුම් නොවන.

**අබ්‍රහ්මචරිය** න-අශ්‍රෙෂ්ඨ හැසිරීම, බඹසරට විරුද්ධ හැසිරීම.

**අබ්‍රහ්මචරියා**. ඉ-පහත් හැසිරීම, උතුම් නොවන හැසිරීම, අබ්‍රහ්මචරියනති අසෙට්ඨචරියං. වයංවයසමාපත්තිය, මෛථුන්දම් සෙවනය, යන නම් වලින්ද මෙය හඳුන්වනු ලැබේ. සමුට්ඨාන වශයෙන් කාය චිත්ත සමුට්ඨාන ය ද, වේදනා වශයෙන් සුඛ හා උපෙක්‍ෂා වේදනාව ද, මූල වශයෙන් ලොභය හා ද්වේෂය ද, කර්මයන්ගේ වශයෙන් කාය කර්මය ද මේ සඳහා උපයෝගී වන්නේ ය.

> අබ්‍රහ්මචරියං ඉ පිවජ්ජයෙය්‍ය -
> අඞ්ගාරකාසුං ජලිතංව විඤ්ඤූ,
> අසම්භුනනෙතා පන බ්‍රහ්මචරියං -
> පරස්සදාරං නාතික්කමෙය්‍ය.

**අබ්‍රහ්මඤ්ඤ**. ති-බ්‍රාහ්මණයන්ට හිත නොවන. බ්‍රාහ්මණයන් කෙරෙහි මිථ්‍යාවශයෙන් පිළිපදින.

**අබ්භ**. d. භූ. ගතියං, යාමෙහි, අබ්භති, යෙයි.

**අබ්භ**. පු-පාෂාණය, ගල, කුඩාගල. න-අහස. ති-මේඝය.

**අබ්භක්ඛාති**. ක්‍රි (අභි + ආ + ඛා. d. භූ. පකථනෙ, කීමෙහි + ති) අභ්‍යාඛ්‍යානය කරයි. දෙස් පහළකරයි.

**අබ්භක්ඛාන**. න (අභි + අක්ඛාන) අභූතයෙන් නින්දා කිරීම.

**අබ්භක**. න-මීරන්.

**අබ්භක**. පු-බාලයා, ළදරුවා, පැටියා,

**අබ්භකූට**. න මේඝකූටය, වලාකුළ.

**අබ්භඤ්ජති** ක්‍රි-(අභි + අඤ්ජ. d භූ අඤ්ජනෙ, අනුලෙපයෙහි. අභි=අබ්භ + ති) ගල්වයි.

**අබ්භඤ්ජන**. න- (අභි + අඤ්ජන) ගැල්වීම, ආලේපය.

**අබ්භඤ්ජනක** පු-ආලේප කරන්නා, ගල් වන්නා.

**අබ්භති**. ක්‍රි-(අබ්භ. d. භූ. ගතියං, යාමෙහි + ති) යෙයි.

**අබ්භතික්කන්ත.** පු-(අභි + අතික්කන්ත) ඉකුත් ව ගිය, පසුවී ගිය.

**අබ්භතීත.** ති-ඉකුත්ව ගිය, පසුකළ.

**අබ්භඝට.** පු-අසනය, පැළඳිග.

**අබ්භන්තර.** පු-අභ්‍යන්තරය, ඇතුළත, අබතුර, අටවිසිරියන.

**අබ්භන්තරික**
**අබ්භන්තරිම.** } ති-ඇතුළත පිහිටි, ඇතුළට අයත්.

**අබ්භනුඤ්ඤා.** ඉ අනුදැන්ම.

**අබ්භනුමොදනා** ඉ-අනුමෝදන්වීම.

**අබ්භපුප්ඵ** පු-අභ්‍රපුෂ්ප, හොඹුවගු.

**අබ්භාකුටික.** පු-නොහකුළුවන, වකුටුනොකළ

**අබ්භාගත.** ති-ඉදිරියට පැමිණි, පැමිණි. ආගන්තුක.

**අබ්භාගමන.** න-(අභි + ආ + ගමන) අභිමුඛ ගමන, ඉදිරියට යාම.

**අබ්භාඝාත.** පු-(අභි + ආ + ඝාත) ආඝාතය, වෙසෙසින් නැසීම, වෛර බැඳීම.

**අබ්භාචික්ඛති.** ක්‍රි-ආභි + ආ + චික්ඛ. d. භූ. වාචායං, කීමෙහි + ති) අභ්‍යාඛ්‍යානය කෙරෙයි, දෙස් පහළ කෙරෙයි.

**අබ්භාචික්ඛන.** න-අභ්‍යාඛ්‍යානය, දෙස් පහළකිරීම.

**අබ්භාන.** න-ඇතුළත් කර ගැනීම, එනම් ශාසනික විනයකර්මය. තෙළෙස් සඟ වෙසෙස් අතුරෙන් එකකට පැමිණි භික්ෂුව වත්මානත් පුරා අබ්භාහන කර්මය කළ යුතුයි. "අභි එතබ්බො සම්පටිච්ඡි තබ්බො අබ්භාන කම්ම වසෙන ඔසාරෙතබ්බොති වුත්තං හොති"

**අබ්භාහත.** ති-(අභි + ආ + හත) නසනලද, ගසනලද. සංයුක්ත, එකට යෙදුනු.

**අබ්භාහනන.** න-නැසීම.

**අබ්භාස** පු-ව්‍යාකරණයෙහි විත්‍වය පිළිබඳ පූර්ව ව්‍යඤ්ජනයට කළ සංඥව.

**අබ්භිත.** ති-අබ්භාන කරනලද, ඇතුළත් කරගන්නාලද.

**අබ්භුක්කිරණ.** න-(අභි + උ + කිරණ) වැගිරීම. ඉසීම.

**අබ්භුක්කිරති.** ක්‍රි-(අභි + උ + කිර d. තු. විකිරණෙ, වැගිරීමෙහි + ති) වගුරුවයි, ඉසියි.

**අබ්භුග්ගච්ඡති.** ක්‍රි-(අභි + උ + ගච්ඡති) උස්ව නගියි, උස්ව පහළ වෙයි, උස්ව පැන නගියි.

**අබ්භුග්ගත.** ති-නැගි, උසස්ව පැනනැගි, පහළ වූ.

**අබ්භුජ්ජලති.** ක්‍රි (අභි + උ + ජල d. භූ. දිත්තියං, බැබලීමෙහි + ති) ඉතා බබලයි. දිලිසෙයි.

**අබ්භුජ්ජලන.** න (අභි + උ + ජලන) දිලිසීම, බැබලීම, ප්‍රභාවත් වීම, මන්ත්‍ර පිරුවා මූඛයෙන් ගිනිදැල් පිට කිරීම, මූඛයෙන් ගිනිදැල් පිට කිරීම.

**අබ්භුට්ඨාති.** ක්‍රි-(අභි + උ + ඨා d භූ. ගතිනිවුත්තියං, ගමන් නැවැත්මෙහි + ති) නැගී සිටියි, කුසීතභාවයෙන් හෝ නින්දෙන් නැගී සිටියි.

**අබ්භුට්ඨාන.** න-නැගී සිටීම, කෙළින් සිටීම, කම්මැලිගතියෙන් තොරව විසීම.

**අබ්භුණ්හ.** පු-(අභි + උණ්හ) ඉතා උණුසුම. අධික උෂ්ණය.

**අබ්භුත.** න-ආශ්චර්‍ය්‍යය. පරදූ තැබීම, ඔට්ටු ඇල්ලීම, අබ්භුත නම් නාට්‍යරසය. එනම් ධර්මය.

**අබ්භුතධම්ම.** පු-ආශ්චර්‍ය්‍ය කරුණු ප්‍රකාශ කරණ නවාඞ්ගශාස්තෘ ශාසනයට අයත් එනම් ධර්මාඞ්ගය.

**අබ්භුධුනාති.** ක්‍රි-(අභි + උ + ධූ. d. කි. කම්පනෙ, සැලීමෙහි + ති) වෙසෙසින් කම්පා කෙරෙයි.

**අබ්භුදාහරණ.** න-උදාහරණ දැක්වීම, සාධක දැක්වීම.

**අබ්භුදාහරති.** ක්‍රි-(අභි + උදාහරති) උදාහරණ කෙරෙයි නිදසුන් දක්වයි.

**අබ්භුදීරේති.** ක්‍රි-(අභි + උ + ඊර. d භූ. වාචායං, කීමෙහි + ති) මහත් කොට ශබ්ද කෙරෙයි, ඝොෂණය කෙරෙයි, උසස් කොට කියයි.

**අබ්භුදෙති**. ක්‍රි-(අභි+උදෙති) පහළ වෙයි, උපදියි. උදාවෙයි.

**අබ්භුන්නත**. ති-(අභි+උන්නත) හරිකෙළින් පිහිටි, නොනැමෙන, නොනැමි, උඩුකුරුවූ, ඉතා උස්වූ.

**අබ්භුන්නදති** ක්‍රි-(අභි+උ+නද d භූ සද්දෙ, ශබ්ද කිරීමෙහි+ති) උසස් කොට නාද කරයි, මහත් කොට ශබ්ද කරයි.

**අබ්භුන්නදන**. න-මහත් කොට නාද කිරීම.

**අබ්භුන්නමති**. ක්‍රි-(අභි + උ + නම. d භූ. නමනෙ, නැමීමෙහි+ති) ඉහළට නමයි, ඉහළට උස්සයි.

**අබ්භුන්නමන**. න-නැමීම, ඉහළට එසවීම.

**අබ්භුය්‍යාත**. ති-විරුඬව ගිය, විරුඬව යුදට ගිය.

**අබ්භුය්‍යාති**. ක්‍රි-(අභි+උය්‍යාති) විරුඬව යෙයි.

**අබ්භුස්සහන**. න-ප්‍රොත්සාහය, අධිකවීර්‍ය්‍යය, දැඩි වීර්‍ය්‍යය.

**අබ්භුස්සක්කති**. ක්‍රි-(අභි+උ+සු+කා. d. භූ. සද්දෙ, ශබ්ද කිරීමෙහි+ති) උත්සාහ කරයි. අධිකවීර්‍ය්‍ය කෙරෙයි.

**අබ්භුස්සුක්කන**. න-අධිකවීර්‍ය්‍ය කිරීම, උත්සාහ කිරීම.

**අබ්භුස්සුයක**. පු-(අභි+උස්සුයක) දෙස් පහළ කරන්නා, ඉතා ඊර්ෂ්‍යා කරන්නා.

**අබ්භුස්සෙති**. ක්‍රි-(අභි+උ+සි. d. භූ සයෙ, සයනය කිරීමෙහි+ති) නැගී සිටියි. කෙළින් සිටියි.

**අබ්‍යත්ති**. ඉ නොපැහැදිලි බව, ලක්ෂ්‍යයාගේ එක දෙශයෙක්හි ලක්ෂණය නොපවත්නා බව.

**අබ්‍යය**. න-නිපාත උපසර්ග, ක්ෂය නොවන්නේ අබ්‍යය නම් වේ. චාදිනිපාතයන්ගේ අතෙකත්වය හා අනෙකාර්ථත්වයද නිසා ක්ෂය භාවයට නොපැමිණෙන බැවින් මොවුහු අබ්‍යය නම් වේ.

**අබ්‍යවධාන**. ති-අතරක් නැති, ව්‍යවධානයක් නැති.

**අබ්‍යාපජ්ඣ**. ති-(අ+ව්‍යාපජ්ඣ) ව්‍යාබාධ රහිත, පීඩා රහිත.

**අබ්‍යාපජ්ජන**. න-නොකිපෙන බව.

**අබ්‍යාපාද**. පු-ව්‍යාපාද රහිත. 'ව්‍යාපාද' බලනු.

**අබ්‍යාපාරනය**. පු-චෙෂ්ටා රහිත භාවය පිළිබඳ ක්‍රමය, ප්‍රත්‍යයන්ගෙන් නිපන් ධර්මයන්ගේ සව වශයෙහි නොපවත්නා බව පිළිබඳ නීතිය.

**අබ්‍යාසෙක**. ති-නෙත්සිත් පිනවන. වැගිරීමක් නැති.

**අබ්‍යාසෙකසුඛ**. ති-කෙලෙසුන්ගෙන් අමිශ්‍ර පිරිසිදු අධිචිත්ත සැපය, නිකෙලෙස් සැපය.

**අබ්භොසිත**. ති-නොපැමිණි නිෂ්ඨා ඇති, නො නිමවූ "අබ්භොසිතත්තා හි භවාභවෙසු, පාපානි කම්මානි කරොන්ති මොහා" (ථෙරගාථා-රට්ඨපාලථෙර වත්ථු.)

**අබ්භාස**. න-සමීපය, පුරුද්ද.

**අභ්‍යුපගම**. පු-ගිවිසුම, ඒත්තු ගැනීම.

**අභ්‍යුහන**. න-තර්කය මූලික කොට ඇති විමසීම.

**අබ්භෙති**. ක්‍රි-(අභි + ඉ. d. භූ. ගතියං, යාමෙහි+ති) ඇතුළත් කෙරෙයි. සාපත්තික භික්ෂුවක් ඊට පිළියම් කර විනය නය පරිදි නැවත සඞ්ඝයාට ඇතුළත් කරගණියි.

**අබ්භොකාස**. පු-(අභි + අව + කස. d. භූ. විලෙඛනෙ, ඉරි ඇඳීමෙහි) අභ්‍යවකාශය, නොවැසුනු ස්ථානය, එළිමහන්තැන.

**අබ්භොකාසික**. ති-(අභි=අබ්භ+ඔකාස+ඉක) අභ්‍යවකාශයෙන් යුත්, ආවරණ රහිත ස්ථානයෙහි වූ, එනම් අඞ්ගය රකින.

**අබ්භොකාසිකඞ්ග**. න-(අභි=අබ්භ+ඔකාස+ඉක+අඞ්ග) පියසි ආදියකින් ආවරණයක් නැති එළිමහන්තැනක විසීමෙන් පුරණ ධුතාඞ්ගයක්.

**අබ්භොකිණ්ණ**. ති-ගැවසී ගත්, සමූහයාගෙන් ආකුල වූ.

**අබ්භිර**. ති-බිහිරි නොවූ, එවැනි තැනැත්තා.

**අබ්භොකිරණ**. න-විසිරවීම, ඉසීම. වැක්කිරීම

**අබ්භොකිරති**. ක්‍රි-(අභි+උ+කිර. d. තු විකිරණෙ, විසිරීමෙහි+ති) පැතිරෙයි, විසුරුවයි.

**අබද්ධ.** ති-(අ=න+බද්ධ) නොබෙදනලද, නො බඳිනලද, අසම්බන්ධ.

**අබද්ධමුඛ.** ති-අප්‍රිය වචන ඇති.

**අබන්ධ.** පු-නොබැඳීම. ති-බැඳුම් නැති.

**අබ්බ.** න එනම් සංඛ්‍යාව, අහහ සියක්ලක්ෂය, අඞ්ක 77 කින් යුත් ගණන. අබ්බනම් නිරය.

**අබල.** ති දුර්වල, ශක්තිය නැති, බලහීන, න-දුබල බව.

**අබලා.** ඉ-බල නැත්තී, කාන්තාව, ස්ත්‍රී.

**අබලබල.** පු-මහමෝඩයා,

**අබහුල** ති-බහුල නොවන, ස්වල්ප, මඳ.

**අබහුලීකත.** ති-බහුලීකෘත නොවන, බොහෝ කොට නොකළ, නැවත නැවත නොකරණ ලද.

**අබාධ** ති-නිරවුල්, අනාකුල, අවිසන.

**අබි.** d. භූ සද්දෙ, ශබ්ද කිරීමෙහි, අම්බති, ශබ්ද කෙරෙයි.

**අබීජ.** න-ඇට නැති ගෙඩි, නො පැසුනුගෙඩි

**අබුධ.** පු-අපණ්ඩිතයා.

**අභබ්බ** ති-“න භබ්බාති අභබ්බා” සුදුසු නො වන්නේ අභබ්බ නම් වේ. යමෙක් කර්මාවරණයයි කියනලද පඤ්චානන්තරිය කර්මයෙන් යුක්තවූවාහුද, ක්ලේශාවරණ යයි කියනලද මිථ්‍යාදෘෂ්ටියෙන් යුක්තවූවාහුද, විපාකාවරණ සංඛ්‍යාත අහෙතුක ප්‍රතිසන්ධිවූයෙන් යුක්තවූවාහුද, ශ්‍රද්ධානැත්තාහුද ඡන්දය නැත්තාහුද, ප්‍රඥා විරහිත වූවාහුද, ශ්‍රොතාපත්ති මාර්ගයට පැමිණෙන්නට නොසුදුසු තැනැත්තෝ වූවාහුද යන මේ අය අභබ්බයෝය. “යෙතෙ සත්තා කම්මාවරණෙන සමන්නාගතා, කිලෙසාවරණෙන සමන්නාගතා, විපාකාවරණෙන සමන්නාගතා, අස්සද්ධා, අච්ඡන්දිකා, දුප්පඤ්ඤා, අභබ්බා නියාමං ඔක්කමිතුං කුසලෙසු ධම්මෙසු සම්මත්තං ඉමෙ තෙ සත්තා අභබ්බා.”

**අභබ්බට්ඨාන.** න-උපදින්නට නොසුදුසු තැන්, එබඳු තැන් දස අටකි. නියත විවරණ ලැබූ ලොවුතුරා බෝසත්හු මේ තන්හියන්හි නූපදිත්. 1. ජාත්‍යන්ධ වීම. 2. ජාතිබධිර වීම 3 උමතුවීම, 4. ගොළු බිහිරිවීම. 5. පසල් දනව්හි ඉපදීම. 6. දාසියකගේ කුසෙහි පිළිසිඳ ගැන්ම. 7. නියත මිථ්‍යා දෘෂ්ටික වීම. 8. ලිඞ්ග පරිවර්තනය, 9. පඤ්චානන්තරිය කර්ම කිරීම. 10. වැරදි දෘෂ්ටි ගැනීම. 11. වටුවෙකුට කුඩානොවූද ඇතෙකුට මහත්-නොවූද තිරිසනෙකු වීම. 12. අවීචියෙහි ඉපදීම. 13. ලොකාන්තරිකයෙහි ඉපදීම. 14. මාරයෙකු වීම. 15. කාලකඤ්ජක අසුරයෙකු වීම. 16. අසඤ්ඤ සත්ත්වයෙහි ඉපදීම, 17. සුද්ධාවාසයෙහි ඉපදීම. 18. අරූප භවයෙහි ඉපදීම.

**අභබ්බ.** ති-අභව්‍ය, අයොග්‍ය, නුසුදුසු, නොවටින.

**අභය.** න-බිය නොවීම බබුස්තරණ. ති-බිය නැති.

**අභයා.** ඉ අරළු බිය නැත්තී.

**අභව.** පු-නො වීම. හට නොගැන්ම, නොඉපදීම

**අභාග්‍ය** න-නපුරු දෛවය, දුර්භාග්‍යය.

**අභාව.** පු-නොවීම, විනාශය, අවිද්‍යමානබව, නො ඉපදීම, තර්කශාස්ත්‍රයෙහි දැක්වෙන ප්‍රාගභාව, ප්‍රධ්වංසාභාව, අත්‍යන්තාභාව, අන්‍යොන්‍යාභාව යන චතුර්විධ අභාවය. ද්‍රව්‍යාදි සප්ත පදාර්ථයන්ගෙන් සත්වැනිවූ අභාවය.

**අභාවිත.** ති-නොවඩනාලද, නැවත නැවත පුරුදු නොකළ.

**අභාසන.** න-කථා නොකිරීම, නොබිණීම, තුෂ්ණීම්භාවය.

**අභාසිත** ති-නොකියනලද, නොබිණූ, නොකී

**අභි.** අ-අභිමුඛ, විශිෂ්ටාර්ථ, ඌර්ධ්වක්‍රියා, සාරූප්‍ය, පරච්ඡෙද, වෘද්ධි, පූජා, අධික, කුල, අසත්‍ය, ලක්ෂණ යනාදියෙහි.

**අභි** d. භූ. සද්දෙ, ශබ්ද කිරීමෙහි. අම්භති, ශබ්ද කෙරෙයි.

**අභික්කන්ත.** ති-සුන්දර, විශිෂ්ට, අභිමුඛව ගිය, ඉක්ම ගිය.

**අභික්කම.** ති-අභිමුඛයට යාම, ඉදිරියටයාම

**අභික්කමති.** ක්‍රි-(අභි+කමු. d භූ. පදවික්ඛෙපෙ, යාමෙහි+ති) ඉදිරියට යෙයි.

**අභික්ඛණං,** අ-නිතොර, නිතර, නැවත නැවත.

**අභික්කමණති**. ක්‍රි-(අභි + ඛණු d භූ අවදාරණෙ, සෑරීමෙහි + ති) සාරයි, හාරයි.

**අභික්කමණන**. න-සෑරීම, කෑණීම.

**අභික්ඛ්‍යා** ඉ-නාමය. ශොභාව.

**අභිකඞ්ඛති**. ක්‍රි-(අභි + කඞ්ඛ. d භූ ඉච්ඡායං කැමැත්තෙහි + ති) කැමති වෙයි, රුචි කෙරෙයි, ආශා කෙරෙයි.

**අභිකඞ්ඛනතා**. ඉ-කැමැති වීම, රුචි වීම.

**අභිකඞ්ඛිත** ති-කැමති වනලද, රුචි කරණලද

**අභිකඞ්ඛී** ති-කැමතිවන, රුචි කරණ

**අභිකති** ඉ-අභිකෘති ඡන්දස, පස්විසි අකුර කින් පරිමිත ඡන්දස

**අභිකිණ්ණ**. ති-ආකීණී, ගැවසී ගත්, සමූහය කින් වටකර ගත්.

**අභිකිරති**. ක්‍රි-(අභි + කිර d තු විකිරණෙ, විසිරවීමෙහි + ති) විසුරුවයි, ඉසියි, පතුරුවයි.

**අභිකීළති**. ක්‍රි-(අභි + කීළ d භූ කීළායං, ක්‍රීඩාවෙහි + ති) මහත් කොට ක්‍රීඩා කෙරෙයි. කෙළියි.

**අභිකූජන**. න-නාද කිරීම, ශබ්ද කිරීම.

**අභිකූජිත**. ති-නාද කළ, ශබ්ද කළ

**අභිගජ්ජිත**. ති-ගජිනා කළ, ගොරවනලද.

**අභිගජ්ජන**. න-ගජිනා කිරීම, ගෙරවීම.

**අභිගමනීය**. ති-එළඹියයුතු, පැමිණියයුතු.

**අභිගිජ්ඣති**. ක්‍රි-(අභි + ගිධු. d දි. ගෙධෙ, ගිජුවීමෙහි + ති) ගිජුවෙයි. ලොල් වෙයි.

**අභිගිජ්ඣන**. න-ගිජු වීම, ලොල් වීම, ආසාවීම.

**අභිගීත**. ති-ගායනා කළ, ගීතිකා කළ.

**අභිඝාත**. පු-නැසීම, ගැටීම.

**අභිඝාතන**. න-නැසීම මැරීම, පෑගීම.

**අභිඝාතී**. පු-සතුරා, විරුඬකාරයා.

**අභිඝුට්ඨ**. ති-ඝොෂා කළ, නාද කළ.

**අභිචක්ඛන**. පු--ප්‍රතිවජනන, වැසුනු.

**අභිචජිත**. ති-කැමති වනලද, පැතු.

**අභිචෙතා**. පු-උත්තම චිත්තය.

**අභිචෙතෙති**. ක්‍රි-(අභි + චිත d. චු. සඤ්චෙතනෙ, සිතීමෙහි + ණෙ + ති) සිතයි. චින්තනය කරයි.

**අභිජ්ඣති**. ති-අභිධ්‍යා කරන්නා.

**අභිජ්ඣමාන**. ති-අභිධ්‍යා කරණ.

**අභිජ්ඣා** ඉ-අභිධ්‍යාව, විෂමලොභය, තෘෂ්ණාව අභිජ්ඣායතීති = අභිජ්ඣා. අනුන්ගේ වස්තුව කෙරෙහි පවත්නා තෘෂ්ණාව,

**අභිජ්ඣාකායගන්ථ**. පු-අභිධ්‍යාකාය ග්‍රන්ථය. (ගන්ථෙතීති වෙඨෙයතීති ගන්ථො; නාමකායෙන රූපකායං, පච්චුප්පන්නකායෙනවා ආගාමිකායං ගන්ථෙති දුප්පමුඤ්චං වෙඨෙයතීති කාය ගන්ථො අභිජ්ඣා එව කායගන්ථො අභිජ්ඣා කායගන්ථො. නාමකායය හා රූපකායයද වර්තමානකායය හා අනාගතකායයද නො මිදිය හැකි සේ වෙළන හෙයින් අභිධ්‍යාවම අභිධ්‍යාකායග්‍රන්ථ නම් වේ.)

**අභිජ්ඣායති**. ක්‍රි (අභි + ඣෙ. d. භූ. චින්තායං, සිතීමෙහි + ති) විෂම ලොභ සහගත සිතිවිලි සිතයි, සිතයි.

**අභිජ්ඣාලු**. ති-(අභිජ්ඣා + ආලු) අභිජ්ඣා බහුල කොට ඇති.

**අභිජ්ඣිත**. ති-අභිධ්‍යා කළ.

**අභිජන**. පු-වංශය, ජාතිය, භූමිය, ජන්ම භූමිය.

**අභිජනෙති**. ක්‍රි-(අභි + ජන. d. දි. ජනනෙ, ඉපදීමෙහි + ති) උපදවයි, පහළ කෙරෙයි.

**අභිජප්පති**. ක්‍රි-(අභි + ජප්ප d. භූ. වාචෙ, කීමෙහි + ති) කථා කරයි, ඉල්වයි.

**අභිජප්පන**. න-පැතීම, ඉල්ලීම, කැමැති වීම, කථා කිරීම.

**අභිජලති**. ක්‍රි-(අභි + ජල. d. භූ. දිත්තියං, දිලිසීමෙහි + ති) දිලිසෙයි. බබලයි.

**අභිජවති**. ක්‍රි-(අභි + ජු. d. භූ. ගතියං, ශීඝ්‍ර ගමනයෙහි + ති) දුවයි.

**අභිජාත**. ති-ප්‍රභූ, කුලීන, මහාකුල ඇති, මවුපිය දෙකුලයෙන් පිරිසිදු ව උපන්.

**අභිජාති**. ති-කුලවත්, වංශවත්. ඉ-ශ්‍රෙෂ්ඨ කුලයක ඉපදීම.

(2779)

**අභිජාතික.** ති-කුලවත්, වංශවත්.

**අභිජනන.** න-සිහිකිරීම, දැනීම, අනුබෝධය, අනුචින්තනය.

**අභිජානාති.** ක්‍රි-(අභි+ඤා. d. කි. අවබෝධෙ. අවබෝධ කිරීමෙහි, ඤා=ජා+නා+ති) දනී, මනාව දනී.

**අභිජායති.** ක්‍රි-(අභි+ජනී. d. දි. පාතුභාවෙ, පහළ වීමෙහි+ය+ති) හටගණී, උපදී, පහළ වෙයි.

**අභිජිගිංසති.** ක්‍රි-(අභි+හර. d. භූ. හරණෙ, හැරීමෙහි, 'හ' හට 'ජ'-ඉ, 'හර'ට 'ගිං'+ස+ති) දිනනු කැමැති වෙයි. ලොභී වෙයි.

**අභිජිඝච්ඡති.** ක්‍රි-(අභි+ඝස. d. භූ. අදනෙ. කෑමෙහි, 'ඝ' හට විතත ඝ=ඛ=ජ- ඉ. ස=ච. ඡ+ති) කනු කැමැති වෙයි.

**අභිජෙති.** ක්‍රි-(අභි+ජි. d. භූ. ජයෙ, දිනීමෙහි+ති) දිනයි. ජය ගණී.

**අභිජොතෙති.** ක්‍රි-(අභි+ජුත. d. භූ. දිත්තියං, බැබලීමෙහි+ති) බබුලුවයි. පිරිසිදු කෙරෙයි.

**අභිඤ්ඤ.** ති-දක්ෂ, නිපුණ.

**අභිඤ්ඤා.** ඉ-දැනීම, අවබෝධය, පඤ්චාභිඤ්ඤා සහ ඡළභිඤ්ඤා. "විසෙසෙන ජානාතීති අභිඤ්ඤා." විශෙෂයෙන් දනීනුයි අභිඤ්ඤා නම් වේ.

අනාගතංස ඤාණං ච යථා කම්මූපගම්පි ච, පඤ්ච ඉද්ධිවිධාදීනි සත්තාභිඤ්ඤා ඉමා පන.

**අභිඤ්ඤාත.** ති-ප්‍රසිද්ධ, ප්‍රකට, අභිඤ්ඤාතා අභිඤ්ඤාතා සක්‍ය කුමාරා."

**අභිඤ්ඤාණ.** න-සලකුණ, චිහ්නය.

**අභිඤ්ඤෙය්‍ය.** ති-දැනගතයුතු, අවබෝධ කටයුතු.

**අභිඤ්ඤෙය්‍යධම්ම.** පු-අනිත්‍යාදි වශයෙන් විශිෂ්ටාකාරයෙන් දැන ගතයුතු ධම්.

**අභිණ්හං.** අ-නැවත නැවත, නිතොර.

**අභිණ්හසො.** අ-නිතොර.

**අභිත්ථනෙති.** ක්‍රි-(අභි+ථන d. චු. දෙවසද්දෙ මෙඝශබ්දයෙහි+ති) ගුගුරයි, ගොරවයි, කම්පා කරයි.

**අභිත්ථරති.** ක්‍රි-(අභි+ථර. d. භූ. සන්ථරණෙ. ඇතිරීමෙහි+ති) අතුරයි, එලයි, ඉතා වෙග වත් වෙයි.

**අභිත්ථවති.** ක්‍රි (අභි+ථු d. භූ ථුතියං, සතුති යෙහි+උ=ඔ=අව+ති) සතුති කරයි, ප්‍රශංසා කරයි.

**අභිත්ථවන.** න-සතුති කිරීම, පැසසීම.

**අභිත්ථවිත.** ති-සතුති කළ, පසසනලද.

**අභිත්ථුනාති.** ක්‍රි-(අභි+ථු. d. කි. ථුතියං, සතුති කිරීමෙහි+නා+ති) පසසයි. සතුති කරයි.

**අභිත්ථුත.** ති-සතුති කළ, පසසනලද.

**අභිතත්ත.** ති-තැවුනු, රත් කළ, ඉතා තැවුනු.

**අභිතාප.** පු-අධිකතාපය, අධිකඋෂ්ණය, ඉතා තැවීම.

**අභිතාලිත.** ති-හාත්පසින් තළතලද ගසන ලද.

**අභිතිට්ඨති.** ක්‍රි-(අභි+ඨා. d. භූ ගතියං, යාමෙහි, ඨා=තිට්ඨ+ති) සිටියි, ස්ථිර ව සිටියි.

**අභිතො.** අ-හාත්පස, සමීප, අභිමුඛ, උභය භාගාදි අර්ථයන්හි.

**අභිතොස.** පු-මහත්සතුට.

**අභිතොසෙති.** ක්‍රි-(අභි+තුස. d. දි. තොසෙ, සතුටෙහි+ති) සතුටු කෙරෙයි, සන්තොෂ කෙරෙයි.

**අභිදස්සන** න-මනා දර්ශනය, යහපත් දැකීම.

**අභිදොස.** පු-රාත්‍රිමුඛය, ඊයේ සවස. "අභි දොසකාලකතො භන්තෙ! ආලාරො කාලාමො."

**අභිධම්ම.** පු-අභිධර්මය, උත්තමධර්මය. චිත්ත චෛතසික රූප නිර්වාණ යන චතුර්විධ පරමාර්ථයන් පිළිබඳ ධර්මය. අභි විසිට්ඨො ධම්මො=අභිධම්මො. අතිරෙක වූ විශිෂ්ඨ ධර්මය අභිධර්මයයි. සූත්‍රාන්තයේදී ස්කන්ධ ධාතු, ආයතනාදිය එක දෙශනාකින්ම බෙදා ඇත. එහෙත් අභිධර්මයේදී ඔවුහු බෙදිය හැකි හැම ආකාරයකින්ම බෙදා ත්බේ. ඒ නිසා විශිෂ්ඨ ධර්මය නම් වේ.

**අභිධම්මික.** පු-ආභිධර්මිකයා, අභිධර්මය දත හැදෑරන්නා. අභිධර්මය දත් තැනැත්තා.

**අභිධමති.** ක්‍රි (අභි + ධම d භූ. ධමනෙ, ගිනි පිඹීමෙහි + ති) මල හරණ පිණිස උදුනෙහි තවයි, පිඹියි.

**අභිධමන.** න-තැවීම, රත් කිරීම, පිඹීම.

**අභිධාන.** න-නාමය, කීම, සංඥා නාමය.

**අභිධානමත්තක** න-අභිධාන මාත්‍රය, කීම පමණ.

**අභිධාරණ** න-දැරීම, ඉසිලීම

**අභිධාරෙති.** ක්‍රි-(අභි + ධර. d චු. ධාරණෙ, දැරීමෙහි + ණෙ + ති) දරයි, උසුලයි.

**අභිධාවති.** ක්‍රි-(අභි + ධාවු. d. භූ. ගමනවුඩ්ඪිම්හි, + ති) දුවයි.

**අභිධාවන** න-දිවීම, වෙගයෙන් දිවීම.

**අභිධාවී.** ති-දුවන, දුවනසුලු.

**අභිධෙය්‍ය.** ති-කියයුතු. න-නම.

**අභිධෙය්‍යලිඞ්ග** පු-වාච්‍යවන අර්ථයට සමානවන ලිඞ්ගය. සමාස-තද්ධිත-කිතක වූ පදයකින් පුරුෂයෙක් වාච්‍යවේනම්ද ස්ත්‍රියක් වාච්‍ය වේනම්ද, නපුංසකයෙක් වාච්‍යවේනම්ද එය අභිධෙය්‍ය ලිඞ්ග නම්.

**අභින්න.** ති-නොබිඳුනු, වෙනස් නොවූ, එකාබද්ධ ව පැවති.

**අභිනත.** ති-නැමුනු, යටත් වූ.

**අභිනදති.** ක්‍රි-(අභි + නද. d. භූ. අබ්‍යත්තෙ සද්දෙ, නො වියත් ශබ්දයෙහි + ති) නාද කරයි, මහාශබ්ද කරයි.

**අභිනදිත.** ති-නාද කළ, ශබ්ද කළ.

**අභිනන්දති.** ක්‍රි-(අභි + නන්ද. d. භූ. සමෙතාසෙ, සතුටින් පිළිගැණීමෙහි, සතුටෙහි + ති) සතුටු වෙයි.

**අභිනන්දන.** න-සතුට, සන්තොෂය, සතුටින් පිළිගැණීම මෙය පස් ආකාරයි, 1. රූප 2 සද්ද, 3. ගන්ධ, 4 රස, 5. ඵස්ස යන මේවාට අභිනන්දන යයි කියත්

**අභිනන්දිත.** ති-සතුටු කරණලද, පිළිගත්.

**අභිනන්දී.** ති-සතුටුවන සුලු. පිළිගන්නා,

**අභිනමති.** ක්‍රි-(අභි + නම. d. භූ. නමනෙ, නැමීමෙහි + ති) නමයි, නමස්කාර කරයි, නැමෙයි.

**අභිනමන.** න-නැමීම, නැමදීම.

**අභිනය.** පු-ශාස්ත්‍රාග්‍රහණාදි ආකාර දැක්වීම, සරඹ කිරීම, ඉඟිකිරීම.

**අභිනව** ති-නවීන, අළුත්, පුරාණ නොවන.

**අභිනාදිත.** ති-නාද කළ, ශබ්ද කළ, ඝොෂ කළ.

**අභිනික්ඛමති.** ක්‍රි-(අභි + නි + කමු d. භූ. පදවික්ඛෙපෙ, යාමෙහි + ති) අභිනිෂ්ක්‍රමණය කරයි, නික්මෙයි.

**අභිනික්ඛමන.** න-අභිනිෂ්ක්‍රමණය, ගිහිගෙයින් ඉවත්ව තපසට යාම.

**අභිනික්ඛිපති.** ක්‍රි-(අභි + නි + ඛිප. d. භූ. ජඩ්ඩනෙ, දැමීමෙහි + ති) බහා තබයි, ඉවත තබයි.

**අභිනික්ඛිපන.** න-තැබීම, බහා තැබීම, ගෙණ ගිය බරක් තැබීම.

**අභිනිකූජන.** න-ශබ්ද කිරීම, නාද කිරීම.

**අභිනිකූජිත.** ති-නාද කළ, ශබ්ද කළ.

**අභිනිග්ගණ්හාති.** ක්‍රි-(අභි + නි + ගහ. d භූ. උපාදනෙ, ගැණීමෙහි, ධාතුවන්තලොප + ණ්හා + ති) නිග්‍රහ කරයි, ගැරීම කරයි.

**අභිනිග්ගණ්හන** න-පෙළීම, ගැරීම, නින්දා කිරීම.

**අභිනින්නමති.** ක්‍රි-(අභි + නි + නමු. d. භූ. නමනෙ, නැමීමෙහි + ති) නමයි, අවනත කෙරෙයි.

**අභිනින්නාමන.** න-නැමීම, අවනත කිරීම.

**අභිනින්නාමෙති.** ක්‍රි-(අභි + නි + නමු d. භූ නමනෙ, නැමීමෙහි + ණෙ + ති) නමයි. එළවයි. පමුණුවයි.

**අභිනිසජ්ජති.** ක්‍රි-(අභි + නි + පද. d. භූ. ගතියං, යාමෙහි + ති) හොවී, සයනය කරයි, නිදයි

**අභිනිප්පසාද** පු මනා ප්‍රසාදය, හොඳ පැහැදීම.

**අභිප්පසාදන** න-මනා පැහැදීම.

**අභිනිපජ්ජන.** න-නිදීම, සයනය.

(2852)

**අභිනිපතති**. ක්‍රි-(අභි + නි + පත. d භූ. ගමනෙ, යාමෙහි + ති) හෙයි, වැටෙයි, පතිත වෙයි.

**අභිනිපතන**. න-වැටීම, හීම, පතනය.

**අභිනිපාත**. න-තුවාල කිරීම, ඇනීම, නැමීම, පහතට හෙළීම.

**අභිනිපාති**. ති අභිනිපාතනය කරණ.

**අභිනිපාතෙති**. ක්‍රි-(අභි + නි + පත. d. චු. ගතිමහි, යාමෙහි + ණෙ + ති) හෙළයි, තුවාල කරයි, අනියි.

**අභිනිපුණ**. ති-දක්ෂ, ප්‍රගුණ, පණ්ඩිත.

**අභිනිප්පීළන**. න-පෙළීම, මිරිකීම, මැඩීම.

**අභිනිප්පීළෙති**. ක්‍රි (අභි + නි + පීළ. d. චු. පීඩායං, පෙළීමෙහි + ණෙ + ති) පෙළයි, මිරි-කයි, මඩියි.

**අභිනිප්ඵජ්ජති**. ක්‍රි - නිපදියි. හටගණියි. (‘නිප්ඵජ්ජති’ බලනු.)

**අභිනිප්ඵජ්ජන**. න-නිපදීම. හටගැණීම.

**අභිනිප්ඵත්ති**. ඉ-අභිනිෂ්පත්තිය, හටගැන්ම, උත්පත්තිය.

**අභිනිප්ඵන්න**. ති-නිපන්, හටගත්.

**අභිනිප්ඵාදන**. න-නිෂ්පාදනය, සම්පාදනය.

**අභිනිප්ඵාදිත**. ති-සම්පාදනය කළ, නිපදවන ලද

**අභිනිප්ඵාදෙති**. ක්‍රි-(අභි + නි + පද. d. චු. ගතියං, යාමෙහි + ණෙ + ති) නිපදවයි.

**අභිනිබ්බත්ත**. ති-උපන්, හටගත්.

**අභිනිබ්බත්තති**. ක්‍රි (අභි + නි + වත්ත හෝ වතු. d. භූ. වත්තනෙ, ‘ව’ හට ‘බ’ ආදෙශ + ති) උපදියි.

**අභිනිබ්බත්ති**. ඉ-පුනරුත්පත්තිය, ඉපදීම.

**අභිනිබ්බත්තිත**. ති-උපදවනලද.

**අභිනිබ්බිජ්ජති**. ක්‍රි-(අභි + නි + විද. d. රු. තුදාද්‍යං, සතුටෙහි + ති) කලකිරෙයි, උකටලී වෙයි.

**අභිනිබ්බුත**. ති-නිවුනු.

**අභිනිබ්බුති**. ඉ-(අභි + නි + වුති) තෘෂ්ණාවෙන් නික්ම යාම, නිවණ.

**අභිනිම්මිත**. ති-මවනලද, සෑදනලද.

**අභිනිම්මිනාති**. ක්‍රි-(අභි + නි + මා. d. කි. පරිමාණෙ, ප්‍රමාණ කිරීමෙහි + නා + ති) මවයි, සාදයි.

**අභිනිරොපන**. න-නැගීම, පැවරීම.

**අභිනිරොපෙති**. ක්‍රි-(අභි + නි + රුප. d. චු රොපණාදිසු, රොපණය කිරීම් ආදියෙහි + ණෙ + ති) නගයි, ආරූඪ කෙරෙයි.

**අභිනිවජ්ජන**. න-දුරු කිරීම, බැහැර කිරීම.

**අභිනිවජ්ජිත** ති-දුරු කළ, බැහැර කළ, ඉවත් කළ.

**අභිනිවජ්ජෙති**. ක්‍රි-(අභි + නි + වජ්ජ. d. චු. වජ්ජනෙ, හැරීමෙහි + ති) දුරු කෙරෙයි, බැහැර කෙරෙයි.

**අභිනිවිට්ඨ**. ති-(අභි + නි + විස. d. තෘ=ට්ඨ.) අන්තර්ගත වූ, ඇතුළත් වූ.

**අභිනිවිසති**. ක්‍රි-(අභි + නි + විස. d. භූ පවෙසනෙ, ඇතුළත් වීමෙහි + ති) අන්තර්ගත වෙයි, ඇතුළත් වෙයි.

**අභිනිවෙස**. පු-ඇතුළත් වීම, ප්‍රවෙශය.

**අභිනිසීදති**. ක්‍රි-(අභි + නි + සද. d. භූ. ගත්‍යව සාදනෙ, ගමන් වැළැක්මෙහි + ති) ගමන් වළක්වයි, හිඳියි, ඉඳියි.

**අභිනිසීදන**. න-හිඳීම, ඉඳීම.

**අභිනිස්සට**. ති-(අභි + නි + සට) දුර ලනලද, හරණලද, නික්මුනු.

**අභිනිහත** ති-(අභි + නි + හත) තසන ලද, පහර දෙනලද.

**අභිනීත**. ති-එළවන ලද, පමුණුවන ලද.

**අභිනීල**. න-පිරිසිදු නීලවර්ණය. ති-ඉතානිල්.

**අභිනීහරති**. ක්‍රි-(අභි + නි + හර. d. භූ. හරණෙ, හැරීමෙහි + ති) ප්‍රාර්ථනා කරයි, බැහැර කරයි, එළවයි, පිහිටුවයි.

**අභිනීහාර**. පු-ප්‍රාර්ථනාව, ප්‍රණිධිය. “අභිනිහාරෙති මූලපණිධානස්සෙතං අධිවචනං,” අභිනීහාර යනු මූලප්‍රණිධියට නමකි, බුදුවීම පිණිස සිත දැඩි කොට ගෙණ බුදුවියරණ නොලබා මෙයින් නො නැගිටින්නෙමියි අධිෂ්ඨාන කොට සයනය කිරීම.

**අභිපත්ථනා**. ඉ- ශුභ ප්‍රාර්ථනාව, මනා ප්‍රාර්ථනාව.

**අභිපත්ථිත**. ති-පතනලද, අධික කොට ප්‍රාර්ථනා කළ.

**අභිපත්ථෙති**. ක්‍රි-(අභි + පත්ථ. d. චු. යාචනායං, පැතීමෙහි, ණෙ + ති) පතයි.

**අභිපස්සති**. ක්‍රි-(අභි + දිස + d භූ. පෙක්ඛණෙ, බැලීමෙහි. දිස=පස්ස + ති) නිරීක්ෂණය කරයි, බලයි දකියි.

**අභිපස්සන**. න-දැකීම, බැලීම.

**අභිපාතෙති**. ක්‍රි-(අභි + පත. d. චු. ගමනෙ, යාමෙහි + ණෙ + ති) හෙළයි, පතනය කරයි

**අභිපාරූත**. ති-පොරොවනලද.

**අභිපාලන**. න-මනා පාලනය, ආරක්ෂාව.

**අභිපාලෙති**. ක්‍රි-(අභි + පාල. d. චු. රක්ඛණෙ, රැකීමෙහි + ණෙ + ති) පාලනය කරයි, ආරක්ෂා කරයි.

**අභිපීළිත**. ති-පෙළනලද, මිරිකනලද, හාත් පසින් පොඩිකළ.

**අභිපීළෙති**. ක්‍රි-(අභි + පීළ d. චු. පීඩනෙ, පෙළීමෙහි + ණෙ + ති) පෙළයි, පීඩා කරයි.

**අභිපුච්ඡති** ක්‍රි-(අභි + පුච්ඡ. d. භූ. පුච්ඡනෙ, විචාරීමෙහි + ති) මනාව විචාරයි, මොනවට පිළිවිසී.

**අභිපුච්ඡන**. න-විචාරීම, මනාව විචාරීම.

**අභිපූරෙති**. ක්‍රි-(අභි + පූර. d චු ආප්‍යායනෙ, ප්‍රීතියෙහි හෝ තෘප්තියෙහි + ණෙ + ති) ප්‍රීත වෙයි, පූරවයි.

**අභිභව**. පු-අභිභවනය කිරීම, මැඩ පැවැත්වීම, යටත් කිරීම.

**අභිභවති**. ක්‍රි-(අභි + භූ. d. භූ. සත්තායං, වීමෙහි, ඌ=ඕ=අව + ති) මඩියි, යටත් කෙරෙයි, මිරිකයි.

**අභිභවන** න-මැඩ පැවැත්වීම, යටත් කර ගැණීම.

**අභිභවනීය**. ති-මැඩ පැවැත්වියයුතු, මැඩිය හැකි.

**අභිභායතන**. න-අෂ්ටවිධ වූ අභිභායතන, ආයතන සඞ්ඛ්‍යාත කසිණාරම්මණයන් අබිබවා සමවදිනු ලබන ධ්‍යාන. (ඤාණුත්තරික යොගාවචර තෙමේ "මේ අරමුණෙහි සමවැදියයුතු කුමක් නම් ඇද්ද? සිත එකඟකර ගැණීමේ බරක් මට නොමැත" යනු සිතා ඒ අරමුණු නො ගෙණ ධ්‍යානයන්ට සමවදියි. නිමිත්තොත්පාදය සමගම අර්පණාව උපදවයි. එසේ උපදවනු ලැබූ ධ්‍යානයෝ **අභිභායතනයෝ** ය යි කියනු ලැබෙත්.) ප්‍රතිභාග නිමිත්තොත්පත්තීන් මතු දෙවන තුන්වන ජවන වීථියෙහි හෝ සතරවන පස්වන වීථියෙහි හෝ උපදවන ලද ධ්‍යාන අට. (**මහානිද්දෙසට්ඨකථා** 7. සූත්‍රයේ අටුවාව හා **අට්ඨසාලිනී** අභිභායතනකථාවද **විසුද්ධිමග්ග** සෙසකසිණනිද්දෙසයද බලනු )

**අභිභාසන**. න-සම්‍යක්කථාව, මනා කථාව.

**අභිභූ**. පු-මැඩපවත්වන්නා බුදුරජ, බ්‍රහ්මයා.

**අභිභූත**. ති-මඩනාලද, යටත්කළ.

**අභිභූයති**. ක්‍රි-(අභි + භූ. d. භූ. සත්තායං, වීමෙහි + ය + ති) මැඩ පවත්වනු ලැබෙයි.

**අභිමණ්ඩිත**. ති-මනා ව සැරසුනු.

**අභිමත**. ති-කැමැති වූ, රුස්වූ.

**අභිමද්දති**. ක්‍රි-(අභි + මද. d. භූ. මද්දනෙ, මැඩීමෙහි + ති) මඩියි, මිරිකයි, පොඩි කරයි.

**අභිමද්දන**. න-මැඩීම, පෙළීම.

**අභිමද්දිත**. ති-මඩනාලද, මිරිකනලද.

**අභිමන්ථති**. ක්‍රි-(අභි + මන්ථ d භූ විලොළනෙ, කැළඹීමෙහි + ති) කළඹයි, මත් ගායි.

**අභිමනාප**. පු-අභිලාෂය, කැමැත්ත.

**අභිමාන**. පු-අධික මානය, ආඩම්බරය, මානය

**අභිමුඛ**. පු-සම්මුඛය, ඉදිරිය.

**අභියාචති**. ක්‍රි-(අභි + යාච. d. භූ. යාචනෙ, යාච්ඤාවෙහි + ති) ඉල්වයි. යාච්ඤා කෙරෙයි.

**අභියාචන**. න-ඉල්ලීම, යැදීම.

**අභියාචිත**. ති-ඉල්ලන ලද, ඉල්ලූ.

**අභියාති**. ක්‍රි-(අභි + යා. d-භූ. ගතියං, යාමෙහි + ති) ඉදිරියට යෙයි, අභිමුඛයට යයි, යෙයි.

**අභියුජ්ඣති**. ක්‍රි-(අභි + යුධ d. දි. සම්පහාරෙ, යුධ කිරීමෙහි + ති) යුධ කෙරෙයි, ඇත කොට ගණී, පෙරමුණෙහි යුද කෙරෙයි.

**අභියුඤ්ජති**. ක්‍රි-(අභි+යුජ. d. රු. යොගෙ, යෙදීමෙහි+ති) යෙදෙයි. යොදයි.

**අභියුඤ්ජන**. න-යෙදීම.

**අභියුඤ්ජිත**. ති-යොදනලද. අභියොග කළ

**අභියොග**. පු-ප්‍රයොගය, යෙදීම, යුධයට කැඳවීම, නඩු කීම.

**අභියොගී**. පු-යොදන්නා.

**අභියොබ්බන**. න-අභිනව යෞවනය, නව යොවුන.

**අභිරක්ඛති**. ක්‍රි-(අභි+රක්ඛ. d. භූ. රක්ඛණෙ, රැකීමෙහි+ති) ආරක්‍ෂා කෙරෙයි, රකියි.

**අභිරත්ත**. ති-රත් වූ, රාගයෙන් රත් වූ.

**අභිරත**. ති-ඇලුනු, ඉතා ඇලුනු.

**අභිරති**. ඉ-කාමතෘෂ්ණාව, අතිශයින් ඇලීම.

**අභිරධ**. ති-ඇලුනු.

**අභිරධි**. ඉ-අභිරතිය.

**අභිරක්ඛණ**. න-රැකීම, සුරක්ෂිත කිරීම.

**අභිරමති**. ක්‍රි-(අභි+රමු. d. භූ. කීළායං, ක්‍රීඩාවෙහි+ති) ඇලෙයි, අභිරති කෙරෙයි.

**අභිරමණ**. න-සිත් ඇලවීම, ආශා කිරීම.

**අභිරවති**. ක්‍රි-(අභි+රු. d. භූ. සද්දෙ, ශබ්ද යෙහි. උ=ඔ=අව+ති) ශබ්ද කෙරෙයි.

**අභිරාධිත**. ති-සතුටු කරණලද.

**අභිරාධෙති**. ක්‍රි-(අභි+රාධ. d. භූ. හිංසායං සංරාධෙ, පෙළීමෙහි හා සිත් ගැණීමෙහි, අ=එ+ති) සතුටු කෙරෙයි.

**අභිරාම**. ති-මනරම්, සුන්දර, සිත් අලවන.

**අභිරුචි**. ඉ-ආශාව, රිස්ස.

**අභිරුචිත**. ති-කැමති වන ලද, රුචි කරණ ලද.

**අභිරුචිර**. ති-ඉතා මනාප, ඉතා සිත්කලු.

**අභිරුහණ**. න-නැඟීම්, ආරූඪ වීම.

**අභිරූප**. ති විශිෂ්ටරූපයක් ඇති, මනාරූ ඇති

**අභිරුහති**. ක්‍රි-(අභි+රුහ d. භූ. පාතුභාවෙ, පහළ වීමෙහි+ති) ආරූඪ වෙයි, නගී.

**අභිරූළ්හ**. ති-ආරූඪ වූ, නැගුනු.

**අභිරොචති**. ක්‍රි-(අභි+රුච. d. භූ. දිත්තියං, බැබලීමෙහි+ති) බබලයි, දිලිසෙයි.

**අභිරොපණ**. න-නැංවීම, සිත යොමු කිරීම. බීජ රොපණය.

**අභිරොපිත**. ති-මනාව රොපණය කළ.

**අභිරොපෙති**. ක්‍රි-(අභි+රුප d. චු. රොපණෙ, රොපණය කිරීමෙහි+ණෙ+ති) බීජාදිය ඉඳුවයි.

**අභිරොහ**. පු-නැඟීම, මණ්ඩනාදිවසයෙන් ශරීරය අලඞ්කාර කිරීම.

**අභිලක්ඛිත**. ති-සලකුණු කළ, නියමිත.

**අභිලඞ්ඝති**. ක්‍රි-(අභි+ලඞ්ඝ. d. භූ. ලඞ්ඝනෙ, පැන යාමෙහි+ති (පැන යෙයි, නගියි.

**අභිලම්බති**. ක්‍රි-(අභි+ලබි d. භූ. අවසංසනෙ, එල්ලීමෙහි+ති) එල්බෙයි, එල්ලෙයි.

**අභිලම්බිත**. ති-එල්වනලද.

**අභිලාප**. පු-වචනය. කීම, ආක්‍රොශය.

**අභිලාව**. පු-කැපීම, ගොයම් ආදිය කැපීම.

**අභිලාස**. පු-ආසාව, තෘෂ්ණාව, කැමැත්ත.

**අභිලිම්පති**. ක්‍රි-(අභි+ලිප d. රු. ලිම්පනෙ, ගෑමෙහි+=ම+ති) ආලෙප කරයි.

**අභිලෙඛති**. ක්‍රි (අභි+ලිඛ d. භූ. ලෙඛෙ, ලිවීමෙහි+ති) ලියයි, ඉරි ගසයි.

**අභිලෙඛන**. න-ලිවීම, ඉරි ගැසීම.

**අභිලෙප**. පු-ආලෙපය, තැවරීම, ගෑම.

**අභිලෙපන**. න-ආලෙපනය.

**අභිවඤ්චන**. න-වඤ්චා කිරීම, රැවටීම.

**අභිවට්ඨ**. න-වැස්ස. ති-තෙත් කරණලද.

**අභිවඩ්ඪති**. ක්‍රි-(අභි+වඩ්ඪ. d භූ. වඩ්ඪනෙ, වැඩීමෙහි+ති) ඉතා වැඩෙයි, දියුණු වෙයි.

**අභිවඩ්ඪන**. න-වැඩීම, අභිවර්ධනය

**අභිවඩ්ඪි**. ඉ-අභිවෘද්ධිය, වැඩීම.

**අභිවණ්ණිත**. ති-වර්ණනා කරණලද, පසසන ලද

**අභිවණ්ණෙති**. ක්‍රි-(අභි+වණ්ණ. d. චු. සංවණ්ණනෙ, වර්ණනා කිරීමෙහි+ණෙ+ති) වර්ණනා කෙරෙයි, පසසයි, සතුති කෙරෙයි.

**අභිවදති.** ක්‍රි-(අභි + වද. d. භූ. වචනෙ, කිමෙහි + ති) කියයි, ප්‍රකාශ කරයි.

**අභිවන්‍දති.** ක්‍රි (අභි + වන්‍ද d. භූ. අභිවාදනෙ වැඳීමෙහි + ති) වඳියි, නමස්කාර කෙරෙයි.

**අභිවන්‍දන.** න-වැඳීම, නැමදීම, භක්තියෙන් වැඳීම.

**අභිවස්සක.** පු-වෂ්ිා කරන්නා, මෙඝය, වලාකුළ.

**අභිවස්සති.** ක්‍රි-(අභි + වස්ස. d. භූ. සෙචනෙ, තෙමීමෙහි + ති) අධික ව වසී, වසී.

**අභිවාදන.** න-මනාකොට වැඳීම.

**අභිවාදිත.** ති-වඳිනලද, නමස්කාර කළ.

**අභිවාදෙති.** ක්‍රි-(අභි + වදි d. චු. අභිවාදනෙ, වැඳීමෙහි + ණෙ + ති) මනාකොට වඳියි. වන්දවයි.

**අභිවායති.** ක්‍රි-(අභි + වා. d. දි ගතිබන්‍ධනෙසු. යාමෙහි, හැමීමෙහි + ය + ති) හුලං හමයි.

**අභිවාරෙති.** ක්‍රි-(අභි + වර. d. චු ආවරණෙ වැළකීමෙහි + ණෙ + ති) වළකයි, ආවරණය කෙරෙයි.

**අභිවාහෙති** ක්‍රි-(අභි + වහ. d. භූ. පාපණෙ, පැමිණීමෙහි + ණෙ + ති.) ඉවත් කෙරෙයි විනාශ කෙරෙයි, පාකරයි.

**අභිවිජයති.** ක්‍රි-(අභි + වි + ජි. d. භූ. ජයෙ, දිනීමෙහි + ති) වෙසෙසින් දිනයි, ජය ගණියි.

**අභිවිජානාති.** ක්‍රි-(අභි + වි + ඤා. d. කි. අව බොධනෙ, අවබොධ කිරීමෙහි. ධාතුහට 'ජා' ආදෙස + නා + ති) දිනයි.

**අභිවිජායති.** ක්‍රි-(අභි + වි + ජනි. d දි. පාතු භාවෙ, පහළ වීමෙහි + ති) ප්‍රසුත කරයි, උපදියි.

**අභිවිජිනාති.** ක්‍රි-(අභි + වි + ජි d. කි. ජයෙ, දිනීමෙහි + ති) දිනයි, ජයගණී.

**අභිවිඤ්ඤාපන.** න-සංඥපනය, දැන්වීම, හැඟවීම

**අභිවිඤ්ඤාපෙති.** ක්‍රි-(අභි + වි + ඤප d. චු තොසෙ, සතුටු කිරීමෙහි + ණෙ + ති) මනාව හඟවයි, දන්වයි.

**අභිවිතරති** ක්‍රි-(අභි + වි + තර. d භූ පලවන-තරණෙසු, පීනීමය-එතරවීමය යන මෙහි + අ + ති) දුරු කෙරෙයි, දෙයි.

**අභිවිධි.** ඉ-ගණුලබන සීමාව, සීමාව ඇතුළත් කර ගැණීම ඇති පිරිසිදීම.

**අභිවින්‍දති.** ක්‍රි-(අභි + විද. d. රු. ලාභෙ, ලාභයෙහි + ති) ලබයි, විඳියි ප්‍රයොජනය ගණී, වලඳයි.

**අභිවිනය** පු-උත්තම විනය, කායාදිවාරත්‍රය හික්මවා ගැණීම, ආපත්ති ආදිය ප්‍රකාශිත විනය.

**අභිවිස්සජ්ජති.** ක්‍රි-(අභි + වි + සජ d භූ. විස්සජ්ජනෙ, හැරීමෙහි + ති) හරියි, මුදයි. පිටත් කර යවයි.

**අභිවිස්සඨ.** ති-පහ වූ සැක ඇති, නිසැක.

**අභිවිසිට්ඨ** ති-ඉතා ශ්‍රෙෂ්ඨ, අති උත්තම.

**අභිවිහච්ච** පු-ක්‍රි-නසා, සිඳ, බිඳ, (හන ධාතු කෙරෙන් 'ත්වා' හට, 'රච්ච' ආදෙශ හා නකාරලොප )

**අභිවුට්ඨ.** ති-වෂ්ිා කළ.

**අභිවුට්ඨි.** ඉ-මහවැස්ස, මහාමෙඝය.

**අභිවුඩ්ඪ.** ති-ඉතා වෘඬ, ඉතා වැඩුනු.

**අභිවුඩ්ඪි.** ඉ-අභිවෘඬිය, මනාව වැඩීම

**අභිවෙඨන** න-එතීම වෙළා බැඳීම.

**අභිවෙඨෙති.** ක්‍රි-(අභි + වෙඨ. d. චු වෙඨනෙ, වෙළීමෙහි + ති) වෙළයි, ඔතයි.

**අභිවෙදෙති.** ක්‍රි-(අභි + විද d චු ලාභෙ, ලැබීමෙහි + ණෙ + ති) ලබයි; වළඳයි. විඳියි, දන්වයි.

**අභිව්‍යාප්ති.** ඉ-පැතිර පැවැත්ම, වෙසෙසින් පැහැදිලි බව.

**අභිව්‍යාපෙති.** ක්‍රි-(අභි + වි + ඉ. d. භූ ගතියං, යාමෙහි + ණාපෙ + ති) පතුරුවයි. ව්‍යාපත කෙරෙයි.

**අභිසඞ්ඛට(ත)** ති-(අභි + සං + කර d. 'ක'හට 'ඛ.' 'ත'හට 'ට') රැස් කළ, සකස් කළ, අභිසංස්කරණය කළ.

**අභිසඞ්ඛරණ.** න-සකස් කිරීම, පිළියෙල කිරීම, සම්පාදනය, අභිසංස්කරණය.

**අභිසඞ්ඛරොති** ක්‍රි-(අභි + සං + කර d ත කරණෙ, කිරීමෙහි, 'කර' හට 'ඛර' ආදෙශයි + ඔ + ති) අභිසංස්කරණය කරයි, සකස් කරයි.

**අභිසඞ්ඛාර.** පු-අභිසංස්කරණය, පිළියෙළ කිරීම, රැස් කිරීම.

**අභිසඞ්ඛාරික.** ති-(අභිසඞ්ඛාර + ඉක) පිළියෙළ කළ, සකස් කළ.

**අභිසඞ්ඛිපති** ක්‍රි-(අභි + සං + ඛිප. d. භූ ඡඩ්ඩනෙ, දැමීමෙහි + ති) දමා ගසයි, වීසි කරයි

**අභිසඞ්ඛිපන.** න-වීසි කිරීම.

**අභිසඤ්චිනන** න-රැස් කිරීම, රාශිභූත කිරීම.

**අභිසඤ්චිනාති.** ක්‍රි-(අභි + සං + චි. කි. චයෙ, රැස් කිරීමෙහි + නා + ති)රැස් කෙරෙයි.

**අභිසඤ්චෙතයිත.** ති-උත්තම චිත්තයෙහි වූ

**අභිසඤ්චෙතෙති.** ක්‍රි-(අභි + සං + චිත. d. චු. සඤ්චෙතනෙ, සිතීමෙහි + ණෙ + ති)සිතයි, මෙනෙහි කරයි.

**අභිසන්තාප** පු-තැවීම, රත් කිරීම, ගිනියම් කිරීම.

**අභිසම්පරාය.** පු-පරලොව, අන්‍යභවය.

**අභිසංවිසති.** ක්‍රි-(අභි + සං + විස. d. භූ. පවෙසනෙ, ප්‍රවිෂ්ට වීමෙහි + ති)ප්‍රවිෂ්ට වෙයි, ඇතුළත් වෙයි.

**අභිසංසති.** ක්‍රි-(අභි + සංස. d. භූ. පසංසනෙ, පැසසීමෙහි + ති) පසසයි, සතුති කරයි, ශුභාශිර්වාද කරයි.

**අභිසංසනා.** ඉ-ප්‍රශංසාව, ආශංසනය, පැතීම.

**අභිසඞ්ග.** පු ඇලීම, එකට එක ඇඳීම. ආක්‍රොශය.

**අභිසඞ්ගී** ති ඇලුනු, ආක්‍රොශ කරණ.

**අභිසජ්ජති** ක්‍රි-(අභි + සජ්ජ d. භූ. සජ්ජනෙ, සෑදීමෙහි + ති) සාදයි, පිළියෙල කරයි, ගැලෙයි, ගිලෙයි.

**අභිසජ්ජනා.** න-ගැටීම, හැරීම, දෙස් පහළ කිරීම.

**අභිසඤ්ඤා.** ඉ-මනා හැඟීම, මනා හැඳිනීම.

**අභිසඤ්ඤූහති.** ක්‍රි-(අභි + සං + ඌහ. d. භූ විතක්කෙ, කල්පනා කිරීමෙහි + ං= 'ඤ'විතන යි + ති) කල්පනා කෙරෙයි, සිතයි.

**අභිසට.** ති-පැමිණි, සමප්‍රාප්ත. සලකුණු බලා ගිය.

**අභිසත්තු.** පු-සතුරා, විරුද්ධකාරයා.

**අභිසද්දහති.** ක්‍රි-(අභි + සං + දහ. d. භූ. පතිට්ඨායං, පිහිටීමෙහි + ති) අදහයි, විශ්වාස කෙරෙයි.

**අභිසද්දහන.** න ඇදහීම, ශ්‍රද්ධාව, විශ්වාසය.

**අභිසන්තාපෙති.** ක්‍රි-(අභි + සං + තප. d. චු. සන්තාපෙ, තැවීමෙහි + ණෙ + ති) තවයි, උණුසුම් කෙරෙයි.

**අභිසන්ද.** පු-ගලා ඒම, බැස ඒම, ජලධාරාවක් ගලා බැසීම.

**අභිසන්දන.** න-ගලා බැසීම, ඉතිරී යාම.

**අභිසන්දහති.** ක්‍රි-(අභි + සං + දහ. d භූ. හසම්කරණෙ, හලු කිරීමෙහි + ති) දවයි, අලු කෙරෙයි.

**අභිසන්දහන.** න-හලු කිරීම, දැවීම.

**අභිසන්දෙති.** ක්‍රි-(අභි + සන්ද. d. භූ. පස්සවනෙ ගලා ඒමෙහි + අ=ඒ + ති) ගලා බස්වයි.

**අභිසන්ධි.** ඉ අභිප්‍රාය, අදහස.

**අභිසන්න.** ති-ඉතිරී ගිය, ගලා ගිය.

**අභිසපති.** ක්‍රි-(අභි + සප + d. භූ. අක්කොසෙ, ආක්‍රොශ කිරීමෙහි + ති) ශාප කෙරෙයි. දිවුරයි.

**අභිසපන.** න-ශාප කිරීම, දිවිරීම.

**අභිසමත්ත.** ති-සම්පූර්ණ, පරිපූර්ණ, පිරුණු.

**අභිසම්පරාය** පු-පරලොව, මතු උත්පත්ති භවය.

**අභිසම්බුජ්ඣති.** ක්‍රි-(අභි + සං + බුධ. d. දි. අවගමනෙ, අවබොධයෙහි + ති) අවබොධ කෙරෙයි, ප්‍රතිවෙධ කෙරෙයි.

**අභිසම්බුජ්ඣන.** න-අවබොධය, වැටහීම.

**අභිසම්බුද්ධ.** ති-මනාව අවබොධ කළ, මනාව ප්‍රතිවෙධ කළ.

**අභිසම්බොධි.** ඉ-සම්‍යක්සම්බොධිය, සර්වඥතාඥානය.

**අභිසම්භව.** පු-උත්පත්තිය, හටගැන්ම.

**අභිසම්භවති.** ක්‍රි-(අභි + සං + භූ. d. භූ. ඌ= ඔ=අව + අ + ති) හටගණී, උපදියි.

**අභිසම්භුණාති** ක්‍රි-(අභි + සම්භු. d. සු. පාපුණනෙ, පැමිණීමෙහි + උණා + ති) පැමිණෙයි. ලබයි. හැකි වෙයි.

**අභිසම්භූ**. පු-මනා ව තෙමේ ම හටගත් තැනැත්තා.

**අභිසම්භූත**. ති මනාව හටගත්, උපන්, පහළ වූ.

**අභිසම්මති** ඉ සම්මත කර ගැණීම, නියම කර ගැණීම.

**අභිසම්මති**. ක්‍රි-(අභි+සමු d. දි. උපසමෙ, සන්සිඳීමෙහි+ති) සන්සිඳෙයි.

**අභිසමය**. පු-අවබොධය, දැනගැන්ම.

**අභිසමයට්ඨ**. පු-අභිසමයාර්ථය.

**අභිසමාගච්ඡති**. ක්‍රි-(අභි+සං+ආ+ගමු. d. භූ. ගතියං, යාමෙහි+ච්ඡ+ති) යහපත් ව එකට එක් වෙයි, රැස් වෙයි.

**අභිසමාචාර**. පු-උත්තම හැසිරීම.

**අභිසමිත**. ති-(අභි + සං + ඉ. d. ගතියං, යාමෙහි+ත) සන්සිඳුවන ලද.

**අභිසමෙක්ඛති**. ක්‍රි-(අභි+සං+ඉක්ඛ. d භූ. දස්සනෙ, දැකීමෙහි+ති) බලයි, පරීක්‍ෂා කෙරෙයි.

**අභිසමෙච්ච**. පූ. ක්‍රි-දැන ප්‍රතිවෙධ කොට.

**අභිසමෙතාවී**. ති-සන්සිඳුනු, අවබොධකළ.

**අභිසමෙති**. ක්‍රි-(අභි+සමු. d. චු. උපසමෙ, සන්සිඳීමෙහි + ණෙ + ති) සන්සිඳුවයි. අවබොධ කෙරෙයි.

**අභිසර**. පු-අනුචරයා, සමග හැසිරෙන්නා.

**අභිසල්ලිඛති**. ක්‍රි-(අභි+සං+ලිඛ. d. භූ. ලෙඛනෙ, ලිවීමෙහි, ඉරි ඇඳීමෙහි, සිඳීමෙහි +ති) ලියයි, ඉරි අඳියි, සිඳියි.

**අභිසල්ලෙඛ**. පු-මනාකොට සිඳීම, ඉරි ගැසීම කෙලෙසුන් සිඳීම.

**අභිසල්ලෙඛික**. ති-කෙලෙසුන් ගෙවීම පිණිස අතිශයින් යෙදුනු

**අභිසල්ලෙඛිත**. ති-ලියනලද, සිඳිනලද.

**අභිසාප**. පු-ශාප කිරීම, විපතක් වේවා යි දෙවාදීන්ට යැදීම, අනතුරායයක් වේවා යි පැතීම.

**අභිසාරිකා(යා)**. ඉ-සලකුණට යන වෙසඟන, අභිසාරිකාව.

**අභිසාරෙති**. ක්‍රි-(අභි+සර. d. භූ ගතියං, යාමෙහි+ණෙ+ති) ඉදිරියට යවයි.

**අභිසිඤ්චති**. ක්‍රි-(අභි+සිච. d. රු. සෙකෙ, ජලය ඉසීමෙහි+ති) සෙචනය කරයි, දිය ඉසියි අභිෂෙක කෙරෙයි.

**අභිසිඤ්චන**. න-ජලසෙචනය, දිය ඉසීම, අභිෂෙකය.

**අභිසිත්ත**. ති අභිෂෙක කළ, ජලසෙචනය කළ. කිරීටධාරණයෙහි දී කරණ සුවඳ පැන් ඉසීම.

**අභිසෙක**. පු අභිෂෙකය, කිරීටධාරණය, ඔටුනු පැළඳීම.

**අභිසෙචති**. ක්‍රි-(අභි + සිච. d. භූ. සරණෙ, ඉසීමෙහි + ති) ඉසියි, ජලසෙචනය කරයි.

**අභිසෙචන**. න-ඉසීම, ජලය ඉසීම.

**අභිසෙති**. ක්‍රි-(අභි+සි. d. භූ. සයෙ, නිදීමෙහි+ති) සයනය කෙරෙයි.

**අභිසෙවති**. (අභි+සෙවු. d. භූ. සෙවනෙ, ආශ්‍රය කිරීමෙහි+ති) සෙවනය කරයි.

**අභිසෙවන**. න-සෙවනය, ආශ්‍රය.

**අභිහට** ති-එළවන ලද, පමුණුවනලද.

**අභිහත**. ති-නසනලද. තළනලද.

**අභිහනති**. ක්‍රි-(අභි+හන d. භූ. හිංසායං, හිංසාවෙහි+ති) නසයි, මරයි, තළයි.

**අභිහනන**. න-නැසීම, මැරීම, තැළීම.

**අභිහරණ**. න-පැහැර ගැණීම, ඉදිරියට ගෙණ යාම.

**අභිහරති**. ක්‍රි-(අභි+හර. d. භූ. හරණෙ, පැහැර ගැණීමෙහි+ති) හැර ගණී, පැහැර ගණී.

**අභිහාර**. පු-ඉදිරියට ගෙණ ඒම. එවීම. පැමිණවීම.

**අභිහිංසති**. ක්‍රි-(අභි+හිංස. d භූ. විහිංසායං, පෙළීමෙහි+ති) හිංසා කෙරෙයි, පීඩා කෙරෙයි.

**අභිහිංසන**. න-හිංසා කිරීම, පීඩා කිරීම. අධික පීඩාව.

**අභිහිත**. ති-කියනලද. (කම් කතෘ ආදි කාරකයන් සමාසාදීන් විසින්) කථිත.

**අභීත**. ති-බිය රහිත, බය නැති, නිර්භය.

**අභීතසීහනාද**. පු-නිර්භය උත්තමනාදය.

**අභීරූ**. ඉ-සාතාචාරිය. (=භාතාචාරිය.)

**අභීරූ(ක)**. ති-බිය නැති, නිර්භය, නොබාන සුලු.

**අභෙද**. ති-වෙනස් නොවන, වෙනසක් නැති.

**අභෙදූපචාර**. පු-ස්වභාවය නැතියහු කෙරෙහි ඒ ස්වභාවය නගාලීම උපචාර නම්. එම ස්වභාවය ආරොපණය කරණු ලබන්නේ නො වෙනස්ව සැලකීම නිසයි. ඊට අභෙදෙපචාරයයි කියනු ලැබේ.

**අභුජිස්ස**. ති-(අ=න+භුජිස්ස) නිදහස් නොවූ, දාසභාවයට පැමිණි.

**අභූත**. ති-(අ=න+භූත) නොවූ, සිදු නො වූ, හට නොගත්.

**අභූතක්ඛාන**. න-අභූත ප්‍රකාශය, සිදු නොවූවක් ප්‍රකාශ කිරීම.

**අභූතභාව**. පු-කිසියම් වෙනසකට නො පැමිණි වස්තුවක් ඒ නොවූ ස්වභාවයට පැමිණීම.

**අභූතවාදී**. ති-අභූතය කියන සුලු, බොරුකාර

**අභෙජ්ජ**. ති-නො බිඳිය හැකි, නො කැඩිය හැකි.

**අභොජන**. න-නොබොජුන, අනුභව නො කිරීම.

**අභොජනෙය්‍ය**. ති-අනුභවයට නුසුදුසු

**අම්බ**. d. භූ. සද්දෙ, අස්සාදෙ, නායනෙ; ශබ්ද යෙහි, ආස්වාදයෙහි, රැකීමෙහි. අම්බති.

**අම්බ**. පු-අඹ, අඹගස.

**අම්බක**. ති-කුඩා, බාල.

**අම්බකමද්දරී**. ඉ-කුඩාකිකිළි, පැටිකිකිළි - "සෙය්‍යථාපි ආවුසො සරභ! අම්බකමද්දරී පුස්සකරවිතං රවිස්සාමීති අම්බකමද්දරි රවිතං යෙව රවති."

**අම්බකා**. ඉ-මව, යහපත් භාර්‍ය්‍යාව.

**අම්බට්ඨ**. පු පොක්ඛරසාති බමුණාගේ අතැවැසි ත්‍රිවෙදයෙහි පරතෙරට ගිය කෙනෙකි මොහු.

**අම්බටඨා**. ඉ-දීයම්බතා.

**අම්බපක්කානි**. ඉ අඹපෙළ, අඹගස් පඬ්තිය.

**අම්බපාන**. න-අඹපැන, පැසුනු අඹ මිරිකා පානය කිරීමට සුදුසු පරිදි කොට ගත් අඹ යුස.

**අම්බපිණ්ඩි**. ඉ අඹපිඬු, අඹපෙති.

**අම්බපෙසිකා**. ඉ-අඹපියලි, අඹකැබලි.

**අම්බපොතක**. පු-අඹපැලය.

**අම්බඵල**. න-අඹපලය, අඹගෙඩිය.

**අම්බර**. න-අහස. වස්ත්‍රය, පිළිය

**අම්බරවතිය**. පු-එනම් කුවෙර රාජධානිය.

**අම්බරුක්ඛ**. පු-අඹරුක, අඹගස.

**අම්බලට්ඨි(කා)**. ඉ-තරුණ අඹරුක.

**අම්බවන**. න-අඹවනය, අඹඋයන.

**අම්බසක්ඛර**. පු-විශාලාමහනුවර රජකළ ලිච්ඡවි රජකෙනෙකි මොහු.

**අම්බසණ්ඩ**. පු-අඹකැළය, අඹගස් සමූහය.

**අම්බසෙචක**. ති-අඹගස්වලට ජලය ඉසින.

**අම්බා**. ඉ වැදූ මව.

**අම්බාටක**. පු-ඇඹැරැල්ලාගස.

**අම්බිල**. පු-ඇඹුල, ඇඹුල්රසය.

**අම්බිලඵල**. න-ගිවුලු ඵලය, දිවුල්ගෙඩිය.

**අම්බිලවල්ලි** ඉ-ත්‍රිපර්ණිකා.

**අම්බිලිකා**. ඉ-සියඹලා. ඇඹුලැඹිලිය, අඹ.

**අම්බු**. න-ජලය.

**අම්බුචාරී**. පු-ජලයෙහි හැසිරෙන්නා, මත්ස්‍යයා දියසෙවෙල.

**අම්බුජ**. පු-න-දියෙහි හටගත් දෙය, මත්ස්‍යයා. පියුම්.

**අම්බුජිනී**. ඉ-පියුම්විල.

**අම්බුද**. පු ජලදායකයා, මෙඝය, වලාකුළ

**අම්බුධර** පු-ජලය දරන්නා, මෙඝය, වලාකුළ.

**අම්බුවෙග**. පු-ජලවෙගය.

**අමෙහා**. අ-පින්වත, එම්බා, එම්බිල යන අර්‍ථ ඇති නිපාත පදයක්.

**අම්මණ** න-ඔරුව, ද්‍රොණ එකොළොසක්, අමුණ.

**අම්මා** ඉ-වැදූ මව.

**අම.** d භූ ගතියං, යාමෙහි. අමති, යෙයි.

**අම.** d චු රොගෙ, රුජාගෙහි, අමති, අමයති, රුජා කෙරෙයි.

**අමච්ච** පු-ඇමතියා, විශ්වාස ඇමතියා, දෙවියා

**අමච්ඡර.** ති-මසුරු නැති, නො මසුරු.

**අමච්ඡරිය.** ති-මසුරු නැති. න-නොමසුරුකම.

**අමච්ඡෙර.** ති-මසුරු නො වන 'මච්ඡෙර' බලනු.

**අමජ්ජ.** න-මද්‍ය නොවන, මත්පැන් නොවන සුරා නොවන.

**අමජ්ජප.** ති-මත්පැන් නොබොන, සුරා නොබොන.

**අමත්ත.** ති-මත් නොවන, මාත්‍රා රහිත, න-ආහාර වළඳන භාජනය 'මත්ත'බලනු.

**අමත්තඤ්ඤුතා.** ඉ-අමාත්‍රඥතාව, ප්‍රමාණය නොදත්තා බව.

**අමත්තඤ්ඤු.** ති-ප්‍රමාණය නොදන්නා සුලු.

**අමත්තෙය්‍ය.** ති-මව කෙරෙහි නිසි ලෙස නොපිළිපන්.

**අමත්තෙය්‍යතා.** ඉ-(අ=න + මාතු + ණෙය්‍ය + තා) මෑනියන්ට හිත ක්‍රියා නොකරණබව, මවට හිතපැවතුම් නැතිබව.

**අමත.** ති-නොමළ, නොමැරුණු. න-නිවණ. ජලය. දිව්බොජුන.

**අමතද්දස.** පු-නිර්වාණය දුටු උත්තමයා, බුදුරජ

**අමතද්වාර.** න-මොක්ෂද්වාරය, නිවන්දොර, නිවණට යන මාර්ගය.

**අමතධාතු.** ඉ-නිර්වාණධාතුව, නිවණ.

**අමතනන්දන.** ති-නිර්වාණයට සතුටු වන, පු-බුදුරජ.

**අමතප.** පු-අමෘතය පානය කරන්නා, අමපා, දෙවියා.

**අමතපද.** න-නිවණට කරුණු වන ධර්මය, නිවණ.

**අමතභෙරි.** ඉ-අමෘතය ලබාගැණීමට ජනයා කැඳවන ධර්මභෙරිය, දහම් නමැති බෙරය.

**අමතවග්ග** පු-නිර්වාණමාර්ගය, ඒකායනමාර්ගය, අරිඅටඟිමඟ.

**අමතා.** ඉ තෙල්ලි, රසකිඳ, අරළු.

**අමතාසන.** පු-(අමත + අසන) අමෘතය අනුභව කරන්නා දෙවියා.

**අමතොගධ.** ති-(අමත + ඔගධ) අමෘතයට බැසගත්, අමෘතයට ඇතුළත්, නිවණට අයිති.

**අමථිතකප්ප.** න-වජ්ජිපුත්‍රක භික්ෂූන් ඇතිකළ දශවස්තුවෙන් එකක්, කිරි බැවින් තොරවූත් දී බැවින් තොර වූ කිරත් කැප කරවාගෙණ බීම කැපය යන මතය.

**අමනාප.** ති-මන නොවඩන, සිත සතුටු නොකරණ.

**අමනුස්ස.** පු-අමනුෂ්‍යයා, යක්ෂ-භූත ආදි සත්ත්වයා.

**අමම.** ති-මමඞ්කාර රහිත, මගේ නොවන, මමත්වයක් නැති.

**අමමායන.** න-(නා) ඉ-(=න + මමායන(නා) මමත්වය නොකිරීම, ති-මමායන රහිත.

**අමයති.** ක්‍රි-(අම. d චු. රොගෙ, රොගයෙහි + ණය + ති) රුජා කරයි.

**අමර.** පු-මරණ නැත්තා, දෙවියා, දෙව්ලොව

**අමරා.** ඉ-'ආඳ' යයි ප්‍රකට මාලුවා.

**අමරාවික්ඛෙපිකවාද.** පු-ලිස්සා යාම නිසා ආඳ අල්ලා ගැණීම දුෂ්කර වන්නාක් මෙන් ඒ මේ අතට පැන පැන යන වාදය. 'චාසට්ඨි දිට්ඨි' බලනු.

**අමල.** න-මීරන්, මිණිරන්, අභ්‍ර ති-මලරහිත, නිර්මල, පිරිසිදු.

**අමස්සුක.** ති-රැවුල නැති

**අමා.** අ-සහාර්ථ, සමීපාර්ථයෙහි පවත්නා නිපාතයක්.

**අමාතාපුත්තික.** ති මව හා පුත්‍රයන් නො ලැබිය හැකි, මවුපුතුන් ගැන නො බැලිය හැකි.

**අමාතික.** ති-මවට අයිති නැති, මවුසතු නොවන.

**අමාදි.** පු-ද්විතියා තත්පුරුෂ සමාසය.

(3188)

**අමාදිපරතප්පුරිස**. පු-අං ආදී ද්විතීයාන්තයන් උපපද කොට ඇති තත්පුරුෂ සමාසය.

**අමානුස**. ති-මිනිසුන්ට අයිති නැති, මිනිසුන් පිළිබඳ නොවන, දෙවියන්ට අයත්.

**අමාමක**. ති-(අ=න + මාමක) මාගේ නොවන, මට අයත් නැති, මමත්වය නොකරණ.

**අමායාවී**. ති-මායා නැති, මායා රහිත.

**අමාවසී.** **අමාවාසී.** } ඉ-රවි චන්ද්‍ර දෙදෙනාගේ එකතු-වීමේ දිනය, අව්පසළොස්වක, මාසේපෝය දිනය.

**අමිත්ත.** **අමිත්‍ර.** } පු අමිත්‍රයා, හතුරා, විරුඬකාරයා.

**අමිත**. ති-අපමණ, ප්‍රමාණ රහිත, ගණන් නැති.

**අමිතාභා**. ඉ-අප්‍රමාණ ආලෝකය.

**අමිලාත**. ති-මලාන නොවන. ඉ-කෝමාරිකා

**අමිස්ස**. ති-අමිශ්‍ර, ව්‍යාකූල නොවන, කලවම් නැති.

**අමු**. ති-සම්මුඛ, අසම්මුඛ, මේ, අසවල්.

**අමුඛර**. ති-මුඛර නොවන, රළුමුව නැති, මූකරි නොවන.

**අමුඛ්‍යව්‍යවහාර** පු-ශබ්දයන් ගේ අප්‍රධාන ව්‍යවහාරය, අභෙදොපචාරය, ගෞණ ව්‍යවහාරය.

**අමුච්ඡිත**. ති-මූර්ච්ඡිත නොවූ, සිහි මුලා නොවූ.

**අමුත්ත**. ති නොමිදුනු, නොගැලවුනු.

**අමුත**. (න + මුත) ඝ්‍රාණ – ජිව්හා – කාය යන ත්‍රිවිධ ඉන්ද්‍රියයන් ගෙන් චෛතන් අරමුණ.

**අමුත්‍ර**. අ-අන්තන්හි, අන්‍යභවයෙහි, අසවල් තැන යන අර්ථයන්හි.

**අමූල**. ති-මුල් නැති, හේතු නැති, ඇමැත් මුල් නැති.

**අමූළ්හ**. ති-නුමුළා, සිත විකල නොවූ.

**අමූළ්හවිනය**. පු-භික්ෂූන්ගේ ආපත්තීන් පිළිබඳව සිදුකරණ එතම විනය කර්මය. අධිකරණ සමථයක්.

**අමෙජ්ඣ** න-අමෙධ්‍යය, අසූචිය, ගූථය, අපවිත්‍ර දෙය.

**අමෙති**. ක්‍රි-'අමයති' බලනු.

**අමොස**. ති-නොසිස්, අතුච්ඡ, සඵල, සාරවත්.

**අමොසවචන**. න-නොසිස් වචනය, ඵලදායක වචනය. ති නොසිස් වචන ඇති. පු-බුදුරජ.

**අමොසා**. ඉ-වලඟසාල්, විඩඞ්ග.

**අමොහ**. පු-නොමුලා බව.

**අය්‍ය** පු ආයෂීයා, උත්තමයා, භික්ෂු.

**අය්‍යක**. පු මුත්තා, පියාගේ පියා, සීයා.

**අය්‍යකා** ඉ ගැණු මුත්තා, මවගේ මව, ආච්චි.

**අය්‍යපුත්ත** පු ආයෂීපුත්‍රයා, ස්වාමියා, ස්වාමි-පුරුෂයා, ස්වාමියාගේ පුත්‍රයා

**අය්‍යා**. ඉ-ආයෂීාව, ස්වාමිදුව, ස්වාමිභායෂීාව, උත්තමාව.

**අයං**. පු-ඉම ශබ්දයාගේ ප්‍රථමා එකවචනය. මේ, මේතෙම, මෝ තොමෝ.

**අය**. භූ. ගතියං, යාමෙහි, අයති, යෙයි.

**අය**. පු-යකඩ. "අයති නානා කම්මාර කිච්චෙසු උපයොගං ගච්ඡතීති අයො" උදය, අභිවෘඬිය, පුණ්‍යක්‍රියාව.

**අයකපාල**. න-යකබල (=යකඩ කබල.)

**අයගුළ** පු න-යබර.

**අයති**. ක්‍රි-(අය d භූ. ගතියං, යාමෙහි + ති) යෙයි.

**අයථා**. අ-(=න + යථා) යථාගති නොවන, ස්වාභාවය ගති නොවන, ක්‍රමවිරොධ යන අරුත්හි

**අයන** න-ගමන, මාර්ගය.

**අයස**. පු-අකීර්තිය, අපකීර්තිය, නින්දාව, පරිභවය.

**අයාචන**. න-නොඉල්ලීම, යාච්ඤා නොකිරීම.

**අයාචිත** ති නොඉල්ලන ලද, යාච්ඤා නො-කළ, තොම ඉල්ලූ.

**අයාථාවමාන** පු-විරුඬ මානය, වැරදි මානය.

**අසිර**. =අරිය. පු-ස්වාමියා, ස්වාමිපුරුෂයා, හිමියා.

**අසිරකුල**. න-අය්‍යක කුලය, ආයෂී කුලය, උතුම් කුලය.

(3230)

**අයිරා.** ඉ-ආර්යාව, ස්වාමිභාර්යාව, සාමිදුව.

**අයුත්ත** න-අයුතු, යුතු නොවූ, නුසුදුසු.

**අයුත්තසමාස** පු-අයුත්තසමාසය, අයුක්තාර්ථ නාමයන් හා වන සමාසය.

**අයෝගග.** පු මොහොල (=මෝල්). ඒතල ආදිය.

**අයෝග.** පු-නොයෙදීම, අස්ථානයෙහි යෙදීම

**අයොජ්ඣ.** ති-නො පැරදවිය හැකි =(යටත් නො කට හැකි.) ඉ සරයු ගංතෙර පිහිටි අයෝධ්‍යා නම් නුවර.

**අයොනිසො** අ-අනුපාය වශයෙන්, නුනුවණින් යන අර්ථයන්හි

**අයොමය.** ති-යමුවා, යකඩින් කළ.

**අර** d. භූ. ගතියං, යාමෙහි, නැසීමෙහි, අරති, යෙයි. නසයි.

**අර.** න-ශිඛ්‍රය, රථචක්‍රයාගේ දත්, (=ගරාදි)

**අරක්ඛිත.** ති-නොරක්නා ලද, පරෙස්සම් නොකළ.

**අරක්ඛිය.** ති-නොරැකිය හැකි, රක්ෂා නොකට හැකි.

**අරක්ඛෙය්‍ය.** ති නොරැකිය හැකි.

**අරජ.** ති-රජස් රහිත, රජස් නැති, පිරිසිදු.

**අරඤ්ජර.** පු-දිය ගන්නා සැළ, දිය වත්කරණ සැළිය.

**අරඤ්ඤ** න අරණ්‍යය, වනය, කැළෑව.

**අරඤ්ඤකුටි.** ඉ-අරණ්‍යයෙහි වූ කිළිය, වනයෙහි වූ කුඩා ආවාසය-කුටිය.

**අරඤ්ඤවාස.** පු-වනවාසය, අරණ්‍යයෙහි විසීම.

**අරඤ්ඤවිහාර.** පු-අරඤ්ඤවාසය.

**අරඤ්ඤානි.** ඉ-මහවනය.

**අරඤ්ඤායතන.** න-අරණ්‍යය, වනය.

**අරණ.** ති (අ=න+රණ) කෙලෙස් රහිත, කිලුටු නැති, පිරිසිදු

**අරණවිහාර.** පු නිකෙලෙස් විහරණ, මෛත්‍රී විහරණය.

**අරණී.** ඉ-ගිනි ගානා දණ්ඩ, ගිනි උපදවන ලීය.

**අරණිපොතක.** පු-ගිනි ගාන කුඩා දණ්ඩ.

**අරණීමථන.** න-ගිනි ගැණීමට දඬු එකට ගෑවීම.

**අරති** ක්‍රි-(අර d භූ. ගතියං, යාමෙහි+ති) යෙයි.

**අරති.** ඉ-විරතිය, වෙන් වීම, නො ඇලීම, උකටලී වීම, එනම් මාර දුව.

**අරවාල** පු අරවා විලෙහි වැසි නා රජෙකි, කාශ්මීර් ගන්ධාර දෙරටෙහි ගොයම් පැසෙන කාලයේදී ඒවා විනාශකළේ මේ නාරජුයි, මජ්ඣන්තික තෙරුන්වහන්සේ මූ දමනය කළ සේක.

**අරවාලදහ.** පු එනම් විල

**අරවින්ද** න-පද්මය, පියුම.

**අරහ.** d. භූ. පූජායං, පිදීමෙහි, අරහති, පුදයි සුදුසු වෙයි.

**අරහ** d. චු පූජායං, පිදීමෙහි, අරහෙති, අරහයති, පුදයි.

**අරහ.** ති සුදුසු, යහපත්, රහත්.

**අරහත්ත.** න-රහත්බව, රහත්ඵලය.

**අරහත්තප්පත්ති.** ඉ-රහත්බවට පැමිණීම.

**අරහත්තඵල.** න රහත් පලය

**අරහත්තමග්ග** පු රහත්මග.

**අරහත්තවිමොක්ඛ.** පු-අර්හත් ඵලය.

**අරහති.** ක්‍රි (අරහ. d භූ පූජායං, පිදීමෙහි +ති)පුදයි සුදුසුයි.

**අරහයති.** ක්‍රි-(අරහ d චු පූජායං, පිදීමෙහි +ණය+ති) පුදයි.

**අරහිත** ති පුදන ලද, යාග කරණ ලද.

**අරාති** පු-සතුරා, විරුඬකාරයා

**අරාල.** පු-දුම්මල, යක්ෂධූම, සල්රුක, මතැනා. ති-අක්බඹුරු,වක් වූ

**අරි.** පු-සතුරා, (=හතුරා), විරොධකාරයා.

**අරිඤ්චිත** ති-නොහරිණ ලද, බැහැර නො කළ, පසු නොබසින.

**අරිඤ්චමාන.** ති-පහ නොකරණ, බැහැර නොකරණ.

**අරිට්ඨ**. න-මරණ ලකුණ, හෙලලුහුනු, පු-කොහොඹ, රුක් පෙනෙල, (බොත) අරිෂ්ට, එනම් පසේ බුදුන්, මත්පැන් ති අරිටු, නොනැසෙන සුළු.

**අරිට්ඨ(ක)** පු-සුරා. කවුඩා, බකමූණා, කොසඹගස, රුක්පෙනෙල.

**අරිත්ත**. ති-තොසිස්, අතුවඡ න-රිට.

**අරිත්තජ්ඣාන**. න-තොසිස් ධ්‍යානය. ති-ධ්‍යාන සහිත.

**අරින්දම**. පු-සතුරන් මඩින තැනැත්තා, එනම් රජ.

**අරිය**. පු-ආර්‍යයා, බ්‍රාහමණයා, බුදුරජ, රහත්හු, සොතාපන්නාදී ආර්‍යපුද්ගලයෝ. ති-පරම විශුඩ, උපකෙලශ රහිත.

**අරියඋපොසථ**. පු-ආර්‍යයන්ගේ උපොසථය.

**අරියචිත්ත**. න-ආර්‍යචිත්තය, මාර්ගඵලසම්ප්‍රයුක්ත චිත්තය.

**අරියඤ්ජස**. පු-ආර්‍යමාර්ගය, ඒකායනමාර්ගය.

**අරියතන්ති**. ඉ-ආර්‍යප්‍රවේණිය, ආර්‍යවංශය, බුඩවංශය.

**අරියධන**. න-ආර්‍යධනය, සඩා සීල හිරි ඔත්තප්ප සුත චාග පඤ්ඤ යන උතුම් ධම් සත.

**අරියධම්ම**. පු-ආර්‍යධර්මය, බුඩධර්මය.

**අරියපඤ්ඤ**. ඉ-ආර්‍යප්‍රඥව, උත්තමප්‍රඥව.

**අරියපවේණී**. ඉ-ආර්‍යප්‍රවේණිය, ආර්‍ය උරුමය.

**අරියපුග්ගල**. පු-ආර්‍යපුද්ගලයා, සෝවාන් ආදී මාර්ගසථඵලසථ පුද්ගලයා.

**අරියමග්ග**. පු ආර්‍යමාර්ගය, ආර්‍යඅෂ්ටාඞ්ගික මාර්ගය.

**අරියවංස**. පු-ආර්‍යවංශය, ආර්‍යපරම්පරාව, සැරියුත් මහමුගලන් ආදී ආර්‍යපරම්පරාව චතුර්විධ ආර්‍යවංශ. (අඞ්ගුත්තර චතුක්කය බලනු.)

**අරියවාස**. පු-ආර්‍යවාසය, ආර්‍යභූමිය, ආර්‍ය පුද්ගලයන්ගේ වාස භූමිය, දශවිධ ආර්‍යවාස. ('දසවාස' බලනු) "අරියා වසිංසු වසනති වසිස්සනති එත්‍ථාති අරියවාසා.

**අරියසංවාස**. පු-ආර්‍යයන් හා එක්ව විසීම.

**අරියසච්ච**. න-ආර්‍යසත්‍යය, චතුඃසත්‍යධර්මය.

**අරියසුඛ** න-ආර්‍ය සුවය.

**අරියා**. ඉ-චතුර්විධ වෘත්තයන් අතුරෙහි වූ ආර්‍යාවෘත්තය, ආර්‍යාගීති, වෛතාලීය සහ මාත්‍රාසමක යනු ඒ චතුර්විධ වෘත්ත නම්.

**අරියාගීති**. ඉ-ආර්‍යාවෘත්තය පිළිබඳ පූර්වාර්ධය අනතයෙහි ගුරක් ඇතිව විරා වෘත්ත කොට සැදූ කල ආර්‍ය ගීතිය වේ.

**අරියූපවාද**. පු-ආර්‍යෝපවාදය.

**අරියූපොසථ**. පු-'අරියඋපොසථ' බලනු.

**අරියොපවාද**. පු-(අරිය + උපවාද) ආර්‍ය පුද්ගලයන්ට කරණ උපවාදය, ආර්‍යයන්ට ගැරහීම.

**අරිස**. න-අර්ශස් (=අරිසස්) රොගය.

**අරු(ක)** න-ව්‍රණය, වණය, ශරීරගත ව්‍රණය.

**අරුකාය**. පු-ව්‍රණයන්ගෙන් යුත් ශරීරය. ව්‍රණසමූහය.

"පස්සචිත්තකතං බිම්බං-
අරුකායං සමුස්සිතං,
ආතුරං බහුසඞ්කප්පං-
යස්ස නත්‍ථි ධුවං ඨිති."

**අරුකාර**. පු-(ව්‍රණකාර), බදුල්ල ගස.

**අරුකූපමචිත්ත** න-(අරුක + උපමා + චිත්ත) ව්‍රණයකට සමාන සිත, ති-එබඳු සිත් ඇති.

**අරුණ** පු-සූර්‍යෝදයෙන් පළමු අහසෙහි නඟින දුඹුරු වර්ණ රශ්මිය, මඳරත, රත්පැහැය. අරුණවණ්ණතාය අරති ගච්ඡතීති අරුණො අරුණෝති වෙත්‍ථ සුරියුග්ගමනස්ස පුරෙචරො වඩ්ඪනරතෙතා පභා විසෙසොති දට්ඨබ්බො, කිඤ්චිරතෙතා අබ්‍යත්ත රත්තවණ්ණො අරුණො නාම යථා මච්චස්ස අක්ඛීනි.

**අරුණුග්ගමන**. න - (අරුණ + උග්ගමන) අරුණෝද්ගමනය, අරුණ නැඟීම.

**අරූප**. ති-රූප රහිත, රූපයක් නැති. න-නිවණ.

**අරූපභාවසික**. ති-අරූපයට අයත්, අරූපීන් පිළිබඳ.

**අරූපධාතු**. ඉ-අරූපභවය, අරූපලෝකය.

**අරූපභව**. පු අරූපධාතුව, අරූපලෝකය, අරූතලය.

**අරූපලෝක**. පු-අරූපභවය. ආකාසානඤ්චායතනය, විඤ්ඤාණඤ්චායතනය, ආකිඤ්චඤ්ඤායතනය, නෙවසඤ්ඤානාසඤ්ඤායතනය යන රූපය නැතිව සිත පමණක් පවතින බඹලෝ සතර.

**අරූපසඤ්ඤා**. ඉ-අරූපය කෙරෙහි පවත්නා සංඥාව.

**අරූපාවචර**. (පු-අරූප + අවචර) අරූපලෝකය. න-අරූප ලෝකයන්හි ප්‍රතිසන්ධි වශයෙන් හැසිරෙණ සිත.

**අරූපී**. ති-රූප රහිත.

**අරෙ**. අ-කොල, බොල යනාදි නීචාමන්ත්‍රණයෙහි හා ප්‍රශංසායුක්ත ආමන්ත්‍රණයෙහි.

**අරොග**. ති-රොග රහිත, ලෙඩ නැති, රුදු නැති.

**අල්ල**. ති-තෙත, දිය සහිත, සිනිඳු.

**අල්ලවත්ථ**. න-තෙත් වස්ත්‍රය, දිය සහිත වස්ත්‍රය. ති-එබඳු වස්ත්‍ර ඇති.

**අල්ලාප**. පු-ආදියෙහි බිණීම, සුවදුක් පිළිබඳ කථාව.

**අල්ලීන**. ති-සැඟවුනු, මුවහ වූ, ඇලුනු.

**අල්ලීයති**. ක්‍රි-(අ + ලී. d කි. සිලෙසෙ, ඇලීමෙහි + ති) ඇලෙයි, වැළඳගණියි.

**අල්ලීයන**. න-ඇලීම, එකට එක ඇලීම.

**අල.** d. භූ-භූසනෙ, සැරසීමෙහි, අලති සරසයි.

**අල.** න-කකුළු ආදීන්ගේ අඬු "යඤ්ඤදෙවති සො හනෙන කක්කටො අලං අභිනින්නාමෙය්‍ය තන්නාදෙව තෙ කුමාරා වා කුමාරිකා වා කටඨෙන වා කඨලෙන වා සඤ්ඡින්දෙය්‍යුං සම්භඤ්ජෙය්‍යං සම්පලිභඤ්ජෙය්‍යුං."

**අලං.** අ-අලඞ්කාර, පර්‍ය්‍යාප්ති, ප්‍රතිෂෙධ, සුදුසු යන අර්ථයන්හි.

**අලංකම්මනිය**. ති-කර්මයට සුදුසු, ක්‍රියාවට යොග්‍ය.

**අලංවචනීය.** පු-කීමට සුදුසු, කීමට නුසුදුසු

**අලංපතෙය්‍ය.** පු-හිමියාහට දීමට සුදුසු, පුරුෂයෙකුට පාවාදීමට සුදුසු.

**අලංසාජීව**. ති-සාජීවයට සුදුසු.

**අලංසාටක.** ති-වස්ත්‍රය ඕනෑ නැති පු-අධික කොට කෑමෙන් ඇඳි වත ලිහා විසි කරණ බ්‍රාහමණයා.

**අලක්ක.** පු-හෙලවරාගස. මතතසුනඛයා, පිස්සුබල්ලා.

**අලක්ඛික.** ති-භාග්‍යය නැති, පින් නැති.

**අලක්ඛී**. ඉ-අභාග්‍යය, පෙර කළ පින් නැති බව.

**අලකා**. ඉ-වෛශ්‍රවණ වරම් රජුගේ නුවර, ආලකමන්දාව.

**අලග්ග.** ති-නොඇලුනු, ආසා නොකළ.

**අලග්ගන**. න-නොඇලීම, නොතැවරීම.

**අලග්ගිත.** ති-ලග්න නොකළ, නොඑල්වූ.

**අලගද්ද**. පු-සර්පයා, නාගයා. අලගද්දොති වෙතථ ආසිවිසො වුච්චති.

**අලඞ්කත.** ති-අලඞ්කෘත, සරසනලද, සැරසූ.

**අලඞ්කරණ.** න-සැරසීම. ආභරණාදියෙන් සැරසීම.

**අලඞ්කාර.** පු-ආභරණය, අලඞ්කාර කිරීම, සැරසීම.

**අලජ්ජී**. පු-ලජ්ජා නැත්තා, පාපයට හිරි නැත්තා. "අලජ්ජීනං බලං දත්වා හාපෙති විනයං මම, ජීවනෙතා යෙව ජාතොසි ගම්භීරා ලොභ කුමහියා."

**අලත්තක.** න-ලාකඩ, ලතුදිය.

**අලත්තකකත.** ති-ලාකඩින් කළ.

**අලති.** ක්‍රි-(අල. d. භූ. භූසනෙ, අලඞ්කාරයෙහි + ති) සරසයි.

**අලම්බ**. පු-නොඑල්ලීම.

**අලම්බුසා.** ඉ-එනම් දෙවඟන.

**අලමරියඤාණදස්සන.** න-කෙලශවිධ්වංසනයෙහි සමර්ථ වූ විශුද්ධ ඥනදර්ශනය

**අලස**. ති-මැලි, කම්මැලි.

**අලසක**. පු-අහර නොදිරීම, අජීර්ණරොගය.

**අලසතා**. ඉ-මැලිබව, කම්මැලිබව.

**අලාබු**. න-පෙනෙල්ල, ගිතිපෙනෙල්ල.

(3351)

**අලාබු** / **අලාපු.** } න-ලබු. නවම්භ ඵලයෙන් එකක්.

**අලාභ** පු-අලාභය, නොලැබීම.

**අලාභී.** පු නොලබන්නා, ලැබී නැත්තා.

**අලාල.** ති-(අ=න + ලාල) කෙලතොලු නොවන, ජඩ නොවන.

**අලාලමුඛ.** ති-කෙලතොලු නොවූ මුව ඇති.

**අලි.** d භූ. බඳිනෙ, බැඳීමෙහි, අලති, බඳියි.

**අලි.** පු-බඹරා, බමරා, ගෝනුස්සා.

**අලික.** න-මුසාවාදය, බොරුව.

**අලිකවාදී.** ති බොරු කියන, අසත්‍යවාදී.

**අලිඞ්ගික.** න ලිඟු නියමයක් නැති, අලිඞ්ගික නාමය, තුම්හ අම්හ ශබ්ද, නිපාත උපසර්ග හා ආඛ්‍යාතය ද අලිඞ්ගිකයි.

**අලිත්ත.** ති-නොතැවුරුණු, නොගල්වනලද.

**අලින.** න-නොසැඟවුනු, නොවැසුනු.

**අලිනචිත්ත.** න-නොසැඟවුනු සිත, ති එබඳු සිත් ඇති.

**අලිනතා.** ඉ-නොසැඟවුනුබව, නොවැසුනු බව.

**අලුත්ත සමාස.** පු-විබත් ලොප් නො කොට සිදු කරණ සමාසය, අලුප්ත සමාසය.

**අලුලිත.** ති-අවඝුඩල, කම්පා නොවූ, නො සොල්වන ලද, නොකලඹින ලද.

**අලෙන.** ති-ලෙන විරහිත, සැඟවීම් නැති.

**අලෙනතා.** ඉ-සැඟවීම් රහිත බව.

**අලොචන.** ති-ඇස් නැති.

**අලොණික.** / **අලොණ.** } ති-ලුණු නැති.

**අලොභ.** පු-අලොභය, ලොභයට ප්‍රතිපක්‍ෂ ධර්මය.

**අලොභී.** ති-ලොභ නැති, දෙන සුළු.

**අලොම.** පු-ලොම විරහිත, රෝම නැති.

**අලොල.** ති-ලොල් නොවන, කෑදර නොවන, ගිජු නොවන.

**අලොලුප.** ති-ලොල්බැව් නැති, ලොලතා රහිත.

**අව්‍යය.** න-ව්‍යය නොවන දෙය, නිපාත උපසර්ග සංඛ්‍යාත අව්‍යය ශබ්ද, නිර්වාණය.

**අව්‍යග්ග** ති-එකග.

**අව්‍යග්ගමනස.** ති එකගසිත් ඇති.

**අව්‍යග්ස** ති-ව්‍යාශ්‍රයත් රහිත, විචිකිච්ඡා රහිත 'වෙයග්ස' බලනු.

**අව්‍යත්ත.** ති ව්‍යක්ත නොවන, අපණ්ඩිත, අදක්‍ෂ.

**අව්‍යත්තතා.** ඉ-අව්‍යක්තබව, නොපටුබව, අදක්‍ෂභාවය.

**අව්‍යත්තරාග.** පු-මඳරත.

**අව්‍යයීභාව.** පු-ව්‍යය නොවන සවභාවය. නිපාත- උපසර්ග පූර්ව සිඬ වන එනම් සමාසය, අනව්‍යය පදයත් අව්‍යය වන්නාවූ සමාසය.

**අව්‍යාකත.** ති-අප්‍රසිඬ, අප්‍රකාශිත, අව්‍යාකෘත, ප්‍රකාශ නොකළ, කුශලාකුශල වශයෙන් ප්‍රකාශ නොකළ ධර්ම, අටළොස් අහෙතුක- සිත්ය, සොළොස් කාමාවචර විපාක ක්‍රියාචෝ්ය, අටළොස් රූපාරූපවිපාක ක්‍රියාචෝ්ය, සතර ලොකොත්තරඵලචිත්ත- යෝ්ය යන ධර්මයෝ් ද, අටවිසි රූපයෝ්ද, නිර්වාණයද යන මොහු අව්‍යාකෘතධර්ම නම් වෙත්.

**අව්‍යාකතපුච්ඡා.** ඉ-කුශලාකුශල දෙකින් තොර වූ අව්‍යාකෘත ධර්මයන් ගැණ විචාරීම.

**අව්‍යාපජ්ජන.** න-විකාරයකට නොපැමිණීම, වෙනසකට නොයාම.

**අව්‍යාපජ්ඣ.** ති-ව්‍යාබාධ රහිත, හිරිහැර නැති. න-නිවණ.

**අව්‍යාපාද** පු-ව්‍යාපාද රහිත බව, ක්‍රොධ නැතිබව, මෛත්‍රිය.

**අව්‍යභිචාර.** පු-නියම විධිය, අනියම් පැවැත්ම ව්‍යභිචාර නම්. ව්‍යභිචාරයක් නැත්තේ අව්‍යභිචාරයි.

**අව්‍යාමිස්ස.** ති-අමිශ්‍ර, මිශ්‍ර නැති, අව්‍යාමිශ්‍ර.

**අව්‍යාවට.** ති-ව්‍යාපෘත නොවන, ක්‍රියාවක නො යෙදී පවතින.

**අව්‍යාසෙක.** ති-නෙත් සිත් පිණවන. කෙලෙස් නැති.

**අවෙයාසිත**. ති-අවසන් නොකළ, කෙළවර නොකළ.

**අව්හය**. පු-කැඳවීම. ආමන්ත්‍රණය, නම.

**අව්හයති**. ක්‍රි-(අ + ව්හෙ. d, භූ. අව්හානෙ, කැඳවීමෙහි + ති) කැඳවයි, අමතයි.

**අව්හයික** ති ආමන්ත්‍රණය කරණ.

**අව්හා**. ඉ සංඥව, නාමය, නම.

**අව්හාන**. න කැඳවීම, ආමන්ත්‍රණය.

**අව්හෙති**. ක්‍රි 'අව්හයති' බලනු.

**අව**. අ-වියොග, අවබොධ, අධොභාව, අවි-නිශ්චය, ශුද්ධි, අල්ප, නින්‍දා, අවකාශ, ව්‍යාප්ති, හානි, වාක්ක්‍රියා, සොරකම්, ප්‍රාප්ති යනාදියෙහි.

**අව**. d භූ. පාලනෙ, පාලනයෙහි. අවති, පාලනය කරයි.

**අවං**. අ පහත, යටභාගය යන අර්ථයන්හි.

**අවඞ්ග**. ති-නෙත් කෙළවර, න භික්ඛවෙ. භික්ඛුනියා, අවඞ්ගං කාතබ්බං.

**අවක්කන්ත**. පු-ඔක්කන්ත, අවක්‍රාන්ත, පැමිණීම් ඇති, උත්පත්තියට එළඹි.

**අවක්කන්ති**. ඉ-අවක්‍රාන්තිය, පැමිණීම, එළඹීම, උත්පත්තිස්ථානයට පැමිණීම.

**අවක්කමති**. ක්‍රි (අව + කමු. d භූ. පදවි-ක්ඛෙපෙ, පදවික්ෂෙපයෙහි + ති) පද තබා යෙයි.

**අවක්කාර** පු කසළ, කා ඉතුරුවන දේ, ඉඳුල්.

**අවක්කාරපාති**. ඉ-අනුභව කොට ඉතිරි වන දේ (=ඉඳුල්) දමන බඳුන.

**අවක්ඛිත්ත**. ති-පහතට හෙළනලද, යටට නමනලද.

**අවක්කංස**. පු-යටපරිච්ඡෙදය, යටත් පිරිස, යටසීමාව. 'උක්කංස' බලනු.

**අවකඩ්ඪති**. ක්‍රි-(අව + කඩ්ඪ. d. භූ. ආකඩ්ඪ-නෙ. කෑඩීමෙහි + ති) කඩයි, ආපසු අදියි.

**අවකඩ්ඪන**. න වරදවා ඇදීම, පහතට ඇදීම.

**අවකඩ්ඪිත**. ති-පහතට අදනා ලද, කෑඩුනු. "රත්තස්ස හි උක්කුටිකං පදං භවෙ-පෙ-මූළ්හස්ස හොති අවකඩ්ඪිතං පදං"

**අවකත්ථන**. න-නානාප්‍රකාර අගුණකථනය.

**අවකප්පන**. න-සැරසීම, පිළියෙල කිරීම. ඔකප්පනය.

**අවකස්සති**. ක්‍රි-(අව + කස්ස. d. භූ. ගතියං, යාමෙහි + ති) අවගමනය කරයි, ආපසු අදියි.

**අවකාස**. පු-අවසරය, අනාවෘතප්‍රදෙශය, හිස්ඉඩම.

**අවකිරති**. ක්‍රි-(අව + කිර. d. තු. විකිරණෙ, විසිරීමෙහි + ති) විසුරුවයි, ඉසියි. 'ඔකිරති' බලනු.

**අවකුජ්ජ**. ති-පහතට හැරුණු, යටිමුව කළ, මුනින් නමනලද.

**අවකුජ්ජපඤ්ඤ** ති යටිමුවවූ ප්‍රඥා ඇති. උක්කුජ්ජ නොවූ ප්‍රඥා ඇති.

**අවකොකිල**. පු කොවුලන්ගෙන් තොර, කොවුලන්ගෙන් වෙන් වූ

**අවග්ග**. ති-(අව + අග්ග) අග පහත්වූ, අගින් නැමුණු.

**අවග්ග**. පු-කා ආදි වර්ග පසින් තොර වූ, ස්වර අට හා යරලව, සහළ, අං යන මොවුහුයි.

**අවගච්ඡති**. ක්‍රි-(අව + ගමු d. භූ. ගතියං, යාමෙහි. ධාත්වන්තයට 'ච්ඡ' ආදෙශයි + ති) බැස යෙයි, පහතට යෙයි, දැන ගණියි.

**අවගණ්ඩ**. පු කපොලයෙහි අහර ගුලි ගසා ගැණීම, වඳුරන් මෙන් කපොල්හි අහර පුරවා ගැණීම.

**අවගණ්ඩකාරක**. පු-කපොලයෙහි වඳුරන් මෙන් ආහාර ගුලි ඇති කිරීම -"න **අවගණ්ඩකාරකං** භුඤ්ජිස්සාමීති සික්ඛා කරණීයා.'

**අවගත**. ති-බැස ගිය, දැන ගත්තා ලද.

**අවගති**. ඉ-නීචගතිය, පහත් ගතිය, නරක පැවැත්ම.

**අවගාහති**. ක්‍රි-(අව + ගාහ. d. භූ. විලොළනෙ, ඇලලීමෙහි + ති) ගැලෙයි, දියේ ගිලෙයි. ඇතුළත් වෙයි, බැස ගණියි.

**අවගාහ**. පු- } **අවගාහන**. න- } ඇතුළට පිවිසීම. බැස ගැන්ම, දියේ ගිලීම.

**අවගුණ්ඨන**. න-වෙළීම, එතීම 'ඔගුණ්ඨන' බලනු.

**අවච්ඡද්දක**. න-සිදුර, හිල, කුඩා සිදුර.

**අවච්ඡේද**. පු-කැඩීම, සිඳීම.

**අවචන**. න-නොකියයුත්ත, කියන්නට නුසුදුසුවුව, නොකීම ති-වචන නැති

**අවචර**. පු හැසිරීම, සඤ්චාරණය.

**අවචරක**. පු-හොරට හැසිරෙන්නා, ඔත්තුකාරයා, ඔචරකයා.

**අවචරණ**. න-හැසිරීම, ඒ මේ අත ඇවිදීම, සක්මන් කිරීම.

**අවජ්ජ**. ති-නිවරද්‍ය, නිදෙස්, නොකියයුතු.

**අවජ්ජ**. න-දෝෂය, නිර්දෝෂභාවය.

**අවජ්ඣ**. ති-වධයට නුසුදුසු, මරණයට නුසුදුසු.

**අවජාත**. ති-අවක්‍රියාවෙන් උපන්, පහත් ගති ඇති, නීචකුලෝත්පන්න.

**අවජානන**. න-නින්දා කිරීම, ගැරහීම.

**අවජානාති**. ක්‍රි-(අව + ඥා. d. කි. අවබොධනෙ, දැනගැණීමෙහි. ඥා=ජා + නා + ති) නින්දා කෙරේ, ගරහයි, ගැරහිය යුතු කොට සිතයි.

**අවණ්ණ**. පු-හ්‍රස්ව දීර්ඝවූ අයන්ත අවර්ණ නම් අ ආ දෙකයි. අගුණ, දෝෂ

**අවතරණ**. න-බැසීම, එතෙර වීම.

**අවතාර**. පු බැසීම, තීර්ථය, සිදුර.

**අවති** ක්‍රි-(අව d. භූ. පාලනෙ, රැකීමෙහි + ති) පාලනය කරයි, රකී.

**අවතිණ්ණ** ති-බැසගත්, අවතීර්ණ.

**අවදඤ්ඤූ**. පු-වචන නොදන්නා සුළු, නොදෙන සුළු.

**අවදාත**. ති-ශ්වෙතවර්ණ. සුදු, ඔදාත, පු සුදු පැහැය.

**අවට්ඨානි**. න ඉටාගැනීම, මැඩගෙන සිටීම.

**අවත්ථන්තර**. න-පෙරවූ අවස්ථාව හැර අන් අවස්ථාවකට පැමිණීම.

**අවත්ථා**. ඉ-කලින් පැවැති ආකාරය වෙනස් වීම.

**අවදාන**. න-පූර්වචරිතය ඉක්මවීම, පරාක්‍රමය, වීර්යය.

**අවදාරණ**. න-බිම කණින හුල, ගල්කටුව.

**අවදානිය**. පු - ගරුවචන නො පිළිගැණීම, පහතට ගැණීම.

**අවදෙහක**. න-ඔක්කාරය, බඩපුරා ආහාර ගැන්ම, වමනය.

**අවධාරණ**. න-නිශ්චය, සමූහයකින් එකක් වෙන්කර ගැණීම.

**අවධාරිත**. ති-නිශ්චය කළ, වෙන් කර ගත්, නියම කර ගත්.

**අවධි**. පු-සීමාව, අපාදාන කාරකය.

**අවන්තිසොම**. න-කාඩි, කාඩිජලය.

**අවන**. න-පිණවීම, ප්‍රීත වීම.

**අවනත**. ති-නැමුනු, යටහත්.

**අවනති** ඉ-පහතට නැමීම, වසඟ කර ගැණීම.

**අවනි**. ඉ පෘථිවිය, පොළොව.

**අවපකාස**. පු-විරුද්ධප්‍රකාශය.

**අවපත්ත**. ති-පා උඩුකුරුව වැටුනු.

**අවබුජ්ඣති**. ක්‍රි-(අව + බුධ. d. දි. අවබොධෙ, අවබොධයෙහි + ති) අවබොධ කර ගණියි, ප්‍රතිවෙධ කරයි. දැනගණී.

**අවබුජ්ඣන**. න-අවබොධය, ප්‍රතිවෙධය.

**අවබොධ**. පු-අවබොධය, අභීකථාඥනය, තේරුම දැනගැණීම.

**අවබොධති**. ක්‍රි-(අව + බුධ d. භූ. බොධනෙ, අවබොධ කිරීමෙහි + ති) අවබොධ කරයි. දැනගණියි.

**අවභාස**. පු-ආලොකය, දීප්තිය, පැහැය, ප්‍රභාව.

**අවභාසක**. ති-දිළිසෙන, බබලන.

**අවභාසන**. න-ඔභාසනය, බැබලීම.

**අවභාසිත**. ති-බබුළුවන ලද.

**අවභුඤ්ජති**. ක්‍රි-(අව + භුජ. d. රු. පාලනාදීසු + ං + ති) අනුභව කෙරෙයි.

**අවභූත**. ති-හටගත්, නිපන්.

**අවමඞ්ගල**. න-අමඞ්ගලය, සිත් නොපිණවන දෙය.

**අවමඤ්ඤති**. ක්‍රි-(අව+මන d. දි. ඤාණෙ, දැනීමෙහි+ති) අවමත් කෙරෙයි. පහත් කොට සිතයි.

**අවමඤ්ඤනා** ඉ පහත් කොට සිතීම, අවමත් කොට සිතීම.

**අවමාන**. පු. න-පරිභවය, හෙළාදැකීම.

**අවමානන**. න-අවමත් කිරීම, නිගා කිරීම.

**අවමානිත**. ති-අවමානප්‍රාප්ත, අවමත් ලද, පරිභව ලද.

**අවමානෙති**. ක්‍රි-(අව+මාන. d. චු පූජායං, පිදීමෙහි + ණෙ + ති) නොපුදයි, අවමත් කෙරෙයි.

**අවය**. ති-ව්‍යය රහිත පු-ව්‍යය නොවීම. වයට විරුඬ දේ. 'වය' බලනු.

**අවයව**. පු-වෙන් වෙන්ව පවත්නා පදාර්ථය, ශරීරාදීන්ගේ කොටස්.

**අවයවසො**. පු-ගද්‍ය පද්‍යයන්ගේ අනුපද ව්‍යාඛ්‍යානය.

**අවරවණ්ණ**. ති-ශුද්‍රවර්ණය, පහත් කුලය, අධු-කුලය.

**අවරුජ්ඣති**. ක්‍රි-(අව+රුධි. d. දි. ආවරණෙ, වැළකීමෙහි+ති) ආවරණ කෙරෙයි, වසයි

**අවරුඬ**. පු-ආවරණය කළ, වැසූ.

**අවරුඬක**. පු-ආවරණය කරන්නා, ඡාදකයා.

**අවරුන්ධති**. ක්‍රි-(අව+රුධි. d. දි. ආවරණෙ, ආවරණය කිරීමෙහි+ති) ආවරණ කෙරෙයි, වසයි.

**අවලම්බති**. ක්‍රි-(අව+ලබි. d භූ. අවසංසනෙ. එල්ලීමෙහි + ති) එල්ලෙයි, එල්බෙයි, 'ඔලම්බති' බලනු.

**අවලම්බන**. න-එල්ලීම, එල්බීම.

**අවලිත්ත**. ති-ආලෙප කළ, ගල්වන ලද

**අවලෙඛති**. ක්‍රි-(අව+ලිඛ d. භූ. ලෙඛෙ, ලිවීමෙහි,+ති) ලියයි, ඉරි ගසයි, සූරා දමයි.

**අවලෙඛන**. න-ලිවීම, ඉරි ඇඳීම, ඉරි ගැසීම

**අවලෙඛනකට්ඨ**. න-සූරා දමන කාෂ්ඨය, වැසිකිළියෙහි පරිභොග කරණ පුසක්කූර.

**අවලෙප** පු-සුණු ආදීන්ගේ ආලෙපය, ගෑම, තැවරීම.

**අවස්සං** අ-නිශ්චයෙහි, ඒකාන්තාර්ථයෙහි.

**අවස්සජති**. ක්‍රි-(අව+සජ. d. භූ. විස්සජ්ජනෙ, හැරීමෙහි+ති) හරියි, නිදහස් කර යවයි.

**අවස්සජ්ජන**. න-හැරීම, වෙන් කිරීම.

**අවස්සය** පු-පිහිට, උදව්ව, උපකාරය.

**අවස්සව**. ති-වසඟ නොවන, වසයෙහි නො පවතින.

**අවස්සුත**. ති-තෙත් වූ.

**අවස**. ති-අවසඟ, වසඟ නොවන, කීකරු නොවන.

**අවසර**. පු-අවකාශය, කාලය, ප්‍රස්තාවය.

**අවසරති**. ක්‍රි-(අව+සර. d. භූ. ගතියං, යාමෙහි+) පහත්ව හැසිරෙයි, අප්‍රකටව හැසිරෙයි.

**අවසවත්තන**. න-වසයෙහි නොපැවැත්ම, තමාට අයිතිව නො පැවත්ම.

**අවසාන**. න-කෙළවර.

**අවසාය**. පු-නිෂ්ඨාව, අවසානය, නිශ්චය.

**අවසිඤ්චන**. න-ඉවසීම, සෙවනය.

**අවසිට්ඨ**. ති-අතිරික්ත, ඉතිරි, ශෙෂ.

**අවසිත්ත**. ති-ඉසින ලද, ජල සෙචනය කළ.

**අවසිත**. ති-නිශ්චිත, නිමාවට පැමිණි, අනුභව කළ.

**අවසිස්සන**. න-අවශිෂ්ට වීම, ශෙෂ වීම, ඉතිරි වීම.

**අවසුච්ඡති** = අවසුස්සිස්සති. ක්‍රි-අව+සුස. d. දි. සොසෙ, වියළීමෙහි+ස්සති. ධාත්වන්තයට හා ප්‍රත්‍යයාගේ ආදියට 'ච්ඡ' ආදෙසයි. වියලෙයි (ජා. අ. සාම ජාතක.)

**අවසුස්සන**. න-වියලීම, වේලීම.

**අවසුස්සති**. ක්‍රි-(අව+සුස d. දි. සොසෙ, වියලීමෙහි+ති) වියලෙයි, වේලෙයි.

**අවසෙස**. ති-ඉතිරි, අධික, ශෙෂ.

**අවහරණ**. න-පැහැර ගැණීම. බලහත්කාර යෙන් ගැණීම, සොර සිතින් ගැණීම.

**අවහරති**. ක්‍රි-(අව+හර. d. භූ හරණෙ, හැර ගැණීමෙහි+ති) පැහැර ගණී, සොරාගණී.

(3526)

**අවහසති** ක්‍රි-(අව + හස d හූ හසනෙ, සිනා සීමෙහි + ති) සිනාසෙයි, අපහාස කෙරෙයි.

**අවහාර** පු අවහරණය, සොරකම් කිරීම, සොරා ගැන්ම, ථෙය්‍ය සංඛාතෙන චිත්තෙන අවහරති ආදියති අවහරණංවා අවහාරො පස්විසි අවහාරයන් විනය පොත්වල දක්නට ලැබේ.

**අවාතාතපහත** ති- (අ=න + වාත + ආතප + හතා) වාතයෙන් හා අව්වෙන් නොනසන ලද, වා අව්වෙන් නොනැසුනු.

**අවාතපාන**. ති (න + වාතපාන) වාකවුළු නැති ජනෙල් නැති. තෙන ඛො පන සමයෙන විහාරා අවාතපානිකා හොන්ති,

**අවාපුරණ** න කෙස්ස, යතුරු මුදුව.

**අවාවට**. ති-අව්‍යාපෘත, ක්‍රියාවක නොයෙදී වාසය කරණ.

**අවායාපිත** ති-නො විය වන ලද.

**අවි**. පු-පොර ගසන එළුවා.

**අවික්ඛිත්ත**. ති-වික්ෂෙපයට පත් නොවූ, එකඟ වූ, නොවිසුරුණු.

**අවික්ඛෙප**. පු-අවික්ෂෙපය, සමාධිය, එකාග්‍රතාව.

**අවිකත්ථි**. ති තමන් ගුණ කියා නොගන්නා.

**අවිකම්පමාන**. පු-කම්පිත නොවන, චලනය නොවන.

**අවිග්ගහ** ති-විග්‍රහ රහිත. පු-ශරීරයක් නැති, අනඞ්ගයා, කාමදෙවයා සමාස වාක්‍ය නැති නිත්‍ය සමාසය.

**අවිඝාත**. ති-විඝාත රහිත, වෙහෙස නැති පු-නොනැසීම.

**අවිචක්ඛණ** ති-විචක්ෂණ නොවන. අදක්ෂ අපණ්ඩිත, අඥ.

**අවිචාර** ති-විචාර රහිත, විචාරීම් නැති. පු-නොවිමසීම.

**අවිජ්ජමාන** ති-අවිද්‍යමාන, සිදු නොවන, නොමැති.

**අවිජ්ජා**. ඉ-අවිද්‍යාව, නොදැනීම, මොහය, චතුසත්‍යය නොදැන්ම. සච්චානං තථට්ඨං අවිදිතං කරොතීති අවිජ්ජා, දුක්ඛෙ අඤ්ඤාණං දුක්ඛසමුදයෙ අඤ්ඤාණං දුක්ඛනිරොධෙ අඤ්ඤාණං දුක්ඛනිරොධ ගාමිනියා පටිපදාය අඤ්ඤාණං අයං වුච්චති අවිජ්ජා.

**අවිජ්ජානීවරණ**. න-අවිද්‍යා සඞ්ඛ්‍යාත නීවරණය, අවිද්‍යාවෙන් ආවරණය වීම.

**අවිජ්ජාසව**. පු-අවිද්‍යා සඞ්ඛ්‍යාත ආශ්‍රවය, මහා අවිද්‍යාව.

**අවිජ්ජාසංයොජන**. න-අවිද්‍යා සංයොජනය, අවිද්‍යාවෙන් බැඳීම.

**අවිජ්ජොඝ** පු-අවිද්‍යා සඞ්ඛ්‍යාත ඔඝය, අවිද්‍යා නැමැති සැඩපහර.

**අවිඤ්ඤාණ**. ති-විඤ්ඤාණ රහිත, දැනගැනීම් නැති, අචිත්තක.

**අවිඤ්ඤාත** ති-අවබොධ නොකළ, නොදත්, අප්‍රසිද්ධ.

**අවිඤ්ඤු**. පු-අඥානයා, මෝඩයා, ජඩයා.

**අවිතක්ක**. ති-විතර්ක රහිත, 'විතක්ක' බලනු.

**අවිතථ** න-(අ + විතථ) සැබෑ තෙපුල. ති-අසත්‍ය නොවන.

**අවිද්දසු**, ති-(න=අ + විද්දසු) අප්‍රාඥ, අපණ්ඩිත, මෝඩ.

**අවිදිත** ති-(න=අවිදිත) අවබෝධ නොකළ, නොදත්.

**අවිදූර**. ති-දුර නොවන, සමීප, කිට්ටු.

**අවිනාස**. පු-අවිනාශය, නොවැනසීම.

**අවිනාසක**. ති-විනාශ නොවන, විනාශ නොකරණ.

**අවිනාසන**. න-නොනැසීම, විනාශ නොකිරීම.

**අවිනිච්ඡය** පු-(අ + වි + නිච්ඡය) නිශ්චය නැති බව. ති-විනිශ්චය රහිත, එකාන්ත නොවන.

**අවිනිච්ඡයඤ්ඤු**. ති-විනිශ්චය නොදන්නාසුළු.

**අවිනිපාත**. ති-විනිපාත නොවන, විවසව පතිත නොවන, නපුරු කොට පතිත වීම් රහිත.

**අවිනිබ්භුජති**. ක්‍රි-(අ + වි + නි + භුජ. d. රූ. පාලනෙ. රක්ඛිමෙහි + ති) වෙන් නොකරයි, වෙනස් නොකරයි.

**අවිනිබ්භොග**. ති-වෙන් නොකටහැකි, වෙනස් නොකටහැකි.

**අවිනිබ්භොගරූප**. න-වණ්ණ ගන්ධ රස ඔජ, සතර මහාභූත යන මේ රූප අට. (වෙන් කර ගත නොහැකි හෙයින් මොහු අවිනිබ්භොගරූප නම් වේත්.)

**අවිනිත**. ති නොහික්මුනු, අකීකරු.

**අවිප්පවාස**. පු වෙන් නොවන වාසය, එකට විසීම.

**අවිප්පටිසාර**. පු-විපිළිසර නොවීම, පසුතැවිලි නොවීම.

**අවිප්පවාස**. පු-වෙන්ව නොවිසීම, එකට විසීම.

**අවිප්පවාසසම්මුති** ඉ-තුන්සිවුරෙන් වෙන්ව විසීමට සඞ්ඝයා විසින් භික්ෂු නමකට දෙන සම්මුතියක්.

**අවිප්පවාසසීමා**. ඉ-තුන්සිවුරෙන් වෙන්ව විසීමෙන් වරදක් නොවන ලෙස සම්මත කළ සීමාව.

**අවිපරිණාම**. පු නොපෙරළීම. ති විකාර නොවන, වෙනස් නොවන, ස්ථිර.

**අවිපරිණාමධම්ම** පු-නොපෙරළෙන ස්වභාවය, වෙනස්නොවන ගතිය, එකාකාරයකින් පවත්නා ස්වභාවය. ති එබඳු ස්වභාවය ඇති.

**අවිභූත** ති-අප්‍රකට, අප්‍රසිද්ධ, නොපතළ.

**අවියත්ත**. ති-අව්‍යක්ත, දක්ෂ නොවන.

**අවිරත**. න නිරන්තරය, නිතොර.

**අවිරාධන**. න නොවැරුද්දීම.

**අවිරුද්ධ**. ති-විරුද්ධ නොවන, සතුරු නොවන.

**අවිරූළ්හ**. ති නොහටගත්, නො උපන්.

**අවිරූළ්හධම්ම**. පු-නොහටගන්නා ස්වභාවය, නැවත නූපදනා ස්වභාවය. ති-එබඳු ස්වභාව ඇති.

**අවිරූළ්හිච්ඡන්ද**. ති-විරූළ්හිච්ඡන්ද නොවන, පුනර්භව සඞ්ඛ්‍යාත විරූළ්හිය (=හටගැන්ම) පිණිස වූ ආසා නැති.

**අවිරොධ**. පු-විරොධ රහිත බව, විරුද්ධ නැති බව, එකට ගැළපීම. ති-විරුද්ධ බැව් නැති

**අවිරොධධම්ම**. පු-අවිරුද්ධස්වභාවය, එකට ගැළපෙන ස්වභාවය. ති-ඒ ස්වභාවය ඇති.

**අවිරොධන**. න-විරුද්ධ නොවීම.

**අවිලම්බිත**. ති-ලැසි නොවන, ශීඝ්‍ර.

**අවිලුත්ත**. ති පැහැර නොගත්, බලෙන් උදුරා නොගත්,

**අවිවට**. ති-අප්‍රකට, අප්‍රසිද්ධ, විවෘත නොවන.

**අවිවදමාන**. පු විරුද්ධවාද නොකරණ.

**අවිවය්හ**. ති විවාහයට නුසුදුසු. 'විවාහ' බලනු.

**අවිවාද**. පු-විවාද රහිත බව. ති විරුද්ධවාද නැති.

**අවිවදමාන**. ති-(න+විවදමාන) වාද විවාද නොකරණ.

**අවිවිච්ච**. පූ. ක්‍රි-(අ+වි+විච d විවෙචනෙ, වෙන් කිරීමෙහි. ත්වා=රච්ච) වෙන්නොවී. විවේක නොගෙණ.

**අවිවිත්ත**. ති (අ=න+විවිත්ත) කාය විවේකාදිය නැති, පළිබොධ සහිත.

**අවිස්සජ්ජන**. න-විසි නොකිරීම, නොහැරීම.

**අවිස්සජ්ජිය**. ති-නොදිය හැකි, නොහැරිය හැකි, දුරුනොකට හැකි.

**අවිස්සාස** ති-විශ්වාස රහිත, ඇදහිලි නැති. පු විශ්වාස නොකිරීම.

**අවිසංවාද**. පු-(අ=න+වි+සං+වාද) නොරුවටීම, සත්‍යවචන කීම, බොරු නොකීම.

**අවිසංවාදක**. ති-අවිසංවාද ඇති.

**අවිසංවාදන**. න-බොරු නොකීම. නොරැවටීම.

**අවිසංවාදී**. ති-විසංවාද නැති, බොරු නොකියන.

**අවිසය**. පු-විෂය නොවූ තැන, අයුතු තැන,

**අවිසාරද**. පු-විසාරද නොවන, පණ්ඩිත නොවන, අශ්‍රේෂ්ඨ, බිය නොවන. 'විසාරද' බලනු.

**අවිසාරී**. ති නො පතළ, අප්‍රකට. පු-එනම් ගීතස්වරය.

**අවිසාහාර**. පු-නොවිසිරීම, එකඟබව.

**අවිහ**. පු එනම් බඹලොව.

**අවිහිංසා**. ඉ-මෙරමාහට හිංසා නොකිරීම, පීඩා නොකිරීම, නොමැරීම.

**අවිහිංසාසඤ්ඤා.** ඉ-මෙරමාහට හිංසා නො-කිරීමේ සංඥාව.

**අවිහිත.** ති-නොදක්වන ලද, නොකරණලද.

**අවිහෙඨක.** ති-හිංසා නොකරණ, පීඩා නොකරණ.

**අවිහෙඨන.** න-පීඩා නොකිරීම, හිංසා නොකිරීම.

**අවිහෙස.** ති-වෙහෙස රහිත, පීඩා නැති.

**අවීචි.** ති-(අ=න + වීචි) අතරක් නැති, එකාබද්ධ. දියරැළ නොමැති. පු-අවීචිනිරය.

**අවීචිනිරය.** පු-ගිනිදැල්වලින් වත් දුකෙන් වත් සතුන්ගෙන් වත් අතරක් නැති නිරය, අටමහනිරයෙන් එකක්.

**අවීත.** ති-පහ නොකළ, දුරු නොකළ, ක්‍ෂය නොකළ,

**අවීතරාග.** පු-ප්‍රහීණ නොකළ රාගය. ති-පහ නොකළ රාගය ඇති.

**අවීතික්කම.** පු-අව්‍යතික්‍රමය. නොඉක්මවීම.

**අවීතික්කමණ.** න-ව්‍යතික්‍රමණය නොකිරීම, ඉක්ම නොයෑම.

**අවුට්ඨික.** ති-වැහි නැති.

**අවුත්ත** න නොකියන ලද්ද, ප්‍රකාශ නො-කරණලද්ද.

**අවුත්තසිද්ධිනය.** පු-කියනලද වචනයන්-ගෙන්ම නොකී දෙයත් දතහැකි වීමේ රීතිය, අනුක්ත සිද්ධිනය.

**අවූපසන්ත.** ති-නොසන්සිඳුනු, නොසන්සුන්.

**අවූපසමන.** න-නොසන්සිඳීම, ශාන්ත නොවීම

**අවූපසමිත.** ති-නොසන්සිඳුවන ලද, ශාන්ත නොකරණ ලද.

**අවෙක්ඛති.** ක්‍රි-(අව+ඉක්ඛ d. භූ දස්සනෙ, දැකීමෙහි+ති) බලයි, පරීක්‍ෂා කරයි.

**අවෙක්ඛණ.** න-බැලීම, පරීක්‍ෂා කිරීම.

**අවෙක්ඛිත.** ති-බලනලද, පරීක්‍ෂා කළ.

**අවෙකල්ල.** න-විකල නොවන බව, අඞ්ග ප්‍රත්‍යඞ්ගාදිය පිළිබඳ විකාර නොමැති බව. ති-විකලබවක් නැති.

**අවෙච්ච.** පු. ක්‍රි-(අ+වි+ඉ. d. ගතියං, යාමෙහි. ත්වා=රච්ච.) ප්‍රතිවෙධ කොට. දැනගෙණ.

**අවෙච්චප්පසාද.** පු-අචලප්‍රසාදය, ගුණ දැන පැහැදීම.

**අවෙධ.** ති-කම්පා නොවීම, නොසෙල්වීම.

**අවෙධඞ්ගික.** ති-(අවෙධ+අඞ්ගික) නොසෙල් වෙන අවයව ඇති.

**අවෙධධම්ම.** පු-අචඤ්චලස්වභාවය, නිශ්චල ගතිය. ති-ඒ ස්වභාව ඇති.

**අවෙභඞ්ගි (ය) ක.** ති-කොටස් නොකටහැකි. නොබෙදිය හැකි.

**අවෙර.** න-වෛර නොකිරීම. ති-වෛර නැති.

**අවෙරී** ති-වෛර නැති.

**අවෙලා.** ඉ-අකාලය, අසීමාව.

**අවොසිත.** ති (අ+වොසිත) අවසන් නොකළ. කෙළවර නොකළ.

**අස්නාති.** ක්‍රි-(අස. d. කී. භොජනෙ, අනුභව කිරීමෙහි+නා+ති) වළඳයි, අනුභව කරයි. "පුත්තානං ඵලමස්නාති."

**අස්ම.** පු-ගල, පාෂාණය.

**අස්මපුප්ඵ.** න-ගල්මල්, ගල්සෙවෙල.

**අස්මසාර.** පු. න-යකඩ.

**අස්මිමාන.** පු මම වෙමියි යන මානය, අහඞ්කාරය.

**අස්ස.** පු අශ්වයා, අසු, වන්නේය යන අර්ථ ඇති ක්‍රියාවක්.

**අස්සකණ්ණ.** පු අශ්වකර්ණය, අසුගේ කණ, සල්ගස, අසුගස, එනම් පර්ණය.

**අස්සඛලුඞ්ක** පු-අශ්වපොතකයා. නාඹු අශ්වයා, උතුම් අශ්වයා.

**අස්සජි.** පු-පස්වග මහණුන් වහන්සේලාගෙන් පස්වැනි රහතුන් වහන්සේ.

**අස්සත්ථ.** පු-ඇසතුගස, ඇසටුබෝ ගස. ති-අස්වැසීමට පැමිණි, සැනසිලි ලත්.

**අස්සතර.** පු-කොටළුවාට දාව අශ්වධේනුව ගෙන් හෝ අසුට දාව කොටළුදෙනගෙන් හෝ උපන් අහසින් ගමන් කළහැකි අශ්වයා, අශ්වවිශේෂයක්, යක්ෂ කොට්ඨාසයක්.

**අස්සතරී.** ඉ-අශ්වතරධේනුව.

**අස්සසති**. ක්‍රි-(ආ+සස d. භූ. ප්‍රාණනෙ, ජීවත් වීමෙහි+ති) ආශ්වාස කරයි.

**අස්සති** ක්‍රි-(අසු d දි. ඛෙපෙ, දැමීමෙහි+ති) දමයි.

**අස්සද්ධ**. ති-ශ්‍රද්ධා නැති.

**අස්සද්ධිය**. න-ශ්‍රද්ධා රහිත බව, ඇදහීම් නැති බව.

**අස්සදම්ම**. පු-අශ්වාචාර්‍ය්‍යයා, අසුන් දමනය කරන්නා.

**අස්සපදවිග්ගහ**. පු-සමස්‍යමාන පදයන්ගෙන් විග්‍රහ නොවන්නේ අස්සපදවිග්ගහ නමි.

**අස්සපුට**. න-(=භස්මපුට) හිසෙහි අළු විසිරවීම. අළු පොට්ටනිය.

**අස්සපොතක**. පු-තාඹු අශ්වයා, තරුණ අශ්වයා.

**අස්සභණ්ඩ**. පු-(අස්සබන්ධ?) අශ්වපාලකයා.

**අස්සම**. පු-ආශ්‍රමය, තාපසාරාමය, පන්සල, අසපුව.

**අස්සම**. පු. න-චතුරාශ්‍රම. බ්‍රහ්මචාරී ගෘහස්ථ වානප්‍රස්ථ භික්ෂු හෝ පිරිවැජි යන ආශ්‍රම සතර.

**අස්සමණ්ඩල**. න-අස්මඩුල්ල, අස්හල.

**අස්සමණ්ඩලික**. පු-අස්මඩලෙහි නියුක්තයා.

**අස්සමණ**. පු-අශ්‍රමණයා, ශ්‍රමණ නොවන්නා, භික්ෂු නොවන්නා, ශ්‍රමණගුණ නැත්තා.

**අස්සමාරක**. පු-අසුන් මරන්නා. කණේරුගස.

**අස්සමුට්ඨික**. පු-එනම් තවුස් වෙසෙස. මිටින් ගලක් හෝ වැපොරෝ ආදී අන් සැතක් හෝ ගෙණ හැසිරෙණ, බඩගිනි වූ විට හමුවූ ගසක පොතු අනුභව කොට පෙහෙවස් ඉටා සිවු බඹසර වඩන තවුස් වෙසෙස (සුත්ත නිපාතට්ඨ කථා හිරිසුත්ත වණ්ණනා.)

**අස්සමේධ**. පු අසුන් මරා කරණ බිලි පූජාව. යාගවිශෙෂයක් 'පඤ්චමහායාග' බලනු.

**අස්සයුජ**. පු-අස්විද නැකත. එයින් යුත් පස ළොස්වක ඇති මාසය, වප්මස.

**අස්සර**. පු-ස්වර නැති. එනම් ව්‍යඤ්ජනාක්ෂරයි.

**අස්සල**. පු-එනම් ඍෂියා.

**අස්සලක්ඛණ**. න-අශ්වයන්ගේ ශුභාශුභ ලක්ෂණ ප්‍රකාශ කරණ ශාස්ත්‍රය.

**අස්සලණ්ඩ**. න-අස්වසුරු, අශ්වබෙටි.

**අස්සලායන**. පු-මේ බ්‍රාහ්මණ මානවකයා තවත් පිරිසක් කැටුව බුදුන්වෙත පැමිණ බණ අසා තුණුරුවන් සරණගිය කෙනෙකි. තමාගේ ගේ ඇතුලෙහි දාගැබක් කෙළේය. (අස්සලායන සූත්‍රය බලන්න.)

**අස්සව**. ති-කීකරු පු-ප්‍රතිඥාව, පූජාව, සැරව.

**අස්සවණ**. න-අශ්‍රවණය, නො ඇසීම.

**අස්සවණතා**. ඉ-නො අසන බව, අශ්‍රවණය.

**අස්සවණීය**. ති-ශ්‍රවණය නො කටයුතු, නො ඇසියයුතු.

**අස්සවති**. ක්‍රි-(අ+සු d. භූ. සවනෙ, වහනය වීමෙහි+ති) වැගිරෙයි, ගලාබසියි.

**අස්සවතික** ති-(අස්ස+වත+ඉක) අශ්වව්‍රත ඇති, අසුන් මෙන් හැසිරෙණ.

**අස්සවන** න-වැගිරීම, ගලාබැසීම. "සෙය්‍යථාපි භික්ඛවෙ දුට්ඨාරුකා කට්ඨෙන වා කඨලාය වා ඝට්ටිතා භීයොසොමත්තාය **අස්ස-වන්ති**."

**අස්සවති** ක්‍රි-(ආ+සු d. භූ සවනෙ, ගලායාමෙහි+ති) ගලායයි. වැගිරෙයි.

**අස්සසදස්ස**. පු-උත්තම අශ්වයා, ශ්‍රෙෂ්ඨ අශ්වයා.

**අස්සා**. ඉ-අශ්වධෙනුව, වෙළඹ.

**අස්සාසක**. පු-බලාපොරොත්තු, ප්‍රාර්ථනා, "පුබ්බෙමෙ හනෙත කුමාරස්ස සතො පඤ්ච අස්සාසකා අහෙසුං."

**අස්සාජානීය**. පු-(අස්ස+ආජානීය) ආජානීය අශ්වයා, උතුම් අශ්වයා.

**අස්සාද** පු-ආස්වාදය, මධුරාදි රසය, රස විඳීම.

**අස්සාදන**. න-ආස්වාදනය, රස විඳීම, අනුභව කිරීම.

**අස්සාදෙති**. ක්‍රි-(ආ+සද d. චු. අස්සාදෙ, ආස්වාදනයෙහි + ණෙ + ති) ආස්වාදනය කරයි, රස විඳගණී, අනුභව කරයි.

**අස්සාරෝහ.** පු-අශ්වාරෝහකයා, අසුපිට යන්නා.

**අස්සාවෙසි.** ක්‍රි-(අ+සු. d සු. සවණෙ, ඇසීමෙහි+ණෙ+ඊ) ඇස්වීය.

**අස්සාස** පු-ආශ්වාසය, අස්වැසීම, සැනසිල්ල, හුස්ම ගැණීම.

**අස්සාසප්පත්ත.** ති-අස්වැසීමට පැමිණි, සැනසීමට පැමිණි.

**අස්සාසපස්සාස** පු ආශ්වාසය හා ප්‍රශ්වාසය, හුස්ම ගැණීම හා හෙළීම

**අස්සාසික.** ති-අස්වසන, සනසන.

**අස්සාසිත.** ති ආශ්වාසයට පැමිණි, සනසන ලද.

**අස්සාසෙති.** ක්‍රි (ආ+සස. d භූ. පාණනෙ, ජීවත්වීමෙහි+ණෙ+ති) සනසයි.

**අස්සිත.** ති විශෙෂයෙන් ආශ්‍රය කළ, ඇසුරු කළ.

**අස්සිරි.** ඉ-අශ්‍රිය, කාලකණ්ණි.

**අස්සු** අ-පදපූරණයෙහි නිපාතයක්. වන්නාහ යන අර්ථ ඇති ක්‍රියාවක්.

**අස්සු** න-කඳුළු, නෙත්ජලය.

**අස්සුධාරා** ඉ-කඳුළුධාරාව.

**අස්සුත.** ති-නො අසනලද, නොඇසූ, ශ්‍රැති විරහිත.

**අස්සුතවන්තු.** ති-අශ්‍රැතවත්, ඇසූ පිරූ තැන් නැති, ධර්මවිනයාදියෙහි හා ස්කන්ධායතනාදියෙහි නොහසළ ප්‍රඥ ඇති.

**අස්සුතාවී.** ති-අශ්‍රැත ස්වභාවය ඇති.

**අස්සුමොචන.** න-කඳුළු මිදීම, කඳුළු වැටීම, හැඬීම,

**අස්‍යාදිවිධි.** පු නාමකාර්‍ය්‍යයක් සිදුනොවන්නේ අස්‍යාදි විධි නම් වේ. අස්‍යාදිවිධිය.

**අස.** d භූ. දිත්ත්‍යාදානෙසු, බැබලීමෙහි, ගැණීමෙහි+ති. අසති, බබලයි, ගණියි,

**අස** d. කි. භොජනෙ, අනුභවයෙහි+ති. අස්නාති, අනුභව කරයි.

**අස** d. සු. ව්‍යාපනෙ, ව්‍යාප්තියෙහි, අසුණාති, ව්‍යාපත වෙයි, පැතිරෙයි.

**අස** d භූ. භුවි, වීමෙහි. අත්ථි, වෙයි, සිදු වෙයි.

**අසක්කච්චං.** අ-නොසකස් කොට, යහපත් නොකොට යන අරුත්හි.

**අසකිං** අ-නොයෙක්වර, බොහෝවර.

**අසක්‍ය** ති-සාක්‍ය වංශයට අයත් නො වූ, එම වංශයේ නූපන්.

**අසඞ්කච්චික** ති තන වැස්ම නැති, තන වසා පොරවන ලද සිවුරු නැතිව.

**අසඞ්කිණ්ණ.** ති-අසඞකිණි, නොගැවසීගත්.

**අසඞ්කිලිට්ඨ.** ති-කිලුටුනොවූ, පිරිසිදු නැති.

**අසඞ්කුප්ප.** ති-කොප්‍ය නොවන, වෙනස් නොවන.

**අසඞ්ඛත** න-ප්‍රත්‍යයයන් විසින් රැස්නොකළ, සංස්කරණය නොකළ. න-නිර්වාණය.

**අසඞ්ඛතධාතු.** ඉ නිර්වාණ ධාතුව.

**අසඞ්ඛතලක්ඛණ** න-අසඞ්ඛත ධර්මයාගේ ලක්ෂණය. (උත්පාද-ස්ථිති-භඞ්ග යන ලක්ෂණත්‍රය නොපෙණීම අසඞ්ඛත ලක්ෂණ යයි)

**අසඞ්ඛාරපරිනිබ්බායී** පු-ඉ ප්‍රයොග රහිතව, වෙහෙස නොවී සැපසේ පිරිනිවන් පාන පුද්ගලයා.

**අසඞ්ඛොභිය** ති-නොකැලඹිය හැකි.

**අසඞ්ඛොභ.** පු-අචඤ්චල බව, කම්පා නොවීම.

**අසඞ්ඛ්‍ය.** න-ගණන් නිම නැති, සඞ්ඛ්‍යාවක් කළ නොහැකි

**අසඞ්ග** ති-නොඇලෙන.

**අසඞ්ගමානස** න-නො ඇලෙන චිත්තය.

**අසඞ්ගාහක** ති සඞ්ග්‍රහ නොවන, ඇතුළත් නොවන.

**අසංයත.** ති-සඤ්ඤත නොවන, සංයම රහිත.

**අසංයුත්ත** ති-යුක්තනොවූ, එකාබද්ධ නො වූ.

**අසංයොග.** පු-සංයොගයක් නැති, එනම් නොබැඳුනු ව්‍යඤ්ජනාක්ෂරයි

**අසංසග්ග.** පු-සංසර්ගනොවීම, එකතු නොවීම. ති-සංසර්ග නැති

**අසංසග්ගකථා.** ඉ-අසංසර්ගය පිළිබඳ කථාව.

(3731)

**අසංසට්ඨ.** ති එකට සංසර්ග නොවූ, කලවම් නැති.

**අසංසය.** පු සංසය රහිත බව ති-සැක නැති

**අසංවාස.** ති-එක්ව නොවිසීම.

**අසංහාරිය.** ති-ගෙණ ගිය නොහැකි.

**අසංහිර** ති පැහැර ගත නොහැකි

**අසජ්ජමාන.** ති නොගැටෙන, නොහැපෙන.

**අසජ්ඣායන.** න-නොහැදෑරීම, සජ්ඣායනා නොකිරීම

**අසඤ්ඤත.** ති සංයත නොවූ, නොහික්මුනු.

**අසඤ්ඤත්ති.** ඉ නොහැඟවීම, නොදැන්වීම

**අසඤ්ඤසමාධි.** පු අචිත්තකභාවයම උතුමැයි ගෙණ උපදවන සමාධිය.

**අසඤ්ඤභව.** පු රූපභවය, සිතෙහි දෙස් දැක අචිත්තකභාවය උතුම්යයි ඒ පිණිස භාවනා කොට ධ්‍යාන ලබා උපදනා අසඤ්ඤීභවය.

**අසඤ්ඤසත්ත.** පු-සොළොස් බඹතලයෙන් එකොළොස්වැනි බඹතලය. "නත්ථි සඤ්ඤා එතෙසන්ති අසඤ්ඤා, අසඤ්ඤායෙව සත්තා අසඤ්ඤසත්තා."

**අසඤ්ඤී.** ති-සංඥා නැති, හැඳිනීම් රහිත

**අසඤ්ඤීවාද.** පු අෂ්ටප්‍රකාර අසංඥීවාදය. (බ්‍රහ්මජාල සූත්‍රය බලනු)

**අසත්වවාචක.** න නිපාතපදය, ද්‍රව්‍ය සත්ව නම්. ද්‍රව්‍ය වාචක නොවන්නේ අසත්වවාචකයි.

**අසති.** ක්‍රි (අස. d. භූ, දිත්තියං, බැබලීමෙහි + ති) බබලයි.

**අසධම්ම.** පු අසත්පුරුෂධර්මය, මිථ්‍යාධර්මය. මෛථුනය.

**අසන්ත.** පු-අසත්පුරුෂයා නොසන්සුන් තැනැත්තා.

**අසන්ත විධි.** පු අවිද්‍යමාන විධිය, කිසිවිටක කිසි සූත්‍රයකින් සිදු නොවන කාර්‍ය්‍යය.

**අසන්තාසී.** ති-තැති ගැණීම් රහිත

**අසබ්බධාතුක.** න-අජ්ජතනී, පරොක්ඛා, කාලාතිපත්ති, භවිස්සන්ති යන ආඛ්‍යාත විභක්ති සතර අසබ්බධාතුක නම්. සර්ව ධාතුක සංඥා නොලබන බැවිනි.

**අසන්තුට්ඨි.** ඉ-අසතුට, අමනාපය, අසන්තුෂ්ටිය.

**අසන්තුට්ඨිතා.** ඉ-නොසතුටුබව, අසන්තුෂ්ට භාවය.

**අසනග්ගි.** පු හෙනගින්න

**අසනි.** ඉ-හෙනය, විදුලිය.

**අසනිපාත.** පු හෙන වැටී(දී)ම.

**අසනිවිච්චක්ක** න-සෙනපහර, අසනිපාතය.

**අසප්පාය** ති-නොසැප, අහිත.

**අසප්පුරිස.** පු-අසත්පුරුෂයා, දුෂ්ටයා.

> යං රාජතො හොති භයං මහන්තං,
> සබ්බස්සහරණාදි වධාදිකං ච,
> අකතඤ්ඤුනා සප්පුරිසෙන හොති,
> ආරාවසොභො පරිවජ්ජනීයො.

**අසපත්ත.** ති-(අ=න+සපත්ත) නොසතුරු, අවිරුද්ධ

**අසබ්භ** ති-අසභ්‍ය, අශීලාචාර, සභාවට යොග්‍ය නොවූ.

**අසබ්භි** අ-අසත්පුරුෂයා විසින්, 'සබ්භි' බලනු.

**අසබල.** ති-සබල නොවූ

**අසභාව.** පු-අස්වභාවය, නපුරු ස්වභාවය.

**අසම්පකම්ප** ති-කම්පා නොවන, නොසෙල්වෙන

**අසම්පජඤ්ඤ** න-මනාප්‍රඥා නැතිබව, නොදත් බව, අඥනභාවය.

**අසම්පජාන.** පු-යහපත් ප්‍රඥානැති (මනොරථ දූක. ත ප.)

**අසම්පවෙධි** ති නොවෙව්ලන, තැති නොගන්න.

**අසම්බාධ** ති සම්බාධ රහිත, හිරිහැර නැති. පු-සම්බාධ නැතිබව.

**අසම්පත්තගාහක.** න-වෙතට නොපැමිණි අරමුණු ගන්න (ඉන්ද්‍රිය) (ඉන්ද්‍රියයන් අතුරෙන් චක්ඛු-සොතවය අසම්පත්තගාහය ඇති ඉන්ද්‍රියයෝය යනු ඇතැම් ආචාර්‍ය්‍ය සම්ප්‍රදායයන්ගේ මතයකි.)

**අසම්භව** පු-නිතර සිදු නොවන, හදිස්සියෙන් සිදුවන, අහම්බයෙන් වන.

**අසම්භුණන** න-නොහැකිවීම, නොකට හැකි බව.

**අසම්පජානගගාහ.** පු-චේතනට නොපැමිණි අරමුණු ගැණීම.

**අසම්මූළ්හ** ති-නොමුළාබව, අවිනාසය

**අසම** ති-අසමාන, සමාන නොවන. පු බුදු රජ.

**අසමසම.** පු-අසමානයන්ට සමාන තැනැත්තා, බුදුරජ

**අසමාන.** ති-සමාන නොවන, එකාකාර නොවන.

**අසමාහිත.** ති-එකඟ නොකරණලද, සත්-නොසිඳි.

**අසරණ** ති-පිහිට නැති, අනාථ. පු-පිහිට නොවීම.

**අසරණී.** ති-අසරණවූ, පිහිටක් නැති.

**අසරූප.** පු-සමාන රූපයක් නැතිවීම, අව-ණියට ඉවණි ආදිය අස රූපයි.

**අසලලක්ඛණ** න-නො සැලකීම, මනාව ලක්-ෂණ නොවීම. ති-ලකුණු නැති.

**අසල්ලීන.** ති-නොසැඟවුනු, ගුප්ත නොවන.

**අසවණ්ණ.** පු-සමාන වණියක් නැතිවීම, එ ඔ දෙක.

**අසස්සත.** ති-ශාශ්වත නොවන, සර්කාලික නොවන.

**අසස්සතවාද.** පු-අශාශ්වතය යන වාදය

**අසහ්‍ය.** ති-නොමැඩිය හැකි, නොදිනිය හැකි, නොඉවසිය හැකි.

**අසහමාන** ති-නොඉවසන.

**අසහන.** න-නොඉවසීම, ක්ෂමා නොකිරීම.

**අසහාන.** පු-නොඉවසන, ක්ෂමා නොකරණ.

**අසහාය.** ති-සහාය රහිත, මිත්‍රයන් නැති, අසරණ.

**අසහිත.** ති-නොඉවසන ලද, ක්ෂමා නොකළ.

**අසාත.** ති නොමිහිරි, අමධුර.

**අසාතතා.** න-අමිහිරිබව.

**අසාතමන්ත.** න-අසාතමන්ත ජාතකයෙහි දැක්වෙන ස්ත්‍රීන්ගේ අගුණ ගැන විස්තර-යකි.

**අසාදිස** ති-අසමාන, උපමා රහිත.

**අසාදු.** න-අමධුර, මිහිරි නොවන.

**අසාධාරණ.** ති සාධාරණ නොවන, පක්ෂය-කට නොඅයත්.

**අසාමඤ්ඤ.** න-හැමටම සාධාරණ නොවීම, විශේෂය.

**අසාර.** පු-නිසරුබව, ති-හර නැති, ඵලනැති.

**අසාරද්ධ.** ති-සාරම්භ නැති.

**අසාරුප්ප.** ති-අහිත ඵලවන, අවැඩ දායක, නුසුදුසු. න-නුසුදුසුබව.

**අසාහස.** ති-දරුණු නොවන, සාහසික නොවන.

**අසි** පු කඩුව.

**අසිචම්ම.** න-කඩුව හා පළිහ.

**අසිත.** ති-ආශ්‍රය නොකළ, තෘෂ්ණා-දෘෂ්ටීන් ආශ්‍රය නොකළ.

**අසිථිල.** ති බුරුල් නොවන, දැඩි, තද

**අසිථිලපරක්කම.** පු-දෘඪපරාක්‍රමය, ස්ථිර වීයර්‍ය ති-එය ඇති

**අසිප්ප.** න-අශිල්පය, ශිල්ප නොදැන්ම ති-ශිල්ප නැති.

**අසිප්පජීවි.** ති-ශිල්පයකින් ජීවත් නොවන, ආජීවපාරිශුද්ධි ශීලය ඇති.

**අසිපත්තවන** න-අවීචි මහ නරකයට සමීපව පිහිටි නිරයකි. මෙය දුරසිට බලන්නන්ට රම්‍ය අඹවනයක් ලෙස පෙනේ.

**අසිසූනා** ඉ-කඩුව හා මස්ලොඹුව.

**අසීති.** ඉ-අසූව, 80.

**අසීල.** ති-සිල්නැති, දුශ්ශීල. න-ශීලයක් නොවීම.

**අසීලතා.** ඉ-සිල්නැතිබව, කම්මැලිබව.

**අසු.** d දි බෙපෙ, දැම්මෙහි, අස්සති, දමයි.

**අසු** d සු. ව්‍යාපනෙ පහළ කිරීමෙහි, අසුනාති පහළ කරයි.

**අසු.** ති 'අමු'ශබ්දයාගේ විකෘතියක්, අසවල්, මේ පු-ප්‍රාණිය (අසතීති අසු.)

**අසුක.** ති-'අමු'ශබ්දයාගේ විකෘතියක්, අසවල්

**අසුචි.** ති-අපවිත්‍ර දේ, මල, ගූථය.

(3820)

**අසුවිසඞකාසසරසමාචාර.** ති-මෙතෙම දුස්සීල යෙකැයි අනායයන් විසින් සැක කටයුතු හැසිරීම් ඇති.

**අසුඤ්ඤ.** ති-ශූන්‍ය නොවන, හිස් නොවන.

**අසුති.** ති-ශ්‍රැති රහිත, ශ්‍රවණය නැති, නොඇසීම.

**අසුද්ධ.** ති-අපිරිසිදු, ශුද්ධ නොවන, නිර්මල නොවන.

**අසුද්ධි.** ඉ-අශුද්ධිය, පිරිසිදු නොවීම.

**අසුණාති.** ක්‍රි-(අස. d සු. ව්‍යාපනෙ, ව්‍යාපනි යෙහි + උණා + ති) පතුරුවයි.

**අසුභ.** ති-සුභ නොවන, අයහපත්.

**අසුභකථා.** ඉ-දසවිධ අසුභයන් පිළිබඳ කථා.

**අසුභසමාපත්ති.** ඉ අශුභ භාවනාවෙන් උපන් සමාපත්තිය.

**අසුභසඤ්ඤා.** ඉ-උද්ධුමාතකාදි දසවිධ අසුභාරම්මණයන්හි උපදනා ප්‍රථමධ්‍යාන සහගත සංඥාව.

**අසුර.** ති-සුරනොවන. පු-අසුරයා.

**අසුර.** ති සුරනොවන දෙවියන්ට විරුද්ධ අය, දෙවාචිය සුරනති න ඊසනති න විරොචනතීති අසුරා, සුරානං පටිපක්ඛාතිවා අසුරා.

**අසුරභවන.** න-අසුරයන්ගේ වාසස්ථානය, මහමෙර පත්ලේ අසුර භවනය පිහිටා ඇත, කුලාවක ජාතකය.

**අසුරකාය.** පු-අසුරයොනිය, එනම් අපාය, අසුර සමූහය.

**අසුරත්ත.** න-අසුරභාවය.

**අසුරුත්ත.** ති-යහපත් නොවූ වචන, විරුද්ධ වචන.

**අසුරින්ද.** පු-අසුරයන්ගේ අධිපතියා. වෙපචිත්ති අසුරයා.

**අසුරොප.** පු-සුරොපිත නොවූ වචනය, නපුරු කොට කියන ලද වචනය, අසම්පූර්ණ වචනය, ක්‍රොධය, කුඩුකෝඩුකම, නපුරුකම, ව්‍යාපාදය, රළුවචනය.

**අසූයක.** ති-ඊර්ෂ්‍යා කරණ.

**අසෙ(ඛ)ඛ.** පු-අශෛක්ෂයා, හික්මී අවසන් කළ තැනැත්තා, රහතන්වහන්සේ.

**අසෙ(ඛ)ඛබල.** පු-රහතන්වහන්සේගේ බල.

**අසෙඛියධම්ම.** පු-අශෛක්ෂයන් තුළ පිහිටනා ගුණධර්ම දහය, එනම්:- (1) අසෙඛසම්මාදිට්ඨි (2) අසෙඛසම්මාසඞ්කප්ප, (3) අසෙඛසම්මාවාචා, (4) අසෙඛසම්මාකම්මන්ත, (5) අසෙඛ සම්මාආජීව, (6) අසෙඛසම්මාවායාම, (7) අසෙඛසම්මාසති, (8) අසෙඛසම්මාසමාධි, (9) අසෙඛසම්මාඤාණ, (10) අසෙඛසම්මා විමුත්ති.

**අසෙ(ඛ)ඛමුනි.** පු-රහතන්වහන්සේ.

**අසෙචනක.** ති-සෙවනය (=ඉසීම) නොකළ.

**අසෙසිත.** ති-සම්පූර්ණ, ඉතිරි නොකළ, ශෙෂනොකළ.

**අසෙවනා.** ඉ-නොසෙවීම, ආශ්‍රය නොකිරීම.

**අසෙවිතබ්බ.** ති-නොසෙවිය යුතු.

**අසෙස.** ති-ශෙෂනොවූ, ඉතුරුනොවූ, සියලු.

**අසෙසවිරාග.** පු-නිරවශෙෂ විරාගය.

**අසෙසවිරාගනිරොධ.** පු-විරාග සඞ්ඛ්‍යාත මාර්ගයෙන් කෙලෙසුන් ඉතිරි නොකොට නැසීම.

**අසොක.** ති-සොක රහිත, සොක නැති. පු-ශොක නොකිරීම.

**අසොචෙය්‍ය.** න-නොපිරිසිදු බව.

**අසොණ්ඩ.** ති-සුරාසොඩ නොවූ, මත්පැන් නොබොන.

**අසොකපිණ්ඩි.** න-අශොක අතු, අශොක මල්.

**අසොතතා.** ඉ-ශ්‍රොත නැතිබව, කන් නැතිබව.

**අස්සාදිට්ඨි.** පු-නාම කාශ්‍යයක් නොවත්තේ අස්සාදි විට් නම් වේ.

**අහ.** අ බෙදයෙහි, අහෝ-අනේ.

**අහ.** න-දවස, දිනය.

**අහං.** අ-අම්හ ශබ්දයාගේ ප්‍රථමා එකවචනය, මම. අහම්පායසමනොත කිඤ්චි න වක්ඛාමි.

**අහඞ්කාර.** පු-ආත්මාර්ථකාමිබව, උඩගුකම.

**අහත.** ති-නොතසන ලද, නොමරණ ලද, නොමැරූ.

**අහත.** න-අලුත් වස්ත්‍රය, තාත්පිළිය.

**අහත්පාස.** ති-අත්පසෙහි නොවූ.

(3862)

**අහමහමිකා.** ඉ-ඔවුනොවුන්ට කරණ අහඞකාරය.

**අහහ.** අ-ඛෙදයෙහි, විසමයෙහි, අහෝ, අපොයි යනාදි අර්ථයන්හි.

**අහහ** න-නිරබබුද සියක් ලක්‍ෂයක්, එනම් නිරය, අවිචියෙහි එක් පසෙක එපමණ කාලයක් දුක්විඳින බැවින් ඊට 'අහහ නිරය'යි ව්‍යවහෘතයි.

**අහරිත.** ති-නිල්පාට නැති, තණකොල නැති.

**අහාරිය.** ති-පැහැර නොගත හැකි, ග්‍රහණය නොකට හැකි.

**අහාපෙති.** (ක්‍රි. d හු. හා+ණෙ+ති) නොපිරි හෙලයි.

**අහි.** පු-සර්පයා, නාගයා.

**අහි.** d. ගතියං, යාමෙහි, අහති, යෙයි.

**අහිංකාර.** පු-අහඞකාරය, මම වෙමියි ගන්න මානය.

**අහිංසක.** ති-හිංසා නොකරණ.

**අහිංසා.** ඉ-අවිහිංසාව, පීඩා නොකිරීම, නොපෙළීම.

**අහිගුණ්ඩික.** පු-නයින් නටවන්නා පාම්බට්ටයා, අහිතුණ්ඩිකයා.

**අහිච්ඡත්තක (ක).** පු-නයිහතු. එනම් තාරජු.

**අහිත.** ති-අයහපත්, අමිත්‍ර.

**අහිතුණ්ඩික.** පු-අහිතුණ්ඩිකයා, නයින් නටවන්නා.

**අහිපෙත.** පු-නාගප්‍රෙතයා, සර්පශරීරයෙන් යුත් ප්‍රෙතයා.

**අහිඵෙන.** පු-අබින්.

**අහිමෙඛලා.** ඉ-අත්පා සතරෙහි නයින් සතර දෙනෙක්ද ග්‍රීවයෙහි එකෙක් ද හිසේ එකෙක් ද එකාංශ කොට එකෙක්දැයි මෙසේ ශරීරයෙහි නයින් ඔතා ගැණීමෙන් සැරසීම.

**අහිරාජකුල.** - සර්පරාජ කුලය.

**අහිරික.** න-පවට ලජ්ජිත නොවීම ති-විළි නැති.

**අහිලතා.** ඉ-බුලත්වැල.

**අහිවාතකරොග.** පු-එනම් රොගය. මෙය විෂවාතයෙන් හටගත්තේයයිද සර්පවිෂ වාතය හා මිශ්‍රවීමෙන් හටගත්තේයයිද සර්පවිෂයාගේ පැතිරීම මෙන් වහා වන පැතිරීම් ඇති දරුණු රොගයක් යයිද කියති. මෙය වසංගත රොගයකි.

**අහිවිජ්ජා.** ඉ-සර්පවිෂ වෙදකම, විෂවිද්‍යාව.

**අහීන.** ති-හීන නොවන, ලාමක නොවන.

**අහීනින්ද්‍රිය.** න-හීන නොවූ ඉන්ද්‍රියය, සම්පූර්ණ ඉන්ද්‍රියය. ති-එය ඇති.

**අහු.** ක්‍රි (අ+d හු+ඊ=උ) වීය. "අහුපපටි සාරො"

**අහුදෙව.** අ-වූයේමය. "අහුදෙව කුක්කුච්චං"

**අහෙඨන.** න-වෙහෙස නොකිරීම, පීඩා නොකිරීම.

**අහෙතු.** ති-හෙතු රහිත, කාරණ රහිත-'හෙතු' බලනු.

**අහෙතුකපටිසන්ධි.** ඉ-අලොභාදී හෙතුරහිත ප්‍රතිසන්ධිය, උපෙක්‍ෂා සහගත අකුසල විපාක සන්තීරණ සිතින් අපායෙහි වන ප්‍රතිසන්ධිය හා උපෙක්‍ෂාසහගත කුශල විපාක අහෙතුක සන්තීරණ සිතින් මනුෂ්‍යලොකයෙහි වන ජාත්‍යන්ධ-ජාතිබධිරාදීන්ගේ ප්‍රතිසන්ධිය. 'පටිසන්ධි' බලනු.

**අහෙතුකයොනි.** න-තිරිසන් යොනිය, අහෙතුක පටිසන්ධියකින් ලබන උත්පත්ති භූමිය.

**අහෙතුකවාද.** න-සත්ත්වයන්ගේ විසුද්ධියට හේතුවක් නැත යන වාදය.

**අහො.** අ-ශොක, නින්දා, විෂාද, දයා, විස්මය ප්‍රශංසා, විතර්ක යනාදියෙහි පවත්නා අව්‍යය ශබ්දයක්.

**අහො.** පු-දවස, දිනය 'අහොරත්තානුසික්ඛිතා'

**අහොරත්ත.** පු-දවාල හා රාත්‍රිය, රෑ දහවල්.

**අහොවත.** අ-අහෝ හොඳ, ඉතා යහපති, ඉතා යෙහෙක යනාදි අර්ථයන්හි.

**අහොසි.** ක්‍රි-(d හූ සත්තායං, වීමෙහි) වීය. වූයේ ය. බ්‍රහ්මචරියං චිරට්ඨිතිකං අහොසි."

**අහොසිකම්ම.** න-විපාක නොදෙන කර්මය, ඵල රහිත කර්මය, විපාක දීමට කාලවේලා නොලබන කර්මය.

**අළ.** (d හු-උග්ගමෙ, නැගීමෙහි) අළති, නගී.

**අළක.** න-හෙළවරා, පු-පිස්සුබල්ලා,

**අළාර.** ති-වක්වූ දෙය, ඇදවූ දෙය.

# ආ

**ආ** – පාලිවර්ණමාලාවේ දෙවැනි අකුර, අවර්ණයෙහි දෙවැනි ආ කාරය, උපසර්ග විස්සෙන් එකක්. සමීප, ආරම්භ, ආලිඞ්ගන, ප්‍රාප්ති, මර්‍යාදා, ඌර්ධ්වකම්ම, ඉච්ඡා, බන්ධන, අභිවෘද්ධි, ආවාස, ආමන්ත්‍රණ, ග්‍රහණ, දුඃඛ, ඊසදර්ථ, නිවෘත්ති, අප්‍රසාද, ආසිංසන, සමරණ, ප්‍රතිඥා, විශ්මය, ක්‍රොධ, සන්තොෂ, පීඩා, පදපූරණ යන මෙහි යෙදේ.

**ආංදොලිකා.** ඉ-දෝලාව, කූනම, පල්ලැක්කිය.

**ආකඞ්ඛති.** ක්‍රි-(ආ + කඞ්ඛ d භූ. කඞ්ඛනෙ, කැමැතිවීමෙහි + ති) කැමැතිවෙයි, ආසාකරයි. "සචෙ හොති භුත්තාවසෙසො, සචෙ **ආකඞ්ඛති** භුඤ්ජති."

**ආකඞ්ඛන.** න - කැමැත්ත, කැමැති වීම, ආසාවීම.

**ආකඞ්ඛනපටිබද්ධ.** ති - රුචියට ඇතුළත්, ආවර්ජන ඥානය පිළිබඳ.

**ආකඞ්ඛඵ.** ක්‍රි-(ආ + කඞ්ඛ d. භූ. කඞ්ඛනෙ, කැමැතිවීමෙහි + ඵ) කැමැතිවනු මැනවි, සතුටුවනු මැනවි.

**ආකඞ්ඛා.** ඉ-කැමැත්ත, ආසාව, තෘෂ්ණාව, රිස්ස.

**ආකඞ්ඛෙය්‍ය.** ක්‍රි-(ආ + d කඞ්ඛ භූ. කඞ්ඛනෙ කැමැතිවීමෙහි + එය්‍ය) කැමැතිවන්නේය, කැමැතිවන්නේ නම්. "**ආකඞ්ඛෙය්‍ය** චෙ භික්ඛවෙ භික්ඛු සබ්‍රහ්මචාරීනං."

**ආකඞ්ඛමාන.** පු-කැමැතිවන, කැමැතිවනු ලබන, "**ආකඞ්ඛමානො** සඞ්ඝො තජ්ජනීය කම්මං කරෙය්‍ය."

**ආකඩ්ඪති.** ක්‍රි-(ආ + කඩ්ඪ d. භූ. කඩ්ඪනෙ, කැඩීමෙහි-ඇදීමෙහි + ති) කඩයි, ඉදිරියට අදියි.

**ආකඩ්ඪන.** න-(ආ + d කඩ්ඪ + යු + අන) ඇදීම, ඉදිරියට ඇදීම, "**ආකඩ්ඪන** පරිකඩ්ඪන වසෙන."

**ආකඩ්ඪන්ත.** ති-(ආ + d. කඩ්ඪ + අන්ත) අදින, අදිමින්.

**ආකඩ්ඪමාන.** ති-ඉදිරියට අදිනුලබන්නාවූ "**ආකඩ්ඪමානා** විසිඛා සමීපං."

**ආකඩ්ඪිත.** ති-ඉදිරියට අදිනාලද, ආකර්ෂණය කළ.

**ආකඩ්ඪිත්වා.** පූ-ක්‍රි-ඇද, ඉදිරියට ඇද,

**ආකති.** ඉ-ආකෘතිය, ආකාරය, සැටිය, දෙවිසි අකුරකින් යුත් ඡන්දස ආකෘති නම් වේ.

**ආකතිගණ.** පු-ආකෘතිගණය, සූත්‍රයන්ගෙන් සිද්ධවූ ශබ්දානුසාරයෙන් එසේ සිදුවීම් ඇති අන්‍ය ශබ්ද සමූහය. "ආකති ජාති වුච්චති, තප්පධානා ගණා **ආකතිගණා**."

**ආකත්ථන.** න-ලොකුවට කථා කිරීම, පුවච්චම් දෙඩීම.

**ආකප්ප.** පු-ආකල්පය, වේශය, ආකාරය, සැටිය, ගමන ආදි ඉරියව් පැවැත්මෙහි ආකාරය. "**ආකප්පෙන** භික්ඛවෙ ඉත්ථිපුරිසං බන්ධති."

**ආකප්පති.** ක්‍රි-(ආ + කප්ප d. භූ. සාමත්ථෙ, පොහොසත් බැව්හි + ති) පොහොසත් වෙයි කැපවෙයි.

**ආකප්පන.** න-ආකල්පනය, සැරසීම.

**ආකප්පසම්පදා.** ඉ - ආකල්ප සම්පත්තිය, ආකාරයාගේ සුවිනීත භාවය, "අඩ්ඪමිදං භික්ඛවෙ ලාභානං යදිදං—**ආකප්පසම්පදා**."

**ආකප්පසම්පන්න.** ති - ආකල්පයෙන් යුත්, සැරසීමෙන් සම්පූර්ණ, ඉඳුම් සිටීම් ආදි ඉරියව් හොඳහැටි පවත්වන. "**ආකප්පසම්පන්නොති** සමණාකප්පෙන සම්පන්නො."

**ආකප්පිත.** ති-සරසනලද, සරසා පිළියෙල කළ,

**ආකම්පා.** ඉ-ස්වල්පයක් කම්පාවීම, මඳක් සෙලවීම,

**ආකම්පිත.** ති-කම්පාවනලද, චලනය වන ලද.

**ආකර.** පු-ආකරය, උත්පත්තිස්ථානය, හට-ගන්නා තැන.

**ආකරමුත්ත.** න-ආකරයන්හි උපදින මුතු විශේෂයක්.

**ආකස්සති.** ක්‍රි-(ආ + කස්ස d. භූ. ගතියං, යාමෙහි + ති) අදියි, ඉදිරියට අදියි, ආකර්ෂණය කරයි.

**ආකඩ්ඪන.** න-ආකර්ෂණය, ඉදිරියට ඇදීම.

**ආකාර.** පු-සැටිය, සටහන, ආකෘතිය, ඉඟිය. පිළිවෙල. අක්ඛර-පද-ව්‍යඤ්ජන-ආකාර-නිරුත්ති, නිද්දෙස, යන ව්‍යඤ්ජන පද ෂට්කයෙන් එකක්. "**ඉති සාකාරං** ස උද්දෙසං අනෙක විහිතං පුබ්බෙනිවාසං අනුස්සරති."

**ආකාරක.** පු-ආකෘති ඇත්තා, සටහන් ඇත්තා, ඉඟිඇත්තා.

**ආකාරපරිවිතක්ක.** න-කරුණු පරීක්ෂාකිරීම, ස්වභාවය සෙවීම, ආකෘතිය සොයා බැලීම.

**ආකාරාන්ත.** පු-සා, මා, ආදි පුල්ලිඞ්ගික ශබ්ද, කඤ්ඤා, සද්ධා ආදි ස්ත්‍රීලිඞ්ගික ශබ්ද, දා, ධා ආදි ධාතුහුද ආකාරාන්ත නම්.

**ආකාරපුච්ඡා.** ඉ-ආකාරය විචාරීම, ගිහි-තිත්ථික-පැවිදි ලිඞ්ගයන් ගැණ ප්‍රශ්නකිරීම, "**ආකාරපුච්ඡා** ති ගිහිලිඞ්ග වා තිත්ථිය ලිඞ්ග වා පබ්බජිත ලිඞ්ග වා."

**ආකාරවන්ත.** ති-කරුණු ඇති, හේතු ඇති, සටහන් ඇති, ආකෘති ඇති.

**ආකාස.** පු-අහස, අනාවරණ ස්ථානය, හිස්, අහසෙහි කරණ ක්‍රීඩා විශෙෂයක්, ආකාශ කසිනය වැඩීමට අරමුණු වශයෙන් ගන්නා ආකාශය, කිසුණු ඉගුලු අහස, කසිණු ගඝාටි මාකාසය. "න කස්සති න නිකස්සති කසිතුං වා ඡින්දිතුං වා න සක්කාති **ආකාසො**."

**ආකාසක.** ති-අහසෙහි වූ, වාතයට අයිති.

**ආකාසඞ්ගණ.** න-සඳලුතලය, සඳැල්ල.

**ආකාසානන්ත.** පු-කෙළවරක් නැති අහස, කිසුණු ඉගුළු අහස, එනම්:- කසිණ ආලොකය යම්තැනෙක පතුරුවනලද්ද, ඒ ආලොකය ඉවත්වූ කල ලැබෙන අහසයි.

**ආකාසචාරිකා.** ඉ-අහස් ගමන, අහස්හි හැසිරීම.

**ආකාසගඞ්ගා.** ඉ-අහස් ගඟ, දිව්‍යනදිය.

**ආකාසසලිල.** න-අහස්දිය, වැසිජලය,

**ආකාසගොත්ත.** පු-ශල්‍යකර්මයට දක්ෂ වූ ආකාසගොත්ත නැමැති වෛද්‍යවරයා. "**ආකාසගොත්තො** වෙජ්ජො සල්ලකම්මං කරොති."

**ආකාසචෙතිය.** න-ආකාශ චෛත්‍යය, පර්වත ශිඛර යෙහි කළ දා ගැබ.

**ආකාසට්ඨ.** ති-ආකාශස්ථ, අහසෙහි පිහිටි, ගුවනෙහි රැඳුන, ආකාශගත වස්තුව.

**ආකාසති.** ක්‍රි-(ආ+කාස d. භූ. දිත්තියං, දීප්තියෙහි+ති) දිලිසෙයි, දූල්වෙයි.

**ආකාසතල.** න-සඳැල්ල, සඳලුතලය, අහස් තලය, උඩුමහල්තලය.

**ආකාසපබ්භාර.** න-නෙරාගිය පර්වතයේ ගුහාව, කඳු ගුහාව,

**ආකාසධාතු.** ඉ-අහස, අභ්‍යවකාශය, ගුවන, විනාශ නොවී පවත්නා ස්වභාවය දූරීම.

**ආකාසපත්ත.** න-අහස්පත, සරුංගලය.

**ආකාසපදීප.** පු-අහසෙහි උඩ එල්ලෙන පහන.

**ආකාසමණ්ඩල.** න-අහස්මඬුල්ල, ආකාශ කසිනය වඩන යොගාවචරයාට ප්‍රතිභාග නිමිත්ත වැටහෙන පිළිවෙල.

**ආකාසයාන.** න-අහසින් යන යානාව, අහස්නැව, අහස්යාත්‍රාව.

**ආකාසානඤ්ච.** න-ආකාසය අනන්තයයි වැඩීම,

**ආකාසානඤ්චායතන.** න-රූපය නැති විසි දහසක් කපට ආයු ඇති හිත පමණක් පවත්නා පළමුවන අරූපාවචර බඹලොව, රූපය කෙරෙහි කලකිරී එයින් පහවීම පිණිස මෙම බඹලොව ඉපදීම සඳහා පැමිණෙන අකාසානඤ්චායතන සමාපත්තිය, අෂ්ටසමාපත්තීන්ගෙන් හා සිවුවැදෑරුම් අරූපභූමීන්ගෙන් එකක්, ප්‍රථමාරූප්‍ය චිත්තය. "එරණ වසෙන නත්ථි එතස්ස අන්තොති අනන්තො, ආකාසො අනන්තො-ආකාසානන්තො, කසිණුගඝාටිමාකාසො. ආකාසානන්තො යෙව = **ආකාසානඤ්චං**. තං, ආකාසානඤ්චං අධිට්ඨානට්ඨෙන ආයතනමස්ස සම්පයුත්තධම්මස්ස ඣානස්ස දෙවානං දෙවායතන මිවාති = ආකාසානඤ්චායතනං (පටිසම්භිදා අට්ඨකථා.)

**ආකාසානඤ්චායතන සමාපත්ති.** ඉ-ආකාසානඤ්චායතන ධ්‍යානයට සමවැදීම, ආකාසානඤ්චායතන මෙව සමාපත්ති. **ආකාසානඤ්චායතන සමාපත්ති.**

**ආකාසානඤ්චායතන සමාධි**. ඉ-ආකාසානඤ්චායතනයෙහි ඉපදීම පිණිස වඩනා සමාධිය, සමාධි බලනු.

**ආකිඤ්චඤ්ඤ**. න-අකිඤ්චනය, කිසිවක් නැති බව.

**ආකිඤ්චඤ්ඤායතන**. න-රූපය නොමැතිව හිත පමණක් පවතින සැට දහසක් කපට ආයු ඇති තුන්වන අරූපාවචර බ්‍රහ්ම ලොකය, විඤ්ඤාණඤ්චායතනයාගේ දොස් දැක ආකිඤ්චඤ්ඤායතනය විඤ්ඤාණඤ්චායතනයට වඩා ශාන්ත යයි ගෙණ ඒ විඤ්ඤාණයෙන් පහවීමට පැමිණෙන සමාපත්තිය, අෂ්ට සමාපත්තීන්ගෙන් හා සිව් වැදෑරුම් අරූප භූමීන්ගෙන් එකක්. "**අකිඤ්චනස්සභාවො ආකිඤ්චඤ්ඤං, ආකාසානඤ්චායතන විඤ්ඤාණාපගමසෙස තං අධි වචනං.**"

**ආකිණ්ණ**. ති-(ආ + d කිර + ත=ඉණ්ණ) ආකීර්ණ, ගැවසීගත්, හැණීගත්, පැතිරගිය.

**ආකිණ්ණ පරිකිණ්ණ**. ති-ගැවසීගත්, විශෙෂයෙන් ගැවසීගත්.

**ආකිණ්ණවිපුල**. ති-විපුල භාවයෙන් ගැවසී ගත්.

**ආකිණ්ණමනුස්ස**. ති-මිනිසුන්ගෙන් ගැවසුනු. "තෙන ඛො පන සමයෙන වෙසාලී ඉද්ධා ඵීතා - බහුජන **ආකිණ්ණ මනුස්සා** සුභික්ඛා ච හොන්ති."

**ආකිණ්ණවිහාර**. ති-හැසී ගැවසී විසීම, ආකීර්ණව විසීම.

**ආකිරති**. ක්‍රි-(ආ + කිර d. තු. විකිරණෙ, විසිරීමෙහි + ති) විසුරුවයි, ඉසියි.

**ආකිරිත්වා**. පූ. ක්‍රි-හලා, විසුරුවා, වත්කොට.

**ආකිරිතත්ත**. ති-ඉසීම් බව, විසිරීම් භාවය.

**ආකුඤ්චන**. න-ඇකිලීම, වකුටු කිරීම, නැමීම.

**ආකුඤ්චිත**. ති-අකුලන ලද, වකුටු කළ.

**ආකුමාර**. පු-කුමරු දක්වා, කුමාර කාලය දක්වා.

**ආකුල**. න-අවුල, පටලැවිල්ල, එකඟ නොවීම, එකට ගැටෙන,

**ආකුලසමාකුල**. න-අවුල් වියවුල් වූ, විශෙෂයෙන් අවුල් වූ.

**ආකුලනීය**. ති-අවුල් විය යුතු, එකඟ නොවිය යුතු.

**ආකුලාකුල**. න-(ආකුල + ආකුල) අවුලෙන් අවුලට පත් වූ, අතිශයින් අවුල් වූ.

**ආකුලි**. පු-ආකුල භාවය, අවුල් බව.

**ආකොටන**. න-(ආ + කුට d + යු=අන) කෙටීම, තැළීම, පොඩි කිරීම, ඇපිල්ලීම මැදීම, පහරදීම.

**ආකොටිත**. ති-(ආ + කුට d + ඉ + ත) කොටන ලද, පොඩිකළ, ඇපිල්ලූ.

**ආකොටිත පච්චාකොටිත**. ති-හැම අතින්ම කෙටූ, සර්වප්‍රකාරයෙන්ම පොඩිකළ.

**ආකොටෙති**. ක්‍රි-(ආ + කුට d. භූ. ඡෙදෙ, සිඳීමෙහි + ති) කොටයි, සිඳියි, අපුල්ලයි, හිඳුවයි, ගසයි.

**ආකොටෙසි**. ක්‍රි-(ආ + කුට d. භූ. ඡෙදෙ, සිඳීමෙහි + සි) පහර දුන්නේය. ගැසුවේය. "උක්කාසිත්වා අග්ගලං **ආකොටෙසි**."

**ආඛ්‍යා** ඉ-සංඥාව, නාමය, නම, කථනය. අභිධානය.

**ආඛ්‍යායිකා**. ඉ-දන්නා ලද අර්ථ ඇති කථාව, දන්නා ලද වෘත්ති අර්ථ ඇති වාසවදත්තාදි ගද්‍ය පද්‍ය ප්‍රබන්ධ විශෙෂයක්, කථානායකයා විසින් තමන්ම කියන ලද වෘත්තාන්තය.

**ආඛ්‍යාත**. ති-කියන ලද, ප්‍රකාශ කළ, ආඛ්‍යාත පද, "යං තිකාලං තිපුරිසං ක්‍රියාවාචි තිකාරකං, අත්තිලිඞ්ගං ද්විවචනං **තදාඛ්‍යාතන්ති** වුච්චති."

**ආඛ්‍යාතික** පු-(ආඛ්‍යාත + ඉක) ආඛ්‍යාතයට අයත්, අවසාන ක්‍රියා කොටසට අයත්.

**ආඛණ්ඩල**. පු-ශක්‍රයා, ශක්‍රදෙවෙන්ද්‍රයා, සක්දෙව්රජ.

**ආඛු**. පු-මීයා, මූෂිකයා.

**ආඛුපණ්ණී**. ඉ-මීනුග, මීකන්පලා.

**ආඛු පාසාණ** පු-කාන්දම් ගල, සුදු පාෂාණම්

**ආඛුභුජ**. පු-මීයන් කන්නා, බළලා.

**ආග.** ක්‍රි-ආවේය යන අර්ථ ඇති අතීත ක්‍රියාවක්.

**ආගඤ්ඡි.** ක්‍රි-(ආ + ගමු d. භූ ගතියං, යැමෙහි + චඡ + ඤ්ඡාදෙශය.) ආවේය, පැමිණියේය.

**ආගච්ඡති.** ක්‍රි-(ආ + ගමු d. භූ. ගතියං) යාමෙහි + චඡ + ති) එයි. ආගමනය කරයි, පැමිණෙයි.

**ආගච්ඡන්ත.** ති-එමින්, එන.

**ආගත.** ති-පැමිණි, අවබොධකළ, දනගත්. "ආගතො බො මහාසමණො මගධානං ගිරිබ්බජං."

**ආගතාගත.** ති-(ආගත + ආගත) ආ ආ, පැමිණි පැමිණි.

**ආගතානාගත.** ති-පැමිණි නො පැමිණි, දනගත් නොගත්. "තෙනහි ත්වං ගහපති ජෙතවනං ආගතානාගතස්ස චාතුද්දිසස්ස සඞ්ඝස්ස පතිට්ඨාපෙහි."

**ආගතාගම.** පු-අධිගත බැවින් ආ ආගම ඇත්තේ, "තත්‍ථ අඤ්ඤතරො භික්ඛු ආගච්ඡති බහුස්සුතො ආගතාගමො."

**ආගතපටිපාටි.** ඉ-ආ පිළිවෙල, පැමිණි ක්‍රමය, වැඩිමහළු පිළිවෙළ, වැසිකිළි - කෙසකිළි - නහන තොට යන තැන්හි වැඩිමහළු පිළිවෙල නොව පැමිණි පිළිවෙල ම ගනු ලැබේ. "ආගත පටිපාටියා'ති වච්චකුටියං පස්සාවට්ඨානෙ නහාන තිත්‍ථෙ'ති තීසුපි ආගත පටිපාටියෙව පමාණං."

**ආගතඵල.** ති-පැමිණි මග ඵල ඇති, සෝවාන් ඵලය අවබොධ කළ, "ආගත ඵලං අස්සා'ති=**ආගතඵලා**, පටිලද්ධ සොතාපත්ති ඵලා'ති අත්‍ථො."

**ආගතභාර.** න-තමන් විසින් ඉසිලිය යුතු බර, ආගත භාරය, පැමිණි බර, ස්ථවිර භික්ෂුවක් විසින් කළයුතු දය,

**ආගතමග්ගාභිමුඛ.** ක්‍රි-වි-ආ මගට අභිමුඛ කොට.

**ආගතසුබ්බ.** න-පැමිණි, ආවිරූ

**ආගතභව.** පු-ආ භවය, පැමිණි භවය.

**ආගතභාව.** පු-ආ බව, පැමිණි බව.

**ආගද.** න-වචනය, කථාව.

**ආගන්තු.** පු-අවස්ථාව, අමුතුවෙන් පැමිණෙන්නා.

**ආගන්තුං.** ක්‍රි-වි-එන්ට, පැමිණෙන්නට.

**ආගන්තුක.** (ග) පු-ආගන්තුකයා, අමුත්තා, අතිථියා.

**ආගන්තුක භත්ත.** න-අමුත්තන්ට දෙන බත, අතිථි බත, ආගන්තුක භික්ෂූන්ට දෙන දනය, මේ සඳහා විශාඛා මහා උපාසිකාව ලැබූ වර අටෙන් එකක්. "ඉච්ඡාමහං භන්තෙ, සඞ්ඝස්ස යාවජීවං **ආගන්තුක භත්තං** දතුං."

**ආගන්තුක වත්ත.** න-වෙහෙරට අමුතුවෙන් පැමිණෙන භික්ෂූන් විසින් කළයුතු වත්-සිරිත් විරිත්, වස් විසීමේදී ආගන්තුක භික්ෂූන් විසින් පිළිපැදිය යුතු වත්, ආවාසික භික්ෂූන් විසින් ආගන්තුක භික්ෂූන්ට කළයුතු වතාවත්.

**ආගන්තුක සක්කාර.** න-අමුතුවෙන් පැමිණි අයට කරණ සත්කාර, එබඳු භික්ෂූන්ට කරණ සත්කාර.

**ආගන්තුක සඞ්ගහ.** න-අමුතුවෙන් පැමිණියවුන්ට කළ යුතු සංග්‍රහ, එබඳු භික්ෂූන්ට කළයුතු සංග්‍රහ - පා සේදීම්, තෙල් ගැල්වීම් ආදිය.

**ආගන්ත්වා.** (න) පු. ක්‍රි-අවුත්, පැමිණ, ඇවිත්.

**ආගම්ම.** පූ. ක්‍රි-(ආ + ගමු d. + ත්වා=මම. ධාත්වන්ත ලොපය) අවුත්, පැමිණ.

**ආගම.** පු-ධර්මය, ශාසනය, දෙශනාව, පැමිණීම, අවබොධය, දික්සඟිය ආදි නිකාය පස, බලාපොරොත්තුව, උපදෙශය, වර්ණයක්හුගේ අමුතුවෙන් පැමිණීම. "**ආගමෙ** ජුණ්ණෙ පචාරෙය්‍යාම" ආගම යනු මෙහි මතු පැමිණෙන යන අර්ථයි.

**ආගම - අධිගම.** පු - බුද්ධවචනය හා ලොකොත්තර ධර්මය.

**ආගමන.** න-ඊම, ඒම, පැමිණීම, ඉදිරියට ඒම.

**ආගමන මග්ග.** පු-පැමිණීමේ මාර්ගය, පෙරලා එන මග, එන මග.

(4023)

**ආගමන සද්ධා**. ඉ-බෝසත්වරුන්ගේ ශ්‍රද්ධාව, අභිනීහාරයෙහි පටන් ආ බැවින් බෝසත් වරුන්ට අයිති ශ්‍රද්ධාව.

**ආගමන පටිපදා**. ඉ-නිවන් අවබෝධය පිණිස පළමුවෙන් කළයුතු පිළිවෙත.

**ආගමසද්ධම්ම**. පු-මගපල හා නිවන, මාර්ග ඵල හා නිර්වාණය, ත්‍රිපිටක ධර්මය, බුද්ධ වචනය.

**ආගමවිරොධි**. පු-ත්‍රිපිටක පර්‍ය්‍යාප්තියට විරුද්ධ බාහිර ශ්‍රැති හා ධර්මසංහිතා.

**ආගමා**. ක්‍රි-ගියේය යන අර්ථයක් ඇති අතීත ක්‍රියාවක්.

**ආගමයති**, ක්‍රි-(අ + ගමු d. මූ. ඊසං අධිවාසෙ, මදක් ඉවසීමෙහි ණ + ය + ති) බලාපො-රොත්තුවෙයි.

**ආගමම**. පූ ක්‍රි-පැමිණ, අවුත්, "යං භික්ඛවෙ පුග්ගලං ආගම්ම වදාමි."

**ආගමි**. පු-එක් පදයක අන්තයද, අනික් පදයේ ආදියද ආගමයට ස්ථානවනුයේ ආගමි නම්වේ.

**ආගමෙති**. ක්‍රි-ආගමයති බලනු.

**ආගමෙහි**. ක්‍රි-(අ + ගමු + d. + එ + හි) බලා පොරොත්තු වෙව, ඉවසව, "ආගමෙහි ත්වං සාරිපුත්ත."

**ආගම්ක**. පු-ආගමයට අයත්, අනාගත කාලය

**ආගාමී**. පු-(ආ + ගමු. d + ණී) මත්තෙහි පැමි-ණෙන, එන, මතු පැමිණෙන තැනැත්තා, නැවත එන අය.

**ආගාමික**. පු-අනාගත කාලය, මතු පැමිණෙන.

**ආගාමිතා**. ඉ-මතු පැමිණෙන බව.

**ආගාර**. න-ගෙට අයිති, ගිහිගෙය පිළිබඳ.

**ආගාරක**. ති-ගෙහිවූ, ගෙට අයිතිවූ.

**ආගාරික**. ති-ගිහිගෙයි වැසි, ගිහි, "මයං බො භන්තෙ ආගාරිකා."

**ආගාරපටිපදා**. ඉ-ගිහියන් විසින් පිළිපැදිය යුතු ප්‍රතිපදාව, ගිහි පිළිවෙත.

**ආගාළ්හ**. ති-දැඩි, කුරිරු, රළු, තද,

**ආගාළ්හපටිපදා**. ඉ-දුෂ්කරවූ පිළිපැදීම ඇති ප්‍රතිපදාව, ගාඪප්‍රතිපත්තිය, කර්කශ ප්‍රතිපදාව, දැඩි පිළිවෙත.

**ආගිලායති**. ක්‍රි-(ආ + ගල d දි. භාසක්ඛයෙ, සතුට නැසීමෙහි + ය + ති) රිදෙයි, ගිලන් වෙයි, රුජා කෙරෙයි. "පිට්ඨං මෙ ආගිලායති."

**ආගු**. ක්‍රි-"ආහ" යන අර්ථ ඇති අතීත ක්‍රියාවක්.

**ආගු**. න-පාපය, අපරාධය, අපරාධකරු, පව් කරන්නා.

**ආගු**. ඉ-ප්‍රතිඥාව, පොරොන්දුව.

**ආගුචාරී**. පු-පව්කාරයා, පහත්ලෙස හැසි-රෙන්නා, නීච හැසුරුම් ඇත්තා, සොරා, අපරාධ කාරයා. "ආගුචාරිං" චොරං ගහෙත්වා.

**ආඝට්ටිත**. ති-ගලපනලද, ඇදන ලද.

**ආඝාත**. පු-වෛරය, කොපය, වධය, වධක ස්ථානය, විනාශය, නැසීම. 'ආඝාතං බන්ධති.'

**ආඝාතන**. න-වධකස්ථානය, සතුන් මරණ තැන, දම්ගෙඩිය, "ආඝාතනන්ති ධම්ම ගණ්ඩිකා වුච්චති."

**ආඝාතවත්ථු**. න-ආඝාතයට කරුණු, වෛර බැඳීමට හේතුවන කරුණු අනත්ථං මෙ අචරි, චරති, චරිස්සතීති යනාදීන් දැක්වෙන නව ආඝාත වස්තුව, අස්ථාන කෝපයත් සමග දස ආඝාත වස්තුවෙක් වෙයි.

**ආඝාතපටිවිනය**. න-ක්‍රොධය නැසීම්, කෝපය ඉවත්කර ගැනීම.

**ආඝාතනනිස්සිත**. න-වධකස්ථාන ඇසුරුකළ පෙදෙස.

**ආඝාතිත**. පු-ක්‍රොධයෙන් ගසන ලද, මරණ ලද, පහරණ ලද, ආඝාත බඳනා ලද,

**ආඝාතුක**. පු-(ආ + හන d. = ඝාත + ණුක) නසන්නා.

**ආඝාතෙති**. ක්‍රි-(ආ + හන d. චු. ඝාතනෙ නැසීමෙහි + ණෙ + ති) නසයි. මරයි.

**ආච්ඡාදෙති**. ක්‍රි-(ආ + ඡාද d. භූ. ඡාදනෙ, හැඳීමෙහි + ණෙ + ති) හඳියි, රෙදි හඳියි, පිළි හඳියි.

**ආච**. පු-තබරස්ජනී යයි ව්‍යවහෘත මරි-තොණ්ඩුගස.

**ආචමති.** ක්‍රි-(ආ + චමු d. භූ. සොධනෙ. පිරිසිදු කිරීමෙහි + ති) සෝදයි, පිරිසිදු කරයි.

**ආචමන.** න-සේදීම, ජලයෙන් අත් පා මුව ආදිය සේදීම, වැසිකිළි කොට වර්චස් සේදීම, "ආචමනන්ති උදකෙන මුඛ සුද්ධි කරණං"

**ආචමනඋදක.** න-වැසිකිළියෙහි පරිභොග ජලය. "ආචමනඋදකාවසෙසං භාජනෙ ඨපෙතබ්බං."

**ආචමනපාදුකා.** ඉ-අත්පා ආදිය සේදීමට පාවිච්චි කරණ ලෑල්ල, අත්පා සේදීමෙන් පසු පාවිච්චි කරණ පාවහන්, වැසිකිළියේ වර්චස් සෝදන පාදුකාව. "ආචමනපාදුකාය ඨිතෙන උබ්භජිතබ්බං"

**ආචමනසරාවක.** න-වැසිකිළියේදී අත් පා සේදීම් ආදියට වතුර ගන්නා සැන්ද හෝ භාජනය-මලාව. "න ආචමනසරාවකෙ උදකං සෙසෙතබ්බං."

**ආචමනකුම්භී.** ඉ වැසිකිළියේ අත්පා සේදීම් ආදියට වතුර ගන්නා කළගෙඩිය හෙවත් භාජනය, "සචෙ ආචමනකුම්භියං උදකං න හොති."

**ආචමා.** ඉ-උරා ගැණීම, නියුක්ත වීම.

**ආචමයති.** ක්‍රි-(ආ + චමු d. චු සොධනෙ, පිරිසිදු කිරීමෙහි + ණය + ති) සෝදයි, පිරිසිදු කරයි.

**ආචමෙති.** ක්‍රි-ආචමයති බලනු.

**ආචමු.** ක්‍රි-ආ + චමු. d චු. ධොවනෙ, සේදීමෙහි) සේදුවේය. පිරිසිදු කෙළේය.

**ආචය** පු-රැස් කිරීම, එක්කාසු කිරීම, කෙලෙස් රැස් කිරීම.

**ආචයගාමී.** පු-රැස්කරන්නා, එකතුකරන්නා, කෙලෙස් රැස් කරන්නා.

**ආචරති.** ක්‍රි-(ආ + චර. d භූ. සංචරණෙ, හැසිරීමෙහි + ති) හැසිරෙයි, එහාට මෙහාට ගමන් කරයි.

**ආචරණ.** න-ආචාරය, ක්‍රියාව, හැසිරීම.

**ආචරි.** ක්‍රි-(ආ + චර. d. චු. චරණෙ, හැසිරීමෙහි + ඊ) හැසුරුණේය, කෙළේය.

**ආචරිත්වා.** පූ-ක්‍රි-(ආ + චර + ත්වා) හැසිරී," යං අනාචාරං ආචරිත්වා,"

**ආචාර.** පු-චාරිත්‍රය, මනා පැවැත්ම, හැසිරීම, චරිතය.

**ආචරිය** පු-ආචාර්‍ය්‍යයා, හික්මිය යුතු ධර්මයෙහි පිහිටුවන්නා, ධර්මශාස්ත්‍රාදිය උගන්වන්නා, ඇදුරා, පබ්බජ්ජා-උපසම්පදා-නිස්සය-උද්දෙස කියා ආචාර්‍ය්‍යවරු සතර දෙනෙකි.

**ආචරියක.** ති-ආචාර්‍ය්‍යයන්ට අයිති, ආචාර්‍ය්‍ය පරපුරට ඇතුළත්, "සකං ආචරියකං උග්ගහෙත්වා."

**ආචරියඋග්ගහ** පු-ආචාර්‍ය්‍යයන් වෙතින් ඉගෙණීම, පරම්පරාගත ඇදුරන් වෙතින් ඉගෙණ ගැනීම

**ආචරියඋපද්දව.** පු ඇදුරන් වෙතින් වන විපත්-උපද්‍රවය.

**ආචරියකම්ම.** න-ඇදුරාගේ කාර්‍ය්‍යය, ඉගැන්වීම.

**ආචරියකිච්ච.** න-ගුරුවරයා විසින් කටයුතු වැඩ.

**ආචරියකුල.** න-ආචාර්‍ය්‍යකුලය, ඇදුරුපරපුර.

**ආචරියගහණ.** න-ගුරුවරයෙකු පත්කර ගැනීම.

**ආචරියචතුක්ක.** න-පරිවාර පාලියෙහි දක්වා ඇති ආචාර්‍ය්‍ය චතුෂ්කය.

**ආචරියධන.** න-ගුරුදක්ෂිණාව, ඇදුරු බැලය, ආචාර්‍ය්‍ය ධනය.

**ආචරියධනු.** න-ඇජර දුන්න, මහා දුන්න, නව වියත් ප්‍රමාණ මහා දුන්න. "ආචරියධනු නාමපකති හත්ථෙන නව විදත්ථිපපමාණ.

**ආචරිය පරම්පරා.** ඉ ඇදුරු පරපුර, ත්‍රිපිටකය පිළිබඳ ආචාර්‍ය්‍ය පරම්පරා කීපයක් පෙර තිබින නිදර්ශනයක් වශයෙන් කියතොත් විනයපරම්පරාව - දඹදිව උපාලි, දාසක, සොණක, ආදි මහරහතුන් වහන්සේලා හා ලක්දිව, මිහිඳු මහ රහතුන් වහන්සේ ආදි කොට ඇත්තාහුද දැක්විය හැක. "පරම්පරාභතා තස්ස නිපුණා අත්ථ වණ්ණනා." යනාදීන් පෙණෙන්නේ අනුරාධපුර මහාවිහාර පරම්පරාවයි.

**ආචරියපාචරිය.** පු-ආචාර්‍ය්‍ය ප්‍රාචාර්‍ය්‍ය, ගුරුවරයා හා ගුරුවරයාගේ ගුරුවරයා. "ආචරියස්ස ආචරියො පාචරියො."

**ආචරියභරියා.** ඉ-ඇදුරු බිරිඳ, ආචාර්ය භාර්යාව.

**ආචරියභාග.** පු-ශාස්ත්‍ර ඉගැන්වූ ගුරුවරයාට දෙන ගුරු පඬුරු, ආචාර්ය භාගය,

**ආචරියමග්ග.** පු-ආචාර්යයන්ගේ කථා මාර්ගය,

**ආචරියමත්ත.** න-ගුරුවරයෙකු වැනි, ආචාර්ය සමාන.

**ආචරියමතික.** පු-ගුරුමතය නො ඉක්මවන, ආචාර්යමතයෙහි සිටින.

**ආචරියමුඛ.** න ගුරුවරයෙකු හමුව, ගුරුමුව

**ආචරියමුට්ඨි.** ඉ-ගුරුවරයන් ශිෂ්‍යයන්ට නොකියා රහසේ තබා ගන්නා කොටස, ගුරුමිට. 'නත්ථානන්ද තථාගතස්ස ධම්ම-විනයෙ **ආචරියමුට්ඨි.**''

**ආචරියලෙස.** පු-ගුරුවරයා හා එක් කොටස කින් සමාන බව, ආචාර්ය ලෙශය.

**ආචරියවත්ත.** න-ඇදුරුවත්, අන්තෙවාසික යන් විසින් ගුරුවරුන්ට කළයුතු වතාවත, ගුරුවරුන් විසින් අතැවැසියන්ට කළ යුතු වත්, (චුල්ලවග්ගපාලි වත්තක්ඛන්ධකය.)

**ආචරියවාද.** පු-ආචාර්ය වාදය, ස්ථවිරවාද යෙන් අන්‍යවූ මහායාන නිකාය, මහාසංඝි කාදි භික්ෂුනිකායයෝ. 'අට්ඨාරස **ආචරිය වාදා** දුතියෙ වස්ස සතෙ උප්පන්නා.''

**ආචරියසුද්ධි.** ඉ-ආචාර්ය පරම්පරාවෙන් ආ පිරිසිදු දැනීම, ආචාර්ය ශුද්ධිය.

**ආචරියානී.** ඉ-ආචාර්ය භාර්යාව, ගුරු බිරින්ද,

**ආචාම.** පු-බත්දන්කුඩ, බතින් පෙරූ කැඳ, කැඳ.

**ආචාමභක්ඛ.** පු-බත් දත් කුඩ බුදින්නා.

**ආචාරකුසල.** පු-මනා පැවැත්මෙහි දක්‍ෂ, ආචාරයෙහි දක්‍ෂ.

**ආචාරගත.** ති-චරිතය, ආචාරයට ඇතුළත්,

**ආචාරපුත්ත.** පු-ආචාරවත් කුලපුත්‍රයා, මනා කුල සිරිත් ඇති කුල පුත්‍රයා.

**ආචාරභෙද.** පු-චාරිත්‍ර විශෙෂයක්.

**ආචරිත.** ති ඇසුරු කළ-කරණලද, හැසි-රෙණ ලද, ව්‍යවහාර කළ,

**ආචාරගොචර.** පු-ආචාරය හා ගොචරය, ධර්මානුකූල හැසිරීම හා ගොචරය,

**ආචාරවිපත්ති.** ඉ ආචාර විපත්තිය, පාරාජික සඞ්ඝාදිසෙසාපත්ති දෙක හැර ඉතිරි පඤ්චාපත්තිස්කන්ධය ආචාර විපත්තියි.

**ආචාර විනය.** පු-හැසිරීමෙහි දක්‍ෂබව, ආචාර සමාචාර දෙකින් රැකියයුතු චාරිත්‍ර ශීලය.

**ආචාරදිට්ඨි.** ඉ-ආචාර විපත්තිය හා දිට්ඨි විපත්තිය.

**ආචාරචොදනා.** ඉ-ආචාර විපත්තියෙන් චොදනා කිරීම,

**ආචාරවිපන්න.** ති-අනියත, පචිති, පාටිදෙස නීය, සෙඛියා, අධිකරණ සමථ යන පඤ්චාපත්තිස්කන්ධයන් අතුරෙන් යම් ඇවතකට පැමිණ එයින් නැගී නොසිටින්නා.

**ආචික්ඛති.** ක්‍රි (ආ+චික්ඛ d. භූ වාචෙ, කීමෙහි +ති) කියයි, ප්‍රකාශ කරයි. දන්වයි.

**ආචික්ඛන.** න-කීම, ප්‍රකාශ කිරීම, දැන්වීම.

**ආචික්ඛන්ත.** ති-කියමින්, ප්‍රකාශ කරමින්.

**ආචික්ඛිත.** ති-කියූ, ප්‍රකාශ කළ, දැන්වූ.

**ආචික්ඛිතමග්ග.** ති-කියූපාර, කියනලද මාර්ගය.

**ආචික්ඛිතු.** පු කියන්නා, දන්වන්නා, ප්‍රකාශ කරන්නා.

**ආචිණ්ණ.** ති ආචීර්ණ, පුරුදු කළ, පරම්පරාවෙන් පුරුදුවී පවතින, ප්‍රකෘතිය, ස්වභාවය.

**ආචිණ්ණකප්ප.** පු-පරම්පරාවෙන් පුරුදු කරණ ලද්ද, ආචීර්ණ කල්පය, විශාලාමහ නුවර වජ්ජිපුත්‍රක භික්ෂූන් ඉපදවූ දශවස්තු වෙන් එකක්, පරම්පරාවෙන් පුරුදු කළදේ, එසේ කිරීම වැරදි නැත යන මතය.

**ආචිණ්ණසමාචිණ්ණ.** ති-පුරුදුකළ, මතා කොට පුරුදු කළ,

**ආචිණ්ණපරිචිණ්ණ.** ති-පුරුදුකළ, නිතර පුරුදුකළ, එවැනි සිරිත් විරිත්,

**ආචිණති.** ක්‍රි-(ආ+චි. d. කි. චයෙ, රැස්කිරී-මෙහි+ණ+ති) රැස්කෙරෙයි, එකතුකරයි.

**ආචිත.** ති-පුරුදු කළ, ප්‍රගුණ කළ, රැස්කළ.

**ආචියති.** ක්‍රි-(ආ+චි d. කි. චයෙ-රැස්කිරීමෙහි ය+ති) වැඩෙයි, දියුණු කරයි, ගොඩගසයි.

**ආචේර**. පු-ආචාර්යවරයා, ගුරුවරයා.

**ආචේල**. ති-අබරණින් සැරසුනු-ආභරණයන් ගෙන් අලංකාර කළ.

**ආචේරක**. න-ආචාර්ය මතය, ආචාර්යවාදය, "ආචේරකම්හි ච සකෙ විසාරදෙ."

**ආජඤ්ඤ**. පු-ආජානීය නම් අශ්වයා, ආජානීය නම් උසස් කුලයෙන් උපන් අශ්වයා.

**ආජඤ්ඤරථ**. න-ආජානීය අශ්වයන් යෙදූ රථය, "ආජඤ්ඤ යුතෙනා රථො ආජඤ්ඤ රථො"

**ආජව**. න-උරා ගැනීම, නියුක්තවීම.

**ආජාන**. ති-අවබෝධ කරගත හැකි, තේරුම් ගත හැකි.

**ආජානන**. න-ඉගෙණුම, දැනීම, තේරුම් ගැනීම, ඥානය.

**ආජානාති**. ක්‍රි-(ආ+ඤා d. භූ. අවබොධෙ-නා+ති) තේරුම් ගනියි, දනියි, උගනියි.

**ආජානීය**. (අ) ඒ ඒ ජාතියෙන් උත්තමයා යන අර්ථයෙහි වූ ආජානීය ප්‍රත්‍යය උතුම් යන අර්ථයයි. එනම් උතුම් අශ්වයා.

**ආජානීය සුසු**. පු-උතුම් අශ්ව පැටියා. ආජානීය අශ්වයා.

**ආජානීයතා**. ඉ-ආජානීයත්වය, උසස් උත්-පත්තියක් ඇතිබව.

**ආජිකාසප්පි** න-එළුකිරෙන් සෑදූ ගිතෙල්, එළු ගිතෙල්.

**ආජිර**. න-රාජාංගනය, මිදුල, රජ මිදුල.

**ආජීව**. න-ජීවනොපාය, ජීවිකාව, දිවෙල, පැවතීම.

**ආජීව පාරිශුද්ධි**. ඉ-ආජීව පාරිශුද්ධිය. මිථ්‍යා ජීවයෙන් වෙන්ව සම්‍යක් ජීවිතයක් ගත කිරීම. දැහැමෙන් සෙමෙන් දිවි පැවැත්ම.

**ආජීව විපත්ති**. ඉ-දැහැමෙන් සෙමෙන් දිවි පැවැත්මට ඇති බාධා.

**ආජීවසම්පදා**. ඉ-ධාර්මික ජීවිතයක් ගත කිරීමට හේතුවන සම්පත්.

**ආජීවට්ඨමකසීල**. න-ආජීවය අටවැනි කොට ඇති සීලය, ත්‍රිවිධ කාය සුචරිතය, චතුර්විධ වාක් සුචරිතය හා පරිශුද්ධ ආජීවය යන අට.

**ආජීවක**. පු-ජීවිකාව සොයන අය, තාපස කොටසක්, බුද්ධ කාලයේ විසූ ආජීවක නිකායට අයිති තාපස කොටසක්.

**ආජීවකසාවක**. පු-ආජීවිකයන්ගේ ගිහි ගෝලයා, අසන්නා.

**ආජීවකචොදනා**. ඉ-ආජීව විපත්තියෙන් චොදනා කිරීම, සිව්වැදෑරුම් චොදනාවන් ගෙන් එකක්.

**ආජීවභණ්ඩක**. න-ජීවත්වීමට සුදුසු වස්තුව, ජීවිතය ගෙණයෑමට අවශ්‍ය උපකරණ.

**ආජීවපුච්ඡා**. ඉ-ආජීවවිපත්තිය විචාරීම, සිවුවැදෑරුම් විපත්තීන්ගෙන් කවර විපත්තියදැයි විචාරීම.

**ආජීවික**. න-ජීවිතයේ පැවැත්ම, ජීවිකාව, ජීවත්වීම.

**ආජීවිකාපකත**. ති-ජීවත්වීමක් නැති, ජීවිකා වෘත්තියෙන් තොර කළ.

**ආට**. පු-එක්තරා පක්ෂි වර්ගයකට අයත් කුරුල්ලෙක්. හැන්දක් වැනි හොට ඇති කුරුල්ලෙක්, "ආටාති දබ්බමුඛ සකුණො"

**ආටවිය**. ති-වනයට අයත්, කැලෑවට අයිති.

**ආටානාටිය**. න-ආටානාටිය සූත්‍රය, දික් සඟියේ පාථික වර්ගයට අයත් සූත්‍රයක්, පිරිත් කීමේදී හමාර බණවරට ඇතුළත් කොට දෙසනු ලැබේ. "ආටානාටෙ (නගරෙ) කතං, ආටානාටියං" ආටානාටියංති ආටානාට නගරෙ බද්ධත්තා එවං නාමං."

**ආඨපන**. න-තැබීම, ඉදිකොට තැබීම.

**ආඨපනා**. ඉ-තැබීම, හොඳට තැබීම, සුදුසු ලෙස තැබීම.

**ආඨපිත**. ති-උකස, උකස් තබන ලද්ද, ණයක් ගත් විට එය දෙනතුරු ණය හිමියා වෙත තබන ලද දෙය.

**ආඩම්බර**. න-දර්පය, ගර්වය, හර්ෂය, එඩිය, ධන ගර්වය, ආරම්භය.

**ආඪක**. න-ලාහ, ලාස්ස, ආඪකය, ලහසුබව.

**ආඪක**. පු-ආළුහකය, පත සතර, සම්පූර්ණ ද්‍රෝණ, ධාන්‍ය මුෂ්ටි 221, ද්‍රෝණයකින් සතරෙන් කොටස, ලාස්ස.

**ආණත්ත.** ති-අණවනලද, නියම කරණ ලද.

**ආණත්ති.** ඉ-අණ කිරීම, අණකිරීම නම් නිස්සය පණ්ණමතයයි. ආණත්තිය, නිස්සය පණ්ණමතය බිඳෙන කරුණුවලින් එකක්, "එත්ථ ආණත්තීති ආණාපනං වුච්චති."

**ආණත්තික්ඛණ.** න-අණ කළ මොහොත, ඇණවූ ක්ෂණය, "ආණාපකස්ස ආණත්තික්ඛණෙ ආපත්ති."

**ආණත්තිනිශාමක.** පු-ඇණවීම සිදුකරණ-සිදුකරන්නා. ප්‍රාණතිපාතය පිළිබඳ ප්‍රයොග සයෙහි ඇණවීම සිදු කරණ, (මනුස්ස විග්ගහ පරාජිකා)

**ආණත්තික.** පු-ඇණවීම කරන්නා, අදිත්නා දන පාරාජිකාවේ සාහත්ථික පඤ්චකයෙහි එක අඞ්ගයක්,

**ආණත්තික.** පු-විධායකයා, අණවන්නා, විදාතේ.

**ආණත්තිකපයොග.** පු-ඇණවූ කෙණෙහිම අනුන් සතු වස්තුව ගැණීමෙහි යෙදීම, ආණත්තික ප්‍රයොගය.

**ආණත්තික මනුස්ස ඝාත.** න-නියම කිරීමෙන් කරණු ලබන මිනිස් දිවිතොර කිරීම - මනුෂ්‍ය ඝාතනය.

**ආණාඅරහ** ති-නියම-අණකිරීමට සුදුසු, නියමයන් පැණවීමට යොග්‍ය,

**ආණාක්ඛෙත්ත.** න-ආඥා ක්ෂෙත්‍රය, අණ පැතිරීමේ පෙදෙස - භූමිය, තෙවැදෑරුම් බුද්ධක්ෂෙත්‍රයන්ගෙන් එකක්, රතන සූත්‍රාදීන්ගේ ආනුභාවය කෙළ ලක්ෂයක් සක්වල පවත්නා බැව් දෙශිතයි.

**ආණාචක්ක.** න-අණසක, ආඥා චක්‍රය.

**ආණාදෙසනා.** ඉ-ආණා දෙශනාව, විනය පිටක, පිටකත්‍රය අතුරෙන් විනය පිටකය අණ බහුල කොට දෙශනා කළ බැවින් ඊට ආණා දෙසනා යන නම ලැබින. "ආණාරහෙන භගවතා ආණාබාහුල්ලෙන දෙසිතත්තා ආණා දෙසනා."

**ආණාපාණසති.** ඉ-ආශ්වාස ප්‍රශ්වාසයන් සිහියේ තබාගෙණ කරණ භාවනාවකි. (සතිපට්ඨාන සූත්‍රය)

**ආණාපාතිමොක්ඛ.** පු-ආණා ප්‍රාතිමොක්ෂය, අඩ මසක් පාසා උදෙසියයුතු ප්‍රාතිමොක්ෂය, භික්ෂු-භික්ෂුනීන් විසින් පොහොය සීමාවත්හි දී මෙය දෙශනා කළ යුතුයි.

**ආණාසම්පන්න.** ති-අණින් යුක්ත වූ, ආඥා සම්පන්න වූ,

**ආණා.** ඉ-නීතිය, ආඥාව, අණ, නියොගය, විධානය. ව්‍යවස්ථාව,

**ආණාදෙසනා.** ඉ-ආඥාව බහුලකොට ඇති දෙශනාව, විනය දෙසනාව, විනය පිටකය.

**ආණාපක.** පු - (ආණා + ප + ණවු = අක) විධායකයා, අණවන්නා.

**ආණාපන.** න-විධානය, ඇණවීම, නියොගය.

**ආණාපවත්ති.** ඉ-අණ පිහිටුවීම, විධානකිරීම.

**ආණාපිත.** ති-අණවන ලද, විධාන කරණලද.

**ආණාපිය.** පූ: ක්‍රි - අණ කොට, ගෙන්වා.

**ආණාපෙති.** ක්‍රි-(ආණ d. චු. පෙසනෙ, මෙහෙයීමෙහි + ණෙ + ති) මෙහෙයයි, අණවයි.

**ආණාපෙත්වා.** පූ: ක්‍රි-ගෙන්වා, අණවා.

**ආණි.** ඉ-ඇණය, රිය සකෙහි අකුර අග ගසන ඇණය, කඩ ඇණය.

**ආණිචොලක.** න-වැරහැලි රෙදි කෑල්ල, කිලුටු රෙදි කඩ.

**ආණිමාර.** න-පවුරුවලින් වට කරණ ලද නගරයක කුඩාදොර.

**ආතඞ්ක.** පු-රොගය, ආබාධය, සන්තාපය, තැවීම.

**ආතඞ්කඵස්ස.** පු-රොග ස්පර්ශය, රෝගයක පහස.

**ආතඞ්කී.** පු-රෝග ඇත්තා, ලෙඩා, රෝගියා.

**ආතත.** ති-තබනලද, රත්කළ, තම්බනලද,

**ආතත.** න-සමින් වෙළන ලද බෙර ආදිය අතුරෙන් එක් මුහුණකින් යුත් තූර්‍යභාණ්ඩය, සැළ බෙර, වජ්‍ර බෙර ආදිය, පතළ.

**ආතත විතත.** න-සම්භාගයෙන් සමින් වෙළන ලද තූර්ය විශෙෂය, පණාබෙර ආදිය.

**ආතප.** පු-හිරු රැස්, අව්ව, ඉර අව්ව, සූර්ය තාපය.

**ආතප වාරණ.** න-ඉරු රැස් මුවහකරන දෙය, කුඩය, ඡත්‍රය.

**ආතප්ප.** පු. න-වීර්යය, උත්සාහය, කෙලෙසුන් තැවීම පිණිස කරණ වීර්යය.

**ආතපත්ත.** න-අව් අත්ත, ඡත්‍රය, කුඩය.

**ආතපතා.** ඉ-දවන ස්වභාවය, තැවීම්බව.

**ආතපති.** ක්‍රි-(ආ + තප. d. භූ. තපනෙ, තැවීමෙහි + ති) තවයි, රත් කරයි.

**ආතපන.** න-තැවීම. වීර්යය උත්සාහය.

**ආතපොදක.** න-(ආතප + උදක) මිරිඟු ජලය.

**ආතාපනපරිතාපන.** න-තැවීම හාත්පස තැවීම.

**ආතාප.** පු-තැවීම, රත්කිරීම.

**ආතාපන.** න-තැවීම, රත්කිරීම, වීර්යය.

**ආතාපී.** පු-වීර්යවත්. කෙලෙස්තවන වීර්ය ඇති.

**ආතාපෙති.** ක්‍රි-(ආ + තප d චු. දහෙ, තැවීමෙහි + ණෙ + ති) තවයි, රත්කරයි.

**ආතිථෙය්‍ය.** න-අමුත්තන්ට කටයුතු සත්කාරය, ආගන්තුක සඞ්ග්‍රහය.

**ආතු.** පු-ග්‍රාම්‍ය ව්‍යවහාරයෙහි පවත්නා පිතෘ පර්යාය වචනයක්, නුගත් ස්ත්‍රියක් ලවා අසත්‍ය වචන කියවීම්.

**ආතුමා.** පු-ආත්මය, තමා, ආත්මභාවය.

**ආතුර.** පු-ලෙඩා, රොගියා, ආබාධ ඇත්තා, ගිලනා,

**ආතුර අනාතුර.** පු-නිරොගී, ලෙඩනැති, ආබාධ විරහිත.

**ආතුරරූප.** පු-රොගිස්වභාවය, ලෙඩබව.

**ආතොජ්ජ.** න-පඤ්චාඞ්ගිකතූර්යය, ආතතාදිය,

**ආථබ්බ.** පු-අථර්ව වෙදයට අයත්.

**ආථබ්බණ.** න-අථර්වවෙදය දත් තැනැත්තා-පරූපඝාතයට මන්ත්‍ර පිරවීම, අශ්වාදීන් මරා යාග කරණ පිළිවෙල දක්වන වෙදයකි. "**ආථබ්බණ** මනෙතා නාම අථබ්බ වෙද විරහිතො පරූපඝාතකරො මනෙතා."

**ආථබ්බණික.** පු අථර්වවෙදය, දූන හදුරන්නා.

**ආද්‍යන්‍යපද.** පු-ආදියෙහි අන්‍යපදය ඇති සමාසය ආද්‍යන්‍යපද නම් වේ. බහුව්‍රීහි සමාස විශෙෂයකට නමකි.

**ආද්‍යුපලබ්ධි.** ඉ (ආදි + උපලබ්ධි) ප්‍රථමොපලබ්ධිය, ප්‍රථම ලාභය.

**ආදදති.** ක්‍රි-(ආ + දද d. භූ. දානෙ, දීමෙහි + ති) දෙයි, දානය කරයි

**ආදදාති** ක්‍රි-(ආ + දා. ජු. දානෙ, දීමෙහි + ති) දානය කරයි.

**ආදර.** පු-ආදරය, දයාව.

**ආදරතා.** ඉ-දයාස්වභාවය, ආදරබව.

**ආදරණීය.** ති-ආදරකටයුතු, දයාකටයුතු.

**ආදරිය.** පු-න-ආදරයෙන් යුත්, ආදරය ඇති.

**ආදහති.** ක්‍රි-(ආ + දහ d භූ. භස්මීකරණෙ, හළුකිරීමෙහි + ති) දවයි, හළුකරයි,

**ආදාන.** න-ගැණීම, ග්‍රහණය, පිළිසිඳ ගැණීම.

**ආදානගන්ථ.** පු-තමාගේ සන්තානයෙහි ගැට ගැසී පවත්නා ග්‍රන්ථය.

**ආදානපටිනිස්සග්ග.** පු-ගැණීම හා ප්‍රතික්ෂෙප කිරීම.

**ආදානතණ්හා.** ඉ-රූපාදී අරමුණුග්‍රහණය කරණ තෘෂ්ණාව.

**ආදානවට්ටි.** ඉ-බෙහෙත් ගැල්වූ රෙදි වැටිය. "වච්චමග්ගෙ භෙසජ්ජ මක්ඛිතා **ආදානවට්ටි** වා වෙළුනාලිකා වා වට්ටති".

**ආදානසීල** න-දෙන ස්වභාවය ඇති. ගැණීම් ස්වභාවය.

**ආදාය.** පු ක්‍රි-(ආ + දා d ත්වා=ය.) ගෙණ, රැගෙණ.

**ආදානධිප්පාය.** පු-පැහැර ගැනීමට ඇති අදහස, සොරකමට මෙහෙයූ සිත ඇති.

**ආදාස.** පු-ආදර්ශය, කැඩපත, මූනබලන කන්නාඩිය.

**ආදාසක.** පු-ආදාස බලනු.

**ආදාසතල.** න-ආදර්ශතලය. කැඩපත.

**ආදූසදණ්ඩ** න-ආදර්ශ දණ්ඩ, ආදර්ශ සැරයටිය,

**ආදූසපඤ්හ**. ති-කැඩපතෙහි දෙවතාරූඪ කොට ප්‍රශ්න විචාරීම.

**ආදූසමණ්ඩල**. පු-ආදර්ශ මණ්ඩලය, කැටපත් තලය.

**ආදූහන**. න-දූවීම, පිලිස්සීම, මළසිරුරු දූවීම.

**ආදි**. පු-ප්‍රථම, මර්යාදා, ප්‍රකාර. සමීප, අවයව.

**ආදික**. ති-පූර්ව, ආදියට අයත්.

**ආදිකම්ම**. පු. න. ප්‍රාරම්භය, ආදික්‍රියාව, ප්‍රථම ක්‍රියාව, පළමුකොට කරණ ක්‍රියාව.

**ආදිකම්මික**. පු-ආදි කර්මයෙහි යෙදුනු තැනැත්තා. ආදිකම්මිකයා,

**ආදිකවි**. පු-ප්‍රථමකවියා, වාල්මීකි ඍෂියා.

**ආදිකල්‍යාණ**. ති-ආදියෙහි යහපත් වූ, මුල යහපත් වූ. "ආදිමජ්ඣ පරියොසාන කල්‍යාණො.

**ආදිකාරණ**. න මූලකාරණය, ප්‍රථමකාරණය

**ආදිගලදිහු**. පු-ආදිගලහු නම් ඡන්දසෙහි එන භගණ සහ යගණ දෙක, "සබ්බගලා මනා දිග්ලහු භ්‍යා මජ්ඣනත ගරුජසා."

**ආදිච්ච** පු-සූර්‍ය්‍යයා, දෙවියා. අදිතියගේ පුත්‍රා.

**ආදිච්චපථ**. පු-සූර්‍ය්‍යමාර්ගය, දෙවමාර්ගය, අහස, ගගන තලය.

**ආදිච්ච බන්ධු**. පු සූර්‍ය්‍ය බන්ධු, සූර්‍ය්‍යවංශ ඇත්තා, සාක්‍යවංශ ඇත්තා, ගෞතම බුදුරජානන් වහන්සේ, පියුම්.

**ආදිච්චපාක**. ති-අව්වෙහි කැකෑරීම, "ඉමානි අට්ඨිපානානි සීතානිපි ආදිච්චපාකානිපි වට්ටනති".

**ආදිච්චවංස**. පු සූර්‍ය්‍යවංශය, ශාක්‍යවංශය.

**ආදිච්චුපට්ඨාන**. න - (ආදිච්ච + උපට්ඨාන) සූර්‍ය්‍යයාට නමස්කාර කිරීම, හිරුට උවටැන් කිරීම, හිරු දෙවියන් පිදීම.

**ආදිට්ඨ**. ති-දක්වන ලද, පෙන්වන ලද.

**ආදිත්ත**. ති-ගිනිගෙණ දිලිසෙනලද, ගිනිගත්.

**ආදිත්තපරියාය**. පු-එනම් සූත්‍රය. උරුවෙල් කසුබ් ආදින්ට දෙසූ එනම් සූත්‍රය.

**ආදිතෙය**. පු-දෙවියා, ස්වර්ගවාසියා.

**ආදිතො පට්ඨාය**. අ-මුල පටන්, ආදියෙහි සිට.

**ආදින්න**. ති-දෙනලද, ගන්නාලද.

**ආදිණ්ණත**. න-කැඩුණු අවස්ථාව, බිඳුනු අවස්ථාව.

**ආදිදෙව**. පු-පූර්වදෙවියා, ඊශ්වරයා. ධන්වන්තරි ඍෂියා.

**ආදිපුරුෂ**. පු-පූර්වපුරුෂයා, ආදිකම්මික පුරුෂයා, විෂ්ණු.

**ආදිපුබ්බඞ්ගම**. පු-ආදිය පෙරටුකොට ඇති, මුල ඉදිරිකොට ඇති,

**ආදිබ්‍රහ්මචරිය**. න-ප්‍රාතිමොක්ෂසංවරාදි සීලය, පුරාණ බ්‍රහ්මචරියාවවූ මාර්ගබ්‍රහ්මචරියාව ඇතිකළ ධර්මය.

**ආදිබ්‍රහ්මචරියක**. පු-ආදිබ්‍රහ්මචරියක සීලය ඇත්තා

**ආදිමග්ග**. පු-ප්‍රථම මාර්ගය, පළමුවන මාර්ගය.

**ආදිමජ්ඣපරියොසාන**. න-මුල මැද අග යන තුන් තැන.

**ආදියති**. ක්‍රි-(ආ + දd. දි. දානෙ, දීමෙහි + ඉ + යති) ගණී.

**ආදිය**. ති-කෑයුතු, බුදිය යුතු.

**ආදියන**. න-ගැණීම, ග්‍රහණය.

**ආදිලොප**. පු-පදයෙක්හි ආදි ස්වරය හෝ ව්‍යඤ්ජනය හෝ සමාසයෙහි ආදි පදය හෝ ලෝප කිරීම, අපිධානං යන තන්හි පිධානං යනු උදාහරණයි.

**ආදියනතා**. ඉ-ගැණීම්, බව, ගන්නා බව.

**ආදිස්ස**. පු. ක්‍රි-(ආ + දිසd. භූ, උච්චාරණෙ, කීමෙහි. ත්වා=ය. යකාරධාත්වන්තදෙකට පූර්වරූපයි) දක්වා, පෙන්වා.

**ආදිසති**. ක්‍රි.-(ආ + දිස d. භූ. පෙක්ඛනෙ, බැලීමෙහි) දක්වයි, බලවයි.

**ආදීසො**. අ-ආදීවශයෙන්.

**ආදීන**. පු-දීනනොවන, බැගෑනොවන.

**ආදීනව**. පු-දෝෂය, වැරැද්ද, නපුරු විපාකය "ආදීනවො උපපාදිතො".

**ආදීනවදස්සාවී**. පු-දෝෂදක්නාසුලු තැනත්තා, දෙස් දක්නා සුල්ලා.

**ආදීනව පරියෙසන**. න-දෙස් සෙවීම, දෝෂ පර්‍යෙෂණය.

**ආදීනවසඤ්ඤා**. ඉ-ශරීරයෙහි උපදනා රොග පීඩාදිය ගැණ සලකා බැලීම.

**ආදීනවානුපස්සී**. පු-දෙස් අනුව බලන සුලුවූ.

**ආදීපන**. න-දූල්වීම, ගිනිඇවිලවීම.

**ආදීපනීය**. පු-දූල්වියයුතු, ගිනි ඇවිල විය යුතු.

**ආදීපිත**. ති-ගිනිගත්නා ලද, ගිනිගෙණ ඇවිලී ගත්.

**ආදු**. අ-නොහොත්, එසේ නොවේනම් හෙවත්.

**ආදෙති**. ක්‍රි-(ආ + දා d. භූ දානෙ, දීමෙහි + ණෙ + ති) දෙයි, දානය කෙරෙයි.

**ආදෙය්‍ය**. ති-ඇදහියයුතු, විශ්වාසකටයුතු.

**ආදෙය්‍යවචන**. න-ඇදහියයුතු වචන, විශ්වාස කටයුතු වචන ඇත්තා.

**ආදෙව**. පු-විලාපය, පරිදෙවය.

**ආදෙවන**. ති-විලාපකිම, උදෙසා හැඬීම,

**ආදෙවතත්තා**. ඉ-විලාපකීම් භාවය, උදෙසා හැඬීම් බව.

**ආදෙවනා**. ඉ-පරිදෙවනය, විලාපකීම.

**ආදෙවනාපරිදෙවනා**. ඉ-විලාපකීම විසෙසින් විලාපකීම,

**ආදෙවනීය**. පු-වැලපියයුතු, විලාපකිය යුතු,

**ආදෙසි**. පු-ආදෙස කාර්‍යය ලබන්නා ආදෙසි නම්.

**ආදෙස**. පු-දක්වීම්, නියොගය, අක්ෂරයකට අක්ෂරයක් ආදෙශවීම.

**ආදෙසනවිධි**. ඉ-අවවාද – අනුශාසනා කිරීමේ ක්‍රමය.

**ආදෙසනන්තරවිධාන**. න-වෙන ආදෙශයක් කිරීම, ආදෙශ විශෙෂයක් කිරීම.

**අදෙසනාපාටිහාරිය**. න-කරුණු දක්ව දක්වා කරණ දෙශනා ප්‍රාතිහාර්‍යය, මෙය මෙසේය මෙය මෙසේයයි සාධක දක්ව දක්වා කරණ ප්‍රාතිහාර්‍යය, ධර්මදෙශනාව

**ආදෙසාපෙක්ඛා**. ඉ-ආදෙශය බලාපොරොත්තුවන්නී, ආදෙසය අපෙක්‍ෂා කරන්නී,

**ආධාන**. න-පිහිටීම, පැවැත්ම ගභීාධානය.

**ආධානගාහී**. පු-තමන් ගත් දෘෂ්ටිය දැඩිකොට ගන්නා, දෘෂ්ටි වශයෙන් දැඩිකොට ගත් අය, බැසගත්, ගිලුනු "ආදානගාහීති දළ්හගාහී"

**ආධාර**. පු-අධිකරණ කාරකය, අදර විබත, පාත්‍රාධාරය, තොතැනිබිම, පිහිට, උදව්ව.

**ආධාරක**. පු-ආධාර කරන්නා, පිහිට, වන්නා දණ්ඩාසනය.

**ආධාරකාර**. පු-උදව්කරන්නා, ප්‍රතිෂ්ඨා වන්නා, උසුලන්නා.

**ආධාරකාරක**. න-ආධාර විභක්තිය, අදරකරු, ආධාර කරන්නා.

**ආධාරණතා**. ඉ-ඇහුම්කන්දීම, සිත එකඟ කිරීම, සිත එලඹ සිටීම.

**ආධාරිත**. ති-දරණ ලද, උසුලන ලද.

**ආධාරෙකත්ත**. ති-තුල්‍යාධිකරණ විශෙෂණ ප්‍රභෙදයට විශෙෂ නමකි

**ආධාවති**. ක්‍රි-(ආ + ධාවු + d. භූ. ධාවනෙ, දිවීමෙහි + ති) දුවයි, ඉදිරියට ධාවනය කරයි, පෙරළා දිව එයි.

**ආධාවන** න-ඉදිරියට ධාවනය කිරීම, අභිමුඛ ධාවනය.

**ආධාවතිපරිධාවති**. ක්‍රි-එහා මෙහා දුවයි. හාත්පස දුවයි.

**ආධාවිත්වා**. පු-ක්‍රි-දිවගොස්, ඉදිරියට ගොස්, ධාවනය කොට

**ආධි**. පු-මූලාව, මූර්ඡාව, චිත්තපීඩාව,

**ආධික්ක**. න-ආධික්‍යය, අධික බව, වැඩි බව.

**ආධික්‍ය**. න-ආධික්ක බලනු.

**ආධිපච්ච**. න-අධිපති භාවය, ප්‍රධාන බව.

**ආධිපච්චපරිවාර**. පු-අධිපති භාවය හා පිරිවර.

**ආධිපතෙය්‍ය**. ති-ආධිපච්චය, අධිපති බව.

**ආධූත**. ති-සැළෙන ලද, කම්පාවන ලද.

**ආධුනන.** න-අභිමුඛයට ඇදීම, ඉදිරියට නැඹීම

**ආධුනික.** ප්‍ර-වර්තමානික, මෙකලට අයිති. අලුත ශාස්ත්‍රාගම ඉගෙණගන්නා තැනැත්තා, දුහුනජනයා.

**ආධෙය -ආධෙය්‍ය.** පු-දැරිය යුතු ඉසිලිය යුතු යමක පිහිටි දෙය, ජලයෙහි පෙණෙන රූපය.

**ආධෙය්‍යමුඛ.** පු-ආධෙයයි, ජලය ආධාරයයි.

**ආන.** න-ආශ්වාසය, නාසිකාවෙන් ඇතුල්වන වාතය, මසුන් බඳින දැල, "ආනනති අස්සාසො"

**ආනක.** පු-ඇනවන්නා, කටයුතු නියම කරන්නා, විධානය කරන්නා

**ආනකදුන්දුභි.** ඉ-අණරබෙරය, අඩබෙරය. වෙණුපියා.

**ආනකභෙරී.** ඉ-ආනකදුන්දුභි බලනු.

**ආනඤ්ජ.** න-කම්පා රහිත, අචල, නොසෙල් වෙන.

**ආනඤ්ජසමාධි.** ඉ.-ආකාසානඤ්චායතනය, විඤ්ඤාණඤ්චායතනය ආකිඤ්චඤ්ඤායතනය නෙවසඤ්ඤා නාසඤ්ඤායතනය යන අරූපාවචර සමාධි සතර.

**ආනඤ්ජාභිසඞ්ඛාර.** පු-චතුර්විධ අරූපාවචර කුසල චෙතනාව.

**ආනණ්‍ය.** න-ණය නැති බව, දනා අයත් නොවන බව.

**ආනණ්‍යපරිභොග.** පු-සිල්වත්ව ප්‍රත්‍යවෙක්ෂා කොට සිවුපසය වැළඳීම.

**ආනර්ථක්‍යප්‍රසඞ්ග.** න-නිරර්ථක භාවයේ පැමිණීම.

**ආනත්ති.** ඉ-ඇණවීම, නියොගය, විධානය.

**ආනත.** ති-නැමුණු, අඟනැමුණු.

**ආනදති.** ක්‍රි-(ආ + නද d. භූ. සද්දෙ, ශබ්ද කිරීමෙහි + ති) නාදකරයි, ශබ්ද කරයි.

**ආනන.** න - මුහුණ, මුඛය, මූණ.

**ආනන්තරිකය.** පු - අතරක් නැති, ව්‍යවධාන යක් නැති, අතර සිදීමක් නැති.

**ආනන්තරියකම්ම.** න - ආනන්තර්‍ය කර්මය, අනතුරු අත්බැව්හි විපාක දෙන කර්මය, කුශල පක්ෂයෙන් අෂ්ටසමාපත්ති ද අකුශල පක්ෂයෙන් පඤ්චානන්තරිය කර්ම ද දතයුතු.

**ආනන්තරිකඤ්ඤමාහු.** (අනන්තරිකං + යං + ආහු) - ආනන්තරික බලනු.

**ආනන්තරිකසමාධි.** පු-මාර්ගයට අනුව ලැබිය යුතු ඵලය, සෝවාන් ආදී ඵල සතර.

**ආනන්තරියධම්ම.** පු-අනතුරු භවයෙහි විපාක දෙන චෙතනාදී ධර්ම.

**ආනන්ද.** පු-සන්තොෂය, බන්ධුමිත්‍රාදීන්ගේ ගමනාගමන සමයෙහි ස්වාගත සම්ප්‍රශ්නා දියෙන් සතුටුවීම, බුදුරජාණන් වහන්සේගේ ධර්මභාණ්ඩාගාරික ආනන්ද මහරහතන් වහන්සේ.

**ආනන්දති.** ක්‍රි-ආ + නන්ද d. භූ. සන්තොසෙ, සතුටු වීමෙහි + ති) සතුටුවෙයි.

**ආනන්දන.** න-සන්තොෂවීම, සතුටුවීම

**ආනන්දි.** ඉ-ප්‍රීතිය, සතුට.

**ආනන්දිත.** ති-සන්තොෂ වනලද, සතුටුවන ලද

**ආනන්දිය.** ති-සතුටුවිය යුතුවූ, ප්‍රීතිවිය යුතුවූ.

**ආනමති.** ක්‍රි-(ආ + නමු d. භූ. නමනෙ, නැමීමෙහි + ති) නමයි.

**ආනමන.** න-නැමීම, යටත් කිරීම, පස්සට නැමීම.

**ආනය.** ති-ගෙණ ආයුතු, පැමිණ වියයුතු.

**ආනයති.** ක්‍රි-(ආ + නී d. භූ. පාපුණනෙ, පැමිණ වීමෙහි + ති + පමුණුවයි.

**ආනයන.** න-ගෙණ ඒම, පැමිණවීම, අත්-පොත් තැබීම, ළදරුවාගේ අතට පොත දීම.

**ආනා.** ඉ-නියොගය, විධාන, අන.

**ආනාදෙසනා.** ඉ-ඇනවීම හෝ ප්‍රඥප්තිය බහුල කොට ඇති දෙශනාව, විනය ධර්මය, විනය පිටකය.

**ආනාපන** න-ඇණවීම, නියොගය.

**ආනාපාන.** න- (ආන + අපාන) ආශ්වාස ප්‍රශ්වාසය, හුස්ම ඉහළ පහළ හෙළීම.

**ආනාපානසති.** ඉ-ආනාපානසමෘතිය, ආශ්වාස ප්‍රශ්වාසයන් පිළිබඳව පවත්නා සිහිය.

**ආනාපානසමාධි** පු-ආශ්වාස ප්‍රශ්වාසයන් පිළිබඳව පවත්නා සිත එකඟ කිරීම (සමාධිය) (ආ + නී d. නයෙ, පැමිණවීමෙහි + ණපෙ + ති) පමුණුවයි.

**ආනාමෙති.** ක්‍රි-(ආ + නම d. නමනෙ නැමීමෙහි + ණෙ + ති) නමයි, ඉදිරියට පමුණුවයි.

**ආනාහ.** පු බඩපිපීම, මලමූත්‍ර බඩය.

**ආනමෙත්වා.** පු ක්‍රි-නමා ඉදියට පමුණුවා, යටට පමුණුවා.

**ආනිසංස.** පු-ආනිශංසය, ඵලය, විපාකය, අනුසස්.

**ආනිසද.** න-සටටම, තටටම - ඉදුම, මාංසය. "සෙයයථාපි නාම ඔට්ඨසදං එවමෙවඝසුමෙ ආනිසදංහොති තාලෙවපසහාරතාය."

**ආනීත.** ති-එලවන ලද, පමුණුවන ලද. ගෙණෙනලද.

**ආනුත්තරිය.** න-අනුත්තරභාවය, නිරුත්තර බව.

**ආනුතාප.** ති-අනුතාපය, අනුසොචනය, තැවීම.

**ආනුපුබ්බ.** ති-අනුපිළිවෙළ, පිළිවෙළ නොඉක්මවීම.

**ආනුපුබ්බතා.** ඉ පිළිවෙළ නොඉක්මවීමේ සවභාවය. අනුපිළිවෙල සවභාවය.

**ආනුපුබ්බිකථා.** ඉ - පිළිවෙළින් පවත්නා කථාව. "ආනුපුබ්බිකථං කථෙසි:- සෙයය්‍යීදං, දානකථං, සීලකථං, සග්ගකථං, කාමානං ආදීනවං ඔකාරං සංකිලෙසං, නෙක්ඛම්මෙච ආනිසංසං පකාසෙසි."

**ආනුභාව.** පු තෙජස, බලය.

**ආනුසී.** ක්‍රි-අනුභවකෙළේය යනාදී ඇති අතීතක්‍රියාව.

**ආනුසඞ්ගිකපපයොජන.** න.-අන් කටයුත්තක යෙදුනාම තවත් කටයුත්තක් එයින්ම සිදුවීමෙන් ලැබෙන ප්‍රයොජනය.

**ආනූප.** පු ජල බහුල භූමියෙහි වූ.

**ආනෙඤ්ජප්පත්ත.** ති-අකම්පෲබවට පැමිණි, සථිරබවට පැමිණි, කම්පානොවන.

**ආනෙඤ්ජ.** ති-කම්පානොවන, නොසෙල්වන බව,

**ආනෙඤ්ජකාරණ.** න - නොසෙල්වී සිටීමට කරණ උපාය, (මැරුණායයි බොරුවට හැඟවීම.)

**ආනෙඤ්ජ.** ති-ආනෙඤ්ජ බලනු.

**ආනෙඤ්ජතා.** ඉ-කම්පානොවන බව නොසෙල්වීම, සථිරබව.

**ආනෙති.** ක්‍රි - (ආ + නී d. භූ. පාපනෙ, පැමිණවීමෙහි + ණෙ + ති) පමුණුවයි, ගෙණ එයි, සමීපයට එළවයි.

**ආනෙත්වා.** පු-ක්‍රි-ගෙණවුත්,

**ආප.** පු-ජලය, ආපොධාතුව.

**ආප.** d සු ව්‍යාපනෙ, ව්‍යාප්තියෙහි + උණ + ති ආපුණාති, ව්‍යාප්තකෙරෙයි. පැතිරෙයි.

**ආප.** d. මු ලම්භනෙ, ශබ්දකිරීමෙහි + ණෙ + ති. ආපෙති, ශබ්දකරයි.

**ආපකා.** ඉ-අපගා බලනු.

**ආපගා.** ඉ-නදිය, ගංගාව.

**ආපණ.** න සල්පිල, වෙළඳම්පොල. කඩය.

**ආපණද්වාර.** න-සල්පිල්දොරටුව, කඩදොර.

**ආපණික.** පු-සල්පිලේ නියුක්තයා, වෙළඳා.

**ආපජ්ජති.** ක්‍රි-(ආ + පද d = පජ්ජ + ති) ගතියං යාමෙහි පැමිණෙයි, යෙයි.

**ආපජ්ජන.** න-ප්‍රාප්තිය, පැමිණීම, සම්ප්‍රාප්තිය.

**ආපත්තවුට්ඨානා.** ඉ-

**ආපත්තවජ්ජිත.** පු-

**ආපත්ති.** ඉ-ශික්ෂාව්‍යතික්‍රමණය, ඇවැත, පැමිණීම, විපත.

**ආපත්ති අඞ්ග.** න-ඇවැත්හි අවයව, ඇවැතක් සිදුවීමට සුදුසු කරුණු.

**ආපත්ති-අධිකරණ.** න-ආපත්තාධිකරණය, මාතිකාවෙහි එන පඤ්චාපත්තිසක්ඛන්ධය හා විභඞ්ගයෙහි දැක්වෙන ථුල්ලච්චය, දුබ්භාසිත යන දෙකත් සමග ඇති සත්තාපත්තිසක්ඛන්ධය ආපත්තාධිකරණ නම්වේ.

**ආපත්ති-ආපජ්ජන.** න-කය හා වචනයෙන් වන ඇවැතකට පැමිණීම, ඇවැත් ඇවදීම.

**ආපත්ති ආරොචන.** න - ඇවැත් දැන්වීම, ගරුකාපත්තියකට පැමිණියහු එය සමාන සංවාසක උපසම්පන්න භික්ෂුවකට දැන්වීම.

**ආපත්තිආරොපන.** න-ආපත්ති ආරොපනය, ඇවැත ගෙණ හැර දැක්වීම.

**ආපත්ති-ආවිකරණ.** න-ඇවැත් පැවසීම, ආපත්ති ආවිකරණය.

**ආපත්තිකර.** ති-ඇවැත්වන, ඇවැත් සිදු කරණ.

**ආපත්තිකරාධම්මා.** ඉ-ඇවැත් සිදුකරණ ධර්ම, සවැදෑරුම් ආපත්ති සමුට්ඨානයෝ ආපත්තිකර ධර්මයෝ නම් වෙති.

**ආපත්තිකාරක.** පු-ඇවැත් සිදුකරණ, ඇවැත් කරණ.

**ආපත්තිකුසලතා.** ඉ-ඇවැත් මේ මේ යයි දැනීමෙහි දක්ෂභාවය, පස්වැදෑරුම් හා සත් වැදෑරුම් ඇවැත්ගැණ දැනීම.

**ආපත්තික්ඛන්ධ.** පු-ඇවැත්සමූහය, ආපත්ති-ස්කන්ධය, පරාජික, සංඝාදිසෙස, ථුල්ලච්චය, පාචිත්තිය, පාටිදෙසනීය, දුක්කට, දුබ්භාසිත යන සප්තාපත්තිස්කන්ධය.

**ආපත්තිඡාදන.** න-ඇවැත් සැඟවීම, ඇවැත් වසන්කිරීම.

**ආපත්තිජනක.** ති-ඇවැත් උපදවන, ආපත්ති සිදුවන,

**ආපත්තිදෙසනා.** ඉ-ආපත්තිදෙශනාව, ඇවැත් දෙසුම, තමා අවත් ඇවැත් වෙන භික්ෂුවක් ඉදිරියේ කීම.

**ආපත්තිනානත්ත.** න-ඇවැත්හි නන්වැදෑරුම් බව, පරිවාරපාලි එකුත්තරිකයෙහි දැක්වෙන ආපත්තිනානත්වය.

**ආපත්තිනිකාය.** ඉ-ඇවැත් සමූහය. "ආපත්ති නිකායොති ආපත්තික්ඛන්ධො."

**ආපත්තිනිරොධ.** පු - ආපත්තිනිරුද්ධිය, ඇවැත් සංසිඳීම, දෙසනාගාමි ආපත්තීන් දෙසීමෙන්ද, උට්ඨානගාමිනී ආපත්තීන් නැගී සිටීමෙන්ද සන්සිඳෙයි.

**ආපත්තිපටිච්ඡාදන.** න - ඇවැත් වැසීම, ආපත්ති සැඟවීම, දසාඞ්ගයකින් ඇවැත් වැසීම සිදුවෙයි, එනම්:- ආපත්ති, ආපත්ති සඤ්ඤී, පකතත්ත, පකතත්තසඤ්ඤී, අනන්තරායික, අනන්තරායික සඤ්ඤී, පහු, පහු සඤ්ඤී, ඡාදෙතුකාමො, ඡාදෙති යන මේ දශයයි.

**ආපත්තිමුඛ.** න-ඇවැත්දොර, ආපත්ති ද්වාරය,

**ආපත්තිවත්ථු.** න-ඇවැත්වන, ආපත්තිවස්තුව, සප්තාපත්තිස්කන්ධය.

**ආපත්තිසඞ්කමණ.** න-ඇවතින් නව ඇවතකට පැමිණීම, ආපත්ති සඞ්ක්‍රමණය.

**ආපත්තිසමුට්ඨාන.** න-ඇවැත් හටගැන්ම, ආපත්ති සමුට්ඨාන සයකි, එනම්:- කාය, වාචා, කායවාචා, කාය චිත්ත, වාචාචිත්ත, කායවාචා චිත්ත යනුවෙති.

**ආපත්තික්ඛන්ධ.** පු-ඇවැත්කඳු, ආපත්තිස්කන්ධ

**ආපත්තික.** පු-පැමිණි ඇවැත් ඇත්තා, ඇවැතට පැමිණියා.

**ආපත්තිභය.** න-ඇවතට පැමිණීමේ භය,

**ආපතති.** ක්‍රි-(ආ + පත d. භූ. ගමනෙ, යාමෙහි + ති) පතිතවෙයි, වැටෙයි.

**ආපත්තිකුසල.** පු-ඇවැතින් නැගිටීමේ දක්ෂ බව.

**ආපතන.** න-වැටීම, පතනයවීම.

**ආපතිත.** ති-වැටෙන ලද, වැටුනු.

**ආපථ.** පු-මිථ්‍යාමාර්ගය,

**ආපථික.** පු-මිථ්‍යාමාර්ගයට බට,

**ආපදා.** ඉ-විපත්තිය, විපත, විනාශය.

**ආපන්න.** ති - පැමිණි, මරදට පැමිණි, "ආපත්තිං භික්ඛු ආපන්නොපාරාජිකනති"

**ආපන්නදුක්ඛි.** පු-පැමිණි දුක් ඇත්තා,

**ආපන්නජීවික.** පු-පැමිණි ජීවිකා ඇත්තා.

**ආපන්නසත්තා.** ඉ-පැමිණි සත්වයා ඇත්තී, දරු ඇත්ති, ගැබිනිය.

**ආපබ්බක.** පු-පර්වතය දක්වා, පර්වතයහැර.

**ආපාත.** පු-වැටීම. හෙලීම. උපක්‍රමය.

**ආපාතලිකා.** ඉ - වෛතාලිකා නම් ඡන්දස් ප්‍රභෙදය.

**ආපාථ.** න-සම්මුඛය, ඉන්ද්‍රියගොචරය, ඇස් හමුව,

**ආපාථක.** පු-සම්මුඛගත, ඉන්ද්‍රිය ගොචරවූ

**ආපාථකනිසාදී.** පු-ආපාථයෙහි සිටින සවභාව ඇත්තා

**ආපාථගත.** ත-ඉන්ද්‍රිය ගොචරයට පැමිණි, සම්මුඛවූ.

**ආපාථකජ්ඣායී.** පු-මිනිසුන් හමුවන තැන භාවනාකරන්නා.

**ආපාණ.** න-දිවිකෙළවරකොට, ජීවිතාන්තය දක්වා.

**ආපාණකොටි.** පු- දිවිකෙළවර, ජීවිත අවසානය.

**ආපාණකොටික.** පු-දිවිකෙළවරකොට ඇති, ජීවිතාන්තය දක්වා ඇති. එවං කාලපරියන්ත ආපාණකොටික වසෙන දුවිධං සීලං.

**ආපාණමණ්ඩල.** න - සුරාපානය සඳහා පිළියෙල කළ තැන.

**ආපාදි.** ක්‍රි-(ආ+පද d. භූ. ගතියං, යාමෙහි + ඊ) පැමිණියේය. ලඟාවූයේය.

**ආපාද.** පු-වර්ධනය. පොෂ්‍යය,

**ආපාදක.** පු-පොෂ්‍යය කරන්නා, පාලනය කරන්නා.

**ආපාදන.** න-වර්ධනය, පාලනය.

**ආපාදා.** ඉ-පාලනයකරන්නී, වර්ධනයකරන්නී.

**ආපාදික.** ති ප්‍රතිපාදනයකළ, පාලනයකළ.

**ආපාදිකා.** ඉ-කිරිමවු, පොෂ්‍යකරන්නී.

**ආපාදෙති.** ක්‍රි-(ආ+පද d චු. ගතියං, යාමෙහි +ණෙ+ති) පාලනය කෙරෙයි, ගොපනය කෙරෙයි.

**ආපාන.** න-මද්‍යපානය, සුරාපානය.

**ආපානක.** පු-රහමෙර බීමෙහි නියුක්තයා, සුරා සොඬා,

**ආපානභූමි.** ඉ-පානභූමිය, සුරාසැල, මද්‍ය පානස්ථානය. තැබෑරුම,

**ආපානීය.** ති-පානය කළ යුතු, බීමට සුදුසු, පියයුතු,

**ආපානීයකංස.** න පැන්බොන භාජනය, බොන භාජනය.

**ආපායික.** පු-අපායට අයිති, අපායට හිමි.

**ආපුච්ඡක.** පු-විචාරන්නා, ප්‍රශනකරන්නා.

**ආපුච්ඡති.** ක්‍රි-(ආ+පුච්ඡ d. භූ, පුච්ඡනෙ, විචාරීමෙහි+ති) විචාරයි, පිළිවිසියි.

**ආපු.** d. චු. ලම්බනෙ, දික්වීමෙහි, ආපෙති, දික්වෙයි.

**ආපුච්ඡකරණ.** න-පිළිවිස කිරීම, මහළු තැනින් විචාරා කිරීම.

**ආපුච්ඡන.** න-විචාරීම, ප්‍රශනකිරීම.

**ආපුච්ඡිත.** ති-විචාළ, ප්‍රශ්න කළ, පිළිවිසූ.

**ආපුච්ඡිතබ්බ.** ති-විචාළ යුතු, ප්‍රශ්න කළයුතු, ඇසිය යුතු.

**ආපූරණ.** න-හාත්පසින් මනාකොට පිරවීම, සම්පූර්ණ කිරීම.

**ආපූරති.** ක්‍රි-(ආ+පූර d. භූ. පූරණෙ, සම්පූර්ණ කිරීමෙහි+ති) පුරවයි, සම්පූර්ණ කරයි. "ආපූරති තස්ස යසො සුක්ක පක්ඛෙව චන්දිමා"

**ආපූරාපෙති.** ක්‍රි-(ආ+පූර d. මූ. ආප්‍යායනෙ, ප්‍රීතියෙහි, තෘප්තියෙහි+ණෙ+ති) ප්‍රීති කරයි, තෘප්තිකරයි.

**ආපූරිත.** ති-පුරවනලද, සම්පූර්ණ කළ.

**ආපෙසි.** න-ඉදිකටුල්ල, ඉඳිකඩ. "ආපෙසීති දීඝ දරුමයි බාහුකෙ පවෙසෙත්වා කණ්ටක සාඛාහි විතන්ධිත්වා කතං ද්වාරත්ථකතං."

**ආපොකසිණ.** න-ආපොධාතුව අරමුණුකොට කසිණ භාවනා කිරීම, ආපො කසිණය, දසකසිණයන් අතුරෙන් එකක්.

**ආපොථන.** න-පෙළීම, පොඩිකිරීම.

**ආපොථිත.** ති-පොඩිකළ, පෙළූ.

**ආපොථෙති.** ක්‍රි-(ආ+පොථ. d. චු. අපොථනෙ, තැලීමෙහි+ණෙ+ති) තලයි.

**ආපොධාතු.** ඉ-ආප්ධාතුව, ජලය, දිය, ද්‍රව ලක්ෂණය.

**ආපොරස.** න-ජල රසය, දියරසය.

**ආපොසම.** න-ජලය සම, වතුර හා සමාන.

**ආඵුසති.** ක්‍රි-(ආ+ඵුස d. භූ. ඵුසනෙ, ස්පර්ශ කිරීමෙහි+ති) ස්පර්ශකරයි, පැමිණෙයි, අවබොධකරයි.

**ආඵුසන.** න-ස්පර්ශ කිරීම, ගැටීම, පැමිණීම.

**ආඵුසිත.** ති-ස්පර්ශකළ, ගැටුණු, පැමිණි.

**ආබද්ධ.** ති-ආදියෙහි බඳනා ලද, හාත්පසින් බඳනා ලද, බඳනා ලද.

**ආබද්ධපටිබද්ධ.** පු-ආදියෙහි පටන් වෙසෙසින්, බඳනාලද. **“ඉමානි දෙවපි කුලානි යාව සත්තමා කුලපරිවට්ටා ආබද්ධපටිබද්ධ සහායකා නෙව”**

**ආබන්ධ.** පු-බඳනාලද, දැඩිව බඳනාලද.

**ආබන්ධක.** පු-දැඩිකොට බන්ධනය කළ අය, ආබන්ධන සවභාවය ඇත්තා.

**ආබන්ධති.** ක්‍රි-(ආ + බන්ධ d. භූ. බන්ධනෙ, බැඳීමෙහි + ති) බඳියි, ගැටගසයි.

**ආබන්ධන.** න-බැඳීම, පෙර පටන් බැඳීම, පළමු කොට බැඳීම.

**ආබන්ධිත.** ති-බඳනා ලද, ආදියෙහි පටන් බඳනා ලද.

**ආබාධ.** පු-ව්‍යාධිය, රොගය, ලෙඩේ, පීඩාව.

**ආබාධික.** පු-ආබාධ ඇත්තා, රොගියා, ලෙඩා.

**ආබාධිකිනී.** ඉ-ආබාධ ඇත්තී. රොග ඇත්තී.

**ආබාධිත.** ති-පීඩාවන ලද, ආබාධ හටගන්නා ලද.

**ආබාධපච්චයා.** ති-ආබාධයක් නිසා, ලෙඩක් නිසා, රොගයක් නිසා,

**ආබාධෙති.** ක්‍රි-(ආ + බධ d. චු. බන්ධනෙ, බැඳීමෙහි. + ණෙ + ති) පීඩාකරයි, බාධා කරයි.

**ආබිල.** ති-කැළඹුණු, අපවිත්‍ර වූ.

**ආභත.** ති-එළවනලද, පමුණුවනලද, ගෙණ එනලද.

**ආභතක.** පු-ගෙණ ආ, එළවූ, පැමිණවූ.

**ආභරණ.** න-ආබරණ, පළඳනාව, සැරසීම

**ආභරති.** ක්‍රි-(ආ + භර d. භූ, පොසනෙ, පොෂ්‍යය කිරීමෙහි + ති) පොෂ්‍යය කරයි, වර්ධනයකරයි.

**ආභස්සර.** පු-ආලොකය ඇති, එනම් බඹලොව.

**ආභස්සරපීති.** ඉ-එනම් බඹලොව පිළිබඳ ප්‍රීතිය.

**ආභස්සරමෙත්තා.** ඉ-එනම් බඹලොව වැසි බඹුන්ගේ මෛත්‍රිය.

**ආභස්සරූපග.** පු-(ආභස්සර + උපග)ආභස්සරයට පැමිණි.

**ආභා.** ඉ-ප්‍රභාව, දීප්තිය, රශ්මිය.

**ආභාකර.** පු-ආලොකකරන්නා, හිරු, සූර්‍ය්‍යයා.

**ආභාති.** ක්‍රි-(ආ + භා d. භා. දිත්තියං, බැබලීමෙහි + ති) බබලයි, දිලිසෙයි.

**ආභාවන.** න-වර්ධනය, වැඩීම.

**ආභාවෙති.** ක්‍රි-(ආ + භා d භූ -දිත්තියං, බැබලීමෙහි + ති) වර්ධනය කරයි,

**ආභාස** පු-ආලොකය, එළිය.

**ආභික්ඛඤ්ඤ.** න-නිරන්තර භාවය, **අභික්ඛණස්ස භාවො ආභික්ඛඤ්ඤං:**

**ආභිචෙතසික.** පු-උත්තම චිත්තයෙහිවූ.

**ආභිදොසික.** පු-රාත්‍රිමුඛයෙහිවූ, ඊයේ සවසවූ.

**ආභිදොසික කාලකතා.** ති-ඊයේ රාත්‍රියේ මළ, ඊයේ රෑ කාලක්‍රියාකළ.

**ආභිධම්මික.** පු-අභිධර්මය දැනහඳුරන්නා, බිදම්දන්නා.

**ආභින්දති.** ක්‍රි-(ආ + භිද(දි) d. රු. විදාරනෙ, පැළීමෙහි + න + ති) බිඳියි, පලයි.

**ආභිනන්දන.** න-අභිනන්දනය, සතුටින් පිළිගැණීම.

**ආභිමුඛ්‍ය.** පු-අභිමුඛභාවය, ඉදිරිබව, ප්‍රධාන බව.

**ආභිමුඛ.** පු-ආභිමුඛ්‍යය, ප්‍රධානබව.

**ආභිසමාචාරික.** න-ශාසනයෙහි චාරිත්‍රසීලය, වතාවත්, ක්ෂුද්‍රානුක්ෂුද්‍ර ශික්ෂාශීලය, **“අභිවිසිට්ඨො උත්තමො සමාචාරො = ආභිසමාචාරො, ආභිසමාචාරොව = ආභිසමාචාරිකං.**

**ආභිසිත්ත.** පු-අභිෂෙකකළ, අභිෂෙකයෙන් උපන්.

**ආභිසෙක.** පු-අභිෂෙකයට සුදුසු, කිරීට ධාරණයට යොග්‍ය.

**ආභිසෙකික.** පු-අභිෂෙකයට සුදුස්සා, රජුන් අභිෂෙක මඩුයෙහි දමා යන පිළිය.

**ආභිසෙකී.** පු-අභිෂෙක ඇත්තා, ඔටුණු දරුවනු.

**ආභුජති.** ක්‍රි-(ආ + භුජ d. තු. කොටිල්ලෙ, වක්ව යාමෙහි + ති)කුටිලව යෙයි, පළක් බැඳ සිටියි, පසුබසියි.

**ආභුජන.** න-පසුබැසීම, වියළී අඩුකිරීම, නැමීම.

**ආභුජී.** ඉ-රුක්බුරුදගස, භූජපත්‍ර වෘක්ෂය.

**ආභුජිත්වා.** පූ-ක්‍රි-පළක්බැඳ, කකුල් ගොතා හිඳ, අරමිතිය ගොතාහිඳ.

**ආභුඤ්ජති.** ක්‍රි-(ආ + භුජ d. රු. පාලනභ්‍යව හරණෙ, පාලනයෙහි හා අනුභවයෙහි + ති)පාලනය කෙරෙයි. වළඳයි.

**ආභුඤ්ජන.** න-පාලනය, ප්‍රයොජනය, අනුභවය.

**ආභාති.** ක්‍රි-(ආ + භා d. භූ. දිත්තියං, බැබලීමෙහි + ති) බබලයි, හොබවයි.

**ආභොග.** පු-ආවර්ජනය, මනසකාරය, මෙනෙහි කිරීම, පරිපූර්ණ, සැපවිඳීම.

**ආභොග ආහර.** පු ආවර්ජන ආහාරය, මනස්කාර ආහාරය.

**ආම.** අ-ස්වීකාරයෙහි, වචන පිළිගැන්මෙහි, එසේය, එහෙයි. ඔව්, "ආම භන්තෙ"

**ආම.** න-නොපැසුනු, නොඉදුනු, අමු, පු, ව්‍යාධිය, අජීර්ණරොගය.

**ආමක.** පු-අමු නොපැසුනු, නොමුහුකළ.

**ආමකධඤ්ඤ.** න- නොපැසුනු-අමු ධාන්‍ය, හැල්, වී ආදී සත් වැදෑරුම් ධාන්‍ය.

**ආමක පටිග්ගහණ.** න-අමුධාන්‍ය පිළිගැණීම, භික්ෂූන්ට නොකැප සත්වැදෑරුම් ධාන්‍ය පිළිගැණීම.

**ආමකපූතික.** පු-මෙනම් ඇති පුද්ගලයා, ජීවමතක තැනැත්තා, අලජ්ජී පුද්ගලයා, පිරිසිදු හෝ අපිරිසිදු යයි කිව නොහැකි තැනැත්තා. "ජීවමතකො නාම ආමක පූතිකො නාම."

**ආමකභණ්ඩික ලසුණ.** න-විශාල ගණනක් බික් ඇති අමුළූනු, මගධරට හැදෙන මෙවැනි ළූනු භික්ෂුනීන්ට කෑමට තහනම් කර ඇත.

**ආමකමාංස.** න-නොපිසූ මස්, අමුමස්, අමනුස්‍ය උපද්‍රවයකදී පමණක් අනුදන්නා ලද මස්, මහාවග්ග පාලියෙහි දක්වා ඇති "අනුජානාමි භික්ඛවෙ අමනුස්සකාබාධෙ ආමකමංසං ආමකලොහිතං"

**ආමක ලසුණ.** න-අමු ළූනු, රාශියක් බික් ඇති අමු ළූනු.

**ආමක ලොහිත.** න-අමු ලේ, අළුත් ලේ, යක්ෂොපද්‍රවාදීන්හිදී පමණට බීමට අනුදත් ලේ.

**ආමක සාක.** න-අමු එළවළු, පලා ජාති.

**ආමක සාඛා.** ඉ-අමු අතු, නොවියලි අතු.

**ආමක සුසාන.** න-අමුසොහොන, වැළලීම්-දැවීම් නොකොට අමු මිනී ගෙණ ගොස් දමන සොහොන, සීවථිකාව, පෙර මෙහි මළමිනී පිස්සීම හෝ වැළලීම නොකරණ ලදී.

**ආමගන්ධ.** පු-මස් ගඳ, දුගඳ, කෙලෙස්, මිනී දුම්, ක්‍රොධය.

**ආමගන්ධි.** න-අමුමස්ගඳ ඇති, නොපැසුනු මාංස මල ආදියෙහි දුර්ගන්ධය. මිනීදැවීමෙන් නගිනදුම.

**ආමගිද්ධ.** න-මාංශලොභය, මසෙහි ගිජුබව.

**ආමට්ඨ.** ති-ආමර්ශනය කළ, ස්පර්ශකළ.

**ආමණ්ඩ.** පු-රටඑරඬු, එරඬු, නෙල්ලි.

**ආමජර.** පු-ආමජ්වරය

**ආමත්තිකා.** ඉ-මැටිභාජන, වලන්, පිඟන්, කෝප්ප ආදී මැටිබඳුන්.

**ආමත්තිකාපණ.** න-පිඟන්කෝප්පාදී මැටි භාජන ඇති වෙළඳසැල.

**ආමද්දන.** න-මැඬීම, පොඩිකිරීම, මිරිකීම.

**ආමද්දිත.** ත-මඩනාලද, පොඩිකළ, මිරිකන ලද.

**ආමන්ත.** ති-ආරාධනා කළ, නිමන්ත්‍රණය කළ.

**ආමන්තන.** න-ආමන්ත්‍රණය, පැවරීම, ආරාධනය.

**ආමන්තනවචන.** න-ආමන්ත්‍රණය කරණ වචන - කථාව, (ආලපන විභක්තිය.)

(4559)

**ආමන්තනක**. ක්‍රි-කථාපවත්වන, කථාකරණ, අමතන.

**ආමන්තනික**. ති - ආමන්ත්‍රණය ඇත්තා, ආරාධිතා ලද තැනැත්තා.

**ආමන්තනිකා**. ඉ සමග හැසිරෙන්නී, හිතවත් දෙවිය,

**ආමන්තයති**. ක්‍රි-(ආ + මන්ත d. චු. භාසනෙ, කීමෙහි + ණය + ති) අමතයි, ආරාධනා කරයි.

**ආමන්තයි** ක්‍රි (ආ + මන්ත d. චු. භාසනෙ, කීමෙහි + ණය + ඊ) ඇමතුයේය, ආරාධනා කෙළේය.

**ආමන්තිත**. ති- ආමන්ත්‍රණයකළ, ඇමතූ.

**ආමන්තනීය**. පු-ආමන්ත්‍රණය කටයුතු, ඇමතිය යුතු.

**ආමන්තෙති**. ක්‍රි-(ආ + මන්ත d. චු ණෙ + ති) ආමන්ත්‍රණය කරයි, ආරාධනා කරයි.

**ආමන්තෙත්වා**. පු-ක්‍රි-අමතා, කථාකොට.

**ආමය**. පු-රොගය, අජීර්ණය.

**ආමයන්තර**. පු- රෝග භෙදයක්, ව්‍යාධි විශෙෂයක්.

**ආමයාවී**. ති-ලෙඩ ඇත්තා, රෝගියා.

**ආමලක**. න-නෙල්ලි, ඇඹුලු, මැණික, මිණ.

**ආමලකී**. ඉ-නෙල්ලි, ඇඹුලු, නෙල්ලිනස, නෙල්ලිගෙඩි.

**ආමලකීවන**. න-නෙල්ලිවනය, ඇඹුලුවනය.

**ආමවාත**. පු-වාතරොගයක්.

**ආමසති**. ක්‍රි-(ආ + මස d. භූ. ආමසනෙ, ස්පර්ශකිරීමෙහි + ති) ස්පර්ශකරයි, පහසගණී, අල්ලයි.

**ආමසන**. න-පරාමර්ශණය, ස්පර්ශය, පහස, පිරිමැදීම.

**ආමසිත** ති-පරාමර්ශණය කළ, ස්පර්ශකළ.

**ආමසූල**. න-අජීර්ණ උපදනා රොගවිශෙෂයක්.

**ආමජීරණ**. න-ආමාජීර්ණය, ආහාර නොදිරීමෙන් වන අජීර්ණ රොගය.

**ආමාදාස**. පු-ගෙයි උපන් දාසයා

**ආමාසය**. පු-(ආම + ආසය) අමුඅහර රඳන ස්ථානය, නොදිරූ කෑම පවතින බොක්ක

**ආමාය**. ති-උපන්, ජාත, ගෙයි උපන්.

**ආමායදාස**. ති-උත්පත්තියෙන් වහලා, වහල් උත්පත්තිය.

**ආමිලාත**. පු-කෝමාරිකා.

**ආමිලාක** න-විසිතුරු මල්කමින් ගෙතූ ලොම පොරොනයක්.

**ආමිස**. න-ආහාරාදි ආහාරප්‍රත්‍යය. මාංසය, කෙලෙස් බිලිය.

**ආමිසඛාර**. න - ගස්වල අළුආදිය මිශ්‍රකර සාදාගන්නාලද කාරම්වතුරක්.

**ආමිස ආහාර**. පු-මස් සහිත ආහාරය,

**ආමිසගරු**. පු-ආමිසය ගරුකරන්නා

**ආමිසකිඤ්චික්ඛහෙතු**. න-සවල්පමාත්‍ර ආමිසයක් හේතුකොට ගෙණ,

**ආමිසචාග**. පු-ආමිස පරිත්‍යාග.

**ආමිසදායාද**. පු-ආමිස දායාද.

**ආමිසදාන**. න-ආමිස දානය.

**ආමිසපරියෙට්ඨි**. ඉ-ආමිස පරියෙසනය.

**ආමිසපූජා**. ඉ-ආමිස පිදීම.

**ආමිසභොග**. පු-ආමිස පරිභොගය.

**ආමිසභොගහෙතු**. න - ආමිස පරිභොග සනතුෂ්ටිය හෙතුකොට ගෙණ.

**ආමිසසඞ්ඛාර**. පු-ආමිසය ඇතිකිරීම, ආමිසය පැතිරීම.

**ආමිසලොක**. න-පඤ්චකාම වස්තූන් පිරි ලෝකය.

**ආමිසසන්නිචය**. පු-ආමිස රැස්කිරීම, ආමිස එකතුකිරීම.

**ආමිසසන්නිධි**. ඉ-ආමිස නිදන්කර ගැණීම.

**ආමිසරත්න**. න-ආමිසරතනය.

**ආමිසිද්ධි**. ඉ-(ආමිස + ඉද්ධි) ආමිස සෘද්ධිය.

**ආමුඤ්චති**. ක්‍රි-(ආ + මුච d. රු. මොචනෙ, මිදීමෙහි + ති) මූදයි, ලිහයි.

**ආමුත්ත**. පු-යුධයෙහි හඳනා ලද වස්ත්‍රාදිය, සැරසෙන ලද, පළඳනා ලද.

**ආමුත්තමණිකුණ්ඩල**. ති-පළඳන ලද රන් කොඩොල් ඇති,

(4608)

**ආමෙණ්ඩිත**. ති-භය, ක්‍රොධ, ප්‍රශංසා, ඉක්මන්, කුහුල්, ආශ්චය්‍ය යනාදියෙහි එකවචන දෙතුන් වරක් කීම, කිවක් නැවත නැවත දෙතුන්වරක් කීම, "ආමෙණ්ඩිතනතු විඤෙඤයාං දවිතතිකඛතතු මුදීරණං."

**ආමෙඩිත.** ති-ආමෙණ්ඩිත බලනු.

**ආමොද**. පු-සන්තොෂය, දුරට හමන සුවඳ.

**ආමොදක.** පු-සතුටුවන්නා, සුවඳකවන, අසමෝදගම්.

**ආමොදති.** ක්‍රි-(ආ + මුද d. භූ. සන්තොසෙ, සතුටෙහි + උ + ඞ + ති) සතුටුවෙයි.

**ආමොදන**. න-සතුටුවීම, සන්තොෂය.

**ආමොදනා**. ඉ-සන්තොෂය, සතුටුවීම.

**ආමොදමාන**. පු-සතුටුවන, සතුටුවනු ලබන.

**ආමොදිත**. ති-සතුටුවන ලද, සතුටු වූ, තුටු කළ, සුවඳ ගල්වන ලද.

**ආමොදිත පමොදිත**. ති - සතුටුවන ලද, බෙහෙවින් සතුටුවන ලද, සුවඳ ගල්වන ලද, අතිශයින් සුවඳ ගල්වන ලද,

**ආමොදෙති**. ක්‍රි-(ආ + මුද d. චු. සංසග්ගෙ, එකතුවීමෙහි + ණෙ + ති) එකතුවෙයි, සමගි වෙයි, සන්තොෂවෙයි.

**ආය.** පු-ලැබීම, වෘද්ධිය, ධනප්‍රාප්තිය, ධන ලාභය පැමිණීම, ඇතුල්වීමම.

**ආයකම්මික**. පු-භාණ්ඩාගාරිකයා, අයකැමියා, අයබදු එක්කරන්නා.

**ආයතක**. ති-අයිති, සන්තක, පිළිබඳ.

**ආයත**. ති-දීඝ, දික්, මහත්, පතළ.

**ආයතකම**. පු-දීඝ. "තනිකඛවෙ ආයතකෙන ගීතසසරෙන ධමෙමා භාසිතබෙබා."

**ආයආපාය**. න-වැඩ අවැඩ, යහපත අයහපත, හොඳනරක,

**ආයතගග**. පු-(ආයති + අගග) විපුලඵල භාව යෙන් මත්තෙහි අග්‍රවන.

**ආයතංස.** පු-(ආයත + අංස) දීඝකොටස.

**ආයතන**. න-උතපතති දෙශය, කාරණය, දෙවාලය, වාසස්ථානය, ආකරය, රැස්වන තැන, පදපූරණය යනාදීයෙහි. (ආයසස වා තනනතො ආයතසස වා සංසාර දුකඛසස නයනතො **ආයතනානි**.)

**ආයතනික**. පු-ආයතනයට අයත්, කාරණයට අයත්.

**ආයතපණ්හි**. ඉ-දික්විලුම් ඇත්තා, බුදුරජ.

**ආයතපම්හ**. පු-දික්වූ ඇස්ලොම්, දීඝාක්ෂිරොම.

**ආයතනඋප්පාද**. පු-ආයතනයන්ගේ ඉපදීම.

**ආයතනපණ්ණත්ති**. ඉ-ආයතන පැනවීම.

**ආයතනකුසල**. පු-ආයතනයන් පිළිබඳ දක්ෂ බව.

**ආයතා.** ඉ-දීඝභාවය, දික්සවභාවය.

**ආයතනට්ඨ.** පු-ආයතන පිහිටි තැන.

**ආයති.** -මතු, අනාගත කාලය.

**ආයතික.** පු-අනාගතයට අයිති, මත්තෙහි ලැබියයුතු.

**ආයතිකා.** ඉ ජල තලය, වතුර පයිප්පය,

**ආයතිභව** පු-මතු පැමිණෙන භවය, අනාගත භවය.

**ආයතිඵල**. න-මතු ජාතියෙහි ඇතිවන ඵලය.

**ආයකුසල**. පු-ධන රැස්කිරීමේ දක්ෂ.

**ආයකොසල්ල**. පු-මුදල් රැස්කිරීමෙන් ලාභ ලැබීමෙහි දක්ෂ බව.

**ආයන**. පු-මාර්ගය, ගමන.

**ආයපරිච්චාග**. පු-කෙනෙකුගේ ආදායම වියදම් කිරීම.

**ආයබ්බ**. පු-(ආය + වය. ව=බ. බ ද්විත්තයි) අය සහ වැය.

**ආය මුඛ**. න. අපායමුඛය. විනාශ දොරටුව, ඇතුල්වීම.

**ආයසමනත**. පු-සමානවූවන්ට ඇමතීමෙහි ශාසනික ව්‍යවහාරයක්. ඇවත්නි, පින්වත.

**ආයසමා**. පු-සතුටුසාමීචියෙහි යොදන වචන යක්, ගුණගෞරවය සඳහා පව්ච්චිකරණ නාමපදයක්, "අයසමාති පියවචන මෙතං".

**ආයස**. පු-යකඩින් උපන්, යකඩින් හටගත්, වානේ.

**ආයසක්‍ය**. න-අවමානය, අපකීර්තතිය. (ආය සතයං පාපුණති)

**ආයපොත්ථක.** න-ආදායම් ලියන පොත, ලේකම් පොත.

**ආයාග.** පු. ක්‍රි-ආගමනයකොට, ඇවිත්.

**ආයාග.** පු-(ආ + යාග) යාගකටයුත්ත.

**ආයාමක.** පු-ඉල්ලන්නා, යාඥකරන්නා.

**ආයාමති.** ක්‍රි-(ආ + යාච d. භූ. යාචනෙ, ඉල්ලීමෙහි + ති) ඉල්ලයි. යාඥකරයි.

**ආයාචන.** න-ඉල්ලීම, යාඥව.

**ආයාචිත.** ති-යාඥකළ, ඉල්ලන ලද.

**ආයාත.** ති-පැමිණි, සම්ප්‍රාප්ත.

**ආයාති.** ක්‍රි-(ආ + යා d. භූ. ගතියං, යාමෙහි + ති) යෙයි, ආගමනය කෙරෙයි.

**ආයාන.** න-කාරණය, පැමිණීම. උත්පත්ති ස්ථානය.

**ආයාච.** පු-දිග. දීඝීභාවය.

**ආයාම.** ක්‍රි-(ආ + යා d. භූ. ගතියං, යාමෙහි + ම) යමු, ගමනය කරමු. "ආයාමා වුසො යෙන භගවා තෙනුපසංකමෙය්‍යාම"

**ආයාම විත්ථාර.** පු-පලල "අතො තීනි යොජනානි විත්ථාරතො අඩ්ඪතියානි"

**ආයාම උබ්බෙද.** න-උස, උස ප්‍රමාණය.

**ආයාස.** පු-වෙහෙස, පීඩාව, අධික උත්සාහය.

**ආයාසිතත්ත.** න-වෙහෙස බව, පීඩා බව.

**ආයු.** න-ආයුෂය, වයස, ජීවනකාලය, ජීවිතින්ද්‍රිය.

**ආයුක.** පු-ආයු ඇත්තා, ආයුෂය, වයස් ඇත්තා. "යාවතායුකා දිබ්බසම්පත්තිං අනුභවිත්වා."

**ආයුකප්ප.** පු-ආයුස්කල්පය, පරමායුෂය. මුළු ජීවත්වනකාලය, "කප්පන්ති ආයු කප්පං."

**ආයුක්ඛය.** න-ජීවිතක්ෂය, ආයුෂය ක්ෂයවීම, සිවුවැදෑරුම් මරණයන්ගෙන් එකක්.

**ආයුපමාණ** න-ආයුෂයාගේ ප්‍රමාණය, ජීවන කාලප්‍රමාණය,

**ආයුපරියන්ත.** පු-ජීවියාගේ කෙළවර, ආයු කෙළවර,

**ආයුසඞ්ඛය.** න-ජීවිතය විනාශ වීම, ආයු පිරිහීම.

**ආයුදුබ්බල.** න-ආයුෂයෙහි දුබල බව, ජීවිතයේ දුබල කම, මරණ සතිය සිහිකටයුතු එක් ආකාරයක්.

**ආයුසඞ්ඛාර.** න-ආයුෂය, ආයුසංස්කාරය, ආයු සංඛාරාති, ආයුමෙව, සතො සම්පජානො ආයුසංඛාරං ඔස්සජි."

**ආයුසංඛාර වොස්සජ්ජන.** න-ආයුෂය අත් හැරීම, ජීවිතය බොහෝ කලක් පවත්වා ගැනීම සඳහා ඵලසමාපත්තීන්ට සම- වැදීමක් නැති බව.

**ආයුකී.** පු-ආයුෂ ඇත්තා, වයස් ඇත්තා.

**ආයුත්ත.** ති-යෙදුනු. විශෙෂයෙන් යෙදුනු.

**ආයුත්තක.** පු-අයකැමියා, අය එකතුකරන්නා.

**ආයුත.** ති-යෙදුන, සංයුක්ත.

**ආයුධ.** න-අවිය, ශස්ත්‍රය, ආයුධය.

**ආයුධී.** පු-අවිදරන්නා.

**ආයුබ්බෙද** පු-ආයුර්වේදය, වෛද්‍යශාස්ත්‍රය.

**ආයුවන්තු.** පු-වැඩිගිය වයස ඇති, මහළු.

**ආයුස්ස.** න-ආයුෂය, ආයු, වයස.

**ආයුසඞ්ඛාර.** පු-ආයුසංසකාරය, ආයුෂය, වයස් ප්‍රමාණය. "අථ ඛො භගවා ආයුසඞ්ඛාරං ඔස්සජි"

**ආයූහ.** පු-රාශිභූතකිරීම, රැස් කිරීම.

**ආයූහක.** පු-රැස්කරන්නා, එකතුකරන්නා.

**ආයූහති.** ක්‍රි-(ආ + ඌහ d. භූ. විතක්කෙ, විතර්කයෙහි + ති) රැස්කෙරෙයි. එකතුකරයි.

**ආයූහන.** න-රැස්කිරීම, එකතුකිරීම.

**ආයූහා.** ඉ (ආයු + ඌහා) ජීවිතය, ජීවිත කාලය.

**ආයූහිත.** ති-රැස්කළ, එක්කාසුකළ.

**ආයූහිත.** ති-කඩිසර, දක්ෂ, ආශා.

**ආයොග.** පු-වීර්‍යයීය යෙදීම, යොගය, ප්‍රයොග කිරීම.

**ආයොධන.** න-යුද්ධය, සංග්‍රාමය, යුද්ධභූමිය.

**ආර.** පු-ඉදිකටුව, විදිනාකටුව, දුර.

**ආරකත්ත.** න-දුරුකළ, ඈත් කළ, ඉවත් කළ, "ආරකත්තාහතත්තාව කිලෙසාරීන සො මුනි"

**ආරක්ඛ.** ති-(ආ + රක්ඛ) ආරක්ෂාව, රැකීම.

**ආරක්ඛා.** ඉ-ආරක්ෂාව.

**ආරක්ඛක.** පු-ආරක්‍ෂා කරන්නා, රක්‍ෂා කරන්නා.

**ආරක්ඛ දේවතා.** ඉ-ආරක්‍ෂක දෙවතාවන්.

**ආරක්ඛ පරිවාර.** න-ආරක්‍ෂා පිරිවර.

**ආරක්ඛාධිකරණ.** ආරක්‍ෂාකරණය.

**ආරක්ඛික.** පු-රකින්නා, ආරක්‍ෂාකරන්නා.

**ආරක්ඛිත.** ති-රක්‍ෂාකළ, රැකි.

**ආරක්ඛිතුං,** පු. ක්‍රි-රකින්නට.

**ආරක්ඛෙය්‍ය.** ආරක්‍ෂාකටයුතු, රැක්කයුතු.

**ආරකා.** අා-දූරාර්ථයෙහි, දුරැයි, ඈතයි.

**ආරකූට.** පු-පිත්තල, "රසතමෙබ මිසෙසත්වා කතා හාරකූටං"

**ආරග්ග.** පු-(ආරා + අග්ග) හිදිඅග, ඉදිකටුඅග.

**ආරග්ගකෝටි** ඉ-ඉදි අග කෙළවර, ඉදිකටු මුතය, "ආරග්ග කොටි නිත්තුද්දන මත්තං"

**ආරඤ්ඤ.** න-අරණයෙහිවූ, වනයෙහිවූ, වනය, කැලෑව.

**ආරඤ්ඤක.** ති-වනයෙහි වසන.

**ආරඤ්ඤික.** පු-වනවාසියා, වනචරයා, වනයට අයත්.

**ආරඤ්ඤිකත්තා.** ති-වනවාසී බව, වනයෙහිවූ.

**ආරඤ්ඤිකාඞ්ග.** න-(ආරඤ්ඤ + ඉක + අඞ්ග) වනයෙහි විසීමෙන් රකිනා අඞ්ගයක්, ආරඤ්ඤිකධුතාඞ්ගය.

**ආරඤ්ජිත.** ති-රඳනාලද, සලකුණුකරණ ලද.

**ආරත්ත.** පු-කාලය, යුගය "වස්සාරත්තෙන භික්ඛු ගාමං ආගච්ඡන්ති".

**ආරත.** ති-නො ඇලුනු, වැළකුනු, ඉවත්වුණු.

**ආරති.** ඉ-නො ඇලීම, වැළකීම, "ආරතිවිරති පාපා මජ්ජපානාච සංයමො".

**ආරතො.** අ-දුරින්, සම්පූර්ණයෙන්,

**ආරද්ධ.** ති-පටන්ගන්නා ලද, ආරම්භකළ.

**ආරද්ධචිත්ත.** න-ආරාධිතසිත් ඇත්තා.

**ආරද්ධවිරිය.** පු, න-පටන්ගන්නා ලද වීර්‍ය්‍යය.

**ආරද්ධ විරියාරම්භ.** පු-පටන්ගන්නා ලද වීර්‍ය්‍යාරම්භය.

**ආරනාළි.** න-කාඩිදිය.

**ආරපථ.** න-හිදිමල, ඉදිකටු මග, සූචිමාර්ගය.

**ආරබ්භ.** පු. ක්‍රි-පටන්ගෙන, ආරම්භකොට.

**ආරබ්ය.** පු- ක්‍රි-අරබයා, කරුණුකොටගෙණ.

**ආරභති.** ක්‍රි-(ආ + රභ d. භූ. රාභසෙස, උත්සාහයෙහි + ති) උත්සාහ කරයි.

**ආරභාමි.** ක්‍රි-(ආ + රභ d. භූ. ආරම්භෙ, ඇරඹීමෙහි + මි) අරඹමි, පටන් ගනිමි. ආරම්භ කරමි.

**ආරම්භ.** පු-ආරම්භය, පටන් ගැණීම, උත්සාහය. ක්‍රියාව-වෘක්‍ෂාදීන්ගේ විකොපනය, වෘක්‍ෂාදීන්ගේ කැඩීම්, බිඳීම් ආදිය.

**ආරම්භධාතු.** ඉ-ප්‍රථමාරබ්ධවීර්‍ය්‍යය, පළමු වෙන් පටන්ගත් වීර්‍ය්‍යය. වීර්‍ය්‍යය.

**ආරම්භපච්චය.** පු-වීර්‍ය්‍යප්‍රත්‍යය, වීර්‍ය්‍යහෙතුව.

**ආරම්භවත්ථු** ඉ-වීර්‍ය්‍ය ඉපදවීමට කාලය.

**ආරමණ** න ඇලීම, සිත් ඇලීම.

**ආරම්මණ.** න-අරමුණ, කාරණය, ගොචරය.

**ආරම්මණ කුසල** පු-අරමුණු දැනගැනීමෙහි දක්‍ෂබව.

**ආරම්මණූපනිජ්ඣාන.** න-(ආරම්මණ + උප + නි + ඣාන)

**ආරා.** අ-දූරාර්ථයෙහි, දුරැයි, ඈතයි.

**ආරා.** ඉ-හිඳ, විදිනා කටුව, සොම්මරුන්ගේ සැත්කටුව.

**ආරාචාර.** පු-(ආර + ආචාර) දුරුවූ ආචාරය, බැහැර ගිය යහපත් හැසිරීම.

**ආරාචාරී.** පු-දුරුවූ යහපත් ආචාර ඇත්තා. ආචාර නැත්තා.

**ආරාධක.** ප්‍ර-(ආ + රාධ + ණ්වු=අක) ආරාධනා කරන්නා, සතුටු කරන්නා.

**ආරාධන.** න-සතුටු කිරීම, සිද්ධිය, ප්‍රාප්තිය පැවරීම.

**ආරාධනා.** ඉ-ආරාධනය, සේවාව.

**ආරාධනාපෙඛ.** පු-සතුටු කරවනු කැමැත්තේ සතුටු කිරීම, බලාපොරොත්තු වන්නේ, ආරාධනා පෙඛො මඤ්ජුසරෙන ගාසි.

**ආරාධනීය** ත්‍රි-ආරාධනා කටයුතු, ඇමතිය යුතු.

**ආරාධිත**. ත්‍රි-ආරාධනා කරණු ලැබූ, පවරණු ලැබූ.

**ආරාධෙති**. ක්‍රි-(ආ + රාධ d. දි. සංසිද්ධියං සිදුකිරීමෙහි + ණෙ + ති) ආරාධනා කරයි.

**ආරාම**. පු-අභිරමනය, උපවනය, නුවරට නුදුරුව රොපනය කළ උද්‍යානය, ආශ්‍රමය.

**ආරාමඋපචාර**. න ආරාම උපචාරය, අරම අසල, අරම ළඟ, ආරාමයේ පරික්ෂෙපය, "අනුජානාමි භික්ඛවෙ ආරාමෙ ආරාමූප චාරෙ ඡතතං ධාරෙතුං."

**ආරාමගොනිසාදිකා**. පු - ප්‍රාකාර, භිත්ති ආදියකින් වට නොකළ ආරාමය ගොනි සාදිකා යයි කියති, එය ආරාමගොනිසාදිකා, විහාර ගොනි සාදිකා යයි දෙවැදෑරුම් වේ.

**ආරාමගොපක**. පු අරම්පල්ලෝ, ආරාම ආරක්ෂකයෝ.

**ආරාමට්ඨ**. පු-ආරාමයෙහි පිහිටි, අරමෙහි තුබූ.

**ආරාමකථා** ඉ-ආරාම වස්තූන් පිළිබඳ කථා, අදින්නාදාන පාරාජිකාවෙහි ආරාම පිළිබඳ විනිශ්චය.

**ආරාමදෙවතා**. ඉ-අරම්දෙවියෝ, පුෂ්පාරාම, ඵලාරාමයන්හි වසන දෙවියෝ.

**ආරාමපරිවත්තන**. න-ආරාම හුවමාරුව, අරමකින් අරමක් පරිවර්තනයකර ගැණීම.

**ආරාමපාල**. පු-උයන් ගොවුවෝ, ආරාම පාලකයෝ.

**ආරාමරාමණෙය්‍යක**. න-ආරාමයන් ගෙන් සිත් ඇලවීම් ඇති, පුෂ්පාරාම ඵලාරාම යන්ගේ සිත්කලු බව.

**ආරාමවත්ථු**. න-අරම් බිම්, ආරාමවස්තු, පස් විසි ගරු භාණ්ඩයන්ගෙන් එකක් "ආරාම වත්ථු නාම තෙසං යෙව ආරාමානං අත්ථාය පරිච්ඡින්දිත්වා ඨපිතොකාසෙ.

**ආරාමසාමික**. පු-අරම් හිමියා, ආරාමය කළ තැනැත්තා පුෂ්පාරාම-ඵලාරායෙහි අයිති කාරයා.

**ආරාමකිච්ච**. න-ආරාම පිළිබඳ කටයුතු.

**ආරාමතා**. ඉ-අභිරමන භාවය, ඇලීම්බව.

**ආරාමපාල**. පු-උද්‍යාන පාලකයා ආරාම පාලකයා.

**ආරාමවත්ථු**. පු-ආරාම භූමිය.

**ආරාමරොපන**. න-උයන්වතු රොපනයකිරීම.

**ආරාමික**. පු-ආරාමයෙහි නියුක්තයා, ආවාසිකයා, ආරාමයෙහි වසන්නා.

**ආරාමිකිනී**. ඉ-ආරාමයෙහි වසන්නී.

**ආරාමරොපන**. න-උයන්වතු රොපනයකිරීම.

**ආරාව**. පු-හඬ, නාදය, ඝොෂාව.

**ආරිය**. පු-ආර්‍ය්‍යයන්ට අයිති, ආර්‍ය්‍යයන් පිළිබඳ.

**ආරියජාති**. ඉ-ආර්‍ය්‍යජාතිය.

**ආරිස්ස**. න-(ඉසි ශබ්දයාගේ ඉකාරයට ආ ආදෙශයි. රිආගමයි. සකරද්විත්තයි.) ඍෂි හුගේ සවභාව. ඍෂිහට අයත් දෙය.

**ආරුප්ප**. න-අරූපයෙහි වූ, අරූතලයෙහිවූ,

**අරූප්පතල**. න-අරූතලය, අරූපීලොකය,

**ආරුප්පසමාධි**. ඉ-අරූපාවචරය පිළිබඳ සමාධිය.

**ආරුණ්ණ** න-වැළපීම, කෑගැසීම, විලාපකීම.

**ආරුය්හ** පු ක්‍රි-(ආ + රුහ. d. ත්වහට ය්හ ආදෙශයි.) ආරූඪවී, නැගී.

**ආරුහති**. ක්‍රි-(ආ + රුහ. d. භූ. ජනනෙ, ඉපදීමෙහි + ති) ආරූඪවෙයි, නැගෙයි.

**ආරුහන**. න-නැඟීම, ආරූඪවීම.

**ආරුග්‍ය**. න-නිරොගී බව, ආරොග්‍ය භාවය,

**ආරූළ්හ**. පු-(ආ + රුහ. d. ධාතුකෙරෙන් වූ ත හට හ ආදෙශයි. හ හට ළ ආදෙශයි) නැගුනු, ආරූඪවන ලද.

**ආරූළ්හ හත්ථි**. ඉ-ඇතුපිට නැගුනු, හස්ත්‍යා රූඪව.

**ආරූහ**. න-නැගීම, වැඩීම, පලල්වීම.

**ආරෙවත**. පු-ඇහැල, ඇසල ගස.

**ආරොග්‍ය**. න-නිරොගි බව, නිරොගි සවභාවය.

**ආරොග්‍යමද**. පු-නිරෝගි භාවයෙන් මත්වීම, නිරොගිකම නිසා ඇතිවන මත් ගතිය.

**ආරොගතා**. ඉ-නිරොගිබව, ආරොගභාවය.

**ආරොග සම්පදා**. ඉ-ආරොග්‍ය සම්පත්තිය, සැපත,

**ආරොචන**. න-දන්වීම, ඇඟවීම, විඥාපනය,

**ආරොචාපන**. න-දන්නවීම.

**ආරොචිත** ති දන්වන ලද, හඟවන ලද.

**ආරොචාපෙත්වා**. ති. පු, ක්‍රි-දන්වා, සැලකරවා.

**ආරොචෙති** ක්‍රි-(ආ + රුච. d. චු, රොචනෙ, රුචිකිරීමෙහි + ණෙ + ති + ) දන්වයි, හඟවයි.

**ආරොචෙත්වා**. පු-දන්වා, හඟවා, විඥාපනය කොට.

**ආරොදති**. ක්‍රි-(ආ + රුදි. d. භූ. අස්සුවිමො චනෙ, කඳුලුහෙළීමෙහි + ති) හඬයි, අඬයි.

**ආරොදන**. න-හැඬීම, කඳුලු වැගිරවීම.

**ආරොදිත**. ති-හඬනා ලද, ඇඬූ.

**ආරොපන** න-ආරූඪවීම, නැගීම, පිහිටුවීම.

**ආරොපිත**. ති-ආරොපනයකළ, නැගීමකළ.

**ආරොපෙති**. ක්‍රි-(ආ + රුප. d. චු. රොපණෙ, රොපණයෙහි + ණෙ + ති) රොපණයකරයි, ඉඳුවයි, සිටුවයි.

**ආරොපෙත්වා**. පු. ක්‍රි-නංවා.

**ආරොහ**. පු-උස. දිග, නැගීම, වැඩුනු මස් පිඬු ඇති.

**ආරොහකම්බු**. උස හා ඊට සුදුසු පළල.

**ආරොහණ**. න-නැගීම, උස, දිග හිණිමග.

**ආරොහණීය**. පු. න-නැගිය යුත්ත. ඉණිමග තරප්පුව.

**ආරොහති**. ක්‍රි-(ආ + රුහ. d. භූ. පාතුභාවෙ, පහළවීමෙහි + ඔ + ති) නගියි, ආරූඪවෙයි.

**ආරොහපරිනාහ** පු-දිග හා වට ප්‍රමාණය.

**ආරොහස්ස**. පු-(ආරොහ + අස්ස) අසු පිට යන්නා.

**ආරොහත්ථි**. ඉ-(ආරොහ + හත්ථි) ඇතු පිට යන්නා.

**ආරොහපරිනාහ**. පු-උස හා පුළුල, සුදුසු උස මහත ඇති.

**ආරොහිත්වා**. පු. ක්‍රි-නැගී, ආරූඪවී,

**ආල**. න-හිරියල්

**ආලක**. පු-ගාල, ගොවුද.

**ආලකමන්දා**. ඉ-වෙසමුණි රජුගේ එනම් උයන.

**ආලකා**. ඉ-වෙසමුණි රජුගේ එනම් රාජ ධානිය.

**ආලග්ගෙති**. ක්‍රි-(ආ + ලග d. භූ. සඞ්ග ඇලීමෙහි + ණෙ + ති) ඇලෙයි, එල්ලෙයි.

**ආලග්ගෙත්වා**. පු. ක්‍රි-එල්වා "පත්තං වෙලග්ගෙ ආලග්ගෙත්වා."

**ආලපති**. ක්‍රි-(ආ + ලප. d. භූ. වාක්‍යෙ, කිමෙහි + ති) ආදිකොට කථාකරයි. අමතයි.

**ආලපන**. න-ආමන්ත්‍රණය, පළමුකොට කථා කිරීම, ඇමතීම.

**ආලපනතා**. කථා සහිත, තමා උසස් කොට බිණීම සහිත.

**ආලපිත**. ති-ආමන්ත්‍රණය කළ, ඇමතූ, බිණූ.

**ආලම්බ**. න අරමුණ, ගොචරය, එල්බීම.

**ආලම්බණ** න-අරමුණ, එල්ලීම, හේත්තුවීම, ගොචරය.

**ආලම්බති**. ක්‍රි-(අ + ලම්බ d. භූ. ආවසංසනෙ, එල්ලීමෙහි + ති) එල්ලෙයි, හාන්සිවෙයි.

**ආලම්බණ දණ්ඩ**. පු එල්ලෙන දණ්ඩ, සැර යටිය.

**ආලම්බණඵලක**. න-හේත්තුවන ලෑල්ල හාන්සිවන පුවරුව.

**ආලම්බණබාහු**. න-එල්ලෙන අත්වැල,

**ආලම්බණරුක්ඛ**. න-එල්බ හිඳිනා රුක.

**ආලම්බර**. පු-පණාබෙරය, කොලාහලය.

**ආලම්බිත**. ති-එල්ලන ලද, එල්ලූ.

**ආලය**. පු-තෘෂ්ණාව, අපෙක්ෂාව, ගෙය.

**ආලයරත**. ති-පස්කම් සැපතෙහි හා තෘෂ්ණා වෙහි ඇලුණු.

**ආලයති**. ක්‍රි-(ආ + d. දි. සිලෙසනෙ, ඇලී මෙහි + ය + ති) ආලය කරයි, ඇලෙයි.

**ආලයරාම**. පු-තෘෂ්ණා වස්තූන්හි ඇලීම.

**ආලයසමුග්ඝාත**. පු-තෘෂ්ණාව නැති කිරීම. ආශාව උපුටා හැරීම,

**ආලයාභිනිවෙස**. පු-ආලයෙහි ඇතුළත්වීම.

**ආලවාල (ක).** පු-තෝතැනි, ගස්මුල් සෝදා නොයෑම පිණිස ගසවටේට බඳනා වැටිය.

**ආලවි** න-එනම් රට, එනම් ජනපදය, අලවි නුවර.

**ආලසක.** පු-අලසයා, මැලිතැනැත්තා.

**ආලස්‍ය.** න-අලසභාවය, මැලිබව.

**ආලස්‍යානුයෝග.** පු-අලස භාවයෙහි යෙදීම.

**ආලසායනා.** ඉ-අලසබව.

**ආලසිය.** න-ආලස්‍යය, අලසබව.

**ආලසියාභිභූත.** ති කුසීතකමින් මඩනාලද, අලසකමින් මඩනාලද.

**ආලාත.** පු-ගිනිපෙනෙල්ල.

**ආලාන.** න-සතුන්බඳින ටැඹ.

**ආලාප.** පු සම්භාෂණය, කථාකිරීම, පළමු වචනය, "ආලාපොනාම පඨමවචනං"

**ආලාපන.** න-කථාකරගැණීම, මනාකථාව.

**ආලාරපම්හ.** පු-වක්වූ නීලවර්ණ දීඝීඅක්ෂිපත්‍ර, නැමුණු නිල්වන් දික් ඇස්පිහාටු.

**ආලාහන.** න-සොහොන, සුසානභූමිය.

**ආලි.** පු-ගෝනුස්සා. ඉ. මියර, නියර. යෙහෙළි

**ආලීක.** න-බොරු, මිථ්‍යා.

**ආලිබති.** ක්‍රි-(ආ + ලිබ d. භූ. ලෙබතෙ, ලිවීමෙහි = ඉරි ඇඳීමෙහි + ති) ලියයි, ඉරි අඳියි.

**ආලිබන.** න-ලිවීම, ඉරිඇඳීම.

**ආලිඛිත.** ති ලියන ලද, ඉරි අඳිනලද.

**ආලිඞ්ග.** පු-මිහිඟුබෙරය, මෘදඞ්ගභෙරිය.

**ආලිඞ්ගන.** න-වැලඳගැන්ම, බදාගැන්ම. ප්‍රිය වචනය.

**ආලිඞ්ගති.** ක්‍රි-(ආ + ලිඞ්ග d. භූ. ලිඞ්ගතෙ, වැලැඳගැනීමෙහි + ති) වැලඳ ගණියි, ඔතයි.

**ආලිඞ්ගිත.** ති-වැලඳගත්තා ලද, ඔතන ලද.

**ආලිඞ්ගෙති.** ක්‍රි-(ආ + ලිඞ්ග d. චු. චිත්තක්‍රියෙ, සිතියම් කිරීමෙහි + ණෙ + ති) වැලඳගණී, ඇලෙයි.

**ආලිත්ත.** ති-දල්වනලද, දිලිසෙන ලද, තැවරූ, ගෑ,

**ආලින්ද.** පු-අක්දෙරිය, ප්‍රකොෂ්ඨය, තිසවත්ත, ගෙයිපිළ, කයිසෝරුව, බරාඳය. "**පසා-ණපසනාලින්ද පමුඛද්වාර බඞ්ඛනං.**" ගෙයි ඉදිරිපැත්තේ ශාලාව, ඉස්තෝප්පුව.

**ආලිප්පති.** ක්‍රි-(ආ + ලිප d. චු. ලිම්පනෙ, ආලෙපනය කිරීමෙහි + ණෙ + ති) ගෑමකරයි, තවරයි.

**ආලිම්පති.** ක්‍රි-(ආ + ලිප d. චු. ලිම්පනෙ, දූල්වීමෙහි, ගිනි මෙලවීමෙහි + ති) ගිනි-දල්වයි, මොලවයි.

**ආලිම්පන.** න-දූල්වීම, ගිනිදූල්වීම, ගෑම, තැවරීම.

**ආලිම්පිත.** ති දල්වන ලද, මොලවන ලද, ගානලද.

**ආලිම්පෙතුං.** අ - ගිනිතබන්ට, තවරන්ට, ගාන්ට.

**ආලු.** න-ගෝලාකාර පැලැටි වර්ගයක්.

**ආලිම්පෙනවා.** පු - ක්‍රි - ගිනිතබා, ගිනිදැල්වා, තවරා, ගා.

**ආලුක.** ති පහසුවෙන් වෙනස් විය හැකි, ඉක්මනින් දූනෙන සවභාවයක් ඇති, හිතට වැදීයන,

**ආලුප්ප.** න-(ආලොප + ණ) පිඩු, පිණ්ඩය.

**ආලුප** න-කෑමට සුදුසු මුල්වර්ගයක් (රාබු)

**ආලුම්පති.** ක්‍රි-(ආ + ලුම්ප d භූ. ලුම්පනෙ, ඇදීමෙහි, කැඩීමෙහි + ති) කඩයි, අදියි.

**අලුම්පකාර.** පු-ආලොපකරණය, බත්ගුලි-කිරීම.

**ආලුල.** පු-කැලඹීම, කැලතීම, අපිරිසිදුවීම,

**ආලුලමාන.** ක්‍රි-වි-කලඹනුලබන, කම්පාකරණු ලබන.

**ආලුලති.** ක්‍රි-(ආ + ලුල d. භූ. මන්‍ථනෙ. කැලඹීමෙහි + ති) කලතයි, මථනයකරයි, කළඹයි.

**ආලුලිත.** ති-කලත්තන ලද, කලඹන ලද, කම්පාකරණලද.

**ආලුවකණ්ඩ.** පු-කෑමටගන්නා එනම් අලවර්ගය.

**ආලෙප.** පු-ආලිම්පනය, ගෑම, තැවරීම, "එකෙනෙව ආලෙපන අපකඩ්ඪි."

**ආලෙපන.** න-ගෑම, තැවරීම, වැකීම.

**ආලෙපෙති.** ක්‍රි-(ආ + ලිප d චු. ලිම්පනෙ, ගෑමෙහි + ණෙ + ති) ගායි, ආලිම්පනය කරයි.

**ආලොක.** පු-රශ්මිය, ප්‍රභාව, එළිය.

**ආලොකකර.** පු-එළිය ගෙණ එන්නා, ආලෝකය කරන්නා.

**ආලොකන.** න-බැලීම, නිරීක්ෂණය.

**ආලොකකරණ.** ති-එළියකරණ, ප්‍රභාමත් කරණ.

**ආලොකනීය.** ති-දක්කයුතු, දැකීමට සුදුසු.

**ආලොකද.** පු-එළිය දෙන්නා, රශ්මිය දෙන්නා

**ආලොකසඤ්ඤා.** ඉ යම්වස්තුවක් පිළිබඳව පවත්නා, ආලොකය පිළිබඳව පවත්නා සංඥාව.

**ආලොකකසිණ.** න-ආලොකකසිණය, දශ-කසිණයන්ගෙන් එකක්.

**ආලොකසන්ධි.** ඉ-කවුළුදොර, ජනෙලය.

**ආලොකදස්සන.** ති-එළියදැකීම, රශ්මිය දැකීම.

**ආලොකඵරණ.** ති-ආලොකය තිරවීම, රශ්මිය විහිදුවීම.

**ආලොකබහුල.** පු-සම්පූර්ණ (ආලොකය) දැකීම.

**ආලොකිත.** ති-ඉදිරිබලන ලද, නිරීක්ෂණය කළ.

**ආලොකිතවිලොකිත.** ති-ඉදිරිපසු බලනලද,

**ආලොකී.** පු-දක්නා තැනැත්තා.

**ආලොකෙති.** ක්‍රි-(ආ + ලොක d. චු දස්සනෙ, දැකීමෙහි + ණෙ + ති) ආලොකනය කරයි, බලයි.

**ආලොප.** පු-බත්පිඩ, බත්ගුලිය, ආහාරය.

**ආලොචන.** න-දැකීම, බැලීම, විමසාබැලීම,

**ආලොපික.** පු-ආලොපයෙන් යුත්, (බත්) පිඩකින් යුතු.

**ආලොල.** පු-කැලඹීම, කම්පාව, චලනය කොළාහලය.

**ආලොලන.** න-කම්පාවීම, චලනයවීම.

**ආලොලිත.** ති-අලලන ලද, කම්පාවන ලද.

**ආලොලෙන්ත.** ති-කලතමින්,

**ආලොලෙති.** ක්‍රි-(ආ + ලොල d. චු. උම්මා-දනෙ, ලොල්වීමෙහි, උමතුවීමෙහි + ණෙ + ති) අලලයි, කලඹයි.

**ආළක.** පු-කටුව, හෙල්ල, තුඩ

**ආවජ්ජ.** ති-ආවර්ජිතාව, ලාමකදෙය.

**ආවජ්ජති.** ක්‍රි-(ආ + වද d. භූ. වචනෙ, කීමෙහි වද=වජ්ජ + ති) නිසුබෙණෙයි. ලාමක කොට කියයි.

**ආවජ්ජන.** න-ආවර්ජනාව, බැලීම.

**ආවජ්ජිත.** ති-ආවර්ජනා කරණලද, බලනලද

**ආවජ්ජිත්වා.** පු-ක්‍රි-ආවර්ජනාකොට, මෙනෙහි කොට.

**ආවජති.** ක්‍රි-(ආ + වජ d. භූ. වචනෙ, ඇතුල් වීමෙහි + ති) ඇතුල්වෙයි.

**ආවට.** පු-ආවෘත, වසනලද, බැසගත්, "තමොකඛණෙන ආවටා."

**ආවට්ට.** පු-ආවර්තනය, කරකැවීම, දිය-සලාව, දියසුළිය.

**ආවට්ටති.** ක්‍රි-(ආ + වටට d. භූ. ආවත්තනෙ, වටකිරීමෙහි + ති) වටකරයි, කරකැවෙයි.

**ආවට්ටන.** න-ආවර්තනය, පෙරළීම. කර-කැවීම,

**ආවට්ටනා.** ඉ-පරිවර්තනය, පෙරළීම.

**ආවට්ටනාවලි.** ඉ-ශුද්‍රාෂ්ටක වැල, නවගුණ වැල

**ආවට්ටද්වාර.** න වසනලද දෙරඇති.

**ආවට්ටනය.** -එකම අර්ථය තවත් අර්ථයන්හි ආවර්තනය වීම (පරිවර්තනයවීම).

**ආවට්ටහාර.** පු-යම් හාරයෙක දෙශනාරූඪවූ ධර්මයෝ සභාග විසභාග ධර්මවශයෙන් ආවර්තනය කරණු ලැබීම.

**ආව.** d. භූ. අවදාරණෙ, නිශ්චයෙහි, ආවති, නිශ්චයකරයි.

**ආවති.** ක්‍රි-(ආව d. භූ. අවදාරණෙ, නිශ්චයෙහි + ති) නිශ්චයකරයි.

**ආවත්ත.** ති-ආපසු නැමුණු, පෙරළා කර-කැවුනු, ආවර්තනය, කරකැවීම.

**ආවත්තක.** පු-ආවර්තිකයා, අනුකූලව- හැසිරෙන්නා, එකඟව පවත්නා තැනැත්තා

**ආවත්තති.** ක්‍රි-(ආ + වතු d. භූ. වත්තනෙ, පැවැත්මෙහි + ති) අවර්තනය වෙයි. පෙරළෙයි. පවතියි.

**ආවත්තමාන.** ති-කැරකෙමින්, ආවර්තනය වෙමින්.

**ආවත්ථික.** ති-අවස්ථාවට සුදුසු, කාලෝචිත මූලික නාම ප්‍රභේදයෙකි, බලිවද්ද, චචොරා, දම්මො යනාදිය මෙනි

**ආවට්ටිත.** ති-පෙරළෙන ලද, පරිභ්‍රමණය වන ලද.

**ආවත්තන.** න-ආවර්තනය, කරකැවීම, ළඟට ඇදගැනීම.

**ආවත්තනීමායා.** ඉ-තමාළඟට ඇදගන්නා මායාව.

**ආවපති.** ක්‍රි-(ආ + වප d. භූ. වප බීජ නික්ඛෙපෙ, බිජුවැපිරීමෙහි + ති) බිජුවපුරයි ධාන්‍යරෝපනය කරයි.

**ආවපන.** න-වැපිරීම, ධාන්‍යරෝපනය

**ආවර.** පු-ආවරණය, වැසීම, ඡාදනය.

**ආවරණ.** න-වැසීම, මුවහකිරීම.

**ආවරණතා.** ඉ-වැසිම් භාවය, මුවහකිරිම් භාවය,

**ආවරති.** ක්‍රි-(ආ + වර d. භූ. සංවරණෙ, ආවරණය කිරීමෙහි + ති) ආවරණයකරයි. අසුරයි.

**ආවරණීය.** පු-ආවරණයකටයුතු වැසියයුතු.

**ආවරණීයධම්ම.** න-ආවරණය කටයුතුධර්ම, පඤ්චනීවරණ.

**ආවලි.** ඉ-වෘක්ෂාදීන්ගේපෙළ, පඞ්ක්තිය.

**ආවසතක.** පු-වාසයකරන්නා, නිවසන්නා.

**ආවසති.** ක්‍රි-(ආ + වස d. භූ. නිවාසෙ, වාසය කිරිමෙහි + ති) වෙසෙයි, වාසය කෙරෙයි.

**ආවසථ.** පු-වාසස්ථානය, ආවාසය, ගෙය, වාසය, විශ්‍රාමශාලාව.

**ආවසථාගාර.** න-ලගිනා ගෙය, ඔවරක, වසනාගෙය.

**ආවසථචීවර.** න-ඔසප් වූ මෙහෙණනට පාවිච්චියට දෙන සිවුරු.

**ආවසන.** -විසීම, වාසයකිරීම.

**ආවසිත.** ති-වාසයකළ, විසූ.

**ආව.** න-දුක්, අභාග්‍යය, ආවාසනාව.

**ආවහ.** පු-බරඉසිලීම.

**ආවහසුඛ.** පු-සැපඑලවීම, සුව ගෙණ දීම.

**ආවහති.** ක්‍රි-(ආ + වහ d. භූ. පාපණෙ, පැමිණීමෙහි, ඉසිලීමෙහි + ති) පැමිණෙයි, උසුලයි

**ආවහන.** න-ඉසිලීම, උද්වහනය.

**ආවහනක.** පු-උසුලන්නා.

**ආවහාති.** ක්‍රි-ආවහති බලනු.

**ආවාට.** පු-බිම සාරණලද වළ, වළ.

**ආවාටකච්ඡප.** පූ-වළෙහි වූ කැස්බාවා

**ආවාප.** පු-උදුන, ළිප, පෝරනුව.

**ආවාර.** පු-වැලැක්ම, ආවරණය.

**ආවාරෙති.** ක්‍රි-(ආ + වර. d. චු. ආවරණෙ, වැලැක්මෙහි + ණෙ + ති)වලක්වයි, ආවරණය කරයි.

**ආවාස.** පු-වාසස්ථානය, ලැගුම්ගෙය, ගෘහය.

**ආවාසකප්ප.** අකැප දශ වස්තූන්ගෙන් එකක්.

**ආවාසමච්ඡරිය.** පු-ආවාසගැණ මසුරුවීම.

**ආවාසපලිබොධ.** පු-ගෘහයන්හි දෝෂ, ආවාසයන්හි දෝෂ.

**ආවාසික.** පු-ආවාසයෙහි වසන්නා, නෙවාසිකයා "ආවාසහෙතුකං වා මච්ඡරියං ආවාසමච්ඡරියං"

**ආවාසසප්පාය.** පු ආවාසයන්හි සුදුසු කම,

**ආවාහ.** පු-පුරුෂයෙකුට කන්‍යාවක් ගෙණ ඊම, අන්ගෙදරකින් දැරිකාවක් ගෙණ ඊම ආවාහයයි. අන්‍යයකුට දීම විවාහයයි.

**ආවාහන.** න-ආවාහකිරීම.

**ආවාහ විවාහ.** පු-ආවාහ සහ විවාහ බලනු.

**ආවි.** අ-ප්‍රාදුර්භාවයෙහි, ඉදිරිපිට, සම්මුඛයෙහි.

**ආවිට්ඨ.** ති-අමනුෂ්‍යාදීන් විසින් ආවේසවන ලද, වාසයකළ.

**ආවිජ්ඣති.** ක්‍රි-(ආ + විද. d. දි. විජ්ඣනෙ, විදීමෙහි + ති) විදියි, දෙපළුකරයි.

**ආවිජ්ඣන.** න-විදීම.

**ආවිජ්ඣනක.** පු-විදින්නා, හිදිවිදින කටුව.

**ආවික්ෂුපන.** න-එල්ලීම, තමා ළඟට ඇදීම, වෙතට ඇදීම.

**ආවික්ෂුපනරජ්ජු.** න-එල්ලෙන රැහැ,

**ආවි වා රහො.** අ-සම්මුඛයෙහි හෝ අසම්මුඛයෙහි (රහසිගතව)

**ආවිකම්ම.** නි-පැහැදිලි කිරීම, පහළ කිරීම,

**ආවිකරොති.** ක්‍රි-(ආ+වි+කර. d. ත. කරණෙ, කිරීමෙහි+ති) පහළ කරයි, ප්‍රකාශ කරයි.

**ආවිකාතබ්බා.** නි-පැවසිය යුතුය, කිවයුතුය, "සන්තී ආපත්ති ආවිකාතබ්බා"

**ආවිඩ.** නි-දමතලද, හෙලතලද, විදිනලද.

**ආවිභාව.** පු-ප්‍රකාශය, වැසුම්හැරීම, ප්‍රකටවීම.

**ආවිල.** නි-මලිනජලය, කැලඹීම, චංචලය ප්‍රසන්න නොවන, නොපැහැදිලි.

**ආවිලත්ත.** න-කැලඹුනු සිත, චංචල සිත.

**ආවිලත්ත.** න-කැලඹීම් බව, චංචල භාවය.

**ආවිසති.** ක්‍රි-(ආ+විස. d. භූ. පවෙසෙ, ප්‍රවේශ වීමෙහි+ති) ප්‍රවේශ වෙයි. ඇතුලත් වෙයි.

**ආවුක.** පු-(ආ+අව. d. රක්ඛතෙ, රැකීමෙහි +ණුක) රක්ෂාකරන්නා.

**ආවුණාති.** ක්‍රි-(ආ+වා. d. යු. සංවරණෙ ආවරණයෙ+උණ+ති) සංවරණය කරයි.

**ආවුත්ථ.** නි-(අ+වස. d ත ප්‍රත්‍යයට උත්ථ දෙසයි,) වාසය කළ. විසූ. **"ඉදං හිතං ජෙතවනං ඉසි සඞ්ඝනිසෙවිතං ආවුත්ථං ධම්මරාජෙන පීතිසංජනනංමම"**

**ආවුත.** නි-අමුණනලද, වටකළ.

**ආවුධ.** පු-ආයුධය, ශස්ත්‍රය.

**ආවුධ හත්ථ.** නි-ආවුධගත් අත් ඇති.

**ආවුය්හන.** න-ඉසිලීම, උසුලාගණියාම.

**ආවුය්හමාන.** නි-ජලවේගයෙන් ගෙණයනු ලැබීම.

**ආවුසො.** ආ-සමානසිත්ථ ආමන්ත්‍රණය කිරීමෙහි පවත්නා ශාසනික ව්‍යවහාරයක්, ඇවැත්නි, පින්වත, ආයුෂ්මත. "ආවුසො ආනන්ද ඉමං සුත්තං කත්ථ භාසිතන්ති."

**ආවෙග.** මහත් වේගය.

**ආවෙඨන.** න-වෙළීම, එතීම.

**ආවෙඨන නිබ්බෙඨන.** න උඩට සහ පහලට වෙළීම.

**ආවෙඨිත.** නි වෙළන ලද, ඔතන ලද.

**ආවෙඨිය.** පු, ක්‍රි-වෙළා, ඔතා.

**ආවෙඨෙති.** ක්‍රි-(ආ+වෙඨ d. චු. වෙඨනෙ, වෙළීමෙහි+ණෙ+ති) වෙළයි, ඔතයි.

**ආවෙණි.** ඉ-පරම්පරාව.

**ආවෙණික.** නි-පරම්පරානුගත, තම කුල ගොත්‍රයට අයිති.

**ආවෙණිකභාව.** කුලගොත්‍රයට අයිති බව, පරම්පරානුගත භාවය.

**ආවෙණිය.** පු-ආවෙණික බලනු.

**ආවෙණිසඞ්ඝකම්ම.** පු-පරම්පරාවෙන් පැවැත එනු ලබන සඞ්ඝ කර්මයන්.

**ආවෙදනීය.** නි-දැන්වියයුතු, හැඟවියයුතු.

**ආවෙනි.** ඉ-ආවෙණි බලනු.

**ආවෙදිත.** නි-දන්වන ලද, හඟවන ලද.

**ආවෙධ.** පු-විදීම.

**ආවෙධික.** පු-විදින්නා.

**ආවෙධිත.** නි-විදින ලද.

**ආවෙධති.** ක්‍රි-(ආ+විධ d. භූ. වෙධනෙ, විදීමෙහි+ති) විදියි.

**ආවෙධික නිබ්බෙධික.** පු-ආවෙධික බලනු.

**ආවෙල(ළ).** පු-මුදුන් මල්කඩ. ශීර්ෂාවරණය.

**ආවෙල පිළන්ධන.** පු ශීර්ෂාවරණ පැළඳීම.

**ආවෙළිත.** නි-වෙළන ලද, ඔතන ලද.

**ආවෙළිත සිඞ්ගික.** නි-වෙළනලද අං ඇති, සරසනලද අං ඇති.

**ආවෙළිනී.** ඉ-මල් හා ශිර්ෂාභරණයන් පැළඳගත් තැනැත්තී.

**ආවෙස.** පු-යක්ෂාදීන්ගේ ආරූඪය. ආකල්පය, ආකාරය. අභිනිවෙසය.

**ආවෙසන.** න-වේශය, ශිල්පශාලාව, ජීවත්වන තැන, ගෙය, ශාස්ත්‍ර ශාලාව.

(5024)

**ආවෙසන විත්‍තක**. න-ඉඳිකටු දිදුල ආදිය තබන බඳුන, කුලාව.

**ආවෙසික**. ති-අමුත්තා, ආගන්තුකයා.

**ආවෙසිත**. ත-ආවේසවන ලද, ආකාර ගත්,

**ආස**. d. භූ. උපවෙසනෙ, හිඳීමෙහි + ති. අසති, හිඳියි, සමීපයෙහි හිඳියි.

**ආසංස**. පු-බලාපොරොත්තුව, ආශාව.

**ආසතන**. ති-ඇළුනු, තදින් ආලයකළ.

**ආසංසති**. ක්‍රි-(ආ + සංස. d. භූ. - සංසනා, බලාපොරොත්තු විමෙහි + ති) බලාපොරොත්තු වෙයි.

**ආසඞ්කනිය**. ති-සැක කටයුතු.

**ආසඞ්කා**. ඉ-එකක් නිශ්චයකරගත නොහැකිවීම, සැකය.

**ආසංසා**. ඉ-කැමැත්ත, ආශාව, බලාපොරොත්තුව.

**ආසංසුක**. ති-බලාපොරොත්තු ඇති, ආශා ඇති.

**ආසඞ්කී**. ති-සඞ්කා ඇති, සැක ඇත්තා.

**ආසඞ්කිත**. ති-සැකකළ, නිශ්චය නොකළ, මුලපටන් සැක කළ.

**ආසඞ්කිත පරිසඞ්කිත**. ති-සැක කළ, විශෙෂයෙන් සැක කළ.

**ආසඞ්ග**. පු-ඇලීම, ආසා කිරීම.

**ආසඞ්ගී**. ති ඇලීම් ඇත්තා, ආශාකිරීම් ඇති

**ආසඞ්ග වචන**. න-අභිරති වචනය, ආසාවෙන් යුත් වචනය.

**ආසංස**. ති-ආසා සහිත, ආසා ඇති.

**ආසක**. ති-කෑම ඇති, ආහාර සහිත.

**ආසකතත**. න-ආහාර සහිත බව, කෑම ඇති බව.

**ආසඞ්සති**. ක්‍රි-(ආ + සංස d. භූ. පසංසනෙ, පැසසීමෙහි + ති) ප්‍රශංසා කරයි, පසසයි.

**ආසඞ්සා**. ඉ-සුභප්‍රාර්ථනාව, ප්‍රශංසාව, පැසසීම.

**ආසජ්ජ**. පු ක්‍රි-(ආ + සද + ත්වා=ය) ලඟට පැමිණ, ගටා.

**ආසජ්ජති**. -(ආ + සජ්ජ d. භූ. සජ්ජ සඞ්ග. ඇලීමෙහි + ති) ගටයි. සමීපයට පැමිණෙයි.

**ආසජ්ජන**. න-ලඟට පැමිණීම.

**ආසතත**. ති-ආශකත, ඇලෙන ලද, ඇලුනු, ශාපකළ.

**ආසතති විඝාත**. න-ඇලීමක් නැතිබව, මිද්ධය.

**ආසතති**. ඉ-ආලය. ශසත්‍රය, ආයුධය, තෘෂ්ණාව.

**ආසතති භව**. පු-භවයෙහි ඇලීම.

**ආසති**. ක්‍රි-(ආස d. භූ. උපවෙසනෙ, හිඳීමෙහි + ති) හිඳියි, ලඟ හිඳියි.

**ආසන්දි**. ඉ-පමණ ඉකුත් දික්හගලා පුටුව, දික් හාන්සි පුටුව.

**ආසද**. පු-ලංවීම. ලඟ හිඳ ගැණීම.

**ආසනන**. ති-සමීපය, ලඟ.

**ආසනනතය**. පු-ආසන්නයෙහිම සිටින්නෙකු ගෙණ කීම ආසන්නතය නම් මේ.

**ආසන**. න-අස්න, හිඳිනා තැන, පුටු බන්කු කලාල ආදිය, හිඳීම.

**ආසන සාලා**. ඉ-අසුන් හල, හිඳින ශාලාව.

**ආසන අභිහාර**. පු-ආසන පරිත්‍යාගය.

**ආසන උපාගත**. ති-අසුනෙහි වාඩිවූ, අසුන් ගත්, අසුන් පත්.

**ආසනක**. පු-නොවටිනා ආසනය, නීචාසනය.

**ආසන පඤ්ඤාපක**. පු-අසුන් පනවන්නා, ආසන පඤ්ඤාපකයා.

**ආසන පටික්ඛිතක**. පු-ආසන අත්හල තැනැත්තා, ආසන ප්‍රතික්ෂෙපකයා.

**ආසනසාලා**. ඉ-හිඳිනා ශාලාව, විශ්‍රාමශාලාව, දන්සැල.

**ආසනික**. පු-ආසන ඇත්තා, එකාසනය ඇත්තා.

**ආසන්දිකා**. ඉ-කුඩා පුටුව, නොවටිනා පුටුව.

**ආසනිය**. ති-හින්ද යුතු, ඉඳගතයුතු.

**ආසනුපගත**. ති-(ආසන + උපගත) ආසනයට පැමිණි.

**ආසපපනා**. ඉ-පසුබැසීම "තිවෙජතුං අසකෙකානති ආරම්මණතො ඔසකකතීති ආසපපනා" මහානිද්දෙසටීකා කථා.

**ආසභ.** පු-උත්තම, ශ්‍රෙෂ්ඨ, නිර්භීය, ශ්‍රෙෂ්ඨ-ගවයා, උත්තම ආචාර්‍ය්‍යයා, උසභයාට අයිතිදේ.

**ආසභට්ඨාන.** පු-උසස් පදවිය, ශ්‍රෙෂ්ඨතනතුර.

**ආසභි.** ඉ-නිර්භය භාවය ඇති, කම්පා නො වන **"ආසභිං වාචං භාසති"**.

**ආසභිවාචා.** ඉ-ශ්‍රෙෂ්ඨ වචනය, නිර්භය වචනය.

**ආසමාන.** පු-ප්‍රාර්ථනා කරණු ලබන, බලාපොරොත්තු වනු ලබන.

**ආසමෙති.** ක්‍රි-(ආ + සමු d. දි. උපසමෙ, සංසිඳීමෙහි + ණෙ + ති) සංසිඳුවයි.

**ආසය.** පු-අභිප්‍රාය + අවකාසය, ලගිනා ගෙය, වාසස්ථානය, ගෙය, සත්ත්ව සන්තානය.

**ආසය විපත්ති.** ඉ-අභිප්‍රාය විපත්තිය.

**ආසයති.** ක්‍රි-(ආ + සි d. භූ. සයෙ, සයනය කිරීමෙහි + ණය + ති) හොවියි, නිදයි.

**ආසයානුසය.** පු-ආසය හා අනුසය.

**ආසය පොසන.** පු-අභිප්‍රාය පොෂණය කිරීම,

**ආසයාස.** පු-වහ්නිය, ගින්න.

**ආසයාසයිභාව.** පු-ද්‍රව්‍ය-ගුණ දෙදෙනා ගේ අන්‍යොන්‍ය සම්බන්ධය, ද්‍රව්‍යය ආසය නම්, ආසයී නම් ගුණයයි.

**ආසව.** පු-කාමාශ්‍රව භවාශ්‍රව දෘෂ්ට්‍යාශ්‍රව අවිද්‍යාශ්‍රව යන සතර. පූසා, සැරව, සුරා, උපද්‍රවය.

**ආසවක්ඛය.** පු-කාමාදී ආශ්‍රවයන් ගේ ක්ෂය කිරීම, නිවණ.

**ආසව නිරොධ.** පු-කාමාදී ආශ්‍රවයන් ගේ නිරුද්ධිය, නිර්වාණය.

**ආසවති.** ක්‍රි-(ආ + සු d. තු. අභිසවෙ, වැගිරීමෙහි + ති) වැගිරෙයි, වහනය වෙයි, ගලාබසියි.

**ආසවසමුදය.** න-කෙලෙසුන්ගේ හටගැන්ම කෙලශොත්පත්තිය.

**ආසංස.** පු-ප්‍රාර්ථනා සහිත, ආසා සහිත.

**ආසංසක.** පු-ප්‍රාර්ථනා කරන්නා බලාපොරොත්තු වන්නා.

**ආසංසන.** න-ප්‍රාර්ථනාව, ආසිංසනය.

**ආසංසනීය.** පු-ප්‍රාර්ථනා කටයුතු.

**ආසංසමාන.** ති-ප්‍රාර්ථනා කිරීම සහිත, බලාපොරොත්තුවනු ලබන.

**ආසංසුකි.** ති-ආසංසක බලනු.

**ආස සාන.** ති-බලාපොරොත්තුවෙන, ආශාවන.

**ආසා.** ඉ-තෘෂ්ණාව, ආසාව. කැමැත්ත.

**ආසාඵල.** න-අර්ථසිද්ධිය, දියුණුව.

**ආසාටිකා.** ඉ-ඉහඬ, ඉහඳ, ඉහඳමැස්සා ගේ බිජු.

**ආසාද.** පු-ගැටීම, පීඩාව, හිරිහැරය.

**ආසාදන.** න-ගැටීම, පීඩාකිරීම, හිරිහැර කිරීම.

**ආසාදනාපෙක්ඛ.** පු-චොදනා කිරීම, ලජ්ජා කිරීම බලාපොරොත්තු වූ.

**ආසාදිත.** ති-ගටන ලද, පීඩා කළ.

**ආසාදිය.** පු. ක්‍රි-සංඝට්ටනය කොට, ගටා.

**ආසාදෙති.** ක්‍රි-(ආ + සද d. චු. අස්සාදෙ, ආස්වාදයෙහි + ණෙ + ති) රසවිඳියි, ආස්වාදනය කරයි.

**ආසාවච්ඡෙද.** පු-ආශාව සිඳීම, කඨින සිවුරෙහි ආශාව නැතිවීම,

**ආසාර.** පු මෙඝයෙන් වැටෙන දිය පොද, මෙඝ බින්දු.

**ආසාළ්හ.** පු. ඉ-ඇසළ මාසය, උතුරුසළ නකතින් යුත් මාසය.

**ආසාළ්හා.** පු-පුවසළ උතුරුසළ නකත්.

**ආසාළ්හනක්ඛත්ත.** න-ඇසළ නැකත, ඇසළ කෙළිය.

**ආසාළ්හ පුණ්ණමා.** ඉ-ඇසළ පුණු පොහොය.

**ආසාළ්හ මාස** පු-ඇසළමාසය, ඇහැලමස.

**ආසි.** ක්‍රි (අස d. භූ. භුවි. වීමෙහි. ඊ. අකාර දීඝීයි ඊ භ්‍රස්වයි) වූයේය, සිදුවූයේය.

**ආසි.** ඉ-ඉෂ්ටවස්තු ප්‍රාර්ථනාව, සම්දළ.

**ආසිඤ්චති.** ක්‍රි-(ආ + සිඤ්ච d. භූ. සිඤ්චනෙ, ඉසීමෙහි + ති) ඉසියි, වත්කරයි.

**ආසික්ඛිත.** ති-හික්මෙනලද, හික්මුණු.

**ආසිට්ඨ.** ති-ප්‍රාර්ථනා කළ, කැමති දෙයක් පැතූ, පතන, ඉෂ්ටප්‍රාර්ථනය.

**ආසිට්ඨත්ත.** ප්‍ර-ආශිංසනාර්ථය, ප්‍රාර්ථනාව.

**ආසිත්ත.** ති ඉසින ලද, සෙවනයකළ.

**ආසිත්තක.** ති-මිශ්‍රකළ, සෙවිත, ඉසූ.

**ආසිත්තපණ්ඩක** පු-එනම් පණ්ඩක විශෙෂය.

**ආසිත.** ති-ප්‍රාර්ථනාකළ, පැතූ, ආශ්‍රයකළ.

**ආසිතබ්බ.** ති-ප්‍රාර්ථනා කටයුතු, ආශ්‍රය කටයුතු.

**ආසිත්තකූපධාන.** න-තඹ ආදි ලොහයෙන් කළ පා පුටුව, පෙළාව.

**ආසිත්ථ.** ක්‍රි-(අස + ත්ථ + අජ්ජතනී මධ්‍යමපුරුෂ බ) වූවහුය.

**ආසිවිස.** ප්‍ර-සර්පයා, නාගයා. "වණ්ණත්ථ නාග රාජා ආසිවිසො."

**ආසිංසක** ති-ප්‍රාර්ථනාකරන්නා, පතන්නා.

**ආසිංසති.** ක්‍රි-(ආ + සිංස d. භූ. ඉච්ඡායං, කැමති වීමෙහි, පැතීමෙහි) කැමතිවෙයි, පතයි.

**ආසිංසන.** න-ප්‍රාර්ථනාව, පැතීම, ඉසීම, ජලසෙවනය.

**ආසිංසමාන.** න-කැමතිවනු ලබන, පතනු ලබන, "ආසිංසමාන රූපොව කිස්සත්ථං ඉධ මාගතො."

**ආසිංසනක.** ප්‍ර-ප්‍රාර්ථනා කරන්නා, කැමති වන්නා.

**ආසිංසනා.** ඉ-ප්‍රාර්ථනාව, ආසංසනය, ආශාව.

**ආසිංසනීය.** පු. න-පැතිය යුත්ත, කැමතිවිය යුත්ත.

**ආසිංසිතත්ත.** න-ප්‍රාර්ථනාකටයුතු බව.

**ආසිවති.** ක්‍රි-(ආ + සිව d රූ. සෙවනෙ, ඉසීමෙහි + ති) ඉසියි, වගුරුවයි.

**ආසිවන.** න-ඉසීම, සෙවනය.

**ආසිවිනී.** ඉ-ඉසීම, ජලසෙවය.

**ආසීසි.** ක්‍රි-(ආ + සිංස d. භූ ඉච්ඡායං, කැමැති වීමෙහි, ආසීසති, ආසිංසති, කැමැතිවෙයි.

**ආසීවිස.** පු-දරුණු විෂ ඇත්තා, සර්පයා.

**ආසී.** ඉ-සර්පදළ, ඉෂ්ටාර්ථ ප්‍රාර්ථනාව.

**ආසීතික.** ති-අසූවක් ඇති, අසූවක් පිරුණු.

**ආසීතිකා.** ඉ-එනම් පැලෑටි වර්ගයක්.

**ආසීතිකපබ්බ.** පු-අසූවක් පුරුක් ඇති වේවැල් වර්ගයක්.

**ආසීදති.** ක්‍රි-(ආ + සද d. භූ. විසරණගත්‍යවසාදනෙසු, ගැලීම් ගමන අවසාන කිරීම් අර්ථයන්හි සද = සීද + ති) ගැලයි.

**ආසීදන.** න-ගැලීම, ගිලීම.

**ආසීන.** න-ලඟට පැමිණීම, සමීපයට එලඹීම.

**ආසීන.** පු-වැහැරීම, කෙට්ටුවීම, ක්‍ෂයවීම.

**ආසීයති.** ක්‍රි-(ආ + සෙ d භූ. ඛයෙ, ක්‍ෂය වීමෙහි, එකාරස්ස ඊයාදෙසො + ති) ක්‍ෂය වෙයි, කෙට්ටුවෙයි.

**ආසු.** පු-වහා, හනික, ඉක්මනින්.

**ආසු.** ක්‍රි-(ආසු d. භූ භුවි, වීමෙහි + ඌෂ) ඌෂහ, සිදුවූහ.

**ආසුග.** පු-සුලඟ, ශරීරය, වහා යන තැනැත්තා.

**ආසුම්භති.** ක්‍රි-(ආ + සුභ d රූ පහරණෙ, ගැසීමෙහි + ති) දමාගසයි, විසිකරයි.

**ආසුම්භිත්වා** පු ක්‍රි-(ආ + සුම්භ + ඉ + ත්වා) වගුරුවා, හෙළා.

**ආසුම්භන.** න-විසිකිරීම, දමා ගැසීම.

**ආසුර.** පු-බළල් ලූණු.

**ආසෙවති.** ක්‍රි-(ආ + සි d භූ. සෙවායං, සෙවීමෙහි + ති) සෙවනය කරයි, ආශ්‍රය කරයි.

**ආසෙවන.** න-සෙවනය, ආශ්‍රය.

**ආසෙවමාන** පු-සෙවිනා ලබන, සේවනය කරණ.

**ආසෙවිත.** ති-සෙවනයකළ, ආශ්‍රයකළ.

**ආසෙවිතමග්ග** පු-පුරුදුකළ මාර්ගය, ආශ්‍රිත මාර්ගය.

**ආසෙවිත නිසෙවිත.** ති-සෙවුනා ලද, නිති සෙවුනාලද, "පුබ්බකෙහි මහෙසීහි ආසෙවිත නිසෙවිතං"

**ආහ.** අ-කීයේය.

**ආහ.** ක්‍රි (බ්‍රූ ධාතුහට පරොක්‍ෂා විභක්තියෙහිදී ආහ ආදෙශ වීමෙන් සිඬය) කීයේය. කියා.

**ආහච්ච**. පු. ක්‍රි-ගටා, හපා, සංඝට්ටනය කොට.

**ආහච්චවචන**. න-ගටා කියන වචනය, අනුන්ගේ සිත් රිදෙන පරිදි කියන වචනය.

**ආහච්චපාද**. න-සවිකළ පාද ඇති ආසනය. වල් හිස විද සිලුගන්වා කළ පා ඇති ආසනය. **"යො පන භික්ඛු සඞ්ඝිකෙ විහාරෙ උපරිවෙහාස කුටියා ආහච්චපාදකං මඤ්චං වා පීඨං වා සහසා අභිනිසීදෙය්‍ය වා අභිනිපජ්ජෙය්‍ය වා පාචිත්තියං"**

**ආහච්චවචන**. න-බුද්ධවචනය, බුද්ධදෙශනාව, සූත්‍රාන්තය. "අයං සුත්තන්තො ජින භාසිතො නාම"

**ආහට**. ති-එලවනලද, පමුණුවනලද, ගසන ලද, අනින ලද.

**ආහටකාල**. පු-ගෙණා කල, පැමිණවූකාලය.

**ආහත**. ති-රූනගා කරණලද, නසන ලද, ගසන ලද.

**ආහතචිත්ත**. න-ක්‍රොධයෙන් නසන ලද චිත්තය.

**ආහතක**. පු-ගසනු ලබන්නා, වහලා.

**ආහනති**. ක්‍රි-(ආ+හන d. හූ. හිංසායං, නැසීමෙහි+ති) නසයි, හිංසාකරයි.

**ආහනන**. න-නැසීම, හිංසාකිරීම, මැරීම.

**ආහත්වා**. පු. ක්‍රි-ගෙණවුත්, එලවා.

**ආහඤ්ඡං**. ක්‍රි-(ආ+හන d හූ. බ.ඡ්චනයට ඤ්ජ ආදෙශ+අං) ගසන්නෙමි. "ආහඤ්ඡං අමත දුන්දුභිං."

**ආහනිත්වා**. පු, ක්‍රි-නසා, හිංසා කොට.

**ආහර**. ක්‍රි-(ආ+හර d. හූ හරණෙ ගෙණ ඊමෙහි+ති) ගෙණ එව.

**ආහරණ**. න-ගෙණඊම, පැමිණීම.

**ආහරණක**. පු-ගෙණ එන්නා, පමුණුවන්නා.

**ආහරති**, ක්‍රි-(ආ+හර d. හූ හරණෙ, ගෙණ යාමෙහි+ති) ගෙණඑයි, එලවයි.

**ආහරහත්ථ**. පු-අතඉල්ලීම, නැගීසිටීම, අත දෙවයි අනිකෙකුගේ අත ඉල්ලීම.

**ආහරහත්ථක**. පු-ප්‍රමාණය ඉක්මවා ආහාර අනුභව කළ බ්‍රාහමණ වර්ගයක්, නැගිටීමට අත දෙවයි අනිකෙකුගේ අත අල්වා නැගිටින බමුණු ජාතියක්.

**ආහරිත්වා**. පු, ක්‍රි-ගෙණවුත්, එලවා, පමුණුවා.

**ආහරිම**. ප්‍ර. ගෙණා යුතු, අරගණ ආයුතු.

**ආහරාපෙත්වා**. පු, ක්‍රි-ගෙන්වා

**ආහරිය**. ප්‍ර-ගෙණායුතු, අරගණ ආයුතු.

**ආහව**. පු-යුද්ධය.

**ආහරෙය්‍ය**. ක්‍රි-(ආ+හර d. හූ හරණෙ, ගෙණ යාමෙහි+ය්‍ය) ගෙණ එන්නේය, එලවන්නේය.

**ආහවන**. න-යාගය, පිදීම, දානය

**ආහවනීය**. ප්‍ර එනම් ගින්න, යාගගින්න, යාගකටයුතු දේ.

**ආහාර**. පු-චතුබ්බිධ ආහාරය, බත, කෑම, ප්‍රත්‍යය, හෙතුව, ගෙණඊම.

**ආහාරට්ඨ**. ති-ආහාර බවට පැමිණි.

**ආහාරත්ථි**. ති-ආහාර පිණිස, ආහාර කෘත්‍යය සඳහා.

**ආහාරක්ඛය**. න-ආහාරක්ෂය, ආහාර අනුභවයක් නැතිවීම, දෙවියන්ට මරණය සිදුවන එක් අයුරක්.

**ආහාරජ**. ති-ආහාරයෙන් උපන්.

**ආහාරට්ඨිතික**. පු-ආහාරප්‍රත්‍යයෙන් ජීවත් වන්නා.

**ආහාරට්ඨිතිකා**. ඉ-ආහාරය නිසා පවත්නා. "සබ්බෙසත්තා **ආහාරට්ඨිතිකා**"

**ආහාරපටිග්ගහණ**. පු-ආහාර ලබා ගැණීම, ආහාර සොයා ගැණීම.

**ආහාරමය**. ති-ආහාරයෙන් කළ, ආහාරයෙන් ඇතිවූ

**ආහාරරූප**. න-ආහාර රූපය, කබලිංකාරාහාරය, බත් ආදිය.

**ආහාරසඤ්ඤා**. ඉ-ආහාරය යන සංඥාව, අහර බව හැගීම.

**ආහාරසමුදය** පු-ආහාරය ඇතිකිරීම.

**ආහාරසම්භව**. ප්‍ර-අහර නිසා හටගත්, ආහාරය නිසා වැඩීම ඇත්තාවූ, පඤ්චස්කන්ධය ආහාරසම්භවයයි.

**ආහාරසම්භූත**. න-අහර නිසා හටගත්, සරීරය අහර නිසා ඇතිවෙයි. **"ආහාර සම්භූතො අයංකායො"**

**ආහාරූපච්ඡේද.** න-නිරාහාරව සිටීම, අහර අනුභව නොකිරීම, ආහාරූපච්ඡේදය.

**ආහාරූපහාර.** න-ආහාර ගැණීම හා දීම, ආහාර ගණුදෙනුව. "නත්ථිමහාකං තයා සද්ධිං **ආහාරූපහාරො**".

**ආහාරෙති.** ක්‍රි-(ආ + හර d. භූ. හරණෙ, හැරගැණීමෙහි + ණෙ + ති) ගණියි අනුභව කරයි

**ආහාව.** ප්‍ර-ළිඳ සමීපයෙහි ගොනුන් දිය බොන වළ, ඝුඩිය.

**ආහි** ක්‍රි-(අස d. භුවි, වීමෙහි + හි) අස ධාතුහුගේ සකාර ලෝපය හා හි විභක්තිප්‍රත්‍යයයි) වෙව, වෙහි.

**ආහික** පු-දවසට ඇතුළත්, දිනයට අයිති.

**ආහිණ්ඩති.** ක්‍රි-(ආ + හිඩි d. භූ ආහිණ්ඩනෙ, ඇවිදීමෙහි + ති) ඇවිදියි, යෙයි

**ආහිණ්ඩන.** න-ඇවිදීම, තැනින්තැන යාම.

**ආහිණ්ඩනත.** ති-ඇවිදින, ඇවිදිමින්, "භගවා ආයස්මා ආනන්දෙන පච්ඡා සමණෙන සෙනාසන චාරිකං **ආහිණ්ඩනතා**."

**ආහිණ්ඩිත්වා.** පු-ක්‍රි(ආ + හිණ්ඩ d. + ඉ + ත්වා) ඇවිද, හැසිර,

**ආහිත.** ති-පුදනලද, කරණ ලද, තබන ලද.

**ආහිතග්ගි** පු-පුදනලද ගින්න, වේදයෙහි නියමිත පරිදි සකස් කළ ගින්න.

**ආහු.** ක්‍රි-(බ්‍රෑ ධාතුවට ආහ ආදෙසයි, වර්තමාන අන්ති ප්‍රත්‍යයහට උ ආදෙසයි) කියති. (පරොක්‍ෂායෙහිදී බ්‍රෑ ධාතුවට ආහ ආදෙස හා උ ප්‍රත්‍යය වෙයි) කීහු, කීහ.

**ආහුත.** ති-ගෙණ එන ලද, සකස් කළ විධිය.

**ආහුති.** ඉ-යාග පූජාව, ගින්නෙන් පිදිය යුතු ද්‍රව්‍යය, "ආහුතිපිණ්ඩං සමුග්ගණ්හාති"

**ආහුන.** න-අමුත්තන්ට දිය යුත්ත, ගරු කටයුත්තන්ට දිය යුතු දේ දුර සිට නමුත් ගෙණවුත් සිල්වතුන්ට පිදිය යුතු සිව්පසය.

**ආහුන.** න-ගිතෙල්, හෝම සඳහා යෙදූ ගිතෙල්,

**ආහුනෙය්‍ය.** පු-ප්‍රත්‍යය පිළිගැණීමට සුදුසු ගුණ ඇත්තා.

**ආහුනෙය්‍යපාහුනෙය්‍ය.** පු එනම් ගුණයන් ඇත්තා, ගෙණවුත් දියයුතු සිවුපසය හා අමුතු දන් පිළිගැණීමට සුදුසු ගුණ ඇත්තා.

**ආහුනෙය්‍යග්ගි.** පු-ආහුනෙය්‍ය පුද්ගලයා ගින්නක් මෙන් සැලකීම.

**ආහුන්දරික.** -ති-වැසු, පසු කළ නොහැකි කරදර,

**ආහෙය්‍ය.** පු-(අහි + ණෙය්‍ය, ආකාරවෘද්ධිය) අහියාගේ පුත්‍රයා.

**ආහො.** අ-පරිවිතර්ක - ප්‍රශ්න - විකල්පාර්ථයන්හි යෙදෙන අව්‍යයෙකි.

**ආහොපුරිසිකා.** ඉ-ආඩම්බරය නිසා තමාම පුරුෂයෙකැයි තමන් කෙරෙහි ඇතිකර ගන්නා සමත්කම් පහළ කිරීම් ගතිය.

**ආළම්බර.** පු-එනම් බෙර විශෙෂය, පනාබෙර, අළිඟු බෙර. "අඞ්කදීසස්සා කවෙජ ආළම්බරං"

**ආළවක.** පු-වනයෙහි වසන්නා, වනවාසී අය, අලවුරවේ වසන්නා, ආළවක රජු, ආළවක නම් යක්‍ෂයා, "ආළවකස්ස යක්ඛස්ස භවනෙ- **ආළවකො** භික්ඛුපටිපුච්ඡි"

**ආළාර.** ති-මහත්, උදාර, තැමුනු, ඝන, එනම් තවුසා.

**ආළාරපම්හ** ති-ඝනවූ ඇස් පිහාටු ඇති.

**ආළාරික.** ප්‍ර-අරක්කැමියා, සූදයා, පිසන්නා. "**ආළාරිකාති** භත්තකාරකා"

**ආළාහන.** න-සොහොන, මිනී දවන තැන, මිනී පිට්ටනිය,

**ආළක.**
**ආළකමන්ද** }-ඉ. එනම් නුවර, වෙසමුණු මහරජුගේ නගරය, ආළකමන්ද නගරය.

**ආළවි.** ප්‍ර-අලවු රටෙහි, අලවු රට වැසි, අලවු රට උපන් අය,

**ආළවික.** පු-අලවුරට වැසි, එහි උපන් දරුවන් "අලවකා නාම ආළවිරට්ඨජකා භූරකා."

**ආළාන.** න-වැඹ, කණුව, ඇම් කණුව,

**ආළාරකාලාම.** පු-සිදුහත් කුමරුගේ ගුරුවරයෙක්, කාලාම ගොත්‍රයෙහි උපන් ආළාර තවුසා.

**ආළි**. ඉ-ඇල, වේල්ල, යෙහෙළිය.

**ආළින්ද**. න-පිළ, ඉස්තෝප්පුව, නිසවත්ත.

**ආළ්හක**. (ක) න-නැළි සතර, ලාහ, ඇතුන් බඳින වැඹ. "සොගන්ත්වා **ආළ්හකං** සප්පිං-තණ්ඩුලං ආහරාපෙත්වා"

**ආළ්හකථාලිකා**. න-සතර නැළියක් හා සමාන වන භාජනය (=පාත්‍රය) "**එකකොඤ්ඤව ආළ්හකථාලිකං** උපනිසීදිත්වා"

**ආළ්හිය**. ති-ඉසුරුමත්, ධනවත්, භාග්‍යමත්.

## ඉ

**ඉ**. අ-කාම, අතික්‍රම, අධ්‍යෙෂණ, පැවැත්ම, ගමන, පැමිණීම, ඊම, හැදෑරීම, යනාදි අරුත්හි වැටේ. ඉයනු පාළි භාෂාවේ තුන්වැනි ස්වරයයි.

**ඉ**. (d භූ. අජ්ඣයනෙ, හැදෑරීමෙහි + ති) අයති, අධියති, හදරයි, ඉගෙණ ගනියි.

**ඉ**. (d. භූ. ගතියං, යෑමෙහි + ති) ඉති එති, එයි. ආගමනය කරයි.

**ඉංඛති**. ක්‍රි-(ඉඛි d. භූ. ගතියං, යාමෙහි + ති) යෙයි.

**ඉංඝ**. පු ඉඞ්ඝ බලනු.

**ඉක්ක**. පු-වලසා, වලහා.

**ඉක්කාස**. පු-ගස් මැලියම්, ලාටු, "අනුජානාමි භික්ඛවෙ **ඉක්කාසං** කාසාවනාති."

**ඉක්ඛ**. ක්‍රි-(ඉක්ඛ d. භූ. දිස්සනඞ්කසු, දුනීමෙහි-සලකුණු කිරීමෙහි) ඉක්ඛති උපෙක්ඛති බලයි.

**ඉක්ඛණ**. න-(ඉක්ඛ. d + යු=අන) බැලීම, නිරීක්ෂණය. දර්ශනය.

**ඉක්ඛණිකා**. ඉ--යක්දෙස්සී, නිමිති කියන්නී. එසා ඉත්ථි ඉමසමිං. රාජගහෙ ඉක්ඛනිකා අහොසි.

**ඉක්ඛති**. ක්‍රි-(ඉක්ඛ d. භූ. දස්සනෙ, දැකීමෙහි + ති) බලයි, දකියි.

**ඉක්ඛිත**. ති-දක්නාලද, බලනලද, නිරීක්ෂණය කරණලද.

**ඉඛ**. (d. භූ. ගතියං, ගමන්හි) එඛති යෙයි

**ඉඛි**. (d. භූ. ගතියං, යාමෙහි) ඉඞ්ඛති, යෙයි.

**ඉඟ**. (d. භූ. ගතියං, ගමන්හි) ඉඞ්ගති යෙයි.

**ඉඞ්ග**. (d. භූ. ගතියං, ගමන්හි) ඉඞ්ගති යෙයි.

**ඉඞ්ග**. පු-ඉඟිය, ඉඟි කිරීම, අදහස් අඟවන අක්ෂිනාසාදි කාය විකාරය.

**ඉඞ්ගති** ක්‍රි-(ඉඞ්ග. d. භූ. ගතියං, යාමෙහි + ති) ඉඞ්ගති, යෙයි.

**ඉඞ්ගාල**. පු- අඟුරුවල, අඞ්ගාර කාසු,

**ඉඞ්ගිත**. න-ඉඟිය, ඉඟි මැරීම ලකුණ.

**ඉඞ්ගුදී**. ඉ-වැලඟුණ.

**ඉඞ්ඝ**. අ-නියොගයෙහි, එකාන්ත භාවයෙහි, චොදනා වෙහි, බැවින් යනාදි අරුත්හි "**ඉඞ්ඝ** මෙ ත්වං ආනන්ද පානීයං ආහර පිවිස්සාමි."

**ඉඞ්ඝ**. අ-එසේ නම්,

**ඉඞ්ඝාල**. න-අඟුරු, ගිනි පුපුරු

**ඉච්චෙවං**. අ-(ඉති + එවං) මෙසේ, මෙපරිද්-දෙන්.

**ඉච්චෙතං**. අ-(ඉති + එතං) එසේ නම්,

**ඉච**. (d. භූ, ථුතියං සතුතියෙහි) ඉචති, සතුති කරයි

**ඉච්ඡ**. පු-කැමැත්ත, ආශාව, තෘෂ්ණාව.

**ඉච්ඡක**. ප්‍ර-ආසා ඇත්තා, කැමැත්ත ඇත්තා

**ඉච්ඡන**. න-කැමැත්ත, ආශාව, තෘෂ්ණාව.

**ඉච්ඡතා**. ක්‍රි-කැමැතිබව, ආශාබව,

**ඉච්ඡති**. ක්‍රි-(ඉසු d. භූ ඉච්ඡායං, කැමතිවීමෙහි ච්ඡ + ති) කැමැති වෙයි, ආසා කරයි.

**ඉච්ඡාගත**. ති-කැමතිවන්නා, ආසා ඇත්තා, තෘෂ්ණා ඇත්තා.

**ඉච්ඡා** ඉ-ආශාව, කැමැත්ත, තෘෂ්ණාව.

**ඉච්ඡාපකත**. ති-කැමතිසේ කළ, ආශා පරිදි කළ.

**ඉච්ඡාවිචාර**. න-කැමැතිසේ හැසිරීම.

**ඉච්ඡාවතී**. ඉ-කැමැති ඇත්තී, මෛථුන්දමට ආශා ඇත්තී.

**ඉච්ඡාවතිණ්ණ**. පු-කැමති සේ අවතීර්ණවූ, කැමැතිසේ බට, ලොභයෙන් දිනූ.

**ඉච්ඡාවිඝාත**. න-කැමැත්ත විනාශවීම, කැමති දෙය නොලැබීමෙන් වන දුක.

**ඉච්ඡාවිනය**, පු-කැමැතිසේ හික්මීම. තෘෂ්ණා විනය, ආශාව මැඩලීම.

**ඉච්ඡිතානිච්ඡිත**. න-ඊප්සිත අනීප්සිතකර්මය "ගාමං ගච්ඡන්තො රුක්ඛමූල මුපසඞ්කමති" මෙහි ගමට යෑම කර්තෘ විසින් කැමතිවන ලද බැවින් "ගාමං" යනු ඉච්ඡිත කර්මයි. ගසමුලට එළඹීම අනියමින් සිදුවීමක් බැවින්ද එය කර්තෘ විසින් කැමතිවන ලද දෙයක් නොවන බැවින් රුක්ඛමූලං යනු අනිච්ඡිත කර්මයි.

**ඉච්ඡිත**. ති-කැමතිවන ලද, ආසා කරණලද, මෙය කර්ම කාරක ප්‍රභෙදයකි. "බුද්ධං නමස්සති" යන නමස්ක්‍රියාව හා බුද්ධ පදාර්ථය සම්බන්ධ කරණ කර්තෘ තමාට අභිමත හෙයින්ම එසේ කෙරේනුයි ඒ බුද්ධ පදාර්ථය ඉච්ඡිත කර්මය නම් වේ.

**ඉජ්ජ**. යජ d භූ. දෙවපූජා සඞ්ගති කරණ දාන ධම්මෙසු, යජති, පූජා කරයි. යදියි.

**ඉජ්ජා**. ඉ-යෑදීම, පූජාව, ආත්මපරිත්‍යාගය.

**ඉජ්ජතෙ**. ක්‍රි-(යජ. d. භූ. දෙවපූජා සඞ්ගති කරණ දාන ධම්මෙසු, දෙවපූජාවෙහි + තෙ) යදිනු ලැබේ, පුදනු ලැබේ.

**ඉඤ්ජ**. (d භූ. කම්පනෙ, කම්පනයෙහි) ඉඤ්ජති කම්පාවෙයි.

**ඉඤ්ජ**. (ඉඤ්ජ. d. භූ. කම්පනෙ, කම්පා වීමෙහි) ඉඤ්ජති, කම්පාවෙයි.

**ඉඤ්ජති**. ක්‍රි-(ඉඤ්ජ. d. භූ. කම්පනෙ කම්පා වීමෙහි + ති) කම්පාවෙයි. සැලෙයි.

**ඉඤ්ජන**. න-සෙලවීම, චලනය, කම්පනය.

**ඉඤ්ජිත**. ති-කම්පාවනලද, චලනයවන ලද,

**ඉඤ්ජිතත්ත**. න-කම්පිත ස්වභාවය, චලිත ස්වභාවය, සෙල්වෙන ගතිය.

**ඉජ්ඣති**. ක්‍රි-(ඉධ d. දි. සංසිද්ධිවුද්ධිසු සිද්ධ වීමෙහි, වැඩීමෙහි, ජ්ඣ × ති) සිදු වෙයි, වැඩෙයි. සමෘද්ධවෙයි.

**ඉජ්ඣන**. න-සිදුවීම, ඉටුවීම, සමෘද්ධවීම.

**ඉජ්ඣිත**. ති-සිදුවනලද, ඉටුවනලද,

**ඉට්ඨ**. ති-අභිලාෂය, කැමැත්ත, ප්‍රිය වස්තු, යහපත්.

**ඉට්ඨකා**. ඉ-උළු, ගඩොල්.

**ඉට්ඨකාකුඩ්ඩ**. න-ගඩොලින් තැනූ පවුර, උළු පවුර.

**ඉට්ඨකාගුහා**. ඉ-ගඩොලින් තැනූ ගුහාව, උළින් තැනූ ගුහාව.

**ඉට්ඨකාචය**. න ගඩොල් බැම්ම, උළු බැම්ම. තුන් බැම්මෙන් එකක්, අනුජානාමි භික්ඛවෙ තයො චයෙ **ඉට්ඨකාචයං** සිලාචයං දාරු චයන්ති."

**ඉට්ඨකාචුණ්ණ**. න-ගඩොල් කුඩු, උළුසුණු.

**ඉට්ඨකාඡදන**. ගඩොල්වලින් කළ පියස්ස, උළුවලින් කළ ඡාදනය පඤ්චවිධ ඡදනයන් ගෙන් එකක්.

**ඉට්ඨකාපාකාර**. න-ගඩොල්වලින් කළ පවුර.

**ඉට්ඨකාසන්ථාර**. න-ගඩොල් ඇතිරීම, ගඩොල් අතුරා කළ බිම.

**ඉට්ඨකා සොපාණ**. න-ගඩොල් පඩිපෙළ, ගඩොල්වලින් තැනූ හිණිමග, ත්‍රිවිධ සොපාණයන්ගෙන් එකක්.

**ඉට්ඨගන්ධ**. පු-සුවඳ, යහපත් ගඳ, සුරභිගන්ධය.

**ඉට්ඨවිපාක**. පු-යහපත් විපාකය, මිහිරි විපාකය.

**ඉට්ඨප්පසිද්ධි** ඉ-අභිමත කාර්‍ය්‍ය සිද්ධිය කැමැති කටයුතු සිදුවීම.

**ඉට්ඨදෙවතා**. ඉ-ඉටුදෙවියා, ඉෂ්ටදේවතාවා,

**ඉට්ඨස්සාසංසන**. න-ඉෂ්ට වස්තු පැතීම, කැමතිදේ පැතීම.

**ඉට්ඨස්සාසිංසන**. න-ඉෂ්ට වස්තු ප්‍රාර්ථනාව, කැමති දේ පැතීම.

**ඉට්ඨාභ්‍යාස.** පු-යහපත් ගතිගුණ පුරුදුකිරීම.

**ඉට්ඨාරම්මණ.** න-යහපත් අරමුණ, ඉටු අරමුණ.

**ඉට්ඨාසංසන.** න-ඉෂ්ට වස්තූන්ගේ පැතීම, ඉටුවූදේ පැතීම:

**ඉට්ඨි.** ඉ-ආශාව, කැමැත්ත,

**ඉට.** (d. භූ. ගමනා, යාමෙහි) ඉටති, එති, යෙයි, ගමනය කරයි.

**ඉණ.** (d. භූ. ගතෙ, යාමෙහි) ඉණෙති යෙයි.

**ඉණ.** න-ණය. ඍණය.

**ඉණපණ්ණ.** න-ණය ඔප්පුව, ප්‍රොමිසරි නෝට්ටුව.

**ඉණක්ඛෙප.** පු-ණය ගෙවීම, ඍණ උද්ධරණය.

**ඉණඝාත.** ති-ණයෙන් වෙලෙන ලද.

**ඉණට්ට.** පු-ණය ගැණීමෙන් පීඩිතයා, ණය ගැතියා.

**ඉණදායක** පු-ණය දෙන්නා, ණය දායකයා.

**ඉණගාහක.** පු-ණය ගන්නා, ණයගැතියා

**ඉණමොක්ඛ.** පු-ණයෙන් මිදුනු තැනැත්තා.

**ඉණසාධක.** පු-ණය ගණු දෙනු ඇතිකර දෙන්නා.

**ඉණායක.** පු-ණය දෙන්නා, ණය හිමියා

**ඉණාපගම.** පු-ණයෙන් නිදහස් වීම.

**ඉණායික.** පු-ණය දෙන්නා, ණය හිමියා, ණය ගැතියා.

**ඉණපරිභොග.** පු=ඍණ පරිභොගය, ණයට කෑම, සිවුපසය ප්‍රත්‍යවෙක්ෂා නොකොට වැළඳීම, "අපච්චවෙක්ඛිත පරිභොගො ඉණ පරිභොගො නාම."

**ඉණපළිබොධ.** පු-ණය පිළිබඳ දොෂය, පැවිද්දට බාධා කරුණක්.

**ඉණසාමික.** පු-ණය හිමියෝ, ණය අයිතිඅය.

**ඉණු.** (d. ත. ගතියං, යාමෙහි) ඉණෙති, යෙයි.

**ඉණොති.** කි-(ඉණු. d. ත. ගතියං, යාමෙහි + ඔ × ති) යෙයි.

**ඉත.** ති-ගිය, ගමනය කළ.

**ඉතර.** ති-අන්‍ය, අනික. නීච, පහත්, වැඩිපුර.

**ඉතරත්‍ර.** අ-අනික්, අනික.

**ඉතරත්ථ.** අ-එහි, එහිවූ.

**ඉතරථා.** අ-අන්‍ය ප්‍රකාරය, අන් අයුර.

**ඉතරාය.** ති-අනිකක් සඳහා.

**ඉතරීතර.** ති-(ඉතර + ඉතර) අනික් අනික්, යම් යම්.

**ඉතරීතර පච්චය.** පු-අනික් අනික් ප්‍රත්‍යය.

**ඉතරීතර යොග** පු-අවයව ප්‍රධාන බැවින් ද්වන්ද සමාසය ඉතරීතර යොග යයි කියනු ලැබේ.

**ඉතරීතර චීවර.** න රූක්ෂවූ හෝ ප්‍රණීත හෝ වශයෙන් වෙනසක් නැතිව ලැබුණු සිවුරක්. "ඉතරීතර චීවර සන්තුට්ඨියාති යෙන කෙනචි චීවරෙන සන්තුට්ඨිතා"

**ඉතරීතර පිණ්ඩපාත,** න-පිඩුපිණිස ලැබුණු මිහිරි හෝ අමිහිරි වූ යම් ආහාරයක්.

**ඉතරීතර සෙනාසන.** සුවදායක හෝ එසේ නොවූ යම්කිසි සෙනසුනක් සොළොස්-වැදෑරුම් සෙනසුන්වලින් එකක්.

**ඉති.** අ-හේතු, ප්‍රකාර, ආඥාපි, අවධාරණ, නිදර්ශන, පදාර්ථ විපර්යාස, පරිසමාප්ති යන මෙහි.

**ඉති.** (d. භූ. බන්ධනෙ, බැඳීමෙහි) ඉන්තනෙ, බඳියි.

**ඉති කිර.** අ-අනුශ්‍රවණයෙහි, මෙසේ වීලූ. මේ ආකාරයෙන් වීලූ

**ඉති ඛො.** අ-මෙසේ වනාහි, මේ නිසා.

**ඉති එව.** අ-මෙසේ ම, ඇත්තෙන් ම.

**ඉතිපි.** අ-(ඉති + අපි) මෙසේ හෙයින් ද.

**ඉති භාව.** පු-මෙසේ වීම

**ඉති වා.** අ-මෙසේ හෝ, මෙබඳු වූ හෝ, මෙයින් අන්‍ය වූ හෝ,

**ඉතිවාද.** පු-මෙසේ මෙසේ යයි කීම, කථාව, ඉතිවාදය.

**ඉතිවුත්තක.** න-නවාංග ශාසනා ශාසනයට ඇතුළත් එනම් අඞ්ගය, මෙය මේ සඳහා කියන ලදී. යන 112 ක් පමණ සූත්‍රයෝ.

**ඉතිවුත්ති.** ඉ-පුරාණ වෘත්ති චරියාව.

**ඉතිස්සු.** අ-එහෙයින්.

**ඉතිහ.** අ-උපදේශ පරම්පරාවෙහි, මෙසේ, මේ අයුරින්.

**ඉතිහ ඉතිහ.** අ-මෙසේ මෙසේ යයි පරම්පරාවෙන් විශ්වාස කරගෙණ එන දේ.

**ඉතිහාස.** පු-පුරාවෘත්ත කථා, ප්‍රබන්ධය, රාමායන, මහාභාරත, මහවංශාදී ඓතිහාසික ග්‍රන්ථ. "ඉතිහ ආස ඉති"

**ඉතිහාස පඤ්චම.** පු-ඉතිහාසය පස් වැනි කොට ඇති, සතර වේදයන් හා ඉතිහාසය.

**ඉතො.** අ-මෙයින්, මේ මරියාදාවෙන්, "ඉතො සත්තමෙ දිවසෙ"

**ඉතොකිර.** අ-මෙයින් වනාහි, "ඉතො කිර තිංස කප්පසහස්සෙ රාජා අහොසිං."

**ඉතොපට්ඨාය.** අ-මෙතැන් පටන්, මෙයින්.

**ඉතොදානි.** අද පටන්, අදින්.

**ඉත්තර.** ති-ලාමක දෙය, ස්වල්පය, ටික, අනිත්‍යය, "සුපිනූපමා කාමා ඉත්තර පච්චුපට්ඨානෙන."

**ඉත්තරතා.** ඉ-වෙනස්විය හැකි බව.

**ඉත්තරසත්ත.** පු-ලාමක සතෙක්, පහත් අදහස් ඇති කෙනෙක්.

**ඉත්තර කාල.** පු-ස්වල්ප කාලය, ටික කාලය.

**ඉත්තෙව.** අ-(ඉති + එව) මෙසේ ම.

**ඉත්ථං.** අ-නිදර්ශනයෙහි, මෙසේ, මේ ආකාරයෙන්,

**ඉත්ථං භාව.** පු-මෙසේ වීම, මේ ආකාරයෙන් වීම.

**ඉත්ථත්ත.** ති-මේ බව, මේ ආකාර භාවය, ස්ත්‍රී භාවය.

**ඉත්ථභාව.** පු-මේ බව, මේ ජාතිය, මේ සක්වල.

**ඉත්ථං නාම.** පු-මෙසේ නමකින් යුක්ත වීම, මෙනම් වූ මෙබඳු නමක් ඇති.

**ඉත්ථම්භූත** පු-කිසි විපරීතයකට පැමිණීම, මෙපරිද්දෙන් වීම.

**ඉත්ථාගාර.** න-අන්තඃපුරය, රාජ මෙහෙසියන්ගේ වාසස්ථානය, ඔරොඩය, "රාජා ච මෙ මාගධො සෙනියො බිම්බිසාරො උපට්ඨාතබ්බො, ඉත්ථාගාරංච බුද්ධ පමුඛො ච සංඝො"

**ඉත්ථි.** ඉ-ස්ත්‍රිය, කාන්තාව, අඞ්ගනාව

**ඉත්ථි අත්ත භාව.** පු-ගැහැණු අත්බැව්, ස්ත්‍රී ආත්ම භාවය.

**ඉත්ථි අධිප්පාය.** පු-ගැහැණුන් පිළිබඳ අදහස් ඇති, එබඳු තැනැත්තා "පුරිසො භික්ඛවෙ, ඉත්ථාධිප්පායො අප්පාරත්තියා සුපති බහුං ජග්ගති."

**ඉත්ථි අන්තර.** (ඉත්ථි + අන්තර = ඉත්ථ්‍යන්තර) රියදුරු ගැහැණියක ඇති, ස්ත්‍රී සාරථියකු ඇති, "තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ යානෙන යායන්ති—පුරිස යුත්තෙන පි ඉත්ථ්‍යන්තරෙන පි."

**ඉත්ථි අලඞ්කාර.** න-ගැහැණු ආභරණ, හිස, කන් ආදියෙහි පළඳනා ආභරණ විශෙෂයක්, ඉත්ථ්‍යලඞ්කාර.

**ඉත්ථි ආකප්ප.** න-ස්ත්‍රී ආකල්පය, ගැහැණුන් ගේ ඇඳුම් හැඳීම් පෙරවීම් ආදිය. "ඉත්ථි කප්පෙන්ති නිවාසන පාරුපණාදිං ඉත්ථි ආකප්පං"

**ඉත්ථිචාර.** පු-ස්ත්‍රී චාරය, පළමු පාරාජික ශික්ෂා පදයෙහි එන 81 ක් ස්ත්‍රීචාරය.

**ඉත්ථිකාය.** පු-ස්ත්‍රී ශරීරය, ගැහැණුන් පාවිච්චි කරන නහානීය සුණු ආදිය ඉත්ථිකාය නම් වේ. "ඉදං තෙ නාන සුදින්නං මාතුමත්තිකං ඉත්ථිකාය ඉත්ථි ධනං"

**ඉත්ථිච්ඡන්ද.** න-ගැහැණියගේ අදහස, කැමැත්ත.

**ඉත්ථිදාන.** න-ගැහැණුන් දන්දීම, ස්ත්‍රීදානය, "පඤ්ච දානානි අපුඤ්ඤානි පුඤ්ඤසම්මතානි ලොකස්මිං මජ්ජදානං—ඉත්ථිදානං උසභ දානන්ති."

**ඉත්ථි පණ්ඩක**. ඉ-සත්‍රී නිමිති නැති ගැහැණිය, පුරුෂ පණ්ඩකයෝ ද සිටිති.

**ඉත්ථිමති**. ඉ-සත්‍රියගේ අභිප්‍රාය, ගැහැණියගේ අදහස.

**ඉත්ථිලීලා**. න-සත්‍රී ලීලා, ගැහැණුන්ගේ නෙත් කොණින් බැලීම් ආදිය.

**ඉත්ථිසර**. න-ගැහැණු හඬ, සත්‍රී ස්වරය.

**ඉත්ථි සාරථී**. ඉ-රියදුරු ගැහැණියක් ඇති, සත්‍රී සාරථියෙකු ඇති.

**ඉත්ථින්ද්‍රිය**. න-සත්‍රී භාවය, සත්‍රී ලක්ෂණයන්හි පවත්නා අධිපති භාවය.

**ඉත්ථිකථා**. ඉ-සත්‍රීන් පිළිබඳ කථා, ගැහැණුන් ගැන කතා.

**ඉත්ථිකා** ඉ-සත්‍රිය, ගැහැණිය.

**ඉත්ථිකාම**. පු-සත්‍රීන් පිළිබඳ ආශාව, ගැහැණු ගැන කැමැත්ත.

**ඉත්ථිගන්ධ**. පු-සත්‍රී ගන්ධය, ගැහැණු ගඳ.

**ඉත්ථි ඝාතක**. පු-සත්‍රීන් නසන්නා, ගැහැණුන් නසන්නා.

**ඉත්ථිධන** න-සත්‍රීන්ගේ ධනය, ගැහැණුන්ගේ ධනය.

**ඉත්ථි නිමිත්ත**. න-සත්‍රී ලක්ෂණය, ගැහැණු නිමිත්ත.

**ඉත්ථි පරිග්ගහ**. පු-සත්‍රී සමාගමය, ගැහැණු සමාගම.

**ඉත්ථිභාව**. පු සත්‍රී භාවය, සත්‍රීත්වය, ගැහැණු බව.

**ඉත්ථි ඵොට්ඨබ්බ**. පු-සත්‍රී ස්පර්ශය.

**ඉත්ථිරූප**. පු-සත්‍රී රූපය, සත්‍රී ලක්ෂණය, ගැහැණු රූ සටහන.

**ඉත්ථිරස** පු-සත්‍රී රසය, ගැහැණු රසය.

**ඉත්ථි ලක්ඛණ**. න-සත්‍රී ලක්ෂණ, ගැහැණු ලකුණු.

**ඉත්ථි ලිඞ්ග**. පු-සත්‍රී ලිඞ්ගය, ගැහැණු ගති ඇති ශබ්ද.

**ඉත්ථි සද්ද**. පු-සත්‍රී ශබ්දය, ගැහැණු හඬ. "නාහං භික්ඛවෙ අඤ්ඤං එක සද්දම්පි සමනුපස්සාමි යං එවං පුරිසස්ස චිත්තං පරියාදාය තිට්ඨති, යථයිදං භික්ඛවෙ **ඉත්ථි සද්දො**" (අඞ්ගුත්තර නිකාය.)

**ඉත්ථි සොණ්ඩී**. ඉ-සුරාපානයෙහි නිරත සත්‍රිය, සුරා සොඬ ගැහැණිය.

**ඉත්ථි කුත්ත**. න-සත්‍රීභාවය, සත්‍රී නිමිත්ත, ගැහැණියගේ හැසිරීම.

**ඉත්ථිධුත්ත**. පු-සත්‍රීධූර්තයා, ගැහැණුන් කෙරෙහි ලොල් වූ තැනැත්තා, "**ඉත්ථිධුත්තො** සුරාධුත්තො අක්ඛධුත්තො ච යො නරො."

**ඉත්ථි පච්චය**. පු සත්‍රී අර්ථයෙහි යෙදෙන ප්‍රත්‍යය විශේෂය, ගැහැණුන් විසින් පරිහරණය කරණු ලබන දේ.

**ඉත්ථි පුප්ඵ**. න-ඔසප්වීම, මල්වරවීම.

**ඉත්ථිරස**. න-සත්‍රීරසය, චතුසමුට්ඨානික රසායතනය.

**ඉත්ථී**. ඉ-සත්‍රිය, ගැහැණිය, අඞ්ගනාව, බබලතා.

**ඉජ්ජක**. පු-යාග කරන්නා, යාග කර්තෘ,

**ඉද්ධ**. ති-සමෘද්ධ, කටයුතු සිද්ධියට පැමිණි සාරවත්.

**ඉද්ධානුභාව**. පු-ඍද්ධි ආනුභාවය, ඍද්ධි බලය.

**ඉද්ධාභි සඞ්ඛාර**. පු-ඍද්ධිය රැස් කරන්නා, ඍද්ධි බලයෙන් කැමැති දේ කරන්නා.

**ඉද්ධිජ**. න-ඉද්ධියෙන් උපන්, එබඳු සිවුරු.

**ඉද්ධිපාද**. පු-ඍද්ධිපාදක ධර්මයන්, සතර ඍද්ධිපාද, ඡන්ද, චිත්ත, විරිය, වීමංසා යන ඍද්ධියට මුල්වන ධර්ම සතර දෙන.

**ඉද්ධිපාටිහාරිය**. න-ඍද්ධි ප්‍රාතිහාර්යය, දස වැදෑරුම් ඍද්ධි විධියෙහි පිහිටා ප්‍රාතිහාර්ය දැක්වීම, ඍද්ධියෙන් දක්වන පෙළහර.

**ඉද්ධිපොණ** න-ඍද්ධියට නැමීම, අවනතවීම.

**ඉද්ධිබල** පු-ඍද්ධි බලය, ඍද්ධියෙන් පවත්වන පුදුම බලය.

**ඉද්ධිමය**. න-ඍද්ධියෙන් උපන්, ඍද්ධියෙන් හටගත්.

**ඉද්ධිමන්ත.** ති-ඍද්ධිමත්, ඍද්ධි ඇති.

**ඉද්ධිභූමි.** න-අභිඥා භූමි, ඍද්ධි භූමි, ප්‍රථම ධ්‍යානාදි සතර ඍද්ධි භූමි.

**ඉද්ධිමා.** පු-ඍද්ධි ඇත්තා, ත්‍රිවිද්‍යා, පඤ්චාභිඥා, අෂ්ටසමාපත්ති ආදි ආශ්චර්ය්‍ය අද්භූත දේ කළ හැකි බලයක් ඇත්තා.

**ඉද්ධියාන.** න-ඍද්ධි බලයෙන් නිපදවාගත් වාහනය.

**ඉද්ධිවිකුබ්බණ.** න-ඍද්ධියෙන් විවිධ රූප කිරීම, ඍද්ධි විකුම්බනය.

**ඉද්ධිවසීභාව.** පු-ඍද්ධි බලයෙන් වසඟයට පත් කිරීම.

**ඉද්ධිවිධ.** පු-ඍද්ධි කොට්ඨාස, ඍද්ධි කොටස්.

**ඉද්ධිවිසය.** පු-ඍද්ධි විශාලත්වය.

**ඉද්ධිවිභාග.** පු-ඍද්ධින් පිළිබඳ වග විභාගය.

**ඉද්ධි වෙසාරජ්ජ.** න-ඍද්ධියෙහි විශාරද බව, ඍද්ධි වෛශාරද්‍යය.

**ඉදං.** අ-මේ, මෙය.

**ඉදං සච්චාභිනිවෙස.** පු-මෙයම සත්‍යයයි කියා මිථ්‍යාවට ඇතුලත් වීම, මෙයම ඇත්ත යයි සිතා බොරුවට ඇතුල්වීම.

**ඉදමත්ථ.** පු-ඉදං ශබ්දයාගේ අර්ථය, අසත්‍යාර්ථයට නමකි.

**ඉදමත්ථික.** පු-ඇති දෙයින් සතුටුවන්නා

**ඉදමත්ථිතා.** ඉ-ඇති දෙයින් සතුටුවීම් ස්වභාවය.

**ඉදප්පච්චය.** පු-ප්‍රත්‍යය පිළිබඳ.

**ඉදප්පච්චයතා.** ඉ-ප්‍රත්‍යය පිළිබඳ බව.

**ඉදානි.** අ-දැන්, වර්තමානයෙහි, පවත්නා කාලයෙහි.

**ඉදානෙව.** අ-(ඉදානි + එව) දැන්ම, වර්තමාන යෙහිම,

**ඉදි.** (d. භූ. පර මිස්සරියෙ, උතුම් ඓශ්වර්ය්‍ය යෙහි) ඉන්දති, ඉසුරු විඳියි.

**ඉන්ද.** (d. භූ. පරමිස්සරියෙ, උතුම් ඓශ්වර්ය්‍ය-යෙහි,) ඉන්දති, ඉසුරු විඳියි.

**ඉන්ද.** පු-ඉන්ද්‍රයා, අධිපතියා, ශක්‍රයා.

**ඉන්දක.** පු-ශක්‍රයා, ඉන්ද්‍රයා.

**ඉන්දඛීල.** පු-ඉන්ද්‍රඛීලය, එසිකාස්ථම්භය, එළිපත, නුවර සීමා කණුව,

**ඉන්දගජ්ජනා.** ඉ-ඉන්ද්‍රගජනාව.

**ඉන්දගජ්ජිත.** න-ඉන්ද්‍රයාගේ හෙනය.

**ඉන්දගූ.** පු-ඉන්ද්‍රියෙන් හා කර්මයෙන් ගමන් කරන්නා, සත්වයා, මනුෂ්‍යයා, "ඉන්ද්‍රියෙන ගච්ඡතීති ඉන්දගූ, අථවා, ඉන්ද භූතෙන කම්මනා ගච්ඡතීති **ඉන්දගූ**."

**ඉන්දගොපක.** පු-වර්ෂාකාලයෙහි පොළොවෙන් මතුවෙන රතු තුඩු ඇති පණුවා.

**ඉන්දග්ගි.** න-(ඉන්ද + අග්ගි), ඉන්ද්‍රයාගේ ගින්න. විදුලිකෙටීම, විදුලිය.

**ඉන්දජාල.** පු-ඇස්බැන්දුම් ශාස්ත්‍රය, ඉන්ද්‍රජාල විද්‍යාව.

**ඉන්දජාලික.** පු-ඉන්ද්‍රජාලිකයා, ඇස්බැන්දුම්-කාරයා, මායාකාරයා,

**ඉන්දත්ත.** පු-ශක්‍රභාවය,

**ඉන්දති.** ක්‍රි-(ඉදි d. භූ. පරමිස්සරිය, උතුම් ඓශ්වර්ය්‍යයෙහි + ති) ඉසුරුවිඳියි.

**ඉන්දමරාජ.** පු-විෂ්ණු

**ඉන්දධනු.** පු-ශක්‍රයාගේ දුන්න, දේදුන්න, වර්ෂාදිනයන්හි අහසෙහි වාතයෙන් අලන ලද ශක්‍රයාගේ දුන්නේ ආකාර ඇති බොහෝ වර්ණඇති සූර්‍ය්‍යරශ්මීහු දක්නා ලැබෙද්ද ඒ රශ්මීහු ඉන්දධනු නම් වේ.

**ඉන්දරී.** පු (ඉන්ද + අරි) ශක්‍රයාගේ සතුරා, අසුරයා,

**ඉන්දන.** න-දර,

**ඉන්දනී.** ඉ-දර ගෙණ යන තැනැත්තී.

**ඉන්දනීල.** න-ඉඳුනිල් මැණික, ඉන්ද්‍රනීල මාණික්‍යය,

**ඉන්දපත්ත.** න-ඉන්ද්‍රපාත්‍රය,

**ඉන්දපුර.** න-ශක්‍රපුරය, සුදර්ශන නගරය,

**ඉන්ද්‍රභවන.** න ඉන්ද්‍රභවනය, ශක්‍රයාගේ දෙව් විමන, ශක්‍රභවනය,

**ඉන්ද්‍රමරාජ.** පු-විෂ්ණු.

**ඉන්ද්‍රශව.** පු කෙළිඳගෙඩි, හරිමල්ලිකා මල, එනම් බෙහෙත්වර්ගය.

**ඉන්ද්‍රාරි.** පු-(ඉන්ද්‍ර + අරි) ශක්‍රයාගේ සතුරා, අසුරයා.

**ඉන්ද්‍රලිඞ්ග.** පු-ශක්‍ර නිමිත්ත, ශක්‍රභවය,

**ඉන්ද්‍රවජිර.** න-මොටතොවන ආයුධය, ඉන්ද්‍ර-වජ්‍රය.

**ඉන්ද්‍රවාරුණී.** ඉ-තියඹරා, එමගස හෝ ගෙඩි,

**ඉන්ද්‍රසාල.** පු ඉන්ද්‍රසාල නම් වෘක්ෂය, ඉඳුසල් රුක

**ඉන්ද්‍රසාලගුහා.** ඉ-ඉන්ද්‍රශාල ගුහාව. සැවැත් නුවර අද දක්වා මෙනමින් යුක් විශාල ගුහාවක් ඇත.

**ඉන්ද්‍රසුර.** පු-නිකගස.

**ඉන්ද්‍රහෙති.** ඉ-ඉන්ද්‍රායුධය, ශක්‍රයාගේ ආයුධය.

**ඉන්ද්‍රායුධ.** න-ඉන්ද්‍රායුධය.

**ඉන්ද්‍රාවුධ.** න-ඉන්ද්‍රායුධය, ඉන්ද්‍රාවුධය.

**ඉන්දීවර.** න-නීලොත්පලය, නිලුපුල්, ඇසල-රුක.

**ඉන්දීවරී.** ඉ-සාතාවාරිය, හාතාවාරිය.

**ඉන්දු.** පු-චන්ද්‍රයා, සඳු.

**ඉන්දුජනක.** පු-සමුද්‍රය, මුහුද.

**ඉන්දුමතී.** ඉ-එනම් නුවර.

**ඉන්දුපුත්ත.** පු-ඉන්දුගේ පුතා, චන්ද්‍රපුත්‍රයා, බුදහු.

**ඉන්ද්‍රිය.** න-අධිපතිධර්ම, චක්ෂුරාදි ඉන්ද්‍රිය, ශ්‍රද්ධාදි-ධර්ම, බාවීසතින්ද්‍රිය. 1. චක්ඛු, 2. සොත. 3. ඝාණ, 4. ජිව්හා, 5. කාය, 6. මන, 7. ඉත්ථි 8. පුරිස, 9. ජීවිත, 10. සුඛ, 11. දුක්ඛ, 12 සොමනස්ස, 13. දොමනස්ස, 14. උපෙක්ඛා 15. සද්ධා, 16. විරිය, 17. සති, 18. සමාධි, 19. පඤ්ඤා, 20. අනඤ්ඤාතඤ්ඤස්සාමීති, 21. අඤ්ඤා, 22. අඤ්ඤාතාවී.

**ඉන්ද්‍රියගය්හ.** න-ඉන්ද්‍රියයන් විසින් ගතයුතු දේ, ප්‍රත්‍යක්ෂ දෙය, චක්ෂුරාදි ඉන්ද්‍රියන්ට හමුවූ දෙය,

**ඉන්ද්‍රියගුත්ත.** පු-චක්ෂුරාදි ඉන්ද්‍රිය ගොපනය, ඉන්ද්‍රිය රැකීම.

**ඉන්ද්‍රියගුත්ති.** පු චක්ෂුරාදි ඉන්ද්‍රිය ගොපනය කිරීම.

**ඉන්ද්‍රියපරොපරිය.**<br>**ඉන්ද්‍රියපරොපරියත්ත.**<br>**ඉන්ද්‍රියපරොපරියත්ති.** } න අනුන්ගේ අදහස් දැනගන්නා නුවණ.

**ඉන්ද්‍රියභාවනා** ඉ-පඤ්චෙන්ද්‍රිය වර්ධනය, ඉන්ද්‍රිය භාවනාව.

**ඉන්ද්‍රියපරොපරියත්තඤාණ.** න-අනුන්ගේ අදහස් උදහස් දැනගන්නා නුවණ.

**ඉන්ද්‍රියලොක.** පු-අරූපාවචර වැසි සත්වයා.

**ඉන්ද්‍රියසංවර.** පු-චක්ෂුරාදි ඉන්ද්‍රියන් ආරක්ෂා-කිරීම, පඤ්චෙන්ද්‍රිය ආරක්ෂාකිරීමෙන් රක්නා එනම් ශීලය,

**ඉන්ද්‍රියසංවරසංවුත.** ති-ඉන්ද්‍රිය සංවරණය කරණලද,

**ඉන්ද්‍රියසමතා.** ඉ-ඉන්ද්‍රියන්ගේ සමබව,

**ඉන්ද්‍රියසථ.** පු-අරමුණ, ගොචරය,

**ඉධ.** (d. දි වුඩ්ඪියං, වැඩීමෙහි) ඉජ්ඣති, සමෘද්ධ වෙයි.

**ඉධ.** (d. භූ. සංසිද්ධියං, සිදුවීමෙහි) එධති, නිපදෙයි

**ඉධලොක.** පු-මෙලොව, මේ ලෝකය.

**ඉධස්සු.** අ-(ඉධ + අස්සු) වන්නාහුය.

**ඉධුම.** න දර.

**ඉධි.** (d. භූ දිත්තියං, දීප්තියෙහි) ඉන්ධති, දිලිසෙයි.

**ඉන්ධ.** d භූ. දිත්තියං, බැබලීමෙහි, දීප්තියෙහි, ඉන්ධතිං බබලයි.

**ඉන්ධන.** න-දර.

**ඉබ්භ.** පු-ධනවතා, පොහොසතා, ගෘහපතියා.

**ඉබ්භ.** ති-වැඩකාර, සෙවක, පහත්, අධම, "මුණ්ඩකා සමණකා ඉබ්භා කණ්හා."

**ඉභ.** පු-හස්තියා, ඇතා, අලියා.

**ඉභපිප්පලී.** ඉ-ඇත්වගපුල්, මහවගපුල්

**ඉභව.** පු-දෙවියා, දෙවතාවා.

(5517)

**ඉභුව**. පු-දෙවියා, දෙවතාවා.

**ඉමං**. අ-මේ, මෙය.

**ඉමිස්සා**. ඉ-මැට, ඇට.

**ඉමමහා**. අ-මෙයින්, මේකෙන්.

**ඉමංලොක**. න මෙලොව.

**ඉර**. d. භූ. පවත්තනෙ කම්පනෙච, පැවැත් මෙහි, කම්පාවීමෙහි, ඉරති, එරති, පවතියි, කම්පාවෙයි.

**ඉරණ**. න-මහවනය, අරණ්‍යය.

**ඉරා**. ඉ-සුරා, මත්පැන්.

**ඉරිණ** න-නිසරු බිම, කාන්තාරය.

**ඉරිත්ථ** පු-යාග කරන්නා, බ්‍රාහ්මණයා.

**ඉරිමාන** පු චතුර්විධ බ්‍රහ්මවිහරණයෙහි හෝ ශ්‍රෙෂ්ඨඵලසමාපත්තියෙහි හෝ පවත්නා.

**ඉරිය**. (d. භූ. වත්තනෙ, පැවතීමෙහි,) ඉරියති, පවතියි.

**ඉරිය**. න-චරිතය, ගතිය.

**ඉරියනා**. ඉ-වැඩිදියුණුව, චර්‍යා මාර්ගය.

**ඉරියති**. ක්‍රි-(ඉරිය. d. භූ. වත්තනෙ, පැවැත් මෙහි + ති) පවතී.

**ඉරියා**. ඉ-චර්‍යාව, පැවැත්ම.

**ඉරියාපථ**. පු-ඊර්‍යාපථය, ගමනාදි ඉරියව් සතර.

**ඉරියාපථචරියා**. ඉ-ඊර්‍යාපථචර්‍යාව, සතර ඉරියව්වලින් හැසිරීම.

**ඉරියාපථපුච්ඡා**. ඉ-ඉරියව් විචාරීම, සිව් ඉරියව්වෙන් කවර ඉරියව්වකදැයි විචාරීම.

**ඉරියාපථමද**. න-ඉරියවුමදය, මාගේම ඉරියව්වට පැහැදේවායි ඇතිවන මදය, සත්විසිමදයෙන් එකක්.

**ඉරියාපථවිහාර**. න-ඉරියව් විහරණය, හිඳීම්, සිටීම් ආදි කායික ක්‍රියාව, සිව් විහරණයන් ගෙන් එකක්.

**ඉරියාපථසම්පන්න**. ති-ඉරියව්වෙන් සම්පූර්ණව, සම්පූර්ණවූ ඉරියව් ඇති, යෑම හා පෙරළා ඊම සතුටු උපදවන එකක් වීම. "**ඉරියාපථසම්පන්නො** භික්ඛු සබ්බසං චිත්තාරාධනං කරොති."

**ඉරියාපථංවිකොපෙය්‍ය**. ක්‍රි- (වි + කුප d. + එය්‍ය) ඉරියව් වෙනස් කරන්නේය. යමින් සිටියහු ඒ යෑම නවත්වන්නේය.

**ඉරීණ**. න-නිරසවූ භූමිදෙශය, කරමැටිබිම.

**ඉරීය**. පු-ප්‍රයොගය, උපක්‍රමය.

**ඉරීය**. (d-තු. පැවැත්මෙහි + ති ඉරීයති + ) පවතී.

**ඉරීයනා**. ඉ-පැවැත්ම, චර්‍යාව.

**ඉරීයති**. ක්‍රි-(d. ඉරීය + ති) පවතී.

**ඉරු**. ඉ-සෘක් වෙදය.

**ඉරුබ්බෙද**. පු-සෘක් වෙදය.

**ඉල**. d, භූ. ගතියං, යාමෙහි, එලති, යෙයි.

**ඉල**. d. තු කම්පායං, කම්පාවෙහි, ඉලති, කම්පාවෙයි.

**ඉල**. d. චු-පෙරණ, මෙහෙයීමෙහි, ඉලෙති, ඉලයති, මෙහෙයයි.

**ඉලලී**. ඉ-කරවාල නම් ආවුධ විශෙෂය, කයිසරඩුව, එකපැත්ත කැපෙන කුඩා කඩුව.

**ඉලලිසිතුං**. (ක්‍රි. වි.) මෙහෙයවීම සඳහා, මෙහෙය වීමට.

**ඉව**. අ-වැනි, සමාන, වාගේ.

**ඉස**. පු-කාළ සිංහයා.

**ඉස**. (d. භූ. උඤ්ඡෙ, පිඩුසිඟීමෙහි) එසති, පිඩුසිගයි.

**ඉස**. (d භූ. පරියෙසනෙ, සෙවීමෙහි) එසති, ඉසති, සොයයි.

**ඉස**. (d. කි. පරියෙසණෙ, නිරන්තරයෙහි, නැවත නැවත යනාඵයෙහි) ඉස්නාති, නිතර කරයි.

**ඉසි**. (d. භූ. ගතියං, යාමෙහි) ඉසති, යෙයි.

**ඉසි**. පු-සෘෂියා, තාපසයා, ශ්‍රමණයා.

**ඉසිකා**. ඉ-බටවර්ගයක්.

**ඉසිගිලි**. පු-රජගහනුවර පිහිටි එනම් පර්වතය.

**ඉසිඩි**. (d. භූ. මද්දනෙ, මැඩීමෙහි,) ඉසිණ්ඩති, මඩියි.

**ඉසිතත**. න-සෘෂි භාවය.

**ඉසිභාසිත**. න-සෘෂි භාසිතය, ඉසිවරුන්විසින් කියූ දෙය.

**ඉසිපතන**. න-බරණැස ඉසිපතනාරාමය, ගන්ධමාදන පර්වතයෙන් වඩනාවූද ඒ පර්වතයට වඩනාවූද පසේබුදු සෘෂීන්ගේ පතන උත්පතනය ඇති වූ මෘගදාය ස්ථානය සෘෂීන්ගේ පතනොත්පතනය වන බැවින් ඉසිපතන නම් වේ.

**ඉසිපයාත**. පු-සෘෂීන් විසින් පැමිණෙන ලද,

**ඉසිනිසභ**. පු-උත්තම සෘෂියා. බුදුරජ.

**ඉසිපබ්බජ්ජා**. ඉ-සෘෂිප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිවීම, සෘෂිප්‍රව්‍රජ්‍යාව.

**ඉසිවාත** පු-සෘෂීන්ගේ වාතය, සෘෂීන් නිසා හටගත් වාතය,

**ඉසිවාතපටිවාත**. පු-සෘෂීන්ගේ ගමනාගමන යෙන් හටගත් වාතය, බොහෝ භික්ෂූන්ගේ ගමනාගමනය නිසා හටගත් වාතය ඇති,

**ඉසිසඞ්ඝ**. පු-සෘෂි සමූහයා, භික්ෂු සමූහයා, "**ඉසිසඞ්ඝ** නිසෙවිතං".

**ඉසිසත්තම**. පු-සත්වැනි සෘෂියා, ගෞතම බුදුන්, විපස්සි, සිඛි, වෙස්සභූ, කකුසඳ, කොනාගමන, කාශ්‍යප යන බුදුවරයන් වහන්සේලාට සත්වැනිව උපන් ගෞතම බුදුරජ.

**ඉසිකා**. ඉ-ඉසිකා බලනු.

**ඉසු**. d. භූ. ඉච්ඡායං, කැමතිවීමෙහි, ඉච්ඡති, කැමතිවෙයි.

**ඉසුකාර**. පු-දුනුවායා, ධනුර්ධරයා,

**ඉස්ස**. පු-කළුසිංහයා, කාලසිංහ, වලසා, "ඉස්ස එනුදනානං විය".

**ඉස්ස**. d. භූ. ඉස්සායං, ඊර්ෂ්‍යාවෙහි, ඉස්සති, ඊර්ෂ්‍යා කරයි.

**ඉස්සති**. ක්‍රි-(ඉස්ස d. භූ. ඉස්සායං, ඊර්ෂ්‍යා වෙහි × ති) ඊර්ෂ්‍යාකරයි.

**ඉස්සත්ථ**. පු-උසස් ස්ථානාන්තරය, ඊශ්වර භාවය, ආයුධ ගෙණ කරණ සේවය, ආයුධ ශිල්පය, "යදි කසියා යදි වණිජ්ජාය යදි **ඉස්සත්ථෙන**".

**ඉස්සත්ථක**. පු-දුනුවායා, ආයුධ ශිල්පියා

**ඉස්සමාන**. ති-ඊර්ෂ්‍යා කරණු ලබන්නේ, ක්‍රොධකරනුලබන්නේ.

**ඉස්සර**. පු-මහදෙවියා, නායකයා, අධිපතියා.

**ඉස්සරකත**. පු-ඊශ්වරයා විසින් කරණලද

**ඉස්සරනිම්මාණ**. න-ඊශ්වර නිර්මාණය, බ්‍රහ්ම, මහෙශ්වර ආදී දෙවියෙක් විසින් ලොකය මවනලදැයි සිතීම.

**ඉස්සර නිම්මාණවාද**. න-ඊශ්වර දෙවියන් විසින් ලොව මවන ලද්දේය යන මතය-වාදය, ඊශ්වර නිර්මාණ වාදය.

**ඉස්සරාධිපච්ච**. න-ඓශ්වර්‍ය්‍යය හා අධිපති භාවය.

**ඉස්සරිය**. න-ඓශ්වර්‍ය්‍යය, ඉසුරු, උපභොග පරිභොග සම්පත්තිය, ප්‍රධානත්වය,

**ඉස්සරියතා**. ඉ-ඓශ්වර්‍ය්‍යභාවය, ඉසුරුමත් බව.

**ඉස්සරියාධිපච්ච**. න-ඓශ්වර්‍ය්‍යය හා අධිපති භාවය.

**ඉස්සා**. ඉ-ඊර්ෂ්‍යාව, නොඉවසීම, අනුන්ගේ යසඉසුරු දැක නොඉවසීම.

**ඉස්සාපකත**. ති-ඊර්ෂ්‍යාවෙන් වඩනාලද, "ථුල්ලනන්‍දා භික්ඛුණී **ඉස්සාපකතා**"

**ඉස්සාපකත**. පු-ඊර්ෂ්‍යාවෙන් කරණලද, ඊර්ෂ්‍යාවෙන් ජයගත්.

**ඉස්සාමච්ඡරිය**. න-ඊර්ෂ්‍යාව හා මසුරුකම.

**ඉස්සාමල**. න-ඊර්ෂ්‍යා නැමැති කෙලෙස් මල, කිලුට.

**ඉස්සාමිග**. පු-ශ්‍රෙෂ්ඨ මුවජාතියක්.

**ඉස්සාමිංග**. න-ඉස්සාමිග මුව ජාතියේ මුව අං අත්ත.

**ඉස්සායනා**. ඉ-ඊර්ෂ්‍යාව.

**ඉස්සායිතත්ත** පු-ඊර්ෂ්‍යාභාවය.

**ඉස්සාලු**. පු-(ඉස්සා × ආලු) ඊර්ෂ්‍යා ඇත්තා.

**ඉස්සාවතිණ්ණ**. පු-ඊර්ෂ්‍යාවට බට, ඊර්ෂ්‍යාව තිණිවූ.

(5600)

**ඉස්සාස**. පු-දුන්න, දුනුවායා, ධනුර්ධරයා,

**ඉස්සාසංයොජන**. න-ඉස්සා සංයොජනය. දශසංයොජනයන්ගේ එකක්.

**ඉස්සාසී**. පු-දුනුවාය, දුනු ඇත්තා.

**ඉස්සිත**. ති-ඊර්ෂ්‍යාකළ.

**ඉස්සුකී**. පු-ඊර්ෂ්‍යා ඇත්තා, ඊර්ෂ්‍යා කරන්නා, "ඉස්සුකී ච හොති ඉස්සාලෙස්සවසස අපප- ගීතං හොති".

**ඉහ** අ-මෙහි යනාර්ථයෙහි, මෙලොව, මේ ලෝකය.

**ඉහලොක** පු-මේ ලොකය, මේ භවය, මේ ජාතිය, මේජාතියපිළිබඳ.

**ඉහලොකික**. පු න-මෙලොව ලැබිය යුතු අර්ථය, මෙදු විඳයුතු පලය

**ඉහලොකපරලොක**. පු-මෙලොව පරලොව

**ඉළ**. d. චු විසීමෙහි හා වසන්‍ර හැඳීමෙහි, ඉළෙති, ඉළයති, වසයි, හඳියි.

**ඉල**. (d චු ථවෙ, තුති කිරීමෙහි) ඉලෙති, සතුතිකරයි

**ඉළෙති**. ක්‍රි-(චු d. වසෙ-විසීමෙහි, ණෙ + ති) වසයි.

## ඊ

**ඊ**. ඉ-ලක්ෂ්මී, ශ්‍රී, ප්‍රෙමනීය වචන, පාලි භාෂාවේ 4 වැනි ස්වරය.

**ඊ**. (d. භූ - ගතියං ගමන්හි) එති, එයි.

**ඊඞ්ඛ** පු-වෙව්ලීම, වෙව්ලන ගතිය.

**ඊජ**. (d භූ. ගතියං, ගමන්හි) ඊජති, යෙයි, ගමන් කෙරෙයි.

**ඊජ්**. (d භූ ගතිනින්‍දාසු, ගමන්හි - නින්දාවෙහි) ඊඤ්ජති, නින්‍දා කෙරෙයි.

**ඊති**. ඉ-උවදුර, විපත.

**ඊතික**. ති-උවදුරු සහිත, විපත්ති දායක.

**ඊතිකා** ඉ-උපද්‍රවය, විපත්තිය, උවදුර "සායං දිසා සභයා සඊතිකා ස උපද්දවා."

**ඊඩ**. (d. භූ. ථවනෙ, තුතිකිරීමෙහි, ඊඩතෙ, තුතිකෙරෙයි.

**ඊදි**. (d චු, සඤ්ඤහනෙ, ගැලපීමෙහි), ඊදෙති, ඊදයති, ගලපයි,

**ඊදිසක** ති මේ ආකාරවූ, මෙබඳු වූ.

**ඊදිස** ති මෙබඳුවූ, මෙවැනි, මෙයාකාර, "ඊදිසො තෙ ආවුසො රොගොති."

**ඊර**. (d. භූ. චචනෙ - ගතිකමපනෙ, කීමෙහි කම්පාවීහෙි) ඊරති, කම්පාවෙයි කියයි.

**ඊර**. (d. චු බෙපනෙ, දැමීමෙහි), ඊරෙති, ඊරයති දමයි.

**ඊරණ**. න-ඉසවීම, ඉස්සීම.

**ඊරණක්ඛම**. පු-ඉසවිය හැකි බව, පැගාලිය හැකි බව.

**ඊරිණ**. න කාන්තාරය, නිසරු බිම, මරු කතර

**ඊරිත**. ති-කියන ලද, දමනලද, ඔතන ලද.

**ඊරිස**. ති-මෙබඳු, මෙවැනි.

**ඊස**. (d. භූ ඉස්සරියෙ, ඉසුරෙහි) ඊසති, ඉසුරු දෙයි.

**ඊස**. (d. භූ. හිංසාගතිදස්සනෙ හිංසාගති දැක්මෙහි) ඊසති, හිංසා කරයි.

**ඊසක**. පු-දණ්ඩ, ධ්‍රැවය, යාර 5½ක් දිග මිම්ම.

**ඊස**. පු-ඉසුරු ඇත්තා, ඊශ්වරයා.

**ඊසති**. ක්‍රි-(ඊස d භූ පධානභාවෙ, ප්‍රධාන බැව්හි + ති) ප්‍රධාන කෙරෙයි.

**ඊසක**. ති-මඳක්, ස්වල්පයක්, ටිකක්,

**ඊසකං**. අ-මන්දාර්ථය දක්වන අව්‍යයක්, ඊසකං අනිවතතනතං"

**ඊසකළු**. පු-ඊෂදර්ථය, මඳක් යන අරුත,

**ඊසදත්‍ථ**. පු-අල්පාර්ථය, ස්වල්පය යන අර්ථය.

**ඊසඬර**. පු-සප්තකූට පර්වතයන්ගෙන් එකක්, එනම් පර්වතය යොදුන් 20,000 ක් උස ඇතැයි කියනු ලබන ඊසඬර පර්වතය.

(5641)

**ඊසං.** අ-අල්පාර්ථයෙහි, මන්දාර්ථයෙහි අව්‍යයක්, ටික.

**ඊසංපණ්ඩු.** පු-මඳක් පඬු පැහැය, මඳරත, ලාරත.

**ඊසම්ඵුට්ඨ.** න-(ඊස + ඵුස=ඵුට්ඨ) ඊෂත්-ස්පෘෂ්ටය, යරලව යන අන්තස්ථාක්ෂර-යන්ගේ කරණ විශෙෂය.

**ඊසා.** ඉ තගුලිස, නගුලිස් දණ්ඩ, රථහිස.

**ඊසාදන්ත.** පු-රියහිසක් මෙන් නැමුණු දත් ඇත්තා, මඳක් නැමුණු දත් ඇත්තා, රිය හිස්වන් දළඇති, "**ඊසා**-දන්තස්ස හත්ථිනො"

**ඊසාක.** පු-නගුලිසක් ඇත්තා.

**ඊසාන.** පු-ඊශ්වරයා, ඉසානාධිපතිය, එම දිශාව.

**ඊසිකා.** ඉ-ගොබය, කාණ්ඩය, "මුඤ්ජම්හා **ඊසිකං** පවාහෙය්‍ය"

**ඊසිතා.** ඉ-තමා වසඟ බව, ප්‍රධාන භාවය, ඊශ්වර භාවය, අෂ්ට සිද්ධීන්ගෙන් එකක්.

**ඊසිත.** ති-අනුන් වසඟ කරගෙණ අධිපති කමින් සිටීම.

**ඊහ.** (d. භූ චිත්තකෙ - චෙතායං, චින්තීයෙහි උත්සාහයෙහි) ඊහති චින්තා කරයි - වීර්ය කරයි.

**ඊහති.** ක්‍රි-(d. භූ. චිත්තකෙ, චින්තීයෙහි + ති) චින්තා කරයි.

**ඊහා.** ඉ-වීර්‍යය, උත්සාහය, ව්‍යාපාරය කට-යුතු කිරීමේ උත්සාහය.

**ඊහානුගත.** න-ඊහා සංඛ්‍යාත වීර්‍යයෙන් යුක්තවීම, ඊහා නම් වීර්‍යයයි.

**ඊහාමිග.** පු-වෘකයා, ව්‍යාඝ්‍රයා,

**ඊළ.** (d. භූ. ථුතියං, සතුති කිරීමෙහි) ඊළති, සතුති කරයි.

**ඊළති.** ක්‍රි-(ඊළ d. භූ ථුතියං, සතුති කිරීමෙහි + ති) සතුති කෙරෙයි, තුටු කෙරෙයි.

## උ

**උ.** අ-ඌර්ධවංගම වියොග, ආත්මලාභ, තෘප්ති සමෘද්ධි, ප්‍රාදුර්භාව, දෙශාභාව, ප්‍රබලත්ව, කථන ශක්ති, මොක්ෂ, ඊශ්වරාර්ථ, අභාවකම්, ඌර්ධ්වකම් යනාදි අර්ථවල යෙදෙන උප-සර්ගයක්, පාලිභාෂාවේ පස්වැනි ස්වරය.

**උ** පු දුක්ඛ, ප්‍රතිෂෙධ රොගමුක්ති, ගමන, යුක්ති, හැඟීම් යන මෙහි.

**උ.** d. භූ සද්දෙ, ශබ්ද කිරීමෙහි, අවති, ශබ්ද කෙරෙයි.

**උක්ක.** පු දෙම්නස, නොසතුට, උදුන, කඹුරු උදුන.

**උක්කති.** ඉ-අකුරු විසිහයකින් යුත් උත්කෘති නම් ඡන්දස.

**උක්කංස.** පු-අතිශය, ප්‍රකර්ෂය, උඩත් පිරිස, ඌර්ධව පරිච්ඡේදය

**උක්කංසක.** පු-නැඟී සිටින්නා, උසස්ව සිටින්නා.

**උක්කංසති.** ක්‍රි-(උ + කංස d. භූ ගතෙ, යාමෙහි + ති) උසස් කෙරෙයි. වර්ණනා කෙරෙයි.

**උක්කංසනා.** ඉ-උසස් කිරීම, නැඟී සිටවීම.

**උක්කංසාධාන.** න උත්තම හා අතිශය භාව-යන්ගේ පිහිටුවීම, උත්කර්ෂාධානය.

**උක්කට්ඨ.** ති-උත්කෘෂ්ට, ශ්‍රෙෂ්ඨ, උතුම්

**උක්කට්ඨාබාධ** පු-වේදනාවක් නැති ආබාධය, මධුමෙහය, "සබ්බෙපි ආබාධාභිනා, අපිච මධුමෙහො **උක්කට්ඨො ආබාධො.**"

**උක්කට්ඨගොත්ත** න-උසස් ගොත්‍රය, පුරාණ යෙහි ගොතම, මොග්ගල්ලාන, කච්චාන, වාසෙට්ඨ, ආදි ගොත්‍රයන් ශ්‍රෙෂ්ඨ සම්මත යයි කීහු.

**උක්කට්ඨජාති.** න-උසස් ජාතිය, ක්ෂත්‍රිය හා බ්‍රාහමණය ජාතිදෙක, "**උක්කට්ඨනාම ජාති** ඛත්තිය ජාති බ්‍රාහමණ ජාති ති වුච්චති"

**උක්කට්ඨදෙසනා.** ඉ උසස් දෙසුම, උත් කෘෂ්ට-දෙශනාව, කෙලෙස් නැති කිරීමට සමත් දෙසුම.

**උක්කට්ඨනාම.** න-උසස් නම, ශ්‍රෙෂ්ඨ නාමයන් "**උක්කට්ඨංනාමං** නාම බුද්ධපටිසංයුත්ත-තතං ධම්මසඞ්ඝ පටිසංයුත්තං."

**උක්කට්ඨපත්ත.** න - ප්‍රමාණයෙන් ලොකු පාත්‍රය, තව වැදෑරුම් පාත්‍රයන්ගෙන් එකක්, දෙතැලියක් බත් හා ව්‍යඤ්ජනාදියෙන් පිරෙන මහ පාත්‍රයක්,

**උක්කට්ඨලිඞ්ග.** න-උසස් ස්වභාවය, උත්කෘෂ්ට ලිඞ්ගය, "නාතිරස්සං නාතිකණ්හං නාවෙච්චොදාතං එතං **උක්කට්ඨං නාම ලිඞ්ගං"**

**උක්කට්ඨසත්ත.** පු-උසස් සත්ත්වයෝ, මනුෂ්‍ය දිව්‍ය බ්‍රහ්මයෝ, "දෙවමනුස්සාදයො **උක්කට්ඨ සත්තා නාම."**

**උක්කට්ඨසිප්ප.** න උසස් ශිල්පය, මුද්‍රා ශිල්පය, ගණිත ශිල්පය, ලේඛන ශිල්පාදිය උසස් ශිල්පගණයට වැටේ.

**උක්කට්ඨනිද්දෙස** පු-උසස්ම දැක්වීම, උතුම් හැඳින්වීම.

**උක්කට්ඨපරිච්ඡෙද.** පු-උතුම් කොටස, ශ්‍රේෂ්ඨ පරිච්ඡේදය.

**උක්කට්ඨතා.** ඉ-උත්කෘෂ්ට බව, ශ්‍රේෂ්ඨබව, උතුම් තත්ත්වය.

**උක්කට්ඨිත.** ති-තැම්බූ, තවනලද, "උදපත්තෙන අග්ගිනා සන්තත්තො **උක්කට්ඨිතො"**

**උක්කට්ඨා.** ඉ එනම් නුවර. "**උක්කට්ඨායං** විහරති සුභගවනෙ සාලරාජමූලෙ.

**උක්කඩ්ඪ** ති-කැඩූ, ඉදිරියට ඇද්ද, ඡේදනය කළ.

**උක්කඩ්ඪති.** ක්‍රි-(d. උ + කඩ්ඪ - කඩ්ඪනෙ, ඉදිරියට ඇදීමෙහි කැඩීමෙහි + ති) ඉදිරියට අදියි, කඩයි, සිඳියි.

**උක්කඩ්ඪන.** න-ඉදිරියට ඇදීම, ඉහළට ඇදීම.

**උක්කඩ්ඪමාන.** පු-ඉදිරියට අදිනුලබන, "උක්කඩ්ඪමානා විසිඛා සමීපං පරමමුඛා වෙච සද පවත්තා"

**උක්කඩ්ඪීයති.** ක්‍රි-උඩට අදිනු ලැබේ, ඉදිරියට ගණු ලැබේ.

**උක්කණ්ඨති.** ක්‍රි-(උ + කඨ d. භූ සොසන පාකෙසු, වියලීමෙහි පිසීමෙහි + ති කළකිතිය.

**උක්කණ්ඨන** න-කළකිරීම, උකටලී වීම.

**උක්කණ්ඨා.** කළකිරීම, උකටලීවීම.

**උක්කණ්ඨතා.** ඉ-කළකිරීම් ස්වභාවය, උකටලීවීම් ස්වභාවය.

**උක්කණ්ඨි** ක්‍රි-(උ + කඨ d. භූ. සොසන පා කෙසු, වියලීමෙහි පිසීමෙහි + ඊ) කළකිරුණේය.

**උක්කණ්ඨිතා.** ඉ උකටලී ස්වභාවය, කළකිරුණු ගතිය.

**උක්කණ්ණ** ති-උඩුකුරුව තුබූ කන් ඇති.

**උක්කණ්ණක.** පු-උඩුකුරුව තැබූ කන් ඇත්තා, හිවලුන්ට සෑදෙන එනම් රෝග විශේෂය.

**උක්කන්තති.** -ක්‍රි- (උ + කන්ත, d භූ. කන්තනෙ, කැපීමෙහි + ති) කපයි, ඉරයි.

**උක්කන්තිත.** ති-කපාදැමූ, ඉරාපු.

**උක්කන්තිත්වා.** පු, ක්‍රි (උ + කන්ත + ඉ + ත්වා) කපා, සිඳ, "ඌරුමංසං **උක්කන්තිත්වා** දුසියා අදාසි."

**උක්කපිණ්ඩක.** ඉ-එනම් පණු විශේෂය.

**උක්කපිණ්ඩකා.** පු-බළල්, මී, මුගටි, ගොයි, ආදීහු.

**උක්කමති.** ක්‍රි-(d. භූ. කමු. පදවික්ඛෙපෙ, පාද වික්ෂේපයෙහි + ති) බැහැර යෙයි.

**උක්කමන.** න නික්මීම, ඉවත යාම, පැනයාම.

**උක්කල.** පු-උක්කල නම් ජනපද වැසියා, බරගෙනයන්නා, වැඩකාරයා.

**උක්කා.** ඉ-කඹුරු උඳුන, ගිනි කබල, ගිනි සුළු, තරළුවත් ගේ කෝවය, ධාතුවේගය විලක්කුව, දඹුවැට, දඹුවැට පහන්, අඟුරු කබල, උල්කා, "උක්කංච පටිච්ච ලොණංච පටිච්ච".

**උක්කාචන.** න-උසස් කොට දැක්වීම, අනුන් ඉහළින් තබා කථාකිරීම.

**උක්කාචිත.** ති-නොපිළිවිසින ලද කරුණු පරීක්ෂා නොකළ, නරකලෙස හික්මුණු.

**උක්කාචිත විනීත.** ති-නොපිළිවිස හික්මුණු-නොහික්මුණු.

**උක්කාධාර** පු-පන්දම් අල්ලන්නා, විලක්කු දරන්නා, එළිය ගෙණයන්නා.

**උක්කාපභා**. ඉ-තාරකා ලොකය, තරු එළිය. "මහාසාවකානං උක්කාපභා සදිසං"

**උක්කාපාත**. පු-උල්කා පාත්වීම, අහසින් ගිනිසිළු කඩාවැටීම, උල්කාපාතය.

**උක්කාමුඛ**. න-කඹුරු උදුන, රන්කරුවන්ගේ ලිප. "උක්කාංබන්ධිත්වා උක්කාමුඛං ආලිම්පති"

**උක්කාමෙති**. ක්‍රි-(උ + කමු d. භූ. ඉච්ඡාය කන්තිමහි, කැමැතිවීමෙහි, කාන්තියෙහි + ණෙ + ති) කැමැතිවෙයි.

**උක්කාර**. පු-අසුචි, වැසිකිළිය. කා ඉතිරි ඉඳුල්.

**උක්කාරභූමි**. න-මලමූත්‍ර හා කසල දමන තැන, අපවිත්‍ර දේ දමන තැන, කචවර ස්ථානය.

**උක්කාරපාති**. ඉ-ඉඳුල් දමන භාජනය.

**උක්කාසති**. ක්‍රි-(උ + කාස d. භූ. දිත්තිමහි සජ්ජනෙ, බැබලීමෙහි සැදීමෙහි + ති) කාරයි, කැසිකාරයි.

**උක්කාසි**. ක්‍රි-(උ + කාස d. භූ. කාසනෙ, කැරීමෙහි + ඊ) කැරීය, සෙම් බැඟීය,

**උක්කාසික**. න-වත් වැටිය,

**උක්කාසිකා**. ඉ-තුවාය, නානවිට සිරුර උලන රෙදි කෑල්ල,

**උක්කාසිත්වා**. පූ. ක්‍රි-කාරා, පසම්බහා, කාරා-දමා,

**උක්කාසිත**. ති-කාරණ ලද, කැස, කාරණලද.

**උක්කාසිත සද්ද**. පු-කැසි කෑරූ ශබ්දය.

**උක්ලාප**. පු-කසල, කුණු, රොඩු.

**උක්කිණ්ණ**. පු-සෑරීම, හෑරීම.

**උක්කිණ්ණපරිඛා**. ඉ-සෑරූ දිය ඇළ, කැනූ දිය අගල.

**උක්කිපිත්වා**. පූ-ක්‍රි-කැන, සාරා, හාරා,

**උක්කිලෙදෙති**. ක්‍රි-(කිලිද d. චු. පරිදෙවනෙ, වැලපීමෙහි, + ණෙ + ති) වැලපෙයි.

**උක්කුජ්ජ**. d. භූ. අව්‍යතෙනසද්දෙ, නොවියත් හඬෙහි, උක්කුජ්ජති.

**උක්කුජ්ජ**. පු-මුව උඩුකුරුව තැබීම.

**උක්කුජ්ජති**. ක්‍රි-(උ + කුජ d. භූ. අව්‍යතෙන සද්දෙ, නොවියත් හඬෙහි + ති) උඩුකුරුව තබයි.

**උක්කුජ්ජන**. න-උඩුකුරු කිරීම, මුනින් නමන ලද්දක් කට උඩු බැලි අතට හැරවීම, වසුන් ඇරීම.

**උක්කුජ්ජපඤ්ඤ**. පු-උඩුමුව ප්‍රඥ ඇත්තා.

**උක්කුජ්ජිත**. ති-උඩුකුරු කළ, මුව උඩුඅතට හරවන ලද, **උක්කුජ්ජිතං** වා නික්-කුජ්ජෙය්‍ය."

**උක්කුටික**. පු-උක්කුටිකය, අඩ දනින් සිටීම.

**උක්කුටිකප්පධාන**. පු-උක්කුටිකව සිටීමේ වීර්‍ය්‍යය, උක්කුටිකයෙන් සිට තවුස් දම් රැකීම.

**උක්කුට්ඨි**. න-ශබ්දය, උක්කුට් ශබ්දය, උන්නාද ශබ්දය.

**උක්කුස**. පු-මුහුදු රාජාලියා, කුරලයා, කබරුස්සා යයි ප්‍රසිඬ පක්ෂියා.

**උක්කූල**. න-උස්, උච්චස්ථානය, උස්බිම, ගොඩ තැන්. උක්කූලනති උණ්ණතට්ඨානං"

**උක්කූල විකූල**. න-උස් පහත්, උස්මිටි තැන සමනොවූ තැන. "උක්කූල විකූල නදී විදුග්ග පබ්බත විසමෙසු"

**උක්කුර**. න-පස්, මීයන් ආදි සතුන් විසින් හාරාදමන ලද පස්,

**උක්කූපමා** ඉ-(උක්කා + උපමා) ගිනිසිළුකට බඳු උපමා ඇති.

**උක්කොට** පු-හුන් තැනට යවන පඬුර, අල්ලස. "උක්කොටං දත්වාති ලඤ්ජං දත්වා"

**උක්කොටන** න-ජය පරාජය කරවීම පිණිස අල්ලස් ගැණීම.

**උක්කොටනක**. පු-ජය පරාජය කරවීමට අල්ලස් ගන්නා, ඉදිරියට ඇදීම. "උක්කොටනකෙ පාචිත්තියං"

**උක්කොටෙති**. ක්‍රි-උ + කුට d. චු. ජොදෙ, ජොදනය කිරීමෙහි + ණෙ + ති) වරක් විනිශ්චය වූවක් නැවතත් විනිශ්චය පිණිස ගන්වයි.

**උක්ඛ**. d. භූ. සෙචනෙ, ඉසීමෙහි, උක්ඛති, ඉසියි.

**උක්ඛ.** පු-ගෝණා.

**උක්ඛලි.** ඉ-සැළිය, ඉකිලිය, "අනනමසො **උක්ඛලි** ආදීනි උපාදාය."

**උක්ඛලිකා.** ඉ-මහසැළිය, බත්උයන භාජනය.

**උක්ඛිණ්ණ.** ති-එසවූ, උස්කළ සාරණලද.

**උක්ඛිත.** ති-තැවරූ, ඉසිනලද, ඝාතලද.

**උක්ඛිත්ත.** ති-ඔසවනලද, උස්කළ, උත්ක්ෂෙ-පනිය කර්මය කළ.

**උක්ඛිත්තක.** පු-සමූහයකගෙන් එක් අයෙක් වෙන්කර තැබීම, එනම් විනය කර්මය.

**උක්ඛිත්තාසික.** පු-කොපුවෙන් ඇදගත් කඩුව ඇති.

**උක්ඛිත්තපලිඝ.** පු-පහවූ බාධා ඇති, දුරුකළ උපද්‍රව ඇති.

**උක්ඛිපති.** ක්‍රි-(උ + ඛිප, d. භූ බෙපනෙ, එසවීමෙහි + ති) ඔසවයි.

**උක්ඛිපන.** න-එසවීම, උසස්කිරීම.

**උක්ඛිත්තකාය.** පු-තගාගත් සිවුරින් යුත් කාය ඇත්තේ.

**උක්ඛිත්තසම්භොග.** පු-උත්ක්ෂෙපනීය කර්මය කළ භික්ෂුව සමග සම්භොගකිරීමෙන් පචිති ඇවැත්වේයයි පැනවූ ශික්ෂාපද.

**උක්ඛෙප.** පු-ඉවත්කිරීම, බැහැරකිරීම.

**උක්ඛෙප.** න-නැටුම් ආදිය පවත්වන විට දෙන තැගි.

**උක්ඛෙපක.** පු-ඉවත්කළ තැනැත්තා, බැහැර කළ තැනැත්තා.

**උක්ඛෙපන.** න-උත්ක්ෂෙපය, බැහැර කිරීම. උඩට එසවීම.

**උක්ඛෙපනා.** ඉ-ඉවත්කිරීම, බැහැරකිරීම.

**උක්ඛෙපනක.** පු-බැහැර කරන්නා, පන්නා දමන්නා.

**උක්ඛෙපනීය.** න-බැහැර කළයුතු, උත්ක්ෂෙප-නය කළයුතු.

**උක්ඛෙපනීයකම්ම.** න-වැරදිකළ භික්ෂුවක් ඒ වැරැද්දට පිළියම් කර ගන්නාතුරු සඞ්ඝයා විසින් බැහැරකිරීමේ විනය කර්මයක්.

**උක්ඛෙපිත.** ති-උත්ක්ෂෙපනය කළ, බැහැර-කළ.

**උක්ඛිපිංසු.** ක්‍රි-(උ + ඛිප. d. චු. බෙපනෙ, එසවීමෙහි + සු) එසවූහ, බැහැර කළහ, ඉවත්කළහ, උත්ක්ෂෙපනීය කර්මය කළහ.

**උක්ඛෙපිම** ති-(උ + ඛිප + ණ + ඉම) ඔසවා ගතයුතු, උස්සාගතයුතු.

**උඛ.** d. භූ. ගමනෙ, යාමෙහි, උඛති, යෙයි.

**උඛා.** ඉ-සැළිය, හැළිය.

**උඛි.** d. භූ. ගතියං, යෑමෙහි, උඛති, ගමනය කරයි.

**උග්ගතප.** පු-උග්‍රවූ තපස, උසස් තපස් ඇති.

**උග්ග.** පු-උග්‍ර, සැඩ, තියුණු, දැඩි, නපුරු, උසස්,

**උග්ග.** පු-ඊශ්වරයා, එනම් සිටු.

**උග්ගත.** ති-උද්ගත, උඩට නැගුණු, ඉහලට නැගුණු, උස්වනැගි.

**උග්ගත්ථන.** න - ආභරණ විශෙෂයක්, දෙනුත්ගේ තනාකාර චතුඃෂෂ්ටිකහාර භෙදයක්.

**උග්ගච්ඡන්ත.** ති-උස්වයන, ඉහලට නගින.

**උග්ගච්ඡති.** ක්‍රි-(උ + ගමු, d. භූ. ගතියං, යාමෙහි, ච්ඡ + ති) උස්වනගියි.

**උග්ගජ්ජති.** ක්‍රි-(උ + ගජ්ජ, d. භූ. ගජ්ජනෙ, ගර්ජනා කිරීමෙහි + ති) උසස්කොට ගර්ජනා කෙරෙයි.

**උග්ගජ්ජන.** න-උසස්ව ගර්ජනා කිරීම, හඬ-යෙන් ගෙරවීම.

**උග්ගජ්ජිත.** ති-උසස්කොට ගර්ජනා කළ, මහත් කොට ගොරවන ලද.

**උග්ගතෙජ.** පු-උසස් තෙජස් ඇති, මහත් තෙජස ඇති.

**උග්ගපුත්ත.** පු-වංශවත් අය, සිටුවරයා.

**උග්ගහකුසල.** පු-ඉගැන්මට දක්ෂවූ, පෙළ අටුවා දෙක්හි දක්ෂවූ.

**උග්ගණ්හාති.** ක්‍රි-(උ + ගහ, d. භූ. උපාදානෙ, ගැණීමෙහි, ණ්හා + ති) උගෙණගනී, ඉගෙණ ගනී.

**උග්ගණ්හණ**. න-උද්ග්‍රහණය, ඉගෙණගැන්ම.

**උග්ගණ්හිත**. ති-උද්ග්‍රහණය කළ, ඉගෙණගත්,

**උග්ගණ්හා** ඉ-වදකසා.

**උග්ගම**. පු-නැගීම, ඉහළට නැගීම, උස්ව නැගීම.

**උග්ගමන**. න-උත්පත්තිය, ඌර්ධවගතිය, උඩට යාම.

**උග්ගහ**. පු-උද්ග්‍රහණය, ඉගෙණීම.

**උග්ගහණ**. න-උද්ග්‍රහණය, උගෙණගැනීම.

**උග්ගහනිමිත්ත**. න-සිතින් ගත් පරිකර්ම නිමිත්ත, උද්ග්‍රහනිමිත්ත.

**උග්ගහාය**. පු. ක්‍රි-ඉගෙණගෙණ, උද්ග්‍රහණය කොට.

**උග්ගය්හති**. ක්‍රි-(උ + ගහ d. භූ උපාදානෙ, ගැනීමෙහි + ය + ති) ඉගෙණීම කරණුලබයි.

**උග්ගහිත**. ති-ඉගෙණගත්, දැනගත්තාලද.

**උග්ගහීත**. න-ඉගෙනගත්තා ලද.

**උග්ගහීයති**. ක්‍රි-(උ + ගහ, d. භූ. උපාදානෙ, ගැනීමෙහි, + යහ + ති) උගෙණී, ඉගෙණගනී.

**උග්ගා**. පු - ඉපිලෙන්නෝ, පැනපැන යුද්ධ කරන්නෝ "**උග්ගා**රාජපුත්තා පක්ඛන්දිනො මහානාගා."

**උග්ගාර**. පු-ඔක්කාරය, වමනය, තැලිතැගීම.

**උග්ගාරණ**. න-ඔක්කාර කිරීම, වමනය කිරීම.

**උග්ගාහක**. පු-ඉගෙණීමට ආශා ඇති අය, ඉගෙණගන්නා ශිෂ්‍යයා.

**උග්ගාහමාන**. න-ඉගෙණීම කරන්නා, ඉගෙණීම.

**උග්ගිරති**. ක්‍රි-(උ + ගිර, d. භූ. උග්ගිරණෙ, ගිලීමෙහි, + ති) ගිලියි. උඩට ඔසවයි.

**උග්ගිලති**. ක්‍රි-(උ + ගිර, d. භූ. උග්ගිරණෙ, ගිලීමෙහි + ගිල + ති) ගිලියි.

**උග්ගිර(ලා)න**. න-ගිලීම.

**උග්ගිරණ**. න-වැගිරීම.

**උග්ගීව**. පු-උඩුකුරුවූ ගෙල ඇත්තා.

**උග්ගීති**. පු-ගීතිප්‍රකරණයෙහි කී තුන්වන වෘත්තය.

**උග්ගො**. පු-නුවණ, ඥානය.

**උග්ඝට්ට**. ති-ගැටෙන, හැපෙන.

**උග්ඝට්ටපාද**. පු-ගැටෙන පා ඇත්තා, විලුඹෙන් විලුඹ හෝ ගොප්මසින් ගොප්මස හෝ දතින් දත හෝ ගැටෙන පා ඇති අය.

**උග්ඝට්ටන** න-වැසුම් හැරීම, පියන හැරීම, උඩරණය.

**උග්ඝංසන**. න-ඇඟඉලීම.

**උග්ඝංසති**. ක්‍රි-(උ + ඝංස, d. භූ. ඝංසනෙ, ඉලීමෙහි, ණෙ + ති) ඇඟ උලයි.

**උග්ඝටිත**. ති උපුටනලද, වැසුම්හරිනලද.

**උග්ඝටිතඤ්ඤු**. පු-(උ + ඝට + ඉ + ත=උග්ඝටිත + ඤ්ඤු + ඌ) තථාගත ධර්මය ඇසූ කෙණෙහිම චතුරාර්‍ය්‍යසත්‍යය අවබෝධ කර ගන්නා උත්තමයා, උසස් ප්‍රඥා ඇත්තා, අධික ප්‍රඥා ඇත්තා.

**උග්ඝංසෙය්‍ය**. ක්‍රි-(උ + ඝංස d. භූ. ඝංසනෙ, ඝර්ෂණය කිරීමෙහි + එය්‍ය) සිරුර උළන්නේය.

**උග්ඝත**. ති-සෙල්වෙන, ගැස්සෙමින් සෙල්වෙන.

**උග්ඝාත**. ති-නැසූ, විනාශ කළ.

**උග්ඝාති**. ඉ-අනුග්‍රහය, ජය, දිනීම.

**උග්ඝාති-නිග්ඝාති**. ඉ-අනුග්‍රහය හා නිග්‍රහය.

**උග්ඝරති**. ක්‍රි-(උ + ඝර d. භූ. සෙචනම්හි, වැගිරීමෙහි + ති) වැගිරෙයි.

**උග්ඝරණ**. න-වැගිරීම, උඩට විසිරීම, කාන්දු වීම.

**උග්ඝට**. පු-වැසුම් ඉවත්කළ.

**උග්ඝමණකිට්ටිකා**. ඉ-පැළැල්ල, එක් පැත්තකට අදින තිරයක්.

**උග්ඝරන්ත**. ති-(උ + ඝර + න්ත) උතුරා යන, ඉහිරෙන.

**උග්ඝාටන කිට්ටිකද්වාර**. න-පැලැල්ල, ඉදිකඩුල්ල, එනම් දොර.

**උග්ඝාටිත**. ති-වැසුම්හළ, පියන්පත් අහක් කළ.

**උග්ඝාටෙති**. ක්‍රි-(උ + ඝට. d. චු. විසරණෙ, හිංසාවෙහි + ණෙ + ති වැසුම් හරියි.

**උග්ඝාතිත**. ති-වැසුම්හළ, පියත්පත් අහක්-කළ.

**උග්ඝොස**. පු-(උ + ඝුස + ණ) මහා නාදය, උසස් ශබ්දය.

**උග්ඝොසන**. න-මහත් නාදය, උසස් ශබ්දය.

**උග්ඝොසනා**. ඉ-මහානාදය මහත් ශබ්දය.

**උග්ඝොසති**. ක්‍රි-(භ + ඝුස. d. භූ. ඝොසෙ ශබ්ද කිරීමෙහි, + ති) මහානාද කෙරෙයි.

**උච**. d. දි. සදෙද, සමවායෙ, ශබ්ද කිරීමෙහි, රැස්කිරීමෙහි, උචති, ශබ්ද කෙරෙයි.

**උච්චං**. අ-උස්, මහත් යනාර්ථයෙහි.

**උච්ච**. ති-උස්, උසස්, මහත්, විශාල.

**උච්චක**. පු-උසස් තැනැත්තා. ශ්‍රෙෂ්ඨ තැනැත්තා.

**උච්චචා**. ඉ-හීන් මිදි.

**උච්චතර**. පු. ඉතා උස්, උසස්.

**උච්චතර**. පු-පොල් ගස.

**උච්චය**. පු-රැස්කිරීම. “සුඛො පුඤ්ඤස්ස උච්චයො.”

**උච්චයගාහ**. පු-රාශි වශයෙන් ගැණීම.

**උච්චතන**. න-උඩගු බව, උඩතාකාරය.

**උච්චතරස්සර**. පු-ඉතා උසස් නාදය, උස්හඬ.

**උච්චසද්ද**. න-උත්ඝොෂණය, උසස් නාදය.

**උච්චභාග**. න-ග්‍රහයින්ට ඒ ඒ රාශිවල උච්චවූ අංශක.

**උච්චා**. අ-උසස්, ශ්‍රෙෂ්ඨ.

**උච්චාවච**. ති-(උච්ච + අවච) උස්පහත්, ලොකු කුඩා, විසිතුරු, මාහැඟි, මිශ්‍ර, “උච්චාවචානි මහන්ත බුද්ධකානි.”

**උච්චාවච කම්ම**. න-උසස් කටයුතු, සැගෙහි පොහෝගෙහි ආදි කටයුතු.

**උච්චාපාදක**. ති-උස්වූ පාද ඇති, වඩුරියනින් උස්වූ පාද ඇති ඇඳපුටු.

**උච්චාවත්ථුක**. න-උස්බිම, උපරි භූමිභාගය,

**උච්චාකුල**. න-උසස් කුලය, වංශවත් කුලය, ක්‍ෂත්‍රිය බ්‍රාහමණකුල.

**උච්චාකුලික**. පු-උසස් කුලයට අයිති තැනැත්තා.

**උච්චාකුලීන**. පු-උසස් කුලයට අයිති වංශවත් කුලයෙහි වූ.

**උච්චාකුලීනතා**. ඉ-උසස් කුලොත්පත්තිය, ශ්‍රෙෂ්ඨ උත්පත්තිය.

**උච්චාකණ්ණෙරුකා**. ඉ උස් ඇතින්නක්.

**උච්චාකාලාරිකා**. ඉ-එනම් ඇත් කුලය.

**උච්චාර**. පු-මල, අසූචි.

**උච්චාරපස්සාව**. න-මල මූත්‍ර.

**උච්චාර පස්සාව කම්ම**. න-මල මූත්‍ර කිරීම.

**උච්චාරණ** න-උසුරුවීම, ශබ්දනගා කීම.

**උච්චාරිත**. ති-කියනලද, උසුරුවන ලද.

**උච්චාරෙති**. ක්‍රි-(උ + චර. d. භූ. ගතිභක්ඛණෙසු, යාමෙහි, කෑමෙහි + ණෙ + ති උසුරුවයි.

**උච්චාරෙත්වා**. පු, ක්‍රි-ඔසවා, උඩට ඔසවා.

**උච්චාලිඞ්ග**. පු-බු පණුවා, බජණුවා, දළඹුවා. “උච්චාලිඞ්ග පාණක දට්ඨෙන.”

**උච්චාසද්ද**. පු-උසස් ශබ්දය, උස් හඬ.

**උච්චාසයන**. න-උස් ආසනය, වඩු රියනින් උස් ආසනය. “උච්චාසයන මහාසයනා වෙරමණී සික්ඛාපදං”

**උච්චිට්ඨකඤ්ජි**. න-ඉඳුල් කැඳ, ඉඳුල් හඹු.

**උච්චිට්ඨඛාදක**. පු-ඉඳුල් කන්නා, ඉතුරුවූ දේ කන්නා,

**උච්චිට්ඨපායාස**. න-ඉඳුල් කිරිබත.

**උච්චිට්ඨභොජී**. පු-ඉඳුල් අනුභව කරන්නා.

**උච්චිට්ඨහත්ථ**. පු-ඉඳුල් තැවරුණු අත, ඉඳුල් අත. “උච්චිට්ඨහත්ථෙන පත්තං ගණ්හිතුං න වට්ටති.”

**උච්චට්ඨානීය**. න-උසස් තනතුරක සිටිත, උසස් තන්හි තැබිය යුතු, “රාජා උච්චට්ඨානියං ඨානෙ ඨපෙති.”

**උච්චිණන**. න-රැස්කිරීම, සමූහයකින් එකක් තෝරා වෙන්කර ගැණීම, ඇහිඳ ගැණීම.

**උච්චිණති**. ති-ක්‍රි-(උ + චි. d. සවා. චයෙ, රැස් කිරීමෙහි + ණ + ති) රැස්කෙරෙයි, ඇහිඳියි.

**උච්ඡඞ්ග**. පු-ඔඩොක්කුව, ඇකය.

**උච්ඡඞ්ගපඤ්ඤ**. පු-ඔඩොක්කුවට සමාන ප්‍රඥා ඇත්තා, යමක් අසා සිටිනවිට පමණක් සිත තබා ගැණීමේ ශක්තිය ඇති, ධාරණ ශක්තිය නැති තැනැත්තා. **"උච්ඡඞ්ගපඤ්ඤො පුරිසො සෙය්‍යො එතෙන වුච්චති."**

**උච්ඡන්න**. න-මතු මත්තෙහි සඟවන ලද.

**උච්ඡාදන**. න-ඇඟ ඉලීම, ශරීරයෙහි රජස් දුරුකිරීම, සනානයෙහි ඇඟ ඉලීම. "**උච්ඡාදනෙ** නහාපනෙ පාදුනං ධොවනෙනව."

**උච්ඡාදිත**. ති-ඇඟ උලනලද.

**උච්ඡාදෙති**. ක්‍රි-(උ+චිද d. චූ අපවාරණෙ, බැසීමෙහි+ණෙ+ති ඇඟ උලයි.

**උච්ඡිත**. ති-උස්දෙය, ඉහළ පවත්නා දෙය.

**උච්ඡිට්ඨ**. ති-ඉදුල්, ඉදුල් කළ, අනුභවකොට ඉතිරිවූ.

**උච්ඡිට්ඨ පත්ත**. පු-ඉදුල් ඇති පාත්‍රය, වළඳා ඉතිරවූ පාත්‍රය.

**උච්ඡිට්ඨොදක**. න ඉදුල් වතුර

**උච්ඡිට්ඨභත්ත**. න-ඉදුල් බත්.

**උච්ඡිට්ඨභොජන**. න-ඉදුල් කළ භොජනය.

**උච්ඡින්දති**. ක්‍රි-උ+ඡිදි d. භූ. ඡෙදනෙ, සිදීමෙහි+ති) සිඳ දමයි, කපා දමයි.

**උච්ඡිජ්ජති**. ක්‍රි-(උ+ඡිදි. d. භූ. ඡෙදනෙ, සිදීමෙහි,+ති) සිඳියි, කපයි.

**උච්ඡින්න**. ති-සිඳිනලද, කපනලද, සහමුලින් සිඳ දැමූ.

**උච්ඡින්න භවනෙත්ති**. ඉ-සිඳිනලද භව නෙත්තිය සිඳින ලද සංසාරය.

**උච්ඡින්නමූල**. පු-කපනලද මුල් ඇති, උසුන් මුල් කළ.

**උච්ඡෙද** පු-සිඳීම, කැපීම, දෙපලු කිරීම.

**උච්ඡෙදන**. න-සිඳීම, කැපීම, විනාශවීම.

**උච්ඡෙදදිට්ඨි**. ඉ-මරණින් මතු ඉපදීමක් නැතැයි ගන්නා ඇදහීම, උච්ඡෙද දෘෂ්ටිය.

**උච්ඡෙදදිට්ඨික**. පු-මරණින් මතු නැවැත ඉපදීමක් නැතැයි ගත් ඇදහීම් ඇත්තා. උච්ඡෙද දෘෂ්ටිකයා.

**උච්ඡෙදවාද**. පු-මරණින් මතු නැවත ඉපදීමක් නැතැයි යන මතය.

**උච්ඡෙදවාදී**. පු-මරණින්මතු නැවත උත්පත්තියක් නැතැයි යන මතය ගත් තැනැත්තා, චාර්වාක දෘෂ්ටිකයා, ඔවුන් මත (ධර්ම)ය නම්, යාවජ්ජීවං සුඛං ජීවෙත්, ඍණං කෘත්වා දධිං පිවෙත්, භස්මීභූතස්‍ය දෙහස්‍ය පුනරාගමනං කුතඃ. 'ශබ්දශීනසමුච්චය' දිවි ඇතිතාක් සැපසේ ජීවත් විය යුතුය. මුදල් නැතිනම් ණයට ගෙණවත් ගිතෙල් කෑ යුතුය. පුලුස්සා අළු කරණලද මේ ශරීරයාගේ නැවත ඒමෙක් කොයින්ද? මෙබඳු අදහස් ඇති උච්ඡෙද වාදියා.

**උච්ඡෙදී**. ති-කපනසුළු, සිඳිනසුළු.

**උච්ඡුකලීර**. න-හුණ බඩ, හුණ ගොබ, හුණ කිළිල්.

**උච්ඡුක්ඛෙත්ත**. න-උක් හේන, උක් කෙත, උක්වැවිල්ල, "සම්පන්නෙ **උච්ඡුක්ඛෙත්තෙ** මඤ්ජෙට්ඨිකා නාම රොගජාති නිපතති."

**උච්ඡුඛණ්ඩ** න-උක්කඳ, උක්දඬු, උක් දණ්ඩ.

**උච්ඡුචොරකා**. පු-උක්ගස් සොරකම් කරන්නෝ, උක්සොරු.

**උච්ඡුඡෙදන**. න-උක් ගස් කැපීම, උක් පොතු හැරීම.

**උච්ඡුනියාස**. පු-උක්ලාටු, උක්ලහටු.

**උච්ඡුපාලක**. පු-උක්වතු පාලනය කරන්නා, උක්පාලකයා.

**උච්ඡුඵාණිත**. න-උක් පැණි, උක් සකුරු. "**උච්ඡුඵාණිතං** වෙ සත්තාහ කාලිකො."

**උච්ඡුභාජක**. පු-උක් බෙදන්නා, උක් ගස්පැනි බෙදන්නා.

**උච්ඡුයට්ඨි**. න-උක් ගස, උක් කඳ, උක් සැරයැටිය.

**උච්ඡුවිකති**. ඉ-උක්පැණිවලින් සාදනු ලබන පැණි, හකුරු ආදිය.

**උච්ඡු**. පු-උක්ගස, එනම් සාගරය.

**උච්ඡුඅග්ග**. පු-උක්ගසේ අග, උක් කරටිය.

**උච්ඡුභණ්ඩිකා**. ඉ-උක්පුරුක, උක් කැල්ල.

**උච්ඡුඛාදන**. න-උක්ගස් කෑම.

(5917)

**උච්ඡුගණ්ඩිකා**. ඉ-ඉක්ෂු විශෙෂයක්, උක්ගස් ජාතියක්.

**උච්ඡුපාල**. පු-උක්ගස් පාලනය කරන්නා, ඉක්ෂු පාලකයා.

**උච්ඡුපීළන**. න-උක් පොඩිකිරීම, උක් තැලීම

**උච්ඡුපුට**. න-ඉක්ෂු භාජනය, උක්ගස් දමන භාජනය.

**උච්ඡුබීජ**. න-ඉක්ෂු බීජය, උක් ඇටය.

**උච්ඡුයන්ත**. පු-උක්මෝල, ඉක්ෂු යන්ත්‍රය.

**උච්ඡුරස**. පු-ඉක්ෂුරසය, උක්පැනි, එක් යාම කාලිකයක්.

**උච්ඡුවාත**. පු-ඉක්ෂු වාතය, උක්ගස්වලින් හමන වාතය.

**උච්ඡුසාලා**. ඉ-ඉක්ෂු ශාලාව, උක් ශාලාව.

**උච්ඡුමය**. ති-ඉක්ෂුමය, උක්මය, උක්පැනි යෙන්ම සෑදුනු.

**උච්ඡුවිකාර**. පු-ඉක්ෂුවිකාර, උක්පැනි, එම සකුරු, සීනි ආදිය.

**උජ**. -d. භූ. පිපාසායං, පිපාසයෙහි, උජති, බොනුරිසිවෙයි.

**උජති**. ක්‍රි-(උජ d. භූ. පිපාසායං, පිපාසයෙහි + ති) බොනු කැමතිවෙයි.

**උජි**. -d. භූ. ආභිණ්ඩනෙ, භිකඛනෙ, ඇවිදීමෙහි, සිඟීමෙහි, උඤ්ජති, ඇවිදියි, සිඟයි.

**උජී**. -d. භූ. බන්ධනෙ, බැඳීමෙහි, උජති, බඳියි.

**උජු=ජ්ජු**. ති-සෘජු, ඇදනැති දෙය, අවඞක. ලක්‍ෂ, "උජුං කායං පණිධාය."

**උජු=ජ්ජු** ක. ති-ඇදනැති, වඞක රහිත, කෙලින්.

**උජු** -d. භූ. උජුභාවෙ, සෘජුබැව්හි, ඔජති, සෘජුවෙයි.

**උජුආජානීය**. පු-හොඳට කාරණාකාරණ දන්නා.

**උජුක**. පු-සෘජු, ඇදනැති. "උජුකො නාම සො මග්ගො."

**උජුගත**. ති-සෘජුව ගිය, ඇදනැතිව ගිය.

**උජුගාමී**. ති-සෘජුව යන සුළු. කෙලින් යන සුළු.

**උජුචිත්තතා**. ඉ-සෘජුවූ සිතක් ඇතිබව, අවඞක සිතක් ඇතිබව.

**උජුජඞඝ**. පු-එනමරට.

**උජුදිට්ඨි**. ඉ-සෘජුවූ දෘෂ්ටිය, ඇදනැති ලබ්ධිය.

**උජුපටිපන්නක**. පු-සෘජුවූ මාර්ගයට පිළිපන්, යහපත් ජීවිතයක් ගතකරණ, "උජුපටිපන්නො භගවතො සාවක සඞ්ඝො."

**උජුමග්ග**. පු-සෘජුවූ මාර්ගය, ඇද නැති පාර, "උජුකො නාම සො මග්ගො අභයා නාම සා දිසා."

**උජුමද්දව**. න-සෘජු ශීලය හා මුදුබව. "උජු මද්දවෙන න ජහාගතිං ගන්තබ්බං"

**උජුභාව**. පු-සෘජු භාවය, ඇද නැති ගතිය, අවඞක භාවය.

**උජුභූත**. ති-සෘජුභාවයට පැමිණි, අවඞක වූ. ඇදනැති.

**උජුවංස**. පු-සෘජුවංශය, නියමවංශය.

**උජුවාත**. පු-මෘදුවූ වාතය, මොලොක් වාතය.

**උජුවිපච්චනීක**. පු-එකිනෙකට විරුඬ, කෙලින්ම විරුඬබව.

**උජුවිපච්චනීකවාද**. පු-එකිනෙකට විරුඬ වූ වාදය.

**උජ්ජ**. -d. චු. බලපාණනෙසු, බලපෑමෙහි, උජ්ජෙති, බලපවත්වයි.

**උජ්ජග්ඝති**. ක්‍රි-(උ + ජග්ඝ. d. භූ. හසනෙ, සිනාසීමෙහි + ති) සිනාසෙයි.

**උජ්ජඞ්ගල**. ති-ඉතා තද බිම, විෂමභූමිය.

**උජ්ජග්ඝිකා**. පු-මහසිනා ඇතිව, මහ සිනාව, හඬනගා සිනාසීම.

**උජ්ජල**. ති-බැබලීම, දීප්තිමත්.

**උජ්ජලති**. ක්‍රි-(d. භූ. උ + ජල, දිත්තියං, දීප්තියෙහි + ති) දිලිසෙයි බබලයි.

**උජ්ජලන**. න-දැල්වීම, පහන් දැල්වීම.

**උජ්ජව**. ති-දිවීම, ධාවනය.

**උජ්ජයනී**. ඉ-අවන්ති පුරය, උදෙනි නගරය, වික්‍රමාදිත්‍ය රජුගේ නගරය.

**උජ්ජවති**. ක්‍රි-(උ + ජු. d. භූ. ජවෙ, දිවීමෙහි + ති) දුවයි, ධාවනය කරයි.

**උජ්ජවනිකාය**. ති-උඩට දුවන, ඉදිරියට දුවන.

**උජ්ජහති**. ක්‍රි-(උ + හා. d. චාගෙ, අත්හැරී මෙහි + ති) අත්හරියි.

**උජ්ජලිංසු**. ක්‍රි-(උ + ජල d. භූ. දීප්තියං, දිලිසී මෙහි + සු) ඇවිලගත්හ, දිලිසුනාහ.

**උජ්ජාලන**. න-බැබලීම, දිලිසීම.

**උජ්ජෙනි**. ඉ-උදෙනි නුවර. "ගච්ඡ භණෙ ජීවක, **උජ්ජෙනිං** ගන්ත්වා රාජානං පජ්ජෝ-තනන්ති තිච්ඡාපෙහි."

**උජ්ජෝත**. පු-ආලොකය, එළිය.

**උජ්ජෝතන**. න-ආලොක කිරීම, එළිය කිරීම.

**උජ්ජෝතිත**. ති-ආලොක කරණ ලද, එළිය කරණ ලද.

**උජ්ජෝති**. ක්‍රි-(උ + ජුත d. භූ. දිත්තියං, බැබලීමෙහි + ති) බබලයි.

**උජ්ඣ**. -d. භූ. උජ්ඣනෙ, ඉවතලීමෙහි, උජ්ඣති, ඉවතලයි.

**උජ්ඣති**. ක්‍රි-(උජ්ඣ d භූ. උස්සග්ගෙ, ඉවතලීමෙහි + ති) උජ්ඣති, ඉවතලයි.

**උජ්ඣග්ඝිකා**. ඉ-ශබ්ද නගා සිනාසීම, මහ සිනාව.

**උජ්ඣත්ති**. ඉ-නො සතුටු වීම, අසතුටු වීම, අසන්තුෂ්ටිය.

**උජ්ඣාන**. න-(උ + ඣෙ + යු=අන) අවඥකිරීම, නින්ද කිරීම.

**උජ්ඣානසඤ්ඤී**. -අවඥ කිරීම් ඇති, නින්ද කිරීම් ඇති, කිපුණුසිත් ඇති

**උජ්ඣාපන**. න-දූත්වීම, හැඟවීම, විඤ්ඤපනය.

**උජ්ඣාපනක**. පු-අවඥ කරන්නා, නින්ද කරන්නා, අවමන් බස් බෙණෙන.

**උජ්ඣාපෙති**. ක්‍රි-(උජ්ඣ d. භූ. උස්සග්ගෙ, හැරීමෙහි + ණප + ති) නින්දකෙරෙයි, අවමන් බස් බෙණෙයි.

**උජ්ඣායති**. ක්‍රි-(උජ්ඣ d. භූ. උස්සග්ගෙ. හැරීමෙහි + ති) නින්ද කරයි, අවමන් කරයි.

**උජ්ඣායන**. න-අවඥ කිරීම, පහත් කොට සිතීම.

**උජ්ඣාපයති**. ක්‍රි-(උජ්ඣ d. භූ. උස්සග්ගෙ, හැරීමෙහි + ණාපය + ති) නින්ද කරවයි, අවමන් කරවයි.

**උජ්ඣිත**. ති-උදුරාදමන ලද, උපුටන ලද, තැන් තැන්වල දැමූ, "අද්දස සත්ථා නි තහිං තහිං **උජ්ඣිතානි**."

**උඤ්ඡ**. ·d භූ. උඤ්ඡනෙ, සිඟීමෙහි, ඇවිලීමෙහි, උඤ්ඡති, සිඟයි.

**උඤ්ඡති**. ක්‍රි-(d භූ. උඤ්ඡ, උඤ්ඡනෙ, සිඟීමෙහි + ති) සිඟයි, ඉල්වයි, පිඬු සිඟයි. "පිණ්ඩපාතං **උඤ්ඡති**."

**උඤ්ඡන**. න-දුක, හිරිහැරය, පීඩාව, ඉල්ලීම.

**උඤ්ඡා**. ඉ-සිඟීම, ඉල්වීම.

**උඤ්ඡාචරිය**. පු-භික්ෂාචරණය, පිඬු පිණිස හැසිරීම.

**උඤ්ඡාචරියක**. පු-පිඬුපිණිස හැසිරෙන්නා, භික්ෂාචරකයා.

**උඤ්ඡාපත්ත**. පු-පිඬු පිණිස ගෙණයන පාත්‍රය.

**උඤ්ඤා**. ඉ-නින්දව, පරිභවය, අවමන් කිරීම, "**උඤ්ඤාතාති** අවඤ්ඤාය".

**උඤ්ඤාතබ්බ**. ති-නින්ද කටයුතු, හෙලාදක්ක යුතු

**උඤ්ඤාත**. ති (උ + ඤා + ත) පහත් කොට සැලකූ, අවමන් කළ

**උට්ඨපන**. න-එසවීම, ඔසවීම, නැගිටවීම, කෙලින් තැබීම.

**උට්ඨවචිත්තක**. පු-උට්ඨව, උට්ඨව, චිත්තක, චිත්තක යයි මෙම අනුකරණ ශබ්ද කරණ පක්ෂි විශෙෂයක්

**උට්ඨහති**. ක්‍රි-(උ + ඨා, d. භූ. තිට්ඨෙ, සිටීමෙහි + ති) නැගිටියි.

**උට්ඨහන**. න-නැගී සිටීම, නැගිට සිටීම.

**උට්ඨාන**. න-(උ + ඨා + යු=අන) නැගී සිටීම, කුසීත භාවයෙන් නැගී සිටීම.

**උට්ඨානක**. පු-(අලස භාවයෙන්) නැගී සිටින්නා.

**උට්ඨාපන**. න-නැගිටුවීම, ඔසවීම.

**උට්ඨාපක**. පු-නැගිටුවන්නා, ඔසවන්නා.

**උට්ඨාන විරිය.** න-නැගී සිටින වීය්‍ය්‍ය, උට්ඨාන වීය්‍ය්‍ය.

**උට්ඨාන සඤ්ඤා.** ඉ-නැගී සිටීමේ සංඥුව = සිහිය.

**උට්ඨානාධිගත.** ති (උට්ඨාන + අධිගත) වීය්‍ය්‍යයෙන් පැමිණෙන ලද.

**උට්ඨාන ගාමිනී.** ඉ-සුදුසු පිළිවෙත් පිරීමෙන් නැගී සිටින ඇවත.

**උට්ඨාපෙති.** ක්‍රි-(උ + ඨා. d චු. තිට්ඨෙ සිටීමෙහි + ණෙ + ති) නැගිටුවයි. නගා සිටුවයි.

**උට්ඨාය.** පු. ක්‍රි-(උ + ඨා + ත්වා=ය) නැගිට, පටන් ගත් වීය්‍ය්‍ය ඇති.

**උට්ඨායක.** ති-උට්ඨාන වීය්‍ය්‍ය ඇත්තා, උපස්ථාන කරන්නා.

**උට්ඨාසික.** ති-උට්ඨාන වීය්‍ය්‍ය සම්පන්නයා, වීය්‍ය්‍ය ඇත්තා.

**උට්ඨාසී.** ක්‍රි-(ව + ඨා. d. භා ක. තිට්ඨෙ, සිටීමෙහි + ඊ.) නැගී සිටියේය.

**උට්ඨාති.** ක්‍රි-(උ + ඨා d. භූ තිට්ඨෙ, සිටීමෙහි + ති) නැගී සිටී.

**උට්ඨාහක.** ති-නැගී සිටින්නා, උට්ඨාන වීය්‍ය්‍ය ඇත්තා.

**උට්ඨිත.** ති-නැගී සිටින ලද, නැගිටිනලද.

**උට්ඨිතජඞ්ඝ.** පු-උඩට නෙරා තිබෙන කෙණ්ඩා ඇත්තා.

**උඨ.** d. භූ. තාලනෙ, තැලීමෙහි, ඔඨ්ති, තළයි.

**උඨ.** d. භූ. උපඝාතෙ, දෙසීමෙහි, ඔඨ්ති, තසයි.

**උඨ්ති.** ක්‍රි-(උඨ d භූ. උපඝාතෙ, තැසීමෙහි + ති) තසයි.

**උඩ්ඩහන.** න-දැවීම, ගිනිදීම.

**උඩ්ඩහති.** ක්‍රි-(උ + දහ. d. භූ. භස්මීකරණෙ. පතිට්ඨාය, අළු කිරීමෙහි + ති) (දවා) අළු කරයි.

**උඩ්ඩහන.** න-දවා අළු කිරීම.

**උඩ්ඩාපෙතුං.** ති-එලවන්නට, පලවා හරින්නට.

**උඩ්ඩිත.** ති-උල්ලඞ්ඝනය කළ, පැනයන ලද.

**උඩ්ඩීයන.** න-පැනයෑම, පලායෑම.

**උඩ්ඩීය මාන.** පු-පැනයනු ලබන. පලායනු ලබන.

**උඩ්ඩෙති.** ක්‍රි-(උ + ඩී. d. චු. වෙහාසගමනෙ අහසින් යාමෙහි + ණෙ + ති) (අහසින්) පියාසර කරයි. ඉගිලෙයි.

**උඩ්ඩෙත්වා.** පු. ක්‍රි-රඳවා, උඩ රඳවා, "සිකතාය පත්තං උඩ්ඩෙත්වා දණ්ඩ ආලග්ගිත්වා"

**උඩු.** පු-තාරකා, තරු, නක්ෂත්‍ර.

**උඩුචක්ක.** න-තාරකා චක්‍රය.

**උඩුප.** න-පසුර. "ජලවෙගෙන වුය්හමානං උඩුපෙනා ගච්ඡන්තං තං" නදී ආදියකින් එතෙර වීමට තනන පහුරු ඔරු ආදිය, කුඩා නැව, චන්ද්‍රයා.

**උඩුපති.** පු-තාරකාවන්ගේ ස්වාමියා, චන්ද්‍රයා

**උඩුපථ.** න-තාරකාවන්ගේ මාර්ගය, අහස. තරුමග.

**උඩුරාජ.** පු-තාරකාවන්ගේ රජු, චන්ද්‍රයා.

**උණ්ණජ.** පු-වටකුරුව ඇති වූ, රවුමට උපන් රොමය.

**උණ්ණත.** න ස්වර්ණාදියෙන් කළ තළල් පළඳනාවක්, උසස් දෙය.

**උණ්ණත.** ති-රන් රිදී ආදියෙන් කළ.

**උණ්ණති.** ඉ-මාන්නය, උණ්ණතිය.

**උණ්ණමති.** ක්‍රි-(උ + නම. d. භූ. නමෙ, නැමීමෙහි + ති) උඩට නමයි.

**උණ්ණම.** පු-මෘදුකම, උසස් කම, උඩගු කම.

**උණ්ණමන** න.-පහකට නැමීම, පාතට එබීම. "ඔනමණුන්නමන පකතිකං සක්කස්ස දෙව රඤ්ඤෙ, පණ්ඩු කම්බල සිලාසනං උණ්හාකාරං දස්සෙසි."

**උණ්ණා.** න-ලොම, එළකලොමාදිය.

**උණ්ණා** ඉ-ඌර්ණරොමය, බොධිසත්වවරයන්ගේ දෙබැම අතර වමතට කරකැවීහි හිටි සුදු පැහැති රොමය, "භමුකන්තරෙජාතා උණ්ණා ඕදාතා" එළකාදීන්ගේ රොම, ලොම් බිස්ස.

**උණ්ණානාභි.** පු-පිහිටි නැබ ඇත්තා, මකුළුවා, "උණ්ණානාභි සරභූ මූසිකා කතා මෙ රක්ඛා කතා මෙ පරිත්තා"

**උණ්ණාභිසි.** ඉ-එළු ලොමින් කළ පාපිස්ස, මෙට්ට.

**උණ්ණාමය.** පු-එළු ලොමින් කළ, එළු ලොමින් සාදනලද.

**උණ්ණායු.** පු-(පොර ගසන) එළුවා, කම්බිලිය, කෂණහඩිගුරය.

**උණ්ණාලොම.** න-එළු ලොම්. උණු ලොම්.

**උණ්ණාපාවාරක.** න-දෙපස ලොම් නගාකළ පොරොනය, කොඳු පලස්.

**උණ්ණි.** ඉ-ලොම ඇඳුමක්, ලොම් ඇඳුම් විශෙෂයක්.

**උණ්ණිණ්ණණ්ඩ.** න-ඉන්නන්, සම්කොඩොලන්.

**උණ්හරංසි.** පු-උණු රැස් ඇත්තා, හිරු.

**උණ්හසමය.** පු-උෂ්ණ කාලය, උෂ්ණ ඍතුව.

**උණ්හාකාර.** පු-උණුසුම් අයුරක්, උෂ්ණාකාරයක්. “සක්කස්ස පණ්ඩුකම්බල සිලාසනං උණ්හාකාරං දස්සෙසි”

**උණ්හ.** න-උණු, රත්වූ, ග්‍රීෂ්මය.

**උණ්හකාල.** පු උණ්හ සමය බලනු.

**උණ්හකලල** පු-දිලිසෙන ගිනි අගුර, ගිනි අළු

**උණ්හවස්ස.** න-උණු අළු වැස්ස,

**උණ්හත්ත.** න-උණුසුම් ගතිය, උෂ්ණ සවභාවය.

**උණ්හී.** ඉ-උෂ්ණික් නම් අකුරු සතකින් යුත් ඡන්දස.

**උණ්හීස.** පු-තලල්පටය, හිස්වෙළුම, ඔටුන්න, හිණිමං මුදුන.

**උණ්හීසසීස.** පු-තලල්පට හිස් වෙළුම් ආදි-යෙන් අලඞ්කාරකළ හිස, ඔටුනු පලන් හිස.

**උණ්හෝදක.** න-උණුවතුර, රත්කළ වතුර, උණුසුම් ජලය. “**උණ්හෝදකෙන** අතෙථ සති උණ්හෝදකං පටියාදෙති.”

**උණාදිකප්ප.** පු-උණාදි ප්‍රත්‍යයයන්ගේ විධානය උණාදි කප්පනම් වේ. විධියට ‘කල්ප’ යයි කියනු ලැබේ.

**උතු.** ඉ. පු-ඍතුව, ඔසප් = මල්වරවීම. උතුම්.

**උතු ආහාර.** පු-ඍතු ආහාරය.

**උතුක.** පු-ඍතුවට අයිති.

**උතුකාල.** පු-ඍතු කාල , මල්වරවීමේ කාලය.

**උතුජ.** ති-ඍතුවෙන් ඇතිවූ = උපන්. යාග කරන්නා.

**උතුනිබ්බත්ත.** ති-ඍතුවෙන් උපන්.

**උතුණී.** ඉ-කිලි ඇත්තී, මල්වරවී සිටින්නී, ඔසප් වූ තැනැත්තී.

**උතුපමාණ.** න-ඍතු මැනීම, ඍතු ප්‍රමාණය.

**උතුපරිනාම.** න-ඍතුන්ගේ පෙරලීම.

**උතුපරිනාමජ.** ති-ඍතුන්ගේ පෙරලීමෙන් හටගත්, “**උතුපරිනාමජා** ආබාධා.”

**උතුපරිස්සය.** න-ඍතු පීඩාව, ශීතොෂ්ණාදි ඍතු නිසා හටගන්නා පීඩාවන්.

**උතුපුබ්බ.** පු-එක එක ඍතුවක් පටන් ගැණීමේදී පවත්වන උත්සවය.

**උතුමතී.** ඉ-ඍතු ඇත්තී, ඔසප්වූ තැනැත්තී.

**උතු ආචික්ඛන.** න-ඍතුව කීම.

**උතුවාර.** පු-ඍතු සමය.

**උතුවිකාර.** පු-ඍතු වෙනස්වීම, ඍතුවිකාරය.

**උතුවෙරමණී.** ඉ-ඍතුන්ගෙන් වෙන්වීම, ඔසප් කාලයෙන් වෙන්වීම.

**උතුසංවච්ඡර** පු-ඍතු සංවත්සරය, ඍතු චක්‍රය.

**උතුසප්පාය.** පු-ඍතු සත්ප්‍රාය, ඍතුන්ට සෑහෙන.

**උතුසමය.** ඍතු කාලය, ඔසප් කාලය.

**උතුවස්ස.** න-හෙමන්න හා ග්‍රීෂ්ම ඍතු.

**උතුරාජ.** පු-වසන්න ඍතුව.

**උතුමඞ්ග.** පු-ඍතුමාගී, ස්ත්‍රීලිඞ්ගය.

**උතුපච්චය.** න-උතුසමුට්ඨානික රූපයන්ගේ පැවතීමට හා විනාශයට ප්‍රත්‍යය වීම.

**උතුසමුට්ඨාන** න ඍතුන් ප්‍රත්‍යයවී නිපන්, ඍතුජ රූපය.

**උත්ත.** ති-කර්මාදි ෂට් කාරකයන්ගේ උක්ත භාවය, උක්තය.

**උත්තණ්ඩුල.** න-හාල්, නොඉදුනු එම බත. “මොකඛං **උත්තණ්ඩුලං** ජාතං”

(6089)

උත්තත්ත. න-වැල්ගිරුම, වියලි මස්, වියලි මුව ගොනාදි මස්, අධිකව වියලන ලද්ද.

උත්තංස පු-මුදුන් මල්කඩ, කණාභරණය, ධවජය.

උත්තංසමාලා. ඉ-හිසේ දමන මල් මාලාව.

උත්තණ්ඩාල. ති-ධාන්‍ය බහුල, වී බහුල (කෑඳ).

උත්තත්ත පු-ත්‍රස්තවූ. බියපත් වූ.

උත්තම. උතුම්, ශ්‍රෙෂ්ඨ.

උත්තමඞ්ග. න-උත්තමාඞ්ගය, හිස, ස්ත්‍රී පුරුෂ නිමිති.

උත්තමඞ්ගරුහ. පු-ශීර්ෂයෙහි හටගත් දෙය, හිසකේ.

උත්තමත්ථ. පු-උත්තමාර්ථය, අර්හත්වය.

උත්තමාධම පු-(උත්තම + අධම).

උත්තමගුණ. පු-උසස් ගුණය, ශ්‍රෙෂ්ඨ ගුණය.

උත්තමපුරිස. පු-ශ්‍රෙෂ්ඨ පුරුෂයා. උසස් පුරුෂයා, ආඛ්‍යාතයෙහි අමහ ශබ්දයෙන් කියවෙන පුරුෂය, උත්තම පුරිස නම්.

උත්තමපොරිස. මහා පුරුෂයා.

උත්තමභාව. පු-උසස්ම තත්වය, ශ්‍රෙෂ්ඨ ස්වභාව.

උත්තමතා. ඉ-ශ්‍රෙෂ්ඨත්වය, උසස් බව, ක්‍රම යෙන් ඉහල නගින ස්වභාව.

උත්තමවාරි. ඉ-උතුම් ජලය, සහල් දෙවුම් දිය.

උත්තමා. ඉ-උතුම් ස්ත්‍රිය, ශ්‍රෙෂ්ඨ ස්ත්‍රිය.

උත්තර. පු-ප්‍රතිවචන, උතුරු සළුව, උතුරු දිශාවට අයත්.

උත්තර. ති-ශ්‍රෙෂ්ඨ, උත්තර දිශාව, පශ්චිම, චතු භාගය.

උත්තරනුත්තර. පු-(උත්තර + අනුත්තර) ශ්‍රෙෂ්ඨයෙක් නැති.

උත්තරත්ථරණ. න-ඌර්ධව භාගය වසන දෙය, උත්තරාස්ථරණය.

උත්තරඅභිමුඛ. පු-උතුරු දෙසට අභිමුඛව.

උත්තරකාල. පු-අනාගත කාලය, මතු කාලය.

උත්තරකුරු. පු-උතුරුකුරු දිවයින.

උත්තර උල්ලපන. න-(උ + ලප + යු = අන) උතුරු මිතිස් දම් පවසන.

උත්තර කොසල. පු-අයොධ්‍ය නගරය, උතුරු කොසොල් රට.

උත්තරච්ඡ. න-උඩුවියන.

උත්තරච්ඡද. පු-පොරොණය, උඩුවියන.

උත්තරච්ඡදන. න-පෙරවීම.

උත්තරද්වාර. න-උතුරු දොරටුව.

උත්තර ධම්ම. පු-උසස් ධර්මය, ශ්‍රෙෂ්ඨ ධර්මය.

උත්තර පට පු-උතුරු සළුව, උත්තරාසඞ්ගය.

උත්තර පථ. පු-උතුරු දිග.

උත්තර පාසක. න-දොරේ උඩ අගුල, උඩලිපත.

උත්තර පුබ්බ. පු-ඉසාන දිග.

උත්තරසස. පු-අනිද්ද.

උත්තර සාටක. න-උතුරු සළුව.

උත්තරාසඞ්ග. පු-(උත්තර + ආසඞ්ග) උතුරු පැත්ත වැසීම, උතුරු සළුව.

උත්තරොට්ඨ. න-උතුරු තොල, උඩු තොල.

උත්තර. ති-එතර වීම, ජලාශයකින් එගොඩ වීම.

උත්තරණ. න-එතර වීම, එගොඩට යාම.

උත්තරණී. ඉ-නැව, පසුර, ඔරුපාරු ආදිය.

උත්තරති. ක්‍රි-(උ + තර. d. භූ. තරණෙ, එතර වීමෙහි + ති) එතර වෙයි.

උත්තර පුබ්බංස න-උතුරු කොටස, උතුරු අඩ කොටස.

උත්තර පද. න-සමාස පදයන්හි අගින් සිටින පදය.

උත්තර සුවෙ. (සෙව) අ-මතු හෙට, අනිද්ද, තුන්වෙනි දින.

උත්තර දායක. පු-උත්තර දෙන්නා, පිළිතුරු දෙන්නා.

උත්තර වාක්‍යට්ඨ. පු-වාක්‍යයක අග සිටින්නේ උත්තරවාක්‍යට්ඨ නම්, ය ශබ්දයට නමකි.

**උත්තර විපරීත.** පු-උත්තරයට විරුද්ධ.

**උත්තරා.** ඉ-උතුරු දිසාව, උත්තර දිශාව.

**උත්තරාධර.** න උඩුතොල, උස් පහත්.

**උත්තරාපථ.** න උත්තරා පථය.

**උත්තරායන** න-හිරු උතුරෙන් ගමන් කිරීම, ශිශිරාදි ඍතු, නවම් ආදි සමස.

**උත්තරාසඞ්ග.** න-වස්ත්‍රය, උතුරු සළුව, තනිපට සිවුර.

**උත්තරිං** අ-මතුයෙහි, ඊට අනතුරුව.

**උත්තරිත.** ති-එතෙර වන ලද, එගොඩ වූ.

**උත්තරි මනුස්ස.** පු-මනුෂ්‍යත්වය ඉක්මවූ, මනුෂ්‍ය බලයට වැඩිවූ.

**උත්තරි මනුස්ස ධම්ම.** පු-මනුෂ්‍ය ධර්මයෙන් උසස්ව පවත්නා ධ්‍යාන සමාපත්ති මාර්ග ඵලාදි ධර්ම.

**උත්තරි කරණීය.** පු-මතුමත්තෙහි කටයුතු.

**උත්තරි භඞ්ග.** පු-කැවිලි වර්ගයක්.

**උත්තරි සාටක.** පු-උත්තර සාටකය, උතුරු සළුව.

**උත්තරීක.** ති-ශ්‍රෙෂ්ඨ, උසස්.

**උත්තරී** ඉ-උතුරු දිශාව.

**උත්තරීතර.** පු-(උත්තර+ඉතර) මීට වඩා උසස් කෙනෙක් නැති, ශ්‍රෙෂ්ඨ, උසස්.

**උත්තරිය.** න-උතුරු සළුව, උතුරට අයත්.

**උත්තරුත්තර.** අතිශයින් උතුම්, වැඩියක්.

**උත්තරොත්තර.** ශ්‍රෙෂ්ඨ, අතිශයින් උතුම්.

**උත්තසති.** ක්‍රි-(උ+තස d. භූ. උබ්බෙගෙ, බියපත් වීමෙහි+ති) තැති ගනී.

**උත්තසන.** න-තැතිගැණීම, ත්‍රස්ත වීම.

**උත්තස්ත.** ති-තැතිගත්, ත්‍රස්ත වන ලද.

**උත්තසිත.** ති-තැතිගන්නා ලද, ත්‍රස්ත වන ලද.

**උත්‍රස්ත.** ති-තැතිගත්, ත්‍රස්ත වන ලද.

**උත්‍රස්ත චිත්ත** ති-තැතිගත් සිත් ඇති, ත්‍රස්තාවත ලද සිත් ඇති.

**උත්තා.** ඉ-උක්තා නම් ඡන්දස, එක අකුරක් ඇති ඡන්දස.

**උත්තාන.** ති-තොගැඹුරු, උඩුරු, උඩුබැලි.

**උත්තානක.** පු-උඩුකුරු වූ.

**උත්තාන මුඛ.** පු-පැහැදිලි මුඛයක් ඇති, පහසුවෙන් අවබොධ කළ හැකි.

**උත්තාන සයන.** න-උඩුකුරු සනයක් ඇති.

**උත්තානසෙය්‍යක.** පු-උඩුකුරුව සයනය කරන්නා=උඩබලා හෝනා ළදරුවා, උඩුබැලි සයනය ඇත්තා.

**උත්තානත්ථ.** න-පැහැදිලි අරුත් ඇති, ප්‍රකට අර්ථ ඇති.

**උත්තාපන.** න-තැවීම, රත් කිරීම.

**උත්තාපිත.** ති-තවන ලද, රත් කරණ ලද, රත්කළ.

**උත්තාපෙති.** ක්‍රි-(උ+තප. d. භූ. සන්තාපෙ, තැවීමෙහි+ති) තවයි.

**උත්තානිකම්ම.** න-කර්මය ප්‍රකට කිරීම-පැහැදිලි කිරීම.

**උත්තානී.** ඉ-අප්‍රකට වූවක් ප්‍රකට කිරීම, පැහැදිලි කිරීම.

**උත්තානී කරණ.** න-උඩුකුරු කිරීම, විවරණ විභජනයන්ගෙන් දක්වන ලද්ද, උපමා දැක්වීමෙන් ප්‍රකට කොට දැක්වීම.

**උත්තාරණ.** න-එතෙර වීම, එගොඩ වීම.

**උත්තාරිත.** ති-එතර වන ලද, එගොඩ වූ.

**උත්තාරෙති.** ක්‍රි-(උ+තර. d. භූ. තරණසම්ං, එතරවීමෙහි+ණෙ+ති) එතෙර කෙරෙයි.

**උත්තාස.** පු-(උ+තස+ණ) උත්‍රාසය, තැතිය.

**උත්තාසන.** න-තැතිගැන්ම.

**උත්තාසිත.** ති-අමුණන ලද, නගන ලද, තැතිගන්වන ලද, ත්‍රාස කළ.

**උත්තාසිතත්ත.** පු-ත්‍රාස සවභාවය, තැති ගැන්වූ බව.

**උත්තාසෙති.** ක්‍රි-(උ+තස d. භූ. උබ්බෙගෙ, බියපත් වීමෙහි+ණෙ+ති) බිය ගන්වයි, තැති ගන්වයි.

**උත්‍රාස**. පු-භය, නැතිගැණීම, මහත් භය.

**උත්තිට්ඨ**. න-පිඬු සිඟා ලත් අහර, ඉඳුල් අහර.

**උත්තිට්ඨ**. ක්‍රි-(උ+ඨා ඨා ධාතුවට තිට්ඨ ආදෙශ වීමෙන්) නැගී සිටුව.

**උත්තිට්ඨති**. ක්‍රි (උ+ඨා. d. භූ. ගතිනිවුත්තියං, ගමන් වැල කිමෙහි නොහොත් සිටීමෙහි+ති) නැගී සිටියි.

**උත්තිණ** න-පිදුරු අස් කිරීම.

**උත්තිණ්ණ**. ති-(උ+තර+ත=ඉණ්ණ) එතෙර වන ලද, එගොඩ වත ලද. "උත්තිණ්ණං තං අසුසූතරං ගොපාලිකං පස්සිත්වා එතදවොච."

**උත්තුඞ්ග**. ති-උස්, වඩා උස.

**උත්තෙජිත**. ති-තියුණු කරණ ලද, යවන ලද.

**උද**. අ-පරිවිතක් අපි ශබ්දාර්ථ, පශ්චාත්තර, නොහොත් යන මෙහි.

**උද**. භූ-මොදෙ කී ලායක්‍ෂව සතුටුවීමෙහි, ක්‍රීඩාවෙහි, උදති=සතුටුවෙයි, කෙළියි.

**උද**. න-ජලය, දිය.

**උදක**. න-ජලය, දිය.

**උදකචජ**. පු-දිය කිස්ස.

**උදක ඵුසිත**. පු-දිය බිඳු, ජල බිඳු

**උදකණ්ණව** පු-ජල ගැල්ම.

**උදක නිද්ධමන**. න-දිය කාණුව, දිය සොරොච්ච

**උදක ධාරා**. ඉ-ජලධාරාව.

**උදක මණි**. න-දිය සැලිය, "පැන් තලිය, මැණික් වණ් ජලය පිරුන බඳුන."

**උදක මල්ලක**. න-දිය සැලිය.

**උදක මෙහ**. න-දියවැඩියා රොගය, බහුමූත්‍ර රොගය.

**උදක සාලක**. පු-සල් රුක්වලින් පතිත වූ ජලය.

**උදක කලහ**. පු ජලය පිළිබඳ කොළාහලය.

**උදක කාක** පු-දිය කාක්කා

**උදක කිච්ච**. පු-ජල කෘත්‍යය, දිය නෑම්, සේදීම් ආදි දේ.

**උදක කීලා**. ඉ-දියකෙළිය, ජලක්‍රීඩාව.

**උදකායතික**. පු-ජල නලය, වතුර පයිප්පය.

**උදකූපම**. පු-ජලයට උපමා කිරීම, උදකොපමාව.

**උදකාලය**. න-ජලස්ථානය, ගං හෝ ආදි ජල පිහිටි තැන්.

**උදකොස** පු-(ජල) සැඩපහර.

**උදක ගහන සාටක**. න-දිය ඇඳුම, ජල-සාටකය, නාන ඇඳුම.

**උදක තෙලක** පු-ජලය හා එකතුකල තෙල් මිශ්‍රණයක්.

**උදක දන්තපොණ**. පු-මුඛය හා දත් පිරිසිදු කරණ ජලය.

**උදක දහ**. පු-විල, තඩාගය.

**උදක දෙණිකා**. ඉ-වතුර බාල්දිය.

**උදක නිබ්බාහන**. න-දියෙන් (ග්‍රීෂ්මය) නිවීම.

**උදක පුඤ්ජනී**. ඉ-සනානය කොට ඇගේ ජලය පිසදමන රෙදි කඩ, තුවාය.

**උදක පොසිත** ති-ජලයෙන් පොෂිත, දියෙන් පොෂණය කල.

**උදක බින්දු** පු-ජල බින්දුව.

**උදක බුබ්බුල**. පු-දිය බුබුල.

**උදක භක්ඛ**. පු-දිය රහිත, වතුර නැති.

**උදක රක්ඛස**. පු-දිය රකුසා, ජලයට අරක්-ගත් රාක්‍ෂයා,

**උදක රුහ**. න-දිය පැලෑටිය.

**උදක ලෙඛා**. ඉ-දියෙහි ලිවීම, ජල රෙඛාව.

**උදක වාර**. පු-දිය වාරය, කලින් කල වතුර ඇද දීමට පැමිණෙන වාරය, කාලි යක්‍ෂනියට මෙබඳු උදක වාරයක් තිබුනු බව ධම්මපදට්ඨ කථාවෙහි පෙනේ.

**උදකචාරක.** පු-බාල්දිය, පනිට්ටුව, කාලය, ජලය ගෙණ එන දෙය.

**උදකචාහ.** පු-වතුර බැස යාම.

**උදක වාහක.** පු-ජල ගැල්ම, ජල ප්‍රවාහය.

**උදක වාහන.** න-ජලය අදින රථය.

**උදක සද්ද.** පු-ජල ශබ්දය, දිය හඬ.

**උදකකලස.** න-දිය කලය, දිය කොතලය.

**උදකසරාවක.** න-ජලගන්නා හැන්ද, දිය සැන්ද.

**උදකසුද්ධික.** පු-(මූත්‍ර කළපසු) වතුරෙන් සේදීම.

**උදකී.** ඉ-ඔසප් වූ තැනැත්තී, මල්වර වූ තැනැත්තී.

**උදකකාක.** පු-දියකාවා.

**උදකුම්භ.** පු-දිය කලය, දිය සැළිය, ඔබරාව.

**උදකුක්ඛෙප සීමා.** ඉ-විනය කර්මයකට සුදුසු ජලාශයකට පැමිණි භික්ෂු සංඝයා විසින් ජලය හාත්පස ඉස ඒ වේලාවට පමණක් කරණු ලබන සීමාව.

**උදකොගාහන.** න-දියට පැනීම, ජලයට ප්‍රවිෂ්ටවීම.

**උදකොරොහණ.** පු-වතුරට බැසීම, නෑම.

**උදකොරොහන.** න-ජලයට පැනීම, ජලස්-නානය.

**උදකොදර.** පු-(උදක + උදර) දිය උදරය, දියබඩ.

**උදග්ග.** ති-ඔදවැඩිප්‍රීතිය, උස්දෙය, ''උදග්ගොති පීතිවසෙන අබ්භුග්ගත කාය චිතෙතා''.

**උදග්ගතා.** ඉ-ඔදවැඩිබව.

**උදග්ගුදග්ග.** පු-(උදග්ග + උදග්ග) ශරීරිය විකාර භාවයට හා උසස් බවට පමුණුවන ප්‍රීතිය.

**උදඞ්ගන.** න-දිය ලබා ගැණීම සඳහා සාරන තැන, අවකාශ ස්ථානය.

**උදච්ඡිද.** ක්‍රි-(උ + ඡිදි. d භූ. ඡෙදනෙ, සිඳීමෙහි + ආ) සින්දේය.

**උදඤ්චන.** න-දිය ඇදීම, ජලය උඩට ඇදීම, සැන්ද, ''චාටියා උදඤ්චන භාවපපත්ති විය හොති''

**උදඤ්චනී.** ඉ-දියගන්නා කුඩා බඳුන, කිතිස්ස.

**උදඤ්ජල.** න-උල් හෙල්වූ තැන, ජලසීරාව සහිත ඉඩම.

**උදඤ්ඤවන්තක.** පු-ජලයෙන් පොහොසත්, උදකසම්පන්න.

**උදණ්හ.** පු-අළුයම, ඉරපායන වේලාව.

**උදතාරී.** ක්‍රි-(උද + තර. d. භූ. තරණෙ, එතෙරවීමෙහි + ඊ) තරණය කෙළේය.

**උදත්ත.** ති-උස්වූ, මෑදුවූ.

**උදනන.** පු-ආරක්ඛිය, අප්‍රත්‍යක්ෂය.

**උදත්ථ.** පු-(උද + අත්ථ) මහාප්‍රඥව, මහ නුවණ.

**උදධි.** පු-ජලය දරණ ස්ථානය, සමුද්‍රය ''උදකං ධාරෙතීති උදධි''. උදකං එත්ථ ධීයතීති උදධි.

**උදධිඛෙළ.** න-මුහුදු පෙණ, සාගරයේ ඇති පෙණ.

**උදධිසුත.** පු-චන්ද්‍රයා, ලක්ෂ්මිය.

**උදධිමල.** න-මුහුදු පෙන, සමුද්‍රයෙහිවූ පෙණ.

**උදපත්ත.** පු-දියබඳුන, ජලපාත්‍රය.

**උදපාදි.** ක්‍රි-(උ + පද, d. දි. ගතියං, යෑමෙහි + ඊ) පහළ විය.

**උදපාත.** පු-ළිඳ, කූපය, ළිඳ සමීපයෙහි සාරණලද කුඩා වල.

**උදපත්ත.** න-දිය බඳුන, වතුර භාජනය, ජල පාත්‍රය, ''ආදාසෙවා උදපත්තෙවා ඔලොකෙන්තස්ස දුක්කටං''.

**උදපාන.** න-ළිඳ, පැන්වල, ''උදපානො අපාරුතොහොති''.

**උදපානරජ්ජු.** න-ළිදෙන් දියගන්නා රැහැණ, කඹය.

**උදකානන්තරා.** ඉ - ජලයෙන් වන අනතුර, දශවිධ අන්තරාවන්ගෙන් එකක්.

(6270)

**උදකාධානං**. න-ජලය තබන තැන, වතුර භාජනය.

**උදකාවට්ට**. ඉ-දිය සුළිය, ජල ධාරාව.

**උදකාවාට**. පු-වතුර වල.

**උදකාසිවිස**. පු-දියේ වසන සජීයෙක්, දිය බරණා.

**උදකාල්හක** පු-දිය පත හතරක්, වතුර කෝප්ප හතරක්, ජලය මිනීමේ භාජනයක්. දියනැළිය.

**උදකුක්ඛෙප**. න-උදකොත්ක්ෂෙපය, ජලය ඉසීම, එනම් සීමාව, "යත්‍ථ එවං ඛිත්තං උදකං වා වාලිකං වා පතති, අයං උදකු-ක්ඛෙපො."

**උදකූපමා**. ඉ-දිය උපමා කොට, ජලය උපමා කොට.

**උදකූපස්සට්ඨා**. ඉ-අත පැන් වත්කොට පාවා ගත්තා බිරිඳ, "සො උදකූපස්සට්ඨං භරියං ගණ්හිත්‍වා ගච්ඡති."

**උදකොඝ**. න-ගංවතුර, වේගයෙන් ගලන ජලය, සැඩපහර.

**උදකකඤ්ජික**. න-දිය කැඳ, දිය හා කැඳ,

**උදකකටාහ**. න-කල්දේරම්, ලොකු දිය බඳුන්.

**උදක කථා**. ඉ-දිය පිළිබඳ කථා.

**උදක කන්‍දර**. පු-දියකඳුර, දියකඳුරැළිය.

**උදක කීළිකා**. ඉ-දියකෙළිය, ජලක්‍රීඩාව,

**උදක කොට්ඨක**. න-දිය කොටුව, නහන කොටුව, නාන කාමරය, "අනුජානාමි භික්ඛවෙ උදක කොට්ඨකං."

**උදකඛන්ධ**. න-ජල කඳක්, දිය කඳක්.

**උදකගණ්ඩුසක**. පු-දිය කොපුල, ජල කපොලය.

**උදකඝට** පු-වතුර කළය, දිය කළය, වතුර භාජනය.

**උදකචාටි**. ඉ-දිය සැළිය, පැන්සැල, පින්තා ලිය.

**උදක චික්ඛල්ල**. න-මඩ බහුල තැන්, දිය මඩ, මඩවගුරු, මඩ සහිත තැන්, "දෙවෙ වස්සන්තෙ උදක සඞ්ගහෙ උදක චික්ඛල්ලෙ ඔකපුණ්ණෙහි චීවරෙහි."

**උදකජල්ලිකා**. ඉ-උදක ලසිකා, දිය දූලි.

**උදකට්ඨ**. ති-දියෙහි පිහිටි, ජලයෙහි තුබූ, ජලස්ථ.

**උදකට්ඨකථා**. ඉ-දියෙහි තැබූ දේ පිළිබඳ කථාව.

**උදකට්ඨාන**. න-දිය ලබාගන්නා තැන. ජලස්ථානය.

**උදකට්ඨාන කථා**. ඉ-පැන්තොටේ දී කරණ කථා. ගැහැණුන් පැන්තොටේ දී එක එක්කෙනා ගැණ කරණ කථා.

**උදකතාරකා**. ඉ-දියෙහි දක්නා තම පිළිබිඹුව. "උදපානෙ උදකතාරකා විය දිස්සන්ති."

**උදකතිත්‍ථ**. න-නහන තැන, ළිඳලඟ, පැන් තොට.

**උදකතුම්බ** න-දියලබුව, ඔබරුව, ජලය වත්කරණ මහ සැලිය.

**උදකදෙඩ්ඩුභ**. පු-දිය බරියා, දිය නයා.

**උදකදෙණි**. න-ජලය වත්කරණ ඔරුව, දිය දෙණ.

**උදකනිද්ධමන**. න-කාණුව, වාරිමාර්ගය.

**උදකනිමිත්ත**. න-උදකනිමිත්ත, සීමා සම්මත යට අවශ්‍ය අටවැදෑරුම් නිමිති අතුරෙන් එකක්.

**උදකනිස්සොත**. න-විහිදගිය දිය, තැන්තැන් වල ඉහිරීගිය ජලය.

**උදකපච්ඡක**. න-දිය පැස.

**උදක පටිග්ගහ**. පු-දිය පිළිගන්නා බඳුන, පාත්‍ර සේදූ වතුර දමන භාජනය.

**උදකපටිච්ඡාදි**. න-දියෙන් වැසී පැවැත්ම, ජලයෙන් වැසී සිටීම, ජලයට මුවා වී සිටීම.

**උදකපට්ටන**. න-පටුණු ගම්, මුහුදු ජලාශයන් අසල වූ පටුණුගම්, කමටහන් වඩන්නට අයොග්‍ය ස්ථානයන්.

**උදකපත්ත**. න-ජලපාත්‍රය, උදක පාත්‍රය.

(6308)

**උදක පදෙස**. පු-දිය තිබෙන තැන්, ජල ප්‍රදේශය.

**උදකපනාලි**. ඉ-දිය ඔබරාව.

**උදකපප්පටක**. න-රොම් මඬ, වියලි මඩ.

**උදක පරිස්සාවන**. න-ජලය පෙරීම, වතුර පෙරීම.

**උදකපාත**. පු-දිය වැටීම, වැටෙන වැසි වතුර.

**උදකපිට්ඨ** න-ජලය මතුපිට, දිය පිට.

**උදකපුඤ්ජනචොලක**. න-තුවාය, දිය පිස්නාව.

**උදකපුඤ්ජනී**. ඉ-වතුර පිසිනා ලෑල්ල.

**උදකපුප්ඵුල**. න-දියෙහි පෙනෙන ඡායාව.

**උදකපූජා**. ඉ-දිය පූජාව, ජල පූජාව.

**උදකපුසිත**. න-දිය බිඳු, ජල බින්දු, වතුර බින්දුව.

**උදකමණිකා**. පු-දියපුරවා තබන මහා සැලි.

**උදකමාතිකා** ඉ-ඇල, මොවු ඇල, මහගඟින් ගලාබසින කුඩා ගඟ.

**උදකරහද** පු-විල, දියවිල, වැව, තඩාගය.

**උදකරාජි**. ඉ-දියෙහි ඇඳි ඉර, ජල රේඛාව.

**උදකවාහක**. පු-කුඩා දිය ඇළ, ඔය, "කුන්නදී සදිසං **උදකවාහකං**."

**උදකසකුණිකා**. ඉ-දියකාවා.

**උදකසප්ප**. පු-දියබරියා.

**උදකසම්භිනන**. න-දියමුසු, ජලය මිශ්‍රවූ.

**උදකසාටිකා**. ඉ-දිය සළුව, වැසි සළුව.

**උදකසුද්ධික**. න-දියෙන් පිරිසිදු වන්නා, ජලයෙන් පව් සෝදා හැරිය හැකියයි විශ්වාස කරන්නා.

**උදකසොණ්ඩි**. න-ගල්හෙබ, දිය සහිත ගල් පොකුණ.

**උදකසොත**. න-සැඩපහර, වේගයෙන් ගලා බස්නා ජල පහර, "තෙ **උදකසොතං** නිම්මෙනත පහරිංසු."

**උදබින්දු**. ති-ජලබින්දු = දියබිඳු "**උදබින්දු** නිපාතෙන උදකුම්භොපිපූරති"

**උදබ්බය**. න-(උදය+වය) උදයව්‍යය, පහල වීම හා නැතිවීම, ඉපදීම සහ මැරීම.

**උදබ්බධි**. ක්‍රි-(උ+වධ d. බඣනෙ. බැඳීමෙහි +ති) විනාශ කරයි, මරයි.

**උදබ්බහ** න-ඉසිලීම, = දුරීම, ඉපදීම.

**උදබ්බහෙය්‍ය** ක්‍රි-(උ+වහ d. පාපණෙ, පැමිණීමෙහි+එය්‍ය) දරන්නේය.

**උදය**. පු-හටගැන්ම, පූර්ව පර්වතය, උදය පර්වතය, උදයකාලය, ලැබීම.

**උදයගිරි**. පු-උදාගිරි, උදයගිරි පර්වතය.

**උදය පබ්බත**. පු-නැගෙණහිර දිග සූර්යයා නගින පර්වතය.

**උදයභද්ද** පු-අජාසත් රජුගේ පුතා, එනම් රජ.

**උදයන**. න-වෑඩිය, නැගිම, වැඩීම.

**උදයත්ථගාමිනී**. පහලවීමට හා අභාවයට යන සුලු.

**උදයත්ථික**. පු-උසස්වීමට කැමැති ඇත්තා.

**උදයවෙලා**. ඉ-සූර්යයා උදාවන වේලාව, අරුණෝදය.

**උදයබ්බයානුපස්සනාඤාණ**. න. ක්ෂය ව්‍යය දෙක දැනගන්නා, නුවණ, එනම් ඥාණය.

**උදයබ්බයඤාණ**. න-උදයව්‍යය ඥානය, යථාභූත ඥාන දර්ශනය, "යථාභූත ඤාණදස්සනන්ති තරුණ විපස්සනා, **උදයබ්බයඤාණ**ස්සෙතං අධිවචනං."

**උදර**. න-බඩ, කුක්ෂිය.

**උදරග්ගි**. පු-බඩගින්න, උදරාග්නිය.

**උදරරොග**. පු-බඩලෙඩ, උදරාබාධ.

**උදරපටල**. පු-බඩේ ඔජස් පිටවෙන සිදුරු සම්බන්ධ සම, උදර පටලය.

**උදරපූර**. පු-බඩපිරීම, උදරපූරණය.

**උදරවට්ටි**. ඉ-බඩරැල්ල, බඩරැලි, උදරවැටිය.

**උදරවාත**. පු-බඩේ ඇති වාතය, බඩේ කැක්කුම, ආමවාතය.

**උදරච්ඡවි**. න-බඩෙහි මතුපිට සිවිය, මතුපිට හම.

(6354)

**උදරාබාධ**. පු-බඩෙහි වාතාබාධයක්, "තෙන ඛො පන සමයෙන ආයසමතො සාරිපුත්තස්ස **උදරාබාධො** හොති."

**උදරාවදෙහක**. පු-උදර පූරණය ඇතිවන. "**උදරාවදෙහකං** භුඤ්ජිත්වා."

**උදවාහ**. පු-මෙඝය, වැස්ස, වලාකුළ.

**උදරිය**. න-බඩ, බඩෙහි හටගත් දේ.

**උදහාරක**. පු-දියහළුවා, දියාළුවා, වතුර ගෙණයන්නා, ගොවියා.

**උදහාරිය**. පු-දිය පිණිස යන්නා, උදහාරකයා.

**උදාත්ත**. න-අකුරු උපදින ස්ථාන අතුරෙන් උසස් ශබ්දයෙන් කියනු ලබන ස්ථානය, හෘදය, මහත් ශබ්දයෙන් කියනු ලබන අකුරු.

**උදාන**. න-ප්‍රීතිය, ඉතිරියන ප්‍රීතිය. ප්‍රීති වාක්‍යය. "ඉමං **උදානං** උදානෙසි." නවාංග ශාස්තෘ ශාසනයෙන් එකක්.

**උදානිත**. ති-ප්‍රීතිය පහළකළ, ප්‍රකාශ කළ, කියූ.

**උදානෙති**. ක්‍රි-(උද d. භූ. මොදකීලනෙසු, සතුටු වීමෙහි, ක්‍රීඩාවෙහි + ණෙ + ති) ප්‍රීති වාක්‍ය පහල කෙරෙයි.

**උදායති**. ක්‍රි-(උද d භූ. මොදකීලනෙසු, සතුටුවීමෙහි, ක්‍රීඩාවෙහි, + ති) පහලවෙයි.

**උදාර**. පු-තෙජස් සහිත, ප්‍රෞඪ, උජාරු, මහත්, විපුල.

**උදාරහදය**. පු. උසස් හිතක් ඇත්තා.

**උදාරතා**. ඉ-උදාරතා ගුණය, ප්‍රසාදාදි දශවිධ කාව්‍ය ගුණයන් අතුරෙන් එකකි.

**උදාවත්ත**. න-උදාවත්තීය, වමනය, ඔක්කාරය.

**උදාසීන**. පු-පසුබැසීම, මැලිකම.

**උදාහට**. න-දක්වනලද, නිදසුන්කළ, උදාහෘත.

**උදාහත**. ති-උදාහට = උදාහෘත.

**උදාහරණ**. න-(උ + ආ + හර + ණ) උදාහරණය, සාධකය.

**උදාහරති**. ක්‍රි-(උ + ආ + හර. d. භූ. හරණෙ හැරීමෙහි + ති) දක්වයි, උදාහරණ කරයි, ගෙණහැර පායි.

**උදාහාර**. පු-උදාහාරය, දැක්වීම, නිදසුන.

**උදාහරිත්වා** පු. ක්‍රි-පවසා, කියා, ප්‍රකාශකොට.

**උදාහු**. අ-පරිවිතර්කීයෙහි අව්‍යයක්, නොහොත්. "කිං අමෙහහි සද්ධිං ආගමිස්සසි **උදාහු** පච්ඡා."

**උදි**. d. රු. පසසවණකිලෙදනෙසු, වහනය වීමෙහි, තෙත්වීමෙහි, උනදති, වහනය වෙයි, තෙත් වෙයි.

**උදි**. d. භූ. උගගිරණෙ, වැගිරීමෙහි, තෙත් වීමෙහි, උනදති, වැගිරෙයි.

**උදික්ඛති**. ක්‍රි-(උ + ඉක්ඛ d. පෙක්ඛණෙ, + දැකීමෙහි + ති) දකියි, පරීක්ෂා කරයි.

**උදික්ඛක**. පු-බලන්නා, පරීක්ෂා කරන්නා.

**උදික්ඛන**. න-බැලීම, නිරීක්ෂණය.

**උදික්ඛිත**. ති-බැලූ, නිරීක්ෂණය කළ, බලන ලද.

**උදිච්ච**. පු-වයඹ දෙස, උතුරටත් බටහිරටත් අතර.

**උදිච්චවුත්ති**. ඉ-උදීච්‍ය වෘත්තිය, වෛතාලීය ප්‍රකරණයෙහි එන වෘත්ත විශෙෂයක්.

**උදිත**. ති-කියනලද, පහලවනලද, නගිනලද, බඳනාලද.

**උදිතොදිත**. ති-අතිශයින් ප්‍රසිද්ධ.

**උදිච්චරෙ**. ක්‍රි-බැලූහ, පිරිවැරූහ, "අග්‍යාගාරං **උදිච්චරෙ** ජටිලා"

**උදීච්‍ය**. න-හිරිවේරිය, ඉදිවේරිය.

**උදීචි**. ඉ-උතුරුදිග, උත්තර දිශාව,

**උදීරණ**. න-කීම, ප්‍රකාශය, උච්චාරණය.

**උදීරිත**. ති-කියනලද, ප්‍රකාශ කළ, කියූ,

**උදීරෙති**. ක්‍රි-(d උ + ඊර. වාචායං, කීමෙහි + ති) කියවයි.

**උදු**. ති-සෘජු, ඉදු, ඇදනැති, කෙළින්,

**උදුක්ඛල**. න-වංගෙඩිය. වත. "**උදුක්ඛලෙ** කොට්ටෙත්වා කොට්ටෙත්වා පරිභුඤ්ජන්ති."

**උදුක්ඛලිකා**. ඉ-දෙර සවි කරණ වංගෙඩිය.

**උදුක්ඛල පාසක** න-දෙර සවි කරණ යට සිදුර හා උඩ පාසකය,

**උදුම්බර**. පු-දිඹුල් ගස-ගෙඩි, උදුම්බර පුරය. "ආයස්මා රෙවතො කඞ්ඛාකුජ්ජා **උදුම්බරං** අගමාසි."

**උදුචිත**. ති-සෘජුකළ, කෙළින් කළ.

**උදුජික**. ති-කෙළින් තුබූ, සෘජුව තුබූ.

**උදෙති**. ක්‍රි-(උ + ඉ. d. භූ පාපුනනෙ, පැමිණීමෙහි + ති) පහලවෙයි, නැගෙයි, හට ගනියි. 'සුරියං **උදෙති**.'

**උදෙනි**. ඉ-දඹදිව පිහිටි උදෙනි නම් නගරය.

**උද්‍රහ**. d. භූ-කැමෙහි, උද්‍රහති, කයි.

**උද්ද**. පු-ජලය, දිය බල්ලා.

**උද්දභණ්ඩ**. පු-ගොඩනැගිලි වර්ගයක්, පැලක්, දික් ගේ.

**උද්දකරාමපුත්ත**. පු. රාම පුත්‍රකවූ උද්දක තැනැත්තා, "අභිදෙස කාලකතො භන්තෙ උද්දකො රාම පුත්තො."

**උද්දය**. පු-වැඩීම, වෘඩිය, ලාභය.

**උද්දසුද්ද**. න-ගොම අලු හා මිශ්‍ර කළ මැටි.

**උද්දලොමි**. දෙ දැය ඇතිරිය - එක් පිටකළු එළු ලොම් ඇති ඇතිරිය.

**උද්දසෙසති**. ක්‍රි-(උ + දිස d. භූ. උච්චාරණාදිසු, කීම් ආදියෙහි + ති) දක්වයි. දිස ධාතුවට දස්සාදෙශවී සිද්ධයි.

**උද්දාන**. න-බන්ධනය, බැම්ම, වඩබා ගිත්න.

**උද්දාප**. ප්‍ර-පවුර, පදනම.

**උද්දාම**. පු-බන්ධන රහිත, කැමතිසේ හැසිරීම, උසස්ව තැනීම.

**උද්දාරක**. පු-වන සතෙක්.

**උද්දාල**. පු-ඇසල ගස, ලෝලුගස, කොබෝලීල යයි ද කියත්.

**උද්දාලක**. පු-සහමුලින් නසන්නා, වාත ඝාතකයා.

**උද්දාලනක**. පු-සූරාදමන්නා.

**උද්දාලෙති**. ක්‍රි-(උ + දල d. භූ. දිත්ති විදාරණෙ, දැවීමෙහි, පැලීමෙහි + ණෙ + ති) සූරාදමවයි.

**උද්දිස්සා**. අ-උදෙසා, සඳහා, නිසා, අරභයා.

**උද්දිස්සකට**. ති-උදෙසා කළ, තමන් වෙනුවෙන් පිළියෙල කළ.

**උද්දිස්සකත**. ති-යමෙක් උදෙසා කළ.

**උද්දිට්ඨ**. පු-දක්වන ලද, යෝජනා කළ, දැක්වූ, ෂට්ප්‍රත්‍යයන් අතුරෙන් තුන්වන ප්‍රත්‍යය උද්දිෂ්ට නම්.

**උද්දිය**. පු-වයඹ දිශාව,

**උද්දිට්ඨවිසය**. න-අපාදාන කාරක ප්‍රභෙදයෙකි. "රුක්ඛස්මා ඵලං පතති" යනාදියෙහි අපාදාන සංඥා විෂයක්වූ ක්‍රියාව දක්වනලද හෙයින් මෙය උද්දිෂ්ට විෂය නම්.

**උද්දිසති**. ක්‍රි-(උ + දිස. d. භූ. පෙක්ඛණෙ, දැකීමෙහි + ති) දක්වයි

**උද්දිසන**. න-දැක්වීම. ගෙණහැරපෑම.

**උද්දිසාපෙති**. ක්‍රි-(උ + දිස d. භූ. පෙක්ඛණෙ, බැලීමෙහි + ණාපෙ + ති) දක්වයි ගෙණහැර පායි.

**උද්දිස්සන**. න-දැක්වීම, ගෙණහැර පෑම.

**උද්දිස්සකටමංස**. න-උදෙසා කළ මාංසය, "න භික්ඛවෙ **උද්දිස්සකටං** මංසං පරිභුඤ්ජිතබ්බං"

**උද්දීපන**. න-දැක්වීම, පෙන්වීම, කරුණු දැක්වීම.

**උද්දීසති**. ක්‍රි-(උ + දිස d. භූ. පෙක්ඛනෙ, දැකීමෙහි + ති) දක්වයි.

**උද්දීසන**. න-දැක්කවීම, පෙන්නවීම.

**උද්දෙක**. ප්‍ර-වමනය, ඔක්කාරය.

**උද්දෙකානික**. ප්‍ර-වැක්කිරීම, ඈරෙන් පිට කිරීම.

**උද්දෙස**. පු-නම්හොත් කීම, පස්වැදෑරුම් ප්‍රාතිමොක්ෂොද්දෙශය, සංක්ෂෙපය, උද්දානය, ප්‍රාතිමොක්ෂය, ශික්ෂාප්‍රත්‍යාඛ්‍යානයෙහි එන ක්ෂෙත්‍රපද විසිදෙකෙන් එකක් "**උද්දෙස** පච්චක්ඛාමීති වදති."

**උද්දෙස**. න-(උ + දිස + ණ) කීම, උදෙසීම, බණ ඉගෙණුම. "**උද්දෙස** ගහණ කාලෙ"

**උද්දෙසකාමක**. පු-උදෙසනු කැමැත්තා, පාලිය හදාරණු කැමැති අය.

**උද්දෙසන්තෙවාසික**. පු-ඉගෙණ ගන්නා ශිෂ්‍යයා, ඉගෙණීම සඳහා යෙදෙන අතැවැසියා.

(6438)

**උද්දෙසාචරිය**. පු-බණ දහම් උගන්වන ආචාර්යවරයා.

**උද්දෙසක**. පු-ඉගෙණගන්නා, පෙළහදාරන්නා, උදෙසන්නා, පාමොක් උදෙසන්නා.

**උද්දෙසග්ගහණ**. න-පාලිය හැදෑරීම, පාළිය කියවා ගැණීම "උද්දිසියතීති, උද්දෙසො, තස්ස ගහණං උද්දෙසග්ගහණං"

**උද්දෙසගොචර**. ති-පාලිධර්මය හදාරණ, උද්දෙසය ගොදුරු කොට ඇති.

**උද්දෙසපත්ත**. පු තමන් පිණිසවූ පාත්‍රය.

**උද්දෙසපරිපුච්ඡා**. ඉ-ඉගෙණීම හා අරුත් ගැණීම.

**උද්දෙසපරියාපන්න**. න-පාමොක් උදෙසීමෙහි ඇතුලත්වූ, එබඳු ශික්ෂාපද.

**උද්දෙසපාළි**. ඉ-උද්දෙශ පාළිය, පඤ්ච ප්‍රාතිමොක්ෂොද්දෙශය.

**උද්දෙසභත්ත**. න-නියම කර දෙන බත, උදෙසා දෙන බත, තුදුස් බතින් එකක්, සලාක වශයෙන් ගතයුතු බත.

**උද්දෙසභත්තඝර**. න-උදෙසා බත දෙන ගෙය

**උද්දෙසලාභ**. පු-නියම කරදෙන බත වශයෙන් ලැබුන ලාභය.

**උද්දෙසවිභඞ්ග**. පු-පෙළ සහ අටුවා.

**උද්දෙසවිහාරී**. පු-නිතර පෙළ හදාරණයෙහි යෙදුනු.

**උද්දෙසසංවාස**. පු-එකතුව පාමොක් උදෙසීම,

**උද්දෙසසීල**. න-පෙළ දහම් හදාරණ සුළු, උදෙසන සවභාවය ඇති.

**උද්දෙස**. පු උදෙසීම, උද්ග්‍රහණය, මාතෘකා පද, නම්ගොත් කීම, සංක්ෂෙපය, උද්ධෘතය, පස්වැදෑරුම් ප්‍රාතිමොක්ෂොද්දෙශ.

**උද්දෙසක**. ති-උදෙසන්නා, දෙශනා කරන්නා.

**උද්දෙසික**. ති-උදෙසා කළයුතු, දෙසිය යුතු, ව්‍යවහාර කටයුතු.

**උද්දෙසිකචෙතිය**. න-උදෙසා කළ චෛත්‍යය, සර්වඥයන් වහන්සේ උදෙසා කළ පෙති-පිළිමාදිය, බුදුපිළිමය.

**උද්දෙහක**. න-බුබුලු නගින, පෙන නගින.

**උද්දොසිත**. පු-රථාදි බඩු තබන ශාලාව, රථ මඩුව, බඩුහල.

**උද්දෙසිත සික්ඛාපද**. න-එනම් ශික්ෂාපදය.

**උද්‍රය**. පු-උදය, වැඩීම, වෘද්ධිය.

**උද්‍රියති**. ක්‍රි-(උ + දර d. වූ නාසනෙ, නැසීමෙහි + ඊය + ති) නැසෙයි, වැනසෙයි, නැසෙනු ලැබෙයි.

**උද්‍රෙක**. පු-තැලිනැගීම, ඔක්කාර කිරීම. වමනය.

**උද්ධ**. අ-ඖද්ධත්‍යය, උදුරණලද.

**උද්ධං**. අ-මස්තකයෙහි, උඩ, මතුභාගය.

**උද්ධංගම**. ති-උඩට යන සුලු, එනම් ශරීර වාතය, වෘද්ධිය භජනය කරණ සුලු.

**උද්ධංආඝාතනික**. ති-මරණයෙන් පසු.

**උද්ධංපාද**. පු-උඩුකුරුවූ පය ඇත්තා. "**උද්ධං පාදතලා** අධො **කෙසමත්ථකා**".

**උද්ධංභාගිය**. පු-උඩ දිශාව භාජනය කරණ.

**උද්ධංභාගිය සංයොජන**. න-උඩයයි කියනලද රූපා රූප භවයන්හි උපදවන රූපරාග අරූපරාග, මාන, උද්ධච්ච සහ අවිජ්ජා යන සංයොජන පස.

**උද්ධංමුඛ**. ති-උඩුකුරුවූ මුව ඇත්තා.

**උද්ධංසර**. පු-මෘදුස්වරයක් ඇත්තා.

**උද්ධංසොත** ති-ජීවිත නැමැති ස්‍රොතයාගේ උඩට යන.

**උද්ධංසොත අකනිට්ඨගාමී**. පු-එනම් බඹ තලයෙහි වසන්නා.

**උද්ධංසවාද**. පු-සසර සැරිසැරීමෙන් සුද්ධියයි කියන්නෝ

**උද්ධංසති**. ක්‍රි-(උ + ධංස. d භූ. ධංසනෙ + ති) උඩට නගියි.

**උද්ධක**. පු-මිහිඟු බෙරය.

**උද්ධග්ග** ති-මතු උතුම්වන, කෙළින් සිටින.

**උද්ධග්ගලොම.** ති-කෙළින්වූ ලොම් ඇති.

**උද්ධග්ගචිත්ත.** න-උඩගුසිත.

**උද්ධග්ගික.** ති-මතු අග්‍රව පවත්නා, මතු ආත්මයෙහි යහපත් විපාක ඇති.

**උද්ධච්ච.** න-ඖද්ධත්‍යය, නොසන්සුන් කම, උඩගුව.

**උද්ධච්චකුක්කුච්ච.** න-උඩගුබව හා කුකුස්බව, එනම් නිවරණය.

**උද්ධට.** ති-උඩටනැගු, නගා සිටුවනලද, උඩගු බව.

**උද්ධත.** ති උදුරණලද, උපුටනලද, ඔසවනලද,

**උද්ධතසල්ල.** ති-උදුරණලද හුල් ඇති.

**උද්ධතාරුණ** න-නැගුණු අරුණ.

**උද්ධන** න උදුන, ලිප.

**උද්ධම්ම.** පු-ධර්මයට විරුද්ධ, අධර්මය, ධර්මය අධර්මය කොට.

**උද්ධරණ.** න-ඉදිරීම, උත්පාටනය, උඩට ගැනීම.

**උද්ධරති.** ක්‍රි-(උ + ධර d. හු ධරණෙ, දූරීමෙහි + ති) උදුරයි.

**උද්ධමාඝාතන.** ති-මරණින් මතු පැවැත්ම ඇති.

**උද්ධජ.** ති මතුභාගයෙහි ඇතිවූ.

**උද්ධස්ත.** ති-ඔසවන ලද, මතුයෙහි වළඳනා ලද, මස්තකය වසාගන්නා ලද.

**උද්ධස්තො.** පු-උද්ධස්ත බලනු.

**උද්ධංස.** d. කි. උවෙඡ, සෙවීමෙහි, උද්ධංසනාති සොයයි.

**උද්ධාර.** පු-ණය, උඩරණය කිරීම.

**උද්ධාලක.** පු උද්ධරණය කරන්නා.

**උද්ධි** න-ඇණ දුවකඩ.

**උද්ධිත.** ති-ඇදදූමු, විනාශ කළ, අහක් කළ

**උද්ධූනන.** උඩට කම්පාකිරීම, ඉහළට සෙලවීම.

**උද්ධූනාති.** ක්‍රි-(උ + ධූ d. කි. කම්පනෙ, සැලීමෙහි + ති) උඩට කම්පාකරයි.

**උද්ධුමාත.** න-ඉදිමෙන ලද, ඉදිමිච්ච.

**උද්ධුමාතක.** න-ඉදිමිච්ච, ඉදිමුණු.

**උද්ධුමාතකසඤ්ඤා.** ඉ-ඉදිමීගිය මෘතශරීරයක් අරමුණු කොටගෙණ කරණ භාවනාව, උද්ධුමාතක සංඥා භාවනාව.

**උද්ධුමාතකසරීර.** න-ඉදිමුණු මළසිරුර.

**උද්ධුමාතකත්ත.** න-ඉදිමුණු ස්වභාවය.

**උද්ධුමායති.** ක්‍රි-(උ + ධුම d. හූ. සංඝාතෙ, නැසීමෙහි + ති) ඉදිමෙයි.

**උද්ධුමායන.** න-ඉදිමෙන.

**උද්ධුමායික.** ති-ඉදිමුණු, ඉදිමීගිය.

**උද්ධුමායිත.** ති-ඉදිමෙනලද, ඉදිමීගිය.

**උද්ධුමායී.** ක්‍රි-(උ + ධම d. හූ. + ඊ) ඉදිමුණේය,

**උද්ධුස.** d. හූ. ඇඹිදීමෙහි, උද්ධුසාති, ඇඹිදියි.

**උද්ද.** d. හූ. මිත අස්සාදකිලෙදනෙසු, ප්‍රමාණ කිරීම් ආදියෙහි, උද්දතෙ, ප්‍රමාණ කෙරේ.

**උද්‍රිය,** }
**උද්දිය.** } න-කම්පාව, චලනය.

**උද්‍රියති.** } කි-(උ + දර d. ත. නාසෙ, නැසීමෙහි
**උද්දියති.** } + ඊය + ති) නැසෙනු ලැබෙයි,

**උද්‍රභ.** d හූ. භක්ඛණෙ, කෑමෙහි, උද්‍රභති, අනුභව කරයි.

**උද්‍රියන.** } න-කම්පාවන, මහත්සේ චලනය
**උද්දියන.** } වන.

**උඳ.** d රු. පසවන කිලෙදනෙසු, වහනය වීමෙහි, තෙත්වීමෙහි උඳති, වහනය වෙයි.

**උඳුර.** පු-මීයා, මූෂිකයා.

**උද්‍රේක.** න-වමනය, ඔක්කාරය, "උද්‍රේකං දස්සතීති උග්ගාරං දස්සති"

**උන්න.** ති-තෙත්දෙය.

**උන්නත(ණ්ණ)ක.** න-ආභරණ විශෙෂයක්.

**උන්නත(ණ්ණ)ත.** ති-උස්දෙය, උච්චස්ථානය.

**උන්නත(ණ්ණ)ති.** ඉ-මානය, උඩගුකම.

**උන්නළ.** පු-මානය ඇත්තා, උඩගුකම ඇත්තා.

**උන්නඞ්ගල.** පු-නගුල් අහක්කර හෝ වැඩ අත්හැර උත්සවයට සැරසීම.

**උන්නතානන** ති-(උන්නත + ආනන) උඩුකුරු මුහුණ ඇති.

**උන්නදති.** ක්‍රි-(උ + නද d. භූ. අව්‍යත්ත සද්දෙ, නොවියත් ශබ්දයෙහි + ති) උසස් නාද කෙරෙයි.

**උන්නදන.** න-උසස් නාදය, මහානාදය.

**උන්නම.** න-උස, උස්තැන

**උන්නමන.** න-උසස්තැන පිහිටුවීම, උඩටනැමීම, "**උන්නමන** - **ඔනමන** පකතිකං සඞ්ඝස්ස ආසනං."

**උන්නමති.** ක්‍රි-(උ + නම d. භූ. නමෙ, නැමීමෙහි + ති) උඩට නමයි. ගොඩකෙරෙයි. "නින්නං ඨානං **උන්නමති**."

**උන්නල.** / **උන්නළ.** } න-උස්වූ හිස්මාන නලය.

**උන්නහන.** න-උඩට නැසීම, උඩට වෙලීම.

**උන්නහනා.** ඉ-වංචාකිරීම, මතුමත්තෙහි බැඳීම, එබඳුකථා.

**උන්නයන.** න-වරනැගීම, උඩට පැමිණවීම, විතර්කය.

**උන්නාද.** පු උසස් නාදය.

**උන්නාදී.** ති-උසස් නාදකරන්නා.

**උන්නාදෙති.** ක්‍රි-(උ + නද d භූ. අව්‍යත්තසද්දෙ, නොවියත් ශබ්දයෙහි + ති) උසස්ලෙස නාදකරයි.

**උන්නාමෙති.** ක්‍රි-(උ + නම d. භූ. නමෙ, නැමීමෙහි + ති) නමයි, උඩටනමයි.

**උන්මත්ත.** ති උමතු, සිහිය විකලවූ, පිස්සු,

**උන්මත්තක.** පු-උමතු තැනැත්තා

**උන්නාම.** පු-උසස් මාන්නය.

**උන්නානාසී.** පු-එතම් සතා.

**උප.** අ-සමීප, පූජා, සදෘශ බව, දොෂකථන, උත්පත්ති, භාගාර්ථ, අපගමන, අධිකත්ව, පූර්වකර්ම, නිවෘත්ති, ප්‍රතිභානාකාර, උපරිභාව, අභොජන යනාදි අර්ථයන්හි වැටෙන අව්‍යයෙකි.

**උප.** d. වු. පජ්ජනෙ, පැමිණීමෙහි, උපෙති, උපයති, පැමිණෙයි.

**උපක්කම.** පු-උපක්‍රමය, ප්‍රයොගය. යමක් කිරීමට යොදන උපාය.

**උපක්කමති.** ක්‍රි-(උප + කමු. d භූ. පදවික්ඛෙපෙ, පයනගා යාමෙහි + ති) උපක්‍රම කෙරෙයි. උපායොදයි.

**උපක්කමන.** න-උපක්‍රමණය, ප්‍රයොග යෙදීම.

**උපක්කන්ත.** පු-උපක්‍රමණය කිරීම, ආක්‍රමණය කිරීම.

**උපක්කට්ඨ.** / **උපකට්ඨ.** } ති-ළඟ සමීප, කිට්ටු "**උපකට්ඨාය** වස්සූපනායිකාය."

**උපක්ක.** පු-ගින්නෙන් දැවුණු සිරුරු ඇති, එබඳු ගැහැණියක්, "අද්දසං ඉත්ථිං උපක්කං."

**උපක්කිලිට්ඨ.** පු කෙලෙසන ලද.

**උපක්කිතක.** පු-විකුට ගැණීම, ඇපකර ගැණීම, විකුටගත්.

**උපක්කිලෙස.** පු-පිටතින් පැමිණෙන කිළුටු, රාගාදිකෙලෙස් "රාගාදිහි **උපක්කිලෙසෙහි** උපක්කිලිට්ඨං."

**උපක්කුට්ඨ.** පු-දොෂාරොපනය කළ, ගැරහූ, සැරකළ, දොස්තැබූ.

**උපක්කොස.** පු-නුගුණකීම, අයුතුකීම.

**උපක්කොසති.** ක්‍රි-(උප + කුස d. භූ. අක්කොසෙ, නපුරු කොට බිනීමෙහි + ති) නුගුණ කියයි. අගුණ කියයි.

**උපක්කොසන.** න-නුගුණ කීම, අගුණ ප්‍රකාශය.

**උපක්ඛට.** ති-සර්ජිත කළ, සාදනලද.

**උපක්ඛත.** ති-සදනලද, හදනලද.

**උපක්ඛලති.** ක්‍රි-(උප + ඛල d. භූ. සංචලනෙ, සැලීමෙහි + ති) පැකිලෙයි, හැපෙයි, වැටෙයි

**උපක්ඛලන.** න-පැකිලීම, වැටීම, හැපීම

**උපක්ඛන්ධ.** පු-කඳේ උඩුපැත්ත, පිටිපස, උරහිස

**උපක්ඛිත්ත(ක).** පු-ඉවත්කරණලද, උස්සා-දමනලද.

**උපකඩ්ඪති.** ක්‍රි-(උප + කඩ්ඪ d. භූ. කඩ්ඪනේ, ඇදීමෙහි + ති) උඩට අදියි, උඩට කඩයි.

**උපකඩ්ඪන.** න-උඩට කැඩීම, උඩට ඇදීම.

**උපකච්ඡ.** කිසිල්ල, කිහිල්ල.

**උපකච්ඡක.** න-කිසිල්ල, කිහිල්ල, ඉඟටිය, උකුල.

**උපකට්ඨ.** ති-ආසන්න වූ, ලංවූ, "උපකට්ඨාය වස්සූපනායිකාය."

**උපකණ්ණක.** ති-කණලඟ, කණ අසල, "උපකණ්ණකං ජප්පතීති— කණමුලෙ මනෙනති,"

**උපකප්පන.** න-(උප + කප්ප + යු=අන) නිසි, සුදුසු වූ, එළවනලද, වළඳින.

**උපකරණ.** න-(උප + කර + යු = අන + ණ) උවමනා දේ, අවශ්‍ය වූ බඩු.

**උපකාරක.** පු-(උප + කර + ණ්වු + අක) උපකාර කරන්නා, උදවුකරන්නා, සහාය දෙන්නා,

**උපකාරිකා.** ඉ-පවුරුපදනම, සත්වැදෑරුම් නගරාරක්ෂාවන්ගෙන් එකක්.

**උපකිරිතුං** ක්‍රි-වි-විසුරුවන්නට, තුනීකරන්-නට.

**උපක්ඛට.** ති-රැස්කළ, පිළියෙළ කළ, සැරසූ, එනම් ශික්ෂාපදය, "චීවර චෙතාපන්නා උපක්ඛටාහොනති."

**උපක්ඛර.** පු-වැපොරෝ ආදිය, රියකොටස්, රථාඞ්ග.

**උපග.** ති-(උප + ගමු + අ) පැමිණීම, එළඹීම.

**උපගච්ඡනති.** ක්‍රි-(උප + ගමු d. චු. ගතියං, යාමෙහි + නති, මූ=චඡ) පැමිණෙත්, එළඹෙත්.

**උපගඤ්ඡි.** ක්‍රි-(උප + ගමු d. භූ. ගතියං, යාමෙහි, මූ = ඤ්ඡ + ඊ) එළඹියේය, වෙත ගියේය.

**උපගත.** ති-පැමිණි, එළඹි, "උපගත ජනා භත්තං භුඤ්ජිංසු."

**උපගුහණ.** න (උප + ගුහ + ණ) ආලිඞ්ගනය, වැළඳගැන්ම.

**උපගූහිත්වා.** පු-ක්‍රි වැළඳගෙන, වැළඳ.

**උපඝාත.** ති-(උප + හන = ඝාත + අ) නැසූ, නසනලද නොහික්මුණු, උපද්‍රව, උවදුරු, බාධා.

**උපඝාතික.** පු-(උප + හන = ඝාත + ඉක) නැසීම, නොහික්මීම, භික්ඛූපඝාතික හා භොගුපඝාතික යන දෙක, "ද්වෙ උපඝාතිකා භික්ඛුපඝාතිකාච භොගුපඝාතිකාච."

**උපචය.** පු-වැඩීම, රැස්කිරීම, "උපචයො නාම වඩ්ඪි."

**උපචරිත.** ති-පැමිණි, එළඹෙන ලද.

**උපචාර.** පු (උප + චර + ණ) ලඟ, සමීපය, අත්පස, දෙවන ජවන්සිත, එක්රියන්හමාර, එපමණ පලල්වූ පෙදෙස, "දියඩ්ඪහත්ථ විත්ථාරෝ මගෙහා උපචාරෝ,"

**උපචාර.** න ආදරය, පූජාව, වෙනසක්නැතිව ගැණීම, වියරණ විසි සතරෙන් එකක්.

**උපචාරක.** පු-ආරක්ෂකයා, සේවය කරන්නා.

**උපචාරජ්ඣාන.** න-උපචාරධ්‍යානය, අපිණාවට සමීපවූ ධ්‍යානය, නීවරණ ප්‍රහීනයෙන් ලැබෙන ධ්‍යානය.

**උපචාරභාවනා.** ඉ-උපචාර භාවනාව.

**උපචාරභූමි.** ඉ-උපචාර සමාධිය, නිමිති-පහළ වූ කළ සිත සමාධියට පැමිණෙන එක් සමාධියක්, "උපචාරභූමීති උපචාරසමාධි."

**උපචාරවචන.** න-ව්‍යවහාරවන වචන, භාවිත වන වචන, "උපචාරවචනං වුච්චති වොහාර වචනං."

**උපචාරසමාධි.** ඉ-උපචාර සමාධිය, අපිණාවට සමීපයෙහි හැසිරෙන සමාධිය.

**උපචාරසීමා** ඉ-උපචාර සීමාව, පසළොස්-වැදෑරුම් සීමාවන්ගෙන් එකක්.

**උපච්ඡිජ්ජති** ක්‍රි-(උප + ඡිද d. දි. ඡෙදනෙ, සිඳීමෙහි + ය + ති) සිඳෙයි, නැතිවෙයි.

**උපච්ඡින්දති.** ක්‍රි-(උප + ඡිදි. d. රු ඡෙදනෙ, සිඳීමෙහි + ති) සිඳියි, විනාශකරයි, "ජීවිතා වොරොපෙය්‍යාති ජීවිතින්ද්‍රියං "උපච්ඡින්දති."

**උපච්ඡිනක.** ති-සිඳුණු, විනාශවූ, සහමුලින්ම නැතිවූ.

(6606)

**උපජානාති**. ක්‍රි-(උප + ජන d. දි. ජනනෙ, දිනීමෙහි + ති) සැරසෙව, සැරසෙන්න, දූනගණුව, "තවසෙඤුව සරාවාසතෙථන "**උපජානාති**."

**උපඤ්ඤාත**. ති-අනුමානයෙන් දත්, දත්තාලද, "උපඤ්ඤාතං තිබබාණනති උපපතතියා අනුමානෙන ඤාතං නිබබාණං."

**උපට්ඨපෙස්සති**. ක්‍රි-(උප + ඨා d. භූ. "ගති-නිවුත්තිමහි, ගතිපැවැත්මෙහි + ණාපෙ + ස්සති) පිහිටුවන්නේය, එලවන්නේය. "ආචරියො භිකඛවෙ, සද්ධි විහාරිකමපි පුතතං චිතතං **උපට්ඨපෙස්සති**."

**උපට්ඨාතුං**. ති-සඞ්ග්‍රහ කරන්නට, උපස්ථාන කරන්නට එළඹ සිටින්නට.

**උපට්ඨාක**. පු-උපස්ථායකයා, ගිලන් උවටැන් කරන්නා. "ආනනෙද බුද්ධුපට්ඨාකො"

**උපට්ඨාක කුල**. න උපස්ථායක කුලය, දානාදි සිවුපසයෙන් උපස්ථාන කරණ කුලය, "ආයසමතො මොගගලලානසස **උපට්ඨාක කුලං** ආයසමතො මොගගලලානසස සනති-කං දූරකං පාහෙසි."

**උපට්ඨාක දුභර**. පු-උවටැන් කිරීමෙන් පොෂණය කිරීමට නොහැකි පුද්ගලයා.

**උපට්ඨාති**. ක්‍රි-(උප + ඨා d. දු. ගතිනිවුත්තිමහි, ගතිපැවැත්මෙහි + ති) උපස්ථාන කරයි, උවටැන් කරයි.

**උපට්ඨාන** න-(උප + ඨා + යු=අන) උවටැන් කිරීම, සිව්පසය එළවීම.

**උපට්ඨාන කාරක**. පු-උවටැන් කරන්නා. උපස්ථාන කාරකයා.

**උපට්ඨාන වෙලා**. ඉ-උවටැන් කරණ වේලාව-කාලය.

**උපට්ඨාන සමබන්ධිතා**. ඉ-උපපතති නිමිතත වැටහෙන අයුරු, සමබනිතා පහෙත් එකක්,

**උපට්ඨාන සාලා**. ඉ-බොජුන්හල, හැමදෙන රැස්වන ශාලාව. උවටැන් සාලාව, "අථඛො ආයසමා ආනනෙද යෙන **උපට්ඨාන සාලා** තෙනුපසඞකමි."

**උපට්ඨාපෙති**. ක්‍රි-(උප + ඨා + ණාපෙ + ති) උපස්ථාන කරවයි, උවටැන් කරවයි.

**උපට්ඨිත**. ති-(උප + ඨා + ඉ + ත) එළඹ සිටි, එබදු සිහිය, "**උපට්ඨිතා** සති අසමමුට්ඨා."

**උපතිට්ඨිත්වා** පු. ක්‍රි-(උප + ඨා + ඉ + ත්වා) ළඟට පැමිණ, වෙත එළඹ.

**උපත්ථම්භ**. පු-උපකාරය, පිටුවහල.

**උපත්ථම්භක**. පු-උපසථම්භක කර්මය, විපාක ඉපදවීමට අසමත් අන් කර්මයකින් උත්-පත්තිය දුන් විට සැප දුක් දෙකට ආධාර වන කර්මය.

**උපදංසෙනති**. ක්‍රි-(උප + දංස d. දංසනෙ + ණෙ + නති) කරත්, පවත්වත්.

**උපදහෙය්‍ය**. (උප + දහ + එය්‍ය,) සැක උපද-වන්නේය. කුකුස් ඇතිකරන්නේය.

**උපදෙස**. න-උපදෙශය, අවවාදය.

**උපද්දව**. පු-විපත්තිය, උවදුර.

**උපද්දුත**. ති-පීඩාවට පැමිණි, දුවදුරු සහිතවූ, "ආරඤ්ඤිකා භිකඛු **උපද්දුතා** හොනති."

**උපධාන**. න-හිස හෝ පා තබන කොට්ටය. "අගිලානසස සීසූපධානං ච පාදූපධා-නඤ්ච ඨ්‍යමෙව වට්ටති."

**උපධාන සම්බික**. න-අත් පා ආදිය සිදීමට යෙදූ දඬුකඩ.

**උපධාරෙති**. ති-(උප + ධා d. චු. ධාරණෙ, දැරීමෙහි + ණෙ + ති) අදහස් බලයි, විමසයි, පරීක්ෂා කෙරෙයි.

**උපධාරයමානො**. ති-විචාරමින්, විමසමින්, අදහස් බලමින්.

**උපධාවිත්වා**. පු. ක්‍රි-(උප + ධා + ඉ + ත්වා) දිව-ගොස්, ළඟට දුව අවුත්, "තෙ **උපධාවිත්වා** තං යකඛං අගගහෙසුං."

**උපනඬි**. ක්‍රි. (උප + නහ + ඊ) වෛර කෙලෙස, "යකෙඛා තසමිං **උපනඬි**"

**උපනය්හනති**. ක්‍රි-(උප + නහ + නති) බද්ධ වෛර කරත්.

**උපනාමෙති**. ක්‍රි (උප + නම + ණෙ + ති) නමයි, නතු කරයි, එළවයි.

**උපනාමිත**. ති-නතු කළ, එළවූ, නමනලද,

**උපනාහ**. පු-බද්ධ වෛරය,

**උපනාහී**. පු-බද්ධ වෛර ඇත්තා, අනාපත්ති-යෙහි ආපත්ති ආරෝපනය කරන්නා.

**උපනික්ඛිත්ත**. ති-ගෙණෙනලද, එළවනලද, අමනුස්සෙන **උපනික්ඛිත්තා** සිලාති."

**උපනික්ඛෙප**. පු-(උප + නි + ඛිප + ණ තැන්-පත් කිරීම, පොළී සඳහා මුදල් තැන්පත් කර තැබීම.

**උපනිසංසනන්ති**. ක්‍රි-(උප + නි + සංස, d. භූ. සංසනෙ, ගැටීමෙහි + නති) ගටත්, හැපී ගෙණ යත්, "හත්ථිනියො කායං **උපනි-සංසනන්ති** යො ගච්ඡන්ති."

**උපනිජ්ඣායති**. ක්‍රි-(උප + නි + ජෙඣ, d. දි, චින්තායං, සිතීමෙහි + ණෙ + ති) බලයි, විමසා බලයි.

**උපනිජ්ඣාන**. න - සිතීම, අරමුණ සිතීම, "**ආරම්මණූපනිජ්ඣාන**."

**උපනිධි**. ඉ-(උප + නි + ධා + ඉ) ආරක්‍ෂාව සඳහා තැබූ වස්තුව, "උපනික්ඛිත්තං භණ්ඩං උපනිධි නාම."

**උපනිධිකථා**. ඉ- උපනිධි වස්තුන්ගේ විනිශ්චය කථාව.

**උපනිපජ්ජෙය්‍ය**, ක්‍රි-(උප + නි + පද d. දි. ගතියං, යෑමෙහි, + එය්‍ය) වැදහෝනේය, නිදන්නේය.

**උපනිබන්ධ ගොචර**. පු-සතර සතිපට්ඨාන-යන්හි සිත පිහිටුවීම, භාවනා සිත බැඳ තැබිය යුතු විෂය, තුන් ආකාර ගොචරයන් ගෙන් එකක්. "තත්‍ථ කතමො **උපනිබන්ධ ගොචරො** චත්තාරො සතිපට්ඨානා යත්‍ථ චිත්තං උපනිබන්ධති."

**උපනිබන්ධති**. ක්‍රි - (උප + නි + බධ, d. රු, බන්ධනෙ, බැඳීමෙහි + ති) භාවනා සිත බඳියි, කමටහන් සිත පිහිටුවා ලයි.

**උපනිබන්ධිත්වා**. පු ක්‍රි ලියා, අකුරු ලියා, "අනුජානාමි භික්ඛවෙ සලාකායවා පට්ටිකායවා **උපනිබන්ධිත්වා**."

**උපනිස**. ති-ප්‍රත්‍යය වීම, "එතදත්‍ථා උපනිසා."

**උපනිසින්නකථා**. ඉ-ලඟ සිටින අය සමග කරණ ධර්ම කථාව, ලඟ හිඳ කරණ කථාව,

**උපනිස්සය**. පු-උපනිශ්‍රය, හේතුව, බලවත් හේතුව, "උපනිස්සයොති බලව කාරණං, **උපනිස්සයං** ඔලොකෙත්වා."

**උපනිස්සය ගොචර**. න-සීල ආදී ගුණයන්ට ගොදුරු වූ, සද්ධා, සීල, සුත, චාග, පඤ්ඤා යන පස්වැදෑරුම් ධර්මයන් ගෙන් යුක්ත වීම. තුන් වැදෑරුම් ගොචරයන්ගෙන් එකක්.

**උපනිස්සාය**. පු. ක්‍රි-ඇසුරු කොට, නිසා "අඤ්ඤතරං ගාමං උපනිස්සාය විහරති."

**උපනීත**. ති-(උප + නී + ත) පිරිනැමූ, තතුකළ, වෙත පමුණුවනලද.

**උපනීය**. පු. ක්‍රි-(උප + නී + ත්වා) පමුණුවා, කැඳවා, උපනයන කර්මය කොට.

**උපනෙති**. ක්‍රි-(උප + නී d. භූ. නයෙ, පැමිණ-වීමෙහි + ණෙති) ගෙණයයි, පමුණුවයි.

**උපපජ්ජරෙ**. ක්‍රි-(උප + පද d. දි. ගතියං, යෑමෙහි + ය + නති=රෙ) උපදිත්, පහලවෙත්, "නිරයං තෙ **උපපජ්ජරෙ**."

**උපපන්න**. ති - (උප + පද + ත = අන්න) උත් පත්න, උපන්, පැමිණි, "**උපපන්නාති** උප ගතා."

**උපපීළක**. පු-(උප + පීළ + ණ්වු=අක) උප-පීඩක කර්මය, අන් කර්මයකින් ප්‍රතිසන්ධිය ලබාදී සැප දුක් විඳිනවිට ඒ සුව දුක් පෙළන කර්මය, සොළස කර්මයන්ගෙන් එකක්.

**උපභොග**. න-(උප + භුජ + ණ) ලඟට පැමිණ විඳිය යුතු සම්පත්තිය.

**උපමාතු**. ඉ-උපමාතාව, පුංචි අම්මා. කිරිමව.

**උපමාන**. න-(උප + මා + යු=අන) උපමානය, සමාන කිරීම.

**උපයොගරත**. ති-පහවූ, නො ඇළුණු,

**උපරුධි**. ඉ-(උප + රුධි d. රු. ආවරණෙ, ඇවිරීමෙහි + ති) වැලකීම, වැලැක්වීම.

**උපරොධෙති**. ක්‍රි-(උප + රුධි d රු ආවරණෙ ඇවරීමෙහි + ණෙ + ති) පමුණුවයි, ගෙණ යෙයි,

**උපරොප**. න-(උප + රුප + ණ) මල්පැළ, හිඳුවූ පැළ, හිටවූ මල් පැළ, "අජකා පසුකා ආදයො **උපරොපෙ** විහෙඨෙන්ති."

(6669)

**උපලාපෙති.** ක්‍රි-(උප + ලප d. තු. ලාලනෙ, නැලවීමෙහි + ණෙ + ති) නලවයි, සඞ්ග්‍රහ කරයි.

**උපලාලන.** න-නැලවීම, සඞ්ග්‍රහ කිරීම.

**උපලාලෙන්ති.** ක්‍රි-(උප + ලාල d. චූ. ලාලනෙ, නැලවීමෙහි + ණෙ + න්ති) නලවත්, සඞ්ග්‍රහ කරත්.

**උපලාලෙත්වා.** පු-ක්‍රි. (උප + ලාල + ණෙ + ත්වා) නලවා, සඞ්ග්‍රහ කොට.

**උපලිම්පන.** න-(උප + ලිම්ප + යු = අන) ගැල්වීම, ආලෙපනය කිරීම.

**උපලිම්පිත්වා.** පු-ක්‍රි-(උප + ලිම්ප + ඉ + ත්වා) ආලෙප කොට, ගල්වා, ගා.

**උපවත්තන.** න-උපවත්තන සල් උයන, කුසිනාරා නුවර මල්ල රජුන්ගේ සල් උයන. බුදුරජාණන් වහන්සේ පිරිනිවන් පෑවේ මෙහිදීය.

**උපවන.** න-උපවනය, ගෙවුයන, උයන.

**උපවස.** ක්‍රි-(උප + වස d. භූ. වසනෙ වැසීමෙහි + අ) වසව, පෙහෙවස් වසව, සිල් ගනුව, "උපොසථං උපවස."

**උපවසිත්වා.** පු-ක්‍රි-(උප + වස + ඉ + ත්වා) වැස, වස් එළඹ, පෙහෙවස් වැස, "උපොසථං උපවසිත්වා."

**උපවස්සං.** පු. ක්‍රි. (උපවස්ස) වස් වැස, වස් එළඹ "උපවස්සං ඛො පන කත්තික පුණ්ණමං"

**උපවාද.** පු-(උප + වද + ණ) චොදනා කිරීම. දෙස් කීම, අගුණ කීම, ආයෙචිාප වාදය.

**උපවාදනා.** ඉ ආක්‍රොෂ කිරීම, චොදනාව,

**උපවාස.** න-(උප + වස + ණ) උපවාසය, අහර ගැනීමෙන් වෙන්ව සිටීම, උපොසථය.

**උපවීණා.** ඉ-වීණා දණ්ඩ.

**උපවෙසන.** න-(උප + විස + යු = අන) එළඹ හිඳීම, හිඳීම.

**උපසග්ග.** පු-උපසර්ගය, නාම ආඛ්‍යාත පදයන් සමග යෙදෙන ප, පරා ආදිය, උපසග්ග විස්සකිං උපද්‍රව්‍යය, උවදුර, ප්‍රවාසය.

**උපසඞ්කමි.** ක්‍රි-(උප + සං + කමු. d. භූ. පද වික්ඛෙපෙ, යාමෙහි + ඊ) පැමිණියේය, එළඹියේය.

**උපසන්ත** ති-ශාන්ත වූ, උපශාන්ත වූ "උපසන්තස්ස සදා සතීමතො."

**උපසම.** පු-සන්සුන්කම, සන්සිඳීම, කෙලෙසුන් ගෙන් සන්සිඳීම, "උපසමාය අභිඤ්ඤාය සම්බොධාය නිබ්බාණාය සංවත්තති."

**උපසම්පජ්ජ.** පු-ක්‍රි-පැමිණ, එළඹ, "තතියජ්ඣානං උපසම්පජ්ජ විහාසිං"

**උපසම්පජ්ජිස්සාමි.** ක්‍රි-(උප + සං + කමු. d. පද වික්ඛෙපෙ, යැමෙහි + ස්සාමි) පැමිණෙන්නෙමි. උපසපත් වන්නෙමි.

**උපසම්පත්ති.** ඉ - (උප + සං + පද + ති) උපසම්පදාව, උපසම්පත්තිය, උපසපත්වීම.

**උපසම්පදා.** ඉ-(උප + සං + පද + අා) වැඩීම, වෘඩිය, කුසලයන්ගේ වැඩීම, "කුසලස්ස උපසම්පදා" උපසම්පදාව, උසස් බවට පැමිණීම, "සඞ්ඝං භන්තෙ උපසම්පදං යාචාමි"

**උපසම්පදාචරිය.** පු-උපසම්පදාව දුන් ආචාර්‍ය්‍ය වරයා.

**උපසම්පදාකම්ම.** න-උපසම්පදා කර්මය, ඤත්ති චතුත්ථක උපසම්පදා කර්මය.

**උපසම්පදා කම්මවාචා.** ඉ-උපසම්පදා කර්ම වාක්‍යය, ඤත්ති චතුත්ථක උපසම්පදා කර්මය "සුණාතු මෙ භන්තෙ අයං නාගො — එසා ඤත්ති තස්මා තුණ්හී එව මෙතං ධාරයාමි."

**උපසම්පදාඤත්ති.** ඉ-උපසම්පදා කර්මය, උපසම්පදා ඤත්තිය.

**උපසම්පදා පරියෙසනා.** ඉ-උපසම්පදා වීම, උපසපන් බව සෙවීම.

**උපසම්පදාපෙඛ.** පු-උපසම්පදාව ලබන්නට බලාපොරොත්තු වන්නා. උපසම්පදාපෙක්ෂකයා, "තෙන ඛො පන සමයෙන ආයස්මතො මහාකස්සපස්ස උපසම්පදාපෙඛා හොති."

**උපසම්පන්න.** ති-උපසපන් වූ, උපසම්පදාව ලැබූ "අනුජානාමි භික්ඛවෙ උපසම්පන්න සමනන්තරා නිස්සයෙ ආචික්ඛිතුන්ති."

**උපසම්පාදෙති.** ක්‍රි-(උප + සං + පද. d. භූ. ගතියං + ණෙ + ති) උපසපත් කරවයි, සාමණේර බැවින් මුදා භික්ෂු භාවයට පත් කරයි. "තෙන ඛො පන සමයෙන භික්ඛූ දුවග්ගෙනපි තිවග්ගෙනපි ගණෙන **උපසම්පාදෙන්ති.**"

**උපසම්පාදෙතබ්බ.** ති-උපසපත් කටයුතු, භික්ෂු භාවයට පැමිණ විය යුතු.

**උපසම්මති.** ක්‍රි-(උප + සමු d. දි. උපසමෙ, උපසමයෙහි + ති) නිවේ, සන්සිඳේ. "නහි වෙරෙන වෙරානි සම්මන්තීධ කුදාචනං, අවෙරෙන ච **සම්මන්ති** එස ධම්මො සනන්තනො."

**උපසංහට.** ති-ඉදිරිපත් කළ, එළ වූ.

**උපසංහරති.** ක්‍රි-(උප + සං + හර. d. භූ. හරණෙ, හැරීමෙහි + ති) ඉදිරිපත් කරයි, එළවයි.

**උපසිඞ්ඝතු.** ක්‍රි-(උප + සිඞ්ඝ. d. ත. සිඞ්ඝණෙ + තු) ආඝ්‍රාණය කෙරේවා, සිඹීවා, ආලිඞ්ගනය කෙරේවා. "ඉමං භන්තෙ භගවා පඨමං උප්පල හත්ථං **උපසිඞ්ඝතු.**"

**උපසිඞ්ඝී.** ක්‍රි-(උප + සිඞ්ඝ. ත. සිඞ්ඝණෙ සිඹීමෙහි + ඊ) ආඝ්‍රාණය කෙළේය. සිඹිබේය.

**උපසෙචන.** න-ව්‍යඤ්ජන, මාළු.

**උපස්සග්ග.** පු-විපත්තිය, උවදුර, "මාහොතු උපස්සග්ගො."

**උපස්සට්ඨ.** ති-පීඩිත, පෙළුණු, "**උපස්සට්ඨා** වත හොති."

**උපස්සය.** පු-ගෙය, අරම, උපශ්‍රය, අසපුව, වසන තැන. "තාපසො තං වසං ගහෙත්වා **උපස්සයං.** අගමාසි."

**උපස්සුති.** න-(උප + සු + ත) වචන ඇසෙන දුර ප්‍රමාණය, වචන ඇසෙන සමීපය. "**උපස්සුතිං**ති සුති සමීපං."

**උපහත.** ති-(උප + හන + ත) නැසුනු, ක්ෂය වූ, "ඛතං **උපහතං** අත්තානං පරිහරාමි."

**උපහතින්ද්‍රිය.** න-නැසුනු ඉන්ද්‍රිය ශක්තිය ඇති, ක්ෂය වූ ශ්‍රද්ධාදි ඉන්ද්‍රියන් ඇති.

**උපහාර.** පූජාව, පිදීම, "**උපහාරං** කරිස්සාමි"

**උප්පජ්ජති.** ක්‍රි-(උප + පද. d. දි. ගතිමහි, යාමෙහි + ප ද්විත්වය. යකාරයට, ය + ද=ජ ජකාරද්විත්වය + ති) උපදියි. බිහිවෙයි.

**උප්පජ්ජන.** න-බිහිවීම, උපදීම.

**උප්පජ්ජනක.** පු-උපදින්නා, ඇතිවන්නා.

**උප්පජ්ජිත.** ති-ඇතිවූ, ඉපදුනු.

**උප්පටිපාටිය.** පු-පිළිවෙළ ඉක්මවීම, උප්පටිපාටිය.

**උප්පණ්ඩන.** න-නින්දා කිරීම, උසුලුවිසුලු කිරීම.

**උප්පණ්ඩුප්පණ්ඩුක ජාත.** ති-කලකිරීමෙන් කහපාටට පැමිණි. සුදුමැලි බවට පැමිණි, "කිසො ලූඛො දුබ්බණ්ණො **උප්පණ්ඩු පණ්ඩුකජාතො** ධමනිසන්ථතගත්තො."

**උප්පණ්ඩෙති.** ක්‍රි-(උ + පණ්ඩ d. චු. පරිහාසෙ, බැණීමෙහි + ණෙ + ති) බණියි, බැණ වැදියි.

**උප්පතති.** ක්‍රි-(උ + පත d. භූ. ගමනෙ, යාමෙහි + ති) පනියි, පියාඹයි.

**උප්පතිත.** ති-පනින ලද, පියාඹන ලද.

**උප්පත්ති.** ඉ-ඉපදීම, උත්පත්තිය, පුනරුත්පත්තිය, මූල ප්‍රකෘතිය, නිපදවීම, ඌර්ධ්ව ගමනය.

**උප්පත්ති දෙව.** පු-දෙව්ලොව දෙවියෝ.

**උප්පථ.** පු-වැරදි මාර්ගය.

**උප්පන්න.** න-නිපන්, උපන්, උත්පත්තිය.

**උප්පබ්බජති.** ක්‍රි-(උ + ප + වජ. d. භූ. ගමනෙ, යාමෙහි + ති) සිවුරු හැරයෙයි. ගිහිවෙයි.

**උප්පබ්බජිත.** ති-සිවුරු හැර ගිය, නැවත ගිහි බවට පත්වූ,

**උප්පල.** න-මහනෙල්, උපුල්.

**උප්පලක** පු-උපුල් වැනිවූ.

**උප්පලිනී.** ඉ-මහනෙල් මල් පොකුණ, නෙළුම් පොකුණ.

**උප්පාතන** න-මුලින් උදුරාදැමීම, විනාශකිරීම.

**උප්පාතෙති.** ක්‍රි-(උ + පත. d භූ ගමනෙ, යාමෙහි + ණෙ + ති) උදුරා දමයි, විනාශ කරයි.

**උපපාද**. පු-උත්පත්තිය, ඉපදීම, චන්ද්‍රග්‍රහණාදිය.

**උපපාදක**. පු-උපදවන්නා, උත්පත්තිය ඇති කරන්නා උඩුවූ පා ඇත්තා. සරභ නම් පා අටක් ඇති මෘගයා, මොහුට බඩ පැත්තේ පා සතරක් ද පිට පැත්තේ පා සතරක් ද තිබේ.

**උපපාදන** න-ඉපදීම, උත්පත්තිය

**උපපාදේති**. ක්‍රි-(උ + පද d. දි. ගතෙ, යාමෙහි + ණෙ + ති) උපදවයි. ඇතිකරයි.

**උපපිලාවති**. ති-(උ + පිලු d. භූ. ගමනෙ, යාමෙහි + ති) පනියි.

**උපපිල**. පු-පීඩා කිරීම, විනාශ කිරීම,

**උපපීළිත** ති-පීඩා කරණ ලද, හිරිහැර කරණ ලද.

**උපපීළෙති**. ක්‍රි (උ + පීළ d. චු. විබාධායං, පෙළීමෙහි + ණෙ + ති) පෙළයි. පීඩා කරයි

**උපකප්පති**. ක්‍රි-(උප + කප්ප. d. කප්පනෙ, කැපවීමෙහි + ති) කැපකරයි. කැපවෙයි.

**උපකප්පනක**. ති-හිමිවිය යුතු, ලාභ ලැබෙන ප්‍රයෝජනවත්.

**උපකප්පිත**. ති-කැපකල, සරසනලද, අයිති කල.

**උපකරණ**. න-අනුකරණය, කටයුතු සිද්ධියට ඕනෑකරණ දේ.

**උපකරොති**. ක්‍රි-උප + කර. d. ත. කරණෙ. කිරීමෙහි + ඔ + ති) කෙරෙයි, අනුව කෙරෙයි.

**උපකාර**. පු උපකාරය, උදව් කිරීම, "බහූප කාරා භික්ඛවෙ මාතාපිතරො පුත්තානං."

**උපකාරී**. පු-උපකාර කරන්නා, උපකාර ඇත්තා.

**උපකිණ්ණ**. ති-ගැවසීගත්, විසුරුණු.

**උපකිරියා**. ඉ-අනුක්‍රියාව, උපකරණ, ආභරණ.

**උපකුම්භ**. පු-කලය සමීපය. කුම්භය ලඟ,

**උපකූජති**. ක්‍රි-(උප + කුජ. d. භූ. කූජනෙ, අව්‍යක්ත ශබ්දයෙහි + ති) සමීපව ශබ්ද කරයි.

**උපකූජන**. න-සමීපව ශබ්ද කිරීම.

**උපකූජිත**. ති-ශබ්දකල, නාද කල.

**උපකූල**. න. කූල සමීපය. ගංඉවුර, ගංගා සමීපය.

**උපකූලිත**. ති-ගායනා කල, තැම්බූ, බැදපු

**උපඛාරි**. ඉ-ඛාරියකට අධික. ඛාරි බලනු.

**උපගගහ**. පු-බලාත්කාරයෙන් ගෙණ අය,

**උපගණ්හන**. න-ගැණීම, උද්ග්‍රහණය.

**උපගණ්හනා**. ඉ-ගැණීම, තැබීම, භාවනා කිරීම

**උපගණ්හාති**. ක්‍රි-(උප + ගහ d. භූ උපාදනෙ ගැණීමෙහි. හ=ණ්හා + ති) ගණී ලඟට ගණී.

**උපගමන**. න-ලඟට පැමිණීම, සමීපයට යාම.

**උපගමනක**. පු-සමීපයට යන්නා.

**උපගලිත**. ති-ගිලිහෙනලද, ගිලිහුනු.

**උපගහන**. න-හුන්තැනට යවන පඬුර.

**උපගීති**. ඉ-උපගීති නම් වෘත්තය. ආර්‍යාගීතී වෘත්තයාගේ විතීය අඩියට තියමිත හැම ලක්ෂණයන්ගෙන් යුක්තවූ වෘත්තය.

**උපගු**. න-ගවයන්ගේ සමීපය.

**උපගුහති**. ක්‍රි-(උප + ගුහ. d. භූ. සංවරණෙ වැසීමෙහි + ති) වසයි, සංවරණය කරයි. වැළඳ ගණියි. ලඟ හිඳියි.

**උපගුහන**. න-සැඟවීම, වැසීම, වැළඳගැණීම.

**උපගුහිත**. ති-සඟවන ලද, වැළඳ ගන්නා ලද.

**උපග්වාදි**. පු-උපගු මනු, භගු ආදිවූ ශබ්ද ගණය.

**උපඝට්ටන**. න-ගැටීම. ඝට්ටනය.

**උපඝට්ටිත**. ති-ගසනලද, නැසූ.

**උපඝාතන**. න-නැසීම, මැරීම.

**උපඝාතක**. පු-නසන්නා, පීඩා කරන්නා.

**උපඝාතක කම්ම**. න-කුශල් වූ හෝ අකුසල් වූ දුර්වල කර්මයෙහි විපාක නැතිකොට විපාක දෙන බලවත් කර්මය."

(6779)

**උපඝාති**. පු නසන, පීඩා කරණ.

**උපඝාතෙති**. ක්‍රි-(උප + හන=ඝාත. d. චු. නාසෙ, නැසීමෙහි + ණෙ + ති) නසයි.

**උපචක්ඛු**. න-උපනෙත්‍රය. කන්නාඩිය, ඇසේ දමන කන්නාඩිය.

**උපචයරාසි**. ඉ-ජන්ම ලග්නයෙන් 3. 6. 10. 11 වෙනි ස්ථාන.

**උපචරති**. ක්‍රි-(උප + චර. d. භූ. සංවරණෙ, හැසිරීමෙහි + ති) හැසිරෙයි අනුවයෙයි.

**උපචරිත**. ති-හැසිරෙණ ලද, එළඹෙන ලද, අභෙදයෙන් ව්‍යවහාර කරන ලද.

**උපචිකා**. ඉ වේයා.

**උපචිකා මක්ඛිකා**. න-වේපස්, කැඩුනු බිඳුනු දේ.

**උපචිත්‍රා**. ඉ-උපචිත්‍රා වෘත්තය, මාත්‍රාසමක ජාතීන් අතුරෙන් සවන වෘත්තය.

**උපචිණ්ණ**. ති. රැස්කළ, පුරුදුකළ.

**උපචිණාති**. ක්‍රි-(උප + චි. d. කි. චයෙ, රැස් කිරීමෙහි + ණා + ති) රැස් කරයි. රාශිභූත කරයි.

**උපචිත**. ති-රැස්කළ, එකතු කළ.

**උපච්චය**. පු-අතික්‍රමය. ඉක්මවීම.

**උපචිනන**. න-රැස් කිරීම, රාශිභූත කිරීම.

**උපච්චකා**. ඉ-පර්වත සමීප බිම.

**උපච්චගා**. අ-(උප + අති + ගා) ඉක්ම ගියේය. “මාතං කාලො උපච්චගා”

**උපචවති**. ක්‍රි-(උප + චි d භූ. චයෙ, රැස් කිරීමෙහි + ති) බිඳෙයි, විනාශවෙයි.

**උපච්ඡින්දති**. ක්‍රි-(උප + ඡිදි. d. රු. ද්වෙධා කරණෙ, දෙපලු කිරීමෙහි + ති) සිඳියි.

**උපච්ඡින්න**. ති-සිඳින ලද, කපන ලද.

**උපච්ඡෙද**. පු-සිඳීම, කැපීම.

**උපච්ඡෙදක**. පු-සිඳීම, කැපීම.

**උපජුම්භති**. ක්‍රි-(උප + ජුභ + ති d. රු නිවජු හෙ, කාරා දැමීමෙහි + ති ඉදිරියට වීසි කරයි.

**උපච්ඡෙදකකම්ම**. න-එක කර්මයකින් විපාක විඳින අතර අන්‍යකර්මයකින් එය සිඳදැමීම ඒ දෙවෙනි කර්මය.

**උපජ්ඣා**. පු - උපාධ්‍යාය, උපාධ්‍යායයන් වහන්සේ,

**උපජ්ඣාය**. පු-උපාධ්‍යායයා, භික්ෂූන්ගේ මහණ උපසම්පදා දෙක්හි ප්‍රධාන වන තෙරුන් වහන්සේ, කුදු මහත් වරද පෙන්නා චෝදනා කරන්නා, සික්කරන්නා. “**උපජ්ඣායො** මෙ භන්තෙ හොහි”

**උපජ්ඣායති**. ක්‍රි-(උප + ඣෙ d භූ චින්තායං සිතීමෙහි + ති) සිතයි. පනවයි. කියයි.

**උපජ්ඣාචරිය**. පු-උපාධ්‍යායාචාර්යවරයා, උපාධ්‍යායවූ ගුරුවරයා.

**උපජ්ඣායකිච්ච**. න-උපාධ්‍යාය කෘත්‍යය, අධිකරණ නොවන කෘත්‍යය.

**උපජ්ඣායකිත්තන**. න-(උප + ජ්ඣෙ + කිත්ත + යු=අන) උපාධ්‍යයන් කීම, “උපජ්ඣායො මෙ භන්තෙ ආයස්මා තිස්සත්ථෙරොනාම.”

**උපජ්ඣායගහණ**. න-උපාධ්‍යායන්ගේ ගැණීම, “උපජ්ඣායො මෙ භන්තෙ හොහි” යන වාක්‍යයෙන් උපාධ්‍යායයන් ගැණීම.”

**උපජ්ඣායචතුක්ක**. න-උපාධ්‍යාය චතුෂ්කය, පරිවාර පාළියෙහි එන චතුෂ්ක භෙදයෙන් එකක්.

**උපජ්ඣාය මත්ත**. පු-උපාධ්‍යායයන් සමානවූ භික්ෂු, උපාධ්‍යාය මාත්‍ර.

**උපජ්ඣාය මූලක**. ති-උපාධ්‍යායයන් ප්‍රධාන කොට, උපාධ්‍යායයන් මූලික කොට පැවිද්දෙහි හා උපසම්පදාවෙහිත් උපධ්‍යාය යෝ මූලිකවෙත්) “සචෙ අඤ්ඤෙ භික්ඛූ පුබ්බො නගෙගා ආගච්ඡන්ති උපජ්ඣායමූලකං චීවරං පරියෙසි තබ්බං.”

**උපජ්ඣාය ලෙස**. න-උපාධ්‍යායන්ගේ සවභාවය, ආකාරය, පිළිවෙළ.

**උපජ්ඣායවත්ත**. න-උපාධ්‍යායවත්, සද්ධිවිහාරිකයන්ට උපාධ්‍යායයන් විසින් කළ යුතුවත්, සද්ධිවිහාරිකයන් විසින් උපාධ්‍යායයන්ට කළ යුතු වත්, "සචෙ උපජ්ඣායො ගිලානො හොති යාවජීවං උපට්ඨාතබ්බො" යනාදීන් දක්වන උපස්ථානාදිය එබඳු වතාවත් 152 ක් පමණ වෙති.

**උපජ්ඣායවෙවචන**. න-උපජ්ඣාය පර්‍යායවචන, උපාධ්‍යාය ශබ්දයට සමාන අර්ථ ඇති වචන.

**උපජ්ඣාය සමොධාන**. න-(උප+ඣෙ+සං+අව+ධා+යු=අන) උපාධ්‍යායයන්ගේ දර්ශනය, උපාධ්‍යායයන්ගේ ශබ්ද ශ්‍රවණයෙන් එක්වීම, උපාධ්‍යායයන්ගෙන් ගත් නිස උපජ්ඣාය සමොධානයෙන් බිඳේ.

**උපජ්ඣායං පච්චක්ඛාමි**. ක්‍රි-උපාධ්‍යායයන් ප්‍රත්‍යාඛ්‍යානය කරමි. ශික්ෂා ප්‍රත්‍යාඛ්‍යාන දෙවිසි ක්ෂෙත්‍රවලින් එකක්.

**උපජානාති**. ක්‍රි-(උප+ඤා d. කි. අවබොධනෙ, අවබොධයෙහි. ඤා=ජා+නා+ති) දනී, දැනගණී.

**උපජාප**. පු-භෙදය, කේලාම් කියා බිඳුවීම.

**උපජීවක**. පු අනුව ජීවත්වන්නා.

**උපජීවන**. න-අනුව ජීවත්වන.

**උපජාති**. ඉ එනම් ඡන්දස.

**උපජීවති**. ක්‍රි-(උප+ජීව d. භූ. පාණධාරෙණ, පණඳරීමෙහි+ති) අනුව ජීවත්වෙයි.

**උපජීවී**. ති-අනුව ජීවත්වන්නා, මෙහෙ කරන්නා.

**උපජූත**, න-ක්‍රීඩාවන්හි ඔට්ටු තැබීම.

**උපඤ්ඤාස**. පු-කථාරම්භය, කථාව පටන් ගැන්ම. "උපඤ්ඤාසො වචීමුඛං,"

**උපඤ්ඤාසි**. ක්‍රි-(උප+අඤ්ඤාසි) දැනගත්තේය, ප්‍රතිවෙධ කෙළේය.

**උපට්ටිත**. ති-වෙදනා කරණලද, භයගන්වන ලද, මැඩපවත්වනලද.

**උපට්ඨපෙති**. ක්‍රි-(උප+ඨා d. භූ. ගති නිවුත්තියං, ගමන් නැවැත්මෙහි+ණෙ+ති) උපස්ථාන කරවයි.

**උපට්ඨහං**. අ-ප්‍රථමා එකවචන. උපස්ථාන කරමින්.

**උපට්ඨහති**. ක්‍රි-(උප+ඨා d. භූ. ගතිනිවුත්තියං, ගමන් නැවැත්මෙහි+ති) උපස්ථාන කරයි, ළඟට එළඹෙයි.

**උපට්ඨහියමාන**. ති-උවටන් කරණු ලබන.

**උපට්ඨාන සම්භාර**. පු-උපස්ථානයට උවමනා ද්‍රව්‍ය.

**උපට්ඨාපන**. න-උපස්ථාන කිරීම.

**උපට්ඨිතසති**. ඉ එළඹ සිටි සිහිය, වික්ෂෙප නොවූ සිහිය.

**උපට්ඨෙති**. ක්‍රි-(උප+ඨා d. භූ. ගතිනිවුත්තියං, ගමන් වැලැක්මෙහි+ණෙ+ති) පිහිටුවයි.

**උපඩ්ඪ**. පු-(උප+අඩ්ඪ) අර්ධය, දෙකෙන් කොටස.

**උපඩ්ඪපථ**. පු-අර්ධමාර්ගය, අඩමග.

**උපඩ්ඪුපඩ්ඪ** පු-(උප+අඩ්ඪ+උප+අඩ්ඪ) අර්ධයෙන් අර්ධය, කොටසින් කොටස. සතරෙන් පංගුව.

**උපඩ්ඪුපොසථ**. පු-(උප+අඩ්ඪ+උපොසථ) අඩපොහොය. පසළොස් පැයක් රක්නා උපොසථය.

**උපඩය්හති**. ක්‍රි-(උප+දහ d. භූ භස්මීකරණෙ, හළුකිරීමෙහි. දහ=ඩය්හ+ති) දවනු ලැබේ.

**උපතප්පති**. ක්‍රි-(උප+තප්ප d. භූ. තප්පනෙ, තැවීමෙහි+ති) තැවෙයි, සන්තාප කරයි.

**උපතප්පන**. න-තැවීම, තැවිල්ල.

**උපතාප**. පු-තාපය, තැවීම.

**උපතාපන**. න-තැවීම, පසුතැවිල්ල.

**උපතාපික**. ති-තැවීමට හෙතුවූ, පසුතැවිලිවූ.

**උපතාපිත**. ති-තවනලද, තැවීම කරණ ලද,

**උපතාපෙති**. ක්‍රි-(උප+තප d. චු. තාපෙ, තැවීමෙහි+ණෙ+ති) තැවෙයි, පසුතැවිලි වෙයි.

**උපතිට්ඨති**. ක්‍රි-(උප+ඨා d. භූ. ගතියං, ඨාමෙහි. ඨා+තිට්ඨ+ති) එළඹ සිටියි.

**උපතිට්ඨෙය්‍ය**. ක්‍රි-(උප + ඨා d. භූ. ගතියං, යාමෙහි, ඨා=තිට්ඨ + එය්‍ය) එළඹ සිටින්නේය.

**උපතිස්ස**. පු-සාරිපුත්ත මහරහතන් වහන්සේ.

**උපත්ත**. ති ගාතලද, තවරණලද.

**උපත්ථ**. පු-තදබව, දෘඪබව.

**උපත්ථද්ධ**. ති-දෘඪ, තද.

**උපත්ථම්භ**. පු-(උප + ථම්භ) රුකුළ, උදව්ව, වැටීමටයන ගස් ආදීයට දෙන කණුව.

**උපත්ථම්භක**. පු- රුකුල් දෙන්නා, උදව් දෙන්නා.

**උපත්ථම්භන**. න-රුකුල්දීම, උදව්දීම.

**උපත්ථම්භිත**. ති-රුකුල් දෙන ලද, උදව් දෙන ලද.

**උපත්ථම්භති**. ක්‍රි-(උප + ථම්භ d භූ. පතිබන්ධෙ, තදවීමෙහි + ති) රුකුල්දෙයි, උදව්දෙයි.

**උපත්ථර**. න-පලස, කම්බිලිය,

**උපත්ථෙය්‍ය**. න-කොට්ටය, කුෂන්එක.

**උපද්දව**. පු-උපද්‍රවය, විපත, උවදුර.

**උපද්දවති**. ක්‍රි – (උප + දු d. භූ. දවනෙ, කෙළි-මෙහි + ති) උපද්‍රව කරයි, පීඩා කරයි.

**උපදා**. ඉ-හුත් තැනට යවන පඬුර.

**උපදිසති**. ක්‍රි-(උප + දිස d. භූ. පෙක්ඛනෙ, බැලීමෙහි + ති) දක්වයි, බලයි.

**උපදුස්සති**. ක්‍රි-(උප + දුස d. භූ. අප්පීතියං, ප්‍රීතිනොවීමෙහි + ති) දූෂ්‍යකරයි.

**උපදෙව**. පු-අනු දෙවියා, දෙවෙනි දෙවියා.

**උපදෙස**. පු උපදෙශය, පරම්පරාගත උප දෙස්, අනුශාසනා කිරීම, යහපතකීම, අභි වෘද්ධි මාර්ගයට හිත දේ කීම.

**උපධා**. ඉ-අන්ත්‍යාක්ෂරයට මුලින් පිහිටි අකුරට සංඥාවකි.

**උපධාන**. න-බිම්බෝහනය, කොට්ටය.

**උපධාරෙති**. ක්‍රි-(උප + ධර d. චු. ධාරණෙ, දැරීමෙහි + ණෙ + ති) බලයි, සොයයි.

**උපධාරණ**. න-බැලීම, සෙවීම.

**උපධාරණා**. ඉ-භාජනය, බඳුන.

**උපධාරිත**. ති-බලන ලද, සොයන ලද.

**උපධාවති**. ක්‍රි-(උප + ධාවු d. භූ. ධාවනෙ, දිවීමෙහි + ති) දුවයි, අනුව ධාවනය කරයි.

**උපධාවන**. න-අනුව දිවීම, පස්සෙන් දිවීම.

**උපධි**. ඉ-ශරීරය, රථාවයව, සටබව, උපා රම්භය, කාමාධිචතුර්විධ උපධි. කෙලෙස්, රත්මිරිවැඩි, පඤ්චස්කන්ධය, "එතං මලං **උපධීසු** ඤත්වා"

**උපධික** ති-උපධියෙන් යුත්, උපධි ඇති.

**උපධිසම්පන්න**. ති-සරීර සොභාවෙන් සම්පූර්ණ,

**උපධිවිවෙක**. න-උපධි විවේකය, කාම, ඛන්ධ, කිලෙස අභිසංඛාර යන මෙයින් වෙන්වූ නිවණ.

**උපධිසඞ්ඛය**. න-මාර්ගඥානය, නිර්වාණය, නිවන. "අනුත්තරෙ **උපධිසඞ්ඛයෙ**"

**උපධිසම්පදා**. ඉ-ශරීර සමපත්තිය, උපධි සමපත්තිය.

**උපනත**. පු-ප්‍රත්‍යන්තය, පසල්දනව්ව, සමීපය.

**උපනන්තික**. ති-සමීපස්ථ, ලඟ, ලඟපිහිටි.

**උපනන්තසෙල**. පු-ප්‍රත්‍යන්ත පර්වතය.

**උපනබ්‍ය**. න-කුෂන් එක, ඇඳ පුටු ආදිය පුළුන් හෝ කොහු දමා ලක්ෂණ රෙද්දකින් වසා මසා දමන එකට කුෂන් කිරීමයි කියත්.

**උපනගර**. න-සමීප නගරය, අනුනගරය.

**උපනච්ච**. න-නැටීම, අනුව නැටීම.

**උපනච්චති**. ක්‍රි-(උප + නච්ච d. භූ. නච්චනෙ, නැටීමෙහි + ති) නටයි, අනුව නටයි.

**උපනත**. ති-සමීපයට පැමිණි. එළඹ සිටි. නැමුණු

**උපනදති**. ක්‍රි-(උප + නද d. භූ. අව්‍යත්ත සද්දෙ, නොවියත් ශබ්දයෙහි + ති) නාද කරයි, අනුව නාද කරයි.

**උපනමති**. ක්‍රි-(උප + නම d. භූ. නමනෙ, නැමීමෙහි + ති) සමීපයට නැමෙයි.

(6892)

**උපනමන**. න-සමීපයට නැමීම, අවනත්වීම.

**උපනයන**. න-අධ්‍යයනය සඳහා ගුරුන් වෙතට බාලයන් පැමිණවීම, නැකතට අත පොත් තැබීම, උපනයන මඞ්ගලය.

**උපනය්හති**. ක්‍රි-(උප + නහ d. දි. බන්ධනෙ, බැඳීමෙහි. ය + ති) බඳියි. "පූතිමච්ඡං කුසග්ගෙන යො නරො **උපනය්හති**."

**උපනය්හන**. න-බැඳීම, බන්ධනය.

**උපනද්ධ**. ති-නිග්‍රහ කළ, පරිභව කළ.

**උපනන්ධති**. ක්‍රි-(උප + නන්ධ. d. තු. විනන්ධනෙ, වැළඳගැන්මෙහි + ති) පරිභව කරයි, නිග්‍රහ කරයි.

**උපනායක**. පු-දෙවෙනි නායක, අනුනායක.

**උපනායිකා**. ඉ-උපනායිකාව, දෙවැනි නායිකාව.

**උපනික්ඛ** පු-නික්ඛයකට අධික

**උපනික්කමති**. ක්‍රි-(උප + නි + කමු d. භූ. පදවික්ඛෙපෙ, යාමෙහි + ති) යයි

**උපනික්කමන**. න - නික්මීම. බැහැරයෑම, පිටතයාම.

**උපනික්ඛමති**. ක්‍රි-(උප + නි + කමු d පද-වික්ඛෙපෙ, යාමෙහි, ක=ක්ඛ + ති) බැහැර යෙයි.

**උපනික්ඛමන**. න-නික්මයාම, බැහැරයෑම.

**උපනික්ඛිපති**. - (උප + නි + ඛිප d භූ. ඛෙපනෙ, ඉවතදැමීමෙහි + ති) ලඟතබයි, බහාතබයි. "සො ආසනං පඤ්ඤපෙති පාදෙදකං— උපනික්ඛිපති"

**උපනිඝංසන**. න-ගෑටීම, හැපීම, ඝට්ටණය කිරීම.

**උපනිජ්ඣායිත**. ති-බලනලද, නිරීක්ෂණය කළ.

**උපනිධා**. ඉ-උපමාව, සමානකිරීම,

**උපනිධාය**. අ-කරුණුකොටගෙණ, හෙතු-කොට ගෙණ.

**උපනිධි**. ඉ-උක්ඛ. සමීපයෙහි තැබීම, **උපනිධි**-නාම උපනික්ඛිත්තං භණ්ඩං."

**උපනිධිකථා**. ඉ - උපනිධිවස්තූන් පිළිබඳ කථාව.

**උපනිපජ්ජති**. ක්‍රි-(උප + නි + පද d. දි. ද = ජ්ජ + ති) සමීපයෙහි හොවී.

**උපනිබජ්ඣති**. ක්‍රි-උපනිබන්ධති බලනු.

**උපනිබන්ධන**. න - බැඳීම. "කම්මට්ඨාන සංඛාතො චිත්තස්ස උපනිබන්ධනට්ඨානතො."

**උපනිබ්බත්ත**. ති-උපන්, හටගත්නා ලද.

**උපනිවත්තති**. ක්‍රි-(උප + නි + වත්ත d. භූ. වත්තනෙ, පැවතිමෙහි + ති) පෙරළාඑයි, ආපසු එයි.

**උපනිබ්බත්තති**. ක්‍රි (උප + නි + වතු d. භූ. වත්තනෙ, පැවැත්මෙහි ච = ච්ච = බ්බ + ති) උපදී.

**උපනිබ්බත්තන**. න-උපදවන, හටගන්නා.

**උපනිභ**. ති-සමාන, තරමක්දුරට සමාන.

**උපනිස්සයති**. ක්‍රි-(උප + නි + සි d. භූ. සයෙ, සයනයෙහි + ති) ආශ්‍රයකෙරෙයි

**උපනිස්සිත**. ආශ්‍රය කළ, සෙවනය කළ.

**උපනිස්සිතක**. පු-ආශ්‍රය කළ තැනැත්තා, පිරිසට අයත්තා ගෝලයා.

**උපනිස**. පු හෙතු, රහස්.

**උපනිසීදති**. ක්‍රි උප + නි + සද d භූ විසරණ ගත්‍යවසාදනෙ, විසිරීම හා ගමන් වැළකීමෙහි + ති) ලඟ හිඳියි.

**උපනිසෙවති**. ක්‍රි-(උප + නි + සි d. භූ. සෙවනෙ, සෙවනයෙහි + ති) සෙවනය කරයි.

**උපනිසෙවන**. න-සෙවනය, ආශ්‍රය.

**උපනිසෙවිත**. ති-සෙවනය කළ, ආශ්‍රය කළ.

**උපනීය**. ති-එළවිය යුතු, පැමිණවිය යුතු ගෙණායුතු.

**උපනීයති**. ක්‍රි-උප + නී d. භූ. පාපණෙ, පැමිණවීමෙහි + ය + ති) පමුණුවනු ලබයි. ගෙණයනුලබයි. "**උපනීයති** ජීවිත මප්පමායු ජරූපනීතස්ස නසන්ති තාණා."

**උපනීල**. න-මදක් කළු නිල්පාට.

**උපනීයමාන**. ති-ගෙණයනු ලබන, පමුණුවනු ලබන.

**උපනෙතබා**. පු. ක්‍රි-ගෙණගොස්. පමුණුවා. එළවා.

**උපනෙති**. ක්‍රි-උප + නී d. භූ. පාපුණනෙ, පැමිණවීමෙහි + ණෙ + ති පමුණුවයි.

**උපනත්‍ති**. නි-ලඟ, සමීපය, ඉදිරිපිට.

**උපනත්‍තික**. ති සමීපය, ඉතාසමීපය.

**උපප්ලවති**. ක්‍රි (උප + පලව d. භූ. ගමනෙ, යාමෙහි + ති) ගමන්කරයි ඉල්පෙයි.

**උපප්ලවන**. **න**-ගමන් කරවන, යාත්‍රාකරවන, පිහිනන, ඉල්පවන.

**උපපජ්ජ**. ති-දෙවෙනි අත්බැව, අනතුරු ආත්මභාවය.

**උපපධූසති**. ක්‍රි-(උප + ධූස d. භූ. එසෙස, සපශීකිරීමෙහි + ති) සපශීකරයි.

**උපපජ්ජති**. ක්‍රි (උප + පද d. දි. ගතියං, යාමෙහි දය=ජ්ජ + ති) උපදී, හටගණී.

**උපපජ්ජවෙදනීය**. පු-දෙවෙනි ආත්මභාවයෙහි විත්දයුතු, අනතුරු අත්බැව්හි විපාක දෙන.

**උපපත්ති**. ඉ-උත්පත්තිය, ඉපදීම, හටගැණීම.

**උපපත්තික**. ති-ඉපදීමට අයිති.

**උපපත්තිදෙව**. පු උත්පත්තියෙන්ම දෙවියා, උපපත්ති දෙවයා.

**උපපති**. ඉ-දෙවෙනි හිමියා, හොර හිමියා.

**උපපද**. න-පූර්වපදය. මුලින්ඇති පදය.

**උපපන්න**. ති-උපන්, හටගත්, පහළවූ.

**උබ්බ**. -d. භූ. ධාරණෙ, දූරීමෙහි. උබ්බති, උසුලයි, දරයි.

**උබ්බති**. ක්‍රි උබ්බ d. භූ. ධාරණෙ, දූරීමෙහි + ති, දරයි.

**උබ්භ**. d. භූ. හිංසනෙ, පීඩාවෙහි. උබ්භති. පෙළයි, පීඩාකරයි.

**උබ්භ**. d. භූ. පූරණෙ, පිරීමෙහි, උබ්භති, පිරෙයි, පූරවයි.

**උබ්භති**. ක්‍රි-(උබ්භ, d. භූ. පූරණෙ, පිරීමෙහි + ති) පුරයි පුරවයි.

**උපම**. පු-උපමාව, සමානභාවය.

**උපමණික**. න-මැණික ලඟ, මැණික සමීපය.

**උපමා**. ඉ-උපමාව, යම් වස්තුවකට සමානකර සැලකීම.

**උපමාතා**. ඉ-කිරිමව, දෙවෙනිමව.

**උපමාතු**. ඉ-දෙවෙනිමව, කිරිමව, කිරිඅම්මා.

**උපමායිත**. ති-ප්‍රමාණ කළ, උපමා කළ.

**උපමාවචන**. න-උපමාකරණුලබන වචන.

**උපමිත**. ති-උපමාකළ, ප්‍රමාණකළ.

**උපමෙය්‍ය**. } පු-උපමාව ලබන්නා, මුබවඳ
**උපමෙය**. } යන්නෙහි මුබ උපමාව, චඳ උපමෙයයි.

**උපය**. පු දෘෂ්ටිනිශ්‍රිත, තෘෂ්ණා දෘෂ්ටි නිශ්‍රිත, සමීපසථ.

**උපයම**. පු-විවාහය. පාණිග්‍රහණය.

**උපපරික්ඛණ**. න-පරීක්ෂාකිරීම, බැලීමෙහි.

**උපපරික්ඛති** ක්‍රි-(උප + පරි + ඉක්ඛ d. භූ. දස්සනඞ්කෙසු, දැකීමෙහි, සලකුණුකිරීමෙහි + ති) දකී, සලකුණුකරයි.

**උපපරික්ඛා**. ඉ-පරීක්ෂාව, මහාකොට පරීක්ෂා කිරීම.

**උපපරික්ඛිත**. ති පරීක්ෂාකළ, විමසූ.

**උපපරික්ඛි**. පු-පරීක්ෂකයා, සොයාබලන්නා.

**උපපාත**. පු-වැටීම, පහළවීම, පුනරුත්පත්තිය,

**උපපාතික**. පු-ඔපපාතික බලනු.

**උපපාදිත**. ති-පහළවන ලද, එළවන ලද, පමුණුවනලද, උපන්.

**උපපාදෙති**. ක්‍රි-(උප + පද d දි. ගතියං, යාමෙහි + ණෙ + ති) උපදවයි, හටගණියි.

**උපපාරමී**. ඉ-උපපාරමිතාව, ශරීර අවයවයන් නොබලා පූරණ පාරමිතාව, බාහිරවස්තු පරිත්‍යාගයෙන් පූරණ පාරමිතාව, පාරමිතා බලනු.

**උපපීඩ**. ති-උපපීළනය.

(6976)

**උපපීළ.** ති-පීඩාව, පෙළීම, හිරිහැරය.

**උපපීඩ(ළ)කකම්ම.** න - එක කුශලා කුශල කර්මයකට විපාකදෙන කල අන්‍යකුශලා කුශල කර්මයකින් ඊට පීඩාකර විපාකදෙන කර්මය.

**උපබ්බජති.** ක්‍රි-උපපබ්බජති බලනු.

**උපබ්බජන.** න-උපපබ්බජන බලනු.

**උපබ්බජිත.** ති-උපපබ්බජිත බලනු.

**උපපුර.** න-ප්‍රධාන නගරය, සමීපයෙහි පිහිටි පුරය, ශාඛා නුවර,

**උපබ්බූළ්හ.** පු-(උප + වහ d තප්‍රත්‍යය ත=හ (ව් අ=උ=වු=වවු=බ්බු, හ=ළ) පීඩා කරණ ලද, උදුරණ ලද.

**උපබ්බූළ්හති.** ක්‍රි-(උපබ්බූළ්හ + ති) පීඩා කරයි, උදුරයි.

**උපබ්බූළ්හ.** න-උද්ධරණය, පීඩණය.

**උපබ්බූළ්හිත.** ති-පීඩා කළ, උදුරණ ලද.

**උපබ්‍රූති.** ක්‍රි-(උප + බ්‍රෑ d. වාචායං, කීමෙහි + ති) කියයි.

**උපබ්‍රෑහණ.** න-වැඩීම, වර්ණනය.

**උපබ්‍රෑහති.** ක්‍රි-(උප + බ්‍රෑහ d. භූ. වඩ්ඪනෙ, වැඩීමෙහි + ති) වඩයි.

**උපබ්‍රෑහිත.** ති-වඩනා ලද වර්ණනය කළ.

**උපභුඤ්ජක.** පු - අනුභව කරන්නා, පසුව වළඳන්නා.

**උපභුඤ්ජති.** ක්‍රි (උප + භුජ d. රු පාලනභ්‍ය වහරණෙසු, පාලනයෙහි, අනුභවයෙහි + ති) රකියි, අනුභව කරයි.

**උපභුඤ්ජන.** න-පරිභොගය, වැළඳීම.

**උපභුඤ්ජිත.** ති පරිභොග කළ, වැළඳූ.

**උපභුත්ත.** ති-පරිභොගකළ, වළඳන ලද.

**උපභොග.** පු-ආහාරානුභවය පිණිස ගනු ලබන කලු තැටි පාත්‍රාදි භාජන, අනුභවය, වැළඳීම, අනුභව කරන්නා, ප්‍රයොජන ගන්නා.

**උපභොගී.** පු-උපභොග ඇත්තා, උපභොග *කරන්නා.*

**උපභොගග.** ති-පරිභොග කළ, වැළඳූ.

**උපමානිත.** ති-උපමා කළ, සමානකොට සලකන ලද.

**උපමෙති.** ක්‍රි-(උප + මා + d චු. පමාණෙ, ප්‍රමාණකිරීමෙහි + ණෙ + ති) කරයි, ප්‍රමාණ කරයි.

**උපමෙය.** ති-උපමා කටයුතු.

**උපමෙයොපමා.** ඉ-(උපමෙය + උපමා) උප-මෙය සහ උපමාව.

**උපමිති.** ඉ-උපමාව සමානකොට සැළකීම.

**උපයාචති.** ක්‍රි (උප + යාච d භූ යාචනෙ, ඉල්වීමෙහි + ති) ඉල්වයි.

**උපයාචිතක.** පු-ඉල්වනලද්ද.

**උපයාති.** ක්‍රි-(උප + යා. d. භූ. ගතියං, යාමෙහි + ති) අනුවයෙයි.

**උපයාන.** න-ඉදිරියට යාම, අභිමුඛ ගමන, සතුරු රජවරුන්ට විරුඬව ඉදිරියට යෑම.

**උපයානක.** පු-අභිමුඛව යන්නා, කකුළුවා.

**උපයුඤ්ජති.** ක්‍රි-උප + යුජ d. රු. යොගෙ, යෙදීමෙහි + ති) යෙදෙයි.

**උපයුඤ්ජන.** න යෙදීම

**උපයුඤ්ජිත.** ති-යෙදෙන ලද.

**උපයුජ්ජමාන.** ති-යොදනු ලබන.

**උපයොග.** පු-යෙදීම. අනුයොගය ඉෂ්ටාර්ථ සාධක ව්‍යාපාරය.

**උපයොග වචන.** නා-විතීයා විභක්ත්‍යන්ත වචනය, **"එකං සමයන්ති උපයොගවචනෙන නිද්දෙසො කතො"**

**උපරචන.** න-අනුව කරණ ලද්ද.

**උපරචිත.** ති-අනුව රචනා කළ, පසුව රචනා කළ.

**උපරජ්ජ.** න-යුව රාජ්‍යය, දෙවෙනි රජකම.

**උපරත.** ති-ඇලීම, ආසාවීම.

**උපරති.** ඉ-ආලය, ආසාව, තණ්හාව.

(7019)

**උපරමති.** ක්‍රි-(උප + රමු d. භූ. කීළායං, ක්‍රීඩා වෙහි + ති) ඇලෙයි, සිත් අලවයි.

**උපරමන.** න-සිත් ඇලවීම, ක්‍රීඩා කිරීම.

**උපරම්භිත.** ති-සිත් අලවන ලද.

**උපරව.** පු-ඝොෂාව, හඬ, ශබ්දය.

**උපරාග.** පු-චන්ද්‍ර සූර්‍ය්‍යයන්ගේ ග්‍රහණය.

**උපරාව.** පු-අනුරාවය, පිළිරැව්.

**උපරාජ.** පු-යුව රජ, දෙවෙනි රජා.

**උපරි.** අ-මතු, මත්තෙහි. සත්තමී විභත්තියෙහි යෙදෙන නිපාත පදයක්,

**උපරිට්ඨ.** පු-මත්තෙහි පිහිටි, අහසෙහි පිහිටි.

**උපරිචර.** ති-අහස්හි හැසිරෙණ, මත්තෙහි හැසිරෙණ,

**උපරිතන.** න උපරිභාවය, මතුභාවය.

**උපරිම කොටි.** ඉ-උඩත් පිරිස, උඩ කෙළවර, අන්තිම පරිච්ඡේදය.

**උපරිකාය.** න-උපරිමකාය, උඩුකය.

**උපරිබාදනීය.** න-කෑයුතු දෙය මතුයෙහි "උපරිබාදනීයෙපි උත්තිට්ඨපත්තං උපනා-මෙනති"

**උපරිගොප්ඵක.** න-ගොප් ඇටයෙන් උඩ.

**උපරිපච්ඡින්න.** න-උඩින් වැසුනු.

**උපරිපාසාද.** න-පහය මත, ප්‍රාසාදය මතුයෙහි "උපරිපාසාදවර ගතො එවං චින්තෙසි"

**උපරිපුඤ්ජ.** ති-ගොඩගසා, උඩරැස්කොට.

**උපරිපුඤ්ජිකත.** ති-එකක් උඩ එකක් තබා ගොඩගැසූ.

**උපරිභාග.** පු-උඩ කොටස, මතුභාගය.

**උපරිභොජන.** න-ආහාරය උඩ, භොජනය මතුයෙහි, "උපරිභොජනෙපි හත්ථං පක්ඛිපන්ති."

**උපරිමුද්ධනි.** න-හිස උඩ, හිස මත්තෙහි.

**උපරිවාත.** න-උඩුදිසාවට හමන වාතය, උඩු සුළඟ, "උපරිවාතෙ තිසිදිතුං න වට්ටති"

**උපරිසායනීය.** න-රස විත්ද යුතු දෙය මත්-තෙහි, එබඳු දෙය උඩ.

**උපරිම.** පු-උපරි භාගයෙහි, උඩ පෙදෙසෙහි.

**උපරිපිට්ඨි.** ඉ-උඩපෙදෙස, වෙදිකාව.

**උපරිභාසා.** ඉ-මතුමත්තෙහි ප්‍රකාශ කරන්නී

**උපරිභාව.** පු-උසස් තත්‍වය, උපරි භාවය.

**උපරිමුඛ.** න-උඩුකුරු මූඛය.

**උපරිය.** පු-උපරිම මතුභාගය.

**උපරිවසන.** න-උඩ ඇඳුම.

**උපරිවාත.** පු--වායුවට උඩ, වාතය උඩ,

**උපරිවිසාල.** ති-බොහෝ පලල.

**උපරිවෙහාස.** න-අහස මතුයෙහි, උඩුමහලේ කාමරය.

**උපරිසච්ච.** න-උසස් සත්‍යය

**උපරුජ්ඣති.** ක්‍රි-(උප රුධි d දි ආවරණෙ වැලකීමෙහි ය + ති) ආවරණ කෙරෙයි.

**උපරුජ්ඣන** න-ආවරණ කිරීම

**උපරුජ්ඣිත** ති-ආවරණයකළ, වසන ලද.

**උපරුද්ධ.** ති-ආවරණය කළ, නැවත්වූ.

**උපරුද්ධි.** ති-ආවරණය කළ වැසූ.

**උපරුන්ධති.** ක්‍රි (උප + රුධි d. රු. ආවරණෙ, වැසීමෙහි, ං + ති) ආවරණ කරයි, වසයි.

**උපරුන්ධන.** න-ආවරණය වැසීම.

**උපරුන්ධිත.** ති-ආවරණය කළ, වැසූ.

**උපරූළ්හ.** ති-නගින ලද, ආරූඪවන ලද, ආරූළ්හ බලනු.

**උපරොචති.** ක්‍රි-උප + රුච d. භූ. රොචෙ, දිත්තියං, රුචියෙහි බැබලීමෙහි + ති) රුචි කරයි බබලයි.

**උපරොදති.** ක්‍රි (උප + රුදි. භූ අස්සු විමොං-චනෙ, කඳුලු හෙළීමෙහි + ති) හඬයි, කඳුලු වගුරුවයි.

**උපරොදන.** න-හැඬීම රොදනය කිරීම.

**උපරොදිත.** ති හඬනා ලද.

**උපරොධ.** ති-ආවරණය, මූවහවීම.

**උපරොධන.** න-මූවහ කිරීම, ආවරණය කිරීම.

**උපරොධෙති**. ක්‍රි-(උප + රුධි d. රු. ආවරණෙ, ආවරණයෙහි. උ=ඔ + ණෙ + ති) ආවරණය කරයි.

**උපරොප**. න-පැළැටිය කුඩා පැලය "උපරොපෙ විහෙඨන්ති.

**උපල**. න-පාසාණය, ගල.

**උපලක්ඛණ**. න-උපලක්ෂණය. යමෙකු කෙරෙහි පිහිටි ලකුණු,

**උපලක්ඛිත**. ති-දක්නා ලද, සලකුණු කරණ ලද.

**උපලක්ඛෙති**. ක්‍රි-(උප + ලක්ඛ d. චු. දස්සනඞ්කෙසු, දැකීම - සලකුණු කිරීමෙහි + ණෙ + ති) දකී, සලකුණු කරයි.

**උපලද්ධ**. ති-ලබන ලද. පැමිණෙන ලද.

**උපලද්ධත්ථ**. පු දන්නා ලද ප්‍රවෘත්ති අර්ථ ඇති, වාසව දත්තාදි ගද්‍ය පද්‍ය ප්‍රබන්ධ විශෙෂය.

**උපලද්ධි**. ඉ-ඥානය. ප්‍රාප්තිය, ප්‍රඥාව.

**උපලබ්භ**. පු. ක්‍රි - (උප + ලභ ධාතු කෙරෙන් ත්‍යා=බ්භ, ධාත්වන්තලොපයි. ලබා, ලැබ,

**උපලබ්භති**. ක්‍රි-(උප + ලභ d. භූ. ලාභෙ, ලැබීමෙහි. භ=බ්භ + ති) ලබයි.

**උපලබ්භන**. න-ලැබීම.

**උපලභති**. ක්‍රි-(උප + ලභ. d. භූ. ලාභෙ, ලැබීමෙහි + ති) ලබයි.

**උපලාපන**. න-නැලවීම, ලොල්කරවීම, භේද කිරීම,

**උපලාපිත**. ති - නලවන ලද, භෙද කළ, ලොල් කළ.

**උපලාපෙති**. ක්‍රි-(උප + ලප d. භූ. වාක්‍යෙ, කීමෙහි + ණෙ + ති) කියවයි, පොලඹවයි.

**උපලාලන**. න-පොලඹවීම, ලොල්කරවීම, නැලවීම, සුරතල් කිරීම.

**උපලාලිත**. ති-පොලඹවන ලද, ලොල්කරවන ලද.

**උපලාලෙති**. ක්‍රි-(උප + ලල d. චු. ඉච්ඡායං, කැමැත්තෙහි + ණෙ + ති) නලවයි. ලොල් කරවයි,

**උපලාසෙති**. ක්‍රි-(උප + ලස d. චු. සිප්පයොගෙ, ශිල්ප ඉගැන්මෙහි + ණෙ + ති) උගන්වයි, ශබ්ද කරයි.

**උපලිඛති**. ක්‍රි-(උප + ලිඛ d. භූ. ලෙඛනෙ, ලිවීමෙහි + ති) ලියයි, අනුව ලියයි.

**උපලිඛිත**. ති-ලියන ලද. අනුව ලියන ලද.

**උපලිත්ත**. ති-ගල්වන ලද, ගාන ලද, තවරණ ලද.

**උපලිප්පති**. ක්‍රි-(උප + ලිප d. රු. ලිම්පනෙ, ආලෙප කිරීමෙහි + ති) ආලෙප කරයි.

**උපලිම්පති**. ක්‍රි-(උප + ලිප d. රු. ලෙපනෙ, ගෑමෙහි + ංඅ + ති) ආලෙප කරයි, තවරයි.

**උපලිම්පන**. න-ගෑම, ආලෙපකරණය

**උපලිම්පිත**. ති-ගල්වන ලද, ආලෙප කළ.

**උපලෙඛන**. න-දෙවෙනි ලියවිල්ල. උපලෙඛනය.

**උපලෙප**. පු-ආලෙපය. ගෑම.

**උපලෙපන**. න-ආලෙපය. ගෑම.

**උපලොහිතක**. න-ති-මදක් රතු පැහැති, මද රතු වූ.

**උපවජ්ජ**. ති-දොෂය, වරද, නින්දාව.

**උපවජ්ජතා**. ඉ-දොෂත්වය, වරද බව.

**උපවණ්ණ**. පු-ගුණය, අනුවර්ණය.

**උපවණ්ණන**. න-වර්ණනා කිරීම, ගුණ කීම.

**උපවණ්ණිත**. ති-වර්ණනා කළ. ගුණකථනය කළ.

**උපවණ්ණෙති**. ක්‍රි-(උප + වණ්ණ d. චු. සංවණ්ණනෙ, වර්ණනා කිරීමෙහි + ණෙ + ති) වර්ණනා කෙරෙයි.

**උපවත්ත**. ති-පැවැත්ම, නැවැත්ම.

**උපවත්තන**. න-මල්ල රජුන්ගේ එනම් මකුට බන්ධන ස්ථානය, පැවැත්ම.

**උපවත්තති**. ක්‍රි-(උප + වතු d. භූ. වත්තනෙ, පැවැත්මෙහි + ති) පවතී. අනුකූලව පවතී

**උපවත්තිත**. ති-අනුව පවත්වන ලද.

**උපවදති**. ක්‍රි-(උප + වද d. භූ. වචනෙ, කීමෙහි + ති) නින්දා කරයි, නුගුණ කියයි.

**උපවදන**. න-නුගුණ කීම, නින්දා බස් කීම.

**උපවදිත**. ති-උපවාද කළ, අපවාද කළ.

**උපවධූ**. න-වධූසමීපය.

**උපවන**. න-සමීපවනය, ගෘහාභිමුඛ උයන, ආරාමය.

**උපවසති**. ක්‍රි-(උප + වස d. භූ. නිවාසෙ, විසීමෙහි + ති) වාසය කරයි, සමීපයෙහි වාසය කරයි.

**උපවසන**. න-වාසය කිරීම, විසීම, දෙවෙති ඇඳුම.

**උපවසිත**. ති-වාසය කළ, සමීපයෙහි විසූ.

**උපවාද**. පු-නින්දාව, අපහාසය, නුගුණ කීම, බාධකය, විරෝධය.

**උපවාදක**. පු-නින්දා කරන්නා, උපවාදකයා.

**උපවාදී**. පු-ගරහන්නා, නින්දා කරන්නා.

**උපවාන**. පු-එනම් ස්ථවිරයෝ.

**උපවායති**. ක්‍රි-(උප + වා d දි. ගති ගන්ධනෙසු, ගමනෙහි හා හැමීමෙහි + ය + ති) යෙයි, ගමන් කෙරෙයි.

**උපවාස**. පු-පෙහෙව විසීම. පාපයෙන් හා භොගානුභවයෙන් වෙන්ව විසීම.

**උපවාසිත**. ති-පෙහෙව වසන ලද, ගුණය හා වාසය කළ.

**උපවාහන**. න-ගෙණ යෑම, සෝදා යෑම,

**උපවිචරති**. ක්‍රි-(උප + වි + චර. d. භූ. සංචරණෙ, හැසිරීමෙහි. + ති) සමීපයෙහි හැසිරෙයි, හැසිරෙයි.

**උපවිචරණ**. න-සමීප සංචාරණය, ලඟ හැසිරීම.

**උපවිජ්ජා**. ඉ-අනුවිජ්ජා.

**උපවිජඤ්ඤා**. ඉ-ප්‍රසූතයට සමීප කල් ඇත්තී.

**උපවිසති**. ක්‍රි-(උප + විස d. භූ. පවෙසනෙ ප්‍රවෙශවී මෙහි + ති) ප්‍රවේශ වෙයි, ඇතුලත් වෙයි.

**උපවීණ**. න-වීණා දණ්ඩ.

**උපවීණයති** ක්‍රි-(උප + වීණ + ණය + ති) වීණා වාදනය කරයි.

**උපවීත**. ති-වැසූ, වසනලද.

**උපවීයති**. ක්‍රි-(උප + වා d. භූ. ගතිබන්ධනෙසු, යාමෙහි හා බැඳීමෙහි + ය + ති) වියනු ලැබේ, බඳිනු ලැබේ.

**උපවුත්ථ**. ති-(වස ධාතුහට උත්ථ ආදෙශයි, වාසය කරණ ලදී, වැසූ, උපොසථොච මෙ උපවුත්ථො භවිස්සති.”

**උපවහයති**. ක්‍රි-(උප + හෙව d. භූ. අවහානෙ, කැඳවීමෙහි + ය + ති) අයදීම කරයි.

**උපවහයන**. න-කැඳවීම, ආමන්ත්‍රණය, ඇයදීම.

**උපවෙසන**. න-සමීපයෙහි හිඳීම, ලඟ සිටීම.

**උපවෙසිත**. ති-සමීපයෙහි හිඳිනා ලද, ලඟ සිටි.

**උපවෙසී**. පු-සමීපස්ථයා. ලඟ සිටින්නා.

**උපසග්ග**. පු-උපද්‍රවය. මහත්භය.

**උපසට්ඨ**. ති-උපද්‍රවය, උවදුර, භීතිය.

**උපස්සය**. පු-අසපුව, ආරාමය, පන්සල, මුනිපැල.

**උපස්සාස**. පු-හුස්ම ගැනීම.

**උපස්සුති**. ති-සමීපයට පැමිණ අසන්නා.

**උපස්සුතික**. ඉ-සමීපයට පැමිණ ඇසීම.

**උපසංකමති**. ක්‍රි-(උප + සං + කමු d. භූ. පදවික්කෙපෙ, යාමෙහි + ති) ලඟට යයි, සමීපයට පැමිණෙයි.

**උපසංකමන**. න-ලඟට පැමිණීම, සමීපයට යාම.

**උපසංඛ්‍යාන**. න-එක කාය්‍යීයකට සුදුසු බොහෝ කාය්‍යීයන් ඇතුලත් කොට ගණන් ගැනීම.

**උපසංඛෙය්‍ය**. ති-පිළියෙල කළයුතු, ඇති-කළයුතු.

**උපසංහරණ**. න-හැකිලීම, සංකුචිතය, පැමිණවීම.

**උපසංහරති**. ක්‍රි-(උප + සං + හර d. භූ. හරණෙ, හැර ගැණීමෙහි + ති) හකුලයි. පමුණුවයි.

**උපසංහරිත**. ති-අකුලන ලද, වකුටු කළ, පමුණුවන ලද.

**උපසංහාර**. පු-අහාවය. සඞ්ග්‍රහය.

**උපසංහිත**. ති-යුක්ත, යෙදුන, සමග පැවති.

**උපසංවසති**. ක්‍රි-(උප + සං + වස, d. භූ. නිවාසෙ, විසීමෙහි + ති) වාසය කරයි, කෙනෙකු සමග වසයි.

**උපසඞ්කමති**. ක්‍රි-(උප + සඞ්ක d. භූ. ගමනෙ, යාමෙහි + ති) යෙයි, අනුව යෙයි.

**උපසඞ්ඛත**. න-උත්සාහය, ප්‍රයොගය.

**උපසග්ග**. අ-උපද්‍රවය, උපසර්ගය, ධාතු හෝ නාමයන් වෙත එළඹ පෙරටුව හෝ පසුව සිය අර්ථය සරසන්නේ උපසර්ග නම් වේ. ප. පරා. නි. නී. උ. දු. සං. යනාදි උපසර්ග ශබ්ද විස්ස.

**උපසග්ග ගති**. පු-උපසර්ගයන්ගේ පැවැත්ම, එය ධාත්වර්ථ බාධනය, ධාත්වර්ථානුවර්තනය, ධාත්වර්ථ විශෙෂණ යයි ත්‍රිවිධ වේ.

**උපසන්ත**. ති-ශාන්තවූ, සංසිඳුනු, "**උපසන්තො සුඛං සෙති.**"

**උපසජ්ජන**. න-උපසර්ජනය, අප්‍රධාන නාමය.

**උපසම්පජ්ජති**. ක්‍රි - (උප + සං + පද d. දි. ගතියං, යාමෙහි + ය + දය=ජ=ජ්ජ + ති) පැමිණෙයි, සමීපයට යෙයි.

**උපසම්පජ්ජන**. න-ලඟාවීම, සමීපයට පැමිණීම.

**උපසම්පන්න**. ති-උපසම්පදා වූ, උපසම්පත්තියට පැමිණි.

**උපසම්පදා**. ඉ-උපසම්පදාව, අධිසීල සික්ඛාවෙහි පිහිටීම.

**උපසම්පාදෙති**. ක්‍රි (උප + සං + ප + ද d භූ. ණෙ + ති) උපසම්පදා කෙරෙයි.

**උපසම්බ්‍යාන**. න-උත්තර සාටකය, උතුරුසළුව.

**උපසම්මති**. ක්‍රි-(උප + සමු d. දි. උපසමෙ, සංසිඳීමෙහි + ය. මය=ම=මම + ති) සංසිඳෙයි.

**උපසම**. පු-සංසිඳීම, කෙලෙශ පීඩාදියෙන් මිදීම."

**උපසමති**. ක්‍රි-(උප + සම d. භූ. පරිස්සමෙ, වෙහෙසෙහි + ති) සංසිඳෙයි.

**උපසමරති**. ඉ-සංසිඳීමෙහි රතිය.

**උපසමසුඛ**. න-සංසිඳීමේ සැපය.

**උපසමිත**. ති-සන්සිඳුනු, ඉන්ද්‍රිය දමනය කළ.

**උපසමානුස්සති**. ඉ-කෙලසුන් සන්සිඳවීම පිණිස උපදනා සිහිය.

**උපසිංඝක**. පු-ආඝ්‍රාණය කරන්නා. ඉඹින්නා

**උපසිංඝති**. ක්‍රි-(උප + සිඝ d. භූ. ආඝායනෙ, ඉඹීමෙහි + ති) ආඝ්‍රාණය කරයි. ඉඹියි.

**උපසිංඝන**. න - ආඝ්‍රාණය කිරීම, ඉඹීම.

**උපසිංඝිත**. ති-ආඝ්‍රාණයකළ, ඉඹිනලද.

**උපසිංඝක**. ති-කැමතිවන, ප්‍රමාදවන.

**උපසුස්සති**. ක්‍රි -(උප + සුස d. දි. සොසෙ, වියළීමෙහි + ය + ති) වියලෙයි.

**උපසුස්සන**. න-වියලීම, වේලීම.

**උපසෙනියා**. ඉ - ලඟ සිටින තැනැත්තී, සාත්තුකාරී.

**උපසෙවති**. ක්‍රි -(උප + සි. d. භූ සෙවායං, සේවනයෙහි + ති) සෙවනය කරයි.

**උපසෙවන**. න-සෙවනය, ආශ්‍රය.

**උපසෙවිත**. ති-සෙවනයකළ, ඇසුරුකළ.

**උපසේවී**. පු-සෙවනය කරන්නා, ආශ්‍රය කරන්නා.

**උපසොභන**. න-සොභනය, හෙබීම, අලංකාරය.

**උපසොභති**. ක්‍රි-(උප + සුභ. d භූ. දිත්තියං, බැබලීමෙහි + ඔ + ති) හොබියි, බබලයි.

**උපසොභිත**. ති-හොබනා ලද, බබලන ලද.

**උපහච්ච**. පු. ක්‍රි-(උප + හන. d. ත්වා. නත්වා=රච්ච) නසා, එනම් බඹලොව.

**උපහච්චපරිනිබ්බායී**. පු-ආයුෂයාගේ මධ්‍යයක් ඉක්මවා පිරිනිවන් පාන පුද්ගලයා සසංඛාර පරිනිබ්බායී, අසංඛාර පරිනිබ්බායි, ආහච්ච පරිනිබ්බායි, උපහච්ච පරිනිබ්බායි, සහ උද්ධංසොත අකනිට්ඨගාමී යන පඤ්ච සුද්ධාවාසික සත්වයන් අතුරෙහි උත්තමයෙක්.

**උපහඤ්ඤති**. ක්‍රි-(උප + හණ. d දි. හිංසායං, නැසීමෙහි + ය + ති.) නසී. හිංසාකරයි.

**උපහඤ්ඤමාන**. ති-නසන, නසනු ලබන.

**උපහත**. ති-නසන ලද, මරණ ලද, යටත්කළ.

**උපහති**. ති-(උප + හන. d. නලෝප + ති.) නැසීම.

**උපහනති**. ක්‍රි-(උප + හන. d. භූ. හිංසායං, නැසීමෙහි + ති.) නසයි.

**උපහනන**. න-නැසීම, මැරීම.

**උපහරති**. ක්‍රි-(උප + හර. d. භූ. හරණෙ, හැර ගැණීමෙහි + ති) ගණී. පැහැරගණී.

**උපහරණ**. න-පැහැර ගැණීම. එළවීම. පැමිණවීම.

**උපහාර**. පු-අභිමුඛයට එළවීම, පූජාව, හුන් - තැනට යවන පඬුර.

**උපහිංසති**. ක්‍රි-(උප + හිසි. d. රු හිංසායං, පෙළීමෙහි + ං + ති.) පෙළයි. හිංසාකරයි.

**උපහිංසන**. න-පෙළීම, පීඩාකිරීම.

**උපහිංසිත**. ති-පෙළනලද, හිංසාකළ.

**උපාඛ්‍යාන**. න-පෙර වූ කථාන්තර කීම, පූර්ව වෘත්ත කථනය.

**උපාගච්ඡති**. ක්‍රි-(උප + ආ + ගමු. d. භූ. මූ.= ච්ඡ + ති) සමීපයට එයි.

**උපාගත**. ති-සමීපයට පැමිණි, සමීපගත.

**උපාගමන**. න-ලඟට පැමිණීම, සමීපයට ඒම.

**උපාතත**. ති-පැමිණි, ගන්නාලද, විසිකළ.

**උපාතතවිසය**. පු-අධ්‍යාහෘත කටයුතු ක්‍රියා-වක් විෂය කොට පවත්නා පදාර්ථය.

**උපාතතවිසය**. න - අපාදන කාරයෙහි අප ගමන ක්‍රියාව අධ්‍යාහාර කොට ගන්නා ලද්දී වේතම් එය උපාත්තවිෂය අපාදාන නම්.

**උපාතිගච්ඡති**. ක්‍රි-(උප + අති + ගමු. d. භූ. ගතිමහි, යාමෙහි + ති.) ඉක්මයෙයි.

**උපාතිවතත**. පු-ඉක්මවන ලද, අතික්‍රමණය කළ.

**උපාතිධාවති**. ක්‍රි-(උප + අති + ධාව d. භූ. ගමනවුද්ධිමහි ගමන් වැඩීමෙහි නොහොත් දිවීමෙහි + ති.) ඉක්මදුවයි.

**උපාතිවතතති**. ක්‍රි-(උප + අති + වතු. d. භූ. වතතනෙ, පැවැත්මෙහි + ති.) ඉක්මවයි. බැහැර කරයි.

**උපාතිවතතන**. න-ඉක්මවීම, බැහැරකිරීම.

**උපාදහති**. ක්‍රි-(උප + ආ + දහ. d. භූ. වුඩ්ඪියං, වැඩීමෙහි + ති.) පහවයෙයි.

**උපාදා**. ඉ-(උප + ආ + දා.) සමීපකොට ගැණීම ග්‍රහණය.

**උපාදාන**. න-(උප + ආ + දාන) ග්‍රහණය, තෘෂ්ණාදි වශයෙන් ගැන්ම කාමුපාදානාදිය.

**උපාදානාක්ඛන්ධ**. පු-උපාදානයන්ට ප්‍රත්‍යය වූ සකන්ධ සන්තතිය, කෙලෙස් සහිත පඤ්ච සකන්ධය.

**උපාදානක්ඛය**. පු-උපාදානයන්ගේ ක්ෂයකිරීම, නිර්වාණය.

**උපාදානනිදාන**. න - උපාදානයන්ගේ නිදා-නය.

**උපාදාන නිරොධ**. පු-උපාදානයන්ගේ නිරු-ද්ධිය, නිවණ.

**උපාදානිය**. ති-තෘෂ්ණාදි වශයෙන් ග්‍රහණය කටයුතු රූපාදිය.

**උපාදානීය**. ති-උපාදානයට කරුණු වූ ධර්ම.

**උපාදාන පච්චය**. පු-උපාදාන ප්‍රත්‍යය.

**උපාදාය**. පූ. ක්‍රි-ගෙණ.

**උපාදායී**. පු-ග්‍රහණය කරණ තැනැත්තා.

**උපාදි**. පු-(උප + ආ + දා. d. + ඉ.) සම්භාවන-යෙහි අනුපාදිසෙස නිබ්බාණ බලනු.

**උපාදින්න**. ති- ගත්තා ලද, පරාමර්ශණය කරණ ලද.

**උපාදින්නක**. ති ගත්තා ලද.

**උපාදිය**. පූ. ක්‍රි-(උපාදියිත්වා = ය.) ගෙණ.

**උපාදියති**. ක්‍රි-(උප + ආ + දා. d. දි. දානෙ, දීමෙහි + ය + ති) ගණී.

**උපාදියන**. න-ගැණීම, ග්‍රහණය.

**උපාධි**. ඉ-විශේෂණය, නිමිත්ත

**උපාධිය**. ති-කුෂන් කිරීමෙන් අලංකාර කළ, විශේෂණයෙන් සැරසූ.

**උපානීය**. න-නොදක්වූ යමක් බුද්ධියෙන් දැන ගැනීම, තන්ත්‍ර යුක්ති විශෙෂයෙකි. "යද නිද්දිඨං බුද්ධියා අවගමානියං තදූපා ණියං"

**උපානන**. පු-විරාමය, නවතින තැන, ධාතූන් - ගේ ආදි සවරවූ ඉ, උ, අ යන මොවුන්ට උපාන්ත සංඥයයි කියත්.

**උපාය**. පු-ප්‍රයොගය, උපක්‍රමය, සාම, දාන, දණ්ඩ, හෙද යන උපායසතර.

(7240)

**උපායන්ත.** ති-අයත්, අයිති.

**උපායකුසල.** පු-උපායෙහි දක්ෂ, ප්‍රයොගයෙහි නිපුණ.

**උපායකොසල්ල.** න-උපායෙහි දක්ෂ බව.

**උපායඤාණ.** න-උපාය කෞශල්‍ය ඥානය, සර්වඥොචිත ප්‍රඥාව.

**උපායන.** න-තුන්නැනට යවන පඩුර, තෑග්ග, කප්පම.

**උපායන්තර.** න-උපාය විශෙෂය.

**උපායාස.** පු-දැඩි ආයාසය, තද වෙහෙස, "දුක්ඛෙහි දොමනස්සෙහි උපායාසෙහි ආදිත්තං"

**උපායාස බහුල.** පු-දැඩි ආයාස බහුලකොට ඇත්තේ.

**උපායික** පු-යුක්ති සඞ්ගත ක්‍රියාව, න්‍යායය.

**උපායුපාදාන.** න-(උපාය+උපාදාන) උපාය සංඛ්‍යාත උපාදානයෝ, (තෘෂ්ණා දෘෂ්ටි උපාය යෝම උපාදාන නම් වෙති.) "උපාදාන" බලන්න. "**උපායුපාදානා** චෙතසො අධිට්ඨානාභිනිවෙසානුසයා"

**උපාරබ්ධ.** ති-ආරම්භකළ, පටන් ගන්නා ලද, දොස් නැගූ

**උපාරම්භ.** පු-දොෂාරොපණය, කාරණ්‍යුතතා-රිය කරණය.

**උපාරම්භති.** ක්‍රි-(උප + ආ + රභ. d. භූ. ආරම්භෙ, පටන් ගැණීමෙහි + ති) දොස් නගයි, පටන් ගණියි.

**උපාරම්භන** න-දොෂාරොපණය, දොස් නැගීම.

**උපාරමති.** ක්‍රි-(උප+ආ+රමු d. භූ කීලායං, කෙළිමෙහි+ති) නවතියි, වැළකෙයි.

**උපාලිගාථා.** ඉ-උපාලි ගෘහපතියා විසින් බුදුගුණ වැනූ ගාථා සියය.

**උපාලිපඤ්හ.** න-උපාලි භික්‍ෂූහු බුදුන්ගෙන් ඇසූ ප්‍රශ්න.

**උපාසක.** පු-(උප+ආස+ණ්වු=අක) තුනු-රුවන් අදහන්නා, උපාසකයා.

**උපාසක වෙවචන.** න-උපාසක පර්‍යායය නාම.

**උපාසති.** ක්‍රි-(උප+ආස. d. භූ උපවෙසනෙ ළඟ හිඳීමෙහි+ති) සෙවනය කෙරෙයි.

**උපාසන්න.** ති-සමීප,ළඟ.

**උපාසන.** න-සමීපාසනය, ළඟ හිඳීම, දුනු-ශිල්පය, ගුරුසේවාව.

**උපාසනීය.** ති-සෙවනය කටයුතු, ආශ්‍රය කටයුතු උපාසිතබ්බ.

**උපාසනසාලා** - ඉ - දුනු ශිල්පය උගන්වන සාලාව, ශරීර ව්‍යායාම උගන්වන තැන.

**උපාසිකා.** ඉ - උවැසිය, උපාසිකාව. "සුපපි-යො ච උපාසකො සුපපියා ච **උපාසිකා** උභතො පසන්නා හොනති."

**උපාසිතබ්බ.** ති-සෙවනය කටයුතු.

**උපාසිත.** ති-සෙවනය කළ, ගෞරව කළ, ආශ්‍රය කළ.

**උපාසින.** න - සමීපයෙහි හිඳීම, ළඟ හිඳීම.

**උපාහට.** ති - එළවන ලද, පමුණුවන ලද.

**උපාහත.** ති - දුක් දුන්, අනතුරු කළ.

**උපාහන.** න - වහන. මිරිවැඩිය.

**උපාහනා.** ඉ - වහන්සගල, මිරිවැඩිසගල, "**උපාහනා** ඔමුඤ්චිත්වා,"

**උපාහනක්ඛවිකා.** ඉ - වහන් දමන පසුම්බිය.

**උපාහන දණ්ඩක.** න - වාන් කොක්ක,

**උපිය.** පු. ක්‍රි - ඇතුලට පලාගොස්, යටට ගොස්, "හදයමංසං ඔපිය"

**උපෙක්ඛක.** පු - උපෙක්ෂා ඇත්තා, උපෙක්ෂා කරන්නා.

**උපෙක්ඛති.** ක්‍රි - (උප+ ඉක්ඛ d. භූ. දස්සන-ඞ්කෙසු, දැකීමය සලකුණුකිරීමය යන මෙහි + ති) **උපෙක්ෂා** කරයි, බලයි.

**උපෙක්ඛන.** න - බැලීම, මැදහත්ව බැලීම.

**උපෙක්ඛා** } ඉ - බැලීම, පරීක්ෂණය. මධ්‍යස්ථ-
**උපෙඛා.** } තාවය.

**උපෙක්ඛා බ්‍රහ්ම විහාර.** පු - උපෙක්ෂා බ්‍රහ්ම විහාරය.

**උපෙක්ඛාසති.** ඉ - උපෙක්ෂා සමෘතිය.

**උපෙක්ඛා සම්බොජ්ඣඞ්ග.** පු - උපෙක්ෂාව වූ සම්බොජ්ඣඞ්ගය, බොජ්ඣඞ්ග බලනු.

**උපෙක්ඛා සුඛ.** පු - උපෙක්ෂා සැපය, සැප දුක් දෙක්හි සමපා නොවී මධ්‍යස්ථව සිටීමෙ සැපය.

(7284)

**උපෙක්ඛින්ද්‍රිය.** න - ප්‍රධාන භාවයට පැමිණි උපෙක්ෂාව.

**උපෙච්ච.** පූ. ක්‍රි-(උප + ඉ-ත්වා = රච්ච) උපෙක්ඛා බලනු.

**උපෙත.** පු - යුක්ත, සහගත. සඞ්ගත.

**උපෙති.** ක්‍රි-(උප + ඉ d. ගු පාපනෙ, පැමිණී මෙහි + ණෙ + ති) පැමිණෙයි.

**උපෙච්චා.** පූ. ක්‍රි-(උප + ඉ-ත්වා) පැමිණ ලඟාවී.

**උපෙන්ද.** පු-උපෙන්ද්‍ර, විෂ්ණු.

**උපොග්ඝාත.** පු-දෘෂ්ටාන්තය, උදාහරණය, සාධකය, "උපොග්ඝාතොච දිට්ඨන්තො තථොදාහරණං භවෙ"

**උපොචිත.** ති-රැස්කරණ ලද, ගොඩගැසුනු.

**උපොසථ.** පු-පාමොක් උදෙසීම, පතන, උපවාසය, අෂ්ටාඞ්ග සීලය, පෝෂථ දිනය, එනම් ඇත්කුලය.

**උපොසථ.** න-පෝය, පොහොය, පෙහෙවස, උපොසථ කර්මය, දෙවැදෑරුම් උපොසථය, චාතුද්දසී පණ්ණරසී, සාමග්ගිසඞ්ඝ, ගණ, පුද්ගල, සුත්තුද්දෙස, අධිට්ඨාන, පාරිසුද්ධි යන නව ආකාර උපොසථය. "අජ්ජ ඉමංච දිවසං උපොසථං උපවසිස්සාමි"

**උපොසථික.** පු-උපොෂථයෙන් යුක්තයා, පෙහෙවස් රකින්නා.

**උපොසථකම්ම.** න-පොහොය කිරීම, උපොසථ කර්මය, සිල්සමාදන්වීම, "උපොසථස්ස කම්මං උපොසථ කම්මං"

**උපොසථ කරණ.** න - පොහොය කිරීම, උපොසථ කරණය, "එකසමිං හි සංවච්ඡරෙ ඡ චාතුද්දසික අට්ඨාරස පණ්ණරසික උපොසථ කරණං."

**උපොසථකාරක.** පු-පොහොය කරන්නෝ, එසේ කරණ භික්ෂු භික්ෂුණීහු.

**උපොසථකුල.** න-එනම් හස්තිරාජකුලය, දස ඇත් කුලයන්ගෙන් එකක්.

**උපොසථක්ඛන්ධ.** පු-පොහෝ කිරීම පිළිබඳ කරුණු ඇතුළත් කොටස, මහාවග්ග පාළියේ උපොසථක්ඛන්ධකය,

**උපොසථදිවස.** න - පොහෝ කරණ දිනය,

**උපොසථ පඤ්ඤත්ති.** ඉ-පොහෝ පවුරුණු කිරීම් පිළිබඳ නීතිරීති පැණවීම,

**උපොසථපමුඛ.** න-පොහෝගෙයි ආලින්දය, අක්දෙරිය.

**උපොසථපුච්ඡක.** න-පොහොය ගැණ විමසුම, පොහෝ කිරීමාදිය විචාරීම. "අනුද්ධමාසං භික්ඛුණියා භික්ඛු සඞ්ඝතො ද්වෙ ධම්මා පටි පුච්ඡිතබ්බා උපොසථපුච්ඡකඤ්ච ඔවදූපසඞ්කමනඤ්ච"

**උපොසථභත්ත.** න-පෝය දිනයෙහි දෙන බත, පෝය දිනවල දෙන දානය.

**උපොසථාගාර.** න-සීමාව, පෝය සීමාව, පෝය ගේ, උපොසථාගාරය, "අනුජානාමි භික්ඛවෙ උපොසථාගාරං සම්මන්නිත්වා උපොසථං කාතුං."

**උපොසථඞ්ග.** න-උපොසථ අඞ්ගයන්, අටසිල්.

**උපොසථාධිට්ඨාන.** න-පොහොය ඉටාගැනීම. උපොෂථාධිෂ්ඨානය.

**උපොසථන්තරාය.** පු-පොහොය නොකිරීම, පොහෝ කිරීම පිළිබඳ දශවිධ අන්තරාය.

**උපොසථික.** පු-පෝය දිනයෙහි සිල්සමාදන් වූ තැනැත්තා. ඒ අය විසින් දෙනු ලබන දානය. පිණ්ඩපාත භොජනයට අතිරේකව ලැබෙන බත.

**උප්පක්ක.** ති - වැඩිපුර ඉදුනු, වඩා තැම්බූ, දැවුනු "අද්දස ඉසිං උප්පක්කං ඔකිලිනිං ඔකිරිනිං."

**උප්පච්ච.** පූ. ක්‍රි-ඉගිලී ගොස්, පියාසර කර.

**උප්පච්චති.** ක්‍රි-(උ + පත d ගු. ගතෙ, යාමෙහි + ති) ඉගිලෙයි, උඩට යෙයි.

**උප්පක්කමුඛ.** පු මහත් උඩුතොල් ඇති තැනැත්තා.

**උබ්බ.** d. ගු. ධාරණෙ, දැරීමෙහි උබ්බති, දරයි.

**උබ්බුම.** පු-අමාගීය මාගීය උදුරා දැමීම.

**උබ්බට්ට.** න-ඇඟ ඉලීම, ඇඟ මිරිකීම.

**උබ්බට්ටක.** පු-ඇඟ උලන්නා, උද්වර්තනය කරන්නා.

**උබ්බට්ටන.** න-උද්වර්තනය, ඇඟලීම, ඉලීම.

**උබ්බට්ටාපෙති.** ක්‍රි-(උ + වට්ට d ගු. ආවට්ටනෙ, වටකිරීමෙහි + ණෙ + ති) ඇඟ උලයි.

**උබ්බට්ටිත.** ති-ඇඟ උලන ලද. ඇඟ ඉලූ.

**උබ්බට්ටෙති**. ක්‍රි-(උ + වට්ට. d. භූ. ආවට්ටනෙ මෙහි + ණෙ + ති) උවත්තනය කරයි. ඇඟ උලයි.

**උබ්බට්ඨක**. පු-උක්කුටිකයෙන් සිටින්නා, උඩ සිටින්නා.

**උබ්බති**. ක්‍රි-(උබ්බ d. භූ. ධාරණෙ, ඇරීමෙහි + ති) දරයි.

**උබ්බත්තති**. ක්‍රි-(උ + වත්තු d. භූ. වත්තනෙ, පැවැත්මෙහි + ති) උදුරයි, පෙරළා දමයි.

**උබ්බත්තෙති** ක්‍රි-(උ + වත්තු. d. වත්තනෙ, පැවැත්මෙහි + ණෙ + ති) නොමග යවයි, උදුරවයි.

**උබ්බත්තෙත්වා**. පු. ක්‍රි-(උ + වත්තු + එ + ත්වා) පෙරළා, උපුටා.

**උබ්බන්ධති**. ක්‍රි-(උ + බන්ධ d. භූ. බන්ධනෙ, බැඳීමෙහි + ති) උඩට බඳී. උඩ එල්ලයි.

**උබ්බන්ධන**. න-උඩට අල්ලා බැඳීම, බොටුවේ වැල් ලා එල්ලීම.

**උබ්බන්ධති**. ක්‍රි-(උ + බන්ධ. d. භූ. බන්ධනෙ, බැඳීමෙහි + ති) උඩට බඳී.

**උබ්බද්ධපිණ්ඩික**. පු-උඩට නැගුනු මස්පිඬු ඇති.

**උබ්බරී**. ඉ-සරුභූමිය, වපුල බිම.

**උබ්බසති**. ක්‍රි-(උ + වස d භූ නිවාසෙ, නිවාසයෙහි + ති) ගෙයින් පිට වෙසෙයි, වනයෙහි වෙසෙයි.

**උබ්බහති**. ක්‍රි-(උ + වහ d. භූ. පාපණෙ, පැමිණ වීමෙහි + ති) උසුලයි.

**උබ්බාධන**. න-හිරගෙයි බැඳීම.

**උබ්බාධික**. පු-ආබාධ කරවූ.

**උබ්බාසිත**. ති වනයෙහි වසනලද, වලවැසූ.

**උබ්බාසිත**. ති-වියොග කළ, වෙන්කරණ ලද.

**උබ්බාසීයති**. ක්‍රි-(උ + වස, d. භූ. නිවාසෙ, නිවාසයෙහි + ඊය + ති)

**උබ්බාහ**. පු-විවාහය, පාණිග්‍රහණය, අස්කිරීමට දුෂ්කර.

**උබ්බාහන**. න-ගෙණයෑම, උසුලායෑම, ඉස්සීම.

**උබ්බාහාපන**. න-බැහැර කරවීම.

**උබ්බාහාපෙතබ්බ**. න-(උ + වහ + ණාපෙ + තබ්බ) රැස්කරවිය යුතු.

**උබ්බාළ්හ**. ති-කරදර කළ, හිංසා කළ, ක්‍රෝධ කළ, හිරිහැරයට පැමිණි.

**උබ්බාහිකා**. ඉ-උබ්බාහිකා කර්මය, වෙන්කිරීම, "උබ්බහන්ති වියොජෙන්තීති **උබ්බාහිකා**."

**උබ්බාහිකාවිනිච්ඡය**. පු-සිල්වත් භික්ෂූන් දෙතුන් නමක් තෝරාගෙන කරණ අධිකරණ විනිශ්චය.

**උබ්බාළ්හෙති**. ක්‍රි-(උ + වහ. d. භූ. පාපණෙ, බර ඉසිලීමෙහි + ණෙ + ති) කරදර කරවයි. ක්‍රොධකරවයි, බාධාකරවයි.

**උබ්බිග්ග**. ති-උද්විග්න, කලකිරුණු, උකටලීවූ, බියෙන් වෙව්ලන.

**උබ්බිජ්ජති**. ක්‍රි-(උ + විජී, d. දි. භයචලනෙ, බියවීමෙහි + ති) සංවෙගයට පැමිණෙයි, කලකිරෙයි.

**උබ්බිජ්ජන**. න-කලකිරීම, උකටලිවීම.

**උබ්බිනය** පු-විනයට විරුද්ධ, විනය ඉක්මගිය, "උද්ධම්මං **උබ්බිනයං** කත්වා"

**උබ්බිලාප**. පු-(උ + විලාප) මහත් විලාපය.

**උබ්බිල්ල**. න-උඩඟු, උඩඟ, ඉපිළීම, අධික සන්තොෂය.

**උබ්බිල්ලිත**. ති-උඩඟුවූ, උඩඟවූ.

**උබ්බිල්ලාවිත**. ති-සතුටුවූ, ප්‍රීතිවූ, ඉපිලෙන ස්වභාවය.

**උබ්බිල්ලාවිතත්ත**. න-ඉපිලීම් බව, උඩඟු බව.

**උබ්බිසති** ක්‍රි-උබ්බසති බලනු.

**උබ්බි**. ඉ-භූමිය, පොළව, උර්වි.

**උබ්බී**. d. භූ. හිංසනෙ-ධාරණෙ, හිංසාවෙහි, දැරීමෙහි උබ්බති, හිංසා කරයි.

**උබ්බෙග**. පු-උද්වේගය, කලකිරීම, ලොමු දැහැගන්නා බිය.

**උබ්බෙගපීති**. ඉ-උද්වේග ප්‍රීතිය, සිරුර අහසට නැංවීමට තරම් වෙගවත්වූ ප්‍රීතිය, පඤ්චවිධ ප්‍රීතින්ගෙන් එකක්.

**උබ්බෙගී**. පු-උද්වේග ඇත්තා, කලකිරීම ඇත්තා.

**උබ්බෙජනීය**. ති-උද්වෙජනීය, කලකිරිය යුතු.

**උබ්බෙජිත**. ති-කලකිරුණු, උද්වෙජයට පැමිණි.

**උබ්බෙජති**. ක්‍රි-(උ + විජ් d. භූ. භයචලනෙ, බියවීමෙහි හා චංචලයෙහි) බියවෙයි, සැලෙයි.

**උබ්බට්ටන**. න-එතීම, වෙලුකැවීම.

**උබ්බට්ටිත**. ති-එතූ, වෙලූ කවන ලද.

**උබ්බට්ටෙති**. ක්‍රි-(උ + වෙඨ d. භූ. වෙඨනෙ, වෙලීමෙහි + ති) වෙළයි, වෙළකවයි.

**උබ්බෙධ**. පු-උස, උස ප්‍රමාණය.

**උබ්බෙධති**. ක්‍රි-(උ + විධ d භූ කම්පනෙ, කම්පා වීමෙහි + ණෙ + ති) කම්පාවෙයි, තැතිගණී.

**උබ්බෙධන**. න-කම්පාවීම, චලනය.

**උබ්බෙධිත**. ති-කලකිරුණු කම්පාවන ලද.

**උබ්භක්ඛක**. න-අකු ඇටින් උඩ, අකු ඇටින් උඩ පෙදෙස.

**උබ්භ**. d. භූ. පූරණෙ පිරීමෙහි උබ්භති, පූරණය කරයි.

**උබ්භක්ඛක**. න-වැලමිටින් උඩ, දෙවෙනි මහ හන්දියෙන් උඩ.

**උබ්භ**. (උඩ-උබ්භ) උඩ, උඩබාගය, උඩ පෙදෙස.

**උබ්භට්ඨක**. පු-නැගිට සිටින්නා, උඩ පැන පැන යන තැනැත්තා.

**උබ්භත**. ති-ඔසවන ලද, දියෙන් ගොඩ ගන්නා ලද, උද්ධරණ ලද, උදුල, උද්ධරණය කළ, "උබ්භතං කිර කඨිනං"

**උබ්භණ්ඩිත**. ති-ඔසවා ගත් බඩු පොදි ඇති. "සම්බහුලෙ භික්ඛූ චීවරෙහි උබ්භණ්ඩිතෙ."

**උබ්භමුග්ගත**. ති - උබ්භ + උග්ගත + උඩට පැමිණි, උඝ්ඝවගත.

**උබ්භව**. පු-උද්භවය, උත්පත්තිය, ඉපදීම.

**උබ්භාර**. පු-බර, එසවිය යුතු බර, කඨිනය, උද්ධරණයකිරීම, "උබ්භාරො උද්ධරණං"

**උබ්භිජ්ජ**. පු. ක්‍රි-බිඳ, දෙපලුකර, ඉපිද.

**උබ්භිජ්ජති**. ක්‍රි-(උ + භිද d. දි, භෙදනෙ, බිඳීමෙහි + ය + ති) බිඳියි, සිඳියි, කඩයි.

**උබ්භිජ්ජන**. න-බිඳීම, සිඳීම.

**උබ්භිද**. න-සුවස ලුණු. වැලි ගැරූ ලුණු සුවස ලුණුයි. සාමුද්දං, කාළලොණං, සින්ධවං, උබ්භිදං, බිලාලං යන ලුණු පස්වගීයෙන් උබ්භිද ලුණු,

**උබ්භිදෝදක**. න-උබ්භිජ්ජා උදකය, පොකුණු ආදියෙහි උල්පත්වලින් අතුළතම උපදනා ජලය.

**උබ්භින්න**. ති-බිඳුනු.

**උබ්භින්දන**. න-බිඳීම, සිඳීම.

**උබ්භුජති**. ක්‍රි-(උ + භුජ d. භූ, කොට්ලෙල, කුටිලබැවිහි + ති) උසට යෙයි. උඩට යෙයි.

**උබ්භුජිත්වා**. පූ-ක්‍රි-(උ + භුජ + ඉ + ත්වා) උස්සාගෙණ, සිවුර ඔසවාගෙණ.

**උබ්භූත**. ති-හටගත්, උපන්,

**උභ**. ති-දෙක, දෙදෙනා, විසංඛ්‍යාව,

**උභ**. d භූ පූරණෙ, පිරීමෙහි. උභති, පූරයි, පූරවයි.

**උභතො** අ-දෙපක්ෂයෙන්, දෙපසින්.

**උභතො අවස්සුත**. ති-දෙපසින් තෙත් වූ, "උභතො අවස්සුතෙ ආපත්ති පාරාජිකස්ස."

**උභතොකාජ**. න-දෙකෙළවර එල්වූ බර ඇති කද, දෙකෙළවර කද, "න භික්ඛවෙ උභතොකාජං හරිතබ්බං."

**උභතොකොටික**. ති-කොන් දෙකක් ඇති, මෙය සැබෑ නම් එය බොරු යයි දෙකෙළවරක් ඇති.

**උභතො ධාරා**. ති - දෙපැත්ත කැපෙන මුවහත ඇති, දෙපැත්තම මුවහත ඇති, "න භික්ඛවෙ උභතො ධාරා ආයුධං පරිහරිතබ්බං."

**උභතො පඤ්ඤත්ති**. ඉ-භික්ෂු භික්ෂුණී දෙපක්ෂයට සමානව පැණවූ ප්‍රඥප්තිය, නවවිධ ප්‍රඥප්තීන් ගෙන් එකක්.

**උභතො පසන්න**. න-දෙපක්ෂය විසින්ම පැහැදුණු, උපාසක - උපාසිකා දෙපක්ෂය විසින්ම පහන්වන ලද, "බාරාණසියං අඤ්ඤතරං කුලං උභතො පසන්නං හොති".

**උභතො බ්‍යඤ්ජනක**. ති - උභතො බ්‍යඤ්ජනකයා, ස්ත්‍රී-පුරුෂ නිමිති දෙකින් ම යුක්ත වූ, අහෙතුක ප්‍රතිසන්ධිකයා.

(7402)

**උභතො භාග විමුත්ත.** ති-අරූප සමාපත්ති-යෙන් රූපකයින් ද මාර්ගයෙන් නාමකයින්ද යන දෙකින් මිදුනු තැනැත්තා.

**උභතො රත්තූපධානක.** න-හිස හා පාමුල රත් කන් වයින් ඇති, එවැනි ආසනය.

**උභතො ලොහිතකූපධාන** න-හිස හා පාමුල රත් කන් වයින් ඇති, එවැනි ආසනය.

**උභතො වණ්ටික.** ති-නැටි දෙපැත්තට සිටින ලෙස ගෙතූ මල්දම.

**උභතො විභඞ්ග.** න-උභය විභඞ්ගය, පාරාජික-පාචිත්තිය යන පොත් දෙක.

**උභතො විභඞ්ග භාණක.** පු-පාරාජික-පාචිත්තිය යන පොත් දෙක හදාළා වූ භික්ෂූහු, අට්ඨාරස මහා ගණයන්ගෙන් එක් කොටසක්.

**උභතො සඞ්ඝ.** පු-භික්ෂු-භික්ෂුණී සඞ්ඝයා, "සික්ඛමානා උභතො සඞ්ඝෙ උපසම්පදා පරියෙසිතබ්බා."

**උභය.** ති-දෙක, දෙදෙන, දෙකොටස,

**උභයක්ඛන්ධක.** න-චුල්ලවග්ග-මහාවග්ග යන දෙ පාලිය.

**උභයක්ඛය.** න-ආයුෂ හා කර්මය ගෙවී යාමෙන් සිදුවන මරණය, සිවුවැදෑරුම් මරණයන් ගෙන් එකක්.

**උභය තොදික.** පු-උභය භාගාදි අර්ථ.

**උභයත්ථ** පු අර්ථවය, මෙලෝ පරලෝ අර්ථ-දෙක.

**උභයත්ථෙනක.** පු-මහණකම හා පොහෝ පවුරුණු ආදී සංවාසය සොරකම් කළ තැනැත්තා.

**උභයත්‍ර.** අ-උභයතහි, දෙතන්හි.

**උභය පඤ්ඤත්ති** ඉ-භික්ෂු-භික්ෂුණී දෙපක්ෂයට සාධාරණව පැණ වූ ශික්ෂා පද.

**උභය පදත්ථප්පධාන.** පු-පූර්ව සහ උත්තර පදාර්ථයන් ප්‍රධාන කොට ඇති සමාසය, ද්වන්ද්ව සමාසය.

**උභය පාතිමොක්ඛ.** න-භික්ෂු-භික්ෂුණී ප්‍රාති-මොක්ෂය, "භික්ඛු-භික්ඛුණී පාතිමොක්ඛානි උභය පාතිමොක්ඛානි නාම හොන්ති."

**උභය මිස්සක.** න-ගල් හා පස් මිශ්‍ර වූ පර්වතය.

**උභයමුත්තක.** පු-ස්තන කොෂවත්වය හා මශ්‍රැමත්වය යන දෙකින් තොරවීම, උභය මුත්තකයා "එත කොසවතී නාපිමස්සුකා පුරිසා සියා උභින්නමන්තරං එතං ඉතරො හය මුත්තකො."

**උභය විභඞ්ග.** න-පාරාජික හා පාචිත්තිය යන පොත් දෙක,

**උභයංස.** පු-දෙ අංසය, දෙකොටස, සම්පූර්ණයෙන්ම.

**උභින්නං.** අ-උභශබ්දයාගේ නං = ඉන්නං දෙදෙනකුට. දෙදෙනකුන්ගේ.

**උභො.** අ-දෙක, දෙදෙන, දෙකොටස.

**උභො අත්ථ.** න-උභයාර්ථය, මෙලෝ පරලෝ යහපත.

**උභො උපකච්ඡක.** න-කිසිලි දෙක, දෙකිසිල්ල.

**උම්මඟ්ග.** පු-නොමග. උමගය, ප්‍රඥාව, නුවණ, "උපකාජීවකො උම්මඟ්ගං ගහෙත්වා පක්කාමි."

**උම්භ.** d. භූ. පූරණෙ, පිරවීමෙහි, උම්භති, පුරවයි.

**උම්භති.** ක්‍රි-(උම්භ d. භූ. පූරණෙ, පිරවී-මෙහි + ති) පුරවයි.

**උම්මට්ඨ.** න-උඩපැත්තේ සිදුර, "උද්ධමුඛ ඡිද්දන්ති=උම්මට්ඨං."

**උම්මට්ඨ.** පු-යට සිට උඩු අතට ගසන පහර.

**උම්මජ්ජති.** ක්‍රි-(උ + මජ්ජ d. භූ. සංමජ්ජනෙ, මැඩීමෙහි + ති) ඇඟ උලයි, ඇඟ මිරිකයි.

**උම්මජ්ජන.** න-(උ + මජ්ජ + යු=අන) උන්මාර්-ජනය, ඇඟ ඉලීම.

**උම්මජ්ජිත.** න-ඇඟ උලන ලද; උන්මාර්ජනය කළ.

**උම්මත්ත.** පු-අත්තන ගස.

**උම්මත්ත.** ති-උමතුවා, පිස්සා, සිහිමුලාවූ අය, "යක්ඛුම්මත්තා පිත්තුම්මත්තා වසෙන දුවිධං උම්මත්තං."

**උම්මත්තක.** පු-උමතුවා, පිස්සා, උම්මත්තිකා, පිස්සි.

(7438)

**උම්මත්ත රූප**. ති-උමතු ස්වභාවය, පිස්සුගතිය.

**උම්මත්තක සම්මුති**. න-උමතු භික්ෂුවට කරණ විනයකර්මය, අසම්මුඛාකරණීය අටෙන් එකක්, මොහු සඟ මැද සිටියත් නොසිටියත් විනයකර්මවලට බාධාවක් නැත.

**උම්මද්දන**. න-වත්සුණු, මුහුණෙහි ගාන සුවඳ ද්‍රව්‍යය.

**උම්මද්දාපෙය්‍ය**. ක්‍රි-(උ + මද්ද d. භූ. මද්දනෙ, මර්දනයෙහි, + ණාපෙ + එය්‍ය,) ඇඟ උලවන්නේය.

**උම්මද්දිතබ්බ** ති-තැවරිය යුතු.

**උම්මද්දෙති**. ක්‍රි-(උ + මද්ද d. භූ. මද්දනෙ, මැඩීමෙහි + ණෙ + ති) මදියි.

**උම්මසති**. ක්‍රි (උ + මස. d. භූ. ආමසනෙ, ස්පර්ශයෙහි + ති)ස්පර්ශකරයි.

**උම්මසන** න-ස්පර්ශ කිරීම, මතුයේ තබා ස්පර්ශ කිරීම.

**උම්මා**. ඉ-ධාන්‍යවර්ගයක්, මෙනේරි.

**උම්මාද**. පු-වියරුව, පිස්සුව.

**උම්මාදන**. න-(උ + මද + ණ) විකාරය, උන්මාදනය, පිස්සුව.

**උම්මාපුප්ඵ**. න-දියබෙරලිය මල.

**උම්මාර**. පු-එළිපත, උලුවස්සේ පාත පඩිය.

**උම්මි**. ඉ. ඌර්මි. (මුහුදේ) රළ, තරඟ.

**උම්මිහති**. ක්‍රි-(උ + මිහ d. භූ. සෙචනෙ, තෙමීමෙහි + ති) තෙමයි, මූත්‍රකරයි. "තොදූරකා ඌහදනතිපි උම්මිහනතිපි."

**උම්මිසති**. ක්‍රි-(උ + මිස. d. භූ. මිලනෙ, ඇස් වැසීමෙහි + ති) ඇස අරියි.

**උම්මිකා**. ඉ-මුද්ද, මුදිහිරුව.

**උම්මිලන**. න-ඇසිපිය හැරීම, ඇසිපිය ඇරීම. ඇස දල්වා බැලීම.

**උම්මිලිත**. ති-උන්මීලනය කළ, ඇස හැර බැලීම් කළ.

**උම්මීලෙත්වා**. පු. ක්‍රි-(උ + මීල-ණෙ + ත්වා) ඇස දල්වා බැලීම.

**උම්මිලෙති**. ක්‍රි-(උ + මීල d. චු. නිමීලනෙ, ඇස නොදල්වීමෙහි + ණෙ + ති) ඇස නොදල්වයි, ඇස් නොපියයි.

**උම්මුක**. න-ගිනිපෙනෙල්ල.

**උම්මුක්ක**. න-ගිනිපෙනෙල්ල

**උම්මුඛ**. පු-ඉවත බැලීම, මුහුණ ඉවතට හැරවීම.

**උම්මුජ්ජ**. න-දියෙන් ඉල්පීම, "ගංගාය උම්මුජ්ජ නිම්මුජ්ජම්පි කරොනති."

**උම්මුජ්ජන**. න-දියේ ගිලීම. ගැලීම, ඉල්පීම.

**උම්මුජ්ජති**. ක්‍රි-(උ + මුජ්ජ d. භූ, මුජ්ජනෙ, ගැලීමෙහි + ති) ගැලෙයි, ගිලෙයි. "තෙ නජ්ජා නෙරඤ්ජරාය උම්මුජ්ජනතිපි නිමුජ්ජනතිපි."

**උම්මුජ්ජිත**. ති-ගැලෙන ලද, ගිලෙන ලද.

**උම්මුජ්ජිත්වා**. පු. ක්‍රි-කිමිද, ගිලී

**උම්මූල**. න-මුල් ඉහලට දැමීම, මුල් ඉදිරීම, උසුන් මුල්කිරීම.

**උම්මූලන**. ති-මුල් ඉදිරීම, උසුන් මුල්කිරීම.

**උම්මූලිත**. ත-මුල් උදුරා දමන ලද, මුල් ඉදුරු.

**උම්මූලෙති**. ක්‍රි-(උ + මූල d. චු. පතිට්ඨායං, පිහිටීමෙහි + ණෙ + ති) මූලොච්ඡින්න කෙරෙයි, මුල් උපුටයි. මුලිනුදුරයි.

**උම**. d. භූ. නිත්දයං, නිත්දවෙහි, උමති, නිත්ද කරයි.

**උමා**. ඉ-උමාව, පාර්වතිය, ඊශ්වර භාර්‍ය්‍යාව.

**උමාපති**. පු-උමාවගේ හිමියා ඊශ්වරයා.

**උමාධව**. පු-උමාවගේ ස්වාමියා, මහදෙවියා.

**උමු** d. භූ. අදනෙ, කෑමෙහි, උවති' අනුභව කරයි.

**උය්‍යුක්ත**. ක්‍රි-උත්සාහකර, වීර්‍ය්‍යකර.

**උය්‍යාති**. ක්‍රි-(උ + යා d. භූ ගතියං, යාමෙහි + ති) ඉදිරියට යයි.

**උය්‍යාන**. න උයන ගමන. "දෙහිමෙ කුමාර, උය්‍යානං ආරාමං කාතුං."

**උය්‍යාන කීලා**. ඉ-උයන් කෙළිය, උද්‍යාන ක්‍රීඩාව.

**උය්‍යාන පාල**. පු-උයන් පල්ලා, උද්‍යාන පාලකයා.

**උය්‍යාම**. පු-වීර්‍ය්‍යය, උත්සාහය.

**උය්‍යාන භූමි**. ඉ-උයන් බිම, උද්‍යාන භූමිය.

**උය්‍යාන නිස්සිත**. ති-උයන් ඇසුරු කළ.

**උය්‍යුඤ්ජති**. ක්‍රි-(උ + යුජ d. රු. යොගෙ යෙදීමෙහි + ං + ති) යෙදෙයි, විර්‍ය කරයි.

**උය්‍යුඤ්ජන**. න-යෙදීම, වීර්‍යකරණය,

**උය්‍යුඤ්ජිත**. ති-යොදනලද, වීර්‍යකළ.

**උය්‍යුත්ත**. ති-සෙනා සන්නි වෙසය, යුධසෙනා රැස් කිරීම.

**උය්‍යුත්තසෙනඞ්ගී**. පු-යුද පිණිස නික්මුණු සේනාව යන හැඟීම් ඇතිව ගමන් නික්මුණු, "ඡබ්බග්ගියා භික්ඛූ උය්‍යුත්තං සෙනං දස්සනාය අගමංසු. උය්‍යුත්තන්ති කත උය්‍යොගං."

**උය්‍යුත්තසෙනා**. ඉ-යුද්ධය සඳහා පිටත්වූ චතුරඞ්ගිනී සෙනාව.

**උය්‍යොග**. පු-විනාසය, මරණය, වියොගය.

**උය්‍යොගමුඛ**. න-විනාසමුඛය, මරණමුඛය.

**උය්‍යොජන**. න-යෙදීම, ගමන් පිටත් කිරීම.

**උය්‍යොජිත**. ති-යොදන ලද, මෙහෙයන ලද.

**උය්‍යොජෙත්වා**. පු-ක්‍රි-(උ + යුජ් + ණෙ + ත්වා) යවා, පිටත්කර යවා.

**උය්‍යොජෙති**. ක්‍රි-(උ + යුජ d. චු. යොගෙ, යෙදීමෙහි + ණෙ + ති) යොදයි, පිටත් කර හරියි.

**උය්‍යොධික**. පු- (උ + යුධ + ණවු + ක) යුද්ධ කරණ ස්ථානය, රණභූමිය. "උය්‍යොධිකං ගන්ත්වා කණ්ඩෙන පටිවිද්ධො හොති."

**උයති**. ක්‍රි-(උයි d. භූ. තන්තුසන්තානෙ, නූල් ගැලපීමෙහි + අ + ති) වියයි.

**උයි**. -d. භූ තන්තුසන්තානෙ, හූනැවීමෙහි. උයති, වියයි.

**උර**. -d භූ. ගතියං, යෑමෙහි, උරති, යෙයි.

**උර**. න-ළය, හෘදය, සිත.

**උරග**. පු-ළයින් යන්නා, බඩගාගෙන යන්නා, සර්පයා, "උරෙන ගච්ඡතීති උරගො."

**උරචක්ක**. න-උරසක, උරචක්‍ර මාලාව, කර පැළඳගන්නා තියුණු ආයුධයෙන් උපදනා කර්මවිපාකයන්ට අනුරූප මාලාවක්, මෙය පාපකර්ම ,විපාකයෙකි.

**උරච්ඡද**. පු-සන්නාහය, යුධ සැට්ටය, උර මාලාව, ළැමදෙහි දමන මාලාවක්.

**උරච්ඡදික**. පු-සන්නාහය, උරච්ඡද.

**උරච්ඡාදන**. න-ළය වැසීම, ළය වසනා සැට්ටය.

**උරණ**. පු-පොරගසන එළුවා, බැටළුවා.

**උරණක්ඛ**. පු-තුවරගස.

**උරණී**. ඉ-පොරගසන එළුදෙන, එළී, බැටළු දෙන.

**උරත්තාළි**. ඉ-දුකක් හෝ කරදරයක් පැමිණි විට පපුවට ගසා ගැණීම.

**උරත්ථාල**. පු-පපුව, ළය.

**උරත්තාලන**. න-උරයට ගැසීම, පපුවට ගැසීම.

**උරත්තාලිත**. ති-ළයට තළන ලද.

**උරත්තාලෙති**. ක්‍රි-(උර + තාලෙති) උරයට ගසයි.

**උරබ්භ**. පු-පොරගසන එළුවා, ඇනගන්නා එළුවා.

**උරබ්භඝාතක**. පු-එළුවන් මරන්නා, බැටළුවන් මරන්නා.

**උරසිජ**. ති - ළයෙහි හටගත් දෙය, ස්ත්‍රී පයොධරය.

**උරානී**. ඉ-උරලොම්.

**උරු**. ඉ-වැලි, වාළුකා, "උරුවෙලායං විහරති නජ්ජා නෙරඤ්ජායතීරේ"

**උරු**. ති-මහත්' විසාල.

**උරුතා**. ඉ-මහත, විචිත්‍රතාව.

**උරුවෙලා**. ඉ-දඹදිව බුද්ධගයාව සමීපයෙහි පිහිටි එනම් ජනපදය. "බුද්ධො භගවා උරුවෙලායං විහරති නජ්ජා නෙරඤ්ජරාය තීරෙ."

**උරුළ්හ**. ති-ශක්තිය, පරාක්‍රමය, මහාවීර්‍යය.

**උරොජාත**. පු-පුත්‍රයා, උරදූ.

**උල්ලඞ්ඝති**. ක්‍රි-(උ + ලඞ්ඝි d. රු. ගතියං, යෑමෙහි + ති) උල්ලඞ්ඝනය කරයි, පැනයයි.

**උල්ලඞ්ඝන**. න-පැනයාම, උඩට එසවීම, "උල්ලඞ්ඝනං නාම උද්ධං උච්චාරණං."

**උල්ලඞ්ඝිත**. ති-පැනයන ලද, උඩට ඔසවන ලද.

**උල්ලඞ්ඝෙති**. ක්‍රි-(උ + ලඝි d. රු. ලඞ්ඝනෙ, පැනයාමෙහි + ණෙ + ති) පැන යයි, උල්ලඞ්ඝනය කරයි.

**උල්ලපති**. ක්‍රි-(උ + ලප d. භූ. වාක්‍යෙ, කීමෙහි + ති) කියයි, උසස් කොට කියයි. ප්‍රකාශ කරයි.

**උල්ලපන**. න-(උ + ලප + යු=අන) කථා කිරීම, කීම, උසස්කර කථාකිරීම.

**උල්ලපිත**. ති-උල්ලපනය කළ, උසස් ලෙස බිණීම කළ.

**උල්ලාප**. පු-කථාව, උග්ඝොෂණය, කීම.

**උල්ලිඛති** ක්‍රි-(උ + ලිඛ d. භූ ලෙඛනෙ, ලිවීමෙහි + ති) ලියයි, ඉරිගසයි, සලකුණු කරයි.

**උල්ලිඛන**. න-ලිවීම, ඉරි ඇඳීම, සලකුණු කිරීම.

**උල්ලිඛිත**. ති-ලියනලද, ඉරිඅඳිනාලද, අඞ්කිත

**උල්ලිඞ්ග** න-ලිඞ්ග විපර්‍ය්‍යාසය, ලිඟු පෙරලීම.

**උල්ලිත්ත**. ති-ආලෙප කරණ ලද, බදාම ගාන ලද

**උල්ලිඞ්ගන**. න - වැණීයය, පදයාගේ ඌර්ධ්වාතීය ප්‍රකාශ කිරීම.

**උල්ලිත්තාවලිත්ත**. පු-ඇතුළත පිටත ආලෙප කළ.

**උල්ලුම්පති** ක්‍රි-(උ + ලුප d. රු. ඡෙදෙ, සිඳීමෙහි + ං + ති) උද්ධරණය කෙරෙයි, ගොඩලයි.

**උල්ලුම්පන**. න-උද්ධරණය කිරීම, ගොඩනැගීම.

**උල්ලුම්පතු**. ක්‍රි-(උ + ලුප d. රු. ඡෙදෙ, සිඳීමෙහි + තු) නගාසිටුවා, උද්ධරණය කෙරේවා.

**උල්ලුම්පිත** ති-උද්ධරණය කළ, ගොඩදැමූ.

**උල්ලුලිත**. ති-(සුලඟින්) සොළවන ලද, රැළි ගැසෙන ලද.

**උල්ලොක**. පු-උඩබැලීම, උඩකොටස, යට ගුදිරි උරය, "උල්ලොකන්ති උඩං ඔලොකනට්ඨානං උපරිභාගන්ති අත්ථො."

**උල්ලොකක**. පු-උඩ බලන්නා.

**උල්ලොකන**. න - උඩ බැලීම, උපරිභාගය බැලීම.

**උල්ලොකිත**. ති-උඩබලන ලද, උඩබැලූ.

**උල්ලොකෙති**. ක්‍රි-(උ + ලොක d. චු. දස්සනෙ, දකීමෙහි + ණෙ + ති) උඩබලයි.

**උල්ලොඝ**. පු-නිරොගි, ලෙඩ නැති.

**උල්ලොච**. න-වියන, උඩුවියන.

**උල්ලොපන**. න-උද්ධරණය, උඩට එසවීම.

**උල්ලොල**. පු-මුහුදේ රළ, නොනැවතිල්ල.

**උල්ලොලෙති**. ක්‍රි-(උ + ලොල d භූ ලොලනෙ,) ලොල්කිරීමෙහි, උඩවනගයි.

**උල්ලොම**. පු-න-උඩුවියන, නිහීය, මයිල් කෙළින් සිටීම.

**උල**. -d. භූ. ගතියං, යෑමෙහි, උලති, යෙයි.

**උලති**. ක්‍රි-(උල d. භූ. ගමනෙ, යාමෙහි + ති) යෙයි.

**උළාර**. පු-උළාර, මහත්.

**උළාරතා**. ඉ-උළාරබව, මහත්බව.

**උළාරත්ත**. න-මහත්බව.

**උළු**. පු-උළු, තාරකා.

**උළුඞ්ක**. න-සැන්ද, හැන්ද.

**උළුම්ප**. න-පසුර, පහුර.

**උළුම්පික**. පු-පසුරෙන් එතෙරවන්නා, ඔළුම් පික.

**උලූක** පු-බකමූණා, බස්සා.

**උලූකපක්ඛ**. පු-බකමූණු පියාපත්.

**උලූකපක්ඛික** න-බකමූණු පිහාටුවලින් කළ වස්ත්‍රය.

**උලූපී**. පු-මත්ස්‍ය විශෙෂයක්.

**උලූමල**. න-ගුගුල්, ගුග්ගුලු.

**උලූමලක**. පු-ගුගුල්.

**උවණ්ණ**. පු-උවණීය, උ ඌ යන අකුරු දෙක.

**උවාළ**. පු-තස්ස පාපියස්සිකා කම්ය කරණු ලැබූ භික්ෂු නමක්.

**උවිට්ඨ**. ති-ඇතුල්වූ, පිවිසෙන ලද.

**උසම**. පු-උෂණය, රසනය.

**උස්මීකත**. ති-උණුසුම් කළ, උණුසුම් ගන්වන ලද.

**උස්ස**. -d. භූ. සංඝට්ටනෙ, ගැටීමෙහි, උස්සති, ගටයි.

**උස්ස**. ති උසස්, ශ්‍රෙෂ්ඨ.

**උස්සක්කති**. ති-(උ + සක්ක d. භූ. ගමනෙ, යාමෙහි + ති) යෙයි, උසස්වයෙයි.

**උස්සක්කන**. න-උත්සාහය, වීර්‍යය.

**උස්සඞ්කිත**. ති-සැකකළ, විශ්වාස නොකළ, "පඤ්චහි අඞ්ගෙහි සමන්නාගතො භික්ඛු උස්සඞ්කිත පරිසඞ්කිතො හොති."

**උස්සඞ්කී**. පු-සැක ඇත්තා, සැක සහිතයා. "භීතො උම්මඟ්ගෙහා උස්සඞ්කී උත්‍රසෙතා සහසා අනෙතපුරං පාවිසි."

**උස්සඞ්ඛ**. පු-උද්ගතවූ සක්ගෙඩිය.

**උස්සඞ්ඛපාද**. පු-එනම් පාද ලක්ෂණය, මහා පුරුෂ ලක්ෂණයන්ගෙන් සත්වන ලක්ෂණය

**උස්සජති**. ක්‍රි-(උ + සජ d භූ. විසජ්ජනෙ, හැරීමෙහි + ති) ඉවත්කරයි, හරියි.

**උස්සජ්ජති**. ක්‍රි-උස්සජති බලනු.

**උස්සට**. ති හරණ ලද, බැහැර කළ.

**උස්සති**. ක්‍රි-(උස්ස d. භූ සට්ටනෙ, ගැටීමෙ + ති) ගටයි.

**උස්සද**. පු-ඔසුපත් නිරය, රාගාදී කෙලෙස්.

**උස්සදක**. පු-උස්සදය, පිරී ඉතිරී යාම.

**උස්සන්න**. ති-උසස්, අධික, වැඩි, ශක්ති සම්පන්න.

**උස්සන්නතා**. ඉ-අධික බව, වැඩිබව.

**උස්සය**. පු-රැස් කිරීම, නැගී සිටීම, ඉල්පීම.

**උස්සයවඤ්ඤු**. න-විවාද පිළිබඳ කථාකිරීම.

**උස්සයවාදී**. පු කොළාහල සහිතය, පරුෂ වචන කියන්නා.

**උස්සයාපෙති**. ක්‍රි-(උ + සි d. භූ. සයෙ, සැතපීමෙහි + ණාපෙ + ති) උස් කරවයි.

**උස්සරති**. ක්‍රි-(උ + සර d. භූ. සද්දෙ, ශබ්ද යෙහි + ති) ශබ්ද කරයි. මහත් ශබ්ද කරයි.

**උස්සව**. පු-උත්සවය, සැනකෙළිය. නැකැත් කෙළිය.

**උස්සරථ**. ක්‍රි-(උ + සර + d. භූ. සද්දෙ. ශබ්ද යෙහි + අ.) දුරුවවූ, පහවවූ

**උස්සහති**. ක්‍රි-(උ + සහ d. භූ. ඛමායං, ඉවසීමෙහි + ති) උත්සාහ කරයි. වීර්‍ය කරයි.

**උස්සාද**. පු-එසවීම, ඔසවීම, වීසි කිරීම.

**උස්සාදන**. න-එසවන, ඔසවන, උස් කරණ

**උස්සාදයිංසු**. ක්‍රි-(උ + සාද d භූ අස්සාදනාදීසු, රස විඳීම් ආදියෙහි + උං=ඉංසු) ඉතිරි කළහ. ශෙෂ කළහ.

**උස්සාදිත**. ති-ඔසවන ලද, උස් කළ.

**උස්සාදියති**. ක්‍රි-(උ + සාද d. භූ. අස්සාදනාදිසු, රස විඳීම් ආදියෙහි + ති) ඔසවයි, උස්සයි.

**උස්සාදියන**. න-ඔසවන, උස්සන.

**උස්සාදෙති**. ක්‍රි-(උ + සද d. භූ ගත්‍යවසාදනෙ, ගමන් නැවැත්මෙහි + ණෙ + ති) ඔසවයි, උස්සයි.

**උස්සාදෙතා**. පු-උසස් කරන්නා පක්ෂය හුවා දක්වන්නා.

**උස්සාදෙය්‍ය**. ක්‍රි-(උ + සද d. භූ. අස්සාදනාදිසු, රස විඳීම් ආදියෙහි + එය්‍ය) රැස්කරන්නේය, එකතු කරන්නේය.

**උස්සාපන**. න-එසවීම, උස් කිරීම.

**උස්සාපිත**. ති-ඔසවන ලද, උස් කළ.

**උස්සාපෙති**. ක්‍රි-උස්සාදෙති, බලනු.

**උස්සාපෙත්වා**. පු-ක්‍රි. උස්සා, ඔසවා, "චීවරං උස්සාපෙත්වා පුනප්පුනං විචජ්ජනතා."

**උස්සාරණ**. න-කස කරකැවීම, වේවැල් එසවීම.

**උස්සාරිත**. ති-ඔසවනලද, උස් කළ. රැස්වූ. එක්තැන්කළ.

**උස්සාරෙති**. ක්‍රි-(උ + සර d භූ. ගතියං යාමෙහි + ණෙ + ති) ඔසවයි, උස්සයි.

**උස්සාව**. පු-පිනි, තුසාර "උස්සාවොව තිණග්ගමහි."

**උස්සාවබින්දු**. පු-පිනිබින්දුව, "උස්සාවබින්දු තක්කානං විය."

**උස්සාවන**. න-එසවීම, දැක්වීම.

**උස්සාවනන්තික**. පු-ප්‍රසිද්ධ කළ සීමාව ඇතුළත කළ කුටිය.

**උස්සාස**. උඩට නගනා ස්වාසය, ඉහළට නගනා හුස්ම.

**උස්සාහ**. පු-(උ + සාහ) උත්සාහය, වීර්‍ය්‍යය. "යාවජීවං උස්සාහො කරණීයො"

**උස්සාහන**. න-වීර්‍ය්‍ය කිරීම.

**උස්සාහිත**. ති-උස්සාහ කළ, වීර්‍ය්‍ය කළ.

**උස්සිඤ්චති**. ක්‍රි-(උ + සිච. d. රු උග්ගරණෙ, වැගිරීමෙහි + ං + ති) ඉසියි, දිය වගුරුවයි.

**උස්සිඤ්චන**. න-(උ + සිඤ්ච + යු=අන) ඉසීම, දිය වැගිරීම, දිය ඉසීම.

**උස්සිඤ්චනීය කද්දම**. න-ඉසින්ට හැකි මඩ, ඝන නොවූ මඩ.

**උස්සුඤ්චිත**. ති-ඉසින ලද, ඉසි.

**උස්සිත**. ති-අභිවෘද්ධියෙන් සමන්විතයා, නගා බඳනා ලද ධ්වජ ඇත්තා. ඔසවනලද, එසවූ.

**උස්සීසක**. පු-හිස් මස්තකය, හිස මතු භාගය, හිස් දෙර.

**උස්සීස**. න-ඇඳේ හිස, ඇඳේ හිස තැබීම.

**උස්සුක**. ති-උත්සාහ ඇත්තා අධික වීර්‍ය්‍යය.

**උස්සුකිත**. ති-තෘෂ්ණාවෙන් තොර නැතැත්තා.

**උස්සුකී**. පු-උද්‍යොග ඇත්තා, වීර්‍ය්‍ය ඇත්තා.

**උස්සුක්ක**. ති-උත්සාහය, වීර්‍ය්‍යය, මාගීසෙවීම, "උස්සුක්කං වා සාතබ්බං,"

**උස්සුක්කතා**, ඉ-වීර්‍ය්‍යභාවය, උත්සාහ භාවය,

**උස්සුක්කති**. ක්‍රි-(උ + සුක d. භූ. ගතියං. යෑමෙහි + ති ) වීර්‍ය්‍යකරයි උත්සාහකරයි.

**උස්සුක්කන**. න-වීර්‍ය්‍යකිරීම, උත්සාහ කිරීම.

**උස්සුස්සති**. ක්‍රි-(උ + සුස d. දි. සො සෙ, වියලීමෙහි. ය + ති) වියලෙයි.

**උස්සුස්සන**. න.-වියලීම, දියසිඳීයාම

**උස්සුස්සිත**. ති.-වියළුනු, වේලිච්ච.

**උස්සූර**. පු-සූර්‍ය්‍යොදගමය, අති උදය, අළුයම, "උස්සූරෙ භත්තං නිහරිස්සති."

**උස්සූරභත්ත**. පු-අනියම් බත, පසු බත, මද්ධ්‍යාහ්නයෙන් පසුව වළඳන බත.

**උස්සූරසෙය්‍යා**. ඉ - ඉර පායනතුරු නිදීම, ප්‍රමාදව නිදීම.

**උස්සෙති**. ක්‍රි -(උ + සි. d. චු. බන්ධනෙ, බැඳීමෙහි ණෙ + ති) ගොඩ නගයි.

**උස්සෙනෙති**. ක්‍රි - (උ + සි. d. චු. සෙවනෙ, සෙවීමෙහි + ණ + ති) තමන්වෙත අදියි.

**උස්සොක** පු-දෙළ මත, ගඟ ඉස්මත්ත.

**උස්සොළ්හනති**. ක්‍රි-සිවුරුහම් කරත්, උරුහම් බාත්.

**උස්සොළ්හී**. ඉ-වීර්‍ය්‍යය, උත්සාහය, මල්ලව යුද්ධය.

**උස්සොළ්හික**. පු-වීර්‍ය්‍යවන්තයා.

**උස්සොළ්හිස්සන්ති**. ක්‍රි - සිවුරුහම් කරත්-නාහුය, උරුහම් බාත්නාහුය.

**උස** d. භූ. රුජායං, රිදීමෙහි, උසති, රුජා-කෙරෙයි.

**උස**. d. ග. දහෙ, දැවීමෙහි, උණුගාපෙති, දවයි, උණුසුම් කරයි.

**උසති**. ක්‍රි-(උස d. භූ රුජායං, රුදුවෙහි + ති) රුදු කරයි.

**උසණ**. ඉ-වගපුල්, එනම් මල්.

**උසභ**. න-ඉස්බ, රියන් 140 ක දුර ප්‍රමාණය.

**උසභ**. පු-එනම් ස්වරය, ඔසබිය, වෘෂභයා. වං ඇපල, සප්තස්වරයෙන් එකක්, ගවනාදය.

**උසභ**. ති-ශ්‍රෙෂ්ඨ, උත්තම, උසස්.

**උසභඞ්ග**. පු-ගොන් මොල්ලිය.

**උසභක්ඛන්ධ**. පු-වෘෂභයාගේ කඳ, උතුම් ගවයාගේ පිට.

**උසභච්ඡද**. පු-බුදුරජ, දුඃඛයට මූලභූත තෘෂ්ණාව සිඳිනැතැත්තා.

**උසභදන**. න- දෙනුන් හෝ ගවයන් දන්දීම.

**උසභයුද්ධ**. න-ගවපොර, ගවයන් පොර ඇණ ගැනීම.

**උසභලක්ඛණ**. න-ගව ලක්ෂණ, එනම් ශාස්ත්‍රය.

**උසර**. පු-සරුනැතිබිම, නිසරුබිම, කරමැටි-බිම.

**උසිත**. ති-වාසයකළ, වැස නිමවනලද, වුසිත.

**උසීර**. න-සුවඳහොට, සැවැන්දරා, බබුස්තණ.

**උසීරමය**. ති-බබුස් තණ හෝ සුවඳ හොටින් කළ විජිනිපත.

**උසීරබ්ජ**. පු-උසීරධ්වජ පර්වතය, මධ්‍යමණ්ඩලයේ එක් සීමාවක්.

**උසු**. d. භූ. දහෙ, සට්ටනෙ දහයෙහි, ගැටීමෙහි ඔසති, දහකරයි. ගටයි.

**උසූ**. ඉ-ඊය, ඊතලය, සැරය.

**උසුකාර**. පු-ඊකරන්නා, ඊ වඩුවා, ඊතල වඩුවා.

**උසුකාරක**. පු-හීවඩුවා, වඩුවා.

**උසුලොම**. පු-ඊතල වැනි ලොම් ඇත්තා, "අද්දසං **උසුලොමං** පුරිසං වෙහාසං ගච්ඡන්තං."

**උසුපෙත**. පු - ඊතලවැනි ලොම් ඇති ප්‍රේතයා.

**උසුම**. න-උෂ්ණය, රසනය, උණුසුම.

**උසුවඩ්ඪකී**. පු-ඊතල සාදන්නා, හී වඩුවා

**උසූයා**. ඉ-ඊර්ෂ්‍යාව, නො ඉවසීම.

**උසූයක**. ති-ඊර්ෂ්‍යා කරන්නා.

**උසූය**. d. භූ-දෙසාවිකරණෙ, දෙස් පහළකිරීමෙහි, උසූයති. දෙස්නගයි.

**උසූයති**. ක්‍රි-(උසූය d භූ. දෙසාවිකරණෙ, දෙස් නැගීමෙහි + ති) දෙස් පහළ කෙරෙයි.

**උසූයනා**. ඉ-දෙස් ප්‍රකාශ කිරීම.

**උසූයා**. ඉ-ඊර්ෂ්‍යාව, අන්සැපතට පිරි හෙළීම.

**උසූය පණ්ඩක**. පු - උසූය පණ්ඩකයා, පස් වැදෑරුම් පණ්ඩකයන්ගෙන් කෙනෙක්.

**උසූයොපගම**. පු-ඊර්ෂ්‍යා පුර්ව්ඞගම උපගමය.

**උහ**. d. භූ. විතක්කෙ, විතර්කයෙහි, උහති විතර්ක කරයි.

**උහි**. d. භූ. අද්දනෙ, ඇදීමෙහි, උංහති, පීඩා කරයි.

**උහුඞ්කාර**. පු-බකමූණා, එනම් අනුකරණ ශබ්දය.

**උළ**. d භූ. ගවෙසනෙ, සෙවීමෙහි, උළති, සොයයි.

**උළාර**. ති-විපුල, ප්‍රශස්ත, ප්‍රණීත, මිහිරි, මහත්.

**උළාරපූජා**. ඉ-ශ්‍රේෂ්ඨපූජාව, මහ පූජාව.

**උළාරභොගකුල**. න-මහත් සම්පත් ඇති කුලය.

**උළාරසම්භාවිත**. ති-උසස් යයි සම්මත වූ, ශ්‍රේෂ්ඨයයි පිළිගත්, "විසාඛා මහා උපාසිකා **උළාර සම්භාවිතා**."

**උළු**. ඉ-තාරකාව.

**උළුඞ්ක**, පු-හැන්ද, දිය ඉස්නා සැන්ද, කෙණ්ඩිය.

**උළුඞ්ක භික්ඛා**. ඉ - පිණ්ඩාහාරය, කෙණෙසි බත්, සැදිබත්.

**උළුම්ප**. පු-පහුර "මනුස්සා උළුම්පං බන්ධිත්වා ගංගාය ඔතරන්ති."

**උළුම්පති**. පු-පසුර, ඇණ සවිකිරීමෙන් කළ පහුර.

**උළුරාජ**. පු-චන්ද්‍රයා, තාරකාධිපතියා නක්ෂත්‍රාධිපතියා.

**උළුසිඞ්හ**. පු - ගුරුළා.

## ඌ

**ඌ**. අ-ප්‍රශ්න, ක්‍රෝධ වචන යන මෙහි.

**ඌකා**. ඉ-උකුණා, ලික්ඛා සතක් ප්‍රමාණ ගණන, රථරේණු සතිසක්, රථය යනවිට නගින දූවිල්ල රථ රේණු නම්.

**ඌජ**. d. චු. ජීවනෙ, ජීවත් විමෙහි, ඌජෙති, ජීවත්වෙයි.

**ඌජ**. d. චු. බලෙ, ශක්තියෙහි, ඔජයති, ශක්ති මත් වෙයි.

**ඌන**. d. චු-පරිහාණෙ, පිරීගීමෙහි, ඌනෙති. ඌනයති, පිරිහෙයි. අනු කෙරෙයි.

**ඌන**. පු-අඩු, අසම්පූර්ණ, හානි,

**ඌනක**. ති-උනු, අඩු.

**ඌනක අඩ්ඪතෙය්‍යකස**. න-කහවනු දහය කට අඩු, එබඳු වටිනාකමක් ඇති පොරොනය.

**ඌනකචතුක්කංස**. ති-කහවණු සොළොස කට අඩු. (1708)

**ඌනඡක්ඛත්තු.** ති-සවරකට අඩු, වාර සය කට අඩු.

**ඌනඡබ්බස්ස** ති-අවුරුදු සයකින් අඩු, සවසකින් අඩු කාලය.

**ඌනතික්ඛත්තු.** ති-තෙවරකට අඩු,

**ඌනසඤ්ඤා.** ඉ-අඩුය යන හැඟීම, එවැනි කල්පනාව.

**ඌනසඤ්ඤී.** පු-අඩුය යන හැඟීම ඇත්තා.

**ඌනතර.** ති-ඉතා අඩුවූ.

**ඌනද්වාදස වස්ස.** පු-දොළොස් වසින් අඩු, අවුරුදු දොළහට අඩු.

**ඌනදසවග්ග.** ති-දස නමකින් අඩු, දශ වර්ගීයකට අඩු, උපසම්පදාවක් නොකළ යුතු සංඝ සංඛ්‍යාව.

**ඌනපඤ්චබන්ධන.** න-බන්ධන පසකින් අඩු, බැඳුම් පසක් සම්පූර්ණ නොවූ, අළුත් පාත්‍රයක් පාවිච්චියට ගත හැක්කේ බැඳුම් පසකට වඩා ඇති පරණ පාත්‍රයක් ඇත්තාටය.

**ඌනබන්ධනවස්සිකා.** ඉ-එනම් සිකපද දෙක, ඌන පඤ්ච බන්ධන ශික්ෂාපදය හා වස්සික සාටික ශික්ෂාපදය.

**ඌනමාසක.** න-මස්සකින් අඩු, මෙපමණ වටිනා දෙයක් සොර සිතින් ගත් භික්ෂුහට දුකුලා ඇවැත්වේ.

**ඌනවීසතිගණ.** පු-එක නමකුදු අඩුවූ විංශති වර්ගී සංඝයා, එබඳු සංඝයාට අබ්භාන කර්මය කිරීමට නොහැක. විසිනමක්වත් සම්පූර්ණව සිටිය යුතුය.

**ඌනවීසති වස්ස.** පු-විසි අවුරුදු වයසට අඩු අවුරුදු විස්සක් නොවූ, නොපිරිපුන් විසි අවුරුදු ඇති.

**ඌනසංවාසනාසනා.** එනම් සිකපද තුණ. ඌන වීසති වස්ස, උක්ඛිත්තක සංවාස, නාසිතක සාමණේර සම්භෝග. යන තුණයි.

**ඌනස්සපාරිපූරියා.** ඉ-ඌනක චීවරයාගේ සම්පූර්ණ බව පිණිස.

**ඌනූදර.** ති-බඩගිනිවූ, අඩුවූ කුස ඇති.

**ඌනඋදර.** පු-හිස්බඩ, ආහාර වලින් හිස් උදරය.

**ඌනත්ත.** න-අඩුබව, ඌනබව.

**ඌණු.** d. භූ. අවජ්ඣාදනෙ, ඇඳීමෙහි, ඌණෙති, අඳියි.

**ඌමි.** ඉ-රළ, දියරළ. වේගය, ප්‍රකාශය.

**ඌමික.** ති-දිය රළ.

**ඌමිභය.** න-මහත් රළ වෙගය නිසා උපදනා බිය.

**ඌය.** d. භූ. තන්තුසන්තානෙ, විවීමෙහි, ඌයති, වියයි.

**ඌයි.** d භූ තන්තු සන්තානෙ, විවීමෙහි, ඌයති, වියයි.

**ඌරට්ඨි.** ඉ-කළවා ඇටය.

**ඌරණ්ණක්ඛ.** පු-තුවරලා ගස.

**ඌරව්‍ය** පු. බ්‍රහමයාගේ කලවයෙන් උපන්නා, වෛශ්‍යයා.

**ඌරු.** පු-කලවය. බොහෝ, මහත් "ඌරූයා පොත්ථනිකං බන්ධිත්වා"

**ඌරුක්ඛම්භ.** පු-කලවයේ කර්කශකම, කකුලේ අංශබාගය.

**ඌරුජ.** පු-කලවයෙන් උපන්නා, වෛශ්‍යයා.

**ඌරුඤ්ඤ.** ති-විවේක ඇති, කරදර නැති.

**ඌරුපබ්බ.** න-දණහිස, දණහිය, දණමඩල, ඌරු සන්ධිය.

**ඌරුබද්ධාසන.** න-පලක් බැඳ හිඳීම, ඌරු බද්ධාසනය.

**ඌරුමංස.** න-කළවා මාංශය, කළවයෙහි මස්. "ඌරුමංසං උක්කන්තිත්වා දසියා අදාසි."

**ඌස.** d භූ. රොගෙ, ලෙඩෙහි, ඌසති, අසනීප වෙයි.

**ඌස.** පු-කරමැටි, කරමැටිබිම, ප්‍රත්‍යූෂය, ඉතා උදය.

**ඌසගන්ධ.** පු-පස්වල සුවඳ, මැටි ආදියෙහි ඇති සුවඳ.

**ඌසණ.** න-මිරිස්.

**ඌසර.** ති-කරමැටි බිම.

**ඌසවන්තු.** පු-කරමැටි බිම් ඇති.

**ඌහ**. d. භූ. විතක්කෙන, විතක්කියෙහි ඌහති, විතර්ක කරයි.

**ඌහච්ච**. පූ. ක්‍රි-පැහැර, කිළිටිකොට, මළපහ කොට

**ඌහච්ච** පූ. ක්‍රි-(උ+හන d. න+ත්වා=රච්ච) උදුරා, නසා, සමූහනනය කොට

**ඌහඤ්ඤති**. ක්‍රි-(උ+හන d. දි හිංසායං, පෙළීමෙහි+ති) උදුරයි, නසයි.

**ඌහඤ්ඤි**. ක්‍රි-(උ+හන d. භූ හිංසායං, හිංසාවෙහි), අපිරිසිදුවිය, කිළිටිවිය.

**ඌහත**. ති-නසන ලද, උදුරණ ලද

**ඌහති** (ඌහ d භූ. විතක්කෙන, විතක්කියෙහි +ති) විතර්ක කරයි. සිතයි.

**ඌහනන**. න-ඉදිරීම, ඉගිලීම, නැසීම, සමූහනන බලනු.

**ඌහනති**. ක්‍රි-(උ+හන d භූ. හිංසායං, පෙළීමෙහි+ති) පෙළයි, පීඩාකරයි නසයි.

**ඌහනනන**. ති-මළපහකරණ, වර්චස්කොට අපිරිසිදු කරණ.

**ඌහරති**. ක්‍රි-(ඌ+හර. d. භූ. හරණසමිං, පැහැරගැන්මෙහි+ති) උදුරයි, පැහැර ගනියි.

**ඌහසති**. ක්‍රි-(උ+හස d. භූ හසනසමිං සිනාසීමෙහි+ති) සිනාසෙයි, විසුලුකරයි.

**ඌහදිත** ති-මළපහහකළ, අසුචි තැවරුණු.

**ඌහසන**. න-සිනාසීම, උසුලු විසුලු කිරීම.

**ඌහදනති**. ක්‍රි-(ඌ+හද d භූ. +නති) මළ පහකරත්.

**ඌහා**. ඉ-විතර්කය, පරීක්ෂණය අරමුණු පිළිබඳ විතර්ක කිරීම,

## එ

**එක**. ති-ශ්‍රෙෂ්ඨ, අසහාය, සඞ්ඛ්‍යා අන්‍ය, අතුල්‍ය, ඒක.

**එක**. ති-ශ්‍රෙෂ්ඨ, අසහාය, සඞ්ඛ්‍යා, අන්‍ය, අතුල්‍ය, ඒක, ගණන, සමාන, "එක පුග්ගලො භික්ඛවෙ ලොකෙ උප්පජ්ජමානො උප්පජ්ජති බහුජනහිතාය බහුජනසුඛාය අත්ථාය හිතාය දෙවමනුස්සානනති."

**එකක**. පු-හුදකලා, අසහාය තනිව.

**එකකත්තුක**. පු-පූර්වක්‍රියාවට හා අවසාන ක්‍රියාවටත් යෙදෙන එක කර්තෘ, එකම කර්තෘ කෙනෙක් ඇත්තේ එකකත්තුක නම්.

**එකකම්ම**. න-පොහෝපවුරුණු එක්වකිරීම, එක්ව සංඝ කර්ම කිරීම, එක කර්මය, "එකතො කත්තබ්බත්තා එකකම්මං නාම."

**එකකුල**. පු-එකම කුලයක් ඇති ගම, එක් ග්‍රාමභොජකයෙකු ඇති ගම.

**එකකූට**. න-එකමඹුල්ල, එකමහල, එකමුදුන.

**එකක්ඛි**. පු එකැස් ඇත්තා.

**එකඝන**. ති-එකාබද්ධවූ, එකට ඝනවූ. "සෙලො යථා එකඝනො වාතෙන න සමීරති."

**එක චඩ්කම** පු-එකම සක්මන, අබ්භානතයට වත් මානත් පූරණ භික්ෂුව සමග එක සක්මනෙහි සක්ම නොකළ යුතුය. "අබ්භානාරහෙන භික්ඛුනා සද්ධිං න එක චඩ්කමෙ චඩ්කමිතබ්බං."

**එකචරියා**. ඉ තනිව හැසිරීම, හුදකලා ජීවිතය, "එකචරියං දළ්හං කත්වා-"

**එකචාරිකභත්ත**. න එකචාරිකභත්තය, හැම ටම ලැබීම පිණිස වෙන වෙන ඕතිකාවෙත් නියමව ඇති බත.

**එකචාරිකවත්ත**. න-වස ඇතුළත හුදකලා වසන්නහු විසින් පිරිය යුතු වත, එනම් භාවනාව, "තෙනිකබු අනෙනා වස්සෙ එක චාරිකවත්තං පූරයිංසු, සද්ධිං චෙව එක චාරික වත්තනන්ත භාවනා කම්මංච."

**එකචඡදන**. ති-එකවහලක් ඇති, එවැනි කාමරපෙළ,

**එකචජනන** ති-(එක+ඡද+න=අනන) එක පියස්ස ඇති, එක වහලක් ඇති.

(7779)

**එකථාලක**. න-පැත්බොත එක බඳුන, එක මලාව, "න භික්ඛවෙ **එකථාලකෙ** පානීයං පාතබ්බං"

**එකදිවස**. න-එක් දිනයක්, එක් දවසක්.

**එකදිසා**. ඉ-එක්දිසාවක, එක පැත්තක.

**එකදෙවසික**. න-එක් දවසක, එක දිනයකම.

**එකදෙස**. න-එක් කොටසක්, එක භාගයක්.

**එකනිකායික**. පු-එකම නිකායෙහි වූ, තම නිකායට අයත් භික්ෂූහු.

**එකනිරොධ**. පු-එක්ව නිරොධය ඇති,

**එකභණ්ඩපඤ්චක**. පු-එකභණ්ඩපඤ්චකය, ආදියෙය්‍ය, හරෙය්‍ය, අවහරෙය්‍ය, ඉරියාපථං විකොපෙය්‍ය, ඨානාචාවෙය්‍ය, යන පඤ්චකය අදින්නාදාන පාරාජිකාවේ පස්විසි අවහාර යන්ට ඇතුලත් පඤ්ච පඤ්චකයන් ගෙන් එක පඤ්චකයක්.

**එකභත්ත**. න-එක් වේලක් පමණක් අනුභව කිරීම.

**එකභත්තික**. පු-එක් වේලක් පමණක් වළඳන තැනැත්තා.

**එකභව**. පු-එක භවය, පටිසන්ධි චුති දෙකෙන් සම්පූර්ණ භවය.

**එකභාජන**. න - එක්බඳුන, එක භාජනය, "**න එක භාජනෙ** භුඤ්ජිතබ්බං"

**එකභික්ඛු** පු එක භික්ෂුනමක්, එක මහණෙක්.

**එකමඤ්ච**. පු එක යහන, එක ඇඳ.

**එකමංස**. න-එකම මාංසය, එකමස.

**එකමූලක**. පු-එකම පදයක් මුල් කොට දක්වීම.

**එකමූලකනය**. පු-එක් පදයක් මුල්කොට දක්වීමේ න්‍යායක්‍රමය.

**එකරජ්ජු**. ඉ-එක ලණුව, එක් රැහැණ, එක කඹය.

**එකරත්ති**. ඉ-එක් රාත්‍රියක්, එක රැයක්

**එකරස**. පු-එකම රසය, විමුක්ති රසය, "විමුත්තිරසමෙව **එකරසං**"

**එකලක්ඛණ**. ති-එකම සවභාවය ඇති, එක ලක්ෂණය ඇති.

**එකවට්ට**. න-එක්වැල, එක්වැල රැහැණ.

**එකවස්ස**. ති-උපසපත් වීමෙන් එක වසක් ඇති, එක වසක් ඇති, "කතිවස්සොසි ත්වං ආවුසො, **එකවස්සො** අහං භන්තෙ."

**එකවාචා**. ඉ-එක් වචනය, එක් වරක් පමණක් කීම.

**එකවාචිකා**. ඉ - එක්වරක් කීම, උපසම්පදා කම්මවාක්‍යය එක් වරක් පමණක් ඇස්වීම.

**එකවිහාරී**. ති-හුදකලා විසීම් ඇති, තනිව වසන.

**එකවීසති**. ඉ-එක් විස්ස, එකකට වැඩි විස්ස.

**එකසඞ්ඝාත**. පු - (එක + සං + හන=ඝාත + අ) එක යුද්ධයක්, එක සටනක්, "නාහං පටිබලො පසෙනදි කොසල රඤ්ඤා **එක සඞ්ඝාත** මපිසහිතුං.

**එකසත්තාහිවත්ත** න-එක් සැත්තැවක්වත්, චුල්ලවග්ගපාළියෙහි පාරිවාසිකක්ඛන්ධක-යෙහි මේ එක්සැත්තෑවක්වත් ඇත.

**එකන්තරික**. න-එකන්තරික ධ්‍යානය, එක්වර නොයෙක් අයුරින් සමවැදීම් ඇති.

**එකපටලික**. පු-එක් පොටක් ඇති, එකම හම් පොටක් ඇති පාවහන්.

**එකපටවිවර**. න-තනිපට සිවුර, එක්පොටක් ඇති සිවුර.

**එකපණ්ණච්ඡත්ත**. න-තලපත් ආදී එකම පත්‍රයකින් කළ කුඩය, "තාලපණ්ණාදිනා එකෙන පණ්ණෙන කත ඡත්තං **එක-පණ්ණච්ඡත්තං** නාම."

**එකපද**. න-එකපදය, එක් කොටස, එක් පියවර.

**එකපරිච්ඡෙද**. පු - (එක + පරි + ඡිද + ණ) එක පරිච්ඡෙදය, එක කොටස, එකවගීය, "රූපියං අඤ්ඤවාදකං උපස්සුති ඉමානි තීනි එක **පරිච්ඡෙදනානි** වෙදිතබ්බං."

**එකපරියාකත**. ති-එක වෙළුම්පටක් ඇති, එක් වරක් වටකළ, එක් වෙළුම් පටක් ඇති කාය බන්ධනය. "අනුජානාමි භික්ඛවෙ භික්ඛුනියා **එකපරියාකතං** කායබන්ධනනති."

**එකපලාසික**. ති-එක් පටක් ඇති පාවහන්, භික්ෂූන්ට පාවිච්චිකිරීමට අනුදත් පාවහන් විශෙෂයක්.

**එකපල්ලඞ්ක**. පු-එක පර්‍ය්‍යඞ්කය, එක පළඟ, "භගවා රාජායතනමූලෙ සත්තාහං **එකපල්ලඞ්කෙන** නිසීදි විමුත්තිසුඛ පටිසංවෙදී."

**එකපස්ස**. ති-එක් පසෙක, එක්පැත්තක.

**එකපාපුරණ**. න-එක් පොරෝනය, එක් පොරෝනයක් ඇති.

**එකපුග්ගල**. පු-එක පුද්ගලයා, බුදුරාජානන් වහන්සේ, "**එකපුග්ගලො** භික්ඛවෙ ලොකෙ උප්පජ්ජමානො උප්පජ්ජති බහුජන හිතාය බහුජන සුඛාය අත්ථාය හිතාය දෙව මනුස්සානං."

**එකපුත්තක**. පු-එකමපුතා, "තාත ත්වං අම්හාකං **එකපුත්තකො**"

**එකපොරිස**. පු-පියවර සතක් ඇති සෙවනැල්ල, එක බඹය.

**එකබන්ධන** පු-එක බන්ධනයක් ඇති, එක බැම්මක් ඇති පාත්‍රය.

**එකබීජී**. පු-එකබීජී පුද්ගලයා, එනම් සෝවාන් පුද්ගලයා එකම සකන්ධ බීජයක් ඇති පුද්ගලයා.

**එකසමුට්ඨාන**. ති-එක් කාරණයකින් පැන නගින, එබඳු ඇවැත්.

**එකසම්භොග**. ති-එකම සම්භෝගය ඇති, ආමිෂ හා ධර්ම යන සම්භෝග ඇති, එබඳු භික්ෂුවරයා.

**එකසංවච්ඡර**. පු-එක සංවත්සරය, එක අවුරුද්ද.

**එකසාලක**. ති-එකම ශාලාවක් ඇති, එවැනි ආරාමය.

**එකසිඛා**. ඉ-කෙස්රොද, "අඤ්ඤමෙසො **එකසිඛාමත්ත** ධරොපි සො භණ්ඩුකම්මං ආපුච්ඡිත්වා ච පබ්බාජෙතබ්බො."

**එකසීමා**. ඉ-එකම සීමාව, පොහෝ පවුරුණු කරණ එක සීමාව, එබඳු සීමා ගෙය.

**එකසෙය්‍යා**. ඉ-එක සේනාසනය, එක සයනය, "දුක්කරං ජීවිං එකභත්තං **එකසෙය්‍යා**."

**එකහත්ථ**. පු-එක් අතක් පමණක් ඇත්තා.

**එකංස**. පු-ඒකාන්ත, නිශ්චය, එක පැත්ත "**එකංසං** උත්තරාසඞ්ගං කරිත්වා බුද්ධානං පාදෙ වන්දි."

**එකංසත්ථ**. පු. ඒකාන්තාර්ථයෙහි නිශ්චිතාර්ථයෙහි

**එකංසික**. ති-එක පැත්තකට අයිති, ඒකාන්ත සන්තක.

**එකංසිකතා**. ඉ-ඒකාන්ත භාවය, සත්තක බව.

**එකංසිකචීවර**. න-උත්තරාසඞ්ග චීවරය, එකංසයක් වසන සිවුර, තනිපට සිවුර.

**එකග්ග**. පු-සමාධිය, එකඟ, අනාකුල නානාරම්මණ ගත සිත ඒකාරම්මණය යෙදවීම. "සමාහිතං චිත්තං **එකග්ගං**."

**එකග්ගතා**. ඉ-ඒකාග්‍රතාව, එකඟ බව සමාධිය.

**එකඞ්ග**. පු-කොටස, ප්‍රදේශය.

**එකඞ්ගණ**. න-අවකාශය, ඉඩ ඇති තැන.

**එකච්ච**. ති-අසහාය දෙය, සමහර, ඇතැම්, "**ඉධෙකච්චො** පුරිසො."

**එකච්චික**. පු-එක්පටක් ඇති, එකපට, තනිපට සිවුර.

**එකච්චිය** පු-**එකච්චික** බලනු. තනිපට සිවුර, උතුරු සඟල, අන්තර වාසකය.

**එකච්ඡන්ද**. පු-සමානච්ඡන්දය, එක අදහස.

**එකච්ඡත්ත** න-එක සේසත, එක කුඩය.

**එකඝන**. ති-එකට ඝනවූ, එකට තදවූ.

**එකචක්ඛු**. න. පු-එක ඇස, එක් ඇසක් ඇත්තා.

**එකචක්ක**. පු-එක රෝදයක් ඇති රථය, සූර්‍ය රථය.

**එකචරියා**. ඉ-තනිව හැසිරීම, හුදකලා විසීම.

**එකචර**. ති-හුදකලාව හැසිරෙන, තනිව හැසිරෙන.

**එකචාරී**. පු-තනිව හැසිරෙන්නා.

**එකචිත්තක්ඛණික**. පු-එකචිත්තක්ෂණයක් කල් පවතින.

**එකචින්තී** පු-එකක් ගැණ සිතන්නා.

**එකජ**. ති එකවරක් උපන්නා, එකට උපන්නා, එකතැනකින් උපන්නා, කණ්ඨතාලව්‍යාදි වශයෙන් එක් තැනකින් උපදින අකුරු එකජ නම් වෙත්.

**එකජ්ඣං.** අ-එකතුකිරීම, එකට රැස්කිරීම, එක්ව.

**එකජ්ඣප්පවත්ති.** ඉ-එක් අයුරකින් පැවැත්ම, ඓකාධ්‍ය ප්‍රවෘත්තිය.

**එකටසිලා.** ඉ-දියමිතන වැල.

**එකතා.** න-එකඟබව, එකක්බව.

**එකත්තතා.** ඉ-එකත්ත භාවය, එකක් බව.

**එකත්තනය** පු-හේතුවල සම්බන්ධය විසින් පරම්පරාවේ නොසිඳී පැවැත්ම.

**එකත්තසඤ්ඤ** පු-එකාත්ම සංඥ ඇති බව.

**එකතො.** අ-එකට, එකින් එක "එකතො හුත්වා පුඤ්ඤං කාරිත්වා සග්ගං ලොකං උපපජ්ජිංසු."

**එකතො.** අ-එක්පසකින්, එක් පැත්තකින්,

**එකතො අවස්සුත.** ති-එක පසකින් පමණක් රාගයෙන් තෙත්වූ.

**එකතො උස්සාදිත.** ති-රැස්කළ, එක්තැනක පිඩුකළ.

**එකතො උස්සාරිත.** ති-එක් තැනක එකතුවූ, එක් තැනක රැස්කළ.

**එකතො භාජ.** න-එක් පැත්තක පමණක් බර ගෙදූ කද, එක පැත්තේ කද.

**එකතොවණ්ටිකමාලා.** ඉ-එක් පැත්තකට නැටි ඇතිවන සේ ගෙතූ මල් මාලාව.

**එකතොසුද්ධි.** ඉ-දායකයකු අත්හි හෝ පාමුල තබා දුන් වස්ත්‍රය, පංසුකූල සිවුරේ එක් ප්‍රභේදයක්.

**එකතොධාර.** ඉ-එක් පැත්තක මුවාත ඇති.

**එකත්ථ.** පු-එකම අර්ථයක් පවත්නා බව, එනම් සමාසයයි.

**එකථූප.** පු-ගොඩක්, එකතුව, රැස්ව.

**එකදිහ.** න-එකදවසක් දෙදවසක්.

**එකදත්තු.** අ-එකාන්තයෙහි, නිශ්චයෙහි.

**එකදන්ත.** පු-එකදතක් ඇත්තා, ගණදෙවියා.

**එකදා.** අ-එක්කලෙක, එක්සමයෙක්හි, එක දවසක්.

**එකද්වික.** න-එකක් ද දෙකක් ද

**එකදෙස.** පු-එක්දෙසයක්, එකකරුණක්.

**එකදෙසබ්‍යාපික** පු-ආධාරයාගේ එක් ප්‍රදේශයක ආධෙයයාගේ ව්‍යාප්තිය ඇතිවීම.

**එකදෙනිකා.** ඉ-එක් ඔරුවක් ඇති.

**එකදෙසූපචාර.** පු-එකදෙශයක්හුගේ අභෙද ව්‍යවහාරය.

**එකධා.** අ - එක් විභාගයකින්, එක් ප්‍රකාරය කින්.

**එකන්ත.** ති-එක් කෙළවරක් ඇති, එකාන්ත.

**එකන්ත.** න-ඒකාන්ත, නිශ්චිත, අතිශය.

**එකන්ත දුක්ඛ.** න-ඒකාන්තම දුක, සැපක් නැතිම.

**එකන්තරික.** ති-එක් අවුරුද්දක් ඇතුළත, වර්ෂයක් තුළ.

**එකන්තරිකභාජ.** න-එක් කෙළවරක බර එල්ලූ කද.

**එකන්තපරිපුණ්ණ.** ති-එක් දිනකුදු අත් නොහැර පිරිය යුතු, ජීවිතාන්තය දක්වා කඩනොකොට සම්පූර්ණකළ යුතු.

**එකන්ත පරිසුද්ධ.** ති-හැමලෙසින්ම පිරිසිදු, එකැතියෙන් පිරිසිදු.

**එකන්තජ්ඣොසාන.** න-එකම පරියොසානය.

**එකන්තනිබ්බිදා** ඉ-ඒකාන්ත නිර්වේදය.

**එකන්තලොමි.** පු-එකදෑය ඇති ඇතිරිය. දෙපිට එළුලොම් ඇති ඇතිරිය.

**එකන්තවාද.** පු-එකම අන්තවාද ඇත්තා.

**එකන්තසිල.** න ඒකාන්තශීලය.

**එකන්තික** පු-නියම විධිය, ව්‍යභිචාර නැත්තේ ඓකාන්තික නම්.

**එකනිරොධ.** පු-එකට නිරුද්ධවන.

**එකපටලික.** ති-එක පටක් ඇති පාවහනය.

**එකපට්ට.** ති-එක පටක් ඇති රෙද්ද.

**එකපිටක.** පු-ත්‍රිපිටකයෙන් එක් පිටකයක් දත්තා.

**එකපදික** ති-එකපදිකමාර්ගය, එක් කෙනෙකුට පමණක් යාහැකි නොපටු මාර්ගය.

**එකපදී.** ඉ-එකපදික බලනු.

**එකපලලඩක.** න-එකපයයිඹකා, එක්පලයක්

**එකපල.** න-විශාල ගෙඩිය, ලොකු ඵලය.

**එකපහාර** න-ඇසිල්ලකින්ම.

**එකපිඞගල.** පු-වෙසමුණු රජු.

**එකපුත්තික.** පු-එකම පුත්‍රයෙක් ඇත්තා.

**එකබීජී** පු-එකබීජයක් ඇත්තා, එක උත් පත්තිවාරයක් ඇත්තා.

**එකපොක්ඛර.** න-ශ්‍රේෂ්ඨ පොකුණ.

**එකභත්තික.** පු-එකවේලේ වළඳන බත් ඇත්තා.

**එකභත්තාකිනී.** ඉ-එකස්වාමියෙකුට භක්ති මත් ස්ත්‍රිය.

**එකමනන.** න-එකත්පස, එක්පාර්ශ්වයක.

**එකමත්ත.** පු-මාත්‍රා එකක් ඇත්තා, හ්‍රස්වය.

**එකමත.** න-එකහසිත, අවික්ෂිප්ත චිත්තය.

**එකමෙක.** න-එකක් එකක්, වෙන වෙනම.

**එකරජ්ජ.** න-එකම රාජ්‍යය, සක්විති රජුගේ රාජ්‍යය.

**එකරාජා.** පු-එකම රජු, සක්විතිරජු.

**එකවචන.** න-එකක් පිළිබඳ වචනය, එක අර්ථයක් කීම.

**එකවත්ථුක.** පු-එකක් වස්තුකොට ඇති.

**එකවාර.** න-එකම වාරය.

**එකයොග.** පු-කාර්‍ය්‍ය කීපයක් එක් සූත්‍රය කින් නියම කිරීම.

**එකවිධ.** ති-එක්විධිය, එක්ප්‍රකාරය, එකා කාරය.

**එකවොකාර.** පු-එක් සම්බන්ධයකින් යුත් භවය, අසඤ්ඤසත්තය.

**එකවොකාරභව.** පු-අසඤ්ඤසත්තභවය.

**එකසදිස.** ති-එක සමාන.

**එකසම.** ති-සමාන.

**එකසංඛ්‍යාත** න-එකට පිඩුකිරීම, එකට ගැටීම.

**එකසාටක.** පු-එක් සළුවක් ඇත්තා.

**එකසො.** අ-එකවිධියකින්, එක්පරිද්දකින්.

**එකසෙස.** පු-සමානවූ පදව්‍යඤ්ජනයන්ගෙන් එකක් ඉතුරු කිරීම.

**එකාකී.** ති-අසහාය දෙය.

**එකාකී.** ති-හුදකලාවූ.

**එකාගාරික.** පු-එක ගෙයකට අයත්, එක ගෙයක් වටකොට පැහැර ගැණීම, සොරා.

**එකාදස අග්ගි.** ඉ-රාගදෙස මොහාදි එකො ළොස් ගිනි.

**එකාදස-අනන්තරා.** ඉ-නසි අනිමිත්තා, නසි නිමිත්ත මත්තා ආදි එකොළොස් අනතුරු. මේවා උපසපත් කැමැති සාමණේරියකගෙන් අසනු ලැබේ.

**එකාදස-අනන්තරායික ධම්ම.** පු-එකොළොස් වැදූරුම් අනන්තරායකර ධම්.

**එකාදස-අභබ්බ.** ති-එකොළොස් වැදෑරුම් අභව්‍යයෝ.

**එකාදස අරුණුග්ගමන.** න-එකොළොස්වන අරුණ නැගීම, කඨිනොද්ධරණය කළ භික්ෂු-නමට දස දවසක් අතිරේක චීවරයක් දැරිය හැකිය.

**එකාදස - අවජ්ජිය.** ති-නොවැදිය යුතු එකො ළොස් දෙන.

**එකාදස-ආචරියවාද.** පු-ස්ථවිර වාදයෙන් වෙන් වී ගිය ආචාර්‍ය්‍යවාද එකොළොසක්.

**එකාදස ආදීනව.** පු-අනධිගතං නාධිගච්ඡති යනාදි දෙස් එකොළොස, සබ්‍රහ්මචාරීන්ට දෙස් දක්වන භික්ෂුහු කෙරෙහි මේ ආදීනව එකොළොස දක්නට ඇත.

**එකාදස-ආනිසංස.** ති-සුඛං සුපති යනාදි මෙත් වැඩීමෙහි ඇති අනුසස් එකොළොස.

**එකාදස-උපක්කිලෙස.** පු-විචිකිච්ඡා, අමනසි කාර, ථිනමිද්ධ ආදි දිව ඇස අපිරිසුදු කරණ එකොළොස් උපක්ලේශ.

**එකාදස-ගණ්ඨිකා.** ඉ-අට්ඨිමය, දන්තමය, විෂාණමය ආදි එකොළොස් වැදෑරුම් ගණ්ඨි.

**එකාදස-පද.** න-එකොළොස් ආක්‍රොශ පද.

**එකාදස-පරම.** න-දසාහපරමං අතිරෙක චීවරං ඌනකස්ස පාරිපූරියා මාසපරමං යනාදි වශයෙන් පරම ශබ්දයෙන් යුතුව පැණවූ ශික්ෂා පද එකොළොස.

(7946)

**එකාදස-පරික්ඛාර**. පු-අටපිරිකර, පසතුරුණ සම්කඩ, සැරයටිය යන තුනක් සමග වූ පිරිකර එකොළොස,

**එකාදස පාදුකා**. ඉ-අකැප පාදුකා එකොළොස.

**එකාදස-මාස**. අකාල චිවරයට නියමිත එකොළොස්මස.

**එකාදස-රාග**. ති-මොචනසසාද, මුචචනසසාද ආදී ආසවාද එකොළොස.

**එකාදස-වර**. න-විශාඛාව ලද වර අටත්, සුදෙවුන් රජ, ජීවකයන් හා මහාප්‍රජාපතීන් ලද වර තුණත් සමග වූ වර එකොළොස.

**එකාදස**. එකලොස 11, එකකින් වැඩි දශය, එකලොස්වන දවස.

**එකාදසම**. ති-එකොළොස්වෙනි.

**එකානික**. ති-තමාම.

**එකාභිධාන**. න-නානාවිධ පදඑ එක්විට කීම.

**එකායන**. න-(එක + අයන) එකමාර්ගය. ආයසීමාර්ගය.

**එකායන මග්ග**. පු-එකායනමාර්ගය, ආයසී මාර්ගය.

**එකාරක්ඛ**. පු-එකම ආරක්ෂකයෙක් ඇති.

**එකාරම්මණ**. න-එකක් අරමුණු කොට ඇති, එක අරමුණ.

**එකාලම්බණ**. න-එක්වස්තුවක එල්ලීම, අර මුණු ගැණීම.

**එකාලොපික**. පු-එක ආලොපයකින් ජීවත් වන්නා.

**එකාසන**. න-එක ආසනය, එක ආසනයක් ඇත්තා, එක අසුනක හිඳ වැළඳීම.

**එකාසනික**. ති-එක ආසනයක් අයිති, එක ආසනයකට හිමි.

**එකාසන භොජන**. න-පෙරවරු ආහාර අනු භවය.

**එකාසනිකඞ්ග**. න-දෙවෙනි ආසනයක් නොගෙණ එක ආසනයකම සිට දන්වැළඳීමෙන් පුරණ අඞ්ගයක්, තෙලෙස් ධුතාඞ්ගයන් ගෙන් එකක්.

**එකාහ**. න-එකදවස, එකදිනය.

**එකාහික**. ති-(එක + ආහික) එක දවසකට අයිති.

**එකිකා**. ඉ-හුදකලාවූ තැනැත්ති.

**එකිභාව**. පු-හුදකලා බව, සමාධිය.

**එකුත්තරික**. පු-අඞ්ගුත්තර නිකායට කියන අන්‍ය නමක්.

**එකුද්දෙස**. පු-එකට උදෙසීම.

**එකූනවීසති ධම්ම**. පු-පාපිවජ්ජතා, අතතුක්කංසන පරවම්භනතා ආදි එකුන්විසි දුර්වලධම්.

**එකූනවීසති පාරාජිකා**. ඉ - මෙථුන ධම්ම, අදින්නාදාන ආදි එකුන්විසි පාරාජිකා.

**එකුප්පාද**. පු-එකට ඉපදීම. එකට ඉපදීම ඇති.

**එකූන**. ති-එකක් අඩු "එකූන වීසති."

**එකෙකලිඞ්ග**. න-එකි එකි ලිඞ්ග ඇති නාමය, එකෙකලිඞ්ගය.

**එකො**. ති-එකෙක්, එක් පුද්ගලයෙක්.

**එකොදි**. අ-එකඟ, සමාධිය.

**එකොදිභාව**. පු-එකඟබව, අවික්ෂිප්තභාවය. "එකො උදෙතීති එකොදි"

**එකොදිභූත**. ති-එකඟ වූ, සමාධිගත වූ.

**එජ**. d. භූ. කම්පනෙ, කම්පාවෙහි, ඒජති, සැලෙයි.

**එජ**. d. භූ. දිත්තියං, බැබලීමෙහි, ඒජති, බබලයි.

**එජති**. ක්‍රි-(එජ. d. භූ. කම්පනෙ, දිත්තියං, කම්පාවෙහි, බැබලීමෙහි + ති) කම්පාවෙයි, බබලයි.

**එජා**. ඉ-තණ්හාව, ආසාව, තෘෂ්ණාව.

**එටති**. ක්‍රි-(ඉට d. භූ. ගතියං, යාමෙහි. ඉ= එ + ති) යෙයි.

**එට්ඨිසුද්ධි**. ඉ-පිරිසිදුව සිවුපසය සෙවීම, එසන සුද්ධිය.

**එට්ඨි**. d. සෙවීමෙහි, බැලීමෙහි. එස d. ස=ට්ඨ ඉ. සෙවීම.

**එට්ඨි**. න-(එස + ති) සෙවීම, සිවුපසය සෙවීම, කැමැතිවීම.

**එඨ**. d. භූ. බාධායං, පෙළීමෙහි, එඨති, පෙළයි.

**එඨති.** ක්‍රි-(d. භූ. බාධායං, පෙළීමෙහි + ති) පෙළයි.

**එණී.** පු-එණී නම් මුවා.

**එණීමිග.** පු-එණී මෘගයා, එණීමුවා.

**එණීජඞ්ඝ.** පු-එණීමුවන්ගේ කෙණ්ඩය, බුදුරජ.

**එණෙය්‍ය.** පු-එණී මෘගයාට අයිති, එණීමුවාට අයත්.

**එණෙය්‍යක.** පු-ඒණී මෘගයා පිළිබඳ, එනම් වධයක්.

**එත්තක.** ති-මෙපමණ, මෙම ප්‍රමාණ "එත්තකොති පමාණං."

**එත්තතො.** අ-මෙපමණින්, මෙතකින්.

**එත්තාවතා.** අ-මෙපමණින්, මෙපමණකින්. පරිච්ඡෙදාර්ථයෙහි.

**එත්තො.** අ-මෙපමණින්, මෙපමණ.

**එත්ථ.** අ-මෙහි. කාල දෙශ ප්‍රදෙශ අවස්ථා ආදියෙහිය.

**එතරහි.** අ-දැන්, මේ කාලයෙහි. "එතරහි මනුස්සා දුට්ඨා, අධම්මිකා, අධම්මික බහුලා හොන්ති."

**එතාදිස.** ති-මෙබඳු, මෙවැනි, මේ ආකාර.

**එතාවන්ත.** පු-මෙපමණ. මෙම ප්‍රමාණ.

**එති.** ක්‍රි-(ඉ d. භූ. ගතියං, යාමෙහි + ති) එයි, ආගමනය කරයි.

**එතිහ.** න-උපදෙශ පරම්පරාව, ඉතිහාසය.

**එථ.** ක්‍රි-(ඉ d. භූ. ගතියං, යාමෙහි + ථ) එව, එවු, එන්න, "එථ මයං ආවුසො සමණස්ස ගොතමස්ස සන්තිකං ගන්තුං."

**එදි.** ති-මොහු මෙන් ඔහු දකී යන අර්ථයෙහි.

**එදික්ඛ.** ති-මොහු මෙන් ඔහු දකී යන අර්ථයෙහි.

**එදිස.** ති-මෙබඳු, මෙයාකාර.

**එදිසක.** ති-මෙබඳු, මෙවැනි.

**එධ.** පු-දර, ගින්දර.

**එධ.** d. භූ. වුඩ්ඪියං, වැඩීමෙහි, එධති, වැඩෙයි, ලබයි.

**එධති.** ක්‍රි-(එධ d. භූ. වුඩ්ඪියං, වැඩීමෙහි + ති) වැඩෙයි, ලබයි.

**එනං.** ති-මේ යන අර්ථ ඇති සබ්බනාම ශබ්දයක්.

**එනිජ්ජක.** න-එනම් මුවසම්වලින් අතුරණ ලද.

**එරක.** ති එනම් තෘණ විශෙෂයක්, එරූ.

**එරකවජ.** පු-දඹදිව පුරාණ නුවරක්.

**එරකපත්ත.** න-එරූපත් කොළ, එනම් නාගයා.

**එරකදුස්ස.** න-එරූහුයෙන් කළ වස්ත්‍ර-සිවුරු.

**එරකවත්තික.** න-දෙතිස් වධයෙන් එකක්.

**එරගු.** න-සතවූ එක් තෘණ විශෙෂයක්, එරූ තණ.

**එරණ්ඩ.** පු-එරඬු, එඬරු, එඬරු ගෙඩි.

**එරණ්ඩතෙල.** න-එරඬු තෙල්.

**එරණ්ඩති.** ක්‍රි-(එරඩි d භූ හිංසායං, වධයෙහි + ති) හිංසා කරයි.

**එරණ්ඩි** d. භූ. හිංසායං, වධයෙහි, එරණ්ඩති, හිංසා කරයි.

**එරණක්ඛම.** ති-එසවිය හැකි බව, නගාලිය හැකි බව.

**එරාවන.** පු-එනම් ඇතා, සක්දෙවිඳුගේ එරාවන නම් ඇතා, නාරංගස.

**එරිත.** න-කම්පාවන ලද, චලනය වන ලද.

**එවකාර.** පු-එව යන නිපාත ශබ්දය එවකාර නම්.

**එරෙති.** ක්‍රි-(ඊර d. චු කම්පනෙ, චලනය වීමෙහි + ණෙ + ති) කම්පා කරවයි.

**එල.** න-දොෂය, වැරැද්ද, ජලය, "එලං වුච්චති උදකං"

**එල.** d. චු කම්පනෙ, කම්පාවීමෙහි, එලෙති, කම්පාවෙයි.

**එල.** න-එන්සාල්, එන්සාල් ගස.

**එලජ.** න-පියුම්, නෙළුම්.

**එලම්බරිය.** ති-ජලයෙහි උපන්.

**එලක.** න-එළිපත්ත, එළුවා.

(8036)

**එලම්බරික.** ති-දියෙහි වූ.

**එලම්බරක.** න-මිදි වැල් විශෙෂයක්.

**එලගල.** ති කෙලතොලු, ජඩ, තුවර ගස.

**එලගල.** ඉ-කුඩා පැලැටි වර්ගයක්.

**එලගග.** ති-කාමාදියෙහි ඇලුනු.

**එලමූග.** පු-කියන්නට ද අසන්නට ද නො හැකි තැනැත්තා.

**එලම්බුජ.** පු එල නම් දියෙන් උපන්.

**එලා.** ති එන්සාල්, කෙල, බීරා.

**එලාලුක.** න-කැකිරි තවමහාඑලයන් ගෙන් එකක්.

**එලි.** ඉ-විලුඹ.

**එව.** ති-අවධාරණාර්ථයෙහි යෙදෙන නිපාත යක්.

**එවං.** ති-අවධාරණාර්ථයෙහි නිපාතයක්, නිදර්ශන, ආකාර, උපමා, සම්ප්‍රහර්ෂණ, උපදෙශ, වචන පිළිගැන්ම, නිඥා, ඉදමත්ථ යන අරුත්හි වැටේ.

**එවරූප.** ති-මෙබඳු, මෙයාකාර, මෙවැනි.

**එවම්පි.** ති-උපමා, වචන ප්‍රතිග්‍රහණ, නියම, නිඥා, ඉදම් ශබ්දාර්ථ, ප්‍රමාණ, ප්‍රශ්නය මේ අරුත්හි වැටේ.

**එවං දිට්ඨි.** න-මෙබඳු දෘෂ්ටියක් දරණ, "පායාසි රාජඤ්ඤස්ස එවං දිට්ඨි උප්පාදි."

**එවං නාම.** ති-එබඳු නමක් ඇති.

**එවාහං.** අ-(එවං + අහං) එබඳු වූ මම.

**එවුමං.** අ-එවැනි, එසේ.

**එවස්සු.** අ-(එවං + අස්සු) මෙසේ වූහ.

**එවංස.** අ-එවැනි, එබඳු, "එවං ස තෙ ආසවා විඝාත පරිලාහා"

**එස.** d. භූ. ගතියං යාමෙහි, එසති, සොයයි, යෙයි.

**එසති.** ක්‍රි-(එස d. භූ. ගතියං, යාමෙහි + ති) යෙයි, සොයයි.

**එසන.** න-සෙවීම, බැලීම, පරියෙසණය, ආමිෂ සෙවීම.

**එසනා.** ඉ-(එස + න + ආ) සෙවීම, ආමිෂ සෙවීම.

**එසනා සුද්ධි.** ඉ-ධාර්මිකව සිවුපස සෙවීම.

**එසා.** ඉ-මෑ, මෝ තොමෝ, "එසා යක්ඛිනී, දාරකං මා පස්ස."

**එසිකා.** ඉ-ඉන්ද්‍රඛීලය, එසිකා සථම්භය, ඇතුළු නුවර හෝ පිට නුවර නගරාලඞ්කාරය සඳහා ගල්වලින් හෝ ලීයෙන් කළ කුළුණක්.

**එසිත.** ති-පරියෙසිත, සොයන ලද,

**එසී.** ති-සොයන්නා, සොයන තැනැත්තා.

**එසු.** d භූ. ගතිය, යාමෙහි, එසති, සොයයි.

**එසුකාරී** පු-පෙර බරණැස විසූ රජෙක්, බුද්ධ කාලයේදී සුද්ධෝදන රජුය.

**එසො.** අ-එත ශබ්දයාගේ ප්‍රථමා එකවචන රූපය, මෙතෙම, මේ තෙම, "එසො මං අක්කමි."

**එහලොකික.** පු-ඓහලෞකික, මෙලොවට අයත්, මෙලොව විඳයුතු

**එහි** ක්‍රි-(ඉ. d. භූ. ගතියං, යාමෙහි + හි) එව, මෙහි එව.

**එහි.** අ-එව, වරෙන්, ඉම ශබ්දයාගේ තෘතියා පඤ්චමී බහුවචනය.

**එහි පස්සික.** පු-එව බලවයි දැක්විය යුතු ගුණ ඇති, එව, බලවයි කීමට සුදුසු, නව ලොවුතුරා දහම්හි එක් ලක්ෂණයක්, "ස්වාක්ඛාතො භගවතා ධම්මො එහිපස්සිකො ඔපනයිකො පච්චත්තං වෙදිතබ්බො විඤ්ඤූහීති."

**එහි භද්‍රන්තික.** පු-නිමන්ත්‍රණයක් භාරගන්නා තැනැත්තා.

**එහි භික්ඛු.** පු- "එව මහණ යි" වදාරණ බුද්ධ වචනය හා ම සෘධියෙන් ලැබෙන පාත්‍ර සිවුරු දරව පිහිටන ශ්‍රමණභාවය ඇති භික්ෂුව, එසේ ලැබෙන මහණ උපසම්පදාව. "තෙ සබ්බෙ එහි භික්ඛුභාවෙ නෙව පබ්බජිත්වා අරහත්තං පත්වා පරිනිබ්බායිංසු."

**එහි භික්ඛු උපසම්පදා.** ඉ-"එහි භික්ඛු චර බ්‍රහ්මචරියං, සම්මා දුක්ඛස්ස අන්තකිරියාය." යනාදි වශයෙන් දෙන උපසම්පදාව, අට වැදෑරුම් උපසම්පදාවන්ගෙන් එකක්.

**එහි භික්ඛුක.** ති-එහි භික්ෂු භාවයෙන් උප සපන් වූ තැනැත්තා.

**එහි භික්ඛුනී**. ඉ-එහි භික්ෂුපසම්පත්තියෙන් උපසම්පදාව ලැබුවා වූ මෙහෙණ.

**එහි භික්ඛු චීවරං**. න එහි භික්ෂු චීවරය, ඍද්ධියෙන් උපන් සිවුර, විසිතුන් වැදෑරුම් පාංශුකූල චීවරයන්ගෙන් එකක් "**එහි භික්ඛු චීවරන්ති** ඉද්ධිමයෙන නිප්පන්නං චීවරං."

**එහි සාගත.**
**එහි ස්වාගත.** ති - යාළු මිත්‍රයෙකු පිළිගන්නා විට පාවිච්චි කරණ වචන, මෙහි එන්න, ඔබගේ පැමිණීම යහපත්ය, ඔබට යහපතක් වේවායි ආදි ආසිංසනාත්මක වචන.

**එළ**. න-දෝෂය, ජලය, එළ.

**එළක**. පු-එළුවා, එළිපත, එළිපත්ත.

**එළක චතුක්ක**. පු-එළක චතුෂ්කය ආනන්තරී කර්ම විභාගයේ එක් කොටසක්.

**එළක චම්ම**. න-එළු සම්, තිරෙළු සම්, දක්ෂිණාපථසථ භික්ෂූන්ට මේවා පාවිච්චි කිරීමට අනුදත වදුරා ඇත.

**එළක පාදපීඨ**. න-එළුවන්ගේ පා වැනි පා ඇති පුටු විශේෂයක්.

**එළක ලොම**. න-එළුලොම්, එනම් ශික්ෂා පදය, තෙලෙස් සමුට්ඨානයන්ගෙන් එකක්.

**එළක සංවාස**. න එළුවන්ගේ එක්වීම, කථා බහක් නොමැතිව නිශ්ශබ්දව එක තැන විසීම. "**එළක සංවාසසදෙසඬව** කිර මෙ භික්ඛවෙ මොඝපුරිසාවුසො සමානා."

**එළගල**. පු-තුවර ගස, කලිල ගස, කෙළ තොල්ලා, කෙළ වැගිරෙන වචන ඇත්තා.

**එළගල වාචා**. පු-කෙළ තොලු වචන ඇත්තා. කථා කරන්නට සැරසෙන විට මුවින් කෙළ වැගිරෙණ අය. "අයං ධනපාලො හොති දුබ්බතො **එළගල වාචො**."

**එළමූග**. පු-කථාකරන්නට ද අසන්නට ද නොහැකි තැනැත්තා. කෙළතොල්ලා.

**එළමුඛ**. පු-නිතර මුවින් කෙළ වැගිරෙන්නා, කෙළතොලු අය, පැවිදි නොකට යුතු පුද්ගලයෙක්, "**එළමුඛොති** නිච්චං පග්ඝරිත ලාල මුඛො, එළමූගොපි වුච්චති."

**එළං**. ඉ-කෙළ, එන්සාල්, එන්සාල්ඇට.

**එළාලුක**. න-නව මහා එළයන්ගෙන් එකක්වූ කැකිරි, කැකිරි එළය, කැකිරි වැල.

## ඔ

**ඔ**. අ-පාලි වර්ණමාලාවේ අටවැනි ස්වරය, අනුමතාර්ථ, බ්‍රහ්ම, විෂ්ණු, මහෙශ්වර යන අර්ථයන්හි යෙදෙන අව්‍යයක්,

**ඔක්කන්ත**. පු-අවක්‍රාන්ත, පැමිණීම, ගෘහය, ආධාරය.

**ඔක්කන්ති**. ඉ-අවක්‍රාන්තිය, පැමිණීම, ලඟාවීම.

**ඔක්කන්ති**. ක්‍රි (අව + කමු d හු සප්පගතිමහි, ගමනෙහි + නති) ඉපදීම, පිළිසිඳ, ගැනීම, මව් කුසට පැමිණීම, "**ඔක්කන්තීති** නිබ්බත්ති."

**ඔක්කන්තික**. පු-පැමිණීම ඇති, ලඟාවීම් ඇති,

**ඔක්කන්තික ධම්ම දෙසනා**. ඉ - ප්‍රකීර්ණක දේශනාව, සූත්‍ර - අභිධර්ම - විනය පාලියට නොහැගු බුද්ධ දෙසනාව, "ඛන්ධෙන අනුපවිසිත්වා අන්තරා කථියමාන **ධම්මදෙසනා ඔක්කන්තික ධම්ම දෙසනා** නාම."

**ඔක්කන්තික පීති**. ඉ-ඔක්කන්තික ප්‍රීතිය, පඤ්චවිධ ප්‍රීතීන්ගෙන් එකක්.

**ඔක්කන්තික විනිච්ඡය**. න-ආචරිය වාදය, ආචාර්‍ය්‍යවාදයෙහි බැසගත් තීරණය, අර්ථකථාව, සතර මහා ප්‍රදෙශයන්ගෙන් එකක්

**ඔක්කන්දික**. න- පනිමින්, මුවෙකු මෙන් ශබ්දකිරීම. "මිගො විය **ඔක්කන්දිකා**."

**ඔක්කන්දිකා**. පු. ක්‍රි-(අව + කන්ද + ඉ + කා) පැන පැන, මහරුව් පවත්වන.

**ඔක්කමන්තා** පු-පැමිණෙන්නෝ, පසුව එන්නෝ, එක්දිශාවකින් පැමිණෙන අය. බැසගන්නෝ. "නිද්දං **ඔක්කමන්තානං** සුපිනනෙනන අසුචි මුච්චනති."

**ඔක්කමනතී**. ඉ-ඉක්මවන්නී, ඉක්මවා යන තැනැත්තී,

**ඔක්කමයන්ත.** ති-බැසගන්න, පැමිණෙන, ළඟා වන.

**ඔක්කමන.** න-ඇතුල්වීම, ප්‍රවෙශවීම, පැමිණීම පසු බැසීම.

**ඔක්කමති.** ක්‍රි-(අව + කමු d භූ. පදගතියං, පහව යෑමෙහි + ති) පහව යෙයි, ඔක්කමන්ති පහව යෙත්.

**ඔක්කමි.** ක්‍රි-(අව + කමු d. භූ. පදගතියං, පහව යෑමෙහි + ඊ) පැමිණියේය. නින්දට වැටුනේය. "මුහුත්තෙන නිද්දං **ඔක්කමි**."

**ඔක්කමිත්වා.** පූ. ක්‍රි-(අව + කමු + ඉ + ත්වා) පැමිණ, වෙත ඉවත්ව, පැමිණ, "ආයස්මා ආනන්දො අත්තරා මග්ගෙ ගුළකරණං **ඔක්කමිත්වා**."

**ඔක්කමිංසු.** ක්‍රි-(අව + කමු d. පදගතියං, පහව යෑමෙහි + සු) පැමිණියාහුය, ගියාහුය, පහව ගියාහුය. "තෙ භික්ඛූ ගාම සීමං **ඔක්කමිංසු**."

**ඔක්කම්ම.** පූ ක්‍රි-ඉවත්ව, පහව, පැමිණ.

**ඔක්කල.** න උත්කල ජනපදය,

**ඔක්කස්ස.** ති-බලෙන් ඇද, තමා වෙතට ඇද,

**ඔක්කාචිතවිනීත.** ති - නොහික්මුණු, හික්මීමක් නැති, නොදැමුණු,

**ඔක්ඛායති.** ක්‍රි-(අව + ඛී. d. කි. ඛයෙ, ක්ෂය වීමෙහි + ති) ක්ෂය කරයි, පහතට හැරෙයි, නැඹුරු කරයි.

**ඔක්ඛායික.** ති-ගැඹුරු, ඈත, දුර, පහතට නැඹුරු වූ.

**ඔක්ඛිත්ත.** ති-(අව + ඛිප + ත) යටහෙළූ, බිම බැලූ, පහතට හරවනලද, යටට දමනලද,

**ඔක්ඛිත්තචක්ඛු.** ති-යටට හෙළූ ඇස් ඇති, බිම බලාගත් ඇස් ඇති, පහතට නමාළූ ඇස් ඇති, බිම බැලූ. "සො භික්ඛු ඔක්ඛිත්ත චක්ඛු ඉරියාපථ සම්පන්නො ගාමං පිණ්ඩාය පාවිසි."

**ඔක්ඛිත්තලොචන.** ති-බිම හෙළූ ඇස් ඇතිව, පහත හෙළන ලද ඇස් ඇතිව, "ආයස්මා ආනන්ද ත්ථෙරො **ඔක්ඛිත්තලොචනෙන** අන්තර ගාමං පිණ්ඩාය චරිත්වා."

**ඔක්ඛිපති.** ක්‍රි-(අව + ඛිප + d. භූ. ඛෙපනෙ, තැබීමෙහි + ති) පහතට හරවයි, බිමට නමයි.

**ඔක.** න-ගෙය, දිය, ජලය, ආධාරය.

**ඔකපුණ්ණ.** න-දිය පිරුණු, දියබත්වූ, "ඔක පුණ්ණෙහි චීවරෙහි"

**ඔකප්පන.** න-ඇදහීම, සිතීම, කල්පනා කිරීම.

**ඔකප්පනසද්ධා.** ඉ-ඇදහීමෙන් ඇතිවූ ශ්‍රද්ධාව.

**ඔකප්පනීය.** ති-ඇදහිය යුතු වූ, ඇදහිලි කටයුතු වූ,

**ඔකප්පෙති.** ක්‍රි-(අව + කප්ප d භූ. කම්පනෙ, සිතීමෙහි + ණෙ + ති) වරදවා කල්පනා කරයි. වරදවා අදහයි.

**ඔකම්පති.** ක්‍රි-(අව + කම්ප d. භූ. කම්පනෙ, කම්පා වීමෙහි + ති) මදක් කම්පා වෙයි. ටිකක් කම්පා වෙයි.

**ඔකම්පන.** න-කම්පාවීම, චලනය.

**ඔකම්පිත.** ති-කම්පාවන ලද.

**ඔකම්පෙත්වා.** පූ. ක්‍රි (අව + කම්ප + ණෙ + ත්වා) මදක් සොලවා. හිසවනා.

**ඔකම්පෙති.** ක්‍රි-(අව + කපි d. චු. චලනෙ, චලනයෙහි + ණෙ + ති) චලනය වෙයි. සැලෙයි.

**ඔකස්සති.** ක්‍රි-(අව + කස්ස d. භූ. ගතියං, යාමෙහි + ති) ආපසු අදියි.

**ඔකස්සන.** න-අවකස්සනය, ආපසු ඇදීම.

**ඔකස්සිත.** ති-අවකස්සිත, ආපසු අදිනලද.

**ඔකසාරී.** පු ගෙයි හැසිරෙන්නා. ආලය ඇත්තා.

**ඔකාර.** න-ලාමක භාවය. පඤ්චස්කන්ධය. "කාමානං ආදීනවං **ඔකාරං** සඞ්කිලෙසං දෙසෙත්වා."

**ඔකාස.** අ-අවකාශය, අවසරය, **ඔකාසං දෙති ඔකාසං යාචති.**

**ඔකාස.** පු - අවසරය, අවකාශය, හෙතු, ස්ථාන, ආධාරකාරකය.

**ඔකාසකම්ම.** න-අවසර ලබාගැනීම, ඉඩ ලබාගැනීම.

**ඔකාසකිච්ච.** න-අවකාශ ලබාගැන්ම, ඉඩ ලබාගැන්ම.

(8141)

**ඔකාසති.** ක්‍රි-(අව + කාස d. භූ. දිත්තියං, බැබලීමෙහි + ති) බබලයි, දකියි.

**ඔකාසතො.** අ – අවකාශ හෙයින්, අසුභ කමටහනේ නිමිති ගන්නා ක්‍රමයක්.

**ඔකාස නිමිත්ත.** න-ඔකාස නිමිත්ත, කෙසාදි කොටස් ගැණ භාවනා කරණ ක්‍රමයක්.

**ඔකාස පරිකප්ප.** න-ඉඩ-අවකාස කල්පනා කර ගැනීම, දෙවැදෑරුම් පරිකප්පාවහාරයන් ගෙන් එකක්.

**ඔකාසපුච්ඡා.** ඉ-අවකාශ ඉල්ලීම, ස්ථානය විචාරීම.

**ඔකාසසෙනාසන.** න-විවේක සෙනසුන, සිවු වැදෑරුම් සෙනසුන්වලින් එකක්.

**ඔකිණ්ණ.** ති-ගැවසීගත්, මිශ්‍ර වන ලද. "**ඔකිණ්ණො** විහරාමි හත්ථිහි හත්ථිකලභෙහි හත්ථිච්ඡාපෙහි."

**ඔකිරණ.** න-විසිරවීම, ඉසිරවීම.

**ඔකිරති.** ති-(අව + කිර d භූ විකිරණෙ, විසිර වීමෙහි + ති) විසුරුවයි ඉසියි.

**ඔකිරි.** ක්‍රි-(අව + කිර d. භූ. ආකිරණෙ, දැමී මෙහි + ඊ) පහතට හෙළීය, පහතට දැමීය.

**ඔකිරිණී.** ඉ-ගැවසුනී, ගැවසුනු තැනැත්තී, ගිනි අඟුරින් මැදිවූ තැනැත්තී.

**ඔකිරියති.** ක්‍රි. (අව + කිර d. භූ. ආකිරණෙ, විසුරුවීමෙහි + ඊය + ති) සිඳින ලද කෙළ-වරින් ගැලෙයි. වැගිරෙයි.

**ඔකිලිනී.** ඉ-තෙත්වූ තැනැත්තී, සිරුරින් ඔජාව වැගිරෙන්නී.

**ඔකොටිමක.** පු-ඉතා මිටි, ලකුණ්ටක. "දුබ්බණ්ණො දුද්දසො **ඔකොටිමකො** බව්හාබාධො."

**ඔඛ.** d භූ සොසනෙ, වියලීමෙහි, ඔඛති, වියලෙයි.

**ඔඛති.** ක්‍රි-(ඔඛ. d. භූ. සොසනෙ, වියලීමෙහි + ති) වියලෙයි.

**ඔග්ගමන.** න-(අව + ගමන) බැසයාම, අස්තඞ්ගමනය.

**ඔගණ.** ති-අඩුවූ සමූහය, ටික පිරිසක්, "**ඔගණෙන** භික්ඛු සංඝෙන සද්ධිං."

**ඔගත.** ති-බැසගිය, ඉර බැසගිය, "**ඔගතෙ** සුරියෙති අත්ථඞ්ගතෙ සුරියෙ."

**ඔගධ.** පු-අභ්‍යන්තරිත, ඇතුළත්.

**ඔගමන.** න-අවගමනය, සරසව් යාම, ඇදව යාම.

**ඔගහන.** න-අනුප්‍රවේශය, දියට බැසීම.

**ඔගහෙත්වා.** පු. ක්‍රි-අනුප්‍රවේශව, දියට බැස.

**ඔගය්හ.** පු. ක්‍රි-අවගහනය කොට, බැස.

**ඔගාහ.** ති-බැසගත්, අවතීර්ණ, දිය, ජලය, "**ඔගාහා** ච මෙ උත්තිණ්ණස්ස හත්ථිනියො කාය—."

**ඔගාහන.** න-ඔගහනය, බැසගැන්ම.

**ඔගාහෙත්වා.** පු-ක්‍රි-(අව + ගාහ + ණෙ + ත්වා) බස්වා, ගිල්වා.

**ඔගාහති.** ක්‍රි-(අව + ගාහ. d. භූ. විලොලනෙ කැලඹීමෙහි + ති) දියට බසී.

**ඔගාළ්හ.** පු-දියට බැසීම, දියේ ගිලීම.

**ඔගිලති.** ක්‍රි-(අව + ගිල. d. භූ. අජ්ඣොහරණෙ ගිලීමෙහි + ති) අනුභව කරයි, ගිලියි.

**ඔගිලන.** න-අනුභවය, ගිලීම.

**ඔගුණ්ඨිතසීස.** න-වෙළන ලද හිස, එනම් ශික්ෂාපදය.

**ඔගිලිත.** ති-අනුභවකළ, ගිලිනලද.

**ඔගුණ්ඨන.** න වෙළීම, එතීම.

**ඔගුණ්ඨිත.** ති-වෙළන ලද, ඔතන ලද "න **ඔගුණ්ඨිතෙන** සීසෙන අන්තරඝරෙ ගමිස්සාමීති සික්ඛා කරණීයා."

**ඔගුණ්ඨෙති.** ක්‍රි-(අව + ගුණ්ඨි. d. චු. වෙඨනෙ වෙළීමෙහි + ති) වෙළයි, ඔතයි.

**ඔගුම්ඵෙති.** ක්‍රි-(අව + ගුම්ඵ. d. භූ. ගුම්ඵනෙ මල්දම් ගෙතීමෙහි + ණෙ + ති) මල්දමින් සරසයි මල්දමින් වසයි.

**ඔගුම්බෙත්වා.** පු. ක්‍රි – (අව + ගුම්බ + ණ + ත්වා) ඝන දඬු යොදා, එසේ පියසි තනා.

**ඔගුම්බන.** න-පියස්ස සුඛ කිරීම.

**ඔගුම්බියන්ති.** ක්‍රි-(අව + ගුම්බ d. භූ. ගුම්බනෙ වෙළීමෙහි + ඊය + න්ති) වෙළා බඳිනු ලැබෙත්. "චම්මවට්ටෙහි **ඔගුම්බියන්ති**."

(8181)

**ඔඝ** - පු-ගලාබසිත බලවත් සැඩ පහර, මහත් ජල සම්බන්ධය, කාමාදි චතුර්විධ ඔඝය, සමූහය.

**ඔඝනීය**. ති-චතුරොඝයට අයිති, කාම - භව - දිට්ඨි - අවිජ්ජා ඔඝයන්ට අයත්.

**ඔඝාතිග** පු - චතුරොඝය මැඩපැවැත්වූ තැනැත්තා.

**ඔඝතිණ්ණ**. පු - චතුරොඝයෙන් එතර වූ තැනැත්තා "ඔඝතිණ්ණොති වුච්චති."

**ඔවරක**. ති-පහත්ව හැසිරෙන්නා, ඔත්තු කාරයා, ඇතුලෙහි හැසිරෙන.

**ඔවරක කථා**. ඉ-ඔත්තුකීම පිළිබඳ කථා, සංඥා ආදිය ගැණ කථා.

**ඔවරණ**. න-අවවරණය, හැසිරීම.

**ඔවරති**. ක්‍රි-(අව + වර d. භූ. වරණෙ, හැසිරීමෙහි + ති) හැසිරෙයි.

**ඔචරිත** ති-හැසිරෙණ ලද.

**ඔචරිත්වා**. පු-ක්‍රි-සලකා, විමසා, පරීක්ෂා කොට බලා.

**ඔචිණ්ණ**. පු-ප්‍රගුණ කළ, පුහුණු කළ, පුරුදු කළ.

**ඔචිණන**. න-නෙලීම, වල් නෙලීම.

**ඔචිණන**. න-රුස්කිරීම, එකතු කිරීම, ඖචිත්‍ය තය නම්.

**ඔචිනාති**. ක්‍රි - (අව + චි d. කි. චයෙ, රැස් කිරීමෙහි + නා + ති) රැස් කෙරෙයි.

**ඔචිනන්ති**. ක්‍රි (අව + චින d. භූ. චිනනෙ, කැඩීමෙහි + නති) මල් කඩත්, මල් නෙලත්.

**ඔචිනාපන**. න-(අව + චි + න + ණප + පු=අන) නෙළීම, කැඩීම, මල් කැඩීම, මල් නෙලීම.

**ඔචිනිතබ්බ** ති-නෙලිය යුතු, කැඩිය යුතු

**ඔචිනාපෙන්ති** ක්‍රි (අව + චි d චයෙ, රැස් කිරීමෙහි + නා + ණාපෙ + නති) නෙලවත්, කඩවත්, මල් නෙලවත්, මල් කඩවත්.

**ඔචජිණ්ඩිත්වා** පු ක්‍රි - (අව + ජිණ්ඩ + ඉ + ත්වා) අවුරා, මග අවුරා, මග වලකා "අමනුස්සා මග්ගං ඔචජිණ්ඩිත්වා තිලිසි."

**ඔචිත**. ති-රුස්කළ, එකතු කළ.

**ඔචිත්‍යනය**. න-පූර්වාපර විරොධිත්වයෙන් යුත් බව ඖචිත්‍ය නම් ඒ ඖචිත්‍යයාගේ වශයෙන් ශබ්දාර්ථ විභාග කිරීම.

**ඔචිත්‍යහීන**. න-ඖචිත්‍යයෙන් තොරවීම, වාක්‍යාර්ථ දෙෂයෙකි.

**ඔජ**. පු-දීප්තිය, ශක්තිය, ඔජො නම් කාව්‍ය ගුණය.

**ඔජ** d. චු. බල තෙජෙසු, බල තෙජස්හි, ඔජයති, බලදෙයි.

**ඔජති** ක්‍රි (උජු d භූ අජ්ජවෙ, ඍජු භාවයෙහි + උ=ඔ + ති) ඍජු කරයි, ඇද නැති කරයි.

**ඔජහාති**. ක්‍රි (අව + හා d භූ. ගතියං යාමෙහි අව = ඔ + ති) ඉවතයෙහි, බැහැර කරයි.

**ඔජා** ඉ-ඔජාව, ශරීර යාපනය කරණ රස ඔජාව, රසගතිය, "අමනුස්සා ආමිසනාහිපි ඔජමහි හරනාති."

**ඔජිනාති** ක්‍රි-(අව + ජි d කි. ජයෙ, දිනීමෙහි + නා + ති) පෙරළා දිනයි, ආපසු දිනයි.

**ඔඤාත** ති-(අව + ඤා + ත) නින්දාකළ, ගරහන ලද, පහත් කොට සැලකූ.

**ඔඤ්ඤාපෙන්ති**. ක්‍රි-(අව + ඤා + ණාපෙ + නති) ලාමක කොට සිතත්, අවමත් බස් බෙණෙත්.

**ඔට්ඨ** පු ඔටුවා, ඔෂ්ඨය, තොල.

**ඔට්ඨ** ති-මුවවිට, ගැට්ට, "සවෙ ජම්මාය පතතං නිකකුජ්ජෙය්‍ය ඔට්ඨො සංසියති."

**ඔට්ඨජ**. ති-තොලෙන් උපදනා, දෙතොලින් උපදන අකුරු, "උපවග්ගා ඔට්ඨජා."

**ඔට්ඨවචිත්තක** පු-එනම් අනුකරණය කරණ පක්ෂිවර්ගයකි, ඔට්ඨව, චිත්තකයයි නාද කරණ පක්ෂි විශෙෂයක්.

**ඔච්ඡුහන**. න-කෙලගැසීම.

**ඔච්ඡුහති** ක්‍රි - (අව + ඡුභ d. තු නිරච්ඡුහනෙ කාරා දැමීමෙහි, අව = ඔ + ති) කාරා දමයි, කෙලගසයි.

**ඔට්ඨො**. පු - දැඩි, ඔටුවකු මෙනි, දශවිධ ආක්‍රොශ වස්තුවෙන් එකක්.

**ඔඩ්ඪ**. ති-නැමුනු, පහතට නැමුනු, යටහත්වූ.

**ඔඩ්ඩන**. න-ඇටවීම, එලවා තැබීම, කෙමන් ආදිය ඔබා තැබීම.

**ඔඩ්ඩි**. ක්‍රි-(උඩ්ඩ d. භූ. ඔඩ්ඩනෙ, අභිමුඛයෙහි + ඊ) අභිමුඛ කෙළේය. ඉදිරිපත් කෙළේය.

**ඔඩ්ඩිත**. ති-එලවා තබන ලද, කෙමන් ආදිය අටවා තැබූ.

**ඔඩ්ඩෙති**. ක්‍රි. (අව + ඩි d. භූ. ඛිපන උඩ්ඩනෙ, දැමීමෙහි, උඩටයාමෙහි, ණෙ + ති) අතඩගු ආදිය සාදා තබයි.

**ඔඩ්ඩෙන්ති**. ක්‍රි-අටවත්, උගුලක් අටවත්

**ඔණ**. d. භූ. අපනයනෙ, බැහැර කිරීමෙහි, ඔණති බැහැර කරයි.

**ඔණති**. ක්‍රි. (ඔණ d. භූ අපනයනෙ, බැහැර කිරීමෙහි + ති) බැහැර කරයි.

**ඔණීත**. ති-ගෙණ එන ලද, ගෙණෙන ලද.

**ඔණීරක්ඛ**. පු-ගෙණවුත් දුන් බඩු ආරක්ෂා කරන්නා, “ආභටං භණ්ඩං ගොපෙන්තස්ස ඔණීරක්ඛො නාම වුච්චති.”

**ඔණොජන**. න-කල් තැබීම, පරෙස්සම් කර තැබීම.

**ඔණොජෙථ** ක්‍රි-(අව + නුද + ණෙ + ථ) දෙව්, “ඔණොජෙථාවුසො පත්තචීවරන්ති.”

**ඔත්තප්ප**. පු පාපයට බියවීම පවට බියවීම.

**ඔත්තප්පඅනොත්තප්ප**. පු-පාපයට බියවීම හා බිය නොවීම.

**ඔත්තප්පති**. ක්‍රි-(අව + තප d. භූ. තාපෙ තැවී-මෙහි + ති) තැවෙයි.

**ඔත්තප්පගාරවතා**. ඉ - පාපයට බියවීමේ ගෞරව බව.

**ඔත්තප්පන**. න-තැවීම, දැහය.

**ඔත්තප්පධන**. න-පාපයට බියවීම් ධනය.

**ඔත්තප්පී**. පු-පැපයට බිය ඇත්තා.

**ඔත්ථට**. ති-යටත් කළ, පොඩිකළ, වස්නා ලද.

**ඔත්ථත**. ති-ඔත්ථට බලනු.

**ඔත්ථරක**. පු-කණු සතරක වස්ත්‍රයක් බැඳ දියෙහි බහා එයින් පැන් පෙරාගැණීම.

**ඔත්ථරණ**. න-යටත් කිරීම, මිරිකීම.

**ඔත්ථරති**. ක්‍රි - (අව + ථර d. භූ. සත්ථරණෙ, යටත්කිරීමෙහි + අව=ඔ + ති) යටත්කරයි.

**ඔතත**.. පු-මස්තකය වසාගන්නාලද.

**ඔතප්පති**. ක්‍රි-(අව + තප්ප d. භූ තප්පනෙ, තැවීමෙහි + ති) රත්වෙයි, රත්කරයි.

**ඔතමසික**. පු - (අව + තමස + ඉක) අඳුරෙහි සිටින්නා.

**ඔතරණ**. න-දියටබැසීම. එතරවීම.

**ඔතරණහාර**. පු-යම් අර්ථසංවර්ණනා විශෙෂය-කින් සූත්‍රාගත ධර්මයෝ ප්‍රත්‍යයාකාරාදී ධර්මයන්හි ප්‍රවෙශ කරණු ලැබීම.

**ඔතරණී**. ඉ-ඔරුව, පාරුව, බෝට්ටුව, නැව.

**ඔතරති**. ක්‍රි - (අව + තර d. භූ. තරණෙ, එතෙරවීමෙහි + ති) එතරකරයි.

**ඔතරාති** ක්‍රි - (අව + තර d. භූ තරණෙ, තරණය කිරීමෙහි + ති) අවතරනය කරති.

**ඔතල්ලක**. පු දුගියා, දීනයා, බැගෑපත් තැනැත්තා.

**ඔතාපන**. න-තැවීම, රත්කිරීම.

**ඔතාපෙත්වා**. පු-ක්‍රි-(අව + තප + ණාපෙ + ත්වා) තවා, වියලා, රත්කොට.

**ඔතාපෙති**. ක්‍රි-(අව + තප d. භූ. දැහෙ. දැවී-මෙහි. අව=ඔ + ණෙ + ති) තවයි, උණුසුම් කරයි.

**ඔතාර**. න-සිදුර ප්‍රමාදය. බැසගැන්ම, පිවිසීම.

**ඔතාරණ**. න-බැසීම, ජලයට බැසීම.

**ඔතාරාපෙඛ**. පු-සිදුරු සොයන්නා, අනුන්ගේ වරද සොයන්නා.

**ඔතාරිත**. ති-බසිනලද, දියට බසිනා ලද.

**ඔතාරෙති**. ක්‍රි-(අව + තර d. භූ. තරණෙ, එතෙරවීමෙහි ණෙ + ති) එතර කරයි, එගොඩ කරයි.

**ඔතිණ්ණ**. ති-එතරවන ලද, එතරවූ, ඇතු-ළත්වූ අවතීර්ණ.

**ඔතු**. පු-බිඩාල, බළලා

**ඔදක**. පු-(උදක + ණ) ජලයෙහි උපන්, ජලය. “කද්දමො නාම ඔදකො.”

**ඔදකන්තික**. ති-දිය කෙළවර කොට ඇති, උදක කිස අවසන්කොට ඇති.

(8263)

**ඔදකජාති**. ඉ-දියෙහි උපදින, මසුන් ආදීහු,

**ඔදග්ග**. න-උදග්ගභාවය, ඔදවැඩිබව.

**ඔදග්‍ය**. න-ඔදවැඩීම, උදග්ගභාවය.

**ඔදන**. පු-බත, ආහාරය, සත්වැදෑරුම් ධාන්‍ය-යෙන් පිසූ බත,

**ඔදනගන්ධික**. ති-බත්වැනි, බත්වැනි සවභාවය ඇති.

**ඔදනසම්භව**. ති-බතින් හටගත්, බතින් උපන්, බත්උල.

**ඔදනික-ආපණ** න-බත් විකුණන සල්පිල, බත් කඩය.

**ඔදනික-ඝරවීථි**. ඉ-බත් විකුණන ගෙවල් ඇති වීදිය, එබඳු වෙළඳුන් ඇති වීදිය.

**ඔදනික**. පු - සූදයා, අරක්කැමියා, බත පිසන්නා, රසකයා.

**ඔදනිය**. පු-ඔදනිකයා.

**ඔදනියඝර**. න-කුස්සිය, බත්උයන කුස්සිය.

**ඔදනියසුරා**. ඉ-බත්වලින් පෙරන සුරා විශෙෂයක්.

**ඔදපත්තකිනි**. ඉ-ජලපාත්‍රය සාක්ෂ්‍ය කොට පාවාදුන් බිරිඳ.

**ඔදපත්ති**. ඉ-උදකපාත්‍රයෙහි අත තබා ජලය මෙන් වෙන් නොවී පවතිමුයි නියමකර-ගන්නා ලද ස්ත්‍රිය.

**ඔදරික**. පු උදරයෙහි උපන්නා, එක උදර-යෙහි උපන් තැනැත්තා, සහෝදරයා.

**ඔදරිකතා**. ඉ-සහෝදරභාවය.

**ඔදරිකත්ත**. න-උදරපූරණය, බඩපිරුම.

**ඔදරිථ**. ක්‍රි-(අව + දහ d භූ. + ථ) යොමුකරව්, කණ් තමව්.

**ඔදහති**. ක්‍රි-(අව + දහ d. භූ. පතිට්ඨායං, පිහිටීමෙහි. අව=ඔ + ති) පිහිටුවයි. දහබලනු.

**ඔදහන**. න-පිහිටුවීම.

**ඔදහිත**. ති-පිහිටුවනලද, ප්‍රතිෂ්ඨාපිත.

**ඔදහිත්වා**. පු. ක්‍රි-(අව + දහ + ඉ + ත්වා) බහා, ඇතුලත බහා.

**ඔදාත**. පු-සුදු පැහැය, පිරිසිදු එළළ.

**ඔදාතක**. පු-සුදු, පිරිසිදු, සුදු වස්ත්‍රය.

**ඔදාතකසිණ**. න-සුදු පැහැති කසින මණ්ඩල-යක් අරමුණුකොට භාවනාකිරීම, ඔදාත කසින නම්. දස කසිණයන්ගෙන් එකක්.

**ඔදාතවණ්ණ**. පු-සුදුපැහැය, සුදුපාට.

**ඔදාතමනස**. පු-පිරිසිදු සිත,

**ඔදාතවසන**. න-සුදුවස්ත්‍ර හැඳීම

**ඔදාතවත්ථ**. න-සුදුවස්ත්‍රය, සුදුරෙද්ද.

**ඔදාර**. ති-උදාරභාවය, උජාරුකම.

**ඔදිස්ස**. අ-උදෙසා, කරුණු සහිතව, අනියම් ලෙස.

**ඔදිස්සක**. ති-නියමපරිදි, විශෙෂසහිත උදෙසා.

**ඔදිස්ස**. පු-ක්‍රි-උදෙසා, පිණිස, නියමකොට,

**ඔදීරණක**. ති-ගැලවූ පිටපොත්ත ඇති ගස, අහක්කළ ගසක පොත්ත, පොතුගලවා දැමූ.

**ඔදුම්බර**. පු-උදුම්බරගසට අයත්, දිඹුල්ගස පිළිබඳ.

**ඔධස්ත**. ති-පහත්කළ, පහතට හෙළන ලද

**ඔධානීය**. පු-යම්කිසිවක් දමන තැන.

**ඔධානසමොධාන**. න-එනම් මානත, සමො-ධානපරිවාසයන්ගෙන් එකක්.

**ඔධි**. ඉ-අංශය, කොටස සීමාව, නියමය.

**ඔධික**. ති-පරිච්ඡෙදය, කොටස.

**ඔධිසොවණෙ**. න - සීමාකොට පැතිරවීම, සත්අයුරකින් මෙත්තාභාවනාව වැඩීම.

**ඔධිකත**. ති-කොටස් කළ, පරිච්ඡෙද කළ.

**ඔධිසුංක**. පු-ඔට්ටුව, ඉත්ත, උල.

**ඔධුනන**. න-කම්පාකිරීම, චලනයවීම.

**ඔධුනාති**. ක්‍රි-(අව + ධූ d කි කම්පනෙ, චලනයෙහි + නා + ති) කම්පාවෙයි, සැළෙයි.

**ඔධුනිත්වා**. පු - ක්‍රි (අව + ධූ + ඉ + ත්වා) දුරු-කොට, මකාහැර.

**ඔනත**. ති-නැමුනු, යටහත්වූ.

**ඔනද්ධ** ති-මස්තකය වළඳනා ලද, මස්තකය වැසුනු.

**ඔනද්ධපීඨ**. න-මෙට්ටය සහිත පුටුව,

**ඔනද්ධමඤ්චු**. න-මෙට්ටය සහිත ඇඳ, "අනුජානාමි භික්ඛවෙ **ඔනද්ධමඤ්චුං** ඔනද්ධපීඨං."

**ඔනන්ධති**. ක්‍රි-(අව+නන්ධ d. තු. විනන්ධනෙ, වැලඳගැන්මෙහි+ති) බඳියි, වසයි,

**ඔනන්ධිතුං**. න-අවටින් වැසීම, උරයක් දමා වැසීම.

**ඔනමන**. පු-(අව+නම+යු=අන) පාතට නැමීම.

**ඔනමති**. ක්‍රි-(අව+නම. d භූ. නමනෙ, නැමීමෙහි+ති) පාතට නමයි.

**ඔනමන**. න-පහතට නැමීම "**ඔනමන** උන්නමන පකතිකං"

**ඔනය්හති**. ක්‍රි-(අව+නහ d. භූ. බන්ධනෙ, බැඳීමෙහි+ති) බැඳදමයි, වසාදමයි.

**ඔනාහ**. පු-හාත්පස පැතිරවීම, සැඟවීම, වසාදැමීම.

**ඔනාමෙසි**. ක්‍රි-(අව+නම d. භූ. නමනෙ, නැමීමෙහි+සි) නැමීය.

**ඔනිරක්ඛ**. පු-ගෙණවුත් දුන් බඩු රකින්නා.

**ඔනීත**. ති-බැහැරකළ, ඉවත්කළ.

**ඔනීතපත්තපාණි**. ති-වළඳු පාත්‍රයෙන් අහක්කළ අත් ඇති, "භුත්තාවිං **ඔනීතපත්තපාණිං**."

**ඔනොජෙති**. ක්‍රි-(අව+නුද d. තු-ඛෙපණෙ, දුරුකිරීමෙහි+ණෙ+ති) සෝදැහරියි.

**ඔනොජන**. න-කල්තැබීම, පරෙස්සම් කර තැබීම.

**ඔප**. d. භූ. නිට්ඨුහනෙ, කාරාදැමීමෙහි, ඔපති, කාරාදමයි.

**ඔප**. d. චු. (ඨපනෙ, තැබීමෙහි) ඔපෙති, තබයි.

**ඔපක්කම**. පු-උපක්‍රමය, ප්‍රයොගය.

**ඔපක්කමික**. පු-උපක්‍රමයෙන් සිදුකටයුතු, උපක්‍රමයෙන් හටගත්.

**ඔපක්කමික** ආබාධ. පු-උපක්‍රමයෙන් හටගත් රොගය, බෝවූ ලෙඩ.

**ඔපක්කමික**. පණ්ඩක. පු-එනම් පණ්ඩකයා.

**ඔපගව**. පු-උපගූ නම් තැනැත්තහුගේ පුත්‍රයා.

**ඔපගුය්හ**. පු-උපගුහන භාවය, ඔපවය්හ බලනු.

**ඔපච්ඡන්දසික**. ඉ-ඔපච්ඡන්දසික වෘත්තය.

**ඔපතන**. න පහතට වැටීම, අවපතනය.

**ඔපතති**. ක්‍රි (අව + පත d. භූ. ගමනෙ, යාමෙහි+ති) පහතට වැටෙයි.

**ඔපති**. ක්‍රි-(ඔප d. භූ. නිට්ඨුහනෙ, කෙලගැසීමෙහි+ති) කෙලගසයි.

**ඔපතිත**. ති-පාතට වැටුනු.

**ඔපතිත්වා**. පු ක්‍රි (අව+පත+ඉ+ත්වා) වැටී. ඇතුලෙහි පතිතව.

**ඔපත්ත**. ති-පත්‍රවැටුනු, කොළ රහිත.

**ඔපධික**. ති-උපධීන්ගෙන් යුත්, උපධීන්ට අයිති. උපධි බලනු.

**ඔපධිකපුඤ්ඤ**. න-ශරීරසම්පත් ආදිය ඇතිකරණ පිණ.

"දදමානං මනුස්සානං
පුඤ්ඤපෙක්ඛාන පාණිනං
කරොතො **ඔපධිකං** පුඤ්ඤං
සඞ්ඝෙ දින්නං මහප්ඵලං."

**ඔපනයික**. ති-තමතමාගේ සිතට පැමිණවිය යුතු.

**ඔපනයික**. ති-නිවණට පමුණුවන. "ස්වාක්ඛාතො භගවතා — **ඔපනයිකො** පච්චත්තං වෙදිතබ්බො විඤ්ඤූහීති."

**ඔපපක්කි**. ති-අත්තටු කපාදැමීම, බලය හීන කිරීම.

**ඔපපච්චයික**. පු-දෙමවුපියන් නැතිව උපදින අය.

**ඔපතිත්වා**. පු-ක්‍රි-(අව+පත+ඉ+ත්වා) වැටී, ඇතුලත පතිතව, "අන්තලික්ඛා වස්සධාරා **ඔපතිත්වා** ගබ්භානි පූරෙන්ති,"

**ඔපපාතික**. පු-මවුපියන්ගේ ආධාරයක් නැතිව උපදින අය, උපපතනය වීමෙන් උපදින අය, දිව්‍ය බ්‍රහ්ම නෙරයික හා සමහර සත්ත්ව ජාතීන් මෙසේ උපදිති, අණ්ඩජ, ජලාබුජ සංසෙදජ හා ඔපපාතික යයි උත්පත්තිය ලැබෙන ආකාර සතරින් එකක්, "උපපාතො අස්ස අත්ථීති=**ඔපපාතිකො**."

**ඔපපාතිකමනුස්ස**. පු-ඔපපාතිකව උපදින මනුෂ්‍යයා.

**ඔපපාතිකයොනි**. ඉ-ඔපපාතික යොනිය, එබඳු සත්ත්වනිකාය,

**ඔපම්ම**. න-උපමාව, නිදර්ශනය, සමානකම,

**ඔපරජ්ජ**. න-උපරාජ්‍යය, උපරජකම, යුවරාජපදවිය.

**ඔපවය්හ** පු-නැගීමට සුදුසු, රජුට නැගීමට සුදුසු ඇතා.

**ඔපවිය්හව**. පු-නැග යාමට සුදුස්සා.

**ඔපසමික**. පු-(උප + සම + ඉක) රාජවාහන ඇතා, හීලෑවූ ඇතා.

**ඔපසායික**. ක්‍රි-අතලඟ තිබෙන, සමීපව තිබෙන.

**ඔපාත** න-(අව + පත + ණ) වළ, ආවාටය.

**ඔපාතඛනක**. පු - වළ කනින්නා, වළ සාරන්නා.

**ඔපාතඛනන**. න-වළක් සෑරීම.

**ඔපාතරොග**. පු-වළෙහි වැටීමෙන් රොගීබවට පත් තැනැත්තා

**ඔපාතෙතබ්බ**. ති-(අව + පත + ණෙ + තබ්බ) හෙළිය යුතු, හටගැන්විය යුතු,

**ඔපාන**. න-උදපානය, ළිඳ, පොකුණ, **"ඔපාන භූතාණි."**

**ඔපාන භූත**. ති-උදපානයක් වැනිව, ළිඳක් සමානව, සැමදෙනාගේ කැමැත්ත ඉටු කරණ සුලු.

**ඔපායික**. වා-උපාය, සුදුසු, මැනවි.

**ඔපාරම්භ**. පු උපාරම්භභාවය, ආධාරභාවය, උපකාර බව.

**ඔපිය**. න-ඇතුළට යෑම, ඇතුළට පිවිසීම, *"නිබ්බාණං හදයස්මිං ඔපිය"*

**ඔපිලාපන**. න-ඉල්පීම, ජලයේ පාවීම,

**ඔපිලාපිත**. ති-ඉල්පුණු, ගැලුණු, පාවුණු,

**ඔපිලාපෙති**. ති-(අව + පිල d. පිලනෙ, ඉල්පී + ණෙ + ති) ඉල්පවා හරියි. දියෙහි පාකර හරියි.

**ඔපිලාවිත**. ති-ඉල්පීගිය, ගිලුණු,

**ඔපුඤ්ජ**. d. (අව + පුඤ්ජ d භූ. පුඤ්ජනෙ, ආලෙපකිරීමෙහි × ඊ) ආලෙප කෙළේය.

**ඔපුඤ්ජති**. ක්‍රි-(අව + පුඤ්ජනෙ, ආලෙප කිරීමෙහි + ති) ආලෙප කරයි. තවරයි.

**ඔපුඤ්ජාපෙත්වා**. පු. ක්‍රි- (අව + පුඤ්ජ + ණාපෙ + ත්වා) ගල්වා, අලේප කොට.

**ඔපුඤ්ජිත්වා**. පු. ක්‍රි - (අව + පුඤ්ජ + ඉ + ත්වා) ආලෙප කොට, පිරිබඩ කොට.

**ඔපුප්ඵ**. න-පොහොට්ටුව, මල්පොහොට්ටුව.

**ඔබ්බුට**. ති-වැසී ඇති, වසා තිබෙන.

**ඔබද්ධ**. න මුදුලීම, ආසනයෙන් නැගිටුවීම.

**ඔබන්ධිත්වා**. පු. ක්‍රි (අව + බන්ධ + ඉ + ත්වා) බැඳ, තමා බැඳ **"තත්ථ තත්ථ ඔබන්ධිත්වා චීවරං සිබ්බෙතුං."**

**ඔභග්ග**. ති-බිඳ හෙලනලද, කඩනලද, පහතට දැමූ **"ඔභග්ගො** භග්ගක්ඛවස්ස සාඛා භඞ්ගං බාදති."

**ඔභඤ්ජති**. ක්‍රි-(අව + භඤ්ජ d. භූ. භඤ්ජනෙ බිඳීමෙහි + ණෙ + ති) බිඳ දමයි. නමාලයි.

**ඔභඤ්ජිත්වා**. පු. ක්‍රි. (අබ + භඤ්ජ + ත්වා) බිඳ දමා, නමාදමා.

**ඔභත**. ති-අහක්කළ, ඉවත්කළ. ඉවතදැමූ,

**ඔභතචුම්බට**. ඉ-ඔභතචුම්බට නම් ස්ත්‍රිය, අට වැඳැරුම් ස්ත්‍රීන්ගෙන් එකියක්. පෙර දර අදින ස්ත්‍රීහු හිසෙහි සුඹුළුවක්-දරණුවක් පාවිච්චි කළහ. හිස් පැළඳි ඒ දරණුව අහක්කර කැමැති වූවෙකුට ඇය සරණ පාවා ගත හැක. එවැනි ස්ත්‍රීන්ට ඔභත චුම්බට යයි කියති.

**ඔහරති**. ක්‍රි-(අව + හර d. භූ. හරණෙ + ති) ගෙණ යයි, ඉවත ගෙණ යයි.

**ඔභාස**. න-ප්‍රත්‍යය පිළිබඳ කථාව, තම අදහස පහළ කිරීම, නුසුදුසු කථාව, **"ඔභාසොති පච්චයපටිසංයුත්තා කථා."**

**ඔභාස**. පු - එළිය, ආලොකය, කසිණ ආලොකය.

**ඔභාසෙ**. ති-මල් හා ගෙඩි ඇතිකරවන රුක් රොපනය කිරීමෙහි අවකාශය.

**ඔභාස කම්ම.** න-සිවුපසය ලබන ආශාවෙන් ඒ ගැණ කථා කිරීමෙන් අදහස හැඟවීම. පහළ කරණ ක්‍රියාව. "ඔභාස කම්මන්ති වච්ඡපාලකෙ දිස්වා කිං ඉමෙ වච්ඡා ඛිර ගොවච්ඡා තක්ක ගොවච්ඡාති පුච්ඡිත්වා, ඛිර ගොවච්ඡා භනෙතති වුතෙත න ඛිරගොවච්ඡා, ඛිරගොවච්ඡා සියුං භික්ඛූපි ඛිර ලභෙය්‍යුන්ති එවමාදිනා නයෙන තෙසං දරකානං මාතා පිතුන්නං නිවෙදෙත්වා ඛිරදපනාදිකං ඔභාසකරණං."

**ඔභාස කරණ.** න-තමාගේ කැමැත්ත හැඟවීම, ඔභාසකම්ම බලනු.

**ඔභාස ගාථා.** ඉ-ආලෝකය විහිදුවීමට පෙරටුව දෙසූ ගාථාව, චූලපන්ථක ස්ථවිරයන්ගේ උදන ගාථාව.

**ඔභාස මණ්ඩල** න-අලෝක මණ්ඩලය, එළිය, මඩුල්ල, ආලෝක කසිණය වඩන යෝගාවචරයා විසින් වැඩිය යුතු එක් නිමිත්තක්.

**ඔභාස මත්ත.** න-අලෝක මාත්‍රය, විදසුනට බාධකවූ ආලෝක මාත්‍රයක්.

**ඔභාසන.** න=(අව + භාස + යු=අන) බැබලීම. අසභ්‍ය කථාව, කෙළින් නොකියා අදහස නැගෙන සේ කීම.

**ඔභාසති.** ක්‍රි-(අව + භාස d. භූ දිත්තියං, බැබලීමෙහි + ති) බබලයි, ආලෝක කරයි.

**ඔභාසන්ති** ක්‍රි-(අව + භාස d. භූ. දිත්තියං බැබලීමෙහි + ති) (අසද්ධර්මය පිණිස) කථා කරත්.

**ඔභාසෙත්වා.** පු. ක්‍රි-(අව + භාස + ණෙ + ත්වා) ආලෝක කොට, එළිය කර, "කෙවලකප්පං ජෙතවනං ඔභාසෙත්වා."

**ඔභාසෙය්‍ය.** ක්‍රි-(අව + භාස d. භූ. දිත්තියං, බැබලීමෙහි + එය්‍ය) (නොමනා වචන) කියන්නේය. හැසිරෙන්නේය.

**ඔභොග.** න (අව + භුජ + ණ) නැමීම, සිවුරේ නැමීම අතර, "ඔභොගෙ කාය බන්ධනං කාතුං වට්ටති."

**ඔම.** ති-පහත්, නීච, ලාමක.

**ඔමක.** පු-ලාමක, අඩු පහත්.

**ඔමක.** න-ප්‍රමාණයෙන් ඉතා අඩු පාත්‍රය. අනුදූන වඳුල නව විධ පාත්‍රයන්ගෙන් එකක්.

**ඔමකචාතුමාස.** ති-සිවු මසකට අඩු, සාර මසක් ඉක්ම නොගිය.

**ඔමකපත්ත.** න-ප්‍රමාණයෙන් අඩු පාත්‍රය, අධිට්ඨාන විකප්පනයට සුදුසු පාත්‍රයක්, උක්කට්ඨපත්ත ප්‍රමාණයෙන් ලොකුම පාත්‍රය.

**ඔමට්ඨ** න-යටිකුරුවූ සිදුර, එවැනි සිදුරු ඇති සැළිය.

**ඔමට්ඨ.** ති-(පහළ සිට) පහර දෙන ලද, උඩ සිට පහළට දෙන පහර.

**ඔමද්ද.** න-මැඩීම, මැඩ පැවැත්වීම.

**ඔමද්දති.** ක්‍රි-(අව + මද්ද d භූ මද්දනෙ, මැඩීමෙහි + ති) මඩියි, මිරිකයි.

**ඔමද්දකාරක.** පු-මැඩලන කැතැත්තා, වත් මඩින භික්ෂුව.

**ඔමද්දිත්වා.** පු. ක්‍රි-(අව + මද්ද + ඉ + ත්වා) මැඩ, මදිනය කොට, අනා මිශ්‍රකොට, "න ථූපතො ඔමද්දිත්වා පිණ්ඩපාතං භුඤ්ජිස්සාමීති සික්ඛා කරණීයා."

**ඔමසති.** ක්‍රි-(අව + වස d. භූ. ආමසනෙ, යටි, බිණීමෙහි + ති) නින්දා කරයි. ගටා බිණියි.

**ඔමසන්ති.** ක්‍රි-(අව + මස d. භූ. ආමසනෙ, නින්දා කිරීමෙහි + න්ති) නින්දා කරත්, ගටා බණිත්. "ඡබ්බග්ගිය භික්ඛූ පෙසලෙ භික්ඛූනං ඔමසන්ති."

**ඔමසන.** න-(අව + වස + යු=අන) උඩ සිට පහළට බැසීම, පහතට බැස්සීම, "ඔමසනා නාම හෙට්ඨාඔරොපනා."

**ඔමසවාද** න-ඔමසවාද නම් පචිත්තිය.

**ඔමසවාද.** ති-පරුෂ තෙපුල්, ජාති නාම, ගොත්‍ර කම්, ශිල්ප, ආබාධ, ලිඞ්ග, කෙලෙශ, ආපත්ති, ආක්‍රොශ යන දස ආකාරයෙන් නින්දා පරිභව බිණීම.

**ඔමසවාද සික්ඛාපද.** න-නින්දා පරිභව පිණිස ජාත්‍යාදීන් සටා බිණීම නිසා පැණවූ ශික්ෂාපදය.

**ඔමාන.** න-අන්‍යයන්ට පහත් කොට සැලකීම, එනම් මානය.

**ඔමිස්සක.** ති-මිශ්‍රවූ, මිශ්‍ර, නොයෙක්.

**ඔමුක්ක.** ති-(අව + මුච + ණ) ඉවත් කළ, මිදූ, "අනුජානාමි භික්ඛවෙ ඔමුක්කං ගණඞ්ගනූ පාහනං."

**ඔමුක්ක**. න-ගිනිපෙණෙල්ල.

**ඔමුඛ**. ති-අහක වීසිකළ, ඉවතදැමූ.

**ඔමුඤ්චති**. ක්‍රි-(අව + මුච. d. මොචනෙ, මිදීමෙහි + ති) මුදයි, ඉවත් කරයි.

**ඔමුඤ්චාපෙත්වා**. පු. ක්‍රි-(අව + මුච + ත්වා) මුදවා, ඉවත් කරවා, "සබ්බාලඞ්කාරං ඔමුඤ්චාපෙත්වා පුඤ්ජකං කාරාපෙත්වා."

**ඔමුඤ්චිත්වා**. පු-ක්‍රි-(අව + මුච + ඉ + ත්වා) මුදා, ඉවත්කොට, ගලවා තබා.

**ඔමුත්ත**. ති-මිදුනු, නිදහස් වුනු, ගැලවුනු.

**ඔමුත්තන්ති**. ක්‍රි-(අව + මුත. d. භූ. වාගෙ හැරීමෙහි + න්ති) මුත්‍රකරත්, මුත්‍රයෙන් තෙමත්.

**ඔයාචති**. ක්‍රි-(අව + යාච d භූ. යාචනෙ. ඉල්වීමෙහි + ති) අයහපතක් පතයි, නරකක් පතයි, නරකක් ප්‍රාර්ථනා කරයි.

**ඔර**. ති-මේ පෙදෙස, මෙතෙර, අපර තීරය. "පාරතො අනන්තං ඔරතො භොගං කත්වා චීවරං නික්ඛිපිතුං වට්ටති."

**ඔරක**. ති-පහත්, සුළු, සවල්පමාත්‍ර, "නහනූන සො ඔරකො ධම්මවිනයෙ, නසා ඔරකා පබ්බජ්ජා."

**ඔරතීර**. න-මෙතෙර.

**ඔරතො**. පු-මෙතෙර, ගංගා සමුද්‍රාදියෙන් මෙතෙර, "යං ඔරතො අත්ථි නං පාරතො තසඞ්කා පස්සතිං."

**ඔරපාර**. න-උඩ පහත, උඩ හා යට ලොක.

**ඔරපුර**. න-බලකොටුවට පිටත නගරය, පිට නගරය.

**ඔරබ්භික**. පු - (උරබ්භ + ණික) එළුවන් මරන්නා, එළුවන් මරා ජීවත්වන්නා, එළු වැද්දා, "අහං භන්තෙ පුබ්බෙ ඔරබ්භිකො අහොසිං".

**ඔරභාග**. පු-මෑත භාගය, කෙළවර.

**ඔරමත්තක**. පු-කුඩා, ටික, අල්ප, සවල්ප, "න භික්ඛු ඔරමත්තකෙන භවිතබ්බං."

**ඔරම්භාගිය**. ති-මෙලොව පිළිබඳ, යට භාගය භජනය කරණ කාම ලොකය පිළිබඳ.

**ඔරම්භාගිය සංයොජන**. න - පහත් භවය භාජනය කරණ සංයොජන, සතර අපාය, සප්තවිධ කාම සවර්ග යන මොහු පහත් භව නම් වේ. කාමච්ඡන්ද, ව්‍යාපාද. සක්කාය දිට්ඨි, විචිකිච්ඡා, සීලබ්බත පරාමාස යන පස්දෙන ඔරම්භාගිය සංයොජන නම් වේ. ඔරංභජන්තීති ඔරංභාගියො "රූපරාග, අරූප රාග, මාන, උද්ධච්ච, අවිජ්ජා, යන සංයොජන පස උද්ධම්භාගිය නම් වේ. කාමලොක යන්ට වඩා උසස් භවයන් භජනය කරණ නිසා උද්ධංභාගිය නම් වේ.

**ඔරව**. න-එක්රැස්වුවන්ගේ හඬ.

**ඔරස**. පු-(උරසි + ණ) ලෙහිදා උපන්, තමාට දාව උපන්.

**ඔරසපුත්ත**. පු-තමාටදාව උපන් පුත්‍රයා, ඖරස පුත්‍රයා. "මාතාපුත්තානංච ඔරසං."

**ඔරාපාරා**. ති-මෙතෙරින් එතර, මෙතෙරින් පරතර, "නාවාය ඔරාපාරං ගන්තුකාමා."

**ඔරිම** ති-මෙතෙර, සමීප ප්‍රදෙශය, "භගවා නෙරඤ්ජරාය නදියා ඔරිම තීරෙ අනන්තරහිතො ඔරිමතීරෙ අට්ඨාසි."

**ඔරිමගාම**. න-සමීප ගම. මෙතෙර ගම.

**ඔරිමභාග**. න - මුල්කොටස, මෑතභාගය. "ගිම්හාන උතුනං පච්ඡිම මාසස්ස ඔරිම භාගෙ යාව හෙමන්තස්ස පඨම දිවසතො."

**ඔරිමවාරගම**. න-තමන්ට නියමිත ලඟ ගම, සමීපයෙහි පිහිටි වරගම.

**ඔරිමන්ත**. න-මෑත පෙදෙස, සමීප ප්‍රදෙශය, මෙපෙදෙස.

**ඔරුද්ධ**. ති-ආපසු නැබූ, වැළැක්වූ, පැරදවූ, සිරකළ.

**ඔරුන්ධති**. ක්‍රි-(අව + රුධි d. දි. ආවරණෙ, ආවරණය කිරීමෙහි + ති) ගතියි, පැමිණෙයි.

**ඔරූහති**. ක්‍රි-(අව + රුහ d. රු, ආරුහෙ, නැගීමෙහි + ති) බසියි, පහතට බසියි,

**ඔරූළ්හ**. ති-බැස්ම, බස්නාලද,

**ඔරෙන**. ති-මෑත, ඇතුළත, පූර්භාගය,

**ඔරෙනද්ධමාස**. න-ඇතුළු අඩමස, අඩමස නොපිරුණ.

**ඔරොධ**. පු-අන්තඃපුරය, ඇතොවුර.

**ඔරොපන**. න-පහතට තැමීම, පාත්කිරීම, බැසීම.

**ඔරොපිත**. ති පහතට නමනලද, පහතට බසිතලද.

**ඔරොපෙති**. ක්‍රි-(අව+රුප d. භූ නයනෙ, පැමිණවීමෙහි + ණෙ + ති) තගයි, බහා තබයි.

**ඔරොපෙත්වා**. පු ක්‍රි-(අව+රුප+ණෙ+ත්වා) තගා, බහාතබා, “ධනපාලහත්ථි භගවතා මෙත්තෙන චිත්තෙන ඵුටෙඨා සොණ්ඩං **ඔරොපෙත්වා**.”

**ඔරොහති**. ක්‍රි-(අව+රුහ d. භූ, රුහණෙ, නැගීමෙහි+ති) බසියි, පහතට බසියි.

**ඔරොහන**. න-බැසීම, පහතට බැසීම.

**ඔලග්ග**. ති-වැළකුණු, නැවත්වූ, බාධාකළ

**ඔලඞ්ඝන**. න-(අව+ලඝි+යු=අන) යටට නැමීම, “තත්‍ර **ඔලඞ්ඝනා** නාම හෙට්ඨා ඔනමනා.”

**ඔලඞ්ඝෙති**. ක්‍රි-(අව + ලඝි. කි. ලාසවෙ, නැමීමෙහි+ණෙ+ති) යටට නමයි, පහතට නමයි, පහතට පනියි.

**ඔලම්බ**. ති-එල්බෙන, එල්ලෙන.

**ඔලම්බක**. පු-(අව+ලම්බ+ණ්වු=අක) එල්-බෙන්නා, එල්ලෙන්නා.

**ඔලම්බක**. න-ඉදිරිය පසුපසින් එල්වා හැදීම, එල්වාගෙණ යන බර, එල්බෙන රැහැණ එල්ලෙන ලණුව.

**ඔලම්බකදීප**. පු එල්ලෙන පහන, එල්ලන ලාම්පුව.

**ඔලම්බකභාර** න-එල්ලාගෙණ යන බර,

**ඔලම්බති**. ක්‍රි-(අව+ලම්බ d. භූ. ලම්බනෙ, එල්ලීමෙහි+ති) එල්බෙයි, එල්ලෙයි.

**ඔලම්බනක**. පු-ඇඳිපුටුව, හාන්සිපුටුව.

**ඔලම්බෙන්තො**. මි-ක්‍රි-එල්බමින්, ඉදිරි හා පසුපසින් එල්ලෙනසේ අදිමින්, “සච්චං කිර තුමෙහ **ඔලම්බෙන්තො** නිවාසෙථ.”

**ඔලාර**. පු-මහත්, විශාල.

**ඔලාරික**. ති-(උලාර+ණික) මහත්වූ, විශාලවූ, සියුම්නොවූ, පහසුවෙන් තේරුම් ගත නොහැකි.

**ඔලාරිකනිමිත්ත**. න-පහත්නිමිත්ත, අහිත නිමිත්ත.

**ඔලිඛති**. ක්‍රි-(අව + ලිඛ. d. භූ. ලිඛනෙ, ලිවීමෙහි+ති) පීරයි, කපා දමයි, හිස බූගා දමයි.

**ඔලිඛිත්වා**. පු-ක්‍රි-(අව+ලිඛ+ඉ+ත්වා) පීරා, කපා හිස බූගා,

**ඔලිගල්ල**. න-ගම්දොර ගවරවල, මඩකුණු ආදිය ගලාබස්නා දිය ඇල, කුණුවල,

**ඔලියති**. ක්‍රි-(අව+ලා d. භූ ආදානෙ, ගැනීමෙහි+ති) ගසයි, ඇලෙයි.

**ඔලීන**. ති සැඟවුණු, යටින් ගලායන, මඳ, ටික.

**ඔලීනවිලීන** ති යටින් හා දෙපසින් වැටෙන, ඉතිරි වැගිරෙණ.

**ඔලීයන**. න-සැඟවීම, ගලායැම.

**ඔලීයති**. ක්‍රි-(අව+ලා d. භූ. ආදානෙ, ගැනීමෙහි+ති) නවතී, ඇලෙයි.

**ඔලුග්ග**. ති-කැඩීගිය, කැලිවලට කැඩීගිය, නරක්විගිය.

**ඔලුග්ගවිලුග්ග**. ති-තිබූ තත්වයෙන් වෙනස්වී ගිය.

**ඔලුජ්ජති**. ක්‍රි-(අව+ලුජ d. දි, විනාසෙ, විනාශයෙහි+ති) බිඳීයයි, කැඩීයයි.

**ඔලුබ්භ**. පු-ක්‍රි-(අව+ලුබ්භ+අ) එල්බ, එල්ලී,

**ඔලුම්පික**. පු-පසුරෙන් එතරවන්නා.

**ඔලුම්පෙත්වා**. පු-ක්‍රි-(අව+ලුප+ණෙ+ත්වා) ගල්වා, ගාගෙන “වෙජ්ජො නබෙන හෙසජ්ජං **ඔලුම්පෙත්වා** ආමලකංච ඛාදති.”

**ඔලුම්පෙති**. ක්‍රි (අව+ලුප d. රු. අවච්ඡදනෙ, නොසිදීමෙහි+ණෙ+ති) කඩවයි, අල්වයි.

**ඔලොකන**. න-බැලීම, අවලොකනය.

**ඔලොකනක**. පු-ජනේලය, වාකවුළුව.

**ඔලොකෙති**. ක්‍රි-(අව+ලුච, භූ. ලොචනෙ, බැලීමෙහි+ණෙ+ති) බලයි, අවලොකනය කරයි.

**ඔලොනි** න-එක් ව්‍යඤ්ජන විශෙෂයක්, එනම් ව්‍යඤ්ජන වර්ගය. “ඔලොනීති එකා ව්‍යඤ්ජන ජාති.”

**ඔවජ**. ති-ජවඇති, ශකතිය ඇති.

**ඔවට**. ති-වසනලද, වලක්වනලද, බාධාකළ, "අජ්ජගෙග ඔවටො භිකඛුනීනං භිකඛුසු."

**ඔවටට** ති-වසිතාලද, වැසිජලයෙන් තෙමුණු, "අතිරෙක චාතුමාසෙ ඔවට්ටො."

**ඔවට්ටි** ඉ-දිගමැහුම, කඨින සිවුරේ දිග මැහුම.

**ඔවට්ටික**. න-වළලු, අත්පා ඇඳියෙහි පළඳින වළලු, "ඔවට්ටික ධාරණෙ පාචිත්තියං" සිසැරීම, හිණගත්වා සිසැරීම, සගුණකිරීම, තනිපොට සිවුර හා දෙපොට සිවුර එකතු කිරීම. "ගිලානො පන අනෙනා කාසාවසස ඔවට්ටිකං දසෙසත්වා." විදීම, විද මැහීම, "අනුජානාමි භිකඛවෙ අගගලං තුයහං ඔවට්ටිකං.—"

**ඔවට්ටික**. පු-ඉහ හිත, "ආවුසො චීවරං මෙ දෙහීති, ඔවට්ටිකාය පරාමසි."

**ඔවටඨ**. (අව + වසස + ත=වඨ) ති - තෙත්වූ, තෙමුණාවූ, "විහාරං ඔවටඨං හොති."

**ඔවදති**. ක්‍රි-(අව + වද d භූ. වචනෙ, කීමෙහි + ති) ඔවදන්දෙයි, අවවාදකරයි.

**ඔවදනමූලක**. පු ඔවදන්දීම මුල්කොට ඇති.

**ඔවදිය**. ති - අවවාදකිරීමට යොගය - සුදුසු, නුවණධහුරු.

**ඔවදියමාන.** න අවවාදකරණු ලබන, ඔවදන් දෙනු ලැබූ.

**ඔවදෙයය**. ක්‍රි-අව + වද d භූ වචනෙ, කීමෙහි + ණෙ + එව අවවාද කරන්නේය, 'ඔවදෙයයානු සාසෙයය."

**ඔවරක** පු-කාමරය, ගබඩාව, ලගිනාගෙය, ආලින්දය නැති ගෙය, "වතේථ උඡරුං වෙයෙත්වා ඔවරකං පවිසිත්වා නිපජ්ජි."

**ඔවරියාන**. න වැලැක්වීම, බාධාකිරීම, තහනම් කිරීම.

**ඔවසස**. ති වැසිනැති, වියලි, ශුෂ්ක.

**ඔවසසක**. පු - (අව + වසස + ක) තෙමෙන, වැස්සට තෙමෙන.

**ඔවසසකමණ්ඩප**. න-තෙමෙනමඩුව, මෙය ශාඛා මණ්ඩපය පදරමණ්ඩපයයි කොටස් දෙකකි

**ඔවසසති**. ක්‍රි-(අව + වසසු d. භූ. සෙචනෙ, තෙමීමෙහි + ති) තෙමෙයි, වැස්සෙන් තෙමෙයි.

**ඔවසසාපෙති**. ක්‍රි-(අව + වසසු d භූ. සෙචනෙ, තෙමීමෙහි + ණපෙ + ති) තෙමීමකරයි, නහයි, සිරුර සනහයි, "ආජීවකා කායං ඔවසසාපෙනති."

**ඔවසසාපෙම**. ක්‍රි-(අව + වසසු d. භූ. සෙචනෙ + ණෙ + ම) තෙමීම කරමු, සිරුර සනහමු.

**ඔවසසාපෙනති**. ක්‍රි-තෙමීම කරත්, නහත්.

**ඔවසසාපෙසසථ**. ක්‍රි-තෙමව්, නහව්.

**ඔවසසාපෙසසනති**. ක්‍රි - (අව + වසසු d. භූ. සෙචනෙ, තෙමීමෙහි + ණෙ + සස නති) තෙමෙත්නාහුය, නහත්නාහුය, සිරුර සනසත්නාහුය.

**ඔවහති**. ක්‍රි-(අව + වහ d. භූ. පාපුණෙ, පැමිණවීමෙහි + ති) පහතට ගෙණයයි,

**ඔවාද**. න-(අව + වද + ණ) අවවාදය, අනුශාසනය, මෙහෙණීන්ට දෙන අවවාදය, පළමුව කරණ අවවාදය, "ඔවාද පාතිමොකඛං දෙසෙසි."

**ඔවාදක**. පු-අවවාද කරන්නා, අනුශාසනා කරන්නා.

**ඔවාදි**. පු-අවවාද දෙන්නා, අනුශාසකයා.

**ඔවාදිත**. ති-අවවාදකළ, අනුශාසනාකළ.

**ඔවාදකඛම**. පු-අවවාදය ඉවසන, කරණුලබන අවවාදය පිළිගන්න.

**ඔවාදදායක**. පු-අවවාද දෙන්නා, අනුශාසනා කරන්නා.

**ඔවාදපටිගගහණ උපසමපදා**. ඉ-එනම් උපසම්පදා කර්මය. අටවැදෑරුම් උපසම්පදාවන් ගෙන් එකක්.

**ඔවාදපටිගගාහක**. පු-(අව + පටි + ගහ + ණ්වු =අක) අවවාදදායක, අවවාදදෙන, එබඳු භික්ෂුව.

**ඔවාදපතිකර**. පු - අවවාදය පිළිපදින්නා, බුද්ධාවවාදය කරන්නා "සො භිකඛු සාසන කරො ඔවාදපතිකරො."

(8526)

**ඔවාදපාතිමොක්ඛ**. න-අවවාද ප්‍රාතිමොක්ෂය, දෙවැදෑරුම් පාමොක්වලින් එකක්. "ඛන්ති පරමං තපො තිතික්ඛා - නිබ්බාණං පරමං වදන්ති බුද්ධා - අතිවිනෙතව ආයොගො එතං බුද්ධාන සාසනං" යන මේ ගාථා තුණින් පමණක් උදෙසන පාමොක් **ඔවාදපාතිමොක්ඛ** නම් වේ.

**ඔවාදසික්ඛාපද**. න-එනම් ශික්ෂාපදය, සංඝ සම්මුතියක් නොලබා භික්ෂුණීන්ට අෂ්ටගරු ධර්මයෙන් අවවාදකරණ භික්ෂුවට පචිති ඇවැතක් වේ යයි පැණවූ ශික්ෂාපදය.

**ඔවාදානුසාසනී**. ඉ-අවවාදය හා අනුශාසනය

**ඔවාදචරිය**. පු-අවවාද දෙන ඇදුරා, පස්වැදෑරුම් ඇදුරන්ගෙන් කෙනෙක්.

**ඔවාදූපසඞ්කමන**. න-(අව+උප+සං+කම+යු=අන) අවවාදලැබීම පිණිස පැමිණීම, පොහොය කරණ දිනයේදී සංඝයා වෙතින් භික්ෂුණීන් අවවාද ලබාගැනීමට පැමිණීම. "උපොසථ පුච්ඡකඤ්ච **ඔවාදූපසඞ්කමනංච**."

**ඔවාදූපසම්පදා**. ඉ-ඔවාදපටිග්ගහණ උපසමපදාව, අෂ්ටවිධ උපසම්පදාවන්ගෙන් එකක්.

**ඔවිජ්ඣති**. ක්‍රි-(අව+විධ d. දි. විධානෙ, විධානයෙහි+ති) විදියි, ඇනුම්පද කියයි.

**ඔවිජ්ඣන**. න-(අව+විධ+ය+යු=අන) ඇණුම් පද කීම, සටා බිණීම.

**ඔසක්කි**. ක්‍රි-(අව+සක d. සවා. සාමත්‍ථියෙ, සමත් බැව්හි+ඊ) පසු බැස්සේය, පැරදී ගියේය.

**ඔසක්කති**. ක්‍රි-(අව+සක d. සවා. සාමත්‍ථියෙ, සමත් බැව්හි+ති) පසුබසියි, පරදියි.

**ඔසජ්ජති**. ක්‍රි-(අව+සද d භූ. විසරණගත්‍යාව සදනෙසු+ති) පිටකරයි, විහිදුවයි.

**ඔසට**. ති-(අව+සර+ත) නෙණහැර දක්වූ, ඉදිරිපත් කළ, ඔප්පු කළ.

**ඔසණ්ඨෙති**. ක්‍රි-(අව+සණ්ඨ d. භූ. සම්පත්ති භූසනෙසු, අලංකාර කිරීමෙහි+ණෙ+ති) පිරයි, හිසකේ පීරයි, හිස අලංකාර කරයි.

**ඔසධ**. න-බෙහෙත්, බේත, ඔසු.

**ඔසධි**. න-ඵලපාකාන්තලතා, ගෙඩි හටගැනී මෙන් මැරෙණ කෙසෙල් ආදි වෘක්ෂ.

**ඔසධී**. ඉ-දහවත් තරුව, ඔසධී තාරකාව.

**ඔසධීතාරකා**. ඉ-අධික ආලෝකය ඇති තාරකාව, "උස්සන්නා පභා එතාය ධීයතීති **ඔසධී**."

**ඔසධිස**. පු-සඳ, චන්‍ද්‍රයා, සඳු.

**ඔසධිකා**. ඉ-බෙහෙත, පිළියම, වේදනා අඩුකිරීම පිණිස යොදන බෙහෙත.

**ඔසනන**. ති-දුන්න, දුනය කළ, වෙහෙසුන.

**ඔසප්පති**. ක්‍රි-(අව+සප්ප d. භූ. ගතියං. යෑමෙහි+ති) ආපසු යයි, මගහරියි.

**ඔසරක**. පු-එළියට පැන්නු වහල, "අනුජානාමි භික්ඛවෙ ආළින්දං පසනං පකුඩ්ඩං **ඔසරකං**."

**ඔසරණ**. න-එකතුවීම, රැස්වීම, සමාගමය.

**ඔසරති**. ක්‍රි-(අව+සර d. භූ. ගති චින්තා හිංසා සද්දෙසු+ති) (බැලීම පිණිස) යෙයි, බසියි.

**ඔසරෙය්‍ය**. ක්‍රි-(අව+සර d. භූ. ගති චින්තා හිංසා සද්දෙසු+එය්‍ය) බසින්නේය, "සො ගාමනත. **ඔසරෙය්‍ය** වෙජ්ජං පසෙසය්‍ය."

**ඔසාදන**. න-ගැලීම, ජලය උතුරා යෑම.

**ඔසාදෙති**. ක්‍රි-(අව×සාද. භූ සාදනෙ,+ණෙ+ති) ගිල්වාදමව, කිඳුවව, "ගඞ්ගාය සොතෙ **ඔසාදෙති**."

**ඔසාන**. න-කෙළවර, අවසානය, "සමුද්ද ගමනෙ **ඔසානං** පස්සිතුං න සක්කා."

**ඔසාර**. න-රැස්වීම, එකතුවීම, සමාගමය.

**ඔසාරක**. පු-රක්ෂාස්ථානය, ආවරණය, මුවාව පිහිට.

**ඔසාරණා**. ඉ-ඇතුළුවීම, පිවිසීම, ඇතුළත් කර ගැනීම. උපසම්පදා අපේක්ෂකයා කැඳවීම. ඔසාරණ කර්මය, එනම් ශික්ෂා පදය, "තෙසං යෙව කම්මානං පටිප්පස්සම්භනා වසෙන **ඔසාරණා** වෙදිතබ්බා."

**ඔසාරණීය**. ති-ඇතුළත් කරගත යුතු ඇතුළත් කටයුතු, එනම් විනය කර්මය, "සම්මාවත්තන්තස්ස **ඔසාරණීයං** පඤ්ඤත්තං හොති."

**ඔසාරයිංසු**. ක්‍රි-(අව+සර. d. භූ. ගතියං යෑමෙහි+සු) ඇතුළු කළෝය. එල්වූහ.

**ඔසාරිත**. ති-ඇතුළු කරණලද, එල්වන ලද.

(8560)

**ඔසාරියති**. ක්‍රි. (අව + සර. d. භූ. ගතියං යාමෙ ණි + ඊය + ති) බැහැර කරනු ලැබේ. එල්වනු ලැබේ.

**ඔසාරෙති**. ක්‍රි-(අව + සර d. භූ. ගතියං, යැමෙහි + ණ + ති) කියයි. දෙසයි, ඇතුලත් කරයි. එල්වයි, "තංවෙ සංඝො **ඔසාරෙති**."

**ඔසානනති**. ඉ-එනම් ශික්ෂාපදය, ඔසානනක නම් ශික්ෂාපදය.

**ඔසිඤ්චති**. ක්‍රි - (අව + සිංච d. රු. සෙචනෙ, ඉසීමෙහි + ති) ඉසියි, දිය ඉසියි. "සො භික්ඛු භික්ඛුණිං කද්දමොදකෙන **ඔසිඤ්චති**."

**ඔසිඤ්චෙය්‍ය**. ක්‍රි-(අව + සිඤ්ච d. රු. සෙචනෙ ඉසීමෙහි + ණෙ + එය්‍ය) ඉසින්නේය. ජලය ඉසින්නේය. "සො **ඔසිඤ්චෙය්‍ය** ආපත්ති දුක්කටස්ස."

**ඔසිඤ්චන**. න. ඉසීම. දිය ඉසීම.

**ඔසිත**. ති-ඉසින ලද, දිය ඉසින ලද.

**ඔසීදති**. ක්‍රි. (අව + සිද d. භූ සෙතියෙ + ති) ගලායයි, කිඳබසියි.

**ඔසීදන**. න-ගිලීම, කිඳීම.

**ඔසීදාපන**. න-ගිල්වීම, කිඳවීම.

**ඔසීදාපෙමි**. ක්‍රි-(අව + සිද. d. භූ. සෙතියෙ + + මි) ගිල්වමි, ගලාපියමි.

**ඔස්ස**. ති-උසස්, උතුම්.

**ඔස්සට්ඨ**. ති-(අව + සජ + ත) අත්හළ, අත්හැර දැමූ, "**ඔස්සට්ඨ** විරියං භික්ඛුං ආරම්භ කථෙසි"

**ඔස්සග්ග**. ති-අත්හැර දැමූ, අත්හළ.

**ඔස්සජති**. ක්‍රි-(අව + සජ. භූ. ආලිඞ්ගනෙ වැළඳ ගැනීමෙහි + ති) අත්හරියි, මුදාහරියි.

**ඔස්සජ්ජන**. න-අත්හැරීම, මුදා හැරීම, ඉවත් කිරීම.

**ඔස්සනන**. න-ගිලීම, අඩුව.

**ඔස්සවන**. න-ගලායැම, උතුරායැම.

**ඔහ**. d. භූ. චාගෙ, හැරීමෙහි, ඔහති, හාරයි.

**ඔහන**. න-හැරීම, සැරීම.

**ඔහනති**. ක්‍රි-(අව + හන. d. භූ. හිංසාගතිසු, හිංසා වෙහි, + ති) මල පහකරයි.

**ඔහරණ**. න-වැරදිමග ගෙණයැම, මග වැරද් දීම.

**ඔහර**. ක්‍රි-(අව + හර d. භූ. හරණෙ ගෙණ යැමෙහි + හි) පහතට ගනුව, "එතං පත්තං **ඔහාර**."

**ඔහරති**. ක්‍රි-(අව + හර. d. භූ. හරණෙ, ගෙණ යාමෙහි + ති) ගෙණයයි.

**ඔහරාපෙත්වා**. පු-ක්‍රි. (අව + හර + ණෙ + ත්වා) ගෙන්වා ගෙණ.

**ඔහාර**. පු - අවහරණය, සොරකම් කිරීම, සොරා ගැන්ම.

**ඔහාරණ**. න-ගැනීම, හිසකෙස් කපා දැමීම.

**ඔහාය**. පු. ක්‍රි-(අව + හා + ත්වා=ය) හැර, අත් හැර, "සො භික්ඛු පත්තං **ඔහාය** පක්කාමි."

**ඔහාරාපෙත්වා**. පු. ක්‍රි (අව + හර + ණාපෙ + ත්වා) ඉවත් කරවා, අහක්කොට, "කෙස මස්සුං **ඔහාරාපෙත්වා** පබ්බජි."

**ඔහාරිත**. ති-බස්වන ලද, පහතට බස්සවන ලද.

**ඔහාරෙති**. ක්‍රි. (අව + හර. d. භූ හරණෙ, ගෙණ යැමෙහි + ණෙ + ති) ඉවත් කරවයි, අහක් කරවයි.

**ඔහාරෙතබ්බ**. ති - (අව + හර + ණෙ + තබ්බ) ඉවත් කළ යුතු, අහක්කළ යුතු, "උල්ලෙඛං පඨමං **ඔහාරෙතබ්බං**."

**ඔහාරෙත්වා**. පු. ක්‍රි - (අව + හර + ණෙ + ත්වා) ඉවත්කර, අහක්කොට, "කෙස මස්සුං **ඔහාරෙත්වා** පබ්බජි."

**ඔහිත**. ති-බහාතැබූ, තැන්පත් කළ, යොමු කළ.

**ඔහිත පත්ත පාණී**. ති. පාත්‍රයෙහි බහාලූ අත් ඇති.

**ඔහිත භාර**. න-බහාතැබූ බර ඇති, බහාලූ කෙලෙස් බර ඇති, "වුසිත වා කත කරණීයො **ඔහිතභාරො**."

**ඔහිත සොත**. න-කත්යොමු කළ, යොමු කළ කන් ඇතිව, "ඔහිත සොතොව ධම්මං සොතුං වට්ටති."

**ඔහියාසක**. පු-ගෙය ආරක්ෂාවට තැබූ තැනැත්තා, මුරකරුවා,

**ඔහියාසක**. ති-හුදකලාව සිටි, "ආයස්මා කාළුදායී **ඔහියාසකො** හොති විහාර පාලො."

**ඔඝිසි.** ක්‍රි-(අව+ඝි. d. සවා. ගති වුද්ධි උපතාපෙසු, + ඊ) වෙන් වීය, සමූහය කෙරෙන් වෙන් වීය. "පාරිලෙය්‍යකො හත්ථි එකා ගණම්හා **ඔඝිසීති.**"

**ඔඝිත**. ති-(අව + ඝි + යු = අන) වෙන්වීම, වෙන්වෙණු, "කිස්ස ත්වං භගිනී එකිකා **ඔඝිතා.**"

**ඔඝිලන.** න-(අව+ඝිල+යු=අන) අධික පිළිකුල් කිරීම, වැඩි වශයෙන් පිළිකුල් කිරීම.

**ඔඝිළිත**. ති-ගරහනලද, ජාති කුලාදි වශයෙන් විශෙෂයෙන් ගරහන ලද.

**ඔළාරික**. පු-මහත්වූ, විශාලවූ, බැරෑරුම් වූ, "නව **ඔළාරිකො** ආහාරො."

**ඔළාරික**. න-මහත්, තේරුම් ගැනීමට පහසු, "භගවතා **ඔළාරිකෙ** නිමිත්තෙ කයිර මානෙ."

**ඔළාරික.** අඞ්ග. න-ප්‍රකටවූ අවයව, ඔළාරික අවයව.

**ඔළාරික.** ආරම්මණ. න-භයානක අරමුණු මහත් අරමුණු.

**ඔළාරික.** චිත්තසඞ්ඛාර. න-මහත් වූ චිත්ත සංඛාරයන්, වෙදනා හා සංඥස්කන්ධ දෙදෙන.

**ඔළාරික** දොස පු-මහත්වූ ද්වේෂයක් ලොකු වරදක්.

**ඔළාරික**. නිමිත්ත. න-මහත් නිමිති, මහත් නිමිති කිරීම.

**ඔළාරික** - රූප, න-මහත් රූපය ප්‍රකට රූපය, ඖදාරික රූපය, ඔළාරික රූප නම්:- චක්ඛු-සොත-ඝාණ-ජිව්හා-කාය- රූප-සද්ද ගන්ධ-රස-පඨවි, ආපො, තෙජො, වායො යන දොළොස් රූපයයි.

**ඔළාරික-විරෙචන.** න-මහත් විරේකයක්, බර විරේකයක්.

**ඔළාරික** සද්ද. න-මහත් ශබ්දය, ලොකු ශබ්දය.

**ඔළාරික**. **අස්සාස පස්සාස.** පු-මහත්වූ ආශ්වාස ප්‍රශ්වාසයන් ලොකුවට හුස්ම ඉහළට පහළට ගැනීම.

**ඔළිගල්ල**. න-ගම්දොර ගවරවිල, කුණු ආදිය ගලා බස්නා වළ.

## ක

**ක්ව.** අ-කොහේ, කොතැන, කොයිබ.

**ක්වචන.** අ-කිසි තැනක, කොතැනක.

**ක්වචි.** අ-සමහර තැනක, සමහරවිට.

**ක්වචනි.** අ-කිසි තැනක, කිසිවෙක් කෙරෙහි. "නාහං **ක්වචනි** කස්සචි කිඤ්චනතස්මිං" අ. නි.

**ක්වණ.** d. චු. ශබ්දකිරීමෙහි.

**ක.** ති-බ්‍රහ්ම, ශරීර, වාත, සූර්‍ය්‍ය, ගිනි, මයූර, පුරුෂ, භූමි.

**ක.** න-ජලය, දිය, ප්‍රකටාර්ථය.

**කං.** අ-ජලය, හිස, සැපය.

**කංක.** පු-ලෝතුඩුවා යයි ප්‍රසිද්ධ පක්ෂියා.

**කංස.** පු-වළඳන පාත්‍රය, රත්රන්, කහවණු, මසු සතරක්.

**කංස කණ්ටක.** න-ලොහොකටු, ලෝහයෙන් කළ කටු.

**කංසකූට.** න-රත්රන් කියා පිත්තල ආදිය විකිණීමෙන් රැවටීම.

**කංසති.** ක්‍රි-(කසි d. භූ. විද්ධංසනෙ, නැසීමෙහි + ති) වධකරයි, නසයි.

**කංසථාල.** න-කස්තලිය, ලොහොතලිය.

**කංසපත්ථරික.** පු-ලෝහ බඩු විකුණන්නා, රන් බඳුන් විකුණන්නා.

**කංසපාති.** ඉ-රන් බඳුන, රත්රන් තැටිය.

**කංසපූර.** න-ලෝහවලින් පිරීම.

**කංසභාණ්ඩ.** න-ලොහොබඩු, රත්රන් බඩු.

**කංසභාජන.** න-ලෝහ භාජනය, රන් බඳුන.

**කංසමය.** ති-ලොහයෙන් තැනූ.

**කංසමල්ල.** න-රන් තැටිය, ලොහො තැටිය.

**කංසලොහ.** න-ලෝකඩ.

**කංසාරති.** පු-විෂ්ණු දෙවියා, විෂ්ණු.

**කංසූපධාරණ.** න-ලෝහවලින් තැනූ කිරි බඳුන, ලෝහයෙන් තැනූ කිරි බාල්දිය, "ධෙනු සහස්සානි දුකූල සන්දනානි **කංසූප ධාරණං.**"

(8639)

**කක්ක.** පු-නෙල්ලි ආදි කල්ක, සුදු අශ්වයා, මැණික් වර්ගයක්.

**කක්කට.** පු-ලොකු මුවා.

**කක්කට(ක).** පු-කකුළුවා, කටක රාශිය.

**කක්කටක නාල.** න-මුහුදු බටවර්ගයක්.

**කක්කටකමග්ග.** න-කකුළු මාර්ගය.

**කක්කටකසන්තක.** පු-ඉනිමං වර්ගයක්, යාත්‍රා වර්ගයක්.

**කක්කටකරස.** න-කකුළුරස, කකුළුවන් ගෙන් තැනූ සුප් වර්ගයක්.

**කක්කර.** පු-කුකුලා, වලිකුකුලා.

**කක්කරතා.** ඉ-කර්කශ භාවය, දැඩි බව.

**කක්කරිය.** න-රළුකොට කීම, රළුකතාව.

**කක්කරු.** පු-වැල්වර්ගයක්.

**කක්කස.** ති-රූක්ෂ, දැඩි, කර්කශ, දරුණු ක්‍රියා කැමැත්තා.

**කක්කස්ස.** න-දැඩි බව, රළු බව.

**කක්කාරී.** ඉ-කැකිරි.

**කක්කාරිකා.** ඉ-කැකිරි, කොමඩු.

**කක්කාරු.** පු-දිව්‍යමල්, ලබු, පුහුල්, වට්ටක්කා.

**කක්කු.** පු-තල, අබ, කහ, ලුණු, මැටි ආදියෙන් තනන මුව ගල්වන සුවඳ ආලේප වර්ගයක්.

**කක්කෝටක.** පු-කෘමිවර්ගයක්.

**කක්කෝල(ක).** පු-තක්කෝල ගසින් කළ සුවඳ වර්ගයක්.

**කක්ඛ.** d භූ. සිනාසීමෙහි, කක්ඛති, සිනාසෙයි

**කක්ඛළ.** ති-කර්කශ, රළු, නොමොලොක්.

**කක්ඛළකථා.** ඉ-රළු කථාව, කෲර වචනය.

**කක්ඛළකම්ම.** න-කර්කශ කර්මය, රළු වැඩය.

**කක්ඛළත්ත.** න-කර්කශ භාවය, රළු බව.

**කක්ඛළභාව.** න-කර්කශ භාවය, රළු බව.

**කක්ඛළිය.** න-රළු බව, තද බව.

**කක.** d භූ. ලොල්බැව්හි, කකති, ලොල්වෙයි.

**කකච.** පු-කියත, කිළල.

**කකචදන්ත.** න-කියත් දත.

**කකණ්ටක.** පු-බොහොඩා, කටුබෝවා, කටුස්සා.

**කකි.** d. භූ. යාමෙහි, ලොල්බැව්හි, කඞ්කති, යෙයි, ලොල්වෙයි.

**කකු.** පු-මොල්ලිය, මුදුන=සිඛරය.

**කකුට.** පු-පරවියා, පාරාවතයා.

**කකුටපාද.** න-පරවිපාදය, පාරාවතපාදය.

**කකුධ.** පු-පඤ්චරාජ කකුධභාණ්ඩ, මොල්ලිය, කුඹුක්ගස, කුකුල් කරමල.

**කකුධභණ්ඩ.** න-කඩුව, සේසත, නළල්පට, මිරිවැඩිසඟල, වාළවීජනිය යන රාජකීය භාණ්ඩ පස.

**කකුභ.** පු-කරාවිය, වීණාඹරුව, වීණාවේ කඳ.

**කකුසන්ධ.** පු-කකුසඳ නම් බුදුරජ.

**කඛ.** d. භූ. සිනාසීමෙහි, කඛති=සිනාසෙයි.

**කඞ්ඛ.** d. භූ. කැමැත්තෙහි, ඉච්ඡාවෙහි, කඞ්ඛති, කැමැතිවෙයි. "නාභි කඞ්ඛාමි මරණං—නාභි කඞ්ඛාමි ජීවිතං කාලඤ්ච පටිකඞ්ඛාමි - නිබ්බිසං භතකො යථා."

**කඞ්ඛ.** d. භූ. සැකයෙහි, සංසයෙහි, කඞ්ඛති, සැක කෙරෙයි, - "බුද්ධෙ කඞ්ඛති ධම්මෙ කඞ්ඛති සඞ්ඝෙ කඞ්ඛති සික්ඛාය කඞ්ඛති."

**කඞ්ක.** පු-ලෝතුඩුවා=කංක.

**කඞ්කට.** පු-සන්නාහය, යුද්ධයෙහි හඳනා ඇඳුම.

**කඞ්කණ.** න-අතපළඳනාව, වළල්ල.

**කඞ්කල.** න-ඇටසැකිල්ල, අට්ඨිකඞ්කල.

**කඞ්කුට්ඨක.** න-පස්වර්ගයක්, රන් රිදී පැහැති පස්වර්ගයක්.

**කඞ්ඛ.** d. භූ. සංසයෙහි, ඉච්ඡාවෙහි - කඞ්ඛ බලනු.

**කඞ්ඛති.** ක්‍රි-කඞ්ඛ, කඞ්ඛ බලනු.

**කඞ්ඛන.** න-සැකය, සැකකිරීම.

**කඞ්ඛනීය.** පු-සැකකටයුතු, සැකයට කරුණු.

**කඞ්ඛච්ඡේද.** න-සැකය දුරුකිරීම.

**කඞ්ඛට්ඨානීය** ති-සැක කටයුතු, සැක ඉපදවියයුතු.

**කඞ්ඛා.** ඉ-සැකය = විචිකිච්ඡාව.

(8692)

**කඞ්ඛාධම්ම**. න-චිත්ත ස්වභාවය ගැන සැක කිරීම.

**කඞ්ඛාවිතරණ**. න-සැකය දුරුකිරීම, සැකය මැඩපැවැත්වීම.

**කඞ්ඛාසමඞ්ගී**. පු - සැක ඇති තැනැත්තා, සැක ඇත්තා.

**කඞ්ඛායති**. ක්‍රි - d. භූ. කඞ්ඛ සංසය ඉච්ඡාසු, සැකකිරීමෙහි (කඞ්ඛ + ණය + ති) සැකකරයි.

**කඞ්ඛායනා**. ඉ-සැක බව, සැක සහිත බව.

**කඞ්ඛිතබ්බ**. ති-සැක කටයුතු බව=කඞ්ඛනීය.

**කඞ්ඛී**. පු-සැක ඇත්තා=විචිකිච්ඡා ඇත්තා.

**කඞ්ගු**. ඉ-තණධාන්‍ය, පුවඟුගස.

**කඞ්ගුපිට්ඨ**. න-තණ ධාන්‍ය පිටි.

**කඞ්ගුභත්ත**. න තණහාල් බත.

**කච්ච**. d. චු - දීප්තියෙහි, කච්චෙති, කච්චයති = බබලයි, දිලිසෙයි.

**කච්චර**. න-කිළුටුදෙය, කසල.

**කච්චි**. අ-ප්‍රශ්න-කිම, ඉච්ඡා, ප්‍රකාශ යනාදී යත්හි - "කච්චි තෙ කුටිකා නත්‍ථි කච්චි නත්‍ථි කුලාවකං."

**කච්චිකාර**. න ලොකු පැලැටි වර්ගයක්.

**කච්ඡ**. පු කිසිල්ල = බාහුමූලය, ජල ප්‍රදේශය. කිස්ස = නදී ගංගා ආදීන්ගේ ඉවුරුවල ඇති වන කිස්ස, ඇතුන්ගේ මැද බඳනා පොරොද්ද. අත්කර, කසපට, මෙවුල්දම.

**කච්ඡ**. පු - කථාවට සුදුසු, කථාවට යොග්‍ය. "කථාසම්පයොගෙන භික්ඛවෙ පුග්ගලො වෙදිතබ්බො යදිවා කච්ඡො යදිවා අකච්ඡො ති" අ. නි.

**කච්ඡ**. ති-කීමට යුතු, කියන්නට වටින.

**කච්ඡ**. න-තණ බිම්, වගුරු බිම්, දිග තණ කොළ, බව.

**කච්ඡති**. ක්‍රි d භූ (කසු + ච්ඡ + ති) කරයි.

**කච්ඡක**. පු-අත්තික්කා - දිඹුල් - බෝ ආදි වර්ග යන්ට අයිති ගස් ජාතියක්.

**කච්ඡන්තර**. න-රජුන්ගේ අසම්මිශ්‍රයස්ථානය, බොහෝදෙනා වැද්ද නොදෙන තැන, ප්‍රමද වනය = රජුන්ගේ අන්තඃපුරය.

**කච්ඡප**. පු-කැස්බෑවා, ඉදිබුවා

**කච්ඡපලක්ඛණ**. න-කැස්බා ලක්ෂණ, එය ශුභ නිමිත්තකැයි ශාස්ත්‍රඥයෝ කියති.

**කච්ඡපලොම**. න-කැස්බා ලොම්, (ලොව හමු නොවන දෙයකි).

**කච්ඡපිනී**. ඉ-කැස්බා හා ඉදිබුවන්ගේ ගැහැනු සතා.

**කච්ඡපුට**. පු-බඩුපොදි කිසිලිගසාගත යන්නා.

**කච්ඡා**. ඉ-ඇතුන්ගේ මැද බඳනා පොරොද්ද, මෙබලාදාමය = මෙවුල්දම.

**කච්ඡා**. ඉ - ආවරණය, ඇතුන්ගේ හිස හා බෙල්ල අලංකාර කිරීම පිණිස යොදන ආබරණයක්, කසපට.

**කච්ඡාලොම**. න-කිසිල්ලේ වැඩෙන ලෝම.

**කච්ඡු**. ඉ-විතච්ඡිකා නම් කුෂ්ටරෝගය, එනම් එලවර්ගය.

**කච්ඡුචුණ්ණ**. න-කච්ඡු නම් එල වර්ගයෙන් ලබාගත් කුඩු, මෙය කුෂ්ටරෝගය සුවකිරීමට ප්‍රබල බෙහෙතකි.

**කච්ඡුපිළකා**. ඉ - සිරුරේ ඇතිවන සීරුම්, බිබිලි.

**කච**. d. භූ. - බන්ධනයෙහි, කචති = බඳියි.

**කච**. d. දි. - බැබලීමෙහි, කචති = බබලයි.

**කච**. d. චු - ශබ්දයෙහි, කචති = ශබ්දකරයි.

**කචවර ඡඩ්ඩිකා**. ඉ-ශුද්ධ පවිත්‍ර කරණ සෙවිකාව.

**කචවර ඡඩ්ඩන**. න-කසළ ඇද දැමීම.

**කචවර ඡඩ්ඩනක**. න-කුණුරොඩු ආදි කසල ඇද දමන භාජනයක්.

**කචවර ඡඩ්ඩනී**. ඉ-කසල ඇද දැමීමට පාවිච්චි කරණ භාජන විශෙෂයක්.

**කචවර**. දු-කසළ, කහළ, අපවිත්‍ර දෙය

**කජි**. d. රු. නැගීමෙහි. කඤ්ජති, නගියි.

**කජ්ජ**. d. භූ-හිංසාවෙහි. කජ්ජති, හිංසා කෙරෙයි, පෙළයි.

**කජ්ජල**. න-අඳුන, දැලි, කිළුට.

**කජ්ජො පක්කාමක**. න-පුෂ්පරාග මැණික, ලොහිතඞ්කය.

**කඤ්චන**. න-රත්රන්, රන්, සවණ.

(8737)

**කඤ්චනක.** ති-රත්රන්, රන්.

**කඤ්චනගඝික.** න-රන් මල්දම.

**කඤ්චනථූප.** න-රන් දාගැබ, රන් ගෑ ථූපය.

**කඤ්චන පට්ට.** න-හිසෙහි පලඳනා රන්පට. කුමාරවරු පලඳනා සුළු ඔටුන්න.

**කඤ්චන පටිමා.** ඉ-රන් පිළිමය, රන් රූපය.

**කඤ්චන පතත.** න සවර්ණ පාත්‍රය, රන් පාත්‍රය.

**කඤ්චන පල්ලඞ්ක.** න-රන් පල්ලැක්කිය.

**කඤ්චන බිම්බ.** න-එනම් පල වර්ගය.

**කඤ්චන බුබ්බුල.** න-රන් බුබුල.

**කඤ්චන රූප.** න-රන්රුව, සවර්ණරූපය.

**කඤ්චන ලතා.** ඉ-රන්ලිය, රාජකීය තූර්‍ය්‍ය භාණ්ඩ වූ බෙරවල අලඞ්කාරය පිණිස යෙදෙන රන් වැල.

**කඤ්චන වණ්ණ.** න-රන් පැහැය, සවර්ණ වර්ණය.

**කඤ්චන වෙල්ලි.** ඉ-ඇඳුම් විශේෂයක්, රන් බදපටිය.

**කඤ්චන සන්නිභ.** ති-රන් පැහැති, සවර්ණ බඳු.

**කඤ්චන සූචි.** රන් කූර, හිසෙහි පලඳනා රන් කොණ්ඩ කටුව.

**කඤ්චි.** අ-කිසි, කිසියම්, යම්කිසි.

**කඤ්චුක** පු-සන්නාහය. සජ්ජ සැට්ටය. කවරය.

**කඤ්චුකී.** පු-රජුන්ට සැට්ට ලන ඇමතියා

**කඤ්ජක.** පු-අසුර වර්ගයක්, අසුර විශේෂයක්.

**කඤ්ජික(ය).** න-කාඩි, කාඩි ජලය, කැඳ.

**කඤ්ජික තෙල.** න-කැඳවර්ගවල ඇති තෙල් ගතිය.

**කඤ්ඤා.** ඉ-දස හැවිරිදි ස්ත්‍රිය, ඔසප් නොවූ තැනැත්ති, තරුණිය.

**කඤ්ඤා දාන.** න-තරුණියන් විවා කරදීම.

**කට්ඨ.** න-කාෂ්ටය, වියලි දර, වියලි ලී, දුක. දුර්වන.

**කට්ඨ.** ති-සානලද, සී සානලද, නරක නිෂ්ප්‍රයොජන.

**කට්ඨක.** පු-න-බට වර්ගයක්, දෙව් වර්ගයක්.

**කට්ඨකලිඞ්ගර.** න-පතුර, දහවියා, බොල්, දහයියා.

**කට්ඨඛණ්ඩ.** න-දර කැබැල්ල, පතුර, නිෂ්ප්‍රයෝජන දේ.

**කට්ඨඞ්ග.** පු-තොටිල ගස.

**කට්ඨග්ගි.** ඉ-දරවලින් ඇති ගින්දර, සවාභාවික ගිනි.

**කට්ඨඞ්ග.** ති-සාරය නැති, හර නැති (ගස්).

**කට්ඨත්ථ** ති-දර පිණිස වූ.

**කට්ඨත්ථර.** න-පැදුර, කොල ආදියෙන් තැනූ පැදුර.

**කට්ඨතාල.** න-ලීයෙන් තැනූ යතුර.

**කට්ඨතාල.** න-ලීයෙන් දෙනු සණ්ඨාව, ගෙඩිය.

**කට්ඨතුම්බ** න-ලීයෙන් තැනූ භාජනය.

**කට්ඨපාදුකා** ඉ-ලී සෙරෙප්පුව.

**කට්ඨපුඤ්ජ.** න-ලීගොඩ, ලී සමූහය.

**කට්ඨඵාලක.** පු-ලී කපන්නා, ගස් කපන්නා.

**කට්ඨමඤ්චක.** න-ලී ඇඳ, ලීයෙන් තැනූ ඇඳ.

**කට්ඨමය.** ති-දැවමය, ලීයෙන් තැනූ.

**කට්ඨමුඛ.** න-නපුරු කට, සර්ප ජාතියක්.

**කට්ඨරූප** න-දැව පිළිමය, ලීයෙන් තැනූ රූපය.

**කට්ඨවාහ.** න-කරත්තයක් බර දර.

**කට්ඨවාහන** න-දර මිටියක් උඩ නැගී යෑම, දඬු මොනර යන්ත්‍රය.

**කට්ඨවිපලාවිත.** න-ගසාගෙන යන දැව, පාවෙන ලී.

**කට්ඨහත්ථී.** පු-දැවමය ඇතා, උදේන රජු උපායෙන් ඇල්ලීමට චණ්ඩපජ්ජෝත රජු විසින් සැදූ ඇතා.

**කට්ඨහාරක.** පු-දර අදින්නා, දැව ගෙණ යන්නා.

**කට්ඨහාරිකා.** ඉ-දර අදින ස්ත්‍රිය.

**කට්ඨිස්ස.** න-රනින් ගෙත්තම් කළ තිහිරි හුයින් කළ ඇතිරිය.

**කට.** d. භූ-වර්ෂා වරණයෙහි, කටති=වැසි වලකයි.

**කට.** d. භූ-යාමෙහි. කටති, යෙයි.

(8789)

**කට.** d. භූ-මැඬීමෙහි කටති=මඩියි, මිරිකයි.

**කට.** ත-කළ, කරණ ලද, "සුකට දුක්කටානං කම්මානං ඵලං විපාකො."

**කට.** පු-හස්තිකපෝලය, කලාල, පැදුර, ජය, ස්ත්‍රී නිමිත්ත, කළ දෙය.

**කටච්ඡු.** පු-හැන්ද, සැන්ද=දබ්බිය.

**කටච්ඡුපරිස්සාවන.** න-දඬු තුණක් බැඳ එහි රෙදි කඩක් බැඳ කරණ ලද පෙරහන.

**කටච්ඡු භික්ඛා** ඉ-හැඳි බත, බත් හැන්ද.

**කටට්ඨික.** න-උකුල් ඇටය.

**කටසර.** න-බට ආදි තෘණ වර්ගයක්.

**කටිසාටක.** න-රෙදි වර්ගයක්.

**කටසාරක.** න-පැදුර.

**කටසි.** න-සොහොන, කනත්ත.

**කටසි වඩ්ඪන.** න-සොහොන් වැඩ කරණ, මැරී සොහොන් කිරීම, සසර මැරී මැරී ඉපදීම, පුනරුත්පත්තිය කරණ.

**කටල්ලක.** පු-රූකඩය, රූකඩ නැටුම.

**කටාහ.** පු-කළය, භාජනය, මල්බඳුන.

**කටි.** ඉ-උකුල. තුණටිය.

**කටිඵලක.** න-පිටකොන්දේ කුඩා ඇට.

**කටිප්පදෙස.** න-සට්ටම, තට්ටම.

**කටිප්පමාණ.** ති-උකුල දක්වා වූ ඇති.

**කටිපරියොසානං.** න-උකුල අවසන් කොට ඇති පෙදෙස.

**කටිපුථුලක.** ති-ලක්ෂණ උකුල් පෙදෙස ඇති

**කටිභාග.** පු-ඉඟටිය.

**කටිභාර.** පු-හිණිත්=උකුලෙන් ගෙණ යන බර.

**කටිසන්ධි.** පු-උකුලේ සන්ධිය, උකුල් සන්ධිය.

**කටිසමොහිත.** ති-උකුලට සවිවූ.

**කටිසුත්තක.** (ක) න-කටියෙහි බඳනා හුය. ඉණේ බඳනා නූල, ඉණ අබරණ.

**කටු.** ති-තීක්ෂවස්තු, අකතීව්‍යය.

**කටු.** පු-කුළුරසය, ඉදල.

**කටුක.** පු-කුළු රසය.

**කටුකඤ්චුකතා.** ඉ-රළු ලෙස සිත හැසිරවීම් බව.

**කටුකත්ත.** න-තිත්තබව, ඇඹුල් ගතිය.

**කටුකප්ඵල.** න-සුවඳැති පැල වර්ගයකින් සෑදූ සුවඳ ද්‍රව්‍යයන්.

**කටුකභණ්ඩ.** න-කුළුබඩු 1 හිංගු වෙරක, 2 සිංගි වෙරක, 3 මරීච, 4 පිප්ඵලී යන සතර වර්ගය.

**කටුකභාව.** න-කෑත කම, මසුරු කම, ලොභ කම.

**කටුකරොහිණී.** ඉ-කුළුරැණ, කටුකරොසන.

**කටුක විපාක.** ති-දරුණු විපාක ඇති.

**කටුක සාසන.** න-තද අනුශාසනය.

**කටුකා.** ඉ-කටුරොහිණී, කුළුරැණ.

**කටුකුද්‍රය.** ති-වේදනා ගෙණ දෙන.

**කටුකොදක.** න-තිත්ත (බෙහෙත්) පානය.

**කටුරොහිණී.** ඉ-කටුකරොහිණී බලන්න.

**කටුල.** ති-කටුක රස ඇති, 1 ආජමොජ, 2 හිංගු ජීරක, 3 ලසුන ආදියයි.

**කටුමිකා.** ඉ-කෘත්‍රිම, ඇඟවීම, පිටතින් ලැබෙන උදව්ව.

**කටුවිය.** ති අපිරිසිදු, කෑත, අපවිත්‍ර.

**කටෙරුක්ඛ.** න-වැල් වර්ගයක්.

**කටෙරුහ.** න-මල් ඇති පැලෑටි වර්ගයක්.

**කඨ.** d භූ-වියලීමෙහි, පිසීමෙහි, කඨති= වියලයි, පිසයි.

**කඨ.** d භූ-දුකින් ජීවත් වීමෙහි, කඨති= දුකසේ ජීවත්වෙයි.

**කඨ.** ති-(d භූ. කඨපාකෙ+කැකෑරීමෙහි+ති) කැකෑරෙයි.

**කඨල.** න-කැබිලිති, හැලිවලත් ආදිය බිඳී ගිය කැබලි.

**කඨලක.** පු-බොරළු, ශර්කර, අශ්මරී, කැට කැබිලිති.

**කඨි.** d. චු-භූ-ශොක කිරීමෙහි. කණ්ඨෙති. කණ්ඨයති, ශොක කෙරෙයි, කණ්ඨති, ශොක කරයි.

**කඨිත.** ති-කකියවන ලද, උණුකළ.

(8841)

**කඨින.** න-කඨිනවස්ත්‍ර, කඨින චීවරය, හිණිපෙති මැස්ස, තද, සපිර, අචල.

**කඨින චීවර.** න-කඨින දීම පිණිස ගන්නා වස්ත්‍ර.

**කඨිනත්ථාර.** පු-කඨින සිවුරු ඇතිරීම.

**කඨිනත්ථාරක.** පු-විනයානුකූල පරිදි කඨින වස්ත්‍රය පරිභොගකිරීමට පිළිගත් භික්ෂු නම.

**කඨිනදුස්ස.** න-කෙළින් පිළි=කඨින චීවර

**කඨින සාලා.** ඉ }
**කඨින මණ්ඩප.** න } -කඨින සිවුරු මසන තැන, නූලින් සිවුර මසන මණ්ඩපය.

**කඨිනුද්ධාර.** පු-කඨින චීවරයාගේ ඉදිරීම.

**කඨිනබ්භාර.** පු-කඨින චීවර පරිහරණය.

**කඨින රජ්ජු.** න-කඨින චීවරය පිළියෙල කිරීමට ගන්නා නූල.

**කඩ්ඪ.** d. භූ ඇදීමෙහි, කඩ්ඪති=ආකඩ්ඪති, අදියි.

**කඩ්ඪති.** d. භූ-කඩ්ඪ+ආකඩ්ඪතෙ (කඩ්ඪ+ති) කඩයි, අදියි.

**කඩ්ඪන.** න-කැඩීම, බිඳීම.

**කඩ්ඪනක.** න-ඇදීම, තල්ලුකිරීම.

**කඩි.** d. රු. -දමියෙහි, කණ්ඨෙති, දමිණය කෙරෙයි.

**කඩි** d චු ඡෙදනයෙහි, කණ්ඩෙති, කණ්ඩයති, සිඳියි.

**කණ්ට.** න-කටුව, කණ්ටක.

**කණ්ටක.** පු=වෘක්ෂාදීන්ගේ කටු, සතුරා, ගෝනා, රෝමහර්ෂය=රෝමෝද්ගමය.

**කණ්ටක කසා.** ඉ-දඬුවම් හා දත් දීමට පාවිච්චි කරණ කටු සහිත කසයක්.

**කණ්ටක ගහණ.** න-කටු සහිත වනලැහැබ, කැලය, වනය.

**කණ්ටක ගුම්බ.** න-කටු සහිත පඳුර.

**කණ්ටකලතා.** ඉ-කටු සහිත වැල්වර්ගයක්.

**කණ්ටක වට්ට.** න-කටු සහිත වන බිම් තීරය.

**කණ්ටකාධාන.** න-කටු සහිත බඩ වැටිය, කටු සහිත පෙදෙස.

**කණ්ටකාපචිත.** ති-කටුවලින් වැසී ගිය.

**කණ්ටකාපස්සය.** න-සමහර නිගණ්ඨයන් විසින් අත්තකිලමථානුයොගය පුරුදුකිරීමට යකඩ ඇණ අතුරණ ලද ඇඳක නිදීම හෝ වාඩිවී සිටීමේ පුරුද්ද.

**කණ්ටකාරී.** ඉ-කටුවැල්බටු.

**කණ්ටකී.** පු-කටු ඇති, කටුසහිත.

**කණ්ටකීඵල.** න-කටුගෙඩි, කොස්ගෙඩි, එම ගස.

**කණ්ඨ.** පු-බොටුව, ග්‍රීවය, උගුර, බෙල්ල.

**කණ්ඨකූප.** න උගුරේ ඇති සිදුර, උගුරු සිදුර.

**කණ්ඨසුත්තක.** න-ඇටවැල් ආදි ගෙලෙහි පළඳනා අබරණ, ගෙල බඳනා නූල.

**කණ්ඨභූසා.** ඉ-ග්‍රීවාභරණය, බෙල්ලේ දමන මාලාදිය.

**කණ්ඩ ගමන.** න-දුනු පහර, ඊතලයක ගමන.

**කණ්ඩ චිත්තක.** පු-ශ්‍රෙෂ්ඨ ඊතලය.

**කණ්ඩනාළි.** ඉ-ඊ කොපුව.

**කණ්ඩපහාර.** න-ඊතල පාර, ඊතලයෙන් වූ වණය, "එකෙන **කණ්ඩපහාරෙන** ද්වෙ මහාකායා පදාලිතා."

**කණ්ඩ වාරණ.** ති-පලිහ, ඊතල නවත්වන ආයුධය.

**කණ්ඩ.** පු-ඊ දඬු, ගොයම් දඬු, සමූහය, කොටස, අවකාශය.

**කණ්ඩ.** d. භූ-සිඳීමෙහි, කණ්ඩති, සිඳියි.

**කණ්ඩක.** ති-ආරක්ෂා නැති, සොරුන්ගෙන් නොමිදුනු.

**කණ්ඩකී.** ඉ-නදී විශෙෂයක්, කටුසහිත වැටක්.

**කණ්ඩරා.** ඉ-මහ නහර.

**කණ්ඩු.** ඉ-කණ්ඩුති රෝගය, කැසීම.

**කණ්ඩුක.** පු-දදය, දදයෙන් වන වෙදනාව.

**කණ්ඩුති.** ඉ ගාත්‍ර සඝර්ෂණය කරන්නාවූ එනම් රෝගය, කැසීම.

**කණ්ඩුසපල.** න-කුමුදුමල්.

(8888)

**කණ්ඩුපටිච්ඡාදී.** ඉ - දද, තුවාලාදිය බඳින රෙදි.

**කණ්ඩුරා.** ඉ-වඳුරු මෑ.

**කණ්ඩුරොගී.** පු-දද වේදනාවෙන් දුක්විඳින්නා.

**කණ්ඩුයන.** න-කැසීම.

**කණ්ඩුයා.** ඉ-කණ්ඩුතිය, කැසීම.

**කණ්ඩුව.** d. භූ කැසීමෙහි, කණ්ඩුවති = කසයි.

**කණ්ඩුවති.** ක්‍රි-කණ්ඩුව. d. භූ. කණ්ඩුවතෙ= කැසීමෙහි + ති. කසයි.

**කණ්ඩුවන.** න-කැසීම් රෝගය, කැසීම.

**කණ්ඩුස.** න-කඨින චීවරය පිළියෙල කිරීමට ගන්නා රෙදිපටියක්.

**කණ්ඩොලිකා.** ඉ-වැල්වලින් තැනූ කූඩය.

**කණ්ණ.** d. චු. ශ්‍රවණයෙහි, කණ්ණෙති, කණ්ණයති=අසයි.

**කණ්ණ.** පු-කර්ණය = කණ, කොණ, කෙළවර.

**කණ්ණක.** පු-කොණ, කෙළවර.

**කණ්ණකිත.** ති-මලබැඳුනු, කිළුටුවනලද.

**කණ්ණගුථක.** න-කන් මැලියම්, කණෙහි කලාඳුරු.

**කණ්ණචාලක.** න-කන් සෙලවීම.

**කණ්ණච්ඡිවර.** න-සිවුරු කොණ.

**කණ්ණචූල.** න-කන්සිළුව.

**කණ්ණච්ඡිද්ද.** න-කන් සිදුර.

**කණ්ණච්ඡින්න.** ති කපනලද කන් ඇති.

**කණ්ණච්ඡෙද.** න-කන් සිඳීම.

**කණ්ණජප්පක.** පු - කණට කොඳුරන්නා, රහස් කියන්නා.

**කණ්ණජප්පන.** න-කණින් ශබ්ද නොඇසෙනසේ මන්ත්‍රපිරවීම, කණට කොඳුරා කීම.

**කණ්ණජලූකා.** ඉ-කන්වැයා = එනම් පණුවා.

**කණ්ණතෙල.** න-කණෙහි තෙල් ගැල්වීම.

**කණ්ණධාර.** පු-නැවියා, නාවිකයා.

**කණ්ණනාස.** න-කණ හා නැහැය.

**කණ්ණපත්ත.** න-කන් පෙත්ත.

**කණ්ණපිට්ඨි.** න-කනේ උඩ කොටස.

**කණ්ණපූර.** පු කර්ණාභරණය, කණපළඳනාව.

**කණ්ණබිල.** න-කන් සිදුර, කන් කුහරය.

**කණ්ණභෙරී.** න-බෙර විශෙෂයක්.

**කණ්ණමල** න-කණෙහි ඇති කලාඳුරු, කන් මැලියම්.

**කණ්ණමලහරණී.** ඉ-කණ සුඬකරණ කන් හැන්ද.

**කණ්ණමාලා.** ඉ-නළල අලඞකාර කරණ මල් මාලයක්.

**කණ්ණමුණ්ඩ.** පු-එනම් විල.

**කණ්ණමූල.** න-කණෙහි මුල.

**කණ්ණරොග.** න-කන් රෝගය.

**කණ්ණවල්ලි.** ඉ-කන් පෙත්ත.

**කණ්ණවිජ්ඣන.** න-කන් විදීම.

**කණ්ණවිභූසන.** න-කර්ණාභරණය.

**කණ්ණවෙඨන.** න-කුණ්ඩලාභරණ = කොඩොල.

**කණ්ණවෙධ.** න-කුඩා දරුවන්ගේ කන් විදීමේ මඞ්ගලය.

**කණ්ණසක්ඛලී.** ඉ-කණෙහි විවර මාර්ගය.

**කණ්ණසංඛලී.** ඉ-කණෙහි යොදන පුංචි දම්වැලක් සහිත ආභරණ විශෙෂයක්.

**කණ්ණසංබොධික.** න-කණ සේදීම.

**කණ්ණසුඛ.** ති-කණට ප්‍රිය, කණට සැප දෙන.

**කණ්ණසුත්තක.** න-කණෙන් පහත වැටෙන කම්බියක් වැනි ආභරණ විශෙෂයක්.

**කණ්ණසුත්තක.** න-කණෙහි යොදන අබරණ විශෙෂයක්.

**කණ්ණසූල.** න-කන් කැක්කුම, කණෙහි යමකින් විදිනා වැනි වේදනාවක්.

**කණ්ණසොත.** න-කර්ණෙන්ද්‍රිය, කණෙහි ඇසීම ඇති කරවන පෙදෙස.

**කණ්ණාලඞකාර.** න-කණෙහි පළඳින ආභරණයක්.

**කණ්ණායත.** න-කන් පෙත්තෙහි දමන මුතු වර්ගයක්.

**කණ්ණිකා.** ඉ-පියුම් කෙමිය. කැණිමඬල. කර්ණාභරණය.

**කණ්ණිකා බද්ධ**. ති-කැණිමඩලෙහි බැඳුනු.

**කණ්ණිකා මණ්ඩල**. න-වහලේ එක් කොටසක්, වහලේ මුදුන් කොටස.

**කණ්ණිකා රුක්ඛ**. න-වහලේ මුදුනට සවි කරණ දැව දණ්ඩක්.

**කණ්ණිකා ලක්ඛණ**. න-කණේ පැලඳි ආභරණයන්ගේ ලකුණු බලා කියන අනාගත වාක්‍යයක් - ශාස්ත්‍රයක්, ගෙහි කැණිමඩල බලා කියන ශාස්ත්‍රයක්.

**කණ්හ**. පු-කළු පැහැය. විෂ්ණු. වසවර්ති මාරයා. පාපය. මිරිස්.

**කණ්හ අතිකණ්හ**. න-ඉතා කළු, තද කළු.

**කණ්හකම්ම**. න-අකුසල කර්මය.

**කණ්හතුණ්ඩ**. පු-කළුතුඩ ඇත්තා. කළුතුඩු වඳුරා.

**කණ්හපක්ඛ**. පු-කෘෂ්ණ පක්ෂය = කළුවර පක්ෂය.

**කණ්හපටිපදා**. ඉ-පව්වු ප්‍රතිපදාව, අකුශල ප්‍රතිපදාව.

**කණ්හපාකඵල**. පු-කරඹු.

**කණ්හපිතක**. පු-කළු රත්වත් පැහැය.

**කණ්හවණ්ටා**. ඉ-පලොල්.

**කණ්හඵලා**. ඉ-බෝලිද්ද.

**කණ්හභෙදී**. පු. ඉ-කුළුරැණ.

**කණ්හවත්තනී**. පු-ගින්න.

**කණ්හලා**. ඉ-හුණිද = ඔලිද.

**කණ**. d චු-ඇස නොදල්වීමෙහි. කාණෙති, කාණයති. ඇස නොදල්වයි, අක්ෂිනිමීලනය නොකරයි.

**කණ**. d භූ-ශබ්ද කිරීමෙහි, කණති, ශබ්ද කරයි.

**කණ**. පු-ධාන්‍යකුඩු, සියුම් දෙය. සවල්පය.

**කණය**. පු-ආයුධ විශෙෂයක් = හීන්දිවාල.

**කණවීරුවෙරා**. පු-වදමල්, අපරාධකරුවන් වධක ස්ථානයට ගෙණ යන විට කරේ පැළඳවීමට යොදන මල්මාල සඳහා රතු මල්.

**කණා**. ඉ-වගපුල්.

**කණාජක**. න-නිවුඩුහාලේ බත, කුඩුහාලේ බත. "කණාජකං දීයති බිලඞ්ග දුතියං."

**කණික**. න-තලකැලල. ශරීරාවයවයන්හි ඇතිවන තල ඇට වැනි ලප.

**කණිකාර**. පු-කිණිහිරි ගස.

**කණෙරික**. න-යුද්ධ තොප්පිය.

**කණෙරු**. පු-ඇතා, ඇතින්න, ඉ.

**කණෙරුකා**. ඉ-ඇතින්න.

**කතබ්බ**. ති-කටයුතු, සිදුකටයුතු.

**කතතර**. d චු-සිවිලබැව්හි, කතතරෙති, කතතරයති, සිහිල් කෙරෙයි, බුරුල් කෙරෙයි.

**කතතර**. න-සැරයටිය, සැරමිටිය.

**කතතරයට්ඨි**. ඉ-සැරයටි, හැරමිටිය.

**කතතර සුප්ප**. පු-පරණ කුල්ල, දිරූ කුල්ල.

**කතතරී**. ඉ-කතුර, ලොකු කතුර.

**කතතරිකා**. ඉ-කතුර, පිහිය.

**කතතික**. පු-ඉල්මාසය, හිල්මාසය.

**කතතිකා**. ඉ-කැති නැකත.

**කත්තු**. පු-කර්තෘ=කරන්නා.

**කථ**. අ-කොතැන්හි, කොයිබ, කොහේ.

**කථ**. d භූ-ගුණකීමෙහි, කත්ථති, ගුණකියයි.

**කථචි**. අ-කිසිතැනක, කිසි ස්ථානයෙක්හි.

**කථති**. ක්‍රි-(කත්ථ + ති) ගුණ කියයි.

**කථනා**. ඉ-වණිනාව, ගුණ කථනය.

**කස්තූරිකා**. ඉ-කස්තූරි, මෘගමද.

**කත**. ති-කළ, කරණ ලද.

**කතක**. පු-ඉඟිනිගස, බලල් ලූණු, සියුම් කෙමියක් සේ කළ බිස්ස.

**කතක**. ති-කරණයෙන් නිවෘත්ත දෙය.

**කතකම්ම**. න-පෙර ජාතීන්හි කළ කර්මය,

**කතකම්ම**. ති-පුරුදුකළ, දක්ෂ, නිපුණ.

**කතකරණී**. පු-කළ කටයුතු ඇත්තා.

**කතකිච්ච**. පු-කළ කටයුතු ඇති, ඉවරකරණ ලද කටයුතු ඇත්තා.

**කතඤ්ඤු**. පු-කෘතඥ, කළ උපකාර දත්.

**කතදුක්කත**. ති-නරකට කළ.

(8996)

**කතඤ්ඤු.** පු-සමයා, මරණය.

**කතන.** න-නරක ක්‍රියා, නරක කිරීම්.

**කතපිටක.** ති-පිට්වලින් කළ (ආහාර ආදිය)

**කතපුබ්බ.** ති-පෙර කරණලද.

**කතඵන.** ති-උස් කළ පෙනය ඇති.

**කතබුද්ධි.** ති-පුරුදුකළ සිතක් ඇති, දක්‍ෂ.

**කතභාව.** න-සිදුවීම, කළබව.

**කතම.** ති-කවර, මොන, කතර.

**කතමත්තක.** න-කළ ප්‍රමාණය.

**කතමල්ලක.** පු-කළ බඳුන් ඇති, කළ මල්ලව යුද්ධ ඇති.

**කතමාල.** පු-කෘතමාල = ඇසළ.

**කතයොග්ග.** ති-යොග්‍ය කළ, පුරුදු කළ, පුහුණු කළ.

**කතර.** පු-කවර, මොන, කතම.

**කතරූප.** ති-ස්වභාවයෙන් කළ, විගසින් කළ

**කතවෙදී.** පු-කළ උපකාර ප්‍රකට කොට දත්තා.

**කතවෙදිතා.** ඉ-කෘතවෙදී භාවය, කළ උපකාර දත්තා බව.

**කතසංකෙත.** ති-කළ සලකුණ, ගිවිසුම් ඇති කළ.

**කතසංසග්ග.** ති-පුරුදු, කලක් ඇසුරු කළ.

**කතසක්කාර.** ඉ-ගෞරව කළ.

**කතසික්ඛා.** ඉ-හැදූරූ ශිල්පය.

**කතහත්ථ.** ති-පුරුදු - දුනු ශිල්පයෙහි පුහුණු කළ අත් ඇති, දක්‍ෂ, නිපුණ.

**කතහත්ථික.** පු-කළ ඇතා, සෙල්ලම් සඳහා සාදූ ගත් ඇතා.

**කතාවී.** පු-සෝවාන් ආදී සතර මගින් කළ කටයුතු ඇත්තා. කරණලද ස්වභාව ඇත්තා.

**කති.** අ-කීයද? කොපමණද.

**කති.** d. චු-සිදීමෙහි, කත්තෙති, විකත්තයති, සිඳියි.

**කති.** d. රු. නූල් කැටීමෙහි, කන්තති, නූල් කටියි.

**කතිකා.** ඉ-කතිකාව, ව්‍යවස්ථාව, පණත.

**කතිකා සණ්ඨාන.** න-ගිවිසුමකට ඇතුල්වීම.

**කතිපය.** ති-කීපය=කොපමණ=කොපමණ.

**කතිපාහ.** න-(කතිප + අහ) කීපදවසක්, දින කීපයක්.

**කතිම.** ති-කවර, කිනම්

**කතිවස්ස.** අ-වස් කීයද, වයස කීයද?

**කතිවිධ.** ති-කතිප්‍රකාර, කී ආකාර

**කත්ථ.** අ-කොහිද?

**කත්ථති.** ක්‍රි. d. (භූ. කත්ථ-කත්ථනෙ, කීමෙහි + ති) කියයි, පුච්චම් දොඩයි.

**කත්ථසීල.** අ-කවර ස්වභාවයක්ද?

**කත්ථවාස.** ති-නිවස කොහිද?

**කත්ථවාසික.** ති-ඉන්නේ කොහිද?

**කත්ථු.** පු-සිවලා, හිවලා.

**කථා.** ඉ-කථාව, කථාකිරීම, කථා වස්තුව, ප්‍රබන්ධ කථාව.

**කථාන.** න - ඒනම් සංඛ්‍යාව, පදුම සියක් ලක්‍ෂය, පදුම බලනු.

**කථි.** d. භූ. කුටිල භාවයෙහි, කත්ථති, වක්ව යෙයි.

**කථික.** පු-කියන්නා, කථා කරන්නා, කථිකයා.

**කථිත.** ති-කියන ලද, දෙසන ලද.

**කථිතා.** ඉ-තෙපුල.

**කථෙති.** ක්‍රි-(කථ-කථනෙ, කීමෙහි + ණෙ + ති) කියයි, බෙනෙයි.

**කථොජ්ජ.** න-තෙජස් රහිත කථාව.

**කදද.** d. භූ. නින්දිත ශබ්දයෙහි, කදදති, කැත ශබ්ද කෙරෙයි.

**කද්දම.** පු-මඩ, පඞ්කය.

**කද.** d. භූ. ආමන්ත්‍රණයෙහි, හැඬීමෙහි, කන්දති, ආමන්ත්‍රණය කරයි, හඬයි.

**කදම්බ.** පු-කොළොම්ගස, රාශිය.

**කදම්බක.** පු-අඹගස, සමූහය.

**කදර.** පු-හෙළ කිහිරියගස.

**කදර.** ති-අසරණ, දුක්ඛිත.

**කදරිය.** පු-තද මසුරා.

**කදලිමිග.** පු-කදලිමෘගයා=කෙහෙල් මුවා.

**කදල.** පු-කෙසෙල් ගස.

**කදලික්ඛන්ධ.** න-කෙසෙල් ගසේ කඳ, නිසරු දෙයට උපමාකරණ ද්‍රව්‍යයක්.

**කදලිමිග පවර පච්චත්ථරණ.** න - කෙසෙල් මුව නම් මෘගයන්ගේ සමින් කළ උතුම් පසතුරුණු.

**කදලිතරු.** න-කෙසෙල් ගස.

**කදලී.** ඉ-ධවජය, කෙසෙල් ගස, කදලි මෘගයා.

**කදා.** අ-කවරදා කවරකාලයක යනාර්ථයෙහි.

**කදා උපසන්තික.** ති-සමහරවිට ඇතිවන.

**කදාචි.** අ-කිසිම කලෙක, අනියත කාලාර්ථයෙහි.

**කදි.** d. රු-ලැසිගමනෙහි, අසීඝ්‍ර ගමනෙහි, කන්දති, ලැසිවෙයි.

**කදි.** d. රු-හැඬීමෙහි, ආමන්ත්‍රණයෙහි, කන්දති, අඬයි, කැඳවයි.

**කන්ත.** පු-ස්වාමිපුරුෂයා, වල්ලභයා, මනොහර, මනවඩන.

**කන්තති.** ක්‍රි-(කන්ත + ති) නූල් කටියි.

**කන්තති.** ක්‍රි-d. භූ. කන්ත-කන්තනෙ, කැපීමෙහි-කන්ත + ති, කපයි, සිඳියි.

**කන්තන.** න-කැපීම, සිඳීම.

**කන්තා.** ඉ-ප්‍රියාව, ප්‍රිය භාර්යාව.

**කන්තාර.** න-ආරණ්‍යය, දුර්ගමාර්ග, නිරුදක, චොර, වාළ, දුර්භික්ෂ යන කාන්තාර සතර.

**කන්තාරද්ධාන.** න-කතර මග, දුර්ගමාර්ගය, කාන්තාර මාර්ගය.

**කන්තාර පටිපන්න.** ති-කතර මගට පිළිපන් තැනැත්තා, වනයෙහි වසන තැනැත්තා.

**කන්තාර මග්ග.** පු-යෑමට අමාරු මග, කාන්තාර මාර්ගය.

**කන්තාර මුඛ.** න-කාන්තාරයට ඇතුල්වන දොරටුව, කාන්තාර මුඛය.

**කන්තාරිය.** ති-කාන්තාරයෙහි ජීවත්වන, වන සංචාරක උපදේශකයා, යක්ෂයනට ව්‍යවහාර කරණ නාමයක්.

**කන්ති.** ඉ-රුචිය, රශ්මිය.

**කන්තික.** න-කරකැවීම, නූල් කැටීම.

**කන්තික.** පු-කැමතිවන්නා, කාන්ති ඇත්තා.

**කන්තිකා.** ඉ-කිඳි = රසකිඳ.

**කන්තිත.** ති-කපනලද, සිඳින ලද.

**කන්ද.** d භූ-ආමන්ත්‍රණයෙහි, හැඬීමෙහි.

**කන්දති.** ඉ-අමතයි හඬයි.

**කන්දති.** ක්‍රි-(d. භූ. කන්ද-රොදනෙ, හැඬීමෙහි + ති) හඬයි.

**කන්ද.** පු-අල, හිඟුරල බතල ආදී අල.

**කන්දන.** න-රොදනය, හැඬීම.

**කන්දප්ප.** පු-අනඞ්ගයා, කාමයා = කන්දර්පයා.

**කන්දර.** පු. න-භූමි පර්වතාදීන්ගේ විවර, කඳු රැලි.

**කන්ද.** d චු-නිතර හැඬීමෙහි, කන්දෙති, කන්දයති, නිතර හඬයි.

**කන්දරාල.** පු-තෙලැසවුගස.

**කන්දල.** පු-කිඩාරම් ගස.

**කන්දිත.** ත්‍රි-හඬනලද, හැඬීම, දුක්වනලද.

**කන්දුක.** පු-පන්දුව.

**කන්ධරා.** ඉ-ග්‍රීවය, ගෙල.

**කන්දළ.** පු-මානෙල් මල්.

**කන.** d. භූ - බැබලීමෙහි, යාමෙහි, කැමතිවීමෙහි, කනති බබලයි, යෙයි, කැමතිවෙයි.

**කනකග්ග.** න-රත්මුදුන.

**කනකච්ඡවි.** න-රත්පැහැති ලක්ෂණ සිරුරු පැහැය.

**කනකතච.** ති-රන් පැහැති සමක් ඇති.

**කනකප්පභා.** ඉ-සුවර්ණමය ආලොකය.

**කනකවිමාන.** න-රන් විමන.

**කනකසිඛර.** ඉ-සුවර්ණමය කඳු මුදුන.

**කනකරාජ.** පු-සුවර්ණමය කඳු මුදුන්හි රජු, හිමාලය පර්වතය.

**කනක.** න-රත්රන්.

**කනති.** ක්‍රි-(කන + ති), බබලයි.

**කනිට්ඨ.** ති-අති ස්වල්පදෙය, ඉතා තරුණයා බාල සහෝදරයා, කනිට්ඨක-බාල සහෝදරයා.

**කනිට්ඨතන** න-දියුණුවෙන් අඩු තන්ඩය.

**කනිට්ඨඵල.** න සුළු ඵලය.

**කනිට්ඨභවන.** න-උසස් දෙවියන්ගේ විමානය

**කනිට්ඨා.** ඉ-සුලඟිල්ල, හුලඟිල්ල.

**කනිට්ඨී.** ඉ-බාල සොහොවුරිය.

**කනිය.** ති-අතිසවල්පය, කනිට්ඨ බලනු.

**කනීනිකා.** ඉ-ඇසේ ඉංගිරියාව, ටිගිනිය.

**කප්ප** d. චු විතර්කණයෙහි, සිදීමෙහි, කප්පෙති කප්පයති. විතර්කයයි, සිඳුයි.

**කප්ප.** d. චු විධානයෙහි කප්පෙති, කප්පයති, විධානයකරයි.

**කප්ප.** d භූ-සමර්ථභාවයෙහි. කප්පති, පොහො සත් වෙයි.

**කප්ප.** ති-කාල, කෘතාදියුග, ලෙශ, පණත්, පරමායුෂ, සදෘශාර්ථ, ශ්‍රමණව්‍යවහාර කප් බින්දු තැබීම, සමන්තභාවය, අන්තඃකල්ප, අසඞ්ඛ්‍යකල්ප, මහාකල්ප, ලෙශමාත්‍ර, විකල්ප, විතර්ක, විධාන, අභිසද්දහනාර්ථ යන මෙහි.

**කප්පක.** පු-කපුවා, කරණවැමියා, ඇඹැට්ටයා.

**කප්පකොලාහල.** පු කල්පවිනාශයට පෙරටුව දෙව් මිනිසුන් අතර පවත්නා කොලාහලය.

**කප්පග්ගි.** ඉ-කල්පාන්තයේ ගින්න.

**කප්පට්ඨ** පු-කාලය ඉක්මවූ කෙනෙක්, රහතුන් වහන්සේ.

**කප්පට.** න-පරණ රෙදි, ඉරුණු ඇඳුම, කුණු.

**කප්පති.** ක්‍රි (d. භූ. කප්ප - සමත්ථභාවෙ, සමර්ථ භාවයෙහි + ති) පොහොසත් වෙයි.

**කප්පන.** න-කැපීම්, විතර්ක, ඉ-අශ්වාදීන් සැදීම.

**කප්පර.** පු-කබල, වැලමිට, හිස්කබල.

**කප්පරුක්ඛ** පු-කල්පවෘක්ෂය=කප්රුක, දිබ්බ රුක්ඛ බලනු.

**කප්පලතා.** ඉ-කප්රුක වැනි වැලක්.

**කප්පහලාහල.** d-කල්පාන්තයෙහි වන මහා හඬ.

**කප්පායුක.** පු-ආයුස් කල්පයට වඩා ජීවිතය ගතකල කෙනෙක්.

**කප්පාස.** පු-කපුගස.

**කප්පාසික.** න-කපුපිළි = කපු නූලින්කළ දේ.

**කප්පාසී.** ඉ-කපු.

**කප්පික.** ති-කැප ඇති, පරිභොගයට සුදුසු.

**කප්පිත.** පු-සරසනලද, සකස්කල, සැරසූ ඇතා.

**කප්පිය.** පු-කැප ඇති, සුදුසු.

**කප්පියකාරක.** පු-කැපකරුවා.

**කප්පියභණ්ඩ.** න-කැප බඩු, පරිභොගයට සුදුසු බඩු.

**කප්පුට්ඨාන.** න කල්පාන්තයට අයත්වීම.

**කප්පූර.** පු න-කපුරු.

**කප්පෙති.** ක්‍රි-(d භූ කප්ප කප්පණෙ, විතර්ක කිරීමෙහි-කප්ප + ණෙ + ති) විතර්ක කරවයි.

**කප** d. භූ - කරුණුවෙහි, කපති, කරුණු කෙරෙයි

**කප.** d. චූ. - චලනයෙහි, කපෙති, කපයති, සැලෙයි

**කප.** තු-වැසීමෙහි, ඇදීමෙහි.

**කපට.** පු. න-කපටියා=කෛරාටිකයා.

**කපණ.** ති - කෘපණ, දිළිඳු, තදමසුරා, දුගියා,

**කපණජීවිත.** න - දිළිඳු ජීවිතය, දුප්පත් ජීවිතය.

**කපණද්ධික.** පු-සිඟන්නා, මගියා.

**කපණභාව.** න-දිළිඳුභාවය, දුප්පත් බව.

**කපණමනුස්ස** පු-දිළිඳු තැනැත්තා, දුප්පත් මිනිසා.

**කපණලද්ධක.** පු දුකින් ලැබූ තැනැත්තා.

**කපණවිසිඛා.** ඉ-මුඩුක්කු, දිළින්දන් වසන විදිය.

**කපණවුත්ති.** න-දිළිඳු ජීවිතයක් ගෙනයෑම.

**කපණිකා.** ඉ-අසරණ ස්ත්‍රිය.

**කපණී ඡී.** ඉ-දුප්පත්-අසරණ ස්ත්‍රිය.

**කපද්දි** පු-ඊශ්වරයා, උමාපති..

**කපල්ල(ක)** න-කබල, කපාල, - කපල්ලපූව, කබලුපූ, කබලුකැවුම්.

**කපල්ලපානී.** ඉ-මැටියෙන් කළ භාජනයක්.

**කපා.** ඉ-රාත්‍රිය.

**කපාට.** පු. න-දොරබාව.

(9054)

**කපාල.** න-හිස්කබල, කළ, ලබු ආදීන්ගේ කබල්.

**කපාලක.** පු-කුඩා භාජනයක්, පාත්‍රය.

**කපාලඛණ්ඩ.** න-කැබිලිති කැල්ල.

**කපාලකර.** පු - කබලක් අතේ ඇත්තා; ඊශ්වරයා, (ඊශ්වරයා අත මිනී හිස්කබලක් ඇත.)

**කපාලහත්ථ** ති - කබලක් ගත් අත් ඇති, පාත්‍රයක් ගත් අත් ඇති.

**කපාලාභත.** ති-පාත්‍රයෙන් ගෙණ ආ, (බත)

**කපි** d චු. -යාමෙහි, කපෙති, කපයති, යෙයි

**කපි** d චු - බැබලීමෙහි, කම්පෙති, කම්පයති, බබලයි.

**කපි.** d. රු. මදක් සෙලවීමෙහි. කම්පති, සෙලවෙයි.

**කපි.** පු-වඳුරා, රිලවා.

**කපිකච්ඡු** පු-වඳුරු මෑ, කසඹිලියා.

**කපිචිත්ත** ති-අස්ථිර, ටිකෙන් ටික වෙනස්වන, වඳුරු සිතක් ඇති.

**කපිඤ්ජල.** පු-වලිකුකුළු වර්ගයක්.

**කපිත්ථ**
**කපිත්ථක** } පු-හිවුලු, දිවුල්ගස.
**කපිත්ථන**

**කපිමිද්ධ.** න-වඳුරු නින්ද.

**කපිල.** පු-නිල් රත්වත් පැහැය, කිඹුලා.

**කපිලවත්ථු.** න-කිඹුල්වත්පුරය.

**කපිලා.** ඉ-ඇට්වේරිය, හරේණුරුක, සුවඳ වර්ගයක්; වරාගස, අසු(හු) ගස.

**කපිවල්ලී.** ඉ-ඇත් වගපුල්.

**කපිසීස.** පු-අගුලුකනුව.

**කපිතන.** න-තෙලැසටුගස.

**කපු** d. භූ. - පොහොසත් බැව්හි, කප්පති, සමර්ථවෙයි=හැකිවෙයි.

**කපු** - d. භූ. හිංසාවෙහි, කප්පති, හිංසා කෙරෙයි.

**කපොණී**-ඉ. වැලමිට.

**කපොත.** පු-පරවියා=පක්ෂි විශේෂයක්.

**කපොත පාද.** ති-පරෙවි පාද වැනි.

**කපොත පාලිකා.** ඉ - කොබෙයි ගෙඩි වලල්ල.

**කපොල** පු කපොලය, කම්මුල.

**කබ්බ.** d. භූ. යාමෙහි, දප්පයෙහි, කබ්බති, යෙයි, ආඩම්බර වෙයි.

**කබ්බ.** d. භූ. ස්තුතියෙහි, වර්ණයෙහි, කබ්බති, පසසයි, පාට කරයි.

**කබ්‍ය.** න-කාව්‍යය.

**කබර** න කබරයයි ප්‍රසිද්ධ තිත්, පැල්ලම්, ලප, පොහොර. "කබර ගොරූපංවිය"

**කබරගොරූප.** න-කබර එලදෙනගේ රූපය.

**කබරමණී.** පු-මැසිරිගල.

**කබල.** පු-ආලොපය=බත්පිඩ.

**කබලිංකාරාහාර** පු-කබලීකෘත ආහාරය. පිඩුකොට වළඳන ආහාරය, දිවි පැවැත්මට හෙතුවන සියලුම ආහාර වර්ග මීට ඇතුළත් වේ.

**කබලීකාර.** පු-බත් පිඩු කිරීම, බත් ගුලි කිරීම.

**කම්ප** d. භූ. කම්පාවීමෙහි, කම්පති, කම්පා වෙයි.

**කම්පක.** පු-කම්පාකරන්නා, සොලවන්නා.

**කම්පති.** ක්‍රි-(කම්ප + ති) කම්පාවෙයි, සැලෙයි.

**කම්පන.** ති සැලීම, කම්පාවීම.

**කම්පිත.** ති-සැලෙන ලද.

**කම්පෙති.** ක්‍රි-(කම්ප + ණෙ + ති) කම්පාකරයි.

**කම්බ.** d. භූ. සංවරණයෙහි, කම්බති, සංවරණය කෙරෙයි.

**කම්බල.** පු. න රොමයෙන් තැනූ පලස.

**කම්බල.** පු-මේරුපාදයෙහි නාග වර්ගයක්.

**කම්බල කූටාගාර.** න-කම්බිලි රෙදිවලින් කරණ කුළුගෙය=සිවිගෙය.

**කම්බලිය.** න-ලෝමවලින් තැනූ පොරෝනාව.

**කම්බු.** පු-රත්රන්, සක්, වළලු.

**කම්බු ගීවා.** ඉ-රන් මිහිගු බෙරයක් සමාන වූ හෝ තුන්හි(ඉ)රකින් උපලක්ෂිත ග්‍රීවය.

**කම්බුර.** පු-කම්බුරු වර්ණය.

**කම්බුපරිහරක.** පු-අත් ඔරලෝසුව, වලල්ල

**කම්බුස්ස.** න-රත්රන්, රත්මය අබරණ.

**කම්බොජ.** පු-එනම් රට, එනම් ජනපදය.

**කම්බොජක** පු-කම්බෝජයෙහි උපන්, අශ්වතරයා.

**කම්ම.** න-කර්මය, ක්‍රියාව, සිතිවිල්ල=යම් ක්‍රියාවක් කිරීමට සිතීම

**කම්මක.** පු-කර්මය ඇති, කර්ම සහිත

**කම්මක්ඛය.** පු-කර්මක්‍ෂය, කර්ම ක්‍ෂයවීම

**කම්මකර.** පු-කම්කරුවා, කර්මාන්ත කරන්නා, බැලමෙහෙකරන්නා

**කම්මකරණ.** න කටයුතු කරණ, කර්ම කරණ.

**කම්මකාරක.** පු-කම්කරන්නා, කටයුතු කරන්නා, බැලමෙහෙවරාදිය කරන්නා, ෂට්කාරකාගත කර්මකාරකය, කම් විබත්.

**කම්මඤ්ඤ.** න කර්මණ්‍ය, කර්මයට සුදුසු, ක්‍රියාවට යොග්‍ය.

**කම්මඤ්ඤතා.** ඉ-කර්මයට සුදුසු බව.

**කම්මඤ්ඤා** ඉ-වැටුප්.

**කම්මන්ත.** ක්‍රි-කර්මාන්තය, කටයුතු, කර්මය.

**කම්මන්තික.** පු-කටයුත්තෙහි යෙදුන තැනැත්තා, කළමනාකරු.

**කම්මනිය.** ක්‍රි කර්මණ්‍ය, කර්මයට සුදුසු, කම්මඤ්ඤ.

**කම්මප්පත්ත.** ක්‍රි-කර්මප්‍රාප්ත, කර්මය පිණිස පැමිණි.

**කම්මරත.** ක්‍රි-ක්‍රියාවෙහි ඇලුනු, කටයුත්තෙහි යෙදුනු.

**කම්මලක්ඛණ** ක්‍රි-කර්මස්වභාව, කර්ම ලක්‍ෂණය.

**කම්මවිපාක** පු කර්මයට ලැබෙන ඵලය, කර්මානිෂංශය, කර්මයෙන් ලැබිය යුතු ප්‍රයොජනය.

**කම්මසීල.** න-කම්මස්වභාව.

**කම්මාධිට්ඨායක** පු කර්මාධ්‍යක්‍ෂකයා, කට-යුත්තේ ප්‍රධානයා.

**කම්මාධිපතෙය්‍ය.** පු-කර්මය අධිපතිකොට ඇත්තා, කර්මය ප්‍රධාන කොට පවත්නා.

**කම්මාර.** පු-කඹුරා, කවම්දන්නා.

**කම්මාරගග්ගරී.** ඉ-කඹුරුගේ, මයිතහම

**කම්මාරභණ්ඩ.** න-කඹුරු බඩු, කඹුරාගේ අඩුවැඩිය

**කම්මාරහ.** පු-කර්මාහී, කර්මයට සුදුසු ක්‍රියාවට යොග්‍ය

**කම්මාරාම** පු කර්මයෙහි ඇලුනහු

**කම්මාරුද්ධන.** න-කඹුරු උදුන

**කම්මාස.** පු-කඹුරුවන් පැහැය, කැලල

**කම්මි.** න-කිරීම, ඉටුකිරීම, පුහුණුවීම.

**කම්මික.** පු-කාරකයා, වැඩෙහි යෙදුනහු

**කම්‍ය.** න-කැමැත්ත, කරණු කැමැත්ත.

**කම්‍යතා.** ඉ-කරණු කැමති බව, කරනු රිසි බව.

**කම.** පු-ක්‍රමය, පිළිවෙළ, අනුක්‍රමය.

**කමණ්ඩලු.** පු-න-කෙණ්ඩිය, කොතලය.

**කමති.** ක්‍රි (කමු+ති) යෙයි, පාද වික්‍ෂෙපය කරයි.

**කමන.** න-යෑම, ගමන්කිරීම.

**කමනීය.** ති-කැමති වියයුතු.

**කමල.** න-පියුම, නෙලුම්, ජලය. එනම් තෘණ විශෙෂය.

**කමලයොනි.** ඉ-පියුම්යොන්, බ්‍රහ්මයා.

**කමලාසන.** පු-න පද්මාසනය, බ්‍රහ්මයා.

**කමලිනී.** ඉ-පියුම්විල, කමලාකරය.

**කමු** d. භූ-පාද වික්‍ෂෙපයෙහි-කමති, යෙයි.

**කමු.** d. චු කැමැත්තෙහි, කාමෙති, කාමයති, කැමති වෙයි

**කමු** d ජු යාත්‍රාවෙහි චඞ්කමති, සක්මන් කරයි, යයි

**කය.** පු මිලයට ගැණීම, වික්කය බලනු

**කයති.** ක්‍රි-d භූ. (කය-වික්කයෙ=විකිනීමෙහි +ති) මිලදී ගනියි.

**කයවික්කය.** පු ක්‍රයවික්‍රය, මිලට ගැණීම හා දීම, ගණුදෙනුකිරීම.

**කයවික්කයික** පු වෙළෙන්ද, වාණිජයා.

**කයික.** පු මිලදී ගන්නා, වෙළෙන්ද බඩු බෙදාහරින්නා.

**කර**. න-කරවුවර, අත, රශ්මිය, සොඬ.

**කර**. d න කිරීමෙහි, (කර+ඔ+ති=කර+ ඕර+ති) කරොති, කයිරති, කෙරෙයි.

**කරක**. න-දෙළුම්ගස, කෙණ්ඩිය, ධම්ම කරකය.

**කරකටක**. පු-ජලය ගැනීමට පාවිච්චි කරණ එනම් යන්ත්‍රය.

**කරකරා**. ති-අඹරණ දත.

**කරකා**. ඉ-පාණ වැස්ස, පිනිකැට වැස්ස.

**කරග්ග** පු සොඬ අග.

**කරජ**. පු-නියපොතු.

**කරඤ්ජ**. පු-කරඳ, මගුල් කරඳ.

**කරට**. පු-ඇතා.

**කරණ්ඩ**. d. භූ-කරණ්ඩති, බෙදයි

**කරණ්ඩ**. පු-කරඬුව, පෙට්ටිය, කොපුව

**කරණ්ඩක**. පු-කරඬුව, කරණ්ඩි.

**කරණ**. න කරණ කාරකය, ක්‍රියා ශරීරය, ඉන්ද්‍රිය.

**කරණීය**. න-කටයුතු, කෘත්‍යය.

**කරපාල**. පු කඩුව, අල්ල.

**කරපාලිකා**. ඉ-සැට්ටය.

**කරපුට**. පු - හස්තපුටය, දෙහොත = දෝත.

**කරභ** පු - පාණිතලය සම්බන්ධවූ මණිබන්ධය = මැණික් කට්ටුව = මිණිබහණ සුලහිල්ල, ඔටුවා.

**කරභූසා**. ඉ - වළල්ල = අතලන වළල්ල

**කරමද්ද**. පු - කරඹ

**කරමර**. පු - බලහත්කාරයෙන් ගෙනෙන මනුෂ්‍යාදීහු.

**කරමරානීත**. පු - බලාත්කාරයෙන් ගෙණ, දසයා.

**කරමිත**. න-දෙ අතින් මැනීම.

**කරරුහ** පු - නියපොතු = නඛා.

**කරවීක**. පු-එනම් පර්වත කූටය, කුරවිකෙවිළි පක්ෂියා.

**කරවීර**. පු-කණේරු, අලරිය.

**කරවි**. පු-ඉන්ද්‍රියානු කොවුලා.

**කරල**. න-වියලි තණ මිටිය.

**කරසාඛා**. ඉ-අත ඇඟිලි.

**කරහචි**. අ-කිසිකලක, කවර කාලයක.

**කරහාට**. පු-අල, කඳමූලය.

**කරහාටක**. පු කුකුරු මුවත් ගස.

**කරහි**. අ-කිසි කලක, කරහචි.

**කරහිචි**. අ-කවර කලෙක, කවදාවත්.

**කරි**. පු-ඇතා, හස්තියා.

**කරිපරිභණ්ඩ**. ති-අපිරිසිදුකමින් යුත්,

**කරිසාපණ** පු කර්ෂාපණය, කහවණුව.

**කරිසාවක**. පු ඇත් පැටියා, හස්ති පුත්‍රයා.

**කරීර**. පු කිළිල, උණ කිළිල් ආදිය.

**කරීස** න වර්චස්=මල. කිරිය=සතර අමුණක්

**කරීසඵල**. පු-බුලුගස.

**කරීසමග්ග**. න අධො මාර්ගය.

**කරුණ**. පු නාට්‍ය රසයක්.

**කරුණායති**. ක්‍රි-d භූ. කර කරණෙ, කිරීමෙහි කර+උ+ණ+යති) කරුණා කරයි

**කරුණා**. ඉ-දයාව, අනුන්ගේ දුකෙහි හිත කම්පාවීම.

**කරුණා සාගර**. පු-කරුණා නැමැති සාගරය.

**කරුණා විහාර**. කරුණා විහරණය.

**කරුණාසීතල**. ක්‍රි-කරුණාවෙන් තෙත්වූ.

**කරෙණු**. ඉ=ඇතින්න.

**කරෙණුකා**. ඉ ඇතින්න.

**කරෙරි**. පු-ලුණුවරණ.

**කරොටි**. ඉ-බෙසම, කෝප්පය, පාත්‍රය, දීසිය.

**කරොති**. ක්‍රි-d. භූ කර+කරණෙ, කිරීමෙහි (කර+ඔ+ති) කෙරෙයි.

**කල්‍ය**. ති-දක්ෂ, සමර්ථ, කලල.

**කල්‍යාණ**. ති-සුන්දර, යහපත්, ඉෂ්ට.

**කල්‍යාණක**. පු-යහපත් තැනැත්තා.

**කල්‍යාණමිත්ත**. පු-කල්‍යාණ මිත්‍රයා, අර්ථ සාධක මිත්‍රයා.

**කල්‍යාණවාක්කරණ**. ති-යහපත් වචන ඇති.

**කල්‍යාණජ්ඣාසය.** න - යහපත් අදහස, යහපත් අදහස් ඇති.

**කල්‍යාණපටිභාන.** න-යහපත් පිළිතුර.

**කල්‍යාණ පාපක.** න-හොඳ හා නරක.

**කල්‍යාණ සද්ද.** න හොඳ වචනය, යහපත් කථාව.

**කල්‍යාණී.** ඉ-සුන්දරිය, යහපත් තැනැත්තී

**කල්ල.** d. භූ-ශබ්දයෙහි, කල්ලති, ශබ්ද කෙරෙයි

**කල්ල** d. භූ සැරසීමෙහි රෝගමුක්තියෙහි, කල්ලති, සැරසෙයි, රෝගයෙන් මිදෙයි

**කල්ල.** ති-නිරෝගි, දක්ෂ, සාදනලද.

**කල්ලහාර.** පු-හෙල්මැලි.

**කල්ලෝල.** පු-මහරළ, මහදියරළ, තරඞ්ගය.

**කල.** d භූ ගණන් කිරීමෙහි, කලති, ගණන් කරයි.

**කල.** d. භූ-සැරසීමෙහි, හැකිබැව්හි, කලති, සැරසෙයි, හැකිවෙයි.

**කල.** d. චු - ගමනයෙහි, ගිණීමෙහි, කලෙති, කලයති, යෙයි, ගණන් කෙරෙයි.

**කල.** d චු-දැමීමෙහි, ගෙවීමෙහි, කලෙති, කලයති, දමයි, ගෙවියයි.

**කල.** පු-මියුරු අව්‍යක්තහඬ.

**කලකල.** පු-කල කල ශබ්දය, කෝලාහලය.

**කලඞ්ක.** පු-සලකුණ, දෝෂය.

**කලත්ත.** න-කලත්‍රාව, භාර්‍ය්‍යාව.

**කලදි.** d භූ ආමන්ත්‍රණයෙහි, කලන්දති, අමතයි

**කලන්ද.** න-ලී මිටිය.

**කලන්දක.** පු-ලේනා.

**කලම්බ.** පු-ශරීරය.

**කලම්බ.** න-කොලොම්ගස.

**කලම්බක.** පු-විලපලා.

**කලභ.** පු-තාම්බා (සිව්පා), තරුණයා, ඇත් තාම්බා.

**කලම්බුකා,** ඉ-උණගස,

**කලමු.** d. භූ-ගිලන් බැව්හි, කලමති, වෙහෙසෙයි.

**කලල.** පු. න-කලල රූපය, මඩ, "පඨමං කලලං".

**කලලගහණ** න-මඩින් යුත්, "හොති කලලං අනකකම්පිත්වා ගච්ඡතු".

**කලලගත.** ති-මඩට වැටුනු.

**කලලීභූත.** ති-මඩසහිත, කැලඹුනු.

**කලවිංක.** පු-ගේ කුරුල්ලා.

**කලස.** පු-කළය, ඝටය.

**කලසී.** ඉ-පුස්වැන්න.

**කලහ.** d. භූ - නිඤුවෙහි, කලහති, නිඤු කෙරෙයි.

**කලහ.** පු-විවාදය, කෝලාහලය, ඹබරය.

**කලා.** ඉ-භාග, ශිල්පය, කාල, චන්ද්‍රයාගේ සොළොස්වන කොටස, කාෂ්ඨා තිසක්, සිය යෙන් කොටස, දහයෙන් කොටස.

**කලානිධි.** පු-චන්ද්‍රයා.

**කලාප.** න - මොනරපිල, හියවුර, සමූහය, පොකුර=මිටිය.

**කලාපක.** න මුතුපටක්.

**කලාපගඟ.** න-දූනය සඳහා යොදන අස්-වැන්නේ කොටසක්.

**කලාපී.** පු-මොනරා.

**කලාබුක.** න-බොහෝ රැහැන් ඇති, කාය බන්ධනය.

**කලාය** පු-කඩල.

**කලායමත්ත.** න කඩල පමණවූ.

**කලාර.** පු-නිල් රත්වත් පාට.

**කලි.** පු-අකුසලය, පරාජය.

**කලිකා.** ඉ-මදක් මූ කළ කැකුළ.

**කලිඞ්ග.** පු-නීලකොබෙයියා.

**කලිඞ්ගර.** පු-නිෂ්ඵල දර ලී කැබැල්ල, බොල් "අපවිඩොතඤසෙති නිරත්ථංව කලිඞ්ගරං".

**කලිගගහ** පු-අවාසනාවනත තත්වය, නපුරු පල විපාකය.

**කලිද්දුම.** පු-බුළු ගස්.

**කලිම්බක.** න-ලාපත.

**කලිමාරක.** පු-කටුකරඳ.

**කලියුග.** න-කලියුගය, ලෝකයේ ආයුෂය පිළිබඳ කරුණු සතරින් එකක්.

**කලිල.** ති-අවිවේකය.

**කලීර.** පු කිළිල. ගොතිය.

**කලිංගරූපධාන.** න-තිඳුගැනීමේදී හිසට තබන ලී කොටයක්.

**කලුස.** න-අකුසලය, අපිරිසිදුබව.

**කලෙබර.** න-ශරීරය.

**කව** භූ වර්ණනා කථනයෙහි, කවති, වර්ණනා කෙරෙයි.

**කවළඞ්ගක.** පු-කඩුව.

**කවච.** න- සන්නාහය, සැට්ටය.

**කවන්ධ** පු න-හිසනැති රූපය. හිසනැතිව ක්‍රියාකරණ රූපය, කවන්ධරූපය. (විස්තර රෙව්තසථවිර සිංහල මහා අකාරාදිය බලනු)

**කවාට.** ති-දොරබාව, වාතපානය, ජනේලය.

**කවාටක.** ති-කවාටය, වාතපානය.

**කවි.** පු-ප්‍රාඥයා, චතුරා, කාව්‍යකාරයා, මුව වළල්ල.

**කවිකා.** ඉ-මුව වළල්ල, කටකලියාව.

**කවිට්ඨ.** න-දිවුල්ගස.

**කව්‍ය.** න-කාව්‍යය, සින්දුව, කවිකතාව.

**කස්මා.** අ-කුමක් හෙයින්, කවර හේතුවකින්.

**කස්මීර.** පු-එනම් ජනපදය.

**කස්මීරජ.** න-කොකුම්,

**කස්ස.** d භූ-යාමෙහි, සීසෑමෙහි, කස්සති, යෙයි, සීසායි.

**කස්සක.** පු-ගොවියා, සීසාන්නා.

**කස්සති.** ක්‍රි-(කස්ස + ති) සීසායි.

**කස්සප.** පු-එනම් බුදුරජ, එනම් ගොත්‍රය.

**කස්සපසය.** පු. අරුණ අරුණ බලනු.

**කස්සාම** ක්‍රි-කරන්නෙමු.

**කස** d භූ - ඉරි ඇඳීමෙහි, කසති, ඉරි අඳියි, ලියයි.

**කස** d. භූ පෙළීමෙහි, කසති, පෙළයි.

**කස** d භූ-යාමෙහි, තුනීකිරීමෙහි, කාංසති, යෙයි තුනී කරයි

**කස.** පු-උරගල, කස්තාපාසාණය.

**කසක.** පු-සීවැල.

**කසට.** ති-තිත්ත, තරක, අම්හිර

**කසෝදක** න-අඹිහිරි ජලය.

**කසති.** ක්‍රි-(d භූ කසවිලෙඛනෙ, ඉරි ඇඳීමෙහි + ති) ඉරි අඳියි.

**කසන** න- සීසෑම = හීහෑම

**කසම්බුජාත** න-කෙලෙසුනු ජීවිතය.

**කසම්බු** පු-කසල, කහළ, නොවටිනා දෙය.

**කසා** ඉ කෂය, සැමිටිය, සබුක්කුව, කහ.

**කසාය** පු-ද්‍රව්‍ය, කසට රසය, එනම් වර්ණය, සුවඳ බෙහෙතින් කළ කසාය ජලය.

**කසායත්ත.** න-කසට බව, රූක්‍ෂබව.

**කසාව.** පු න-කසට රසය, එම වර්ණය, පඬු පැහැය.

**කසිකම්ම.** න-කෘෂිකර්මය. සී සෑම.

**කසිණ.** න - සියල්ල, කසිණ වැඩීම, පඨවි කසිණාදිය.

**කසිණමණ්ඩල.** න-කසිණ මණ්ඩලය, කසිණ භාවනා වැඩීමට සදා ගන්නා තැටියක් වැනි දෙයක්.

**කසිත.** ති-සාතලද තැන.

**කසිර.** න-දුක. හිරිහැරය.

**කසිරවුත්ති.** ඉ-දුකසේ පැවැත්ම.

**කසී.** ඉ-සීසෑම.

**කසේරු.** පු-කෙකටිය, කොකටිය.

**කසේරුක.** පු-කැලගස.

**කහං.** අ- කොහේ, කොතැන, කොයිබ.

**කහාපණ.** පු-කහවණුව.

**කහාපණගබ්භ.** න මුදල් තැන්පත්කර තබන සේප්පුව.

**කහාපණවස්ස.** න-මුදල් වර්ෂාව.

**කහාපණක.** න-කහවණු තරමට සිරුර කපා කරණ වධයක්.

**කළ.** d. භූ-ඉසීමෙහි, කළති, දිය ඉසියි.

**කළ.** d. භූ-මත්වීමෙහි, කළති, මත්වෙයි.

**කළභ.** පු-ඇත් පැටවා, ඇත්හාම්බා.

**කළා (ලා) ය.** පු-කබල, කලතණ.

**කළෙබර.** පු-මෘතශරීරය, මිනිය.

# කා

**කා** d දි-ශබ්දකිරීමෙහි, කායති, ශබ්දකෙරෙයි.

**කාක**. පු-කවුඩා, කපුටා.

**කාකච්ඡති**. ක්‍රි-d භූ. කාස-සද්දකුච්ඡායං, ශබ්ද කිරීමෙහි, + ති, කසියි.

**කාකචිඤ්චි**. ඉ-හුනිද.

**කාකතින්දුක**. පු-කවුඩු තිඹිරි.

**කාකනික**. පු-කහවණුවෙන් $\frac{1}{8}$ක් වටිනා මුදලක්, කහාපණ, අඩ්ඪපාද, මාසක හා කහාපණික යනු ඒ මුදල්ය.

**කාකනිල**. න-කවුඩු කූඩුව.

**කාකතාලීය**. ති සම්භාවනා නොකොට හැකිව පැමිණියේ, හදිස්සියෙන් ලැබෙන දෙය.

**කාකපක්ඛ**. පු-කුඩුම්බිය (කුඩුසම්බිය).

**කාකපට්ටනක**. න-පාළුගම.

**කාකපෙය්‍ය**. න-කවුඩන් විසින් පිය යුත්ත.

**කාකභීරු**. පු-කවුඩාට බියවන්නා, බකමූණා.

**කාකමාසක**. පු-කපුටු හොට දමා කෑමට හැකිවන ලෙස උගුරටම කන්නා.

**කාකම්බු** පු-සක් වළලු.

**කාකලී** ඉ-සියුම් මියුරු අවියත්හඬ.

**කාකවස්ස**. න-කවුඩු ශබ්දය.

**කාකෝදර**. පු-සර්පයා

**කාකෝදුම්බරිකා**. ඉ-කොට දිඹුලාගස.

**කාකෝල**. පු-කපුටු වර්ගයක්.

**කාකෝල** (ළ) පු-වන කවුඩා, විෂභෙදයක්.

**කාකෝළූක**. පු-කවුඩා හා බකමූණා.

**කාච**. පු-කදුමැටි, සාල්ල, නෙත්‍රරෝගයක්, කර්කශ, තද.

**කාචනා**. ඉ-කදක් ගෙණයෑමේදී ඇතිවියයුතු සමබර

**කාච**. අ-කිසියම්, යම්කිසි.

**කාඤ්චි**. ඉ-මෙවුල්දම

**කාජ**. පු-කද.

**කාජකෝටි**. ඉ-කද කෙළවර.

**කාජහාරක**. පු-කද ගෙණයන්නා, කත්-කාරයා.

**කාණ**. පු-කණ, එක ඇසක් ඇත්තා.

**කාතබ්බ**. ති-කටයුතු, සිදුකටයුතු.

**කාතර**. ති-බැගෑපත් තැනැත්තා

**කාතන්තික** පු නැකැත්තා.

**කාතුං**. අ-කරන්නට, කිරීමට.

**කාතුන**. පු. ක්‍රි-කොට, කර.

**කාදම්බ** පු-විල්කුකුළා.

**කාදම්බක**. ති-කදම්බ ලී වලින් තැනූ.

**කාදම්බරී**. ඉ-සුරා, එනම් ග්‍රන්ථය.

**කාදලිමිග පවර පච්චත්ථරණ**. න-කෙසෙල්, මුව සමින් කළ උතුම් පසතුරුණ.

**කානන**. න-වනය, අරණ්‍යය.

**කා නාමා**. ඉ-ඇගේ නම කුමක්ද, ඔබේ නම කුමක්ද?

**කා නු**. අ-කවර, කිනම් (තැනැත්තියක්ද)

**කාපිල**-කපිලට අයත්, කපිල පිළිබඳ.

**කාපිලවත්ථු**. න-කිඹුල්වතට අයිති, කිඹුල්-වතෙහිවූ.

**කාපුරිස**. පු-නින්දිතපුරුෂයා, කැතමිනිහා.

**කාපෝතක**. ති-පරෙයි පාට, ඇටසැකිලිවල ඇතිපාට.

**කාපෝතිකා** ඉ-පරෙවිපාද වැනි පාටින් යුත් සුරා වර්ගයක්.

**කාමං**. අ-ඒ කාන්තාර්ථයෙහි, කැමතිනාක්, යදි-අපි ශබ්දයන්ගේ අර්ථයෙහි.

**කාම**. පු-වස්තුකාම, ක්ලේශකාම, අභිලාෂ, අනංග, මෛථුන, කාමාචාර, අනුමති.

**කාමක**. ති-කැමැති, සතුටු

**කාමකණ්ටක** න-කාම නැමැති කටු.

**කාමජ**. පු-කාමයෙන් උපන්, කාමයෙන් හටගත්.

**කාමකලල**. න-කාම නැමති මඩ.

(9383)

**කාමණ්ඩලුක.** ති-කමණ්ඩල ඇති - කමණ්ඩල බලනු.

**කාමගිද්ධ.** ති-කාමයෙන් ගිජු බවට පැමිණි.

**කාමච්ඡන්ද.** පු-කාමාශාව, කාමතෘෂ්ණාව.

**කාමජ්ඣොසාන.** කාම + අජ්ඣොසාන, කාමයට ඇතුළත්වීම - බැසගැන්ම.

**කාමතණ්හා.** ඉ - කාමතෘෂ්ණාව, කාමාශාව, වස්තුකාම - කෙලශ කාමයන්හි ආශාව.

**කාමතා.** ඉ-කැමති බව, රුචි බව.

**කාමධාතු.** ඉ - කාම භවය, කාම විතර්කය, සිංලුම් අකුශල ධර්ම.

**කාමන.** ති-කාමීහු.

**කාමදුක්ඛ.** ති-කාමයෙන් දුකට පත්.

**කාමප්පවේදන.** න-ඉච්ඡාප්‍රකාශය, කැමැත්ත ප්‍රකාශ කිරීම.

**කාමපරිලාහ.** පු-කාමයෙන් ඇතිවූ දැවිල්ල.

**කාමභව.** පු-කාමධාතුව, කාමලෝකය, එකාදසවිධ කාමාවචරය.

**කාමභොගී.** පු-කාමභොගියා, ගිහියා.

**කාමනන්දි.** ඉ-කාම තණ්හාව.

**කාමසිත.** ති-කාමීහු.

**කාමරාග.** පු-කාමයෙහි ඇලීම, කාමාශාව, පඤ්චකාමගුණික රාගය.

**කාමවිතක්ක.** පු-කාමවිතර්කය, කාමසිතිවිලි.

**කාමසග්ග.** න-කාම ස්වර්ගය.

**කාමසඤ්ඤා.** ඉ-කාමසංඥව, කාමචේතනාව.

**කාමසඞ්ග.** න-කාමයට ඇලීම.

**කාමසුඛ.** පු-කාම සැපය, පස්කම් සැපය.

**කාමාලය.** පු-කාමාශාව, කාමතෘෂ්ණාව.

**කාමාවචර.** පු-කාමධාතුව, කාමභවය, සතර අපාය, මිනිස් ලොව හා සදෙව්ලොව්ය යන එකොළොස් තැන.

**කාමාසව.** පු-කාමාශ්‍රවය, පඤ්චකාමගුණික රාගය.

**කාමී.** ති-කාමීහු, කාමය කැමැත්තා.

**කාමිනී.** ඉ-විශිෂ්ට ස්ත්‍රී, කාමයන් කැමැත්තී.

**කාමුක.** පු-කාමීහු, කාමාශා ඇත්තා.

**කාමෙති.** ක්‍රි-d. භූ කමු. ඉච්ඡායං, කැමැති-වීමෙහි (කමු + ණෙ + ති) කැමතිවෙයි, ඉච්ඡා කෙරෙයි.

**කාමොඝ.** පු-පඤ්චකාමගුණික රාගය, කාම නමැති වණ්ඩ ප්‍රවාහය.

**කාය.** පු-ශරීරය, සමූහ-"ජනකායො -හත්ථි-කායං"

**කායක.** පු කරවන්නා, අනුන් ලවා කටයුතු කරවන්නා.

**කායකම්ම.** පු. න-කයින් කරණ කර්මය, කායචාරය ප්‍රධානව කරණ කර්මය.

**කායකසට.** න-ශාරීරික අපිරිසිදුකම.

**කායගතාසති.** ඉ-කායගතාසති භාවනාව.

**කායගුත්ත.** න-තම සිරුර හික්මවා ගැනීම.

**කායදුච්චරිත.** න-කායදුශ්චරිතය.

**කායපචාලක.** න-කය සෙලවීම.

**කායබන්ධන.** න-කඟබහන, කයබැඳුම, බඳපටිය.

**කායමුනි.** පු පිරිසිදු කායචාරය.

**කායමොනෙය්‍ය.** පු කයින් පවත්නා මුනිභාවය.

**කායවංක.** පු-කාය දුශ්චරිතය.

**කායවිඤ්ඤත්ති.** න-කයින් කරණ හැඟවීම.

**කායවිවෙක** පු-කය පිළිබඳ ඇතිවන විවේකය

**කායවෙය්‍යාවච්ච.** න-කයින් කරණ වතාවත්.

**කායසඞ්ඛාර.** පු-කායසංස්කාරය, කයින් රැස් කරගත් කුසලාකුසලාදී සඞ්ඛාර - සඞ්ඛාර බලනු.

**කායික.** පු - විකිණි ගන්නා, කය පිළිබඳ, ශරීරාගත.

**කායුර.** න-මුදු, මාල ආදී සිරුර අලංකාර වීමට පාවිච්චිකරණ ආභරණ.

**කාර.** පු-කරගස්, සත්කාරය, බන්ධනාගාරය, උපකාරය.

**කාරක.** පු-කරන්නා, කර්තෘ කරණාදි කාරක.

**කාරකවස්ස.** න-හිමවැස්ස.

**කාරණ.** න-හෙතුව, කාරණය.

**කාරණා.** ඉ-කම්කටුළු.

**කාරණික.** පු-නිරයපාලයා, ඊතල සාදන්නා.

**කාරණික.** ති-කරුණු පරීක්ෂා කරන්නා

**කාරණී.** පු-කසල

**කාරණ්ඩව.** පු-කරළු පක්ෂියා, කැරලා.

**කාරණ්ඩව.** න-කැත කුණු, අපිරිසිදු දේ.

**කාරවෙල්ල.** පු-කරවිල

**කාරා.** ඉ බන්ධනාගාරය, හිරගෙය.

**කාරාපක.** පු- කරවන්නා.

**කාරාපන.** න-කරවීම

**කාරාපිත.** ති- කරවන ලද, කරවූ.

**කාරිකා.** ඉ-ක්‍රියාපද, පද්‍ය.

**කාරිය.** න-කටයුත්ත, සාධ්‍යය.

**කාරිසාපණ.** න-කහවණුව.

**කාරී.** පු-කරණ සුළු.

**කාරු.** පු ශිල්පියා.

**කාරුඤ්ඤ.** න-කරුණාව, දයාව.

**කාරුඤ්ඤතා.** ඉ-කරුණා ඇති බව.

**කාරුණික.** ති-කරුණා සම්පන්නයා, නිරය පාලයා.

**කාරෙති.** ක්‍රි-d. භූ කර - කරණෙ කිරීමෙහි (කර + ණෙ + ති) කරවයි.

**කාල.** d. චු-ගණන් කිරීමෙහි, කාලෙති, කාලයති, ගණන්කෙරෙයි.

**කාල.** පු-කාලය=සමය, කලුපැහැය, මරණය යමයා.

**කාලක.** පු-කළුපුස්, කළුලප.

**කාලකණ්ටක.** පු-පක්ෂි වර්ගයක්, දතුඩුවා

**කාලකණ්ඨ.** පු-ඊශ්වරයා, නිල්ගෙලේ.

**කාලකණ්ණී.** පු-නිශ්ශ්‍රීකයා, නිස්සිරිකයා, ශ්‍රියානැත්තා.

**කාලකා.** ඉ-ලේනා, කලන්දකයා.

**කාලකිරියා** ඉ-කාලක්‍රියාව, මරණය.

**කාලකොකිල.** පු-කළු කොවුලා.

**කාලපක්ඛ.** පු-කලුවරපක්ෂය, කෘෂ්ණපක්ෂය.

**කාලමේසිකා.** ඉ-වැල්මිදට, කලුත්‍රසනවාලු.

**කාලසීහ.** පු-කාලසිංහයා, කලුමුඛ වඳුරා. වලසා, වලහා

**කාලානුසාරී.** පු-කලුවැල්.

**කාලික.** පු-කාලයට අයිති, කාලයෙහිවූ.

**කාලිඞ්ග.** පු-කලිඟු ජනපදය, කලිඟු රට.

**කාලී.** ඉ-කලුතැනැත්තී, කලුපාට ඇත්තී.

**කාලිය.** න-සඳුන් ලී වර්ගයක්.

**කාලුසිය.** න කැත කුණු, අපවිත්‍ර දේ.

**කාලෙයක.** පු-වනුවැල්.

**කාවෙය්‍ය.** පු-කවීන්ට හිතදේ, පද්‍ය බන්ධනය.

**කාවෙය්‍යමත්ත.** න-කවියෙන් මත්වීම.

**කාවෙරී.** පු-එනම් ගංගාව.

**කාසම්රී.** පු-ඇද්දෙමට ගස.

**කාස.** d. භූ-නින්දිත ශබ්දයෙහි, කාසති, පහත් ශබ්ද කෙරෙයි.

**කාස.** d භූ-දීප්තියෙහි, සැදීමෙහි, කාසති, බබලයි, දිලිසෙයි, සාදයි.

**කාස.** පු. න-වැලුක්.

**කාසමද්ද.** පු-කාශමර්දී, රුවර, පලාවර්ගයක්.

**කාසාය.** න-කසටින් රඳනා ලද්ද, චීවරය, සිවුර.

**කාසායපජ්ජෝත.** ති-කහ සිවරෙන් දිලිසුනු.

**කාසාව.** පඬුපොවන ලද්ද, සිව්ර, චීවරය.

**කාසාවක.** න-කසටින් රඳනා ලද වස්ත්‍රය, සිව්ර.

**කාසාවකණ්ඨ.** පු-කාසාවකණ්ඨයා, කහ කඩක් බොටුවෙහි බැඳ හැසිරෙන තැනැත්තා

**කාසාවිය.** පු-කහ පාට වස්ත්‍ර ඇඳගත් තැනැත්තා, රාජකීය වධකයා.

**කාසි.** පු-කසී ජනපදය, කසීරට.

**කාසික.** ති-කසීජනපදයෙහිවූ, කසීරටෙහි උපන්.

**කාසිකවත්ථ.** න-කසීසළු, බරණැස වියන සළු.

**කාසු.** ඉ-වළ, පොළොවෙහි සාරන ලද වළ, රාශිය.

**කාළ.** පු-කළුවර පක්ෂය, කළුපැහැය, අකුසලය.

**කාලකණ්ටක.** පු-දුතුඩුපක්ෂියා

**කාලකා.** ඉ-ලේනා.

**කාලකූට.** පු-එනම් පර්වතය.

**කාලකූට** පු. න-විෂ වර්ගයක්, වච්චිනාවි.

**කාලඛන්ධ.** පු-කළුකඳ, තිඹිරිගස.

**කාලතිපු.** න-කළු තුඹ, කළු ඊයම්.

**කාලමෙසි.** ඉ-බෝදිගස්.

**කාලලොණ.** න-කළු ලුණු.

**කාලසීහ.** පු-කාලසිංහයා, කළුසිංහයා, වළහා.

**කාලසුත්ත.** පු-කළුනූල, එනම් නිරය.

**කාලහංස.** විලිකුකුළා, කළුහංසයා.

**කාලා.** ඉ-බෙරුගස්, කළුත්‍රසනවාලු.

**කාලාගුරු.** න-කළු අගිල්.

**කාලානුසාරි.** පු-කළුවැල්, ගල්මල.

**කාලාවික.** පු-එනම් ඇත්කුලයක්.

**කාලායස.** පු-යකඩ.

**කාලාවක.** පු-එනම් ඇත්කුලය.

**කාළීය.** න-කළුවැල්.

## කි

**කි.** පු-එකසංඛ්‍යාව, පද්මාදිය, සදෘශාර්.

**කි.** d. සු-පෙළීමෙහි, කිණෝති, පීඩාකෙරෙයි.

**කි.** d. භූ-උන්නතියෙහි, කෙති, උඩට යයි.

**කිං.** ති-පුච්ඡා, ගර්හා, අනියම, පරිවිතක්ක, ප්‍රශ්න, යන අර්ථයන්හි.

**කිං.** අ-නින්දා, අනියම, නිශ්ඵලවචන, පිළිගැන්ම, යන අර්ථයන්හි.

**කිංජච්ච.** කුමන ජාතියකද?

**කිංසු.** අ-ප්‍රශ්නයෙහි, කිමෙක යනාර්ථයෙහි.

**කිංසීල.** න-කවර සීලයක්ද?

**කිංසුක.** පු-එරබදු, කැල

**කිංපක්ක.** න - නොදන්නා හෝ විෂ ඵල ඇති ගස.

**කිකී.** පු-කිරලා, - "කිකීව අණ්ඩං චමරීව වාලධිං"

**කිංපුරිස** පු පුරුෂයන් වැනි අයෙක්, වානර

**කිඞ්කර** පු-දාසයා, කිකරුවා, "කුම්කෙරෙම් දැයි පිළිවිස කරනුයේ කිකරු."

**කිඞ්කිණී.** ඉ-රහුගෙඩි, කිකිණි, ගෙජ්ජි.

**කිඞ්කිණිික.** ති-කිකිණි.

**කිඞ්කිරාත.** පු=කටුකරඹු, කටුකරඳ.

**කිච්ච.** න-කෘත්‍යය, කටයුත්ත.

**කිච්ඡ.** පු. ති-දුක, දුෂ්කර, අමාරු.

**කිච්ඡති** ක්‍රි d. භූ. (කිත - දුබ්බලෙල, දුකෙහි, + ති) දුෂ්කරයි.

**කිඤ්චි.** අ-සවල්පය යනාර්ථයෙහි.

**කිඤ්චික්ඛ.** න-සවල්ප දෙයක්, කුඩා දෙයක්

**කිඤ්චිදූනක.** ති-මඳක් අඩු දේ.

**කිඤ්ජක්ඛ.** න-කෙසර, රේණු. ධාන්‍ය කුඹුර, බිම ඇති අස්වැන්න.

**කිට්ඨ.** න-ගොයම්.

**කිට්ඨාද.** න-ධාන්‍ය කෑම.

**කිට.** d. භූ-යාමෙහි, කෙටති, යෙයි.

**කිට්ඨරක්ඛ.** පු කුඹුර රකින්නා.

**කිටක.** න-} සංඝාරාමයෙහි ඉස්තෝප්පුව,
**කිටික.** න-} ආලින්දය.

**කිණ්ණ.** න.-සුරාබීජය, රාමණ්ඩි.

**කිණ්හ.** පු-කෘෂ්ණ, කළු පැහැය.

**කිණාති.** ක්‍රි d භූ. කී - දබ්බවිනිමයෙ, ද්‍රව්‍ය මිලදී ගැනීමෙහි (කී + ණා + ති) මිලදී ගණී, විකොට ගණී.

**කිත්ත** d. චු-මනාකොට කීමෙහි, කිත්තෙති කිත්තයති, මනාකොට ප්‍රකාශ කෙරෙයි.

**කිත්තක.** ති කොපමණ, කෙපමණ.

**කිත්තන.** න-කීර්තිය, ප්‍රකාශය.

**කිත්තාවතා.** අ-කොපමණකින් යනාර්ථයෙහි.

**කිත්ති.** ඉ-කීර්තිය, ගුණ කථාව.

**කිත්තිත.** ති-කීර්තිය ප්‍රකාශකළ, කීර්ණය කළ.

**කිත්තිම.** ති-කරණයෙන් නිවෘත්ත දෙය.

**කිත්තෙති.** ක්‍රි d භූ. කිත්ත-කිත්තනෙ කීර්තන යෙහි. (කිත්ත + ණෙති) කීර්තනය කෙරෙයි.

(9550)

**කිනති**. අ-කිම යනාර්ථයෙහි.

**කින්නර**. පු-කිඳුරා, විස්තර සිංහල අකාරාදියෙහි.

**කින්නරෙස**. පු-කින්නරාධිපතියා, වෙසමුණි රජ.

**කින්නු**. අ-කිම, මොකද යනාර්ථයෙහි.

**කිප**. d. චු-දුර්වල බැව්හි, කිපෙති, කිපයති, දුර්වල වෙයි.

**කිපිල්ලික**. පු කුහුඹුවා, කිපිලි.

**කිපෙති**. ක්‍රි-d. චු. කිප-දුබ්බල්‍යෙ දුර්වල්වීමෙහි (කිප + ණෙ + ති) දුර්වලවෙයි.

**කිබ්බිස**. න-අපුණ්‍යය, අපරාධය.

**කිබ්බිසකාර**. පු-අපරාධකාරයා.

**කිමඞ්ගපන**. අ-කියනුම කවරේද යනාර්ථයෙහි.

**කිමි**. පු-පණුවා.

**කිමිජ**. න-තිහිරිපිළි, පට පණුවන්ගෙන් උපදින පිළි, අගිල්.

**කිමිණ**. න-කෙමන.

**කිමින**. ති-පණුවන්ගෙන් ගහණ.

**කිමිසත්තු**. පු-පණු සතුරා, වලගසාල්.

**කිමු**. අ-පරිවිතර්කයෙහි.

**කිමුත**. අ-අතිශයාර්ථයෙහි.

**කිමුතො**. අ-පරිවිතර්කයෙහි.

**කිම්පචාන** පු-තද මසුරා.

**කිම්පුරිස**. පු කිඳුරා, කින්නරයා.

**කිම්මිර**. ති කබු වර්ණය.

**කිමහිවි**. අ-අනියමාර්ථයෙහි, කිසිව්ටක.

**කිර**. d භූ-විසිරීමෙහි, කිරති, විසුරුවයි.

**කිර**. අ-අනුශ්‍රැතියෙහි, ආරංචියෙන් ඇසීමෙහි අරුචියෙහි.

**කිරණ**. පු-රශ්මිය.

**කිරති**. ක්‍රි-d. භූ. කිර-විකිරණෙ, විසුරුවීමෙහි, (කිර + ති) විසුරුවයි.

**කිරාත**. පු-මොනර පිල් ආදිය පිළිකොට හඳනා මෙලච්ඡ ජාතික චණ්ඩාල විශෙෂයක්, වැදි, වනචර, බිම්කොහොඹ.

**කිරාස**. ත්‍රි-අසත්‍ය, වංචාකාර.

**කිරිය**. න-ක්‍රියාව, විංශතිප්‍රකාර ක්‍රියාසිත්.

**කිරියා**. ඉ-ක්‍රියාව, ත්‍රෛයිකාලිකාදි ක්‍රියා.

**කිරියාපද**. න-ක්‍රියා පදය.

**කිරියාවාද**. පු-කුසලාකුසල විශ්වාස කරන්නා.

**කිරීට**. පු න-කිරුළු, වොටුන්න=ඔටුන්න. වෙළුතලද හිස.

**කිල**. d භූ-බැඳීමෙහි, කිලති, බඳියි.

**කිලඤ්ජ**. පු කළාල, පැදුර.

**කිලමති**. ක්‍රි d. භූ. කිලමු-බෙදෙ, බෙදයෙහි (කිලමු + ති) ක්ලාන්තවෙයි, වෙහෙස වෙයි.

**කිලමථ**. පු-ක්ලාන්තය, වෙහෙස.

**කිලමිත** ති-ක්ලාන්තවන ලද, වෙහෙසෙන ලද.

**කිලමන**. න-වෙහෙසීම, ක්ලාන්තවීම.

**කිලමු**. d භූ-වෙහෙසෙහි, බෙදයෙහි, කිලමති, ක්ලාන්තවෙයි. වෙහෙසෙයි.

**කිලමෙති**. ක්‍රි-d. භූ. කිලමු-බෙදෙ, බෙදයෙහි, (කිලමු + ණෙ + ති) වෙහෙසෙයි.

**කිලන්ත**. ති-ක්ලාන්තය, වෙහෙස

**කිලාස**. පු-එනම් කුෂ්ටය.

**කිලාසික**. පු-කුෂ්ටරොගයෙන් පෙලෙන්නා.

**කිලාසු**. ති-වෙහෙසුණු, බෙලහීන.

**කිලි**. අ-අනුකරණ ශබ්දයක්.

**කිලිකිලායන**. න-ප්‍රීතියෙන් කෑගැසීමක්.

**කිලිට්ඨ**. ති-පෙර පසු විරුද්ධය කිළුටු දෙය.

**කිලින්න**. ති-තෙත් දෙය.

**කිලිස්සති**. ක්‍රි-d දි කිලිස-උපතාපෙ, පීඩා කිරීමෙහි + ති, පීඩා කරන්නේය

**කිලිස්සන**. න-කෙලසීම, කිළුටුවීම.

**කිලිස**. d. භූ-පීඩා කිරීමෙහි, කිලිසති, පීඩා කෙරෙයි.

**කිලිස**. d. දි-තැවීමෙහි, කිලිස්සති, තැවෙයි.

**කිලිස**. d. කි-ආබාධයෙහි, කිලිසති, ආබාධ කෙරෙයි.

**කිලිද**. d. භූ-පරිදෙව්යෙහි, කිලිදති, වැළපෙයි.

**කිලිද.** d. දි-තෙත් බැව්හි, **කිලිජ්ජති,** තෙත් වෙයි.

**කිලෙස.** පු-කෙලෙස්, ලොභාදී දොස්.

**කිලෙසකාම.** පු-කෙලශ කාමය, වත්‍ථු කාම බලනු.

**කිලෙස.** d. භූ-නැවත නැවත කැමතිවීමෙහි, **කිලෙසති,** පුන පුනා කැමති වෙයි.

**කිලෙසති.** ක්‍රි-d දි. කිලිස=ඉච්ඡායං කැමැති වීමෙහි + ති (කිලස + ති) නැවත නැවත කැමැති වෙයි.

**කිලෙසාවරණ.** න කෙලෙස්වලින් වැසීම.

**කිලෙසමාර** පු-කෙලෙස් මාරයා.

**කිලොක.** d. භූ-ආර්ද්‍රභාවයෙහි, **කිලොකති.** තෙත් කෙරෙයි.

**කිලොම.** පු-හැඩගැසුණු කෙස්.

**කිලොමක.** පු-දකුණු පෙනහැල්ල.

**කිවි.** d සු-පීඩාවෙහි, **කිවුණොති, කිවුණාති,** පීඩා=හිංසා කෙරෙයි.

**කිස්ස.** අ කුමකට – "කිස්ස තුමෙහ ආය-සමනෙතා"

**කිස්සස්ස.** අ-කවර, කිනම් – "කිස්සස්ස එක ධම්මස්ස වධං ගොතම රොචසි"

**කිස්සව.** ති නුවණින් බැහැර, අනුවණ.

**කිස** ති-කෘශ, කෙට්ටු, සවල්පය.

**කිස.** d. භූ-තුනී කිරීමෙහි, සනගැමෙහි, **කිසති,** තුනී කෙරෙයි, සනගායි.

**කිසක.** පු-කෘශ වූවහු, කෙට්ටු වූවහු – 'කිස කොවදනො.

**කිසලය.** පු-ලාපත්, ලා කොල, දලු.

**කිසොර.** පු-අස් පැටවා.

## කී

**කී.** d. කී-ද්‍රව්‍ය ගණුදෙනු කිරීමෙහි, **කිණාති,** විකුණයි, ගණුදෙනු කරයි.

**කීකස.** පු-ඇසල ගස.

**කීචකා.** ඉ-පවනින් හඬන හුණ ගස උණ ගස්වල ඇතිවන සිදුරුවලට පවන් වැදී-මෙන් මහත් ශබ්ද උපදී.

**කීට.** d. චු-බැඳීමෙහි, කීටෙති, කීටයති, බඳියි

**කීට.** පු-පණුවා.

**කීටක.** න-පණුවා නොකොත් පණුවත්.

**කීත.** ති-විකුට ගත්නා ලද, මිලදී ගත්.

**කීදිස.** ති-කෙබඳු, කොයි ආකාර.

**කීර.** පු ගිරවා.

**කීරිස.** ති-කෙබඳු, කීදිස.

**කීල.** d. භූ බැඳීමෙහි, **කීලති,** බඳියි.

**කීල.** පු-උල, ඇණය.

**කීව.** අ-පරිච්ඡෙදයෙහි, කෙපමණ.

**කීවක.** පු-කෙපමණ.

**කීවතික.** ති-කෙපමණ.

**කීවන්ත.** පු-කෙපමණ.

**කීළ.** d භූ-ක්‍රීඩාවෙහි, **කීළති,** කෙළියි

**කීළති.** ක්‍රි d. භූ කීළාය, ක්‍රීඩාකිරීමෙහි + ති (කීළ + ති) ක්‍රීඩා කෙරෙයි.

**කීළන.** න-කෙළිය, ක්‍රීඩාව.

**කීළනක.** න සෙල්ලම් බඩුව, කෙළි බඩුව.

**කීළා.** ඉ-ක්‍රීඩාව, කෙළිය.

**කීළාපන** න-සෙල්ලම් කරවන.

**කීළා ගොල** න-සෙල්ලම් බෝලය.

**කීළා පසුත.** ති සෙල්ලමෙහි ඇළුනු.

**කීළාමණ්ඩල.** න සෙල්ලම් පිටිය.

**කීළික.** පු-ක්‍රීඩාව, ක්‍රීඩාකළ

**කීළි.** ක්‍රීඩාව, කෙළිය.

## කු

**කු.** අ-පව්, සවලපාථ, නින්දිතාථයන්හි

**කු.** d. භූ-ශබ්දයෙහි, කොති කවති, ශබ්ද කෙරෙයි.

**කුක.** d. භූ-ගැණීමෙහි, කුකති, ගණියි.

**කුකුත්ථක.** පු-සීනි, බිලිබිලි පක්ෂියා, වලි කුකුළා. (9655)

**කුක්කු**. න-රියන, දිග මැණීමක්

**කුක්කුක** න-රියනේ මැණුම් ප්‍රමාණය.

**කුක්කුට**. පු-කුකුළා, කුක්කුට පක්ෂියා.

**කුක්කුට සම්පාතික**. පු-(වහලෙන් වහළට) කුකුළන්ගේ පැනයාම ඇති.

**කුක්කුච්ච**. න-කුකුස-"කළ නොකළ උදෙසා පසුතැවිලිවනු කුකුසා"

**කුක්කුච්චක**. පු-කුකුස් කරන්නා.

**කුක්කුච්චායති**. ක්‍රි-(කුක්කුච්ච + ආය + ති) කුකුස් කෙරෙයි.

**කුක්කුර**. පු-බල්ලා

**කුක්කුරවතික**. ති-බල්ලෙකු මෙන් පවත්නා,

**කුක්කුල**. පු-උණු අලු, එනම් නිරය.

**කුක්කුල වස්ස**. න-උණු අළු වැස්ස.

**කුක්කුස**. න-රතු පැහැති වී කුඩු

**කුක්කුහ**. පු-කබරුස්සා, පක්ෂි විශෙෂයක්.

**කුංකුම**. න-කොකුම්.

**කුච**. d. භූ-හැකිලීමෙහි, කොචති, සංකොචති, ඇකිලෙයි.

**කුච**. d. භූ-බැබලීම් ආදීයෙහි, කොචති, බබලයි.

**කුජ**. d. භූ-අවියත් හඬෙහි, කුඤ්ජති, මඳ ශබ්ද කෙරෙයි.

**කුජ**. පු-අඟහරුවා, වෘක්ෂය

**කුඤ්ච**. d. භූ-කුටිලබැව්හි, ගමනෙහි, අනාදරයෙහි, කුඤ්චති, වක්වයෙයි.

**කුඤ්චනාද**. පු-ඇතුන්ගේ නාදය, කුඤ්ච නාදය.

**කුඤ්චිකා**. ඉ-කෙස්ස, යතුර.

**කුඤ්චිකාවිවර**. න-කෙසිවිඳ, යතුරු කපල්ල

**කුඤ්චිත**. ති-වක්වූ (වකුටු) දේ "කුඤ්චිත කෙසො."

**කුච්ඡ**. d. චු-අවික්ෂෙපනයෙහි හෝ දැමීමෙහි, කුච්ඡති, කුච්ඡයති, අවික්ෂෙපනය කෙරෙයි, දමයි.

**කුංකුමිය**. න-සොෂාව, අරගලය

**කුච්ඡා**. ඉ-නිඤුව, ගැරහීම.

**කුච්ඡි**. පු-බඩ, උදරය.

**කුච්ඡිවාත**. පු-කොටඨසය නම් වාතය.

**කුච්ඡිවාතසත්ත**. පු-මව්කුස වසන සත්වයා.

**කුච්ඡිත**. ති-ලාමක, නින්දිත.

**කුජ්ජි**. d. භූ-අධොමුඛ කරණයෙහි, කුජ්ජති, නිකුජ්ජති, යටිමුව කෙරෙයි අධොමුඛ කරයි.

**කුජ්ඣිත**. ති කිපෙන ලද, ක්‍රෝධ කළ, කිපුනු.

**කුජ්ඣති**. ක්‍රි d. (දි කුධ, කොපෙ, කිපීමෙහි + ති) කිපෙයි.

**කුජ්ඣන**. න කිපීම, ක්‍රොධය.

**කුජි**. d භූ-අව්‍යක්ත ශබ්දයෙහි, කුජි. d බලනු.

**කුජු**. d, භූ සොරකමෙහි, කොජති, සොරාගණී.

**කුඤ්ජ**. පු. න-ලතාදියෙන් වැසුනු ලෙන

**කුඤ්ජර**. පු-ඇතා, ශ්‍රෙෂ්ඨයා.

**කුඤ්ජල**. පු-කාඩිජලය.

**කුට්ට**. d. චු ඡේදනයෙහි. කුට්ටෙති, කුට්ටයති, සිඳියි.

**කුට්ඨ**. න උපුල් කොල. කුෂ්ඨ රොගය.

**කුට්ඨිලිකා**. ඉ-ගෙඩියක සිවිය.

**කුට්ඨින**. පු-කුෂ්ට රෝගියා, ලාදුරු රොගියා

**කුට්ඨි**. ති-කුෂට ඇත්තා.

**කුටි**. d. භූ-කුටිලභාවයෙහි, කුටති, කුටිලවයෙයි.

**කුටි**. d භූ-ඡේදනයෙහි, කුටති, සිඳියි, කපයි.

**කුට**. d. චු-අප්‍රසාදයෙහි, කුටෙති, කුටයති, වංචා කෙරෙයි

**කුට**. පු. න-කලස, කලගෙඩිය

**කුටක**. පු-වංචාකාරයා.

**කුටජ**. පු-කෙලිඳ, "රෝගං කුටති ඡින්දතීති කුටජො."

**කුටධාරිකා**. ඉ දැසිය. කලම්බිය, සටදැසිය.

**කුටති**. ක්‍රි (d චු කුට-අප්පසාදනෙ, අප්‍රසාද යෙහි + ති) අප්‍රසාද කෙරෙයි, වංචා කෙරෙයි.

**කුටනනව**. න - දසපුර, කොටවියාමුරු, සෙවෙල් රැස්හි හටගන්නා වම්මුතු ආකාර වශීයක්, නෙවනීමුසකා නම් ද්‍රව්‍යය, ජල මුස්තා, සුළුකුරු, තොටිල.

**කුටව.** න-කුඩුව, කැඳැල්ල.

**කුටි.** d. මු.-දැවීමෙහි, දහනයෙහි, කුටෙති, කුටයති, දවයි.

**කුටි.** d. භූ.-වියලීමෙහි, කුණ්ටති, වියලයි.

**කුටි.** ඉ-කුටිය, ගෙය.

**කුටිකා.** ඉ-ගෙය "කච්චි තෙ කුටිකා තණ්"

**කුටිම්බික.** පු-පවුල්කාරයා, පවුලක් ඇති.

**කුටුම්බ.** පු. න - පවුල, භාර්‍ය්‍යාව, නෑයා, පරම්පරාව.

**කුඨාරී.** ඉ කෙටේරිය, කුඩා පොරව "පුරිසස්සහිජාතස්ස කුඨාරී ජායතෙ මුඛෙ"

**කුඨි** d. භූ-අලසබැව්හි, නැසීමෙහි, කුණ්ඨති, වකුටුවෙයි, අලසවෙයි, නසයි.

**කුඨි.** d. භූ-වියලීමෙහි, කුණ්ඨති, වියලෙයි.

**කුඩ්ඩ.** න බිත්තිය, කුඩා, ක්‍ෂුද්‍ර.

**කුඩ්ඩනගර.** න-කුඩානගරය, ක්‍ෂුද්‍රනගරය.

**කුඩ්ඩපාද.** පු-බිත්තිමුල, අත්තිවාරම.

**කුඩ.** d. චු-වෙඨනයෙහි, කුණෙඩති, කුණ්ඩයති, වෙළයි.

**කුඩි.** d. භූ-දැවීමෙහි, කුණ්ඩති, දවයි.

**කුඩුබ.** පු-උලුක්කුව, පත.

**කුඩුමල (ලක).** පු-පිපෙන තරම් මුහුකළ කැකුළ.

**කුණ.** පු-ක්‍රියාවෙහි අසමර්ථයා මොට=තිසුණු විරහිත.

**කුණ්ඨති.** ක්‍රි-(කුඨි d බලනු. වකුටුවෙයි.

**කුණ්ඨිත.** ක්‍රි-මොටවනලද, වකුටුවන ලද.

**කුණ්ඩ.** න-සැළිය, ධාන්‍යකුඩු.

**කුණ්ඩ.** පු-ගොයා, ගොඩයා, තලගොයා.

**කුණ්ඩක.** පු-ධාන්‍යකුඩා, කණ.

**කුණ්ඩති.** ක්‍රි-කුඩි d. භූ-බලනු. දවයි.

**කුණ්ඩමත්තිකා.** ඉ-ධාන්‍ය කුඩු පමණ ඇති ද්‍රව්‍යය.

**කුණ්ඩල.** න-කුණ්ඩලාභරණය, කර්ණාභරණය, කොඩොල්.

**කුණ්ඩලී.** පු-සූයර්‍ය්‍යා, කුණ්ඩල ඇති.

**කුණ්ඩිකා.** ඉ-කෙණ්ඩිය, කොතලේ.

**කුණ්ඨිත.** ති-ගානලද, තවරන ලද, අතුල්ලන ලද.

**කුණ.** d භූ - ශබ්දයෙහි, උපකරණයෙහි, කුණති, කුණෙති, ශබ්දකෙරෙයි, උපකරණ කරයි.

**කුණ.** d. චු සංකොචනයෙහි = හැකිළීමෙහි, කුණෙති, කුණයති, හැකිළෙයි=ඇකිළෙයි.

**කුණප** පු න මළකුණ, මෘතශරීරය, මිනිය.

**කුණාල.** පු-එනම් විල, කොවුල් පක්‍ෂියා.

**කුණී.** පු වක්වූ ඇඟිලි පා ඇත්තා.

**කුතක.** ති-කපන ලද්ද, කරණ ලද්ද, මවන ලද්ද.

**කුතතක.** න-සත්‍රීන් සොළසක් සිට නටත්-නට සුදුසු එළු ලොමින් කළ එනම් ඇතිරිය.

**කුතතිම.** ති-බලල් ලුණු.

**කුත්‍ර.** අ-කොතැන්හි, කවර තැනක, කොහේ.

**කුත්‍ර.** අ-කොතැන්හි, කුත්‍ර බලනු.

**කුතුක.** පු-ආශා ඇත්තා.

**කුතුහල(ළ).** පු-කුහුල, පුදුමදෙය දැක්ම.

**කුතො** අ-කවරහෙයකින්, කුමක් හෙයින්.

**කුථ.** d. භූ-පීඩාවෙයි, කුථති, කොථති, පීඩා කෙරෙයි.

**කුථ** d. භූ-පූතිභාවයෙහි, සංකිලෙසයෙහි, කුථති, කොථති, කුණුවෙයි, කෙලෙයි.

**කුපි.** d. භූ-පීඩාවෙහි, කිළුටෙහි, කුපති, හිංසාකෙරෙයි, කිළුටුකෙරෙයි.

**කුපිත.** පු. න-කුණුවනලද, "සාවකුපිතං න හොති තාව පාරාජික වත්ථු."

**කුද.** d. භූ-ක්‍රීඩාවෙහි, කුදති, කොදති, කෙළියි.

**කුද්දල** පු-කොබෝලීල, උදැල්ල, කුද්දල පණ්ඩිතයා.

**කුද්‍රූස.** පු-අමුයයි ප්‍රකට ධාන්‍යය.

**කුදස්සු** අ-කවදා, කවර දවසක, කවර කලෙක.

**කුදර.** නපුරු භාර්‍ය්‍යාව, වසබිරින්ද.

**කුදරිකා.** ඉ-නපුරු දරිකාව, අයහපත් ගෑණු ළමයා.

**කුදු**. අ- කවරකලෙක, කවදු.

**කුදුචන.** (නං) අ-කවරකාලයක, කවදු.

**කුදි.** d. චු-අසත්‍ය වචනයෙහි, කුදෙති, කුදයති, අසත්‍ය කියයි.

**කුදිට්ඨි.** ඉ-නපුරු දිට්ඨිය, මිථ්‍යා දෘෂ්ටිය, මිථ්‍යාමත.

**කුධ**. පු-කිපියනු, කිපිනු, කොපවන ලද.

**කුධ**. d. දි-කොපයෙහි, කුජ්ඣති, •කිපෙයි.

**කුනත**. පු-එනම් ආයුධය, හෙල්ල.

**කුනතනී**. ඉ-කොස්වාලිහිණියා.

**කුනතල** පු-හිසකේ

**කුනප්**. න-පණුවගීයක්.

**කුනපකිපිලලික**. න-එනම් පණු විශෙෂය.

**කුනද**. න-කොංද, වෑකොද.

**කුනනදී**. ඉ-කුඩා ගංගාව, ඔය.

**කුනුස**. d. භු ශබ්දකිරීමෙහි, කුනුසති, ශබ්ද-කෙරෙයි.

**කුපප**. න-තඹ ලොහෝ ආදිය, කිපිම, කොපය.

**කුපපති.** ක්‍රි d. දි. කුප, (කිපීමෙහි + ති.) කිපෙයි.

**කුපපන** න-කිපීම, කොපය.

**කුප**. d. දි කිපීමෙහි, කුපපති, කිපෙයි.

**කුප**. d. චු-කීමෙහි, දීප්තියෙහි, කොපෙති, කොපයති කියයි. දිලිසෙයි.

**කුපථ**. පු-අයහපත් මාර්ගය, නපුරු මාගය, මිථ්‍යා මගීය.

**කුපිත**. ති කිපුනු, කොපවනලද.

**කුබබති**. ක්‍රි (කර + ඔ=උ කරධාතු කකාරසථ අකාරයට, උ, රකාර ලොප් උ=ව. වව=බබ + ති) කෙරෙයි.

**කුබබන**. න කිරීම.

**කුබබනක**. පු-කිරීම, කරන්නා, කුඩා කැලෑව.

**කුබබර**. පු-රථයෙහි කිඹුල් මුව, රිය කඳ, ඊරිය කඳ, බෝත්ලිය.

**කුබබි**. d. භු-උසස් ගමනෙහි, කුම්බති, උසස්ව යෙයි.

**කුබි**. d. භු-ඇසීමෙහි, කුම්බති, වසයි.

**කුමභ**. පු හසති ශීර්ෂ පිණ්ඩය, කුමභසථලය, කළය, දස අමුණ, ගුගුල්.

**කුමභ**. න-කුම්බය, තැව් කුඹ ගස.

**කුමභකාර**. පු-කුඹලා, මැටි බඳුන් සාදන්නා, බඩසැලයා.

**කුමභණ්ඩ**. පු-එනම් දෙවයොනිය, කොමඩු

**කුමභණ්ඩසාමි** පු-විරූළහක නම් වරම් රජ

**කුමභට්ඨාන කථා**. ඉ-උදක සථානය පිළිබඳ කථා.

**කුමභථූන** න-එක් මුහුනින් යුත් තූය්‍ය විශෙෂයක්.

**කුමභදාසි**. ඉ-කළම්බිය, දිය අදිනා දාසිය.

**කුමභදාසි කථා**. ඉ-කුමභදාසීන් පිළිබඳ කථා.

**කුමභභාරමතත**. න-කළගෙඩි බරක් පමණ බර.

**කුමභි**. ඉ-සැළිය, කසට ගස.

**කුමභීල**. පු-කිඹුලා.

**කුමභීලක**. පු-කිඹුලන්ට අයත්, කිඹුලුන් පිළිබඳ.

**කුමභූපමා**. ඉ-කළගෙඩි උපමාව.

**කුමම**. පු-කූර්මයා, කැස්බා, ඉබ්බා.

**කුමමගග**. පු-නොමග, අයුතුමග, නපුරුමග.

**කුමමාස**. පු-කොමු, කොමු පිඩු.

**කුමමිග**. පු-කුඩා මුවා.

**කුමාර**. පු d. චු-ක්‍රීඩාවෙහි, කුමාරෙති, කුමාරයති, ක්‍රීඩා කෙරෙයි, සෙල්ලම් කෙරෙයි.

**කුමාර**. පු-බාලයා, කඳකුමරු, යුවරජ, ලදරු, රාජ පුත්‍රයා.

**කුමාරක**. පු-ලූණුවරණ ගස, කුඩා ළමයා.

**කුමාරකවාද**. න-කුඩා ළමයෙකු මෙන් කථා කිරීම.

**කුමාරි** ඉ-කුමරිය, ලදරිය, රජදුව, කෝමා-රිකා ගස.

**කුමාරිකා**. ඉ-බාලසත්‍රිය, කෝමාරිකා.

**කුමාරිපඤ්හ**. පු-කුමාරිකාවගේ ශරීරයෙහි දෙවතාරොපණය කොට ප්‍රශන විචාරීම.

(9812)

**කුම්ණ**. න කෙමණ, මසුන් ඇල්ලීමට සාදන ඉරටිය.

**කුමුද** න-හෙළ උපුල්, උත්පල සියක් ලක්‍ෂයවූ සඞ්ඛ්‍යාව, කුමුද නම් දිගැත්‍ා. පු-

**කුමුදනාල**. න-හෙළ උපුල් දණ්ඩ.

**කුමුදබන්‍ධු**. පු-චන්‍ද්‍රයා, සඳරැසින් කුමුදු පිපෙයි. කපුරු.

**කුමුදවතී**. ඉ-උපුල් විල.

**කුමුදවණ්ණ**. න-හෙළ උපුල් මල් පැහැය.

**කුමුදිකා**. ඉ-කසට ගස.

**කුමුදිනී**. ඉ-උපුල් විල, පියුම් විල

**කුර**. d. භූ ශබ්දයෙහි, ආක්‍රොශයෙහි, කුරති, ශබ්ද කෙරෙයි, අක්‍රොශ කෙරෙයි.

**කුර**. න-බත්.

**කුරඞ්ග**. පු-එනම් මුවා.

**කුරණ්ඩක**. න කුඩා පැලෑටියක්, එහි පිපෙන මල්, කටුකරඬු

**කුරර**. පු-කබරුස්සා, 'මුහුදු රාජාලියා' කුරලයා.

**කුරවක**. පු-රත් කරඬු.

**කුරුන්‍දවක කථා**. ඉ-කුරුන්‍දි නම් විහාරයෙහිදී කළ අටුවාව.

**කුරු**. පු-කුරු රට.

**කුරුන්‍දි**. එනම් විහාරය.

**කුරුවින්‍දක**. පු-එනම් ගල, එයින්කළ නහන කුඩු.

**කුරුවක**. පු-රත්කරඬු. කුරවක.

**කුරූර**. ති-භයානක, කක්‍ඛශ, නිෂ්කාරුණික.

**කුරුවින්‍දපාසාන**. පු-එනම් ගල.

**කුරුවින්‍දසුත්ත**. න-කුරුවින්ද ගල්කුඩු ලං රස හා මිශ්‍රකොට ගුලිකර ඇටවැලක් මෙන් නූලක අමුණන ලද්දක්, මෙය දෙකොණ ගෙන ඇඟ ඉලීමට ගණිති.

**කුලල**. පු-පසුර, පහුර - "කුලලංහි ජනො පබන්‍ධති."

**කුල්ල**. පු-ධාන්‍යාදිය පොළන කුල්ල

**කුල්ලක**. න-පහුර කුඩාකුඩය, කුඩා-කම්ානතය.

**කුල්ලකවිහාර**. න-පහුරක මෙන් ජීවත්වීම.

**කුල්‍ය**. න-ඇට.

**කුල**. d. භූ ගිණීමෙහි, බැඳීමෙහි, කුලති, ගණන් කරයි, බඳියි.

**කුල**. න-ගොත්‍රය, වංශය, සමූහය, උතුම් කුලය.

**කුලක**. න-කවුඩුකැකිරි, දුම්මැල්ල, එක ක්‍රියා කාරක පද සම්බන්‍ධය ඇතිපද්‍යපසක්.

**කුලඞ්ගාර**. න කුලයේ ගිනිඅඟුරු=යමෙකු කුලය නසන්නනට කරණ විනාශය.

**කුලජ**. පු-කුලීන, ආඪ්‍ය කුල ඇත්තා.

**කුලටා**. ඉ-ධූර්තස්ත්‍රී, වෙසඟන.

**කුලත්‍ථ**. පු-කොල්ලු.

**කුලදූසි**. ඉ-උසස්කුලයන්හි සේවය කරණ කාන්තාව.

**කුලදූසක**. පු කුල දූෂ්‍ය කරන්නා, ශ්‍රද්ධාවත් කුලයන් කිළුටු කරන්නා.

**කුලධීතා**. ඉ-උසස් කුලයන්හිවූ කාන්තාව.

**කුලපති**. පු-කුලහිමියා, කුලදෙටුවා.

**කුලපාලිකා**. ඉ - කුලපල්නී, කුලස්ත්‍රී, තම කුලය රකින්නී, සත්‍රිය.

**කුලගෙහ**. න-කුලගෙය=පියාගේ ගෙදර.

**කුලපුත්ත**. පු-කුලපුත්‍රයා, කුලදරුවා.

**කුලමූල**. පු-කුලගෙය, කුලයාගේමූල

**කුලතන්‍ති**. න - කුලයට ආවේණික සිරිත් විරිත් ආදිය.

**කුලල** පු-ගිජුලිහිණියා, කුඹලා, වලිකුකුලා, වළත් සාදන්නා.

**කුලාලචක්ක**. න-කුඹල්සක.

**කුලාවල**. පු-කුලපජීතය.

**කුලාචාර**. පු කුලසිරිත.

**කුලාලභණ්ඩ** න-කුඹලුන්ගේ බඩු

**කුලාව** න-අපතේයැම, "න කුලාවං ගමෙ-න්ති" 'කුරුළුවගීයක්'

**කුලාවක**. න-කැදැල්ල, පක්‍ෂිකූඩුව, නිවාස-ස්ථානය.

**කුලික**. ති-කුලශ්‍රෙෂ්ඨ, කුලදෙටු.

**කුලිකා**. ඉ-මැඩහගු.

**කුලිඞ්ග**. පු-ගේකුරුල්ලා, නීලකොබෙයියා. අලුකොබෙයියා.

**කුලිඤ්ජි**. ඉ-කුලසත්‍රිය, කුලකාන්තාව.

**කුලිශ**. පු න-ශක්‍රයාගේ වජ්‍රායුධය.

**කුලිශාසන**. පු-බුදුරජ, සම්බුද්ධයන්වහන්සේ.

**කුලී**. ඉ-කටුවැල්බටු.

**කුලීන**. පු-ආර්‍ය්‍යකුලඇත්තා, උතුම්කුලවතා.

**කුලීනක**. පු-ජාතිමත් තැනැත්තා.

**කුලීර**. පු කකුළුවා, රන්වන් කකුළුවා.

**කුලීරක**. පු කුලීරයා, කකුළුවා

**කුලීරපාද**. පු-කකුළුවන්ට බඳු සටහන් ඇති මඤ්ඤව විශෙෂයක්, කකුළු පා වැනි පා ඇති ඇද

**කුලුඞ්ක**. පු-කරුව, රුකුල, කුඩා පක්ෂිවර්‍ගයක්.

**කුලුඞ්කපාදක**. පු-කරුව, රුකුල, දෙබල.

**කුලුම්බ**. න-ගැබ, ගභීය

**කුව**. න-උපුල්, පියුම්, ජලජපුෂ්ප.

**කුවණන**. ශබ්දකරණ, කොපමණ.

**කුවල**. න-ඩෙබර.

**කුවලය**. න උපුල්.

**කුවාද**. පු-කැතවාදය, අපවාදය.

**කුවින්ද**. පු-රෙදිවියන්නා.

**කුවිවාහ**. පු-මිශ්‍රජාතීන් විවාහය.

**කුවිලාර**. න-දෙව්ලොව ඇති කොවිලාර වෘක්ෂය.

**කුවෙණි**. ඉ-කෙමෙණ, නින්දිතකෙශකලාප ඇත්නී.

**කුවෙර**. පු-වෙසමුණුරජ, වෛශ්‍රවණ නම් වරම්රජ.

**කුවෙරකාකී**. ඉ-කුඹුරවැල, පලොල්ගස.

**කුවෙනී**. ඉ-කොස්ලිහිණියා.

**කුස්සුබ්භ**. පු-කුඩාවිල, කුසොබ්භ.

**කුසොබ්භ**. පු-කුඩාවිල, කුස්සුබ්භ.

**කුස**. d. භූ-ආක්‍රොශයෙහි, කුසති, කොසති, අකොසති, ආක්‍රොශකෙරෙයි.

**කුස**. d භූ-ආමන්ත්‍රණයෙහි, හැඬීමෙහි, කොසති, පකොසති, හඬයි, ආමන්ත්‍රණය කරයි.

**කුස** d. දි-හැරීමෙහි, බැබලීමෙහි, වැලඳගැන්මෙහි, කුස්සති, බැහැරකරයි, බබලයි, වැලඳගණියි.

**කුස**. d. තු සිඳීමෙහි, පිරීමෙහි, කුසති,

**කුස** පු-කුශතෘණ, කුසපත්.

**කුසග්ග**. න-තණ අග.

**කුසචීර**. න තණවලින් තනාගත් ඇඳුම. කුසතණින්කළ සිවුර.

**කුසමුට්ඨි**. න-තණමිටක්.

**කුසති**. ඉ-සටබව, කපටිබව.

**කුසල**. න-ආරොග්‍යය, මඞ්ගල්‍යය.

**කුසල**. ති-දක්ෂ, අනවද්‍ය.

**කුසලවිතක්ක**. න-නෙක්ඛම්ම, අව්‍යාපාද, අවිහිංසා යන ත්‍රිවිධ කුසල විතර්ක.

**කුසල**. පු මධුර විපාකයෙහි.

**කුසලාභිසන්ද**. න-කුසල් සිත් වැඩීම.

**කුසලී**. ඉ-නිදුක්බව.

**කුසලසීල**. න-ජීවිතයේ හොඳ පැවැත්ම.

**කුසා**. ඉ-තාස්ලනුව.

**කුසි**. d. භූ. කීමෙහි, කුංසති, කියයි.

**කුසි**. d චු-කීමෙහි, දීප්තියෙහි, කුංසෙති, කුංසයති, කියයි, බබලයි.

**කුසි**. න-භික්ෂූන්ගේ සිවුරුවල දිගමැසීමක්, දිගනුවාව.

**කුසිනාරා**. ඉ-එනම් නුවර.

**කුසි**. න-භික්ෂූන්ගේ සිවුරුවල දිගමැසීම් සතරින් එකක්.

**කුසීත** ති-කම්මැලි, හීනවීර්‍ය්‍යය.

**කුසුම්භ**. න - රතුපාට ඇතිකරගැණීමට පාවිච්චිකරණ මල්වර්‍ගයක්.

**කුසුම**. න-මල්, ඔසප්, මල්වරවීම.

**කුසුමිත** ති-මල් ඇති, පොහොට්ටු සහිත.

**කුසුමෙසු**. පු-අනඞ්ගයා, කාමයා

**කුසුමපුර**. න-පාටලී පුත්‍රනගරය, පැළලුප් නගරය.

**කුසුමඵල**. න-සාදික්කා.

**කුසූල**. පු-කොටුව, කොටුගුල.

**කුසෙසය**. න-පද්මය.

**කුහ**. d. චු-විසමය පත්කිරීමෙහි, කුහෙති, කුහයති, විසමය පත්කෙරෙයි, පුදුම කෙරෙයි.

**කුහ**. පු-පුදුමඵලවත්නා.

**කුහක**. පු-කුහකයා, නැතිගුණ පෙන්වන්නා.

**කුහනා**. ඉ-වංචාක්‍රියා.

**කුහර**. න-(කු+හර)හරනැති, සිදුර, පර්වත-සිදුර, විවරය.

**කුහං**. අ-කුහිං, කුහිංචනං, කොතැන්හි, කොහේ.

**කුහිලිකා**. ඉ-කුබලී මල්.

**කුහිත්වා**. පූ. ක්‍රි. -රවටා, වංචාකොට.

**කුළ**. d. භූ-අනුභවයෙහි, කුළති, අනුභවකරයි.

**කුළ**. d. භූ-කෛවල්‍යයෙහි, කොළති, තනිවෙයි.

## කූ

**කූජ**. d. භූ-ශබ්දයෙහි, කූජති, ශබ්ද කෙරෙයි.

**කූජති**. ක්‍රි-(කූජ+ති) ශබ්ද කෙරෙයි.

**කූජන**. න-ශබ්ද කිරීම, අව්‍යක්තහඬ.

**කූට**. d. චු-අප්‍රසාදයෙහි, කූටෙති, කූටයති, අප්‍රසාද කරයි.

**කූට**. පු. න-රාශි, නිශ්චල, ඉන්ද්‍රජාල, වංචාව, අසත්‍ය, යකුළ, පර්වත ශිඛර, නගුලිස, යන්ත්‍රය, පාපය, මුදුන.

**කූටඞ්ග**. න-උරය, උරහිස, පිටිකර.

**කූටචරියා**. ඉ-වංචාක්‍රියා.

**කූටජටිල**. පු-හොර තවුසා.

**කූටට්ඨ**. ති-එකස්වරූප සර්වකාලව්‍යාපී ආත්මය.

**කූටතුලා**. ඉ-හොර තරාදිය.

**කූටමාන**. න-හොර තරාදි ආදියෙන් මැනීම

**කූටසිම්බලී**. ඉ කොළ ඉඹුල්ගස, ඵලරහිත ඉඹුල් විශේෂයක්.

**කූටසක්ඛි**. ඉ-බොරු සාක්ෂි, බොරු සාක්ෂි කියන.

**කූටාගාර**. පු-කූටවලින්යුක්තගෙය, මුදුන්වලින් යුක්තගෙය, මහල්ගෙය.

**කූටවාණිජ**. පු-කළුකඩ කාරයා, හොරට වෙළඳාම් කරන්නා.

**කූටෙය්‍ය**. න-වංචාව, රැවටීම.

**කූටවෙදී**. පු-බොරු කියන්නා.

**කූප**. පු. ලිඳ. වළ. කුඹස

**කූපකච්ඡප**. පු. ලිංකැසුබුවා, කූපමණ්ඩූක මෙනි.

**කූපක**. පු-කුඹගස.

**කූපකා**. ඉ-ස්ත්‍රීනිමිත්ත.

**කූපඛණ**. පු-ලිඳක් කනින්නා.

**කූපමණ්ඩූක**. පු-ලිංමැඩියාට ලිදේ මහතට අහසපෙණේ. වැඩියක් නොපෙණේ. ලිදෙහි මැඩියෙකු මෙන් මඳ දෙයක් දන්නාහට තිබූ පිණිස මෙය න්‍යායයක් වශයෙන් කියනු ලැබේ.

**කූර**. න-බත්, තැම්බූ සහල්.

**කූල**. න-ඉවුර, තීරය.

**කූලදෙස**. පු-තීරදෙශය. තීරය සමීපයෙහිවූ දෙශය.

**කූලභූමි**. ඉ-ඉවුරු බිම.

## කෙ

**කෙ**. d. භූ-ශබ්දයෙහි, කායති, ශබ්ද කෙරෙයි.

**කෙක**. න-ගස්වර්ගයක්.

**කෙකර**. පු-වපරයා, වපර ඇස.

**කෙකා**. ඉ-මයූර නාදය, මොනර ශබ්දය.

**කෙකී**. ඉ-මොනරා.

**කෙකිසිඛා**. ඉ-මොනර කුඩුම්බිය.

**කෙචන**. අ-කිසිවෙක් යනාර්ථයෙහි.

**කෙචි**. අ-කිසිවෙක් යනාර්ථයෙහි.

**කෙටුභ.** න-කවීන්ට හිතවූ කාව්‍යකල්පය= සුබොධාලඞ්කාරාදි අලඞ්කාර ග්‍රන්ථ විශේෂය.

**කෙටුභී.** පු-වංචාකාරයා, ශික්ෂිත වංචාකාරයා.

**කෙත.** d. චු-ආමන්ත්‍රණයෙහි, කෙතෙති, කෙතයති, ආමන්ත්‍රණය කරයි.

**කෙතක.** පු-වැටකේගස. ධ්වජය, ගෘහය.

**කෙතකී.** ඉ-වැටකේගස.

**කෙතන.** න-ධ්වජය, ගෘහය.

**කෙතර.** පු-වපරයා.

**කෙතව.** න-ශඨබව. දූකෙළිය.

**කෙතු.** පු-ලකුණ, ධ්වජය, මිලවදීම, එනම් ග්‍රහයා. ප්‍රඥාව, දීප්තිය.

**කෙතුකම්‍යතා.** න-කීර්තියට කැමැතිවීම.

**කෙදර.** න-කෙත. ආලවාලය.

**කෙතුමාලා.** ඉ-රැස්මාලාව.

**කෙනචි.** අ-කිසියම්, යම්කිසි.

**කෙනිපාත.** පු-නැව් ආදිය පදවන රිට, හබල.

**කෙබුක.** න-ජලය, වතුර, "කෙබුක වුච්චති උදකං."

**කෙය්‍ය.** පු-විකිණියයුතු දෑ.

**කෙයූර.** න-අඟුපළඳනාව වැලම්ටෙන් උඩ බාහුවෙහි, හස්තමූලයෙහි ලත වලල්ල.

**කෙයූරී.** පු-අතෙහි වලල්ලක් පළඳන්නා.

**කෙරල.** න-එනම් දෙශය.

**කෙරාටික.** පු-කෛරාටික, කපටි.

**කෙරාටිය.** පු-කෙරාටික, කෛරාටික, කපටි

**කෙල.** d භූ-සැලීමෙහි, ගමනෙහි, කෙලති, ශබ්දකරයි.

**කෙලාස.** පු-කෛලාස පර්වතය. පලිඟුව.

**කෙලි.** ඉ-ක්‍රීඩාව. පරිහාසය.

**කෙලිසර.** න ක්‍රීඩාකරණ ගෙය, කෙලිමඩුව

**කෙලිමුඛ** පු-පරිහාසය, කවට කම.

**කෙළු** d. භූ-ගමනෙහි, කෙලති, යයි

**කෙලෙ.** d භූ. මමත්වයෙහි, මාගේ යයි ගැණීමෙහි, කෙලායති, මමත්වය කරයි, මගේ යයි ගණියි.

**කෙවතතිමුණ්ඩක.** පු-දස.

**කෙවට්ට.** පු-කෙවුලා, මසුන් මරන්නා.

**කෙවල** ති-භූයොවෘත්ති, අව්‍යාමිශ්‍ර, විවෙක, දෘඪාර්ථ, අනතිකාර්ථ, සංකල්ප, අනවසෙස යනමෙහි, නිර්වාණ.

**කෙවලකප්ප.** පු-සකල, සියලු, "කෙවලකප්පං ජෙතවනං ඔභාසෙත්වා"

**කෙවලී.** ති-රහත්වීමට සුදුසු, "යෙ සුවිමුත්තාතෙ කෙවලිනො යෙ කෙවලිනො වට්ටං තෙසං නත්ථි පඤ්ඤාපනාය"

**කෙවු.** d. භූ-සෙවනයෙහි, කෙවති, සෙවනය කෙරෙයි.

**කෙස.** පු කෙශය, කෙස්.

**කෙසකලාප.** පු-කෙස් වල්ල කෙශරාශිය.

**කෙසකම්බල.** පු-කෙස්වලින් සාදන කම්බිලි රෙදි.

**කෙසකල්‍යාණ.** න-පඤ්ච කල්‍යාණයන්ගෙන් එකක් වූ කෙස කල්‍යාණය.

**කෙසකීට.** පු කෙස් පණුවා, උකුණා.

**කෙසධාතු.** ඉ-බුදුන්වහන්සේ ගේ කෙස්වලට කෙසධාතුව යයි කියති.

**කෙසපාස** පු-කෙශකලාපය, කෙශ සමූහය.

**කෙසපසාධනී.** ඉ-කෙස්පීරණ පනාව.

**කෙසපුබ්බවය** පු-කෙශ කලාපය.

**කෙසමද්දන** න. කෙස්මැදීම, පනාව.

**කෙසමස්සු** න කෙස් රැවුල්, "කෙසමස්සුං ඔහාරාපෙත්වා පබ්බජ්ජාපෙසි"

**කෙසර** පු දෙඹ, මුහුණමල් මූණමල්=සිංහයාගේ බෙල්ලෙහිවූ ලෝමරැස, මල් කෙසුරු.

**කෙසරී** පු සිංහයා, කෙසර ඇත්තා.

**කෙසව.** පු-විෂ්ණු

**කෙසහත්ථ.** පු-කෙශකලාපය.

**කෙසික.** ති කෙස් සහිත.

**කෙළනා** ඉ ක්‍රීඩාව.

**කෙළායන.** න-ක්‍රීඩාකරණ.

**කෙළායති.** ක්‍රි d භූ (කීළ-කීළායං සෙල්ලම් කිරීමෙහි+ය+ති,) සෙල්ලම්කරයි.

**කෙළාසික** ති-බාලදරුවා.

**කෙළාසිත** ති-ක්‍රීඩා කරණලද.

**කෙළාස.** පු කෛලාස පර්වතය.

**කෙළා.** ඉ-ක්‍රීඩාව, සෙල්ලම.

(9968)

# කො

**කො**. අ. පු-කවර.

**කොක**. පු-කොක්නාවා, වෘකයා. වෘක්ෂජාති-යක්.

**කොකනද**. න-රත්පියුම්.

**කොකාසක**. පු-රත්පියුම්, පිපෙන්ට කිට්ටුවූ මහ කැකුළ.

**කොකාසික** පු-රත්පියුම් වැනි පාරිච්ඡත්‍රක මල්.

**කොකිල**. පු-කොවුල් පක්ෂියා, පරපුටු

**කොකිලනයන**. න-ඉකිරිගස.

**කොච** ති-හැකිලීම, ඇකිලීම.

**කොචි**. අ-කවරෙක්.

**කොච්ඡ**. න-භද්‍රපීඨය, කොස්ස, බුරුසුව, පනාව.

**කොච්ඡකාර**. පු-පනා-බුරුසු සාදන්නා.

**කොජව**. පු-කොඳු පලස.

**කොඤ්ච**. න-යකඩ සන්නාහය.

**කොඤ්ච**, පු-කොස්වා ලිහිණියා

**කොඤ්චනාද**. පු-ඇතුන්ගේ නාදය, ඇත්හඬ,

**කොට්ට** d. භූ-සිඳීමෙහි, කොට්ටති, සිඳියි, කඩයි.

**කොට්ට** d චු-සිඳීමෙහි, කෙටීමෙහි, කොට්ටෙති කොට්ටයති, සිඳියි, කොටයි.

**කොට්ටන**. න-කෙටීම, සිඳීම.

**කොට්ටිත**. ති-කොටනලද, සිඳිනලද.

**කොට්ටිම**. න-කොටනලද ගල්වලින් තැනූ ගෙබිම,

**කොට්ටෙති**. ක්‍රි භූ චු-(කොට්ට-ඡෙදනෙ, සිඳී-මෙහි + ති,) කොටයි.

**කොට්ඨ**. පු ඇතුළුගෙය, ඇතුළුකුස, ධාන්‍යාදි කොටුඹුල්.

**කොට්ඨක** පු-කොටුව, කොෂ්ඨාගාරය.

**කොට්ඨගත**. පු-කුක්ෂිගත ගින්න.

**කොට්ඨාගාර**. න-කොටුගෙය, ධාන්‍යතැන් පත් කළ ගබඩාව,

**කොට්ඨාස**. පු-කොටස, භාගය, එනම් වාතය.

**කොට**. න-කඳුමුදුනට අයත්,

**කොටච්චිකා**. ඉ-බැණුම් විශෙෂයක් "කොට ච්චිකාති ඉත්ථිනිමිත්තං."

**කොටර**. පු-රුක්සිදුර

**කොටි**. ඉ-කෙළවර, සියක් ලක්ෂය, උත්කෘෂ්ටය.

**කොටික**. ති සසර දෙකෙළවරට උපමා කළ හැකි.

**කොටිප්පකොටි**. ඉ කොටි ප්‍රකොටිය, ප්‍රකොටි සියක් ලක්ෂය.

**කොටිමක**. පු-කොරා

**කොටිල්ල**. න-කුටිල බව.

**කොටිසිම්බලී** ඉ-කොළ හිඹුල.

**කොටුම්බර** න-මෑගලෝම කොට (තලා) සියුම් කොට කරණලද වස්ත්‍රය, කොටුම්බර දෙශ යෙහිවූ වස්ත්‍රයක්.

**කොණ්ඩ**. න-ජය ගැණීම, හරවා ගැණීම, ආත්ම දමනය.

**කොණ්ඩදන්ද** පු-එනම් ඇත්තා.

**කොණ**. පු කෙළවර, අව්කොණ, කඩිප්පු ආදිය, මුල්ල, පිණබෝව.

**කොණපාන**. පු-කුණපය.

**කොතුහල**. න-කුහුල්සිත පුදුම දෙය දකිනු කැමැත්ත.

**කොත්ථලී**. ඉ මල්ල, ගෝනිය.

**කොත්ථු**. පු-කැණහිලා, සිවලා.

**කොදණ්ඩ**. න-දුන්න

**කොධ**. පු-ක්‍රොධය.

**කොධන**. ති-ක්‍රොධශීලීහු.

**කොනන**. න-කුඩ, කොඩිය

**කොනකණ්**. පු-එනම් පක්ෂියා.

**කොන්තිම**. පු-සම්වඩුවා, සම්වලින් වැඩ කරන්නා.

**කොප**. පු-කිපීම.

**කොපනෙය්‍ය**. තී-තරහ ඇතිකිරීමට දක්ෂ,

**කොපජ**. තී-ක්‍රොධයෙන් උපන්.

**කොපී.** ති-කිපෙන සුලු තැනැත්තා, ක්‍රොධ ශීලීහු.

**කොපින.** න-අකාතීව්‍ය, ගුය්හසථානය, වැහැරි.

**කොපෙති.** ක්‍රි d. දි. (කුප-කොපෙ, කිපීමෙහි=ණෙ+ති) කිපෙයි.

**කොමල.** ති-මොලොක්, මෘදු.

**කොමලනාරිකෙල.** න. කුරුම්බා.

**කොමාර.** පු-කුමරුන්ට අයිති, කුමරුන් පිළිබඳ.

**කොමාරබ්‍රහ්මචරිය.** න-කුමර බඹසර,

**කොමාරභච්ච.** පු-කුමාරයන්ට අයත් පොෂ්‍යය.

**කොමාරපති.** පු-ලඳරු ගැහැණු ළමයෙකුගේ ස්වාමිපුරුෂයා.

**කොමාරි.** ඉ-තරුණදැරිකාව, කුමරිය.

**කොමුදී.** ඉ-සඳරැස. කුමුදු ඇති, විල.

**කොමුදුනි.** ඉ-සඳරැස් සහිත කුමුදු පිපීම ඇති.

**කොරක.** පු-මඳක් මුකළ කැකුල.

**කොරකිත.** ති-දළු බොහෝ ඇති, මොට්ටු බොහෝ ඇති.

**කොරජික.** ති-මුලාවට පත්, වංචල වියහැකි,

**කොරඤ්ජික.** පු-හැකිලෙත

**කොරනී.** ඉ-ගින්එන්සාල්.

**කොරණ්ඩ.** න-පැලෑටි වර්‍ගයක් හා එහි මල්

**කොරණ්ඩක.** න එනම් විහාරය,

**කොරබ්‍ය.** පු-කුරු රටට අයිති, කුරුරට පිළිබඳ

**කොල.** පු-ඩෙබර=මසන්, තිප්පිලි, වගපුල්.

**කොලඞකොල.** පු-කුලයෙන් කුලයටයන්නා, ආත්මභාව 2. 3. 4. 5. 6. ක් ඇත්තා

**කොලක.** න-තකුල්, මිරිස්.

**කොලඤ්ඤ.** ති-උසස් කුලයක උපන්.

**කොලට්ඨිපක්ඛි.** පු-එනම්පක්ෂියා, කබරුස්සා.

**කොලට්ඨි.** න-ඩෙබර-මසන් පලවල මදය.

**කොලපුත්ති.** පු-කුලපුත්‍රභාවය.

**කොලම්බ.** පු-සැළිය, කොළඹ නගරය.

**කොලවල්ලී.** ඉ-ඇත්වගපුල්.

**කොලාප.** පු-දිඹුල්=උදුම්බර "කසමානු රුක්ඛෙ කොලාපෙ සුවස්ස රමතෙ මනො"

**කොලාහල.** පු-බොහෝ දෙනා එක්ව කරණ අරගලනාදය, කලකල ශබ්දය, කාය කොලාහල වාචා කොලාහල දෙක.

**කොලිය.** පු-එනම් රාජවංශය.

**කොලිත.** පු-එනම් ඇත්තා, මුගලන් මහ තෙරිඳු.

**කොලීනියා.** ඉ-උසස් පවුල, ශ්‍රෙෂ්ඨ උත් පත්තිය.

**කොලී.** පු-ඩෙබර, මසන්.

**කොලෙය්‍ය.** පු-බල්ලා.

**කොලෙය්‍යක.** පු-උසස් වර්‍ගයට අයත් බල්ලා

**කොවිද.** පු-පණ්ඩිතයා, ප්‍රාඥයා.

**කොවිදාර.** පු-කොවිලාර, කොබෝලීල.

**කොවිලාර.** පු-කොවිදාර, කොබෝලීල.

**කොස.** පු-පුරුෂනිමිත්ත, භාණ්ඩාගාරය, කළ නොකළ රන්රිදී, මල්කැකුල, කඩු කොපුව, සමූහය, කරඬුව, අකාරාදී කොෂ ග්‍රන්‍ථ, දුනුපන්සියයක දුරප්‍රමාණය.

**කොසක.** පු-කොෂාගත, කෝසයට ඇතුලත්.

**කොසජ.** පු-කොසයෙන් ජාතවූ, තෙජස.

**කොසජ්ජ.** න-කුසීතභාවය, කම්මැලිකම

**කොසමත්ත.** ති-හඬසනක් පමණවූ.

**කොසපණ්ණි.** ඉ-සැබෝ ගස.

**කොසඵල.** න-තකුල්.

**කොසම්බ.** පු-කොසඹ.

**කොසම්බි.** ඉ-කොසඹෑනුවර

**කොසල්ල.** න-දක්ෂභාවය, කොසොල් රටට අයිති අයොධ්‍යය

**කොසල.** පු-කොසොල්රට, අයොධ්‍යපුරය.

**කොසාතකී.** ඉ-වැටකොළු, සැබෝගස.

**කොසාරක්ඛක.** පු-රාජභාණ්ඩාගාරිකයා

**කොසික.** පු-ගුගුල්, කොසයට ඇතුලත්, බස්සා.

(10074)

**කොසිකී**. ඉ-නදීවිශෙෂයක්.

**කොසිය** පු-ශක්‍රයා, බකමූණා, කඩුකොපුව.

**කොසි**. ඉ-කොපුව, පියන, වැස්ම.

**කොසෙය්‍ය**. න-පටපණුවන්ගේ නූලින් කළ වස්ත්‍ර, රත්මුසු තිහිරි නූලින් කළ වස්ත්‍රය.

**කොසොහිත** පු (කොස + අවහිත)වස්ත්‍රයෙහි සැඟවුනු, වස්ත්‍රයෙන් වැසෙනලද.

**කොසොහිතවත්ථගුය්හ** පු-කොෂයෙහි අව හිත වස්ත්‍ර ගුය්හ ලක්ෂණය, ගවාදීන්ගේ මෙන් කොපුවෙහි සැඟවී තිබෙන පුරුෂ නිමිත්ත.

**කොහඤ්ඤ**. න-කුහකබව, කුහක බලනු.

# බ

**බ** න-අහස, සැපය, ඉන්ද්‍රිය, ශුන්‍යය, සිදුර

**බං**. අ-පණ්ඩක, ලිංගයන මෙහි.

**බග**. පු-පක්ෂි, ශරීර.

**බගග**. පු-කඩුව, කගවෙණා.

**බගගවිසාණ**. පු-කගවෙණා.

**බගගාදිමුට්ඨි**. ඉ-කඩු ආදීන්ගේ මිට.

**බගන්තර**. න-පක්ෂිහෙද, කැරලා.

**බගාදි**. පු-පක්ෂි ආදීහු.

**බගාදිබන්ධන**. න-පක්ෂි ආදීන් බඳනා මල.

**බගොල**. පු-ආකාශගොලය, පොළොව මතු පිට මණ්ඩලාකාරව පෙණෙන අහස,

**බචිත**. ති-සාරණ ලද, බඳනා ලද, යෙදුනු, පැතුරුණු.

**බජ්ජ**. d. භූ-භක්ෂණයෙහි, බජ්ජති, අනුභව කරයි.

**බජ්ජ** d. භූ-පිරිසිදු කිරීමෙහි, බජ්ජති, පිරිසිදු කරයි.

**බජ්ජ**. න-කඩා කෑ යුතු ආහාර, කැවිලි.

**බජ්ජක**. න-කෑ යුතු දෑ, කැවිලි.

**බජ්ජති**. ක්‍රි-d. භූ. බජ්ජ-භක්ඛනෙ, කෑමෙහි + ති) කයි.

**බජ්ජනනාද**. න-බාද්‍ය විශෙෂ, අඟලා.

**බජ්ජසද්ද**. පු-බාද්‍ය විශෙෂය.

**බජි** d. භූ-ගමන් විකලත්වයෙහි, බඤ්ජති, කොරගසයි.

**බජි**. d. භූ-දීමෙහි, යාමෙහි, බඤ්ජති, දෙයි. යෙයි.

**බජි** d. චු-රැකීමෙහි, දුඃඛ ජීවිකාවෙහි, බඤ්ජෙති, බඤ්ජයති, රකියි, දුකින් ජීවත් වෙයි.

**බඤ්ජ**. පු-කොරා, කොරගසන්නා

**බඤ්ජති**. ක්‍රි d. භූ. (ගති වෙකල්ලෙ=ගති විකලයෙහි + ති) (බඤ්ජ + ති) බඤ්ජති, කොරගසයි. දෙයි. යෙයි.

**බඤ්ජන**. න-පක්ෂි විශෙෂයක්, කොර ගැසීම.

**බඤ්ජරීට**. පු-පක්ෂි විශෙෂයක්.

**බජ්ජර**. න-දලඹුවා.

**බජ්ජු**. ඉ-කණ්ඩුතිය.

**බජ්ජොපනක**. පු (බ + ජොපනක) අහස බබුලුවන්නා, කණාමැරියා=කලාමැදිරියා.

**බජ**. d. භූ-ඇලලීමෙහි, බජති, අලලයි, කලඹයි.

**බට්ට**. d. චු-වැසීමෙහි, බටෙති, බට්ටයති, වසයි.

**බට්ට**. පු-ඇඳ.

**බට්ට** d. භූ-ශබ්දයෙහි, රැස්කිරීමෙහි, බට්ටති, ශබ්ද කෙරෙයි, රැස් කෙරෙයි.

**බට**. d. භූ-කැමැත්තෙහි, බටති, කැමති වෙයි.

**බටක**. පු-මිට, මිට මොලවීම.

**බටබට**. න-උගුර පෑදීමේ ශබ්දය.

**බටොපිකා**. ඉ ඇඳ පත්ත, කට්ච්චිය.

**බඩ**. d. චු-බිඳීමෙහි, බණ්ඩෙති, බණ්ඩයති, බිඳියි.

**ඛඩි.** d. භූ-බිඳීමෙහි, ඛණ්ඩති, බිඳියි.

**ඛණ්ඩ.** පු-ඉක්ෂු විකාරය, සකුරු, සූකිරි.

**ඛණ්ඩ** පු. න-කොටස, කැඩීම, අඩිය, චන්ද්‍රාඩිය.

**ඛණ්ඩති.** ක්‍රි-d. භූ. ඛණ්ඩ අවදාරණෙ, බිඳීමෙහි + ති) (ඛඩි + ති) බිඳියි.

**ඛණ්ඩපරසු.** පු-ඊශ්වරයා.

**ඛණ්ඩ ඵුල්ල.** ති-කැඩිච්ච-බිඳිච්ච.

**ඛණ්ඩලවණ.** ති-බලල් ලුණු.

**ඛණ්ඩන.** න-හෙදය, කැඩීම.

**ඛණ්ඩාඛණ්ඩ.** න-කැබලි කැබලි.

**ඛණ්ඩික.** පු-කලතණ.

**ඛණ්ඩිච්ච.** න-කැඩුනු බව, කැඩිච්ච බව

**ඛණ.** පු-ක්ෂණය, දස අක්ෂුරුසණක පමණ කාලය, අව්‍යාපාරසථිතිය.

**ඛණ.** න-හැරීම.

**ඛණති.** ක්‍රි d. භූ. ඛනු අවදාරණෙ, පැලීමෙහි + ති, බිඳියි, පලයි.

**ඛණදා.** ඉ-රාත්‍රිය.

**ඛණන.** න-බිඳීම, පැලීම,

**ඛණපරිත්ත.** න-සුළු මොහොත.

**ඛණ මුහුත්ත.** පු-දස මොහොතක් ප්‍රමාණ කාලය. මුහුත්ත බලනු.

**ඛණාතීත.** ති-අවසථාව ඉක්මවූ.

**ඛණලය.** පු-ක්ෂණලය, ලය දසයක් පමණ වූ කාලය, ලය බලනු.

**ඛණසම.** පු-බුදු රජ.

**ඛණික.** න-ක්ෂණික, ක්ෂණයක් පවත්නා.

**ඛණිත.** න-සාරණ ලද, සෑරූ.

**ඛණිත්ති.** ඉ-බිම කණින හුල, සාරණ උල.

**ඛණු.** d. භූ-අවදාරණයෙහි, සෑරීමෙහි, ඛණති, ඛඤ්ඤති, සාරයි, ඛණනය කරයි.

**ඛණති.** ක්‍රි-(ඛණු + ති) සාරයි.

**ඛණන.** න-සෑරීම, හෑරීම.

**ඛත.** ති-සාරණලද, උදුරණලද, හිංසාකළ තුවාලකළ,

**ඛතක.** න-අලාභ හානි, කැඩුනු බිඳුනු.

**ඛත්ත.** න-නීතිය, බලය, අයිතිවාසිකම්,

**ඛත්තධම්ම.** න-දේශපාලන විද්‍යාව,

**ඛත්තවිජ්ජා.** ඉ-රාජ්‍ය සංසථාව, ආණ්ඩු ක්‍රමය,

**ඛත්තවිදූ.** පු-උපායෙහි දක්ෂ තැනැත්තා,

**ඛත්තර.** පු-අතවැසියා, රියදුරා, රාජ පුරොහිතයා.

**ඛත්ත.** පු-ක්ෂත්‍රිය වංශිකයා, විචාල ප්‍රශ්න විසඳීමෙහි සමර්ථ මහ ඇමතියා.

**ඛත්තිය.** පු-ක්ෂත්‍රියයා, ඛත්තිය වංස ඇත්තා, රාජවංශිකයා.

**ඛත්තියකඤ්ඤා.** ඉ-ක්ෂත්‍රිය කන්‍යාව.

**ඛත්තියකුල.** න-ක්ෂත්‍රිය කුලය.

**ඛත්තියජ.** පු-ක්ෂත්‍රියයාට ජාතක, ක්ෂත්‍රියයා ගෙන් උපන්.

**ඛත්තිය පරිසා.** ඉ-ක්ෂත්‍රිය පිරිස, ක්ෂත්‍රිය සමාගම.

**ඛත්තිය මහාසාල.** පු-ක්ෂත්‍රිය මහාසාරයා, පශ්චිමාන්තයෙන් සියක් කෙළක් ධන නිධානගත වේ ද කහවණු විසි අමුණක් දිනපතා වියදම් වේ ද එබඳු රාජකුල ඇත්තා.

**ඛත්තිය මායා.** ඉ-ක්ෂත්‍රිය මායම, ක්ෂත්‍රිය විජ්ජාව.

**ඛත්තිය වංස.** න-ක්ෂත්‍රිය වංශය.

**ඛත්තිය සුඛුමාල.** පු-සිවුමැලි කුමරා.

**ඛත්තියා.** ඉ-රාජසත්‍රිය, රජ බිසව.

**ඛත්තියානී.** ඉ-රාජසත්‍රිය, රාජ දෙවිය.

**ඛත්තියී.** ඉ-ක්ෂත්‍රිය කාන්තාව.

**ඛත්තු.** පු-රියදුරා. දොරටුපාලයා.

**ඛතජ.** න-ලේ.

**ඛද්ද.** d. භූ-ඩැසීමෙහි, ඛද්දති, දෂ්ටකෙරෙයි.

**ඛද.** d. භූ-බැගෑපත්වීමෙහි, පීඩාවෙහි, ඛදති, බැගෑපත් වෙයි, පීඩා වෙයි.

**ඛදි.** d. භූ-පැනීමෙහි, යාමෙහි, ඛන්දති, පක්ඛන්දති, පනී, යෙයි, පැණයෙයි.

(10170)

**ඛදිර.** පු-කිහිරි ගස.

**ඛන්ති.** ඉ-ක්ෂමාව, ක්ෂාන්තිය, ඉවසීම.

**ඛන්තිමන්තු.** ති-ඉවසන්නා.

**ඛඤ්ජ.** d. භූ-යාමෙහි, වියලීමෙහි, ඛඤ්ජති, යෙයි, වියලයි.

**ඛන්ධ.** පු-රූපාදිස්කන්ධ, උරහිස, කඳ, සමූහය, ගුණ, කඳ කුමරු, ශරීරයාගේ හස්ත පාද යන් අතර මැද කොටස.

**ඛන්ධක.** න-කොට්ඨාසය, පරිච්ඡේදය, සගීය.

**ඛන්ධ කොට්ඨාස.** පු-රූපාදි ස්කන්ධ කොටස්.

**ඛන්ධ දෙස.** පු-ස්කන්ධ ප්‍රදේශය, ඇත් කඳ, තාරීත්ගේ කඳ.

**ඛන්ධිම.** න-ගසක ලොකු කඳ.

**ඛන්ධ පඤ්චක.** පු-පඤ්චස්කන්ධය. පස්කඳ.

**ඛන්ධ බීජ.** න-ඇසටු නුග උක් ආදිය. කඳෙන් පැල නගින රුක් වැල්.

**ඛන්ධභාර.** පු-රූපාදි පඤ්චස්කන්ධය, ශරීරයාගේ කඳින් ගෙණ යන බර.

**ඛන්ධභාරාදි.** පු ස්කන්ධභාර, කටිභාර, සීස භාරාදිය.

**ඛන්ධාවාර.** පු-කඳවුර, ටික කලකට යුද්ධ හමුදුවක් නවතින ස්ථානය, තාවකාලික යොධ ස්ථානය, රාජධානිය.

**ඛන.** d. භූ-කැණීමෙහි, ඛනති, සාරයි, කණියි.

**ඛනු.** d. භූ-කැණීමෙහි, ඛණති, සාරයි, කණියි.

**ඛපුර.** පු-පුවක්ගස.

**ඛබ්බ.** d. භූ-දපියෙහි, ඛබ්බති, අහඞ්කාර වෙයි.

**ඛබ්බ.** d. භූ-යාමෙහි, ඛබ්බති, යෙයි.

**ඛභි.** d. භූ-මැඩීමෙහි, ඛම්භති, ඔබා මඩියි

**ඛම.** ති-යොග්‍ය, හිත, යුක්ත.

**ඛමන.** න-ක්ෂමාව, ක්ෂමා කිරීම.

**ඛමන.** ති-ක්ෂමා කරන්නා, ඉවසන්නා.

**ඛමති.** ක්‍රි d. භූ. ඛමු-ඛන්තියං, ඉවසීමෙහි + ති (ඛමු + ති) ඉවසයි, ක්ෂමා කරයි.

**ඛමා.** ඉ-ක්ෂමාව, පෘථිවිය.

**ඛමාපන.** ඉ-ක්ෂමාව, ක්ෂමා කිරීම.

**ඛමිතබ්බ.** ති-ක්ෂමා කටයුතු, ඉවසියයුතු.

**ඛම්භ.** d. භූ-තදවීමෙහි, මැඩීමෙහි, ඛම්භති, වික්ඛම්භති, තදවෙයි, මැඩ පවත්වයි.

**ඛම්භන.** න-විෂ්කම්භනය, මැඩීම.

**ඛම්භිත.** ති-පසුකළ, ඔතන ලද, විෂ්කම්භනය කළ.

**ඛය.** පු-ක්ෂය, ටිකින් ටික ක්ෂය වී යාම

**ඛර.** d. භූ-තෙමීමෙහි, ගෙවීයාමෙහි, ඛරති, තෙමෙයි, ගෙවී යෙයි.

**ඛර.** ති-දුඃඛ ස්පර්ශ ඇති දෙය, තියුණු දෙය.

**ඛර.** පු-කොටළුවා, කියත.

**ඛරමඤ්ජරී.** ඉ-සැබෝ ගස.

**ඛරස්සර.** පු-රළු ශබ්දය, කර්කශ ශබ්දය.

**ඛරා.** ඉ-දෙවදූලිය.

**ඛරාජින** න-රළු අඳුන් දිවිසම.

**ඛරිකා.** ඉ-කාඩි, විනාකිරි.

**ඛල.** d. භූ-රැස්කිරීමෙහි, ඛලති, රැස්කෙරෙයි.

**ඛල.** පු කල්ක, අධම, කමත, කළුවිට.

**ඛල.** d. භූ සැලීමෙහි, ඛලති, සෙලවෙයි.

**ඛල.** d. චු-පවිත්‍රභාවයෙහි, ඛාලෙති, පවිත්‍ර-කෙරෙයි

**ඛලති.** ක්‍රි d භූ - ඛල-ඛලනෙ, සෙලවීමෙහි + ති, සෙලවෙයි.

**ඛලමණ්ඩල** න කමත, වී පාගන තැන.

**ඛලග්ග** න-පෑගීමට සුදුසු ධාන්‍ය

**ඛලභණ්ඩග්ග.** න-ධාන්‍ය පෑගීමට සුදුසු උපකරණ.

**ඛලභණ්ඩග්ගකාල.** න ධාන්‍ය පෑගීමට සුදුසු උපකරණ ලබාගැණීමේ කාලය.

**ඛලි.** න-පාප්ප, තලප.

**ඛලික.** න-දූදුකැටය, දූදුලැල්ල.

**ඛලිකා.** ඉ-දූදුලැල්ල.

**ඛලිත.** ති-පැකිළීම, පැකිළෙනලද.

**ඛලීන.** පු න-මුවවලල්ල=කටකලියාව, පැසුනු හිසකේ.

**ඛලෙති.** ක්‍රි d. භූ(ඛල-ඛලනෙ, සෙලවීමෙහි × ණෙ + ති). සෙලවෙයි.

(10224)

**බලු**. ආ-ප්‍රතිෂෙධ වාක්‍යාලඞ්කාර අවධාරණ, ප්‍රසිඞ්ධ යනාදියෙහි.

**බලොපි**. ඉ-සැළිය=හැළිය.

**බලලක**. න-(අඞ්ග වැසූ) සපත්තු වර්ගයක්

**බලලාම**. පු-කෙස්නැති හිස ඇත්තා, තට්ටයා, මුඩුහිසා.

**බලුඩක**. පු-අස්කුණ්ඩයා, අශ්වපොතකයා

**බලුපච්ඡාභත්තික**. පු-පෙරවරු කාලයෙන් පසුව ආහාර පිළිනොගන්නා තැනැත්තා.

**බලුපච්ඡාභත්තිකාඞ්ග**. න පෙරවරු කාලයෙන් පසුව ආහාර නොපිළිගැණීමෙන් රකින ධූතාඞ්ගය.

**බස**. d. භූ-හිංසාවෙහි, බසති, හිංසාකෙරෙයි.

**බළ**. d චු-විඳීමෙහි, බළෙති, බළයති, බිඳියි, භග්නකෙරෙයි.

**බළෙති**. ක්‍රි-(බළ + ණෙ + ති) බිඳියි.

## බා

**බා**. d. භූ-කීමෙහි, බාති, අක්ඛායති, කියයි.

**බා**. d භූ දූනගැන්මෙහි, සංඛ්‍යායි, සඞ්ඛාය, පටිසංඛාය. **"සඞ්ඛාය ලොකස්මිං පරොවරානි."**

**බාණු**. ඉ-කණුව.

**බාණුක**. පු-කණුව.

**බාණුකණ්ටකාධාන**. න-කණුකටු වලින් ගැවසී ගත්තැන.

**බාත**. න-සාරණලද, පොකුණ.

**බාද**. d. භූ-කෑමෙහි, බාදති, කයි.

**බාදක**. පු අනුභවකරන්නා, කන්නා.

**බාදති**. ක්‍රි d. භූ. (බාද-භක්ඛනෙ, කෑමෙහි + ති) කයි.

**බාදන**. න. අනුභවය, කෑම.

**බාදනීය** න-කැවිලි, කෑයුතුදෑ.

**බාදාපන**. න-අනුභවකරවීම, කැවීම.

**බාදාපෙති**. ක්‍රි-d. භූ (බාද-භක්ඛනෙ කෑමෙහි. බාද + ණාපෙ + ති) කවයි, අනුභවකරවයි.

**බාදිත**. ති-කනලද, අනුභවකළ

**බාදිතට්ඨාන** න-කෑ තැන, කන තැන.

**බායති**. ක්‍රි-d.භූ. (බා=ඝාදණෙ=වැටගීමෙහි + ති වැටහෙයි, **"සුසානං විය බායති, අලක්ඛි විය බායති"**

**බායිත** ති-කනලද, අනුභවකළ.

**බාරක**. න ක්ෂාරමය.

**බාර**. පු අලුත්කැකුල, රස, ඉඳුසල්රුක.

**බාර**. න-ක්ෂාරය, ලවණ, කටුක, අම්හිරි.

**බාරාපත** කියන, කියන්පත

**බාරාපතච්ඡික** න - තියුණු ආයුධයෙන් ශරීරය කෙඳි (තීරු) කොට කාඩි ගල්වා වධ දීමක්.

**බාරික**. අළුත් දලුව.

**බාරි**. ඉ-මාණික්‍ය සතරක බර, තවුස් පිරිකර.

## බි

**බිජ**. d. භූ-අව්‍යක්ත හඬෙහි, බිජති, පහත් ශබ්ද කරයි.

**බිට**. d භූ.-තැති ගැන්මෙහි, බිය වීමෙහි, බෙටති, බිය වෙයි, තැතිගණියි.

**බිඩ්ඩාදසක**. න (ළමයෙක්) සෙල්ලම් කරණ කාලය.

**බිඩ්ඩාරති**. ඉ-සෙල්ලමෙහි ඇලීම.

**බිඩ්ඩාපදොසක**. ති-සෙල්ලමින් දූෂ්‍යවූ.

**බිඩ්ඩා**. ඉ-ක්‍රීඩාව, සෙල්ලම.

**බිණ්ණ**. ති-ශ්‍රාන්ත, වෙහෙසටපත්.

**බිණු**. d. න-පෙළීමෙහි, බිණෙති, පෙළයි.

**බිණු**. d. භූ-ක්ෂයෙහි, බිණති, ක්ෂය කෙරෙයි.

**බිත්ත**. ඉ-දමනලද, පිඩාකළ, විසිකරණ ලද.

**බිද**. d. දි-බැගෑපත් බැව්හි, ගෙව්මෙහි, බිජ්ජති, බැගෑපත් වෙයි, ගෙව්යෙයි.

**බිදි**. d භූ - රු - දි - දීනභාවයෙහි, බිඥති, බිජ්ජති, බැගෑපත් වෙයි, තසයි.

**බිඤ්ඤං**. අ-වහා, හනික, ශීඝ්‍රව.

(10271)

**ඛිප්පවිරාගී.** පු-වහා කෙලෙසුන්ගෙන් වෙන් වන්නා.

**ඛිප්පාභිඤ්ඤ.** ති වහාපැමිණෙනලද අභිඥ ඇත්තා

**ඛිප.** d. භූ.-අව්‍යක්ත ශබ්දයෙහි ඛිපති, අව්‍යක්ත ශබ්ද කෙරෙයි.

**ඛිප.** d භූ-දැමීමෙහි, ඛිපති, උක්ඛිපති, දමයි.

**ඛිප.** d. භූ.-සුණු කිරීමෙහි, ඛෙපෙති, සුණු කෙරෙයි.

**ඛිප.** d. දි සුණු කිරීමෙහි, ඛිප්පති, සුණුකරයි.

**ඛිප.** d. සු-දැමීමෙහි, ඛිපුණති, දමයි.

**ඛිප.** න-කෙමණ "නදීමුඛෙ ඛිපං ඔඩ්ඩෙය්‍ය"

**ඛිප.** d. තු-යැවීමෙහි.

**ඛිප.** d. චු-සුණුකිරීමෙහි, ඛෙපෙති, සුණු-කෙරෙයි.

**ඛිප.** d. කි-දැමීමෙහි, දමයි.

**ඛිපති.** ක්‍රි d. භූ. ඛිප-ඛෙපනෙ-දැමීමෙහි+ති) (ඛිප+ති) දමයි, උස්සාදමයි.

**ඛිපන.** න-දැමීම, විසිකිරීම.

**ඛිපිත** ති-කිඹිසිතලද.

**ඛිපිතක.** පු-කිඹිසීම, කිඹුහුන්යාම.

**ඛිල.** d. භූ-තදබැවිහි, ඛිලති, තද කෙරෙයි.

**ඛිලති.** ක්‍රි-d. භූ. (ඛිල-ඛිලනෙ-තද බවෙහි, +ති) (ඛිලති) තද කෙරෙයි.

**ඛිවු.** d. භූ-මත්වීමෙහි, ඛිවති, සුරාවෙන් මත් වෙයි.

**ඛිවු.** d දි-පරිත්‍යාගයෙහි, ඛිබ්බති, පරිත්‍යාග කරයි.

**ඛී.** d. කි-ගමනෙහි, ඛීණති, යෙයි.

**ඛී.** d. භූ-ක්ෂයවීමෙහි, ඛියති, ක්ෂයවෙයි.

**ඛී.** d. දි-ගෙවීමෙහි ඛීයති, ගෙවෙයි.

**ඛී.** d. සු-ක්ෂයවීමෙහි, ඛිණොති, ක්ෂයවෙයි.

**ඛීණ.** ති-ක්ෂය, පිළිවෙළින් ගෙවීයාම.

**ඛීණාසව.** පු-ක්ෂීණාශ්‍රව, රහත්.

**ඛීයති.** ක්‍රි-(ඛී+ය+ති) ක්ෂයවෙයි.

**ඛීර.** න-ක්ෂීර, කිරි, ජලය.

**ඛීරණ්ණව.** පු-ක්ෂීරාණ්වය, කිරිමුහුද.

**ඛීරිකා.** ඉ-කිරිපලුගස.

**ඛීරොදක.** න-කිරි හා ජලය.

**ඛීල** පු ඵල, හුල, කණුව.

**ඛීලක.** පු ඵල, ඛීලය.

**ඛීලන.** න-ක්‍රීඩකාරන, සෙල්ලම.

**ඛීලති.** ක්‍රි-d.භූ. (ඛීල ඛීලනෙ, සෙල්ලම් කිරීමෙහි+ති) සෙල්ලම් කරයි

## ඛු

**ඛු** d. භූ-ශබ්දයෙහි, ඛොති, ඛවති, ශබ්ද කෙරෙයි.

**ඛුජ්.** d, භූ-සොරකම් කිරීමෙහි, ඛොජති, සොරකම් කරයි.

**ඛුජ්ජ.** පු-කුදු, කුඩා.

**ඛුඩ** d. චු-භෙදනයෙහි, ඛුණෙඩති, ඛුණ්ඩයති බිඳියි.

**ඛුඩි.** d. භූ-කුදුගැසීමෙහි, ඛුණ්ඩති, කුදුවෙයි.

**ඛුඩි** d. චු-බිඳීමෙහි, ඛුණෙඩති, ඛුණ්ඩයති, බිඳියි.

**ඛුණ.** d. ත-හිංසාවෙහි, ඛුණොති, හිංසා-කරයි.

**ඛුණු.** d. ත-පෙළීමෙහි, ඛුණොති, පෙළයි.

**ඛුණොති.** ක්‍රි-d. ත-ඛුණ-හිංසනෙ, හිංසා කිරීමෙහි+ති (ඛුණ+ඔ+ති) පෙළයි.

**ඛුද්ද.** න-මධු, මීමැස්සා.

**ඛුද්ද.** ති-අල්ප, දීන, නීච, බහුල, කදය්‍යී-යන මෙහි.

**ඛුද්දක.** ති-කුඩා, නොමහත්.

**ඛුද්දක නදී.** ඉ-කුඩා නදිය.

**ඛුද්දකපාඨ.** න-ඛුද්දක නිකායේ පළමුවන පොත.

**ඛුද්දසණ්ඩිකා.** ඉ-කුඩාමිණිගෙඩිය, රහුගෙඩිය.

**ඛුද්දජ.** ති-කුඩා මැස්සන් විසින් කරන ලද්ද.

**ඛුද්දජන්තු.** පු-කුඩාසත්තු, මැසි මදුරු ආදිහු.

**ඛුද්දපාදප.** පු-කුඩාගස්, පැළැටි.

**ඛුද්දමධු.** න-කුඩාමී, කණමී.

**ඛුද්දසඞ්ඛ.** පු-සක්බෙල්ලා.

(10325)

**බුඳු.** ඉ-දඹුවැල්බැමැසි, කටුවැල්බටු.

**බුඳ්‍ඨානුබුඳ්‍ඨක.** න-(බුඳු + අනුබුඳ්‍ඨක) ක්‍ෂුද්‍රානුක්‍ෂුද්‍ර, කුඩා ඉතාකුඩා.

**බුද.** d. භූ-ක්‍රීඩාවෙහි, බුදති, ක්‍රීඩා කරයි.

**බුද** d භූ-ක්‍ෂුධාවෙහි, කනුකැමැත්තෙහි, බුදති, කනුකැමතිවෙයි.

**බුද.** ඉ-ක්‍ෂුධා, බඩගින්න, කනුකැමැත්ත.

**බුදිත.** ති-ක්‍ෂුධා ඇත්තා, බඩසා ඇත්තා.

**බුපපිපාසා.** ඉ-සාපිපාසා, බඩසය හා පිපාසය.

**බුබ්භති.** ක්‍රි.-d. භූ බුභ-සංචලනෙ, සැලීමෙහි + ති) (බුභ + ති) චලනයවෙයි, ඇලලෙයි,

**බුභ.** d. භූ-ඇලළීමෙහි, බොහෙති, චලනය කරයි.

**බුභ.** d දි-ඇලළීමෙහි. බුබ්භති, ඇලලයි.

**බුර.** පු ගවමහිසාදීන් කුර, ඔවුන්ගේ නිය පොතු, දැළිපිහිය, කඩකැත්ත, "**තුරගානං බුරණිපාතා.**"

**බුර** d භූ කැපීමෙහි, ඉරිඇඳීමෙහි, බුරති, කපයි, ඉරි ගසයි.

**බුරක.** පු-මදටගස, මදටියගස.

**බුරගෙහ.** න-කරගෙය.

**බුරභණ්ඩ.** න-ක්‍ෂුරභාණ්ඩ, කඩකැත්ත හා ඒට උවමනා ගල් ආදි බඩු.

**බුරචක්ක.** න-පිහියා මුවාත තබන ගල.

**බුරසිපාටික.** න-කරකැති කොපුව, දැළිපිහියා කොපුව.

**බුරසිපාටිකා.** ඉ-දැලිපිහියා මල බැඳීමෙන් තොර කරණ කුඩු වගීයක්.

**බුරප්ප.** පු-ඊය, ඊතලය

**බුරසිලා.** ඉ-කරගල, දැළිපිහියා මුවහත් තබන ගල.

**බුරී.** පු-ක්‍ෂුර දරන්නා, කරණැවැමියා,

**බුල්ලක.** පු. න-නීචයා, අධමයා.

**බුස** d. භූ. ආක්‍රොශයෙහි, නපුරුකොට කීමෙහි බුංසති, නපුරු කොට කියයි.

**බුඝ** d. චු-ආක්‍රොශයෙහි, බුංසෙති බුංසයති. අක්‍රොශ කරයි.

**බුංස** d චු-අක්‍රොශයෙහි, බුංසෙති බුංසයති, නිඥ කරයි, ආක්‍රොශකරයි.

**බුංසන.** න-ගැටීම, ගැරහීම, බැණීම.

**බුංසිත.** ති-අක්‍රොශකළ, ගරහන ලද, ගටන ලද, d. චු. බුඞි-බුංසනෙ, ආක්‍රොශ කිරීමෙහි.

**බුංසෙති.** ක්‍රි- + ණෙ + ති) (බුංස + ණෙ + ති) ආක්‍රොශ කෙරෙයි.

**බුල.** -d. භූ-සිසෑමෙහි, බුලති, සිසායි.

## ඛෙ

**ඛෙ.** d. භූ-අනුභවයෙහි, ක්‍ෂයවීමෙහි, සයනයෙහි, ඛායති' කයි, සයනය කරයි. ක්‍ෂය වෙයි.

**ඛෙට.** d. චු-භක්‍ෂණයෙහි, ඛෙටෙති, ඛෙටයති, කයි.

**ඛෙටක.** න-පලිහය, පලස.

**ඛෙත්ත.** න-කෙත, භාය්‍යීාව, ශරීරය.

**ඛෙත්ත කම්මන්ත.** න-කුඹුරේ වැඩ කිරීම, කුඹුරු වැඩ.

**ඛෙත්තගත.** ති-කුඹුරක් බවට පෙරලුනු.

**ඛෙත්තගොපක.** පු-කුඹුර රකින්නා.

**ඛෙත්තජ.** පු - තමාගේම ඉඩමේ උපන්න, පුතුන් සතර දෙනාගෙන් කෙනෙක්.

**ඛෙත්තජින.** පු-කුඹුරක් භුක්ති විඳීමේ ශ්‍රෙෂ්ඨකම.

**ඛෙත්තපාල.** පු - කුඹුර පාලනය කරන්නා.

**ඛෙත්තාමහන්තතා.** ඉ-කෙතේ උසස්කම.

**ඛෙත්තරක්ඛක.** පු-කෙත රකින්නා

**ඛෙත්තවත්ථු.** න-කෙත්වතු.

**ඛෙත්තසම්පත්ති.** ඉ-ක්‍ෂෙත්‍ර සම්පත්තිය.

**ඛෙත්තසාමික.** පු-කුඹුරු හිමියා, කෙත්හිමියා.

**ඛෙත්තසොධන.** න - සිසෑමට පෙර කුඹුර ශුද්ධ කිරීම.

**ඛෙත්තාජීව.** පු-ගොවියා.

**ඛෙත්තූපම.** න-කෙත් උපමාව.

**ඛෙද.** පු-විසාදය, සංවේගය, පරිශ්‍රමය, ශ්‍රමය, අසහනය.

**බෙප.** පු-දැමීම, නිඥුව.

**බෙප.** d. චු - සුණුකිරීමෙහි, බෙපෙති, සුණු කෙරෙයි.

**බෙපක.** පු-දමන්නා, විසිකරන්නා.

**බෙපන.** න-දැමීම, විසිකිරීම.

**බෙපිත.** ති-දමන ලද, විසිකළ, ක්‍ෂයකළ.

**බෙපෙති.** ක්‍රි-(බෙප + ණෙ + ති) ගෙවයි, විසි කරයි.

**බෙම.** පු-නිභීය, නිවණ, කල්‍යාණ

**බෙමභූමි.** ඉ-ක්‍ෂෙමභූමිය, සාරපොළව.

**බෙම.** ති-ලබ්ධවස්තු රැස් කිරීම.

**බෙමක.** පු-නිදහස්ව සිටින තැනැත්තා.

**බෙමත්ත.** න-ආරක්‍ෂාව.

**බෙමී.** පු-නිභීය තැනැත්තා, ක්‍ෂෙමියා.

**බෙල.** d. භූ-සැලීමෙහි, ගමනෙහි, බෙලති, සැලෙයි, යෙයි.

**බෙල.** පු-කෙළ, මුඛගත කෙළ.

**බෙලකිලින්න.** ති - කෙළගැලීමෙන් තෙත් වුණු.

**බෙලමල්ල.** න පඩික්කම.

**බෙලු** d. භූ-චලනයෙහි, ගතියෙහි, බෙලති, සැලෙයි, ගමන් කෙරෙයි.

**බෙමු.** d. භූ-සෙවනයෙහි, බෙවති, සෙවනය කරයි.

**බෙළ** d චූ-භක්‍ෂණයෙහි, බෙළෙති, බෙළයති, කයි.

**බෙළෙති.** ක්‍රි-(බෙළ + ණෙ + තී) අනුභව කරයි.

**බෙලාසික.** පු-කෙලතොලු, වැගිරෙන කෙළ ඇත්තා.

**බෙලාසිකවාද.** පු-කෙලතොලු වාදය, කෙල තොල්ලෙති යයි කීම.

**බෙළසිංඝාටක.** න-පිත් හා සෙම.

## බො

**බො.** අ- පදපූරණයෙහි.

**බොට** d චු දැමීමෙහි, බොටෙති, බොටයති, දමයි.

**බොටෙති** ක්‍රි (d. චු. බොට බෙපනෙ, දැමීමෙහි + ණෙ + ති) (බොට + ණෙ + ති) දමයි.

**බොණ්ඩ.** පු කොරා, කොරගසන්නා.

**බොණ්ඩ.** d. චු - භක්‍ෂණයෙහි, බොණ්ඩෙති, බොණ්ඩයති, අනුභව කරයි.

**බොණ්ඩෙති.** ක්‍රි -(බොණ්ඩ + ණෙ + ති) අනුභව කරයි.

**බොද.** d. භූ නැසීමෙහි, බොදති, නසයි.

**බොභ.** පු-ක්‍ෂොභය, කම්පාව, ඇලලීයාම.

**බොම** න-කොමුපිලි, කොමු නූලින් කළ වසත්‍ර.

**බොල.** d. භූ-ගමන් වැළකීමෙහි, බොලති, ගමන්වලකී.

## ඛ්‍යා

**ඛ්‍යා.** d. භූ-කීමෙහි, ඛ්‍යායති, කියයි, ආඛ්‍යායති, ආඛ්‍යාතං.

**ඛ්‍යාත.** ති-ප්‍රසිඞ, පතළ, කියන ලද.

**ඛ්‍යාපන.** න-ව්‍යාපතිය, පැතිරීම.

**ඛ්‍යායති** ක්‍රි. d. භූ. ඛ්‍යා-පකථනෙ, කීමෙහි + ති) කියයි.

## ග

**ගඟගර.** න-උගුර, දිය සුළිය.

**ගඟගරා.** ඉ-එනම් පොකුණ.

**ගඟරායති.** ක්‍රි ගඟගර යන අනුකරණ ශබ්ද කෙරෙයි.

**ගඟරී.** ඉ - මෝරු අළලන (කලතන) භාජනය. කඹුරු සම, කඹුරු උදුනේ තලය.

**ගගස.** d. භූ-සිනාවෙහි, ගගසති, සිනාවෙයි.

**ගගසති.** ක්‍රි-d. භූ ගගස-හසනෙ, සිනාසීමෙහි + ති) (ගගස + ති) සිනාවෙයි.

**ගඞ්ගා.** ඉ-එනම් මහා නදිය, අහස්ගඟ.

**ගඞ්ගාධර.** පු-ඊශ්වරයා, ඊශ්වර ජටාවෙන් ආකාශ ගඞ්ගාව ගලා බසී යනු මතයෙකි.

**ගඞ්ගෙය්‍ය.** න-දස ඇත්කුලයෙන් එනම් ඇත් කුලය.

**ගගන.** න-අහස, ආකාසය.

**ගගනතල** න-අහස, අහස්තලය.

**ගච්ඡ** පු-කුඹාගස්, පැලෑටි, යව, ගමනය කරව යනාදි අර්ථ ඇති මධ්‍යම පුරුෂ ඒක වචන ක්‍රියාවක්.

**ගච්ඡති.** ක්‍රි-d. භූ ගමු=ගතියං, යාමෙහි, (ගමු=ච්ඡ + ති) යෙයි, ගමන් කෙරෙයි.

**ගච්ඡනත.** පු-යන්නා, යන තැනැත්තා.

**ගජ:** d. චු - මැඩීමෙහි, ශබ්දයෙහි, ගජෙති, ගජයති, මඩියි, ශබ්දකරයි.

**ගජ.** පු-ඇතා, අලියා.

**ගජ.** d භූ-ශබ්දයෙහි, ගජති, ශබ්දකෙරෙයි.

**ගජකණ්ඨාරණ.** න-ඇත්සැට්ටය.

**ගජතා.** ඉ-ඇත්සමූහය.

**ගජති.** ක්‍රි-d. භූ. ගජ-සද්දෙ, ශබ්දකිරීමෙහි + ති) (ගජ + ති) ශබ්දකරයි.

**ගජබල.** පු-සිංහයා, හස්තිබලය.

**ගජාසන.** න-ඇතුන්ගේ ආහාරය, ඇසටුගස.

**ගජ්ජ.** d. භූ-ශබ්දකිරීමෙහි, ගජ්ජති, ශබ්ද කෙරෙයි, ගජිනා කෙරෙයි, ගොරවයි.

**ගජ්ජති.** ක්‍රි-(d. භූ. ගජ්ජ - සද්දෙ, ශබ්දකිරී මෙහි + ති) (ගජ්ජ + ති) ගොරවයි, ගජිනා කරයි.

**ගජ්ජිත.** ති-ගජිනා කළ, ගුගුළ.

**ගජ්ජන.** න-ගජිනාව, ගෙරවීම.

**ගජ්ජිත.** න-මෙඝනාදය, ගොරවනලද.

**ගජ්ජිත.** පු-මතැතා, මතනහස්තියා.

**ගඩ.** d. භූ සෙචනයෙහි, ගඩති, වැගිරෙයි, ඉසියි.

**ගඩි.** d. භූ - රැස්කිරීමෙහි, ගණ්ඩති, රැස් කෙරෙයි.

**ගඩි.** d. භූ-මුහුණේ එක් පැත්තක්.

**ගණ්ඩි.** පු-පුරුක, ගැටය.

**ගණ්ඨි.** ඉ-පයමල.

**ගණ්ඨිකා.** ඉ-ගැටය.

**ගණ්ඨිත.** ති-ගොතන ලද, ගෙතූ.

**ගණ්ඨිපාස.** පු පයමල, භික්ෂූන්ගේ සිවුරුවල, ගණ්ඨිය අමුණන පාසය = පුඩුව.

**ගණ්ඨිල.** පු-කිලිල.

**ගණ්ඩ.** පු-ගඩ = පොල, කපෝලය, ගිජු-ලිහිණියා.

**ගණ්ඩක.** පු-කහවේණා, මනුෂ්‍ය විශෙෂයක්.

**ගණ්ඩම්බ.** න - එනම් අඹගස, මේ අඹගස යටදී බුදුන්වහන්සේ යමක ප්‍රාතිහාර්‍ය්‍ය පෑසේක. ගණ්ඩම්බ රුක්කමූලෙ යමක පටි හාරියං කරිත්‍වා.

**ගණ්ඩාලි.** ඉ-සුදුගිතණ.

**ගණ්ඩිකා.** ඉ-ගැටය.

**ගණ්ඩි.** පු-ගඩු ඇත්තා.

**ගණ්ඩුප්පාද.** පු-ගැඩවිලා, ගැඩවිල් පණුවා.

**ගණ්ඩුල.** පු-කුද.

**ගණ්ඩුස.** න-(බත්) කටක්.

**ගණ්හණ** න-ගැණිම, ග්‍රහණය.

**ගණ්හති, ගණ්හාති.** ක්‍රි-(d ග්‍ර ගහ-උපාදනෙ + ති) ගණී, ග්‍රහණය කරයි.

**ගණ.** d. චු-සංකලනයෙහි, ගණෙති, ගණයති ගණන් කරයි.

**ගණ.** d. භූ-යාමෙහි, ගණති, යෙයි.

**ගණ.** පු-භික්ෂු විශෙෂයක්, තුන්නමක්, සමූහය

**ගණක.** පු-ගණින්නා, ගණන් කරන්නා, තැකැත්තා.

**ගණන.** න-ගැණීම, සඞ්ඛ්‍යාව.

**ගණාචරිය.** පු ගණාචාර්‍ය්‍ය, සමූහයාගේ ආචාර්‍ය්‍යයා.

**ගණී.** පු-ගොණා, ගණයා ඇති.

**ගණික.** පු ගොණා

**ගණිකා.** ඉ-වෙසඟන, සිතිද්ද.

**ගණිකාරිකා.** ඉ-මිදි, මුද්දික.

**ගණිත.** ති-පරිමිත, ගණනලද.

**ගණී.** ඉ-සමූහ ඇත්තා.

**ගණේති.** ක්‍රි-(ගණ + ණෙ + ති) ගණන් කෙරෙයි.

**ගත්ත.** න-ගාත්‍රය, ශරීරය.

**ගත.** ඉ-ගමන, ගිය.

**ගතක.** පු-දූතයා, පණිවිඩ ගෙණයන්නා.

**ගති.** ඉ-භව විශෙෂය, භවය, ප්‍රතිෂ්ඨාව, නිෂ්ඨාව, අභිප්‍රාය, නුවණ, වාසස්ථානය. ගමන, විසදභාවය.

**ගති.** ඉ-යෑම, පිටත යෑම.

**ගතික.** ති-ගති ඇත්තා.

**ගථිත.** ති-ගැටගසනලද, ගොතනලද.

**ගද්ද.** d. භූ-ශබ්දකිරීමෙහි, ගද්දති, ශබ්දකරයි.

**ගද්දහණ්ඩ.** පු-තෙලසාටු, තෙල් ඇසටු.

**ගද්දුල.** පු-බලුදම, බල්ලන්බඳින යොත.

**ගද්දූහන.** න-අවකාශය හා කාලය මනින කුඩා මිම්මක්.

**ගද.** d. භූ වියත් හඬෙහි, ගදති, බෙණෙයි.

**ගද.** d චු මෙස ශබ්දයෙහි, ගදෙති, ගදයති, ශබ්දකරයි, ගොරවයි.

**ගද.** පු රොගය, ව්‍යාධිය.

**ගදා.** ඉ එනම් ආයුධය, වෙසමුණි රජුගේ එනම් යගදාව.

**ගදිත.** ති-කියනලද, ප්‍රකාශකල

**ගද්‍රභ.** පු-කොටලුවා.

**ගධ.** චු-කැමතිවීමෙහි, ගධෙති ගධයති, කැමති වෙයි.

**ගධ.** පු-ගිජු ලිහිණියා.

**ගධිත.** ති-ගිජුවනලද, ලොල්වනලද.

**ගන්තබ්බ.** පු-අශ්වයා, යායුතු.

**ගන්ථ.** d. චු-ගෙතීමෙහි, ගන්ථෙති, ගන්ථයති, ගොතයි.

**ගන්ථ.** පු-ග්‍රන්ථය, ශාස්ත්‍රය, අභිජ්ඣාකාය ගන්ථය, බන්ධනය.

**ගන්ථධුර.** න-ග්‍රන්ථධුරය, ශාසනයෙහි ඇති ධුර දෙකින් එකක්, ත්‍රිපිටකය ඉගෙණීම.

**ගන්ථික.** ති-අමාරුවෙන් ඉගෙණුම් ඇති.

**ගන්ථෙති** ක්‍රි. d. භූ-ගන්ථ ගන්ථෙ, ගෙතීමෙහි, (ගන්ථ + ණෙ + ති) ගොතයි, ග්‍රන්ථනය කරයි.

**ගන්ධ.** d. භූ-ප්‍රකාශකිරීමෙහි, සුවඳ කැවීමෙහි, ගන්ධෙති ගන්ධයති, ප්‍රකාශකරයි, සුවඳහමයි.

**ගන්ධ.** පු-ස්වල්පය, ආඝ්‍රාණය, කටයුතුදෙය, සුගන්ධය-එනම් ඇත්කුලය.

**ගන්ධකුටි.** ඉ-ගඳකිළිය, සුවඳගෙය.

**ගන්ධජාති.** ඉ-සුවඳවර්ගයක්.

**ගන්ධථලි.** පු-පුවඟු

**ගන්ධන.** න-සුවඳ කැවීම.

**ගන්ධබ්බ.** පු-ගන්ධර්වයා, ගාන, ගායක, අශ්ව, දෙවතා විශෙෂයක්.

**ගන්ධබ්බහත්ථක.** පු-ගන්ධර්වහස්තය, එඬරුගස.

**ගන්ධබ්බාධිපති.** පු-ගන්ධර්වයන්ට අධිපතිවූ ධෘතරාෂ්ට්‍ර නම් වරම් රජ.

**ගන්ධමාදන.** පු-හිමාලයෙහි පිහිටි එනම් පර්වතය.

**ගන්ධසාර** පු-සඳුන්.

**ගන්ධවහ.** පු-සුලඟ, වාතය.

**ගන්ධාපන.** න-සුවඳ, වෙලඳ සැල.

**ගන්ධාර.** පු-එනම් ස්වරය, එනම් ජනපදය.

**ගන්ධික.** පු-සුවඳ වෙළෙන්ද, සුවඳ ඇති.

**ගන්ධොත්තමා** පු-සුරා.

**ගන්ධෙති.** ක්‍රි-d චු ගන්ධ-ගන්ධෙ, ගඳ සුවඳ දැනීමෙහි. (ගන්ධ + ණෙ + ති) සුවඳ හමයි, ප්‍රකාශ කරයි.

**ගන්ධොදක.** න-සුවඳ ජලය.

**ගබ්බ.** d. භූ-යාමෙහි, ගබ්බති, යෙයි.

**ගබ්බ.** d. භූ-එඩියෙහි, ගබ්බති, අහඞ්කාරවෙයි

**ගබ්බ.** d. චු-එඩියෙහි, ගබ්බෙති, ගබ්බයති, අහඞ්කාරවෙයි.

**ගබ්බිත.** ති-ගර්විත, එඩිය ඇත්තා.

**ගබ්භ.** d. භූ-ප්‍රගල්භයෙහි, වධයෙහි, දූරීමෙහි ගබ්භති, අහඞ්කාරවෙයි, දරයි.

**ගබ්භ.** පු-දරුගැබ, බඩ, ගබඩාව, ලගිනාගෙය.

**ගබ්භති.** ක්‍රි-d භූ. ගබ්භ-පාගබ්භියෙ, ආඩම්බර වීමෙහි + ති (ගබ්භ + ති) ආඩම්බර වෙයි.

(10522)

**ගබ්භර.** න-ගල්ලෙන, මව් ගැබ, උපාසවය.

**ගරල(ළ).** පු. න-විෂය.

**ගරහන.** න-ගැරහීම, නින්‍දාකිරීම.

**ගරහිත.** ඉ-ගරහන ලද, නිඳි ලද, ගර්හිත.

**ගරී.** ඉ-දේවදූලිය.

**ගරු.** පු-ආචාර්‍ය්‍යාදීහු, මව්පියහු, පක්ෂිපත්‍ර, නපුරු.

**ගරු.** ති-මහත්දෙය, දුකසේ දිරනදෙය, බර දෙය.

පුමෙ ආචරියා දිමහි
ගරුමාතා පිතුඝවපි
ගරුනිසු මතෙනව
දුජ්ජරා ලහුකෙසුව (අභිධානප්පදීපිකා)

**ගරුක.** ති-ගරුවූ, බරවූ, නපුරුවූ.

**ගරුකත.** ති-ගරුකළ; සම්මානනය කළ.

**ගරුකාපත්ති.** ඉ-බර ඇවැත්, පාරාජිකා, සඞ්ඝාදිශෙෂ යන ඇවැත් දෙක.

**ගරුකම්ම.** න-බරකම්, කුශලපක්ෂයෙන් පඤ්චාභිඥාද අෂ්ටසමාපත්ති දෙකද, අකුසල පක්ෂයෙන් ආනන්තරිය කර්මාදියද.

**ගරුගබ්භා.** ඉ-බරගැබ් ඇත්ති, දූරි ඇත්තී.

**ගරුල.** පු-ගුරුළා.

**ගරුලගගජ.** පු-අරුණ.

**ගරුලධජ.** පු-විෂ්ණු, ගුරුළුද්ද.

**ගල.** භූ-කෑමෙහි, ගලති, කයි.

**ගල.** පු-ග්‍රීවය, උගුර.

**ගලගග.** න-උගුරේ මුල.

**ගලනාලි.** න-උගුරුදණ්ඩ.

**ගලක.** පු-ග්‍රීවය, බෙල්ල.

**ගලගලායති.** ක්‍රි-d. චු. ගල-සවෙ, ගැලීමෙහි + ති) ශබ්දකරමින් ගලා බසියි.

**ගලගණ්ඩ.** පු-ගලගණ්ඩරොගය, කණ්ඨමාලය.

**ගලති.** ක්‍රි-(ගල d. භූ. අදනෙ, අනුභවයෙහි, අනුභවකරයි, ගිලියි.

**ගබ්භාවෙක්ඛන.** න-මව්කුස පිළිසිඳ ගැණීම.

**ගබ්භවුට්ඨාන** න-වැදීම, ප්‍රසූතය.

**ගබ්භසෙය්‍යා.** ඉ-ගර්භසයනය, ගර්භවාසය.

**ගබ්භාසය.** පු-ගර්භාසය, දලබුව, වැදුමහ.

**ගබ්භිනී.** ඉ-ගැබිනිය, දරුගැබ් ඇත්තී.

**ගබ්භාවක්කන්ති.** ඉ-ගර්භාවක්‍රාන්තිය, පිළිසිඳීම.

**ගම්භීර.** ති-ගැඹුර, සප්තස්වරයෙහි එනම් අඞ්ගය.

**ගම්භීරත්ථ** පු-ගැඹුරු අරුත, ගම්භීරාර්ථය.

**ගම්ම.** ති-යායුතු, පැමිණියයුතු, ග්‍රාම්‍ය.

**ගම.** පු-ගමන, යාම.

**ගමන.** න-යාම, ප්‍රයාණය.

**ගමනීය.** පු-යායුතු, ගමනට සුදුසු.

**ගමික.** පු-ආගන්තුක නොවන්නා, නිත්‍ය වාසය ඇත්තා.

**ගමික.** ති-ගමික, යාමට සැරසුනහු.

**ගමු** d. භූ-යාමෙහි, ගච්ඡති, යෙයි, (ගමු=ගච්ඡ + ති)

**ගමු.** d. චු-මදක් ඉවසීමෙහි, ආපුච්ඡීයි, ආගමෙති, ආගමයති, ඉවසයි.

**ගයා.** ඉ-දඹදිව මහබෝමැඩ පිහිටි ප්‍රදේශය, බුද්ධගයා පලාත.

**ගය්හ.** පු-ගතයුතු, ගැණීමට නිසි.

**ගය්හක.** පු-සිරකරුවා, සිරභාරයට ගන්නා.

**ගය්හති.** ක්‍රි-d. භූ. ගහ-උපාදානෙ ගැණීමෙහි (ගමු=ගය්හ + ති) ගණී.

**ගය්හාකාර.** පු-වැටහෙනාකාරය, ගන්නා ආකාරය.

**ගරහ.** d. භූ-නින්‍දාවෙහි, ගරහති, නින්‍දාකරයි.

**ගරහ.** d. චු-නින්‍දාවෙහි, ගරහෙති, ගරහයති, නින්‍දාකරයි.

**ගරහක.** පු නින්‍දාකරන්නා, ගරහන්නා.

**ගරහති.** ක්‍රි-d. භූ. ගරහ-නින්‍දාය, නින්‍දා කිරීමෙහි (ගරහ + ති) ගරහයි, බණියි.

**ගර.** d. භූ-උතුම් දෙයෙහි, ගරති, උතුම්වෙයි.

**ගර.** d. චු-උසස් ගමනෙහි, ගරෙති, ගරයති, උසස්ව යයි.

**ගරහී.** පු-ගරහන්නා, නින්‍දාකරන්නා.

**ගරු.** න-බර.

**ගරුළ**. පු-ගුරුළා.

**ගරුධම්ම**. න-පිළිපැදියයුතු ගරුධම් අටක්.

**ගරුතා**. න-ගරුකටයුතු බව.

**ගල**. d. භූ-කැමෙහි, ගලති, ගිලියි, අජ්ඣාහරණය කරයි.

**ගල**. පු-ග්‍රීවය, බෙල්ල.

**ගලවාට**. න-ගලවලුව, ග්‍රීවය, බෙල්ල, ගෙල.

**ගලිත** ති-ගිලිහුනු, ගැලවී පතිතවූ.

**ගලොචී**. ඉ-කිඳිවැල, රසකිඳවැල.

**ගව**. පු-ගවයා, එලහරකා.

**ගවක්ඛක**. පු-කවුළු දොර, වාතපානය.

**ගව්‍ය**. පු එලකිරි ගිතෙල් ආදි එලදෙනගෙන් උපදනා දෙය.

**ගලග්ගහ**. න-උගුරෙන් අල්වා ගැණීම.

**ගලප්පමාණ**. න-උගුර දක්වා ඇති ප්‍රමාණය.

**ගලන්තට්ඨි**. න- ගලග ඇටය, ගලසර ඇටය.

**ගලමූල**. න-උගුරේ මූල.

**ගලිත**. ති-ගිලිහුණු, ගැලවුනු.

**ගලක**. න-උගුර.

**ගවක්ඛ** න-කවුළු දොර, ජිනේලය.

**ගව්‍ය**. න-ගිතෙල.

**ගවක්ඛජාල**. න දැල් කවුළුව.

**ගවච්ඡිත**. න-දැලකින් වසන ලද රිය.

**ගවජ**. පු-ගවරා.

**ගවපති**. පු-ගව හිමියා.

**ගවපාන**. න-මහත් මහත් සැලි කිරෙන් පුරවා උතුවන පරිදි උණුකොට සහල් ටිකක් දමා මී සකුරු දමා සකස්කළ භොජනය.

**ගවය**. පු-ගවය, ගවරා.

**ගවාඝාතන**. න-ගවයන් මැරීම.

**ගවි** පු- ගිතෙල, යාගද්‍රව්‍ය

**ගවිප්ඵල**. න-රුක්ඛවල්ලි ඵලය, එනම් ගෙඩි වර්ගය.

**ගවෙස**. d. චු-මග්ගනෙ, සෙවීමෙහි, ගවෙසති, ගවෙසයති, සොයයි.

**ගවෙසක**. පු-සොයන්නා, පරීක්ෂා කරන්නා.

**ගවෙසති**. ක්‍රි- d. චු- ගවෙස- මග්ගනෙ සෙවීමෙහි; + ති) ගවෙස d. චු. මග්ගනෙ සෙවීමෙහි + ණෙ + ති) සොයයි.

**ගවෙසන**. න-සෙවීම, පරියෙසනය.

**ගවෙසිත**. ති-සොයන ලද, බලන ලද.

**ගවෙසී**. පු-සොයන තැනැත්තා, පරීක්ෂා කරන්නා.

**ගස**. d. භූ-අදනෙ, කැමෙහි, ගසති, කයි, අනුභව කරයි.

**ගසති**. ක්‍රි-(ගස d. භූ. අදනෙ, කැමෙහි + ති අනුභව කරයි.

**ගසු**. d. භූ-අදනෙ, අනුභවයෙහි, ගසති, කයි.

**ගහ**. d. ක්‍රි-උපාදනෙ, ගැණීමෙහි, ගණ්හාති, ගණියි.

**ගහට්ඨ**. පු-(ගහ + ඨා) ගෘහස්ථයා, ගෙයි සිටින්නා, ගිහියා.

**ගහකාරක**. පු-ගෙවල් සාදන්නා, වඩුවා.

**ගහකූට**. න-ගෙයි මුදුන, ගෙයි කොත.

**ගහණ**. න-ග්‍රහණය, ගැවසීගැන්ම, වන දුර්ග ආදිය.

**ගහණ**. ති-අවිවෙක, විවෙක රහිත.

**ගහණී**. ඉ-ග්‍රහණීරොගය, පාකාග්නිය, බඩ.

**ගහපති**. පු-ගෘහපතියා, ගෙයි හිමියා, ගිහියා සූයඹියා.

**ගහපතික**. පු-ගහපතියා.

**ගහපතිමහාසාර(ළ)**. පු-ගෘහපති මහාසාරයා; යටත් පිරිසෙයින් සතළිස් කෙළක් ධන නිධාන ඇති දිනපතා පස්මුණක් කහවනු වැයවන කුල ඇත්තා.

**ගහිත**. ති-ගත්තා ලද, ග්‍රහණය කළ.

**ගහිතභාව**. න-ගත් බව.

**ගළ(ල)** පු-ජීඬ, කෙලතොළු.

**ගළො(ල)**. චි. ඉ-කිඳි, රසකිඳ.

(10625)

## ගා

**ගා.** d. දි-සද්දෙ, ශබ්දකිරීමෙහි, ගායති, ශබ්ද කරයි.

**ගා.** d. භූ-ගතියං, යාමෙහි, ගීති,යෙයි.

**ගා.** d. භූ-ගතියං, යාමෙහි, ගාති, යෙයි.

**ගඩෙගරුකි.** ඉ කැලිය, සිරිවැඩි බැවිල.

**ගාති** ක්‍රි-(ගා d. භූ. ගතියං, යාමෙහි + ති) යෙයි.

**ගාථක**. පු-ගාථාවන්ගෙන් යුත්, ගාථා ඇති.

**ගාථා.** ඉ-පාලි පද්‍යය, පාලි කවි පාද තුණකින් පාද සයකින් යුත් පද්‍යය. ආයර්‍යා ඡන්දස, විෂමාක්‍ෂර විෂමපාද ඇති ශ්ලෝක.

**ගාථාභිගීත** න-මනාකොට ගැයූ ගීතය.

**ගාථාවසාන**. න-ගාථාවේ අවසන්හි.

**ගාධ.** පු-ප්‍රතිෂ්ඨාව, නොගැඹුර, අගාධ බලනු.

**ගාධ**. d. භූ. පතිට්ඨායං, පිහිටීමෙහි, ගාධති, පිහිටයි.

**ගාධති.** ක්‍රි-(ගාධ d. භූ. පතිට්ඨායං, පිහිටී මෙහි + ති) පිහිටයි.

**ගාන.** න-ගී කීම.

**ගාම**. පු-ග්‍රාමය, ගම, සමූහය.

**ගාමක.** පු-ගමට අයිති, ගම පිළිබඳ.

**ගාමකථා.** ඉ-ගම්මැදි කතා, ගැමිකතා.

**ගාමජෙට්ඨක**. පු ගම් දෙටුවා, ගම්ප්‍රධානියා

**ගාමකූට**. න-ගැමි වංචාව.

**ගාමගත**. ති-ගමට ගිය.

**ගාමජන**. පු-ගමේ මිනිස්සු,

**ගාමණී**. ති-ගම්දෙටු, ශ්‍රේෂ්ඨ, අධිපති.

**ගාමණීක**. ති-ග්‍රාමණීක, ග්‍රාමික.

**ගාමණීය.** පු-හස්ත්‍යශ්වාදීන් හික්මවන ආචාර්‍යයා.

**ගාමද්වාර**. න-ගම්දොර, ගමට ඇතුළත්වන දොර.

**ගාමදාරක**. පු-ගම්දරුවෝ.

**ගාමධම්ම**. පු-ග්‍රාම්‍ය ධර්මය, මෙවුන්දම. නින්දිත ස්වභාව.

**ගාමන්ත**. පු-ග්‍රාමාන්තය, ගම්සීමාව

**ගාමපොද්දව**. පු-ජිව්රාග මණ්ඩණයෙහි සෙදුනු නාගරිකයා.

**ගාමභොජක**. පු-මූලාදෑනියා.

**ගාමබන්ධන**. න-ගමින් පිට නොයන පරිදි බැඳීම, ගමේම සිරකර තැබීම.

**ගාමමණ්ඩල**. න-ගම්මඩුලු, ගම්සභා

**ගාමසූකර**. පු-ගම් ඌරා.

**ගාමික**. පු-ග්‍රාමික, ගමට අයත්, ගම් පිළිබඳ.

**ගාමී**. පු-යනසුලු. ගමන් කරණ ස්වභාව ඇති.

**ගාමෙය්‍ය**. පු ග්‍රාමික, ගම්වාසි.

**ගායක**. පු-ගායනා කරන්නා, වයන්නා.

**ගායත්ති**. ඉ-එනම් ඡන්දස, අකුරු සයකින් යුත් ගායත්‍රී නම් ඡන්දස, කිහිරිගස.

**ගායති**. ක්‍රි-(ගී. d සු. සද්දෙ, ශබ්දකිරීමෙහි + ති) ගායනා කරයි.

**ගායති**. ක්‍රි-(ගෙ. d. භූ. සද්දෙ, ශබ්දකිරීමෙහි + ති) ගී කියයි.

**ගායන**. න-ගායනා කිරීම.

**ගායිත**. ති-ගායනා කළ.

**ගාරව**. පු-ගෞරවය, බුහුමන් කිරීම, ගරු කටයුතු.

**ගාරය්හ**. ති-(ගරහ d=ගාර. ණ්‍ය=ය්හ) ගැරහිය යුතු, නින්දාකටයුතු.

**ගාරය්හවචන**. න-නින්දාකටයුතු වචන ඇත්තා පිළිකුල් වචන ඇත්තා.

**ගාරවතා**. ඉ-ගෞරවය.

**ගාරව**. පු-ගෞරවය, බුහුමන් කිරීම.

**ගාරවාධිවචන**. න-ගෞරව සහිත ආමන්ත්‍රණය.

**ගාවී**. ඉ-ගවදෙන, එළදෙන.

**ගාවුත**. න-ගවුව, අසූ ඉස්බක්-උසභ බලනු.

**ගාවුත**. න-තණ බිම, දිස්ත්‍රික්කය.

**ගාවුතික**. පු-ගවුවක් ඇති.

(10676)

**ගාහ.** d. භූ.-විලොලනෙ, ඇළලීමෙහි, ගාහති, අළලයි.

**ගාහ.** ති-ගහණ, ග්‍රහණ, ගැණීම.

**ගාහක.** පු-ගන්නා තැනැත්තා, බාරගන්නා තැනැත්තා.

**ගාහන.** න-ගැණීම.

**ගාහති.** ක්‍රි-(ගහ. d භූ. උපාදනෙ, ගැණීමෙහි + අ=ආ + ති) ගණී, ග්‍රහණය කරයි.

**ගාහති.** ක්‍රි-(ගාහ d. භූ. විලොලනෙ, ඇළලීමෙහි + ති) අළලයි.

**ගාහපමව.** න-එනම් ගින්න.

**ගාහාපක.** පු-ගන්වන්නා, ග්‍රහණය කරවන්නා.

**ගාහාපෙති** ක්‍රි-(ගහ d. භූ. උපාදනෙ, ගැණීමෙහි + ණපෙ +) ගන්වයි.

**ගාහික.** ති-ගැණීම කරණ, ගැණීම කරන්නා

**ගාහී.** ඉ-ගිවුළ.

**ගාළ්හ** ති-දැඩි, තද, අතිශය.

**ගාළව.** පු-ලොත්.

## ගි

**ගී.** d. සු-සද්දෙ, ශබ්දකිරීමෙහි.

**ගිඞගමක.** න-කරපළඳනා මාල විශෙෂයක්.

**ගිජ්ඣ.** පු-ගිජු තැනැත්තා, ගිජු ලිහිණියා.

**ගිජ්ඣ,** ති-ආශා සහිත, ගිජුලෙස.

**ගිජ්ඣක.** පු ගිජුතැනැත්තා ගිජු ලිහිණියා

**ගිජ්ඣකූට.** පු-ගිජුකුළු, ගිජ්ඣකූට පර්වතය.

**ගිජ්ඣති.** ක්‍රි-(ගිධු d දි. අභිකඞ්ඛායං, ගිජුවීමෙහි + ති) ගිජුවෙයි.

**ගිජ්ඣා.** ඉ-ඌලි,

**ගිධ** d දි ගෙධෙ, ගිජුවීමෙහි, පැතීමෙහි, ගිජ්ඣති, ගිජුවෙයි, ලොල්වෙයි.

**ගිධි.** ඉ-ආශාව.

**ගිධිමා.** ති-ගිජුවූ, ආශාවූ, ආශාවෙන් පිරුණු.

**ගිනි.** පු-ගින්න.

**ගිම්හ** පු ග්‍රීෂ්ම ඍතුව, ග්‍රීෂ්මය, උෂ්ණය,

**ගිම්හාන.** පු-බක්මස ආදී සාරමසක් වූ කාලය බක්, වෙසක්, පොසොන්, ඇසළ යන සාරමාසය.

**ගිම්හික.** පු-ගිම්හානයට අයත්, ග්‍රීෂ්ම ඍතුවට ඇතුළත්.

**ගිබ්බාන.** පු දෙවියා, ගීර්වාණ.

**ගිර** d. භූ නිගිරණාදිසු, කීම් ආදියෙහි, ගිරති කියයි, ප්‍රසවකරයි, වැස්සෙයි

**ගිරග්ග** න-පර්වත කූටය, කඳු මුදුන.

**ගිරග්ගසමජ්ජ.** න-රජගහ නුවර අවුරුදුපතා පවත්වන සැණකෙළියක්.

**ගිරා.** ඉ-තෙපුල, වචනය.

**ගිරි.** පු-පර්වතය, කන්ද.

**ගිරිකර්ණි.** ඉ-කටරොලු.

**ගිරිකණ්ණි.** පු-ගිරිතිල් ගස.

**ගිරිකණ්ණිකා.** ඉ-කටරොළු.

**ගිරිගබ්භර.** න-පර්වත ගුහාව, පර්වත සිදුර.

**ගිරිගබ්භාර.** න-පර්වත ප්‍රාන්තය.

**ගිරිගුහා.** ඉ-පර්වත ගුහාව.

**ගිරිබ්බජ.** පු පර්වතවලින් වටවූ ප්‍රදෙශය, පර්වතවලින් වටවූ ගාල. (ගිරි + බජ=වජ) රජගහ නුවර.

**ගිරිමල්ලිකා.** ඉ-කෙළිඳ ගස.

**ගිරිමෙඛල** පු-ගිරිමෙවුල, වසවර්තිගේ ඇතා.

**ගිරිසිඛර.** න-කඳු මුදුන.

**ගිරිසිඞ්ග.** න-පර්වත සිඛර, පර්වතකූට.

**ගිරියා.** ඉ-සිතිමා සඳගීනයක්.

**ගිරීස.** පු-ඊශ්වරයා.

**ගිල.** d භූ-අදනෙ, කෑමෙහි, ගිලති, ගිලියි, කයි.

**ගිල.** d. තු-අදනෙ, කෑමෙහි, ගිලියි, කයි.

**ගිලති.** ක්‍රි-ගිල. d. භූ. අදනෙ, කෑමෙහි (ගිල + ති) කයි.

**ගිලා.** d දි-හාසකඛයෙ සතුටු ගෙවීමෙහි, මිරිකීමෙයි, ගිලායති, නොසතුටුවෙයි, මිරිකෙයි.

**ගිලෙ.** d. භූ-කිලමනෙ, කලාන්තවීමෙහි, ගිලායති, කලාන්තවෙයි.

**ගිලාන.** පු ලෙඩා, රොගියා.

**ගිලානක.** පු-ගිලනා, ලෙඩා.

**ගිලානපච්චය** පු-ගිලන්පස, ගිලනුන්ට හිත බෙහෙත් ආදිය.

**ගිලානසාලා.** ඉ-ආරොග්‍ය ශාලාව,

**ගිලානාලය.** න-අසනීප බව් දැක්වීම.

**ගිලානුපට්ඨාන** න-ගිලනුන්ට උපස්ථානකිරීම

**ගිලානුපට්ඨායක.** පු-රෝගීන්ට උපස්ථාන කරන්නා.

**ගිලායති.** ක්‍රි-ගිලෙ. d. භූ. කිලමනෙ, කලාන්ත වීමෙහි (ගිලා+ය+ති) ගිලන් වෙයි, පීඩෙයි.

**ගිලිත.** ති-අනුභවකළ, ගිලිනලද, කනලද.

**ගිලෙ** d භූ-පීතික්ඛයෙ. ප්‍රීතික්ෂයෙහි, ගිලායති අසතුටුවෙයි, ගිලන්වෙයි.

**ගිහී.** පු-ගිහියා, ගෘහස්ථයා.

**ගිහිකිච්ච.** න-ගිහියාගේ කටයුතු.

**ගිලෙච්.** d. භූ-සේවනෙ, සේවනයෙහි, ගිලෙචති, සෙවනය කෙරෙයි.

**ගිහිභොග.** න ලෞකික මිනිසාගේ ධනය.

**ගිහිලිඞ්ග.** න-ගිහියාගේ ලක්ෂණය.

**ගිහිසංයොජන** න-ගිහි බන්ධනය.

**ගිහිසුඛ.** න-ගිහි සැපය, පස්කම් සැපය.

## ගී

**ගීත.** න-ගී කීම, ගායනා කිරීම, නාට්‍යය.

**ගීතක.** න-කුඩා ගීතය, පුංචි සින්දුව.

**ගීතරව.** න-ගී හඬ, ගීතිකා ශබ්දය.

**ගීතසද්ද.** න-ගී කියන හඬ, ගී රාවය.

**ගීතස්සර.** න-ගී ස්වරය.

**ගීතිකා.** ඉ-ගී කීම.

**ගීවා.** ඉ-බොටුව=ග්‍රීවා, උගුර, නය.

**ගීවෙය්‍ය.** න-ග්‍රීවාභරණය, ග්‍රීවයෙහි ලන වළල්ල

**ගීවෙය්‍යක.** න-ග්‍රීවය ඔතන පටිය, ග්‍රීවාභරණය.

## ගු

**ගු.** d භූ-වච්චකරණෙ, වර්චස්කිරීමෙහි, ගවති, මලපහකරයි.

**ගු.** d භූ ගමනෙ, ගමනයෙහි, ගාතෙ ගවතෙ, යයි.

**ගු.** d භූ-සද්දෙ, ශබ්දකිරීමෙහි, ගවති, ශබ්ද කෙරෙයි.

**ගුග්ගුලු.** පු-ගුගුල්, සුවඳ සඳහා ගන්නා ද්‍රව්‍යයක්.

**ගුජ.** d. භූ-අව්‍යත්ත සද්දෙ, නොවියත් හඬෙහි, ගුජති, ශබ්දකෙරෙයි.

**ගුජි.** d. භූ සද්දෙ. ශබ්දයෙහි, ගුඤ්ජති, ශබ්ද කෙරෙයි.

**ගුඤ්ජා.** ඉ-හුනිඳ, ඔලිඳ, සතර වියටෙක බර

**ගුඤ්ජති.** ක්‍රි-ගුජි d. භූ-ආව්‍යත්ත සද්දෙ, අව්‍යක්ත ශබ්දයෙහි+ති (ගුජි+ති) ශබ්ද කෙරෙයි.

**ගුඩි.** d චු-වෙඨනෙ, වෙළීමෙහි, ගුණ්ඨෙති, ගුණ්ඨයති, වෙළයි, ඔතයි.

**ගුණ.** d. භූ-අභ්‍යාසෙ, අභ්‍යාසයෙහි.

**ගුණ.** d චු-ආමන්තනෙ, ආමන්ත්‍රණයෙහි, ගුණෙති, ගුණයති, අමතයි, ආමන්ත්‍රණය කරයි.

**ගුණ.** d සු-සංවරණ, සංවරණයෙහි, ගුණෙති, සංවරණය කරයි.

**ගුණ.** පු-පටලය, රාශිය, අනුසය.

**ගුණක.** න-මිහිගුබෙර සටහනින් වියමන, ගුණකරන්නා,

**ගුණඩ්ඪ.** ති-ගුණයෙන් උසස්, ගුණයෙන් පොහොසත්.

**ගුණරුක්ඛ.** පු-කුඹය, නැවේ කුඹගස.

**ගුණාධාර.** පු-ගුණයන්ට ආධාර, ගුණයන්ට පිහිට.

**ගුණී.** පු-ගුණ ඇත්තා, ගුණවතා.

(10772)

**ගුණුක්කංස.** පු-ගුණොත්කර්ෂය, උසස්ගුණය.

**ගුණෙතර.** ති-නුගුණ, අගුණ.

**ගුණ්ඩික.** පු-වැසු තැනැත්තා.

**ගුණ්ඩිම** ති-වසා දැමූ. ආවරණය කළ.

**ගුණ්ඨෙති.** ක්‍රි - ගුණ්ඨ. d. චු. වෙඨනෙ, වෙළීමෙහි + ණෙ + ති (ගුඩි + ණෙ + ති) වෙළයි.

**ගුත්ත.** ති-රක්නාලද, සඟවනලද, ගොපනය කළ.

**ගුත්තගාර.** න-රක්නා ලද දොර, වසනලද දොර.

**ගුත්තපුරිස.** පු-චර පුරුෂයා, රහස් ඔත්තු කාරයා.

**ගුත්ති.** ඉ-ආරක්ෂාව, ගොපනය.

**ගුත්තින්ද්‍රිය.** ති-වසනලද ඉඳුරන් ඇති.

**ගුත්තික.** පු-ආරක්ෂා කරන්නා, ගොපකයා.

**ගුද.** d. භූ-කීළනෙ, ක්‍රීඩාවෙහි, ගුදති, ගොදති, කෙළියි.

**ගුද.** න-ගුදය, මලමාර්ගය, අධොමාර්ගය.

**ගුධ.** d. භූ දි-වෙඨනෙ, වෙළීමෙහි, ගුජ්ඣති, වෙළයි.

**ගුන්‍ද්‍රා.** ඉ-චම්මුතු, පුවඟු.

**ගුප** d. භූ-ගොපනෙ, රැකීමෙහි, ගොපති, රකියි.

**ගුප.** d. භූ-ජිගුච්ඡනෙ, පිළිකුල් කිරීමෙහි, ජිගුච්ඡති, පිළිකුල් කෙරෙයි.

**ගුප.** d. චු-දිත්තියං, දීප්තියෙහි, ගොපෙති, ගොපයති, බබලයි, දිලිසෙයි.

**ගුඵ.** d. භූ-ගන්ථනෙ, ග්‍රන්ථනයෙහි, ගුඵති, ගොඵති, ග්‍රන්ථනය කරයි.

**ගුබි.** d. භූ-පිණ්ඩිකරණෙ, පිඩු කිරීමෙහි, ගුම්බති, පිඩු කෙරෙයි, සමුච්චය කෙරෙයි.

**ගුම්බ** d. භූ.-පිණ්ඩීකරණෙ, පිඩු කිරීමෙහි, ගුම්බති, පිඩු කෙරෙයි.

**ගුම්ඵ.** න-මල් මාලාවලින් සැරසීම, මල්වලින් අලංකාර කිරීම.

**ගුම්බ.** පු-ලැහැබ. රාශිය, සෙනඟ, සැරසුම.

**ගුම්බන්තර.** න-වන ලැහැබ

**ගුම්බිය.** න-යුද්ධභටයන් ගෙන් එක් හමුදාවක්.

**ගුමු.** d. චු-ථෙය්‍යෙ, සොරකමෙහි, ගොමති, සොරකම් කරයි.

**ගුය්හ.** න-ලිඞ්ගය, රහස, වැසීම.

**ගුය්හක.** පු-එනම් දෙව යොනිය, කුවෙරානු චර නිධිසංරක්ෂක මණිභද්‍රාදීහු.

**ගුය්හකිස්සර.** පු-වෙසමුණිරජ.

**ගුය්හඞ්ග.** න-රහසඟ, ගුය්හ ප්‍රදෙශය.

**ගුළාක.** පු-පුවක් ගස.

**ගුරු.** ති-ගරු කටයුතු, බුහුමන් කළයුතු.

**ගුරුදක්ඛිණා.** ඉ-ගුරු දක්ෂිණාව, ගරු පූජාව.

**ගුහ.** d. භූ-සංවරණෙ, සංවරයෙහි, ගුහති, නිගූහති, වසයි.

**ගුහා.** ඉ-ලෙන, ගල්ලෙන, ගල් ගුහාව, පුස් වැත්ත.

**ගුහාසය.** න-හෘදය වස්තුවේ ඇති කුහරය.

**ගුළ.** d. භූ-රක්ඛණෙ, රැකීමෙහි, ගුළති, රකියි.

**ගුළ.** d. භූ-පරිවත්තනෙ, පෙරළීමෙහි, වට කිරීමෙහි.

**ගුළ.** d. තු-මොක්ඛෙ, මිදීමෙහි,

**ගුළ.** පු-ගුළිකා, ඉක්ෂුවිකාර=උක් සකුරු

**ගුළපුප්ඵ.** පු-මීගස.

**ගුළඵල.** පු-මොරගස.

**ගුළභෙද.** පු-ඉක්ෂු විකාර=උක්සකුරු.

**ගුළමෙථුන.** පු-රහස් මෙවුම්දම් ඇත්තා, කපුටුවා.

**ගුළා.** ඉ-සිතුක්.

**ගුළික.** න-පොකුර, මැණික් දම්වැල.

**ගුළිකා.** ඉ-කුඩා බෝලයක්.

## ගූ

**ගූථ.** පු. න-අසුචි, වර්ච්ස්, ගූථය.

**ගූථක.** න-මලපහ කිරීම,

**ගූථකටාහ.** න-මල පහකරණ භාජනය.

**ගූථකූප.** පු-අසුචි වල, වැසිකිළි වල.

**ගූථනරක.** න-එනම් නරකය.

**ගූථභාණී.** පු-අසුචි මෙන් පිළිකුල් වචන කියන්නා.

**ගූහති.** ක්‍රි-ගුහු d. භූ. සංවරණෙ, වැසීමෙහි +ති) (ගුහ+ති) වසයි, නිගූහණය කරයි.

**ගූහන.** න-වැසීම, ගොපනය.

**ගූළ්හ.** පු-සඟවන ලද.

**ගූළ්හපාද.** පු-සූයඝීයා, ඉරු.

**ගූළ්හපුරිස.** පු-චරපුරුෂයා, ඔත්තුකාරයා.

## ගෙ

**ගෙ** d. භූ-සද්දෙ, ශබ්දයෙහි, ගායති, ශබ්ද කරයි.

**ගෙ.** d. සු-සද්දෙ, ශබ්දයෙහි, ගිණෙති, ගිණති, ශබ්ද කෙරෙයි.

**ගෙවු.** d. භූ සෙවනෙ, සේවනයෙහි, ගෙවති, සේවනය කරයි.

**ගෙණ්ඩුක.** පු-පන්දුව, සෙල්ලම් කරණ බෝලයක්.

**ගෙධ.** පු-ගිජු, ලොල්

**ගෙධි.** පු-ගිජුවූ තැනැත්තා, ලොල්වූවහු.

**ගෙධිත.** ති-ගිජුවන ලද.

**ගෙය.** න-සන, ගිජු.

**ගෙය්‍ය.** න-නවාඞ්ග ශාසනා ශාසනයෙන් දෙවන කොටස, ගෙය්‍ය ධර්මය.

**ගෙරික.** පු ගෛරික, ගුගුල්.

**ගෙරුක.** න-ගෛරික=සිවංගුරු.

**ගෙලඤ්ඤ.** න-ගිලන් බව, රෝගය, ලෙඩය.

**ගෙහ.** පු-ගෙය, නිවස, වාසස්ථානය.

**ගෙහඞ්ග.** න-ගෘහාවයව.

**ගෙහඞ්ගන.** න-මිදුල, ගෙය ඉදිරිපිට ඇති අවකාශය.

**ගෙහනිස්සිත.** ති-ගේ පිළිබඳ, ලෞකික ජීවිතය පිළිබඳ.

**ගෙහසිත.** ති-ලෞකික ජීවිතය පිළිබඳ.

## ගො

**ගො.** පු. ඉ-ගෙරි, භූමිය, වචනාදිය.

**ගො.** ති-වචනාදිය.

**ගො.** න-චක්ඛුරින්ද්‍රියාදිය, ජලය, රශ්මිය, සවගීය, වජ්‍රායුධය, වචනය, පෘථිවිය, ඥනය, සූයඝීයා, ගායකයා, කඳකුමරු, ගාන්ධර්වයා, චන්ද්‍රයා, දුෘඛය, අධිපති, සරසවතිය, පූර්වාදි දිසා යනාදියෙහි.

**ගොකණ්ටක.** පු ගොකටු, ගවකුරය.

**ගොකණ්ටකහත.** ති-ගවකුරයෙන් තසන ලද.

**ගොකණ්ණ.** පු-වෙදගිල්ල හා මහපටගිල්ල විදහා ගත් ප්‍රමාණය, ගෝනා.

**ගොකණ්ණී.** ඉ-මොරගස.

**ගොකුල.** න-ගාල.

**ගොඛුර.** පු-ගොටුකොළ, ගවකුරය.

**ගොගණ.** න-ගවසමූහයා, හරක් රංචුව.

**ගොසංඝික.** න-හරක් හම.

**ගොඝාතක.** පු-ගවයන් මරන්නා.

**ගොචර.** පු-අරමුණ, විෂය, ගොදුර.

**ගොච්ඡක.** පු-මල්කැන.

**ගොටවිය.** පු-නැවෙහි පශ්චාත්බන්ධනය, ගල් වත්ගෙඩිය.

**ගොටවිස.** පු-ගොටවිය.

**ගොට්ඨ.** න-ගාල, ගවමඩුව.

**ගොඨඵල.** න-බෙහෙත් පිණිස ගන්නා ගෙඩි වගීයක්.

**ගොණ.** පු-ගොණා.

**ගොණකපථක.** පු-සතරඟුලාධික කලුලොම් මුවා ඇතිරිය.

**ගොණක.** පු. න-දික්ලොම් ඇති මහත් කොඳු පලස, ගොඳුපලස් අතුල.

**ගොණඞ්ගුල** පු ගොනඟුල් කලුතුඩු ඇති වඳුරා.

**ගොණිසාදිකා.** ත ගවහල, ගවමඩුව.

**ගොතම.** පු-ගෞතම බුදුරජ, එනම් වංශය.

**ගොතමක.** පු-එනම් තොට, එනම් ඇත්තා

**ගොත්‍රභූ** පු-කාමලොකයෙන් එතෙර වන්නා.

**ගොත්‍රභූචිත්ත** න-අනුලොම සිතට පසුව මාර්ග චිත්තයට පෙරටුව තුන්වැනිව හෝ මාර්ග සමඞ්ගීහුගේ පෘථක්ජන ගෝත්‍රය හෝ ව්‍යවහාරය ඉක්මවීමෙන් ආර්‍ය්‍ය ගොත්‍රයට හෝ ආර්‍ය්‍ය ව්‍යවහාරයට පමුණුවමින් ඇඳගු විදර්ශනා චිත්තය.

**ගොත්‍රභූඤාණ.** න-කාමලොකයෙන් එතෙර වන ඥානය.

**ගොත්ත.** න-නාමය, වංශය, පවීතය.

**ගොත්තු.** d භූ-වංසෙ, වංසයෙහි, ගොත්තෙති, වංශ ඇත්තේ වෙයි.

**ගොථනී.** ඉ-මුද්‍රික, මිදි.

**ගොදූහ.** පු ගොපල්ලා.

**ගොධ.** පු-ගොයා, තලගොයා.

**ගොධක.** පු-කුරුළු වර්ගයක්.

**ගොධරණී.** ඉ-ගැබිනි දෙන, ගැබ් ඇති දෙන.

**ගොධූම.** පු-තිරිඟු, යව.

**ගොනක.** පු-දික්ලොම් ඇති, මහත් කොඳු පලස.

**ගොනක.** ත-සතරඟුල් දික් ලොම් ඇති ඇතිරිය.

**ගොනස.** පු-පොළඟා, ගෝනුස්සා.

**ගොප.** පු-ගොපල්ලා, ගෝපාලයා.

**ගොපක.** පු-ගොපල්ලා, මුරකරුවා.

**ගොපගාම.** පු ගොපලුගම.

**ගොපති.** පු-ඊශ්වරයා, රජා, ශ්‍රී කෘෂණ, සූර්‍ය්‍යයා, ශක්‍රයා, ප්‍රධාන වෘෂභයා.

**ගොපන.** න-රැකීම, ආරක්ෂාව, පාලනය කිරීම.

**ගොපාන(ණ)සී.** ඉ-ගොතැස්ස, පරාල.

**ගොපායිත.** ති-රක්නා ලද, ගොපනය කල.

**ගොපාල.** පු ගොපල්ලා, ගවපාලයා.

**ගොපාලගාමක** පු-ගොපලුගම.

**ගොපාලකුපොසථ,** පු-ගොපලු ක්‍රියා වැනි ක්‍රියා ඇති උපොසථය.

**ගොපිත.** ති ගොපනය කල, රක්නා ලද.

**ගොපුර.** න-වාරය=නුවර දොරටුව, දසපුර.

**ගොපෙති** ක්‍රි-(ගුප d. භූ. රකඛණෙ, රකී මෙහි+ණ+ති) (ගුප+ණෙ+ති) ගොපනය කරයි, රකියි.

**ගොප්ඵක.** පු-දූසයා

**ගොප්ඵක.** පු-ගොප්මස, ගොප් ඇටය, කෙණ්ඩය.

**ගොම.** d චු-ලෙපනෙ, ආලෙප කිරීමෙහි, ගොමෙති, ගොමයති, ආලෙප කරයි.

**ගොමග්ග.** පු-ගව මාර්ගය.

**ගොමණ්ඩල.** පු-ගවරැල, ගව සමූහය.

**ගොමන්තු.** පු-ගවයන් ඇත්තා, ගෙරි ඇත්තා.

**ගොමය.** පු-ගොම, ගොවසුරු.

**ගොමායු.** පු-කැනහිලා.

**ගොමික.** පු ගවහිමියා, ගෙරිඇත්තා.

**ගොමිල්හ.** පු න-ගොම, ගවකරීසය.

**ගොමුත්ත** න ගොමුත්‍ර, එළමුත්‍ර, රතුපැහැති වටිනා මැණික්වර්ගයක්.

**ගොමුඛ.** න පිඹිනා හඟ, පිඹිනා අඟ.

**ගොමෙධ.** න-ගවයන් බිලිදීම

**ගොයූථ.** පු-ගොමණ්ඩලය, ගවරැල

**ගොයොගපිලක්ඛ.** න-ගවයන් විකුණන තන්හි හටගත් පිළ කඩය.

**ගොර.** පු සුවඳ, සුගන්ධය.

**ගොරක්ඛා.** ඉ-ගෙරි රැකීම, ගවපොෂණය.

**ගොල.** න-ගුලිය

**ගොලිකා.** ඉ-තලගොයා, ගොධා.

**ගොලිස.** පු-වල්පලොල්.

**ගොලිවණ.** පු-වල්පලොල්.

(10920)

ගොලොමික. ති-පොකුරු සහිත, "මස්සුං ගොලොමිකං කාරාපෙති."

ගොලොමි. ඉ-වදකසා, සුදුහීතණ.

ගොවජ. පු-ගොවුද, ගවගාල.

ගොවඤ්ඤති. ඉ-පුවඟු.

ගොවින්ද. පු-ගොවිධානකරන්නා, විෂ්ණු.

ගොසංඛ. පු-ගොපොල්ලා.

ගොසාලා. ඉ-ගොවුද, ගවගාල.

ගොසීත. න-රත්වන් සඳුන්.

ගොල. පු-ගුළිකා, ගුලිය, බෝලය.

ගොලක. පු පිණ්ඩ, පිඩ, ගෝලය.

ගොළිකා පු ගුලිය.

## ඝ

ඝ. අ-මරණ, නසන, විනාශකරණ යන අර්ථයෙහි අව්‍යයක්.

ඝට. d භූ-ඊහනෙ, උත්සාහයෙහි, ඝටති, උත්සාහකරයි.

ඝට d භූ-රාසිකරණෙ, රැස්කිරීමෙහි, ඝටති, රැස්කෙරෙයි.

ඝට. d චු-විසරණෙ, හිංසායෙහි, ඝටෙති, ඝටයති හිංසාකෙරෙයි, ගටයි.

ඝට. d. චු සංඝාතෙ, ගැටීමෙහි, රැස්කිරීමෙහි. ඝටෙති, ඝටයති, ගැටෙයි, රැස්කෙරෙයි.

ඝට. පු-කලය.

ඝට්ට. d භූ-සංඝට්ටනෙ, ගැටීමෙහි, ඝට්ටති, ගැටෙයි.

ඝට්ට d. භූ-සද්දෙ, ශබ්දකිරීමෙහි, ඝණ්ටති, ශබ්ද කරයි.

ඝටිත. ති-ගැටුනු, එකතුවුනු.

ඝටන. න-ගැටීම, ඝට්ටනය.

ඝටති. ක්‍රි-(ඝට d. භූ-සංඝාතෙ, ගැටීමෙහි + ති) ගැටෙයි.

ඝටා ඉ-ඝටනය, සමූහය.

ඝටී. ඉ-බත්සැළිය

ඝටිකපාල. පු-කලකබල.

ඝටිකා ඉ-පැය, දිගදණ්ඩකින් කෙටිදණ්ඩකට ගැසීමෙන් කරණ ක්‍රීඩාව, ගුඩුගැසීම, සිංකෙළිය, කල්ලිගැසීම.

ඝටියන්ත න-ළිඳෙන් පැන් නගන යන්ත්‍රය, පොම්පය.

ඝටොදන. න-සැළියෙහි පිසූබත්.

ඝට්ට. d චු-සංචලනෙ, සැලීමෙහි, ඝට්ටෙති, ඝට්ටයති, චලනයවෙයි, සැලෙයි.

ඝට්ටන. න-ගැටීම, හැපීම.

ඝංස ක්‍රි-(ඝංස d. භූ ඝංසනෙ ඉලීමෙහි + ති) ඉලීමකරයි=උලයි.

ඝංස d. භූ ඝංසනෙ, ඉලීමෙහි ඝංසති උලයි.

ඝංසන. න-ගැටීම, ඝර්ෂණය.

ඝංසිත ති-ගටන ලද, ඝර්ෂණය කළ.

ඝණ්ටා ඉ ගෙඩිය, ගණ්ඨාරය, සීනුව.

ඝණ්ටික පු බොහෝදෙනා එක්ව චක්‍රවසිට සතුතිකරණ වන්දීහු.

ඝඩ. d භූ, චු-ඝට්ටනෙ, ගැටීමෙහි, හැපීමෙහි, ඝණ්ඩති, ඝණ්ඩෙති, ඝර්ෂණයකරයි

ඝත. න-ගිතෙල්, ගී.

ඝනාද. න-මව්ගැබපිළිසිඳි සත්වයා පෙසී අසථාවෙන් මාරුවී කිකිළිබිජු ආකාර මස් පිඩු බවට පැමිණීම.

ඝන. පු ගනකම, යකුළ, මුගුර, මෙඝය, කුළුතාලම් ආදී තූර්‍යභාණ්ඩ, න-නිරන්තර වස්තු, ඝනබද්ධ වස්තු යනමෙහි.

ඝනතම. පු ගනඳුර, ගනාන්ධකාරය.

ඝනපුප්ඵ න-ඝනපුප් ඇතිරිය, ඝන වූ මල් ඇති ඇතිරිය.

ඝනසාර. පු-කපුරු.

ඝනික. පු-වලාහක දෙවියෝ, වැහිවලාකුල්.

ඝනොපල. න-පාණවැස්ස, පාත්වැස්ස, අයිස්කැටවර්ෂාව,

ඝම්මජල. න ඩහදිය, ග්‍රීෂ්මජලය.

ඝම්ම. පු ග්‍රීෂ්මඍතුව, උෂ්ණය, සෙවදජලය.

ඝම්මති. ක්‍රි-(ගමු= d. භූ. ගතියං, යෑමෙහි + ති) යෙයි.

(10968)

**සර**. d. භූ-සෙවනෙ, ඉසීමෙහි, සරති, ඉසියි, වැගිරෙයි.

**සර**. න-ගෙය, ගෘහය.

**සරකූට**. න-ගෘහකූට, කැණිමඩල.

**සරගොලිකා** ඉ-සූතා=හූනා හිකතලා.

**සරදාසිකා**. ඉ-ගෙදර සේවිකාව.

**සරනී**. ඉ-ගෘහිණිය, භාර්‍ය්‍යාව, බිරින්ද.

**සරසූකර**. පු-ගෙදර ඇතිකරන ඌරා.

**සරසප්ප**. පු-ගරඬියා, ගරවිලා.

**සරාජීර**. න-ගෙම්දුල.

**සරාදිභූ** ඉ-ගෘහාදිභූමිග, ගෙබිම්ආදිය.

**සරාවාස** න-ගිහිගෙයි ජීවිතය.

**සස**. d. භූ-අදනෙ, කෑමෙහි, සසති. කයි.

**සසති** ක්‍රි-( d. භූ. සස, ආදිතෙ කෑමෙහි + ති) අනුභවකරයි, කයි.

**සසර**. පු-දවස, දිනය.

**සසමර**. ති-හසෂණයීලීහු.

## සා

**සා**. d. භූ - සායනෙ, ගඳගැන්මෙහි, සාති, ආඝ්‍රානය කරයි.

**සා**. d. දි-සායනෙ, ගඳගැන්මෙහි, සායති, ආඝ්‍රාණයකරයි.

**සාත**. පු- මැරීම, නැසීම.

**සාතක**. පු-මරන්නා, නසන්නා.

**සාතන**. න-නැසීම, මැරීම, වධය.

**සාතික**. පු-වධකයා, මරන්නා.

**සාතිත**, ති-වධකළ, නසකලද.

**සාතුක**. පු-වධකයා, වදකරුවා.

**සාතෙති**. ක්‍රි-(හන d. භූ-හිංසාගතිසු - හිංසාවෙහි + සාත + ණෙ + ති)නසයි.

**සාතොදක**. පු-එතම් සැගරය.

**සාන**. න-ඝ්‍රාණය, නාසය, නාසිකාව.

**සායති**. ක්‍රි-(සා d. භූ, ගන්ධොපාදනෙ, ගඳ සුවඳ දැනීමෙහි + ති) ආඝ්‍රාණයකරයි. ගඳ ගණියි.

**සාස** පු-ආහාරය, අනුභවය, ගවයන් අනුභව කරණ තණ.

**සාසච්ඡද**. න-ආහාර හා ඇඳුම් පැලඳුම්.

**සාසන**. න-ආහරය, අනුභවය, කෑම.

**සාසනට්ඨාන**. න-තණබිම, පිට්ටනිය.

**සාසහාරක**. පු-ආහාර ගෙනයන්නා.

**සිණි**. d. භූ-ගහණෙ, ග්‍රහණයෙහි, සිණෙති, ගණියි.

**සිණු**. d. න-දිත්තියං, දීප්තියෙහි, සිණෙති, දිලිසෙයි.

## සු

**සුට්ට**. පු-ඝොෂාව, නාදය.

**සුට**. d. භූ-පරිවත්තනෙ, පෙරළීමෙහි, සුටති. පෙරළෙයි.

**සුණ**. d. භූ-ගමනෙ, ගමනයෙහි, සොණති, යෙයි.

**සුණි**. d. භූ-ගහණෙ, ග්‍රහණයෙහි, සුණෙති, ගණියි.

**සුර**. d. භූ-භීමත්‍ථෙ, භයානකාර්‍ථයෙහි, සුරති. බියඑලවයි, සොර බලනු.

**සුරුසුරු**-සුරුසුරු යන නාදය, එතම් අනුකරණ ශබ්දය.

**සුස**. d. භූ-සද්දෙ, ශබ්දකිරීමෙහි, සොසති, ශබ්දකරයි.

**සුස**. d. චු සද්දෙ, ශබ්දකිරීමෙහි, සොසෙති, සොෂයති, ශබ්දකරයි.

## සො

**සොටක**. පු-අස්කුණ්ඩයා, කුඩා අශ්ව විශෙෂයක්, පෝනි අශ්වයා.

**සොට**. න-ගැසීම, තැලීම.

**සොණ්ඩා**. පු පුවක්ගස.

**සොර**. d. භූ-ගමන් වැලැක්මෙහි, සොරති, ගමන් වලකයි.

**සොර**. පු-භයානක, දරුණු.

(11015)

**ඝොස**. පු-ඝොෂාව, හඬ, ගොපලුගම.

**ඝොසප්පමාණ**. ති-පැතුරුනු කීර්තියක් ඇති

**ඝොසක**. පු-ඝොෂාකරන්නා, ශබ්දකරන්නා.

**ඝොසන**. පු-ඝොෂාකරන්නා, ශබ්දකරන්නා.

**ඝොසනා**. ඉ-උද්ඝොෂණය, උසස්නාදය.

**ඝොසිත**. ති-ඝොෂාකළ, ශබ්දකළ.

**ඝොසෙති**. ක්‍රි-(ඝුස d. භූ ඝොසනෙ, ඝොෂා කිරීමෙහි + ණෙ + ති) ඝොෂාකරයි, ශබ්ද කරයි.

## ච

**ච**. අ-සම්පිණ්ඩන, සමාහාර, අන්වාචය, ඉතරීතරයොග, පදපූරණ, අවධාරණ, ව්‍යතිරෙක, විකල්ප, වාක්‍යාරම්භ, අනුකඩ්ඪනාදියෙහි.

**චක්ක**. d. චු-බ්‍යාඵනෙ, පෙළීමෙහි, චක්කෙති චක්කයති, පෙළයි.

**චක්ක**. න-රථ චක්‍රය, සක්ලකුණ, ධර්මචක්‍රය, උරසක්, ඉරියව්, සම්පත්, සක්රුවන, මණ්ඩලය, සේනාව, කුඹල්සක, ආඥාව, චක්‍රායුධය, දනය, සමූහය.

**චක්ක(ග)ඞ්ග** පු-හංසයා.

**චක්කනන**. පු-තිම්වලල්ල.

**චක්කපාණි**. පු-අතේ චක්‍රයක් ඇත්තා, විෂ්ණු.

**චක්කභෙද**. න-නිදහස හෝ එකඟකම නැති කිරීම.

**චක්කමද්දක**. පු-තුවර.

**චක්කයුග**. න-සක්යුවළ.

**චක්කරතන**. න-චක්‍රරත්නය, සක්විති රජුගේ චක්‍රරත්නය.

**චක්කලක**. න-මණ්ඩලය, මඬුල්ල.

**චක්කලා**. ඉ-හීන්වම්මුතු.

**චක්කලික** න-ජනෙල් තිරය, තිරය.

**චක්කවට්ටක**. න-එනම් ඝටීයන්ත්‍රය.

**චක්කවත්ති**. පු-සක්විති රජ, චක්‍රවර්ති රජ.

**චක්කවනතු**. පු-කොටළුවා.

**චක්කවාක**. පු-සක්වාලිහිණියා.

**චක්කවාල**. පු-චක්‍රවාටය, සක්වල.

**චක්කවහ** සක්වාලිහිණි.

**චක්කසමාරූළ්හ**. ති-ඊර්යාපථ චක්‍රයට නැගී.

**චක්කාඞ්ගී**. පු-කුළුරණ.

**චක්කික**. පු-බොහෝ දෙනා එක්ව චක්‍රව සිට ස්තුති කරණ වන්දීහු, වන්දිභට්ට බලනු.

**චක්කී**. පු-සජියා.

**චක්ඛ**. d. භූ-ව්‍යත්තවචනෙ, ව්‍යකත වචනයෙහි, චක්ඛති, ව්‍යකත ලෙස කියයි.

**චක්ඛ**. d භූ - දස්සනෙ, දැකීමෙහි, චක්ඛති, දකී.

**චක්ඛු**. න-ඇස, බුදුඇස, සමතැස, පැණස, මසැස, දිවැස, ධර්මචක්ෂුස, ශ්‍රොතාපත්ති මාර්ගඥානය.

**චක්ඛුක**. පු-ඇස් ඇත්තා.

**චක්ඛුමන්තු**. පු-ඇස් ඇත්තා, බුදුරජ.

**චක්ඛුචාර**. න-චක්ෂුර්චාරය, චක්ෂුස.

**චක්ඛුල**. පු-චපර ඇස, චපර කර බැලීම.

**චක්ඛුවිඤ්ඤාණ**. න-චක්ෂුර්විඥානය.

**චක්ඛුස්ස**. ති-ඇසට සතුට ගෙණ දෙන.

**චක්ඛුස්සව**. පු-සජියා, සජියාට කන් නොමැත්තේය. චක්ෂුසටම ඇසේ, එහෙයින් චක්ඛුස්සව "චක්ඛුශ්‍රව" යයි කියත්.

**චඞ්කම**. පු-සක්මන, සක්මන් කිරීම.

**චඞ්කමති**. ක්‍රි-(ච + කමු d. භූ. පද වික්කෙපෙ, ගමන්කිරීමෙහි + ති-ති) සක්මන් කෙරෙයි, ගමන් කෙරෙයි.

**චඞ්කමන**. න-සක්මන, යාම, ගමන, පැමිණීම, සක්මන්මළුව.

**චඞ්කමික**. ති-සක්මන් කරණ පුරුද්ද ඇති.

**චඞ්ගවාර**. පු-රහපෙරහන, රාපෙරණ මටුල්ල, ඔරුව.

**චඞ්කොර**. පු-වලිකුකුළා.

**චඞ්ගොටක**. පු-කරඬුව, මඤ්ජුසාව, පෙප්පුව.

**චච්ච**. d. භූ. පරිභාසන, තජ්ජනෙසු, පරිභවයෙහි හා තර්ජනයෙහි "චච්චති" බනී, තැතිගත්වයි.

**චච්ච** d චු - අජ්ඣයනෙ, අධ්‍යයනයෙහි, චච්චති, හදාරයි, උගෙණගණී.

**චච්චති.** ක්‍රි-(චච්ච d. භූ. පරිභාසන තජ්ජනෙසු පරිභවයෙහි හා තර්ජනයෙහි + ති) බණියි.

**චච්චර** න-මිදුල, අඞ්ගනය.

**චජ.** d. භූ පරිච්චාගෙ, පරිත්‍යාගයෙහි, චජති, පරිච්චජති, පරිත්‍යාග කරයි.

**චජන.** න-හැරීම, ත්‍යාගය.

**චජ්ජ.** d. භූ-පරිභාසනෙ, පරිභවයෙහි, චජ්ජති, පරිභව කරයි.

**චඤ්චල.** ති-සැලීම, චලනය, සැලෙන.

**චඤ්චා.** ඉ-පඹයා, විකටරූපය.

**චඤ්චු** d. භූ-ගතියං, ගමනෙහි, චඤ්චති, යෙයි.

**චඤ්චු** න. ඉ කොට, එරඬු.

**චට** d. භූ පරිභාසනෙ, පරිභවයෙහි, චටති, පිරිහෙලයි.

**චට.** d. චු හෙදෙ, බිඳීමෙහි, චටෙති, චටයති, බිඳියි.

**චටක.** පු-ගේකුරුල්ලා.

**චඩි** d. භූ කොපෙ, කොපයෙහි, චණ්ඩති, කිපෙයි.

**චණ.** d භූ-දානෙ, දීමෙහි, චණති. දෙයි.

**චණක.** පු-කඩල, කලතණ.

**චණති.** ක්‍රි-(චණ d. භූ. දානෙ, දීමෙහි + ති) දෙයි.

**චණ්ඩ** ති දැඩි, නොසන්සිඳෙන ක්‍රොධ ඇත්තා, එරඬුගස.

**චණ්ඩ.** d. භූ - චණ්ඩිකෙක, චණ්ඩ බැව්හි, චණ්ඩති, චණ්ඩ වෙයි.

**චණ්ඩ** d චු කොපෙ, කිපීමෙහි, චණ්ඩෙති, චණ්ඩයති, කිපෙයි.

**චණ්ඩක.** ති-සැරපරුෂ, සැඩ,

**චණ්ඩාල.** පු-සැඬොල්, අයොගුල ක්‍රීඩාව, සැඬොලුන්ගේ හණසෙදීම ක්‍රීඩාව.

**චණ්ඩාංශු** ඉ දැඩි රැස් ඇත්තා, හිරු.

**චණ්ඩිභාව** ති-චණ්ඩිබව, දැඩිබව.

**චණ්ඩික්ක.** ති-තරහ, කොප.

**චණ්ඩිසොත.** න-තරහ ගතිය.

**චතන.** ති-හරණ ලද, බැහැර කළ, ඉවත් කළ.

**චත්තාරීස.** ඉ-සතළිස, 40.

**චත්තාරීසක** පු-සතළිසක් ඇති, සතළිස,

**චත** d භූ - යාචනෙ, යාඥවෙහි, චතති, ඉල්වයි .

**චතති** ක්‍රි (චත d භූ. යාචනෙ, ඉල්වීමෙහි + ති) ඉල්වයි.

**චති.** d භූ-හිංසායං, හිංසාවෙහි, චතති, හිංසා කරයි.

**චතු** පු-සතර, හතර, 4.

**චතුක්ක** න-සතරමංසන්ධිය, මාර්ග සතරක් එක්වූ තැන.

**චතුක්කණ්ණ.** න-කන්සතර, කොන්සතර, දෙදෙනෙකුට ගොචර වූ, සතරකන් මන්ත්‍රණය, රහස් කථාව.

**චතුක්කභත්ත.** න - භික්ෂූන් සතර නමකට දෙන දානය.

**චතුක්ඛත්තුං.** අ-සතර වරක්, ඛත්තුං බලනු.

**චතුජ්ජාතිගන්ධ.** පු-සිව්දගඳ, කොකුම්, යොන්පුප්, (සඳුන්මල්) තුවරලා, තුරුක් තෙල් යන සිව් ජාතිය.

**චතුත්ථ** ති-සතරවැනි, සිව්වෙනි.

**චතුත්ථාංස.** පු-චතුර්භාගය, සතරෙන් පංගුව.

**චතුපටිසම්භිදා.** ඉ සිව්පිළිසිඹියා, අර්ථ ධර්ම නිරුක්ති ප්‍රතිභාන යන සතර.

**චතුකහාපණ.** න-කහවණු සතරක්.

**චතුකුණ්ඩික.** ති - සතර ගාතෙන් නැමීම්, දෙදන හා දෙවැලමිට බිම තබාගණ.

**චතුබ්බග්ග** පු - චතුවර්ගය, සිව්දෙනෙකුගෙ සමූහය. ධර්ම අර්ථ කාම මොක්ෂ යන චතුර්වර්ගසම්පත.

**චතුබ්බිධ.** ති-චතුර්විධ, සිව් ආකාර.

**චතුභුජ** පු අත් සතරක් ඇත්තා, විෂ්ණු.

**චතුර්විධනාම.** එකී එකී ලිඟු ඇති විලිඟු ඇති තිලිඟු ඇති නාම හා අලිඟු නාමපද යන සතර.

**චතුර.** ති-දක්ෂ, සමර්ථ, නිපුණ.

**චතුරඞ්ගතම.** පු-චතුරඞ්ග කලුවර, කලුවර පක්ෂයෙහි තුදුස්වක්දින, ඝණ වළාලෑබ, මෙඝය, මධ්‍යම රාත්‍රිය යන අඞ්ග සතරින් යුත් රාත්‍රිය.

**චතුරඞ්ගිනීසෙනා.** ඉ-අඞ්ගසතරකින් යුත් යුධසෙනා, සිව්රඟ සේනාඟ, හස්ති අශ්ව රථ පාබල යන කොටස් සතරින් යුත් සේනාව

**චතුරඞ්ගුල.** පු-ඇසළගස, ඇඟිලි සතර.

**චතුරස්‍ර.** න-කොන් = පැති සතරක් ඇති, කොන් සතරේ ඉතිරි කොට රවුල් කැපීම.

**චතුරස්සර.** න සිව්රැස්, පැතිසතරක් ඇති.

**චතුරානන.** න-මූනුසතරක් ඇත්තා, බ්‍රහමයා.

**චතුරාසව.** පු-කාම, භව, දිට්ඨි, අවිජ්ජා යන ආශ්‍රව සතර,

**චතුරොඝ.** පු කාමොඝ භවොඝ දිට්ඨොඝ අවිජ්ජොඝ යන සතර, ඕඝ බලනු.

**චතුරොපධි.** ඉ-උපධිසතර, චතුරොපධිය.

**චතුවෙසාරජ්ජ.** න-චතුර්වෛශාරද්‍යය, 1. බුදුන් "සම්‍යක් සම්බුද්ධ යෙමි"යි කීකල, නැත; මේ නම් ධර්මයක් ඔබ විසින් අනභිසම්බුද්ධ යයි කියන්නට නිසි මහණෙක්, බමුණෙක්, දෙවියෙක්, මරෙක් සහ බ්‍රහ්මයෙක් ලොකයෙහි නැත. 2. 'ක්ෂීණ ශ්‍රවයෙමි'යි කීකල මෙතෙක් ආශ්‍රවයෝ ඔබ විසින් අපරික්ෂීණ යයි කියන්නට නිසි කෙනෙක් ලෝකයෙහි නැත. 3. මේ ධර්මයෝ ස්වර්ග මොක්ෂයට අනතරාය කරහයි කීකල නැත; කිසි අනතරායකර නොවෙතියි කියන්නට කෙනෙක් ලොකයෙහි නැත. 4. මේ ධර්මයෝ නෛර්‍යාණිකහ යයි කීකල, නැත. මේ ධර්මයෝ අනෛර්‍යාණිකහ යයි කියන්නට නිසි කෙනෙක් ලෝකයෙහි නැත මේ සතර කාරණයෙහි තමන්ගේ විශාරද භාවයත් ප්‍රත්‍යවෙක්ෂා කරණ බුදුන්වහන්සේට උපන් සොම්නස්‍ය ඥානය චතුර්වෛශාරද්‍ය නම්වේ.

**චතුවොකාරභව.** පු-සිව්වැදෑරුම් අරූප සකන්ධයන්ගෙන් යුත් භවය, අරූපලොකය.

**චදි.** d. භු-පීණනෙ, පිණායාමෙහි, චන්දති, පිණවයි, බබලයි.

**චන්ද.** පු-චන්ද්‍රයා, සඳු, හඳ.

**චන්දක.** පු-සඳැස්පිල්, මොනරපිල්ලේ පිහිටි සඳැස්.

**චන්දකන්ත.** පු-චන්ද්‍රකාන්ත පාෂාණය.

**චන්දග්ගාහ.** පු-චන්ද්‍රග්‍රහණය.

**චන්දගි.** පු-සඳරැස්.

**චන්දත්ත.** න-චන්ද්‍රභාවය, චන්ද්‍රයාගේ ගතිය.

**චන්දන.** න-සඳුන්, හඳුන්.

**චන්දනිකා** ඉ-ගම්දොර ගවරවල.

**චන්දපභා.** චන්ද්‍රාලොකය, සඳරැස.

**චන්දභාගා** ඉ දඹදිව පිහිටි එනම් ගංගාව.

**චන්දභාස.** පු-කඩුව.

**චන්දමාලා.** ඉ-එත්සාල්.

**චන්දසෙඛර.** පු චන්ද්‍රශෙඛර, ඊශ්වරයා.

**චන්දිකා.** ඉ-චන්ද්‍රප්‍රභාව, සඳරැස.

**චන්දිමන්තු.** පු-චන්ද්‍රයා.

**චන්දිමසූරිය.** පු-සඳ හිරු දෙදෙනා.

**චන්දිමා.** පු-චන්ද්‍රයා, චන්දිමන්තු.

**චනං** අ-අසම්ග්‍රහණයෙහි.

**චනක.** පු-කඩල.

**චන.** d. භූ-හිංසායං, හිංසාවෙහි, චනති හිංසා කෙරෙයි.

**චනති.** ක්‍රි (චන d. භූ. හිංසායං, හිංසාවෙහි +ති) හිංසා කරයි.

**චප.** d භූ-සාන්ත්වනෙ, නැලවීමෙහි, චපති, නලවයි, සනසයි.

**චප** d. භූ-සාන්ත්වනෙ නැලවීමෙහි.

**චපති** ක්‍රි-(චප d. භූ සාන්ත්වනෙ, නැලවීමෙහි+ති) නලවයි.

**චපල** ති-අවිනිශ්චිත ක්‍රියා කරන්නා. චංචල, ශීඝ්‍ර රසදිය.

**චපලා** ඉ-වගපුල්.

**චමි.** d චු ගතියං, යාමෙහි, චමෙපති යෙයි.

**චමු.** න-තොල් ගැටීමේදී ඇතිවන ශබ්දයක්.

**චබ්බ.** d. භූ-අදනෙ, කෑමෙහි, චබ්බති, කයි.

**චම්ප.** පු-සපුගස.

**චම්පක**. පු-සපුගස.

**චම්පා**. ඉ-එනම්නුවර.

**චම්පෙති**. ක්‍රි-චපි d භූ. ගතියං. යැමෙහි + ති, යෙයි.

**චම්පෙය්‍යක**. පු-චම්පා නුවර වැසියා.

**චම්බ**. d. භූ-අදනෙ කෑමෙහි, චම්බති අනුභව කරයි.

**චම්බති**. ක්‍රි-චම්බ. d. භූ. අදනෙ, කෑමෙහි + ති, අනුභව කරයි.

**චම්ම**. න. සම, පලිහය, පලග.

**චම්මක** න. සම්කඩ, සම්කැබැල්ල.

**චම්මඛණ්ඩ**. න. සම්කඩ, පත්කඩය.

**චම්මකාර**. පු-සොම්මර, සම්වලින් වහන් ආදිය සාදන්නා.

**චම්මපසිබ්බක**. න-සම්පයිය, සම්පසුම්බිය.

**චම්මයොනි**. ඉ-රත්නභූත චර්මයට ප්‍රභව වූ මෘගයෝ.

**චම්මි**. ඉ. රුක් බුරු ද.

**චම්මාවුත**. පු-සමින් වළඳනා ලද, සමින් වසන ලද.

**චම්මසාඨක**. න-තපසුන් විසින් අඳින සම් වලින් සාදා ගත් වස්ත්‍ර.

**චමර**. පු-සෙමරා, උත්තරාපථයෙහි ප්‍රසිද්ධ මහිෂාකාර මෘග කොටසක්, උතුමන් ඉදිරියෙහි පවන් සැලීමට ගත්තේ මේ සෙමරාගේ වාලධිය යි. ටිබැට් රටේ ඇති යැක් නම් ගවයා.

**චමරික**. පු-කොබෝලීල.

**චමරී**. පු-සෙමෙර මුවා.

**චමු**. d. භූ-අදනෙ, කෑමෙහි, චමති, කයි.

**චමු**. d. චු ධොවනෙ, සෙදීමෙහි – ආවමෙති ආචමයති, සෝදයි.

**චමූරු**. පු-රත්නභූතචර්මයට යොනිවූ මෘගයා, රත්වන් මෘගයෙක්.

**චමූ**. ඉ-සේනාව.

**චමූපති**. පු-සෙනාපතියා, සෙනෙවියා.

**චය**. පු-බන්ධනය, රාශිය.

**චර**. d. භූ-ගතියං, යාමෙහි, චරති, යෙයි.

**චර**. පු-චරපුරුෂයා, ඔත්තුකාරයා ජඞ්ගම, හැසිරීම.

**චරක**. පු-දූතයා.

**චරණ**. න-හැසිරීම, පාදය.

**චරති**. ක්‍රි-(චර d. භූ. චර, චරණ, හැසිරීමෙහි + ති) හැසිරෙයි.

**චරණායුධ**. පු-පාදය ආයුධකොට ඇත්තා, කුකුළා.

**චරහි**. අ-එවිට, ඒනිසා, දූත්, "කථං චරහි ජානෙමු."

**චරාචර**. ති-ජඞ්ගම වස්තු විදිනා සත්ව වර්ගයා

**චරාපෙති**. ක්‍රි (චර d. භූ. චරණෙ, හැසිරීමෙහි + ණාපෙ + ති) හසුරුවයි, ඇවිදීම කරවයි.

**චරිත**. ති-චරිතය, සවභාවය හැසිරෙන ලද, ගතිය.

**චරිතක**. න-චය්‍යාව, හැසිරීම.

**චරිම**. ති-පසුවූ (දෙය). අනතිමය, අවසානය.

**චරිමක**. පු-අවසත්, කෙළවර.

**චරිමකචිත්ත**. න-අන්තිම සිත (-චරිමක විඤ්ඤාණය)

**චරිය**. න-හැසිරීම, චය්‍යාව, තත්වය.

**චරියමනුස්ස**. පු-චරපුරුෂයා.

**චරියාපිටක**. න-ඛුද්දකනිකායේ අන්තිම පොත.

**චරු**. න යාගද්‍රව්‍ය පිසීම, යාගයෙහි පිසූ කිරිබත.

**චල**. d. භූ-චලනෙ, සැලීමෙහි, චලති සෙලවෙයි.

**චල**. ති-චඤ්චල, සෙලවීම.

**චලක**. පු-යුධසෙනාවන් පිළියෙල කරන්නා, සේනා වින්‍යාසය කරන්නා.

**චලති**. ක්‍රි-(චල d. භූ. චලනෙ, සෙල වීමෙහි + ති) සෙලවෙයි.

**චලන**. න-සෙලවීම්, චලනය.

**චල**. ති-සෙලවෙන, චංචලවන, වෙව්ලන.

**චලනී**. පු-චාත මෘගයා.

**චලාචල**. ති-එහාට මෙහාට සෙලවෙන.

(11203)

**චලදල.** පු-චඤ්චලපත්‍ර, ඇසටු ගස.

**චලිත.** ති-සැලෙන ලද, සෙලවෙන ලද.

**චවති** ක්‍රි-(චු d. භූ. චවනෙ, චුත වීමෙහි + උ = ඔ = අව + ති) චුතවෙයි. මැරෙයි.

**චවන.** න-චුතවීම, මරණය.

**චවනතා.** ඉ-චුතවීම්බව, මැරෙණබව.

**චෂක.** පු. න-පාන පාත්‍රය, රා බොන ඔඩම, රා කෝම්බය.

**චළික.** න-සපාදූමු ආහාරය, සපය.

## චා

**චාග.** පු-දානය, අගාණිය, තැගි.

**චාගාධිට්ඨාන.** න-ත්‍යාගාධිෂ්ඨානය.

**චාගානුස්සති.** ඉ-ත්‍යාග ගැණ සිහිකිරීම, ත්‍යගානුස්සතිය.

**චාගී.** ති-තැගි කරන්නා, ත්‍යාගියා, දායකයා.

**චාටි.** ඉ-සැලිය, හැලිය.

**චාටුකම්‍යතා.** ඉ-රවටන කැමැත්ත, කපටි අදහස.

**චාටු.** රැවටිල්ල, කපටි.

**චාතක.** පු-කෑදෑත්තා.

**චාතුද්දස.** පු-තුදුස, දස සතර.

**චාතුද්දීපික.** ති-සතර මහත් දීපයට අයත්, සතර මහත් දීපයෙහි පවත්නා.

**චාතුද්දීපිකමෙඝ.** පු සතර දීපයෙහි පවත්නා වර්‍ෂාව.

**චාතුම්මහාරාජික.** පු-සිව්මහරජය, සිව් මහ දෙව්රජුන් වසන දෙව්ලොව.

**චාතුරන්ත.** න-සිවු කෙළවර

**චාතුරිය.** න-දක්‍ෂකම, නුවණැති බව.

**චාප.** පු-දුන්න, ධනුව.

**චාපකොටි.** න-දුනු කෙළවර.

**චාපල්‍ය.** න-චපල බව, අස්ථිර භාවය.

**චාපලසුන.** න-සුදුලූනු වර්ගයක්.

**චාපල්ල.** න-චාපල්‍ය, චපල බව.

**චාමර.** න-සෙමර වාලධියෙන් කළ විජිනිපත.

**චාමීකර.** න-රත් හඳුන්.

**චාය.** d. භූ-සම්පූජනෙ, පිදීමෙහි, චායති, ආචායති පුදයි.

**චායති.** ක්‍රි-(චාය d. භූ. සම්පූජනෙ, පිදීමෙහි + ති) පුදයි.

**චාර.** පු-හැසිරෙන්නා, හැසිරීම.

**චාරක.** පු-හැසිරෙන්නා, සංචාරණය කරන්නා

**චාරණ.** න-හැසිරීම.

**චාරණික.** පු-කෝලම් නැටුම.

**චාරි.** පු. හැසිරෙන්නා.

**චාරිත්ත.** න-චාරිත්‍රය, මනා හැසිරීම.

**චාරිකා.** ඉ. හැසිරීම. සංචාරය.

**චාරු.** පු-ස්වර්‍ණය, රත්රන්.

**චාරු.** ති-සුන්දර, මනා යහපත්.

**චාරෙති.** ක්‍රි-(චර d. භූ-චරණෙ, හැසිරී-මෙහි ණෙ + ති) හසුරුවයි, හැසිරෙයි.

**චාවන.** න-චුතවීම, මරණය.

**චාවෙති.** ක්‍රි-(චු d. භූ. චවනෙ, චුතවීමෙහි උ = ඔ = අව + ණෙ + ති) චුත කරවයි.

## චි

**චි.** d. භූ. චයෙ, රැස්කිරීමෙහි, චිනාති, රැස් කරයි.

**චි.** d. සු- චයෙ, රැස්කිරීමෙහි, චිණො-(නො) ති, රැස් කෙරෙයි.

**චි.** d. කි-චයෙ, රැස්කිරීමෙහි, චිනාති විචිනාති රැස් කෙරෙයි.

**චි.** අ-අසම්ග්‍රහණයෙහි, සමහර, ඇතැම්.

**චික්ඛ** d. භූ - වාචෙ, කිරීමෙහි, චික්ඛති - ආචික්ඛති, කියයි.

**චික්ඛල්ල.** න-මඩ කලල.

**චිකිච්ඡති.** ක්‍රි-පිළියම් කරයි, බෙහෙත් කරයි.

**චිකිච්ඡන.** න-පිළියම්කිරීම, රෝගයට බෙහෙත් කිරීම.

**චිකිච්ඡිත**. ති-පිළියම්කළ, බෙහෙත්කළ.

**චික්ඛති**. ක්‍රි-කියයි-චික්ඛ බලනු.

**චික්ඛන**. න-කීම.

**චික්ඛිත**. ති කියන ලද, කියූ.

**චිඤ්චා**. ඉ-සිංඹලා. සිනිඹලා.

**චිඞ්ගුල**. d. චු-පරිබ්භමෙ කරකැවීමෙහි, චිඞ්ගුලායති, කරකැවෙයි.

**චිඞ්ගුලක**. න-කරකැවීම, තල්පත් කඩදාසි ආදියෙන් කළ හුලන් පෙත්ත, මෙය ඉරටුවක සවිකරගත්විට වාත වේගයෙන් කරකැවේ.

**චිඞ්ගුලායති**. ක්‍රි-චිඞ්ගුල-d. චු. පරිබ්භමෙ, කරකැවීමෙහි. (චිඞ්ගුල + ආයති) කර-කැවෙයි.

**චිච්චියති**. ක්‍රි. (චිඞ්ගුල + ණය + ති) කර-කැවෙයි.

**චිච්චිටායන**. න-චිච් චිට යන අනුකරණ ශබ්ද කරණ.

**චිච්චිටායති**. ක්‍රි-(චිච්චි, චිට + ආයති) චිච්, චිට යන ශබ්ද කරයි.

**චිට**. d භූ-අක්කොසෙ, පෙසනෙ, අක්‍රොශයෙහි, යැවීමෙහි. චෙටති, අක්‍රොශ කරයි. යවයි.

**චිට**. d භූ උත්තාසෙ, තැතිගැන්වීමෙහි චෙටති බියගන්වයි.

**චිණ්ණ** පු-පුරුදුකළ ආචීර්ණ.

**චිණ්හ**. න-සලකුණ, ලකුණ.

**චිත්ත** පු-පණත, බක්මස.

**චිත්ත** න-සිත. සිතුයම විචිත්‍ර, කබුරුවන් පැහැය.

**චිත්තක** පු රත්නිටුල්, එරබදුගස.

**චිත්තක**. න-තිලකය.

**චිත්තකථික**. පු-විසිතුරු කථා ඇත්තා, චිත්‍ර කථිකයා.

**චිත්තකම්ම**. න-සිතුවම, චිත්‍ර කර්මය.

**චිත්තකා**. ඉ-න-වීමෙන් විසිතුරු එළලොම් ඇතිරිය.

**චිත්තකාර**. පු-සිත්තරා, සිතුයම් කරන්නා, සිත්තරු.

**චිත්තකූට**. පු-එනම් පර්වතය, සිතුකුළුපව්.

**චිත්තක්ඛර**. න-විසිතුරු අකුරු.

**චිත්තත්ත**. න-සිතෙහි සවභාවය, සිතේ ආකාරය.

**චිත්තපණ්ණී**. ඉ-පුස්වැන්න.

**චිත්තපීලා**. ඉ-මූර්ඡාව, සිහිමුළාව.

**චිත්තභාවනා** ඉ-සිත්භාවනාව.

**චිත්තමාස** පු බක්මාසය.

**චිත්තරූප**. න-විසිතුරු රූපය, සිත පිරීම.

**චිත්තලතා**. ඉ-ශක්‍රයාගේ එනම් උයන.

**චිත්තවිබ්භම**. පු-චිත්තවිභ්‍රමය වියරුව, උමතු වීම.

**චිත්තවිවෙක**. පු සිතට විවේකය.

**චිත්තසිබ්බන**. න-විසිතුරු මැහීම.

**චිත්තා**. ඉ-සිත නැකත.

**චිත්තාභොග**. පු මෙනෙහි කිරීම.

**චිත්ති** ඉ-විචිත්‍රය, විසිතුර.

**චිත්තිකා**. ඉ වීමෙන් විසිතුරු ඇතිරිය.

**චිත්තීකාර**. පු ගරුකිරීම, බුහුමන් කිරීම,

**චිත්තිත**. ති අලංකාර කළ, චිත්‍රකම් කළ,

**චිත්‍ර** ති-විසිතුරු, විචිත්‍ර.

**චිත්‍රතණ්ඩුලා**. ඉ-වලඟසාල්.

**චිත්‍රභාණු** පු වහ්නිය, සූර්යයා.

**චිත්තෙකග්ගතා**. ඉ-චිත්තෙකාග්‍රතාව, සිත එකඟ බව.

**චිත** d භූ-සඤ්ඤාණෙ, සිතීමෙහි චින්තයති, සිතයි.

**චිත** d චු-සඤ්චෙතනෙ, සිතීමෙහි චෙතෙති, සිතයි.

**චිත**. d. තු-සංචේතනෙ, සිතීමෙහි, සමෘතියෙහි චෙතයති, සිතයි.

**චින්ත**. d. චු චින්තායං, සිතීමෙහි, චින්තෙති, සිතයි.

**චිති** d චු. සඤ්ඤාණෙ, සිතීමෙහි, චෙතති, සිතයි.

**චිත්ත** d චු චිත්තීකරණෙ, විසිතුරු කිරීමෙහි චිත්තෙති, චිත්තයති, විචිත්‍ර කෙරෙයි.

**චින්ත** d. චු චින්තායං සිතීමෙහි, චින්තෙති, චින්තයති, සිතයි.

**චින්තන**. න-සිතීම, චින්තනය.

(11306)

**චින්තක** පු-සිතා බලන්නා, සිතන්නා.

**චින්තනක**. ති හැඟීම් සහිත, සිතීම් සහිත,

**චින්තාමණි**. ඉ- චින්තාචාර දනගන්නා ගන්ධාර රට පැවති විද්‍යාවක්, සිතුමිණි රුවන චින්තාමාණික්‍යය.

**චින්තා**. ඉ. සිතීම, සිතිවිල්ල.

**චින්තිත** ති සිතනලද, සිතූ.

**චිනාති**. ක්‍රි-චි d භූ. චයෙ, රැස්කිරීමෙහි + ති රැස් කෙරෙයි.

**චින්ති**. ඉ-සිතන්නා, සිහිකරන්නා

**චින්ති**. ක්‍රි-(d. චු චින්තායං. සිතීමෙහි + ණෙ + ති) චින්තෙති සිතයි.

**චිමිලික**. න-භූමියෙහි ඇතිරිම.

**චිරං** අ-බොහෝ කල් යනාපියෙහි, දීර්ඝ කාලයක්.

**චිරක්‍රිය** පු-පටන්ගත් ක්‍රියාවෙහි කාලක්‍ෂෙප කරන්නා.

**චිරදිට්ඨ** ති-දක්නාලද, බොහෝ කල් ඇති.

**චිරන්තන** ති-පරණ=පුරාණ.

**චිරන්තනික**. ති-පුරාතනයින්ට අයිති, පෞරාතික.

**චිරපවික**. න-බොහෝකල් පටන්.

**චිරරත්තාය**. අ-චිරකාලාපියෙහි, දීර්ඝකාලයක්

**චිරස්සං** අ-චිරකාලාපියෙහි, බොහෝ කාලයක්

**චිරාතීත** පු-බොහෝකල් අතික්‍රාන්ත.

**චිරායති**. ක්‍රි. (චිර d. භූ. ඛෙපනෙ, ගෙවීමෙහි, + ආය + ති) කල්යවයි, කල්ගතකෙරෙයි.

**චිරායන**. න කල්ගත කරණ. කල්යවන.

**චිරායුක**. පු-චිරායු ඇත්තා, දෙවියා.

**චිරෙන** අ-චිරකාලාපියෙහි, බොහෝකලකින්.

**චිරබිල්ල**. පු-කරඳ, මඟුල් කරඳ.

**චිරි**. d. සවා-හිංසායං, හිංසාවෙහි, චිරුණාති, හිංසා කරයි.

**චිල**. d. භූ අවඡාදනෙ, ඇඳීමෙහි, චිලති, වස්ත්‍ර හඳියි.

**චිල** d. චු-අවඡාදනෙ, ඇඳීමෙහි, චිලෙති, චිලයති, අඳියි.

**චිල්ල**. d භූ-සිථිලකරණෙ. ලිහිල් කිරීමෙහි, චිල්ලති බුරුල් කෙරෙයි.

**චිල්ලක**. න-ඇණය කණුව,

**චිලිමිකා** ඉ-තල්, කිතුල් කොළ ආදියෙන් කළ බුමුතුරුණු, රෙදි වර්ගයක්.

**චිණ්හ**. **චින්හ**
**චිණ්හ**. **චිහ්න** } න. සලකුණ. ලකුණ.

## චී

**චීන**. න=එනම් රට, චීන දෙසය.

**චීනක** ති-චීන දෙශයට අයත්, චීනයෙහිවූ.

**චීනපිට්ඨ**. න-සින්දූරම්, සින්දූර සුණු.

**චීයති** ක්‍රි-(චි d. භූ. චයෙ රැස්කිරීමෙහි ය + ති) රැස් කෙරෙයි.

**චීර**. න-තිරු, ඉරු.

**චීරක**. ති. තිරු ඇති. තිරු ඇතිකොට.

**චීරකවාසික**. න-වැහැරි සිවිරු.

**චීරකවාසිකකම්ම**. න. ශරීරයෙහි සම ගලවා වැහැරි වස්ත්‍රමෙන් කරණ වධයක්.

**චීරි**. ඉ-සීරු, රැසියා, රැහියා.

**චීරිය**. පු-සීරු, රැසියා.

**චීරිලිය** පු-රැසියා, චීරිළිකාබලනු 699.

**චීව**. d. චු-දිත්තියං, භාසනෙ බැබලීමෙහි, කීමෙහි, චිවෙති චිවයති, බබලයි, කියයි.

**චීවර**. න-සිවුර, භික්‍ෂූන්ගේ චීවරය.

**චීවරපටිග්ගාහක**. පු-සිවුරුලබන්නා.

**චීවරපවිවෙක**. පු-සිවුරු පිළිබඳ උතුම් විවේකය.

**චීවරසංකමනීය**. න-සිවුර අයිති තැනැත්තාට දීම.

**චීරිළිකා**. ඉ-රැසියා, චීරිලිය 579. (අඞ්ගුත්තර නිකාය)

## චු

**චු** d. භූ-චවනෙ, චුතවීමෙහි, චවති, චුතවෙයි.

**චු**. d. චු-සහනෙ, ඉවසීමෙහි, චාවෙති චාවයති. ඉවසයි.

**චුචුක**. න-නිකට, අධරෝෂ්ඨයෙන් යටභාගය.

**චුච්චු**. ඉ-මූල්පලා.

(11359)

**චුක්ක**. d. චු-ව්‍යථනෙ, පෙළීමෙහි, චුක්කෙති චුක්කයති, පීඩාකරයි.

**චුජ්ජන**. න-චෝදනාකිරීම, චෝදනාව.

**චුට**. d භූ-අප්පකෙ, ස්වල්පභාවයෙහි, චොටති මඳවෙයි.

**චුට**. d භූ-ඡේදනෙ, සිඳීමෙහි, චුටති සිඳියි.

**චුට**. d. චු ඡේදෙ, සිඳීමෙහි, චුටෙති, චුටයති සිඳියි.

**චුට්ට**. d. චු මන්‍දෙ, ස්වල්පයෙහි, චුට්ටෙති, චුට්ටයති, අල්පවෙයි, මඳවෙයි.

**චුවි**. d. චු ඡේදනෙ, සිඳීමෙහි, චුණෙති, චුණයති, සිඳියි.

**චුණ්ණ**. d චු-චුණ්ණනෙ, සුණුකිරීමෙහි, චුණ්ණෙති, චුණ්ණයති, සුණුකරයි.

**චුණ්ණ**. පු, න-චත්සුණු, සුණු ධූලි, රේණු.

**චුණ්ණපිණ්ඩ**. න-කුඩු පිඩ.

**චුණ්ණක**. ති-සුණු, සුණුවීම ඇති.

**චුණ්ණචාලිනී** ඉ-සුණුකරණ යන්ත්‍රය.

**චුණ්ණෙති**. ක්‍රි-(චුණ්ණ d. භූ - පෙරණෙ, ණෙ + ති) සුණුකිරීමෙහි, සුණුකෙරෙයි.

**චුණ්ණිත**. ති සුණුකළ කුඩුකරණ ලද.

**චුණ** d. භූ-ඡේදනෙ, සිඳීමෙහි චුණති, චොණති, සිඳියි.

**චුණ**. d. චු-කුච්චනෙ, හැකිලීමෙහි, චුණෙති, චුණයති, හැකිළෙයි.

**චුත**. ති-ගිලිහුණු; ගැලවුණු, කාලක්‍රියාකළ.

**චුත**. d. භූ-සෙවනෙ, වැගිරීමෙහි, චොතති, වැගිරෙයි.

**චුති**. ඉ-චුතිය, මරණය, චුතවීම.

**චුතූපපාත**. න චුතිය හා උපපත්තිය.

**චුතූපපාතඤාණ**. න-චුති උත්පත්ති දැනගන්නා නුවණ.

**චුද්දස**. න-තුදුස, දස සතර, 14.

**චුද**. d. චු-දෙසාවිකරණෙ, දෙස් පහළ කිරීමෙහි, චොදෙති, චොදයති, චොදනා කරයි.

**චුද**. d. චු-නුදෙ, දැමීමෙහි, මෙහෙයීමෙහි, චොදෙති, චොදයති, දමයි, මෙහෙයයි.

**චුදිත** ති=චොදනා කරණ ලද, චොදනා ලබන්නා, විත්ති පක්ෂය.

**චුන්‍ද**. පු-ඇත් දත් වලින් වැඩ කරන්නා.

**චුන්‍දකාර**. පු-ලීයන වඩුවා, හමකාරයා.

**චුන්‍දභණ්ඩ**. න-චුන්‍ද කාරයාගේ බඩු, ලීයන පට්ටලේ උපකරණ.

**චුප**. d. භූ-මන්‍ද ගමනෙ, ලැසි ගමනෙහි, චොපති, ලස්වයයි.

**චුබි**. d. භූ-වදන සංයොගෙ, මුහුණු සංයොග වීමෙහි, චුම්බති, සිඹියි.

**චුම්බ**. d-චුම්බනෙ, ඉඹීමෙහි, චුම්බති, සිඹියි.

**චුබුක**. න-නිකට.

**චුම්බට**. න-දරණුව, කොට්ටය.

**චුම්බටක**. න-සුඹුළුව, දරණුව.

**චුම්බති**. ක්‍රි-(චුම්බ d. භූ. චුම්බනෙ, සිඹීමෙහි + ති) සිඹියි. (චුම්බ + තී)

**චුර**. d. චු-ථෙය්‍යෙ, සොරකම් කිරීමෙහි, චොරෙති, චොරයති, සොරකම් කෙරෙයි.

**චුල්ල**. ති-සුළු, කුඩා.

**චුල්ල**. d. භූ-ශෘඞ්ගාර ලීලාවෙහි, චුල්ලති, ශෘඞ්ගාර ලීලා කරයි.

**චුල්ලසීල**. න-පඤ්චසීලාදී කුඩා සීලය.

**චුල්ලාසීතිකල්ප**. පු-සුළු අසූ කල්පයක්.

**චුල්ලී**. ඉ-උඳුන, ලිප.

**චුල** d. භූ-මද්දනෙ, මැඩීමෙහි, චොලති, මඩියි, සොලවයි

**චුල**. d. චු නිමුජ්ජනෙ, ගැලීමෙහි, චොලෙති, ගිලෙයි.

**චූචුක**. න-තන පුඩුව, පයොධරාග්‍රය.

(11404)

## චූ

**චූත**. න අඹගස.

**චූස**. d. භූ-පාතෙ, පානයෙහි, චූසති, පානය කරයි.

**චූළනියලොකධාතු**. ති-දහසක් සක්වල.

**චූළනිකා**. ඉ-කුඩා, සුළු, "සහස්සි චූළනිකා ලොකධාතු"

**චූළා**. පු. ඉ චූඩා, බඩ කෙශය, කොණ්ඩය, වොටුන්න, මොනරකුඩුම්බිය, හුනිඳ.

**චූළාමණි**. ඉ චූඩා මාණික්‍යය, සිළුමිණ, ඔටුනුමිණ.

**චූළිකා**. ඉ හස්තීන්ගේ කණ මුල

**චූළොදර**. න-කුඩා බඩ, එනම් ඇත්තා.

## චෙ

**චෙ**. අ-ඉදින්, සංයොගයෙහි.

**චෙට**. d. භූ-ඊහායං, උත්සාහයෙහි, චෙටති, උත්සාහ කරයි.

**චෙටක**. පු-දාසයා, මෙහෙකාරයා.

**චෙටච**. පු. ක්‍රි-දූත, දූතගණ.

**චෙටි**. ඉ-දාසිය, මෙහෙකාරි.

**චෙත**. න-සිත, මනස, විඥාණය.

**චෙතක**. පු-සේ මුව, සේ වටු ආදීහු.

**චෙතකී**. ඉ-අරළු.

**චෙතනා**. ඉ සිතිවිල්ල, ප්‍රඥාව.

**චෙතස**. පු-හොඹු මඟ.

**චෙතසික** පු සිතෙහි හටගත්, සිතිවිලි.

**චෙතසො**. පු. ක්‍රි සිතා.

**චෙතාපන**. න-සිතීම.

**චෙතාපෙති**. ක්‍රි-(චිති + ණපෙ + ති) සිතවයි.

**චෙතෙති**. ක්‍රි-(චිති + ණෙ + ති) සිතයි. චිති බලනු.

**චෙතියද්දුම**. පු චෛත්‍ය වෘක්ෂය, පූජ්‍ය වෘක්ෂය.

**චෙතො** න-සිත.

**චෙතො විමුත්ති**. ඉ චිත්තවිමුක්තිය.

**චෙතො සමාධි**. ඉ චිත්තසමාධිය, සිතේ එකඟකම.

**චෙල**. d. භූ-සංචලනෙ, චලනයෙහි, චෙලති, සැලෙයි.

**චෙල**. න-වස්ත්‍රය, සෙලේ.

**චෙලක**. පු-යුඩයෙහි ජය ධවජය ගෙණ ඉදිරියෙහි යන තැනැත්තා, යුඩයෙහි කොඩිකාරයා.

**චෙලපතතික**. න-රෙදි පිළවිලි.

**චෙලාපක**. පු-කුරුළු වර්ගයක්, කොක් ජාතියක්.

**චෙලාඝුඩ**. න-චෙලායුධය.

**චෙලු**. d භූ-ගමනෙ, යාමෙහි, චෙලති, යයි.

## චො

**චොක්ඛ**. ති-පවිත්‍ර, පිරිසිදු.

**චොච**. පු-ඇටිකෙසෙල්.

**චොදක**. පු-චොදනා කරන්නා, පැමිණිලිකාරයා.

**චොදන**. න-නියොගය, ඇනවීම.

**චොදනා**. ඉ-චොදනා කිරීම, පැමිණිලි කිරීම.

**චොදිත**. ති-චොදනාකළ

**චොදෙති**. ක්‍රි-(චුදි d භූ. චොදනෙ, චොදනා කිරීමෙහි + ණෙ + ති) චොදනා කරවයි.

**චොර**. පු-සොර.

**චොරිකා**. ඉ-සොරකම, සොරා.

**චොරී**. ඉ-සෙර, සොරකම් කරණ ස්ත්‍රිය.

**චොල**. න-රෙදි වස්ත්‍ර.

**චොලක**. වස්ත්‍ර, රෙදි.

**චොලභිසි**. ඉ-රෙදිවලින් කළ බිස්ස.

## ඡ

**ඡ**. සය, 6.

**ඡක්ක**. පු-සදෙනෙකුන්ගේ සමූහ කරුණු ඇතුළත්.

**ඡකණ**. න-ගූථය, අසූචි.

**ඡකන**. න-අස්බෙටි ආදිය.

**ඡකල**. පු-එළුවා.

**ඡකලක**. පු-එළුවා, තිරළුවා.

**ඡක්ඛත්තුං**. අ-සවරක්, සයවිටක්, සවාරයක්.

**ඡග්ගණ්ඩා**. ඉ-වදකහ.

**ඡජ්ජ**. පු-එනම් හඬ, නාසය, බොටුව, තල්ල, ලය; දිව, දත් යන සතැන ඇසුරුකොට උපදනා සවර විශෙෂය.

**ඡඩ්ඩ**. d. චු-ඡඩ්ඩනෙ, දැමීමෙහි, ඡඩ්ඩෙති, ඡඩ්ඩයති, දමයි.

**ඡඩ්ඩක**. පු-දමන්නා, ප්‍රක්‍ෂෙප කරන්නා.

**ඡඩ්ඩන(ණ)**. න-දැමීම, ඉවත දැමීම.

**ඡඩ්ඩිත**. ති-දමන ලද, වීසි කළ.

**ඡඩ්ඩෙති**. ක්‍රි-(ඡඩ්ඩ. d. භූ. ඡඩ්ඩනෙ, දැමීමෙහි + ණෙ + ති) දමයි.

**ඡණ**. පු-උත්සවය, සැණකෙළිය.

**ඡණක**. න-කඩල පැලය.

**ඡතණ්හාකාය**. ෂට්විධ තෘෂ්ණා සමූහය.

**ඡත්ත**. න-කුඩය, ඡත්‍රය, ශරීරය.

**ඡත්තපණ්ණ**. පු-රුක් අත්තන.

**ඡත්තක**. පු-අව්ව ආවරණය, කුඩය.

**ඡත්තපථ**. පු-භූමිය ස්පර්ශකොට යා නොහැකි වාලුකා කාන්තාරාදියෙහි කුඩයක එල්ලී යා යුතු බැවින් එය ඡත්තපථ නම් වේ.

**ඡත්‍ර**. න-සැත, කුඩය.

**ඡද**. d. චු-සංවරණෙ, සංවරණයෙහි, ඡාදෙති, ඡාදයති, ආවරණය කරයි.

**ඡද**. න-පත්‍රය, පක්‍ෂි විශෙෂයක්.

**ඡද්ද**. d. චු-වමනෙ, වැමැරීමෙහි, ඡද්දියෙහි, ඡද්දෙති, ඡද්දයති, වමාරයි, ඔක්කාර කරයි

**ඡද්ද**. න සෙවෙනිය, ඡදනය, පියස්ස වහලය.

**ඡද්දන්ත**. පු-එනම් ඇත් කුලය, එනම් විල, සදත්

**ඡද්දිකා**. ඉ-ඡද්දිකාව, වමනය, ඔක්කාරය.

**ඡදි**. d. භූ-බලෙ, ශක්තියෙහි, ඡන්දති, බල ඇති කරයි.

**ඡදි**. d. චු-ඉච්ඡායං, කැමැත්තෙහි, ඡාදෙති, රුචි වෙයි.

**ඡධා**. සපරිද්දකින්, ෂට් ප්‍රකාරයකින්.

**ඡන්ද**. පු-තෘෂ්ණාව, ඡන්දස, අභිප්‍රාය, සන්තක බව, රුචිය, ඉච්ඡාව, අක්‍ෂර ප්‍රමාණ වූ ඡන්දස.

**ඡන්ද**. d. චු-ඉච්ඡායං, රුචියෙහි, ඡන්දෙති, ඡන්දයති, ඉච්ඡා කරයි, රුචි වෙයි.

**ඡන්ද**. න-ඡන්දස.

**ඡන්දස**. පු-බ්‍රාහමණයා.

**ඡන්දසා**. ඉ-ඡන්දස.

**ඡන්දික**. පු-ඡන්දය ඇති, රුචිය ඇති.

**ඡන්දරාග**. පු-බලවත් රාගය, අයුතු රාගය.

**ඡන්දසමාධි**. ඉ-ඡන්දය ප්‍රධාන කොට පැවති සමාධිය.

**ඡන්දාගති**. ඉ-ඡන්දයෙන් අගතියට යාම.

**ඡන්දාගමන**. න-ඡන්දයෙන් පැමිණීම

**ඡන්දොවිචිති**. ඉ-ඡන්දශ්ශාස්ත්‍ර නම් වූ වෙදාඞ්ගය. කප්පය, ව්‍යාකරණය, ජොතිසත්ථය, සික්ඛාය, නිරුත්තිය, ඡන්දොවිචිති යනු වෙදාඞ්ගයයි.

**ඡන්න** ති-අනුරූප, වසන ලද්ද, සඟවන ලද්ද, හැඟීම, පෙරවීම, රහස.

**ඡන්නවුති පාසණ්ඩ** 133 පිට. පද සාධන ටීකාව.

**ඡන්න** පු-පනත, එනම් ඇත්තා

**ඡප්පද**. පු-පාද සයක් ඇත්තා, බඹරා.

**ඡප්පක**. පු-පහත් කුල ඇත්තා.

**ඡබ්බග්ගිය**. පු-ෂට්වර්ගිය, සදෙනෙකුන්ගෙන් යුත් සමූහය.

**ඡම්පා**. ඉ-එනම් රට.

**ඡම්භී**. ඉ-උත්‍රාසය, තැතිගැන්ම.

**ජමහිත**. ති-තැතිගන්නා ලද, බියවන ලද.
**ජමහිතතා**. න-තැතිගැණීම් බව.
**ජමහී**. ති - තැතිගත්තහු, උත්‍රාස ඇති.
**ජම**. d. භූ-ගමනෙ, යාමෙහි, ජමති, යෙයි.
**ජමු**. d. භූ-ආදනෙ, කෑමෙහි, ජමති, කයි.
**ජමු**. d. තු-තිකුගං, තිකුවෙයි.
**ජමු**. d. භූ-අදනෙ, කෑමෙහි, ජමති, අනුභව කරයි.
**ජමා**. ඉ-භූමිය, පෘථිවිය.
**ජර**. d. භූ-ඡෙදෙ, සිදීමෙහි, ජරති, සිඳියි.
**ජරස**. ති-ෂට්රසය, තිත්ත කටුකාදි රසසය
**ජල්ලි**. ඉ-පට්ටා, පොතු.
**ජල**. න-සටබව, ව්‍යාජය, පැකිළීම.
**ජලභිඤ්ඤ**. ඉ - ෂඩභිඤ්ඤ, ආශ්‍රවක්ෂයකර ඥානය සහිත පඤ්චාභිඥාව.
**ජව**. පු-මිනිය, මළසිරුර.
**ජව**. ති-ලාමක, දුර්වල.

**ජිගගල**. න-සිදුර.
**ජින**. ති-කපන ලද.
**ජිද්ද**. d. චු හෙදෙ, සිදුරු කිරීමෙහි, ජිද්දෙති, ජිද්දයති, සිදුරු කරයි, සිඳියි.
**ජිද්ද**. පු-සිදුර, දෝෂය.
**ජිද්දක**. ති-සිදුරු ඇති
**ජිද්දවන්තු**. පු-සිදුරුවත් දේ.
**ජිද්දික**. ති-විදින ලද, සිදුරු කළ.
**ජිද**. පු-විවරය, සිදුර.
**ජිදි**. ති-සිදීම, කැපීම.

**ජු**. d භූ-ඡෙදනෙ, සිදීමෙහි, ජොති, සිඳියි.
**ජුට**. d. හෙදනෙ, සිදීමෙහි, ජටති, සිඳියි.
**ජුටති** ක්‍රි - ජුට, d. භූ. හෙදනෙ, සිදීමෙහි, (ජුට + ති) සිඳියි.
**ජුබ**. පු-දමන ලද, විසිකළ
**ජුප**. d. භූ-සමප්සෙස, සපත් කිරීමෙහි, ජුපති, සපත් කරයි.
**ජුපති**. ක්‍රි-ජුප, d. භූ. සමපසෙස, (ජුප + ති) සපත් කරයි.

**ජවක**. පු ශරීරය, මිනිය.
**ජවදුස්ස** න-මිනී ඔතා දමන ලද වස්ත්‍රය.
**ජවි**. ඉ-ශොභාව, සිවිය, චන්ද්‍රරශ්මිය.
**ජවිසමපතති**. ඉ-වණීසමපත, සිවියේ පැහැය.
**ජළඞග** පු-අඞග සයක්, අවයව සයක්.
**ජළභිඤ්ඤ** පු-ෂට්අභිඤ්ඤ, බුදුරජ.
**ජාග**. පු-එළුවා.
**ජාත** ති-ක්ෂුධාව, බඩසා ඇත්තා, කපනලද.
**ජාතක**. ති-බඩගිනි ඇත්තා, බඩගින්න.
**ජාදන**. න-පියන, වැසීම
**ජාදිත**. ති-වසන ලද, පියන ලද.
**ජාදෙති**. ක්‍රි. ඡිද d. භූ. ඡද-සංවරණෙ වැසීමෙහි + ණෙ + ති) වසයි.
**ජාප**. පු-බාලයා, පැටවා.
**ජායා**. ඉ - සෙවනැල්ල, පිළිබිඹු, කාන්තිය, සෙය.
**ජාරිකා**. ඉ-අළු, හළු.

## ජි

**ජිදි**. d රු-විධාකරණෙ, දෙපළු කිරීමෙහි, ජින්දති, දෙපළු කරයි.
**ජිදි**. d. දි-ඡෙදනෙ, සිදීමෙහි, ජිජ්ජති, සිඳියි.
**ජින්දන**. න-සිදීම, කැපීම.
**ජින්දති**. ක්‍රි·ජිදි d දි. ඡෙදනෙ, සිදීමෙහි, (ජිද + ං + ති) සිඳියි.
**ජින්න**. ති-සිඳින ලද, කපන ලද.
**ජින්නක**. ති-කැපීම් සහිත.
**ජින්නරුහා**. ඉ-කිඳිවැල, රසකිඳ.
**ජින්නිරියාපථ**. පු-සිඳුනු ඉරියාපථ ඇත්තා, පිළා.

## ජු

**ජුපන**. න-සපත්කිරීම, ගැටීම.
**ජුපිත**. ති-සපත්කළ, හැප්පූ.
**ජුඩන**. න-දැමීම, ප්‍රක්ෂෙපය.
**ජුභ** d භූ-නිවජ්ජුභනෙ, කාරාදැමීමෙහි, ජුභති, නීවජ්ජුහති, කාරාදමයි.
**ජුභති**. ක්‍රි-ජුභ, d. භූ. නිවජ්ජුභනෙ, කාරාදැමීමෙහි, (ජුභ + ති) කාරාදමයි.
**ජුරිකා**. ඉ-සිරිය, කිරිච්චිප, කෙටි කඩුව.

(11560)

## ඡෙ

**ඡෙක**. ති-දක්ෂ, සමර්ථ, හුරුබුහුටි.

**ඡෙද**. පු-ඡේදනය, සිඳීම.

**ඡෙද**. d. චු-විධාකරණෙ, දෙපලු කිරීමෙහි, ඡෙදෙති, ඡෙදයති, දෙපලු කරයි.

**ඡෙදක**. පු-සිඳින්නා, කපන්නා.

**ඡෙදනක**. පු-සිඳුවන්නා, කප්පවන්නා.

**ඡෙපපා**. ඉ-වලිගය.

**ඡෙදන**. න-සිඳීම, කැපීම.

**ඡෙජ්ජති**. ක්‍රි-ඡෙද, d භූ. විධකරණෙ, දෙපලු කිරීමෙහි + ති දෙපලු කරයි.

**ඡෙට**. පු-දිවියා.

**ඡෙවනිය**. න-එකතොධාරාදි අතිසඝගිය ආයුධ, අතින් නුමුඳ අතින ආයුධ.

## ජ

**ජක්ඛ** d. භූ-භක්ඛනෙ, අනුභවයෙහි, ජක්ඛති, කයි.

**ජගති**. ති-භූමිය, ගෘහාලින්දයාගේ අධිෂ්ඨානය, ලොකය.

**ජග්ග**. d. භූ-අභිසංඛරණෙ, ප්‍රතිසංස්කරණයෙහි, සෑදීමෙහි, ජග්ගති, සාදයි, අලුත් වැඩියා කරයි.

**ජග්ග**. d. භූ-රක්ඛණෙ, රැකීමෙහි, ජග්ගති, පටිජග්ගති, රකී.

**ජග්ගති**. ක්‍රි-ජග්ග, d. භූ. අභිසංකරණ, අභිසංස්කරණයෙහි, (ජග්ග + ති) සාදයි, අලුත් කරයි, රකී.

**ජග්ගන**. න-රැකීම, ආරක්ෂා කිරීම.

**ජග්ඝ**. d. භූ-හසනෙ, සිනාසීමෙහි, ජග්ඝති, සඤ්ජග්ඝති, සිනාසෙයි.

**ජග්ඝති**. ක්‍රි-ජග්ඝ, d. භූ. හසනෙ, සිනාසීමෙහි, (ජග්ඝ + ති) සිනාවෙයි.

**ජග්ඝන**. න-සිනාව, සිනාසීම

**ජගතිපාල**. පු-භූමිපාලකයා, ලොකපාලකයා රජු.

**ජගතිපාණ**. පු-සුලඟ, වාතය.

**ජඝඤ්ඤ**. පු-ක්ෂුද්‍රයා, නීචයා.

**ජඝඤ්ඤජ**. පු බාලසහෝදරයා.

**ජඝන**. න-උකුල, කටිය.

**ජඞ්ගම**. ති-ඇවිදින සුලු තැනැත්තා, ඇවිදින්නා.

**ජඞ්ගල**. පු-රූක්ෂ භූමි ප්‍රදේශය.

**ජඞ්ඝමග්ග**. පු-අඩිපාර, පාදමාර්ගය, පාපාර.

**ජඞ්ඝසත්ථ**. න-පයින් වෙළඳාමට යන සමූහය, සතුන් පිට බඩු පටවා යන කාණ්ඩය=තවලම.

**ජඞ්ඝා**. ඉ-කෙණ්ඩය, සත්වයාගේ මල් ආසන ප්‍රමාණය, දගැබේ ආසනය දක්වා ඇති කොටස.

**ජඞ්ඝසක**. න-සිවුරුවලට අල්ලන පටියක්, නුවා පටිය

**ජඞ්ඝාමග්ග**. න-අඩිපාර, පටුමග.

**ජඞ්ඝාවිහාර**. පු-ජඞ්ඝාවිහරණය, ශරීරසුඛය සඳහා ඇවිදීම.

**ජච්ච**. d. භූ-පරිහාසනෙ, පිරිහෙළීමෙහි, ජච්චති, පිරිහෙළයි.

**ජච්චති**. ක්‍රි-(ජච්ච d භූ. පරිහාසනෙ, පිරිහෙලීමෙහි + ති) පිරිහෙළයි.

**ජච්චන්ධ**. පු-ජාති අන්ධයා, උපතතියෙත්ම අන්ධයා, වැදූ ගෙයි අන්ධයා.

**ජච්චන්ධකිශ**. පු-ජාත්‍යන්ධයා කෙරෙහි යෙදුනු තැනැත්තා,, කණවැල අල්ලන්නා.

**ජජ්ජර**. න-දිරූ, දිරීමට ගිය.

**ජජ්ජරී**. ඉ-රිහිකොළ.

**ජජ**. d. භූ-යුද්ධෙ, යුද්ධයෙහි, ජජති, යුද්ධ කෙරෙයි.

**ජඤ්ජ**. d. භූ-යුද්ධෙ, යුද්ධයෙහි, ජංජති, යුද්ධ කරයි.

**ජජ්ඣ**. d. භූ-තජ්ජනෙ, තර්ජනයෙහි. ජජ්ඣති, තර්ජනය කරයි.

**ජට**. d. භූ-සංඝාතෙ, රැස්කිරීමෙහි, ජටති, රැස් කරයි.

**ජටා.** ති-හුණ ආදීන්ගේ ශාඛා ජාලය, අවුල් හිසකේ, තෘෂ්ණාව.

**ජටාධර.** පු-ජටාදරන්නා, ජටිලයා.

**ජටී.** ති-ජටාධරයා, ජටිලයා

**ජටිල.** පු-අවුල් කෙස් ඇත්තා, සැඩපලු කෙස් ඇති තාපස කොට්ඨසක්, සන්‍යාසි ජාතියක්.

**ජටිත.** න-අවුල්වන ලද, ආකුල කරණ ලද.

**ජටිලක.** පු ජටිලයා, ජටා ඇත්තා.

**ජඨර.** න උදරය බඩ.

**ජළා.** ඉ-වඳුරු මෑ.

**ජණ්ණු.** පු-දණ, දණහිස, ඌරුසන්ධිය.

**ජණ්ණුතග්ඝ.** ති-දණපමණ.

**ජණ්ණුමත්තක** පු-දණපමණ.

**ජණ්ණුඝට.** පු-දණින් යායුතු මාර්ගය, දණ ගාගණ යායුතු මාර්ගය.

**ජතු.** න-ලාකඩ, ලතුදිය, ඊයම්.

**ජතුකා.** ඉ-වවුලා, දුවා.

**ජතුක.** පු-නීච, පහත්.

**ජත්තු.** න-ජතෲව, අංසසන්ධිය.

**ජත්තුවිල.** ප-දිඹුල්ගස.

**ජන්තාඝර.** න-ගිනිහල්ගෙය, ගිනිදල්වන ගෙය.

**ජන්තු** පු-සත්වයා, සතා, ප්‍රාණියා.

**ජන.** පු-ජනයා, සතා.

**ජන.** d. භූ-සද්දෙ. ශබ්ද කිරීමෙහි, ජනති, ශබ්ද කෙරෙයි.

**ජන.** d. චු ජනනෙ, ඉපදීමෙහි, ජනෙති, ජනයති, උපදවයි.

**ජන.** d. දි-උප්පාදෙ, ඉපදීමෙහි, ජනයති, උපදවයි.

**ජනක.** පු-උපදවන්නා, පියා.

**ජනකාය** පු-ජනසමූහයා, ජනතාව.

**ජනයති,** ක්‍රි-ජන d. ජනනෙ, ඉපදීමෙහි + ණය + ති) උපදවයි.

**ජනද්දන.** පු-විෂ්ණු.

**ජනන.** න-උත්පත්තිය, හටගැන්ම.

**ජනනී.** ඉ-උපදවන්නී, මව, වැදූමව.

**ජනපද.** න-දේශය, දනව්ව, ප්‍රදේශය, නගර නොවන ජනවාස පලාත.

පුම්බහුතෙන කුරුසක්කා
කොසලා මගධා සිවි
කාලිඞ්ගා වන්ති පඤ්චාලා
වජ්ජී ගන්ධාර චෙතයො
වඞ්ගා විදෙහා කාම්බොජා
මද්දා භග්ගඞ්ග සීහලා
කස්මීරා කාසි පණ්ඩාදි
සියුං ජනපදන්තරා.

මෙහි දක්වන ලද කුරු ආදී එක් විස්සද කක්කුට අස්සක යනාදී රටවල්ද ජනපදයෝයි.

**ජනපදන්තර.** පු-ජනපද විශෙෂ.

**ජනපද කථා.** ඉ-පිටිසර කථා.

**ජනපද පදෙස.** න-පිටිසර දිස්ත්‍රික්ක.

**ජනවාද.** පු-ජනකථා, ගුණකීම.

**ජනාධිප.** පු-ජනාධිපතියා, රජු.

**ජනාලය** පු-මඩුව, ශාලාව.

**ජනාවාස.** පු ජනයාගේ වාසස්ථානය, ගම, ග්‍රාමය.

**ජනි.** d. දි-පාතුභාවෙ, පහළවීමෙහි, ජායති, පහළවෙයි, උපදියි.

**ජනිකා.** ඉ-මව්, වැදූමව

**ජනෙත්තී.** ඉ-වැදූමව, උපදවන්නී.

**ජනෙසභ.** පු-සර්වඥයන් වහන්සේ.

**ජප්ප.** d. භූ-කීමෙහි, ජප්පති, කියයි.

**ජප්පනා.** ඉ-කථාව.

**ජප්පා.** ඉ-තෘෂ්ණාව.

**ජප්පිත.** ති කියන ලද.

**ජප.** d. භූ ව්‍යක්තවචනයෙහි, ජපති, කියයි, ජපකරයි.

**ජප්ප** d. භූ පත්ථනෙ, පැතීමෙහි, ජප්පති, පතයි, අභිලාෂාකරයි, මන්ත්‍රාදිය සියදහස් වාර ගණනක් මැතිරීම.

**ජභ.** d. භූ-ගත්තවිනාමෙ, ශරීරය නැමීමෙහි, නැටීමෙහි, ජගති, ශරීරය නමයි, නටයි.

**ජම්පතී.** ඉ-අඹුසැමි දෙදෙනා, ස්ත්‍රී පුරුෂ දෙදෙනා.

**ජඝ**. d. භූ-ගත්තවිත්‍යාමෙ, ශරීරය නැමීමෙහි, නැටීමෙහි, ජඝති, විජඝති, ශරීරය නමයි, නටයි.

**ජම්බල**. පු දෙසි, දෙඩම්.

**ජම්බාල**. පු-කදීම, මඩ.

**ජම්බාලි**. ඉ-ගම්දෙර, ගවරවල.

**ජම්බි(ම්භි)ර**. පු-දෙසි, දෙඩම්.

**ජම්බු**. පු-දඹ, ජම්බු.

**ජම්බුක**. පු-කැණහිලා, සිවලා, හිවලා

**ජම්බුදීප**. පු - ජම්බුවීපය, දඹදිව, ඉන්දියා දෙශය, සිඹු.

**ජම්බුසණ්ඩ**. න-දඹදිව.

**ජම්බූ**. ඉ-දඹපල.

**ජම්බුනද**. න-දඹරත්රන්.

**ජම්භ**. d චු ගත්තවිත්‍යාමෙ, ශරීරය නැවීමෙහි, ජම්භෙති, ජම්භයති, සිරුර නවයි.

**ජම්භ**. d. භූ-ගත්තවිත්‍යාමෙ, ශරීරය නැවීමෙහි ලීලාවෙහි, ජම්භති, නටයි.

**ජම්භ**. පු-දෙසි, දෙඩම්.

**ජම්භොනද**. න-දඹරත්රන්.

**ජම්භභෙදි**. පු-ශක්‍රයා.

**ජම්භල**. පු-දෙසි, දෙඩම්, ජම්බල.

**ජම්භති**. ක්‍රි-(ජම්භ d භූ. ගත්තවිත්‍යාවෙ, සිරුර නැවීමෙහි + ති) කිලිපොලයි.

**ජම්භීර**. පු-දෙසි, දෙඩම්

**ජම්භනා**. ඉ නැමීම.

**ජම්ම**. පු-පුද්ගලයා, සත්වයා, උත්පත්තිය.

**ජම්ම**. න-නීච, පහත්, ලාමක.

**ජම්ම**. න අපරීක්ෂක, පරීක්ෂා නැති

**ජමු**. d භූ-අදනෙ, කෑමෙහි, ජමති, කයි.

**ජය**. පු-දිනීම, ජයග්‍රහණය, විජය.

**ජයති**. ක්‍රි-(ජි d භූ. ජයෙ, දිනීමෙහි + ය + ති) දිනයි.

**ජයන**. න-දිනීම, ජයගැන්ම.

**ජයන්ති**. ඉ-තිටිඹ.

**ජයපාන** න - යුධයෙන් දිනා කරණ ලද පානය,

**ජයම්පති**. පු-අඹුසැමි දෙදෙනා, ස්ත්‍රී පුරුෂ දෙදෙනා.

**ජයසුමන**. න-බඳුවද, වදමල්.

**ජර**. d. භූ-රොගෙ, රොගයෙහි, ජරති, දිරයි, රිදෙ.

**ජර**. d. චු - වයොහානිමහි, වයස්පිරිහීමෙහි, ජරෙති, ජරයති, දිරයි, වයස්පිරිහෙයි.

**ජර**. පු-ජ්වර රොගය, උණ රොගය.

**ජරගව**. පු මහලු ගොණා, නාකිගොණා.

**ජරතා**. ඉ-ජරාබව, දිරීම් බව.

**ජරති**. ක්‍රි-(ජර. d භූ. වයොහානිමහි, වයස් ගතවීමෙහි + ති) දිරයි.

**ජරා**. ඉ-ජරාව, දිරීම, ඉන්ද්‍රිය මුහුකිරීම.

**ජරාධම්ම**. පු-ජරාසවභාව, ජරාගතිය.

**ජරාභය** න-ජරාව නිසා ඇතිවින දෙය.

**ජල**. d භූ - දිත්තියං, බැබලීමෙහි, ජලති, බබලයි.

**ජල**. d. චු-වාරණෙ, වැලකීමෙහි, ජාලයති, ජාලෙති, දිලිසෙයි, බබළයි.

**ජල**. න-ජලය, දිය, වතුර.

**ජලකක්ඛ**. පු-ඇතා, හස්තියා.

**ජලචර**. පු-දියෙහි හැසිරෙන්නා, මත්ස්‍යයා.

**ජලති**. ක්‍රි-(ජල d. භූ දිත්තියං, දිලිසීමෙහි + ති) දිලිසෙයි.

**ජලදායක**. පු - ජලදායකයා, දියදෙන්නා, කෙණ්ඩිය, මොසය.

**ජලන** න-දිලිසෙන, දිලිහීම, ගින්න.

**ජලනිධි** ඉ-සාගරය, සමුද්‍රය.

**ජලනිග්ගම**. පු - උදක නිගීමය, වාරිමාගීය, සොරොව්ව.

**ජලසුකති**. ඉ-රන්වන් බෙල්ලා.

**ජලාධාර**. පු - උදකාධාරය, ජලාසය, විල් සැලි ආදිය.

**ජලාබු**. පු-ගභීාශය, දලඹුව, දලඹු බලනු.

**ජලාලය**. පු-ජලය ආලය කොට ඇත්තා, දියෙහි වාසය කරන්නා, මත්ස්‍යයා.

**ජලාසය.** පු - දිය පිහිටි තැන, සමුද්‍ර, විල්, තඩාගාදිය.

**ජලිත.** ති-ජ්වලිත, බබලන ලද, දිලිසෙනලද.

**ජලිතිද්ධි.** ඉ-ජ්වලිත ඍද්ධිය, ජ්වලිත ඍද්ධි ඇති.

**ජලූපිකා.** ඉ-කුඩැල්ලා.

**ජලූකා.** ඉ-දියපූඩාවා, දියකුඩැල්ලා, කන්වැයා

**ජලෞගී.** ඉ-තරුණසුරා.

**ජල්ලිකා.** ඉ - ලවණ පටලාදි ශරීරය පිට සෑදෙන මල, කුණු

**ජල්ල.** පු-සරඹ ආදී ශරීර ව්‍යායාමයෙහි දක්ෂයා

**ජල්ලී.** පු-විජ්ජා කාරයා, ඉන්ද්‍රජාලිකයා.

**ජව.** පු-වෙගය, ඉතා ජවඇති අශ්වයා

**ජව.** d. භූ-ගමනෙ, යෑමෙහි, ජවති, යෙයි.

**ජවති.** ක්‍රි-(ජු d. භූ. සීඝගමනෙ, දිවීමෙහි, උ=අව + ති) ධාවනය කරයි.

**ජවන.** න ධාවනය, දුවන්නා, ජවසම්පන්න අශ්වයා.

**ජවන.** ති-ශීඝ්‍ර ජවඇත්තා, ධාවනය කරන්නා

**ජවනචිත්ත.** න ජවන් සිත, භවඞ්ග, ආවජ්ජන, දස්සන, සම්පටිච්ඡන, සන්තීරණ, වොත්ථපන, ජවන යන සිත්සතින් සත් වැනි සිත.

භවඞ්ගාවජ්ජනංචෙව දස්සනං සම්පටිච්ඡනං
සන්තීරණං වොත්ථපනං ජවනං භවති
සත්තමං

**ජවනවීථි.** ඉ-ජවන් වීථිය

**ජවනිකා.** ඉ-තිරය, කඩතුරාව.

**ජවසම්පන්න.** ති-ජවයෙන් යුත්, ජවය ඇති.

**ජවාධික.** පු-අධික ජව ඇත්තා, ජවසම්පන්න අශ්වයා.

**ජස.** d. භූ හිංසායං, පීඩාවෙහි, ජසති, පීඩා කරයි.

**ජස.** d. චු - තාඩනෙ, තැලීමෙහි, ජාසෙති, ජාසයති, තලයි.

**ජස.** d. චු - හිංසායං, හිංසාවෙහි ජාසෙති, ජාසයති, හිංසාකරයි.

**ජසි.** d. චු-රක්ඛණෙ, රැකීමෙහි, ජංසෙති, ජංසයති, රකී.

**ජහ.** ති-ආපසු තබා, දීලා.

**ජහති.** ක්‍රි-(ජහ. d. භූ ගත්‍යවිනාමෙ, යෑමෙහි + ති) අත්හරියි.

**ජහාති.** ක්‍රි-(ජහ. d. භූ ගත්‍යවිනාම, යෑමෙහි + ති) බැහැරකරයි.

**ජා.** ඉ-දුනුදිය, දුනුලනුව.

**ජාගර.** පු - නිදිවර්ජිත කිරීම, නිදිමැරීම, සන්නාහය.

**ජාගර.** d. භූ-සුපිණක්ඛයෙ, නිදිදුරු කිරීමෙහි, ජාගරති, නිදිදුරුකරයි, නොනිදයි.

**ජාගර.** d න - සුපිණක්ඛයෙ, නිදිදුරු කිරීමෙහි, ජාගරෙති, නිදිදුරුකරයි, නොනිදයි.

**ජාගරණ.** න නිදිවර්ජනය, නොනිදීම.

**ජාගරති.** ක්‍රි-(ජාගර d. භූ. සුපිනක්ඛයෙ, නිදිදුරු කිරීමෙහි + ති) නිදිදුරුකරයි.

**ජාගරික.** පු - නිදිවර්ජිතයා, සන්නාහසන්නද්ධයා.

**ජාගරිත.** ති-නිදිදුරුකල, නොනිදි.

**ජාගරියා.** පු-නිදිවර්ජිත කිරීම, නිදිදුරු කිරීම.

**ජාත.** ති-උපන්, හටගත්.

**ජාත.** න රාශිය, සමූහය.

**ජාතක.** පු-ජාතකය, උත්පත්තිය, ජාතකධර්මය, පියා.

**ජාතරූප.** න-රන්රන්.

**ජාතවෙද.** පු-ගින්න, ගිනි.

**ජාතා.** ඉ-දරුඇත්තී, දරුලද්දී.

**ජාතාපච්චා.** ඉ-දරුලදස්ත්‍රී, වැදූ තැනැත්තී.

**ජාති.** ඉ-නිකාය, ප්‍රතිසන්ධිය, සමානබව, වැදීම, වංශය, විශෙෂාංශ, දෑසමන්, ප්‍රත්‍යයොත්පන්නයන්ගේ උත්පාද ලක්ෂණය, සමූහය. සීලය, ප්‍රඥප්තිය, දීඝීමාගීය.

**ජාතික්ඛය.** පු-ජාතික්ෂය. උත්පත්තිය ක්ෂයකිරීම, නිවණ.

**ජාතික.** ති-ජාතියට අයත්, ජාතිය පිළිබඳ

**ජාතිකොස.** න-සාදික්කා. ජාතිඵල.

**ජාතිම.** පු-ජාතිමත්,

(11752)

**ජාතිවාද.** පු-ජාති ගොත්‍රපිළිබඳ වාදය, ජාති ගොත්‍රයන් පිළිබඳ කථා.

**ජාතිසම්භෙද.** පු-ජාතිගොත්‍රවල සිරිත් බිඳීම, කුලසිරිත් කිළුටුවීම.

**ජාතිසුමනා.** ඉ-දෑසමන්, සමන් පිච්ච.

**ජාතු.** අ-ඒකාන්තාර්ථයෙහි, අනියත කාලයෙහි, කිසිකලක.

**ජාන.** ති දැනගතහැකි, තේරුම්ගතහැකි.

**ජානන.** න-දැනීම, දැනගැන්ම, හැඳිනීම.

**ජානක.** පු දැනගන්නා.

**ජානපද.** න-දනව්වැසි, ජනපදයට අයත්

**ජානාති.** ක්‍රි-(ඤා d. භූ. අවබොධනෙ, අවබොධයෙහි, ජා + නා + ති)දනී.

**ජානි.** ඉ-හානිය, ජරාව

**ජානිපති.** පු අඹුසැමි දෙදෙනා

**ජාණු.** ඉ-උරුසන්ධිය, දණහිස, දණහිය.

**ජාණුක.** න-දණහිස, උරුසන්ධිය.

**ජාමාතු.** දුවගේ හිමියා, බෑනා

**ජායති.** ක්‍රි-(ජනී d. භූ පාතුභාවෙ, පහළවීමෙහි + ති) උපදියි.

**ජායාපති.** පු-අඹුසැමි දෙදෙනා.

**ජායා.** ඉ-භාර්යාව, අඹුව.

**ජායිකා.** ඉ-බිරිඳ, අඹුව.

**ජාර.** පු-සොරසැමියා, හොරපුරුෂයා.

**ජාරී.** ඉ-සොර අඹුව.

**ජාල.** න-සිව්මැදුරුකවුළුව, රාශිය, දැල.

**ජාලක.** න-අලුත් කැකුළ.

**ජාලා.** ඉ-ජ්වාලා, ගිනිසිළ, ගිනිදැල.

**ජි.** d. කි-ජයෙ, දිනීමෙහි, ජිනාති, දිනයි, ජයගණී.

**ඤා.** d. කි - ඤාණබොධ, දැනගත යුත්තෙහි, ජිනාති, දැනගණී.

**ජි.** d භූ-ජයෙ, දිනීමෙහි, ජයති, දිනයි, පරාජයති, පරදවයි.

**ජි.** d. භූ - අභිභවෙ, අභිභවනයෙහි, ජෙති, මැඩපවත්වයි.

**ජිඝඤ්ඤ.** ඉ-අවසානය, ලාමක.

**ජිඝච්ඡා.** ඉ-ක්ෂුධාව, බඩගින්න, කනුකැමැත්ත.

**ජිඝච්ඡිත.** ති-බඩසා ඇත්තා, ක්ෂුධා ඇත්තා.

**ජිගුච්ඡා** ඉ-නින්දාව, පිළිකුල.

**ජිගුච්ඡන.** න-නින්දාකිරීම, පිළිකුල්කිරීම.

**ජිගිංසක.** පු - කනු කැමැත්තා, අනුභව-කැටපියා.

**ජිගිංසති.** ක්‍රි - (ජි. d භූ. ජයෙ, දිනීමෙහි, ජ (හර = ගගිං= ජ ති= ජ + ඉ + ගිං + ස + ති= ජිගිංසති හැරගණු කැමතිවෙයි.

**ජිගුච්ඡති.** ක්‍රි-(ගුප. d භූ-ගොපනෙ, රැකීමෙහි + ති) පිළිකුල්කෙරෙයි.

**ජිගුච්ඡන.** න පිළිකුල්කිරීම.

**ජිගුච්ඡා.** ඉ-ප්‍රතික්කූල, පිළිකුල.

**ජිඝච්ඡති.** ක්‍රි-ඝස d. භූ. අදනෙ කැමෙහි, (ඝස=ගඝස ඛඝස = ජඝස = ජ + ඉ = ඝස = ජිඝච = ජිඝච + ඡ + ති = ජිඝච්ඡති) කනු කැමතිවෙයි.

**ජිඞ්ගී.** ඉ-වැල්මදට.

**ජිඤ්ජුක.** පු-හුනිඳ ඔලිඳ.

**ජිණ්ණ.** ති-ජීර්ණ, මහලු.

**ජිණ්ණක.** ති-මහලු, දිරූ, ජීර්ණක.

**ජිණ්ණවසන.** න-මහලුපිලී, දිරූ රෙදි.

**ජිත.** ති-දිනන ලද, ජයග්‍රහණයකළ.

**ජිති.** ඉ-දිනීම, ජය.

**ජින.** පු-බුදුහු, සර්වඥයන් වහන්සේ.

**ජිනපතනා.** ඉ-වවුලා, දුවා.

**ජිනාති.** ක්‍රි-ජි. d භූ. ජයෙ, දිනීමෙහි, (ජි + නා + ති) දිනයි, ජයගනියි.

**ජිම්හ.** පු-වක්වූදෙය, වකුට්ට, ඇදය.

**ජිමු.** d. භූ - භක්ඛනෙ, කැමෙහි. ජෙමති, අනුභවකරයි.

**ජියා.** ඉ-දුනුදිය, දුනුරැන, දුනුලනුව.

**ජීර.** d. භූ - බ්‍රූහනෙ, වැඩීමෙහි, ජීරති, වැඩෙයි, "අප්පස්සුතායං පුරිසො බලිවද්දොව ජීරති."

**ජීරි.** d. ස්වා-හිංසාය, පෙළීමෙහි, ජීරුණාති, පෙළයි.

**ජිව්හා.** ඉ-දිව, දිග්වාව

**ජිවහානිසාධක.** න - මන්ත්‍රබලයෙන් දිව සොලවන්ට බැරිසේ තදකිරීම.

## ජී

**ජි**. d. කි – ජාතියං, හටගැන්මෙහි, ජිනාති, හටගණී.

**ජීමූත**. පු-මෙඝය, දෙවදුලිය.

**ජීයති**. ක්‍රි-ජර d හූ – වයොහානිම්හි, වයස්ගත වීමෙහි+ති දිරයි.

**ජීර**. d. හූ-ජීරණෙ, දිරීමෙහි, ජීරති, දිරයි.

**ජීරක**. න-දුරු, දෙදුරු.

**ජීරණ**. න–දිරීම, මෙරීම, පරණවීම.

**ජීරමාන**. ති-දිරණු ලබන, දිරණ.

**ජීරාපෙති**. ක්‍රි - (ජීර d. හූ. ජීරණේ, දිරීමෙහි + ණෙ + ති) දිරවයි.

**ජීරි**. d. සු-හිංසායං, පෙළීමෙහි, ජීරුණෙති, පෙළෙයි.

**ජීව**. පු-ආත්මය, සත්වයා, බ්‍රහස්පතියා.

**ජීව**. න-ප්‍රාණය, පණ.

**ජීව**. d. හූ – පාණධාරණෙ, ප්‍රාණධාරණයෙහි, ජීවති, ජීවත්වෙයි

**ජීවක**. පු–ජීවත්වන්නා, දිවි ඇත්තා, පියාගස, එනම් පැලෑටිය

**ජීවති**. ක්‍රි - (ජීව d හූ. පාණකරණෙ, ප්‍රාණ ධාරණයෙහි + ති) ජීවත්වෙයි.

**ජීවන**. න ජීවත්වන, පණඇති, ජීවිකාව.

**ජීවංජීවක**. පු – එනම් අනුකරණ ශබ්දය, පවත්වන මයුර ප්‍රමාණපක්ෂියෙක්, කපුටා, කොහා උගේ ශබ්දය පවත්වන්නාක්මෙන් මූද ජීවංජීවකයයි ශබ්දනගයි.

**ජීවන්ති**. ඉ-ජීවත්වන තැනැත්තී, දිවිපසුරු

**ජීවන්තිකා**. ඉ-පිළිල=පිළිල.

**ජීවලොක**. පු.- මනුෂ්‍යලොකය.

**ජීවසුමන**. න වදගස, බදුවදගස.

**ජීවා**. ඉ-දිවිපසුරු

**ජීවිකා**. ඉ - ජීවිකාව, ජීවිකාවෘත්තිය, දිවිරැකීම, ජීවත්වීම.

**ජීවිත**, න ජීවිතය=ජීවිතෙන්ද්‍රිය.

**ජීවිතවුත්ති**. න-ජීවිකාවෘත්තිය=දිවිපැවැත්ම.

**ජීවිතමද**. පු - ජීවිතය නිසා ඇතිවන මදය=උමතුව.

**ජීවිතින්ද්‍රිය** න-ජීවිතය, ජීවිතෙන්ද්‍රිය.

**ජීවිනියා**. ඉ දිවිපසුරු, ජීවිති.

**ජීවිනී**. ඉ-දිවිපසුරු, දිවත්වන්නී.

**ජීවී**. පු ජීවත්වන්නා, ප්‍රාණියා.

## ජු

**ජු**. d. හූ-සීඝ ගමනෙ, ශීඝ්‍රගමනෙහි දුවයි.

**ජු**. d හූ -ගමනෙ, යාමෙහි, ජීවති යෙයි.

**ජුඞ්ගි**. d. හූ–වජ්ජනෙ, හැරීමෙහි, ජුඞගති, හරියි.

**ජුති**. ඉ-රුචිය, රශ්මිය, ආලොකය.

**ජුතික**. පු - ආලොක කරන්නා, ආලොකය ඇති.

**ජුතිමන්තු**. පු-ආලොක ඇත්තා, එළිය ඇති.

**ජුත**. d. හූ–කථාවෙහි දීප්තියෙහි, ජොතති, කථාකරයි, බබලයි.

**ජූත**. පු. න–දූකෙළිය, සූදුව.

**ජූතකාරක**. පු-දූකෙළින්නා, අක්ෂධූර්තයා.

**ජුතින්ධර**. පු-ආලොකය දරන්නා.

**ජුතිමා**. පු-ජුතිමන්තු ශබ්දයාගේ පඨමා එකවචනය.

**ජුණ්හ**. පු-සඳරැස, සඳරැසින්යුත් රාත්‍රිය.

**ජුණ්හ**. d. දිත්තියං, බැබලීමෙහි, ජුණ්හාති, බබලයි.

**ජුස**. d. හූ – පරිතක්කනෙ, පරිතර්කණයෙහි, ජොසති, කැබලිකර කපයි.

**ජුස**. d. චු – පරිකත්තනෙ පරිකර්තනයෙහි, ජොසෙති, ජොසයති, කැබලිකර කපයි.

**ජුස**. d. හූ – හිංසායං, හිංසාවෙහි, ජුසති. පෙළයි.

**ජුසි**. d. පීතියං–ප්‍රීතියෙහි, ජොසති, ප්‍රීතිවෙයි.

(11854)

**ජුහන.** න-පූජාව, යාගය, ගිනිදෙවියාපිදීම.

**ජුහොති.** ක්‍රි-හු d. හු දානාදන භව්‍යපපදසෙසු, පිදීමෙහි, (හු. ධාතු අබ්භාස-හු, හු. ජ × හු. අ × උ. ජිහු උ × ඕ. ජුහොති) පුදයි.

**ජුල.** d. චු-පෙරණෙ, යැවීමෙහි, ජොලෙති, ජොලයති, යවයි.

**ජුල.** d. භූ-ගතියං, ගමනෙහි, ජුලති, ජොලති, යෙයි.

**ජූතමලිකා.** න දූපෝරුව, දම්ලැල්ල.

## ජෙ

**ජෙ** අ-නිච්ාමන්තණයෙහි, බොල, කොල, අඩේ.

**ජෙ.** d. භූ-ඛයෙ, ක්‍ෂයවීමෙහි, ජයති.

**ජෙගුච්ඡ.** ති-පිළිකුල, ජිගුප්සාව.

**ජෙගුච්ඡී.** පු- පිළිකුල් කරන්නා, පිළිකුල් ඇත්තා.

**ජෙට්ඨ.** පු-පොසොන් මාසය, ශ්‍රෙෂ්ඨ, බුදුරජ.

**ජෙට්ඨක.** පු-දෙටු තැනැත්තා.

**ජෙට්ඨා.** ඉ දෙටේ නැකත.

**ජෙට්ඨම්බු.** න කාඩිජලය.

**ජෙතබ්බ.** ති-දිනියයුතු, ජයගතයුතු.

**ජෙතවන.** න-සැවැත් නුවර පිහිටි එනම් උද්‍යානය.

**ජෙතු.** ක්‍රි-ජයගණියි, ජි බලනු.

**ජෙතුත්තර.** න-දඹදිව....... පිහිටි ජයතුරා නම් නුවර.

**ජෙතුමිච්ඡා.** ඉ-විජිගිංසාව, දිනනු කැමැත්ත.

**ජෙනාදනනි.**

**ජෙනාදනතිකා.**

**ජෙසු.** d. භූ-ගමනෙ, යාමෙහි, ජෙසසති, යෙයි.

**ජෙහු** d. භූ උස්සාහෙ, උත්සාහයෙහි, ජෙහති, උත්සාහකරයි

**ජෙය්‍ය.** ති-දිනිය යුත්ත, අතිප්‍රශස්ත, අතිවෘද්ධ.

## ජො

**ජොඞගක.** පු-අගිල්.

**ජොතක.** පු-බබුලුවන්නා, දීප්තිමත්කරන්නා.

**ජොතන.** න-බැබලීම, ආලොකය.

**ජොත.** ති-බැබලීම.

**ජොතති.** ක්‍රි-ජුත. d. (භූ භාසන දීත්තිසු, දිලිසීමෙහි+) දිලිසෙයි, බබලයි.

**ජොති.** ඉ-දීප්තිය, බැබලීම.

**ජොති.** ඉ-නැක, රසම්ය, වහ්නිය.

**ජොතිකා.** පු-නැකත්තා, නැකැත් දත්තා, නැකතියා.

**ජොතිමන්තු.** පු-රසම් ඇති, සූය්‍ර්‍යයා.

**ජොතිමාලිකා** න - ශරීරයෙහි ගිනි දල්වා කරන එනම් වධය.

**ජොතිසත්ථ.** න-එනම් වෙදඞ්ගය, ජොතිශ් ශාස්ත්‍රය.

**ජ්‍යා.** ඉ දුනුදිය, දුනුරැහැණ.

## ඣ

**ඣඤ්ඣරී.** ඉ-ලිහිල කොල.

**ඣඤ්ඣ.** d. භූ - පරිභාසෙ, පරිභාසනයෙහි, ඣඤ්ඣති, බණියි, තර්ජනය කරයි.

**ඣට.** d. භූ රාසිකරණ, රැස්කිරීමෙහි, ඣටති, රැස්කරයි.

**ඣත්ත.** පු-දවනලද, බඩසයින් පෙළෙන ලද.

**ඣප.** d. භූ-චු. දැවීමෙහි, ඣාපෙති, ඣාපයති, දවයි.

**ඣමු.** d. භූ-අදනෙ, දහෙව, ඣමති, දවයි.

**ඣල්ල.** d. භූ-සද්දෙ, ශබ්දකිරීමෙහි, ඣල්ලති, ශබ්දකරයි.

**ඣස.** d. භූ - හිංසායං, හිංසාවෙහි, ඣසති, පෙළයි, හිංසා කරයි.

**ඣා** d. දි-චින්තනෙ, සිතීමෙහි, ඣායති, සිතයි, ධ්‍යානකරයි.

**ඣාන.** න-ධ්‍යානය, චින්තාව, ධ්‍යානවැඩීම.

**ඣානික.** පු-ධ්‍යානවඩන්නා, ධ්‍යාන කරන්නා.

**ඣාස.** පු. මත්ස්‍යයා, මාලුවා.

(11901)

ඣාෂා. ඉ-කැළිය, ගඩකැළිය.

ඣාමල. පු-වල් පලොල්.

ඣාපක. පු-දැවීම කරන්නා, දවන්නා

ඣාපන. න-දැවීම, පිලිස්සීම,

ඣාපිත. ති-දවන ලද, පුලුස්සන ලද.

ඣාපෙති. ක්‍රි - ඣප d. භූ. චු, දාහෙ, (දැවීමෙහි, + ති) දවයි.

ඣාම ති දැම, පිලිස්සීම.

ඣාමක. පු-දවන්නා, ගින්න.

ඣායක. පු-ධ්‍යාන කරන්නා, සිතන්නා.

ඣායති. ක්‍රි-සිතයි, ඣා බලනු

ඣායන. න ධ්‍යාන කරණ සිතන, සිත එකග කරණ.

ඣායී. පු ධ්‍යාන වඩන්නා.

ඣාවුක. පු පිමුල රුක, නාවාගස.

ඣීරුකා. ඉ-රැහැයියා, රැසියා, සීරු.

ඣෙ. d. භූ-චින්තායං, සිතීමෙහි, ඣායති, සිතයි, නිජ්ඣායති, උපනිජ්ඣායති, දැවීමෙහි, "කට්ඨානි ඣායති, කාෂ්ට දති" අධ්‍යායන යෙහි, සජ්ඣායති මන්තං-මන්ත්‍රහදුරයි.

## ඤ – ඤෙ

ඤතික. න-සමීපය, කිට්ටුව ළඟ.

ඤත්ති. ඉ-ඤාණය, සමීපය, එනම් විනය කර්මය,

ඤමු. d. භූ අදනෙ, කෑමෙහි, කැමති අනුභව කරයි.

ඤා. භූ-මාරණ තොසන නිසා 'නෙසු, මැරීමෙහි, සතුටු කිරීමෙහි තියුණු කිරීමෙහි, ඤතති, මරයි, සතුටු වේ'යි, තියුණු කෙරෙයි.

ඤා. d. භූ - බොධෙ, අවබොධයෙහි, ඤාති, අවබොධ කරයි.

ඤා. d. කි - බොධෙ, අවබොධ කිරීමෙහි (ඤා=ජා) ජානාති අවබොධකරයි.

ඤා d. චු යොගෙ, යෙදීමෙහි, ඤායති, යොදයි.

ඤාණ. න-ප්‍රඥාව, ඥාණය, පරිඥාණය,

ඤාණචක්ඛු. න-නුවණැස.

ඤාණදස්සන. න - ශ්‍රාමණ්‍ය ඵලය, විදර්ශනා ඥානය, දිව්‍යචක්ෂුස, සර්වඥතාඥානය, ප්‍රත්‍යවෙක්ෂඥානය, ආයතීමාර්ගය, මාර්ගඥානය, ඵලඥානය.

ඤාණපවත්ති. ඉ-ඥාන ප්‍රාප්තිය.

ඤාණපරිභූත. ති ඤාණයෙන් වැසුනු.

ඤාණභූත. පු-සර්වඥයන් වහන්සේ.

ඤාණික. පු ඥානයෙන් යුක්, ඥානවන්ත.

ඤාණී. පු-නුවණැත්තා, ඤාණය ඇත්තා.

ඤාත. ති-දන්නා ලද, කියන ලද, ප්‍රසිද්ධ.

ඤාතක. පු-නෑයා, ප්‍රසිද්ධ.

ඤාති. පු-නෑයා.

ඤාතිසාලොහිත. පු-ඤාති හා සමාන ලේ ඇති.

ඤප. d. චු-තොස නිසාන මරණාදිසු, සතුටු වීම තියුණු කිරීම මැරීම යනාදියෙහි, ඤපෙති, ඤපයති.

ඤාපක. පු-දන්වන්නා, දැනුම් දෙන්නා.

ඤාපන. න දැන්වීම, හැඟවීම.

ඤාපෙති. ක්‍රි (ඤා d. භූ. අවබොධෙ, අවබොධයෙහි + ණෙ + ති) (ණාපෙ + ති) හඟවයි.

ඤාය. පු-යුක්තිය, විදර්ශනාමාර්ග ප්‍රඥාව, යුක්ති සංගත ක්‍රියාව, කාරණය.

ඤෙය්‍ය. න-ඤෙය්‍යවස්තු, දතයුත්ත.

## ට

ටඞ්ක. පු-ගල පලන පෙතුම, ගල් කටුව, තොට්ල ටඞ්කනමකුව, ගල් සතරක් මතු යෙහි ගල්ලෑල්ලක් අතුරාකල ආසනය, ගයාවේ පිහිටි සුචිරෝමයාගේ වාසභවනය

ටල. d. භූ වියාකුලෙ, ව්‍යාකුලයෙහි, ටලති ව්‍යාකුල වෙයි.

ටි. d. භූ - පකබබනෙ, ඉගිලීමෙහි, ටෙති, ඉගිලෙයි.

ටික. d. භූ ගතියං, යාමෙහි, අවබොධයෙහි, ටෙකති, යෙයි දැනගණියි, ටෙකකති.

ටීකා. ඉ-අර්ථකථාවෙහි දුෂ්කර පදයන්ගේ අර්ථ ප්‍රකාශකරණ ග්‍රන්ථය.

ටුල. d භූ-වියාකුලෙ ටුලති ව්‍යාකුලවෙයි,

ටෙක. d. භූ-ගතියං, යෑමෙහි, ටෙකති යෙයි.

## ඨ

**ඨප.** d චු-ඨපනෙ, තැබීමෙහි, ඨපෙති, ඨපයති, තබයි.

**ඨපන.** න-තැබීම, පිහිටුවීම.

**ඨපිත.** ති-තබනලද, පිහිටුවනලද.

**ඨපෙති.** ක්‍රි-ඨප. d භූ. ඨපනෙ, තැබීමෙහි, (ඨප + ණෙ + ති) තබයි.

**ඨා.** d. භූ - ගතිනිවුත්තියං, ගමන් නැවැත් මෙහි, ඨාති, තිට්ඨති, සිටියි, නවතියි.

**ඨා.** d. දි-ගතිනිවුත්තියං, ගමන් වැලකීමෙහි, ඨායති, නවතියි, සිටී.

**ඨාපන.** න-තැබීම, පිහිටුවීම.

**ඨාන.** න-ඓශ්වර්‍ය්‍යය, හෙතුව, අවකාශ සපිති.

**ඨානීය.** න-නුවර, නගරය.

**ඨායික.** පු - ජීවිකාව පහසුවෙන් කරණ තැනැත්තා.

**ඨායී.** පු-සිටින සුළුතැනැත්තා, සිටින සවභාව ඇත්තා.

**ඨිත.** ති-සිටින ලද, සිටි, පිහිටි.

**ඨිතක.** පු-සිටිතැනැත්තා, නොනැමී කෙලින් සිටි තැනැත්තා.

**ඨිතසීලී.** පු සිටීම සවභාව කොට ඇති.

**ඨිති.** ඉ-සිටීම, පැවැත්ම, ජීවිතය.

**ඨිතික.** පු-සිටින්නා, පවතින්නා.

**ඨුභ** d. භූ. නිට්ඨුභනෙ, කාරා දැමීමෙහි, නිට්ඨුභති, කාරා දමයි.

**ඨෙ.** d භූ. වෙඨනෙ, වෙලීමෙහි, ඨාති, ඨායති, වෙළයි.

## ඩ

**ඩප.** d. භූ. චු-සඞ්ඝාතෙ, රැස්වීමෙහි, ඩපති= ඩාපෙති ඩාපයති, රැස්වෙයි.

**ඩපි.** d. භූ. සාඞ්ඝතෙ, රැස් කිරීමෙහි ඩම්පති, රැස් කරයි.

**ඩය්හමාන.** පු-දවනු ලබන, පුළුස්සනු ලබන.

**ඩසති.** ක්‍රි - (ඩංස. d. භූ. ඩංසනෙ, දෂ්ට කිරීමෙහි + ති) දෂට කරයි.

**ඩසන.** න-ඩැසීම, සපා කෑම දෂට කිරීම.

**ඩහන.** න ඩැහීම, දෂට කිරීම.

**ඩහති.** ක්‍රි-(දහ + d භූ භස්මීකරණ, හළු කිරීමෙහි + ති) දවයි, අළුකෙරෙයි.

**ඩංක.** පු-ඇට ලේ මැස්සා, මංස.

**ඩංස.** පු-ඩැහැ ලේබොන මැස්සා, ඇටමැස්සා

**ඩංස.** d භූ-ඩංසනෙ, දෂට කිරීමෙහි, ඩංසති, දෂට කරයි.

**ඩාක.** පු. පලා. කෑමට ගන්නා කොළවගී

**ඩෙති.** ක්‍රි-ඩී d භූ, වෙහාස ගමනෙ, අහස් ගමනෙ + ති ඉගිලෙයි.

## ඩි – ඩී – ඩු

**ඩි.** d. භූ. වෙහාස ගමනෙ, අහසින් යාමෙහි, ඩෙති, ඉගිලෙයි, අහසින් යයි.

**ඩිප.** d. භූ. ඛෙප, දැවීමෙහි, ඩොපෙති, දවයි

**ඩිප.** d චු-සංඝාතෙ, රැස්කිරීමෙ, ඩෙපෙති, ඩෙපයති, රැස් කරයි.

**ඩී.** *d. භූ-ආකාස* ගමනෙ, අහසින් යාමෙහි, ඩෙති, ඩයති, ඉගිලෙයි, අහසින් යෙයි,

**ඩී.** d. භූ-ඛෙපෙ, උඩගමනෙ, දැවීමෙහි, උඩ යාමෙහි, ඩෙති-උඩ්ඩෙති, දවයි, ඉගිලෙයි,

**ඩී.** d. දි-ගමනෙ, යාමෙහි, ඩීයති, යෙයි,

**ඩු.** d භූ. උච්ච, උසස් කිරීමෙහි, ඩුණ්ණති, උසස් කරයි,

## ත

**තක.** d. භූ-හසනෙ, සිනාවෙහි, තකති, සිනාසෙයි

**තකි.** d. භූ-දුක්ඛ ජීවනෙ, දුඃඛ ජීවිකාවෙහි, තඞ්කති, දුකින් ජීවත් වෙයි.

**තකි.** d. චු-බන්ධනෙ, බැඳීමෙහි, තඞ්කෙති, තඞ්කයති, බඳියි.

**තකි.** d භූ-යාමෙහි, ඉවසීමෙහි, සිනාවෙහි, දුකසේ ජීවත් වීමෙහි, තඞ්කති, ආතඞ්කති ආතඞ්කෙපති, දුකසේ ජීවත් වෙයි,

**තක්ක.** d. චු විතර්කයෙහි, තක්කෙති, තර්කයණ කරයි, විතක්කෙති.

**තක්ක**. පු. විතර්කය, මෝරු, සොරා.

**තක්කන**. න-තර්කණය, සංකල්පය,

**තක්කර**. පු-සොර, එය කරන්නා.

**තක්කසිලා**. ඉ. තක්සලා නුවර.

**තක්කාරි**. ඉ-තිරිඟ.

**තක්කාල**. න-ඒකාලය, එමකාලය.

**තක්කික**. පු-තාර්කිකයා, තර්ක කරන්නා.

**තක්කෙති**. ක්‍රි-තක්ක d. භූ තක්කනෙ, තර්ක කිරීමෙහි+ණෙ+ති) තර්කකරයි.

**තක්කෝල**. න-තකුල්.

**තක්කී**. පු-තර්කකරන්නා. තර්කශාස්ත්‍රඥයා.

**තක්ඛ**. d. භූ-සංවරණෙ, සංවරයෙහි, තක්ඛති, සංවරණය කරයි.

**තගරුක**. ති-එය ගරුකරන්නා, එය ගරු වශයෙන් සලකන්නා

**තග්ඝ**. අ-ඒකාන්තයෙහි, එබැවින්.

**තග්ඝ** d. භූ. පාලනෙ, පාලනයෙහි, තග්ඝති, පාලනය කරයි.

**තඟ**. d. භූ සංවරෙ, වැසීමෙහි තඟති, වසයි, අවුරයි.

**තඟි**. d. භූ-ගමනෙ, ගමනයෙහි, තඞ්ගති, යෙයි

**තච**. පු-චර්මය, සම, සුඹුල්.

**තච**. d. භූ සංවරණයෙහි, තචති, රකියි තචො.

**තචසාර**. පු. හුණගස.

**තච්චරිත**. ති. එසේ හැසිරෙණ ලද, එසේ හැසුරුණු.

**තච්ඡ**. d. භූ තනුකරණෙ, තුනී කිරීමෙහි, තච්ඡති, තුනී කරයි, සසියි.

**තච්ඡ**. න සැබෑතෙපුල, සත්‍යවචනය.

**තච්ඡක**. පු-වඩුවා, සසින්නා.

**තච්ඡන**. න-සැසීම, තුනී කිරීම.

**තච්ඡති**. ක්‍රි-(තච්ඡ d භූ. තනු කරණෙ, තුනී කිරීමෙහි+ති) සසියි.

**තච්ඡනී**. ඉ-වෑය, සසිනා ආයුධය.

**තච්ඡිත**. ති-සසිතලද, සැස පු.

**තජ්ජ**. d චු-තජ්ජනෙ, තර්ජනයෙහි, තජ්ජෙති තැතිගන්වයි.

**තජ්ජ**. d. භූ හසසනෙ, අපකාර වචනයෙහි, තජ්ජති, තර්ජනය කරයි.

**තජ්ජ**. න ඊට සුදුසු, ඊට යොග්‍ය.

**තජ්ජන**. න-තර්ජනය, තැති ගැන්වීම.

**තජ්ජනී**. ඉ-තර්ජනිය, දබර ඇඟිල්ල.

**තජ්ජනීයකම්ම**. න-භික්ෂුන් පිළිබඳ විනය කර්මයක්.

**තජ්ජාරි**. ඉ අනුප්‍රමාණ සතිසක්, අනුබලනු.

**තජ්ජිත**. ති තැති ගන්වනලද, තැතිගත්.

**තජ්ජෙති**. ක්‍රි (තජ්ජ d. චු තජ්ජනෙ, තර්ජන යෙහි+ණෙ+ති) තර්ජනය කරයි

**තඤ්චු**. d භූ. ගතියං, ගමනෙහි, තඤ්චතියෙයි.

**තට** d. භූ-උස්සයෙ. උසස් ගතියෙහි, තටති. උස්වෙයි.

**තට**. පු-පර්වත ප්‍රන්ත; ප්‍රපාතය.

**තට**. ති-ඉවුර, ගංගා ආදියෙහි ඉවුර.

**තට්ට** d භූ-ඡෙදනෙ, සිඳීමෙහි, තට්ටති, සිඳියි

**තට්ටක**. පු-ආහාර අල්ලන තැටිය, පැතලි පාත්‍රය,

**තඩි**. d. භූ-තාලනෙ, තැළීමෙහි, තණ්ඩති, විතණ්ඩති, තළයි.

**තඩි**. d. චු තාඩනෙ, තැළීමෙහි, තණ්ඩෙති, තණ්ඩයති, තළයි.

**තණ්ඩුල**. න-සාල්, සහල්, වළගසාල්.

**තණ්ඩුලික**. පු-සුලුකුර.

**තණ්ඩුලෙය්‍ය**. පු-සුලුකුර.

**තණ්හක්ඛය**. පු තෘෂ්ණාක්ෂය, නිවණ.

**තණ්හා**. ඉ-තෘෂ්ණාව, පිපාසය, එනම් මාරදුව.

**තත**. ති-පලල, පතළ.

**තතිය**. ති-තුන්වැනි, තෙවැනි,

**තතියක්ඛ**. පු-තෘතීයා අක්ෂය.

**තතියා**. ඉ-තෘතීය, තුන්වැනි, තියවක. තුන් වන විභක්ති, තෘතීයාව.

**තතත**. ති-රත්වූ, තපත, තවන ලද, තැවුනු

**තතක**. ති. එපමණ, එතෙක්.

**තතතභාණ්ඩ**. පිලි විවීමට උවමනා බඩු.

(12046)

**තතො**. අ-හෙතුවීයෙහි, එහෙයින්.

**තතොපරං**. අ-එයින් මතු, එයින් මත්තෙහි.

**තත්ථ**. අ-එහි.

**තත්‍ර** අ-එහි.

**තථ**. ති-ස්වභාවය, ස්ථිර, සත්‍ය, තථා ස්වභාවය

**තථතා**. ඉ-තථභාවය.

**තථරිව**. අ-උපමායෙහි, එසේ.

**තථා**. අ-උපාමායෙහි, එසේ.

**තථාරූප**. ති. එබඳු, එයාකාර.

**තථාගත**. පු බුදුරජානන් වහන්සේ. සත්වයා.

**තථෙව**. අ-උපමායෙහි, එසේ.

**තදක්ඛයොජනා**. ඉ-

**තදඞ්ගවිමුත්ති**. ඉ-යම් යම් කුසලාඞ්ගයකින් යම් යම් අකුසලාඞ්ගයක් ප්‍රහීණ කෙරේ එය තදඞ්ග විමුක්තියයි. තදඞ්ගප්‍රහාණය

**තදඞ්ගප්පහාන**. න-තදඞ්ග විමුක්තිය.

**තදනන්තර**. න-ඒ උතුම්කොට ඇති.

**තදධිමුත්ත**. ති-එයින් මිදුනු, එයින් මිදේ.

**තදනුරූප**. ත ඊට සුදුසු, ඊට ගැලපෙන, තදනුකූල.

**තදා**. අ-ඒකාලයෙහි, එසමයෙහි, ඒවිට.

**තදාත්ත**. න. එකල.

**තදානි**. අ එකල, එසමයෙහි.

**තදි**. d. භූ - ආලසියේ, මැලවීමෙහි, තන්දති, මැලිවෙයි.

**තදි**. d. රු - හිංසායං, පීඩාවෙහි, තන්දති, පෙලයි.

**තදූපික**. අ- මෙවගේ.

**තදූපිය**. අ-එවැනි,

**තදූපෙත**. පු-එයින් යුක්ත, ඒ හා යෙදුනු.

**තන්තවාය**. පු - පිළිවියන්නා, පෙසකාරයා, පෙහරා.

**තන්ති**. ඉ-පෙළ, පරම්පරාව, පරම්පරාගත සිරිත, පාලිභාෂාව මූලභාෂාව, බුඞභාෂාව.

**තන්ති**. ති-වීණාව, වීණතත.

**තන්තු**. පු-හුය, නූල.

**තන්තුභ**. පු-

**තන්දි**. ති-නිද්‍රාව, ප්‍රමාදය, මැලිය, තෙමරිය.

**තන්නින්න**. ති-ඊට නැමුණු, ඊට අවනත.

**තනය**. පු-පුත්‍රයා, පුතා.

**තනු**. ඉ-බම්, සම, සරීරය.

**තනු**. ති-අල්පාවී, තුනී, සිහින්, හින්දූරි.

**තනු**. d ත-විත්ථාරෙ, පැතිරීමෙහි, තනොති, පතුරුවයි.

**තනුක**. ති-තුනී, නොපටු.

**තනුකත**. පු-තුනීකළ, සස්තාලද.

**තනුජ**. පු-පුත්‍රයා, පුතා.

**තනුය**. පු-පුත්‍රයා, පුතා.

**තනුය**. පු තනුජ, පුත්‍රයා.

**තනුරුහ**. පු-රොම, මයිල්.

**තනොති**. ක්‍රි-පතුරුවයි, තනුබලනු.

**තප**. d. භූ-සන්තාපපනෙ, තැවීමෙහි, තපති සන්තාපපති, තැවෙයි, වියලෙයි.

**තප**. d. චු - සංතපපනෙ, සංතපෙණයෙහි, සැතැප්පවීමෙහි සන්තපෙති, සන්තපපයති, සංතර්පණයකරයි, සතප්පවයි, තෘප්තියට පමුණුවයි.

**තපන**. න-තෘප්තිය, පිනවීම.

**තපති**. ක්‍රි-තැවෙයි, තප, තපපබලනු

**තපබ්භාර**. පු - ඊට අභිමුඛකය ඇති, ඊට අවනත.

**තපර**. පු තපපර, එහි ඇලුනු

**තපොණ**. පු-ඊට නැමුණුකය ඇති, දිසාවට නැමුණු.

**තප**. පු-තැවීම, ව්‍රතය, ධර්මය.

**තප**. d. භූ-දිත්තියං තපති, තැවෙයි, දිලිසෙයි.

**තප**. d දි-සන්තාපපිනනෙ, තැවීමෙහි, පිනවීමෙහි, තපපති සන්තපපති, තැවෙයි, පිනවයි.

**තප**. d චු දහෙ, දහයෙහි, තපෙති තපයති තැවෙයි.

**තප**. d. චු - පිනනෙ, පිනවීමෙහි, තපෙති, තපයති, පිනවයි.

**තප**. d. චු-ඛයෙ, ක්ෂයවීමෙහි, තපෙති, තපයති, ක්ෂයවෙයි.

(12102)

**තපති**. ක්‍රි-(තප. d. දි-සන්තාපෙ, තැවීමෙහි, ×ති) තැවෙයි,

**තපන**. න-තාපය, සූර්‍ය්‍යයා, තැවීම කරණ.

**තපනීය**. න-රත්රන්, තැවීම කරණ.

**තපස්සී** පු - තපස් ඇත්තා, අනුකම්පාකටයුතු දුක්ඛිතයා, ශ්‍රමණයා, තවුසා.

**තපු**. d. භූ - උබ්බෙගෙ, කලකිරීමෙහි, බියවීමෙහි.

**තපොවන** න - තපස ධනකොට ඇත්තා, තාපසයා, පැවිද්දා.

**තප්ප**. d. භූ - තිත්තියං, තෘප්තියෙහි, තප්පති, තෘප්තියට පැමිණෙයි.

**තප්පති**. ක්‍රි - (තප්ප, d. භූ-තිත්තියං තෘප්තියෙහි ×ති) තෘප්තියට යයි.

**තබ්භාව**. පු-තද්භාවය, ඒ වීම,

**තම්බ**. න- ලොහ විශෙෂය, තඹ, එනම්,

**තම්බ**. පු-එනම් ඇත්කුලය.

**තම්බ**. න-තඹ, රක්තවර්ණය, තාම්බුවර්ණය.

**තම්බක**. පු-තම්පලා

**තම්බචූල**. පු-තඹසිළු, කුකුළා.

**තමස්සිනී**. ඉ-රාත්‍රිය.

**තමී**. ඉ-රාත්‍රිය.

**තම**. d. භූ-සාන්තවාදියෙ, සැනසීමෙහි, පසු බැසීමෙහි, තමති, සැනසෙයි, පසුබසී.

**තම**. d. චු-භූසනෙ, සැරසීමෙහි ගිලන් බැව්හි, තමෙති තමයති, අලඞ්කාරවෙයි.

**තම**. පු. න-අඥන, අන්ධකාර, තාමස ගුණය, රාහු.

**තමාල**. පු-තමලුගස.

**තමුස්සන්නා**. ඉ-අන්ධකාර බහුල රාත්‍රිය.

**තයී**. ඉ-වෙදත්‍රය, ඍක් යජුස්, සාම යන වේද තුණ.

**තර**. d භූ-තරණප්ලවනෙසු, එතෙරවීමෙහි, පීනීමෙහි, තරති, එතරකරයි, පීනයි.

**තර**. d. භූ-වෙගෙ, ජවයෙහි, තරති. වෙගයෙන් යෙයි, තරිතො, තරගො, අතරමානො.

**තර**. පු-පහුර, පසුර, ශක්තිය.

**තරඞ්ග**. පු-තරඟ, දියරැල.

**තරච්ඡ**. පු කරබාතවලසා, සුනඛාකාර ව්‍යාඝ්‍ර විශෙෂයක් කළුහිස්වලසා.

**තරණ**. න-එතරවීම, එතරවන. එගොඩවීම.

**තරණී**. ඉ-නැව, ජලයෙන් එතරවීමට උප කාරවන ඔරු ආදිය.

**තරති**. ක්‍රි-එතෙරවෙයි, තර බලනු.

**තරමාන**. පු-ඉක්මන්, වහා, හනික.

**තරමාන රූප**. පු. න-යුහුසුළු සවභාව ඇති, ඉක්මන් සවභාව ඇති, ඉක්මන් ගතිය.

**තරල**. න කැඳ යාගුව.

**තරල**. ති-චඤ්චල, සැලෙන.

**තරහි**. අ-ඒකාලයෙහි, එවිට

**තරී**. ඉ-නැව, තරණය කරන්නී.

**තරු**. පු-වෘක්ෂය, ගස.

**තරුණ**. ති-ලදරු, අභිනව, යෞවන වයසට පැමිණියා, මාණවකයා.

**තරුණක**. පු-පැටියා, ලපටියා, තරුණයා.

**තරුසණ්ඩ**. පු-වෘක්ෂසමූහය, වෘක්ෂ ග්‍රහණය.

**තල**. න-සවරූපය, යට, පොළව, ගොඩබිම.

**තල**. d. චු-පතිට්ඨාය, පිහිටීමෙහි, තාලෙති, තාලයති, පිහිටයි.

**තලික**. ති-සිදුරක් ඇති,

**තලුණ**. පු-තරුණ, මෘදු, මොලොක්.

**තස**. ති-ඇවිදිනාදෙය, සෙලවන වස්තුව.

**තස**. d. භූ උබ්බෙගෙ, උද්වෙගයෙහි, තසති, තැතිගණී.

**තස** d. දි-පිපාසායං, පිපාසයෙහි, දිය බොනු රිස්සෙහි, තස්සති, පිපාසිත වෙයි, පරිතස්සති.

**තස** d චු ධාරණගහණවාරණෙ, දැරීම, ගැනීම යන මෙහි, තාසෙති තාසයති, දැරීම ගැනීම වැළැක්වීම කරයි.

**තස්මා**. අ එහෙයින්, එබැවින්.

**තස්සති**. ක්‍රි-පිපාසිත වෙයි, තස බලනු.

**තස්සන**. න-පිපාසාව, තැතිගැන්ම.

(12154)

**තස්ස පාපියසිකා**. ඉ - එනම් විනයක්‍රමයක්.

**තසති**. ක්‍රි-තැතිගණී. තසබලනු.

**තසර**. පු-පිළිවියන හරස්දණ්ඩ, නූල් ඔතන දණ්ඩ.

**තසිත**. ති-ත්‍රස්ත, තැතිගන්වන ලද, පිපාසිත දිය බොනු රිස්ස.

**තසිතා**. ඉ-තෘෂ්ණාව, තණ්හාව.

**තහ**. d. භූ - හිංසායං, හිංසාවෙහි, තහති, හිංසා කරයි.

**තහං**. අ-එහි, ඒ අවසථාවෙහි, තහිං.

**තහිං**. අ-එහි, ඒ අවසථාවෙහි, තහං.

**තළ**. d චු-තාළනෙ, තැළීමෙහි, තාළෙති තාළයති, තළයි, පෙළයි, තසයි.

**තළාක**. පු-විල, තඩාගය.

## තා

**තා**. d. දි. පාලනෙ, රැකිමෙහි, තායති, රක්‍ෂා කෙරෙයි.

**තාන**. න-රක්‍ෂා සථානය, සැඟවියයුතු තැන, නිවණ.

**තාත**. පු පියා, තාත්තා.

**තාත**. ති-රක්නා ලද්ද.

**තාදි**. පු-එබඳු, බුදුරජ.

**තාදිස**. ති එබඳු, එයාකාර.

**තාදිසක**. ති-එබඳු, එයාකාර.

**තාප**. පු-කුකුස, තැවීම, එනම් නිරය.

**තාපන**. න-තැවීම, උණුසුම්කිරීම.

**තාපස**. පු තාපසයා, මුනි, සෘෂියා.

**තාපසතරු**. පු-වැලපෙණ.

**තාපිඤ්ඡ** පු-කමලු ගස.

**තාපෙති**. ක්‍රි - (තප d. භූ-තාපෙ, තැවීමෙහි ණෙ × ති) තවයි.

**තාමරස**. න-පද්මය, පියුම.

**තාම්බූලි**. ඉ-බුලත්වැල, නාගලතා.

**තාය**. d භූ-සන්තානෙ, නොසිඳ පැවැත්මෙහි, තායති, නොසිඳ පවතී

**තාය** d. චු - තරණෙ එතෙර කිරීමෙහි, තායෙති, තායති, එතෙරකරයි.

**තායි**. d. භූ-වුඩ්ඪියං, වෘඩියෙහි, තායිති, වඩයි.

**තාර**. ති-ඉතා උස් හඬ.

**තාර**. ති-ඉතා උස් හඬ.

**තාරකරාජා**. පු-උලුරජ, චන්ද්‍රයා.

**තාරකා**. ඉ-න-තරු, තාරකා.

**තාරකා**. ඉ-නක්‍ෂත්‍ර, ටිහිතිය, නෙත්‍ර මධ්‍යය, ඇහේ කළු ඉංගිරියාව.

**තාරණීය**. පු - තරණය කටයුතු, එතර කටයුතු.

**තාරයති**. ක්‍රි - (තර + ණය + ති + වුඩ්ඪි) එතර කරයි.

**තාරා**. ඉ-ටිහිතිය, තාරකා.

**තාරාපථ**. පු - තාරා ගමන් කරණ මාර්ගය, අහස, ගුවන.

**තාරාපති**. පු-තාරානාථයා, චන්ද්‍රයා.

**තාල**. පු හිරයල්, මාපට ඇඟිල්ල හා තර්ජනිය විදහා ගත්කල අතර, කෙස්ස, තල් ගස, තූර්‍ය්‍යවාදනයේ විශෙෂයක්=තාලම්පට.

**තාලවජ්ඣගල**. පු-කෙසි සිදුර, යතුරු කපල්ල.

**තාලච්ඡිද්ද**. න යතුරු සිදුර, යතුරු කපල්ල.

**තාලපණ්ණ**. න-තල්පත, කර්ණාභරණය, කන් තෝඩු.

**තාලවණ්ට**. න තල් වැට, විජිනිපත, පවන් පත.

**තාලසද්ද**. පු අත්ලෙන් අත්ල ගැසීමේ ශබ්දය, අප්පුඩි ගැසීම, තාලම්පට ශබ්දය.

**තාලා**. ඉ කංස තාලාදි තූර්‍ය්‍ය භාණ්ඩ.

**තාලාවත්ථුක**. පු - මස්තකය-කරටිය සිඳින ලද තල් ගසක් මෙන් කරණ ලද.

**තාලි**. ඉ-තල්ගස, තලගස.

**තාලීස**. පු-පතොක්.

**තාලු**. න-තල්ල.

**තාලුජ**. පු-තල්ලෙන් උපන්.

**තාව**. අ-පරිච්ඡේදාර්ථයෙහි, එපමණක්.

**තාවකාලික**. ති-එතකල්, ඒ වේලාවට සුදුසු, ටික වේලාවක් පවත්නා, කාලික බලනු.

**තාවතක**. න-එපමණ.

(12207)

**තාවතා**. අ-එපමණ, එතෙක්.

**තාවදෙ**. අ-එකල්හි, එසමයෙහි.

**තාවදෙව**. අ-එකෙණෙහිම, එවිට.

**තාවතිංස**. ඉ-තව්තිසා දෙව්ලොව.

**තාස**. d. චු - සංතරණෙ, එතර කිරීමෙහි, තාසෙති, තාසයති, එතෙර වෙයි.

**තාසු**. d. චු - නිවාරණෙ, අකවරණයෙහි, තාසෙති, තාසයති, නිවාරණය කරයි.

**තාල**. පු-කෙස්ස, තුයහීංවයවය, වෘක්ෂ විශෙෂය=තල්.

**තාලෙති**. ක්‍රි-(තළ+ණෙ+ති) තළවයි, තළ බලනු.

## ති

**ති**. ති-ත්‍රිසංඛ්‍යාව, තුණ.

**තිංස**. තිංසති -ඉ- තිසයි, 30.

**තික**. පු-තුන්දෙනෙකුන්ගේ සමූහය, ත්‍රිකය.

**තික**. d. භූ-ගතියං, යාමෙහි, තෙකති, යෙයි.

**තික**. d. සු-හිංසායං, පෙළීමෙහි, තිකුණති, පෙළයි.

**තිකාල**. පු-අතීතානාගතවර්තමාන යන කාල තුණ.

**තිකාලවිදූ**. පු - තුන්කල් දත් තැනැත්තා, සර්වඥයන් වහන්සේ.

**තිකිච්ඡක**. පු-පිළියම් කරන්නා, වෛද්‍යයා.

**තිකිච්ඡති**. ක්‍රි-(කිත, d. භූ. රොගාපනයනෙ, රොග සුව කිරීමෙහි+ති) සුවකරයි.

**තිකිච්ඡන**. න-පිළියම් කිරීම, වෙදකම් කිරීම.

**තිකිච්ඡා**. ඉ-පිළියම, වෙදකම, වෛද්‍යශාස්ත්‍රය.

**තිකූට**. පු-ත්‍රිකූට පර්වතය.

**තික්ඛ**. න තියුණු, යකඩ.

**තික්ඛින්ද්‍රිය** න-තියුණු ඉන්ද්‍රිය ඇත්තා.

**තික්ඛත්තුං**. අ-තුන්වරක්. තුන්විටක්.

**තිඛිණ**. ති-තියුණු, මුවහත් ඇති.

**තිගොචර** පු-තිදෙනෙකුට විෂයවන.

**තිචීවර**. න - දෙපට සිවුර, තනිපට සිවුර, අඳනය යන සිවුරු තුණ.

**තිජ** d. භූ. ඛමායං, ඉවසීමෙහි, තිතික්ඛති, ඉවසයි.

**තිජ**. d. භූ - නිසානෙ, තියුණු කිරීමෙහි, තෙජෙති, තියුණු කරයි, මුවහත් කරයි.

**තිජ**. d. චු - නිසානෙ, තියුණු කිරීමෙහි, තෙජෙති, තෙජයති, තියුණු කරයි.

**තිට්ඨ**. ක්‍රි-සිටුව යනාර්ථ ඇති ක්‍රියාවක්.

**තිට්ඨති**. ක්‍රි-(ඨා=තිට්ඨ+ති) සිටියි, නවතියි.

**තිට්ඨනත**. ති-සිටීම, නැවතීම.

**තිණ්ණ**. ති-එතෙරවන ලද, එතෙරවූ, එතර වීම.

**තිණ්හ**. තියුණු, මුවහත් කළු.

**තිණ**. න-තෘණ, තණ, තණකොළ.

**තිණගහණ**. න-තෘණග්‍රහණය, තණ ලැහැබ

**තිණභිසි**. ඉ-තෘණ බිස්ස, තණකොළ බිස්ස.

**තිණව**. පු-පණාබෙර.

**තිණවත්ථාරක**. පු-තණ ඇතිරිය, කලාලය, තෘණවලින් වැසීම, එනම් විනය කර්මය.

**තිණසන්ථාරක**. පු - තෘණ ඇතිරිය, තණකොල ඇතිරිය, කලාලය.

**තිණසූල**. න-බෝලිද්දගස, තණසුල.

**තිණු**. d. ත-අදනෙ, කෑමෙහි, තිණෙති, කයි. අනුභව කරයි.

**තිතික්ඛා**. ඉ-ක්ෂමාව, ඉවසීම.

**තිතික්ඛති**. ක්‍රි-(තිජ, d භූ - ඛමායං, ඉවසීමෙහි+ති) ඉවසයි.

**තිතික්ඛන**. න-ඉවසීම, ක්ෂමා කිරීම.

**තිතික්ඛාවනතු**. පු-ඉවසන තැනැත්තා.

**තිත්ත**. පු-තිත්තරසය, තෘප්තියට පැමිණියනු.

**තිත්තක**. පු-දුම්මැල්ල, කොසඹ, තිත්ත දේ.

**තිත්තිණීක**. පු-ලුණුවරණ ගස.

**තිත්ති**. ඉ-තෘප්තිය, ඇතිවීම, සෑහීම.

**තිත්තික**. ති - හොඳට පිරුණු, කට ළඟට පිරුණු.

**තිත්තිර**. පු-තිත්වටුවා, වටුවා.

(12259)

**තිත්තිරිය**. පු-තිත්වටුවාට අයිති.

**තිත්ථ**. පු-ගුණය, උපාය, තොටුපල, පවිත්‍රය, ජලය, ලබ්ධිය.

**තිත්ථකර**. පු-ලබ්ධි ඇතිකරන්නා, තීර්ථකයා.

**තිත්ථඤ්ඤුතා**. ඉ-තීර්ථක ඥානය.

**තිත්ථායතන**. න-තීර්ථායතනය, ලබ්ධි ඇති කරණ ස්ථානය.

**තිත්ථික**. පු - තීර්ථකයා, මිථ්‍යා ලබ්ධි ඇති කරන්නා.

**තිත්ථියා**. පු-තීර්ථකයා, තිත්ථකයා.

**තිත්ථියසාවක**. ති - තීර්ථක ශ්‍රාවකයා, මිථ්‍යා ලබ්ධි තීර්ථකයින්ගේ ශ්‍රාවකයා.

**තිපි**. ඉ-පැලවිය දියවකාදිවක් පඞ්ක්ති, තිපි.

**තිපිභෙද**. පු-තිපි පිළිබඳ බේද, වෙනස්කම්,

**තිදස**. පු-තිදස, තිදස, තව්තිසා වැසි දෙවියා, ත්‍රිදස.

**තිදසාධිපති**. පු-ශක්‍රයා, තව්තිසා දෙව්ලොවට අධිපතියා.

**තිදසාලය**. පු-ත්‍රිදසාලය, තිදස දෙවියා, තව්-තිසා දෙව්ලොව.

**තිදිව**. පු-ත්‍රිදසාලය, තව්තිසාව.

**තිදිවාධිභූ**. පු-ත්‍රිදසයට අධිපතියා, ශක්‍රයා.

**තිදිවාධාර**. පු-මහමෙර.

**තිධා**. අ - ත්‍රිධා, ත්‍රිවිධාකාරයෙන්, තුන් පරිද්දකින්.

**තිනන**. ති-තෙත, ආද්‍රදෙය.

**තිනතිණ**. න-ආශාව, කැමැත්ත.

**තිනතිනති**. ක්‍රි-අඳුරු කරයි.

**තිනතිණී**. ඉ-සිනිඹලා, සියඹලා ගස.

**තින්දුක**. පු-තිඹිරිගස.

**තින්දුකාලක**. පු-තිඹිරිපෙතෙල්ල, තිඹිරිදර-පෙතෙල්ල.

**තිනක**. ති-තෙත්දෙය.

**තිපථගා**. ඉ-ගඞ්ගා නදිය.

**තිපු**. d. භූ-ලජ්ජායං. තිපතෙ ලජ්ජාවෙයි.

**තිපු**. පු-ඊයම්.

**තිපුරනාසක**. පු-ඊශ්වරයා, ශිව.

**තිපුටා**. ඉ-සුදුත්‍රසතවාලු, හීන් එන්සාල්.

**තිපුස**. න-කැකිරි විශෙෂයක්.

**තිප්ප**. ති-තීව්‍ර, දැඩි, කැකුළු.

**තිබ්බ**. ති-තිව්‍ර, අතිශය, තියුණුදෙය.

**තිබ්බරාග**. පු-තීව්‍රරාගය, අධිකරාගය, දැඩි රාගය.

**තිභව**. පු-භවත්‍රය, තුන්භවය, ත්‍රිවිධ ලොකය.

**තිමි**. පු-එනම් මහා මත්ස්‍යයා.

**තිමිඞ්ගල**. පු-එනම මහා මත්ස්‍යයා.

**තිමිර**. න-අන්ධකාරය, කළුවර, අඳුර.

**තිමිස**. න-අන්ධකාරය, අඳුර.

**තිමිසිකා**. ඉ-අන්ධකාර බහුල රාත්‍රිය.

**තිමු** d. භූ-චු. තෙමන සංකාසු, තෙමීමෙහි, සැකකිරීමෙහි, තෙමති. තෙමෙති, තෙමයති, තෙමෙයි, සැක කරයි.

**තිම්බරු**. පු-තිඹිරිගස, එනම් අසුරයා.

**තිම්බරුසක**. පු-තිඹිරගස.

**තියාම**. පු-ප්‍රථමාදි යාම තුණ, යාමයකට සිංහල පැය දසයකි, රාත්‍රිය.

**තියාමරත්ති**. ඉ-යාමත්‍රයෙන් යුත් රාත්‍රිය. සම්පූර්ණරාත්‍රිය, මුලු රෑ.

**තිර**. d. භූ-අධොගමනෙ, පහතට යාමෙහි, තිරති, පහතට යයි, පහත්වයයි.

**තිරක්කාර**. පු-පරිභවය, අවඥව.

**තිරච්ඡ**. පු-තිරිසනා, තිරශ්චිනයා.

**තිරච්ඡාන**. පු-තිරිසනා.

**තිරච්ඡානගත**. පු-තිරිසනා, තිරිසන්ගතයා.

**තිරියං** අ-සරස්හි, සරස, හරහ.

**තිරිටක**. න-රිටිසුඹුල, රුක්පොතු.

**තිරො**. අ-සංවරණය, සරස්හි

**තිරොකරණී**. ඉ - තිරය, කඩතුරාව, ජවනිකාව.

**තිරොකුඩ්ඩ** න-බිත්තියෙන් පිටත.

**තිරොක්කාර**. පු-අවමානනය, පරිභවය.

**තිරොධාන**. න-පියන.

**තිල**. d. චු-සෙනහෙ, මෘදුකිරීමෙහි, තෙලෙති, තෙලයති, මෘදුකරයි.

**තිල**. d. භූ-ගතියං, ගමනෙහි, තිලති, යෙයි.

**තිලක**. පු-මදට වෘක්ෂය, තලකැලල.

**තිලකාලක**. පු-තලකැලල, අටකරිස.

**තිලකාහතගත්ත** න-තලකැලලින් යුත් ශරීරය.

**තිලපණ්ණී**. ඉ-රත්සඳුන්.

**තිලබීජ**. න-තල ඇටය, තල ඇටයක් පමණ, නීලවණී, දියසෙවෙල් විශෙෂයක්.

**තිලවාහ**. පු-තල පිරූ ගැල.

**තිලිඞ්ග**. ති-ස්ත්‍රී, පුං, නපුංසක යන ලිඟු තුණ.

**තිලසූල**. න-බෝලිද්ද

**තිලිච්ඡ**. පු-පොළඟා, තෙලිස්සා.

**තිලොක**. පු-ත්‍රිවිධලොකය.

**තිලොචන**. න-නෙත් තුණක් ඇත්තා, ඊශ්වරයා.

**තිවග්ග**. පු-ත්‍රිවර්ගී සම්පත්තිය, ධර්මාර්ථකාම මොක්ෂ යන තුණ, තිපල්.

**තිවික්කම**. පු-ත්‍රිවික්‍රමය, විෂ්ණු.

**තිවිජ්ජා**. ඉ-ත්‍රිවිද්‍යාව, තෙවිජ්ජා, තිවිදු

**තිවිධ**. පු-ත්‍රිවිධි, තුන්ප්‍රකාර.

**තිවිධ පපඤ්ච**. පු-ත්‍රිවිධ ප්‍රපඤ්චය, තණ්හා මාන දිට්ඨි යන තුණ.

**තිවිධසඤ්ඤා**. ඉ-ත්‍රිවිධ සංඥාව.

**තිවිධවිතක්ක**. පු-කාමව්‍යාපාද විහිංසා යන විතර්කතුණ.

**තිවුතා**. ඉ-ත්‍රිවෘතා, සුදු ත්‍රාසතඑාලු.

**තිස්සඵලා**. ඉ-නෙල්ලි.

**තිස**. d. භූ-දිත්ති තිත්තිසු, දීප්තියෙහි, තෘප්තියෙහි, තෙසති, තිසති, බබලයි, තෘප්තිකරයි.

**තිසත**. පු-තුන්සියය.

**තිසරණ**. න-ත්‍රිශරණ, ශරණත්‍රය, බුදුරජ.

**තිසහස්සී**. පු-තුන්වන සහස්‍රයෙන් ගුණකළ දහස, කෝටිය.

**තිසහස්සිලොකධාතු**. ඉ-තුන්වන සහස්‍රයෙන් ගුණකළ ලොකධාතුව, විසහස්සී ලොකධාතු බලනු. කෝටියක් සක්වළ.

**තිසිඛ**. පු-දෙව්ලොව.

**තීර**. d. චු-කම්මසමත්තිමහි, ක්‍රියාසමාප්තියෙහි, තීරෙති තීරයති, ක්‍රියා අවසන් කරයි.

**තීර**. න-ඉවුර, ගංගා ආදීන්ගේ තෙර, තීරණය.

**තීරණ**. න-නිශ්චය, තීන්දු.

**තීරණපඤ්ඤා**. ඉ-තීරණප්‍රඥාව, නිශ්චය කරණ ප්‍රඥාව.

**තීරෙති**. ක්‍රි - (තීර + ණෙ + ති) තීරණය කරයි.

**තීහං**. තුන් දිනක්, තුන් දවසක්.

## තු

**තු**. අ-විශෙෂාර්ථ අවධාරණාර්ථයන්හි.

**තුඞ්ග**. ඉ-උස්දෙය, උසස්.

**තුච්ඡ** ති-හිස්, පුහු, නිසරු, කිසිවක් නැති.

**තුච්ඡවචන**. න-හිස් වචන. නිස්ඵල වචන.

**තුජ**. d. භූ-හිංසායං, හිංසාවෙහි, තොජති, හිංසාකරයි.

**තුජ්ජ**. d. චු-සත්තිමහි, ශක්තියෙහි, තුජ්ජෙති, තුජ්ජයති, ශක්තිමත් කරයි.

**තුජි**. d. චු - වචනෙ, කීමෙහි, තුඤ්ජෙති. තුඤ්ජයති, කියයි.

**තුට්ඨ**. පු - තුෂ්ටිප්‍රාප්තයා, සතුටට පැමිණී තැනැත්තා.

**තුට්ඨි**. ඉ-සතුට, සන්තොෂය.

**තුට**. d. භූ-චු, කලහෙ, ඩබරකිරීමෙහි, තුටති, තුටෙති, තුටයති, කලහකරයි.

**තුවි**. ඉ-හීන් එන්සාල්

**තුඩි**. d. භූ-තොඩනෙ, මිරිකීමෙහි, ඉරීමෙහි, තුණ්ඩති, මිරිකයි, ඉරයි.

**තුණ්ඩ**. න-හොට, මූඛය.

**තුණ්ඩක**. න-මූඛය, හොට.

**තුණ්ඩික**. පු-හොටක් ඇත්තා.

**තුණ්ඩිකෙසරී**. ඉ-කපු, කෙම්වැල.

**තුණ්ණ**. න-ශීඝ්‍රය, වහා.

**තුණ්ණවාය**. පු-සන්නාලියා, වස්ත්‍රවියන්නා, පෙසකාරයා.

(12367)

**තුණ්හී**. අ - නිශ්ශබ්දය, නොබිනීම, කථා නොකිරීම.

**තුණ්හීභාව**. පු-නිශ්ශබ්දභාවය, නොබිනීම්, සවභාවය.

**තුණ්හීයති**. ක්‍රි-(තුණ්හී + ඊය + ති) නිශ්ශබ්ද වෙයි.

**තුණ්හීර**. න-ඊකොපුව.

**තුණ**. d. භූ - කොටිල්ලෙ, කුටිලභාවයෙහි, තොණති, වක්ව යෙයි.

**තුත්ත**. න-කැවිට, කෙවිට. ඇතුත්ගේ කණ මූල විදින කටුව, තොමර බලනු.

**තුත්ථා**. ඉ-බෙරු, බෙරු තෘණ.

**තුද**. d. භූ-ව්‍යථායං, පෙළීමෙහි, තුදති, විදියි. පෙළයි, විතුදති.

**තුදති**. ක්‍රි-(තුද. d. භූ, බ්‍යථනෙ, පෙළීමෙහි + ති) පෙළයි, අනියි.

**තුදන**. න-විදීම, පෙළීම.

**තුදම්පති**. පු-අඹුසැමි දෙදෙනා.

**තුන්ද**. පු-අලසයා.

**තුප**. d. භූ - හිංසායං, පීඩාවෙහි, තොපති, තුම්පති, හිංසා කරයි.

**තුහ**. d. භූ - දී- හිංසායං, පීඩාවෙහි, තුහති, තුබ්හති, පීඩාකරයි.

**තුබ්බ**. d. භූ-හිංසායං, පෙළීමෙහි, තුබ්බති, පෙළයි.

**තුබි**. d. භූ - පීඩනෙ, පීඩාවෙයි, තුම්බති, පෙළයි.

**තුම්බ**. පු - කෙණ්ඩිය, ලාස්ස, ලාභ=නැළි සතරක්, පැන්සැළිය.

**තුම්බකටාහ**. පු-ලබුකබල.

**තුම්බී**. ඉ-ලබු, ලාබු.

**තුමා** පු-හෙතෙම.

**තුරග**. පු-වෙග ගමන් ඇත්තා, අශ්වයා.

**තුරගම**. පු-අශ්වයා.

**තුරඞ්ගම**. පු-ශීඝ්‍ර ගමන් ඇත්තා, අශ්වයා.

**තුරති**. ක්‍රි-(තුර + ති) ශීඝ්‍රවයෙයි

**තුරිත**. න-ශීඝ්‍රය, ශීඝ්‍රජව ඇත්තා.

**තුරිය**. න-තූර්‍ය්‍යය, තුරු.

**තුරියඞ්ග**. න-තූර්‍ය්‍යාවයව, තූර්‍ය්‍ය කොටස්.

**තුරියනතර**. න-තූර්‍ය්‍යාවයව.

**තුරුක්ඛ**. පු-තුරුක්තෙල්.

**තුල**. d. චු-උම්මානෙ, ප්‍රමාණයෙහි, කිරීමෙහි, තොලෙ, තොලයති, කිරයි, ප්‍රමාණකරයි.

**තුල**. ති-උපමාකළ හැකි, නිශ්චය කළ හැකි, මැණිය හැකි.

**තුලන**. න-මැණීම, කිරීම.

**තුලා**. ඉ-තරාදිය, සියක් පලම, සා ද්‍රව්‍යය, ගෘහාවයවය=තලාඳ, තලානය.

**තුලා**. ඉ-තලාගස.

**තුලාකොටි**. ඉ-නුරුවලා, නූපුර බලනු.

**තුලාබීජ**. න-හුනිඳ, ඔලිඳ ඇට.

**තුලාසඞ්ඝාට** න-තලාඳ මුට්ටු, තලාත් සන්ධිය.

**තුලිකා**. ඉ-පුළුන් ඔබා කළ බුදිරිය.

**තුලිත**. ති-උපමා කළ, අගය කළ, කල්පනා කළ

**තුලිස**. පු-පියා බලලා

**තුලෙති**. ක්‍රි-(තුල + ණෙ + ති) ප්‍රමාණ කරයි. මණියි.

**තුල්‍ය**. ති - සදෘශාර්‍ථ, සමාන, වැනි. "ත්වං, තුවං, තං, තවං, අ, තෝ"- නුඹ, තමුසේ.

**තුවට**. න-වහා, ශීඝ්‍ර, හනික.

**තුවට්ට**. d. චු එකාසයනෙ, එකට නිදීමෙහි, තුවට්ටෙති, තුවට්ටයති, එකට සයනය කරයි.

**තුවට්ටෙති**. ක්‍රි - (තුවට්ට + ණෙ + ති) එකට නිදයි, තුවට්ට බලනු.

**තුස**. d භූ-සන්තොසෙ, සතුටුවීමෙහි, තුසති, සතුටුවෙයි.

**තුස**. d. දි-තොසෙ, සතුටුවීමෙහි, තුස්සති, සන්තුස්සති, සතුටුවෙයි.

**තුස**. d. භූ-සද්දෙ, ශබ්දකිරීමෙහි, තුසති, ශබ්ද කරයි.

**තුස්සති**. ක්‍රි-(තුස. d භූ. තොසනෙ, සතුටු කිරීමෙහි + ති) සතුටු වෙයි.

**තුස්සන**. න-සතුටුවීම.

**තුසිත**. න-එ නම් දෙව්ලොව.

**තුසි**. d. චු-භාසායං, කීමෙහි, තුසෙති, තුසයති කියයි (=තුංසෙති, තුංසයති.)

**තුහි** d. භූ-හිංසායං, පීඩාවෙහි, තුහති, තොහති, පීඩාකරයි.

## තූ

**තූණ**. පු-හියවුර.

**තූණ**. d. චු-පූරණෙ, පිරවීමෙහි, තූණෙති, තූණයති, පූරවයි.

**තූණී**. ති-හියවුර.

**තූණීර**. පු-හියවුර.

**තූල**. පු-පුලුන්, තරාදි දණ්ඩ, එනම් යන්ත්‍රය.

**තූලිකා**. ඉ-පුලුන් ආදියෙන් කළ මෙට්ටය, "තිණ්ණං තූලානං අඤ්ඤතර පුණ්ණා තූලිකා."

**තූලිනී**. ඉ-කපුගස.

## තෙ

**තෙ**. d භූ-පාලනෙ, රැකීමෙහි, තායති, රකියි.

**තෙකාලික**. ති-තුන්කාලයට අයිති.

**තෙකිච්ඡ**. ති-පිළියම, බෙහෙත් කිරීම.

**තෙචීවරික**. පු-තුන්සිවුරු දරන්නා, ඇත්තා.

**තෙචීවරිකඞ්ග**. න-වැඩි සිවුරු අත්හැර තුන් සිවුරු පමණක් දැරීම වූ අඞ්ගය, ව්‍රතය.

**තෙජ**. පු-තෙද, තේජස, ශක්තිය, ආනුභාවය, දීප්තිය, ගින්න.

**තෙජන**. න-හීය, සැරය, ඊසැරය=බිහිබට, හුණගස.

**තෙජනී**. ඉ-මොරගස.

**තෙජවන්ත** පු-තෙජස් ඇති, තෙදැති.

**තෙජස්සී**. ති-තෙද ඇති.

**තෙජී**. ති-තෙජස් ඇති, තෙදැති

**තෙජිත**. ති-තියුණුකළ, මුවාත්කළ.

**තෙජොධාතු**. ඉ-තෙජොධාතුව, උෂ්ණය.

**තෙධා** ඉ-ත්‍රිවිධ ධාතුව.

**තෙධාතුක**. පු-ත්‍රිවිධ ධාතුවෙහි පවත්නා, තුන්ලොවට අයිති.

**තෙතිංසති**. ඉ-තෙතිස 33.

**තෙන**. අ-හෙතුවීමයෙහි එ හෙතුවෙන්.

**තෙපිටක**. න-ත්‍රිපිටකය, සූත්‍ර, අභිධම්, විනය යන තුන්පිටකය.

**තෙමන**. න-තෙමීම, ජලයෙන් තෙත්කිරීම.

**තෙරස**. ති-තුදුස, 14.

**තෙල**. න තෙල්, තලතෙල.

**තෙලක**. න-තෙල් ටිකක්.

**තෙලකටාහ**. පු - තෙල් සැලිය, තෙල් ඇතිලිය.

**තෙලපණ්ණික**. න-හෙළ සඳුන්.

**තෙලපජ්ජොතික**. න - ශරීරයෙහි තෙල් රෙදි ඔතා ගිනි දැල්වීමෙන් කරණ එනම් වධය.

**තෙලප්පදීප**. පු-තෙල් ප්‍රදීපය, තෙලින් යුත් පහණ.

**තෙලිය**. ති-තෙල් ගතිය ඇති.

**තෙවිජ්ජා**. ඉ - ත්‍රිවිද්‍යාව, බාහිරක ත්‍රිවිද්‍යාව, ශාසනික ත්‍රිවිද්‍යාව යයි විප්‍රකාරවේ.

## තො

**තොමර**. ති-ඇතුන්ගේ පා විදිනා කටුව.

**තොය**. න-ජලය, දිය.

**තොරණ**. න-තොරණ, බහිවාරය.

**තොස**. d. භූ-චලනෙ, චංචලයෙහි, තොසති, සැලෙයි.

**තොස**. පු-තොෂය, තොස, සන්තොෂය.

**තොසන**. න-සන්තොෂය, සතුට.

**තොසාපන**. න-සතුටු කරවීම.

***තොසිත**. ති-තොෂිත, සතුටුකළ, තුසිත*

**තොසෙති**. ක්‍රි-(තුස d.. භූ. තොසනෙ, සතුටුවීමෙහි + ඔ + ණෙ + ති) සතුටුකරයි, තුස බලනු.

**ත්‍ර්‍යම්බක**. පු-ඊශ්වරයා, තිසඹු.

**ත්‍ර්‍යම්බකසඛ**. පු-වෙසමුනි රජ.

**ත්‍ර්‍යාදි**. පු-ත්‍රයාදිය, තුණ ආදී ගණන්.

**ත්‍රස**. d. භූ-උබ්බෙගෙ, බියපත්වීමෙහි, ත්‍රසති, බියවෙයි.

## ථ

**ථක**. d. චු-ඡාදනෙ, වැසීමෙහි, ථකෙති ථකයති, වසයි,

**ථක**. d. චු-පතිඝාතෙ, ඡාදනයෙහි, ථකෙති, වසයි.

**ථකන**. න-වැසීම.

**ථකෙති**. ක්‍රි-(ථක d. භූ. ඡාදනෙ, වැසීමෙහි + ණෙ + ති) වසයි.

**ථඤ්ඤ**. න-තනකිරි, මව් තනකිරි.

**ථණ්ඩිල**. න-උන්නතභූමි ප්‍රදේශය, රට.

**ථද්ධ**. පු-ස්තබ්ධ, තද.

**ථද්ධමච්ඡරී**. පු-තද මසුරා.

**ථද්ධලූඛ**. පු-තද හා රළු.

**ථද්ධහදය**. ති-තද පපුවක් ඇති.

**ථන**. පු-තනය, පියයුරු.

**ථන**. d. භූ-සද්දෙ, ශබ්දකිරීමෙහි, ථනති, ශබ්ද කරයි.

**ථන**. d චු-දෙවසද්දෙ, මෙඝ ගර්ජනාවෙහි, ථනෙති, ථනයති, අහස ගොරවයි.

**ථනප**. පු-තනබොන්නා, කිරිබොන දරුවා, බාලයා.

**ථනිත**. න-මෙඝධ්වනිය, මෙඝනාදය.

**ථනෙති**. ක්‍රි - (ථන d. චු. දෙවසද්දෙ, මෙඝ ගර්ජනාවෙහි + ණෙ + ති) ගොරවයි. ථන බලනු.

**ථපති**. පු-වඩුවා, ඇමතියා.

**ථබක**. පු-මල්කැණ, මල්කැකුල.

**ථම්භ**. d. භූ-ථම්භනෙ, ඔබා මැඩීමෙහි, ථම්භති, විත්ථම්භති, ඔබා තද කරයි,

**ථම්භ**. d. භූ-පතිබන්ධෙ, තදවීමෙහි (කි. සු.) ථම්භනාති, ථම්භණොති, තදකරයි.

**ථම්භක**. පු-තදකරන්නා, තද ඇති.

**ථම්භකරී**. පු-වී, ඇල් ආදි වී.

**ථම්භ**. පු-ටැඹ, පදුර, ඇතුන් බඳිනා ටැඹ, ජඩබව.

**ථම්භති**. ක්‍රි-(ථම්භ d. භූ. ථම්භනෙ, ඔබා මැඩීමෙහි + ති) තදකරයි. ථම්භ බලනු.

**ථම්භන**. න-තදකිරීම.

**ථම්භිත**. ති-තද කළ, හිරකරණ ලද.

**ථම්භිතත්ත**. -තද බව, හිර බව.

**ථම්භෙරම**. පු-ඇතා, හස්තියා.

**ථම**. d. භූ - අතිසීඝ වෙකල්ලෙසු, ඉතා ශීඝ්‍රයෙහි හා විකලභාවයෙහි, ථමති, ඉතා ශීඝ්‍රව යෙයි, විකල වෙයි.

**ථර**. d. භූ-සන්ථරණෙ, ඇතිරීමෙහි, ථරති සන්ථරති අතුරයි, ආස්තරණය කරයි.

**ථරති**. ක්‍රි-(ථර + ති) අතුරයි, ථර බලනු.

**ථරණ**. න-ඇතිරීම, ඇතිරිලි ආදිය ඇතිරීම.

**ථරු**. කඩු මිට, කඩුව.

**ථරුග්ගහ**. පු-කඩු මිට අතටගැන්ම, කඩුව ගැණීම.

**ථල**. න-ගොඩ, ගොඩබිම, ස්ථල

**ථල**. d. භූ-ඨානෙ, සිටීමෙහි, ථලති සිටියි. පිහිටයි.

**ථලී**. ඉ-ගොඩ බිම.

**ථවිකා**. ඉ-කොච්චලර ආදී, උරය, පසුම්බිය.

## ථා

**ථා**. d. භූ-ගති නිවත්තිම්හි, ගමන් නැවැත්මෙහි, ථාති නවතියි, සිටියි, ගමන් වලකයි.

**ථාපනී**. ඉ-දියමිනන.

**ථාම**. පු-ශක්තිය, බලය.

**ථාමක**. පු-ශක්තිමත්, බලවත්, ශක්තිය.

**ථාමවන්ත**. පු-බලවතා, ශක්ති ඇත්තා.

**ථාර**. න-පැදුර,

**ථාල**. න-තැටිය, දීසිය, භාජනය.

**ථාලක**. න-තලු තැටිය, භික්ෂූන්ගේ පැන් බොන තැටිය.

**ථාලි**. ති-සැලිය, හැලිය.

**ථාලිකා**. ඉ-ධාන්‍ය මැණීමේ භාජනයක්, සේරුව.

**ථාලිපාක**. පු-සැලිබත, පිසූ සැලිය පිටින්ම ගනු ලබන බත.

(12517)

**ථාවර**. ති-ස්ථාවර වස්තු, තහවුරු.

**ථාවරිය**. න-තද කම, දෘඪබව, තහවුරු බව.

**ථාවෙරය්‍ය**. න-ස්ථවිර භාවය, වයසට ගිය බව.

**ථිත**. d. තු-සංඝාතෙ, ගැටීමෙහි, රැස්කිරීමෙහි.

**ථිම**. d. භූ-සංඝාතෙ, ගැටීමෙහි, රැස්කිරීමෙහි, ථිමති ගැටෙයි, රැස්කෙරෙයි.

**ථිර**. d. භූ-දළ්හෙ, දෘඪ බැවිහි, ථිරති, දෘඪ කරයි.

**ථිර**. ති-ස්ථිර, ශක්ති සම්පන්න, තර, තිර.

**ථිරංස**. පු-ස්ථිරාවය.

**ථිරා**. ඉ-අස්වැන්න.

**ථිරායු**. ඉ-දීර්ඝායු ඇත්තා, ඉඹුල්ගස.

## ථී

**ථී**. ඉ-ස්ත්‍රී, අඞ්ගනාව, ඉතිරි.

**ථීන**. න-ඝණ, බහල.

**ථීනමිද්ධ**. න-කාය චිත්ත දෙදෙනාගේ අකර්මණ්‍ය ස්වභාවය, කය හා සිත ක්‍රියා කිරීමට නොතැවන නිද්‍රාව.

**ථීයති**. ක්‍රි. (ථි + ය + ති) ශබ්ද කරයි. ථි බලනු.

**ථීයන**. න-මැලිය, තෙමරිය.

**ථීරජ**. න-ඔසප්, මල්වරවීම.

**ථීධම්මිනී**. ඉ - ඔසප් වූ ස්ත්‍රිය, මල්වර වූ තැනැත්තී.

## ථු

**ථු**. d. කි - අභිත්ථවෙ, පැසසීමෙහි, ථුනාති, සතුතිකරයි.

**ථු**. d. තු. අප්පික්‍රියායං, සුළුකිරීමෙහි.

**ථු**. d. භූ-ථුතියං, සතුතියෙහි, ථවති, අභිත්ථවති පසසයි.

**ථු**. d. කි-නිත්ථුනනෙ, නැටවීමෙහි, ථුනාති, නිත්ථුනාති......

**ථු**. d. කි-ජිතියං, ප්‍රීතියෙහි, ථුනිති, ප්‍රීතිකරයි.

**ථුත**. ති-පසස්නා ලද, සතුතිකරණ ලද

**ථුති**. ඉ-සතුතිය, පැසසීම.

**ථුව**. d. භූ - පසාදෙ, ප්‍රශාදයෙහි, ථොවති, පසසයි.

**ථුනාති**. ක්‍රි-(ථු + නා + ති)......

**ථුතිපාඨක**. පු-සතුති පාඨකයා, වියත්ථාදීන් සතුති කරන්නා.

**ථුබ්බි**. d. භූ - හිංසායං, පෙළීමෙහි, ථුබ්බිති, පෙළයි.

**ථුල්ල**. ති-පිරුණු, මහත්, සම්පූර්ණ.

**ථුල්ලක්ඛි**. පු. ඉ-බොහෝ දූ දෙන තැනැත්තා.

**ථුල්ලකුමාරි**. පු-පතිකුලයකට නොගොස් ගෙයිම සිටින වයසට පැමිණි තරුණිය.

**ථුල්ලකුමාරිගොචර**. පු-දීග නොගොස් සිටින වැඩිවිය පැමිණි යුවතීන් වසන තැනට පැමිණීම.

**ථුල්ලච්චය**. පු. මහවැරැද්ද, මහාපරාධය, එනම් ඇවත.

**ථුල්ලඵුසිතක**. න-මහාදිය බිඳු.

**ථුළ**. d. භූ-සංවරණෙ, සංවරණයෙහි, ථුළති, සංවරණය කරයි.

**ථුස**. පු-වීපොතු, දහයියා, තොස.

**ථුසපිණ්ඩ**. පු-බොල්මැටිපිඬු.

**ථුසොදක** න-කාඩි.

## ථූ

**ථූණ**. පු. ඉ. ටැබ, කම්බ කනුව.

**ථූණිකා**. ඉ-ණිණකාව, කැණිය.

**ථූණිර**. න - වහලේ ඉහළ තුන් හුලස් කොටස

**ථූප**. d. චු-සමුස්සයෙ, උසස් කිරීමෙහි, ථූපෙති ථූපයති, ඔසවයි, උස්සයි, රැස් කරයි.

**ථූප**. පු-සෑය, චෛත්‍යය, ප්‍රතිෂ්ඨාව.

**ථූපික**. පු-කොත, කොතක්මෙන් කළ.

**ථූල**. d. භූ-ආකස්සනෙ, අකෘස කිරීමෙහි, ථූලති, කෙට්ටු නොකරයි, කෘශ නොකරයි.

**ථූල**. පු. ස්ථූල, මහත්, ජඩ.

**ථූල** d. චු-වඩ්ඪනෙ, වැඩීමෙහි, ථූලෙති ථූලයති, වඩයි, ස්ථූලකරයි.

**ථූලතා**. ඉ-ස්ථූලභාවය, මහත් බව.

**ථූලසරීර**. පු-ස්ථූල සරීරය, වැඩි මහත්ව ගිය ශරීරය.

(12566)

## ථෙ

**ථෙ.** d. භූ-සද්ද සඞ්ඝාතෙසු. ශබ්දයෙහි රැස් කිරීමෙහි, ථායති, පියති, ශබ්දකරයි, රැස් කරයි.

**ථෙත.** පු-ස්ථිර. ශක්තිමත්,

**ථෙන.** d. චු-චෞර්යෙ, සොරබැව්හි, ථෙනයති ථොනයති සොරකම් කරයි.

**ථෙන.** න. සොරකම, චෞරක්‍රියාව.

**ථෙනක.** පු-සොරා, සොරකම් කරන්නා.

**ථෙනෙති.** ක්‍රි-(ථෙන + ණෙ + ති) සොරකම් කරයි. ථෙන බලනු.

**ථෙර.** පු-ස්ථවිර, මහලු, උපසම්පදාවෙන්, දස වස් පිරුණු භික්ෂුව.

**ථෙරිකා.** ඉ-ස්ථවිරය, මහලුභික්ෂුණිය.

**ථෙරී.** ඉ-ස්ථවිරී, දස වයස් ගිය භික්ෂුණිය.

**ථෙය්‍ය.** ඉ-සොරකම, සටුල.

**ථෙය්‍යසංවාසක.** පු-සොරෙන් සංවාසය අඟ වන්නා, බොරුවට ශ්‍රමණ භාවය පෙන්වන්නා.

**ථෙව.** පු-දියබින්දු, දියබිඳු.

**ථෙවක.** න-දිය පෙරහන, පෙරහන්කඩය.

## ථො

**ථොක.** ති-ස්වල්ප, ටික, මඳදෙය.

**ථොකක.** ති-ථොක, මඳදෙය.

**ථොම** d චු-පසංසායං, පැසසීමෙහි, ථොමෙති ථොමයති, පසසයි.

**ථොමන.** න-ප්‍රසංසාව, පැසසීම, ගුණවර්ණනාව.

**ථොමිත.** ති-ප්‍රසංසාකරණ ලද, පසසන ලද, තුතිකළ.

**ථොමෙති.** ක්‍රි-(ථොම + ණෙ + ති) පසසයි, ස්තුති කරයි.

## ද

**දක්ඛ.** d. භූ-වුඩ්ඪිසීඝ්‍රත්ථෙසු, වැඩීමෙහි, ශීඝ්‍රාර්ථයෙහි, දක්ඛති, වැඩෙයි, ශීඝ්‍රවෙයි.

**දක්ඛ.** d. භූ-හිංසාගමනෙසු, හිංසාවෙහි, ගමනෙහි, පීඩාකරයි, යෙයි.

**දක්ඛ.** ති-දක්ෂ, සමර්ථ, පොහොසත්.

**දක්ඛතා.** ඉ-දක්ෂබව, සමර්ථ බව.

**දක්ඛති** ක්‍රි-(දක්ඛ d භූ හිංසාගමනෙසු හිංසා ගමන්හි + ති) හිංසාකරයි, ගමන්කරයි.

**දක්ඛා.** ඉ-මුද්‍රික, මුද්දිරප්පලන්.

**දක්ඛි.** පු-දක්ඛයාගේ පුතා, දක්ෂයා.

**දක්ඛිණග්ගි.** පු-එනම් ගින්න, සිල්වත් මහණ බමුණෝ, ඔව්හු ගිනි සෙයින් සැලකිය යුත්තාහුය.

**දක්ඛිණ.** පු-දකුණ, දකුණු භාගය, දකුණු පැත්ත.

**දක්ඛිණා.** ඉ-දකුණුදිසාව, සත්කාර සහිතව දෙන දනය, උත්තම දානය. විවරාදී සිවු පසය.

**දක්ඛිණපථ.** පු-දකුණු දිග.

**දක්ඛිණයන.** න-දක්ෂිණායනය, සූර්යයාගේ දක්ෂිණාවර්ති ගමන, ඇසළ මස පටන් උඳුවප් මාසය දක්වා ඇති මාස සය-උත්තරායන බලනු

**දක්ඛිණෙය්‍ය.** පු-දක්ෂිණෙය්‍ය. දක්ෂිණාවට සුදුසු, සිල්වත්.

**දක්ඛිණෙය්‍යග්ගි.** පු දක්ඛිණග්ගිය.

**දක්ඛිත.** ති-දක්නා ලද, අවබෝධ කළ, දුටු.

**දක්ඛිතාජ.** පු-රියදුරා.

**දක්ඛෙය්‍ය.** ති-දක්කයුතු, බැලියයුතු.

**දඛි.** d. භූ-ඝොර වස්සිත කඞ්ඛාසු, දරුණු තිරිසන් හඬ, කාඞ්ක්ෂා යන මෙහි, දක්ඛති, රෞද්‍රව ශබ්දකරයි, සැකකරයි.

**දංස.** d. භූ. චූ-දංසනෙ, දෂ්ට කිරීමෙහි, දංසති, දංසයති, ඩසියි, දෂ්ට කරයි.

**දංස.** d. භූ. චු-දිත්තිදස්සනෙ, දීප්තියෙහි දැකීමෙහි, දංසති=විදංසති, දංසෙති, දංසයති, බබළයි, දකියි.

(12605)

**දංසක.** පු-ඩැහැගන්නා, දෂ්ටකරන්නා.

**දංසති.** ක්‍රි-(දංස + ති) බසියි, දංස බලනු.

**දංසන.** න-සන්නාහය.

**දංසිත.** පු-සන්නාහ සන්නද්ධයා.

**දක.** න-ජලය.

**දකසීතලික.** න-හෙල්මැලි, කලහැර.

**දට්ඨ.** ති-දෂ්ටනය කළ, සපාකන ලද

**දඩ්ඪ** පු-දවන ලද, පුලුස්සන ලද.

**දළ්හී** න-ශක්තිය ඇතිකිරීම, තදගතිය ඇති කිරීම.

**දඩි** d හූ. චු-ආණායං, නියොග කිරීමෙහි, දණ්ඩෙති, දණ්ඩෙති, දණ්ඩයති, ඇණවයි, නියොගකරයි,ආඥකරයි.

**දණ්ඩ.** පු - දඩය, මුගුර, දමනය කිරීම, ලී කැබල්ල.

**දණ්ඩ** d. චු-දඬුහෙලීමෙහි, දණ්ඩනමසකාර-යෙහි, දණ්ඩෙති, දණ්ඩයති, දඩදෙයි, දණ්ඩනමස්කාර කරයි.

**දණ්ඩක.** පු-විසිතුරු සැරමිටි දණ්ඩ, මුගුරු දණ්ඩනය.

**දණ්ඩකඨින.** න - කෙවිටක් මත දිගහැරිය රෙද්ද.

**දණ්ඩජතෙජ.** පු - දඩයෙන් ජාත තෙජස, ප්‍රතාපය.

**දණ්ඩධර.** පු-දඬු දරන්නා, යමයා.

**දණ්ඩනිය.** ති-දඬුවම් කටයුතු, දඬුවමට සුදුසු.

**දණ්ඩනීති.** ඉ-දණ්ඩනීතිය, අර්ථ ශාස්ත්‍රය.

**දණ්ඩපරායන.** පු - දඬු පිහිටකොට ඇති, දණ්ඩක් ආධාර කොට ඇති.

**දණ්ඩපරිස්සාවන.** න-දඬුපෙරහණ.

**දත්ත.** ති-දෙන ලද, පරිත්‍යාග කරණලද

**දත්ති.** ඉ-කුඩා තැටි විශෙෂයක්, තැඹිලිය

**දත්තික.** ති-දෙන ලද, තැගිකරණ ලද

**දත්තිම.** න-දෙන ලද්ද.

**දත්තිය.** න-තෑග්ගක් වශයෙන් දෙන ලද්ද.

**දත්තු.** ඉ-ජඩයා, කෙලතොල්ලා.

**දද්දභ.** පු-බර, නොපැහැදිලි ශබ්දය.

**දද්දභායති.** ක්‍රි-බර ශබ්දයක් ඇති කරයි.

**දද්දර.** පු-මැඩියා, මණ්ඩුක.

**දද්දරී.** ඉ-බෙර විශෙෂයක්, වජ්‍රභෙරිය.

**දද්දල.** පු-නිල් තෘණබිම, තෘණ නිල්බිම.

**දද්දල්ලති.** ක්‍රි-(දද්දල්ල + ති) බබලයි, දිලිසෙයි.

**දද්දල්ලන.** න-බබලන, දිලිසෙන.

**දද්‍රු.** පු-දදයයි ප්‍රකට කුෂ්ට රෝගය, දද්‍රු පණුකැවිල්ල.

**දද්දුල.** න-සම්කැබලි, හම් කැලි.

**දද.** d. භූ-දානෙ, දීමෙහි, දදති, දෙයි.

**දදති,** ක්‍රි-(දද + ති) දෙයි, දානය කෙරෙයි.

**දද්‍රුඝ.** පු - තුවර, රටතෝර, ඇත්තෝර, දද්‍රුඝ්න

**දධ.** d. භූ-ධාරණෙ, දරීමෙහි, දධතෙ, දහති, දරයි.

**දධි.** න-දී, මිදිකිරි.

**දධිත්ථ.** පු-ගිවුලුගස.

**දධිමණ්ඩ.** න-දීපෙරලි දිය.

**දධිඵල.** න-ගිවුලු, දිවුල්.

**දනු.** ස්ත්‍රී, අසුරමව.

**දධ්‍යුද.** පු-සාගර භෙදයක්, කිරි මුහුද.

**දනුජ.** පු-අසුරයා.

**දන්ත.** පු-දත්, දළ.

**දන්ත.** ති-දමිත, දමනය කළ, හික්මවන ලද.

**දන්තක.** න-ඇත් දත්වලින් කළ දත් කටුව.

**දන්තකට්ඨ.** න-දැහැටි, දැහැටු.

**දන්තච්ඡද.** පු-දන්තාවරණය, තොල.

**දන්තධාවන.** න-කිහිරි, ඛදිර රුක.

**දන්තපොන.** පු-දැහැටි, දැහැටු.

**දන්තබල.** පු-ඇතා, අලියා.

**දන්තසඨ.** පු-ගිවුලු, දෙසි.

**දන්තලූයක.** පු-දතින් ගස්, පොතු ආදිය කා ජීවත්වන්නා.

**දන්තවිදංසක.** න - දන්ත විවෘතය, දත් පෙණෙන පරිදි මුඛය විවෘතකොට සිනාසීම.

**දන්තී.** අ-ඇතා, දත් ඇත්තා.

**දනතී**. ති-ඉන්ද්‍රියාදීන්ගේ දමනය, දත් ඇත්තා.

**දන්ධ**. ති-අඥාන, මෝඩ.

**දන්ධවිරාග**. පු-දන්ධවූ විරාගය ඇත්තා.

**දන්ධතා**. ඉ-දන්ධබව, අඥානභාවය.

**දප්ප**. පු-දර්පය, එඩිය, අහඞ්කාරය.

**දප්පක**. පු-අනඞ්ගයා, කාමයා.

**දප්පණ**. න-ආදර්ශතලය, කැඩපත, මූණබලන කණ්ණාඩිය.

**දප්පිත**. ති-දර්පිණයවනලද, අහඞ්කාරවනලද.

**දප**. d. දි-හාසෙ, සතුටුවීමෙහි, දප්පති, සතුටු වෙයි.

**දබ්බ**. පු-යොග්‍ය, සුදුසු, ප්‍රාඥ.

**දබ්බ**. න-ගුණධාර, ධන, කාෂ්ඨ.

**දබ්බජාතික**. පු-ප්‍රාඥ, පණ්ඩිත.

**දබ්බවිදූ**. පු-පණ්ඩිතයා, ප්‍රාඥයා.

**දබි**. d. භූ. ගති සද්දෙසු, ගමනෙහි, ශබ්ද කිරීමෙහි, දබ්බති, යෙයි, ශබ්දකෙරෙයි.

**දබ්බි**. ඉ-සැන්ද, හැන්ද.

**දබ්බිකර**. පු-සර්පයා, නයා.

**දබ්බිමුඛද්විජ**. න-හැන්දක් වැනි තුඩ ඇති පක්ෂි විශේෂයක්.

**දබ්භ**. d. භූ. ගන්ථෙ, ගෙතීමෙහි, දබ්භති, ගොතයි.

**දබ්භ**. පු-කුසතණ.

**දබ්භි** d. භූ. ගන්ථෙ, ග්‍රන්ථනයෙහි, දබ්භති, ගොතයි.

**දභි**. d. භූ-සද්දෙ, ගන්ථෙ, ශබ්දකිරීමෙහි, ගෙතීමෙහි, දබ්භති, ශබ්දකරයි, ගොතයි.

**දභි**. d. චු-භයෙ, බියවීමෙහි, දභෙති, දභයති, බියවෙයි.

**දභෙති**. ක්‍රි-(දභ+ණේ+ති) බියවෙයි, දභි බලනු.

**දම්භ**. පු-සට බව, කපටි.

**දම්භොලි**. පු-වජ්‍රායුධය.

**දම්පතී**. පු-අඹුසැමි දෙදෙන, ස්ත්‍රී පුරුෂ දෙදෙන.

**දම්ම**. පු-නාඹුවස්සා, දමනය කටයුත්තා.

**දම**. පු-ප්‍රඥ, උපවාස, ක්ෂමා, ඉන්ද්‍රිය සංවර.

**දම**. d. භූ-දමනෙ, දමනය කිරීමෙහි, දමති, දමනයකරයි.

**දමක**. පු-ඉඳුල් කන්නා, විඝාසයා.

**දමථ**. පු-හික්මීම, ඉන්ද්‍රියාදීන්ගේ දමනය.

**දමන**. න-හික්මීම, දමනය කිරීම.

**දමිත**. ති-දමනය කළ, හික්මෙන ලද.

**දමු**. d. දි-දමනෙ, දමනයෙහි, දම්යති, දමනය කරයි.

**දමෙති**. ක්‍රි-(දම+ණේ+ති) දමනය කරයි.

**දය**. d. භූ-දාන ගති රක්ඛා හිංසාදිසු, දීමය, යාමය. රැකීමය, පෙළීමය, යනාදියෙහි, දයති.

**දයති**. ක්‍රි-(දය+ති) දෙයි, දය බලනු.

**දයා**. ඉ-දයාව, අනුකම්පාව, කරුණාව.

**දයාලු**. ති-දයා බහුලකොට ඇත්තා, කරුණාවන්තයා.

**දයිත**. ති-කරුණාකළ, නලවනලද.

**දයිතා**. ඉ-ප්‍රියතැනැත්තී, සප්‍රිය.

**දර**. d. භූ-භය දුඃඛ විදාරණෙසු, බියවීමෙහි, දුඃඛයෙහි, පැළීමෙහි, දරති, බියවෙයි, දවයි, එළයි, විදාරණයකරයි.

**දර**. d. භූ-අනාදරෙ, අනාදරයෙහි, දරති, අනාදර කරයි.

**දර**. පු-ශරීරපීඩා, භය, වෙහෙස, "සබ්බං නිබ්බා පයෙදරං."

**දරණ**. න-භය වෙහෙසාදිය ඉවසීම.

**දරථ**. පු-දුඃඛය, දැවිල්ල, උෂ්ණය.

**දරථජ**. ති-දුඃඛයෙන් උපන්, උෂ්ණයෙන් හටගත්.

**දරි**. ඉ-භූමිපර්වතාදීන්ගේ විවර, කඳුරැළිය.

**දරීචර**. පු-ගල් ගුහාවල ජීවත්වන්නා.

**දරීසය**. පු-ගුහාවෙහි වාසයකරණ තැනැත්තා.

**දල**. d. භූ-දිත්තියං, බැබලීමෙහි දලති, බබලයි.

**දල**. d. චු-විදාරණෙ, පැළීමෙහි, දලෙති, දලයති, පදාලෙති, පලයි, දෙපලුකරයි.

(12715)

**දල.** d. භූ - විකිරණෙ, විසිරීමෙහි, දලති, විසිරෙයි, විහිදෙයි.

**දල.** d. භූ - දුග්ගතියං, දිලිඳුවීමෙහි, දලති, දිලිඳුවෙයි.

**දල.** න-භාගය, කොටස, පත්‍රය.

**දලති.** ක්‍රි - (දල + ති) විසිරෙයි දිලිඳුවෙයි. බබලයි.

**දලිද්ද.** d. භූ-දුග්ගතියං, දිලිඳු බැව්හි, දලිද්දති, දිලිඳුවෙයි, දුකසේ ලබයි

**දලිද්දිය.** න-දිලිඳු බව, දරිද්‍රභාවය.

"දලිද්දියං දුක්ඛං ලොකෙ-
ඉණාදානඤ්ච වුච්චති
දලිද්දො ඉණමාදාය
භුඤ්ජමානො විහඤ්ඤතීති"

**දව.** පු-ක්‍රීඩාව, ආරණ්‍යය, පලායාම.

**දව.** d. භූ-දවනෙ, ක්‍රීඩාවෙහි, දවති, ක්‍රීඩා කෙරෙයි.

**දවථු.** පු-දාහය, දැවිල්ල.

**දස.** ති-දසය. 10.

**දසක.** ති-දසයෙන් යුත්, දසයක් ඇති.

**දසකථා.** ඉ - අප්පිච්ඡකථා, සන්තුට්ඨිකථා, විවේකකථා, අසංසග්ගකථා, විරියාරම්භකථා, සීලකථා, සමාධිකථා, පඤ්ඤාකථා, විමුත්තිකථා, විමුත්තිඤාණදස්සනකථා, යන දසය,

**දසගුණ.** පු-දසයෙන් ගුණවීම. දහයෙන් වැඩි කිරීම.

**දසදිසා.** ඉ-දසදිග, පූර්වපශ්චිමාදි දිසා දසය.

**දසන** න-දත්, හැපීම, හපාකෑම.

**දසනාගබල.** දසවිධ නාග බලය.

**දසනච්ඡද.** පු-දන්තාවරණය, තොල්, ඕෂ්ඨය.

**දසපද.** න-අට්ඨපද ක්‍රීඩාව වැනි එක එක පෙලට අල්ලී දසය බැගින් සිටින්ට සෑදූ ගණ කරණ ක්‍රීඩාවක්.

**දසපාරමිතා** ඉ-දානාදී පාරමිතා දසය.

**දසබල.** න-දසවිධකාය බලය හා දසවිධඥාණ බලය, සිංහල මහා අකාරාදිය බලනු.

**දසවත්ථුකා අන්තග්ගාහිකාදිට්ඨි.** න-දශවස්තුක අන්තග්‍රාහික දෘෂ්ටිය,

**දසවත්ථුකා මිච්ඡාදිට්ඨි** න-දශවස්තුක මිථ්‍යා දෘෂ්ටිය.

**දසහාකාර කොධ.** න-දසවැදෑරුම් ක්‍රෝධය.

**දසවිධ අක්කොසවත්ථු.** න-දසප්‍රකාර ආක්‍රෝශ කරුණු, "චොරොසි බාලොසි මූළ්හොසි ඔට්ඨොසි ගොණොසි ගද්‍රභොසි නෙරයිකොසි තිරච්ඡාන ගතොසි නත්ථි තුය්හං සුගති දුග්ගතියෙව තුය්හං පාටිකඞ්ඛා"ති කියන ලද කරුණු දසය.

**දසවිධනාගබල.** න-දසප්‍රකාර හස්ති බලය.

"කාලාවකඤ්ච ගඞ්ගෙය්‍යං-
පණ්ඩරං තම්බ පිඞ්ගලං
ගන්ධමඞ්ගල හෙමංච-
උපොසථ ඡද්දන්තිමෙදස"

මේ දශවිධ ඇතුන්ගේ බලය, කාලාවක ඇතුන් දස දෙනෙකුගේ බලය ගඞ්ගෙය්‍ය කුලයෙහි එක් ඇතෙකුට ඇති වන්නේය. පෙ-උපොසථයින් දස දෙනෙකුගේ බලය එක් සදන් කුලයෙහි ඇතෙකුට වන්නේය. ඔවුන් දස දෙනෙකුගේ බලය බුදුරජාණන් වහන්සේගේ කාය බලය වේ.

**දසවිධව්‍යඤ්ජන.** න-සිථිලය ධනිතය දීර්ඝය යනාදි දසය.

"සිථිල ධනිතඤ්ච දීඝරස්සං-
ගරුලහුකඤ්ච නිග්ගහීතං
සම්බන්ධං වවත්ථිතං විමුත්තං-
දසධා බ්‍යඤ්ජන බුද්ධියාපපභෙදො,

**දසසත කිරණ.** න-දහසක් රැස් ඇත්තා, සූර්යයා.

**දස භූමිස්සර.** පු-බුදුහු.

**දසසත නයන.** න-දහසක් ඇස් ඇත්තා, ශක්‍රයා.

**දසසද්ද.** පු-බාදථ පීවථ යනාදී ශබ්ද දශය.

**දසා.** ඉ-අවස්ථාව, දැවල්ල.

**දසායතන.** න-ආයතන දසය.

**දසිත.** ති-දක්වන ලද.

**දස්ස.** සූර්ය චන්ද්‍ර දෙදෙනාගේ සඞ්ගමයවන දිනය, අවපසළොස්වක් දිනය.

**දස්සති.** ක්‍රි-දිස, d. භූ. (පෙක්ඛණෙ, දක්නීමෙහි + ති) දකියි, බලයි.

(12750)

**දස්සන**. න - දැකීම, දෘෂ්ටිය, ශ්‍රොතාපත්ති මාර්ගය, ඥානය, ඇස, බැලීම, ලබ්ධිය.

**දස්සනීය**. ති-දස්සනෙය්‍ය, දැකුම් කටයුතු.

**දස්සනෙය්‍ය**. ති-දැක්කයුතු, දස්සනීය.

**දස්සිත**. ති-දක්වන ලද, දර්ශනය කළ.

**දස්සී**. ති-දකින සුළු, බලන සුළු.

**දස්සෙති**. ක්‍රි-(දස + ණෙ + ති) දක්වයි.

**දස්සාවී**. පු-දැකීම සවභාව කොට ඇත්තා, දුටු තැනැත්තා.

**දස්සු**. පු-හොරා, සතුරා.

**දසි**. d. භූ. - දස්සනෙ, දැකීමෙහි, දංසෙති දංසයති, දකී.

**දංස**. d භූ-දංසනෙ, ඩැසීමෙහි, දෂ්ටකිරීමෙහි, දංසයති, ඩසියි.

**දංස**. d. චු-දංසනෙ, ඩැසීමෙහි, දංසෙති, දංසති, ඩසියි.

**දහ**. d. භූ-භස්මීකරණෙ, හළුකිරීමෙහි, දහති. අළුකරයි.

**දහ**. d භූ-වුඩ්ඩියං, වෘද්ධියෙහි, දහති, වැඩෙයි.

**දහ**. න-භස්මීකරණය, විල, තඩාගය.

**දහති**. ක්‍රි -(දහ d භූ භස්මීකරණය - හළු කිරීමෙහි + ති) හලුකරයි.

**දහන**. න-ගින්න, දැවීම

**දහර**. පු-තරුණයා, යෞවනයා.

**දහරක**. පු-තරුණයා.

**දහරභූමි** ඉ - තරුණ අවස්ථාව, යෞවන කාලය.

**දළිද්ද** d. භූ-දුග්ගතියං, දිළිඳුවීමෙහි, දළිද්දෙති. දිළිඳුවෙයි.

**දළිද්ද**. ති-දිළින්ද, දිළිඳු, දුප්පත්

**දළ්හ**. ති-දැඩි, කර්කශ, කැකුළ, ස්ථාවරවස්තු.

**දළ්හසමාදි**. පු-දෘඪසමාධිය.

**දළ්හපරක්කම**. පු-දෘඪපරාක්‍රමය, මහාවීර්යය.

**දළ්හමිත්ත**. පු-දෘඪමිත්‍ර, දැඩි මිත්‍රයා.

**දළ්හීකම්ම**. න-දෘඪකර්මය, දැඩිකිරීම, ශක්ති මත්කිරීම, එනම් විනයකර්මය.

## දා

**දා**. d. භූ-දානෙ, දීමෙහි, දෙති, දදාති, දෙයි, දානයකරයි.

**දා**. d. දි-දානෙ, දීමෙහි, දීයති.........

**දා**. d. දි-සොධනෙ, පිරිසිදු කිරීමෙහි, දායති, පිරිසිදු කරයි.

**දා**. d. දි-සුපනෙ, නිද්‍රාවෙහි, නිද්‍රායති, නිදයි.

**දා** d. දි අවඛණ්ඩනෙ, සිඳීමෙහි, දීයති, ආදීයති, සිඳියි.

**දා**. d. දි-දානෙ, දීමෙහි, දායති, ආදීයති, දෙයි.

**දා**. d. දි-වොදානෙ, පිරිසිදුකිරීමෙහි, දායති, වොදායති පිරිසිදුකරයි.

**දාබ** d. භූ සොසන අලම්භේසු, වියළීමෙහි අලං අර්ථයෙහි, දාබති, වියලයි, ප්‍රතික්ෂෙප කරයි.

**දාස**. d. භූ-කිලමථෙ, ක්ලාන්තවීමෙහි, දාසති, ක්ලාන්තවෙයි.

**දාඨා**. ඉ-දළ, දඩයම්දත.

**දාඨාමන්දිර**. න-දළදා මැදුර,

**දාඨාධාතු**. ඉ-බුදුවරුන්ගේ දළදාව.

**දාඨිකා**. ඉ-උඩු රැවුල, උඩුතොලේ පිහිටි රැවුල.

**දාඩිම**. පු-දෙළුම්ගස.

**දාඨී**. පු-දළ ඇත්තා.

**දාඩිමපුප්ඵක**. වල්එරබදු වැල, එරබදු, සොම ගස.

**දාත්ත**. න-දැය, දෑකැත්ත.

**දාත**. ති-කපන ලද, ඡේදනයකළ.

**දාතවෙ**. අ-දෙන්නට, දෙනුපිණිස.

**දාත්‍යූහ**. පු-දතුඩු පක්ෂියා.

**දාතා**. පු-දානය කරන්නා, දායකයා.

**දාතුං**. අ-දෙන්නට, දෙනු පිණිස.

**දාන** d. භූ-අවඛණ්ඩනෙ, ආපසු ඇදීමෙහි, සිඳීමෙහි දානති, සිඳියි.

**දාන** න-දානය, දීම. ශුද්ධිය. හෙදය, මදය, ඡේදනය, විනාශය හස්තිමදය.

(12800)

**දානපති** පු-දානපතියා, දානහිමියා. මනාකොට දන්දෙන තැනැත්තා.

**දානපාරමී.** ඉ-දානපාරමිතාව

**දායක** පු-දානයකරන්නා, දන්දෙන්නා, දායකයා, දීම කර ගන්නා.

**දානි.** අ-දැන්, මේකාලයෙහි.

**දානව.** පු-අසුරයා, පූර්වදෙවියා.

**දානවාරි.** පු-දෙවියා.

**දානසංවිභාග** පු-දානය මනාකොට දීම, දානද බෙදීම.

**දානසොණ්ඩ.** පු-බොහෝ දූ දෙන සුලුතැනත්තා, දන් සොඬ තැනැත්තා.

**දාතා.** ති-බැදියව.

**දාතාරහ.** ති-දක්ෂිණාර්හයා, දක්ඛිණෙය්‍යය.

**දාපන.** න-දානයකරවීම, දෙවීම.

**දාපිත.** ති-දානය කරවනලද.

**දාපෙති.** ක්‍රි-(දා. d භූ. දානෙ, දීමෙහි + ණාපෙ + ති) දානය කරවයි.

**දාබ්බි** ති-වනුවැල්.

**දාමරික.** පු-යුධකාරකසොරා.

**දාම.** න-දම, යොත.

**දාමොදර.** පු-විෂ්ණු දමෝදර.

**දාය.** d භූ-දානෙ දීමෙහි, දායති දෙයි. "ධම්මදායාදා මෙ භික්ඛවෙ භවථ මා ආමිසදායාදා"

**දාය.** d. පු-දානය, මව් පියන්ගේ බෙදිය යුතු ධනය, වනාන්තරය කැපීම.

**දායජ්ජ.** න.-දාවැද්ද.

**දායති.** ක්‍රි-(දාය + d භූ. දානෙ දීමෙහි + ති) දෙයි. දානය කෙරෙයි.

**දායන.** න-කැපීම, දානය.

**දායාද.** පු-බන්ධු, දූදරු, දාවැද්ද.

**දායිකා.** ඉ-දානයකරන්නී, දෙන්නී. දෙන තැනැත්තී.

**දායී.** ති-දෙනසුළු, දානය කරණ සුළු.

**දාර.** පු-භාර්‍යයාව, බිරින්ද.

**දාරක.** පු-දරුවා, ළදරුවා, තරුණයා.

**දාරද.** පු-විෂභෙදයක්.

**දාරා.** ඉ-භාර්‍යයාව, බිරින්ද.

**දාරිකා.** ඉ-ළදරිය, තරුණිය.

**දාරිත.** න-පලනලද, දෙපලුකළ.

**දාරු.** න-කාෂ්ඨය, දර, දැව. දෙවදාරගස.

**දාරුඛණ්ඩ.** න-කොළොම්බුව.

**දාරුචය.** පු-දාරුමය බන්ධනය, ලීයෙන් කළ බැම්ම.

**දාරුචාරක.** පු-ලීයෙන් කළදිය බඳුන, බාල්දිය.

**දාරුචීරිය.** පු-එනම් සථවිර.

**දාරුණ.** පු. න-භයානක, දරුණු.

**දාරුසන්ථර.** පු ලී ඇතිරීම, ලී ඇතිරිය.

**දාරුසොපාණ.** න-දඬුහිණ, දැව හිණිමග.

**දාරුහලිද්ද,** න-වෙණිවැල්.

**දාලිද්දිය.** ති-දිළිඳුබව.

**දාව.** පු දවාග්නිය, කැලේ සෑදෙන ගින්න. ලැව්ගින්න.

**දාවග්ගි.** පු-දවාග්නිය, කැලේ සෑදෙන ගින්න ලැව්ගින්න.

**දාස.** d. සු-හිංසනෙ, පෙළීමෙහි, දාසුණාති, පෙළයි.

**දාස.** පු-දාසයා, දැස්, කෙව්ලා.

**දාසක.** පු-දාසයා.

**දාසව්‍ය.** පු-දාසභාවය, දාසවිය.

**දාසව්‍යතා.** ඉ-දාසභාවය, දාසව්‍ය.

**දාසවිය.** පු-දාසභාවය, දාසව්‍යය.

**දාසව්‍යොපගත.** පු-තෙමේම දාස බවට පැමිණි තැනැත්තා.

**දාසි.** ඉ-දාසිය, ඇස්, කටු කරඬුගස.

**දාසු.** d. භූ චු-දානෙ, දීමෙහි, දාසති, දාසෙති, දෙයි.

**දාසෙය්‍ය.** පු-දාසයා, දස්.

**දාසෙර.** පු-දාසයා.

**දාහ.** පු-දාහය, දැවිල්ල, පරිළාහය.

**දාහු.** d. භූ-නිද්දක්ඛයෙ, නිදිදුරුකිරීමෙහි දාහති නොනිදයි.

**දාළ.** d. භූ භෙද, බිඳීමෙහි, දාළති පලයි.

**දාළන.** න-පැළීම, සිඳීම.

**දාළිම.** පු-දෙළුම් ගස, දාඩිම.

# දි

**දික්ඛ**. d. භූ-මුණ්ඩියෙ, උපනයනෙ, මුඩුකිරීමෙහි, ශිෂ්‍යාදීන් ගැන්මෙහි, දික්ඛති, හිස මුඩු කෙරෙයි, පැවිදි වෙයි. උපනයනය කෙරෙයි.

**දික්ඛා**. ඉ-යාග පූජාව.

**දික්ඛිත**. න-යාගපූජාව පිළිබඳ ආරම්භක ක්‍රියාව.

**දිග්ඝිකා**. ඉ-අගල.

**දිගම්බර**. පු-නිවටා, වස්ත්‍ර පිළිකුල්කොට, නග්නව වාසය කරණ නිවට තාපස කොටසක්. නග්නයා.

**දිව**. d, භූ-ථුතියං, ස්තුතියෙහි, දීවති, ස්තුති කරයි.

**දිජ**. පු-දෙවරක් උපන්නහු-ද්විජ බලනු.

**දිට්ඨ**. පු-දක්නා ලද්ද, සතුරා, කාලය.

**දිට්ඨක**. ති, දක්ක, පෙණෙන, පැහැදිලි,

**දිට්ඨධම්ම**. පු-දක්නා ලද ධර්මය, ආත්මභාවය, ඉහාත්ම භාවය, මෙම ආත්මභාවය.

**දිට්ඨධම්ම**. ති-ප්‍රත්‍යක්ෂවූ, අවබොධ ධර්මය.

**දිට්ඨධම්මික**. ඓහලෞකිකය, මෙලොවෙහි ඇතිවන ඵලය.

**දිට්ඨන්ත**. පු-දෘෂ්ටාන්තය, උදාහරණය.

**දිට්ඨපද**. න-දක්නා ලද පදය.

**දිට්ඨප්පත්ත**. පු-දිට්ඨිප්පත්ත, දෘෂ්ටිප්‍රාප්තයා.

**දිට්ඨමත්තක**. පු-දෘෂ්ටමාත්‍ර මිත්‍රයා.

**දිට්ඨමිත්තක**. පු-දුටුමිත්‍ර.

**දිට්ඨා**. අ-සන්තොෂයෙහි.

**දිට්ඨානුසය**. පු-දෘෂ්ටි අනුසය.

**දිට්ඨානුගති**. ඉ-දෘෂ්ටානුගතිය, දුටුදේ අනුව යාම.

**දිට්ඨි**. ඉ-දෘෂ්ටිය, ලබ්ධිය, විශ්වාසය.

**දිට්ඨිනිජ්ඣානක්ඛන්ති**. ඉ-තමා විසින් ගන්නා ලද ලබ්ධිය හා සමානයයි කැමති වීම.

**දිට්ඨිවිපත්ති**. ඉ-දෘෂ්ටිවිනාශය, සම්‍යක් දෘෂ්ටිය නැතිවීම.

**දිට්ඨිවිසූකා**. ඉ-දෘෂ්ටිවිකාරය, සම්‍යක් දෘෂ්ටිය. විනි විදින සම්‍යක් දෘෂ්ටියට විලොමවන දෘෂ්ටිය.

**දිට්ඨිවිප්ඵන්දිත**. න-දෘෂ්ටිචලනය, දෘෂ්ටිකම්පාව.

**දිට්ඨිසංයොජන**. න-දෘෂ්ටිගැලපීම=බැඳීම.

**දිට්ඨිසම්පන්න**. පු-සෝවාන්මාර්ගී දෘෂ්ටියෙන් යුත්=සම්පූර්ණ.

**දිට්ඨිවිසුද්ධි**. ඉ--දෘෂ්ටි විසුද්ධිය.

**දිට්ඨිසම්පදා**. ඉ-දෘෂ්ටිසම්පත්තිය.

**දිට්ඨොඝ**. පු-දෘෂ්ටි ඔඝය, දෙසැට දිටු.

**දිණ්ණ**. ති-දෙනලද්ද, දානය කළ.

**දිත**. ති-කපන ලද්ද.

**දිත්ත**. පු-දිලිසෙනලද, ගිනි ඇත්තා.

**දිත්ති**. ඉ-දීප්තිය, රශ්මිය, ඉරු රැස.

**දිද්ධ**. පු-විෂපෙවූ හීය.

**දිද්ධ**. ඉ-පරිභාවිතාර්ථයෙහි.

**දින්න**. ති-දෙනලද්ද, දානයකළ

**දින්නක**. පු-අත්‍රජ, ඛෙත්තජ, අන්තෙවාසික, දින්නක යන සතර වැදෑරුම පුතුන් ගේ අවසානය

**දින්දිම** පු-කුඩා බෙරවර්ගයක්,සංගීත භාණ්ඩයක්

**දින්දිභ**. පු. කුරුළු වර්ගයක්,

**දින**. න-දිනය, දවස.

**දිනකර**. පු-සූර්යයා, හිරු, ඉරු.

**දිනච්චය**. පු-සවස, සවස්කාලය, දිනාන්තය.

**දිනපති**. පු-දවසට අධිපතියා, සූර්යයා, හිරු.

**දිනමණි**. පු-හිරු, සූර්යයා.

**දිනන්ත**. පු-දින කෙළවර, සවස, දිනච්චය.

**දින්දිභ**. පු-කිරලා, කිරල් පක්ෂියා.

**දින්නපාටිකඞ්ඛී**. පු-දුන් දෙය කැමති වන සුලුයේ.

**දින්නාදායී**. පු-දුන් දෙය ගන්නා සුලු තැනැත්තා.

**දිප්පති**. ක්‍රි-(දිප+ති) බබලයි, දීපෙ.

(12909)

**දිප්පන**. න-බැබලීම, දිලිසීම.

**දිප**. d. දි. – දිත්තියං, බැබලීමෙහි, දිප්පති, බබලයි.

**දිපදුත්තම**. පු-බුදුරජ, දෙපා ඇත්තවුන්ගෙන් උත්තමයා.

**දිපාද**. පු-පා දෙකක් ඇත්තා, විපාදයා.

**දිපි**. d. භූ-ගතියං, යාමෙහි, දිප්පති=දිම්පති, යෙයි.

**දිබ්බ**. පු-දෙවියා, විෂපෙව් සරය=භීය

**දිබ්බචක්ඛු**. න-දිවැස, දිව්‍ය චක්‍ෂුස.

**දිබ්බ**. ති. ක්‍රි-(දිවු=දිවව=දිබබ + ති) කෙළි.

**දිබ්බවිහාර**. පු-දිව්‍ය විහාරය.

**දියඩ්ඪ**. ති-එකහමාර, දිවඩ්ඪ.

**දිරද**. පු-ඇතා.

**දිරසඤ්ඤ**. පු-සාමාන්‍ය ඥනය, දියුණු නොවූ තැනැත්තා.

**දිව**. පු-ස්වර්ගය, අහස.

**දිවඩ්ඪ**. ති-එකහමාර

**දිවංපති**. පු-ශක්‍රයා, දෙවාධිපතියා.

**දිවස**. පු-දිවස.

**දිවසවලඤ්ජ**. පු-දවස වැලඳුම, දවස වියදම.

**දිවා**. අ-දවල, දහවල.

**දිවාකර**. පු-සූර්‍ය්‍යා, ඉරු.

**දිවාකිත්ති**. පු-කරණවෑමියා, නහාපිතයා.

**දිවාදිවා**. අ-දවල්හි, දවල, මද්දහන, මහ දවාල.

**දිවාන්ධ**. පු-දහවල් අන්ධයා, බකමූණා.

**දිවාවිහාර**. පු-දවල් වාසය, දවල් විසීම.

**දිවිසද**. පු-දෙවියා.

**දිවු**. d. දි-කීළායං, ක්‍රීඩාවෙහි, දිබ්බති, ක්‍රීඩා කෙරෙයි.

**දිවු**. d. චු-ගජ්ජනෙ, ගර්ජනාවෙහි, දෙවෙති, දෙවයති, ගර්ජනාවෙහි, ගොරවයි.

**දිවු** d චු-ගන්ධපිසනෙ, සුවඳසුණු කිරීමෙහි, දෙවෙති, දෙවයති, සුවඳසුණු කරයි, සුවඳ අඹරයි.

**දිවොක**. පු-දෙවියා.

**දිස**. d. භූ පෙක්ඛනෙ, බැලීමෙහි (දිස=පස්ස + ති) පස්සති, දකියි, බලයි.

**දිස**. d. තු-දනෙ කථනෙව, දීමෙහි. කථන-යෙහි.

**දිස** d. භූ-හිංසායං, පෙළීමෙහි, දිසති, පෙළයි, පීඩාකරයි.

**දිස**. d. භූ-ගහණෙ, සංවරණෙව, ගැණීමෙහි, සංවරණයෙහි, දිස්සති, ගණියි, සංවරණය කරයි.

**දිස**. d. භූ පෙක්ඛනෙ, බැලීමෙහි, දිස්සති, පස්සති, දක්ඛති, බලයි.

**දිස**. d. භූ-අප්පීතියං, අප්‍රීතියෙහි, දෙස්සති, නොසතුටුවෙයි.

**දිස**. d. භූ-දනෙ, දීමෙහි, දිසති, උපදිසති. දෙයි, දක්වයි.

**දිසති**. ක්‍රි-දිස බලනු.

**දිසම්පති**. පු-රජා, තරදෙවයා.

**දිසා**. ඉ-දිසාව, පූර්වාදි දිසා.

**දිසාවන්තික**. පු-දිසාවෘත ඇත්තා.

**දිසාඩාහ**. පු-වහ්නි සිඛා, ධූමසිඛාවන්ගෙන්...

**දිසි**. d. චු-කථනෙ, කීමෙහි, දෙසෙති, දෙස යති, දෙසයි.

**දිසො**. අ-දිසාවෙන්, සොරතෙම.

**දිස්වා**. අ-දක යනාඵ ඇති පූර්වක්‍රියාවක්.

**දිස්සති**. ක්‍රි-(දිස=දිස්ස + ති) දකියි.

**දිහ**. d. භූ-රාසිකරණෙ, රැස්කිරීමෙහි, දෙහති, රැස්කරයි.

## දී

**දී**. d. දි-ඛයෙ, ක්‍ෂයවීමෙහි, දීයනෙ, ක්‍ෂයවෙයි.

**දීඝ**. ති-දිග

**දීඝ**. පු-සර්පයා, දීර්ඝ ජාතියා.

**දීඝඤ්ඤ**. න-දීර්ඝමාර්ගය.

**දීඝතක**. න-දීර්ඝ බව.

**දීඝතා**. ඉ-දීර්ඝ බව.

**දීඝපිට්ඨික**. පු-දිග පිට ඇත්තා, සර්පයා.

**දීඝමාරුත**. න-ඇතා.

**දීඝලොමක** පු දිගලොම් ඇත්තා.

(12963)

**දීඝරත්ත**. න-චිරකාලය, දීර්ඝකාලය, බොහෝ කල්.

**දීඝවණ්ට**. පු-දිගනැටි ඇති, තොටිලගස,

**දීඝායු**. පු-දීර්ඝායු ඇත්තා, ජීවක නම් ගස.

**දීඝසුත්ත**. ති-දීර්ඝසූත්‍ර, ප්‍රාරබ්ධ ක්‍රියායෙහි කල් ගතකරණ තැනැත්තා, දීර්ඝ ක්‍රියා ඇත්තා.

**දීධි**. d. භූ-දිත්තියං, දීප්තියෙහි, දීධති, බබලයි

**දීන**. ති-දිලින්ද, බැගෑපත් අය, දිළිඳු.

**දීනත්ත**. න - දීනබව, දිළිඳු බව, බැගෑපත් බව.

**දීප**. පු-දිවයින, ප්‍රදීපය, පහන, ප්‍රතිෂ්ඨාව, නිර්වාණය, දිවිසමින් මලදනා ලද රථය.

**දීප**. පු න - ජලයෙන් වටවූ ප්‍රදෙශය, දූව, විපය. ජලය මධ්‍යයෙහි පිහිටි ගොඩබිම.

**දීප**. d. දි - දිත්තියං, බැබලීමෙහි' දිප්පති, බබලයි, පදීපො, දීපපූජා.

**දීප**. d. චු-පකාසනෙ, ප්‍රකාශයෙහි, දීපෙති, දීපයති, ප්‍රකාශ කරයි, පහළ කරයි, දීපනං, දීපනී.

**දීපක**. පු-මුවං, සේවටු ආදීහු.

**දීපඞ්කර**. පු-ආලොක කරන්නා, සූර්‍ය්‍යයා, හිරු.

**දීපච්චි**. ඉ-ලාම්බු දැල්ල.

**දීපන**. න බැබලීම, දූත්වීම, ප්‍රකාශය.

**දීපඞ්කර**. පු-ආලෝක කරන්නා, එනම් බුදු රජ.

**දීපාලය**. න-විශ්‍රාම ගන්නා තැන, විසුම්හල.

**දීපාලොක**. න-පහන් ආලොකය.

**දීපි**. පු-දිවියා, කොටියා.

**දීපික**. පු-දිවියා, කොටියා.

**දීපිකා**. ඉ-ගිනිසුල, දීප්තිය.

**දීපිත**. ති-දක්වන ලද, නිරූපනය කළ.

**දීපිය**. පු-දිවිසමින් වැසූ රථය.

**දීපෙති**. ක්‍රි-(දීප. d දි-දිත්තියං-දීප්තියෙහි + ණෙ + ති) දිලිසෙයි, එළිය දෙයි, දල්වයි.

**දීපරුක්ඛ**. න-ලාම්පුගස, ලාම්පු කණුව, ඉටි පන්දම් ගසන උපකරණය.

**දීපසිඛා**. ඉ-ගිනිදල්ල, ගිනිසිළුව.

**දීධිති**. පු. ඉ-රශ්මිය, හිරු රැස.

## දු

**දු**. අ-කුත්සිතාර්‍ථ, ඊසදර්‍ථ, විරූපත්‍ව, අසොභන, අභාව, සමෘද්ධි, දුඃඛ, සන්තොෂ, වශෙෂය.

**දු**. d. භූ-ගමනෙ, යාමෙහි, දවති, යෙයි.

**දු**. d. සු-හිංසායං, පෙළීමෙහි, දුණාති, පෙළයි.

**දු**. d. කි-හිංසායං, පෙළීමෙහි, දුනාති, පෙළයි.

**දුක්කට**. න-පාපය, නපුරුකොට කරණ ලද්ද.

**දුක්කර**. ති-දුෂ්කර, කිරීමට නොපහසු.

**දුක්ඛ**. d. භූ-දුක්ඛනෙ, දුක්වීමෙහි, දුක්ඛති; දුක්වෙයි.

**දුක්ඛ** න-දුක.

**දුක්ඛතා**.

**දුක්ඛක්ඛන්ධ**. පු-දුක්රැස, දුක්කඳ, දුක්ගොඩ.

**දුක්ඛති**. ක්‍රි-(දුක්ඛ + ති) දුක්වෙයි.

**දුක්ඛක්ඛය**. පු-දුක් ක්ෂයකිරීම, නිවණ.

**දුක්ඛනිරොධ**. පු-දුක් නිරුද්ධ කිරීම, නිවණ.

**දුක්ඛඞ්ගී**. පු-දුක්ඛාංගනීය, දුක්ගින්න.

**දුක්ඛසමුදය**. පු-දුක් ඉපදීම, සමුදය සත්‍යය.

**දුක්ඛාපන**.

**දුක්ඛාපෙති**. ක්‍රි - (දුක්ඛ + ණාපෙ + ති) දුක් දෙවයි.

**දුක්ඛිත**. ති-දුඃඛිත, දුඃඛප්‍රාප්ත, දුකට පැමිණි.

**දුක්ඛී**. පු දුක් ඇත්තා.

**දුක්ඛීයති**. (දුක්ඛ + ඊය + ති) දුක්වෙයි.

**දුක්ඛුද්ද**. පු දුක් ඉපදීම.

**දුක්ඛුද්‍රය**. පු-දුක් ඉපදීම.

**දුක**. න-දෙදෙනකුන්ගේ සමූහය "දුකනිපාත, දුක පට්ඨාන"

**දුකූල**. න-දුහුල් පිලි, දුකූලවස්ත්‍ර.

**දුඛද්දිත**. ති-දුඃඛිත, දුකින් පීඩිත.

**දුග්ග**. න - පර්වත ජලාදියෙන් වටවී යාමට දුෂ්කරවූ ප්‍රදේශය, දුර්ගස්ථානය, එනම් රාජ්‍යාඞ්ගය.

(13016)

**දුග්ගත**. ති-දිළින්ද, දුගියා.

**දුග්ගති**. ඉ-දුගතිය, දුර්ගතිය, නිරය.

**දුග්ගන්ධ**. පු-දුර්ගන්ධය, දුගඳ, අපිවූ ගඳ.

**දුග්ගම**. පු-දුර්ගමාර්ගය, සොරුන් විසින්ද කණු කටු ආදියෙන්ද ගහණ යා නොහැකි මාර්ගය.

**දුග්ගහිත**. පු - වරදවා ගන්නා ලද්ද, නපුරු කොටගත්.

**දුග්ගසංචාර**. පු-දුර්ගමාර්ගය, දුර්ගස්ථානය.

**දුඝණ**. පු-මුගුර, මුද්ගරය.

**දුච්චරිත**. න-පාපය, දුශ්චරිතය, දුසිරිත.

**දුච්චජන**. න-හැරිය නොහැකි,

**දුජ්ජරා**. ඉ-නොදිරණ දෙය.

**දුට්ඨ**. පු-දුෂ්ට, නපුරු, කිපියහු, අප්‍රිය

**දුට්ඨමන**. න-දූෂිත සිත් ඇත්තා.

**දුට්ඨමිත්ත**. පු-දුෂ්ට මිත්‍ර, නපුරු මිත්‍ර.

**දුට්ඨාරුක**. න-දුෂ්ටවෘණය, නපුරු වණය.

**දුට්ඨු**. ති-නරක, වැරදි, දුෂ්ට.

**දුට්ඨුල්ල**. න - එතම් ඇවැත, නපුර ආශ්‍රය කරණ ලද්ද.

**දුතිය**. පු-දෙවෙනි, දෙක සම්පූර්ණ කරණ.

**දුතියක**. ති-දෙවෙනියෙක් සහිත, දෙවැන්-නෙක් ඇති.

**දුතියා**. ඉ-දියවක, භාර්‍ය්‍යාව, දෙදෙනකුන්ගේ පිරීම (සම්පූර්ණ කිරීම) කරන්නී.

**දුතියිකා**. ඉ-භාර්‍ය්‍යාව.

**දුත්තප්ප**. ති-තෘප්ති කොට හැකි.

**දුත්තර**. න-එතරවීමට දුෂ්කර.

**දුද්දස**. ති-නොදක්ක හැකි, නොදත හැකි.

**දුද්දසතර**. ති-අතිශයින් නොදත හැකි දර්ශනීය දේ.

**දුද්දසික**. ති-දැකීමට නුසුදුසු, නපුරු දැකුම් ඇත්තා.

**දුද්දිට්ඨි**. ඉ-නපුරු දෘෂ්ටිය, මිථ්‍යා දෘෂ්ටිය.

**දුද්දින**. න - වැලලි දවස, මෙසයෙන් අහස වැසී තිබෙන ආලෝක රහිත දිනය.

**දුද්ධ**. න-දුග්ධ. මිදිකිරි, දීකිරි.

**දුන්දුභි**. පු-බෙරය.

**දුන්නාමක**. න-අර්ශස් රෝගය.

**දුන්නික්ඛිත්ත**. ති-වරදවා තබන ලද, වැරදි ලෙස.

**දුප්පජහ**. පු-පහකිරීමට දුෂ්කර.

**දුප්පමෙය්‍ය**. පු-ප්‍රමාණ නොකට හැකි.

**දුප්පරියොගාළ්හ**. ති - දුකසේ ඇතුලත් විය යුතු, ඇතුලත් වීමට දුෂ්කර.

**දුප්පසහ**. න-ඉවසිය නොහැකි.

**දුපට්ට**. න-දෙපොට, පොටවල් දෙකක් ඇති.

**දුළු**. d. භූ-විබාධනෙ, බාධා කිරීමෙහි, දෙළුති, කිළුටුවෙයි, "දෙළුති චොරං රාජා"

**දුළුස්ස**. පු-දුඃස්පර්ශය ඇති, කසඹිලියා.

**දුබ්බණ්ණ**. පු - (දු + වණ්ණ) නපුරු වර්ණය, අශොභන වර්ණය, විවර්ණය, පිදී. න.

**දුබ්බල**. න-දුර්වල, බලහීන, දුබල, අබල

**දුබ්බා**. ඉ-හීතණ, ඊතණ.

**දුබ්බච**. පු-නපුරු කොට කියන ලද්ද

"අනුසූය්‍යාය මාණොසෝ
සම්මදක්ඛාය භාසති,
සුභාසිතං අනුමොදෙය්‍ය
දුබ්භටෙට නාවසාදයෙ"
(අංගුත්තර)

**දුබ්භ**. ති-වංචා කරණ සුළු, කරදර කරණ සුළු.

**දුබ්භක**. ති-ද්‍රෝහි, මිත්‍ර ද්‍රෝහි.

**දුබ්භන**. න-ද්‍රෝහීකම, හිරිහැර කිරීම.

**දුබ්බුට්ඨි**. ඉ-(දු + වුට්ඨි) නපුරු වර්ෂාව.

**දුබ්බුට්ඨික**. නපුරු වැස්ස ඇති.

**දුබ්භණිත**. න-නපුරු කොට කියන ලද.

**දුබ්භික්ඛ**. න-දුර්භික්ෂය, ආහාර හිඟකම.

**දුබ්භාසිත**. න - නපුරු කොට කීම, නපුරු කොට කියන ලද, වරදවා කියන ලද.

**දුබ්භික්ඛ**. න-දුර්භික්ෂය, භික්ෂා දුර්ලභය, ආහාර හිඟකම.

**දුහ**. d නසපණේ, තර්පණයෙහි, දුහෙති, දුහයති, තර්පණය කෙරෙයි.

**දුභය**. උභය දෙක.

**දුම්මඞ්කු** පු-දුශ්ශීල, පව්ටු.

**දුම්මන**. න-දුෂ්ට සිත් ඇත්තා, නපුරු සිත් ඇත්තා.

**දුම්මුඛ**. පු-දුර්මුඛයා, අප්‍රියවාදියා.

**දුම**. පු-වෘක්ෂය, ගස.

**දුමචය**. පු-වෘක්ෂ සමූහය.

**දුමන්තර**. න-වෘක්ෂ විශෙෂය.

**දුමාමය**. පු-ලාකඩ

**දුමුප්ඵල**. පු-කිණිහිරි ගස.

**දුමෙසා**. ඉ-හුනිද.

**දුය්හති**. දුහ. ක්‍රි-(d. දි. ජියං සායං, අභිත හැසිරීමෙහි + ති) දඬුවම් කරයි.

**දුරක්කම**. (දු + අක්කම) පු-ඉක්මිය නොහැකි.

**දුරක්ඛාත**. ති-(දු + අක්ඛාත) නපුරු කොට කියන ලද, වරදවා කියන ලද

**දුරතිවත්තන** න-ඉක්මීමට දුෂ්කර, බැහැර කිරීම නොහැකි.

**දුරනුබෝධ**. (දු + අනුබෝධ) පු. අවබෝධයට අමාරු, ප්‍රතිවේධයට අමාරු.

**දුරභිරම**. (දු + අභිරම) ති-අභිරමණයට අමාරු, සිත් ඇලවීමට අමාරු.

**දුරභිසම්භව**. පු-ඉවසිය නොහැකි, සම්පූර්ණ නොකට හැකි.

**දුරා**. අ-දූරාර්ථයෙහි.

**දුරාචාර**. පු-නපුරු හැසිරීම, අනාචාර.

**දුරාසද**. (දු + ආසද) පු - ගැටීමට, ළටහත් කිරීමට, ලත්වීමට නොහැකි.

**දුරිත**. න-පාපය.

**දුල**. d. චු-උද්දක්ඛිපනෙ. උඩදැමීමෙහි, දෙලෙති දෙලය, උඩදමයි.

**දුවිඤ්ඤාපය**. පු-අවබෝධ කරවීමට දුෂ්කර ඇඟවීමට අමාරු.

**දුස්ස**. න-වස්ත්‍රය, පිළිය.

**දුස්සක**. න-වැරදි කිරීම, අවනම්බු කිරීම,

**දුස්සති**. ක්‍රි-දුස + d. භූ. ති දූෂ්‍ය කෙරෙයි.

**දුස්සන**. න-දූෂ්‍යවීම, දූෂ්‍ය කිරීම.

**දුස්සස්ස**. න-සස්‍ය විනාශවී යාම.

**දුස්සනීය**. ති-ක්‍රොධ බහුල, කිපෙන සුළු.

**දුස්සික**. පු-රෙදි වෙළෙන්ද.

**දුසිත**. ති-කිළිටු.

**දුස්සීල**. පු-සිල්නැති, දූෂ්‍යවූ සිල් ඇත්තා.

**දුස**. දි. භූ. අප්පීතියං, අප්‍රීතියෙහි, දුස්සති, පදුස්සති, ප්‍රීති නොකරයි.

**දුස**. d. වෙෂයෙහි - දුස්සති, වෙෂකරයි.

**දුස්සීල්‍ය**. න-දුස්සීලභාවය, සිල්නැති බව.

**දුස්සීලමල**. න-දුස්සීලමලය, දුසිල් මල.

**දුහ**. භූ. d. දෙවීමෙහි - පිරවීමෙහි, දෙහති. දුහයති. පුරවයි, දෙවයි.

**දුහ**. d. භූ-ඉච්ඡායං, කැමැත්තෙහි, දුහති.

**දුහිතු**. ඉ-දුවනිය, දුහිතා, දූ.

**දුහි**. d. භූ-පීඩාවෙති, දුහති, පීඩාවෙයි.

**දුහිණ**. පු-බ්‍රහමයා.

**දුහද**. පු-සතුරා

## දූ

**දූත**. පු-පණිවිඩ කරන්නා, සන්දෙශහාරකයා.

**දූතෙය්‍ය**. න-දූතකම, පණිවිඩ ගෙනයෑම.

**දූර**. න-දුර ඈත.

**දූරා**. අ-දූරාර්ථයෙහි.

**දූසක**. ති-වැරදි සහිත, දෙස් සහිත.

**දූසන**. න-දෙෂය.

**දූසිත**. ති-දූෂ්‍යවන ලද, කිළිටුකළ, අප්‍රිය.

**දූසි**. පු-මහමඟ සොරා.

**දූසෙති**. දූස. d. චු. නාසෙ, (නැසීමෙහි + ණ + ති) නසයි.

**දූහන**. න-සොරකම් කිරීම, අවනම්බු කිරීම, කිරි දෙවීම, කිරි භාජනවලට පිරවීම.

(13120)

## දෙ

**දෙ.** d. භූ-රක්‍ෂාකිරීමෙහි, දයති, රක්‍ෂාකරයි.

**දෙ.** d. භූ-සොධනෙ. සුඩකිරීමෙහි, දයති. සුඩකරයි.

**දෙ.** d. භූ-රැකීමෙහි, දයති රකියි.

**දෙක.** d. භූ-සද්දෙ, ශබ්දය, උත්සාහය, දෙකති. ශබ්දකරයි.

**දෙක.** d. භූ-කඞ්ඛායං. සැක කිරීමෙහි, දෙකති, සැකකරයි.

**දෙච්ච.** පු-අසුරයා.

**දෙච්චාරී** පු-අසුර ශත්‍රු, විෂ්ණු.

**දෙජ්ඣ.** ති-බෙදූ, බෙදන ලද.

**දෙට.** d. භූ-පරිභාසෙ, පරිභාසණයෙහි, දෙටති. පරිභාෂාකරයි.

**දෙඩ්ඩුභ.** පු. දිය බරියා, දියනයි ඕස වැනි කාය බන්ධනය.

**දෙණ්ඩිම.** පු. පණාබෙර.

**දෙතෙය.** පු-තෛදත්‍ය අසුරයා.

**දෙය්‍ය.** ති-දියයුතු.

**දෙය්‍යධම්ම.** න-තෑග්ග, දිය යුතු වස්තුව.

**දෙව.** පු. විශුඩි දෙව සම්මුතිදෙවාදීහු මෙඝය, මරණය, ආකාශය.

**දෙවකිනන්‍ද.** පු-විෂ්ණු.

**දෙවතා.** ඉ-දෙවියා, දෙව්දුව, සුරංගනාව

**දෙවකාය.** පු-දෙව සමූහයා.

**දෙවති.** ක්‍රි-දෙව d. භූ. දෙවනෙ, වැලපීමෙහි + ති වැලපෙයි.

**දෙවකුසුම.** න-ලවඟ, කරාබුනැටි.

**දෙවචාරික.** පු-දෙව්ලොව චාරිකාව.

**දෙවත.** න-දෙවි.

**දෙවතන්තර.** න-දෙවතා විශෙෂ.

**දෙවඤ්ඤු.** පු-නැකැත් දන්නා.

**දෙවමාතක.** න-වැස්සෙන් කැණීගිය වල.

**දෙවතාඩ.** පු-දෙවදලිය, දේවදර.

**දෙවතාවාස.** පු-දෙව ප්‍රාසාදය, දෙවස්ථාන, දෙව්ලොව.

**දෙවතාස.** පු-දෙවදලිය.

**දෙවදාරු.** පු-දේවදර.

**දෙවදූත.** පු-දෙවියන්ගේ දූතයා, වැහි නැති මේඝ නාදය.

**දෙවදුන්‍දුභි.** පු-දෙවහෙරි, දෙවියන්ගේ බෙර. අහසෙහි පවත්නා නාදය, මෙඝනාදය.

**දෙවදුම.** පු-දෙවදුම, දිව්‍යවෘක්‍ෂය.

**දෙවදෙව.** පු-බුදුරජ.

**දෙවන.** න-ව්‍යවහාරය, දිනනුකැමැත්ත, ක්‍රීඩා, ද්‍යූති, ස්තුති ආදිය.

**දෙවභෙද.** පු-දෙවතා විශෙෂ.

**දෙවමාතික.** ඉ-අහස්දියෙන්, උපත් සස්‍ය ඇති ප්‍රදෙශය.

**දෙවර.** පු-සැමියාගේ, සහෝදරයා, මස්සිනා.

**දෙවරාජ.** පු-දිව්‍යරාජ, දෙව්රද, දෙවියන්ගේ රජා, ශක්‍රයා.

**දෙවරුක්ඛ.** පු-දෙව වෘක්‍ෂ, දෙව්රුක්, දිව්‍ය වෘක්‍ෂය.

**දෙවලොක.** පු-දිව්‍යලොකය, දෙව්ලෝ, දෙව්ලොව.

**දෙවසක.** න-දවස්පතා, දිනපතා.

**දෙවාලය.** පු - දෙව්ලෝකය, දෙව්ලොව, දෙවොල.

**දෙවාතිදෙව.** පු-දෙවාධිදෙව, බුදුරජ.

**දෙවිත්‍ථි.** ඉ-දෙවඟන, දිව්‍ය ස්ත්‍රිය.

**දෙවී.** ඉ-අගමෙහෙසිය, මොරගස.

**දෙවු** d. භූ කීළනෙ, ක්‍රීඩාවෙහි, දෙවති, ක්‍රීඩා. කෙරෙයි.

**දෙවු.** d. භූ-නිත්‍ථුයං, පරිභවයෙහි දෙවති, පරිභවකරයි.

**දෙස.** d. භූ-අබ්‍යත්ත සද්දෙ, ආව්‍යක්ත ශබ්ද යෙහි දෙසති, දෙසයි.

**දෙස.** පු-ප්‍රදෙශය, රට.

**දෙසක.** පු-දෙශයට අයත්, දෙශය පිළිබඳ.

**දෙසන.** පු-සතුරා.

**දෙසනා.** ඉ-දෙශනාව, දෙසීම, කීම

(13175)

**දෙසිත**. පු-දෙශනා කළ.

**දෙහ**. පු. න-ශරීරය.

**දෙසෙති**. ක්‍රි. d. භූ-දෙශනා කෙරෙයි.

**දෙහක**. පු-සිරුරක් ඇත්තා

**දෙහමජ්ඣ**. පු-ශරීර මධ්‍යය.

**දෙහී**. පු-සත්වයා, පුද්ගලයා.

**දෙහිනී**. ඉ-එලිපත.

**දෙහාවයව**. පු-ශරීරාවයව.

## දො – ද්‍රු

**දො**. d. දි - පරිතාපනෙ, තැවීමෙහි, අයනෙ, තැවෙයි.

**දොණ**. පු. න-ද්‍රෝණය, සතර ලාස්ස, 16 නැළිය.

**දොණපාක**. න-ද්‍රෝණයක් පමණ, පිසීම.

**දොණී**. ඉ-ඔරුව, බේරුගස.

**දොණික**. ති-ද්‍රෝණයක් පමණ මැන්න.

**දොනගග**.

**දොමහ**. පු-මිත්‍රද්‍රෝහය.

**දොමනස්ස**. න-දෞර්මනස.

**දොවාරික**. පු-දොරටුපාලයා, ද්වාරාරක්ෂකයා.

**දොවචස්සතා**. ඉ-දුර්වචභාවය.

**දොස**. පු-දෝෂ, ක්‍රෝධය, නුගුණ, දෙස්.

**දොසනීය**. ති-ක්‍රොධ සහිත, දෙස් සහිත.

**දොසග්ගි**. පු-වෛසාග්නි, ද්වෙෂ නමැති ගින්න.

**දොසඤ්ඤූ**. පු-දෙස් දන්නා අය, පණ්ඩිතයා.

**දොසක්ඛාණ**. න-දෙස කථනය, දෙස් පහළ කිරීම.

**දොසා**. ඉ-රාත්‍රිය.

**දොසිනා**. ඉ-දෙස් රහිත.

**දොසී**. පු-දෙස් ඇත්තා.

**දොසෙ**. ං-රාත්‍රියෙහි.

**දොස්නාරත්ති**. ඉ-සඳරැසින් යුත් රාත්‍රිය.

**දොහ**. න-කිරිදෙවීම, අනතුරු කිරීම.

**දොහළ**. පු-තෘෂ්ණාව, ආසාව.

**දොහති**. ක්‍රි (දුහ, d. භූ පපූරණෙ+ති) දොවයි.

**දොලා**. ඉ-දෝලාව, කුණම, ඔන්චිල්ලාව.

**දොහළ**. න-අසනීපය, ආශාව.

**ද්‍රුව**. පු-ද්‍රුව, තෙත්දෙය.

**ද්‍රවිණ**. න-ශක්තිය.

## ද්ව

**ද්වත්තිංස**. ඉ-දෙතිස, 32.

**ද්වය**. න-දෙදෙනෙකුගේ සමූහය.

**ද්වන්ද**. න-යුගලය, යුග්මය.

**ද්වාදස**. න-දොළස, 12

**ද්වාකාර**. පු-ආකාර, දෙකක්.

**ද්වාදසායතන**. න-චක්ඛාදී ආයතන දොළස.

**ද්වාදසක්ඛ**. පු-සර්වඥයන් වහන්සේ.

**ද්වාදසන්ත**. පු-ඉරු.

**ද්වාදසවිපල්ලාස**. න-දොළොස් විපල්ලාස

**ද්වාර**. න-දොර, මුඛය.

**ද්වාරකොට්ඨක**. පු-දොරකොටුව, දොරටුව.

**ද්වාරට්ඨ**. පු-දොරටුපාලයා.

**ද්වාරපාල**. පු-දොරටුපාලයා.

**ද්වාරපාලක**. පු-දොරටුපාලයා.

**ද්වාරබන්ධන**. න-ආලින්දය, පිල.

**ද්වාරබාහා**. ඉ-දොරබාව, දොරපියන

**ද්වාරමත්තක**. න-වාරකොෂ්ඨය.

**ද්වාරික**. පු-දොරටුවෙහි නියුක්තයා, දොරටු පාලයා.

**ද්වාසට්ඨි**. ඉ-වාසට්ඨි, දෙසැට, සැටදෙක, 62.

**ද්වාසට්ඨිදිට්ඨි**. ඉ - වාසට්ඨිදෘෂ්ටි, දෙසැට දිටු, සැට දෙකක් දෘෂ්ටි.

(18230)

## ද්වි – ද්වෙ

**ද්වි.** පු-දෙක.

**ද්විගොචර.** පු-දෙදෙනෙකුට ගොචර වූයේ.

**ද්වික.** න-දෙදෙනෙකුගේ සමූහය.

**ද්වික්ඛත්තුං.** අ-දෙවරක්, දෙවාරයක්.

**ද්විජ.** පු-දෙවරක් උපන්නා, බ්‍රාහමණයා, පක්ෂියා, දත්, ස්ථාන දෙකකින් උපදනා අක්ෂරාදිය.

**ද්විජමහාසාරකුල.** න-බමුණ මහසල් කුලය. බ්‍රාහමණ මහාසාර කුල බලනු.

**ද්විජරාජ.** පු-චන්ද්‍රයා.

**ද්විජා.** ඉ-හරේණු.

**ද්විතා.** න-එකක් දෙකක්වීම, දෙගුණයක්වීම.

**ද්විධා.** අ-දෙපරිද්දකින්, දෙයාකාරයකින්.

**ද්විජිව්හා.** ඉ-දිව් දෙකක් ඇත්තා, සර්පයා, ගොයා, කෝලාම් කියන්නා.

**ද්විප.** පු-දෙවරක් පානය කරන්නා, ඇතා.

**ද්විපද.** න-පා දෙකක් ඇත්තා, දෙපා සත්වයා.

**ද්විරද.** පු-ඇතා.

**ද්විරෙඵ** පු-රකාර දෙකක් ඇත්තා, බඹරා, භ්‍රමර.

**ද්විසහස්සිලොකධාතු.** ඉ-දෙවන සහස්‍රයෙන් ගුණිත ලොකධාතුව, චූලනී සහස්‍ර ලොක ධාතුව, සහස්‍රයෙන් ගුණ කරණ ලද්දේ ද්විසහශ්‍රී ලොක ධාතු නම් වේ.

**ද්විහ.** න-දෙදවස, දෙදවසක්.

**ද්විහිතික.** පු-දෙදවසකට අයිති.

**ද්වෙ** දෙක.

**ද්වෙධා.** අ-දෙයාකාරයකින්, දෙපරිද්දකින්.

**ද්වෙජ්ඣ.** ති-බෙදූ, දෙකට බෙදූ.

**ද්වෙධාපථ.** පු-දෙපරිද්දකින් පවත්නා මාර්ගය.

**ද්වෙළ්හක.** න-විචිකිච්ඡාව, එකක් නියම කර නොහැකි සැකය.

## ධ

**ධංක.** පු-කපුටා, කොකා.

**ධංසති.** ක්‍රි-(දසි d. භූ. දංසනෙසු, නැසීමෙහි + ති) නසයි.

**ධංසන.** න-නැසීම, ගැලවීම, ඩැහැගැණීම.

**ධංසී.** පු-නැසුණු තැනැත්තා.

**ධංසිත** පු-ගිලිහුණු, නැසුණු.

**ධංඬ.** d. භූ-වස්සිතෙ, තිරිසන් හඬෙහි, ධඬෙති, තිරිසන් නාද කරයි.

**ධක්ක.** d. චු නාසනෙ, නැසීමෙහි, ධක්කෙති, ධක්කයති, නසයි.

**ධක.** d. භූ-ගතියං, යෑමෙහි, ධකති, යෙයි.

**ධකි.** d. භූ-ඉච්ඡායං, කැමැතිවීමෙහි, ධඞකති, කැමතිවෙයි.

**ධජ.** පු-ධජ, දද, ධවජය, කොඩිය.

**ධජ.** d භූ-යාමෙහි, ධජති, යෙයි.

**ධජග්ග.** න-කොඩියේ අග, එනම් සූත්‍රය.

**ධජවන්තු.** පු-ධවජ බහුල රථාදිය.

**ධජි.** d. භූ-ගතියං, යාමෙහි, ධජති, යෙයි.

**ධජිනී.** ඉ-සේනාව.

**ධඤ්ඤ.** න-ධාන්‍යය, හැල්වී ආදිය.

**ධඤ්ඤ.** ති-පුණ්‍යවත්හු, පිණැත්තහු.

**ධඤ්ඤඞ්ග.** පු-ධාන්‍යාවයව.

**ධඤ්ඤකරණ.** න-කලවිට, කමත.

**ධඤ්ඤතච.** පු-ධාන්‍යපොතු, වීපොතු.

**ධඤ්ඤමාස.** පු-ඌනකාසත ප්‍රමාණය, ඌනකා බලනු

**ධඤ්ඤම්බිල.** න-කාඩි.

**ධත.** ති-දරණ ලද, උසුලන ලද.

**ධතරට්ඨ.** පු-ධ්‍රතරාෂ්ට නම් වරම්රජ, ධතරට, කළුතුඩු හා පා ඇති හංසයා.

**ධන.** න-මුක්තා මාණික්‍යාදි ධනය.

**ධන** d. භූ-සද්දෙ, ශබ්දයෙහි, ධනති, ශබ්ද කෙරෙයි.

**ධන.** d. චු-සද්දෙ, ශබ්දයෙහි, ධනෙති, ධනයති ශබ්ද කෙරෙයි.

**ධන.** d. චු-අභිලාසෙ, කැමැත්තෙහි, ධනෙති, කැමති වෙයි. (13281)

**ධනක්කීත**. පු-ධාන්‍යාදියෙන් ගත් දාසයා.

**ධනද**. පු-වෙසමුනු රජ.

**ධනදප්ප**. පු-ධනදර්පය, ධනය නිසා උපදිනා අහංකාරය,

**ධනරාසි**. පු-ධනරාසිය, ධනසමූහය.

**ධනවන්තු**. පු-ධන ඇත්තා, ධනවතා.

**ධනාගම**. පු-ධනප්‍රාප්තිය, ධනලාභය.

**ධනි**. න-ධ්වනිය, ශබ්ද, හඬ.

**ධනික**. පු-ධනවතා, ණය දුන් අය.

**ධනිය**. පු-ධනවතා, වස්තු හිමියා.

**ධනිට්ඨා**. ඉ-දෙනේ නැකත.

**ධනිත**. ති-ධ්වනිත, ධ්වනි යුක්තයා.

**ධනී**. පු-ධනවතා, ධනවන්තයා.

**ධනු**. න-දුන්න, ධනු.

**ධනු** d. දි-යාචනෙ, ඉල්වීමෙහි, ධනීයති, ඉල්වයි.

**ධනුක**. න - කුඩා දුන්න, කුඩා දුන්නෙන් කෙළීම.

**ධනුපඤ්චසත**. න දුනුපංසියක් දුර, ක්‍රෝෂය

**ධනුසෙසාණි**. පු-මොරගස.

**ධම්ම** පු සවභාව, පාලිධර්මය, ඥානය, යුක්තිය. සත්‍යය, ප්‍රකෘතිය, පුණ්‍යය, ඥෙය වස්තු, ගුණය, ආචාරය, සමාධිය, නිස්සත්තතාව, ආපත්තිය, හේතුව.

**ධම්මකථික**. පු-ධර්මකථිකයා, ධර්මය කියන්නා.

**ධම්මකාය** පු-බුදුරජ.

**ධම්මචක්ක**. න-ධර්ම චක්‍රය, දම්සක, ධර්මචක්‍ර දෙශනාව, බුදුරජ, ධර්මඥව.

**ධම්මචක්ඛු**. න-ධර්මචක්ෂුස්, දම් ඇස, ශ්‍රොතාපත්ති මාර්ගඥානය.

**ධම්මචරිය**. ති-ධර්මචරියා, ධර්මයෙහි හැසිරීම.

**ධම්මචාග**. පු-ධර්මත්‍යාගය, දහම් තෑගි, ධර්ම දානය.

**ධම්මට්ඨ**. පු-ධර්මස්ථ, ධර්මයෙහි පිහිටි.

**ධම්මට්ඨිතඤාණ**. න-ප්‍රත්‍ය ඥානය, පටිච්ච සමුප්පාද අවබොධඥානය.

**ධම්මට්ඨිතතා**. ඉ-ධර්මස්ථතාව, ධර්මයෙහි පිහිටි බව.

**ධම්මතක්ක**. පු-ධර්මානුගත විතර්කය, සම්මා සංකල්පය, අහීත්ඵල විමොක්ෂය.

**ධම්මදාන**. න-ධර්මය දීම, ධර්ම දෙශනාව.

**ධම්මදෙසනා**. ඉ-දහම් දෙසීම, බණකීම.

**ධම්මද්ධජ**. පු-ධර්මධ්වජය, දහම් දද.

**ධම්මධර**. පු-ධර්මධර, ධර්මධරයා, දහම් දරන්නා.

**ධම්මධාතු**. ඉ-ධර්මධාතුව, දහම්දා, සර්වඥයන් වහන්සේ.

**ධම්මනී**. පු-ගැරඬියා.

**ධම්මනියාමතා**. ඉ-ධර්මයාගේ නියම සවභාවය.

**ධම්මපත්තන**. න-මිරිස්.

**ධම්මපරියෙට්ඨි**. ඉ-දහම් සෙවීම.

**ධම්මපූජා**. ඉ-ධර්මපූජාව, ධර්මයට පිදීම, දහම් පුද.

**ධම්මපීති**. ඉ-ධර්මප්‍රීතිය, ධර්මය අරමුණුකොට උපන් ප්‍රීතිය.

**ධම්මවුඩ්ඪි**. ඉ-ධර්මවෘද්ධි, දහමින් වැඩීම.

**ධම්මභොග**. පු-ධර්මභොගය, දහම් අනුභවය.

**ධම්මභණ්ඩාගාරික**. පු-ධර්මභාණ්ඩාගාරික.

**ධම්මභූත**. පු-ධර්මභූත, බුදුරජ.

**ධම්මවිචය**. පු-ධර්මවිචය, ධර්මය සෙවීම.

**ධම්මරතන**. න-ධර්මරත්නය, දහම්රුවන

**ධම්මරාජ**. පු-ධර්මරාජයා, බුදුරජ, දම්රද.

**ධම්මවිනය**. න-ධර්මය හා විනය.

**ධම්මසාකච්ඡා**. ඉ-ධර්මසාකච්ඡාව, ධර්මය ගැණ සමගියෙන් කථාකිරීම.

**ධම්මසාර**. පු-ධර්මසාර, දම්සර, බුදුරජ.

**ධම්මසෙනාපති**. ධර්මසෙනාපති, දම්සෙනෙවි, සාරිපුත්‍රස්ථවිරයන් වහන්සේ.

**ධම්මාධිප**. පු-ධර්මාධිපති, ධර්මය අධිපතිකොට ඇත්තා, බුදුරජ.

**ධම්මස්සාමි**. පු-ධර්මස්වාමි, දහම් සමි, බුදුරජ.

**ධම්මසංවෙග**. පු-ධර්මසංවෙගය, විනය ටීකා.

**ධම්මානුධම්ම**. පු-ධර්මානුධර්ම, ධර්මයට අනුව පිළිපදින්නා.

(13335)

**ධම්මානුසාරී.** පු-ධර්මානුසාරී, දහම්සිහිකරණ පුද්ගලයා.

**ධම්මාභිසමය.** පු-ධර්මාභිසමය, ධර්මාවබොධය.

**ධම්මික්ඛන්ධ.** පු-න-අනවද්‍යභාවය.

**ධම්මික.** පු-ධාර්මික, දැහැමි, දැහැමින් යුත්.

**ධම්මිය.** පු-ධාර්මික දැහැමි, දැහැමින් යුත්.

**ධම්මිල්ල.** පු-බැඳිකෙශකලාපය, කොණ්ඩය.

**ධම්මී.** පු-ධර්මය ඇත්තා.

**ධම්මොක්කා.** ඉ-(ධම්ම + උක්කා) දහම් විලක්කු.

**ධම.** d. භූ-ධමණෙ, ගිණිපිඹීමෙහි ධමති, පිඹී.

**ධම.** න-ගිනි පිඹීම.

**ධමක.** පු-ගිනි පිඹින්නා,

**ධමති.** ක්‍රි-(ධම + ති) ගිණි පිඹී.

**ධමන.** න-කුලල් පිඹීම, කුලල් බට පිඹීම.

**ධමණී.** ඉ-නහර.

**ධර.** d. භූ-ධාරණෙ, දැරීමෙහි, ධරති, දරයි.

**ධර.** d. භූ-සුණුකිරීමෙහි, නිධරති, සුණුකරයි.

**ධර.** d. භූ-පතිඨායං, ප්‍රතිෂ්ඨාවෙහි, ධරති, පිහිටවයි.

**ධර.** d. චු-ධාරණෙ, දැරීමෙහි, ධාරෙති, ධාරයති, දරයි.

**ධරණී.** ඉ-භූමිය, පෘථුවිය.

**ධරති.** ක්‍රි-(ධර + ති) දරයි.

**ධරා.** ඉ-භූමිය.

**ධරාධර.** පු-මෙඝය.

**ධව.** පු-දවගස, සවාමිපුරුෂයා.

**ධවනී.** ඉ-අභිසාරිකාව, වෙසඟන.

**ධවල.** පු-සුදු, ශෙවතවර්ණය.

**ධංස.** d. භූ-නාසෙ, නැසීමෙහි, ධංසති, නසයි.

## ධා

**ධා.** d. භූ-ධාරණෙ, දැරීමෙහි; දධාති, ධාති, දරයි.

**ධා.** d. භූ ධාරණෙ, චු-දැරීමෙහි ධාරෙති, ධාරයති, දරයි.

**ධාක.** d. භූ-සොසනෙ වියලීමෙහි, අල්පාණී යෙහි, ධාඛති වියලෙයි.

**ධාතකී.** ඉ-වල ඉන්න, මයිලගස.

**ධාති.** ඉ-කිරිමව, උපමාතාව.

**ධාතා.** ඉ-බැදියව.

**ධාතු.** පු. ඉ-ශෛලසමාදිය, රස රක්තාදිය, පඤ්චමහාභූත, වර්ණාදිය, ඇට, ඇස් ආදිය, භූධාතු ආදිය, ගෛරිකාදිය, චක්ඛුධාතු ආදිය, බ්‍රහමයා, ධාතුකුසල හා, චක්ඛුධාතු ආදී අටලොස්ධාතු දැකීමේ දක්ෂබව.

ධාතුසද්දො ජිනමතෙ -
ඉත්ථිලිඞ්ගත්තනෙ මතො
සත්ථෙ පුල්ලිඞ්ග භාවසම්ං -
කච්චායන මතෙ විදූ
විපුබ්බොධා කරොත්‍යත්ථෙ -
අභිපුබ්බොතු භාසනෙ
න්‍යංසංපුබ්බො යථායොගං -
න්‍යංසාරොපන සඤ්ඤු.

**ධාතුලොක.** පු-මහාභූත ධාතූන්ගෙන් යුත් ලෝකය.

**ධාමඟගව.** පු-සැබෝගස.

**ධාරක.** පු-දරන්නා.

**ධාරණ.** න-දැරීම, ඉසිලීම.

**ධාරා.** ඉ-ප්‍රබන්ධ, කඩු ආදීන්ගේ මුවහත්, වර්ෂාධාරාව.

**ධාරාසම්පාත.** පු-මෙඝයෙන් වැටෙන, දිය කරාව, වැසිපොත.

**ධාව.** d. භූ-යාමෙහි, දිවීමෙහි.

**ධාවන.** න-ගමන, දිවීම, පවිත්‍ර.

**ධාවනී.** ඉ-පුස්වැන්න, පොල්පලා.

**ධාවු.** d. භූ-ගතියං, ගමනෙහි වැඩීමෙහි, ධාවති, දුවයි විධාවති.

(13378)

## ධි – ධී

**ධික්ඛ.** d. භූ-දිත්ති කිලෙස ජීවනෙසු, දීප්තිය කිළුටුවීමය, ජීවත්වීමය, යන මෙහි.

**ධික්ඛති.** ක්‍රි. d. භූ-ධික්ඛ, (කිලෙසෙ, කිලිටු වීමෙහි + ති) කිළුටුවෙයි.

**ධික්ඛිත.** ති-බැබලුණු, කිළුටුවූණු, ජීවත්වුණු.

**ධිමහ** d. භූ-ධිමහ, නිඹුහනෙ, කාරාදූම්මෙහි.

**ධිමහති.** d. භූ-කාරාදමයි.

**ධිති.** ඉ-ධෛර්‍යය, දැරීම, ධාරණ ප්‍රඥාව.

**ධිතිමන්තු.** පු-වීර්‍ය්‍ය ඇත්තා ප්‍රාඥයා.

**ධිච්.** d. භූ-දිත්තියං, බැබලීමෙහි.

**ධිචු.** d. භූ-පරිච්චාගෙ, පරිත්‍යාගයෙහි, ධිබ්භති, පරිත්‍යාගකරයි.

**ධී.** අ-ගර්හාවෙහි, නින්දාවෙහි, බියගැන්වීමෙහි.

**ධී.** ඉ-ප්‍රඥාව.

**ධී.** d. භූ-අනාදරෙ, අනාදරයෙහි, ධීයතෙ, අනාදරකෙරෙයි.

**ධීතු.** ඉ-දුහිතෘ, දූ, දුවණිය.

**ධීතුපති.** පු-දුවගේ සැමියා, බෑනා.

**ධීමන්තු.** පු-ප්‍රාඥයා, පණ්ඩිතයා.

**ධීර.** පු-ප්‍රාඥයා වීරයා, කොකුම්.

**ධීරත්ත.** න-ධෛර්‍යබව.

**ධීරසම්මත.** පු-පණ්ඩිත සම්මත.

**ධීවර.** පු-කෙවුලා, කෙවට්ටයා.

## ධු

**ධු.** d. භූ-ගමනෙ, ගමනෙහි, ධුවති, යෙයි.

**ධු.** d. භූ-චලනෙ, සැළීමෙහි, ධුවති, සැලෙයි, චලනය කරයි

**ධු.** d. කී-චලනෙ, සෙලවීමෙහි, ධුනාති, සොලවයි, කම්පාකරයි.

**ධු.** d. චු-කම්පනෙ, කම්පාවීමෙහි, ධාවෙති, ධාවයති, කම්පාකරයි.

**ධුත.** ති-කම්පා කරණ ලද, සැලෙන ලද.

**ධුතඞ්ග.** න-කෙලෙස් කම්පාකරණ ව්‍රත විශෙෂය, තෙරස ධුතාඞ්ග බලනු.

**ධුතවාද.** පු-කෙලෙස්, ධුතාඞ්ග.

**ධුත්ත.** පු-අත්තනගස, දූකෙළින්නා, ධූර්තයා.

**ධුත්ත.** පු-වංචකයා, ධූර්තකයා

**ධුත්තක.** පු-ධූර්තකයා

**ධුත්තූර.** පු-අත්තනගස.

**ධුනන.** න-කම්පාවීම, සෙලවීම.

**ධූප.** d. භූ-සන්තාපෙ, තැවීමෙහි, ධූපති, තැවෙයි.

**ධුනමාන.** න-කම්පාවෙනු ලබන.

**ධුබ්බි.** d. භූ-හිංසායං, හිංසාවෙහි, ධුබ්බති, හිංසා කෙරෙයි.

**ධුර.** d. භූ-කුටිල බැව්හි, ධුරති, කුටිල වෙයි.

**ධුර.** පු-වියදඬු, අධිකාර වීර්‍ය්‍ය, ප්‍රධාන, සමීප.

**ධුව.** d භූ-ගතියං, ගමන් ස්ථිර බැව්හි, ධුවති, යෙයි.

**ධුරවන්ත.**

**ධුවකාල.** පු-නිතිකල්.

**ධුරවාහී** පු-ධුරවාහභයා, බර උසුලන ගොණා.

**ධුව** ත-තක්, නිශ්චිතාර්ථ, නිච්ච, නිරන්තර, ස්ථිර, නියම, ඒකාන්ත.

**ධුව.** පු-නොනස්නා දෙය.

**ධුවං.** අ ස්ථිර නියමයෙහි, ඒකාන්තයෙහි.

## ධූ

**ධූ.** ති-සැලීමෙහි.

**ධූත.** ති-හරණ ලද, බැහැර කරණ ලද.

**ධූප.** d චු-දීප්තියෙහි, ධූපෙති, ධූපයති, බබලයි, දුවයි.

**ධූපායති** ක්‍රි-(d. ධූපසන්තාපෙ, තැවීමෙහි + ති) දුම්ගසයි.

**ධූපාදිසඞ්ඛාර.** පු-සුවඳ දුම් කැවීම් ආදී සංස්කාරණය. **(13426)**

**ධූපිත.** ති-තවන ලද, රත්කරණ ලද.

**ධූම.** පු-දුම.

**ධූමකෙතු** පු - උත්පාතය, වහ්නිය, උල්කා-පාතය.

**ධූමනෙත්ත.** න-දුම්කවුළු.

**ධූමසිඛ.** පු-ගිනි, එනම් නාරජ.

**ධූමායති.** ක්‍රි-(d. භූ. ධූ කම්පනෙ, සැලීමෙහි +ති) කම්පා කරයි.

**ධූම්‍යාම.** පු-නීල කොබෙයියා.

**ධූමායනා.** ඉ-දුම්බීම, දුම්ගැසීම.

**ධූලි.** ති-රජස්, දූවිලි.

**ධූස.** d. චු - දිත්තියං, බැබලීමෙහි, ධූසෙති, ධූසති, බබලයි.

**ධූසර.** පු-මඳක් පඬු පැහැය, මදරත.

## ධෙ – ධො

**ධෙ.** d. භූ-සද්දෙ, ශබ්දය රුස්වීමය යන මෙහි ධායති, ශබ්ද කරයි, රුස්වෙයි.

**ධෙ.** d. භූ-පානෙ, පීමෙහි, ධයති, පානය කරයි, ධෙනු.

**ධෙනු.** ඉ-දෙන, අලුත වැදූ දෙන.

**ධෙක්ඛ.** d. භූ-සද්දෙ, ශබ්දය, උත්සාහය, යන මෙහි, ධෙක්ඛති ශබ්ද කරයි, උත්සාහ කරයි.

**ධෙනුප.** පු-දෙනගෙන් කිරි බොන පැටියා, කිරි බොත්තා.

**ධෙය්‍ය.** ති-දෙත, දෙත ලද.

**ධෙවත.** පු-එනම් සවරය.

**ධොත.** පු-පිරිසිදු කරණ ලද, සෝදන ලද.

**ධොපන.** න - මල නෑසින්ගේ මිනී ඇට, ඉදිරිපිට තබා කකා බිබී සෝක කිරීම, ඉන්ද්‍රජාලයක් ඇට සෝදා පෙන්නීම.

**ධොනා.** ඉ-ප්‍රඥාව.

**ධොර.** d. භූ-ගතිචාතුරියං, ගමන් දක්ෂ බැව්හි ධොරති, ගමනෙහි දක්ෂ වෙයි.

**ධොරය්හ.** පු-ධූර උසුලන්නා, ධූරවෘෂභයා, ඉසිලිය හැකි බර ඇත්තා.

**ධොරිතක.** පු ධාරා නම් අශ්වගණියක්.

**ධොවන.** න-සේදීම, ඇඹිල්ලීම.

**ධොවිත.** ති-සෝදන ලද, සේදූ.

**ධොවු.** d භූ-ධොවනෙ, සේදීමෙහි, ධොවති, සෝදයි.

## න

**න.** අ-ප්‍රතිෂෙධයෙහි, නෑ.

**නකුල.** පු-මුගටියා.

**නක්ක.** d. චු-නාසනෙ, නැසීමෙහි, නක්කෙති, නක්කයති, නසයි.

**නක්ක.** පු-කිඹුලා, මත්ස්‍යයා.

**නක්ඛ.** d. භූ-ගතියං, යාමෙහි, නක්ඛති, යෙයි.

**නක්ඛ.** d. චු - සම්බන්ධෙ, සම්බන්ධයෙහි, නක්ඛෙති, නක්ඛයති, සම්බන්ධ කෙරෙයි.

**නක්ඛත්ත.** න-නැකැත් තාරකා, අශ්විත්‍යාදි නැකත්.

**නක්ඛත්තරාජ.** පු - තාරකාවන්ගේ රජා, චන්ද්‍රයා.

**නක්ඛත්තෙසස.** පු-නක්ෂත්‍රාධිපතියා, චන්ද්‍රයා.

**නඛ.** d. භූ-ගතියං, යාමෙහි, නඛති, යෙයි.

**නඛ.** පු-නියපොතු.

**නඛර.** පු-නියපොතු.

**නඛී.** පු-නිය ඇත්තා.

**නඛසිඛා.** නිය අග.

**නග්ග.** පු-නග්න, අචෙලක, ආජීවක.

**නග්ගිය.** පු-නග්න බව.

**නග.** පු-පර්වතය, වෘක්ෂය.

**නගර.** ඉ. න-නගර, රාජධානිය.

**නගර සොභිනී.** ඉ-වෙසඟන.

**නගරක.** න-කුඩා නගරය, පුංචි නුවර.

**නඞ්ගල.** න-නගුල.

**නඞ්ගලදණ්ඩක.** පු-නගුල් දණ්ඩ.

**නඞ්ගුඨ.** න-නගුට, වාලධිය.

**නච්ච.** d. භූ-නච්චනෙ, නැටීමෙහි.

**නච්ච.** න-නැටීම.

**නච්චට්ඨාන.** න-නටන තැන, නෘත්‍යස්ථානය.

**නජ්ජන්තර.** න-නදී විශෙෂයක්.

**නට්ට.** න-නැටීම.

**නට්ටක.** පු-නටන්නා.

**නට.** d භූ-නච්චෙ, නැටීමෙහි, නටති, නටයි, නාටකො.

**නට.** d චු-නච්චෙ, නැටීමෙහි, නටෙති, නටයති, නටයි.

**නට.** පු-නටන්නා, නැටීම, තොටිල.

**නටක.** පු-නටන්නා, නෘත්‍ය කරන්නා

**නටන.** න-නැටීම, නෘත්‍ය කිරීම.

**නටභූසන.** න-තොටිල.

**නත්තක.** න-කුඩ රෙද්ද.

**නත්තකී.** ඉ-නිමිති කියන්නී, නටන්නී.

**නත්තන.** න-නැටීම.

**නත්තමාල.** පු-මඟුල් කරඬ.

**නත්තු.** පු-මුනුපුරා.

**නත්ථි.** අ-නැත, අවිද්‍යමානාර්ථයෙහි.

**නත්ථිකදිට්ඨි.** ඉ-නාස්තික දෘෂ්ටිය.

**නත්ථික.** පු-නාස්තික දෘෂ්ටිය ප්‍රකාශ කරන්නා.

**නත්ථිතා.** ති-නාස්තික දෘෂ්ටිය ඇතිබව.

**නත්ථිභාව.** ති-නැතිබව, නාස්තික භාවය.

**නත්ථු.** ඉ-නාසිකාව.

**නත.** d දි - සරීර වික්ඛෙපෙ, ශරීරවික්ෂෙප යෙහි, නච්චති, නටයි, නච්චං.

**නද්ද.** d. භූ-නද්දෙ, ශබ්දයෙහි, නද්දති, ශබ්ද කරයි.

**නද.** d. භූ - අබ්බ්‍යත්තෙ සද්දෙ, නොවියත් හඬෙහි, නදති, නාදකරයි.

**නද.** d. චු - සද්ද-කීමෙහි, නාදෙති, කියයි.

**නදති.** ක්‍රි. d. භූ. නද, අබ්‍යත්ත සද්දෙ, අව්‍යක්ත ශබ්දයෙහි + ති නාද කරයි.

**නදන.** න-නාද කිරීම.

**නදිත.** ති-නාද කළ.

**නදී.** ඉ-ගඞ්ගාව, නදිය.

**නදීමාතිකා.** ඉ-නදී ජලයෙන් හටගත් ශස්‍ය ඇති ප්‍රදෙශය.

**නදීමුඛ.** න-මෝය-පෙ-

**නදීවිදුග්ග.** න-නදියෙන් වටවී යා නොහැකි දුගීම ස්ථානය.

**නද්‍යම්බුජීවන.** න - නදීජලයෙන් ජීවත්වන සස්‍ය ඇති ප්‍රදෙශය, ගඞ්ගාජලයෙන් සස්‍ය කරණ ප්‍රදෙශය.

**නන්ද.** d. භූ - තුඨිමොදෙසු - සමෘද්ධියෙහි, නන්දති, සතුටුවෙයි, අභිනන්දති.

**නන්ද** පු-සන්තොෂය.

**නන්දි.** ති-වරපට, සොණ.

**නන්දි.** ඉ-තෘෂ්ණාව, තණ්හාව, යොත.

**නන්දති.** ක්‍රි-(නන්ද + ති) සතුටුවෙයි.

**නන්දන.** න - සන්තොසය, ශක්‍රයාගේ උයන.

**නන්දා.** ඉ-ශක්‍රයාගේ පොකුණ, එම දෙවඟන.

**නන්දියාවට්ට.** පු-කපුටු ගඳ.

**නන්දිමුඛිරත්ති.** ඉ-අලුයම් කාලයෙහි රාත්‍රිය.

**නනු.** අ - විරොධ ප්‍රකාශ, ප්‍රශන, අනුඥ, නැලවිල්ල, ආමන්ත්‍රනාදියෙහි.

**නන්ධ.** d තු-බන්ධනෙ, වැළඳගැන්මෙහි, නන්ධති, වැළඳගණී.

**නන්ධති.** ක්‍රි-(නන්ධ + ති) වැළඳගණී.

**නන්ධි.** න-බැඳීම.

**නපුංසක.** පු-පණ්ඩකයා, නපුංසකයා, ස්ත්‍රී පුරුෂ භාවයෙන් තොරවූ තැනැත්තා.

**නභ.** න-අහස.

**නභස.** න-අහස, අවකාශය.

**නභොසද.** පු-දෙවියා.

**නම.** d භූ-පහුත්තෙවසද්දෙච, නමස්කාරයෙහි හා ශබ්දයෙහි, නමති, නමස්කාර කෙරෙයි, ශබ්දකෙරෙයි.

**නමක්කාර.** පු-වන්දනාව, නමස්කාරය.

**නමතක.** න - සැත දවටන රෙදිකඩ, එළු ලොමින් කළ වස්ත්‍ර විශේෂයක්.

**නමස්ස.** d. භූ-වන්දනෙ, වැඳීමෙහි, නමස්සති, වඳියි.

**නමු**. d භූ-නමනෙ, නැමීමෙහි, නමති. නමයි.

**නමුචි**. පු-වසවර්තිමාරයා.

**නමුචිසූදන**. පු-ශක්‍රයා.

**නමති**. ක්‍රි-(නම + ති) නමස්කාර කරයි, නැමෙයි.

**නමන**. න-නැමීම.

**නමස්සති**. ක්‍රි-(d. භූ. නම, පහුනෙන, ගෞරව කිරීමෙහි + ස්සති) (නමස්ස + ති) නමස්කාර කෙරෙයි.

**නමස්සන**. න-නමස්කාරය, වැඳීම.

**නමස්සිය**. ක්‍රි-නමස්කාර කොට.

**නමිත**. පු-නමස්කාර කළ, නැමුනු.

**නමො**. අ-ප්‍රණාමයෙහි, නමස්කාරයෙහි.

**නම්මදා**. ඉ-එනම් ගඟ.

**නය්හන**. න-ගැට ගැසීම, බැඳීම, බැඳුම.

**නය්හති**. ක්‍රි-(d. දි. නහ-බන්ධනෙ, බැඳීමෙහි + ති) බඳියි.

**නය**. d. භූ-ගතියං, ගමනෙහි නයති, යෙයි, පමුණුවයි.

**නය**. පු-යුක්තිය, ක්‍රමය.

**නයන** න-ඇස, නෙත්‍රය.

**නයනාමය**. පු-නෙත්‍රරෝගය.

**නයනායුධ**. න-යම රජුගේ ආයුධය, යම රජුගේ ඇස.

**නය සහස්ස**. න-ක්‍රම දහස.

**නයුත**. න-දස දහස, නහුතය.

**නර**. d. භූ-පාපුණනෙ, පැමිණීමෙහි නරති, පැමිණෙයි.

**නර**. පු-මිනුෂ්‍යයා.

**නරක**. න-නරකය, නිරය.

**නරක භෙද**. පු-නරක විශෙෂ.

**නරදෙව**. පු-රජ, දිව්‍ය පුත්‍ර.

**නරනාරී**. ඉ-පුරුෂ, ස්ත්‍රී.

**නරමර**. පු-මිනුෂ්‍ය, දෙව.

**නරවර**. පු-නරෝත්තමයාං, බුදුරජ.

**නරවාහන**. පු-වෛශ්‍රවණ වරම් රජ.

**නරසාරථි** පු-බුදුරජ.

**නරසීහ**. පු-බුදුරජ.

**නරාධිප**. පු-රජ.

**නරාසභ**. පු-නරශ්‍රෙෂ්ඨයා, බුදුරජ.

**නල**. න-බට, කුලල්බට.

**නලග්ගි** පු-තණ-බට ආදියෙන් ඇතිවන ගින්න.

**නලකාර**. පු-කුළුපොත්තා.

**නලමීන**. පු-මත්ස්‍යයා.

**නලින**. න-පද්මය, පියුම.

**නලිනී**. ඉ-පියුම් විල.

**නලද**. පු-බබුස්තණ.

**නව**. ති අභිනව, අලුත්, නවය.

**නවක**. පු-නවකයා, අභිනවයා, අලුත පැමිණි තැනැත්තා.

**නවඞ්ග සත්ථුසාසන**. න-සූත්‍රය, ගෙය්‍යය, වෙය්‍යාකරණය, ගාථාය, උදානය, ඉතිවුත්තකය, ජාතකය, අබ්භූත ධම්මය, වෙදල්ලය අඞ්ග නවයෙන් යුත් ශාස්තෘ සාසනය.

**නවනාට්‍යරස**. පු-නාට්‍ය රස නවය.

**නවනීත**. න-වෙඬරු.

**නවපසූතිකා** ඉ-අළුත වැදූ තැනැත්තිය.

**නවම**. න-නවවැනි.

**නවමල්ලිකා**. ඉ-සත්පෙති, දෑසමන්.

**නවුත**. න-දසදහස, 10,000, නවුතය.

**නවුති**. න-දසදහස.

**නවුඩට**. න-අලුත කැගූ තෙල, නොහොත්, වෙඬරු.

**නවානුපුබ්බ විහාර**. න-නවානුපූර්ව විහාරයන්.

**නවුබ්භින්න**. න-අළුත පහලවූ දලුව, අඞ්කුරය.

**නවොරොපිත**. ති-අළුත බාන ලද, අලුත කපන ලද.

**නස**. d. භූ-කොටිල්ලෙ, කුටිල බැව්හි, නසති, වක්ව යෙයි.

**නස**. d. දි-අදස්සනෙ, නොදැක්මෙහි, විනාශයෙහි, නස්සති, නැසෙයි.

(13488)

**නස්සති**. ක්‍රි-(නස + ති) නැසෙයි.

**නස්සන**. න-විනාශය, අදර්ශනය.

**නස්සනක්ඛර**. පු-නසන සුළු අක්ෂර.

**නහ** d. දි-බන්ධනෙ, බැඳීමෙහි, නය්හති, බඳී-සන්නාය්හති.

**නහ** d. දි-සොචෙය්‍ය, පවිත්‍ර බැව්හි, නහායති, පවිත්‍ර කෙරෙයි, ස්නානය කරයි.

**නහාත**. න-ස්නානය කළ, සුද්ධ කළ.

**නහාතක**. පු-කෙලෙසුන් නැසූ අය.

**නහාති**. ක්‍රි-(නහ + ති d. භූ. නහන, නැමෙහි) ස්නානය කරයි.

**නහාන**. න-ස්නානය.

**නහානිය**. නැමට යොග්‍ය දේ.

**නහාපක**. පු-කරනැවැමියා, කපපකයා.

**නහාපන**. න-නැවීම, ස්නානය කරවීම.

**නහාපික**. පු-කරනැවැමියා.

**නහාපිත** පු-කරනැවැමියා.

**නහාපෙති**. ක්‍රි-(d. භූ. නහ, නහනෙ, නැමෙහි + ණෙ + ති) (නහ - ණාපෙ - ති) නාවයි.

**නහාරු**. න-නහර.

**නහි**. අ-ප්‍රතිෂෙධයෙහි.

**නහුත**. න-දසදහස, කොටිප්‍රකොටි සියක් ලක්ෂය, 10000000000000000000000000000.

**නළ**. d. චූ-සස්සනෙ, වැටීමෙහි, නළෙති, වැටෙයි.

**නළ**. පු-කුලල් බට.

**නළාගාර**. පු-බටකොළ සෙවිලි කළ ගෙය.

**නළාටික**. න-තමන්ගේ නලලෙහි ඇඟිල්ල තබා නටන්නියගේ නලලෙහි ඇඟිලි තැබීම.

## නා

**නාග**. පු-සර්ප, හස්ති, නාග වෘක්ෂ, ශ්‍රෙෂ්ඨ, බුදුරජ, සිරියල්.

**නාගදන්ත**. න-බිත්තිකොකු.

**නාගනාථ**. පු-ශක්‍රයා

**නාගර**. න-වියලි, ඉඟුරු.

**නාගබලා**. ඉ-ගස් කැළිය.

**නාගමාලිකා**. ඉ-නාගවෘක්ෂ.

**නාගරාජ**. පු-නාරජ, අනන්ත නාරජ.

**නාගමානවිකා**. ඉ-මනුෂ්‍යස්ත්‍රී ස්වරූපයෙන් සිටින නාගධෙනුව, නා මෙනෙවිය.

**නාගලතා**. ඉ-බුලත්.

**නාගලොක**. පු-නා ලොව, නාග භවනය, නාගාවාසය.

**නාගාධිප**. පු-නාගාධිපතියා, විරූපාක්ෂ වරම් රජ.

**නාගසම්භව**. පු-සින්දූරම්.

**නාගාපලොක**. න-හස්ති බැල්ම, ඇතාට පසු භාගය බැලීමේදී බෙල්ල හරවා බැලිය නොහැකිය. ශරීරයම හරවා බැලිය යුතු වේ. බුදුවරයෝ පසුභාගය බලන කල්හි ග්‍රීවය නොකරකවා ඒ දිසාව හැරී බලති.

**නාගබොධි**. ඉ-තිටිඟ.

**නාටක**. පු-නටන්නා, නෘත්‍ය කරන්නා.

**නාට්‍ය**. න-නැටුම්, වැයුම්, ගී කීම්, යන තුන.

**නාථ**. d භූ-යාචනෙ, ආසිංසනෙ, උපතාපෙ, ඉස්සරියෙච, ඉල්වීමෙහි.

**නාථ**. d. භූ-වාචනෙ, ආසිංසනෙ, උතාකෙ, ඉස්සරියෙච, ඉල්වීම - තැවීම, ඉසුරු බව පැතීම යන මෙහි නාථති, ඉල්වයි.

**නාථ**. පු-බුදුරජ, නාථ දෙවිරජ, අධිපතියා.

**නාථපුත්ත**. පු-නිගණ්ඨනාථ පුත්‍රයා.

**නාද**. පු-නාද, හඬ.

**නාදී**. ඉ-මහහඬ, ගෙන පුපුරණ හඬ.

**නානත්ත කථා**. ඉ-කට කතා.

**නානත්ත**. න-නානත්වය, නොයෙක් ආකාර ඇති බව.

**නානත්තතා**. ඉ-නොයෙක් ආකාර ඇති ස්වභාවය.

**නානත්තසඤ්ඤී**. පු-නොයෙක් අදහස් ඇත්තා.

**නානත්ත**. ඉ-වෙනස.

**නානාසංවාස**. න-වෙන වෙනම ජීවත්වීම.

**නා නා**. අ-නෙකාර්‍ථ, වර්ජිත යන මෙහි.

(13539)

**නානාරූප**. න-නානාප්‍රකාර දෙය, නා නා සවභාව.

**නාභි** ඉ-නැබ, පෙකනිය, රථනාභිය, බොස් ගෙඩිය.

**නාම** න-නම, අරූප ධර්මය, චතුර්විධ අරූපී යාමය.

**නාමක**. ති-තේරුමක් නැති කථා, නිකම් කථා පමණක්.

**නාමගොත්ත**. න-නාමය සහ ගොත්‍රය.

**නාමධෙය්‍ය**. න-නම.

**නාමරූප**. න-නාමය හා රූපය.

**නාමෙති**. ක්‍රි-(d භූ. නම, නමනෙ, නැමීමෙහි + ණෙ + ති) නැමෙයි.

**නායක**. පු-බුදුරජ, අධිපතියා, ඉසුරු ඇත්තා, ප්‍රධානයා.

**නාමරූප කථා**. ඉ-නාමය හා රූපය පිළිබඳ කථා, අභිධර්ම පිටකය.

**නාරක**. පු-නිරයෙහි දුක්විඳින්නා.

**නාරාච**. න-යකඩ පොල්ලක්, යකඩ ඉන්න.

**නාරඞ්ග**. පු-නාරංගස.

**නාරායන**. පු-විෂ්ණු.

**නාරිපුප්ඵ**. න-ස්ත්‍රීන්ගේ ඔසප්, ස්ත්‍රීන් මල්වරවීම.

**නාරී**. ඉ-ස්ත්‍රී, කාන්තාව.

**නාලං**. අ-නුසුදුසු, නොසෑහෙන.

**නාල**. න-පියුම් දණ්ඩ, සිදුර, බට.

**නාලි**. ඉ-නැලිය, නළ.

**නාලිගබ්භ**. පු-පලලට වඩා දිගුණ තිගුණ දිග ඇති කාමරය.

**නාලිකා**. ඉ-ට්‍යුබය.

**නාරිකෙර**. පු-පොල්.

**නාළිකෙරික**. ති-පොල්වලට අයත්.

**නාලින්ධම**. පු-සවර්ණකාරයා, රන්කරුවා.

**නාලිපට්ට**. පු-හිස් වැසුම, තොප්පිය

**නාවා**. ඉ-පසුර, නැව.

**නාවායික**. පු-නැවට අයිති නැනැත්තා. නැවියා.

**නාවික**. පු-නැවියා, නැවෙන් හැසිරෙන්නා.

**නාවුත්තික**. පු-අනුවකින් යුත්.

**නාස**. පු-මරණය, නැසීම, ආදර්ශනය.

**නාසන**. න-මැරීම, වධය.

**නාසා**. ඉ-නාසිකාව, නැහැය.

**නාසෙති**. ක්‍රි. d. චු-නස, අදස්සනෙ, විනාශයෙහි, (නෙ + නය + ති) නාසෙති, නසයි.

**නාසිකා**. ඉ-නාසිකාව, නාසිකාව, නැහැය.

**නාසිකාරොග**. පු-නාසිකාරෝගය, පීනසය

**නාසිතක**. ති-බැහැරකළ, අස්කළ,

**නාසු**. d. භූ-සද්දෙ, ශබ්දයෙහි, නාසති, ශබ්ද කරයි.

**නාහ**. න-සන්නාහය, යුද්ධසැට්ටය, ලොහ තහඩුව.

**නාළි**. ඉ-පයිප්පය, පියුම් දණ්ඩ.

## නි

**නි**. අ-නිශ්ශෙෂ, අභාව, සන්නිවෙස, අතිස යාර්ථ, මොක්ෂ, රාසි, ගෘහ, නියොග, උපමා, හිතාර්ථ, ප්‍රසාද, නිග්‍රහ, අතික්‍රම, දර්ශන, අවසාන, නිකාන්ත, අධොභාව, අවධාරණ, සාමිප්‍ය, බන්ධන, දක්ෂත්ව, අනන්තභාව, උපරම, ප්‍රාදුර්භාව, විරහ, ප්‍රතිෂෙධ යනාදියෙහි.

**නි**. d. භූ-පාපුණෙ, පැමිණීමෙහි, නෙති, පමුණුවයි.

**නික්ඛ**. d. භූ-පරිමාණෙ, මැණීමෙහි, නිනික්ඛති, මණියි.

**නිකච්ච**. ඉ-වංචාව, රැවටීම.

**නිකට්ඨ**. ති-පහත් කළ, නීච කළ,

**නිකට**. ති-සමීපය, ළඟ.

**නිකත**. ති-කපටියා, කෛරාටිකයා.

**නිකති**. ඉ-ශඨබව, සමාන හොරබඩුවකින් හොඳ බඩුවක් රවටවා ගැනීම.

**නික්ඛ**. d. භූ-චුම්බනෙ, සිඹීමෙහි, නික්ඛති, සිඹියි.

**නිකන්ත.** ති-කැපූ, කපනලද.

**නිකන්ති.** ඉ-තෘෂ්ණාව, තණ්හාව.

**නිකන්තති.** ක්‍රි. d. භූ-කති, ඡේදනෙ, කැපීමෙහි, නි+කති+ති) කපයි, සිඳියි.

**නිකර.** පු-සමූහය, රැස.

**නිකරණා.** ඉ-රැවටීම, වංචාව, මායාව.

**නිකස.** පු-උරගල, කරගල.

**නිකාම.** න-කැමතිසේ, සිත්සේ.

**නිකාමතා.** ඉ-කැමතිබව.

**නිකාමෙති.** ක්‍රි. d. භූ-කමු, ඉච්ඡායං, කැමැති වීමෙහි (නි+කං+ණෙ+ති) කැමතිවෙයි.

**නිකාය.** න-කොටස, පඞ්ක්තිය, සමූහය, නිසය.

**නිකාය.** පු-සමාන ආචාර ඇත්තන්ගේ සමූහය, ගෘහය, දීඝමධ්‍යමාදි සඟි, දිව්‍යනිකාය ප්‍රෙතනිකායාදී ජාති.

**නිකාර.** න-සේවය, මෙහෙය,

**නිකාස.** න-පෙණුම, දැක්ම.

**නිකිණ්ණ.** ති-විසුරුණු, සැඟවුනු, ආරක්ෂා කළ.

**නිකිඨ.** ති-නිකෘෂ්ට, ලාමක, පහත්.

**නිකූජති.** ක්‍රි-(d. භූ-කූජ, කූජනෙ, ශබ්ද කිරීමෙහි, නි+කූජ+ති) කෑගසයි.

**නිකූජිත.** ති-හඬනැගූ, කෑගැසූ.

**නිකුඤ්ජ.** පු-ලතාදියෙන් වැසුණු ලෙන.

**නිකූට.** න-කොණ, කෙළවර, මුදුන, මස්තකය.

**නිකේත.** න-ගෙය, වාසස්ථානය.

**නිකේතන.** න-ගෙය, වාසස්ථානය.

**නික්කම.** පු-නිෂ්ක්‍රමණය, වීර්‍ය්‍යය.

**නික්ක.** d. චු-පමාණෙ, ප්‍රමාණයෙහි, නික්කෙති, නික්කයති, ප්‍රමාණ කෙරෙයි.

**නික්කේසසීස.** පු-කෙස්නැති හිස් ඇත්තා

**නික්කඩ්ඪති.** ක්‍රි-(d. භූ-කඩ්ඪ, ආකඩ්ඪනෙ, ඇදීමෙහි, නි+කඩ්ඪ+ති) අදියි.

**නික්කඩ්ඪන.** න-කැඩීම, සිඳීම, ඇදීම.

**නික්කඩ්ඪිත.** පු-බැහැරකළ, ඉවත්කළ.

**නික්කණ්ටක.** පු-කටු නැති, උපද්‍රව නැති.

**නික්කාමධාතු.** ඉ-කුසීතභාවයෙන් ඉවත්වීමේ වීර්‍ය්‍යය.

**නික්කරුණා.** ඉ-කරුණාරහිත.

**නික්කසාව.** පු-කසට රහිත.

**නික්කිලෙස.** පු-කෙලෙස් රහිත, කෙලෙස් නැති.

**නික්කුජ්ජන.** න-යටිමුව කරන, මුනින් නමන.

**නික්කුජ්ජිත.** පු-යටිමුවකළ, මුනින් නැමූ

**නික්කුහ.** පු-කුහක නොවන.

**නික්කොධ.** පු-ක්‍රොධ රහිත.

**නික්කොසජ්ජ.** පු-නොමැලි, අලස නොවන.

**නික්ඛ.** d. භූ-චුම්බනෙ, සිඹීමෙහි නික්ඛති, සිඹී.

**නික්ඛ.** පු. න-රත්‍රං, පස්විසි කළඳ, පළඳනාව.

**නික්ඛමති.** ක්‍රි-(d. භූ-කමු, පදවික්ඛෙපෙ, පයින් ගමන්හි, නි+කමු+ති) බැහැර යෙයි.

**නික්ඛමන.** න-නික්මීම, බැහැරයාම.

**නික්ඛම.** අ-නික්මීම, බැහැරයාම.

**නික්ඛමනීය.** ති-නික්ම යායුතු.

**නික්ඛන්ත.** ති-නික්මුණු.

**නික්ඛය.** ති-විනාශ කළ හැකි, විනාශ විය හැකි.

**නික්ඛික.** පු-රත්බලන්නා, ස්වර්ණ පරීක්ෂකයා.

**නික්ඛිත්ත.** පු-බැහැරකළ, ඉවත්කළ, බහාතබනලද.

**නික්ඛිපන.** න-බහාතැබීම, ඉවත තැබීම.

**නික්ඛිපති.** ක්‍රි. d. භූ (ඛිප, ඛිපනෙ, තැබීමෙහි, නි+ඛිප+ති) තබයි.

**නික්ඛෙප.** පු-නික්ෂෙප, තැබීම, බහාතැබීම

**නික්ඛෙපන.** න-නික්ෂෙපනය, බහාතබන.

**නිඛනති.** ක්‍රි d. භූ-(ඛන, ඛනනෙ, කැනීමෙහි නි+ඛන+ති) කනියි, සාරයි.

**නිඛාත.** පු-සාරනලද, ඛනිනලද.

**නිඛාදන.** න-සාරාදූමීම, තියත.

**නිඛිල**. ත-සියලු, සකල.

**නිග්ගච්ඡති**. ක්‍රි. d. භූ-(ගමු, ගතියං, යැමෙහි, නි + ගමු + ච්ඡ + ති)බැහැර යයි.

**නිග්ගණ්හති**. ක්‍රි. d. චු - (ගහ, උපාදනෙ, නි + ගහ + ති) නිග්‍රහකරයි.

**නිග්ගහණ**. ත-නිග්‍රහකිරීම.

**නිග්ගහා**. පු-නිග්‍රහය, නිඥුව.

**නිග්ගම**. පු-බැහැරයාම

**නිග්ගමන**. න-බැහැරයාම ඉවතයාම.

**නිග්ගය්හවාදී**. පු-නිග්‍රහකොට කියන්නා.

**නිග්ගය්හති**. ක්‍රි. d. භූ - (ගහ, උපාදනෙ, ගැනීමෙහි, නි + ගහ + ති) නිග්‍රහකරයි

**නිග්ගහීත**. පු - අනුස්වාරය, නිස්ශෙෂයෙන් ගත්නාලද.

**නිග්ගාථා**. ඉ-ගාථානැති, ගාථාවිරහිත.

**නිග්ගාථක**. පු-ගාථාවිරහිත.

**නිග්ගාහක**. පු - නිග්‍රහ කරන්නා, නිගා කරන්නා.

**නිග්ගිලති**. ක්‍රි. d. භූ-(ගිල, අදනෙ, කෑමෙහි, නි + ගිල + ති) ගිලියි.

**නිග්ගුණ**. පු-ගුණනැති.

**නිග්ගුණ්ඩී**. ඉ - නිකගස, බෝලිඳ, නීල, සෙථාලිකා.

**නිග්‍රොධ**. පු-නුගරුක, ව්‍යාමය, බඹය.

**නිග්ඝනිත**. ති - බැහැර කළ, අවවාද කළ, නැවැත්වූ.

**නිඝොසා**. පු-හඬ, මහානාදය.

**නිඝණ්ඩු**. පු-සත්වවෘක්‍ෂාදීන්ගේ නම් ප්‍රකාශ කරණ එනම් කොෂ ග්‍රන්ථය.

**නිඝංසති**. ක්‍රි. d. භූ-ඝසි, ඝංසනෙ, ගැටීමෙහි, නි + ඝංස + ති ගැටෙයි, එකට හැපෙයි.

**නිඝංසන**. ත-ගැටීම, ඝර්ෂණය.

**නිඝංසිත**. පු-ඝට්ටනයකළ, ගැටූ.

**නිඞ්ක**. පු-මෘග විශෙෂයක්.

**නිචය**. පු-රැස්කිරීම, රාසිකරණය.

**නිචිත**. පු-රැස්කරණ ලද.

**නිච්ච**. ති-නිත්‍යය, නොනස්නා ලද්ද.

**නිච්චතා**. ඉ-නිත්‍යබව, නිත්‍යභාවය.

**නිච්චම්ම**. ත-සමනැති, සම්රහිත.

**නිච්චල**. පු-නිශ්චල, අචල, නොසෙල්වන.

**නිච්චිත්තක**. පු-සිත්නැත්තා.

**නිච්චොල**. න, වස්ත්‍රරහිත, පිළිනැති.

**නිච්ඡන්ද**. පු-ඡන්දයරහිත, කැමතිනැති.

**නිච්ඡරණ**. න-පැතිරවීම.

**නිච්ඡරති**. ක්‍රි. d. භූ-(චර චරනෙ, හැසිරීමෙහි, නි + චර + ති) හැසිරෙයි.

**නිච්ඡය**. පු-නිශ්චය, අධිමොක්‍ෂය.

**නිච්ඡාත**. පු-තෘෂ්ණාරහිත, ආසා රහිත.

**නිච්ඡාදෙති**. ක්‍රි d. චු, ඡද, සංවරණෙ, වැසීමෙහි, නි + ඡද + ණ + ති වසාවයි.

**නිච්ඡාරෙති**. ක්‍රි. d. භූ (චර, චරණෙ, හැසිරීමෙහි, නි + චර + ණෙ + ති) හසුරුවයි.

**නිච්ඡිත**. පු-නිශ්චිතාර්ථයෙහි, නිශ්චය කළ. පැහැර කෙරෙත්.

**නිච්ඡුභති**. ක්‍රි. d. භූ - (ඡුභ, නිච්ඡුභනෙ, විසිකිරීමෙහි + ති) විසිකරයි.

**නිජ්ජර**. පු-ජරානැත්තා, දෙවියා.

**නිජ්ජට**. ති - අවුල්වලින් මිදු, ගැටවලින් මිදු,

**නිජ්ජරෙති**. ක්‍රි. d. භූ-(ජර, හානෙ, දිරීමෙහි, නි + ජර + ණ + ති) විනාශ කරයි.

**නිජ්ජීනන**. පු-දිරීමට පැමිණි.

**නිජ්ජුව්හ**. පු-දිවනැත්තා, වලිකුකුලා, කිඹුලා, මැඩියා.

**නිජ්ඣර**. පු-දියඇල්ල, පර්වතයෙන් ගලා බසින දියපාර.

**නිජ්ඣාන**. ත-බැලීම.

**නිජ්ඣාපන**. න-දැවීම.

**නිජ්ඣාපෙති**. ක්‍රි d. චු ඣප, දහෙ, දැවීමෙහි. දවයි.

**නිජ්ඣාම**. න-විශෙෂයෙන් දන ලද.

**නිජ්ඣාමතණ්හික**. පු-එනම් අසුරනිකාය.

**නිජ්ඣායති**. ක්‍රි. d. භූ - (ඣෙ, චින්තායං, සිතීමෙහි + ණ + ති) සිතා බලයි.

**නිජ්ඣායන.** න-බැලීම.

**නිට්ඨා.** ඉ-සිඩිය, අවසානය, විනාසය.

**නිට්ඨාති.** ක්‍රි - (d. දි, ඨා, ගතිනිවත්තියං, නැවතීමෙහි + ති) නවතියි.

**නිට්ඨාන.** න-අවසානය, සමාප්තිය.

**නිට්ඨාපෙති.** ක්‍රි. (d. දි. ඨා. ගතිනිවත්තනෙ, ගමන් නැවැත්වෙහි + ණ + ති) නවත්වයි.

**නිට්ඨිත.** පු-අවසන්කළ, නිමවන ලද.

**නිට්ඨුභති.** ක්‍රි - (d. භූ. ඨුභ, නිට්ඨුභනෙ, කෙළගැසීමෙහි + ති) කෙළගසයි.

**නිට්ඨුභන.** න-කෑරීම, කෙළගැසීම,

**නිට්ඨුර.** න-කර්කශ දෙය.

**නිට්ඨුරවචන** න-කර්කශ වචන, රළු වචන

**නිට්ඨුරිය.** න-සැඩපරුෂකම, තදගතිය,

**නිඩ්ඩහන.** න-තණඉදිරවීම.

**නිත්තණ්හ.** තෘෂ්ණා නැති, ආසා නැති.

**නිතම්බ.** පු-උකුල, පර්වත පර්සවය

**නිත්තල.** න-වටදෙය.

**නිත්ථනන.** න-තැත්කිරීම, උත්සාහකිරීම.

**නිත්ථරණ.** න-එතෙරවීම, තරණය කිරීම.

**නිත්ථරති.** ක්‍රි. d. භූ. තර, තරණය, කිරීමෙහි + ති) එතර කරයි,

**නිත්ථාර.** න-ගැලවීම, තරණය කිරීම,

**නිද්දය.** පු-කරුණා රහිතයා,

**නිදස්සති.** ක්‍රි-d භූ. දිස, පෙක්ඛණෙ, බැලීමෙහි නි + දිස + ති) නිදර්ශන වශයෙන් පෙන්වයි.

**නිදස්සන.** න-නිදර්ශනය, උදාහරණය.

**නිදස්සිත.** පු-උදාහරණකළ, සාධක කළ

**නිදසන.** න-උදාහරණ දැක්වීම.

**නිදහති.** ක්‍රි. d. දි. දහ, භස්මීකරණෙ, හළුකිරීමෙහි + ති) තැත්පත්කරයි

**නිදහන.** න-නිධහනය, නිධහන්කිරීම.

**නිද්දා.** ඉ. නිද්‍රාව, නිදීම.

**නිද්දාල** පු නිද්‍රා බහුලයා.

**නිද්දායන.** න-නිදීම.

**නිද්දාසීල.** න-නිද්‍රාබහුලයා.

**නිද්දිට්ඨ.** පු-දක්වනලද, පෙන්නුම් කළ.

**නිද්දිසති.** ක්‍රි-(d. භූ. දිස, පෙක්ඛණෙ, දැකීමෙහි + ති) දක්වයි.

**නිද්දෙස.** පු-නිදේසය. දැක්වීම, මාතෘකාපද විස්තරකර දැක්වීම.

**නිද්දොස.** පු-නිදෙස්, දෙස්රහිත, වැරදිරහිත.

**නිද්ධන.** න-ධනරහිත, වස්තුව නැති.

**නිද්ධන්ත** පු-පිරිසිදුකළ.

**නිද්ධනති.** ක්‍රි - (d. ධන, ධඤ්ඤෙව, ධන රැස් කිරීමෙහි + ති) දුප්පත් වෙයි, ධනරහිත වෙයි.

**නිද්ධමන.** න-ධනරහිතයා, දිළින්දා.

**නිද්ධරණ.** න-එගොඩවීම, එතෙරවීම.

**නිද්ධුනාති.** ක්‍රි-(d ධූ. කම්පනෙ, සැලීමෙහි, නි + ධූ + ති) සැලෙයි,

**නිද්ධොත.** පු-සෝදන ලද, සේදූ.

**නිද්ධොපිත.** ති-සෝදනලද.

**නිද්ධොවන.** න-සේදීම.

**නිධන.** පු. න-මරණය, ධනරහිතයා.

**නිධාන.** න - නිධානය, ධනය නිධන් කරවා තැබීම.

**නිධානග** පු. නිධානගත,

**නිධානවන්තු.** පු-නිධාන ඇත්තා.

**නිධාපෙති.** ක්‍රි -(d භූ. ධා. ධාරණෙ, දැරීමෙහි ණපෙ + ති) නිදන් කරවයි.

**නිධාය.** අ. හැර.

**නිධි.** ඉ. නිධානය.

**නිනද.** පු-හඬ, ශබ්දය.

**නිනාද.** පු. හඬ.

**නින්ද.** d. භූ. ගරහෙ, ගැරහීමෙහි.

**නින්දති.** ක්‍රි-(d භූ. නින්ද, ගරහායං, ගැරහීමෙහි + ති) ගරහයි.

**නින්දා.** ඉ-ගරහැව, දෝෂාරෝපනය.

**නින්දිත.** ති-ගර්හිත; නින්දාකළ.

**නින්දිය.** පු. නින්දාකටයුතු, ගැරහිය යුතු.

**නින්න.** න-ගැඹුරු, පහත්බිම.

(13752)

**නින්නගා.** ඉ-නදිය, ගංගාව, කුඩාගඟ.

**නින්නහුත.** න-නහුත සියක්ලක්ෂය, නහුත බලනු.

**නින්නාද.** පු-මහත්නාදය, එනම් සවරයෙහි අඞ්ගය. සවරයෙහි එනම් අංගය.

**නින්නාදී.** පු-මහත්කොට ශබ්ද කරන්නා.

**නින්නාමෙති.** ක්‍රි-(d. භූ. නම, නමනෙ, නැමී මෙහි + ණෙ + ති) නැමෙයි.

**නින්නෙජක.** පු-රදවා, රජකයා.

**නින්නෙති.** ක්‍රි-(d. භූ. නී. නයෙ, ඇමෙහි, + ණෙ + ති) නැමෙයි.

**නින්නාත** ති-නාතලද සෝදනලද.

**නිපක.** පු-දක්ෂ, නිපුන, පණ්ඩිත.

**නිපක්ක.** ති-තැම්බූ, උයනලද.

**නිපච්චාකාර.** න-කීකරුකම, මෙහෙය, නිහත මානී භාවය.

**නිපජ්ජන.** න-නිදීම, හොවීම, සැතපීම.

**නිපට.** පු-සැදූරීම, උද්ග්‍රහණය.

**නිපතති.** ක්‍රි-(d භූ. පත, පතනෙ, වැටීමෙහි, + ති) වැටෙයි.

**නිපතන.** න-වැටීම.

**නිපන්න.** පු-සැතපුනු, නිදාගත්.

**නිපාඨ.** පු-හැදූරීම, උගෙනීම.

**නිපාත.** පු-හීම, වැටීම, අව්‍ය, නිපාතය.

**නිපාතක.** ති-කොටස්වලට බෙදූ, නිපාතකළ, පරිච්ඡේදකළ.

**නිපාතන.** න-වැටීම, හීම.

**නිපාතෙති.** ක්‍රි-(d. භූ-පත, පතනෙ, වැටී මෙහි, නි + පාත + ණෙ + ති) වැටෙයි.

**නිපාන.** න-ළිඳ සමීපයෙහි ගෙරි පැන්බොන වල.

**නිපුන.** න-දක්ෂ, නිවන, ව්‍යසන.

**නිප්පක්ක.** ති-කකියවන ලද දෙය.

**නිප්පච්චති.** ක්‍රි-(d. භූ. පච, පචනෙ, පැසී මෙහි + නි + පච + ති) පැසෙයි.

**නිප්පඤ්ඤ.** පු-ප්‍රඥනැත්තා, ප්‍රඥනැති.

**නිප්පන්න.** පු-නිපන්, උපන්.

**නිප්පත්ති.** ඉ-නිෂ්පත්තිය, හටගැන්ම.

**නිප්පදෙස.** න-වෙනම.

**නිප්පපඤ්ච.** පු-ප්‍රමාදරහිත.

**නිප්පභා.** ඉ-ප්‍රභාරහිත, දීප්තිනැති.

**නිප්පලිබොධ.** පු-පලිබෝධ රහිත, හිරිහැර නැති.

**නිප්පාදන.** න-නිෂ්පාදනය, හටගැනීම.

**නිප්පාදෙති.** ක්‍රි. d. භූ-පද, ගතියං, යැමෙහි, (නි + පද + ණෙ + ති) නිපදවයි.

**නිප්පාප.** පු-පවු රහිත, පවු නැති.

**නිප්පාව.** පු-ධාන්‍ය පවිත්‍රය, ධාන්‍ය තැබීම.

**නිප්පීලන.** න-ක්‍රීඩාකිරීම, පොඩිකිරීම.

**නිප්පීතික.** පු-ප්‍රීතිරහිත.

**නිජ්පීලිත.** පු-ක්‍රීඩාකරණ ලද, අතුල්ලන ලද.

**නිජ්පීළෙති.** ක්‍රි-(d. භූ පීල, පටිත්ථමෙහ, ක්‍රියා නිරොධයෙහි, නි + පීල + ණෙ + ති) පෙලයි.

**නිප්පෙසික.** පු-අනුන්ගේ ගුණ ලාභාදිය නසා කියන්නා.

**නිප්පෙසිකතා.** ඉ-ගුණ මකු බව.

**නිප්ඵත්ති.** ඉ-සිද්ධිය, උප්පත්තිය.

**නිප්ඵාදන** න-නිස්පාදනය සෑදීම.

**නිප්ඵල.** න-නිස්ඵල, නිරර්ථක.

**නිප්ඵාදක.** උපදවන්නා, සාදවන්නා.

**නිප්ඵාදිත.** පු-සාදනලද, සම්පාදනය කළ.

**නිප්ඵොටන.** න-ඇපිල්ලීම, ඉලීම.

**නිප්ඵොටෙති.** ක්‍රි-(d. භූ-ඵුට, විකසනෙ, විකසනයෙහි, නි + ඵුට + ණෙ + ති) පොලයි.

**නිප්ඵොඩිත.** අපුල්ලන ලද, මදිනලද.

**නිබ්බත්ත.** ති-නිපන්, උපන්, හටගත්.

**නිබ්බත්තන.** න-ඉපදීම, හටගැනීම.

**නිබ්බන.** න-නිකලෙස්, වෘණරහිත.

**නිබ්බත්තති.** ක්‍රි. (d. භූ-වතු, වත්තනෙ, පැවැත්මෙහි, නි + වතු + ති) උපදියි.

**නිබ්බත්ති.** ඉ-උප්පත්තිය, හටගැනීම.

**නිබ්බත්තික.** න-උපදවන ලද සාදන ලද.

**නිබ්බත්තෙති.** ක්‍රි-(d. භූ-වතු, වත්තනෙ, පැවැත්මෙහි, නි + වතු + ණෙ + ති) පවත්වයි.

**නිබ්බන.** ති-කැලෑ නැති, වන විරහිත.

**නිබ්බනථ.** ති-ආශාවෙන් වෙන්වූ, තණ්හා නැති.

**නිබ්බහති.** ක්‍රි-(d. භූ. වහ, පාපුණනෙ, පැමිණ වීමෙහි, නි + වහ + ති) අදියි, උසුලයි.

**නිබ්බාණ.** න-නිවීම, නිර්වාණය.

**නිබ්බාත.** න-නිකෙලෙස්, වාණ රහිත.

**නිබ්බාන.** න-නිවීම.

**නිබ්බාපිත.** පු-නිවනලද.

**නිබ්බාපෙති.** ක්‍රි-(d. භූ. වහ, පාපුණනෙ, පැමිණවීමෙහි, නි + වහ + ණාපෙ + ති) පමුණුවයි, නිවයි.

**නිබ්බිකාර.** පු-විකාර රහිත.

**නිබ්බිජ්ඣන.** න-කලකිරීම.

**නිබ්බිදරච්ඡා.** ඉ-විනිවිද නොගිය වීථිය.

**නිබ්බිතිකිච්ඡා.** ඉ-විචිකිච්ඡා රහිත, විචිකිච්ඡා නැති.

**නිබ්බිදන.** න-කලකිරීම

**නිබ්බිදානුපස්සී.** පු කලකිරීම අනුව බලන සුළුවූයේ.

**නිබ්බින්නක.** පු-කලකිරුණු.

**නිබ්බින්දති.** ක්‍රි-(d. භූ. විද, ඤාණෙ, නුවණෙහි, නි + විද + ති) කලකිරෙයි.

**නිබ්බිඨා.** ඉ-විනිවිදගිය වීථිය.

**නිබ්බිරිය.** න-වීර්‍ය්‍ය රහිත, උත්සාහ නැති.

**නිබ්බිස.** ති-විෂ නැති

**නිබ්බිසය.** ති-ගෙයක් නැති, නෙරපන ලද.

**නිබ්බිසෙවන.** න-ශාන්ත, සුසීල.

**නිබ්බිසෙස** ති-විශෙෂ රහිත, වෙනස්නැති.

**නිබ්බුජ්ජති.** ක්‍රි-(d චු. බුජි, සද්දෙ. ශබ්දයෙහි, නි + වුජි + ති) ගිලෙයි.

**නිබ්බුත.** න-නිවන, නිවීගිය.

**නිබ්බුති** ඉ-සිත්සතුට, නිර්වාණය, නිවීම.

**නිබ්බුධ.** න-මල්ලව යුද්ධය, හේවා යුද්ධය.

**නිබ්බෙජනීය.** පු-උකටලී විය යුතු.

**නිබ්බෙඨන.** න-වෙලුහැරීම, පැටලුම් හැරීම.

**නිබ්බෙඨිත.** පු-වෙලන ලද, ඔතන ලද.

**නිබ්බෙඨෙති.** ක්‍රි-(d භූ. වෙඨ, වෙඨනෙ, වෙලීමෙහි + ණෙ + ති) වෙලයි.

**නිබ්බෙධ.** පු-නිර්වේදය, කලකිරීම.

**නිබ්බෙධක.** පු-කලකිරීම ඇති.

**නිබ්බෙධගාමී.** ඉ-නිර්වේදයට පමුණුවන, කලකිරීම ඇතිකරණ.

**නිබ්බෙධික.** පු-කලකිරීම ඇති.

**නිබ්බෙමතික.** පු-විමති රහිත, සැක නැති.

**නිබ්බෙස.** පු-වැටුප්, කුලීමිල.

**නිබ්‍යාපාරට්ඨිති.** ඉ-අව්‍යාපාරස්ථිතිය.

**නිබ්භර.** න-අතිශය දූඩි.

**නිබ්භය.** න-භයරහිත, බයනැති.

**නිබ්භුජති.** ක්‍රි-(d. භූ. භුජ, කොටිල්ලෙ, කුටිල බැව්හි-නි + භුජ + ති) නමයි, අඹරයි.

**නිබ්භොග.** පු-භොගරහිත, භොගනැති.

**නිභ.** පු-සදෘස, සමාන.

**නිභාති.** ක්‍රි-(d. භූ. භා, දිත්තියං, දීප්තියෙහි, නි + භා + ති) දිලිසෙයි.

**නිමන්තන.** න-නිමන්ත්‍රණය, පැවරීම, ආරාධනය.

**නිමන්තනික.** පු-ආරාධකයා.

**නිමන්තිත.** පු-නිමන්ත්‍රණය කළ, පැවරූ.

**නිමන්තෙති.** ක්‍රි-(d. චු. මන්ත, ගුත්තභාසනෙ, මන්ත්‍රණයෙහි + නි + මන්ත + ණෙ + ති) නිමන්ත්‍රණ කරයි.

**නිමිත්ත.** න-හේතුව, ස්ත්‍රී පුරුෂ නිමිති, චිහ්නය, සලකුණ, නිමිති ශාස්ත්‍රය.

**නිමිස.** න-ඇස්වැසීම, ඇසිපිය ගැසීම.

**නිමිසති.** ක්‍රි-(d භූ. මිස, සද්දෙ, ශබ්දයෙහි, නි + මිස + ති) ඇස්පිය ගසයි.

**නිමිලන.** න-ඇස් පිය හෙලීම.

**නිමුග්ග.** ති-ගැලුනු, ගිලුනු.

**නිමුජ්ජති.** ක්‍රි-(d. භූ. මුජ්ජ, ඔසීදනෙ, යටට ගිලීමෙහි, නි + මුජ්ජ + ති) ගිලෙයි.

**නිමුජ්ජන.** න-ගැලී, ගිලීම.

**නිමෙස.** පු-ඇසිපිය ගැසීම, ඇසිපිය හෙලීම.

**නිමොක්ඛ.** පු-නිමෝක්ෂය, කෙලෙසුන්ගෙන් මිදීම.

**නිම්බ.** පු-කොසඹගස.

**නිම්බතුරු.** පු-කොසඹරුක.

**නිම්මක්ඛික.** ති-මැස්සන් නැති.

**නිම්මජ්ජන.** න-කැලතීම, කැලැම්බීම.

**නිම්මථන.** න-මැඩීම, කැලඹීම.

**නිම්මථනදුරු.** න-ගිනිගාන දණ්ඩ.

**නිම්මද.** පු-මද රහිත.

**නිම්මදන.** න-යටත් කිරීම, පරාජය කිරීම.

**නිම්මල.** න-නිර්මල, මලරහිත, පිරිසිදු, නිමල

**නිම්මාතක.** පු-මව්නැති.

**නිම්මාන.** න-නිර්මාණය, සෑදීම, මැවීම.

**නිම්මානරති.** ඉ-එනම් දිව්‍ය ලෝකය.

**නිම්මිත** පු-නිර්මිත, සාදනලද, මවනලද

**නිම්මිනාති.** ක්‍රි-(d සවා, මි මානෙ, මිණීමෙහි, නි+මි+ති) මණීයි.

**නිම්මීලෙති.** ක්‍රි-(d චු මීල, නිමෙසනෙ, ඇස් පිය ගැසීමෙහි, නි+මිල+ණෙ+ති) ඇස් වසයි.

**නිම්මූල** න-මුල් රහිත

**නිම්මොක.** පු-සර්ප සැවය.

**නියක.** පු-ස්වකීය, තමාට අයත්.

**නියත.** න-ඒකාන්ත, නියමය.

**නියති.** ඉ-දෛවය.

**නියන්තු.** පු-රථාචාර්‍ය්‍යයා, රියදුරා.

**නියම.** පු-නිශ්චය, ප්‍රතිඥාව, ව්‍රතය.

**නියමෙති.** ක්‍රි-(d. භූ. යමු, උපරමෙ, ඇලීමෙහි, +ණ+ති) සවිකරයි.

**නියස්සකම්ම.** න-එනම් විනය කර්මය.

**නියාම.** පු-නියමය.

**නියාමතා.** ඉ-නියම බව,

**නියාමක.** පු-නියමුවා, රථපදවන්නා, නැව් පදවන්නා.

**නියුජ්ජති.** ක්‍රි-(d. භූ. යුජ, යොගෙ, යෙදීමෙහි +ති) සුදුසු වෙයි.

**නියුත්ත.** ති-යෙදුනු, යුක්ත.

**නියුත.** න-දසදහස, අයුත බලනු.

**නියුර.** පු-වලල්ල.

**නියොග.** පු-නියෝගය, නියමය.

**නියොජන.** න-නියෝගය, නියමය.

**නියොජෙති.** ක්‍රි-(d. භූ යුජ, යොගෙ, යෙදීමෙහි+නි+යුජ+ණෙ+ති) යොදවයි.

**නිරග්ගල.** න-නිරවුල් දෙය.

**නිරග්ගල.** පු-එනම් මහා යාගය.

**නිරජ්ජති.** ක්‍රි-(d භූ. රජී, විජඹනෙ, විදීමෙහි, නි+රජ+ති) පිටතයයි.

**නිරත.** පු-ඇලීම.

**නිරත්ත.** ඉ-නොවැලුනු

**නිරත්ථ.** පු-අර්ථ රහිත, නිෂ්ඵල.

**නිරත්ථක.** න-නිෂ්ප්‍රයෝජන, අපල.

**නිරද්දම** පු-නිශීම, බැහැරවීම.

**නිරන්තර.** න-නිරතුරු, අතරක් නැති.

**නිරපරාධ.** පු-අපරාධ රහිත, නිදොස්.

**නිරපෙක්ඛ.** පු-උපෙක්ෂා රහිත.

**නිරබ්බුද.** න-අර්බුද රහිත, අරබුද සියක් ලක්ෂය, අබ්බුද බලනු.

**නිරය.** පු-නරකය, අපාය.

**නිරප.** පු-නිරයපාලයා.

**නිරයපාල.** පු-නිරයපාලයා.

**නිරවසෙස.** පු-අවශෙස රහිත, ඉතුරුනැති.

**නිරසන.** න-දුරුකිරීම.

**නිරස්සාද.** පු-ආස්වාද නැති, සැනසීමක් නැති.

**නිරාකති.** ති-දුරු කිරීම, නිරාකුල.

**නිරාකරන.** න-බැහැර කිරීම, ඉවත්කිරීම.

**නිරාකරොති.** ක්‍රි-(d. භූ. කර, කරණෙ කිරීමෙහි නි+කර+ති) දුරුකරයි.

**නිරාකුල.** පු-ආකුල රහිත.

**නිරාතඞ්ක.** පු-ලෙඩ රහිත, දොස් රහිත.

(18923)

**නිරාමය.** පු-නිරෝගී, ආමරහිත.

**නිරාමිස.** පු-ආමිස රහිත.

**නිරාරම්භ.** පු-ආරම්භරහිත.

**නිරාලම්බ** පු-ආලම්බන රහිත.

**නිරාලය.** පු-ආලය රහිත.

**නිරාස.** පු-ආසා රහිත, තෘෂ්ණා රහිත.

**නිරාසය.** පු-ආසය රහිත.

**නිරාසව** පු-ආශ්‍රව රහිත.

**නිරාමිස.** න-ආමිස රහිත.

**නිරාහාර.** පු-ආහාර රහිත.

**නිරීහ.** ති-නොසෙල්වෙන, අකර්මණ්‍ය.

**නිරින්ධන.** න-ඉන්ධන රහිත, දරනැති

**නිරුජ්ඣති** ක්‍රි-(d. භූ. රුධි, ආවරණෙ, වැසීමෙහි + ති) නිරුද්ධවෙයි.

**නිරුජ්ඣන.** න-නිරුධය, නොපෙනීයාම.

**නිරුත්තම.** පු-සර්වඥයන්වහන්සේ.

**නිරුත්තර.** පු-උත්තම, ශ්‍රේෂ්ඨ.

**නිරුත්ති.** ඉ-නිරුක්තිය, න්‍යාය, එනම් වෙදාඞ්ග ශාස්ත්‍රය.

**නිරුත්තිපථ.** න-නිරුක්තිපථය.

**නිරුදක.** න-ජල රහිත.

**නිරුද්ධ.** න-අභාප්‍රාප්ත, විනාශයට ගිය.

**නිරුන්ධති.** ක්‍රි-(d. භූ රුධි, ආවරණෙ, වැසීමෙහි + ති) නොපෙනීයයි.

**නිරුපකාර.** පු-උපකාර රහිත, උපකාර නැති.

**නිරුපලෙපන.** න-අනුපලෙපනය.

**නිරුපඝාත.** පු-උපඝාත රහිත.

**නිරුපද්දව.** පු-උපද්‍රව රහිත, උවදුරු නැති.

**නිරුපධි.** ඉ-උපධි රහිත.

**නිරූපන.** න-දක්වීම, පෙන්වීම.

**නිරුපම.** ඉ-උපමා රහිත.

**නිරුස්සාහ.** පු-උස්සාහ රහිත.

**නිරුස්සුක්ක.** පු-වීර්ය රහිත.

**නිරොග.** පු-රොග රහිත, නිරෝගීහු.

**නිරොජ.** පු-ඔජා රහිත.

**නිරොධ.** පු-නිර්වාණය, විනාශය, ආවරණය.

**නිරොධික.** පු-නිරොධය ඇති, නිරුද්ධකරණ.

**නිරොධෙති.** ක්‍රි-(d. භූ. රුධි, ආවරණෙ, වැසීමෙහි, ණෙ + ති) නිරුද්ධ කෙරෙයි.

**නිරොධසච්ච.** න-චතුරාර්ය සත්‍යයෙහි තුන්වන සත්‍යය.

**නිලය.** පු-ගෙය.

**නිල්ලූර.** පු-ඇතා.

**නිලොප.** පු-මහාවිලොපය, මහත්වූ කොල්ල කෑම.

**නිලොභ.** පු-ලොභ රහිත,

**නිලොලුප.** පු-ලොල් නොවූ

**නිලීන.** න-සැඟවුණු, ආවරණයවුණු

**නිලීයති.** ක්‍රි-(d. දී. ලී. සිලෙසනෙ, + ය + ති) සැඟවෙයි

**නිලීයන.** න-සැඟවෙන, ආවරණයවන.

**නිලජ්ජ.** පු-ලජ්ජා රහිත.

**නිවත්තන.** පු-නැවතීම.

**නිවත්තනීය.** පු-නැවැත්වියයුතු, වැලැක්විය යුතු.

**නිවත්ති.** ඉ-නිවෘත්තිය, නැවැත්ම.

**නිවත්ථ.** ති-හඳනා ලද, වසන ලද.

**නිවසති.** ක්‍රි-(d. භූ. වස, වසනෙ, වැසීමෙහි + ති) වසයි.

**නිවහ.** පු-සමූහය.

**නිවාත.** ති-වාතරහිත, පීඩාරහිත, හිරිහැර නැති, නීචවෘත්තිය.

**නිවාතක.** පු-ආවරණ සහිත තැන, අවසථාව.

**නිවාප.** පු-මලපියන් පිණිස දෙන දානය, ආමිසය.

**නිවාරණ.** න-ආවරණය, වැලැක්ම.

**නිවාරය.** ති-නොවැලැක්විය හැකි.

**නිවාරිත.** ති-වලක්වන ලද.

**නිවාරෙති.** ක්‍රි-(d. භූ. වර, වාරණ, වැලැක්වීමෙහි + ණෙ + ති) වලක්වයි.

(13981)

**නිවාස.** d. චු. නිවාසෙ, ඇදීමෙහි, නිවාසෙති, නිවාසයති, අදීය.

**නිවාස.** පු-ආවාසය, වසනගෙය.

**නිවාසන.** න-යටිහඳනා පිළි, අඳනා පිළි.

**නිවාසිත.** පු-වාසය කළ, විසූ.

**නිවාසී.** පු-වාසය කරන්නා.

**නිවාසෙති.** ක්‍රි-(d. භූ. වස, නිවාසෙ, වැසීමෙහි, නි + වස + ණෙ + ති) වාසය කරවයි.

**නිවිඪ.** ති-අනතගීත, ඇතුළත්.

**නිවුත.** ති-වටකළ, පරික්ෂෙප කළ.

**නිවුත්ත.** ති-පහළ කළ, හරණ ලද.

**නිවුවාණ.** න-නිබ්බාන, නිවන, වාණ රහිත.

**නිවෙදක.** පු-නිවේදකයා, දන්වන්නා.

**නිවෙදෙති.** ක්‍රි-(d. භූ. විද, ඤාණෙ, දැනුමෙහි නි + විද + ණෙ + ති) දන්වයි.

**නිවෙදන.** න-දැන්වීම.

**නිවෙස.** පු-ඇතුළත්වීම.

**නිවෙසන.** න-ගෙය.

**නිවෙසිත.** පු-හිඳින ලද.

**නිවෙසෙති.** ක්‍රි-(d. භූ. වස, නිවාසෙ, වැසීමෙහි, නි + වස + ණෙ + ති) වෙසෙයි.

**නිව්‍යග්ඝ** පු-විචිකිච්ඡා රහිත, සැකනැති.

**නිස්සය** පු-පිහිට, උපකාරය.

**නිසග්ග.** පු-ස්වභාව.

**නිසජ්ජ.** ඉ-නිසදෘය, නිද්‍රාව.

**නිසජ්ජන.** න-හිඳීම, ඉඳීම.

**නිසජ්ජනඨාන.** න-ඉඳිනාතැන.

**නිසම්ම** ක්‍රි.වි-ප්‍රවෙසම්සහිත, කල්පනා සහිත.

**නිසා.** ඉ-රාත්‍රිය.

**නිසාකන්ත** රාත්‍රිය, රාත්‍රි කාන්තාව.

**නිසාකර.** පු-අඹයා.

**නිසාද.** පු-හසතීත්ගේ එනම් සවරය, සොරා.

**නිසාදික.** ති-විවේක ගැනීමට සුදුසු, නිඳ ගැනීමට යොග්‍ය.

**නිසාදී.** පු-ඇලවී සිටින්නා.

**නිසාන.** න-පිහියා මුවහත් කිරීමට පාවිච්චි කරණ උපකරණයක්.

**නිසානාථ.** පු-චන්ද්‍රයා.

**නිසාමක.** පු-අසන්නා, ඇහුම්කන් දෙන්නා.

**නිසාමන.** න-දැකීම, ඇසීම.

**නිසාමෙති.** ක්‍රි-(d. චු. සාම, සන්ත්වනෙ, ප්‍රිය කිරීමෙහි + නි + සාම් + ණෙ + ති) ඇහුම්කන් දෙයි, අසයි.

**නිසාපති.** පු-චන්ද්‍රයා.

**නිසාසර.** පු-නිශාචරයා.

**නිසි.** d. භූ-චුම්බනෙ, සිඹීමෙහි, නිසෙති, සිඹියි.

**නිසිත.** ති-තියුණු කළ, මුවහත් කළ.

**නිසිථිනී.** ඉ-රාත්‍රිය.

**නිසීථ.** පු-මධ්‍යම රාත්‍රිය.

**නිසින්න.** පු-හුන්, විසූ.

**නිසින්නක.** පු-හිඳීම.

**නිසීදන.** න- හිඳීම, හඳනාවස්ත්‍රය.

**නිසු.** d. භූ-සිඤ්චනෙ, ඉසීමෙහි, නෙසති, ඉසී.

**නිසුම්භති.** ක්‍රි-(d. භූ. සුම්භ, හිංසායු, හිංසා වෙහි, නි + සුම්භ + ති) අණියි, ගසයි.

**නිසූදන.** න-මැරීම, වධය.

**නිසෙධ.** පු-ප්‍රතික්ෂෙපය, වැළැක්ම.

**නිසෙධක.** පු-ප්‍රතිෂෙධකයා, වලක්වන්නා.

**නිසෙධෙති.** ක්‍රි-(d. දි. සුධ, සොවෙය්‍ය, සුව් බැව්හි + නි + සුධ + ණෙ + ති) වලක්වයි.

**නිසෙවති.** ක්‍රි (d. භූ. සෙවු, සෙවනෙ, සේවන යෙහි, නි + සෙවු + ති) සෙවනය කරයි.

**නිසෙවන.** න-සෙවනය, ආශ්‍රය.

**නිසෙවිත.** ති-ආශ්‍රය කළ, සෙවනය කළ.

**නිස්සක්ක.** න-පිටතයෑම, නික්මයෑම.

**නිස්සක්කන.** න-පලායෑම, ලිස්සායෑම.

**නිස්සග්ගිය.** පු-හැරියයුතු, ඉවත දැමිය යුතු.

**නිස්සඞ්ග.** ති-පරාඪීකාමී, නොඇලුනු.

**නිස්සජ්ජති.** ක්‍රි-(d. භූ. සජ්ජ, සජ්ජනෙ, දුරු කිරීමෙහි, නි + සජ්ජ + ති) දුරුකෙරෙයි.

**නිස්සජ්ජන.** න-හැරීම, අතහැරීම.

**නිස්සට.** ති බෙරුනු, නිදහස්වුණු, ආපසු අං.

(14041)

**නිස්සට්ඨ.** ති-අත්හළ, දීපු.

**නිස්සත්ත.** පු-සත්ව නොවන.

**නිස්සත්තතා.** ඉ-නිස්සත්තබව.

**නිස්සද්ද.** පු-තුෂ්ණීම්භාවය, මවුන භාවය.

**නිස්සන.** න-හඬ.

**නිස්සන්දන.** න-ගලාඑන, නොසිඳී පැවතෙන.

**නිස්සය.** ති-හෙතුව, ආශ්‍රය, ආධාරය, ඇලීම.

**නිස්සයති.** ක්‍රි-(d. භූ. සි, සෙවායං, සේවාවෙහි, නි + සි + ති) විශ්වාස කරයි.

**නිස්සංසය.** පු-නිශ්චිත, එකාන්ත.

**නිස්සයදායක.** පු-ආචාර්යයා.

**නිස්සරණී.** න-එතම්.

**නිස්සරණ.** ති-නිෂ්ක්‍රමණය, ගමන.

**නිස්සාය.** අ-නිසා.

**නිස්සාර.** පු-නිසරු, හරනැති.

**නිස්සාරණ.** න-පිටත යාම, එලවා දැමීම.

**නිස්සලාක.** පු-විජනස්ථානය.

**නිස්සාව.** පු-බතින් පෙරූ කැඳ.

**නිස්සිත.** පු-ආශ්‍රය කළ, සේවනය කළ.

**නිස්සිතක.** පු-ආශ්‍රය කළහු, සේවනය කළ තැනැත්තා.

**නිස්සිරීක.** පු-ශ්‍රියා නැත්තා.

**නිස්සෙණී.** ඉ-හිණ, ඉණිමග.

**නිස්සෙස.** පු-අවශෙෂ රහිත, සියලු.

**නිසෙවන.** න-සෙවනය, ආශ්‍රය.

**නිසෙවිත.** ති-ආශ්‍රය කළ.

**නිහත.** පු-නසනලද.

**නිහිත.** පු-පිහිටුවන ලද, තබන ලද.

**නිහිතදණ්ඩ.** පු-ඉවත තබන ලද දඬු ඇති.

**නිහීන.** පු-ලාමක, නීච.

**නිහීනක.** පු-නීචයා, අධමයා.

**නිහීයති.** ක්‍රි-(d. භූ. හා, චාගෙ, තැගිදීමෙහි, නි + හා + ති) පිරිහෙයි.

**නිහුහුඞ්කක.** පු-හුං ශබ්දය විශ්වාස නොකරන්නා.

## නී

**නී.** අ-දුරු කිරීම්, ආවරණය යන මෙහි.

**නී.** d. භූ-පාපුණනෙ, පැමිණවීමෙහි, නෙතිනයති, පමුණුවයි.

**නීඝ.** පු-දුක, තද කෝපය.

**නීක.** පු-මුව වර්ගයක්.

**නීච.** පු-නීචයා, නිහීනයා.

**නීච.** ති-ලුහුඬු මග.

**නීච.** අ-අල්පාර්ථයෙහි.

**නීත.** ති-ගෙනයන ලද.

**නීතත්ථ.** ති-පමුණුවන ලද අර්ථ ඇති.

**නීති.** ඉ-නීතිය.

**නීප.** පු-කොළොම් ගස, මිදෙල්ල ගස.

**නියති.** ක්‍රි-(d. භූ. නී, නයෙ, පැමිණවීමෙහි + ති) පමුණුවයි.

**නියාත.** න-පවරාදීම, භාරදීම.

**නියාතන.** න-නෛර්යාතන, තමා වෙත තැබූ දේ පවරා දීම, දානය, ත්‍යාගය.

**නීයානික.** න-නෛර්යානික.

**නීයාණ.** න-උතුම්.

**නීයාතුං.** අ-පිටතයාමට.

**නීයාදිත.** න-පාවාදෙන ලද.

**නියාදෙති.** ක්‍රි-(d. භූ. නෙද, කුමාරායං, ගැරහීමෙහි + ණෙ + ති) පාවාදෙයි.

**නීයාන.** න-ගමන.

**නීයානික.** පු-නෛර්යානික.

**නීයාම.** පු-නියාමය.

**නීයාස.** පු-ලාටු, මැලියම්.

**නීයුජ්ජ.** පු-දාසයා.

**නීර.** න-ජලය.

**නීරජ.** ති-කෙලෙස්වලින් දුරුවූ.

**නීරව.** ති-ශබ්ද නැති, නිශ්ශබ්ද.

**නීරස.** ති-රස නැති, වේලුනු.

**නීරුජ.** ති-ලෙඩ නැති.

(14099)

**නීරොග.** ති-රෝග නැති, සනීප ඇති.

**නීල.** පු-කළු පැහැය, සොහොන, අළු.

**නීල.** d. භූ. පැහැයෙහි, නීලති, නිල් පැහැ කරයි.

**නීලති.** ක්‍රි - (d. භූ. නීල, වණ්ණෙ, පැහැයෙහි + ති) නිල් පැහැ කරයි.

**නීලගීව.** පු-මොනරා, ඊශ්වරයා.

**නීලජිත.** පු-නිල්රත්වන් පැහැය.

**නීලවනරාජි.** ඉ-නිල්වන රේඛාව.

**නීලලොහිත.** න-ඊශ්වරයා.

**නීලසප්ප.** පු-නිල්පැහැති සර්පයා පණුවුල්ල, ඇහැටුල්ලා.

**නීලිකා.** ඉ-කළුසෙපාලිකා, සෙවෙල්.

**නීලිනී.** ඉ-බේරු.

**නීලුප්පල.** න-නිලුපුල්.

**නීසුභ.** පු-ලාටු, මුදුන්මල්කඩ, නාගදන්තකය. පරිස්කාරාදිය එල්වන කොක්ක.

**නීවරණ.** න-ආවරණ කිරීම, පංචනීවරණ.

**නීවරණීය.** පු-ආවරණ කටයුතු, වැලැක්විය යුතු.

**නීවාප.** පු-මව්පියන් පිණිස දෙන දානය.

**නීවාර.** පු-හුරුහැල්.

**නීහට.** පු-බැහැර කළ, ඉවත්කළ.

**නීහරණ.** න-දුරුකිරීම, බැහැරකිරීම.

**නීහරති.** ක්‍රි-(d. භූ. හර, හරණෙ, බැහැර කිරීමෙහි + නි + හර + ති) බැහැර කරයි.

**නීහාර.** පු-පිණි, ආකාරය, සැටිය.

**නීහාරක.** පු-බැහැර ගෙණ යන්නා,

**නීහරණ.** න-දුරුකිරීම, බැහැරකිම.

**නීහරිත.** ති-බැහැරකළ, දුරුකළ.

**නීළ.** පු. න-කැදැල්ල.

**නීළජ.** පු-පක්ෂියා, කුරුල්ලා.

## නු

**නු** අ-ප්‍රශ්න, සංසය යන මෙහි.

**නු.** d. භූ-ථුතියං සතුතියෙහි, නොාති, සතුති කරයි.

**නුජ්ජ.** දමව.

**නුට්ඨුහති.** ක්‍රි-(භූ. d ථුහ, නිට්ඨුහනෙ, කෙල ගැසීමෙහි + නි + ථුහ + ති) කෙලගසයි,

**නුට්ඨුහණ.** න-කෙලගැසීම,

**නුණ්ණ(නුන්න).** ති-දමනලද.

**නුති.** ඉ-සතුතිය.

**නුත්ති.** ඉ-දමනලද දෙය.

**නුද.** d. භූ-ඛෙප, පහකිරීමෙහි, නුදති, පනුදති, පහකරයි.

**නුද.** න-කැපැම.

**නුදක.** පු-අඳුර දුරු කරන්නා,

**නුදති.** ක්‍රි-d. භූ. නුද, පෙරණෙ, යැවීමෙහි, පලවා හරිය.

**නුහි.** ඉ-දළුක් ගස. සිනුක්.

**නූතන.** ති-අළුත්දෙය, අළුත්.

**නූන.** අ-නිශ්වය, අනුමානය, විතීකය, විකල්පය යන මෙහි.

**නූපුර.** පු-නිරුවලා ගිගිරි.

## නෙ

**නෙක්ඛම්ම.** න-නෛෂ්ක්‍රම්‍යය, අභිනිෂ්ක්‍රමණය, ප්‍රථමධ්‍යානය, නිවන, විදර්ශනාව, සියලු කුශල ධර්ම

**නෙක්ඛම්මධාතු.** ඉ-නෛෂ්ක්‍රම්‍යය පිළිබඳ කල්පනාව සියලුම කුශලධර්ම.

**නෙක්ඛ.** න-රන්මසු සියයක්.

**නෙක්ඛංජම්බොනද.** න-ජම්බොනද නම් රන් වගීය.

**නෙක.** ති-අනෙක, නොයෙක්.

**නෙකතික.** පු-රවටන්නා, වංචාකරන්නා.

**නෙකායික.** පු-අංගුත්තර නිකායාදී නිකාය සතරෙහි නිපුණයා. (14150)

**නේගම**. පු-නියම්ගම්හිවූයේ වෙළඳාමින් ජීවත් වන්නා.

**නේතාර**. පු-පමුණුවන්නා.

**නේති**. ක්‍රි-(d. භූ. නී, නයෙ, පැමිණවීමෙහි + ති) පමුණුවයි.

**නේතු**. පු-නායකයා.

**නෙත්ත**. න-නෙත්‍රය, වස්ත්‍ර විශෙෂයක්.

**නෙත්තතාරා**. ඉ-ඇසේ ඉංගිරියාව.

**නෙත්ත**. න-නෙත්‍රය; ඇස.

**නෙත්තන්ත**. පු-නෙත්‍රාන්තය.

**නෙත්තජල**. න-කඳුළු.

**නෙත්තමජ්ඣ**. න-විගිනිය. (කළු ඉංගිරියාව)

**නෙත්තරොග**. පු-නෙත්‍රරෝගය.

**නෙත්ති**. ඉ-භවතෘෂ්ණාව.

**නෙත්තික**. පු-දිය අලුවා. ගොවියා.

**නෙත්තිංස**. පු-කඩුව, ඛඞ්ගය.

**නෙද**. d. භූ. කුච්ඡායං, ගැරහීමෙහි, නෙදති, ගරහයි.

**නෙදිය**. පු-ගරහන්නා.

**නෙදිත**. ති-ගරහනලද,

**නෙපක්ක**. න-ප්‍රඥාව. අර්ථානර්ථාදිය සලකන ප්‍රඥාව.

**නෙපච්ච**. න-වෙගය.

**නෙපාතික**. පු-වැටුණු තැනැත්තා.

**නෙපුඤ්ඤ**. න-නිපුනභාවය, දක්‍ෂබව.

**නෙම**. න-කොණ, කෙළවර, ඉම.

**නෙමන්තනික**. පු-ආරාධනා ඉවසන්නා.

**නෙමි**. ඉ-නිම්වලල්ල.

**නෙමිත්තක**. පු-නිමිති කියන්නා.

**නෙමිත්තික**. පු-නිමිතිකියන්නා.

**නෙය්‍ය**. පු-පමුණුවන්නා.

**නෙය්‍යත්ථ**. පු-පැමිණවිය යුතු අර්ථය.

**නෙර**. පු-නිදෙස්.

**නෙරයික**. පු-නිරයෙහි දුක්විඳින සතා.

**නෙරු**. පු-මහමෙර, සුනෙර පර්වතය.

**නෙලත්ත**. න-නිදෙස්බව,

**නෙවසඤ්ඤ**. ඉ-එනම් භවය.

**නෙවසඤ්ඤ**. නාසඤ්ඤ.

**නෙවාපික**. පු-ගොවියා.

**නෙවාසික**. පු-ආරාමයක නිත්‍ය වාසය කරන්නා, ආගන්තුක නොවන්නා.

**නෙසජ්ජිකඞ්ග**. පු-නිදා නොගැනීමෙන් පුරණ අංගය, තෙළෙස් ධූතාඞ්ගවලින් එකක්.

**නෙසාද**. පු-ව්‍යාධයා වැද්දා.

**නෙසු**. d. භූ. - ගමනෙ, යාමෙහි, නෙසති, නෙස්සති, යයි.

## නො

**නො**. අ-ප්‍රතිෂෙධයෙහි නැත, යන තේරුම්හි,

**නොචෙ**. අ. ඉදින්, එසේතම්.

**නොනීත**. න-වෙඬරු, නවනීත.

**න්‍යාය**. පු-යුක්ති සහගත ක්‍රියාව.

**න්‍යාස**. න-උකස.

**න්‍යාසප්පණ**. න-තමා කෙරෙහි තබන ලද වස්තුව ඇත්තාවුන්ට පාවාදීම.

## ප

**ප**. අ-ආදික්‍රියා, අතිශය, ප්‍රභව, අවතීර්ණ, තෘප්ති, නියොග, ඓශ්වර්‍ය, ප්‍රීති, දාන, පූජා, අග්‍ර, ශාන්ති, දර්ශන, තත්පර, ආලය, ප්‍රශංසා, ගමන, ශුද්ධි, හිංසා, ප්‍රකාර, අන්තර්භාව, වියොග, අවයව, දිසායොග, ප්‍රාර්ථනා, සර්ති යනාදියෙහි.

**පංසු**. න-පස්, ධූලි, දූවිලි.

**පංසුක**. ති-දූවිලි.

**පංසුකිත**. න-පස් නැවරීම, දූවිලි ගැසීම.

**පංසුකූල**. න-පස් අතර දිරායාමට සුදුසු හිමියන් නැති දේ, නිරාලයව දමා යන ලද්ද.

**පංසුකූල චීවර**. න-එනම් සිවුර.

**පංසුකූලිකඞ්ග**. න-හිමියන් නොමැතිව දිරා යන රෙදි කැබලි ගොතා කරණ ලද සිවුරු දැරීම වූ අඞ්ගය, තෙරස ධූතාඞ්ග බලනු.

**පංසුපිසාචක.** පු-ධූලි කසල ගොඩවල් ආදි යෙහි හැසිරෙන කුඩා ප්‍රේත කොටසක්.

**පකට්ඨ.** පු- ප්‍රකෘෂ්ට, උත්කෘෂ්ට, ශ්‍රේෂ්ඨ, උසස්.

**පකට්ඨක.** ති-ප්‍රකෘත.

**පකට්ඨිත** පු-උණුකළ, ගිනියම් කළ.

**පකත.** ති-කළ, සිදුකළ.

**පකතානිවත්තන** පු-ප්‍රස්තුතයාගේ අනිවෘත්තිය

**පකති.** ඉ-ඇමති ආදීහු, සප්තරාජ්‍යාඞ්ග, ස්වභාව, යොනිමාර්ගී, සත්ත්වරජස් තමස් යන මොවුන්ගේ ඌනාතිරේක රහිත අවස්ථාව, ප්‍රත්‍යයන් කෙරෙන් පළමුව සිටින ධාතු ආදී ප්‍රකෘතිරූප.

**පකතික.** පු-ප්‍රකෘතිය, පකති.

**පකතිජ.** පු-ප්‍රකෘතියෙන් හටගත් ගුණය.

**පකප්පති.** ක්‍රි-(පු + කප්ප + ති) කැපවෙයි භූ.

**පකප්පන.** න-කැපකිරීම, අයිතිකරදීම.

**පකප්පිත.** ති-කැපකළ, සකස්කළ.

**පකප්පෙති.** ක්‍රි (d. භූ. කප්ප, කප්පණෙ, ප + කප්ප + ණෙ + ති) කෙරෙයි, "සීහ සෙය්‍යං කප්පෙති".

**පකම්පන.** න-කම්පාවීම, චලනයවීම.

**පකම්පිත.** ති-කම්පාකළ, චලනයකළ.

**පකරණ.** න- ප්‍රකරණය, ග්‍රන්ථය, විශිෂ්ට ක්‍රියාව.

**පකරොති.** ක්‍රි d. භූ-කර, කරණෙ, කිරී මෙහි, (ප + කර + ඔාත) කෙරෙයි.

**පකාර.** පු - ප්‍රකාරය, සාදෘශ්‍ය, ප්‍රභේදය විධිය.

**පකාරෙති.** ක්‍රි-(d. භූ. කර කරණෙ, කිරී මෙහි, ණෙ + ති) (ප + කර + ණෙ + ති) කර වයි.

**පකාස.** පු-ප්‍රකාශය, ආලෝකය, එළිය.

**පකාස.** පු-ප්‍රකට වස්තු, පතළදෙය, ප්‍රසිද්ධ.

**පකාසන.** න-ප්‍රකාශ කිරීම, පතළකිරීම.

**පකාසති.** ක්‍රි. (ප + කාස + ති) ප්‍රකාසකරයි, ප්‍රසිද්ධකරයි.

**පකාසිත.** ති-ප්‍රකාසකළ, පතළකළ.

**පකිණ්ණක.** න-ප්‍රකීර්ණක, සංග්‍රහ වශයෙන් දක්වන.

**පකිණාති.** ක්‍රි-(d. භූ. කී, දබ්බ විනිමයේ විකිනීමෙහි, ප + කී + ති) විකුණයි.

**පකිත්තන.** න-ප්‍රකීර්තනය, ප්‍රකාස කිරීම.

**පකිත්ති.** ඉ-ප්‍රකාශය, ප්‍රසිද්ධිය.

**පකිත්තිත.** ති-ප්‍රකාශකළ, ප්‍රසිද්ධකළ.

**පකිත්තෙති.** ක්‍රි - (d. චු. කිත්ත, සංසද්දෙ ශබ්ද කිරීමෙහි, ණෙ + ති) ප්‍රකාශ කෙරෙයි.

**පකිරති.** ක්‍රි-(ප + කිර + ති) වැගිරෙයි, විසිරෙයි.

**පකිරිය.** පු ක්‍රි - විසුරුවා, වීසිකර, පකිරිත්වා.

**පකිරිය.** න-කටු කරඳ.

**පකුජ්ඣති.** ක්‍රි-(d. භූ කුජ්ඣ, කුජ්ඣ, කිපීමෙහි, (පි + කුජ්ඣ + ති) කිපෙයි, කෝප කරයි.

**පකුජ්ඣන.** න-කිපීම, කෝපවීම.

**පකුජ්ඣිත.** ති-කෝපකළ, කෝපවනු.

**පකුද්ධ.** ති-කිපුණු.

**පකුප්පති.** ක්‍රි. (d. භූ - කුප, කෝපෙ, කිපී මෙහි + ති) (ප + කුප + ති) කිපෙයි කෝප කරයි.

**පකුප්පන.** න-කෝපය කිරීම, තරහවීම.

**පකුබ්බති.** ක්‍රි-(d. භූ. කර, කරණෙ, කිරී මෙහි + ප + ඔ + පු + ව + බ්බ + ති) කෙරෙයි.

**පකුබ්බන.** න-කිරීම, කටයුතු සම්පාදනය.

**පකූජන.** න නාදකිරීම.

**පකොටි.** ඉ-ප්‍රකෝටිය, කෝටිසියක්, ලක්ෂය.

**පකොප.** පු-ප්‍රකෝපය, මහත් කෝපය.

**පකොපන.** න-අධිකව කිපීම.

**පකොපිත.** පු මහත්ව කිපිනු.

**පක්ක.** d. භූ. නීච ගතියං, හීන ගමනයෙහි, පක්කති, පහත්වෙයි.

**පක්කති.** ක්‍රි - (d. භූ. පක්ක, නීචගතියං, හීන ගමනෙහි + ති) පහත්ව යෙයි.

**පක්කට්ඨිත.** පු-කකියවනලද, උනුකළ.

**පක්කන්ත.** ති-බැහැර ගිය, ඉවත්ව ගිය.

**පක්කන්තති.** ක්‍රි - (ප + කන්ත + ති) හඬයි, අඬයි.

**පක්ක.** පු. න-අල, විනාශෝන්මුඛ වස්තු. මුහුකළ, පැහිච්ච.

**පක්කමති.** ක්‍රි. (d. භූ-කමු, පද වික්ඛෙපෙ, යෑමෙහි + ති) (ප + කම + ති) යෙ.

**පක්කමන.** න-ගමන යාම.

**පක්කමො.** පු-උපක්‍රමය.

**පක්කව.** න-බෙහෙත් පැලෑටි වර්ගයක්.

**පක්කුල.** ති-අවුල්වුනු.

**පක්කොසති.** ක්‍රි - (d. භූ - කුස, ආවහානෙ, කැඳවීමෙහි + ති) (ප + කුස + ති) කැඳවයි, අමතයි.

**පක්කොසන.** න - කැඳවීම, ආමන්ත්‍රණය කිරීම.

**පක්කොසිත.** ති-කැඳවනලද, ආමන්ත්‍රණය කළ.

**පක්ඛ.** පු - (ශුක්ල, කෘෂ්ණ, පක්ෂ, සඞ්ඛ්‍යාත මාසාර්ධකාලය, සේනාව, සිඬකටයුත්ත, යහළු, පියාපත්, පිළාපර්සවය, පැත්ත, කෙස කලාපය.

**පක්ඛක.** පු-පක්ෂයට අයත්, පාක්ෂික.

**පක්කවට්ඨ.** පු-කකියවනලද, උණුකළ, රත් කළ.

**පක්ඛන්ත.** පු-බැහැරගිය, ඉවත්වගිය.

**පක්ඛන්දන.** න-පැනීම, ඇදීම.

**පක්ඛන්දක.** පු-පනින්නා.

**පක්ඛන්දින.** පු-පැනයන්නා.

**පක්ඛන්දිකා.** ඉ - රක්තාතිසාරය, අතීසාර රෝගය.

**පක්ඛන්දති.** ක්‍රි. (d. භූ - බඳි, පක්ඛන්දනෙ, ඇදීමෙහි + ති) පනියි.

**පක්ඛන්දෙති.** ක්‍රි. [d. භූ. බඳි, පක්ඛන්දනෙ. ඇදීමෙහි + ණෙ + ති] ඇදීම-කරවයි.

**පක්කඛඬන.** න-හැරයාම, උඩින් පැන යාම.

**පක්ඛපාස.** පු-ගෘහාවයවයක්, පැරන් පෝරුව.

**පක්ඛබිලාල.** පු-පියා, බිළලා.

**පක්ඛර.** න-ගැටිය, අද්දර.

**පක්ඛරණ.** න-පස්කර ලණය, හැපීම, ගැටීම.

**පක්ඛලති.** ක්‍රි - (d. භූ. චල, චලනෙ, සෙලවීමෙහි + ති) වැටෙයි.

**පක්ඛහත.** ති-පක්ෂඝාතය, පක්ෂයක් නසන ලද පැත්තක් නැසුනු.

**පක්ඛාලෙති.** ක්‍රි - (d. භූ. චල, චලනෙ, සැලීමෙහි + ණෙ + ති) වැටෙයි, සෙලවෙයි.

**පක්ඛී.** පු පක්ෂ ඇත්තා, පියාපත් ඇත්තා.

**පක්ඛික.** ති-පක්ෂයකට අයත්, පර්සවයකට අයත්.

**පක්ඛිකභත්ත.** න-පක්ෂයක් පාසා දෙන බත.

**පක්ඛිත්ත.** ති-දමනලද, බහාලන ලද.

**පක්ඛිජ.** න-පක්ෂි බිජ, කුරුළු බිජු.

**පක්ඛිපති.** ක්‍රි - (d. භූ. ඛිප, ඛිපනෙ, දැමීමෙහි + ති) (ප + ඛිප + ති) දමයි, යමක් තුලට ප්‍රවෙශකරයි.

**පක්ඛිය.** පු-පක්ෂයකට අයත්, පක්ඛික.

**පක්ඛිසීහ.** පු-පක්ෂි සිංහයා, ගුරුලා.

**පක්ඛෙප.** පු-ප්‍රක්ෂෙපය, දැමීම, පැහීම.

**පක්ඛෙපන.** න-පක්ෂෙපනය, දැමීම.

**පක්ඛෙපිත.** ති-ප්‍රක්ෂෙපිත, දැමූ, දමනලද, බහන ලද.

**පඛුම.** න-පක්ෂ්ම, ඇසිපිය ලොම්, ඇස්පිහාටු.

**පගබ්භ.** පු-ප්‍රගල්භ, බුහුටි, සූර.

**පගල්භතා.** ඉ-ප්‍රගල්භත්වය, බුහුටිබව.

**පගබ්භී.** පු-ප්‍රගල්භ ඇත්තා, බුහුටි ගති ඇත්තා.

**පගාලභ.** දූඩි, තද, ප්‍රගාල්භ.

**පගාහති.** ක්‍රි - (d. භූ. ගාහු, විලොමනෙ, ගැනීමෙහි + ති) (ප + ගාහු + ති) ඇතුලත් වෙයි.

**පගිබ.** පු-අතිශයින් ගිජුවූ.

**පගුන.** ති-ප්‍රගුණ, නිපුන, ඇදනැති, අභ්‍යාසය.

**පගුණතා.** ඉ-ප්‍රගුණභාවය, නිපුන බව.

**පගුම්බ.** පු-පඳුර, වනරොද, බඩවැටිය.

**පගෙ.** අ-පූර්වාහ්නයෙහි, පෙරවරු කාලයෙහි.

(14302)

**පගෙව**. අ-(පා + එව) පළමුකොටම, ප්‍රථම කොටම.

**පග්ගණ්හාති**. ක්‍රි-(ප + ගහ + ණ්හා + ති) ගනී, ග්‍රහණයකරයි

**පග්ගණ්හන**. න-ගණී, ග්‍රහණය.

**පග්ගණ්හිත**. ති-ගන්නා ලද, ගත්.

**පගලිත**. ති-ගිලිහුනු, ගැලවුනු, ගැලවෙන ලද.

**පග්ගව**. න බෙහෙත් පැලෑටි වර්ගයක්.

**පග්ගහ**. පු-වීයසීය, බලාත්කාරයෙන් ගෙනා මනුෂ්‍යාදීහු.

**පග්ගහණ**. න-වීයසීකිරීම, ගැණීම.

**පග්ගහිත**. ති-ගන්නාලද, ග්‍රහණය කළ.

**පග්ගාහ**. පු-වීයසීය, උත්සාහය.

**පග්ගාහික** පු - වීයසී කරන්නා, උත්සාහ කරන්නා.

**පඝරති**. ක්‍රි-(ප + ඝර + ති.) වැගිරෙයි, වෑස්සෙයි.

**පඝරණ**. න-වැගිරීම, ජලාදිය වහනයවීම.

**පඝරිත**. ති-වැගිරෙන ලද, කාන්දුවන ලද.

**පඝණ**. පු-ආලින්දය, සරීරාවයව.

**පඝාණ**. පු-ආලින්දය, ගෙයිපිල, තරප්පුව.

**පඞ්ක**. පු-මඩ, කරදම.

**පඞ්ක**. න-අකුසලය.

**පඞ්කචිර**. න-පත්‍රයෙන් කළ නලාව.

**පඞ්කජිනි**. ඉ-පියුම් විල.

**පඞ්කෙරුහ**. න-පද්මය, පියුම.

**පඞ්ග**. පු - කොලවලින් තැනූ තලා වර්ගයක්.

**පඞ්ගු**. පු-පිලා, පුරා.

**පඞ්ගුල**. පු-පිලා.

**පච**. d. භූ-පාකෙ, පිසීමෙහි, පචති, පිසයි.

**පච**. d. චු-විත්ථාරෙ, පැතිරීමෙහි, පඩෙචති, පඩචයති, පපඤ්චති, පපඩෙචති, විස්තර කරයි.

**පච**. d. භූ-ගමනෙ, ගමන්හි, පචති, යෙයි.

**පචති**. ක්‍රි-(d. භූ. පච, පාකෙ, පිසීමෙහි + ති) පිසයි.

**පචංපචා**. ඉ-වතුවැල්.

**පචන**. න-පිසීම, ඉසීම.

**පචරති**. ක්‍රි-(ප + චර + ති) හැසිරෙයි.

**පචල**. න ප්‍රකට, පතල.

**පචලති**. ක්‍රි-(d. භූ. චල, කම්පනෙ, සැලීමෙහි, + ප + චල + ති) සැලෙයි.

**පචලායති**. ක්‍රි-(d. භූ. චල, කම්පනෙ, සැලීමෙහි + ප + චල + ය + ති) එල්ලෙයි, සැලෙයි.

**පචලායන**. න-නිඳ.

**පචලායිකා**. ඉ-නිද්‍රාව, නිඳ.

**පචලිත**. ති-ප්‍රචලිත, සැලෙනලද.

**පචා**. ඉ-පිසීම.

**පචාර**. පු-පිරිවර, පිරිස, යක්කපචාර.

**පචාරෙති**. ක්‍රි-(d. භූ. චර, ගතිවරණෙ, හැසිරීමෙහි + ප + චර + ණ + ති) ගැවසෙයි.

**පචාලෙති**. ක්‍රි-(d. භූ. චල, කම්පනෙ, සැලීමෙහි + ණෙ, + ති) සැලෙයි.

**පචිනාති**. ක්‍රි-(d. චු. චි, චය, රැස්කිරීමෙහි + ති) (ප + චි + නාති) රැස්කෙරෙයි.

**පචිස්සති**. ක්‍රි-(d. භූ. පච, පචනෙ, පිසීමෙහි + ස්සති) (පච + නෙ + ඉස්ස + ති) පිසන්නේය.

**පචුර**. ති-බොහෝ, අධික, වැඩි.

**පච්ච**. d. චූ-යොගෙ, යෙදීමෙහි පච්චෙති, පච්චයති, පොළයි.

**පච්චක්කොසති**. ක්‍රි- (d. භූ-කුස, අක්කොසෙ, ආක්‍රොශයෙහි + පති + ආ + කුස + ති) ආක්‍රොශකරයි. පෙරලා ආක්‍රොශකරයි.

**පච්චක්කොසන**. න-පෙරලා බැනීම, බැන්න හුට බැනීම.

**පච්චක්කොසිත**. ති-පෙරලා බනින ලද.

**පච්චක්ඛ**. ති-ප්‍රත්‍යක්ෂ, පසක්, ඉන්ද්‍රිය හමුවීම, ප්‍රත්‍යක්ඛ්‍යානය.

**පච්චක්ඛාත**. ති-ප්‍රතික්ෂෙප කළ, බැහැර කළ.

**පච්චක්ඛාති**. ක්‍රි-(d. භූ. ඛ්‍යා, පකථනෙ, කිරීමෙහි + පති + ආ + ඛ්‍යාති) ප්‍රතික්ෂෙප කරයි.

**පච්චාක්ඛාන**. න-ප්‍රතික්ෂෙපකිරීම, ඉවත්කිරීම.

**පච්චග්ඝ**. පු-අභිනව, අලුත්.

**පච්චඟු.** පු-ඉදිරියට යන්නා, පෙරටුව යන්නා.

**පච්චඟ්ගල.** පු-උගුර.

**පච්චඞ්ග.** න-(පති + අඞ්ග) අවයව, ශරීරාවයව.

**පච්චඤ්ජන.** න-අඳුන, ඇඳීම.

**පච්චති.** ක්‍රි-(d. භූ. පච, පාකෙ, පිසීමෙහි + පච + ති) පිසයි.

**පච්චත්ත.** න – තමා පිළිබඳ, තමාට අයත්, තමා අධිපති කොට ඇති.

**පච්චත්ථරණ.** න-පසතුරුණු, ඇතිරිලි.

**පච්චත්ථික.** ති-ප්‍රයෝජනයට ප්‍රතිවිරුඬ.

**පච්චන.** න-පිසීම, පැසීම.

**පච්චනුභාසති.** ක්‍රි-(d. භූ. භාස, භාසනෙ, කීමෙහි + පති + අනු + භාස + ති) අනුව කියයි, කියන ලද්ද අනුව කියයි.

**පච්චනුභාසන.** න-කී දෙය අනුව කීම, කියන ලද්දට අනුව කීම.

**පච්චනුභාසිත.** ති-අනුව කියන ලද.

**පච්චනීක.** ති-සතුරු, විරුඬ, සතුරා.

**පච්චනීය.** පු-පැසිය යුතු.

**පච්චනුභූත.** ති-අනුභව කළ, ප්‍රයෝජනගත්, වැළඳූ.

**පච්චනුභොති.** ක්‍රි – (පති + අනු + භූ + ඔ + ති) අනුභව කෙරෙයි.

**පච්චන්ත.** පු-ප්‍රත්‍යන්තය, පසල්දනව්ව.

**පච්චන්තිම.** පු – ප්‍රත්‍යන්තය, පිටිසර පළාත, පසල්දනව්ව.

**පච්චභිඤ්ඤාන.** න-අවබෝධ, දැනීම.

**පච්චය.** පු-ශ්‍රද්ධාව, සිවුපසය, හේතුව, ආධාරය කාරණය; ව්‍යාකරණයෙහි දක්වන ලද ප්‍රත්‍යවන අක්ෂරය.

**පච්චයතා** ඉ-ප්‍රත්‍යබව.

**පච්චයික.** ති-ඇදහිය යුතු, විශ්වාස කටයුතු.

**පච්චරි.** ඉ-පසුර, පහුර, අඟුල

**පච්චරියට්ඨකථා.** ඉ-පසුරෙහි සිට කළ අට්ඨකථාව.

**පච්චලද්ධංසු.** ක්‍රි-(d. භූ. ලභ, ලාභෙ, ලැබීමෙහි + පති + ලභ + උංසු) ලැබූහ.

**පච්චලද්ධුං.** අ-ලැබීය.

**පච්චවිද්ධුං.** ක්‍රි-(d. භූ. විද, ඤාණෙ, දැනීමෙහි + පති + විද + උං) දත්හ, දැනගත්තෝය.

**පච්චවෙක්ඛන.** න – ප්‍රත්‍යවෙක්ෂා කිරීම, මෙනෙහි කරීම.

**පච්චවෙක්ඛනඤාණ.** න – ප්‍රතිවෙක්ෂාකරන ඤාණය.

**පච්චවෙක්ඛනතා.** ඉ-ප්‍රතිවෙක්ෂාකිරීම් බව.

**පච්චවෙක්ඛති.** ක්‍රි – (d. දී. වික්ඛ, හිංසායං, හිංසාවෙහි + පති + වික්ඛ + ති) ප්‍රතිවෙක්ෂා කෙරෙයි.

**පච්චවෙක්ඛා.** ඉ-ප්‍රත්‍යවෙක්ෂාව.

**පච්චස්සොසි·** ක්‍රි-(d. චු. සු. සවනෙ, ඇසීමෙහි + පති + ආ + සු + ඉ) පිලිවදන් ඇස්සුයේය.

**පච්චාසාරි.** පු-බලාපොරොත්තු වන්නා.

**පච්චාකත.** ති-අස්කළ, වෙනස්කළ.

**පච්චාකොටිත** ති – (පති + ආ + කොටිත) අපුල්ලා මදින ලද.

**පච්චාගච්ඡති.** ක්‍රි – (d. භූ. ගමු ගතියං, යෑමෙහි + පති + ආ + ගච්ඡ + ති) පසුව එයි.

**පච්චාගත.** ති-පසුව ආ, කැටුව ආ.

**පච්චාගමන.** න - ඉදිරියට යාම, අභිමුඛයට යාම.

**පච්චාඝාත.** ති-නසන ලද, මරන ලද

**පච්චාඝාතිත.** ති-මරණ ලද, නසණ ලද.

**පච්චාවික්ඛති.** ක්‍රි – (d. භූ. වික්ඛ, වාචායං, කීමෙහි + පති + ආ + වික්ඛ + ති) කියයි.

**පච්චාජාති.** ඉ-උත්පත්තිය, හටගැන්ම.

**පච්චාජායති.** ක්‍රි-(d. ති. ජී. ජාතියං, ඉපදීමෙහි + පති + ආ + ජායති) උපදී, හටගනී.

**පච්චාදෙස.** පු-පුරුදු කිරීම.

**පච්චාභාසති.** ක්‍රි – (d. භූ. භාස, භාසනෙ, කීමෙහි + පති + ආ + භාස + ති) කියයි.

**පච්චාභාසන.** න-කීම, පසුවකීම.

**පච්චාභාසිත** ති-අනුව කියන ලද, කියනලද.

**පච්චාමිත්ත.** පු-පසමිතුරා, හතුරා.

**පච්චාරොති.** ක්‍රි-(d. භූ. රු. හිංසායං, හිංසාවෙහි + පති + ආ + රු + ති) වාක්‍යාදියකට නගී, දෙෂාදිය ආරෝපනය කරයි.

**පච්චාරොහණි.** ඉ-නැගියයුත්ත, ඉනිමග.

**පච්චාසති.** ක්‍රි-(d. භූ. ආස, පත්‍ථනායං, ප්‍රාර්ථනා වෙහි + පති + ආස + ති) ප්‍රාර්ථනා කරයි.

**පච්චාසන්න.** පු-සමීප, කිට්ටු, ළඟ.

**පච්චාසා.** ඉ-ආසාව, කැමැත්ත, අධ්‍යාශය.

**පච්චාසාරෙති.** ක්‍රි-(d භූ. සර, ගතියං, යැමෙහි + පති + ආ + සර + ති) පස්සට යවයි, ආපසු යවයි.

**පච්චාසිංසන.** න-ප්‍රාර්ථනාව, පැතීම.

**පච්චාසිංසති.** ක්‍රි-(d. භූ. සිස, ඉච්ඡායං, කැමැතිවීමෙහි + පති + ආ + සිස + ති) පතයි, ප්‍රාර්ථනා කරයි.

**පච්චාහත.** ති-නසන ලද, විනාශ කළ.

**පච්චාහරණ.** න-ආපසු ගෙනයාම, නැවත ගෙනයාම.

**පච්චාහරති.** ක්‍රි-(d. භූ. හර, හරණෙ, ගෙණ යැමෙහි + පති + ආ + හර + ති) ආපසු ගෙන යයි.

**පච්චුක්කඩ්ඪති.** ක්‍රි-(d. භූ. කඩ්ඪ, කඩ්ඪනෙ, ඇදීමෙහි + පති + උ + කඩ්ඪ + ති) පස්සට අදියි, ආපසු ඉහළට අදියි.

**පච්චුක්කඩ්ඪන.** න-ඉහළට ඇදීම, ආපසු ඉහලට ඇදීම.

**පච්චුග්ගච්ඡති.** ක්‍රි-(d. භූ. ගමු, ගතියං, යැමෙහි + පති + උ + ගමු + ච්ඡ + ති) ඉදිරියට යෙයි, අභිමුඛව යෙයි.

**පච්චුග්ගත.** ති-උත්ගතවන ලද, නැගුණු, පහලවන ලද.

**පච්චුග්ගමන.** න-ඉදිරියට යාම, අභිමුඛයට යාම.

**පච්චුට්ඨාති.** ක්‍රි-(d. භූ. ඨා, ගතිනිවුත්තියං, යැමෙහි + පති + ඨා + ති) එළඹ සිටියි, පැමිණ සිටී.

**පච්චුට්ඨාන.** න-එළඹ සිටීම, උපස්ථානයට පැමිණීම.

**පච්චුට්ඨිත.** ති-එළඹ සිටින ලද, උපස්ථාන කල.

**පච්චුත්තරති.** ක්‍රි-(d. භූ. තර, තරණෙ, එතෙර වීමෙහි + පති + තර + ති) එතෙර වෙයි, එගොඩ වෙයි.

**පච්චුත්තරන.** න-එතර වීම, එගොඩ වීම, පරතීරයට යාම.

**පච්චුද්දවත්තති.** ක්‍රි-(d. භූ. වත්ත, වත්තනෙ, පැවතීමෙහි + පති + වත්තති) ප්‍රත්‍යුදාහරණ කරයි.

**පච්චුද්දවත්තන.** න-උඩට ඒම, උදාවර්තනය.

**පච්චුදාහරති.** ක්‍රි-(d. භූ. හර, හරණෙ, ගෙණ යැමෙහි + පති + උදාහරති) ප්‍රත්‍යුදාහරණ කරයි.

**පච්චුදාහරණ.** න-උදාහරණයකට අනුව උදාහරණ කීම, සාධක දැක්වීම.

**පච්චුද්ධාර.** පු-(පති + උද්ධාර) ඉගිලීම, ඉදිරීම.

**පච්චුද්ධාරන.** න-ඉදිරීම.

**පච්චුපට්ඨහති.** ක්‍රි-(d. භූ. ඨා, ගතිනිවුත්තියං, යැමෙහි + පති + උප + ඨා + ති) උපස්ථාන කෙරෙයි.

**පච්චුපට්ඨාන.** න-උපස්ථාන කිරීම, ළඟට පැමිණීම.

**පච්චුපට්ඨාපෙති.** ක්‍රි-(d. භූ. ඨා, ගතියං, යැමෙහි + පති + උපට්ඨා + ණෙති) එළඹ සිටී.

**පච්චුපදිස්සති.** ක්‍රි-(d. භූ. දිස, පෙක්ඛණෙ, දැකීමෙහි, පති + උප + දිස + ති) දක්වයි. උදාහරණ කරයි.

**පච්චුපලක්ඛන.** න-ගරු සරු ඇති බව, ගෞරවය ඇති බව.

**පච්චුපෙති.** ක්‍රි-(d. චු. උප, පජ්ජනෙ, පැමිණීමෙහි + ණෙ + ති) පැමිණෙයි.

**පච්චුප්පන්න.** න-වර්තමානය, පවත්නා කාලය.

**පච්චුය්‍යාති.** ක්‍රි-(d භූ. යා, ගතියං, යැමෙහි + පති + උ + යා + ති) ඉදිරියට යෙයි.

**පච්චුස.** පු-ප්‍රත්‍යුෂය, අළුයම, ඉතා උදය කාලය.

**පච්චූහ.** පු-විඝ්නය.

**පච්චෙක.** න-වෙන වෙනම.

**පච්චෙකබුද්ධ.** පු-පසේබුදු රජ.

**පච්චෙකමුනි.** පු-පසේබුදු රජ.

**පච්චෙති.** ක්‍රි-(d භූ. එ, ආගතියං, ඒමෙහි පති + එ + ණෙ + ති) එයි, ආපසු එයි.

**පච්චෝර.** න-ළය, හදවත, පතුල.

**පච්චාරොහති.** ක්‍රි. (d. භූ. රුහ, ගතියං, ගමන්හි, පති+ආ+රුහ+ති) ආරූඪවෙයි. පහලට බසියි.

**පච්චාරොහන.** න-නැගීම, ආරොහනය

**පච්චාසක්කන.** න-(පති+අව+සක්කන) පසු බැසීම.

**පච්චාසක්කති.** ක්‍රි-(d. භූ. සක්ක, ගතියං ගමන්හි, පති+අව+සක්කති) පසුබසියි.

**පච්ඡතො.** අ-පස්සෙන්, පසුභාගයෙන්.

**පච්ඡන්න.** පු-ප්‍රතිච්ඡන්න, සැඟවීම, වැසීම

**පච්ඡා.** අ-පසුව, නැවත, පශ්චිම දිශාව.

**පච්ඡාතාප.** පු-පසුතැවිල්ල, අනුසොචනය.

**පච්ඡානුතප්පති.** ක්‍රි-(d. භූ. තපප, තිත්තිය. තෘප්තියෙහි පච්ඡා+අනු+තපපති) පසු තැවිලිවෙයි පශ්චාත්තාපවෙයි.

**පච්ඡානුතාප.** පු-පසුතැවිල්ල, පශ්චාත්තාපය.

**පච්ඡානුතප්පන.** න-පසු තැවිලිවීම.

**පච්ඡාබන්ධ** පු-ලුහුබැඳිම, අනුව යන ලද, **නැවේ ගල්වර.**

**පච්ඡාබාහු.** න-අත්පිටිපසට ගැනීම, පිටිකර.

**පච්ඡාභත්ත** න-පසුබත, පසුබත් කාලය, අවරකාලය.

**පච්ඡාභාව.** පු-පසුව, පසුවීම, පශ්චාත්භාවය.

**පච්ඡාසා.** ඉ-සෙවනැල්ල ඇති කොටස.

**පච්ඡි.** ඉ-පැස, පෙට්ටිය

**පච්ඡිම.** පු-අන්තිමයා, අන්තයෙහි පිහිටි තැනැත්තා, පසුවූ දෙය.

**පච්ඡිමක.** පු-පච්ඡිමයා, අන්තිමයා.

**පච්ඡිමකත්තික.** පු-පශ්චිමකාර්තික, උඳුවප් මස.

**පච්ඡිජ්ජති.** ක්‍රි-(d. රු. ඡිදි, ද්විධාකරණෙ, දෙපලු කිරීමෙහි, ප+ඡිදි+ති) සිඳියි, කපයි

**පච්ඡිජ්ජන.** න-සිඳීම, වෙන්වීම.

**පච්ඡින්දිත.** ති-සිඳීතලද, කඩනලද.

**පච්ඡෙදන.** න-සිඳීම, කැඩීම.

**පජ්ජ.** පු-මාර්ගය, මාවත පාර.

**පජ්ජ.** න-පද්‍ය ශ්ලොක, කවි.

**පජ්ජති.** ක්‍රි-(d. දි. පද; ගතියං, යැමෙහි. පද+ය+ත) යෙයි.

**පජ්ජරක.** පු-එනම් යක්ෂරෝගය, ශරීරය දිරායන රෝගය.

**පජ්ජලන.** න-බබලන, දිලිසෙන.

**පජ්ජලති.** ක්‍රි-(d. භූ. ජල, දිත්තියං දීප්තියෙහි ප+ජල+ති) දිලිසෙයි, බබලයි.

**පජ්ජලිත.** ති-බබලන ලද, දිලිසෙන ලද.

**පජ්ජාලිත.** ති-දල්වන ලද, ගිනි අවුලන ලද.

**පජ්ජුන්න.** පු-මෙඝය, වලාකුල.

**පජ්ජොත.** පු-ප්‍රදීපය, පහණ, පාණ.

**පජ්ඣායති.** ක්‍රි-(d. භූ. ඣෙ, චින්තායං, සිතීමෙහි, ප+ඣායති) ධ්‍යාන කරයි, සිතයි.

**පජ්ඣායන.** න-සිතීම, ධ්‍යාන වැඩීම.

**පච.** ති-පස, පහ.

**පචක.** ති-පසකින්යුත්, පසක් ඇති, පචකසි පාතය.

**පඤ්චකාම.** පු-රූපශබ්දාදි පඤ්චවිධ කාමය, රූපාදි පඤ්චාලම්බනයෙහි පවත්නා ආසාව.

**පඤ්චක්ඛත්තුං** අ-පස්වරක්.

**පඤ්චඤාණ** පු-පඤ්චවිධ ඤාණයක් ඇත්තා. සර්වඥයන් වහන්සේ.

**පඤ්චතප.** පු-එනම් තප වරණය, මධ්‍යාහ්න කාලයෙහි සතර පැත්තෙන් ගිනිගොඩවල් සතරක් කොට ගෙන ඒ මැදට වී ගිනි ගොඩවල් සතරින් හා අව්වෙන් කෙලෙසුන් තැවීම.

**පඤ්චධා** අ-පස් පරිද්දෙකින්, පස් ආකාරය කින්.

**පඤ්චන.** පු-පස්වැනියා, පහ සම්පූර්ණකරන්නා

**පඤ්චදසී.** ඉ-පසළොස පුරවන්නී, පසළොස් වක් තිථිය.

**පඤ්චනීචකුල.** න-පහත්කුල පස

**පඤ්චනෙත්ත.** පු-පඤ්චප්‍රකාර ඇස් ඇත්තා, පසැස්, බුදුරජ.

**පඤ්චම.** පු-පස්වැනි, පස්වන, එනම් ස්වරය.

**පඤ්චමක.** පු-පස්වැනිය, පහ පුරවන්නා.

(14495)

**පඤ්චමහාපරිච්චාග**. පු-ධන, පුත්‍ර, දාරා, රාජ්‍ය, ශරීරඞ්ග, යන, මහත් පරිත්‍යාග පස

**පඤ්චමාර**. පු-කිලෙස, ඛන්ධ, අභිසංඛාර, දෙවපුත්තමච්චු, යන පස්දෙන, පස්මරු

**පඤ්චවිධ**. පු-පඤ්චප්‍රකාර, පස් පරිදි,

**පඤ්චවිධබීජ**. න-මූලබීජ, ඛන්ධබීජ, අග්ගබීජ, ඵලුබීජ, බීජ බීජ, යන පස

**පඤ්චවොකාරභව**. පු-පඤ්චස්කන්ධයෙන් යුත් භවය, කාමරූප භවයන්ගෙන් එක් කොටසක්.

**පඤ්චසර**. පු-සැරපසක් ඇත්තා, අනංගයා.

**පඤ්චසාඛ**. පු-අතුපසක් ඇති, අත.

**පඤ්චසො**. අ-පසක් බැගින්, පස්පරිද්දෙකින්.

**පඤ්චස්ස**. පු-සිංහයා.

**පඤ්චසිඛ**. පු-සිඛාපසක් ඇති දෙවියා, දෙව ගන්ධබ්බයෙක්, පංසිලුදෙවියා

**පඤ්චසීල**. න-ප්‍රාණඝාතාදි පස්පවින් වෙන්වී රකින සීලය, පන්සිල්.

**පඤ්චාල**. පු-එනම් ජනපදය, පඤ්චාල රාජ්‍යය

**පඤ්චාඞ්ගුල**. න-එරඬුගස.

**පඤ්චාභිඤ්ඤා**. ඉ-අභිඤ්ඤාපස, ඉද්ධිවිධ, දිබ්බසොත, පරචිත්තවිජානන, පුබ්බෙනිවාසානුස්සති, දිබ්බචක්ඛු යන පස.

**පඤ්චාලිකා**. ඉ-පෙනහැල්ල.

**පඤ්චින්ද්‍රිය**, ඉ-සද්ධින්ද්‍රියාදි පස, චක්ඛුන්ද්‍රියාදි පස.

**පඤ්චුපාදානක්ඛන්ධ**. පු-උපාදානුස්කන්ධ පංච-කය, කෙලෙස් සහිත රූපාදි ස්කන්ධ පස.

**පඤ්චොරම්භාගිය සංයොජන**. න-ඔරයයි කියනලද කාමධාතුව භජනය කරණ බන්ධන පස, විචිකිච්ඡා, ආදි පස.

**පඤ්ජ** න-ගොඩ, සමූහය.

**පඤ්ජර**. පු-හස්තියා, ඇතා, කූඩුව.

**පඤ්ජලි**. ඉ-නමස්කාරය, වැඳීම.

**පඤ්ජලික**. පු-නමස්කාර කරන්නා.

**පඤ්ජස**. ති-කෙළින්, නියම ලෙස.

**පඤ්ඤ**. පු=ප්‍රාඥයා, පණ්ඩිතයා.

**පඤ්ඤත්ත**. ති-පනවනලද, ව්‍යවස්ථාපිත.

**පඤ්ඤත්ති**. ඉ-ප්‍රඥප්තිය, ව්‍යවහාරය, පැණවීම, ප්‍රකාශය, අසත්තවුන්ගේ සිත් නොයෙක් ආකාරයෙන් විසිතුරු කොට සොම්නස ඉපදවීමෙන් නිපුණකොට දෙසීම.

**පඤ්ඤත්තිපථ**. පු-ප්‍රඥප්ති මාර්ගය, පැණවීම් මග.

**පඤ්ඤවන්තු**. පු-ප්‍රඥා ඇත්තා, නුවණ ඇත්තා.

**පඤ්ඤා**. ඉ-ප්‍රඥාව, පැණ, නුවණ.

**පඤ්ඤාණ**. න-ප්‍රඥාව, චිහ්නය, බුද්ධිය.

**පඤ්ඤාත**. ති-ප්‍රසිද්ධ, පණවන ලද.

**පඤ්ඤාපක**. පු-පනවන්නා

**පඤ්ඤාපණ**. න-පැනවීම, ප්‍රඥප්තිය.

**පඤ්ඤාපභෙද**. පු-ප්‍රඥාපභෙදය.

**පඤ්ඤාපිත**. ති-පණවන ලද.

**පඤ්ඤාපෙති**. ක්‍රි-(d. භූ ඤා. අවබොධනෙ, අවබොධ කිරීමෙහි, ප + ඤා + ණපෙ + ති) පණවයි, සම්මත කරයි.

**පඤ්ඤායති**. ක්‍රි-(d. භූ. ඤා, අවබොධනෙ, අව-බොධකිරීමෙහි, (ප + ඤා + ය + ති) පෙණෙයි. පණවයි.

**පඤ්ඤාවිමුත්ති**. ඉ-ප්‍රඥාවිමුක්තිය, ප්‍රඥාවකරණ කොට ගෙන මිදීම.

**පඤ්ඤින්ද්‍රිය**. න-ප්‍රඥෙන්ද්‍රියය.

**පඤ්හ**. ති-ප්‍රශ්නය, පැණ.

**පඤ්හ**. d. භූ-පඤ්හෙ, විචාරීමෙහි, පඤ්හති. විචාරයි.

**පඤ්හ**. d. භූ-කාමෙ. කැමෙත්තෙහි, පඤ්හති. කැමතිවෙයි.

**පඤ්හිපණ්ණි**. ඉ-අස්වැන්න.

**පට**. d. චු-කථනෙ. කීමෙහි, පාටෙති; පාටයති, කියයි.

**පට**. d. භූ-ගමනෙ. යාමෙහි, පටති, යෙයි.

**පට**. d. චු. ගන්ථෙ. ග්‍රන්ථයෙහි, පටෙති. පටයති. හදුරයි, ග්‍රන්ථය කරයි.

**පට**. න-වස්ත්‍රය, ඇඳුම, රෙද්ද.

**පටග්ගි**. පු-ප්‍රතිගින්න, ලැව්ගින්නක් ඇතිවී දා ගෙනයන කල ඊට විරුද්ධ පැත්තේ සිට, ඒ දිසාවට දාගෙන යාමට ගිනිදීම.

**පටඞ්ග**. පු-පළඟැටියා.

(14544)

**පටල.** න-සමූහය, වලාපටල, අක්‍ෂිපටලාදිය.

**පටලිකා.** ඉ-සණවූ මල් ඇති එළුලොම් මුව ඇතිරිය.

**පටහ.** පු-උඩැක්කියයි ප්‍රසිඞ තූය්‍ය විශෙෂය.

**පටාකා.** න-පතාකාව, ධවජ විශෙෂයක්.

**පටි.** අ-විරුඬ, පිපිපස, පමණ, සඳහා.

**පටික.** න-එළුලොම් මුවා සුදු ඇතිරිය.

**පටිකඞ්ඛති.** ක්‍රි-(d. භූ. කඞ්ඛ, ඉච්ඡායං, කැමැත්තෙහි, පති+කඞ්ඛ+ති) කැමැති වෙයි, ආශාවෙයි.

**පටිකථා.** ඉ-ප්‍රතිකථාව, උත්තර කථාව.

**පටිකණ්ට.** පු-වෛරයට ප්‍රතිවෛර කිරීම.

**පටිකත.** ති-ප්‍රතිකත, විරුඬව කළ.

**පටිකති.** ඉ-ප්‍රතිමාරූපය.

**පටිකම්ම.** න-ප්‍රතිකර්මය, පිළියම.

**පටිකර.** පු-ප්‍රතිකාරය.

**පටිකරණ.** න-කරණලද්දක් වෙනුවට තමා විසින්ද එසේ කටයුතු කිරිය.

**පටිකරොති.** ක්‍රි-(d. භූ. කර, කරණෙ, කිරීමෙහි, පටි+කර+ඔ+ති) ප්‍රතික්‍රියා කරයි. පටිකරණය කරයි.

**පටිකසන.** න-ඇදීම, ආපසු ඇදීම.

**පටිකසති.** ක්‍රි-(d. භූ. කස්ස, ගතියං ඇදීමෙහි පටි+කස+ති) ආපසු අදියි, අදියි.

**පටිකා.** ඉ-සුදු එළු ලොම් ඇතිරිය.

**පටිකාර.** පු-ප්‍රතිකාරය.

**පටිකිට්ඨ.** පු-පිළිකුළ.

**පටිකාෂික.** ති-හරිගැස්සීම් සහිත, නිදෙස් කිරීම් සහිත.

**පටිකිබ්බිස.** න-ප්‍රතික්‍රියා වශයෙන් වැරදිකිරීම.

**පටිකිරති.** ක්‍රි-(d. භූ. කිර, විකිරණෙ, විසුරුවීමෙහි, පටි+කිර+ති) විසුරුවයි, වගුරුවයි.

**පටිකිලිට්ඨ.** ති-පිළිකුල්.

**පටිකුජ්ඣති.** ක්‍රි-(d. දි. කුධ, කොපෙ, කිපීමෙහි+ති) වසයි, මුව යටිකර තබයි.

**පටිකුජ්ජණ.** න-වැසීම, මූවයටිකර තැබීම.

**පටිකුජ්ජිත.** ති-වසනලද, යටිමූවකර තබන ලද.

**පටිකුජ්ඣති.** ක්‍රි-(d. දි. කුධ, කොපෙ, කිපීමෙහි පටි+කුධ+ති) කිපෙයි, කෝපකරයි.

**පටිකුජ්ඣන.** න-කිපීම.

**පටිකුටති.** ක්‍රි-(d. දි. කුට, ආදනෙ, ගැනීමෙහි +ති) නැමෙයි, හැරෙයි.

**පටිකූළ.** ති-පතික්කූල, පිළිකුළ.

**පටිකුණ්ඨිත.** ති-වටකළ, වැසූ.

**පටිකුත්තක.** පු-කුරුළු වර්ගයක්.

**පටිකුබ්බර.** පු-වියගහ, බෝංලීය.

**පටික්කූල්‍යතා.** ඉ-පිළිකුල් බව.

**පටිකූට.** පු-ප්‍රතික්‍රියා වශයෙන් රැවටීම.

**පටිකූලතා.** ඉ-පිලිකුල් බව.

**පටිකෙලනා.** ඉ-ප්‍රතිවිරුඬ ක්‍රීඩා කිරීම.

**පටිකොටෙති.** ක්‍රි-(d. භූ. කුට, ආදනෙ, ගැනීමෙහි + ණෙ + ති = පති + කුට + ති) නමයි, වලක්වයි.

**පටික්කන්ත.** පු-බැහැර ගිය.

**පටික්කන්තක.** පු-බැහැරගිය තැනැත්තා.

**පටික්කම.** පු-ආපසු යාම, පස්සට යාම.

**පටික්කමති.** ක්‍රි-(d. භූ. කමු පදවික්ඛෙපෙ, යෑමෙහි+ති=පටි+කමු+ති) පස්සට යෙයි, ආපසුයෙයි.

**පටික්කමන.** න-පස්සට යාම, ආපසු යාම. ආසනශාලාව.

**පටික්කූල.** න-පිළිකුළ, ප්‍රතිකූලය.

**පටික්කූලමනසිකාර.** පු-පිළිකුල් වශයෙන් මෙනෙහි කිරීම.

**පටික්කොසති.** ක්‍රි-(d. භූ. කුස, අක්කොසෙ, ආක්‍රොෂ කිරීමෙහි=පටි + කුස + ඔ + ති) ආක්‍රොශකරයි, නිගාකරයි.

**පටික්කොසන.** න-නිගාකිරීම, ආක්‍රොශකිරීම.

**පටික්කොසිත.** ති-පෙරලා ආක්‍රොශකළ.

**පටික්ඛමාපෙති.** ක්‍රි-(d. භූ. ඛමු-ඛන්තියං, ක්‍ෂාන්තියෙහි, +ණපෙ+ති) ක්‍ෂමාකරවයි.

**පටික්ඛිත්ත.** ති-ප්‍රතික්‍ෂෙපකළ, එපාකළ.

**පටික්ඛිපන.** න-ප්‍රතික්‍ෂෙප කිරීම.

**පටික්ඛිපති.** ක්‍රි-(d. භූ. ඛිප, ඛෙපනෙ, ක්‍ෂෙපන යෙහි, පටි+ඛිප+ති) ප්‍රතික්‍ෂෙප කරයි.

(14597)

**පටිග්ගහා**. පු-ප්‍රතිග්‍රහණය, පිලිගැන්ම, පිලි-ගන්නා බඳුන, පඩික්කම.

**පටිග්ගහන.** න-ප්‍රතිග්‍රහනය කිරීම, පිළිගැනීම.

**පටිග්ගහනක**. පු-ප්‍රතිග්‍රාහකයා, පිලිගන්නා තැනැත්තා.

**පටිග්ගහිත.** ති-ප්‍රතිග්‍රහණයකළ, පිළිගත්.

**පටිග්ගණ්හාති.** ක්‍රි-(d. භූ. ගහ, උපාදානෙ, ගැනීමෙහි පටි+ගහ+ණ්හ+ති) පිළිගනී, ප්‍රතිග්‍රහණය කරයි.

**පටිග්ගණ්හිය.** අ-පිළිගෙණ, ප්‍රතිග්‍රහණය කොට.

**පටිග්ගාහක**. පු-පිලිගන්නා අය, ප්‍රතිග්‍රාහ-කයෝ.

**පටිගච්ච.** අ-ප්‍රථමකොට, පළමුකොට.

**පටිගායති.** ක්‍රි-(d. භූ. ගෙ, සද්දෙ, ශබ්දකිරී මෙහි+ති) ප්‍රතිගායනා කරයි, නැවත ගායනා කරයි.

**පටිගිජ්ඣ.** ති-ගිජුවීම, ලොල්වූ, ලොල්වීම.

**පටිගුහති.** ක්‍රි-(d. භූ. ගුහු, සංවරණෙ, සංවරණයෙහි+ති =පටි+ගුහ+ති) වසයි, ඡාදනයකරයි.

**පටිගුහන.** න-ප්‍රතිගුහණය, වැසීම.

**පටිඝ.** පු. න-ප්‍රතිඝය, ක්‍රොධය, වෛෂය, හිංසනය.

**පටිඝාත.** ති-නැසීම, මැරීම, විනාශ කිරීම.

**පටිඝොෂ.** පු-ප්‍රතිරාවය, ප්‍රතිඝොෂය, පිළිරැව්.

**පටිච්ච.** අ-පිණිස, සඳහා.

**පටිචරති.** ක්‍රි-(d. භූ. චර, චරණෙ, හැසිරීමෙහි +ති) හැසිරෙයි.

**පටිච්චසමුප්පන්න.** ති-ප්‍රත්‍යයෙන් නිපන්.

**පටිච්චසමුප්පාද.** පු-ප්‍රතීත්‍යසමුප්පාදය.

**පටිචරණ.** න ප්‍රතිචරණය, නැවත, නැවත හැසිරීම.

**පටිචාර.** න-යෑම, ගමනාගමනය, ආශ්‍රය.

**පටිචොදන.** න-පෙරලා චොදනා කිරීම.

**පටිචොදෙති.** ක්‍රි-(d. චු. ඉද, සංචොදනෙ, චොදනා කිරීමෙහි+ති) පෙරලා චොදනා කරයි. ප්‍රතිචොදනා කරයි.

**පටිච්ඡක.** පු-ප්‍රතිග්‍රාහකයා, පිලිගන්නා තැනැත්තා.

**පටිච්ඡති.** ක්‍රි-(d. චු. ඉසු, ඉච්ඡායං, කැමැත්තෙහි+ති) පිලිගනී, භාරගනී.

**පටිච්ඡන්න.** පු-ප්‍රතිච්ඡන්න, වැසුණු.

**පටිච්ඡාද.** පු-වැසීම.

**පටිච්ඡාදක.** පු-වසන්නා, සාධකයා.

**පටිච්ඡාදන.** න-වැසීම, ආවරණය.

**පටිච්ඡාදනීය.** න-මාංස රසය, වැසිය යුත්ත.

**පටිච්ඡාදිත.** ති-වසන ලද, වැසූ

**පටිච්ඡාදෙති.** ක්‍රි-(d. භූ-ඡද, සංවරණෙ, වැසීමෙහි+ණෙ+ති, පටි+ඡාද+නෙ+ති) ප්‍රතිච්ඡාදනය කරයි, වසයි.

**පටිච්ඡිත.** ති-පිළිගත්, ප්‍රතිග්‍රාහක.

**පටිජග්ගති.** ක්‍රි-(d. භූ. ජග්ග, ජග්ගනෙ, පොෂණය කිරීමෙහි+ති පටි+ජග්ග+ති) ප්‍රතිජග්ගණය කරයි, අළුත්වැඩියා කරයි.

**පටිජග්ගණ.** න-අළුත්වැඩියාකිරිම, සුඩකිරීම, පිළිදුගුම.

**පටිජග්ගණක.** පු-පිළිදුගුම් කරන්නා.

**පටිජග්ගාපෙති.** ක්‍රි (d භූ-ජග්ග, ජග්ගණෙ, පිළිදුගුමෙහි + ණෙ+ති පටි+ජග්ග+ණ+පෙ+ති) පිළිදුගුම් කරවයි.

**පටිජග්ගික.** පු-ප්‍රතිජග්‍රහණය කරණ තැනැත්තා, පොෂණය කරන්නා,

**පටිජග්ගිත.** ති-පිළිදුගුම් කළ

**පටිජග්ගිය.** පු-ප්‍රතිජග්ගණය කටයුතු, පිළිදුගිය යුතු.

**පටිජාගර.** න-නිදි දුරුකිරීම, නිදි මැරීම.

**පටිජාගර උපොසථ.** පු-ප්‍රතිජාගරණ, උපොසථය.

**පටිජානාති.** ක්‍රි. (d. භූ-ඤා, අවබොධනෙ, අවබොධයෙහි+ති, පටි+ඤා+ති) දනී

**පටිඤ්ඤා.** ඉ-ප්‍රතිඥාව, පොරොන්දුව, පිළිණ, ගිවිසීම.

**පටිඤ්ඤාත.** ති-ප්‍රතිඥකළ, පොරොන්දුවන ලද.

**පටිදණ්ඩ.** පු-දඬුවම, ප්‍රතිදණ්ඩනය.

**පටිදදති.** ක්‍රි - (d. භූ. දද් මෙහි + ති) පෙරළා දෙයි, දානය කරයි.

**පටිදස්සති.** ක්‍රි (d. දිය, පෙක්ඛණෙ, බැලීමෙහි ති + ) දක්වයි.

**පටිදාන.** න-ප්‍රතිදානය, දුන්දෙය අනුවදීම

**පටිදිස්සති.** ක්‍රි. (d. භූ-දිය, පෙක්ඛණෙ, බැලී මෙහි + ති) දකියි.

**පටිදෙසෙති.** ක්‍රි. (d. දෙසු, අබ්‍යත්තසද්දෙ, ශබ්දකිරීමෙහි + ණෙ + ති) දෙසයි.

**පටිධාවති.** ක්‍රි - (d. භූ. ධවු, ගතියං යෑමෙහි + ති) ආපසු දුවයි.

**පටිනන්දති.** ක්‍රි (d. භූ. නන්ද, නන්දනෙ, සතුටු වීමෙහි + ති)සතුටුවෙයි.

**පටිනන්දන.** න-නැවත නැවත සතුටුවීම

**පටිනන්දිත.** ති-සතුටුවනලද, ප්‍රීතිවනලද.

**පටිනාසිකා.** ඉ-කෘත්‍රිම නාසිකාව, බොරු නාසය.

**පටිනිජ්ඣත්ත.** පු-දුරලීම, බැහැරකිරීම.

**පටිනිද්දෙස.** පු - නිර්දේශයාගේ විස්තර, නිර්-දේශය.

**පටිනිවත්තති.** ක්‍රි - (d. භූ. වතු, වත්තනෙ, පැවැත්මෙහි + නී + වතු + ති) නවතියි.

**පටිනිවාසන.** න-හැඳතිබූ නිවාසනය.

**පටිනිස්සග්ග** පු-දුරලීම, බැහැර කිරීම.

**පටිනිස්සජති.** ක්‍රි - (d. භූ සජ, සංසග්ගාදිසු, සංසර්ගාදියෙහි + ති)(පටි + නි + සජ + ති) බැහැර කරයි, දමයි, ඉවත දමයි.

**පටිනිස්සට්ඨ.** ති-දුරුකළ, බැහැර කළ.

**පටිනිස්සරති.** ක්‍රි - (d. භූ. සර, ගතියං යෑමෙහි, පටි + නි + සර + ති) බැහැරයෙයි, නිදහස් වෙයි.

**පටිනෙති.** ක්‍රි - (d. භූ. නී, නයෙ, පැමිණ වීමෙහි + ණෙ + ති) පමුණුවයි.

**පටිපක්ඛ.** පු-විරුඩ, සතුරු.

**පටිපක්ඛික.** පු - විරුඩ පක්ෂයට අයත් තැනැත්තා.

**පටිපජ්ජති.** ක්‍රි - (d. භූ. පද, ගතියං, යෑමෙහි + ති, පටි + පද + ඉජ්ජ + ති) පිළිපදියි.

**පටිපජ්ජන.** න-බැහැර කිරීම, අත්හැරීම.

**පටිපනාමෙති.** ක්‍රි - (d. භූ. නම, නමනෙ, නැමීමෙහි + ණ, + ති) නමයි.

**පටිපණ්ණ.** න-ප්‍රතිශාසනය, පිළිහසුන.

**පටිපණ්ණ.** ති-පැමිණි, පිළිපන්.

**පටිපණ්ණක.** පු-පැමිණි තැනැත්තා.

**පටිපත්ති.** ඉ-ප්‍රතිපත්තිය, පිළිපැදීම.

**පටිපථ.** පු-ඉදිරිමාගීය.

**පටිපදා.** ඉ-ප්‍රතිපදාව.

**පටිපරිවත්තෙති.** ක්‍රි-(d. භූ. වතු, වත්තනෙ, පැවැත්මෙහි + ණෙ + ති) පෙරළයි, පරිවර්ත-ණය කරයි.

**පටිපවිසති.** ක්‍රි - (d. භූ. විස, පවෙසනෙ, පිවිසීමෙහි + පටි + ප + විස + ති) ප්‍රවෙශ වෙයි, ඇතුළත් කරයි.

**පටිපසංසති.** ක්‍රි - (d. භූ. සංස, පසංසනෙ, පැසසීමෙහි + ති) පසසයි, ප්‍රසංසා කරයි.

**පටිපහිණති.** ක්‍රි - (d. චු. පහ, පෙසනෙ, යැවීමෙහි + ණ + ති) ආපසු යවයි.

**පටිපාටි.** ඉ-පිළිවෙළ, අනුක්‍රමය.

**පටිපාකතික.** ති-ප්‍රකෘතිමත් කළ, නැවත සෑදූ.

**පටිපාද.** පු-පිළියෙළ, සකස්කිරීම.

**පටිපාදන.** න-ප්‍රතිපාදනය, පිළියෙළ කිරීම.

**පටිපාදිත.** ති-ප්‍රතිපාදනයකළ, පිළියෙළකළ.

**පටිපිණ්ඩ.** පු-ප්‍රතිපිණ්ඩය, පිඩු දීම හා ගැණීම.

**පටිපීළන.** න-පීඩණය, මිරිකීම.

**පටිපීළිත.** ති-පීඩා කළ, හිරිහැර කළ.

**පටිපුච්ඡා.** ඉ-ප්‍රතිපුච්ඡාව, පිළිවිසීම, විචාරීම.

**පටිපුග්ගල.** පු-සමාන පුද්ගලයා.

**පටිපුග්ගලික.** පු-පුද්ගලයන්ට අයිති, පුද්ගල සන්තක.

**පටිපුච්ඡති.** ක්‍රි - (d. භූ. පුච්ඡ, පුච්ඡනෙ, විචාරීමෙහි + ති) විචාරයි, පිළිවිසියි.

**පටිපුරිස.** පු-ප්‍රතිපුරුෂයා, සමාන පුරුෂයා.

**පටිපූජන.** න-පිදීම, පූජාව.

**පටිපූජිත.** ති-පුදනලද, පූජාකළ.

**පටිපූජෙති.** ක්‍රි - (d. භූ. පූජ, පූජනෙ, පිදීමෙහි + ණෙ + ති) පුදයි, පූජාකරයි.

**පටිපෙසන.** න-ආපසු යැවීම.

**පටිපෙසිත.** ති-ආපසු යවනලද.

**පටිපෙසෙති.** ක්‍රි-(d. භූ. පෙස, පෙසනෙ, යැවීමෙහි + ණෙ + ති) පෙරලා යවයි.

**පටිපණාමිත.** ති-නමන ලද.

**පටිපණාමෙති.** ක්‍රි-(d භූ. නම, නමනෙ, නැමීමෙහි + ණෙ + ති) නමවයි.

**පටිප්පස්සම්භති.** ක්‍රි-(d. භූ. සම්භු, හිංසායං, හිංසාවෙහි + පටි + ප + සම්භු + ති) බර ඇරෙයි.

**පටිප්පස්සම්භන.** න-බර ඇරීම, කෙලෙස් බර හැරීම.

**පටිපස්සද්ධ.** ති-බර අරින ලද, කෙලෙස් බර හරින ලද.

**පටිප්පස්සද්ධි විමුත්ති.** ඉ-ප්‍රතිපපසද්ධ විමුක්තිය.

**පටිප්පස්සද්ධි.** ති-බර ඇරුණු කෙලෙස් බරින් බිදුණු

**පටිප්පහරති.** ක්‍රි-(d. භූ. හර, හරණෙ, හැරීමෙහි + පටි + ප + හර + ති) ගසයි, පෙරලා ගසයි.

**පටිබද්ධ.** ති-පිළිබඳ, ප්‍රතිබද්ධ.

**පටිබන්ධ.** පු-පිළිබඳ, බඳනාලද.

**පටිබල.** න-ප්‍රතිබල, පොහොසත්, ශක්ති සම්පන්න.

**පටිබාහන.** න-ප්‍රතිබාහණය, වැළැක්වීම.

**පටිබාහිය.** පු-ප්‍රතිබාහණය කටයුතු, නැවැත්වියයුතු.

**පටිබාහිර.** න-බැහැර, ඉවත.

**පටිබාල්හ.** ති-දැඩි, තියුණු.

**පටිබිම්බ.** පු-ප්‍රතිබිම්බය, පිළිබිඹ, ඡායාරූපය, පතිරූපය.

**පටිබුජ්ඣති.** ක්‍රි-(d. භූ. බුධ, බොධනෙ, අවබොධයෙහි + ති) (පටි + බුධ + ති) අවබොධ කරයි.

**පටිබුජ්ඣන.** න-අවබොධකිරීම.

**පටිබුද්ධ.** ති අවබොධකළ, ප්‍රතිවෙධකළ.

**පටිබාහති.** ක්‍රි-(d. භූ. බාහ, නිවාරණෙ, වැළැක්මෙහි + ති,) ප්‍රතිබාහණය කරයි. වළක්වයි.

**පටිබොධ.** පු-අවබොධය.

**පටිභය.** පු-ප්‍රතිභය, භය, භයානක.

**පටිභාග.** පු-ප්‍රතිභාග, සමාන.

**පටිභාගක්ඛ.** පු-ප්‍රතිභාගාඛ්‍යය.

**පටිභාති.** ක්‍රි-(d භූ. භා. දිත්තියං, දීප්තියෙහි + ති) වැටහෙයි. දූනෙයි.

**පටිභාන.** න-වැටහීම, ඥාණය, එළඹ සිටි වචනය, අවබොධය.

**පටිභානවන්තු.** පු-ප්‍රතිභාණ ඇත්තා, වැටහීම ඇත්තා.

**පටිභාණෙය්‍ය.** පු-වැටහීම ඇත්තා.

**පටිභාසති.** ක්‍රි-(d භූ. භාස, භාසනෙ, කීමෙහි + ති) කියයි, ප්‍රකාශ කරයි.

**පටිභාසන.** න-කීම, කථනය.

**පටිභායුත්ත.** ති-බුහුටි.

**පටිභූ.** න-ප්‍රතිභූ, ඇපය.

**පටිමග්ග.** පු-ප්‍රතිමාර්ගය, ඉදිරිමඟ.

**පටිමණ්ඩන.** න-සැරසීම.

**පටිමණ්ඩිත.** න-ප්‍රතිමණ්ඩිත, සැරසෙන ලද.

**පටිමන්නෙති.** ක්‍රි-(d. භූ. මන්ත, මන්තනෙ, මන්තනයෙහි + ණෙ + ති) නිමන්ත්‍රණය කරයි, පවරයි.

**පටිමල්ල.** පු-ප්‍රතිමල්ල, විරුද්ධ.

**පටිමසති.** ක්‍රි-(d. භූ. මස, ආමසනෙ, ආමර්ශනයෙහි + ති) පරාමර්ශනය කරයි, ස්පර්ශ කරයි.

**පටිමා.** ඉ-ප්‍රතිමාව, පිළිබිඹුව.

**පටිමානිත.** පු-පුදන ලද.

**පටිමානෙති.** ක්‍රි-(d. භූ. මාන, මානනෙ, පිදීමෙහි + ණෙති) පුදයි, පූජාකරයි.

**පටිමුක්ක.** ති-යුද්ධයෙහි දැඩිකොට ඇඳගත් වස්ත්‍රාදිය පැළඳීම.

**පටිමුඛ.** පු-ප්‍රතිමුඛය, ඉවත මුව හරවා ගැනීම.

**පටිමුඤ්චති.** ක්‍රි-(d. භූ. මුඤ්ච, මුඤ්චනෙ, මිදීමෙහි + ති) මුදයි.

**පටිමුඤ්චන.** න-මිදීම.

**පටිමුඤ්චිත.** ති-මුදන ලද, නිදහස් කරණලද,

**පටිමුත්ත.** ති-මුදන ලද.

**පටිමොක්ඛ.** පු-මිදීම, මොචනය.

**පටියත්ත.** ති-පිළියෙළ කළ.

**පටියාති.** ක්‍රි-(d. භූ. යා, ගමනෙ, ගමන්හි + ති) ආපසුයයි.

**පටියාදපන.** න-පිළියෙල කිරීම, සකස්කිරීම.

**පටියාදිත.** ති-පාවාදෙන ලද, පිළියෙළ කළ,

**පටියාදෙති.** ක්‍රි-(d. භූ. දා, දානෙ, දීමෙහි + ණෙ + ති) පිළියෙල කරයි, සකස් කරයි.

**පටිරව.** පු-ප්‍රතිරාවය, පිළිරැව්.

**පටිරාජ.** පු-විරුද්ධ රජු, සතුරු රජ.

**පටිරූප.** න-ප්‍රතිරූපය, සමාන රූපය.

**පටිරොස.** පු-රෝසය, ක්‍රොධය.

**පටිරොසති.** ක්‍රි-(d. දි. රුස, හිංසායං, හිංසාවෙහි + ති) පෙරළා හිංසා කරයි, පෙරළා කිපෙයි.

**පටිරොසන.** න-කිපීම, තරහවීම.

**පටිලභති.** ක්‍රි-(d. භූ ලභ, ලාභෙ, ලැබීමෙහි + ති) ලබයි.

**පටිලාභ.** පු-ප්‍රතිලාභය, ලැබීම

**පටිලාභක.** පු-ලබන්නා.

**පටිලීන.** න-සැඟවීම, ගුප්තව තිබීම.

**පටිලියති.** ක්‍රි-(d. කි ලී, සිලෙසනෙ + ති) සැඟවෙයි.

**පටිලොම.** න-පිළිලෝම්, ප්‍රතිලොම, විරුද්ධ.

**පටිලොමපක්ඛ.** පු - ප්‍රතිලොමාර්ථය, ප්‍රතිපක්ෂාර්ථය.

**පටිලොමෙති** ක්‍රි-(d. කි. ලූ, ඡෙදනෙ, සිඳීමෙහි + ණෙ + ති) ප්‍රතිලොම කෙරෙයි.

**පටිවචන.** න-පිළිවදන්දීම, ප්‍රතිවචනය.

**පටිවජ්ජන.** න-දුරු කිරීම, බැහැර කිරීම.

**පටිවදති.** ක්‍රි-(d. භූ. වද, වචනෙ. කීමෙහි + ති) පිළිවදන් කියයි.

**පටිවසති.** ක්‍රි-(d. භූ. වස, නිවාසෙ, වැසීමෙහි + ති) වාසය කෙරෙයි.

**පටිවාත.** පු-ප්‍රතිවාතය, උඩු සුළඟ.

**පටිවාද.** පු-ප්‍රතිවාදය, විරුද්ධ වාදය.

**පටිවාන.** න-සිඹවෙනවා.

**පටිවිංස.** පු-කොටස, භාගය.

**පටිවිංසක.** පු-සමීපවාසියා, අසල්වැසියා.

**පටිවිගච්ඡති.** ක්‍රි-(d. භූ. ගමු, ගතියං, යෑමෙහි + ති) වෙන්ව යෙයි.

**පටිවිචරණ.** න-හැසිරීම, සංචාරය.

**පටිවිචරති.** ක්‍රි-(d. භූ. චර, චරණෙ, හැසිරීමෙහි + ති) වෙන් වෙයි, වළකියි.

**පටිවිජානාති.** ක්‍රි - (d. භූ. ඤා. අවබොධෙ, අවබොධයෙහි + ති) දනී, දැනගනී.

**පටිවිජ්ඣ.** ක්‍රි-ප්‍රතිවෙධ කරව.

**පටිවිජ්ඣති.** ක්‍රි-(d. භූ. ඣෙ, අජ්ඣයනෙ, ඉගෙණීමෙහි + ති) ප්‍රතිවෙධ කරයි. අවබෝධ කරයි.

**පටිවිජ්ඣන.** න-ප්‍රතිවෙධය, අවබොධය.

**පටිවිජ්ඣනක.** පු-අවබෝධ කරන්නා, ප්‍රතිවෙධ කරන්නා.

**පටිවිදිත.** ති-දන්නා ලද, දැනගත්.

**පටිවිද්ධ.** ති-ප්‍රතිවෙධ කළ, අවබෝධ කළ.

**පටිවිනය.** පු-හික්මීම, මනාව හික්මීම.

**පටිවිනය** න-යටත් කිරීම.

**පටිවිනීත.** ති-හික්මෙන ලද, ශික්ෂිත.

**පටිවිනෙති.** ක්‍රි-(d. භූ. නී, නයෙ, පැමිණවීමෙහි + ති) හික්මෙයි.

**පටිවිනොදන.** න-ප්‍රතිවිනෝදනය, සැනසීම.

**පටිවිනොදෙති.** ක්‍රි-(d. භූ නුද, පෙරණෙසු, සුණුකිරීමෙහි + ණෙ + ති) විනොදනය කරයි.

**පටිවිභත්ත.** පු-බෙදන ලද, කොටස් කළ.

**පටිවිභජති.** ක්‍රි-(d. භූ. භජ, භාගෙ, බෙදීමෙහි + ති) බෙදයි, කොටස් කරයි.

**පටිවිභජන.** න-බෙදීම, කොටස් කිරීම.

**පටිවිරත.** ති-වෙන්වූ, වෙන් වන ලද.

**පටිවිරති.** ඉ - පාපකර්මාදියෙන් විරමනය, විරතිය

**පටිවිරමණ.** න-වෙන්වීම, වැළැක්ම.

**පටිවිරුජ්ඣති.** ක්‍රි-(d. භූ රුධි, ආවරණෙ, ඇවිරීමෙහි + ති) විරුද්ධ වෙයි. ප්‍රතිවිරුද්ධ වෙයි.

**පටිවිරුද්ධ.** පු-විරුද්ධ වන ලද.

(14796)

**පටිවිරූහති.** ක්‍රි-(d. භූ. රූජ, ජම්මනි, ඉපදීමෙහි + ති) හටගනී, පසුව හටගත්.

**පටිවිරොධ.** පු-ප්‍රතිවිරොධය, විරුද්ධය.

**පටිවිස්සට්ඨ.** පු-හරණ ලද, පහකරණ ලද.

**පටිවෙක්ඛිය.** අ-ප්‍රත්‍යවෙක්ෂා කොට, පරීක්ෂා කොට.

**පටිවෙධ** පු-ප්‍රතිවෙධය, අවබොධය.

**පටිවෙධෙති.** ක්‍රි-(d. භූ. විධ, ඤාණෙ, ඤාණයෙහි + ණෙ + ති) ප්‍රතිවෙධ කරයි, අවබොධ කරයි.

**පටිවෙර.** න-ප්‍රතිවෛරය, වෛරයාට වෛර කිරීම.

**පටිසක්කණ.** න-ආපසු දිවීම.

**පටිසක්කති.** ක්‍රි-(d. භූ. සක්ක, ගතියං, යෑමෙහි + ති) ආපසු දුවයි.

**පටිසඞ්ඛරොති.** ක්‍රි-(d. භූ. කර, කරණෙ, කිරීමෙහි + ති) සකස් කෙරෙයි, අලුත්වැඩියා කෙරෙයි.

**පටිසඞ්ඛා.** ඉ-ප්‍රත්‍යවෙක්ෂා.

**පටිසඞ්ඛාත.** ති-ප්‍රත්‍යවෙක්ෂා කළ, පසක් කළ.

**පටිසඞ්ඛාන.** න - ප්‍රත්‍යවෙක්ෂාව, නැවත මෙනෙහි කිරීම.

**පටිසඞ්ඛාණ.** න-ප්‍රත්‍යවෙක්ෂා කිරීම.

**පටිසඞ්ඛාර.** පු-සැපදුක් පිළිබඳ කථාව, පිළිසඳරය

**පටිසඞ්ඛාරිත.** ති-අළුත්වැඩියා කළ.

**පටිසන්ධියුත්ත.** පු-ප්‍රතිසන්ධියුක්ත, යෙදුන, සමග පවතින.

**පටිසත්තු.** පු-හතුරා, සතුරා, ප්‍රතිසත්‍රා.

**පටිසන්ධි.** ඉ-ප්‍රතිසන්ධිය, පිළිසඳ.

**පටිසම්භිදා.** ඉ-ප්‍රතිසම්භිත්, පිළිසිඹියා, අත්ථ, ධම්ම, නිරුක්ති, ප්‍රතිභාණ යන සතර.

**පටිසංවික්ඛති** ක්‍රි - (d. භූ. චික්ඛ, වියත්තියං වාචායං, වියත් වචනයෙහි + ති) සිතයි, සලකා බලයි

**පටිසංවිදිත.** පු-දන්නාලද, අවබෝධකළ.

**පටිසංවෙදි.** පු - විඳින සුළු වූයේ, විඳින තැනැත්තේ.

**පටිසංවෙදෙති.** ක්‍රි - (d. භූ. විද, ඤාණෙ, දැනීමෙහි + ණෙ + ති) විඳියි.

**පටිසංහරති.** ක්‍රි - (d. භූ. හර, හරණෙ, හැරීමෙහි + ති) (පටි + සං + හර + ති) අකුළුවයි, අකුලයි.

**පටිසංහරණ.** න-හැකිළීම, ඇකිළීම.

**පටිස්සව.** පු-ප්‍රතිඥාව, ඇපය, ගිවිසීම.

**පටිසන්ථරති.** ක්‍රි - (d භූ. ථර, සන්ථරණෙ, ඇතිරීමෙහි + ති) අතුරයි, දිගහරියි, ඇතිරිලි ආදිය, අතුරයි.

**පටිසන්ථාර.** පු-ඇතිරීම.

**පටිසන්ථාරක.** පු-අතුරන්නා.

**පටිසරණ.** න-පිළිසරණ, පිහිට.

**පටිසරති.** ක්‍රි-(d. භූ. සර, සරණෙ, සිහිකිරීමෙහි + ති) සිහිකරයි, සමරණය කරයි.

**පටිසල්ලාන.** න-ඵලසමවත, ඵලසමාපත්තිය.

**පටිසල්ලීන.** න-ඵලසමාපත්තියට පැමිණීම.

**පටිසල්ලීයති.** ක්‍රි-(d. භූ. ලී, සිලෙසනෙ, ඇලීමෙහි + ති) ඵලසමාපත්තියෙන් යුක්තවෙයි.

**පටිසල්ලීයන.** න - ඵලසමාපත්තියෙන් යුත්.

**පටිසල්ලීයනා.** ඉ-එකඟවීම් බව.

**පටිසාමන.** න-තැන්පත්කර තැබීම.

**පටිසාමිත.** ති - තැම්පත් කළ, සැකසුරුවම් කළ.

**පටිසාමෙති.** ක්‍රි- (d. භූ. වෙකල්ලෙ, වෛකල්‍ය යෙහි + ණෙ + ති) තැන්පත් කෙරෙයි, සකස් කරතබයි.

**පටිසාර.** න-ආපසු යෑම, ඉගෙණීම.

**පටිසාරන.** න-ඇස්වීම, තේරුම්කරදීම.

**පටිසාරනීය.** පු-ගිහියන් කමාකරවා ගන්නා කර්මයක්.

**පටිසාරී.** ඉ - ආපසු යන්නී, ඉගෙනගන්නා තැනැත්තී.

**පටිස්සාවී.** පු-කීකරු තැනැත්තා, කැමැතිවන තැනැත්තා.

**පටිසාසන.** න-ප්‍රතිශාසනය, හසුනකට යවන උත්තර හසුන.

**පටිසෙධ.** පු-ප්‍රතිෂෙධ, වැලැක්ම.

(14843)

**පටිසෙධක.** පු - ප්‍රතිෂෙධ කරන්නා, වලක්-වන්නා.

**පටිසෙධති.** ක්‍රි - (d භූ. සිධ, ගතියං, යෑමෙහි + ති) ප්‍රතිෂෙධකරයි. වලක්වයි.

**පටිසෙධන.** න-ප්‍රතිෂෙධනය, වැලැක්වීම.

**පටිසෙනා.** ඉ-හතුරු සේනාව.

**පටිසෙනිකරක.** පු-හතුරුකම්කරන, විරුද්ධ කම්කරන.

**පටිසෙනි.** පු-හතුරා, අමිත්‍රයා.

**පටිසෙවති.** ක්‍රි-(d. භූ. සෙවු, සෙවනිත, සේව-නයෙහි + ති) සේවනය කරයි, ආශ්‍රය කරයි.

**පටිසෙවන.** න-සේවනය කිරීම, ආශ්‍රය කිරීම.

**පටිසෙවිත.** ති-සේවනයකළ, ආශ්‍රයකළ.

**පටිසොත.** පු-ප්‍රතිශොතය.

**පටිහත.** ති-නසනලද, විනාශකළ.

**පටිහනන.** න-නැසීම, මැරීම.

**පටිහරති.** ක්‍රි - (d භූ. හර, හරණෙ, හැරීමෙහි + ති) ගෙණයයි.

**පටිහාර.** පු-නැවත ගෙනයාම, වාරය, දෙරටු පාලයා.

**පටු.** ති-දක්‍ෂ, තීක්‍ෂණ, ඡෙක, රෝගමුක්තිය.

**පටෝල.** පු-දුම්මැල්ල, පතෝල.

**පට්ට.** න-ගල්ලෑල්ල, පිඟාන.

**පට්ටන.** න-පටුන්ගම, නගරය, වරාය.

**පට්ටි.** ඉ-රත්ලොත්.

**පට්ටිකා.** ඉ-රෙදිපටිය, සෑදලය.

**පඨපන.** න-තැබීම.

**පඨපණා.** ඉ-තැබීම.

**පඨපිත.** ති-තබන ලද, තැබූ.

**පඨාන.** න-ගමන, කාරණය, පිහිටුවීම, එනම් අභිධම් මහා ප්‍රකරණය.

**පඨාය.** අ-පටන්, තතොපඨාය, එතැන් පටන්.

**පඨ.** d. භූ. ව්‍යතෙන, වියත් බසෙහි, පඨති, හදාරයි, ඉගෙනගනී.

**පඨති.** ක්‍රි - (d. භූ. පඨ, වියතතියං, වාචායං, වියත් වචනයෙහි + ති) හදාරයි, ඉගෙන ගනියි.

**පඨන.** න-හැදෑරීම, උද්ග්‍රහණය.

**පඨම.** පු-පළමුවැනි, ප්‍රථම.

**පඨමජ්ඣාන.** න - පළමුවන ධ්‍යානය, ප්‍රථම ධ්‍යානය.

**පඨමා.** ඉ-ප්‍රථමා, පළමුවන තැනැත්තී.

**පඨමාවිජ්ජා.** ඉ-පළමුවන විද්‍යාව.

**පඨවි.** ඉ-පෘථිවිය, පොළොව.

**පඨවිකසින.** න-පෘථිවිය අරමුණුකොට වඩන කසිනය.

**පඨවිධාතු.** ඉ-පෘථිවි ධාතුව, පෘථිවිය.

**පඨීත.** ති-හදාළ, ඉගෙනගත්.

**පඩි.** d. භූ. ගතියං, යෑමෙහි, පණ්ඩති, හැඟීරු තැන්හි යෙයි.

**පඩි.** d. චු. නාසනෙ, නැසීමෙහි, පණ්ඩති, නසයි.

**පඩි.** d. චු. පරිහාසනෙ, දෙස්කීමෙහි, පණ්ඩති, දෙස් කියයි.

**පණ්ඩක.** පු - නපුංසකයා, ස්ත්‍රී-පුරුෂ නොවූ තැනැත්තා.

**පණ්ඩර.** පු-සුදුපැහැය, එනම් ඇත්කුලය.

**පණ්ඩව.** පු-රජගහනුවර පිහිටි එනම් පර්වතය.

**පණ්ඩිච්ච.** න-පණ්ඩිතබව, එනම් පාණ්ඩිත්‍යය.

**පණ්ඩිත.** පු-ප්‍රාඥයා, පණ්ඩිතයා.

**පණ්ඩිතක.** පු-පණ්ඩිතයෙක්මෙන් හඟවන්නා.

**පණ්ඩු.** පු-පඬුපැහැය, පඬුජනපදය.

**පණ්ඩුක.** පු-පඬුපැහැ ඇත්තා.

**පණ්ඩුකම්බල.** න-පඬුපැහැය ඇති කම්බිලිය.

**පණ්ඩුකම්බලසිලාසන.** න-ශක්‍රයාගේ පාණ්ඩු කම්බල ශෛලාසනය.

**පණ්ඩුපලාස.** පු - පැසුණු පත්‍රය, පැහිචච කොළය, ප්‍රව්‍රජ්‍යාපෙක්‍ෂව පාත්‍රා සිවුරු සැප-යෙනතුරු විහාරයෙහි වසන්නා.

**පණ්ඩුසීහ.** පු-දුඹුරුවණ් සිංහයා.

**පණ්ණ.** න-පත්‍රය, කොළය, ලියමන.

(14896)

**පණ්ණ.** d. චු. නීලෙ, නීල වර්ණයෙහි, පණ්ණෙති-පණ්ණයති, නිලවර්ණකරයි.

**පණ්ණක.** න-එළවළු, නිල් කොල ජාතිය.

**පණ්ණත්ති.** ඉ-ප්‍රඥප්තිය පැනවීම.

**පණ්ණත්තික.** පු-පනවන්නා.

**පණ්ණභාර.** පු-බහා තබන ලද බර.

**පණ්ණභිසි.** ඉ-පත්‍රවලින් කළ බිස්ස.

**පණ්ණරස.** පු-පසළොස, පසළොස්වක.

**පණ්ණරසී.** ති-පසළොස්වක, පසළොස්වක් තිථිය.

**පණ්ණසන්ථාර.** පු - පත් ඇතිරිය, කොල ඇතිරිල්ල.

**පණ්ණවික්කයසාලා.** ඉ-වෙළඳ බඩු විකුණන ශාලාව.

**පණ්ණසාලා.** ති-පණ්ණසාලාව, පන්සල.

**පණ්ණාකාර.** හුත් තැනට යවන පඬුර, තෑග්ග.

**පණ්හිකා.** ඉ-විළුඹ.

**පණ්හි.** ඉ-තෘෂ්ණාව, විළුඹ.

**පණ්ණික.** පු - මල් වෙළෙන්ද, එළවලු වෙළෙන්ද.

**පණ්‍යවීථිකා.** ඉ-සල්පිල, වෙළඳම් පොල, වෙළඳ වීථිය.

**පණ්ණ්‍යාපජීවී.** ව්‍යවහාරයෙන් ජීවත්වන්නා වෙළෙන්ද.

**පණ-d.** භූ. ගනුදෙනු කිරීමෙහි හෝ සතුති කිරීමෙහි පණති, සතුති කරයි

**පණ-d** චු. ගනුදෙනු කිරීමෙහි, පණෙති, පණයති, ගනුදෙනු කරයි.

**පණ.** න-වැටුප්, මිල, ධනය, ක්‍රය, වික්‍රය.

**පණක.** පු-සෙවෙල් විශෙෂයක්.

**පණමති.** ක්‍රි-(d. භූ. නම පදුනෙන, ගෞරව කිරීමෙහි + ති) (ප + ණම + ති) නමස්කාර කරයි. වඳියි.

**පණය.** පු-විස්වාසය, යාඥව, ස්නේහය.

**පණව.** පු-පණාබෙර, තුනීවූ මධ්‍ය ඇති බෙරය.

**පණාම.** පු-ප්‍රණාමය, නමස්කාරය.

**පණාමිත.** පු-ප්‍රණාමිත, නමස්කාර කළ.

**පණිධාන.** න-ප්‍රාර්ථනාව, පැතීම.

**පණාලි.** ඉ-ප්‍රණාලී, පීල්ල, සොරොච්ච.

**පණිධහති.** ක්‍රි-පිහිටුවයි. නිධාන් කෙරෙයි.

**පණිධි.** ඉ ප්‍රණිධිය, ප්‍රාර්ථනාව, වරපුරුෂයා.

**පණිපාත.** පු-ප්‍රණිපාතය, වැඳීම.

**පණිපාතික.** පු-ප්‍රණිපාත කළ, නමස්කාර කළ තැනැත්තා.

**පණිය.** ති-විකිණිය යුතු බඩු, වෙළඳ බඩු.

**පණිහිත.** ති-නිධන් කළ.

**පණීත.** න-ප්‍රණීත, මිහිරි, නිර්වාණය.

**පණීත.** ති-ප්‍රණීත, මධුර වස්තු, මිහිරි දෙය.

**පණීතක.** ති-ප්‍රණීත, මධුර, මිහිරි.

**පණීතධාතු.** ඉ-ප්‍රණීත ධාතුව, නව ලොකොත්තර ධර්මය.

**පණුන්න.** පු-බැහැරකළ, ප්‍රහීණ කළ.

**පණුදන.** න-කම්පාකිරීම, මහත් කොට චලනය කිරීම.

**පත්ත.** පු. න-පියාපත්, පත්‍ර, භොජන පාත්‍ර, පැමිණෙන ලද දෙය.

**පත්තක.** පු-පත්‍ර ඇති, කොළ ඇති.

**පත්ත කණ්ඩොලික.** පාත්‍රය දමන සැරියක්.

**පත්තකථවික.** න-පාත්‍රා පසිය.

**පත්තචීවර.** න-පාත්‍රා සිවුරු, පාසිවුරු

**පත්තක්ඛන්ධ.** කඳට හෙලන ලද හිස, බිම බලාගැන්ම.

**පත්තපුණ්ඩතන.** න-මළ අය, කළුරිය කළ තැනැත්තා.

**පත්තබ්බ.** ති-පැමිණිය යුතු දෙය

**පත්තපාණී.** පු-පක්ෂියා.

**පත්තමාළක.** පාත්‍රය තබන මැස්ස.

**පත්තයාන.** න-පියාපත් යානාව කොට ඇත්තා, පක්ෂියා.

**පත්තලි.** ඉ-වතු කැන්, කෙසෙල් කැන්.

**පත්තාධාර.** න-පාත්‍රාධාරය, පාත්‍රා අඩිය.

**පත්තාණීක.** න-කඩු ආදී ආයුධ ගත් පුරුෂයන්, සතර දෙනෙකුගෙන් යුත් සමූහය, ඇණිය.

**පත්තාල්හක.** පු - පත්‍රවලින් සාදන ලද නැලියෙන් වැලි ආදිය මැන කරණ ක්‍රීඩාව, පත්නැලියෙන් වැලි ආදිය මැන සෙල්ලම් කිරීම.

**පත්ති.** ඉ-ප්‍රාප්තිය, පැමිණීම, පාබල සෙනඟ, ගමන.

**පත්ති.** පු-වාරය, සෘධිකරණයෙහි කැමති තැනකට පැමිණීම.

**පත්තික.** පු-පාබල සේනාව.

**පත්තිකා.** ඉ-කොළය, පත්ඉරුව.

**පත්තිය.** පු-විශ්වාසය, ඇදහීම

**පත්තියායති.** ක්‍රි-(d. චු. පත, ගතියං, යැමෙහි + ති) විශ්වාස කරයි,

**පත්තීයති.** ක්‍රි-(d. භූ. පත, ගතියං, යැමෙහි + ඊ + ති) පාත්‍රයක් කැමතිවෙයි.

**පත්තුණ්ණ.** න-එනම් රටෙහිවූ පිළි, සේදූ පිළි.

**පත්තෙය්‍ය.** ති-ස්වාමියෙක් ලැබිය යුතු.

**පත්ථ.** d. චු-යාචනෙ, ඉල්වීමෙහි, පත්ථයති, ඉල්වයි.

**පත්ථ.** පු-නැලිය, පර්වතයාගේ එකපැත්තක්.

**පත්ථට.** පු-පතළ, ප්‍රසිඬ, පැතුරුණ.

**පත්ථද්ධ.** ති-ඉතා දැඩි, ඉතා තද.

**පත්ථර.** ති-පැතිරීම.

**පත්ථරති.** ක්‍රි-(d. චු. පත්ථ, යාචනෙ, ඉල්වීමෙහි + ති) පතුරුවයි, පැතිරෙයි.

**පත්ථයාන.** න-පැතීම, පතනය.

**පත්ථෙති.** ක්‍රි-(d. චු. පත්ථ, යාචනෙ, ඉල්වීමෙහි + ණේ + ති) පතයි.

**පත්ථාව.** පු - ප්‍රස්තාව, අවසථාව, කාලය, වේලාව.

**පත්ථිත.** න-ප්‍රාර්ථනාකළ, පතනලද.

**පත්ථින්න.** ති-තද, රළු, දැඩි.

**පත්ථිය.** පු-තෘෂ්ණාව, පැතියයුත්ත.

**පත්ථිව.** පාර්ථිව, රජදරුවා.

**පත.** d. භූ-ගමනෙ, යාමෙහි. පතති, පපතති, වැඩෙයි.

**පත.** d. චූ-ගතියං, යාමෙහි, පතෙති. පතයති, යෙයි.

**පතඞ්ග.** පු - පක්ෂියා, කුරුල්ලා, රත්රන්, පතගිරුක.

**පතන.** න-වැටීම, සීම.

**පතනක.** පු-වැටීම පතනය.

**පතත්ත.** න-පක්ෂිපත්‍ර, පිහාටු.

**පතගන.** පු-පක්ෂියා.

**පතති.** ක්‍රි-(d. භූ. ගතියං, යැමෙහි + ති) හෙයි වැටෙයි.

**පතරති.** ක්‍රි-(d. භූ. තර, තරණෙ, එතෙර වීමෙහි + ති, ප + තර + ති) එතරවෙයි. එගොඩවෙයි.

**පතාකා.** ඉ-පතාකය.

**පතාකිනී.** ඉ-බොහෝ පත්‍ර ඇති වැල.

**පතාප.** පු-ප්‍රතාප, කොෂජවූ තෙජස, දීප්තිමත් ශරීරප්ප්‍රභාව, අධිකව තැවීම, එනම් නිරය.

**පතාපන.** න-තැවීම, අධිකතැවීම.

**පතාපෙති.** ක්‍රි-(d. භූ. තප, තාපෙ, තැවීමෙහි + ණේ + ති, ප + තාපෙ + ති) තවයි, දවයි.

**පතායති.** ක්‍රි-(d. භූ. තය, ගතියං, යැමෙහි + ති) පතුරුවයි.

**පතාරන.** න-එතරවීම, එගොඩවීම.

**පතාරෙති.** ක්‍රි-(d. භූ. තර, තරණෙ, එතෙර කිරීමෙහි + ණේ + ති, ප + තා + ර + ති) එතර කරයි.

**පති.** අ-ප්‍රතිදාන, නිවාරණ, ප්‍රතිලෝම, ග්‍රහණය, නිවෘත්ති, සාදෘශ්‍ය පත්‍රතිෂ්ඨා, අභිමුඛ බව, ගමන් ප්‍රතිපොධ, ප්‍රතිගමනාර්ථ, පශ්චිම ක්‍රියා, ආදරකිරීම, පිණිස, යනාර්ථ ලක්ෂණා දිය යන මෙහි.

**පති.** පු-ස්වාමිපුරුෂයා, හිමියා.

**පති.** ති-ඉසුරු, ඇත්තා, අධිපතියා.

**පතික.** පු-ස්වාමියා, ස්වාමිපුරුෂයා.

**පතිංවරා.** ඉ - සෙවච්ඡාවෙන් වල්ලභයන් සොයන්නී, වෙසඟන.

**පතිකිඨ.** පු-ලාමක දෙය, පහත්දෙය.

**පතික්‍රියා.** ඉ-පිළියම, ප්‍රතික්‍රියා කිරීම.

**පතිකූටන.** හැකිලෙන, ඇකිලෙන.

(14997)

**පතිගණ්හන.** න-ප්‍රතිග්‍රහණය, පිළිගැනීම.

**පතිග්ගණ්හන.** න-ප්‍රතිග්‍රහණය, පිළිගැනීම.

**පතිට්ඨති.** ක්‍රි-(d. දි. ඨා, ගතිනිවත්තියං, ගති පැවතුම්හි + ති) පිහිටයි.

**පතිට්ඨහන.** න-පිහිටුවීම, ප්‍රතිෂ්ඨාපනය.

**පතිට්ඨා.** ඉ-ප්‍රතිෂ්ඨාව, පිහිටීම.

**පතිට්ඨාපන.** න-ප්‍රතිෂ්ඨාපනය, පිහිටුවීම.

**පතිට්ඨාපිත** ති-ප්‍රතිෂ්ඨාපිත, පිහිටුවන ලද

**පතිට්ඨිත.** ප්‍රතිෂ්ඨිත, පිහිටුවන ලද, පිහිටි.

**පතිත.** ති-වැටුණු, ප්‍රසිද්ධ, පතළ.

**පතිදාන.** න-ප්‍රතිදානය, ගත් දෙය වෙනුවට වෙන දෙයක් දීම, ආපසු දීම.

**පතිනී.** ඉ-භාර්‍ය්‍යාව, බිරිඳ.

**පතිපිණ්ඩ.** පු-තමා විසින් ගත් පිඬු වෙනුවට ආපසු පිඬුදීම. ගත් ආහාර වෙනුවට වෙන ආහාරදීම.

**පතිබ්බත.** න-පතිව්‍රතාව, පතිවත.

**පතිබ්බතා.** ඉ-පතිව්‍රතා ඇත්තී, සිය හිමියා හැර අන් පුරුෂයෙක් නොපතන්නී.

**පතිබොධ** පු-ප්‍රතිබොධය, අවබොධය.

**පතිභූ.** ති-ඇපය, ගිවිසුම, පොරොන්දුව.

**පතිමණ්ඩිත.** ප්‍රතිමණ්ඩිත, සැරසුනු.

**පතිමා.** ඉ-ප්‍රතිමාව, පිළිබිඹුව.

**පතිමාන.** පු-බුහුමන් කිරීම, සත්කාරය.

**පතිමානෙති.** ක්‍රි (d. භූ මාන, පූජායං පිදීමෙහි + ණෙ × ති) බුහුමන් කරයි, සත්කාර කරයි

**පතිරූප.** ති-සුදුසු, ප්‍රතිරූපය, සමාන රූපය.

**පතිරූපං.** අ-ස්වීකාරයෙහි සුදුසු.

**පතිරූපදෙස.** පු-සුදුසු ප්‍රදෙශය, තුනුරුවන් පිහිටි දෙශය.

**පතිස්සය.** පු-ගෙය, ගෘහය.

**පතිස්සායරොග.** න-ප්‍රතිශ්‍යා රෝගය, හෙම්-බිරිස්සාව.

**පතිස්සත.** පු-නුමුලා සිහි ඇත්තා.

**පතිස්සති.** ඉ-එළඹසිටි, සිහිය.

**පතිලීන.** පු-සැඟවීම.

**පතිසල්ලීන.** පු-ඵලසමවත, ඵලසමාපත්තිය. ඒකීභාවය.

**පතිසල්ලීයන.** න-ඵලසමවතින් වසන.

**පතිභාස.** පු-කණේරු ගස.

**පතිසිරා.** ඉ-තිරය, කඩතුරාව, වසනලද වස්ත්‍රය.

**පතීක.** පු-ශරීරාවයව.

**පතීචි.** ඉ-පශ්චිමදිශාව, අපරදිශාව, බස්නාහිර දිසාව.

**පතීර.** න-ඉවුර, එතෙර.

**පතෙය්‍ය.** ති-කසාද බැඳීමට සුදුසු.

**පතොද.** පු-කැවිට, කෙවිට, සබුක්කුව.

**පතොදක.** පු-කෙවිට, කසය.

**පතොලි.** ඉ-වීථිය, වීදිය.

**පථ්‍යා.** ඉ අරළු, හරීතකී,

**පථ.** පු-මාර්ගය, පාර.

**පථ.** -d. භූ. ගමනෙ, යාමෙහි, පථති, යෙයි.

**පථ.** d. චු. පාකමම, ප්‍රකට බවෙහි, පථති ප්‍රකට වෙයි.

**පථවී.** ඉ-විහිවිද ගියමාර්ගය.

**පථව්‍ය** / **පථබ්‍ය** } පු-පෘථිවිය පිළිබඳ.

**පථාවී.** පු-මගියා පථිකයා.

**පථි.** -d. චු. ගතියං, යාමෙහි, පථෙති, පථයති, යෙයි.

**පථික.** පු-මාර්ගිකයා, මගියා

**පථිත.** ති-ප්‍රසිද්ධ, ප්‍රකට, පතළ.

**පද.** -d. භූ. චිරෙ, ස්ථිර බැව්හි, පදිති, ස්ථිරකරයි

**පද.** -d. චු. ගතියං, යාමෙහි, පදෙති, පදයති. යෙයි.

**පද.** -d. දි. ගමනෙ, යාමෙහි, පජ්ජති, පටිපජ්ජති යෙයි.

**පද.** න-ස්ථානය, ආරක්ෂාව, නිර්වාණය, කාරණය, ශබ්දය, වස්තුව, කොටස, පාදය, පාදලාඤ්ඡනය, අරමුණ.

**පදක්ඛිණා.** ප්‍රදක්ෂිණාව, පැදකුණු කිරීම, දකුණතින් වටේටයාම, අවවාදය මනා කොට ගැනීම, වෘද්ධිය.

**පදග.** පු-පාබල සේනාව.

**පදට්ඨාණින**. ආසන්න කාරණය, ධම්යන්ගේ ලක්‍ෂණයාදි කරුණු සතරින් එකක්.

**පදත්‍ථි.** පදාර්ථය.

**පදපූරණ**. න-පද සම්පූර්ණකිරීම.

**පදර**. පු-පෝරුව, බිඳීම, මහත්භූමි විවරය, ප්‍රදරයයි කියන ලද කිළිමාල නම් වූ ලේ යාම.

**පදවි**. ඉ-මාර්ගය, පාර.

**පදවීතිහාර**. පු - සම ගමණින් යන්නහුගේ පා දෙක අතර පිහිටි මිටිරියන් ප්‍රමාණ ප්‍රදෙශය.

**පදහති**. ක්‍රි (d. භූ. ධා ධාරණේ, දූරීමෙහි + ති) වීර්‍ය්‍යකරයි, උත්සාහකරයි.

**පදහණ**. න-උත්සාහය, වීර්‍ය්‍යය.

**පදාති**. ක්‍රි - (d. භූ. දා. දානෙ, දීමෙහි + ති, ප + දාති) ප්‍රදානය කෙරෙයි.

**පදාති.** ඉ-පාබල සේනාව.

**පදාන.** පු-ප්‍රදානය, දීම, ත්‍යාගය.

**පදාරණ**. න-දෙකට පැලීම.

**පදාලණ**. න-පැලීම, දෙකට පැලීම.

**පදාලිත**. ති-පලනලද, පලකල.

**පදාලෙති**. ක්‍රි-(d. චු. දල, විදාරණේ, දෙපළු කිරීමෙහි + ණේ + ති) පලයි, දෙපලුකරයි.

**පදික**. පු-පාබලසෙනග.

**පදික**. පු-පදිකයා, පදහඳුරන්නා.

**පදික**. ති-පද හඳුරණ තැනැත්තා, චතුර්විධ පද ඉගෙන ගන්නා අය.

**පදිත්ත**. ති-දිලෙසෙන ලද, ගිනිගන්නා ලද, බබලන ලද.

**පදීප**. පු-ප්‍රදීපය, පහණ, පාණ, ලාම්පුව.

**පදීපණ.** න-විෂ භේදයක්.

**පදිප්පති.** ක්‍රි-(d. භූ. දීප, දිත්තියං දීප්තියෙහි + ති) බබලයි, දිලිසෙයි, ගිනි ගනියි.

**පදිස්සති**. ක්‍රි-(d. භූ. දිස, පෙක්ඛණේ බැලීමෙහි + ති) දකී

**පදීපිත**. ති-දල්වනලද, පත්තු කල.

**පදීපෙති**. ක්‍රි-(d. භූ. දිප, දිත්තියං බැබලීමෙහි + ණේ + ති, ප + ල්. පෙති) දක්වයි, ගිනි දල්වයි.

**පදීපියති.** ක්‍රි-(d. දිප, දිත්තියං බැබැලීමෙහි + ඊය + ති) දල්වනු ලැබේ.

**පදීපෙය්‍ය.** න-පහණට හිත තෙල් පහන් කබල් ආදිය.

**පදුට්ඨ** ති-පදුට්ඨ, අතිශයින් දුෂ්ට, ඉතා නපුරු.

**පදුබ්භති** ක්‍රි - (d. චු දුහ, සත්‍රුමෙහ, ද්වෙෂයෙහි + ති=ප + දුබ්භති) ද්‍රෝහකරයි.

**පදුම.** පු - පියුම, උත්පල සියක් ලක්‍ෂයක්වූ සඞ්ඛ්‍යාව එනම් නිරය, පෙති සියක් ඇති පියුම, පෙති සියක් නැත්තාවූ හෝ සුදු පියුම.

**පදුමනාභ.** පු-විෂ්ණු, පියුම් නැබ, විෂ්ණුගේ පෙකනියෙන් පියුම් රැසක් හටගෙන තිබේ යයි මිථ්‍යාමතයෙකි.

**පදුමරාග.** පු-පද්මරාග මාණික්‍යය, පියුම් රා මිණ.

**පදුමිණී.** ඉ-පියුම් විල, පද්ම තඩාගය.

**පදුස්සති.** ක්‍රි-(d චු. දුස, නාසෙ, නැසීමෙහි + ති, ප + දු + ස + ති) ද්වෙෂකරෙයි.

**පදුස්සණ.** න-වෙෂකිරීම.

**පදූසන.** න-දූෂ්‍යකිරීම, කෙලසීම.

**පදූසිත.** ති-දූෂ්‍යකල, අතිශයින් දූෂ්‍යකල.

**පදෙස.** පු-ප්‍රදෙශය, පෙදෙස, මහපට ඇඟිල්ල හා තර්ජනිය විදහා ගත් කල ඇතිවන ප්‍රමාණය.

**පදෙසන.** න - ත්‍යාගය, හුත්තැනට යවන පඬුර.

**පදෙසිත.** ති-ප්‍රදෙශයකට අයත්, කොට්ඨාසකට අයත්.

**පදොස.** පු - වෙසොත්පත්තිය, රාත්‍රිමුඛය, සැන්දෑව, සැන්දෑ කාලය, සවස්කාලය.

**පදොසික**. ති-දූෂ්‍ය කරන්නා.

**පදොසී.** ති-දූෂ්‍ය කරන්නී, දුෂ්ටකම් කරන්නී.

**පදොසෙති**. ක්‍රි-(ප + දුසෙති) දූෂ්‍ය කෙරෙයි.

**පදොසෙති.** ක්‍රි-(d. චු. දුස, නාසෙ, නැසීමෙහි + ති) ද්වෙෂ කෙරෙයි.

**පද්ධ.** ති-මඟට පැමිණි, සෙවය කරණ.

**පද්ධති.** ඉ-මාර්ගය, මාවත.

**පධාන.** පු-ප්‍රධාන, පළමුවන, ප්‍රමුඛ.

**පධංසති.** ක්‍රි-(d. භූ. ධංස, ධංසනෙ, දූෂ්මෙහි ප + ධංස + ති) නසයි, දවයි.

**පධානවනතු.** පු-ප්‍රධානයා, ප්‍රථමයා.

**පධානික.** පු-ප්‍රධානයාට අයත්.

**පධානිය.** පු-පලමුවෙනියා, ප්‍රධාන තැනැත්තා.

**පධාරිත.** ති-දරණලද, උසුලනලද.

**පධාවති.** ක්‍රි-(d. භූ. ධාවු, ගතියං, යෑමෙහි + ති ප + ධා + ව + ති) දුවයි, ධාවනය කරයි.

**පධාවි.** පු-දුවන්නා, දුවන තැනැත්තා.

**පධි.** ඉ-රථයෙහි නිම්වලල්ල, කරත්තපට්ටම.

**පධුපති.** ක්‍රි-(d. චු. ධූප, ධූපෙ, දුම් ගැසීමෙහි + ති, ප + ධු + ප + ති) අතිශයින් දුමයි, අතිශයින් දුම් ගසයි.

**පධුපිත.** ති-දුම්ගසන ලද.

**පධොත.** ති-සෝදන ලද, පිරිසිදුකල.

**පණ.** d. භූ-ගමනෙ, යාමෙහි, පණති, යෙයි.

**පණත.** ති-අවනත, යටත්, සුවය.

**පණත.** ති-පසුවූ දෙය, අවසානය, පිලිත්ත, දුර.

**පණතකසල.** පු-ප්‍රත්‍යන්ත පර්වතය, මහා පර්වතයක් සමීපයෙහි පිහිටි පර්වතයක්.

**පණතාන.** න-ඉතාදුර.

**පණන.** අ-විශෙෂාර්ථ පද පූරණයෙහි, යො පන භික්‍ඛු.

**පණමන.** න-නමස්කාරය, ප්‍රණාමය.

**පණස.** පු-කොස්ගස.

**පණසසති.** ක්‍රි-(d. භූ. නස, නාසෙ, නැසීමෙහි + ති) නැසෙයි.

**පණාද.** පු-උත්තමනාදය, එනම් රජ.

**පණාදෙති.** ක්‍රි-(d. භූ. නද, උන්නාදෙ, නාද කිරීමෙහි + ණෙ + ති) නදදෙයි.

**පණාම.** ති-පැහැර කිරීම.

**පණාලිකා.** ඉ-පයිප්පය, බටය, දිය බසිනා මග, කාණුව.

**පණිධිකම්ම.** න-දෙව්දෙවතාවුන්ට බාර වූ පරිදි කටයුතු කිරීම.

**පණුනනකොධ.** පු-සමුච්ඡෙද නොකල ක්‍රොධ ඇත්තා.

**පණුදති.** ක්‍රි-(d. භූ. නුද, බෙපණෙ, ක්‍ෂෙපණයෙහි + ති, ප + ණුද + ති) පහකෙරෙයි, කම්පාකෙරෙයි.

**පණුදිත.** ති-පැණයනලද, කම්කල.

**පණිනි.** ඉ-පණිනියුපෙල, පේලිය.

**පණිථ.** පු-මාර්ගය.

**පණිථක.** පු - මග නියුක්තයා, මාර්ගයෙහි උපන්නහු.

**පණිථදූහන.** න-මම් පැහැරීම, මංකොල්ල කෑම.

**පණිථික.** පු-මාර්ගිකයා, මගියා; මාර්ගයෙහි උපන්නා.

**පණණ.** න ගිලීහුනු දෙය, ගැලවුනුදෙය.

**පණණක.** ති-නිශ්ශබ්ද, නිසසල.

**පණණග.** පු-සර්පයා, සපු.

**පණණධජ** පු-පහත්කල, ධජ ඇත්තා.

**පණණරසම.** පු-පසළොස්වැනි.

**පණණරසික.** පු-පණණරසියට අයත්.

**පණණලොම.** පු-ලොමුඩැහැගැනීම, උපදවන තැතිගැනීම නැති බැවින් අනුලොම් ඇති.

**පප.** න-ජලය, වතුර, "ආපං පපා මහොදකංති වුච්චති"

**පපඤ්ච** පු - ප්‍රපඤ්ච, තෘෂ්ණාදි පපඤ්චය, උත්තරය.

**පපචචති.** ක්‍රි-(d. භූ. පච, පාකෙ, පිසීමෙහි + ති) පිසියි.

**පපඤ්චති.** ක්‍රි-ප්‍රමාද කරයි.

**පපඤ්චණ.** න-ප්‍රමාදය.

**පපඤ්චෙති.** ක්‍රි-(d. චු. ව්‍යත්තීකරෙ, ප්‍රමාදයෙහි + ණෙ + ති) ප්‍රමාද කරයි.

**පපති.** ක්‍රි (d. භූ. පත, පතනෙ, වැටීමෙහි + ති, ප + පති) වැටේ, පතිත වෙයි.

**පපතික.** පු-වැටෙන්නා, පතිතවන්නා.

**පපතති.** ක්‍රි-(d. භූ. පත, පතනෙ, වැටීමෙහි + ති = ප + පපති) හෙයි, වැටෙයි.

**පපතණ.** න-වැටීම.

**පපද.** පු-පාදාග්‍රය, පතුලේ කෙළවර.

**පපා.** ඉ-පැන්ශාලාව, පැන්හල.

**පපාත.** පු-ප්‍රපාතය, පර්වත ප්‍රණතය, පර්වත පල්ලම.

**පපාතී.** පු-ප්‍රපාතයට වැටෙන්නා, පහතට වැටෙන්නා.

**පපිතාමහ.** පු-මී මුත්තා, මුත්තගේ පියා.

**පපිලිත.** ති-පරණවූ, වැහැරීගිය, සොරකම් කළ.

**පපුත්ත.** පු-මුණුපුරා, දුවගේ හෝ පුතාගේ පුතා.

**පපුප්ඵක.** න-ත්‍රෛභූමිකවෘතය.

**පපුණ්ණාග.** පු-තුවර, තෝර.

**පප්ඵට.** පු-පැපිලිය.

**පප්ඵොටණ.** න-කුල්ලේ පෙලීම, ගසාදැමීම.

**පප්ඵොටෙති.** ක්‍රි-(d. භූ. ඵුට, විකසනෙ, විකාසයෙහි+ණෙ+ති) පොලයි.

**පප්ඵාටි.** පු-පැපිලිය.

**පප්ඵාස** න-පපුමාංසය.

**පබන්ධ.** පු-ප්‍රබන්ධය, ගද්‍ය පද්‍ය වශයෙන් ද්විධ වූ ප්‍රබන්ධය.

**පබන්ධකප්පනා.** ඉ-ප්‍රබන්ධයෙන් කල්පිත වූ කාදම්බරී අත්තනගලුවංසාදි කාව්‍ය විශේෂය.

**පබල.** පු-ප්‍රබල, මහත් බලය, අධික බලය.

**පබාළ්හ.** පු-ඉතා දැඩි.

**පබාළ්හති.** ක්‍රි-(d. භූ. බහ, වුඩ්ඪියං, වැඩීමෙහි+ති) දැඩි කරයි.

**පබාහති.** ක්‍රි-(d. භූ. බාහ, නිවාරණෙ, වැලැක්මෙහි+ති) වලක්වයි.

**පබුජ්ඣති.** ක්‍රි-(d. දි. බුධ, බොධනෙ, පිබිදීමෙහි+ති=ප+බුජ්ඣති) පිබිදෙයි.

**පබුජ්ඣන.** න-පිබිදීම.

**පබුජ්ඣිත.** ති-පිබිදෙන ලද.

**පබුද්ධ.** පු-අවබොධකළ, පිබිදුනු.

**පබෝධ.** පු-ප්‍රබොධය, අවබෝධය.

**පබෝධති.** ක්‍රි-(d. දි, බුධ, බොධනෙ, පිබිදීමෙහි+ති) ප්‍රබෝධ කරයි.

**පබෝධන.** න-ප්‍රබෝධය.

**පබ්බ.**-d. භූ. පූරණෙ, පිරීමෙහි, පබති, පූරය.

**පබ්බ.** d. භූ. ගමනෙ, යාමෙහි පබ්බති, යෙයි.

**පබ්බ.** පු-පර්ව, සන්ධිය, පුරුෂ, පීති විශෙෂ.

**පබ්බජති.** ක්‍රි-(d. චු වජ, ගතියං, යෑමෙහි+ති) (ප+වජති) පැවිදි වෙයි.

**පබ්බජන.** න-පැවිදි වන, තපසට යාම.

**පබ්බජිත.** ති-පැවිද්ද, පැවිදි වන ලද

**පබ්බජ්ජා.** ඉ-ප්‍රව්‍රජ්‍යාව, පැවිදිවීම, පැවිද්ද, මහණවීම.

**පබ්බත.** පු-පර්වතය, කන්දය.

**පබ්බතක.** පු-පර්වතයක්, කන්දක්.

**පබ්බතෙය්‍ය.** ති-පර්වතයෙහි නියුක්ත, හැසිරෙන.

**පබ්බාජන.** න-නෙරපීම, රටෙන් නෙරපීම, පිටුවහල් කිරීම.

**පබ්බාජනීය.** න-ශාසනයෙන් නෙරපිය යුතු විනය කර්මයක්, චූදිතයා.

**පබ්බජිත.** ති-පැවිදි කළ, මහණ කළ.

**පබ්බාජෙති** ක්‍රි-(d. භූ. වජ, ගතියං, යාමෙහි+ණෙ+ති) පැවිදි කරවයි.

**පබ්බබධ.** ති-පසාකරගෙණ යන.

**පබ්භාර.** පු-පල්ලම, පර්වතප්‍රපාතය.

**පභ.** ති-රශ්මිය, ප්‍රභාව, ආලෝකය.

**පභඞ්ග.** ති-විනාශ කළ, කැඩුනු, පැරදුනු.

**පභඞ්කර.** ආලොක කරන්නා, හිරු.

**පභඞ්ග** ති-කැඩෙන, බිඳෙන.

**පභඞ්ගු.** න-බිඳෙනසුළු, රශ්මිහිදෙන.

**පභඞ්සන.** න-බබලන, දිලිසෙන.

**පභඤ්ජති.** ක්‍රි-(d. භූ. භඤ්ජ, භඤ්ජනෙ, බිඳීමෙහි+ති, ප+භඤ්ජ+ති) බිඳෙයි.

**පභඤ්ජන.** න-සුළඟ, බිඳීම.

**පභඤ්ජිත.** ති-බිඳෙන ලද.

**පභව.** පු-ප්‍රභව, උත්පත්තිය, කාරණය, ස්ථානය, පළමු හටගත් වස්තු.

**පභවති.** ක්‍රි-(d. භූ භූ. සත්තායං, වීමෙහි+ති) (ප+භව+ති) පහළ වෙයි හටගනියි.

**පභස්සර.** න-ප්‍රභාස්වර, රශ්මිහිදෙන, ආලෝකමත් බබසර, රශ්මිය.

**පහස්සති.** ක්‍රි-(d. දි. හසු, අධොපතනෙ, පහතට වැටීමෙහි + ති) (ප + හස්සති) පහතට බසී.

**පභා.** ඉ-ප්‍රභාව, රශ්මිය, ආලෝකය, පඹ.

**පභාකර.** පු-ප්‍රභාකර, ආලෝක කරන්නා, සූර්‍ය්‍යයා.

**පභාත.** න-ප්‍රභාතය, අළුයම, අති උදය.

**පභාති.** ක්‍රි-d. භූ. භා, දීප්තියං. බැබලීමෙහි + ති. (ප + භා + ති) බබලයි. දිලිසෙයි.

**පභාමාලා.** ඉ රශ්මි මාලාව.

**පභාව.** පු ප්‍රභාව, වික්‍රමය, තෙජස, දණ්ඩන යෙන් උපන් තෙජස, සමර්ථභාවය.

**පභාවිත** ති-භාවිතාකළ, ප්‍රගුණ කළ.

**පභාවෙති.** ක්‍රි-(d. භූ. භූ සත්තායංවීමෙහි + ති, ප + භාවෙති) වඩයි, වර්ධනය කරයි.

**පභාස** පු-ආලෝකය, දීප්තිය.

**පභාසති.** ක්‍රි-d. භූ. භා. සු. දීප්තියං බැබලීමෙහි + ති, (ප + භාස + ති) බබලයි, දිලිසෙයි.

**පභාසෙති.** ක්‍රි-(d. භූ භාසු, දිත්තියං, බැබලීමෙහි + ණෙ + ති, ප + භාසෙති) බබලයි.

**පභින්දති** ක්‍රි-(d. රු. භිද, විදාරණෙ, බිඳීමෙහි + ති, ප + භිද + ති) බිඳියි

**පභින්න.** පු-බිඳිනු, මත්තහස්තියා.

**පභු.** පු-ප්‍රභු, අධිපති, ඉසුරු ඇත්තා, නායකයා.

**පභුති.** අ-ප්‍රභුති, පටන්කොට, ආරම්භ කොට

**පභුතික.** ති-ආරම්භකොට ගෙණ එන.

**පභුත්ත.** න-ප්‍රභුභාවය, ප්‍රධානභාවය.

**පමත්ත.** ති-ප්‍රමත්ත, ප්‍රමාද, කර්කශ නොවන

**පමත්තබන්ධු.** ප්‍රමාදයින්ගේ නෑයා, මාරදිව්‍ය පුත්‍රයා.

**පමථාධිප.** පු-ඊශ්වරයා.

**පමදවන** න-ප්‍රමාද (ප්‍රමාද) වන. අන්තඃපුර වාසීන් හා රජදරුවන් කෙළනා උයන. ක්‍රීඩාවනොද්‍යානය.

**පමදාසී.** ඉ. ස්ත්‍රී, කාන්තාව, ප්‍රමාද

**පමද්දති.** ක්‍රි-(d. භූ. මද්ද, මද්දනෙ, මැඩීමෙහි + ති) ප + මද්ද + ති) මිරිකයි. පොඩිකරයි.

**පමද්දන.** න-මැඩීම, මිරිකීම.

**පමද්දිත.** ති-මඩනාලද, මිරිකන ලද.

**පමා.** ඉ-ප්‍රමාණය, පමාන.

**පමාන.** න-ප්‍රමාණය පමණ, කාරණය, ශාස්ත්‍රය ප්‍රමාණ, සත්‍යවාදී, පමනදන්නා, නිත්‍යාණි, සීමා

**පමාණක** පු-ප්‍රමාණවූ, පමණ වූ.

**පමාධිකරණ.** න-ප්‍රමාදයට කාරණා.

**පමාතු.** පු-ඉ. මවගේ මව්

**පමාද.** පු-ප්‍රමාද, පමා, සිහි මුලාව.

**පමාදි** පු- ප්‍රමාද වන පුද්ගලයා.

**පමාණයති.** ක්‍රි - (d. භූ. මාන, පූජායං පිදීමෙහි + ති) ප + මාණයති) පුදයි,

**පමාය.** පූ. ක්‍රි-බෙදූ, මැණූ,

**පමිති.** ඉ-ප්‍රමාණය, පමණ

**පමිලාත** ති-වියළුණු, මැලවුනු.

**පමුඛ.** පු-ප්‍රමුඛ, ඉදිරිපත් වූ, ප්‍රධානවූයේ, ආලින්දය. න.

**පමුද.** පු-ප්‍රමොදය, සතුට, සන්තොෂය.

**පමුදිත.** ති-ප්‍රමුදිත, සතුටට පැමිණි.

**පමුච්චති.** ක්‍රි-(d භූ. මුච, මොචන, මිදීමෙහි + ති, ප + මුච + ති) මිදෙයි.

**පමුච්චිත.** ති-මිදෙන ලද.

**පමුඤ්චති.** ක්‍රි-(d. භූ මුච, මොචනෙ, මිදීමෙහි + ති) මිදෙයි.

**පමුඤ්චන.** න-මිදීම.

**පමුඤ්චිත.** ති-මිදෙනලද

**පමොක්ඛ.** පු-මිදීම, මාර්ගයෙන් ලැබියයුතු ඵලය. ප්‍රමොක්ෂය.

**පමොචන.** න-ප්‍රමොචනය, මිදීම.

**පමොචති.** ක්‍රි-(d. භූ. මුච, මොචෙ, මිදීමෙහි + ති) මුදයි.

**පමොද.** පු-ප්‍රමෝදය සන්තොසය.

**පමොදති.** ක්‍රි - (d භූ. මුද, මොදනෙ, සතුටු වීමෙහි + ති) සතුටුවෙයි.

**පමොදන.** න-සන්තොසය,

**පමොදිත.** ති-සතුටුවනලද.

**පමොහ.** පු-ප්‍රමෝහය, මුලාව. අධික මෝහය.

**පමොහති.** ක්‍රි-(d භූ. මුහ, මුච්ඡායං, මුලාවෙහි + ති) මුලාවෙයි.

**පමොහණ.** න-මුලාවීම් අධික මුලාවීම.

**පම්පක.** පු-හුණපුළුලා.

**පම්පතක.** පු-හුණපුළුලා.

**පම්හ.** න-අක්ෂිරෝම, ඇසිපිහාටු.

**පමුට්ඨ.** ති-මුලාව, මුලාවනලද.

**පමුට්ඨණ.** න-මුලාවීම.

**පමුත්ත.** පු-මුදනලද, මිදෙනලද.

**පමුත්ති.** ති-මිදීම මොක්ෂය.

**පමුදිත.** ති-ප්‍රමුදිත, සන්තොෂ වන ලද

**පමුය්හති.** ක්‍රි-(d. භූ. මුහ, වෙචිත්තතෙ, මුලා වීමෙහි + ති (ප + මුය්හ, ති) මුලාවෙයි.

**පමුය්හණ.** න-මුලාවීම් මුලාව.

**පම්මුස්සති.** ක්‍රි-(d. භූ මුස, සම්මොසෙ, මුලා වෙහි + ති) මුලාවෙයි

**පම්මුස්සණ.** න-මුලාවීම.

**පම්මුස්සිත.** ති-මුලාවනලද මුලාවූ

**පමුළ්හ.** පු-අතිමුලාව, අධිකමුලාව.

**පමොහිත.** ති-ඉතාමත් මුලාවනලද.

**පය.** d. භූ ගමනෙ, යාමෙහි, පයති, යෙයි.

**පය.** පු-කිරි, ජලය.

**පයච්ඡති.** ක්‍රි-(d. භූ. යාච, යාචනෙ, ඉල්වීමෙහි + ති) ඉල්වයි දෙයි.

**පයත.** ති-පවිත්‍ර, පිරිසිදු.

**පයතපාණි.** පු-පවිත්‍රකළ අත් ඇත්තා, දන් දීමෙහි ඇලුනහු.

**පයතන.** න-ප්‍රයත්නය, උත්සාහය.

**පයාත.** ති-අයත්වූ, අයිති, සන්තක.

**පයුත්තක.** පු-යොදනලද ප්‍රයුක්ත.

**පයාති.** ක්‍රි-d. භූ. යා, ගතිපාපුනණෙසු ගමන්හි + ති, (ප + යා + ති) යෙයි.

**පයුරුදාහරති.** ක්‍රි-(d. භූ. හර, හරණෙ, ගෙණයෑමෙහි, + පරි + උදයාදි + හර + ති) කථා කරයි.

**පයුරුපාසති.** ක්‍රි-(d. භූ. ආස, උපවෙසනෙ, ඇසුරු කිරීමෙහි + පරි + උප + පාස + ති, පයුරු + පාස + ති) ආශ්‍රය කෙරෙයි.

**පයුරුපාසණ.** න-ආශ්‍රය, සේවනය, පයුරු පාසණය.

**පයුරුපාසික.** පු-ආශ්‍රය කරන්නා.

**පයුරුපාසිත.** ති-පයුරුපාසනය කළ ආශ්‍රය කළ.

**පයුඤ්ජති.** ක්‍රි-(d. භූ. යුජ. යොගෙ, යෙදීමෙහි + ති) (ප + යුජ + ති) යොදයි.

**පයුඤ්ජණ.** න-යෙදීම.

**පයුඤ්ජිත.** ති-යොදනලද

**පයුත්ත.** ති-ප්‍රයුක්ත, යොදනලද.

**පයුත.** ති-යෙදූ, සංයුක්ත.

**පයොග.** පු-ප්‍රයොග, සව්‍යාපාරත්වය, යෙදීම.

**පයොජන.** න-ප්‍රයොජනය, ඵලය, නියොග කටයුතු, කාර්‍ය්‍යය.

**පයොජිත.** ති-යොදනලද මෙහෙයනලද.

**පයොජෙති.** ක්‍රි-(d. භූ. යුජ, යොගෙ, යෙදීමෙහි + ණෙ + ති.) යොදයි. මෙහෙයයි

**පයොධර.** පු-ස්ත්‍රී පයොධරය, තනය, මේඝය, වලාකුළ.

**පයොවෙග.** පු-ජලප්‍රවාහය, ජලවේගය.

**පයක.** පු-මිමුත්තා, මුත්තාගේ පියා, පියාගේ පියාගේ පියාගේ පියාගේ පියා.

**පර.** d. චු-ගමනෙ යාමෙහි. පරෙති, පරයති. යෙයි.

**පර.** පු-පසමිතුරු උත්තමයා. අන්‍යයා. පශ්චාත්භාවය, නිවණ.

**පරක්කම.** පු-පරාක්‍රමය, මහත් වීර්‍ය්‍යය. ශූරත්වය.

**පරකීය.** පු-අනාඅයත්, අන්‍යයාට අයිති.

**පරක්කමධාතු.** ති-උතුම්වීර්‍ය්‍යය.

**පරචිත්තවිජානන.** අනුන්ගේ සිත් දැනගැනීම.

(15310)

**පරචිත්තවිජානනඤාණ.** න-අනුන්ගේ සිත් දැනගන්නා නුවණ.

**පරත්‍ථ.** පරඅර්ථය. අන්‍යයාගේ ප්‍රයෝජනය. පරලොව පරමාර්ථය.

**පරද.** ති-ආශා ඇතිකරවන.

**පරපොෂට.** පරපුටු, අනුන් විසින් පෝෂ්‍යය කරන්නා, කොවුලා. කාකයා.

**පරදාරා.** ඉ - පරසත්‍රී අන් අඹුව.

**පරදත්තූපජීවී.** පු-අනුන් විසින් දෙන ලද දෙයින් ජීවත්වන තැනැත්තා, අනුන්ගේ පිහිත් සුව ලබන, එනම් ප්‍රෙත නිකායෙහි උපන් තැනැත්තා.

**පරතොඝොස.** පු-අනුන්ගෙන් ඇසීම.

**පරභත.** පු-අනුන් විසින් පෝෂ්‍යය කල අය කවුඩා, යාචක.

**පරභර.** පු-පරභත, අනුන් විසින් පෝෂ්‍යය කල තැනැත්ත.

**පරමත්ත.** න පරපරිකල්පිත ආත්මය, පරමාත්මයා.

**පරමත්‍ථ.** පු - පරමාර්ථය, උත්තමාර්ථය, ප්‍රධානාර්ථය නිවණ.

**පරමත්‍ථදෙසනා.** ඉ-පරමාර්ථදෙශනාව, අභිධර්මදෙශනාව.

**පරමන්න.** න-කිරිබත, උතුම්බත.

**පරමදන.** න-උතුම්දනය, ශ්‍රෙෂ්ඨදනය.

**පරමනිබ්බාන.** න-එනම් නිර්වාණ වාදය.

**පරමාණු.** පු - අනුප්‍රමාණයෙන් තිහෙන් කොටස, සූක්ෂ්මයා, දූල්කවුළු අතරට ගිය කල්හි යම්සියුම් රජසක් දක්නා ලැබේනම් එයින් තිහෙන් කොටස.

**පරමායු** න-පරමායුෂය, ඒකාලවල මනුෂ්‍යයින්ට යන නියම සම්පූර්ණ වයස.

**පරමිට්ඨි.** පු-බ්‍රහ්මයා.

**පරමසුකුමාල.** පු-ඉතා සියුමැලි, ඉතා මෘදු.

**පරම්මුඛ.** න-අනභිමුඛය, ඉදිරිපස නොවන.

**පරම්මුඛා.** අ-අසම්මුඛාර්ථයෙහි.

**පරම්පරා.** ඉ-පරම්පරාව, අන්වය, වංශය, පරපුරය.

**පරනිම්මිත.** ති අනුන්විසින් නිර්මිත කරණ ලද්ද එනම් දෙව්ලොව.

**පරරූප.** න-අන්‍යයන්ගේ රූපය, පරවූරූපය

**පරලොක.** පු-අන්‍යභවය, අන්‍යලොකය.

**පරවම්භන.** න-අනුන්ට හෙලාදකීම.

**පරවාද.** පු-අන්‍යවාද, දෙසැටදිටු.

**පරවිසය.** පු-අනුන්ගේ රට, දනාඅයත් දෙශය.

**පරවෙදිය.** පු-අනුන් පිළිබඳව තැබිය යුතුදේ.

**පරව්‍යාබාධ.** පු-අනුන්ට හිරිහැර කිරීම.

**පරධීන.** ති-පරායත්ත, අනුන්ට අයිති

**පරණුවාද.** පු-අනුන්ගේ නින්දාව.

**පරස්සපද.** න-අන්‍යයා පිළිබඳ පදය.

**පරා.** අ- පිරිහීම, පෙරළීම, ගමන්, අතිශයාර්ථ, ප්‍රතිපක්ෂාර්ථ, වික්‍රම, පරාමර්ශණ යනාදියෙහි.

**පරාද.** පු-මල්රේනු, මකරන්ද, මූවරද.

**පරාජය.** පු-පැරදීම.

**පරාජිත.** ති-පැරදුනු, පරදවන ලද.

**පරාජෙති.** ක්‍රි-(d භූ ජේ. ජයෙ, දිනීමෙහි + ති පරා + ජෙ + ති) පරදවයි.

**පරාභව.** පු-පිරිහීම.

**පරාභවති.** ක්‍රි-(d භූ. භූ. සත්තයං, විමෙහි + පර + ආ. භූ + ති) පිරිහෙයි.

**පරාභූත.** ති-මඩනාලද.

**පරාමට්ඨ.** ති-පරාමර්ශණය කල, සපර්ශ කල.

**පරාමස්ස.** අ-පරාමර්ශණය කොට.

**පරාමසති.** ක්‍රි-සපර්ශකරයි.

**පරාමසන.** න-පරාමර්ශණය, සපර්ශ කිරීම.

**පරාමසති.** ක්‍රි-(d. භූ. මස, ආමසනෙ සපර්ශයෙහි + ති) පරා + ආමසති, සපර්ශ කෙරෙයි.

**පරාමාස.** පු-සපර්ශ කිරීම.

**පරාමාසී.** පු-ස්පර්ශ කරණ තැනැත්තා.

**පරායන.** න-පිහිට, ආධාරය.

**පරාසික.** පු-පරාඅයත්, අනුන්ට අයිති.

**පරාසිනී.** ඉ-පිහිටාධාරයක් නැති තැනැත්තී.

**පරි.** අ - හාත්පස, පරිච්ඡෙද, ආලිඞ්ගන වර්ජන දෙසකථා, හැඳීම, අවමාන, ආධාර භොජන, ගහණ, ව්‍යාප්ති, සවභාව, ලක්ෂණා දියෙහි.

**පරිකඩ්ඪති.** ක්‍රි-d. භූ. කඩ්ඪ, ආකඩ්ඪනෙ, ඇදීමෙහි + ති. (පරි + කඩ්ඪ + ති) ආපසු අදියි, පස්සට අදියි.

**පරිකඩ්ඪන.** න-පස්සට ඇදීම, හාත්පස ඇදීම.

**පරිකඩ්ඪිත.** ති-පස්සට අදිනලද හාත්පස අදිනලද.

**පරිකථා.** ඉ-විවරණ කථාව, විස්තරකටයුතු පදවල විස්තරකිම.

**පරිකන්ත.** පු-කැපීම.

**පරිකන්තති.** ක්‍රි-d. භූ. කති, කොටිල්ලෙ, කුටිල බැව්හි + ති) පරි + කන්ත + ති) කපයි, තීරුකර කපයි.

**පරිකප්ප.** පු-කල්පනාව, කල්පනා කරණ ලද්ද, අදහස.

**පරිකප්පති.** ක්‍රි-d. භූ. කප්ප, චින්තීකරණෙ කල්පනා කිරීමෙහි + ති, කල්පනා කෙරෙයි, අදහස් කෙරෙයි.

**පරිකප්පන.** න-කල්පනා කිරීම.

**පරිකප්පිත.** ති-කල්පනා කළ, කැපකළ.

**පරිකර.** පු-ආභරණ.

**පරිකරොති.** ක්‍රි-(d භූ. කර, කරණෙ, කිරීමෙහි + ති) (පර + කරොති) පිළියම් කරයි.

**පරිකම්ම.** න-ප්‍රතිකර්මය, පිළිගම.

**පරිකස්සති.** ක්‍රි-(d. භූ කස්ස, ගතියං, යෑමෙහි + ති) අදියි.

**පරිකස්සන.** න-ඇදීම.

**පරිකිණ්ණ.** ති-ගැවසීගත්.

**පරිකිත්තිත.** ති ප්‍රකාශ කරණලද, සතුති කරණ ලද.

**පරිකිත්තෙති.** ක්‍රි-(d. චු. කිත්ත, සංසද්දෙ, ප්‍රකාශයෙහි + ණෙ + ති) පරි + කිත්තෙ + ති, ප්‍රකාශකරයි, සතුතිකරයි

**පරිකිරති.** ක්‍රි -d භූ. කිර, ආකිරණෙ, වැගිරීමෙහි + ති, වගුරුවයි.

**පරිකිස්සති.** ක්‍රි - (d භූ. තිය, තනුකරණෙ, තුනීකිමෙහි + ති) කරදර කරයි.

**පරිකිලන්ත.** ති-වෙහෙසුනු,

**පරිකිලමති.** ක්‍රි-(d. භූ. කිලමු වෙදෙ, ක්ලාන්ත යෙහි + ති) ක්ලාන්තවෙයි.

**පරිපූජති.** ක්‍රි-(d. භූ පූජා, පූජායං, පිදීමෙහි + ති) පරි + පූජ + ති, කම්පාවෙයි, සෙලවෙයි

**පරිකිලෙස** පු-දුක්බව, අවාසනාවන්තභාවය දඬුවම.

**පරිකුපිත.** ති-කෝපවන ලද, කිපුනු.

**පරි ජිත.** ති-කම්පාවන ලද,

**පරිකෙළන.** න-ක්‍රීඩාව, සෙල්ලම.

**පරිකොපෙති.** ක්‍රි-(d. භූ. කුප, කොපෙ, කිපීමෙහි + ණෙ + ති) කිපෙයි, තරහවෙයි.

**පරික්කමන.** න-යාම, බැහැරයාම.

**පරික්කිලිට්ඨ.** ති-කිලටුවනලද, කෙලසනලද.

**පරික්කෙලස.** පු-කිලුට, කෙළසීම.

**පරික්ඛක.** පු-පරීක්ෂා කරන්නා, විභාග කරන්නා.

**පරික්ඛන.** න-පරීක්ෂාව, සෙවීම, විභාග කිරීම.

**පරික්ඛති.** ක්‍රි-(d. චු. කඛු, විජ්ඣනෙ, විදීමෙහි + ති) (පරි + කඛ + ති) පරීක්ෂා කරයි.

**පරික්ඛිත.** ති-පරීක්ෂාකළ, සෝදිසිකළ.

**පරික්ඛය.** පු-ක්ෂය, විනාශවියාම, ටිකින් ටික විනාශවී යාම.

**පරික්ඛා.** ඉ-පරීක්ෂාව, විපරම.

**පරික්ඛාර** පු-පිරිකර, පරීක්ෂාකාර, ඇඳුම් බැඳුම් ආදිය.

**පරික්ඛාරික.** පු-පිරිකර අයිති කාරයා.

**පරික්ඛීණන.** ති-ක්ෂයකළ, සිඳිනලද.

**පරික්ඛිත්ත** ති වටකළ, පරික්ෂෙප කළ.

**පරික්ඛිපති.** ක්‍රි-(d. භූ. ඛිප, ඛෙපනෙ, තැබීමෙහි + ති) (පරි + ඛිප + ති) බහයි, දමයි.

**පරික්ඛිපන.** න-බැහීම, දැමීම.

**පරික්ඛීණ.** න-ක්ෂයකළ, ගෙවන ලද

**පරික්ඛියති.** ක්‍රි-(d භූ. ඛී, ඛයෙ, ක්ෂයවීමෙහි + ති, පරි + ඛියති) ක්ෂයකරණු ලැබේ.

(15407)

**පරික්ඛීයන**. න-ක්ෂය කළ.

**පරික්ඛෙප**. පු-පරික්ෂෙපය, වටකිරීම.

**පරිඛණන**. න-හෑරීම, බිම සෑරීම.

**පරිඛා**. ඉ-අගල.

**පරිඛාකූප**. පු අගල, අගල්වල.

**පරිගලති**. ක්‍රි-(පරි + ගල + ති) ගලයි, ගිලෙයි.

**පරිගණන**. න-ගණන් කිරීම.

**පරිගණ්හාති** ක්‍රි බඳින දෙය, බැඳීම, බලයෙන් අල්වා ගැණීම.

**පරිගිලති** ක්‍රි-(d භූ. ගිල, අදනෙ, කෑමෙහි + ති, පරි + ගිල + ති) ගිලී ගැලෙයි.

**පරිගූහණ**. න-වැසීම, ඡාදනය.

**පරිගූහිත**. ති වසනලද ඡාදනය කළ.

**පරිග්ගහ**. පු-අයිතිය, පිරිවෙර, භාය්‍යාව.

**පරිග්ගහිත**. ති-පරිගෘහිත, අධිගෘහිත, වසඟ යට යටත්වී.

**පරිග්ගාහක**. පු අධිගෘහිතයා, අයිතිකාරයා. බලකාරයා

**පරිච්ච**. අ-පිරිසිඳ නියමකොට.

**පරිච්චජන**. න-පරිත්‍යාගය, හොඳ අදහසින් දීම

**පරිච්චජති** ක්‍රි (d. භූ චජ, චාගෙ, ත්‍යාග කිරීමෙහි + ති), (පරි + චජ + ති) පරිත්‍යාගකරයි.

**පරිච්චත්ත**. ති-පරිත්‍යාග කළ, හරණලද.

**පරිච්චාග**. පු-පරිත්‍යාගය, දානය.

**පරිච්ඡද**. ති-වැසීම, ඡාදනය.

**පරිච්ඡාදන**. න-වැසීම, ඡාදනය.

**පරිච්ඡාදිත**. ති-වසනලද ඡාදනය කරණලද.

**පරිච්ඡාදෙති**. ක්‍රි-(d. භූ. ඡද, සංවරණෙ ඇවිරීමෙහි + ණෙ + ති) වහයි, ඡාදන කරයි.

**පරිච්ඡින්දන**. න-පිරිසිඳීම.

**පරිච්ඡින්න** ති-පිරිසිඳනලද, නියමකරණ ලද.

**පරිච්ඡෙද**. පු-පිරිසිඳීම, කොටඨාසය, භාගය.

**පරිච්ඡෙදක**. පු-පිරිසිඳීම කරන්නා.

**පරිචය**. පු-පුරුද්ද, අභ්‍යාසය, ප්‍රගුණ.

**පරිචරණ**. න-හැසිරීම, සිත්සතුටු කිරීම,

**පරිචරණක**. පු-පරිවරණය කරන්නා.

**පරිචරති**. ක්‍රි-(d. භූ. චර චරණෙ, හැසිරීමෙහි + ති, (පරි + චර + ති) හැසිරෙයි.

**පරිචරියා**. ඉ-පරිවරණය.

**පරිචාර**. පු-හැසිරීම, මනා සිරිතින් හැසිරීම.

**පරිචාරක**. පු-පරිවාරකය, කරන්නා.

**පරිචාරී**. පු-පරිවාර ඇත්තා, පරිවාරකරන්නා

**පරිචාරිත**. ති-පරිවාරය, කළ, මනාව ඇසුරු කළ.

**පරිචාරෙති**. ක්‍රි-(d. භූ. චර, චරණෙ, හැසිරීමෙහි + ණෙ + ති) පරිචරණය කරයි.

**පරිචිත**. ති පුරුදුකළ, ප්‍රගුණ කළ.

**පරිචිණ්ණ**. ති-පුරුදුකළ, පරිචිත.

**පරිචුම්බණ**. න-සිඹීම, ඉඹීම, භාත්පසින් සිඹීම.

**පරිචුම්බිත**. ති-මනාකොට චුම්බනය කළ.

**පරිජන**. පු-පිරිවර ජනයා, සෙවක ජනයා.

**පරිජපන**. න-ජපකිරීම, නොයෙක්වාර ගණින් කීම.

**පරිජපති**. ක්‍රි-(පරි × ජප × ති) ජප කෙරෙයි.

**පරිජපිත**. ති-ජපකළ.

**පරිජිණ්ණ**. ති-දිරූ, දිරාගිය.

**පරිජිත**. ති-දිනූ, බල පැවැත්වූ.

**පරිජුණ්ණ**. පු-පිරිහුණු, විපතට පත්

**පරිඤ්ඤා**. ඉ-අවබොධය.

**පරිඤ්ඤන**. න-මනා දැනීම.

**පරිඤ්ඤාත**. ති-දැනගන්නා ලද, පමණ දැන ගන්නා ලද.

**පරිඤ්ඤාතාවී**. පු-පමණ දන්නාසුළු පුද්ගල තෙම.

**පරිඤ්ඤෙය්‍ය**. පු-දැනගත යුතු.

**පරිඤ්ඤෙය්‍යධම්ම**. පු-අනිත්‍යාදි වශයෙන් දැනගතයුතු දුඃඛාදි ධර්‍ම.

**පරිඩය්හන**. දැවීම, තාපනය.

**පරිඩහති**. ක්‍රි-(d. භූ. දහ, භස්මීකරණෙ, අළු කිරීමෙහි + ති) දයි, භස්මවෙයි.

**පරිනත** ති-මුහුකල, අන්‍යයෙකුට පවරණලද

**පරිනමති**. ක්‍රි-(d. භූ. නම, නමනෙ, නැමීමෙහි + ති) (පරි + නම + ති) පිරිනමයි.

**පරිනය**. පු-විවාහය.

**පරිනමන**. ති-පිරිනැමීම.

**පරිනාම**. පු-පිරිනැමීම.

**පරිනායක**. පු-පමුණුවන්නා. අධ්‍යක්ෂකයා.

**පරිනාහ**. පු-පුළුලු, විශාල.

**පරිනාමිත**. ති-පිරිනමන ලද.

**පරිනානි**. පු-පිරිනමන්නා.

**පරිනාමෙති**. ක්‍රි-(d. භූ. නම; නාමෙ, නැමීමෙහි + ණෙ + ති) පිරිනමයි, පවරයි.

**පරිකප්පෙති**. ක්‍රි-(d භූ. කප්ප, කප්පනෙ, කැප කිරීමෙහි + ති) කැපකරයි. කැපවෙයි.

**පරිකප්ප**. න-කැපවීම, කැපකිරීම.

**පරිත්ත**. ති-අල්ප, ස්වල්ප, මද.

**පරිත්ත**. න-රක්ෂාව, ආරක්ෂාව, පිරිත

**පරිත්තක**. පු-ස්වල්ප ප්‍රමාණය.

**පරිත්තාන**. න-ආරක්ෂාව, විපත් ආදියෙන් රැකගැණීම, පිරිත.

**පරිත්තානකුටි**. පු-ආරක්ෂාකුටිය, වැහිකුඩුව.

**පරිත්තායති**. ක්‍රි-(d. දි. තා. පාලනෙ, ආරක්ෂා කිරීමෙහි + ති. පරි + තායති) ආරක්ෂා කෙරෙයි.

**පරිතප්පන**. න-තැවීම.

**පරිතප්පති**. ක්‍රි-(d. භූ. තප්ප, තාපනෙ, තැවී-මෙහි + ති. පරි + තප්ප + ති) තැවෙයි.

**පරිතප්පිත**. ක්‍රි-තැවෙන ලද, උණුකල.

**පරිතාප**. පු-තාපය, බලවත් තැවුලිය.

**පරිතාපන**. න-මහත්තැවීම.

**පරිතාපෙති**. ක්‍රි-(d භූ. තප, තාපනෙ, තැවී මෙහි + ණෙ + ති) තවයි.

**පරිතො**. අ-හාත්පරිසිත්, වටේට.

**පරිතොසන**. න-සතුට, සන්තොෂය.

**පරිතොසෙති**. ක්‍රි-(d. දි. තුස, තුට්ඨියං, සතුටෙහි + ණෙ + ති. පරි + තොසෙති) සතුටු කෙරෙයි.

**පරිතසිත**. ති-තැතිගන්නා ලද, ත්‍රසක වන ලද.

**පරිතස්සති**. ක්‍රි-(d. භූ. තස, උබ්බෙගෙ, උද්-වෙගයෙහි + ති) ත්‍රස්තවෙයි. තැති ගණියි.

**පරිතස්සන**. න-තැති ගැණීම, තැතිගණී.

**පරිතාප**. පු-තැවීම.

**පරිතාප**. න-තැවීම, දැහය.

**පරිතාපෙති**. ක්‍රි-(d භූ. තප, සංතාපෙ, තැවී මෙහි + ති පරි + තා + පෙති) තවයි.

**පරිදණ්ඩ**. පු-දණ්ඩනය, දඬුවම.

**පරිදමන**. න-දමනය කිරීම.

**පරිදමිත**. දමනය කළ, හික්මවන ලද.

**පරිදමෙති**. ක්‍රි-(d. භූ. දම, දමනෙ, දැමීමෙහි + ති. පරි + දමෙ + ති) දමනය කරයි.

**පරිදහන**. න-දැවීම, දැහය, පිළිස්සීම.

**පරිදහති**. ක්‍රි-(d. භූ. දහ, භස්මීකරණෙ, අළු කිරීමෙහි + ති) දවයි. දැහකරයි.

**පරිදහිත්වා**. දවා, හැඳ, පරිවඡාදනය කොට

**පරිදහිත**. ති-දවන ලද, අවඡාදනය කරණ ලද.

**පරිදාහ**. පු-දැහය, තැවිල්ල, දැවිල්ල.

**පරිදීපක**. පු-දැක්වීම, දක්වන්නා.

**පරිදීපන**. න-දැක්වීම, පෙන්නීම.

**පරිදීපිත**. ති-දක්වන ලද, පෙන්නුම් කරණ ලද.

**පරිදීපෙති**. ක්‍රි-(d. දි දීප, දිත්තියං, දීප්ති-යෙහි + ණෙ + ති) දක්වයි, පෙන්නුම් කරයි.

**පරිදූසෙති**. ක්‍රි-(d. දි. දුස. අප්පීතියං, අප්‍රීති යෙහි + ති) දූෂ්‍ය කෙරෙයි.

**පරිදූසන**. න. දූෂ්‍ය කිරීම, කෙලෙසීම.

**පරිදූසිත**. ති-කෙලෙසන ලද, දූෂ්‍ය කළ.

**පරිදෙව**. පු-හැඬීම, විලාප කියමින් හැඬීම.

**පරිදෙවති**. ක්‍රි-(d. භූ. දෙව, දෙවනෙ, විලාප යෙහි + ති) විලාප කියයි.

**පරිදෙවන**. න-විලාප කීම, හැඬීම.

**පරිදෙවිත**. ති-හඬනා ලද, විලාප කියන ලද.

**පරිද්දව**. පු-විලාපය, හැඬීම.

**පරිධංසක**. පු-දවන්නා, අළු කරන්නා, විනාශ කරන්නා.

**පරිධංසති**. ක්‍රි-(d. භූ. ධංස, විධංසනෙ, විනාශ කිරීමෙහි + ති) විනාශ කරයි.

**පරිධංසන**. න-විනාශ කිරීම.

**පරිබාවති**. ක්‍රි-d. භූ. බාවු, (පරි + බාව + ති) ගතියං, යැමෙහි + ති) දුවයි.

**පරිධි**. ඉ-ඉර මඬල.

**පරිබොත**. ති-සෝදන ලද, සේදූ.

**පරිබොවති**. ක්‍රි-(d. භූ. බොවු, බොවනෙ, සුඩ කිරීමෙහි + ති) සෝදයි, සුඩ කරයි.

**පරිබොවන**. න-සේදීම, ඇපිල්ලීම.

**පරිනායක**. පු-නායකයා, අනුශාසකයා, මග පෙන්වන්නා.

**පරිනායක රතන**. න-සක්විති රජුගේ වැඩි මහල් පුත්‍රයා පරිනායක රත්න නමින් හඳුන්වයි.

**පරිනිබ්බාන**. න-අවසානය, කෙළවර.

**පරිනිට්ඨාපෙති**. ක්‍රි-(d. දි. ඨා ගතිනිවත්තියං, ගති පැවැත්මෙහි + ණෙ + ති) අවසන් කරයි.

**පරිනිට්ඨිත**. ති-අවසන් කළ, නිමාවට පමුනු වන ලද.

**පරිනිප්ඵන්න**. න-උපන්, හටගත්.

**පරිනිබ්බාණ**. න-පිරිනිවණ් පෑම, රහතුන්ගේ කාලක්‍රියාව කෙලෙස පරිනිර්වාණය සහ ස්කන්ධ පරිනිර්වාණය.

**පරිනිබ්බානික**. පු-පිරිනිවණ් පාන්නා.

**පරිනිබ්බාපන**. න-පිරිනිවණ් පෑම.

**පරිනිබ්බාපෙති**. ක්‍රි-(d. චු වජ, ගතියං, යැමෙහි + ණෙ + ති) පිරිනිවණ් පෑම කරයි.

**පරිනිබ්බායති**. ක්‍රි-(d චු. වජ, ගතියං, යැමෙහි + ති) පිරිනිවණ් පායි.

**පරිනිබ්බායක**. න-පිරිනිවණ් පානා.

**පරිනිබ්බායි**. පු-පිරිනිවන් පානා පුද්ගල තෙම.

**පරිනිබ්බුත**. ති-පිරිනිවන්පානා ලද, පරිනිර්වාණයට පැමිණි.

**පරිනිම්මිත**. ති-අනුන් විසින් නිර්මාණය කළ,

**පරිනිම්මිත**. පු-පරනිර්මිත දිව්‍ය ලොකය,

**පරිපච්චයති**. ක්‍රි-(d. දි. පච, පාකෙ, පිසීමෙහි + ති) පැසෙයි. විපාක දෙයි.

**පරිපච්චන**. න-පිසීම, පැසීම.

**පරිපක්ක**. පු-මුහුකළ, පැසුනු, ඉදුනු

**පරිපඤ්ඤති**. ක්‍රි-(d. දි. ඤා. අවබොධනෙ, අවබොධයෙහි + ති) ප්‍රශ්න කරයි.

**පරිපතති**. ක්‍රි-(d. භූ පට, ගතියං, යැමෙහි + ති) වැටෙයි, පතිතවෙයි.

**පරිපන්ථ**. පු-සතුරු මග, හතුරා, සතුරා.

**පරිපන්ථික**. පු-මං පහරන්නා.

**පරිපාක**. පු මුහුකිරීම, මේරීම, පැසීම.

**පරිපාචන**. න-මේරීම, පැසීම

**පරිපාචනීය**. ති-පැසවිය යුතු, මේරිය යුතු.

**පරිපාචෙති**. ක්‍රි-(d භූ පච, පාකෙ, පැසීමෙහි + ති) පැසවයි, මෝරයි.

**පරිපාචිත**. ති-පැසවන ලද, පුරුදු කළ, පුහුනු කළ.

**පරිපාතිත**. ති-හෙළන ලද, පහතට දමන ලද.

**පරිපාතෙති**. ක්‍රි-(d චු පත, ගතියං, යැමෙහි + ණෙ + ති) හෙළයි, පහත දමයි.

**පරිපීළිත**. පීඩා කළ, හිරිහැර කළ.

**පරිපාලෙති**. ක්‍රි-(d. භූ. පාල, රක්ඛණෙ, රැකීමෙහි + ණෙ + ති) පාලනය කරයි, ආරක්ෂා කරයි.

**පරිපුච්ඡක**. පු-විචාරන්නා, පිළිවිසින්නා.

**පරිපුච්ඡති**. ක්‍රි-(d. භූ. පුච්ඡ, පුච්ඡනෙ, විචාරීමෙහි + ති) විචාරයි. පිළිවිසියි.

**පරිපුච්ඡන**. න-පිළිවිසීම, විචාරීම.

**පරිපුච්ඡා**. ඉ-ප්‍රශ්න කිරීම.

**පරිපුච්ඡිත**. ති-විචාළ, විචාරණ ලද.

**පරිපුඤ්ජති**. ක්‍රි-(d. භූ පුජ, රාසි කරණෙ, රැස් කිරීමෙහි + ති) පිස දමයි.

**පරිපුඤ්ජන**. න-පිස දැමීම, පිස දමන.

**පරිපුණ්ණ**. න-සම්පූර්ණ, පිරුණු.

**පරිපූර**. පු-සම්පූර්ණ, පිරීම.

**පරිපූරණ**. න-සම්පූර්ණ කිරීම, පිරවීම.

**පරිපූරක**. පු පුරවන්නා, සම්පූර්ණ කරන්නා.

**පරිපූරකාරී**. පු-සම්පූර්ණ කරන්නා.

**පරිපූරති**. ක්‍රි-(d චු. පූර, පූරණෙ, පිරීමෙහි + + ති) සම්පූර්ණ කරයි.

(15570)

**පරිපෙරව** න-දසපුර.

**පරිපොථිත**. ති-තලන ලද, පොඩිකළ.

**පරිපලුත**. ති-ඉල්පෙන ලද. ඉළුප්පුනු.

**පරිප්ලව**. පු-ඉල්පීම, ඉලිප්පීම.

**පරිප්ලවති**. ක්‍රි-(d. භූ. ප්ලු, ගතියං, යැමෙහි + ති. පරි + ප්ලව + ති) ඉල්පෙයි, ඉලිප්පෙයි.

**පරිඵරති**. ක්‍රි-(d භූ. ඵර, ඵරණෙ, පැතිර වීමෙහි + ති) පැතිරෙයි, පතලවෙයි.

**පරිඵන්දති**. ක්‍රි-(d. භූ. ඵදි, චලනෙ, සැලීමෙහි + ති පරි + පන්ද + ති) සැලෙයි, චලනය වෙයි.

**පරිඵන්දන**. න-චලනය, කම්පාවීම.

**පරිප්ඵුටඨ**. පු-විචාල, සපණීකළ.

**පරිපොථසක**. පු-දිය ඉසීම, ජලය ඉසින්නා

**පරිපොථසිත**. ති-ජලය ඉසින ලද.

**පරිපොථසෙති** ක්‍රි-(d. භූ ඵුස. සම්පසොස, සම්පගීයෙහි + ණෙ + ති) දිය ඉසීම කරයි.

**පරිපන්දිත**. ති-සැලෙන ලද, කම්පාවන ලද

**පරිබන්ධ**. පු-බැඳීම, බන්ධනය.

**පරිබාධෙති**. ක්‍රි-(d. භූ. බාධ, නිවාරණෙ, වැළැක්මෙහි + ණෙ + ති) වළක්වයි, පීඩා කරයි.

**පරිබාහති** ක්‍රි-(d භූ. බාහ, නිවාරණෙ, බැහැර කිරීමෙහි + ති) බැහැර කරයි. දුරුකරයි.

**පරිබාහිර**. ති-පිටත් දෙය, බාහිරදෙය.

**පරිබ්බජති**. ක්‍රි-(d. භූ. වජ, ගතියං, යැමෙහි + ති. පරි + වජ + ති) පිටත යයි, ඇවිදියි.

**පරිබ්බය**. පු-වැටුප්, ජීවිකාවෘතියට දෙන මුදල් ආදිය.

**පරිබ්බාජක**. පු-පිරිවැද්දා, පරිබ්‍රාජකයා.

**පරිබ්භමති**. ක්‍රි-(d. භූ. භමු, අනවඨානෙ, නොනැවතීමෙහි + ති) කරකැවෙයි.

**පරිබ්භමන**. න-කැරකැවීම, භ්‍රමණය.

**පරිබන්‍ධන**. පු-වැඩීම, නැවත නැවත මෙනෙහි කිරීම.

**පරිබන්‍ධනති**. ක්‍රි-(d. භූ. බද, ථෛරියං, ස්ථිර බැවිහි + ති) වඩයි.

**පරිබන්‍ධනිත**. වඩන ලද.

**පරිභට්ට**. ති-වැඩූ, වඩිනය කළ.

**පරිභණ්ඩ**. පු-පිරිබඩ, ගොම ආදිය පිරිබඩ ගෑම, පිටිපස කෙවෙරුව.

**පරිභව**. පු-අවමානය, නිඳාව.

**පරිභවති**. ක්‍රි-(d. භූ. භූ. සත්තායං, වීමෙහි + ති) අවමන් කෙරෙයි. නිඳා කරයි.

**පරිභවන**. න-නිඳා කිරීම, පරිභව කිරීම.

**පරිභාස**. පු-ආක්‍රොශ තෙපුල.

**පරිභාසන**. ආක්‍රොෂය, ව්‍යවසථා, බැබලීම.

**පරිභාවනා**. ඉ-භාවනා කිරීම.

**පරිභාවිත** ති-වඩනා ලද.

**පරිභාවෙති**. ක්‍රි-(d. භූ. භූ සත්තායං, වීමෙහි + ණෙ + ති) වඩයි, භාවනා කරයි.

**පරිභාසා**. ඉ-දූත්වීම, සංඥකිරීම.

**පරිභුඤ්ජන**. න-අනුභවය, ප්‍රයෝජන ගැණීම.

**පරිභින්න**. පු-බිඳෙන ලද.

**පරිභින්දති**. ක්‍රි-(d. රු. භිද, විදාරණෙ, දෙපලු කිරීමෙහි + ති) බිඳියි, සිඳියි.

**පරිභුඤ්ජ**. ක්‍රි - (d. රු. භුජ, බ්‍යවහරණෙසු, භාවිතයෙහි) අනුභව කරව, වළඳව.

**පරිභුඤ්ජන**. අනුභවය, වැළඳීම.

**පරිභුත්ත**. ති-අනුභව කළ, වැළඳූ.

**පරිභූත**. ති-අවමානප්‍රාප්ත, මඩනාලද.

**පරිභෙද**. පු-බිඳීම.

**පරිභෙදක**. බිඳින්නා, කඩාදමන තැනැත්තා.

**පරිභොග**. පු-අනුභවය, වැළඳීම, ප්‍රයෝජන ගැනීම.

**පරිභොජනීය**. ති-පරිභොග කටයුතු, වැළඳිය යුතු.

**පරිමණ්ඩල**. පු-භාත්පස මඩුල්ල, භාත්පසින් වටවීම.

**පරිමජ්ජක**. පු - පිරිමදින්නා, මිරිකන තැනැත්තා.

**පරිමජ්ජන**. න-පිරිමැදීම, මිරිකීම.

(15622)

**පරිමඨ.** ති-පිරිමැද්ද. මැදපු.

**පරිමජ්ජති.** ක්‍රි-(d භූ. මජ්ජ, සංසුද්ධියං, සුධියෙහි+ති) පිරිමදියි, මිරිකයි, පොඩිකරයි.

**පරිමද්දන.** න-පිරිමැදීම, මිරිකීම.

**පරිමද්දිත.** ති-මඩනා ලද, පිරිමදිනා ලද.

**පරාමසති.** ක්‍රි-(d. භූ. මස්, ආමසනෙ, ස්පර්ශ කිරීමෙහි+ති) පිරිමදියි, ස්පර්ශකරයි.

**පරිමසන.** න-ස්පර්ශකිරීම, පිරිමැදීම.

**පරිමල.** පු-පෙම්කරු සුවඳ, මනා සුවඳ.

**පරිමුඛ.** න-අභිමුඛය, ඉදිරිපිට.

**පරිමාන.** න-ප්‍රමාණය, මැනීම.

**පරිමිත.** ති-ප්‍රමාණ කළ.

**පරිමුච්චති** ක්‍රි (d. දි, මුච, මොක්ඛ, මිදිමෙහි +ති) මිදෙයි.

**පරිමුණ්ඩ.** පු-අලසයා, කම්මැලියා.

**පරිමුත්ත.** ති-මිදෙන ලද.

**පරිමුත්ති.** ඉ මිදීම, මොක්ෂය.

**පරිමුස්සති.** ක්‍රි-(d භූ. මුස, සමෙම, සෙ, මුළා වීමෙහි+ති) මුලාවන්නේය.

**පරිමොචන.** මිදීම, බන්ධනයෙන් මිදීම.

**පරිමොචෙති.** ක්‍රි-(d භූ. මුච, මොක්ඛ, මිදීමෙහි+ණෙ+ති) මුදයි.

**පරිමොහිත.** මුලාවනලද.

**පරිය.** පු. ක්‍රි-අවබොධකොට, පසාකරගෙණ

**පරිසිට්ඨි.** ඉ-පුදනලද=යාගකළ.

**පරිසිට්ඨි.** න-පිදීම, සෙවීම.

**පරියුක්කණ්ඨති** ක්‍රි-(d භූ. කඨි, සොසනෙ, වියලීමෙහි+ති) කලකිරෙයි.

**පරියුට්ඨති.** ක්‍රි-(d භූ ඨා, ගතිනිවුත්තියං, ගති පැවතුම්හි+ති) නැගිටියි, නැගී සිටියි.

**පරියුට්ඨාන.** න-නැගී සිටීම.

**පරියුට්ඨිත.** න-නැගී සිටින ලද = අලස භාවයෙන් තුරන්වන ලද

**පරියුද්ධරති.** ක්‍රි-(d. භූ. හර, හරණෙ, හැරීමෙහි, පරි+උ+ආ+හර + ති) උදාහරණ කරයි.

**පරියෙට්ඨි.** ඉ-සෙවීම. පරියෙසනය.

**පරියෙසති.** ක්‍රි-සොයයි, පරියෙසනය කරයි,

**පරියෙසනා.** ඉ-සෙවීම, නිරීක්ෂණය.

**පරියෙසිත.** ඉ-සොයන ලද = නිරීක්ෂණය කළ.

**පරියොග** පු-යෙදීම, එකාබද්ධවීම. (මජ්ඣිම, මජ්ඣිමපණ්ණාසක. 4 වග්. 1 සූත්‍රය හෙවත් සටිකාර සූත්‍රය සහ අටුවාව බලන්න)

**පරියොදපන.** න-පිරිසිදුකිරීම, සුද්ධකිරීම.

**පරියොගාළ්හ.** පු - ඇතුලත්වන ලද = බැස ගන්නා ලද.

**පරියොගාහ.** ඇතුලත්වීම = බැසගැන්ම.

**පරියොගහති.** ක්‍රි - (d භූ. ගහ, උපාදානෙ, ගැනීමෙහි+ති) බැසගණී, ඇතුලත්වෙයි.

**පරියොගාහන.** ඇතුලත්වන = බැසගන්නා.

**පරියොත්ථරති.** ක්‍රි-(d. භූ ථර, සංතරණෙ, එගොඩවීමෙහි+ති) යටත් කෙරෙයි.

**පරියත්ත.** පු-උගෙන ගන්නා ලද්ද, සිත්සේ යතාඤීයෙහි.

**පරියත්ති.** ඉ-පරියාප්ති ධර්මය, ත්‍රිපිටක ධර්මය.

**පරියන්ත** ති-සීමාව, කෙලවර, පසුවූ දෙය.

**පරියන්තික.** කෙලවරෙහි, යෙදුනු.

**පරියාදාන.** න-ගැනීම, ග්‍රහණය.

**පරියාදින්න** ති-ගන්නා ලද, මඩනා ලද.

**පරියාදාය.** අ-හාත්පසින් මැඩගෙන, පරියාදාය තිඨති.

**පරියාපන්න** ති-අන්තගීත, ඇතුලත් දෙය.

**පරියාදියති.** ක්‍රි-(d භූ. දා, අවඛණ්ඩනෙ, ඇදීමෙහි+ති) මැඩපවත්වයි.

**පරියාපුනාති.** ක්‍රි (d. භූ පුන, සංඝාතෙ, නැසීමෙහි+ති) හදාරයි, ඉගෙණගනියි.

**පරියාපුනන.** න-උද්ග්‍රහණය, ඉගෙනීම.

**පරිපූරිත** ති-පිරුණු, සම්පූර්ණවූ

**පරියාය.** පු-හෙතුව, කාරණය, දෙශනා, වාර වේවචන, සමානාර්ථ ශබ්දය, ප්‍රකාර ප්‍රස්තාව.

**පරියාහත** ති-නසන ලද, විනාශ කළ.

**පරියාහනන.** න-ගැසීම, තැලීම.

**පරියොදපෙති.** ක්‍රි-(d භූ. දා, සුද්ධියං, ශුද්ධියෙහි+ණෙ+ති) පිරිසුදුකරයි.

(15675)

**පරියොදපිත**. ති-පිරිසුදුකළ, ශුඬකළ.

**පරියොදපක**. පු-පිරිසිදුකරණ තැනැත්තා.

**පරියොදත**. ති-පිරිසිදුකළ.

**පරියොදන**. පිරිසිදුකිරීම.

**පරියොඬ**. න-ආරක්‍ෂාව.

**පරියොඬාන**. න-වැසීම, ඡාදනය.

**පරියොඬාය**. අ-වසාගන, සඟවාගෙණ.

**පරියොනඬ**. ති-මස්තකය පළඳනාලද, මස්තකය වසාගත්.

**පරියොනඬති** ක්‍රි-(d. භූ. නහ, බන්ධනෙ, බැඳීමෙහි + ති) මස්තකය වසාගනී.

**පරියොනාහ**. පු- හාත්පසින් පැතිරවීම.

**පරියොනඬන**. න-මස්තකය, වැළඳගැන්ම.

**පරියොසාන**. න-අවසානය, කෙළවර.

**පරියොසාපිත**. ති - අවසන් කළ, කෙළවර කළ.

**පරියොසාපෙති**. ක්‍රි-(d. භූ සප, ආකොසෙ, ආක්‍රොෂ කිරීමෙහි + ණා + ති) අවසන් කෙරෙයි, කෙළවර කරයි.

**පරියොසිත**. ති-රක්‍ෂාකළ, රැකි.

**පරිරඤ්ජිත**. ති-හඳනා ලද, අලවන ලද, සායම් පොවන ලද.

**පරිරුන්ධන**. න-ආවරණය, මුවහකිරීම.

**පරිලාහ**. පු-දූහය, දූවිල්ල.

**පරීත**. ති-පීඩිත, පෙළුණු, විඩාවට පැමිණි

**පරූප**. න-අන්‍යයා, අනුන්.

**පරූපඝාත**. පු-අනුන් නැසීම.

**පරූපවාද**. පු-(පර + උපවාද) අනුන්ගේ උපවාදය.

**පරූළ්හ**. ති-වැඩුණු, හටගත්.

**පරෙ**. අ-අන්‍යයා. අනුන්.

**පරෙත**. ති-පෙළුණු, පීඩිත, විඩාවට පැමිණි.

**පරෙති**. ක්‍රි-(d. භූ. ඉ. ගතිය, යෑමෙහි + ති) යෙයි.

**පරො**. අ-අන්‍යයා, අත්පුරුෂයා.

**පරොක්ඛ**. පු-පරොක්‍ෂ ඉන්ද්‍රිය- හමුනොවූ පදාර්ථය.

**පරොදති**. ක්‍රි - (d. භූ. රුද, අස්සුමොචනෙ, කඳුලු හෙළීමෙහි + ති, පර + රුද + අ + ති) හඬයි.

**පරොදන**. න-හැඬීම, විලාප කීම.

**පරොපරිය**. ති-මතු, උඩ.

**පරොවර**. පු-පරාත්මභාවය හා සකාත්ම භාවය.

**පරොසත**. න - සියයකට අධික, සියයකින් වැඩි.

**පලු** d.-භූ. ගතිය, යාමෙහි, ප්ලවති, යෙයි, සොප්ලවති හුරාහුජං එලම්වජංච වනසම්ං වානරො.

**පරොසහස්ස**. ති-දහසකින් වැඩි, දහසකට අධික.

**පල්ල**. d -භූ. පහත්ව යාමෙහි.

**පල්ලඞ්ක**. පු-පර්‍ය්‍යඞ්කය, පළක් බැඳීම, ව්‍යාඝ්‍ර රූපාදිය නගා කළ පර්‍ය්‍යඞ්කය.

**පල්ලත්ථ**. න-හිඳගැනීමේ ආසනයක්.

**පල්ලත්ථිකා**. ඉ-වාඩිවීමේ ආසන විශෙෂයක්.

**පල්ලල**. න-කුඩා විල, දිය පිහිටි තැන.

**පල්ලව** පු-ලා පත්‍රය, ලාකොළය.

**පල්ලාස**. පු-විපර්‍ය්‍යාසය, විකාරය.

**පල්ලොම**. පු-පතිත ලොල් ඇත්තා, ලොමු ඩැහැගැනීමක් නැත්තා, බිය රහිතය.

**පල**. d -චු සිඳීමෙහි, පිරිසිඳු කිරීමෙහි, පාලෙති. පලයති සිඳියි, පිරුසිඳු කරයි.

**පල**. d -චු. ගතියං යාමෙහි පලෙති, පලයති, යෙයි.

**පල**. d -භූ. ගමනෙ. යාමෙහි පලති, යෙයි.

**පල** න-පැලීම, කලන්දෙලසක ප්‍රමාණය.

**පලක**. න-පෝරුව, ලෑල්ල.

**පලගණ්ඩ**. පු-වඩුවා, සුධාජීවීහු.

**පලගණ්ඩක**. පු-වඩුවා.

**පලණ්ඩු**. පු-කතලුව.

**පලද්ධ**. ලබන ලද, විශෙෂයෙන් ලබන ලද.

**පලපති**. ක්‍රි-d. චු. ලප, ව්‍යත්තියං වාචායං වියත් වචනයෙහි + ති (ප + ලප + ති) කථා කරයි, කියයි.

**පලපන**. න-කථාකිරීම, සුවදුක් කථාව.

**පලම්බති**. ක්‍රි-d භූ. ලම්බ, ගතිය. යැමෙහි+ති (ප+ලම්බ+ති) එල්බෙයි, එල්ලෙයි.

**පලම්බිත**. ක්‍රි-එල්ලෙන ලද, එල්ලුනු.

**පලම්භති**. ක්‍රි-d. චු. ලභි, මක්‍ෂවනෙ+ති, එල්ලෙයි.

**පලය**. පු-ප්‍රලය, කල්ප විනාසය, මරණය අදශීණය, මායන්වීම.

**පලල**. න-මංසය,

**පලලල**. න-විලය, "ජිණ්ණෙ කොඤ්චාව ඛායනති ඛිණමච්ඡෙව පලලලෙ."

**පලවඞ්ග**. පු-වඳුරා, වානරයා.

**පලඞ්කසා**. ඉ-ගොටුකොළ.

**පලාත**. ති-පැනයාම, දුවගත ගිය, රහසින් ගිය.

**පලාප**. පු-ප්‍රලාපය, නිරත්ථක වචන, බොල්, හිස්.

**පලාපිත**. පන්නන ලද, එලවාදමන ලද.

**පලාපී**. පු-ප්‍රලාප කියන්නා.

**පලාපෙති**. ක්‍රි-(d. චු. ල ප. ව්‍යක්තියං වාචායං වියත් වචනයෙහි+ති) පන්නා දමයි.

**පලායන**. න-පැනයාම, සැඟවියාම.

**පලාල**. අ-විදුරු.

**පලාලපීඨ**. (ක) න. පිදුරු බිස්ස, එතම් වඩය පිදුරු වලින් කළ පුටුව.

**පලාලපුඤ්ජ**. න-තණ බිස්ස, පිදුරු වෙනිය.

**පලාලිත**. ති-මග වැරදීගිය.

**පලාත**. පු-කැලගස, පලාවන් පැහැය, පත්‍රය.

**පලාසාද**. පු-කඟවේනා.

**පලාසික**. පු-ප්‍රලාප කියන්නා, හිස් වචන කියන්නා.

**පලාසී**. පු-ප්‍රලාප ඇත්තා, ප්‍රලාප කියන්නා.

**පලි**. අ-පරි උපසර්ගයාගේ අර්ථවත් පදයක්.

**පලිකුජ්ජති**. ක්‍රි-පිළිකුල් කරයි, පටිකුජ්ජති, බලනු.

**පලිම**. පු-ඉරි ඇඳීම, රේඛා ඇඳීම.

**පලිඛ**. පු-ඉරි ඇඳීම, රේඛා ඇඳීම.

**පලිඛණන**. න-ලිවීම, කැබලි කැබලි කිරීම.

**පලිඛලතා**. ක්‍රි-ලියයි, කැබලි කරයි.

**පලිඛාදන**. න-ලිවීම.

**පලිඛති**. ක්‍රි-(d. ලිඛ, ලෙඛනෙ, ලිවීමෙහි+ති) (ප+ලිඛති) ලියයි කැබලි කරයි.

**පලිබාධති**. ක්‍රි-d. භූ. බාධ නිවාරණෙ, වැලැක්මෙහි+ති) වළක්වයි.

**පලිගිජ්ඣති**. ක්‍රි-(d. භූ. ගිධු. අභිකඞ්ඛායං කැමැත්තෙහි+ති) ගිජුවෙයි.

**පලිගුණ්ඨිත**. ති-වෙළන ලද, ඔතන ලද.

**පලිගුණ්ඨන**. න-වෙළීම, එතීම.

**පලිගෙධ**. ති-ගැනීම, එරීම, ගිලුණු, එලුනු.

**පලිගෙධී**. පු-ආත්මාර්ථකාමියා

**පලිඝ**. පු-බණයම.

**පලිත**. ති-පැසුනු.

**පලිතත**. ති-ගල්වන ලද, කවන ලද.

**පලිබුජ්ඣති**. ක්‍රි-(d. භූ. බුධ, අවබොධෙ, අවබොධයෙහි+ති) ප්‍රබෝධ කරයි.

**පලිප**. පු-ගැලුනු, එලුනු.

**පලිපපලියනත**. පු-මඩේ එරුණු.

**පලිබුජ්ඣන**. න-අවබෝධය.

**පලිපන්න**. ති-එරුණු; ගැලුනු.

**පලිබුද්ධති**. ක්‍රි-(d. භූ. බුධ, අවබොධෙ; අවබොධයෙහි+ති) අවබෝධකරයි.

**පලිප්පති**. ක්‍රි-(d. භූ. ලිප, ලෙපනෙ, තැවරීමෙහි+ති) ගල්වයි, තවරයි.

**පලිබොධ**. පු-හිරිහැරය, කරදරය.

**පලිභඤ්ජන**. න-බිඳීම, කැඩීම.

**පලිභඤ්ජ**. බිඳීම, කැඩීම.

**පලිසති**. ති-රෝදදමු, ආර එකනය.

**පලිවෙඨන**. න-වෙළීම, එතීම.

**පලිවෙඨිත** ති-වෙළනලද; ඔතන ලද.

**පලිවෙඨෙති** ක්‍රි-(d. භූ. වෙඨ, වෙඨනෙ, වෙළීමෙහි+ති) වෙලයි, ඔතයි.

**පලි**. d-භූ. ගමනෙ, යාමෙහි.

**පලුගග**. පු-පලුද්ද, කැඩීම.

(15784)

**පලුජ්ජති**. ක්‍රි-(d. දි. ලුජ, විනාසෙ, විනාසයෙහි + ති) කඩයි, සිඳියි, පලුදු කරයි.

**පලුජ්ජිත**. ති-කඩනලද, පලුදු කරණලද.

**පලුට්ඨ**. පු-පුලුටු, බැදුම, දුම

**පලුද්ධ**. ති-අතිලෝභ, ඉතා ලොහොබි.

**පලුම්පති**. ක්‍රි-(d රු, ලුප, ඡෙදනෙ සිඳීමෙහි + ති,) කඩයි, පලුදු කරයි.

**පලෙති**. ක්‍රි-(d. චු. ගතියං, යෑමෙහි + ණෙ + ති) යෙයි, ගමන් කෙරෙයි.

**පලෙප**. පු-ලේපනය, ගෑම, තැවරීම.

**පලෙපන**. න-ලේපනය.

**පලොක**. පු-පලුද්ද, විනාසය.

**පලොභෙති**. ක්‍රි-(d. භූ. ලුභ, විසමෝහනෙ + ණෙ + ති) ලෝභ කරයි, ආසා කරයි.

**පලොභ**. ලොභය, ආසාව.

**පලොභිත**. ති-ආසා කළ.

**පලොභන**. න-පොළඹවීම, ලොල්වීම.

**පව**. පු-ධාන්‍යාදිය පවිත්‍ර කිරීම, පෙළීම, කුල්ලෙන් පෙළීම.

**පවක්ඛති**. ක්‍රි-(d. භූ වක්ඛ, වාචාය. කීමෙහි + ති, ප + වක්ඛති) කියයි.

**පවච්ඡති** ක්‍රි-(d. භූ. වඡ, කන්තියං, කාන්තියෙහි + ති) කැමැති වෙයි.

**පවජති**. ක්‍රි. (d. චු. වජ, ගතියං, යෑමෙහි + ති) (ප + වජ + ති) යෙයි, යයි.

**පවජන**. න-ගමන යාම.

**පවජ්ජන**. න-හැරීම, බැහැර කිරීම.

**පවඩ්ඪ**. ති-වෘඩිය, වැඩීම

**පවඩ්ඪති**. ක්‍රි-(d භූ. වඩ්ඪ, වඩ්ඪනෙ, වැඩීමෙහි + ති) (ප + වඩ්ඪති) වැඩෙයි.

**පවඩ්ඪන**. න-වැඩීම වෘඩිය.

**පවඩ්ඪිත**. ති-වැඩෙනලද, වැඩුණු.

**පවත්ත**. ති-පැවතෙයි, ප්‍රවෘත්තිත.

**පවත්තති**. ක්‍රි. (d වතු, වත්තනෙ, පැවතීමෙහි + ති) (ප + වත + ති) පවති.

**පවත්තන**. න-පැවැත්ම, පැවැත්වීම.

**පවත්තිත**. ති-පවත්නා ලද, පැවති.

**පවත්තඵල**. න. වැටුණගෙඩි, ගසෙන් වැටුණු ඵල.

**පවත්ති**. ඉ. ප්‍රවෘත්තිය, වෘත්තාන්තය, පවත්.

**පවත්තින**. ති-පවත්වන ලද පැවති

**පවත්තු**. පු-සර්වඥයන් වහන්සේ.

**පවත්තෙති**. ක්‍රි-(d. භූ. වතු, වත්තනෙ, පැවැත්මෙහි + ති) පවත්වයි, පැවැත්ම කරයි.

**පවදති**. ක්‍රි-(d. භූ. වද වචනෙ, කීමෙහි + ති) (ප + වද + ති) කියයි.

**පවදන**. න ප්‍රවදනය, උතුම්වචනය, සුළඟ නහාතය, වනලහැබ.

**පවපති**. ක්‍රි-(d භූ. වප, බීජ සන්තානෙ, බිජු වැපිරීමෙහි + ති) වපුරයි බිජු, වපුරයි.

**පවන**. න-සුළඟ.

**පවපන**. න-වැපිරීම, ධාන්‍ය වැපිරීම.

**පවනාසන**. න-වාතය, අනුභව කරන්නා; සර්පයා.

**පවමාන**. න-සුළඟ.

**පවයහ**. පු-ඉසිලීම, ඉහිලීම.

**පවර**. පු ප්‍රවර, අතිශ්‍රෙෂ්ඨ, ඉතා උතුම්.

**පවස්ස**. පු-වශීව, වශීකරව.

**පවස්සති**. ක්‍රි-(d. භූ. වස පගඝරණෙසු, වැගිරීමෙහි + ති) වසී, වශීකරයි.

**පවස්සන**. වශී කිරීම.

**පවහන**. න-වෙහි, වෙහිතැබීම.

**පවාත**. පු-මහාවාතය.

**පවාති**. ක්‍රි-(d භූ. වා, ගතියං, යෑමෙහි + ති) හුලං හමයි. හුලං ගසයි.

**පවාද**. පු ප්‍රවාදය, මහත් වාදය.

**පවායති**. ක්‍රි-(d. භූ. වා, ගතියං, යෑමෙහි + ති) සුලං හමයි.

**පවාරණ**. වැලකීම, නැවැත්ම, ආරාධනය.

**පවාරිත**. ති. පැවරූ, පවරණ ලද.

**පවාරෙති**. ක්‍රි-(d. චු. වර, ආවරණෙ, ඈවිරීමෙහි + ණෙ + ති) පවරයි, ආරාධනා කරයි.

**පවාස**. න-පිටරට වාසය, 'මයමස්සු භො ගොතම **පවාසං** ගන්තුකාම'' අංගුත්තර 8 නි. 6. වර්ගය.

(15837)

**පවාසිත.** ති-පිටරට වාසය කළ.

**පවාසී.** පු-පිට රටවැසියා.

**පවාහ** පු-ප්‍රවාහය, ජලස්‍රොතය.

**පවාහණ.** න පාකොට හැරීම, ජලයෙහි පා කොට හැරීම.

**පවාහති.** ක්‍රි-(d භූ වහ, පාපුණනෙ, පැමිණ වීමෙහි + ති) පාකොට හරී.

**පවාළක.** ති ගසාගෙණ ගිය, පාවී ගිය.

**පවාළ.** න-ප්‍රවාල, පබළු, පබුලු අංකුර,

**පවි.** පු-වජ්‍රායුධය.

**පවිරති.** ක්‍රි (d. භූ. විර, වික්කනතියං, බැහැර යාමෙහි + ති) (ප + වි + රති) හැසිරෙයි.

**පවිචනති.** ක්‍රි-(d. භූ චි, චයෙ, රැස් කිරීමෙහි + ති) වෙසෙසින් රැස් කෙරෙයි.

**පවිචය.** පු-වෙසෙසින් රැස්කිරීම.

**පවිජ්ඣන.** න-විදීම, පෙරළීම.

**පවිචිනන.** න-රැස්කිරීම.

**පවිජ්ඣති.** ක්‍රි-(d භූ. විධ, විජ්ඣනෙ, විදීමෙහි + ති) විදියි, පෙරලයි.

**පවිජ්ඣන** විදීම, පෙරලීම.

**පවිජ්ඣිත.** පෙරලන ලද, විදිනලද.

**පවිට්ඨ.** ති-ප්‍රවිෂ්ඨ, ප්‍රවෙශ වූ, ඇතුලත් වූ.

**පවිතක්ක.** පු-විතර්කය, සංකල්පය.

**පවිත්‍ර.** න-පිරිසිදු.

**පවිත්ත.** ති-පවිතුරු, පිරිසිදු, පවිත්‍ර.

**පවිද්ධ.** ති-විදින ලද.

**පවිනෙති.** ක්‍රි-(d. භූ. නී, නයෙ, පැමිණවීමෙහි + ති) හික්මවයි.

**පවිවිත්ත.** ති-උත්තම විවෙකය, උතුම් විවෙක ඇති, පවත්වන ලද.

**පවිවෙක.** ති-උතුම් විවෙකය.

**පවිවෙකිය.** ති-උතුම් විවෙක ඇත්තා,

**පවිසති.** ක්‍රි-(d. භූ. විස, පවෙසනෙ, පිවිසීමෙහි + ති) පවිසති, ප්‍රවිෂ්ටවෙයි. ඇතුලත් වෙයි.

**පවිසන.** න-ප්‍රවෙශය, ඇතුලත්වීම්.

**පවිසඞ්ඛිලෙක.** පු-විවාදඋපන්නය, විවාදයට පැමිණියනු.

**පවීන.** ති-ප්‍රවීන, දක්‍ෂ, සමර්ථ.

**පවුච්චති.** ක්‍රි-(d. භූ වච, වියත්තියං වාචායං, වියත් බැව්හි + ති) කියයි.

**පවුත්ත.** ති-කියන ලද.

**පවුද්ධරී.** මහත්වූ භූමි විවරය.

**පවෙක්ඛති.** ක්‍රි-(d භූ. වෙක්ඛ, වෙක්ඛණෙ, බැලීමෙහි + ති) (ප + වි + ක්ඛ + ති) බලයි, පරීක්‍ෂා කරයි.

**පවෙච්ඡති.** ක්‍රි-(d. භූ. විචාර ගතිසු, යෑමෙහි + ති) අනුව ප්‍රවෙෂ කරයි, අනුව දෙයි.

**පවෙණි.** ඉ-ප්‍රවෙණිය, පරම්පරා අයිතිය හා කෙස කලාපය හා ස්තරණය, ඇතුල් පිට අතුරණ චිත්‍ර කම්බිලිය.

**පවෙධන.** න-දැන්වීම, නිවේදනය.

**පවෙධිත.** ති-දන්වන ලද, හඟවන ලද.

**පවෙධෙති** ක්‍රි-(d. චු. විධ, විධානෙ; විධාන යෙහි + ති) දන්වයි.

**පවෙධෙති.** ක්‍රි-(d. චු. විධ, කම්පනෙ, සැලීමෙහි + ති) කම්පාවෙයි, වෙවුලයි.

**පවෙධමාන.** න-කම්පාවන, වෙවුලන.

**පවෙල්ලති.** ක්‍රි. (d. භූ. විල, සංවරණ, සංවරයෙහි + ති) සොලවයි, චංචල වෙයි.

**පවෙල්ලිත.** ති සොලවන ලද, සෙල්ලු.

**පවෙස.** පු-ප්‍රවෙසය, ඇතුලත්වීම.

**පවෙසක.** පු-ප්‍රවෙස කරන්නා, ඇතුලත් කරන්නා.

**පවෙසන.** න-ප්‍රවෙසනය, ඇතුලත් කිරීම.

**පවෙසිත.** ති-ප්‍රවෙස කළ, ඇතුලත් කළ.

**පස.** d චු. නාසෙ, නැසීමෙහි, පසෙති, පසයති, නසයි.

**පස.** d. චු. බන්ධනෙ, බැඳීමෙහි, පාසෙති, පාසයති, බඳියි.

**පස.** d. භූ. බැලීමෙහි, පස්සති, බලයි.

**පස.** d චු. සම්ඵස්සෙ, ස්පර්ශයෙහි, පසෙති, පසයති, ස්පර්ශකරයි.

**පසක්කති.** ක්‍රි-(d. භූ. සක්ක, ගතියං, යෑමෙහි + ති) ලඟට පැමිණෙයි.

(15888)

**පසක්කන**. න-ළඟට පැමිණීම, සමීපයට එළඹීම.

**පසක්කිය**. අ-ළඟට පැමිත.

**පසඞ්ග**. පු-ප්‍රසංගය, අහම්බය.

**පසඞ්ගික**. පු-ප්‍රසංගය, අහම්බය.

**පසංසති**. ක්‍රි-(d. භූ. සංස, පසංසනෙ, ප්‍රශංශාමෙහි+ති) ප්‍රසංසා කරයි.

**පසංසන**. න-ප්‍රශංසාව, ප්‍රශංසා කිරීම.

**පසංසා**. ඉ-පැසසීම, සතුති කිරීම.

**පසංසිත**. ප්‍රශංසා කළ, පසසන ලද.

**පසක්කති**. ක්‍රි (d. භූ. සක්ක, ගතියං, යැමෙහි +ති) ඉදිරියට යෙයි.

**පසංසිය**. ති-පැසසිය යුතු, ප්‍රශංසා කටයුතු.

**පසත**. පු-හකුළුවන ලද, හස්ත තලය, උළක්කුව, පත.

**පසත්ථ**. ති-ප්‍රසස්ත, පසස්නාලද දෙය.

**පසත්ථතර**. ති-අතිසයින් පැසසිය යුතු, ඉතා ප්‍රශංසා කටයුතු.

**පසද**. පු-මෘග විශෙෂයක්.

**පසන්න**. පු-ප්‍රසන්න, පහන්, නිමල, පැහැදුනු, ජලය.

**පසන්නා** ඉ-සුරා.

**පසන්නතා**. ඉ-ප්‍රසන්න බව, පැහැදුනු බව.

**පසංසති** ක්‍රි-(d. භූ. සංස, පසංසනෙ, පැසසීමෙහි+ති, ප+සංස+ති) පසසයි. සතුති කරයි.

**පසය්හ**. පු-මැඩ, බලහත්කාරකොට.

**පසර**. පු-පැතිරීම, පතළ කිරීම.

**පසව**. පු-ප්‍රසවය, මල්, ගෙඩි, උත්පත්තිය, ප්‍රසූතිය.

**පසවති**. ක්‍රි-(d. භූ. පසව, ගතියං, යැමෙහි+ති) රැස් කරයි, උපදවයි, පලදෙයි.

**පසවන**. න-රැස් කිරීම.

**පසව්‍ය**. ති-විපරීතය.

**පසහ**. පු-බලහත්කාරය.

**පසහති** ක්‍රි-(d. භූ. සහ, බත්තියං, ක්ෂාන්ති-යෙහි+ති) මඩියි, බලහත්කාර කරයි.

**පසාඛා**. ඉ-අතුවලින් හටගත් රිකිලි, කුඩා අතු.

**පසාද**. පු-ප්‍රසාදය, පැහැදීම, ප්‍රසන්නතාව.

**පසාදක**. පු-පහදවන්නා, පැහැදීම කරන්නා.

**පසාධන**. න-පළඳනාව, ආභරණය.

**පසාදනීය**. ති-ප්‍රසාදණීය, පැහැළලවන.

**පසාදිය**. ති-පැහැළලවන, ප්‍රසන්නය, ඇති කරණ.

**පසාදෙති**. ක්‍රි-(d භූ. සාද, සාදනෙ; රස විඳීමෙහි+ති) පහදවයි.

**පසාධන**. න-පළඳනාව, පැළඳීම.

**පසාධිත**. ති-පළඳනා ලද, සරසන ලද.

**පසාධෙති**. ක්‍රි-(d. දි. සාධ, සංසිද්ධියං, සැදී-මෙහි+ති) පළඳියි, සැරසෙයි.

**පසාරණ**. න-ප්‍රසාරණ, අතපය ආදිය දිගු කිරීම.

**පසාරිත**. ති-දිගුකළ, දිගහරින ලද.

**පසාරෙති**. ක්‍රි-(d. භූ. සර, දුබ්බල්‍යෙ, දුබල බැව්හි+ණෙ+ති) දිගු කරයි. දිග හරියි.

**පසාසති**. ක්‍රි-(d. භූ. සාසු, අනුසිඨිමහි+ අනුශාසනයෙහි+ති) (ප+සාස+ති) අනු-සාසනාකරයි. අවවාද කරයි.

**පසාසන**. න-අනුසාසනය.

**පසිති**. ඉ-බන්ධනය.

**පසිබ්බක**. න-පසුම්බිය.

**පසිබ්බිත**. ති. මසන ලද, ගෙත්තම් කළ.

**පසිද්ධ**. ති-ප්‍රසිද්ධ, ප්‍රකට.

**පසීදති**. ක්‍රි-(d භූ. සද, විසරණෙ, ආකුල බැව්හි+ති) පහදියි.

**පසීදන**. න-පැහැදීම.

**පසු**. පු-මෘගාදි සිව්පා සත්වයා, එළුවා.

**පසුක**. පු-මෘගයා, සිවුපාවා,

**පසුත**. ති-යෙදුනු, නියුක්ත.

**පසුපති**. පු-ඊශ්වරයා, මෘගෙන්ද්‍රයා, සිංහයා.

**පසුර**. ති-බොහෝ, බහුල.

**පසූත**. පු-ප්‍රසූත, දරුවන් වැදීම.

**පසූතා**. ඉ-දරුලද්දී, වැදූනැනැත්තී.

(15942)

**පසූති.** ඉ-වැදීම, ඉපදවීම.

**පසූතිකා.** ඉ-දරු ලද්දි, වැදූ තැනැත්තී.

**පසූතිඝර.** න-වදන ගෙය, තිඹිරි ගෙය.

**පසෙවක.** පු-කරාවිය, විනාඹරුව

**පස්ස.** න-පාශ්‍රීය, පස, ඇලය.

**පස්ස.** ක්‍රි-(d. භූ. දිස, පෙක්ඛන, බැලිමෙහි+ති) බලව, නිරීක්‍ෂණය කරව.

**පස්සති.** ක්‍රි-(d භූ. දිය, පෙක්ඛණ, බැලීමෙහි +ති) බලයි.

**පසකී** න-පල ඇටය.

**පසඛ.** ති-බර හරින ලද.

**පස්සඩි.** අ-බර ඇරීම, බර හැරීම,

**පස්සන.** දූකීම, බැලීම.

**පස්සමය.** න-පාශ්‍රීවය. දැල

**පස්සනා** ඉ-දැක්ම, දශීනය

**පස්සනක.** ති-දක්නා

**පස්සම්භති.** ක්‍රි-(d. දි. සම්භු, පාපුණනෙ, පැමිණ වීමෙහි+ති) බර ඇරෙයි.

**පස්සම්භන.** න-බර ඇරීම.

**පස්සම්භිත.** ති-බර හරින ලද.

**පස්සය.** න-ආරක්‍ෂාව.

**පස්සයවති.** ක්‍රි. (d. භූ. සව, ගතියං, යැමෙහි+ ති) ගලයි.

**පස්සසති.** ක්‍රි (d. භූ. සස, සුපනෙ, හුස්ම ගැනීමෙහි+ති) ප්‍රශ්වාස කරයි. පහතට හුස්ම හෙලයි.

**පස්සාව.** පු-මූත්‍ර, මරදීය.

**පස්සාවමග්ග.** පු-මූත්‍ර මාර්ගය. ස්ත්‍රී පුරුෂ නිමිති.

**පස්සාස.** පු ප්‍රශ්වාසය, හුස්ම පහත හෙලීම.

**පසසිත.** ති-දක්නා ලද.

**පංසු.** d. භූ යටට හෙලීමෙහි=පංසුති, යටට හෙලයි.

**පහට.** ති-ගසනලද, තලන දල.

**පහඨ.** ති-අතිශයින් සතුටුවනලද.

**පහත.** ති-ගසනලද, නසනලද.

**පහරණ.** න-ගැසීම, තැලීම, ආයුධය.

**පහරති.** ක්‍රි-(ප+හරති) ගසයි, තලයි.

**පහාණන.** න-ගැසීම, තැලීම, නැතිකිරීම,

**පහාය.** අ-හැර, අත්හැර.

**පහාර.** පු-ප්‍රහාරය, පහර, යාම නම්වූ, කලා විශෙෂය.

**පහංසති.** ක්‍රි-(d. භූ. හංස, පීතියං, ප්‍රීතියෙහි +ති) (ප+හංස+ති) සතුටු කෙරෙයි.

**පහංසන.** න-සතුටු කිරීම.

**පහංසිත.** ති-සතුටුවන ලද, සතුටුවූ.

**පහාන.** න-ප්‍රහාණය, විනාශය.

**පහාර.** ප්‍රහාරය, පහර.

**පහාරණ.** න-ප්‍රහාර දීම, ගැසීම.

**පහාරද.** පු-එනම් අසුරයා.

**පහාස.** පු-මහ සිනාව.

**පහාසති.** ක්‍රි. (d. භූ. හස, හසනෙ, සිනාසී මෙහි+ති) (ප+හාස+ති) මහත් කොට සිනා සෙයි.

**පහාසෙති.** ක්‍රි-(d. භූ. හස, හසනෙ, සිනාසී මෙහි+ණෙ+ති) මහත් කොට සිනාසෙයි.

**පහිත.** ති-යවනලද, පමුණුවනලද.

**පහිණන.** න-යැවීම.

**පහිතත්ත.** න-නිවන් පිණිස යවන ලද සිත.

**පහීණ.** න-ප්‍රහීන, ප්‍රහීනකළ, නැතිකළ.

**පහීනක.** පු-ප්‍රහීන කරන්නා, නැතිකරන්නා.

**පහීයති.** ක්‍රි-(d. භූ. හා, චාගෙ, පරිත්‍යාගයෙහි +ති) ප්‍රහීන වෙයි.

**පහු.** අ-බොහෝ අධික.

**පහුත.** න-බොහෝ, අධික.

**පහුතික.** න-පොහෝනා.

**පහෙන.** න-යැවීම, දූතයෙකු යැවීම.

**පහෙණක.** පු-හුන් තැනට යවන පඬුර.

**පහොණක.** න-පොහොසත්, පුළුවන්.

**පහොති.** ක්‍රි-(d. භූ. හු, සත්තායං, වීමෙහි+ති) පොහෝනේවෙයි, පුළුවන් වෙයි.

**පහොණ.** න-පොහෝනා, පමණ, හැකි.

**පහොණක.** ති-පොහෝසත්.

**පළවවර.** න-මහලු, පිළි, දිරූ වස්ත්‍ර.

**පළිගිජ්ඣන.** න-ගිජුවීම, මහත්කොට ගිජුවන

**පළිගෙධ.** පු-ගැලීම, එරීම.

**පළිබොධ.** පු-හිරිහැරය, කරදරය.

(16004)

# පා

**පා.** d. භූ. රක්ඛණෙ රැකීමෙහි, පාති රකියි.

**පා.** d. භූ. පානෙ, පීමෙහි, පාති, පිබති, පිවති, පානය කරයි, බොයි.

**පා.** d භූ. පූරණෙ, පිරීමෙහි පාති, පුරවයි.

**පා.** d. භූ. රැකීමෙහි, පාති, ආරක්ෂා කරයි.

**පාක.** පු-පිසීම, පිපාසය.

**පාකට.** පු. ප්‍රකට, ප්‍රසිඬ, පතළ.

**පාකටික.** පු-ප්‍රකට, ප්‍රසිඬ, පතළ.

**පාකටට්ඨාන.** න-මුලුතැන්ගෙය, පිසන ගෙය.

**පාකතික.** න-ප්‍රකෘතිමත්, පෙර තිබූ පරිදි සකස් කර.

**පාකතින්ද්‍රිය.** න-ප්‍රකෘති, ඉන්ද්‍රිය, නොදමුන ඉන්ද්‍රිය ඇත්තා.

**පාකම්ම.** පු-අභිඤ්ඤානාදි වශයෙන් කැමති දෙය නිපදවීම.

**පාකළ.** න-උපුල් කොල, කොව්වටන්

**පාකසාසන.** න ශක්‍රයා, සක්දෙව්රජ.

**පාකාර.** පු. න-ප්‍රාකාරය, පව්ර, කොටු තාප්පය.

**පකාසිය.** ති-සාක්‍ෂ්‍ය, විවෘත, පිරිසිදු,

**පාකුල.** ති-ආකුල, ව්‍යාකුල,

**පාගබ්භිය** න-නිර්භීතකම, ප්‍රගතිශීලි බව.

**පාගුඤ්ඤතා.** ති-ප්‍රගුණ බව.

**පාචක.** පු-පිසන්නා, උයන්නා, පිසීම කරන්නා

**පාචන.** න-පිසීම, පාචන රෝගය.

**පාචනනල.** ති-පාකාග්නිය, පිසනගින්න.

**පාචරිය.** පු-(ප + ආචරිය) ආචාර්යයාගේ ආචාර්යයා, ප්‍රාචාර්යයා.

**පාචිත්තිය.** න-පචිත්තිය, එනම් ඇවත.

**පාචි.** ඉ-ප්‍රාචි, පෙරදිග, නැගෙනහිර දිසාව.

**පාචීණ.** න-ප්‍රාචීන, නැගෙනහිර, නැගෙනහිරට අයත්.

**පාචෙති.** ක්‍රි-(d. භූ. පච, පිසීමෙහි + ණෙ + ති) (පච + ණෙ + ති) පිසවයි.

**පාජන.** න-නැබීම, රථාදිය නැබීම.

**පාදිත.** පු-පදිනලද, රථාදිය පදින ලද.

**පාජාපෙති.** ක්‍රි-(d චු. පජ, ගතියං, යෑමෙහි + ණෙ + ති) පදවයි.

**පාජෙති.** ක්‍රි-(d. චු. පජ, ගතියං, යෑමෙහි + ණෙ + ති) පදියි.

**පාටංකි.** ඉ-පල්ලක්කිය, ඤ්ජාම.

**පාටල.** පු-පලොල් මල් පැහැය වැනි සුදු මුසු රත් පැහැය.

**පාටලි.** ඉ-පලොල්ගස.

**පාටලිපුත්ත.** පැලලුප් නුවර, පාටලිපුත්‍ර නගරය.

**පාටව.** අ- දක්ෂ, සමර්ථ.

**පාටිකඞ්ඛා.** ඉ-කැමතිවිය යුත්තී, අභිලාෂා ඇත්තී.

**පාටිකංඛී.** ඉ-කැමතිවිය යුත්තී.

**පාටිකා.** ඉ-සඳකඩ පහන, අර්ධ චන්ද්‍රාකාර යෙන් කළ ගල්ලෑල්ල.

**පාටිකුල්ලිය.** පිළිකුල, අරුචිය.

**පාටිකුලතා.** ඉ-පිළිකුල් බව, අරුචි බව

**පාටිදෙසනීය.** දෙසිය යුතු, දේශනා කටයුතු.

**පාටිපද.** පු-පැළවිය, දෙවෙනි තිථිය, දෙවෙනිද, පාක්ෂයාගේ දෙවෙනි දවස

**පාටිපලක.** න-පැලවිය.

**පාටිපාදික.** පු-පැළිවියට අයත්, පැලවිය.

**පාටිපුග්ගලික.** ති-පුද්ගලයන්ට අයත් තම තමන්ට අයත්.

**පාටිභොග.** පු-ඇපය, කෙනෙක් වෙනුවට ඇපවීම.

**පාටිමොක්ඛ.** පු-ප්‍රාතිමොක්ෂය, පාමොක්.

**පාටිරූපික.** ති-වංචාකාර, වෙස්වලාගත්.

**පාටිපෙක්ක.** පු-වෙන වෙන, එක එකා පිළිබඳ.

**පාටිහාර.** පු ප්‍රාතිහාර්යය, පෙළහර, ආශ්චර්යය

**පාටිහාරික.** පු-ආශ්චර්යයෙන් යුත්, ප්‍රාතිහාර්යයෙන් යුත්.

(16055)

**පාටිහාරියපක්ඛ**. න-ප්‍රාතිහාර්‍ය පක්ෂය.

**පාටිහාරිය**. ති-ප්‍රාතිහාර්‍යය පිළිබඳ

**පාටිහීර**. න-ප්‍රාතිහාර්‍යය, ආශ්චර්‍යය, අද්භූත දෙය.

**පාටිහෙරියපක්ඛ** ප්‍රතිහාර්‍ය පක්ෂය, වස්තුත් මාසය පවාරණ දෙකට අතරවූ චීවර මාසය, පළමු මහා පවාරණයෙහි පටන් පසළොස් දවසක් වන කාලය.

**පාටිහාරික**. පු-ප්‍රාතිහාර්‍යයෙන් යුත්.

**පාටිහෙර**. න-ප්‍රාතිහාර්‍යය.

**පාටෙක්ක**. න-තනි, හුදකලා,

**පාටෙති**. ක්‍රි-(d භූ. පට, ගතියං, යැමෙහි + ණෙ + ති) අස්කරයි.

**පාටිරූපක**. ති-ප්‍රතිරූපයට අයත්.

**පාඨ**. පු-වාක්‍යය, අක්ෂරය, කීම.

**පාඨක**. පු-කියවන්නා, උගන්වන්නා.

**පාඨා**. ති-දියමිත්ත.

**පාඨීන** පු-පෙතියා, පෙතියායි ප්‍රසිඬ මාලුවා, ගුගුල්රුක.

**පාණ්ඩව**. පු-එනම් පර්වතය, පාණ්ඩව පර්වතය

**පාණ්ඩු** පඬු පැහැය.

**පාණ්ඩුකම්බල කම්බල**. න-පඬුවන් කම්බිලිය, පඬුවන් ඇති පොරොණය.

**පාණ**. පු-ප්‍රාණය ජීවිතය, ශක්තිය, සත්වයා, පාදය

**පාණක**. පු පණුවා.

**පාණාතිපාත**. පු-ප්‍රාණාතිපාතය, ප්‍රාණවධය.

**පාණන**. න-හුස්ම ගැණීම, ආශ්වාසය.

**පාණිකා**. ඉ-හැඳිවගීයක්.

**පාණි**. පු-හස්තය, සත්වයා, බිම සිලුටුකිරීමට සාදන දුරුමය හස්තය.

**පාණිතල**. න-අල්ල, අත්ල.

**පාණිගහිතා**. ති-ප්‍රණිග්‍රහනය ලද්ද, භාර්‍යාව.

**පාණිගහණ**. පු-අත් අල්වා ගැනීම, විවාහය.

**පාණිස**. පු-අත් තලගසන්නා.

**පාණිපීළන**. න-විවාහය.

**පාණිමුත්ත**. න-අඩයටි ආදී විසිකරණ දමා ගසන ආයුධාදිය.

**පාණිස්සර**. න-ඥනැටි ගැසී, අත්තල ගැසීම, අප්පුඩි ගැසීම.

**පාණිය**. න-පැත්, අත්තලගසන්නා.

**පාණිවාද**. පු-අත්තල ගසන්නා, කයිතාලම් ගසන්නා.

**පාණ්‍යඞ්ග**. පු-පෙකතිය, ප්‍රාණි අවයවය

**පාත**. අ-උදය.

**පතන**. න-හෙළීම, පතනය, වැටීම.

**පාතරාස**. න-උදය බත, ගිල් බත.

**පාතව්‍ය** න-පිය යුතු, නැසිය යුතු.

**පාතව්‍යතා**. ති-නැසිය යුතු බව, පිය යුතු බව.

**පාතාපෙති**. ක්‍රි-(d. භූ තප, සන්තාපෙ, තැවීමෙහි + ණෙ + ති.) පෙළයි, තසයි.

**පාතාල**. න-නාගභවනය, වඩවා මුඛය.

**පාති**. ඉ-කැටිය, පාත්‍රය, වළඳන භාජනය.

**පාතික**. පු-පාත්‍රයට අයත්.

**පාතික**. ති-හෙළන ලද, දමන ලද.

**පාතිමොක්ඛ**. පු-ප්‍රාතිමොක්ෂය.

**පාතිමොක්ඛුද්දෙස**. න-පාමොක් දෙසීම.

**පාතුකරණ**. න-පහල කරණ, නිපදවන.

**පාතුභවන**. න-පහලවීම, හටගැනීම.

**පාතුභාව**. පු-පහලවීම, හටගැන්ම

**පාතුං**. අ-ප්‍රාදුර්භාව, සම්මුඛත්ව, ප්‍රකාශ, උප්පත්ති, යන මෙහි.

**පාතුභූත**. ඉ-පහලවූ.

**පාතුකම්‍යතා**. ඉ-පැත් බොනුරිස්ස, බොනු කැමැත්ත.

**පාතෙති**. ක්‍රි-(d භූ. පත, ගතියං, යැමෙහි + + ණෙ + ති) හෙලයි, දමයි.

**පාතො**. අ-උදය, පූර්වාහනය, උදය කාලය.

**පාථෙය්‍ය**. න-මඟට හිතදේ, මාර්ගෝපකරණ මගවියදම.

**පාථෙය්‍යක**. න-පාථෙය්‍ය බලනු

**පාද**. පු-සතරෙන් කොටස, පාදය, පය, ප්‍රත්‍යන්ත පර්වතය, මූරල.

**පාදක**. පු-පාදය.

(16111)

**පාදකජ්ඣාන.** න-පාදකධ්‍යානය, භාවනාවට ආධාර වන අරමුණ.

**පාදකටක.** පු-නුරුවලා, පාදාභරණය.

**පාදකඨලික.** න-පාතබඟ දූවය.

**පාදගණ්ඩි.** ඉ-පයගැටිය, ගොප් ඇටය.

**පාදජාල.** න-පාදූල, මේස් වගීයක්.

**පාදඞ්ග.** පු-පාදාග්‍රය, පා අග, අක්පතුල.

**පාදඞ්ගද.** න-නුරුවලා, සිලම්බු.

**පාදප.** පු-පයින් පැන්බොන්නා, වෘක්ෂය, හක්වන පුටුව.

**පාදපරිචාරිකා.** ඉ-භාර්‍යාව, බිරිඳ.

**පාදපීඨ.** පය තබනා පුටුව, පාදුකාව.

**පාදපඤ්ජන.** න-පය ගල්වන බෙහෙත්.

**පාදපොඨ.** පු-පයපොල.

**පාදමූල.** පු-පාමුල, පාදසමීපය.

**පාදමූලික.** පු-බැලපිණිස පයින්යන්නා.

**පාදලොල.** පු-ගිජු තැනැත්තා.

**පාදහිත.** න-පයට හිතදේ, වහන් ආදිය.

**පාදවිසාණ.** න-පයේ ඇති අඟ.

**පාදසම්බාහණ.** න-පා මැඩීම, පා මිරිකීම.

**පාදික.** ති-පා ආදිය, ප ආදි උපසර්ග.

**පාදු.** ති-වහන් සෙරෙප්පු, සපත්තු, මිරිවැඩි ආදිය.

**පාදුකාර.** සොම්බරුවා, වහන් ආදිය සාදන්නා.

**පාදුකා.** ඉ වහන් මිරිවැඩි, වැසිකිලිකෙ සකිලි වල පාදුකා, සපත්තු.

**පාදූදර.** පු-(පාද+උදර) උදරය පාදකොට ඇත්තා, සර්පයා, බඩගාගත යන්නා, උරගයා.

**පාදෝදක.** න-(පාද+උදක) පා සෝදන ජලය.

**පාන.** න-පියයුතු පැන්, ජලය.

**පානක.** න-ජලය, පානය කටයුත්ත.

**පානකූප.** පු-පැන් බොන ළිඳ, ළිඳ.

**පානපත්ත.** න-රා බොන ඔබම, රා බොන කෝම්බය.

**පානමණ්ඩල.** න - පානභූමිය, සුරාහල, තැබෑරුම.

**පානාගාර.** න-පාන මණ්ඩලය.

**පානීය.** න-පියයුතු ජලය, ජලය.

**පානීය සරාවක.** පු-පැන්මල, දියබොන බඳුන.

**පාප.** න-පාපය, අකුශලය.

**පාපක.** පු-පාපයෙන් යුක්තය, පව්කරන්නා.

**පාපතර.** පු-අතිශයින් පව් ඇත්තා.

**පාපන.** න-පැමිණවීම, බාරකිරීම,

**පාපනික.** පු-වෙළෙන්ද, වාණිජයා.

**පාපනීය.** පු-පැමිණ වියයුතු.

**පාපගොචර.** පු-පාපය ගොචරකොට ඇත්තා, පාපයෙහි ඇලීවසන්නා.

**පාපචලී.** ඉ-දියමිතන.

**පාපභීරු.** ති-පවට බියවන්නා.

**පාපමිත්ත.** පු-පවිටු මිත්‍රයන් ඇත්තා.

**පාපික.** පු-අතිශයින් පව් ඇත්තා, පවිටා.

**පාපිත.** ති-පමුණුවනලද, එලවනලද.

**පාපිච්ඡා.** ඉ-පාපඉච්ඡාව, පවිටු ආසාව, පවිටු අදහස.

**පාපිඨ.** පු-අතිශයින් පව් ඇත්තා

**පාපිඨතර.** පු-ඉතා අධික පව් ඇත්තා.

**පාපිමන්තු.** පු-පව් ඇත්තා, පාපියා.

**පාපුනන.** න-පැමිණවීම, ලැබීම.

**පාපුනාති.** ක්‍රි-(d. සවා, අප, පාපුණනෙ, පැමිණ වීමෙහි+ති) පැමිණෙයි ලැබෙයි.

**පාපුනිය.** පු-ගෙණ ආ යුතු දෙය.

**පාපුනන.** න-පොරෝනය, ඉපාරෝනා රෙද්ද

**පාපෙති.** ක්‍රි-(d සවා, අප, පාපුණනෙ, පැමිණ වීමෙහි+ණෙ+ති) පැමිණෙයි ලැබෙයි.

**පාභත.** න-මිල, පඩුර.

**පාභති.** න-ගෙණ ආ දෙය, තෑග්ග, අල්ලස.

**පාම.** න-විතච්ඡිකානම් කුෂ්ඨය.

**පාමංග** පු-පාදාභරණය, පයලන සිලම්බු හවඩිය.

**පාමර.** පු-නීචයා, හීනයා.

**පාමුජ්ජ.** පු-ප්‍රමොද්‍යය, ප්‍රීතිය.

(16170)

**පාමෙක්ඛ.** පු-උතුම්, ප්‍රධාන, ඉදිරියෙහි සිටින්නා, ප්‍රමුඛයා.

**පාමොජ්ජ.** පු - සන්තොෂය, ඉතා බලවත් ප්‍රීතිය.

**පාය.** d. භූ, වුඩ්ඪියං වැඩීමෙහි, පායති, වැඩෙයි.

**පායන්ත.** ති-පානය කිරීම.

**පායති.** ක්‍රි-(d. භූ, පාය, වුඩ්ඪියං, වැඩීමෙහි + ති) වැඩෙයි.

**පායන්තක.** පු-පිටත්ව යන්නා.

**පායස.** පු-සරල ද්‍රව්‍යය.

**පායසො.** අ-බොහෝ සේ.

**පායාත.** ති-පිටත්වූ, ඉදිරියට ගිය.

**පායාති.** ක්‍රි-(d, භූ. යා, ගතියං, ගච්ඡති + ති) යෙයි.

**පායාස.** පු-කිරිබත, කිරෙන් පිසූ බත.

**පායි.** d. භූ. වුඩ්ඪියං වැඩීමෙහි, යාති වැඩෙයි.

**පායිත.** ති-පොවනලද, පානය කරවනලද.

**පායු.** පු-ගුදය, මලමාර්ගයාගේ දොර.

**පායෙති.** ක්‍රි-(d. පා, පානෙ බීමෙහි + ණෙ + ති) පානය කරවයි.

**පායො.** අ-බාහුල්‍යයෙහි, බොහෝසේ.

**පාර.** d. චු, කටයුතු නිමවීමෙහි, පාරෙති, පාරයති, කටයුතු නිමවයි.

**පාරං.** අ-එතර, එගොඩ.

**පාර.** d. චු. යටත් බැව්හි, පාරෙති, යටත් වෙයි, පූරණය, සමාපත්තිය, යනමෙහි.

**පාර.** න-එතෙර, නිවණ, සසරින් එතරවීම.

**පාරගත.** ති-පරතෙරට ගිය, එගොඩට පැමිණී.

**පාරගමන.** න-පරතෙරට යාම, සසරින් එතරවීම.

**පාරද.** පු-රසදිය.

**පාරමිතා.** ති-දානාදි ගුණධර්ම වැඩීම.

**පාරමී.** ඉ-පාරමිතා.

**පාරම්පරිය.** න-උපදෙශ පරම්පරාව, වංශය, අන්වය.

**පාරාජික.** පු-පැරදීම, කෙලෙසුන්ගෙන් පැර දීම.

**පාරාපත.** පු-පරවියා.

**පාරායන.** න-පරතෙරට යාම.

**පාරාවත.** පු-පරවියා, පරෙයියා.

**පාරිචරියා.** ඉ-පාරචරියාව, වතාවත් කිරීම.

**පාරිච්ඡත්තක.** පරසතු රුක.

**පාරිජාතක.** පු-පරසතු රුක.

**පාරිජුඤ්ඤ.** න-පිරිහීම.

**පාරිපන්ථක.** පු-මං පහරණ සොරා, මංකොල්ල කන්නා.

**පාරිපන්ථික.** පු-සතුරු මාර්ගයෙහි සිටින්නා, මංකොල්ල කාරයා

**පාරිපූරී.** ඉ-සම්පූර්ණ බව.

**පාරිභට්ට.** න-දරුවන් නැලවීම, දරුසුරතලය.

**පාරිභට්ටතා.** ඉ දරු සුරතල් කරන බව.

**පාරිසජ්ජ.** ති-පිරිවර.

**පාරිසුද්ධි.** ඉ-පිරිසිදු කම,

**පාරිභද්ද.** පු-පරසතුරුක, දේවදාර ගස.

**පාරිභව්‍ය.** පු-උපුල්කොල, කොට්ටන්.

**පාරිභොගික.** පු-ප්‍රයෝජනගත්, පරිභොග යට සුදුසු.

**පාරිවාසික.** පු-පිරිවෙස් වසන්නා.

**පාරිවට්ට.** න-පිරුවටය.

**පාරිත.** ති-පොරෝන ලද.

**පාරිම.** න-පරතෙර.

**පාරුපති.** ක්‍රි-පොරවයි.

**පාරුපන.** න-පෙරවීම, පොරවීම.

**පාරෙවට.** පු-පරවියා.

**පාරෙවත.** පු-පරවියා, පාරෙවට.

**පාරොහ.** පු-නුග අරළු ආදිය, නුග ආදීන්ගේ අතුවලින් ඇදෙන මුල්.

**පාල.** d. චු-දැකීමෙහි, පාලෙති, පාලයති, රකියි.

**පාල** ති-පාලනය, ආරක්ෂාව.

**පාලක.** පු-පාලනයකරන්නා, රක්ෂාකරන්නා.

**පාලන.** න-පාලනය රැකීම

**පාලි**. ඉ. පාලි භාෂාව, පෙල.

**පාලිච්ච**. න-පැසුනු බව, ඉස කෙස් පැසීම.

**පාලිත**. ති-පාලනයකළ, රකිතලද.

**පාලිභද්ද**. පු-එරබොදු.

**පාලිභද්දක**. පු-එරබොදුගස.

**පාලෙති**. ක්‍රි-(d. භූ. පාල, රක්ඛණෙ, රැකීමෙහි + ණෙ + ති) (පාල + ණෙ + ති) පාලනය කරයි.

**පාවක**. පු- ගින්න.

**පාවචන**. න-බුද්ධවචනය, ප්‍රධාන වචනය, ධම් විනය.

**පාවදති**. ක්‍රි-(d. භූ. වද, වචනෙ, කීමෙහි + ති) කියයි.

**පාවන** න-ධාන්‍ය පවිත්‍ර කිරීම, ධාන්‍ය පෙළීම.

**පාවර**. පු-උතුරුසලුව, වස්ත්‍රය.

**පාවාරික**. න-එනම් අඹ උයන.

**පාවාල**. පු-පුවාල්, පබලු.

**පාවුස** පු-වස්සාන කාලය, ලූලා.

**පාවුසාසෙති**. ඉ-වඳුරු මැ.

**පාස**. පු-සතුන් බඳනා පුඩුව, තොන්ඩුව, මල, මඳ.

**පාසක**. පු-සුදු ඇටය, දුදු ඇටය, පාසය

**පාස**. පු-විලුඹ, පාස්මිය

**පාසාණ්ඩ**. සයානුවක් පමණ පාසාණ්ඩයයි කියන ලද මිථ්‍යාලබ්ධි.

**පාසරාස්**. ඉ. පාස සමූහය.

**පාසංස**. පු-ප්‍රශංසා, පැසසීම.

**පාසාද**. පු-ප්‍රාසාදය, සිවුරැස් ගෙය, මන්දිරය, මාලිගාව.

**පාසාණ**. පු-ගල, කුඩාගල, බොරළු කැට

**පාසාණක**. පු-ගල.

**පාසාණගුල**. න-මෘදු ගල් බෝලයක්.

**පාසාණචාරණ**. න-ගල් පලන, පෙලුම.

**පාසාණඑලක**. න-ගල්ලැල්ල.

**පාසාණමච්ඡ**. පු-පෙපියා.

**පාසාණලෙඛා**. ඉ-ගල්ඉර, ගලේ ඇඳි ඉර.

**පාසාදනීය**. ති-ප්‍රසාදවහවූ, පැහැ එලවන්නාවූ.

**පාසාද**. පු-ප්‍රාසාද, මාලිගා, මහල්ගෙවල්.

**පාසාදතල**. න-පහතල, මාලිගාවල උඩුමහල්.

**පාසාදික**. ති-පැහැ එලවන.

**පාසාණවස්ස** පු-ගල්වැස්ස, පිණිකැට වැස්ස.

**පාසුක**. පු-ඉල ඇටය.

**පාසුල**. පු-ඉල ඇටය.

**පාසුලි**. ඉ-ගෘහපරාල, ශරීරඉල ඇට

**පාහු**. අමුත්තන්ට දිය යුත්ත, ගරුකොට දිය යුත්ත.

**පාහුන**. ති-අමුත්තා, ආගිපියා.

**පාහුනක**. ති-අමුත්තා, අමුත්තාට දිය යුත්ත.

**පාහුණෙය්‍ය** (නෙ) ති-අමුත්තන්ට දියයුතු දත්, පිළිගැණීමට සුදුසුගුණ ඇත්තා.

**පාහෙති**. ක්‍රි-(d. සවා හි, ගතියං, යැමෙහි + ණෙ + ති) යවයි.

**පාලි**. (ළි) ඉ-මියර, නියර, පාඨ, පඞ්ක්තිය

**පාළි** (ළි) භද්ද, පු-එරබදු.

## පි

**පික**. පු-කොවුල් පක්ෂියා, කොහා.

**පිස**. d. භූ. සුණුකිරීමෙහි, පිසෙති, කුඩු කරයි.

**පිංසති**. ක්‍රි-(d. රු. පිස, සංචුණ්ණෙ, කුඩුකිරීමෙහි + ති) කුඩු කරයි.

**පිංගිය** න-කහපාට.

**පිච්ඡ**. d. භූ-බාධනෙ, බාධාකිරීමෙහි, පිච්ඡති, බාධාකරයි.

**පිඞ්ග**. පු-ගොරදුට බඳු පැහැය.

**පිඞ්ගල**. පු-එනම් ඇත්කුලය, එනම් ඇත්තා, ගොරදුට බඳුපැහැය, ගිනිදලු පැහැය.

**පිඞ්ගලමක්ඛිකා**. ඉ-ඇට ලේ මැස්සා.

**පිච්ච**. d. චු-ඡේදනෙ, සිඳීමෙහි, පිච්චෙති, පිච්චයති, සිඳියි.

(16280)

**පිචු.** පු-කපු පුලුන්.

**පිචුපටල.** න-නූල් කැටීම සඳහා පිළියෙළ කැරගත්නා පුලුන් පටිය.

**පිචුමන්ද.** පු-කොහොඹගස.

**පිචුල.** පු-නාවා ගස.

**පිච්ඡිල.** පු-න-ඉඹුල්ගස, බෙලසුල් දේ.

**පිඡ්.** d. චු-පීඩනෙ, පෙළීමෙහි, පිඤ්ජති, පිඤ්ජයති=පෙළයි.

**පිජ්.** d. චු-වචනෙ, කීමෙහි, පිඤ්ජති, පිඤ්ජයති කියයි.

**පිඤ්ජ්.** d. භූ-පීඩනෙ, පෙළීමෙහි, පිඤ්ජති, පෙළයි.

**පිඤ්ජ.** න-පක්ෂිපත්‍ර, මොනරපිල.

**පිඤ්ජර.** න-හිරියල්.

**පිඤ්ජිත.** ති-මළ.

**පිඤ්ඤුක.** පු-තලඹුරුවට, තලපුත්තක්කු.

**පිටක.** ති-සුණුකරන ලද්ද, පිටි.

**පිට්ඨ.** න-පිට, පිටපැත්ත.

**පිට්ඨක.** පු-පිටිකැවුම්, පූප.

**පිට්ඨඛජ්ජක.** න-පිටිකැවුම්.

**පිට්ඨසඞ්ඝාටක.** න-දොරබාව.

**පිට්ඨි.** ඉ-පිට, පිට පැත්ත.

**පිට්ඨිපරිකම්ම.** න-පිට මිරිකීම, පිටඅතගෑම.

**පිට්ඨිමද්ද.** න-පිටිකැඳ.

**පිට්ඨිමංසිකතා.** ඉ-පිටමස් කන බව, ඉදිරි පිටදී ගුණකියා පිටිපා ගියපසු නුගුණකීම.

**පිට්ඨිසඞ්ඝාට.** න-තොරණ, දොරබාව.

**පිට.** d. භූ-සද්දසඞ්ඝාතෙසු, ශබ්දයෙහි හා රැස් කිරීමෙහි, පෙටෙති, ශබ්දකෙරෙයි, රැස් කරයි.

**පිටක.** න-පයසීාපති ධර්මය, පැස, පෙට්ටිය, භාජනය.

**පිටකත්තය.** ත්‍රිපිටකය, සූත්‍රාභිධර්ම විනය යන පිටක තුණ.

**පිටකසම්පදාන.** න - පිටකයට අයිති, පිටක යෙහි එන පරිදි.

**පිඨර.** පු-සැළිය; හැළිය.

**පිඩ.** ඪ චු-රාසිකරණෙ, රැස් කිරීමෙහි

**පිඩි.** d-රාසිකරණෙ, රැස් කිරීමෙහි පිණ්ඩති, රැස් කරයි.

**පිඩි.** d චු-රැස්කිරීමෙහි, පිණ්ඩෙති, පිණ්ඩයති, රැස් කරයි.

**පිණ්ඩ.** පු-ජීවිත වෘත්තිය, යකඩ, ශරීරය, පිඩු කිරීම, ගුළිකිරීම, ගෝලාකාරදෙය, ගුළිය.

**පිණ්ඩක.** පු-තුරුක් තෙල්, පිඩුදෙන්නා.

**පිණ්ඩන.** න-පිඩු කිරීම, සම්පිණ්ඩනය.

**පිණ්ඩ.** d. චු-නිත්‍යං, නිත්‍යකිරීමෙහි, පණ්ඩෙති පණ්ඩයති, උපපණ්ඩෙති, උපපණ්ඩයති, ගරහයි, බණියි.

**පිණ්ඩික.** පු-පිඩු ඇත්තා, පිණ්ඩදායකයා.

**පිණ්ඩිත.** ති-පිඩුකළ, සමුච්චයකළ, පුඩුකළ.

**පිණ්ඩපාත.** පු-පිඩුලැබීම, ආහාර ලැබීම.

**පිණ්ඩපාතී.** ති-පිඩුසිඟා ලබන්නා.

**පිණ්ඩපාතික.** පු-පිණ්ඩපාතය ලබන්නා.

**පිණ්ඩපාතිකාඞ්ග.** න-පිඩුසිඟා වැළදීමෙන් රකින අඞ්ගයක්, තෙලෙස් ධූතාඞ්ගයෙන් එකක්.

**පිණ්ඩි.** ඉ-පිඩ, බත් පිඩ.

**පිණ්ඩිකා.** ඉ-රථනැබ, රථයෙහි බොස්ගෙඩිය.

**පිණ්ඩියාලොප.** න-පිඩු පිණිස හැසිරීමෙන් ලබන ලද අලොපා, පිණ්ඩපාතාහාරය.

**පිණ්ඩෙති.** ක්‍රි. (d. චු. පිඩිම් සංඝාතෙ, රැස් වීමෙහි + ණෙ + ති) පිඩුකරයි.

**පිණ්ඩොල.** පු-එනම් ඇත්තා.

**පිතා.** පු-පියා. බ්‍රහ්මයා.

**පිතාමහා.** පු-මුත්තා, ආතාගේ පියා, මහබඹා

**පිතික.** පු-පියාඅයත්, පියා සන්තක.

**පිතු.** පු-පියා, බ්‍රහ්මයා.

**පිතුච්ඡා.** ඉ-පියාගේ සහෝදරී, නැන්දා.

**පිතුවන.** න-සොහොන, පිතවන.

**පිත්ත.** න-පිත, ශරීරගත පිත.

**පිත්තසමුට්ඨාන.** න-පිතින් උපන්, පිත්කෝප යෙන් සෑදුණු.

**පිත්තික.** න. පියා සතු, පියා පිළිබඳ.

**පිතත්විසය.** ප්‍රෙත විෂය, ප්‍රෙතාත්මභාවය.

**පිපීයති.** ක්‍රි-(d. භූ. පී. සංසානෙ, තැසීමෙහි + ති) වසනු ලැබෙයි.

**පිපීයන.** න-වැසීම ඡාදනය,

**පිදහති.** ක්‍රි-(d. භූ. දහ, ධාරණෙ, දැරීමෙහි + ති) වසයි. හඟවයි.

**පිදහන.** න-වැසීම, ඡාදනය.

**පිධාන.** න-පියන, වහනතරාව.

**පිනාකී.** පු-ඊශ්වරයා, මහදෙවියා.

**පිනාස.** පු-නාසිකාරොගය, පීනස් රෝගය.

**පිපති.** ක්‍රි (d. භූ. පා. පාණෙ, වීමෙහි + ති) පානය කෙරෙයි, බොයි.

**පිපාසා.** ති-දියබොනුරිස්ස, පවස.

**පිපාසිත.** ති-පිපාසා ඇතිවන ලද.

**පිපාසි.** පු-පිපාසා ඇත්තා, පවස ඇත්තා.

**පිපි.** ති-බොන.

**පිපිලික.** පු-කුරුකුහුඹු ආදී කුඩා සත්වවර්ගයා.

**පිප්පල.** න-ගම්මිරිස්.

**පිප්ඵල.** න-පුලිල රුක, කඩක තුර.

**පිප්ඵලක.** න-මහත නූල්, කතුර.

**පිප්ඵලි.** ඉ-පුලිල.

**පිය.** පු-සවාමියා, පලුපස.

**පිය.** ති-ප්‍රියදෙය, ප්‍රියඑලවන දෙය.

**පියක.** පු-කොලොම්ගස, පියාගස, තිත්මුවා.

**පියඞ්ගු.** ඉ-තණ, පුවඟු ගස, රුක්මල් ගස.

**පියතත.** න-පියවිත්, ප්‍රියබව.

**පියරූප.** න-ප්‍රියරූපය, ප්‍රියඑලවන රූපය.

**පියායති.** ක්‍රි-(d. භූ. පී. තප්පණ, තුටුවීමෙහි + ති) ප්‍රියකරයි.

**පියායන.** න-ප්‍රියකරන.

**පියායිත.** ති-ප්‍රියකළ.

**පියාල.** පු-පියලගස, රාජාදන ගස.

**පිලක්ඛ.** පු-පුලිලගස.

**පිලක.** න-බිබිල, කුඩා බිබිල

**පිලධි.** d. භූ. ආභරණය, සැරසීමෙහි, පිලන්ධති, පලඳියි, සැරසෙයි.

**පිලන්ධති.** ක්‍රි-(d භූ. පිලධි, අලඞ්කාරෙ, සැරසීමෙහි, + ති) පලඳියි, අබරණ දරයි.

**පිලන්ධන.** න-ආභරණය, පලඳනාව.

**පිලන්ධිත.** පලඳනා ලද, සැරසෙන ලද.

**පිලව.** පු-මහවෙල් පක්ෂියා.

**පිලව.** පු-ඉල්වීම, ඉල්පීම.

**පලවති.** ක්‍රි-(d. චු. පලු, ගතියං, යැමෙහි + ති) ඉල්පෙයි, ඉලිප්පෙයි.

**පිලයති.** ක්‍රි. (d භූ. පිල, විබාධායං, බාධාවෙහි, + ති) බාධාකරයි.

**පිලවන.** න-ඉලිප්පීම, ඉල්පීම.

**පිලාල.** න-පිදුරු, වියළි තණ

**පිලකා.** ඉ-පිළිකා රෝගය.

**පිලොතිකා.** රෙදි කැබෙල්ල.

**පිවති.** ක්‍රි-(d භූ. පා. පානෙ, බීමෙහි + ති) පානයකෙරෙයි.

**පිවන.** න-පානය කිරීම, බීම.

**පිස.** d. රු. සුණුකිරීමෙහි, පිංසති, සුණුකෙරෙයි, පිංසකො.

**පිස.** d. චු. සත්තියං සක්තියෙහි, පිසෙති පිසයති, ශක්තිය දෙයි.

**පිසාච.** පු-පිසාචයා, පිසස්, යක්ෂදෙවයෝ, තිවිසේසයක්, පාංශු පිසාචාදී ප්‍රෙත කොටසක්.

**පිස.** d. චු. ගමනෙ, යැවීමෙහි, පෙසෙති, පිසයති, යවයි.

**පිසාචක.** පිසාචයා.

**පිසාචි.** ඉ-පිසාචයන්ට අයිති.

**පිසාචිල්ලක.** පු පිසාච පැටවු, පිසාචදරු.

**පිසි.** d. භූ. ගමනෙ, යාමෙහි, පිසති, යෙයි.

**පිසි.** d. චු. කථනෙ, කීමෙහි, පිසෙති, පිසයති, කියයි.

**පිසිත.** න-මාංශය.

**පිසු.** d. භූ. අවයවෙ, අවයවයෙහි, පිසති, අවයය කරයි.

**පිසු.** d. භූ දාහෙ, දාහයෙහි, පිසති, දවයි.

**පිසුන.** න-කේලම්කියන්නා, කේලම, පිසුන වචන, කේලම් වචන, ප්‍රියශූන්‍ය වචන.

**පිසොදර.** පු-සුලීලි ඇති, බඩක් ඇත්තා.

(16392)

**පිහ.** d. චු. අභිලාසෙ, කැමැත්තෙහි, පිහෙති, පිහයති, කැමති වෙයි.

**පිහක.** න-බඩවැල, අතුණු බහන.

**පිහ.** d. කැමැත්තෙහි, පිහෙති, පිහයති, කැමති වෙයි.

**පිහතා.** ඉ-ප්‍රියබව.

**පිහයති.** ක්‍රි-(d චු පිහ, ඉච්ඡායං, කැමැති වීමෙහි+ති) කැමතිවෙයි, ප්‍රියවෙයි.

**පිහයිත.** ති-කැමතිවනලද, ප්‍රියවනලද.

**පිහා** ති-තෘෂ්ණාව, ආසාව.

**පිහායති.** ක්‍රි-(d. චු. පිහ, ඉච්ඡායං, කැමති වීමෙහි+ති) කැමතිවෙයි, ප්‍රියවෙයි.

**පිහායන.** න-කැමතිවන.

**පිහාලු.** ති-තෘෂ්ණාධිකයා, දයාධිකයා.

**පිහිත.** ති-වසන ලද, පියවනලද.

**පිහෙති.** ක්‍රි-(d. චු. පිහ, ඉච්ඡායං, කැමති වීමෙහි+ණ+ති) කැමතිවෙයි.

**පිලකා.** ඉ-පිළිකාව, පොළ, ඡවිගත ගඩුව.

**පිලකොලික** න-ඇශේකබර, ඇස්පිහාටුවල හටගන්නා පිළිකාවක්.

## පී

**පී.** d. සු. පීතියං, ප්‍රීතියෙහි, පිණෙති, පීණාති, ප්‍රීතිවෙයි.

**පී** d. ක්‍රි-පීතනෙ, පිනවීමෙහි, බැබලීමෙහි, පීණෙති, පිනවයි, බබළයි.

**පීඨ.** d. භූ. පීඨනෙ, පෙළීමෙහි, කිලුටුවීමෙහි, පෙඨති, පෙළයි, කිලුටුකරයි.

**පීඨ.** න-කොලොම්බුව, පුටුව, සල්පිල්, ආසනය.

**පීඨක.** න-පීඨය, කුසිත්කළ, පොරෝසු කළ පුටුව.

**පීඨන්තර.** න-පුටු විශේෂයක්, දික්සඟලපුටු, අත්හාත්සිපුටු.

**පීඨසප්පි.** පු-පිලා, කුරා.

**පීඨිකා.** ඉ-පීඨය, පුටුව.

**පීඩිත.** ති-පීළිත, පෙළුණු, පීඩාවට පැමිණි.

**පීණ.** d. භූ. පීණනෙ, සම්පූර්ණ බැව්හි, පීණති, සම්පූර්ණ කරයි.

**පීණන.** න-පිනවීම, තෘප්තියට පැමිණීම, සෑහීම.

**පීණිත.** ති-තෘප්තියට පැමිණි, සෑහීමට පැමිණි.

**පීණෙති.** ක්‍රි-(d. භූ. පී. තප්පණෙ, සතුටුවීමෙහි +ණෙ+ති, පීණ+ණෙ+ති) පිණවයි.

**පීත.** ති-රත්වත් පැහැය, තෘෂ්ටිප්‍රාප්තයා, බොනලද්ද, පානය.

**පීත.** න-පීතවර්ණය.

**පීතක** ති-පීත වර්ණය.

**පීතදාරු.** න-දෙවදාරු, දෙවකාපරු.

**පීතන.** න-හිරියල්, කොකුම්.

**පීතද්දුම.** න-වැනිවැල්.

**පීතනක.** න-හිරියල්.

**පීතම්බර.** පු-විෂ්ණු, නිල්අහස, නිල්රෙදි.

**පීතසාල.** පු-පියාගස.

**පීතසාර.** පු-රත්වත් සඳුන්, රත්සඳුන්.

**පීති.** ඉ-ප්‍රීතිය, සතුට.

**පීති.** පු-විපුලභාවය, සමෘද්ධිය.

**පීතික.** පු-ප්‍රීති ඇත්තා.

**පීතී.** ඉ-ප්‍රීති ඇත්තා.

**පීන.** ති-සම්පූර්ණදෙය.

**පීනන.** න-පිනවීම, තෘප්තියට පැමිණීම.

**පීයූස.** පු - සුධාභොජනය=අමෘතභොජනය= දිව්බොජුන.

**පීල.** d. භූ-බන්ධනෙ, බැඳීමෙහි, පීලති, බඳියි.

**පීල.** d. චූ-දැමීමෙහි, පීලෙති, පීලයති, දමයි.

**පීලහ.** d. භූ-ගතියං, යාමෙහි, පීලහති, යෙයි.

**පීලු.** පු-පලුගස

**පීලුපණ්ණී.** ඉ-මෛරගස, කෙම්වැල්.

**පීව** d. භූ.-මහත්තෙ, මහත්බැව්හි, පීවති, මහත්බවට පමුණුවයි.

(16442)

**පීළු** d. භූ-ගමනෙ, යාමෙහි.

**පීවර.** ති-සම්පූර්ණ දෙය.

**පීළා.** ඉ-පීඩාව.

**පීළිත.** ති-පීඩිත, පෙළුණු.

**පීළක.** පු-පීඩාකරන්නා.

**පීළන.** න-පෙළීම, පීඩාව.

**පීළෙති.** ක්‍රි. d පීල, විචාධායං, බාධාවෙහි + ) පෙළයි, ක්‍රීඩා කරයි.

## පු

**පු.** d. භූ-පවනෙ පිරිසුදු කිරීමෙහි, පවති, පිරිසුදු කරයි.

**පු.** d ක්‍රි-පවනෙ, පිරිසුදු කිරීමෙහි පුනාති, පිරිසුදු කරයි.

**පුං.** අ-නිරය, අපාය.

**පුංස.** පු-පුරුෂයා.

**පුක්කුසස.** පු-බමුරා.

**පුක්කුස කුල.** න පුක්සඩු කුලය, පරමල් ආදිය අදින කුලය, නුවර කුණු කසල ඇද දමන කුලය, මල්වර ස්ත්‍රීන්ගේ වස්ත්‍ර පිරිසුදු කරන කුලය.

**පුඛබල.** ති-උතුම් දෙය.

**පුග්ගල.** පු-සත්වයා, ආත්මය.

**පුග්ගලික.** ති-එක තැනැත්තකුට අයිති දෙය.

**පුංඛ.** න-ඊතලයෙහි පිහාටු යොදා ඇති කොටස.

**පුඞ්ගව.** පු-වෘෂභයා, උතුම් ගවයා.

**පුඞ්ගව.** ති-ශ්‍රෙෂ්ඨයා, උත්තමයා.

**පුච්ඡ.** d. භූ - පඤ්හ, ප්‍රශනයෙහි, පුච්ඡති, ප්‍රශනකරයි.

**පුච්ඡති.** ක්‍රි-(d භූ-පුච්ඡ, පුච්ඡනෙ, විචාරීමෙහි + ති) විචාරයි, ප්‍රශන කරයි, අසයි.

**පුච්ඡ.** න-වාලධිය, වලිගය, විචාරවයනාඇති ඇති ක්‍රියාවක්.

**පුච්ඡ.** පු-විචාරන්නා, පිළිවිසින්නා.

**පුච්ඡන.** න-විචාරීම, ඇසීම.

**පුච්ඡඤ්ඤවනකතා.** ඉ-තණ්හාව.

**පුච්ඡා.** ඉ-ප්‍රශ්ණය, විචාරීම.

**පුච්ඡිත.** ති-විචාළ, විචාරණ ලද.

**පුජ්ජ.** ති-පූජ්‍ය, පිදිය යුතු.

**පුඤ්ජ.** පු-සමූහය, මිටිය, පොදිය, කලාපය.

**පුඤ්ජති.** ක්‍රි. (d. භූ-පුඤ්ජ, රාසිකරණ, රැස්කිරීමෙහි + ති) රැස් කරයි.

**පුඤ්ජන.** න-රැස්කිරීම.

**පුඤ්ජිකතා.** ඉ-තගුට වැනීම.

**පුඤ්ජ.** d. භූ-පාකෙ පිසීමෙහි, පුඤ්ජති, පිසයි.

**පුඤ්ඤ.** න-පුණ්‍යය, පින, කුසලය.

**පුඤ්ඤ.** ති-යහපත්, පවිත්‍ර, පිරිසුදු.

**පුඤ්ඤවන්තු.** පු-පුණ්‍යවන්තයා, පිං ඇත්තා.

**පුඤ්ඤාභිසඞ්ඛාර.** පු-පුණ්‍යාභිසංසකාර, කුසල චෙතනා.

**පුඤ්ඤාභිසන්ද.** පු-පින ගලාඒම, කුසල විපාකය ගලාඒම.

**පුඤ්ඤජනිස්සර.** පු-වෙසමුනිරජ.

**පුට.** d. භූ-ඇලීමෙහි, පුටති, ඇලෙයි.

**පුට්ට.** d. චූ-චනෙද, සවල්ප බැවිහි, පුට්ටෙති, පුට්ටයති, සවල්ප වෙයි.

**පුට.** d. චු-පොටෙති, බිඳියි.

**පුටහ.** න-පොදිය, බඩුමිටිය, ගුලිය.

**පුටංස.** පු-පාථෙය්‍යය, මඟ වියදම.

**පුටක.** න-පොදිය, මිටිය.

**පුටභෙදන.** න-බඩු පොදි ලිහා තබාගෙන විකුණන තැන, නගරය.

**පුටඨ.** ති-විචාරන ලද, පොෂ්‍ය කළ.

**පුණ්ඩරීක.** පු-එනම් දිගැතා, ඇටඹ, ව්‍යාඝ්‍රයා, සුදු අඹගසක්, රත්පියුම, පදුම නම් සඞ්ඛ්‍යාව, සියක් ලක්ෂය, එනම් නිරය, උඩුපියපත් ඇත්තේ, පුණ්ඩරීකය, පෙති ගණන් රහිතවූ හෝ රතු වූයේ පුණ්ඩරීකයි.

**පුණ්ඩරීකිනි.** ඉ-පියුම් විල.

**පුණ්ඩරීකකඛ.** පු-විෂ්ණු.

(16492)

පුණ්ණ. ති-පූර්ණ, සම්පූර්ණ දෙය, පුණු.

පුණ්ණකුම්භ. පු-පුණුකලස, පූර්ණකුම්භය.

පුණ්ණතා. ඉ-පිරුණු බව, සම්පූර්ණ බව.

පුන්නපත්ත. පු-සතුටුපඬුර.

පුණ්ණමා. ඉ-මැදිපෝය, පුර පසළොස්වක, පිරුණු සඳ ඇති දිනය.

පුණ්ණමාසී. ඉ-මැදිපෝය, පුරපසළොස්වක

පුණ. d. චු-රැස් කිරීමෙහි, පුණෙති, පුණයති, රැස් කරයි.

පුණ. d. භූ-දක්ෂකමෙහි, පුණති, දක්ෂ වෙයි.

පුත්ත. පු-පුත්‍රයා, එකශෙෂව බහුවචන වූකල පුත්‍ර දුහිතෘ දෙපක්ෂයටම නම් වේ, දරුවා

පුත්තා. පු-පුත්දූත්, පුත්තාව, ධීතාව,

පුත්තක. පු-පුත්‍රයා, පුතා.

පුත්තත්ත. න-පුත්‍ර බව.

පුත්තදාරා. ඉ-දරුවන් හා අඹු, අඹුදරු.

පුත්තධීතු. ඉ-පුත් දූත්.

පුත්තිම. පු-පුත්‍රයන් ඇත්තා.

පුත්තිමන්තු. පු-පුත්‍රයන් ඇත්තා.

පුත්තික. පු-පුත්‍රයන් ඇත්තා.

පුත්තිය. පුත්‍රයන් ඇත්තා.

පුථ. d. චු-ආදරානාදරෙසු, ආදර අනාදර දෙක්හි, පුථෙති, පුථයති, ආදර අනාදර-කරයි.

පුථ. d. චු-කථනෙ, කීමෙහි, පොථෙති, පොථයති, කියයි.

පුථ. d. චු-පීඩායං, පෙළීමෙහි, පොථෙති, පොථයති, පීඩා කරයි.

පුථ d. භූ-පුථුලෙ, පුළුල් බැව්හි.

පුථ. d. තු-පැසවීමෙහි, කුණුවීමෙහි.

පුථි. d. භූ-පීඩාවෙහි හා කිලුටෙහි, පුත්ථති, කිලුටුවෙයි.

පුථු. d. භූ-පුථුලෙ, පළල් කිරීමෙහි, පුථති, පොථති, පළල් කෙරෙයි.

පුථු-3-මහති, විසාල.

පුථු. අ-වජ්ජිතාර්ථයෙහි, වෙන් වීමෙහි.

පුථගත්තා. ඉ-වෙන්වූ බව, විවේකය.

පුථවි. ඉ-පෘථුවිය, පොළොව.

පුථුක. පු-බාලයා, ළදරුවා

පුථුකග්ග. පු-මුලින්ම කපාගන්නා අස්වැන්න.

පුථුජ්ජන. පු-නීචයා, මෝඩයා, කෙලෙස්-සහිතයා, පෘථජ්ජනයා.

පුථුජ්ජනික. පු-පෘථජ්ජනයාට අයත්.

පුථුපඤ්ඤ. මහත් ප්‍රඥා ඇත්තා.

පුථුපණ්ණී. ඉ-පුස්වැන්න, පොල්පලා.

පුථුපාණික. න-හස්තපරිකර්මය, අතින් පිට ඉලීම.

පුථුභූත. ති-මහත් බවට පැමිණි.

පුථුජ්ජනත්ත. පුථජ්ජන භාවය.

පුථුත්ත. න-මහත් බව.

පුථුසො. අ-මහත්සේ.

පුථුල. පුථුල, මහත් දේ.

පුථුලොම. පු-මත්ස්‍යයා.

පුථුවි. ඉ-පොළොව, භූමිය.

පුන. අ-විශෙෂයෙහි, නැවත යනාර්ථයෙහි

පුන. d. භූ. ගතියං, යෑමෙහි, පුනති, යෙයි.

පුනන්නවා. ඉ-සුලු බුරුද.

පුනප්පුන. අ-නැවත, නැවත, පුන පුනා.

පුනබ්බසු. පු-පුනාවසේ නැකැත.

පුනබ්භව. පු-පුනර්භවය, නැවත හටගැන්ම, නිය පොතු.

පුනාති. ක්‍රි-(පුන + ණා + ති) පවිත්‍ර කෙරෙයි.

පුන්නාග. පු-දොඹගස.

පුප්ඵ. d. භූ. පුප්ඵනෙ, පිපිමෙහි, පුප්ඵති, පිපෙයි.

පුප්ඵ. න-පුෂ්පය, මල, පුප්, ඔසප්වීම, මල්වර වීම.

පුප්ඵක. න-ලේ.

පුප්ඵච්ඡඩ්ඩක. පු-බඹුරා, පුප්සඬුවා, නගර සෝදකයා, කොටහළුවා.

පුප්ඵදන්ත. පු-එනම් දිගැතා.

පුප්ඵධනුවා. පු-අනංගයා, කාමදෙවයා, මල්සැර.

**පුප්ඵති**. ක්‍රි - (d. භූ. පුප්ඵ, විකසනෙ, පිපීමෙහි + ති) (පුප්ඵ + ති) පිපෙයි.

**පුප්ඵන**. න-පිපෙන, මිණිදෑදිරිය

**පුප්ඵභාණී**. පු-පුෂ්පමෙන් සුවඳ විහිදෙන කථා කියන්නා.

**පුප්ඵවතී**. ඉ-ඔසප්වූ තැනැත්තී.

**පුප්ඵිත**. ති-පුෂ්පිත, පිපුණු, ප්‍රබුද්ධ වන ලද.

**පුප්ඵාපන**. න-පුබුදුකරවීම, පුෂ්ප ප්‍රබෝධය, මල් පිප්පීම.

**පුබ්බ**. d. භූ-පූරණෙ, පිරීමෙහි, පුබ්බති, පුරයි.

**පුබ්බ**. d. චු-වාසෙ, වාසය කිරීමෙහි පුබ්බෙති පුබ්බයති, වාසය කරයි.

**පුබ්බ**. පු-පූයා, සැරව, අභිමුඛ, ඉදිරිපිට.

**පුබ්බ**. ති-පූර්ව, පළමු දේ, පූර්වාදි දිසා

**පුබ්බක**. පූර්වයෙහිවූ.

**පුබ්බකත්තික**. පු-ඉල් මස.

**පුබ්බකාරී**. ති-පළමු උපකාරකළ තැනැත්තාට පසුව උපකාර කරන්නා.

**පුබ්බඞ්ගම**. පු-යජ්ඤයෙහි යන යෝධයා, ඉදිරියෙහි යන්නා.

**පුබ්බජ**. පු - පළමුව උපන්නා, වැඩිමාලු සහෝදරයා, අසුරයා.

**පුබ්බණ්හ**. පු-උදය කාලය, උදේ වරුව.

**පුබ්බණ්හසමය**. පු-පූර්වාහ්ණය, උදේ කාලය.

**පුබ්බණ්හකප්පික**. පු-පූර්ව කෙළවර, කල්පනා කරන්නා, අතීත අන්තය අනුව, මම වූයෙම් දැයි කල්පනා කරන්නා.

**පුබ්බදෙව**. පු-පූර්ව දෙවියා, අසුරයා, මව්පියෝ.

**පුබ්බණ්ණ**. න-හැල් ආදි ධාන්‍ය විශෙෂ.

**පුබ්බලොහිත**. න-පූයා සහිත ලේ, සැරව හා රුධිරය.

**පුබ්බවාසනා**. ති-පෙර ජාතියෙහි කළ කම් බලය, පූර්ව දෛවය.

**පුබ්බවිදෙහ**. පු-පූර්ව විදෙහය, නැගෙනහිර ලෝකය.

**පුබ්බභද්දපද**. පුව පුර ථූපය.

**පුබ්බාචරිය**. පු-පූර්වාචාර්‍ය්‍යා, ප්‍රථම ගුරුවරයා, මව්පියෝ.

**පුබ්බෙකතහෙතු**. පු-පෙර කළ කම් හේතුව.

**පුබ්බෙනිවාසඤාණ**. න-පෙරවිසූ සකන්ධ පටිපාටිය දැනගන්න නුවණ, අසවල් ජාතියෙහි මෙසේ උපන්නෙමි, එහි දී මෙසේ සැප දුකක් ආයුසයක් වින්දෙමි, මෙපමණ කාලයක් ජීවත්වීමි යනාදි පිළිවෙළ දැන ගන්නා ඥණය.

**පුමභාව**. පු-පුරුෂභාවය, පිරිමි බව.

**පුම**. පු-පුරුෂයා පිරිමියා, පිරිමි සතා.

**පුම**. d. භූ. ගිති පිඹීමෙහි.

**පුමත්‍යාදි** පු-පුන්නපුංසකත්‍වාදිය.

**පුර**. d. භූ. පුරණෙ පිරවීමෙහි, පූරති, පිරෙයි.

**පුර**. d භූ-රක්ඛණෙ රැකීමෙහි, පූරති, රකී.

**පුර**. d භූ-ප්‍රධාන ගමනයෙහි, පූරති, ප්‍රධානව පෙරටුව යෙයි.

**පුර**. පු-ගෘහය, ගුගුල්.

**පුර**. න. ඉ-නුවර, නගරය.

**පුරක්ඛත**. ති - අභිමුඛ කළ, පුදන ලද, අභිසේක කළ.

**පුරතො**. අ-අභිමුඛාර්ථයෙහි ඉදිරියෙන්.

**පුරත්ථා**. අ-පූර්වදිග, පුරාශබ්දාර්ථ, අභිමුඛාර්ථ, ප්‍රථමාර්ථ.

**පුරින්‍දද**. පු-ශක්‍රයා, සක්දෙව්රජ.

**පුරා**. අ-ප්‍රබන්ධ, චිරාතීත, ආසන්න, අනාගත කාල.

**පුරාණ**. ති-පරණ, ඉසසර, විෂ්ණු පුරාණාදිය.

**පුරාණකම්ම**, න-පෙර කර්මය, පුරාතන කර්මය.

**පුරාණදුතියිකා**. ඉ-පෙර භාර්‍ය්‍යාව, කලින් සිටිය බිරිය.

**පුරෙක්ඛාර**. පු-පෙරටුව යන්නා, ඉදිරියෙහි යන යොධයා.

**පුරාණපුරිස**. පු-පරණ මිනිහා, විෂ්ණු.

**පුරාතන**. ති-පරණ දෙය, අතීතයෙහි සිදුවූ දෙය.

**පුරාණසාලොහිත**. ති-පරණ සමාන ලේ ඇත්තා, පෙර ජාතියෙහි නෑයා.

**පුරින්‍දද**. පු-ශක්‍රයා, සක්දෙව්රජ.

(16591)

**පුරිම**. ති-පූර්ව, පෙර, ඉස්සර, අතීත.

**පුරිමක**. ති-පූර්වයෙහි වූ.

**පුරිමික**. ති-ප්‍රථමයෙහි වූ, පූර්වයෙහි වූ.

**පුරිස**. පු-පුරුෂයා, පිරිමියා, මනුෂ්‍යයා, ආත්මය.

**පුරිසක**. පු-කුඩා පුරුෂයා.

**පුරිසකිච්ච** ති-පුරුෂයා විසින් කටයුතු යුතු දේ, මෛවුන්දම.

**පුරිමයාම**. පු-පෙර යාමය, රාත්‍රිය පිළිබඳ පූර්ව දස පැය.

**පුරිසථාම**. පු-පුරුෂ වීර්‍ය්‍යය, පුරුෂ ධෛර්‍ය්‍යය.

**පුරිසත්ත**. න-පුරුෂ භාවය, මනුෂ්‍ය භාවය, මනුෂ්‍ය ගතිය.

**පුරිසමෙධ**. පු-පිරිමින් බිලිපූදා කරන එතම් යාගය.

**පුරිසාජඤ්ඤස**. පු-තරුණ පුරුෂයා, උතුම් පුරුෂයා.

**පුරිසදම්මසාරථි**. පු - දමනය කටයුතු පුරුෂ යන් දමනයකරන තැනැත්තා. සර්වඥයන් වහන්සේ.

**පුරිසාජඤ්ඤ**. උත්තම පුරුෂයා, සර්වඥයන් වහන්සේ.

**පුරිසාතිසය**. පු-ශ්‍රේෂ්ඨ පුරුෂයා, සර්වඥයන් වහන්සේ.

**පුරිසුත්තම**. පු-පුරුෂොත්තමයා, බුදුරජ.

**පුරෙ**. අ-අභිමුඛයෙහි, පූර්වයෙහි.

**පුරෙක්ඛත**. ති-අභිමුඛ කරන ලද, ඉදිරිපත් කළ.

**පුරෙක්ඛාර**. ති-අභිමුඛ කිරීම, ඉදිරිපත් කිරීම.

**පුරෙගාමී**. ති-ඉදිරියෙහි යන යොධයා, පෙරටුව ගමන් කරන්නා.

**පුරෙචර**. ති-ඉදිරියෙන් යන, පෙරටුව යන.

**පුරෙචරික**. පු-පෙරටුව යන්නා.

**පුරතොගම**. පු-පෙරටුව යන්නා, ඉදිරිපත් වන්නා.

**පුරොහිත**. පු-රජුනට අර්ථයෙන් ධර්මයෙන් අනුශාසනා කරන ඇමතියා, පෙරවියා.

**පුලක**. න-ධාන්‍ය විශෙෂයක්.

**පුලකින**. න-පණු ගස්, එනම් ගස් වර්ගයක්.

**පුලව**. පු-කෘමි, පණු.

**පුලවක**. පු-පණු, කෘමි.

**පුලවකසඤ්ඤා**. ඉ-සරීරය, පණුකැදලිවලින් ගැවසීගත්තේයයි සැලකීම.

**පුලින**. න-වැලි, වාලුකා

**පුලුසු**. d. භූ-ඛාපණෙ, දැවීමෙහි. පුලුසති= දවයි.

**පුලොම**. පු-වෙපචිත්ති. අසුරයා.

**පුස්ස**. පු-පුසේ නැකත, දුරුතු මාසය.

**පුස්සරථ**. මගුල් රථය, ක්‍රීඩා ගමන් රථය, රාජ රථය.

**පුස** d. භූ-වුඩ්ඪියං වැඩීමෙහි. පුසති=වැඩෙයි.

**පුස**. d. භූ-පොසණෙ, පොෂ්‍යය කිරීමෙහි. පුසති=පොෂ්‍යය කෙරෙයි.

**පුස**. d. ති-පොසණෙ, පොෂණයෙහි, පුසාති පොෂ්‍යය කෙරෙයි

**පුස**. d. චු-වුද්ධියං වැඩීමෙහි. පොසෙති, පොසයති=වැඩේ.

**පුස**. d. චු-වුඩ්ඪියං වැඩීමෙහි. පුංසෙති, පුංසයති=වැඩෙයි.

**පුස** d-චු. ධාරණෙ. දැරීමෙහි. පොසෙති, පොසයති=දරයි.

**පුසු**. d-භූ. දහෙ, දැවීමෙහි. පාසති=දවයි.

**පුළ**. d-භූ. සැපයෙහි. පුළති=සැප ඇතිවෙයි=

**පුළ**. d-භූ. රාසියං, රැස්වීමෙහි, පුළති, රැස්වේ.

**පුළව**. පු-පණුවා.

**පුළවක**. පු-පණුවා.

(16635)

## පූ

**පූග.** පු-සමූහය, පුවක්ගස.

**පූගමජ්ඣ.** නි-සමූහමධ්‍යය.

**පූජ.** d-චු පූජායං, පිදීමෙහි. පූජෙති, පූජයති= පුදයි.

**පූජක.** පු-පුදන්නා.

**පූජන.** න-පිදීම, සත්කාරය.

**පූජනීය.** පු-පිදියයුත්තා, සත්කාර කටයුත්තා.

**පූජනෙය්‍ය.** පු-පූජනිය, පූජාකටයුතු.

**පූජා.** ඉ-පූජාව, පිදීම, පුද.

**පූජිත.** ති-පුදන ලද.

**පූජිය.** පු-දෙවියා, පිදිය යුත්තා.

**පූජෙති.** ක්‍රි - (d. චු. පූජ. පූජායං, පිදීමෙහි + ණෙ + ති. පූජ් + ණෙ + ති) පුදයි.

**පූජ්ජ.** ති-පූජ්‍ය, පිදිය යුතු, පූජාහී, පිදීමට සුදුසු.

**පූත.** ති-පවිත්‍ර, පිරිසුදු.

**පූතනා.** ඉ-අරළු, සේනාව.

**පූති.** ඉ-කුණු, දුගඳ හමන දෙය.

**පූතික.** ති-පූති, කුණු, පූතිකරඤ්ජ = කුණු කරඳ

**පූතිකට්ඨ.** ක-සරලගස.

**පූතිකරඤ්ජ.** පු-කටුකරඹුගස, කුණුකරඳගස.

**පූතිකාය.** පු-ශරීරය, කුණු ශරීරය.

**පූතිගන්ධි.** ති-දුගඳ, දුර්ගන්ධය.

**පූතිඵලී.** ඉ-බෝදි ගස්.

**පූතිමුත්ත.** න-ගෝමූත්‍රය, සරකුන් ගේ මූත්‍රය.

**පූතිලතා.** ඉ-කිඳිවැල, රසකිඳ වැල.

**පූප.** පු-කැවුම්, පිටිකැවිලි.

**පූපපණිය.** පු-පූවෙළෙන්ද, කැවිලි වෙළෙන්ද.

**පූය.** d-භූ. විකිරණෙ, දුග්ගන්ධෙ, විසිරීමෙහි, දුර්ගන්ධයෙහි. පූයති=විසිරෙයි, දුගඳ හමයි.

**පූය.** පු-පූයාව, සැරව.

**පූර.** d. චු. ඉච්ඡායං ඉච්ඡායෙහි. පූරෙති. පූරයති=තෘප්ති කරයි.

**පූර.** d-භූ. පූරණෙ. පිරීමෙහි පූරති=පිරෙයි.

**පූරක.** පු-පුරවන්නා සම්පූර්ණ කරන්නා.

**පූර.** ති-සම්පූර්ණ, පිරුණු.

**පූරණ.** ති-පිරීම, සම්පූර්ණ කිරීම.

**පූරණී.** ඉ-ඉඹුල් ගස, රුක්බුරුද ගස.

**පූරළාස.** පු-පූජාව සඳහා යොදන රස කැවිලි,

**පූරිත.** ති-පුරන ලද, සම්පූර්ණ කළ, වඩනා ලද.

**පූරෙති.** ක්‍රි - (පු. d. භූ පූර, පූරණෙ, පිරීමෙහි + ණෙ + ති) පුරවයි, සම්පූර්ණ කෙරෙයි.

## පෙ

**පෙ.** d-භූ වුඩ්ඪියං, වැඩීමෙහි. පෙති=වැඩෙයි.

**පෙ.** d-භූ. ගමනෙ, යාමෙහි. පෙති=යෙයි.

**පෙ.** d-භූ. වියැළීමෙහි. පායති, පයති=වියළේ.

**පෙ.** අ- පෙය්‍යාලම, මුලින් කියවුණු වාක්‍යාදිය නැවත යොදගැනීම වෙනුවට පෙ යොදනු ලැබේ.

**පෙක්ඛා.** ඉ-දේළාව, උසුලාගෙන යන වාහන විශෙෂයක්.

**පෙක්ඛ.** ති-බැලීම, නෘත්‍ය බැලීම.

**පෙක්ඛා.** අ-බැලීම.

**පෙක්ඛන.** න-බැලීම, නිරීක්ෂණය.

**පෙක්ඛිත.** ති-බලන ලද සොයන ලද.

**පෙක්ඛි.** බලන තැනැත්තා, බලන්නා.

**පෙක්ඛුන.** න-පක්ෂි පත්‍රය.

**පෙච්ච.** අ-පරලොව, අන්‍ය භවය, අන්‍ය ජාතිය.

**පෙටක.** පු-පැස, පෙට්ටිය පෙට්ටගම.

**පෙතත්තික.** ති-පියාට අයත්, පියාට අයිති.

**පෙතත්තිවිසය.** පු-ප්‍රේතාත්මය, ප්‍රේතයෝනිය.

**පෙතෙතය්‍ය.** ති - පියාට හිත ක්‍රියා, පියා සතු දේ.

(16687)

**පෙතනයාතා**. ඉ-පියාට හිත බව.

**පෙත**. පු-මළතැනැත්තා, ප්‍රෙතයොනියෙහි උපන් තැනැත්තා.

**පෙතනික**. ති-ප්‍රෙතයන්ට අයත්, ප්‍රෙතයන් පිළිබඳ.

**පෙතයොනි**. ඉ-ප්‍රේත භවය, ප්‍රේතාත්මය, ප්‍රේත ගතිය.

**පෙම**. න-ආදරය, ප්‍රෙමය, පෙම්.

**පෙමනීය**. ති-ප්‍රෙම කටයුතු, ආදරය කටයුතු

**පෙය්‍ය**. න-පානය කටයුතු දේ.

**පෙය්‍යවාචා**. ඉ-ප්‍රිය වචනය, ප්‍රිය බව.

**පෙය්‍යාලක**. පු - මුලින් කියන ලද්දක් නැවත කීම වෙනුවට යොදන සලකුණ. පෙ.

**පෙරිත**. ති-යවනලද, පමුණුවන ලද.

**පෙල**. d. භූ. චලනෙ සැලීමෙහි, පෙලති= සැලෙයි, යෙයි.

**පෙලක**. පු-සාවා, හාවා.

**පෙලාව**. ති-තුනී.

**පෙලිකා**. ඉ-පැස, කුඩා පෙට්ටිය.

**පෙලු**. d.-භූ. ගමනෙ, යාමෙහි. පෙලති=යෙයි.

**පෙස්ස**. පු-දාසයා, මිල පිණිස මෙහෙකරන්නා.

**පෙස**. d-චු. පෙසනෙ, යැවීමෙහි. පෙසෙති, පෙසයති=යවයි.

**පෙසක**. පු-යවන්නා.

**පෙසකාරක**. පු-පෙසකම්කරන්නා, රෙදි වියන්නා.

**පෙසන**. න-යැවීම, ප්‍රෙරණය.

**පෙසනක**. පු-යවන්නා.

**පෙසනික**. පු-යවන්නා.

**පෙසනිය**. න-යැවිය යුතු දෙය.

**පෙසල**. ති-ප්‍රියසිලි, සිල්වත්, සිත්කලු, සුන්දර, දක්ෂ.

**පෙසාච**. පු පිසාචයා, පාංශු පිසාචයා.

**පෙසි**. ඉ-මස් පිඩුව.

**පෙසිකා**. වැදූලල, අබ්බුදාවස්ථාවෙන්, සති-යකට පසු, වියළි ආකාර, වියළි ගතියට පැමිණි අවස්ථාව.

**පෙසිත**. ති-යවන ලද.

**පෙසු**. d. භූ. ගමනෙ, යාමෙහි. පෙසති=යෙයි.

**පෙසුණ**. න-පෙහෙසුන් තෙපුල් කීම.

**පෙසුනක**. පු-පෙහෙසුන් කියන්නා.

**පෙසුනිය**. පු-පෙහෙසුන් කියන්නා.

**පෙසුණකරණ**. ති-ප්‍රියබව නැති කරන වචන.

**පෙසෙති**. ක්‍රි-(පෙස + ණෙ + ති) යවයි.

## පො - ප්

**පොක්ඛර**. න-පද්මය, ශරීරය, වීනාද්‍රෝණිය, ශෝභනත්වය, ජලය, ඇතුන්ගේ හොඬ අග කරාවිය.

**පොක්ඛරවස්ස**. න-පොකුරු වැසි, පොකුරු පත්වල, පියුම්පත්වල (හිමෙන්) තෙමෙනු කැමැත්තවුන් තෙමෙන්නාවූද, අකමැත්ත-වුන්, නොතෙමෙන්නාවූද වර්‍ෂාවක්.

**පොක්ඛරණී**. ඉ-පුෂ්කරණිය, පියුම්විල.

**පොක්ඛරසාතක**. පු-තල් රෙහෙනු.

**පොක්ඛරතා**. ඉ - සෝභනත්වය, වර්‍ණණ පොක්කරතා.

**පොඛ**. න-පටිපාටිය, පිළිවෙළ.

**පොට**. න-බුබුළ.

**පොටගල**. පු-වැලුක්, කුලල්, බට.

**පොට්ඨපාද**. පු-බිණර මාසය, බිඩර මාසය.

**පොට්ඨබ්බ**. පු-ස්පර්‍ශය, පහස, එකට එක හැපීම.

**පොථ**. d. චු. තාඩණෙ තැළීමෙහි. පොථෙති= තළයි.

**පොථන**. න-තැළීම, පොඩි කිරීම, පහර ගැසීම, ගෙඩිදීම.

**පොථිත**, ති-තළන ලද; පොඩි කළ.

**පොථෙති**. ක්‍රි. d-චු. පොථ තාඩණෙ, තැළී-මෙහි + ණෙ + ති (පොථ + ණෙ + ති) තළයි.

**පොණ**. ති-අවනත, නැමුණු ගම්භීර.

**පොණ්ක.** ති-ප්‍රණත, යටත් දෙසට නැමුණු, මූහින් වැටී සිටින.

**පොත** පු-බාලයා, ළදරුවා, නැව.

**පොතක.** පු-බාලයා

**පොතවාහ.** පු-නැව් පදින්නා.

**පොත්ථ.** ති-දුප්පත්, අසරණ.

**පොත්ථක.** න - තියඳ පට්ටයෙන් කළ වස්ත්‍ර.

**පොත.** ති-ලිපි ආදී ක්‍රියා ග්‍රන්ථය.

**පොතිකා.** ඉ-බාල තැනැත්තී, පොතී.

**පොත්ථලිකා.** ඉ-පෙතැල්ල, වස්ත්‍ර දනතාදීන් කළ රූපය, බෝනික්කා.

**පොත්ථක.** න-පොත, පොතු, පුරාණ ග්‍රන්ථ ලිවීමට ගස් පොතු පාවිච්චි කළ බැවින් ග්‍රන්ථයන්ට පොත්ථක යයි ව්‍යවහාරය.

**පොත්ථනිකා.** ඉ-කිරිච්චිය, කඩුව.

**පොථ.** d-භූ. පුරණතාඩනෙසු, පිරීමෙහි හා, තැළීමෙහි.

**පොථති.** ක්‍රි-සම්පූර්ණ කරයි, තළයි.

**පොථ.** d-චු. තාඩනෙ, තැළීමෙහි, පොථෙති පොථයති, තළයි. ගෙඩි දෙයි.

**පොථෙත්වා.** අ-තළාපෙලා.

**පොථෙති.** ක්‍රි-d. චු. පොථ, තාඩනෙ, තැළීමෙහි + ණෙ + ති (පොථ + ණෙ + ති) තළයි, ගෙඩි දෙයි.

**පොථුජ්ජනික.** ති - පෘථග්ජනයන්ට අයිති, පෘථග්ජනයන් පිළිබඳ, පුථුජ්ජන බලනු.

**පොනොභාවික.** පු-පුනර්භවයට අයිති, නැවත නැවත භවයෙහි ඉපදීම ඇතිකරන.

**පොරාණ.** න-පරණ, කල්ගිය.

**පොරාණික.** පු-පුරාතනයෙහිවූ, පුරාණයට අයත්.

**පොරාණක.** පු - පොරාණික.

**පොරී.** ති-පුරවැස්සන්ට අයත්, නාගරිකයන්ට අයිති, සීලාචාරයෙන් යුත්.

**පොරිස.** න-මිනිස් ප්‍රමාණය, මනුෂ්‍ය ප්‍රමාණ, උස ඇති, ශූරත්වය.

**පොරිසාද.** පු-මිනිසුන් කන්නා, එනම් තැනැත්තා.

**පොරිසාදක.** පු-මිනිසුන් කන්නා.

**පොරිසිය.** ති-මිනිස් ගති ඇති.

**පොරොසෙය්‍ය.** ති-මිනිස්කමට සැහෙන, මනුෂ්‍යත්වයට යොග්‍ය.

**පොරොහච්ච.** න-පුරොහිත භාවය, පුරෝහිත බලනු.

**පොරොහිත.** න-පුරෝහිතයාට අයත්.

**පොස.** පු-පුරුෂයා, පිරිමියා.

**පොසක.** පු-පොෂ්‍ය කරන්නා.

**පොසති.** ක්‍රි-(d. භූ. පුස, පොසණෙ, පොෂ්‍ය කිරීමෙහි + ති) පොෂ්‍යය කරයි.

**පොසථ.** පු-පොහෝ දිනය.

**පොසථික.** පු-උපොසථිකයා, පොහෝදින සිල් රකින්නා.

**පොසන.** න-පොෂණය, පොෂ්‍ය කිරීම

**පොසාපිත.** ති-පොෂ්‍ය කළ, පුටු.

**පොසාපෙති.** ක්‍රි-පොෂ්‍යය කෙරෙයි.

**පොසාවනික.** පු-පොෂ්‍යය කරන්නා.

**පොසිත.** ති-පොෂ්‍යය කළ, ඇතිදැඩි කළ.

**පොසිය.** ති-පොෂ්‍යය කටයුතු, පොෂ්‍යයට යොග්‍ය.

**පොසිතුං.** අ-පොෂ්‍යය කිරීමට.

**ප්ලව.** පු-පසුර, පහුර, මැඩියා.

**ප්ලවඞ්ග.** පු-වඳුරා, රිලවා.

**ප්ලිහ.** පු-පිළාව.

**ප්ලිහනාසක.** පු-පිළා නසන්නා, වල් එරබදු, වැල් එරබදු.

## ඵ

**ඵගගව.** පු-හගුළ.

**ඵග්ගු.** පු-පොහෝ දිනය. "සුඛස්සවෙ සදා ඵග්ගු"

**ඵග්ගුණ.** පු-ඵාලගුණය, මැදිපෝය, පුවපල්, උතුරුපල් නැකත්.

**ඵග්ගුණී.** ඉ-මැදිපෝය දිනය.

**ඵණ.** d. භූ. ගමනෙ, යාමෙහි. පනතී=යෙයි.

**ඵන.** න-සජීයන්ගේ පෙණය, පතාව.

(16788)

**ඵණක.** පු-සර්පයා.

**ඵණති.** ක්‍රි-(d භූ. ඵණ, ගමනෙ, යෑමෙහි + ති) යෙයි.

**ඵණි.** පු-පෙණේ ඇත්තා, සර්පයා.

**ඵණිජ්ජක.** න-සමීරණ වෘක්‍ෂය.

**ඵන්දන.** පු-කොළොම් රුක

**ඵන්දති.** ක්‍රි-(d. භූ. ඵදි, චලනෙ, සෙලවීමෙහි + ති) සැලෙයි, කම්පිතවෙයි.

**ඵන්දන.** න-සැලීම, කම්පා වීම.

**ඵන්දිත.** ති-සැලෙන ලද, කම්පාවන ලද.

**ඵර.** d. භූ. පැතිරීමෙහි, ඵරති, පැතිරෙයි.

**ඵරණ.** පැතිරීම, පතළවීම.

**ඵරණක.** ති-පැතිරීම, පැතිරවීම.

**ඵරසු.** පු-පොරොව, කෙටේරිය.

**ඵරිත.** ති-පතළ, පැතුරුණු.

**ඵරුස.** ති-රූක්‍ෂ වස්තු, කර්කශ දේ.

**ඵල.** d. චු. ඵාලනෙ, පැලීමෙහි, ඵලති= පැලෙයි.

**ඵල.** d. භූ. ගතියං, පැතිරීමෙහි, ඵලති= පැතිරෙයි.

**ඵල.** d. භූ. නිප්ඵත්තියං, නිපදවීමෙහි, ඵලති, පලගනී, හටගනී,

**ඵල.** d. භූ. භෙදෙ, බිඳීමෙහි, ඵලති, බිඳෙයි.

**ඵල.** න-විපාක සිත, හෙතුවෙන් කරන ලද්ද, ප්‍රයොජනය, ධ්‍යානාදිය, . ගෙඩි, ස්ත්‍රීපුරුෂ නිමිති,

**ඵලක.** න-පලිහය, ලෑල්ල.

**ඵලකපාදක** න-පුවරුවල සවිකළ පා ඇති, පුටුව.

**ඵලදණ්ඩ** පු-වඩුවා.

**ඵලකචීර.** න-වැහැරි සිවුරු.

**ඵලති.** ක්‍රි-(d. භූ. ඵල, නිප්ඵත්තියං, නිපදවීමෙහි) විපාක දෙයි.

**ඵලන.** න - වැටෙන, පුපුරණ, අසනියා ඵලනතියා.

**ඵලපූර.** පු-ලප්නාරං ගස, ලප්නාරඟ.

**ඵලවන්තු.** ති-ඵල ඇති, ඵලවත්.

**ඵලවන්ති.** ඉ-ඵල ඇත්ති.

**ඵලික.** පු-පළිඟු, පළිඟු මැණික.

**ඵලිකමය.** පු-ඵළිඟුමය, පළිඟුවලින් නිම කළ,

**ඵලිත.** ති-පැසුණු, ඵලයෙන් ගැවැසුණු.

**ඵලින.** ති-ඵල ඇති වෘක්‍ෂය.

**ඵලිනි.** ඉ-පුවඟු.

**ඵලී.** ඉ-පුවඟු.

**ඵලු.** න-පුරුක, පර්වය.

**ඵල්ල.** d. භූ. පටිසංඛරණෙ, ප්‍රතිසංස්කරණයෙහි, ඵල්ලති පිළිදුගුම් කෙරෙයි,

**ඵස්ස.** පු ස්පර්ශය, පහස.

**ඵස්ස.** d. භූ. ඵස්සෙ, ස්පර්ශයෙහි, ඵස්සති, ස්පර්ශ කරයි.

**ඵස්සති.** ක්‍රි-(d. භූ. ඵස්ස, ඵස්සෙ, ස්පර්ශ කිරීමෙහි + ති) ස්පර්ශ කරයි.

**ඵස්සනා.** ඉ-ස්පර්ශ කිරීම, පහස ගැනීම.

**ඵස්සිත.** ති-ස්පර්ශ කළ

**ඵස්සෙති.** ක්‍රි-ස්පර්ශ කෙරෙයි.

## ඵා

**ඵාණි.** ඉ-අත්ල, අත.

**ඵාණිත.** න-ඉක්‍ෂුවිකාරය, පැණි.

**ඵාති.** ඉ-වෘද්ධිය, වැඩීම.

**ඵාරුසක.** න-ශක්‍රයාගේ උයන, බොරළු දමුනු, මසන්.

**ඵාරුස්සක.** න-ඵාරුසක.

**ඵාල.** පු-සීවැල.

**ඵාලන.** න-පැලීම, දෙපලු කිරීම.

**ඵාලක.** න-පැලීම, කොටස් කිරීම.

**ඵාලිපුල්ල.** පු-භාත්පසින් පිපීගිය, මනාව පිපි ගිය.

**ඵාලිත.** න-පලන ලද, පැළූ.

**ඵාලිභද්දක** පු-පාරිභද්‍ර.

(16841)

**ඵාලිම**. න-පළල් කිරීම, විවෘත කිරීම.

**ඵාලෙති**. ක්‍රි-(d. භූ ඵල, භෙදනෙ, බිඳීමෙහි + ණෙ + ති) (ඵල + ණෙ + ති) පලයි.

**ඵාසු**. පහසු, සැප ඇති.

**ඵාසුක**. ති-පහසු, පීඩා රහිත, කරදර නොමැති.

**ඵාසුකා** ඉ-ඉල ඇට, පරාල. පරල.

**ඵාසුලා**. ඉ-පරාල, ඉල ඇට

**ඵාසුලි**. ඉ-පරාල, ඉල ඇට

**ඵාසුලිකා**. ඉ-ඉල ඇට, පරාල.

**ඵාසු විහාර**. පු-සැප විහරණය, උතුරු මිනිස් දහමින් යුක්තව විසීමෙන් වන සැප විහරණය.

**ඵිය**. පු-පලුපත, හබල්පත, ඔරු හබල

**ඵීත**. න-සමෘද්ධි, වෘද්ධිප්‍රාප්ත, වැඩීමට පැමිණි.

## ඵු

**ඵුජ**. d. භූ. විකිරණෙ, විසිරීමෙහි, ඵොජති, විසිරේ.

**ඵුජ**. d. භූ. මෙසනාදෙ. මෙසනාදයෙහි, ඵුජති මෙසගජිතා කරයි

**ඵුට**. ති-ව්‍යක්තාදෙය, ස්පර්ශී කළ, පතළ.

**ඵුඨ**. d. භූ. විකිරණෙ, විසිරීමෙහි, ඵොටති, විසිරෙයි.

**ඵුඨ**. d. භූ. විකාසෙ, ප්‍රබොධයෙහි, ඵුඨති, පිපෙයි.

**ඵුට**. d චු. පීඩනෙ, පෙළීමෙහි, ඵොටෙති, ඵොටයති, පෙළයි, පීඩා කරයි.

**ඵුට**. d. චු. භෙදනෙ, බිඳීමෙහි, ඵොටෙති, ඵොටයති, බිඳියි.

**ඵුට**. d චු. කථනෙ, කීමෙහි. ඵොටෙති, ඵොටයති = කියයි.

**ඵුට**. d භූ. විකිරණෙ, විසිරීමෙහි, ඵොටති, විසිරෙයි.

**ඵුටන**. න-පැලීම.

**ඵුටිත**. ති-පලන ලද, ඵලිත.

**ඵුට්ඨ**. ති-ස්පර්ශිය, ස්පර්ශී කළ.

**ඵුණ**. d. භූ. විකිරණාදීසු විසිරීම් ආදියෙහි, ඵුණති, විසුරුවයි.

**ඵුර**. d. භූ-ඵාලන සොභනෙසු, සැලීමෙහි, සොභාවෙහි, ඵුරති, සැලෙයි, බබලයි.

**ඵුර**. d. තු-චලනෙසු, සැලීමෙහි, පිනවීමෙහි.

**ඵුල**. d භූ-රාසිකරණෙ, රැස්කිරීමෙහි, ඵුලති, රැස්කෙරෙයි, පැතිරෙයි.

**ඵුලිඞ්ග**. පු-ගිනි අඟුරු, විස්ඵුලිඞ්ග.

**ඵුල්ල**. d. භූ-විකාසෙ, පිපීමෙහි, ඵුල්ලති, මල් පිපෙයි.

**ඵුල්ල**. d. භූ-පටිසංඛරණෙ, ප්‍රතිසංස්කරණයෙහි, ඵුල්ලති, ප්‍රතිසංස්කරණය කරයි.

**ඵුල්ලපටිසංඛරණ**. න-කැඩුම් බිඳුම් අලුත් වැඩියා කිරීම, කැඩුම් බිඳුම් සාදා පෙර පැවති තත්වයට පැමිණවීම.

**ඵුල්ලිත**. ති-ප්‍රබුද්ධවන ලද, පිපුණු.

**ඵුස**. d භූ-ඵස්සෙ, ස්පර්ශ කිරීමෙහි, ඵුසති, ස්පර්ශකරයි, ඵස්සො.

**ඵුස**. d. කි-සෙනහෙ, සෙනහයෙහි, ඵුසෙති, සෙනහකරයි.

**ඵුසති**. ක්‍රි-(ඵුස + ති) ස්පර්ශකෙරේ.

**ඵුසන**. න-ස්පර්ශ කරන, ස්පර්ශය.

**ඵුසිත**. ති-ස්පර්ශ කළ, පහස කළ.

**ඵුසිතක**. පු-දියබින්දු, "ඵුල්ලඵුසිතකෙ දෙවෙ වස්සන්තෙ"

**ඵුසී**. ඉ-කටුවැල්බටු.

**ඵුස්ස** පු-පුසේ නැකත, දුරුතු මාසය.

**ඵුස්සතිල**. න-මඞ්ගලතල, තලමඞ්ගල්‍ය වස්තුවකැයි සලකනු ලැබේ.

**ඵුස්සරථ**. පු-යුද්ධයට නොයන රථය, මඟුල් රථය.

**ඵුස්සරාග**. පු-මාණික්‍ය විශෙෂයක්, පුෂ්පරාග මැණික.

**ඵුස්සිත** න-ඔබ්බන ලද, කාවද්දන ලද

**ඵුල**. d. භූ-ඡාදනෙ, වැසීමෙහි, ඵුලති, වසයි.

(16886)

## ඵෙ – ඵො

**ඵෙග්ගු**. පු-කොටදිඹුලා ගස.

**ඵෙග්ගු** න-අසාර දෙය, එලය.

**ඵෙග්ගුක**. පු-එලය, සාරනොවත දෙය.

**ඵෙණ**. න-තයිපෙණ ආදිය, දියෙහි ඇතිවන පෙණ, සබන් ආදියෙහි පෙණ.

**ඵෙණිල**. පු-පෙණෙල ගස.

**ඵෙත**. d. භූ-ගමනෙ, යාමෙහි.

**ඵෙනිල**. පු-ඩෙබර, බදර.

**ඵෙලු**. d. භූ-ගමනෙ, යාමෙහි, ඵෙලති, යෙයි.

**ඵොට**. පු-පොළ, බිබිලි, පිළිකා.

**ඵොටක**. න-බිබිළ, පිළිකාව.

**ඵොටන**. න-ගැසීම, ගසාදැමීම, පපෙඵාටන.

**ඵොටෙති**. ක්‍රි. d-තලයි, ගසාදමයි.

**ඵොට්ඨබ්බ**. පු-(d. භූ. ඵුට, විකසනෙ, විකාස යෙහි + ණෙ + ති) ස්පෘෂ්ටව්‍යය, පහස.

## බ

**බක**. පු-කොක, බලාකය.

**බකුල**. න-වක්කුල, දෙකුලය

**බක්කුල**. න-වක්කුල, දෙකුලය කුලදෙක.

**ලජ්ඣති**. ක්‍රි-(d. චු. බධ, බන්ධනෙ, බැඳීමෙහි + ති) බඳියි.

**බජ්ඣන**. න-බැඳීම, බන්ධනය

**බත්තිංස**. වත්තිංස, දෙතිස, 32.

**බදර**. පු-ඩෙබර, මසන්.

**බදරා**. ඉ-කපු.

**බදරි**. ඉ-ඩෙබර.

**බදලතා**. ඉ-කටුසහිත වැලක්, මිහිරි රස ඇති ලක්ෂණ වැලක්.

**බධ**. d. භූ-බන්ධනෙ, බැඳීමෙහි, බන්ධති බඳියි.

**බධ**. d. චු – බන්ධනෙ, පෙළීමෙහි, බාධෙති, බාධයති, පෙලයි, පීඩාකරයි.

**බධිර**. පු-බිහිරා, බිහිරා, ශ්‍රැතිහීනයා.

**බධ**. ති-බඳනා ලද.

**බද්ධක**. ති-බැඳුණු.

**බද්ධචර**. න-බද්ධවෛරය, අඝාතය.

**බන්ධ**. d. භූ. බන්ධනෙ, බැඳීමෙහි, බන්ධති, බඳියි.

**බන්ධකී**. ඉ-ධූර්තස්ත්‍රී, දූතකම් කරන්නී.

**බන්ධති**. ක්‍රි-බඳියි, ගැටගසයි.

**බන්ධන**. න-බැඳීම, බන්ධනය, පයමල.

**බන්ධනභණ්ඩි**. ඉ-පයමලය.

**බන්ධනාගාර**. න-සිරගෙය, හිරගෙය.

**බන්ධනාලය**. පු-බන්ධනාගාරය, සිරගෙය

**බන්ධනීය**. න-බැඳිය යුතු.

**බන්ධව**. පු-බන්ධුවර්ගීයා, නෑයා.

**බන්ධු**. පු-නෑයා, බ්‍රහ්මයා.

**බන්ධුක**. පු-බඳුවදමල්ගස.

**බන්ධුකපුප්ඵා**. ඉ-ප්‍රියාගස

**බන්ධුජීවක**. පු-බඳුවද.

**බන්ධුමතී**. ඉ-එනම් නුවර.

**බප්ප**. පු-කඳුළු, නෙත්‍රජලය.

**බබ්බජ**. ති-බබුස්තණ, හීන්වේවැල්.

**බබ්බු**. පු-බළලා, මුගටියා.

**බබ්බර**. න-ගොත ගැසීම, වික්කල් ගැසීම,

**බරිහි**. න-මොනරපිල මයුරපිඤ්ජය.

**බරිහිස**. න-කුසතණ.

**බරිහී**. පු-මොනරා, මයුරයා.

**බල**. d. භූ-ජීවනෙ, ජීවත්වීමෙහි, බලති, ජීවත්වෙයි.

**බල**. න-ශක්තිය, බලය, සෙනාව, ස්ථූලභාවය.

**බලකාය**. පු-බලසමූහය, භට සෙනාව.

**බලකොට්ඨක**. පු-බලකොටුව.

**බලගග**. න-බලසේනා ගණින තැන.

**බලවක්ක**. න-සේනාබලය.

(16942)

**බලක්කාර** පු-බලහත්කාරය.

**බලට්ඨ** පු-යුද්ධ නිලධාරියා, මාලිගාවේ ආරක්ෂකයා,

**බලති.** ක්‍රි-d. භූ බල, පාණනෙ, ජීවත් වීමෙහි + ති) (බල × ති) ජීවත් වෙයි.

**බලදෙව.** පු බලයට අධිපති දෙවියා

**බලධංසී.** පු-විෂ්ණු

**බලන්‍යාස.** පු-සෙනා වින්‍යාසය.

**බලසජ්ජන.** න-සෙනා සැරසීම.

**බලවං.** අ-අතිශයාර්ථයෙහි

**බලවාහන.** න-භට සෙනාව හා වාහනය.

**බලාකා.** ඉ-කණකොකා.

**බලානීක.** න-බලසෙනාව.

**බලාය.** පු-දෙව්ලොව.

**බලාරාති.** පු ශක්‍රයා.

**බලි.** පු-පූජා, කරවුවර, අසුර විශෙෂයක්.

**බලී.** පු-බල ඇත්තා, ශක්ති ඇත්තා

**බලිපුට්ඨ.** පු-බිලිපුටු, කවුඩා.

**බලිභුජ.** පු-බිලිපුටු, කවුඩා.

**බලිවද්ද.** පු-බලිවදීයා, ගොනා, වෘෂභයා.

**බලිස.** න-බිලිය, බිලිකොක්ක.

**බලිසමංසික.** න-බිලියෙන් ඇද ඇද ඇඟමස් කඩන වධයක්, දෙතිස් වධයෙන් එකක්.

**බලියති.** ක්‍රි-(d. භූ. බල, ගහණෙ, ජීවත්වීමෙහි + ති) බලඇත්තේ වේ.

**බල්‍ය.** න-බල ඇතිබව, බලභාවය.

**බලවන්තු.** පු-බල ඇත්තා.

**බලියක්ඛ.** පු-බලිබුදින යක්ෂයා.

**බහ.** d. භූ-සද්දෙ, ශබ්දයෙහි, බහති, ශබ්ද කෙරෙයි.

**බහ.** d. භූ-වුඩ්ඪියං, වැඩීමෙහි බහති, වැඩෙයි.

**බහති.** ක්‍රි-(d. භූ. බහ, වුඩ්ඪියං, වැඩීමෙහි + ති, බහ + ති) ශබ්දකරයි, වැඩෙයි.

**බහල.** න-ඝන. ඝනකම, ඝණකම, බහල භාවය.

**බහලත්ත.** න-ඝනභාවය, ඝනකම් බව, බහල භාවය.

**බහි.** අ-බැහැර, පිටත යනාර්ථයෙහි.

**බහිට්ඨ.** න-හිරිවේරිය, ඉරිවේරිය.

**බහිද්ධා.** අ-බැහැර, පිටත, ඉවත.

**බහිද්වාර.** න-බිහිදොර, දොරින් පිටත.

**බහු.** d. භූ-ගණනෙ, ගිණීමෙහි.

**බහු.** ති-බහුලාර්ථයෙහි, බොහෝ, වැඩිපුර.

**බහුක.** ති-බොහෝ, අධික, වැඩිපුර.

**බහුක්ඛත්තුං.** අ-බොහෝවර, බොහෝවාරවල

**බහුකම්ම.** පු-සර්වඥයන් වහන්සේ.

**බහුකිච්ච.** පු-බොහෝ කටයුතු, අධික කටයුතු දේ.

**බහුධා.** අ-බොහෝ පරිද්දෙන්, බොහෝ සෙයින්.

**බහුජන.** පු-බොහෝ ජනයා, මහජනයා, බොහෝ දෙනා.

**බහුතර.** ති-අති බහුල, ඉතා, බොහෝ.

**බහුත්ත.** න-බහුලත්වය, බොහෝබව.

**බහුප්පාද.** පු-බොහෝ පාද ඇත්තා, බොහෝ කකුල් ඇත්තා.

**බහුභෙද.** ති-මිශ්‍රදෙය, නොයෙක් ප්‍රභෙද ඇති.

**බහුරූප.** පු-දුම්මල, අනෙකරූප.

**බහුල.** ති-බොහෝ, බොහෝ දෙය.

**බහුලා.** ඉ-එන්සාල්, එලා.

**බහුලී.** ති-බොහෝ සෙයින්,

**බහුලීකත.** ති-බොහෝ සෙයින් කළ.

**බහුවාක.** පු-ලෝලුගස.

**බහුවිධ.** ති-නානාප්‍රකාර, අනෙකවිධ.

**බහුසො.** අ-බොහෝ සේ, බහුවිධ.

**බහුස්සුත.** පු-බහුශ්‍රැත, බොහෝ ඇසූපිරූ තැන් ඇති.

**බහුසුතා.** ඉ-බොහෝ දරුවන් ඇත්ති, සාතාවාරිය වැල.

## බා

**බාණ**. පු-හීතැරය, ඊතැරය, තෘෂ්ණාව, වාණ.

**බාණධි.** පු-හියවුර, ඊ පැස.

**බාකුචී**. ඉ-බෝදීගස.

**බාධ**. d. භූ-බාධායං, බාධාකිරීමෙහි, බාධති, බාධාකරයි, අළලයි.

**බාධක**. පු-බාධාකරන්නා, වළක්වන්නා.

**බාධති**. ක්‍රි-(d. භූ බාධ, බාධායං, බාධා කිරීමෙහි + ති) බාධා කරයි, හිංසා කරයි.

**බාධන**. න-බාධාව, වැලැක්වීම.

**බාධා**. ඉ-දුක, වැලකීම.

**බාධික.** ති-බාධාකළ, හිංසාකළ.

**බාධා.** d. භූ-හිංසායං, පෙළීමෙහි, බාධති= පෙළයි.

**බාධිත.** ති-බාධාකළ, හිංසා කළ.

**බාධෙති.** ක්‍රි-d. භූ. බාධ, හිංසායං, පෙළීමෙහි + ණෙ + ති) හිංසා කෙරෙයි, බාධා කරයි.

**බාරාණසී.** ඉ-බරණැස් නුවර, ඉසිපතනය පිහිටි මෙම නගරය වනාහි අප්‍රමාණ දීඝී කාලයක් මුලුල්ලෙහි අන්‍යනාමයකට නොපෙරළා මේ බාරාණසී නාමයෙන්ම පැවැතෙන බව බොහෝ ජාතක කථාවත් ගේ අතීත කථා වස්තූන් ගෙන් පෙනීයේ.

**බාරාණසෙය්‍යක.** පු-බරණැසට අයත්, බාරාණසිය පිළිබඳ.

**බාල.** ති-බාලයා, ප්‍රථම වයසින් යුක්තයා, ළදරුවා, අඥානයා, මෝඩයා.

**බාලක.** පු-බාලයා, ළදරුවා.

**බාලකී.** ඉ-ළදැරී, බාල තැනැත්තී.

**බාලතනය.** පු-කිහිරිගස.

**බාලතා.** ඉ-බාල බව.

**බාලිස**. පු-බාල, මූඪ.

**බාලිසික.** පු-මාළු මරන්නා, කෙවුලා.

**බාලෙය්‍ය.** පු-කොටළුවා, ගද්‍රභයා.

**බාවීසති.** ඉ-දෙවිස්ස, විසිදෙක – 22

**බාහ.** න-බාහුව, අත.

**බාහති.** ක්‍රි-d. භූ. බාහ, නිවාරණෙ, (වැලැක් මෙහි + ති) වළක්වයි.

**බාහන.** න-වැලැක්ම.

**බාහික.** ති-විදෙශීය, පිට රටකට අයත්.

**බාහිත.** ති-පිටකළ, ඉවත්කළ, බැහැර කළ.

**බාහිතෙය්‍ය.** ති පිටත තැබිය යුතු.

**බාහිතිකා.** ඉ-වැස්ම, මැන්ටලය, සිවිය.

**බාහිය.** ති-විදෙශීය, අන් රටකට අයිති.

**බාහිර.** පු-පිටත, ඉවත.

**බාහිරක.** පු-පිටත වූ, ශාසනයෙන් පිටත වූ.

**බාහිරිම.** ති-පිටත, බාහිර.

**බාහු.** පු-බාහුව, වැලම්වේ පටන් උරහිස දක්වා අතේ උඩ කොටස.

**බාහුජ.** පු-ක්‍ෂත්‍රියයා, ක්‍ෂත්‍රිය වංශිකයා, ක්‍ෂත්‍රියයා, බ්‍රහමයාගේ බාහුවෙන් උපන්නේය යන මිථ්‍යා මතය පරිදි මෙසේ ව්‍යවහාර විය.

**බාහුජඤ්ඤ.** න-බොහෝදෙනා විසින් දන්නා ලද්ද.

**බාහුමූල.** න-කිසිල්ල, කිහිල්ල.

**බාහුමූලභූසන.** න-අගුපලඳනාව.

**බාහුලික.** ති-බොහෝසේ පවත්නා.

**බාහුසච්ච.** න-බහුශ්‍රැත භාවය.

**බාහුල්ලතා.** ඉ-බහුල භාවය.

**බාහුල්ලික.** බොහෝ බැවින් යුත්.

**බාහුල්‍ය.** න-බොහෝ බව, බහුල බව.

**බාහෙත්වා.** අ-වළක්වා.

**බාහෙති.** ක්‍රි-d. භූ. බාහ, (නිවාරණෙ, වැලක් වීමෙහි + ණෙ + ති.) වළක්වයි.

**බාහ්‍ය.** න-පිටත.

**බාළ්හ.** පු-අතිශය, බලවත්, දැඩි.

**බාල්හික.** ති-බොහෝ සම්පත් ඇති, බොහෝ දේ ඇති.

## බි

**බිදල.** න-වේවැල.

**බිදලාමඤ්චක.** ති-වේපත්වලින් වියන ලද ඇඳ.

**බින්දු.** පු-අනුස්වාරය, 0 ඒක සත වස්තුව, ස්වල්පය.

**බිම්බ.** න-ප්‍රතිමාව, මණ්ඩලය, කෙම්වැල.

**බිම්බක.** න-පිළිරුව, ප්‍රතිරූපය.

**බිම්බා.** ඉ-යසොධරා දෙවී, රාහුල මාතාව.

**බිම්බිකා.** ඉ-කෙම්වැල, කෝවක්කා, රතන කුරවක.

**බිම්බී.** ඉ-රත්රන්, රත්රන් පාට "බිම්බිනි සුවණ්ණං."

**බිම්බජාත.** න-ධම්මදස්සී බුදුන්ගේ බෝරුක

**බිම්බොහන.** න-කොට්ටය, = කත්වයිත් = මාවුලා.

**බිල.** d චු-භෙදෙ, බිඳීමෙහි, බිලති, බිඳියි.

**බිල.** න-භාගය, විවරය, සිදුර, බිලං බිලාසයා පවිසනති.

**බිලඞ්ග.** පු-කාඩි, කාඩිදිය, විනාකිරි.

**බිලඞ්ගථාලික.** පු-හිස්කබල උපුටා එහි රත් කළ ගලක් හෝ යගුලියක් දමා හිස් මොළය උණුවී යාමට කරන වධයක්, දෙතිස් කම්කටුල්ලෙන් එකක්.

**බිලඞ්ගික.** පු-බිලඞ්ග.

**බිලාසය.** පු-බිලයෙහි වාසය කරන්නා, සර්පයා.

**බිලි** d භූ-රොසෙ, අක්‍රොශයෙහි, බෙලෙති, අක්‍රොශ කරයි.

**බිල්ල.** පු-බෙලිගස.

**බිසකණ්ණිකා.** ඉ-කණකොකා.

**බිළාර.** පු-බළලා, බළල් ලූණු.

**බිළාරිකා.** ඉ-බැළලී.

**බිළාල.** පු-බළලා, බළල් ලූණු.

**බිළාලි.** න-පැළැටි වර්ගයක්.

**බිළිබිළිකා.** ඉ-ආශ්‍රය කිරීමට අමාරු ක්‍රියාව.

## බී

**බීජ.** න-කාරණය, බිත්තරය, ධාන්‍යාදිය, පුරුෂ නිමිත්ත.

**බීජක.** පු-බිජු ඇත්තා, බිජුහිමියා

**බීජති.** ක්‍රි-d. භූ. බීජ වාත, ජනනෙ, සුළං ඉපදීමෙහි + ති ) හුලංගසයි.

**බීජී.** පු-බීජ ඇත්තා, උත්පත්තිය ඇත්තා එකබීජී කොලබෙකාල.

**බීජකොස.** පු-පියුම් කෙමිය, පදමකර්ණිකාව, පුරුෂයන්ගේ අණ්ඩකොෂය.

**බීජබීජ.** න-උළු මුං ආදිය.

**බීජපූර.** පු-ලප්නාරන්.

**බීභච්ඡ.** ති-විකාරප්‍රාප්ත, භයඞ්කර.

**බීරණ.** න-සුවඳහොට, සැවැන්දරා.

## බු

**බුක්ක.** d. භූ-සුනඛසද්දෙ, බිරීමෙහි, බුක්කති, (බල්ලා) බුරයි.

**බුධ.** d. දි-ජානනෙ, දැනීමෙහි, බුජ්ඣති, දනී, අවබොධ කරයි.

**බුධ.** d. භූ-බොධෙ, අවබොධයෙහි, බොධති, අවබොධ කරයි, බොධි, බුධො.

**බුධ.** d. දි-නිද්‍රක්ඛයෙ, නිද්‍රාක්ෂයෙහි, පබුජ්ඣති, පිබිදෙයි.

**බුධ.** d. දි-විකාසෙ, පිපීමෙහි, පබුජ්ඣති, පිපෙයි.

**බුධ.** පු-පණ්ඩිතයා, බුධ ග්‍රහයා, ප්‍රඥව.

**බුධ.** පු-අවබොධ කළ තැනැත්තා, තථාගත යන් වහන්සේ, ප්‍රාඥයා.

**බුජ්ඣක.** පු-අවබොධ කරණ තැනැත්තා.

**බුජ්ඣති.** ක්‍රි-(බුධ + ති) අවබොධ කෙරෙයි.

**බුජ්ඣන.** න-අවබොධ කිරීම=දැනගැනීම.

**බුජ්ඣනක.** පු-අවබොධ කරන්නා, බුජ්ඣක.

**බුජ්ඣිත.** න-අවබොධකළ, ප්‍රතිවෙධකළ.

**බුද්ධ කොලාහල.** පු-බුදුවරුන්ගේ ලොව පහළ වීම පිළිබඳව දෙව් මිනිසුන් අතර ඇතිවන කලබලය.

**බුද්ධ ඤාණ.** න-බුද්ධ ඥානය.

**බුද්ධ චක්ඛු.** න-බුදු ඇස, පඤ්ච චක්ඛු බලනු.

**බුද්ධ ධම්ම.** පු-බුද්ධ කාරක ධර්ම, පාරමී ධර්ම.

**බුද්ධත්ත.** න-බුදු බව, බුද්ධ භාවය.

**බුද්ධ බල.** න-දසවිධ බුද්ධ බලය, දශවිධ කාය බලය හා දශවිධ ඥාන බලය.

**බුද්ධ භූමි.** ඉ-බුද්ධ භූමිය, බුද්ධත්වය, පාරමී පූරණ.

**බුද්ධ වචන.** න-සර්වඥ වචනය, බුදුබණ, බුද්ධ දේශනාව.

**බුද්ධගයා.** සර්වඥයන් වහන්සේ බුද්ධත්වයට පැමිණි නේරඤ්ජරා ගඟ බඩ පිහිටි එනම් ප්‍රදේශය.

**බුද්ධ සාසන.** න-බුද්ධානුසාසනාව, බුද්ධාගම, බුද්ධ ධර්මය, ත්‍රිපිටක බුද්ධ ධර්මය.

**බුධි.** d චු-පීඩනෙ, පෙළීමෙහි, බුධෙති, බුද්ධයති=පෙළයි, පළිබොධො, පළිබුජ්ඣති.

**බුද්ධි.** ඉ-බුද්ධිය, ප්‍රඥාව, ඥානය.

**බුද්ධික.** පු-බුද්ධි ඇත්තා, නුවණැත්තා.

**බුද්ධිමන්තු.** පු-ප්‍රාඥයා, බුද්ධි ඇත්තා.

**බුන්ද.** පු-අල, බද්ධ මූලය.

**බුන්දි.** d භූ-තිබ්බණෙ, තියුණු කිරීමෙහි, බොන්දති, තියුණු කරයි.

**බුන්දික.** න-ඇඳේ කුඩුව, ඇඳ.

**බුන්දිකාබද්ධ.** පු-මඤ්ච විශෙෂයක්, පාද හා විට්ටම් ඒකාබද්ධ කොට ඇති ඇඳක්.

**බුබ්බුද.** න-බුබුල, දිය බුබුල.

**බුබ්බුල.** න-බුබුල, දිය බුබුල.

**බුභුක්ඛ.** ති-කනු කැමැත්ත, බුදිනු රිස්ස.

**බුභුක්ඛති.** ක්‍රි-(d. භූ. භුජ, බ්‍යවහරණෙසු, පරිභොගයෙහි+ති) (භුජ+ඛ+භුභුජක+බුභුජක+බුභුකඛ+ති) කනු කැමති වෙයි. භුජ බලනු.

**බුභුක්ඛිත.** ති-බුභුක්ඛිත, කනු කැමති වන ලද, ක්ෂුධා ඇත්තා, බඩසා ඇත්තා.

**බූලහ.** පු-යුද්ධ භට සමූහය.

## බෙ – බො

**බෙලුව.** පු-බෙලිගස.

**බෙලුව පණ්ඩු වීණා.** ඉ-පඤ්චසිඛ දෙවියාගේ එනම් වීණාව.

**බෙලුව සලාටුක.** න-බෙලි ගැට.

**බෙලුල.** පු බිල්ව, බෙලිගස.

**බොධ.** පු-අවබොධය, ඤාණය, ප්‍රඥාව.

**බොධකර.** පු-වන්දිභට්ටයා, පුබුදු කරවන්නා, ඇහැරවන්නා, රජුන්ගේ සයනාගාර සමීපයට පැමිණ අලුයම රජුන් පුබුදු කරවීමට වන්දිවරු තුති ගී ගායනා කරමින් නිඳි දුරු කරවති.

**බොධි.** ති-සර්වඥතාඥානය, අර්හත් මාර්ග ඥානය, ආර්‍ය මාර්ගය, සතර මාර්ග ඥානය, බෝරුක.

**බොජ්ඣ.** න-බුදියයුත්ත, අනුභව කටයුත්ත.

**බොධි.** පු-පණ්ඩිතයා, ප්‍රාඥයා.

**බොජ්ඣයාගු.** ඉ-අනුභව කටයුතු කැඳ, තලප.

**බොධන.** න-අවබොධය, දැනීම.

**බොධනීය.** ති-අවබොධ කටයුතු, අවබෝධයට සුදුසු.

**බොධනෙය්‍ය.** ති-අවබොධ කටයුතු, බොධනීය.

**බොධිද්දුම.** පු-බොධි වෘක්ෂය.

**බොන්දි.** පු-ශරීරය, දෙහය.

**බොධි පක්ඛික ධම්ම.** පු-සර්වඥතාඥානයාගේ පක්ෂයෙහි වූ ධර්ම, බුද්ධත්වයට පක්ෂ වූ ධර්ම, සතර සතිපට්ඨානාදිය.

**බොධි පක්ඛිය ධම්ම.** පු-බොධිපක්ඛික ධම්ම.

**බොජ්ඣඞ්ග.** පු-බොධියට අඞ්ග වන, සති ධම්ම විචය ආදී ධර්මසත.

**බොධබ්බ.** පු-අවබොධ කටයුතු, "මනනාය බොධබ්බං."

**බොධි පාචන ධම්ම.** පු-බුදු බව මුහුකරවන ධර්ම, දසපාරමිතා ධර්ම.

**බොධනෙය්‍ය.** පු-විනෙය ජනයා, ධර්මාවබොධයට සුදුසු ජනයා, වෛනෙය්‍ය ජනයා.

**බොධිමණ්ඩ.** න-බොධිසඞ්ඛ්‍යාත ඥානයාගේ සැරසීම හෝ ප්‍රසන්නාය ඇතිවූ ස්ථානය, බෝමැඩ.

## බ්‍ය

**බ්‍යග්ඝ.** පු-ව්‍යාඝ්‍රයා, වග.

**බ්‍යග්ඝී.** ඉ- කටුවැල් බටු, ව්‍යාඝ්‍ර ධෙනුව.

**බ්‍යඤ්ජන.** න-ව්‍යඤ්ජනාක්ෂර, ලක්ෂණය, ව්‍යඤ්ජනය, මාළුපිනි ආදිය.

**බ්‍යත්ත.** ති-ව්‍යක්ත, සමර්ථ, දක්ෂ, ප්‍රවීණ

**බ්‍යථ.** d. භූ-දුක, බිය, සැලීම යන මෙහි බ්‍යථති, දුක්වෙයි.

**බ්‍යන්ති.** අවසානය, කෙළවර.

**බ්‍යන්තිකරණ.** න-අවසන් කිරීම, කෙළවර කිරීම.

**බ්‍යධ.** d. දි-වෙධනෙ, තැළීමෙහි.

**බ්‍යපගත.** ති-විගත, පහවන ලද, තොරවන ලද.

**බ්‍යප්පථ.** පු-වචන මාර්ගය, කථා කිරීමේ මඟ.

**බ්‍යය.** d. චු-චාගෙ, පරිත්‍යාගයෙහි, බ්‍යයෙති, බ්‍යයයති, වස්තු පරිත්‍යාග කරයි.

**බ්‍යය.** d. චූ-ඛයෙ, ක්ෂයයෙහි, බ්‍යයෙති, බ්‍යයයති=ක්ෂය වෙයි.

**බ්‍යසන.** න-විනාසය, වැනසීම.

**බ්‍යා.** d. භූ-උම්මීලනෙ, ඇස දැල්වීමෙහි, බ්‍යති, ඇස දල්වයි.

**බ්‍යාකරණ.** න-ව්‍යාකරණය.

**බ්‍යා.** ඉ ව්‍යාජය, සටබව.

**බ්‍යාධි.** ඉ-ව්‍යාධි, වැදි, ලෙඩ, රොග.

**බ්‍යාධිත.** ති-පෙළෙන ලද, රොගයෙන් පීඩිත වන ලද.

**බ්‍යාධෙති.** ක්‍රි-(බ්‍යාධ + ණෙ + ති) පෙළයි, පීඩිත වෙයි.

**බ්‍යාපජ්ඣ.** පු-ව්‍යාබාධය, රොගය.

**බ්‍යාපජ්ඣති.** ක්‍රි-පීඩාවෙයි.

**බ්‍යාපත්ත.** න-ව්‍යාප්තිය, පැතිරීම.

**බ්‍යාපන්න.** පු-විපතට පැමිණි.

**බ්‍යාපාද.** පු-ව්‍යාපාදය, වැපාදය, වෛතස් සිතිවිල්ල.

**බ්‍යාප.** පු-පතළ.

**බ්‍යාබාධ.** පු-දුක, හිරිහැරය, විපත.

**බ්‍යාම.** පු-බ්‍යාම, බඹය, සතර රියන.

**බ්‍යාභඞ්ගී.** බ්‍යාභඞ්ගී.

**බ්‍යාමප්පභා.** ඉ-ව්‍යාම ප්‍රභාව, හාත් පස බඹයක් තන්හි පවත්නා ආලොකය.

**බ්‍යාවට.** පු-ව්‍යාවෘත, වට කළ, වටලන ලද

**බ්‍යාසත්ත.** ති-ව්‍යාසක්ත, ඇලුණු, ඇලෙන ලද.

**බ්‍යූහ.** පු-විනිවිද නොගිය වීදිය, සමූහය, රැල.

## බ්‍ර – බ්‍රැ

**බ්‍රහ.** d. භූ-උස්සාහෙ, උත්සාහයෙහි, බ්‍රහති, වීර්‍ය්‍ය කරයි.

**බ්‍රහ.** d. භූ-වුඩ්ඪියං, වැඩීමෙහි.

**බ්‍රහ.** ති-මහත් විශාල.

**බ්‍රහතී.** ඉ-දෙබටු, එළබටු, කටුවැල් බටු.

**බ්‍රහාරඤ්ඤ.** න-මහ වනය, මහ කැලය.

**බ්‍රහ්ම.** න-වෙදය, තපස.

**බ්‍රහ්ම.** පු-බුදුරජ, බ්‍රහ්මයා, ශ්‍රෙෂ්ඨ, මව්පියවරු.

**බ්‍රහ්මක.** ති-බ්‍රහ්මයා වෙත, බ්‍රහ්මලොකය පිළිබඳ.

**බ්‍රහ්මකායික.** පු-එනම් බඹලොව.

**බ්‍රහ්මකුත්ත.** පු-බ්‍රහ්ම කායිකය.

**බ්‍රහ්මචරිය.** න-දානය, බඹසර විහරණය, ශාසනය, මෛථුන විරතිය, සවදාර සන්තොසය, වතාවත්, පඤ්ච ශීලය, ආර්‍ය්‍ය මාර්ගය, උපොසථ සීලය, ධෛර්‍ය්‍යය.

**බ්‍රහ්මචාරී.** පු-බ්‍රහ්මචාරීහු, බඹසර රකින්නා.

**බ්‍රහ්මඤ්ඤ** පු-බ්‍රහ්මයාට හිත ක්‍රියා, රහතුන්ට හිත වූ ක්‍රියා.

**බ්‍රහ්මපුත්ත.** පු-එනම් ගම, එනම් නදිය, බ්‍රාහ්මණ පුත්‍රයා, විෂ භෙදයක්.

**බ්‍රහ්ම බන්ධු.** පු-බ්‍රාහ්මණයා.

**බ්‍රහ්මත්ත.** න-බ්‍රහ්මාත්ම භාවය.

**බ්‍රහ්මභූත.** පු-තථාගතයන් වහන්සේ.

**බ්‍රහ්මී.** ඉ-තෙපුල, වචනය.

**බ්‍රහ්මලෝක.** පු-බ්‍රහ්මයන්ගේ ලෝකය, බඹ ලොව.

**බ්‍රහ්මවිහාර.** පු-මෙත්තා කරුණා මුදිතා උපෙක්ෂා යන උත්තම ධර්ම සතරින් යුක්තව විසීම, මහා බ්‍රහ්මයා කෙරෙහි මේ ධර්ම සතර නොසිඳී පවතී.

**බ්‍රහ්මස්සර.** පු-බ්‍රහ්ම ස්වර, මහා බ්‍රහ්මයාගේ ස්වරය, නාදය, හඬ.

**බ්‍රාහ්මණ.** පු-බමුණු, වේදය හදාරන්නා.

**බ්‍රාහ්මණ මහාසාර කුල.** න-බමුණු මහසල් කුලය, දිනපතා කහවණු අසූ කෙළක් නිදන ගත වේ ද, විසි අමුණක් වියදම් වේ ද එබඳු සාර කුලය.

**බ්‍රූ.** d. භූ-වියත් ශබ්දයෙහි, බ්‍රවීති, නොපැකිල කියයි.

**බ්‍රූති.** ක්‍රි-(d. භූ බ්‍රූ, වියත්තිය, වාචායං, වියත් ශබ්දයෙහි + ති) කියයි.

**බ්‍රූහ.** d. භූ-වුඩ්ඩියං, වැඩීමෙහි, බ්‍රූහති, වඩයි.

**බ්‍රූහෙති.** ක්‍රි-(d. භූ බ්‍රූහ, වඩ්ඪනෙ, වැඩීමෙහි + ති) (බ්‍රූහ + ණෙ + ති) වඩයි.

**බ්‍රූහන.** න-වැඩීම, කීම.

**බ්‍රූහිත.** ති-වඩනා ලද, නැවත නැවත වඩනා ලද.

**බ්‍යූස.** d. චු-චාගෙ, ත්‍යාගයෙහි. බ්‍යාසති= තැගි කරයි.

## භ

**භ.** අ-නැකැත්, තාරකා.

**භචක්ක.** න-නක්ෂත්‍ර චක්‍රය.

**භකුටි.** ඉ-උදුරකම නිසා අනුන් පහත් කොට සිතීම, නොසැලකිලි ගතිය.

**භක්ඛ.** d. චු-භක්ඛනෙ, කෑමෙහි, භක්ඛෙති, භක්ඛයති=කයි.

**භක්ඛ.** පු-භක්ෂණය, අනුභවය, කෑම.

**භක්ඛක.** පු-භක්ෂණසීලියා = කෑදරයා, අනුභව කරන්නා.

**භක්ඛන.** න-භක්ෂණය, අනුභවය, කෑම.

**භක්ඛිත.** ති-අනුභව කළ, කන ලද.

**භග්ග.** පු-ඊශ්වරයා, එනම් ජනපදය, බිඳින ලද්ද.

**භග්ගවී.** ඉ-ගිතණ, ඊතණ.

**භග.** ති-යොනිය, යොනි මාර්ගය, කාමය, සමෘද්ධිය, ප්‍රධාන බව, ධර්මය, වීර්යය, කීර්තිය.

**භගණ්ඩ.** d. භූ සෙවනෙ, නෙත්වීමෙහි, වැගිරීමෙහි.

**භගන්දලා** (ලා) ඉ-එනම් රෝගය, යෝනිය පලාගෙණ ගෙඩියක් එන දරුණු රෝගයක්, ගුදය පලාගෙන එන ගෙඩි රෝගයක්.

**භගලවරියා.** ඉ-එනම් වැල් ජාතිය.

**භගලවතී.** ඉ-එනම් රාජධානිය.

**භගලවන්තු.** පු-භගලවතී රැස්වීම් ශාලාව අයත් තැනැත්තා.

**භගු.** පු-වේද කර්තෘ, එනම් ඍෂිවරයෙක්.

**භගිනී.** ඉ-සහෝදරිය, සොහොයුරිය.

**භගවන්තු.** පු-පූජාහීය, බුදුරජ.

**භඞ්ග.** න-එනම් වස්ත්‍ර විශේෂය.

**භඞ්ග.** පු-භේදනය, තරඟය.

**භච්ච.** පු-පෝෂණය, පෝෂ්‍යය, කොමාරභච්ච.

**භජ.** d-චු. විස්සාසෙ, විශ්වාසයෙහි, භජෙති, භජයති, විශ්වාස කෙරෙයි.

**භජ.** d. භූ-සෙවනෙ, සෙවනයෙහි, භජති= සේවනය කරයි.

**භජති.** ක්‍රි-භජනය කෙරේ, සෙවනය කෙරේ.

**භජ.** d. තු-සෙවනයෙහි වෙන් කිරීමෙහි.

**භජන.** න-භජනය කිරීම, සෙවනය කිරීම.

**භජමාන.** න-යුක්තිසඞ්ගත ක්‍රියා, භජනය කිරීම.

**භජ්ජ** d. භූ-අවියත් හඬෙහි, භඤ්ජති, අවියත් ශබ්ද කරයි.

**භජ්ජ.** d. භූ-තාපනෙ, තැවීමෙහි, භජ්ජති, භජ්ජති, තැවෙයි, බදියි.

**භජ්ජති.** ක්‍රි-බදියි, පුළුටු කරයි, පුළුස්සයි.

(17230)

**භජ්ජ.** d භූ-පාකෙ, පිසීමෙහි, භජ්ජති, බදියි, පිසයි.

**භඤ්ජ.** d. භූ-භෙදෙ, බිඳීමෙහි, භඤ්ජති, බිඳියි, කඩයි.

**භඤ්ජති.** ක්‍රි-බිඳියි, කඩයි.

**භඤ්ජක.** පු-කඩන්නා, බිඳින්නා.

**භඤ්ජන.** න-කැඩීම, බිඳීම.

**භඤ්ජනක.** පු-බිඳීම, බිඳින්නා.

**භඤ්ජනී.** ඉ-බිඳින්නී.

**භට්ඨ.** ති-බදින ලද, ගිලිහුනු දෙය, පිසන ලද්ද.

**භට්ඨයව.** පු-බැදියව බදිනලද යවහාල්.

**භට.** d. භූ-සෙවායං, මෙහෙකිරීමෙහි, භටති, බැලමෙහෙ කරයි.

**භට.** d. භූ-පරිභාසෙ, පරිභාසනයෙහි, භටති පරිභව කරයි, බණියි.

**භට.** පු-භටයා, සේවායා යොධයා.

**භඩි.** d. භූ-පරිභාසෙ, බැණීමෙහි, ඩබර කිරීමෙහි, භණ්ඩති, බණියි, භණ්ඩතක.

**භඩි.** d. චු-කල්‍යාණෙ, යහපතෙහි, භණ්ඩති, භණ්ඩයති, යහපත කියයි.

**භණිතාකී.** ඉ-වම්බටු.

**භණ්ඩ.** d. චු-භණ්ඩති, භණ්ඩයති, බණියි.

**භණ්ඩ.** පු-ඩබරය, දබරය, කලහයට පූර්වභාගය.

**භණ්ඩන.** න-විවාදය, කලහයට පෙරාතුව ඇති වන දබරය, දඬුවම.

**භණ්ඩනක.** පු-දබරය, දබර කරන්නා.

**භණ්ඩති.** ක්‍රි-(දණ්ඩ + ති) ඩබර කරයි,

**භණ්ඩි.** ඉ-වැල්මදට.

**භණ්ඩික.** පු-බඩුමිල, පොට්ටනිය, පොදිය.

**භණ්ඩිකා.** ඉ බදුවද.

**භණ්ඩිල.** පු-මහරි රුක.

**භණ්ඩු.** පු-හිස මුඩුකළ තැනැත්තා.

**භණ්ඩුකම්ම** න-හිසකෙස් කැපීම, ශ්‍රමණ භූමියට පැමිණීම පිළිබඳව ප්‍රථම කොට හිස මුඩු කිරීම.

**භණති.** ක්‍රි-(d භූ භණ, භණනෙ, කීමෙහි + ති) කියයි.

**භණන.** න-කීම, බිණීම.

**භණිත.** ති- කියන ලද, බණින ලද.

**භණ.** d. භූ-කථනෙ, කීමෙහි, භණති, කියයි.

**භණ.** d. භූ-සද්දෙ ශබ්ද කිරීමෙහි, භණති, ශබ්ද කරයි.

**භණෙ.** අ-නීචාමන්ත්‍රණයෙහි, කොල, බොල, අඩෙ යනාදිය වැනි ආමන්ත්‍රණයක්.

**භත.** ති-ආධාර කළ, උපකාර කළ, වැඩූ, පොෂ්‍ය කළ.

**භතක,** පු-මෙහෙකරන්නා, බැලමෙහෙවර කරන්නා.

**භති.** ඉ-බැලමෙහෙය, පොෂණය, වැටුප්.

**භතිකා.** ඉ-වැටුප්, ගෙවීම්, කුලිය.

**භත්ත.** න-බත, ආහාරය.

**භත්තකාර.** පු-අරක්කැමියා, සූදයා, බත පිසන්නා.

**භත්ති.** ඉ-භක්තිය, විභාගය, සෙවනය.

**භත්තු.** පු-සැමියා, ස්වාමිපුරුෂයා පොෂ්‍ය කරන්නා.

**භත්තුද්දෙසක.** පු-බත් උදෙසන්නා, දනාරාධනා පිළිගන්නා භික්ෂුව.

**භද්ද.** d. භූ-කල්‍යාණෙ, කල්‍යාණ කර්මයෙහි.

**භද්ද.** ති-ඉෂට, සුන්දර,.

**භද්දක.** ති-යහපත්.

**භද්දකච්චානා.** ඉ-එනම් ඇත්ති. යශෝධරා දේවී.

**භද්දකප්ප.** පු භද්‍රකල්පය, බුදුවරුන් පස් නමක් පහළ වීමෙන් ශ්‍රෙෂ්ඨ වන කල්පය, උත්තම කල්පය.

**භද්දකුම්භ.** පු-පූර්ණ කුම්භය, පුන්කලස.

**භද්දදාරු.** පු-දේවදාරු, දේවදාර.

**භද්දපණ්ණි.** ඉ-ඇද්දෙමට.

**භද්දපද.** ඉ-පුවපුටුප නැකත.

**භද්දපීඨ.** න-භද්‍රපීඨය, වේවැල් පුටුව.

**භද්දමුත්තක.** න-වම්මුතු, කලාදුරු.

භද්දසාල. පු-ශාලරාජ වෘක්ෂය, යහපත් සල් රුක.

භද්දලතා. ඉ-ආදිකල්පයෙහි පහළ වූ මිහිරි රසැති වැල් වර්ගයක් = බද්දලතා.

භද්දසිරි. ඉ-චන්දන, සඳුන්,

භද්දන්ත. ති-පින්වත.

භද්දෙක. ති-හොඳ එක, යහපත් එක.

භද්දන්ත. ති-පින්වත, ශාසනික ආමන්ත්‍රණයෙහි, ස්වාමීනි.

භද්දන්තික. ති-පින්වත, භදන්ත,

භද්දි d භූ-සුඛිතෙ, සුවපත් බැව්හි, භන්දති, යහපති, භද්දෙ.

භදි. d. දි-කල්‍යාණෙ, කල්‍යාණ කම්යෙහි.

භන්තෙ. අ-ආමන්ත්‍රණයෙහි, ස්වාමීනි, පින්වතුන් වහන්ස.

භබ්බ. d. භූ-හිංසායං, හිංසාවෙහි, භබ්බති, පෙළයි.

භබ්බ. ති-භව්‍ය, යොග්‍ය, මතුවන දෙය.

භම. පු-ජල නිර්ගමය, භිත්ති ආකාරාදියෙන් ජලය පිටවීමට තනන වාරිමාර්ගය, ලියන වඩුවාගේ උපකරණයක්, මිථ්‍යාමතිය, කර කැවිල්ල, භ්‍රමණය කර කැවීම.

භමකාර. පු-ලියනවඩුවා ලියනපට්ටල්කාරයා

භමති. ක්‍රි-(භමු+ති) භ්‍රමණය වෙයි, කරකැවෙයි.

භමර. පු-බඹරා, බමරා, මීමැස්සා විරෙළුයා.

භමරිකා ඉ මීමැස්සා.

භමු. d. භූ-අනවට්ඨානෙ, අනවස්ථානයෙහි, භමති, භ්‍රමණය වෙයි, මුළාවෙයි.

භමු. පු-බැම, ඇහිබැම.

භමුක. පු-ඇහිබැම.

භය. න-බිය, බය.

භයංකර. ති-භයානකය.

භයභෙරව. න-මහත් බිය, භයානක

භයානක. න-මහත්බය.

භර. d. භූ-පොසනෙ, පොෂ්‍යය කිරීමෙහි, භරති, පොෂ්‍යය කරයි.

භර. පු-බර, අතිශය, පොෂණය.

භරණ. න-වැලුක්.

භරණී. ඉ-බෙරණ නැකත.

භරණීය. න-වැලුප්, පොෂණීය ද්‍රව්‍යය.

භරති. ක්‍රි-පොෂ්‍යය කෙරෙයි.

භරිත. ති-බරවන ලද, පිරුණු.

භරියා. ඉ-භාර්යාව, බිරිය.

භරු. න-භරු රට, භරු රටැ, භරු කච්ඡක, එනම් රාජධානිය.

භරුකච්ඡක. පු-භරු රට වැසියා.

භල්ල. d. භූ-ගරහන, ගැරහීමෙහි, භල්ලති= බණී.

භල්ලක. පු-තඹ (ලෝහ) විශෙෂයක්.

භල්ලාතික. ති-බදුල්ල ගස, භල්ලාටක

භල්ලාටක. බදුල්ල, භල්ලාතක.

භල. d. භූ-බැණීමෙහි පෙළීමෙහි, භලති= බණියි, පෙළයි.

භල්ලි. ති-බදුල්ලගස.

භල්ලූක. පු-වලසා.

භව. පු-වෘද්ධි, උත්පත්ති, කාමධාතු ආදීභව, ලෝක, පැමිණීම, විද්‍යමානභාවය, සංසාරය, ශාස්වත දෘෂ්ටිය, ඊශ්වරයා.

භවග්ග. පු-භවාග්‍රය, අකනිට්ඨය, භවාග්‍රය.

භවඞ්ග. පු-න භවාඞ්ගය.

භවචක්ක. න-සංසාරචක්‍රය, සංසාරය.

භවච්ඡන්ද. පු-භවතෘෂ්ණාව, භවාසාව, භවසැපතෙහි ආසාව,

භවතණ්හා. ඉ-භවතෘෂ්ණාව, භවාසාව.

භවති. ක්‍රි-(d. භූ. භූ. සත්තායං, වීමෙහි+ති) වෙයි, සිදුවෙයි.

භවන. න-විද්‍යමානභාවය, ගෘහය.

භවන්ත. පු-භවාන්තය, සංසාරාන්තය, මොක්ෂය, නිවණ.

භවන්තගූ. -භවයාගේ කෙළවරට පැමිණි තැනැත්තා, රහත්හු.

භවන්තර. න-සසරවාසය ඇති අතර, සංසාර ප්‍රවෘත්තිය පවත්නා අතර, සසරවාසයෙහි.

භවනෙත්ති. ඉ-භවතෘෂ්ණාව, භවරැන.

**භවාභව**. පු-කුඩුමහත්බව, භවයාගේ අභාවය, ප්‍රණීතා ප්‍රණීතභව.

**භවභෙද**. පු-භවවිශෙෂ, ලොකප්‍රභෙද.

**භවන්තර**. න-අන්‍යභාවය, පෙරජාතිය.

**භවසංයොජන**. න-භවයෙන් භවය බැඳීම කරණ සංයොජන ධර්ම.

**භවරාග** පු-භවතෘෂ්ණාව, රූපාරූප භවයන් පිළිබඳ රාගය, ධ්‍යාන නිකන්තිය, ශාස්වත දෘෂ්ටිය සහගතරාගය.

**භවාසව**. පු-ශාස්වත දෘෂ්ටි සහගත රාගය, භවතෘෂ්ණාව.

**භවෙසනා**. ඉ-භවය ඇසුරුකිරීම, භවසැපත සෙවීම.

**භවසල්ල**. පු-භවාසා හුල.

**භවසාත**. න-භව සැපය, සසර සැපය.

**භසක**. පූ-බල්ලා.

**භසතා**. ඉ-භසත්‍රාව, පසුම්බිය.

**භස්ම**. න-හළු, අළු.

**භස්මගණ්ඨිනී**. ඉ-හරේණු.

**භවූපපත්ති**. ඉ-භවොත්පත්තිය, සසර ඉපදීම.

**භවොඝ**. පු-භවරාගය, රූපාරූපයන්හි පවත්නා ඡන්ද රාගය, භවොඝය.

**භස්ස**. d. භූ-කථායං, කථාකිරීමෙහි, භස්සති, කථාකරයි.

**භස්ස**. d. චු-සන්තප්පනෙ, සන්තර්පණයෙහි, භස්සෙති, භස්සයති, තැතිගන්වයි.

**භස්ස**. d. භූ-දිත්තියං, බැබලීමෙහි, භස්සති= බබලයි.

**භස්සති**. ක්‍රි-බබලයි, දිලිසෙයි.

**භස්ස**. පු-ඝොෂාව, වචන කොලාහලය.

**භංසු**. d. භූ-අධොපතනෙ, යටට හෙළීමෙහි, භංසති, බසී, පහතට බසී.

**භස්සර**. ති-බබලන සුදුදේ, කාන්තිමත් දේ.

**භස**. d දි-අධොපතනෙ, පහතට වැටීමෙහි භස්සති, බසී, පහතට බසී.

**භස**. d. භූ-භස්මීකරණෙ, හළුකිරීමෙහි.

## භා

**භා**. d. භූ-දිත්තියං, බැබලීමෙහි, භාති, බබලයි. පටිභාති වැටහෙයි.

**භා**. ඉ-රස්මිය, දීප්තිය.

**භාකුටි**. ඉ-බැම හැකිළීම, බැම බිඳීම, රවා බැලීම.

**භාකුටික**. න-බැම්බිඳිම, භාකුටි.

**භාග** පු-කොටස, දෛවය, කෘතපුණ්‍ය භාවය.

**භාගධෙය්‍ය**. පු-කරවුවර.

**භාගධෙය්‍ය**. න-දෛවය, පෙර ජන්මයෙහි කළ කර්මය. පූර්ව කර්ම විපාකය.

**භාගාදික**. පු-කොටස්

**භාගී**. පු-කොටස් ඇත්තා, කොටස් හිමියා.

**භාගිනෙය්‍ය**. පු-සහෝදරීගේ පුතා=බෑනා.

**භාගිමන්තු**. පු-කොටස් හිමියා, කොටස් ඇත්තා.

**භාගිය**. පු-කොටස් අයිතිකාරයා, කොටස් හිමියා.

**භාගීරථී**. ඉ-එනම් ගංගාව.

**භාග්‍ය**. න-පුණ්‍යාපුණ්‍යකර්මවිපාකය, දෛවය.

**භාග්‍යවන්තු**. පු-භාග්‍ය ඇත්තා.

**භාග්‍යවිහීන**. න-භාග්‍යය නැත්තා, කළ පින් නැත්තා.

**භාජ**. d. චු-පුථකකරණෙ, වෙන් කිරීමෙහි, බෙදීමෙහි, භාජෙති, භාජයති= බෙදයි, වෙන් කරයි.

**භාජක**. පු-බෙදන්නා, බෙදීම කරන්නා.

**භාජන**. න-බෙදීම, බඳුන, වළඳ.

**භාජනන්තර**. න-භාජනවිශෙෂ.

**භාජි**. d. චූ-පුථකකරණෙ, වෙන් කිරිමෙහි, භාජෙති, භාජයති, බෙදයි.

**භාජිත**. ති-බෙදනලද, කොටස් කළ.

**භාජෙති**.-ක්‍රි-(d. චු. පුථකකරණෙ, කොටස් කිරීමෙහි + ති) භාජ + ණ + ති, බෙදයි, කොටස් කරයි.

**භාණ**. පූ-වචන ඇත්තා, කියන්නා,

(17383)

**භාණක**. පු-කියන්නා, මහසැලිය.

**භාණී**. පු-කියන්නා.

**භාණෙති**. ක්‍රි-(d. භූ. භණ, භණනෙ, කීමෙහි + ණෙ + ති) කියවයි.

**භාතර**. පු-බෑයා, සහෝදරයා.

**භාතු** පු-කුසෙහි හොත්තා, සහෝදරයා.

**භාති**. ක්‍රි-(d භූ. භා, දිත්තියං, දිලිසීමෙහි + ති) බබලයි, දිලිසෙයි.

**භාතික**. පු-බෑයා, සහෝදරයා.

**භාතුභගිනි**. ඉ-සහෝදර සහෝදරියෝ.

**භානු**. පු-සූර්‍යයා, රශ්මිය.

**භානුමන්තු**. පු-රශ්මි ඇත්තා, සූර්‍යයා, ගින්න.

**භාම**. d. භූ. කොපෙ, කිපීමෙහි. භාමති= කිපෙයි.

**භාම**. d. චු-කොධෙ, කිපීමෙහි.

**භාමර**. පු-මී පැණි,

**භායන**. න-බියවීම.

**භායති**. ක්‍රි-(d. භූ. භී, භයෙ, බිය වීමෙහි + ති) බියවෙයි.

**භායිතබ්බ**. පු-බියවිය යුත්ත,

**භායිතබ්බක**. පු-බියවිය යුත්තා.

**භාර**. පු-බර, පලම් දෙදහසෙක බර.

**භාරක**. පු-බර, පලම් දෙදහසෙක බර.

**භාරතී**. ඉ-තෙපුල, වචනය.

**භාරත**. න-ජම්බුද්වීපය, දඹදිව

**භාරතක**. පු-භාරතයෙන් පැවතෙන කුඩා ජාතිකයා.

**භාරපාදතා**. ඉ-බරවූ (මහත්) පාද ඇති බව, බරවා රොගය.

**භාරද්වාජ**. පු-එනම් ගොත්‍රය. එනම් තැනැත්තා.

**භාරද්වාජී**. ඉ-වනකපු, භාරද්වාජගොත්‍ර ඇත්තී.

**භාරමොචන** න-බර මිදීම, බරින් මිදීම, දරු ප්‍රසූතය.

**භාරවාහ**. පු-බර උසුලන්නා, බර අදින්නා.

**භාරික**. පු-බර අදින්නා, බර උසුලන්නා.

**භාරිය**. පු-භාරික, බර අදින්නා, බර උසුලන්නා.

**භාරී**. පු-බර උසුලන්නා, බර ගෙණ යන්නා.

**භාරුකච්ඡක**. පු-එනම් ජනපදය.

**භාව**. පු-පදාර්ථ, විද්‍යමාන, අභිප්‍රාය, ක්‍රියා ස්වභාව වීම, පුරුෂෙන්ද්‍රිය, ස්ත්‍රීන්ද්‍රිය.

**භාවනා**. ඉ-වැඩීම, රාගවෙෂාදිය මර්දනය කරන්නාවූ සිතිවිලි සිතීම, යම් ධර්මයක් නැවත නැවත මෙනෙහි කිරීම.

**භාවනීය**. ති-වැඩිය යුතු.

**භාවිත**. ති-වඩනා ලද, භාවනා කළ, සුවඳ කවන ලද්ද.

**භාවිතත්ත**. ති-වඩනා ලද (සිත්) ආත්මය.

**භාවී**. පු-වඩන සුලු තැනැත්තා.

**භාවෙති**. ක්‍රි-(d. භූ. භූ, සත්තායං, වීමෙහි + ති) වඩයි, වර්ධනය කරයි.

**භාස**. d. චු-ආදානෙ, ගැනීමෙහි, භාසෙති, භාසයති, ගණී.

**භාස**. d. භූ-වාචායං, ව්‍යක්ත් බසෙහි, භාසති, කියයි.

**භාස**. d. භූ-ඔභාසෙ, බැබලීමෙහි, ඔභාසති, බබලයි.

**භාස**. පු-කීම, කථනය.

**භාසක**. පු-කියන්නා, කථා කරන්නා.

**භාසති**. ක්‍රි-(d. භූ. භාස, ව්‍යක්තායං වාචාය, ව්‍යක්ත් බිනීමෙහි + ති, භාස + ති) කියයි, කථා කරයි.

**භාසන**. න-කීම, කථා කිරීම.

**භාසපක්ඛි**. පු-සොෂටකුක්කුට පක්ෂියා = ඇට් කුකුළා.

**භාසා**. ඉ-භාෂාව, තෙපුල, ඒ ඒ ජාතීන් පිළිබඳ භාෂා.

**භාසී**. පු-කියන සුල්ලා, කියන ස්වභාව ඇත්තා.

**භාසිත**. ති-කියන ලද, තෙපුල.

**භාසුර**. ති-බබලන සුලු දෙය, දීප්තිමත් දෙය.

(17433)

## භි

**භිංස.** ති-බියජනක, බිය උපදවන, භයානක.

**භිංසන.** න-භයානක, මහත් බය.

**භිංසනක.** ති-භය ජනක, භයානක.

**භිංසා** ඉ-බිය, භය.

**භිංසිකා.** ඉ-භය ජනක දේ, බියජනක පෙර නිමිත්ත.

**භික්ඛ.** d. භූ-යාචනෙ, සිඟීමෙහි, භික්ඛති, සිඟයි.

**භික්ඛ.** න-යාඥව, ආහාරය, භික්ෂාව.

**භික්ඛක.** පු-සිඟන්නා, යාඥ කරන්නා.

**භික්ඛන.** න-සිඟීම, යාඥව.

**භික්ඛති.** ක්‍රි-(d. භූ. භික්ඛ, යාචනෙ, ඉල්වීමෙහි+ති) සිඟයි, ඉල්වයි.

**භික්ඛා.** ඉ-භික්ෂාව, සිඟා ලබන ලද්ද, ආහාරය.

**භික්ඛු.** පු-භික්ෂුව, ශ්‍රමණයා, පැවිද්දා.

**භික්ඛුක.** පු-භික්ෂුව.

**භික්ඛුනී.** ඉ-භික්ෂුණිය, මෙහෙණ.

**භික්ඛු සඞ්ඝ.** පු භික්ෂු සමූහයා.

**භිඞ්ක.** පු-ඇත් පැටියා, ඇත් පොවුවා.

**භිඞ්කාර.** පු-රන් කෙණ්ඩිය, කෙණ්ඩිය, මොනර තුඩු ආකාර බලි කම් පිණිස තනන ලද භාජනයක්.

**භිඞ්ග.** පු-නීල කොබෙයියා.

**භිඞ්ගරාජ.** පු-කීකිරිඳිය, භෘඞ්ගරාජ.

**භිජ්ජති.** ක්‍රි-(d. භූ. භිද, විදාරණෙ, බිඳීමෙහි+ති) භිද+ය්‍ය+ති, බිඳියි.

**භිජ්ජන.** න-බිඳීම, කැඩීම.

**භිත්ති.** ඉ-බිත්ති, බිතු.

**භිත්තික.** ති-බිත්ති ඇති, බිත්ති සහිත.

**භිද.** d. දි-විදාරණෙ, බිඳීමෙහි, භිජ්ජති, බිඳියි.

**භිදි.** d. රු-විදාරණෙ, දෙපලු කිරීමෙහි, භින්දති, බිඳියි.

**භිදුර.** ති බිඳෙන සවභාව, වජ්‍රායුධය.

**භින්දති.** ක්‍රි-බිඳියි, පලු කරයි.

**භින්දන.** න-බිඳීම, පලු කිරීම.

**භින්න.** ති-පලන ලද, අන්‍යනිශ්‍රිත.

**භින්දිවාල.** පු-එතම් ආයුධය.

**භිසි.** d. භූ-භය, බියපත් වීමෙහි, භිංසති, බියපත් වෙයි.

**භිස.** න-නෙළුම් පැලය, නෙළුම් කාහු.

**භිසක්ක.** පු-වෛද්‍යවරයා, වෙද මහතා.

**භිසි.** ඉ-බිසි, මෙට්ටය.

**භිසිකා.** ඉ-කුඩා කොට්ටය, උපධානය.

## භී

**භී.** d. භූ-භයෙ, බියවීමෙහි, භායති, බියවෙයි.

**භීභච්ච.** ති-පිළිකුල, පිහිකුළු.

**භීම.** පු-බිය එලවන, භයදෙන.

**භීය්‍යො.** අ-බොහෝ, බොහෝ සෙයින්, නැවත නැවත.

**භීය්‍යොසො.** අ-බොහෝ සෙයින්.

**භීය්‍යොසො මත්තාය.** අ-බොහෝ සෙයින්.

**භීරු.** ඉ-ස්ත්‍රී, බිය වන්නා.

**භීරු.** ඉ-භීරුකයා, බියවන සවභාව ඇත්තා

**භීරුක.** පු-බියවීම සවභාව කොට ඇත්තා, බියසුල්ලා.

**භීසන.** න-බිය එලවන, භය උපදවන.

## භු

**භුංකරණ.** න-බිරීම, බල්ලන් බිරීම.

**භුක්ක.** d. චු-භුඞ්කරණෙ, සුනඛ ශබ්දයෙහි, බිරීමෙහි, භුක්කෙති, භුක්කායති, බුරයි, බල්ලා බුරයි.

**භූකුටි.** ඉ-බැම බිඳීම, ඇහි බැමෙන් ඉඟි කිරීම, රවා බැලීම.

**භුඞ්කරණ.** න-බිරීම, සුනඛ ශබ්දය කිරීම.

(17482)

**භුජ.** d. භූ-කුටිලෙ, කුටිල බැවිහි, භුජති= වක්ව යෙයි.

**භුජ.** d රු-පාලනෙ, පාලනයෙහි, පරිභොග-යෙහි, භුඤ්ජති, පාලනය කෙරෙයි, පරිභොග කරයි.

**භුජ.** පු-සර්පයා, භුජගයා.

**භුජක.** පු-සර්පයා.

**භුජග.** පු-භුජගයා, සර්පයා.

**භුජඞ්ගම.** පු-භුජයෙන් යන්නා, සර්පයා.

**භුජපත්ත.** පු රුක් බුරුද.

**භුජසිර.** පු-උරහිස

**භුඤ්ජිස්ස.** පු දූසකමින් මිදුනාහු, නිදහසයා.

**භුඤ්ජති.** ක්‍රි-(d රු. භුජ, ව්‍යවහරණෙසු, ව්‍යවහාරයෙහි + ති) අනුභව කෙරේ, වළඳයි.

**භුඤ්ජක.** පු-අනුභව කරන්නා, පරිභොග කරන්නා.

**භුඤ්ජන.** න-අනුභව කිරීම, භොජනය, අනුභවය.

**භුඩි.** d. භූ-පොසනෙ, පොෂණයෙහි, භුණ්ඩති, පොෂ්‍ය කෙරෙයි.

**භුණ.** d. චු-ආසායං, ආසාවෙහි, භුණෙති, භුණයති, ආසා කරයි.

**භුත්ත.** ති-අනුභව කළ, කන ලද, වැළඳූ.

**භුත්තවන්තු.** පු-අනුභව කරණ තැනැත්තා.

**භුත්තාවී.** පු-අනුභව කළ සුල්ලා.

**භුභුක්ඛ.** අ-කනු කැමැත්ත, අනුභව කරණු රිස්ස

**භුභුක්ඛති.** ක්‍රි-(d. රු. භුජ, බ්‍යවහරණෙසු, ව්‍යවහාරයෙහි + ති) (භුජ = ඛ + භුභුජ + ඛ= භුභුක් + ඛ + ති) කනු කැමැති වෙයි.

**භුභුක්ඛන.** න-කනු කැමැත්ත. බොජුන් රිස්ස.

**භුම්ම.** ති-බිම හටගත්, බිම ඇසුරු කළ, බූමාටු.

**භුම්මත්ථරණ.** න-බුමුතුරුණු, බිම අතුරණ ඇතිරිලි.

**භුම්මි.** ඉ-භූමිය, පෘථිවිය, පොළොව, ලොකය.

**භුවන.** න-ලොකය, සත්වාවාසය.

**භුස.** d චු-විභූසනෙ, සැරසීමෙහි, භූසෙති භූසයති, සැරසෙයි, විභූසනං.

**භුවි.** ඉ-පෘථිවිය, ලොකය.

**භුස.** d. භූ-අලඞ්කාර, අලඞ්කාරයෙහි, භුසති, සැරසෙයි, භුසනං.

**භුස.** න-බොල්, අතිශය, අධික, බලවත්.

**භුසති.** ක්‍රි-(d. භූ. භුස, අලඞ්කාර, අලංකාර-යෙහි + ති) සැරසෙයි.

**භුස්සති.** ක්‍රි-(d. භූ භස, බුකෙක, බිරීමෙහි + ති) බුරයි, සුනඛ ශබ්දය කරයි.

**භුසත්ථ.** පු-අතිසයාර්ථ, සාමාන්‍යාර්ථ

**භුස්සිත.** ති-බුරන ලද.

**භුසා.** ඉ-මහත්, දූඩි.

**භුසෙති.** ක්‍රි-(d. චු. භුස, වඩ්ඪනෙ, වැඩීමෙහි + ණ + ති) වර්ධනය කරයි, වඩයි.

## භූ

**භූ.** d. භූ-සත්තායං, වීමෙහි, භවති, වෙයි.

**භූ.** d. චු-අනුකම්පායං, අනුකම්පාවෙහි, භාවෙති, භාවයති=අනුකම්පා කරයි.

**භූ** d. චු-පාපුණනෙ, පැමිණවීමෙහි, භාවෙති, භාවයති=පැමිණෙයි, වඩයි.

**භූ.** ඉ-බැම, ඇහි බැම,

**භූකුටි.** ඉ-බැම බිඳීම, රවා බැලීම.

**භූත.** න-වෘක්ෂ ලතාදිය, විද්‍යමාන, රහත්, ස්කන්ධ පඤ්චකය, සත්වයා, සතරමහා භූත, අමනුෂ්‍ය, කාම කෙලශයන්ගෙන් උපන්.

**භූත.** ති-අතීත, උත්පන්න, ප්‍රාප්ත, සදෘශ, ලද් දෙය යන මෙහි.

**භූත චිකිච්ඡා.** ඉ-අමනුෂ්‍ය රොගයට පිළියම්, දෙල බිලි පිදවිලි ආදිය දීම.

**භූත ධරා.** ඉ-පෘථිවිය, පොළව.

**භූතනක.** පු-සුවඳ තණ, සැවැන්දරා.

**භූතපති.** පු-ශක්‍රයා, සිකුරා.

**භූතපුබ්බ.** පු-පෙරවූ දෙය, අතීතයෙහි සිදු වූ දෙය.

(17528)

**භූතවාස.** පු-අමනුෂ්‍ය වාසය, බුළු ගස.

**භූත විජ්ජා.** ඉ-යකුන් කැඳවීම් ප්‍රලය කරවීම් ආදිය කරන්නාවූ භූත විද්‍යාව, අමනුෂ්‍ය ප්‍රතිකාරාදිය.

**භූති.** ඉ-උත්පත්තිය, සම්පත්තිය, ඉපදීම, ඓශ්වර්‍ය්‍යය.

**භූතික.** පු-භූතයන්ට අයත්, භූතයන් පිළිබඳ.

**භූතිණ.** න-ගන්ධ මේධක නම් සුවඳ, සුවඳ තණ විශෙෂයක්.

**භූතිණක.** පු-භූතිණ.

**භූතෙස.** පු-භූතාධිපතියා, ඊශ්වරයා.

**භූදර.** පු-පර්වතය.

**භූනාථ.** පු-පොළොවට අධිපතියා, රජු.

**භූපාල.** පු-භූනාථ, බුවිපල්.

**භූභුජ.** පු-භූපාලයා, බුවිසුරු.

**භූම.** පු-මහල් ගෙවල්, සොල්දර තට්ටු ගෙවල්.

**භූමක.** පු-මහල්, මාල්, භූමියට අයිති.

**භූමි.** ඉ-බිම, පෘථිවිය, ස්ථානය, පවත්නා තැන.

**භූමිකම්ම.** න-භූරිවිද්‍යා පරිදි ප්‍රයොගකිරීම, ගෙබිම් බැලීම.

**භූමිප.** පු-භූපාලයා, රජු.

**භූරි** ඉ-පෘථිවිය, ප්‍රඥාව.

**භූරි.** ඉ-බොහෝ, බොහෝ දෙය.

**භූරිපඤ්ඤ.** පු-මහත් ප්‍රඥා ඇත්තා, බුදුරජ.

**භූරිමෙධ.** පු-භූරිපඤ්ඤ, බුදුරජ.

**භූස.** d. භූ-අලඞ්කාරෙ, අලඞ්කාරයෙහි.

**භූස.** d. චු-විභූසනෙ, සැරසීමෙහි, භූසෙති, භූසයති, සැරසෙයි.

**භූසන.** න-අලඞ්කාරය, සැරසීම, ආභරණය.

**භූසනකරණී.** ඉ-බිම සිළුටුකරන දැරැමය හසනය, ලැලි අත, මනිස්ලැල්ල.

**භූසා.** ඉ-ආභරණය, අලඞ්කාරය.

**භූසික.** න-බොල්.

**භූසිත.** ති-සැරසෙන ලද, අලඞ්කාරවත ලද.

**භූසෙති.** ක්‍රි-සැරසෙයි, අලඞ්කාර කෙරෙයි.

## භෙ

**භෙක.** පු-මැඩියා, ගෙම්බා.

**භෙච්ඡති.** ක්‍රි-(d. භිද, විදාරණෙ, බිඳිමෙහි + ති) බිඳියි.

**භෙජ්ජ.** පු-බිඳීම, භෙදනය.

**භෙජ්ජන.** න-බිඳීම, සිඳීම.

**භෙජ්ජනක.** න-බිඳීම.

**භෙජ.** d. භූ-දිත්තියං, බැබලීමෙහි, භෙජති, බබලයි.

**භෙණ්ඩි.** න-ආයුධ විශෙෂයක්, ඊතලය.

**භෙණ්ඩිවාල.** න-නපුරු ආයුධ විශෙෂයක්.

**භෙණ්ඩු.** ඉ-පන්දුව.

**භෙණ්ඩුක.** න-කන්දුකය, පන්දුව.

**භෙද.** පු-බිඳීම, කෝලාම්කියා බිඳීම, විශෙෂය, පැළීම.

**භෙදක.** පු-භෙදකරන්නා, භෙදකයා.

**භෙදන.** න-බිඳීම, පැළීම.

**භෙදාපෙති.** ක්‍රි-(d. රු. භිදි, විදාරණෙ, බිඳීමෙහි ණෙ + ති) බිඳුවයි, අනුන් ලවා බිඳුවයි.

**භෙදික.** ති-බිඳිනලද, පළනලද.

**භෙරණ්ඩ.** පු-කැණහිලා, අප්‍රිය ශබ්දය.

**භෙරණ්ඩක.** පු-සිවලා, කැණහිලා, අම්හිරි ශබ්දය.

**භෙරව.** න-මහත් භය.

**භෙරව.** පු-කැණහිලා.

**භෙරි.** ඉ-බෙරය.

**භෙරිපභෙද.** පු-බෙර විශෙෂය, බෙරජාති.

**භෙරිභෙද.** පු-භෙරිවිශෙෂ.

**භෙසජ.** න-බෙහෙත.

**භෙසජ්ජ.** න-බෙහෙත, බේත.

**භෙසම.** ති-භයානක, බිහිසුණු.

(17581)

## භො

**භො.** අ-ගරු ආමන්ත්‍රණයෙහි, පින්වත, භවත්නි.

**භොග.** පු-සර්ප පෙණය, සර්ප ශරීරය, කුටිලත්වය, අනුභවය, ධනය, උපභොග පරිභොග වස්තු.

**භොගක්ඛන්ධ.** පු-භොගරාසි, ධනරාසිය, ධන රැස.

**භොගවත්තු.** පු-භොග ඇත්තා.

**භොගාවලි.** ඉ-සර්පදරණය, සර්පශරීරය.

**භොගික.** පු-අනුභව කරන්නා, ප්‍රයෝජන ගන්නා තැනැත්තා.

**භොගිය.** පු-භොගිකයා.

**භොගී.** පු-භොගවත්හු, භොග ඇත්තා, සර්පයා.

**භොගිනී.** ඉ-අභිෂෙක නොලත් රාජස්ත්‍රීහු, භොග ඇත්තී.

**භොග්ග.** ඉ-බිඳීම, කැඩීම.

**භොජ.** න-පු-වහල් බවින් මිදීම, ගම්වැසියා.

**භොජක.** පු-අනුභව කරන්නා, ප්‍රයොග ගන්නා අය.

**භොජන.** න-බොජුන, ආහාරය.

**භොජනක.** න-භොජනය.

**භොජනීය.** පු-බුදියයුතු දේ, අනුභව කටයුතු දේ.

**භොජ්ජ.** ති-අනුභව කටයුතු දේ.

**භොජ්ජයාගු.** ඉ-අනුභව කටයුතු කැඳ, මී පැණි ගිතෙල් මත්ස්‍ය මාංස එළරසාදී කැ යුතු නානා දේ බහා පිසන ලද කැඳ, තලප විශෙෂයක්.

**භොජෙති.** ක්‍රි-(d. රු. භුජ, ඛ්‍යවහරණෙසු, ව්‍යවහාරයෙහි + ණෙ + ති) අනුභව කරවයි.

**භොත්තබ්බ.** ති-අනුභව කටයුතු දේ.

**භොත්තුං.** අ-අනුභව කිරීම පිණිස.

**භොන්ත.** අ-පින්වත

**භොන්තා.** අ-පින්වත.

**භොන්ති.** අ-පින්වත.

**භොන්තෙ.** අ-පින්වත.

**භොභුක්ක.** පු-කනුකැමැත්ත, භූභුක්ක බලනු.

**භොවාදි.** පු-භොවාද ඇත්තා, බ්‍රාහමණයා, බමුණ.

## ම

**මංස.** න-මාංශය, මස්.

**මංසචක්ඛු.** න-මසැස, ස්වාභාවික ඇස.

**මංසි.** පු-ජටමංසි නම් පැලෑටි වර්ගයක්.

**මංසික.** පු-මස් වෙළෙන්දා, මස් කඩකාරයා.

**මකචි.** ඉ-නියඳ.

**මකචිවත්ථ.** න-නියඳ වස්ත්‍ර.

**මකර.** පු-මකර රාශිය.

**මකරන්ද.** න-මුවරද, මල්රේණු, පරාග.

**මකරදන්තක.** පු-මුවර දති කැපීම, මෝරදත්.

**මකස.** පු-මදුරුවා.

**මකසකුටි.** පු-සිවුරුකුටිය, මදුරුකුටිය.

**මකි.** d. භූ-සැරසීමෙහි, මඛෙකති, සැරසෙයි.

**මකුට.** පු. න-වොටුන්න, ඔටුන්න, කිරීටය.

**මකුල.** න-මුකුළ කැකුල.

**මක්කට.** පු-වඳුරා, රිළවා.

**මක්කටක.** පු-මකුළුවා, රිළවා.

**මක්කටී.** ඉ-වැඳිරී, වඳුරැමෑ.

**මක්කර.** න-හුණුගස්.

**මක්ඛ.** පු-මකුගුණය, ගුණමැකීම.

**මක්ඛ.** d. භූ-රාසි කරණෙ, රැස් කිරීමෙහි. මක්ඛති=රැස්කරයි.

**මක්ඛ.** d. චු-මක්ඛණෙ, මැකීමෙහි, මක්ඛෙති; මක්ඛයති, මකයි.

**මක්ඛණ.** න-මැකීම, වසාදැමීම.

**මක්ඛායන.** න-මකුගුණය, මකුගතිය.

**මක්ඛෙති.** ක්‍රි-(d. චු-මක්ඛ, මක්ඛණෙසු, මැකී මෙහි + ති) මකයි, මකාදමයි.

**මක්ඛිකා.** ඉ-මැස්සා.

**මක්කිකාසණ්ඩ.** න-මැසි බිජුවට, මැසි රැල, එනම් ජනපදය

**මක්කිත.** ති-ගල්වන ලද, ආලෙපකල, තවරණ ලද.

**මක්ඛෙති.** ක්‍රි-(d. චු මක්ඛ, මක්ඛණෙ, මැකීමෙහි + ණෙ + ති) (මක්ඛ + ණෙ + ති) මකි. (ගුණමකයි)

**මඛ.** d. භූ-ගමනෙ, යාමෙහි, මඛති, යෙයි.

**මඞ්ක.** d. භූ-සංකාසං, සැකකිරීමෙහි, මඞ්කති, සැකකරයි.

**මග්ග.** d. චු-ගවෙසනෙ, සෙවීමෙහි, මග්ගෙති, මග්ගයති, සොයයි.

**මග්ග.** පු-ආයසීමාගීය, මාගීය, පාර, මාවත.

**මග්ගති.** ක්‍රි (d. චු මග්ග, ගවෙසනෙ, සෙවීමෙහි + ති) යයි, පරීක්‍ෂා කරයි.

**මග්ගන.** න-සෙවීම, බැලීම.

**මග්ගන.** පු-ශරීරය, සිරුර, කය.

**මග්ගනා.** ඉ-සෙවීම.

**මග්ගවිරති.** ඉ-ආයසීමාගී විරතිය, මාගීයෙන් විරතිය.

**මග්ගසඞ්ඛ.** ඉ-මාගීසඞ්ඛය, මංසන්දිය.

**මග්ගික.** පු-මගියා, මාගීයෙහි යන තැනැත්තා.

**මග්ගිත.** ති-සොයන ලද, බලන ලද.

**මග්ගුර.** පු-මගුරා, මගුරා යයි ප්‍රකට මාළුවා.

**මග.** පු-මෘගයා, මුවා.

**මග.** d. භූ-ගවෙසනෙ, සෙවීමෙහි, මගති, බලයි.

**මග.** d. චු-ගවෙසනෙ, සෙවීමෙහි, මගෙති, මගයති=සොයයි.

**මගධ.** පු-එනම් ජනපදය,

**මගසිර.** න-මුවසිරිස තැකත.

**මඝි.** d. භූ-ගම්නෙ, යාමෙහි, මඞ්ගති, යෙයි, උම්මඞ්ගො, මඞ්ගලං.

**මඝවන්තු, මඝ.** පු-මඝ යන නම් ඇත්තා, ශක්‍රයා.

**මඝා.** ඉ-මා තැකත.

**මඞ්ඝ.** d. භූ-කෛරාටිකෙ, කෛරාටික වීමෙහි, මඞ්ඝති, කපටිවෙයි.

**මඞ්කු.** ති-මූලාව්, සිහිවිකලය, මකුණ.

**මඞ්කුණ.** පු-මකුණ, ඇඳමකුණ.

**මඞ්ගල.** පු එනම් ඇත්කුලය.

**මඞ්ගල.** න-මඞ්ගල්‍යය, සිත් පිනාවන ක්‍රියාව, කල්‍යාණය.

**මඞ්ගලික.** පු-මඞ්ගල්‍ය ඇත්තා, මඟුලෙහි නියුක්තයා.

**මඞ්ගල්‍ය.** න-මඞ්ගල, මඟුල්.

**මච්චු.** පු-මනුෂ්‍යයා; මිනිහා, මරණය, කාල යාත්‍රාව.

**මච්චුධෙය්‍ය.** පු-මාරයා විසින් දැරිය යුත්ත, තෙභූමක වෘත්තය.

**මච්චුපාස.** පු-මාරපාසය, මාරබන්ධනය, පස් කම් සැපත.

**මච්චුරාජ.** පු-මෘත්‍යුරාජයා, යමරජ, මරණය.

**මච්චුසඤ්ඤ.** පු-ඊශ්වරයා, මහදෙවියා.

**මච්ඡ.** පු මත්ස්‍යයා, මාළුවා.

**මච්ඡක.** පු-මච්ඡයා, මාළුවා.

**මච්ඡගුම්බ.** න-මත්ස්‍ය සමූහයා, මාලුරැල.

**මච්ඡණ්ඩි.** ඉ-ගුලිකාකාරව තනන ඉක්‍ෂුවිකාරය, කැටහකුරු.

**මච්ඡපිත්තා.** ඉ-කුළුරණ

**මච්ඡබන්ධ.** පු-කෙවුලා, මාළු අල්ලන්නා.

**මච්ඡබන්ධන.** න-මසුන් බැඳීම, මාළුඇල්ලීම.

**මච්ඡර.** න-මසුරු, මසුරුබව.

**මච්ඡරායති.** ක්‍රි-මසුරුකම් කරයි.

**මච්ඡරායන.** න-මසුරුකම් කරණ.

**මච්ඡරායි.** පු-මසුරු, මසුරුකම් ඇත්තා.

**මච්ඡරිය.** පු-මසුරා, මසුරු බැවින් යුක්තයා.

**මච්ඡරී.** පු-මසුරා.

**මච්ඡික.** පු-මාලු මරන්නා, කෙවුලා.

**මච්ඡී.** ඉ-ගැහැනු මාලුවා.

**මච්ඡෙර.** න - මසුරුබව, තමාගේ සම්පත් සැඟවීමේ කැමැත්ත.

**මච්.** d. භූ. ධාරණෙ, දැරීමෙහි, මඤ්චති, දරයි, මඤ්චො.

**මජ්ජ.** d. දි-සොධනෙ, පිරිසුදු කිරීමෙහි.

**මජ්ජ.** d. භූ-සොධනෙ, පිරිසුදු කිරීමෙහි, මජ්ජති, පිරිසුදු කරයි.

**මජ්ජ.** d. භූ-පරිමජ්ජනෙ, පිරිමැදීමෙහි, පරිමජ්ජති, පිරිමදියි.

**මජ්ජති.** ක්‍රි-(මද + ජ්ජ + ති) මත්වෙයි, සුරා ආදියෙන් මත්වෙයි.

**මජ්ජති.** ක්‍රි-පිරිසුදු කරයි, පිරිමදියි, මැදීම් කරයි.

**මජ්ජවික්කායී.** පු-රා වෙළෙන්දා, මත්පැන් වෙළෙන්දා, තැබෑරුම්කාරයා.

**මජ්ජාර.** පු-බළලා, මසට ලොල් තැනැත්තා.

**මජ්ජික.** පු-තැබෑරුම්කාරයා, බීමවෙළෙන්දා.

**මජ්ජිත.** ති-මත්වන ලද, මත්වූ.

**මජ්ඣ.** න-මැද, මධ්‍යය.

**මජ්ඣ.** ති-මධ්‍යප්‍රදෙශය, මධ්‍යභාගය, ඉගටිය, තුනටිය.

**මජ්ඣක.** ති-මැදඇති, හරිමැද තිබෙන.

**මජ්ඣණ්හ.** පු-මධ්‍යාහ්ණය, මැද්දහණ, හිරු අහස මැද සිටින කාලය, දවසේ මැදභාගය.

**මජ්ඣත්ත.** මධ්‍යස්ත, මැදපිහිටි, මැදහත්.

**මජ්ඣත්තතා.** ඉ-මධ්‍යස්ථභාවය, උපෙක්ෂාව.

**මජ්ඣත්තික.** ති-මධ්‍යස්ථ, මැදපවත්නා.

**මජ්ඣදෙස.** පු-මධ්‍යදෙශය, මධ්‍යභාගය, දඹදිව මධ්‍යදෙශය, මහ බෝ මැඩ පිහිටි ප්‍රදෙශය, මගධ රට.

**මජ්ඣන්තික.** න-මධ්‍යාහ්න කාලය, මද්දහන.

**මජ්ඣභාව.** පු-මධ්‍යභාවය, මධ්‍යයෙහිවූ වස්තු.

**මජ්ඣිම.** පු-මධ්‍යදෙශය, තාරකලකකලීශ්‍රැති ඇති කොස්වාලිහිණි හඬ වැනි පස්වන ස්වරය, මැදපිහිටි.

**මජ්ඣිම.** න-ඉගටිය, තුනටිය.

**මජ්ඣිම.** ති-මධ්‍යයෙහි නියුක්තයා, මැද්දුමයා.

**මජ්ඣිම ජනපද.** න-මධ්‍ය ජනපදය.

**මජ්ඣිමා.** ඉ-මැද ඇඟිල්ල.

**මජ්ඣිමා ධාතු.** ඉ-හීනධාතුව හැර අවශෙෂ ත්‍රෛභූමික ධර්මය.

**මජ්ඣිමරත්ති.** ඉ-මධ්‍යම රාත්‍රිය, දෙගොඩහරි වේලාව, රෑ පසළොස්පැයවන කාලය.

**මජ.** d. චු-පවිත්‍රභාවයෙහි, මජෙති මජයති, පවිත්‍ර කෙරේ, පිරිසිදු කරයි, සම්මජ්ජෙති, අමදියි, පිරිසිදු කරයි.

**මඤ්ච.** පු-මැස්ස, ඇඳ.

**මඤ්චක.** පු-මැස්ස, ඇඳ.

**මඤ්චාධාර.** පු-ඇඳේ පා අලුව, ඇඳකකුල.

**මඤ්චු.** d. භූ-ගමනෙ, යාමෙහි. මඤ්චති=යෙයි.

**මඤ්ජ.** පු-මල්කැන, මල්පොකුර.

**මඤ්ජරික.** පු-මල්කැන, මැදිරිවැනි මල් මාලා.

**මඤ්ජරිකා.** ඉ-මල් පොහොට්ටුව.

**මඤ්ජිට්ඨා.** ඉ-වැල්මදට.

**මඤ්ජිර.** පු-නුරුවලා.

**මඤ්ජීර.** න-පයෙහි ලන වළල්ල, පා සළඹ.

**මඤ්ජු.** ති-සිත්කලුදෙය, මෘදු, මධුර, ස්වර යෙහි අඞ්ගයක්.

**මඤ්ජුක.** න-මිහිරි නාදය, මිහිරි හඬ.

**මඤ්ජුසක.** පු. න-පෙට්ටිය, පැස.

**මඤ්ජුසා.** ඉ-මඤ්ජුසකය, පැස.

**මඤ්ජුස්සර.** පු-මධුරනාදය, මිහිරි ශබ්දය.

**මඤ්ජෙට්ඨ.** පු-මදටිය, රත.

**මඤ්ජෙට්ඨක.** පු-මදටිය.

**මඤ්ජෙට්ඨි.** ඉ-මදටිය.

**මඤ්ඤති.** ක්‍රි-(d. භූ. දි. මන, ඤ්ඤෙ, ඤ්ඤ යෙහි + ති) හඟියි.

**මඤ්ඤනා.** ඉ-හැඟීම, දැනීම.

**මඤ්ඤෙ.** ක්‍රි-හඟිමි, සිතමි.

**මටම.** පු-විතිවිද යන පාර, පහර.

**මට්ඨ.** ති-මට=සිලිටඨ, මට්ටම.

**මඨ.** d. භූ-සොකෙ, සොකයෙහි, මඨති, සොකකරයි

**මඨ.** d. භූ-වාසෙ, වාසයකිරීමෙහි, මඨති, වසයි.

**මඩි.** d. භූ-මණ්ඩනෙ, පිරිසිදු කිරීමෙහි, මණ්ඩති, සැරසෙයි.

**මඩි.** d. භූ-වෙඨනෙ, වෙළීමෙහි, මණ්ඩති, වෙළයි.

**මඩි.** d. චු-මණ්ඩනතුට්ඨීසු, සැරසීමෙහි සතුටෙහි, මණ්ඩෙති, මණ්ඩයති, සැරසෙයි, සතුටු වෙයි.

**මණ්ඩ.** d. භූ-මණ්ඩනෙ, සැරසීමෙහි, මණ්ඩති, සරසයි.

**මණ්ඩ.** පු-අග්‍රරසය, කාඩිවතුර.

**මණ්ඩකප්ප.** පු-සුන්දරකල්පය, බුදුවරයන් පහළවන කල්පය.

**මණ්ඩන.** න-ආභරණය, සැරසීම.

**මණ්ඩප.** න-මඩුව.

**මණ්ඩහාර.** පු-වෙළෙන්ද, වාණිජයා.

**මණ්ඩල.** න-ග්‍රාමසමූහය, චන්ද්‍රසූර්‍ය්‍යාදීන්ගේ බිම්බය=පරිවේෂය, සමූහය, මැඩිල්ල, ඉර මඩල.

**මණ්ඩලග්ග.** පු-කඩුව.

**මණ්ඩලික.** පු-මණ්ඩල ඇත්තා.

**මණ්ඩලිස්සර.** පු-ප්‍රදෙශරජ, පලාතක රජ.

**මණ්ඩලී.** පු-මණ්ඩල ඇත්තා.

**මණ්ඩිත.** ති-සැරසෙන ලද, අයිත් තම්වන ලද.

**මණ්ඩූක.** පු-මැඩියා, ගෙම්බා.

**මණ්ඩූකපණ්ණ.** පු-තොටිල ගස

**මණ්ඩූකපණ්ණී.** ඉ-වැල් මදට

**මණ්ඩෙති.** ක්‍රි-සැරසෙයි, අලඞ්කාර වෙයි.

**මණ.** d. භූ-සද්දෙ, ශබ්දකිරීමෙහි, මණති, ශබ්දකරයි.

**මණ.** d. භූ-චාගෙ, පරිත්‍යාගයෙහි, මණති, පරිත්‍යාග කෙරේ, වෙරමණී.

**මණි.** පු-මහසැළිය, කල්දේරම, මැණික, ගල.

**මණික.** න-මහසැළිය.

**මණිකුණ්ඩල.** න-මිණිකොඩල, මාණික්‍ය කුණ්ඩලාභරණය.

**මණිකා.** ඉ-මහ සැළිය.

**මණිබන්ධ.** පු-මිණිබහන, මැණික්කට්ටුව, අත්කර අනාතය.

**මණිවෙධ.** පු-මැණික් විදිනාකටුව.

**මත්ත.** න-ස්වල්පය, නියමය, ප්‍රමාණය.

**මත්තක.** පු-ඉතා ස්වල්පය, කුඩා ප්‍රමාණය.

**මත්ත.** ති-තුෂ්ටිප්‍රාප්තයා, කාමීහු.

**මත්තකාසිනී.** ඉ-උතුම් ස්ත්‍රී.

**මත්තඤ්ඤූ.** පු-මාත්‍රඥයා, පමණ දන්නා තැනැත්තා.

**මත්තණ්ඩ** පු-මාර්තණ්ඩ, හිරු.

**මත්තසො.** අ-ප්‍රමාණ වශයෙන්, කොටස් වශයෙන්.

**මත්තා.** ඉ-ප්‍රමාණය, ඓශ්වර්‍ය්‍යය, අක්ෂර මාත්‍රාව, ස්වල්පය.

**මත්ති** ඉ-මවට අයත්, මවුසතු.

**මත්තිකා.** ඉ-මැටි, මෘත්තිකා.

**මත්තිකාභණ්ඩ.** න-මැටිකැට මැටි ගුළි.

**මත්තිකාභෙද** පු-මැටිවර්ගී, කඳුමැටි.

**මත්තෙය්‍ය.** පු-මවට හිත, මවට කැමති.

**මත්තෙය්‍යතා.** ඉ-මවට උපස්ථාන කරණ බව.

**මත්ථ.** න-කැවුම් වර්ගයක්, කළඹන දණ්ඩ.

**මත්ථක.** පු-හිස, කිසිල්ල, අතීත කාලය, අනාගත කාලය, මස්තකය, මතුභාගය.

**මත්ථලුඞ්ග.** න-හිස් මොළය, ඉස් මොළය.

**මත්ථු.** න-දීපෙරලිදිය, මෝරු, දීකිරි පොඩි කිරීමෙන් ලැබෙන ජලය.

**මත.** ති-මළාහු, දන්නා ලද, දැනගත්.

**මතක** පු-මළවුන්ට අයිති, මළවුන් සතු.

**මතකභත්ත.** න-මළවුන් පිණිස දෙන දානය මතක බත.

**මති.** ති-ඉච්ඡාව, ප්‍රඥාව, අදහස.

**මතික.** පු-මති ඇත්තා.

**මතිකත.** ති-සාතලද, සීසාන ලද.

**මතිමන්තු.** පු-ප්‍රඥා ඇත්තා, පණ්ඩිතයා.

**මතිසච්ච.** පු-මන්ත්‍රියා, ඇමතියා.

**මථ.** d. භූ-මන්ථනෙ, ඇළලීමෙහි, මථති, අළලයි, කලතයි, කලඹයි.

**මථති.** ක්‍රි- d. භූ. මථ, විලොලනෙ, කැළඹීමෙහි + ති (මථ + ති) මථනය කරයි, කළඹයි.

**මථන.** න-මැඩීම, පෙරළීම, මිරිකීම.

**මථිත.** ති-මඩනා ලද, අලලන ලද.

**මථිත.** න-මෝරු.

**මද්ද.** d. භූ-මද්දනෙ මැඩීමෙහි, මද්දති, මඩියි.

**මද්ද.** පු-එනම් ජනපදය.

**මද්දති.** ක්‍රි-d. භූ. මද්දනෙ, මැඩීමෙහි, (මද්ද + ති) මඩියි, මිරිකයි.

**මද්දන.** න-මැඩීම, පෙළීම

**මද්දරී.** ඉ-පක්ෂි විශෙෂයක්.

**මද්දාලක.** පු-කුරුලුවර්ගයක්, පක්ෂිජාතියක්.

**මද්දිත.** ති-මඩිනාලද, පෙළනලද.

**මද්දල.** පු-එනම් බෙරවර්ගය.

**මද්දව.** ති-මෘදුබව, මොළොක්බව

**මද්දවතා.** ඉ-ශාන්තකම, මෘදුතාවය.

**මද.** d. දි-උම්මාදෙ, උමතුවීමෙහි, මජ්ජති, මත් වෙයි, උමතු වෙයි, පමජ්ජති.

**මද.** d. චු-තප්පනෙ, තෘප්තියෙහි, මදෙති, මදයති, තෘප්තියට පැමිණෙයි, සෑහීමට පැමිණෙයි.

**මද.** d. භූ-තොසෙ, සතුටුවීමෙහි, මදෙති, සතුටුවෙයි.

**මද.** පු-ගර්ව, සන්තිමදය, මත්වීම.

**මදන.** න-අනඞ්ගයා, කුකුරුමුවන් ගස, මත්වීම.

**මදනීය.** ති-මත්වියයුතු.

**මදි.** d. භූ-පසංසාතොස, පමාදසයනෙසු, පැසසීම, සතුටුවීම, ප්‍රමාදවීම, සයනය කිරීම යන මෙහි, මන්දති.

**මදිරා.** ඉ-සුරා, මත්වීම.

**මදිරොද.** පු-එනම් සමුද්‍රය.

**මධු.** d භූ. කිලිහනෙ, තෙත් බැවිහි, මධති, තෙත් වෙයි.

**මධු.** න-මී. මුද්‍රික, මුද්‍රිකරසය, මල්රස, මීයෙන් කළ සුරා.

**මධු.** ති-මධුර, ඉෂට.

**මධුආසව.** පු-මීයෙන්කළ ආසව.

**මධුක.** පු-වංශ දූත සතුති කරන්නා, මීගස්.

**මධුක.** න-වැල්මී.

**මධුකර.** පු-මී සාදන්නා, බඹරා

**මධුකා.** ඉ-මධුපානය, මිහිරිපානය.

**මධුගන්ධ.** න-මිහිරිසුවඳ, මීපැණිසුවඳ.

**මධුගණ්ඩ.** න-මීවදය.

**මධුචඡිටඨ.** න-මීපැණි.

**මධුර,** ති-මිහිරි, ප්‍රණීත.

**මධුරක.** න-මිහිරි පානයක් වූ මද්‍යසාරය.

**මධුටඨිල.** පු-මීගස.

**මධුද්දුම** පු-මීගස.

**මධුප.** පු-මීපානයකරන්නා, මීමැස්සා, බඹරා.

**මධුපටල.** න-මීවදය.

**මධුපණ්ණී.** ඉ-ඇද්දෙමට, කිඳි.

**මධුපිණ්ඩික.** පු-මීපිඩු, මීපැණි මිශ්‍රකළ විලද ගුලි.

**මධුබ්බත.** පු-මධුප, මීපානයකරන්නා.

**මධුභාණී.** පු-මීපැණි මෙන් මිහිරි කථා-කියන්නා.

**මධුමක්ඛික.** පු-මීමැස්සා.

**මධුමෙහ.** පු-එනම් රෝගය.

**මධුමෙහික.** පු-මධුමෙහය ඇත්තා.

**මධුයට්ඨිකා.** ඉ-වැල්මී.

**මධුර.** පු-මිහිරිරසය, ජීවක.

**මධුරක.** පු-ජීවක නම් ඖෂධය.

**මධුරතා.** ඉ-මිහිරිබව

**මධුරස්සර.** පු-මිහිරිස්වරය, මිහිරිනාදය.

**මධුරසර.** පු-මිහිරිස්වරය, මධුරස්වරය.

**මධුරසා.** ඉ-මොර, මිදිවැල.

**මධුරිපු** පු-විෂ්ණු.

**මධුලිහ.** පු-බඹරා, මීමැස්සා.

**මධුලට්ඨිකා.** ඉ-වැල්මී.

**මධුලාජ.** න-මිහිරිධාන්‍ය.

**මධුලිකා.** ඉ-මොරගස.

**මධුවාණිජ.** පු-මීවෙළෙන්දා.

**මධුස්සව.** ති-මීපැණියෙන් ඉතිරීයන.

**මධ්වාසව.** පු-මීයෙන් කළ සුරා, මීමල් කාඩි-කිරීමෙන් පෙරන සුරා.

**මන්ත**. d. චු-ගුත්තභාසනෙ, සඟවා කීමෙහි, මන්තෙති මන්තයති, මන්ත්‍රණය කෙරෙයි, රහස් කථාකරයි.

**මන්ත**. පු-වේදය, මන්ත්‍රණය, ප්‍රඥාව.

**මන්තඅජ්ඣායක**. පු-මන්ත්‍රහැදෑරීම, මන්ත්‍ර-පිරිවැහීම.

**මන්තක**. පු-මන්ත්‍රකරන්නා, මන්ත්‍රකාරයා.

**මන්තන**. න- මන්ත්‍රණය, කථාව, සාකච්ඡාව

**මන්තපද**. න-මන්ත්‍ර පිළිබඳ පද.

**මන්තනා**. ඉ-සංසන්දනය.

**මන්තනක**. පු-මන්ත්‍රණයකිරීම, උපාය යෙදීම.

**මන්තා**. ඉ-ප්‍රඥාව, පැණි.

**මන්ති**. පු-මන්ත්‍රියා, මැති, ඇමති.

**මන්තික**. පු-මන්ත්‍රීත්ව අයත්, ඇමතියන් පිළිබඳ.

**මන්තිත**. ති-මන්ත්‍රණය කළ, කථාකර ගන්නා ලද.

**මන්තු**. පු-අපරාධය, දොෂය.

**මන්තභාණී**. පු-ප්‍රමාණ කථා කියන-තැනැත්තා.

**මන්තබන්ධු**. පු-එකට මන්ත්‍ර ඉගෙනගත් අය, බ්‍රාහමණයා.

**මන්ථ**. d. භූ-මොහෙ, ඇලලීමෙහි, මන්ථති, අලලයි, අභිමන්ථති.

**මන්ථ**. පු-මෝරු අළලනමත, මෝරු පොඩි-කරණ උපකරණය අත්සුණු.

**මන්ථනී**. ඉ-මෝරු අළලන (පොඩිකරණ) භාජනය.

**මන්ද**. ති-සවල්පය, මද, ටික, පින් නැත්තා, මූඪයා, බාලයා, අවිසාරදයා, නොගැඹුරු හඬ, මැලීඅය, පු.

**මන්දක**. පු-මැලිතැනැත්තා, කම්මැලියා.

**මන්දගාමී**. ති-ලැසිගමන් යන්නා, ප්‍රමාදව යන්නා.

**මන්දතා**. න-මද බව, සවල්ප බව, ටික බව.

**මන්දලොචන**. න-මෑදූ ඇස්, සුන්දර ඇස්.

**මන්දාකිණී**. ඉ-අහස් ගඟ, එනම් නදිය.

**මන්දාමුඛී**. ඉ-ගිනි අඟුරු, තැබීමේ භාජනයක්,

**මන්දාර**. පු-හස්තපර්වතය. මදාරාගස.

**මන්දාරව**. පු-මදාරා.

**මන්දාලක**. පු-මන්දරම.

**මන්දිර**. න-පුරය, ප්‍රාසාදය, ගෘහය.

**මන්දිරාලින්ද වත්ථු**. න-ගෘහාලින්දයාගේ අධිෂ්ඨානය.

**මන**. d. භූ-පත්ථරණෙ, ව්‍යාප්තියෙහි, ව්‍යාප්ත වෙයි, මනො.

**මන**. d දි-ජානනෙ, දැනීමෙහි, මඤ්ඤති, දනී.

**මන**. පු. න-සිත, චිත්තය, හිත.

**මනං**. අ-අල්පාර්ථයෙහි, සවල්පය, ටික,

**මනක්කාර**. පු-මෙනෙහි කිරීම, සිහි කිරීම.

**මනන්තර**. පු-දෙව්ලොව.

**මනස**. න-සිත.

**මනසිකරණ**. න-මෙනෙහිකිරීම.

**මනසිකාර**. පු-මනසකාරය, මෙනෙහිකිරීම, සිහිකිරීම.

**මනසිජ**. පු-අනඞ්ගයා.

**මනාති**. ක්‍රි-(d භූ-මන, පත්ථරණෙ, පැතිරීමෙහි + ති) පැතිරෙයි.

**මනාප**. ති-සිත්කලු, මන වඩන.

**මනාපක**. පු-මනවඩන, මනාප.

**මනාපදායක**. ති-කැමති දෙය දෙන තැනැත්තා.

**මනාපික**. ති-මනවඩන.

**මනාල**. න-බඹුස් තණ.

**මනින්ද්‍රිය**. න-මනස් ඉන්ද්‍රිය, මනස, මනා-යතනය.

**මනු**. d. න-ඤාණෙ, දැනීමෙහි, මනොති, දනී, මනුසෙසා.

**මනුජ**. පු-මනුෂ්‍යයා, මිනිහා.

**මනුජාධිප**. පු-මනුෂ්‍යාධිපයා, රජු.

**මනුඤ්ඤ**. ති-සිත්කලු දෙය, මනොඥ.

**මනුතෙ**. ක්‍රි-(d භූ. මන, ඤාණෙ, ඤාණයෙහි) හඟියි.

**මනුස්ස**. පු-මනුෂ්‍යයා, මිනිහා.

(17906)

**මනුස්සත්ත.** න-මනුෂ්‍යාත්මභාවය, මිනිසත් බව.

**මනුස්ස ධම්ම.** පු-වෙමුණි රජ, ධ්‍යානාදියෙන් තොරවූ සාමාන්‍ය මනුෂ්‍යයාට අයිති දශ කුසල ධර්මය.

**මනුස්සික.** පු-මිනිසුන්ට අයත්, මිනිසුන්ට සුදුසු.

**මනුස්සලොක.** පු-මිනිස් ලොව, මනුෂ්‍යවාසය.

**මනුස්සවරාක.** පු-මනුෂ්‍ය ලාමකයා, හීන මිනිහා, මහත් මනුෂ්‍යයා.

**මනෙසික.** පු-සිතෙන් සිතන ලද්ද, දූත කරණ ක්‍රීඩාව.

**මනොකම්ම.** න-මනසින් සිදුවන කර්ම.

**මනො තොස.** පු සිත් සතුට, සන්තොසය.

**මනොදණ්ඩ.** පු-මනො කර්මය.

**මනොදුච්චරිත.** න-සිතින් වන දුසිරිත්, චතුර්විධ මනො දුශ්චරිතය.

**මනො දොස.** පු-මනො දුච්චරිතය.

**මනොධාර.** න-මනස, සිත.

**මනොපදොසික.** පු-එනම් දිව්‍ය නිකාය, සිත දූෂ්‍ය වීමෙන් මරණයට පැමිණෙන දෙව කොටස.

**මනොපසාද.** පු-සිත පැහැදීම, චිත්ත ප්‍රසාදය

**මනො භාවනීය.** පු-හිත හොඳට වැඩීම.

**මනොභූ.** පු-අනඞගයා, කාමදෙවයා.

**මනොමය.** පු-සිතින් හටගත්, සිතේ උපන්.

**මනොමය ඉද්ධි.** ඉ-සිතින් උපදවන ඍද්ධිය.

**මනො මොනෙය්‍ය.** පු-මනො ව්‍යාරයාගේ පවිත්‍ර භාවය, චිත්ත සංඛාර නිරොධය ඇති සඤ්ඤා වෙදයිත නිරොධ සමාපත්තිය.

**මනොරථ** පු-සිතේ ආසාව, තණ්හාව, ආසාව.

**මනොරථ පූරණී.** ඉ-මනොරථය පුරවන්නී, එනම් අඞ්ගුත්තර නිකායට්ඨ කථාව.

**මනොරම** පු-සිත්කලු, සිත් අලවන, මනො-හර.

**මනොවිඤ්ඤාණ.** න-මනොවිඥානය.

**මනො විඤ්ඤෙය්‍ය.** පු-මනසින් දතයුතු දේ.

**මනො විලෙඛ.** පු-විචිකිච්ඡාව.

**මනො විතක්ක.** පු-මනසෙහි පවත්නා විතර්කය.

**මනො සංචෙතනාහාර.** න-ප්‍රත්‍යවෙක්‍ෂා මගින් සිතට දෙන ආහාරය.

**මනො සඞ්ඛාර.** පු-සිතින් රැස්කිරීම, සිතින් කුශලාකුශලයන් රැස් කිරීම.

**මනො සමාචාර.** පු-සිතේ පුරුද්ද, සිත හැසිරීමේ පුරුද්ද.

**මනොසිලා.** ඉ-සිරියල්.

**මනොසිලික.** පු-සිරියල්.

**මනොසුචරිත.** න-මනසින් සුචරිතයෙහි හැසිරීම.

**මනොහර** න-සිත්කලු, මනොරම, සිත පැහැර ගන්නා.

**මප** d. චු. මාපනෙ, මැවීමෙහි, මාපෙති, මාපයති, සාදයි, මවයි.

**මබ්බ.** d. භූ-ගමනෙ, යාමෙහි, මබ්බති, යෙයි.

**මබ්භ.** d. භූ-ගමනෙ, යාමෙහි, මබ්භති, යෙයි.

**මම්ම.** පු-ගිවුලුගස, මර්මස්ථානය, මරණ සිදු කරණ තැන්.

**මම්මච්ඡෙද.** පු-මර් සිඳීම, බල නහර සිඳීම්.

**මම්මන** පු-ගොතයා, ගොත ගසා කථා කරන්නා.

**මමඞ්කාර.** පු-අහඞ්කාර, ආඩම්බරය.

**මමත්ත.** න-මමත්වය, ආදරය.

**මමායති.** ක්‍රි-මමත්වය කරයි.

**මමායන** න-මමත්වය කිරීම.

**මමායිත.** ති-මමත්වය කළ.

**මමිං කරොති.** ක්‍රි-අහඞ්කාර කරයි. ආඩම්බර කරයි.

**මමං.** අ-මාගේ, මාවිසින්, මට, මා

**මය.** d. භූ. ගමනෙ, යාමෙහි, මයති, යෙයි.

**මය.** පු-එයින් කරණ ලද්දේ යනාර්ථයෙහි වූ ප්‍රත්‍යයක්, මනොමය, සුවණ්ණමය, රජතමය.

**මයා.** අ-මා විසින්, මා කරණ කොට.

**මයුඛ.** පු-රශ්මිය, මොනරා.

**මයුර**. පු-මොනරා.

**මයුරක**. පු-සැබෝගස.

**මයුරවිදලා**. ඉ-කලුත්‍රාසත්‍රවාළු.

**මමිංකාර**. පු-මම වෙමියි යන දෘෂ්ටිය.

**මර**. d. භූ-පාණචාගෙ, ප්‍රාණ ත්‍යාගයෙහි, මරති, මැරේ, මරණං, මචෙචා.

**මරණ**. න-මැරීම, කාලක්‍රියාව, මරණය.

**මරණමඩ**. පු-මරණාසන්නයෙහි හෝනා ඇඳ, අනුට්ඨාන ශෙයයාව.

**මරණමුඛ**. පු-මරණවාරය, මරණාසන්නය.

**මරණානුස්සති**. ඉ-මරණය සිහිකිරීම, නිතොර මරණය ගැණ සිහිකිරීම.

**මරිච**. න-මිරිස්, ගම්මිරිස්.

**මරති**. ක්‍රි-(d. භූ. මර, පාණචාගෙ, ප්‍රාණත්‍යාගයෙහි + ති) (මර + ති) මැරෙයි.

**මරණසති**. ඉ-මරණය ගැණ පවත්වන සිහිය.

**මරියාද**. ඉ-සීමාව, ඉම, චාරිත්‍රය.

**මරිස**. d. චු-මමායං, ඉවසීමෙහි, මරිසෙති, මරිස්සති, ඉවසයි, ක්‍ෂමාකරවයි.

**මරීචි**. ඉ-මිරිඟු, මිරිඟුදිය, මිගතණ්හිකා, මිරිඟු, ජලය.

**මරීචිකම්මට්ඨාන**. න-ආත්ම භාවය මිරිඟු ජලයකට උපමා කොට භාවනාකිරීම වූ කමටහන.

**මරීචිධම්ම**. පු-මිරිඟු සවභාව, මිරිඟු වැනි ගතිය,

**මරීචි**. න-රශ්මිය, දීප්තිය, මිරිඟුදිය.

**මරීචිකා**. ඉ-මරීචි, මෘග තෘෂ්ණිකා.

**මරිසු**. d. භූ-ඛමායං, ඉවසීමෙහි, මරිස්සති, ඉවසයි.

**මරු**. පු-ශෛලය, ගල, නිරුදක ප්‍රදෙශය, දෙවියා.

**මරුකන්තාර**. පු-අමනුෂ්‍යාධිගෘහිත කාන්තාර.

**මරුම්බ**. න-සුවඳ ඇති පස් වර්ගයක්, සුවඳැති වැලි ජාතියක්.

**මරුවක**. පු-කුකුරුමුවන් ගස.

**මල**. d. භූ-ධාරණෙ, දැරීමෙහි, මලති, දරයි.

**මල**. න-ගූථය, කිළුටුදෙය.

**මලය**. පු-එනම් පර්වතය, එනම් දීපය, වනාන්තරය.

**මලයජ**. පු-මලය පර්වතයෙහි හටගත් දෙය, සඳුන්ගස.

**මලින**. න-කිළුටු, අපිරිසිදුදෙය.

**මලිනක**. න-අපිරිසුදු, කිළුටු.

**මලිනී**. ඉ-ඔසප්වූ ස්ත්‍රිය, මල්වරවූ තැනැත්තී.

**මලිමස**. පු-කිළුටුදෙය, අපවිත්‍රදෙය.

**මලොරිකා**. ඉ-කනප්පුව.

**මල්ල**. d. භූ-ධරණෙ, දැරීමෙහි, මල්ලති, දරයි, මල්ලො.

**මල්ල**. පු-යොධයා, යුඩභටයා, සෙබලා.

**මල්ලක**. පු-මාලාව, මල්දම, ක්‍රීඩාභාණ්ඩයක්.

**මල්ලගණ**. පු-රක්‍ෂාවක් වශයෙන් පොර බදන්නෝ.

**මල්ලමුට්ඨික**. පු-මල්ලව කාරයා, ගුස්ති අල්ලන්නා.

**මල්ලයුඩ**. පු-මල්ලව පොරබැදීම.

**මල්ලිකා**. ඉ-බෝ ලිද්ද.

**මල්ලිකාක්ඛ**. පු-කිළුටු පා හා තුඩු ඇති හංසයා.

**මල්‍ය**. න-කිළුටුබව, අපිරිසිදුබව.

**මස්සු**. න-රැවුල, පුරුෂයන්ගේ මුහුණෙහි ඇතිවන රැවුල.

**මස්සුකරණ**. න-අන්දම් තැබීම, රැවුල කැපීම.

**මස්සුක**. ති-කරණවැමියා.

**මස්සුකම්ම**. න-රැවුල කැපීම් කර්මය.

**මස**. d. භූ-කොධෙ සද්දෙච, ක්‍රොධයෙහි හා ශබ්දයෙහි, මසති, ක්‍රොධකරයි, ශබ්දකරයි.

**මස**. d. භූ-පීඩායං, පෙළීමෙහි, මසති, පෙළයි.

**මස**. d. භූ-සමඵසෙස, ස්පර්ශකිරීමෙහි, මසති, ස්පර්ශකරයි, ආමසති, පරාමසති.

**මස**. d. දි-ඛමායං, ක්‍ෂමායෙහි, මසති, ක්‍ෂමා කරයි.

**මසති**. ක්‍රි-(d. භූ-සමඵසෙස, ස්පර්ශයෙහි + ති) සම්මර්ශනය කෙරෙයි.

(18007)

**මසක්කසාර**. පු-ශක්‍රපුරය.

**මසාණ**. න-හත.

**මසාණක**. න-මිශ්‍රවස්ත්‍ර, නානා හු මිශ්‍රවස්ත්‍රය

**මසාරක**.පු-මඤ්ච විශෙෂයක්.

**මසාරගල්ල**. න-කබරමණි, මැසිරිගල.

**මසි**. න-පියල්ල, අඳුන, කජ්ජලය.

**මසු**. d. භූ-මච්ඡරියෙ, මසුරුවීමෙහි.

**මසූරක**. ති-රැවුල් ඇති.

**මහ**. පු-උත්සවය, සැනකෙළිය.

**මහ**. d. භූ-පූජායං, පිදීමෙහි, මහති, පුදයි.

**මහ**. d. භූ-වුඩ්ඪියං, වෘඩියෙහි, මහති, වෘඩියට පැමිණෙයි.

**මහ**. d. චු-පූජායං, පිදීමෙහි, මහෙති, මහයති, පුදයි.

**මහග්ගත**. ති-මහත් බවට පැමිණි, මහත් සවභාවයට පැමිණි.

**මහග්ඝ**. පු-මාහැගි, මහඟු, බොහෝ වටිනා.

**මහග්ඝස**. පු-බොහොම කන්නා, අධිකව අනුභව කරන්නා.

**මඞ්** d. භූ මන්‍දහාසෙ, මදසිනාවෙයි, මඞ්ඛතෙ, විම්හයතෙ, මුකුළු කෙරේ, මදසිනාකෙරේ.

**මහච්ච**. අ-මහත්, විසාල, "මහච්ච රාජානුභාවෙන."

**මහත්ත**. න-මහත් බව.

**මහති**. ඉ-මහත්.

**මහද්ධන**. න-බොහෝ ධනය, මහත් ධනය.

**මහනීය**. පු-පිදියයුතු, පූජනී.

**මහන්ත**. පු-මහත් දෙය, මහත්.

**මහල්ලක**. පු-මහලු, වෘඩ, වැඩිසිටි.

**මහා**. අ-මහත්.

**මහාඅරිය**. පු-මහායසීයා, මහ බෝසතාණෝ.

**මහාකථාන**. න-එනම් සඞ්ඛ්‍යා විශෙෂය, කථාන සියක් ලක්‍ෂය, කථාන බලනු.

**මහාඛන්ධ**. පු-හෙළ ලුනුණු, සුදුලූණු.

**මහාකාරුණික**. පු-මහාකරුණා ඇත්තා, බුදුරජ.

**මහාකුල**. න-ආර්‍ය්‍යකුලය.

**මහාඝොඛ**. පු-මහාබන්ධනය, මහත් ඝනය.

**මහාතණ්හ**. පු-මහත් තෘෂ්ණා ඇත්තා, තෘෂ්ණාධිකයා.

**මහාතිමි**. පු-එනම් මත්ස්‍යයා.

**මහාධිති** ඉ-මහා ප්‍රඥ ඇත්තා, වීර්‍ය්‍ය සම්පන්නයා.

**මහානසන**. න-මුලුතැන්ගෙය, පිසන ගෙය.

**මහානාග**. පු-මහ නයා, මහොත්තමයා, මහා හස්තියා.

**මහානාම**. පු උක්ගස, එනම් ඇත්තා.

**මහානදී**. ඉ-මහාගංගාව.

**මහානිරය**. පු-අවීචිය, අටමහනිරය.

**මහානිසා**. ඉ-මහාරාත්‍රිය, මධ්‍යම රාත්‍රිය, රෑ දෙගොඩහරි වේලාව, අඩ රාත්‍රිය.

**මහානුභාව**. පු-මහත් ආනුභාවය, මහා තෙජස.

**මහාපදෙස**. පු-සූත්‍ර, සූත්‍රානුලොම, ආචාර්‍ය්‍ය වාද අත්තනොමති යන මහා කරුණු සතර.

**මහාබල**. පු-මහත්බල ඇත්තා, බුදුරජාණන් වහන්සේ.

**මහාබොධි**. ඉ-බුඩ්ගයාවෙහි පිහිටි ජය ශ්‍රී මහා බොධිය, අනුරාධපුරයෙහි පිහිටි ශ්‍රීමහ බොධිය.

**මහාබොධිධම්ම**. පු-මහාබොධි ධර්ම ඇත්තා, බුදුරජ.

**මහාමති**. ඉ-මහත් ප්‍රඥ ඇත්තා, බුදුරජ.

**මහාමායා**. ඉ-බුඩ්මාතාව, මහාමායාදේවිය.

**මහාමුනි**. පු-මහා මුනීන්‍ද්‍රයන් වහන්සේ, බුදුරජ.

**මහාරජක්ඛ**. න-ප්‍රඥ චක්‍ෂුසෙහි රාගාදී මහත් රජස් ඇත්තා, මුහුකල ප්‍රඥ නැත්තා,

**මහාරඤ්ඤ**. න-මහවනය.

**මහාරාජික**. පු-මහරජුන්ට අයත්, සිව්මහ රජුන්ට අයිති.

**මහාරොරුව**. පු-එනම් නිරය.

**මහාවිරේක**. පු-අතීසාරය.

**මහාවීචි.** ඉ-මහාතරඞ්ගය, සමුද්‍රාදියෙහි මහත් රැල.

**මහාසභා.** ඉ-කොමාරිකා, මහා සමිතිය.

**මහාසමණ.** පු-මහා ශ්‍රමණයා, බුදුරජ.

**මහාසය.** පු-තෘෂ්ණා අධිකයා, මහත් සයනය.

**මහාසයන.** න-නොකැප මහඟු ඇතිරිලි අතුරණ ලද සයනය.

**මහාසාලා.** ඉ-මහාවෘක්ෂ, මහත්ශාලා.

**මහාසාවජ්ජ.** න-මහවරද, මිථ්‍යා දෘෂ්ටිය.

**මහාසිරා.** ඉ-මහ නහර.

**මහාසුඛ.** පු-සම්ඳෙයන් වහන්සේ-

**මහාසොබ්භ.** පු-මහාවිල, මහහෙබ.

**මහිකා.** ඉ-පිනි, පිනිබින්දු, මීදුම.

**මහිච්ඡ.** පු-තෘෂ්ණාධිකයා, මහා ආසා ඇත්තා.

**මහිච්ඡා.** ඉ-මහෙච්ඡාව, අධික ආසාව, මහෙච්ඡා බව.

**මහිත.** ති-පුදන ලද, පූජා ලබන ලද.

**මහිධි.** ඉ-මහත් සෘධිය.

**මහින්ද.** පු-මිහිඳු කුමාරයා, ශක්‍රයා.

**මහිමා.** ඉ-සෘධිකරණයෙහි ශරීරය මහත් බවට පැමිණවීම.

**මහිලා.** ඉ-ස්ත්‍රී, කාන්තාව, පුවඟු.

**මහිස.** පු-මීසරක්, මීමා.

**මහිසමණ්ඩල.** න-අන්ධක රට, ආන්ධ්‍ර රට.

**මහිස්සර.** පු-මහේශ්වරයා, ඊශ්වරයා.

**මහී.** ඉ-පෘථිවිය, එනම් නදිය.

**මහීතල.** න-පෘථිවිතලය, පොළොව.

**මහීධර.** පු-පර්වතය,

**මහීප.** පු-මිහිපල්, මහීපාල.

**මහීපති.** ඉ-පෘථිවිස්සර, මිහිපති.

**මහීභාග.** පු-පෘථිවිභාගය, භූමිප්‍රදේශය.

**මහීරුහ.** පු-වෘක්ෂය, ගස.

**මහීලතා.** ඉ-ගඬවිල් පණුවා.

**මහුස්සාහ.** පු-මහත් වීර්‍ය්‍යය, වීර්‍ය්‍යසම්පන්නයා

**මහෙසක්ඛ.** පු-අල්පේශාක්‍ය නොවන, මහා තේජස් ඇති, මහානුභාව ඇති, මහා යසස් ඇති.

**මහෙසි.** පු-(මහ+ඉසි) මහාර්ෂී=බුදුරජ.

**මහෙසී.** ඉ-අගබිසව, අගමෙහෙසිය, ප්‍රධාන බිසව.

**මහොඝ.** පු-මහා ඔඝය, මහා සැඩ පහර, ඔඝබලනු.

**මහොදධි.** පු-මහා සමුද්‍රය, මහමුහුද.

**මහොදික.** න-මහජලය, අධික ජලය.

**මහොසධ.** න-ඉඟුරු, ඉවඳ, සුදුලූණු.

**මහොළාරිකා.** ඉ-දණ්ඩාධාරයක්.

## මා

**මා.** අ-ප්‍රතිෂේධයෙහි, වැළැක්වීමෙහි.

**මා.** d. භූ-පමාණෙ, මැණීමෙහි, මාති, මැණීම කරයි.

**මා.** d ක්‍රි-පමාණෙ, මැණීමෙහි, මිණාති, ප්‍රමාණ කරයි.

**මා.** පු-චන්ද්‍රයා, සඳු.

**මාකකව.** පු-කී කිරිදිය.

**මාක්ඛික.** න-මීපැණි.

**මාගධ.** පු-වංශ දන සතුති කරන්නා, ශුද්‍රයාට දුව වූ ක්ෂත්‍රිය සත්‍රියගේ පුතා.

**මාගධක.** පු-මගධ රට වසන්නා, මගධ රටට අයත්.

**මාගධී.** ඉ-සිතිද්ද, වගපුල්, මගධ ජනපද වාසීන්ගේ භාෂාව, පාලිභාෂාව.

**මාගවික.** පු-මුව වැද්දා, මුවන් මරා ජීවත් වන්නා.

**මාගසිර.** පු-උඳුවප් මස,

**මාඝ.** පු-නවම් මස.

**මාඝාත.** න-සතුන් මැරීම තහනම් කිරීමේ නීතිය.

**මාඝ්‍ය.** න-කොඳ, කොඳවැල.

**මාඞ්ගල්‍ය.** න-මඞ්ගල භාවය.

**මාණ.** න-ප්‍රමාණය, මැණීම.

**මාණභණ්ඩ.** න-කිරණ මණිත බඩු, තරාදි හුණ්ඩු ආදිය.

**මාණව.** පු-මනුෂ්‍යයා, තරුණයා, සත්වයා, සොරා.

**මාණව.** ති-තරුණයා,

**මාණවක.** පු-තරුණයා.

**මාණිකා.** ඉ-සතර ද්‍රෝණයක්, ලාස් දහසයක්.

**මාණිමන්ථ.** පු-සිඳු ලුණු.

**මාතඩ්ග.** පු-ඇතා, චණ්ඩාලයා.

**මාතඩ්ගජ.** පු-ඇතා, හස්තියා.

**මාතලී.** පු-එනම් දෙවතාවා, ශක්‍රයාගේ රථාචාර්‍ය්‍ය දෙවියා.

**මාතාපෙත්තික.** පු-මව්පියන්ට අයත්, මව් පියන් පිළිබඳ.

**මතාමහා.** ඉ-ගැණුමුත්තා.

**මතාමහී.** ඉ-ගැණුමුත්තා.

**මාතික.** පු-මවට අයිති, මව් සන්තක.

**මාතිකා.** ඉ-මාතෘකාව, ප්‍රධාන වචනය, ඇල දිය අගල.

**මාතර.** ඉ-මාතු, මව, වැදූමව.

**මාතිය.** පු-මවට අයත්, මව්සතු.

**මාතු.** ඉ-මව, මවගේ මව, ආච්චි.

**මාතුක.** පු-මවට අයිති, මැනියන් සතු.

**මාතුගාම.** පු-මාගම, ස්ත්‍රිය, කාන්තාව.

**මාතුඝාතක.** පු-මාතෘ ඝාතකයා, මව් මරන්නා.

**මාතුච්ඡා.** ඉ-මව්ගේ සහෝදරී, ලොකු මව හෝ කුඩා මව.

**මාතුල.** පු-මවගේ සහෝදරයා, මාමා.

**මාතුලක.** පු-මයිලනුවා, අත්තන ගස.

**මාතුලධීතු.** ඉ-මාමාගේ දුව, නෑනා.

**මාතුලානී.** ඉ-නැන්දනී, නැන්ද.

**මාතුලුඞ්ග.** පු-ලප්නාරන්, නස්නාරන්.

**මාදිස.** ති-මාවැනි, මා සමාන.

**මාධක.** පු-විෂ්ණු.

**මාධවික.** පු-මීයෙන් කළ සුරා.

**මාධවිලතා.** ඉ-යොහොඹු ගස. ඉද්ද.

**මාන.** d. භූ-පූජායං, පිදීමෙහි, මානෙති, පුදයි.

**මාන.** d. භූ-වීමංසනෙ, විමසීමෙහි, මාන්ති, විමසයි.

**මාන.** d. චු-වීමංසනෙ පූජනෙච, විමසීමෙහි හා පිදීමෙහි, මානති, මානයති, විමසයි, පුදයි.

**මාන.** පු-මාන්නය, උන්නතිය.

**මානගන්ධ.** පු-මානගැටය.

**මානකූට.** න-හොර මැනීම, වඤ්චා මානය.

**මානත්ත.** න-ගරු ඇවැත් වලට පැමිණි භික්ෂූන් විසින් පිළිපැදිය යුතු විනය කර්මයක්.

**මානධජ.** පු මානය ධජකොට ඇත්තා, මානාධිකයා.

**මානන.** පු-පූජාව, පිදීම.

**මානනා.** ඉ-පූජාව, පිදීම.

**මානමද.** පු-මාන්නයෙන් මත්වීම.

**මානව.** පු-මනුෂ්‍යයා.

**මානවිනිබන්ධන.** න-මානයෙන් බැඳීම.

**මානස.** පු-රාගය, චිත්තය, අර්හත්වය. (380 පපඤ්ච සූදනී.)

**මානස.** න-චිත්තය, අර්හත්වය, රහත් බව.

**මානසංයෝජන.** න-දසංයොජනයෙන් එකක් වූ මානසංයෝජනය, මානබන්ධනය.

**මානසික.** න-සිතින් උපදවන ලද්ද.

**මානසොක.** පු-හංසයා.

**මානානුසය.** පු-මාන්නය හා අනුසය.

**මානාතිමාන.** පු-මාන්නය හා අතිමාන්නය.

**මානිත.** ති-පුදන ලද, පූජා කළ.

**මානිකා.** ඉ-බරක්, ද්‍රෝණ සතරක් මානික එකකි, "චතුද්දෙණං මානිකා"

**මානුස.** පු-මනුෂ්‍යයා, මිනිහා.

**මානුසක.** පු-මිනිහාට අයත්, මනුෂ්‍යයා පිළිබඳ.

**මානුසක කාම.** පු-මනුෂ්‍යයාට අයත් කාමය.

(18168)

**මානුසී.** ති-මිනිසුන්ට අයිති.

**මානෙති.** ක්‍රි-(d. භූ. මාන, පූජායං, පිදීමෙහි + ණෙ + ති) පුදයි.

**මාපක.** පු-මවන්නා, සාදන්නා.

**මාපෙති.** ක්‍රි-(d. චු. මාප, මාපනෙ, මැවීමෙහි + ණෙ + ති) මවයි, සාදයි.

**මාමක.** පු-බුහුමන් කරන්නා, ගරු කරන්නා,

**මාමිකා.** ඉ-මව, මැණි,

**මායා.** ඉ-මායාව, ඉන්ද්‍රජාලය.

**මායාකාර.** පු-ඉන්ද්‍රජාලිකයා, මායාකාරයා.

**මායාදෙවී.** ඉ-එනම් දෙවිය.

**මායාදෙවීසුත.** පු-මායාදේවියගේ පුතා, සිදුහත් කුමරු.

**මායාවී.** ති-මායා ඇත්තා, ඉන්ද්‍රජාලිකයා.

**මායු.** පු-පිත.

**මාර.** පු-වසවත්තිමාරයා, මරණය, පඤ්චමාර බලනු.

**මාරකායික.** පු-මාරපිරිසට අයත්, මාරනිකායික.

**මාරජ.** පු-මාරපරාජය කළ තැනැත්තා, බුදුරජ.

**මාරණ.** න-මැරීම, වධය.

**මාරක.** පු-මරණය, මරන්නා.

**මාරණන්තික.** පු-මරණාසන්න, මරණය සමීපව සිටි.

**මාරත්ත.** න-මාරාත්මය, වසවත්ති මාරාත්මභාවය.

**මාරධීතු.** ඉ-මාරයාගේ දූවරු, තණ්හා, රතී, රගා යන තුන්දෙනා.

**මාරධෙය්‍ය.** ති-මාරයා විසින් දැරිය යුත්ත සංසාරවෘතය.

**මාරබන්ධන.** න-මාරපාශය, පඤ්චකාමබන්ධනය.

**මාරභඤ්ජන.** පු-මාරපරාජයකළ තැනැත්තා, බුදුරජ.

**මාරමන්දිර.** න-මාරභවනය, සත්‍රීනිමිත්ත.

**මාරසෙනා.** ඉ-මරසෙනඟ, මාරපිරිස.

**මාරහරිහර.** පු-විෂ්ණු.

**මාරාපිත.** ති-මරවනලද, මැරූ.

**මාරාපෙති.** ක්‍රි-(d. චු. මර, පාණචාගෙ, දිවිපිදීමෙහි + ණෙ + ති) (මර + ණාපෙති) මරවයි.

**මාරාභිභූ.** පු-මාරපරාජය කළ තැනැත්තා, බුදුරජ.

**මාරාමිස.** න-මාරයාගේ ගොචරය, පස්කම් රසය.

**මාරිත.** න-මරණලද, මැරූ.

**මාරිස.** පු-සුලුකුර පැලෑටිය.

**මාරිස.** ති-නිදුක්, ශ්‍රේෂ්ඨ, උත්තම.

**මාරුත.** න-සුළඟ, වාතය.

**මාරෙති.** ක්‍රි-(d. චු මර, පාණචාගෙ, දිවිපිදීමෙහි + ණෙ + ති) (මර + ණෙ + ති,) මරවයි.

**මාල.** න-පුෂ්පය, මල.

**මාල.** පු-එක් බුමුයුත් ගෙය, එක් මාල්ගෙය.

**මාලක.** පු-මාල් ඇති, තට්ටු ඇති, කොසොඹ ගස.

**මාලතී.** ඉ-දෑසමන්, සමන්පිච්ච.

**මාලා.** ඉ-මල්දම, මල්, පඞ්ක්තිය.

**මාලාකම්ම.** න-මාලාකම්, මල ලොඹුකිරීම, මල්වඩම් තැනීම, මල්වැඩ කිරීම.

**මාලාකාර.** පු - මල් කරුවා, මල්වඩම් ගොතන්නා.

**මාලාවුම්බටක.** න-මල් දරණුව.

**මාලාගුණ.** න-මල්දම, මල්වඩම.

**මාලාවච්ඡ.** පු-මල්පැල; මල් පැලෑටි.

**මාලික.** පු-මල්කරුවා, මල්වඩම් සාදන තැනැත්තා.

**මාලිකා.** ඉ-සමන් පිච්ච.

**මාලිනී.** ඉ-මාලා ඇති.

**මාලී.** ඉ-මාලා ඇති.

**මාලුක.** පු-භාජන විශෙෂයක්.

**මාලුත** පු-මාරුත, සුලඟ.

**මාලුතකම්පිත.** ති-(මාලුත + ඊරිත) වාතයෙන් කම්පා කළ.

**මාලූර**. පු-බෙලිගස.

**මාලුවා**. ඉ-එනම් වැල, යම් ගසක මේ වැල එතුනේ නම් එයින් ඒ ගස විනාශයට පැමිණේ.

**මාල්‍ය**. න-මල්දම, මල්.

**මාස**. පු-මාසය, පක්‍ෂ දෙකකින් යුත් කාලය, ධාන්‍ය විශේෂයක්, උඳු.

**මාසක**. පු-මදටියක ප්‍රමාණය, ඔලිඳ ඇට දෙකක බර.

**මංසාචිත**. ති-හමසක් පිරුණු, 'කුචජි ගරු ගරුවිය මංසාචිතං මඤ්ඤති.''

**මාසික**. පු-මාසයකට අයිති, මාසයක් පිළිබඳ, මාසිය.

**මාසිය**. පු-මාසික, මාසයට අයිති.

**මාහ**. d. භූ-මාණේ, මැණීමෙහි, මහති, මණීයි.

## මි

**මි**. d. ක්‍රි-පීඩායං, පෙළීමෙහි, මිණති, පෙළයි, කුම්ණං

**මි**. d. ක්‍රි-පමාණෙ, ප්‍රමාණකිරීමෙහි, මිණති, මණීයි, ප්‍රමාණ කරයි.

**මිග**. පු-මෘගයා, මුවා තිරිසනා.

**මිගඞග**. පු-(මිග + අඞග) චන්ද්‍රයා.

**මිගදංසක**. පු-බලලා.

**මිගතණ්හිකා**. ඉ-මිරිඟු ජලය.

**මිගදාය**. න-මෘගදාය, දඹදිව බරණැස් නුවර පිහිටි එනම් උයන, දැනට මේ ප්‍රදේශයට ''සාරානාත්'' යයි කියති. හෙද මිගදාය ශබ්දයට පරියාය නාමයකි.

**මිගධුත්ත**. පු-මෘගධූර්ත, කැණහිලා, සිවලා.

**මිගපක්ඛ**. පු. න-මෘග පක්ෂීන්ගේ ශබ්ද දන්නා මන්ත්‍රය.

**මිගබන්ධිනී**. ඉ-වරදැල.

**මිගභූත**. ති-මෘගයෙකු මෙන් සිටින.

**මිගමද**. පු-මෘගමද, කස්තුරි, මෘගනාභි.

**මිගමන්දලොචන**. න-මුවෙකුට බඳු වූ මඳ ඇසින් බැලීම.

**මිගරාජ**. පු-මෘගරාජයා, සිංහයා.

**මිගමාතුකා**. ඉ-මෘග විශේෂයක්-මීමින්නා.

**මිගලුද්දක**. පු-මෘගව්‍යාධයා, මුව වැද්දා,

**මිගව**. පු-මුවදඩයම, ක්‍රීඩා පිණිස මුව දඩයම.

**මිගව්‍යාධ**. පු-මුවවැද්දා, මුවදඩයම.

**මිගවධ**. පු-මෘගවධය, මුවන් මැරීම.

**මිගවිත්තක**. පු-නුපුරුදු දඩයක්කාරයා, ආධුනික දඩයක්කාරයා.

**මිගවිසාණ**. න-මුව අඟ.

**මිගාදන**. පු-කරබාන වලසා.

**මිගාභිභූ**. පු-මුවන් මර්දනය කරන්නා, සිංහයා.

**මිගාරමාතු**. ඉ-මිගාර සිටු විසින් මව් තනතුරෙහි තබාගත් විසාඛා උපාසිකාව.

**මිගින්ද**. පු-මෘගෙන්ද්‍රයා, සිංහයා.

**මිගී**. ඉ-මුව දෙන.

**මිච්ඡත්ත**. න-මිථ්‍යා සවභාව.

**මිච්ඡාචාර**. පු-වැරදි හැසිරීම, කාම මිථ්‍යාචාරය.

**මිච්ඡාඤාණ**. න-විපරීතඥනය, වැරදි දැනුම.

**මිච්ඡාදිට්ඨි**. ඉ-මිථ්‍යා දෘෂ්ටිය, වැරදි දැක්ම.

**මිච්ඡාගහණ**. න-මිථ්‍යා ග්‍රහණය, වරදවා ගැන්ම.

**මිච්ඡාගහිත**. ති-වරදවා ගන්නා ලද.

**මිච්ඡාපටිපදා**. ඉ-මිථ්‍යා ප්‍රතිපදාව, වැරදි පිළිපැදීම.

**මිච්ඡාපටිපන්න**. පු-වරදවා පිළිපන්.

**මිච්ඡාපථ**. පු-මිථ්‍යා මාර්ගය, වැරදි මග.

**මිච්ඡාපණිහිත**. පු-වරදවා තබනලද, වරදවා පිහිටුවන ලද.

**මිඤ්ජා**. ඉ-මදුලු, මිදුලු, ඇටමිදුලු.

**මිඤ්ජක**. න-තල ඇටයේ ඇති මිදුලු.

**මිණ**. d. භූ-හිංසාය, හිංසාකිරීමෙහි, මිණති, හිංසා කරයි.

**මිත්ත**. පු න-මිත්‍ර, මිත්‍රයා, මිතුරා.

(18269)

**මිත්තතා**. ඉ-මිත්‍ර භාවය.

**මිත්තද්දු**. ති-මිත්‍ර ද්‍රොහි.

**මිත්තද්දුභ**. පු-මිත්‍රද්‍රොහී, මිතුරන්ට ද්‍රොහි කරන්නා.

**මිත්තද්දුහි**. පු-මිත්‍ර ද්‍රොහියා.

**මිත්තභෙදී**. පු-මිත්‍රභෙදකයා, මිත්‍රද්‍රොහියා.

**මිත්ති**. ඉ-යහළුකම, මිත්‍රකම.

**මිත**. ති-ප්‍රමාණ කරණ ලද්ද.

**මිතභාසන**. න-රහස් කථාව, ප්‍රමාණ කථාව.

**මිතභාණී**. පු-ප්‍රමාණකථා ඇත්තා, පමණට කථා කරන්නා.

**මිථිලා**. ඉ-මියුලු නුවර.

**මිථු**. මිත්‍රභාවය, සමගිය.

**මිථුන**. න-ස්ත්‍රී පුරුෂ සංගමය, මිථුන රාසිය.

**මිථො**. අ-ඔවුනොවුන්, රහස් යනාර්‍ථයෙහි

**මිඛ**. න-නිද්‍රාව, චිත්තයාගේ අලස බව, චිත්තයාගේ අකර්‍මණ්‍යය.

**මිඛ**. පු-මිඛයෙන් යුත් තැනැත්තා, අලසයා.

**මිද**. d. භූ-සිනෙහෙ, ස්නෙහයෙහි, මෙදති, ස්නෙහ උපදවයි.

**මිද**. d. භූ-පීඩායං, පෙළීමෙහි, මිදති, පෙලයි.

**මිද**. d. දි-සිනෙහෙ, ස්නෙහයෙහි, මිජ්ජති, ස්නෙහ උපදවයි, මිනෙනා, මෙතතා.

**මිද**. d. චු-පීතියං, ප්‍රීතියෙහි, මෙදති, මෙදයති, ප්‍රීතිවෙයි.

**මිණන**. න-ප්‍රමාණ කිරීම, මැණීම.

**මිණාති**. ක්‍රි-(d. සවා, මි, මානෙ, ප්‍රමාණයෙහි + නා + ති) ප්‍රමාණ කරයි.

**මිප**. d. සු-ඛෙපෙ, ක්‍ෂපයෙහි, මිණොති, දමයි.

**මිම**. d. භූ-ගමනෙ, යාමෙහි, මිමති, යෙයි.

**මිය්‍යති**. ක්‍රි-(d. භූ. මර, පාණචාගෙ, ප්‍රාණ ත්‍යාගයෙහි + ති) මැරෙයි.

**මිය්‍යමාන**. පු-මැරෙණ, මැරෙනු ලබන.

**මිල**. d. භූ-ආදානෙ, ගැණීමෙහි, මිලති, ගණියි.

**මිල**. d, භූ-සිලෙසනෙ, මෘදු කිරීමෙහි, මිලති, මෘදුකෙරෙයි.

**මිලක්ඛ**. පු-මෙලච්ඡ, වනචර.

**මිලක්ඛජාති**. ඉ-මෙලච්ඡ ජාතිය, වනචර ජාතිය.

**මිලක්ඛදෙස** පු-ප්‍රත්‍යන්ත දෙශය, පිටිසර දෙසය.

**මිල්ලිකා**. ඉ-මෘදු කම, මොලොක් කම.

**මිලාදි**. ගතනවිතාමෙ, සිරුරු මැඩිමෙහි, මලානිකවීමෙහි, මිලායති, මලානික වෙයි.

**මිලාත**. න-මලානිකවනලද.

**මිලායති**. ක්‍රි-(d. භූ. මිලෙ, මලානෙ, මලානික වීමෙහි + ති) මලානික වෙයි.

**මිළල**. d. භූ-මලානෙ, මලානික වීමෙහි, මිලායති, මලානික වෙයි.

**මිළෙඡ**. d. භූ-අව්‍යත්තෙසද්දෙ, නොවියත් හඬෙහි, මිලච්ඡති, මෙලච්ඡ ශබ්ද කෙරෙයි.

**මිලෙඡ**. d. චු-අව්‍යත්තෙසද්දෙ නොවියත් බසෙහි, මිලච්ඡති, මිලච්ඡයති, මෙලච්ඡ බස් කියයි.

**මිලෙට**. d. භූ-උම්මාදෙ, උමතුවෙහි, මිලෙටති උමතුවෙයි; පිස්සුවෙයි.

**මිස්ස**. පු-මිශ්‍ර, හාමු, කලවන්.

**මිස්ස**. d. චු-පූජායං, පිදීමෙහි, මිසෙසති, මිස්සයති, පුදයි.

**මිස්ස**. d. චු-මිස්සනෙ, මිශ්‍රකිරීමෙහි, මිසෙසති, මිස්සයති. මුසුකරයි, මිශ්‍ර කරයි.

**මිස්සක**. පු. න-මිශ්‍රකළ, ශක්‍රයාගේ උයන, මිහිත්තලයෙහි පිහිටි එනම් පර්‍වතය.

**මිස්සකෙස**. පු-ගැටගැසුණු කෙස් ඇත්තා, හැඩපළු ඇති කෙස්වලින් යුත් තැනැත්තා.

**මිස්සිත**. ති-මිශ්‍රකරණ ලද, කලවන්වන ලද.

**මිස්සන**. න-මිශ්‍රවන, මිශ්‍රය.

**මිස**. d. භූ-සද්දෙකොධෙච, ශබ්දයෙහි හා ක්‍රොධයෙහි, මෙසති, ශබ්ද කෙරෙයි, ක්‍රොධ කෙරෙයි.

**මිසු**. d. භූ-සෙචනෙ, ඉසීමෙහි, මෙසති, ඉසයි.

**මිසෙසති**. ක්‍රි-(d. චු. මිස්සනෙ, මිශ්‍රකිරීමෙහි + ණෙ + ති) මිශ්‍ර කෙරේ.

**මිහ**. d. භූ-තෙමනෙ, තෙමීමෙහි, මිහති, තෙමයි, උම්මිහති, මෙහෙ.

**මිඝිත**. තෙමන ලද, තෙත්කළ.

(18319)

## මී-මු

**මිඪ**. පු-පිළ, කයියෝරුව.

**මියති**. ක්‍රි-(d. දි. මී. හිංසායං, හිංසාවෙහි + ති) මැරෙයි.

**මීල**. d. භූ නිමීලනෙ, ඇස පියවීමෙහි, මිලති, ඇස පියයි, උම්මිලනං, නිමීලනං

**මීල**. d. චු-මීලනෙ, ඇස නොදැල්වීමෙහි, මීලෙති, මීලයති, ඇසපිය නොගසයි.

**මීලති**. ක්‍රි-(d. චු. මීල, මීලනෙ, ඇසපිය ගැසීමෙහි + ති) ඇසිපිය ගසයි.

**මීන**. පු-මත්ස්‍යයා, මීන රාශිය.

**මීනකෙතන**. පු-අනඞ්ගයා, මරධ්වජයා

**මීළ්හ**. න-අසුචිය, ගූථය

**මු**. d. භූ-බන්ධනෙ, බැඳීමෙහි, මුවති, බඳියි.

**මු**. d. ක්‍රි-බන්ධනෙ, බැඳීමෙහි, මුණාති, බඳියි.

**මුකුර**. පු-කැඩපත, ආදර්ශය.

**මුකුල**. ති-මූකල කැකුල, මේරු මල්කැකුල

**මුක්ක**. පටි මුක්ක.

**මුඛ**. න-මුහුණ, කට; උපාය, ආදිය, උදුන, මාර්ගය, ප්‍රධාන.

**මුඛ**. ති-මුඛ්‍ය උතුම්දෙය, ප්‍රධාන.

**මුඛදුග්ග**. පු. න-නපුරු මුව ඇත්තා, අභූත වාදියා.

**මුඛවලිමක**. පු-තොල්හි දිව පිහිටුවා ශබ්ද කිරීම=උරුසත්බැම=සිවුරුසත් බැම=එළුසත් බැම.

**මුඛඬෙණ්ඩිම**. පු-දෙකපෝලයෙහි බෙරගැසීම. වාතයෙන් දෙකපොල පුරවා එහි බෙර ගැසීම.

**මුඛපූලල**. න-මුඛාලඞ්කාර කරණ සවර්ණමය ආභරණ විශෙෂයක්, මුවසරසන ආබරණයක්.

**මුඛභෙරී**. ඉ-කට බෙර ගැසීම, මුඛය විවෘත කොට ශබ්ද නගින පරිදි අතින් මුඛයට ගැසීම.

**මුඛර**. පු රළුවචන ඇත්තා, අප්‍රිය වාදියා, මුකරියා (මුඛ + බර)

**මුඛරතා**. ඉ-මුඛර බව, මුකරි බව.

**මුඛසඤ්ඤත**. න-මුඛයෙන් සංයත ඇතිවීම, වාක්චාරය රැක ගැණීම.

**මුඛසත්ති**. ඉ-වචන ශස්ත්‍රය, රළු වචන.

**මුඛාධාන**. න-මුව වළල්ල, කටකලියාව.

**මුඛාලම්බර**. පු-මුඛයෙහි පනාබෙර ගැසීම.

**මුඛ්‍ය**. ති-ප්‍රමුඛ, ප්‍රධාන, උතුම්.

**මුග්ග**. න-මුං, මුං ඇට.

**මුග්ගතිය**. න මුං වගීයක්.

**මුග්ගර**. පු-මුගුර, පොල්ල.

**මුග්ගසූප්‍යතා**. ඉ-මුං ව්‍යඤ්ජනය වැනි සවභාවය මුං ව්‍යඤ්ජනය වැනි කථා (එබඳු ව්‍යඤ්ජනයක වූ ඇට සියල්ලම තැම්බෙන්නෙ නැ. එවැනි කථා ඇත්තාගේ වචනවල බොරු ද ඇත.)

**මුග්ගසූප**. මුං ඇට මාලුව.

**මුඞ්ගුස**. පු-මුගටියා

**මුච්ඡ**. d. ති-මුච්ඡනෙ, මූලාවෙහි, මුච්ඡති, මූලාවෙයි, මූර්ඡාවෙයි.

**මුච්ඡති**. ක්‍රි-(d. කි. මුච්ඡ, මුච්ඡනෙ මූලාවෙහි + ති) මූලා වෙයි. සිහි මූලාවෙයි.

**මුච්ඡන**. න-මූර්ඡාව, මූලාවීම.

**මුච්ඡනා**. මූර්ජාව, මූලාව.

**මුච්ඡිත**. ති-මූර්ඡාවන ලද, මූලාවන ලද.

**මුච**. d. චු-මොචනෙ, මිදීමෙහි, මොචෙති මොචයති=මුදයි.

**මුච**. d. රු-මොචනෙ, මිදීමෙහි, මුඤ්චති, මිදෙයි.

**මුච**. d. දි-මොචනෙ, මිදීමෙහි, මුඤ්චති, මිදෙයි

**මුච**. d. දි-මොචනෙ, මිදීමෙහි, මුචචති, මිදේ.

**මුචලින්ද**. පු-මිදෙල්ල ගස.

**මුචි**. d. භූ-මජ්ජනෙ, ඇඟ ඉලීමෙහි, මුඤ්චති. ඇඟ ඉලයි.

**මුජ්ජ**. d. භූ-නිමුජ්ජනෙ, ගැලීමෙහි, කිමිදීමෙහි මුජ්ජති, ගැලේ, කිමිදියි, නිමග්න වෙයි.

**මුජ්ජති**. ක්‍රි-(d. භූ. මුජ්ජ, මුජ්ජනෙ, ගැලීමෙහි + ති) ගැලෙයි. උම්මුජ්ජති, නිමුජ්ජති.

**මුජි**. d. භූ-සද්දෙ, ශබ්දකිරීමෙහි, මුඤ්ජති, ශබ්දකරයි.

**මුඤ්ච**. d. භූ-මිදීමෙහි, මුඤ්චති, මුදයි, මොචනය කරයි.

**මුඤ්චති.** ක්‍රි-(d. භූ මුඤ්ච, මුඤ්චනෙ, මිදීමෙහි+ති) මුදයි.

**මුඤ්චන**. න-මිදීම, මොක්ෂය.

**මුඤ්චනක**. පු-මිදීම, මුදන්නා, මොක්ෂය.

**මුඤ්ජ**. පු-මුදු තණ, මත්ස්‍ය විශෙෂයක්.

**මුට්ට**. d. චු-චුණ්ණෙ, සුණුකිරීමෙහි, මොටෙති මොටයති, සුණු කරයි, චූර්ණකරයි.

**මුට්ඨ**. ති-මුලාව, සිහි නැතිවීම.

**මුට්ඨසම්ම**. න-මුලා සිහිය, සිහි මුලාව.

**මුට්ඨස්සති**. ඉ-මුලාසිහිය, මුලාසිහි ඇත්තා

**මුට්ඨි**. පු-ඉ-මිටිය, කඹුරුමිටිය, ඇඟිලිවකුටු කිරීම වූ මිට.

**මුට්ඨික**. න මිටට අයත්, මිට.

**මුට**. d. භූ-මද්දනෙ, මැඩීමෙහි, පෑගීමෙහි, මොටති, මඩියි.

**මුට**. d. භූ-ආක්ඛෙපෙ, ආක්ෂෙපයෙහි, මුටති අතපයාදිය හෙලයි, දිගු කරයි.

**මුඩි**. d. භූ-ඡෙදනෙ, සිඳීමෙහි, මුණ්ඩති, සිඳියි

**මුණ්ඩ**. පු-මුඩා, මුඩුහිස ඇත්තා, හිසකෙස් නැත්තා, තට්ටයා.

**මුණ්ඩක**. පු-මුඩා, මුඩුහිස ඇත්තා.

**මුණ්ඩච්ඡද්ද**. පු-සඳලු සහිත ගෙය, චන්ද්‍රිකා ශාලා සහිත ගෙය.

**මුණ්ඩපබ්බත.** පු-මුඩු පර්වතය, ගස්වැල් ආදිය රහිත පර්වතය.

**මුණ්ඩන** න-මුඩුකිරීම, කෙස්ලොම් ආදිය කපා මුඩු කිරීම.

**මුණ්ඩික**. පු-මුඩුකරන්නා, කරණවැමියා.

**මුණ්ඩිත**. ති-මුඩුකරණ ලද

**මුණ්ඩිය**. පු-මුඩා, මුඩුබව.

**මුණ්ඩී**. පු-මුඩුකරන්නා, කරණවැමියා, හිස මුඩු කරන්නා, ඇම්බැට්ටයා.

**මුණ්ඩෙති**. ක්‍රි-මුඩු කරයි, මුඩු කරවයි.

**මුණ**. d. භූ-ඤාණෙ, දැණීමෙහි, මුණති, දනී.

**මුණ**. d. කි-ඤාණෙ, දැණීමෙහි, මුණති, දනී.

**මුත්ත**. d. චු-පගසරණෙ, වැගිරීමෙහි, මුත්තෙති මුත්තයති, වැගිරෙයි.

**මුත්ත**. චු-මුදනලද, ලිහන ලද.

**මුත්ත**. න-මූත්‍රය, පස්සාව.

**මුත්තක**. න-වම්මුතු, කලාඳුරු.

**මුත්තා**. ඉ-මුතු, වම්මුතු, කලාඳුරු.

**මුත්තාචාර**. පු-(මුත්ත+අනචාර) මුදනලද ආචාර, සිඳිනලද කුල සිරිත් ඇති.

**මුත්තාගුණ**. න මුතුදම, මුතුවැල, මුතුමාලය

**මුත්තාදි**. පු-මූත්‍රාදිය.

**මුත්තා මුත්ත**. න-අතින් මුදා දනුමුදද පහර දෙන මුගුරු ආදී ආයුධ විශෙෂය.

**මුත්තාවලි**. ඉ-මුතුවැල, මුතුහර, මුතුමාලය.

**මුත්තාහාර**. පු-මුතුහර, මුත්තාවලිය.

**මුත්ති**. ඉ-මිදීම, නිර්වාණය, මොක්ෂය.

**මුත්තික**. න-මුතු.

**මුත්ථ**. d. චු-රාසිකරණෙ, රැස් කිරීමෙහි, මුත්ථෙති, මුත්ථයති, රැස් කෙරෙයි.

**මුත**. න-ස්පර්ශය, ස්පර්ශකළ.

**මුතමඞ්ගල**. න-ස්පර්ශකරණ ලද්ද, මඞ්ගලයයි ගන්නා දිට්ඨිය.

**මුති**. ඉ-ප්‍රඥාව, පඤ්ඤා.

**මුතිඞ්ග**. පු-මිහිඟු බෙරය.

**මුතිමන්තු** පු-ප්‍රඥා ඇත්තා.

**මුතින්ද්‍රිය**. න-මෘදුවූ ඉන්ද්‍රියය, ඉන්ද්‍රිය මෘදුභාවය

**මුද්දා**. ඉ-මුද්‍රා ශාස්ත්‍රය, මුදුව, මුද්ද, මුදුහිරුව.

**මුද්දික**. පු-හස්ත මුද්‍රාදිය පුරුදු කරණ තැනැත්තා.

**මුද්දිකා**. ඉ-මිදිවැල, පේරුස් මුද්ද.

**මුද**. d. චු-රාසිකරණෙ, රැස් වීමෙහි, මුත්ථෙති මුත්ථයති, රැස්වෙයි.

**මුද**. d. භූ=සන්තොසෙ, සතුටු වීමෙහි, මුදති සතුටු වෙයි.

**මුදති**. ක්‍රි-(d. භූ. මුද, සන්තොසෙ, සතුටුවීමෙහි+ති) සතුටු වෙයි.

(18418)

**මුද්**. ඉ-සන්තොෂය ප්‍රීතිය.

**මුදිත**. ති-සතුටුවන ලද, තුටුවන ලද, තොස් වන ලද.

**මුදිතා**. ඉ-මුදිතාව

**මුදු**. ති-මොලොක්දෙය, අතීක්ෂණ දෙය, රළු නොවන.

**මුදුක**. ති-මෘදු. මොලොක්.

**මුදුතච**. පු-රුක්බුරුද, මොලොක් සිවිය.

**මුදුතලුන**. පු-මෘදු තරුණ, මොලොක් සහ තරුණ.

**මුදුතා**. ඉ-මෘදු බව.

**මුදුපිට්ඨික**. පු මොලොක් පිට ඇත්තා. පිට නැමීමට පුරුදු කළ බැවින් මෘදු පිට ඇත්තා.

**මුද්ධ**. පු-හිස, ඉස, ඔලුව.

**මුද්ධ**. ති-මූඪ අඥය.

**මුද්ධජ**. පු-මුදුනෙහිත්, කෙස්, මූර්ධන්‍යාක්ෂර, ට, ඨ, ඩ, ඪ, ණ, ර, ළ යන අකුරු

**මුද්ධට**. පු-මෝඪ සවභාව ඇත්තා.

**මුද්ධමාල්‍ය**. න-මුදුන් මල් කඩ.

**මුද්ධාභිඝාත**. න-හිසට පහරදීම, හිසට ගැසීම.

**මුද්ධාභිසිත්ත**. පු-මස්තකයෙහි අභිසෙක කරණ ලද, කිරීටධාරි රජු. ක්ෂත්‍රියයා

**මුද්ධාවසිත්ත**. පු-මස්තකයෙහි අභිසෙක කළ

**මුද්ධා**. අ-නිරර්ථකයෙහි, හිස්, තුච්ඡ.

**මුන**. න-ඥානය, නුවණ.

**මුනන**. න-සත්‍යය සොයා දැන ගැණීම, ඥානය, නුවණ.

**මුනාති**. ක්‍රි-(d කි. මුන-ඤාණෙ, දැන ගැනීමෙහි+ති) දැනගණීයි.

**මුනි**. පු-බුදුරජ, ධ්‍යායිහු, තපස්වියා.

**මුනින්ද**. පු-මුනීන්ද්‍ර, මුනිරජ, බුදුරජ.

**මුබ්බ**. d. භූ-බන්ධනෙ, බැඳීමෙහි, මුබ්බති, බඳියි.

**මුබ්බා**. ඉ-මොරගස.

**මුබ්බි**. ඉ-දුනුදිය.

**මුම්මු**. න-කැඩීමේ හා හැප්පීමේ ශබ්දය.

**මුය්හති**. ක්‍රි-(d. භූ-මුහ, මෙච්චිත්තෙ, මුලා-වීමෙහි+ති) මුලා වෙයි.

**මුය්හන**. න-මුලාවීම.

**මුර**. d. භූ-වෙඨනෙ, වෙළීමෙහි, මුරති, වෙළයි.

**මුරජ**. පු-මිහිඟු බෙරය, මුතිඞ්ගය.

**මුරුමුරායති**. ක්‍රි-මුරු මුරු යන අනුකරණයෙන් ශබ්ද කරයි.

**මුරුමුරා**. අ-ඇඹරීමේ හා සැඩීමේ ශබ්දය.

**මුස**. d. භූ-චොරියෙ, සොරකම් කිරීමෙහි මුසති, සොරකම් කරයි.

**මුස**. d. භූ-මොහෙ, මුලාවීමෙහි, මුසති, මුලා වෙයි.

**මුස**. d. කි චොරියෙ, සොරකමෙහි මුසාති සොරකම් කරයි.

**මුස**. d භූ-ගරහනෙ, ගැරහීමෙහි, මුසති, ගරහයි.

**මුසති** ක්‍රි-(d. භූ-මුස, ගරහණෙ, ගැරහීමෙහි +ති) ගරහයි, සොරකම් කරයි.

**මුසල**. පු-මෝල, මොහොල, වී කොටන මෝල් ගස.

**මුසලක**. න-කුඩා මෝල් ගස, කුඩා ළමයින් සෙල්ලම් කරණ කුඩා මෝල් ගස.

**මුසලමාරක**. පු-මහමදිකජනය, මුස්ලිම් ජනයා.

**මුසා**. අ-බොරුබස, අසත්‍යයෙහි.

**මුසාවාද**. පු-බොරුබස, බොරුකීම.

**මුස්සති**. ක්‍රි-(d. භූ. මුස, මෝසෙ, මුලාවීමෙහි +ති) මුලාවෙයි, විනාසවෙයි.

**මුස්සන**. න-මුලාව, විනාසය.

**මුහ**. d. භූ-මුච්ඡායං, අදස්සනෙව මුසපත්වීමෙහි, නොදැක්මෙහි, මුය්හති, මුසපත් වෙයි.

**මුහ**. d. දි-අදස්සනෙ, නොදැක්මෙහි, මුය්හති පමමුය්හති, මුලාවෙයි.

**මුහුං**. අ-නැවත නැවත යනාර්ථයෙහි.

**මුහුත්ත**. පු-මොහොත, ක්ෂණ ලය දශයක් පවත්නා කාලය, ඛණලය බලනු.

**මුහුත්තික**. පු-නැකැත් කියන්නා, නැකතියා

**මුහුම්භාසා**. ඉ-කී තෙපුල් නැවත කීම:

**මුළාල**. පු. න-නෙළුම්දලි මුළාල.

**මුළා** (ළා) **ලපුප්ඵ**. න-පද්මය, පියුම්, මල.

(18471)

## මූ

**මූග.** පු-ගොලුවා, කථා විරහිතයා.

**මූත.** ති-බඳනා ලද්ද.

**මූල.** d. භූ-පතිට්ඨායං, පිහිටීමෙහි, මූලති, පිහිටයි.

**මූල.** d. චු-උප්පත්ති, හට ගැන්මෙහි, මූලෙති මූලයති, හටගණී.

**මූල.** d. චු-ඡේදන සොධනෙසු; සිඳීමෙහි, පිරිසිදු කිරීමෙහි, මූලෙති, මූලයති, සිඳියි, පිරිසිදු කරයි.

**මූල.** න-මූලේ නැකත, සමීපය, අසාධාරණ හෙතු ආදිය ලොභාදිය, මිල=මුදල, වෘක්ෂා දීන්ගේ මූල්.

**මූලක.** පු. න-මූලපලා.

**මූලකන්ද.** න-අල; මූල්, අල වර්ග, බතල ආදිය.

**මූලකම්මට්ඨාන.** න-මූලකර්මස්ථානය.

**මූලගන්ධ.** පු-මූල්ගඳ, මූල්වලින් සුවඳ හමන සැවැන්දරා ආදිය.

**මූලබීජ.** න-මූල් බිජු = කහ ඉගුරු සිගුරු පියල් කටුකරෝසණ ආදිය.

**මූලා.** ඉ-මූලේ නැකත.

**මූලායපටිකස්සන.** න-මූලට ඇදීම, නැවතත් මුල පටන් වත පියයුතුවූ විනය කර්මයක්.

**මූලික.** පු-ප්‍රධානයා, සමූහයකගේ අධිපතියා.

**මූලොච්ඡින්න.** ති-මුලින් සිඳින ලද, මුලින් කපා දමනලද, උසුන් මුල් කළ.

**මූල්‍ය.** න-මිල, වැටුප්, මුදල.

**මූසා.** ඉ-කෝච්චය, කඹුරු උදුන.

**මූසික.** පු-මීයා, උන්දුරයා.

**මූසිකාදරී.** ඉ-මී හිල, මී ගුල, මී බෙනය.

**මූසිකච්ඡින්නක.** ති-මීයන් විසින් කන ලද්ද, මීයන් විසින් කන ලද වස්ත්‍ර බලා පලාපල කීම.

**මූසික විජ්ජා.** ඉ-මීයන් පිළිබඳ විද්‍යාව.

**මූළ.** d. භූ. සුඛෙ, සැපයෙහි, මූළති, සැප ඇතිවෙයි.

**මූළ්හ.** ති-ජඩ අය, මුළාවූ අය, ජඩගතිය.

**මූළ්හගබ්භ.** පු-මූඪගර්භය, විපතට පැමිණි දරුගැබ.

**මූළ්හරූප** න-මුළාවන සවභාව, මුලාවන ගතිය.

## මෙ–මො

**මෙ.** d. භූ-දාන දානෙසු, දීමෙහි ගැණීමෙහි, මෙති, මයති, දෙයි, ගණී.

**මෙ.** අ-මා විසින්, මට, මාගේ.

**මෙඛලා.** ඉ-මෙඛලාදාමය, මෙවුල්දම, රසනා දාමය.

**මෙඛලිකා.** ඉ-බඳපිටිය, හවඩිය, මෙඛලාදාමය කැසපට.

**මෙඝ.** අ-වැහිවලාව, වලාකුළ.

**මෙඝනාථ.** පු-මෙඝයට අධිපතියා, වැහිකළු ආරක්ෂකයා කොට ඇත්තා.

**මෙට.** d. භූ-උම්මත්තෙ, උමතුබැව්හි, මෙටති, උමතුවෙයි.

**මෙටක.** ති-තෘෂණ වසතු, කළු ලුණු.

**මෙධ.** d. භූ-හිංසායං, හිංසා කිරීමෙහි, මෙධති හිංසා කරයි.

**මෙධි.** ඉ-කණුව, ස්ථම්භය, ස්ථූපයක කොටසක්

**මෙචක.** පු-වාලධිය, ඇස්පිල.

**මෙජති.** ක්‍රි-(d. දි. මදි, හාසෙ, සිනා ඉපදීමෙහි + ති) තරවෙයි.

**මෙජ්ඣ.** ති-පවිත්‍රදෙය, පිරිසිදු.

**මෙණ්ඩ.** පු-පොරගසන එළුවා, එළුවා.

**මෙණ්ඩක.** පු-එළුවා, පොරගසන එළුවා.

**මෙණ්ඩපථ.** න-බැටළුවන් යන මාර්ගය, බැටළු පාර.

**මෙණ්ඩයුද්ධ.** න-එළු යුද්ධය, එළුවන් පොර ඇනීම.

**මෙත්ත.** පු-මෛත්‍රය.

**මෙත්තා.** ඉ-මෛත්‍රය.

(18515)

**මෙත්තා කම්මට්ඨාන**. න-මෛත්‍රීකර්ම ස්ථානය, මෙත් කමටහන.

**මෙත්තාචෙතො විමුත්ති**. ඉ-මෛත්‍රී චිත්ත විමුත්තිය.

**මෙත්තෙය්‍යතා**. ඉ-මෛත්‍රෙය්‍ය භාවය.

**මෙත්තායති**. ක්‍රි-(මෙත්තා + ආය + ති) මෛත්‍රී කෙරෙයි.

**මෙත්ති**. ඉ-මෛත්‍රිය.

**මෙත්තෙය්‍ය** ති-මෑනියන්ට හිත ක්‍රියා, මෛත්‍රියෙන් යුත් බව.

**මෙථුන**. න-සඞ්ගමය, රති ක්‍රීඩාව, ස්ත්‍රී පුරුෂ සඞ්ගමය.

**මෙත්තායනා**. ඉ-මෛත්‍රී කිරීම.

**මෙථුනක**. පු-මෙථුන.

**මෙථුනා විරති**. ඉ-මෛථුන විරතිය.

**මෙද**. පු-ශරීර ගත එනම් මේදස් තෙල.

**මෙදක**. පු-මේද බලනු.

**මෙදිනී**. ඉ-පෘථිවිය, පොළව.

**මෙදෙති**. ක්‍රි-(d. භූ. මෙද, හිංසාසු, හිංසාවෙහි + ණෙ + ති) තර කෙරෙයි.

**මෙධ**. d. භූ-පීඩායං, සාමග්ගියෙච, පෙළීමෙහි, එකතුවීමෙහි, මෙධති, පෙළයි එකතුවෙයි.

**මෙධ**. පු-ප්‍රඥාව, ඥානය, පැණ.

**මෙධග**. පු-කලහය, ඩබරය, කලබලය.

**මෙධා**. ඉ-ප්‍රඥාව.

**මෙධාවී**. පු-ප්‍රඥා ඇත්තා, පණ්ඩිතයා.

**මෙධාවිතා**. ඉ-ප්‍රාඥභාවය, පාණ්ඩිත්‍යය.

**මෙරය**. න-පුෂ්පාදියෙන් කළ සුරාව, පුප්ඵාසව, ඵලාසව මධ්වාසව ගුඩාසව, සසම්භාර සංයුත්තාසව යන ආසව පස.

**මෙරිත**. ති-බියෙන් එලවනලද, බියගන්වන ලද.

**මෙරු**. පු-මහමෙර, මෙරු පර්වතය.

**මෙවු**. d. භූ-සෙවනෙ, සෙවනයෙහි, මෙවති, සෙවනය කරයි.

**මෙස**. පු-පොරගසන එළුවා, එළුවා, එනම් රාශිය.

**මෙහ**. පු-ප්‍රමේහය, ප්‍රමෙහ නම් රෝගය.

**මෙහන**. න-ස්ත්‍රී පුරුෂ නිමිති, ස්ත්‍රී පුරුෂ ලිඟු.

**මොක්ඛ**. d. භූ-මොචෙ, මිදීමෙහි, මොක්ඛති, මිදේ

**මොක්ඛ**. d. චු-පටික්ඛෙපෙ, ප්‍රතික්ෂෙපයෙහි, මොක්ඛෙති, මොක්ඛයති, ප්‍රතික්ෂෙපකරයි.

**මොක්ඛ**. පු-මොක්ෂය, මිදීම, නිවණ.

**මොක්ඛ**. ති-ප්‍රධාන, උතුම්, පාමොක්ඛ.

**මොක්ඛති**. ක්‍රි-(d. රු. මුච, මොචනෙ, මිදීමෙහි + ති) මිදෙයි.

**මොක්ඛචික**. න-කරණම් පැණීම, පිණුම් පැණීම, ඉහළට හා පහතට පෙරළීම.

**මොක්ඛාදික**. පු-මොක්ෂාදිය.

**මොග්ගල්ලාන**. පු-එනම් කුලය, එනම් තෙරිඳු.

**මොඝ**. ති-තුච්ඡ, හිස්, නිෂ්ප්‍රයොජන, නිෂ්ඵල.

**මොඝ පුරිස**. පු-හිස් පුරිෂයා, ගුණධර්මාදියක් නැත්තා.

**මොඝසුත්ත**. න-දූව ආදියෙහි දූලි කහ ආදියෙන් ගසන නූල, ඇද ඇරගැණීමට ගසන නූල.

**මොච**. පු-කෙසෙල් ගස, කදලී.

**මොචන**. න-මිදීම, බන්ධනයෙන් මුක්තවීම, ශුක්‍රමොචනය.

**මොචා**. ඉ-ඉඹුල්ගස.

**මොචාපන**. න-මුදවීම, නිදහස් කර ලීම.

**මොදක**. පු-අත්වට, අග්ගලා, සුරාබීජ, සුරා මුහුන්.

**මොදන**. න-සතුටුවීම, ප්‍රීතිවීම, සන්තොෂවීම.

**මොදනා**. ඉ-සතුට, ප්‍රමෝදය, ප්‍රීතිය.

**මොදති**. ක්‍රි-(d. භූ. මුද, මොදනෙ, සතුටුවීමෙහි + ති) තුටුවෙයි.

**මොදර**. පු-සතුටුවීම, ප්‍රමොදවීම, ප්‍රීතිවීම.

**මොදෙර**. ක්‍රි-සතුටුවන්නේය, ප්‍රීතිවන්නේය.

**මොන**. න-නොබිණීම, ප්‍රඥාව, මාර්ගී ප්‍රඥාව.

**මොනිස්සං**. අ-දැන ගත්තෙමි, අවබොධ කෙළෙමි.

(18565)

**මෝනෙය්‍ය**. න-මුනිභාවය, නිශ්ශබ්දභාවය.

**මෝනෙය්‍ය කෝලාහල**. න-මුනීහු පිළිබඳ කථා ශබ්දය.

**මෝර**. පු-මොනරා, මයූරයා.

**මෝරමූලි**. ඉ-මයූර සිඛාව, මොනරකුඩුම්බිය, එනම් පැලෑටිය.

**මෝරපිඤ්ඡ**. න-මොනර පිල, මොනර පිලින් කළ අවාන.

**මෝරඟු**. න-ලපටි - ළඳරු තෘණ.

**මෝරඩා**. ඉ මොරගස.

**මෝරිනී**. ඉ-සෙබඩ, ගැහැණු මොනරා.

**මෝමූහ**. පු-මොහයෙන් මූළාව, මූළාවීම.

**මෝමූහත්ත**. න-මූලාබව.

**මෝමූළ්හ**. ති-මොහයෙන් මූළාවීම.

**මෝමුහුත්ත**. න-සිතේ චංචල බව, මෝඩකම, බයාදුබව.

**මෝලි**. ඉ-කොණ්ඩය, ධම්මිල්ලය.

**මෝලිබඩ**. ති-කොණ්ඩා බඳිනලද.

**මෝස**. පු-සොරකම.

**මෝසක**. පු-සොරා, හොරා.

**මෝසවජ්ජ**. න-මුසාවාදය, අසත්‍යවාදය.

**මෝසල්ල**. ති-දඬුවම්දීමට සුදුසු, මැරීමට සුදුසු.

**මෝහ**. පු-මෝහය, නුනුවණ, මුවජාව, අවිද්‍යාව.

**මෝහග්ගි**. පු-මොහාග්නිය.

**මෝහත්ත**. න-මූලාබව.

**මෝහනන**. න-මූලාව, පස්කම් රසය, පස්-කම් ගුණය.

**මෝහක**. පු-මූලාවන්නා.

**මෝහක්ඛය**. පු-මොහාක්‍ෂය, අහීත් ඵලය, නිවණ.

**මෝහනිය**. ති-මූලාවිය යුතු.

**මෝහනෙය්‍ය**. ති-මූලා වියයුතු.

**මෝහෙති**. ක්‍රි-(d. භූ. මුහ, මෙචිතෙනසු, මූලා වීමෙහි + ති) මූලාවෙයි.

## ය

**යං**. අ-හෙතුවීයෙහි.

**යක්ඛ**. d. චු පූජායං, පිදීමෙහි, යක්ඛති, යක්ඛයති, පුදයි.

**යක්ඛ**. පු-අමනුෂ්‍යයා, දෙවතාවා, වරම් රජහු, යකා, වෛශ්‍රවණයාගේ සෙවක පිරිස, ක්‍ෂයරොගය.

**යක්ඛධූමෝ**. පු-දුම්මල.

**යක්ඛරාජ**. පු යක්‍ෂරාජයා, වෙසමුණිරජ.

**යක්ඛි**. ඉ-යක්‍ෂණිය, යකින්නිය.

**යක්ඛිනී**. ඉ-යකින්නී, යක්‍ෂණිය.

**යකත**. න-අක්මාව.

**යකපෙල**. න-අක්මා මස් පිඩ.

**යකාර**. පු-ය යන අක්‍ෂරය.

**යගඝ**. අ-පදපූරණයෙහි, එබැවින්, එම නිසා.

**යඝගඝ**. අ-පදපූරණයෙහි, එබැවින්, ඒ නිසා.

**යජ**. d. භූ-දෙවච්චනෙ, දෙව පූජාවෙහි, යජති, පුදයි.

**යජති**. ක්‍රි (d. භූ. යජ, දෙවච්චනෙ, දෙවියන් පිදීමෙහි + ති) පුදයි

**යජන**. න-පිදීම, පූජාව, යාගය.

**යජනක**. පු-යාග කරන්නා, පූජකයා.

**යජාපෙති**. ක්‍රි-(d. භූ. යජ, දෙවච්චනෙ, දෙවියන් පිදීමෙහි, + යජ + ණපෙ + ති) යාග කරවයි, පුදවයි.

**යජු**. න-යජුර්වේදය.

**යජුබ්බෙද**. පු-යජුර්වේදය.

**යඤ්ඤ** පු-යාගය, දියයුතු දෙය, පිදියයුතු දෙය.

**යඤ්ඤාගාර**. න-යාග කරණ ගෙය, යාග මඩුව.

**යඤ්ඤාවාට**. පු-යාග ද්‍රව්‍ය දමන වළ.

**යඤ්ඤසුත්ත**. න-යාග සූත්‍රය, යාගය පිණිස ගන්නා හුය, යාග නූල.

**යඤ්ඤඞ්ග** පු-දිඹුල්ගස.

(18616)

**යට්ඨි.** පු. න-යෂ්ටිය, සැරයටිය, සත්රියන - සත්රියන් දිග දණ්ඩ.

**යට්ඨිමධු.** (මධුකා) ඉ-වැල්මී.

**යතන** න-වීර්‍යය, උත්සාහය

**යත්තක.** පු-යම් පමණ, යම් ප්‍රමාණයක්.

**යත්ථ.** අ-යම් තැනක, යම් හෙයකින්.

**යත්වාධිකරණ.** න-(යතො + අධිකරණ) යම්ක් හෙතුකොටගෙණ.

**යත්‍ර.** අ-යම් තැනෙක්හි, යම් කාරණයෙක්හි.

**යත.** d. භූ-උස්සාහෙ, උත්සාහයෙහි, යතති, උත්සාහ කරයි, වීර්‍ය කරයි.

**යත.** d. චු-නිද්‍යසං උපකාරෙච, නිද්‍යවෙහි හා උපකාර කිරීමෙහි, යතෙති, යතයති, නිද්‍යකරයි, උපකාර කරයි.

**යත.** d. චු-නීය්‍යාතනෙ, පාවාදීමෙහි, යතති, පාවාදෙයි.

**යත.** ති-සංයමයෙහි, සංසිඳීමෙහි, සංයත.

**යතචාරී.** පු-සංයතවූවහු සංවරණය ඇත්තා, හැසුරුම් ඇත්තා.

**යතත්ත.** පු-සංසිඳුනු සිත් ඇත්තා.

**යතති.** ක්‍රි-නිය්‍යාතනය කරයි.

**යතන.** න-උත්සාහය, ධෛර්‍යය.

**යති.** පු-ඉන්ද්‍රිය දමනය ඇත්තා, යතීහු, මුනි, යතීහු, ඡන්දශ්ශාස්ත්‍රයෙහි ප්‍රකාශ විරාම ස්ථානය.

**යතින්ද්‍රිය.** න-සංසිඳුනාවූ ඉන්ද්‍රිය ඇත්තා.

**යතිරාජ.** පු-යතීන්ද්‍රයා, මුනීන්ද්‍රයා, බුදුරජ.

**යතිස්සර.** පු - යතිරාජ, මුනීන්ද්‍රයාණන් වහන්සේ.

**යතො.** අ-හෙත්වර්ථයෙහි, යම් හෙයකින්.

**යථතථං.** අ-අවිපරිතාර්ථයෙහි, සිඬවූ පරිදි.

**යථරිව.** අ-(යථා + ඉව) උපමායෙහි.

**යථං.** අ-යම්සේ, යම් පරිද්දකින්.

**යථාච** අ-උපමායෙහි, යම්සේ.

**යථාජාත.** ති-බාලයා, උපන් පරිදිවූ තැනැත්තා.

**යථාතං.** අ-යම්සේ ද එමෙනි.

**යථාධම්ම.** පු-දහම්වූ පරිදි, ශික්ෂවූ පරිදි, ආපත්තිවූ පරිදි, ධර්මානුකූල ලෙස.

**යථාව.** ති-සත්‍යවූ, ඇත්තවූ.

**යථාවක.** ති - අවශ්‍යක, අවශ්‍යයෙන් ම සත්‍යවූ.

**යථාකම්ම.** න කර්මය වූ පරිදි, කර්මානුකූල ලෙස.

**යථාක්කම.** පු-පිළිවෙල, පටිපාටිය.

**යථාකාල.** පු-සුදුසු කාලය, සුදුසු අවස්ථාව.

**යථා තථ.** න-සැබෑ තෙපුල.

**යථා තථ.** අ-අවිපරීතාර්ථයෙහි.

**යථා නාම.** අ-උපමායෙහි, යම්සේ නම්. යම් හැටියකින් නම්.

**යථානුධම්ම.** පු-දහම් වූ පරිදි, ධර්මය නො ඉක්මවා.

**යථාපරාධසාසන** න-විනය පිටකය.

**යථාපි.** අ-යම්සේ, උපමායෙහි.

**යථානුරූප.** න-අනුරූප පරිදි, යොග්‍ය ලෙස.

**යථානුසිට්ඨ.** පු-අනුසාසනා පරිදි, අනුශාසනා කළ ආකාරය.

**යථාභිරන්ත.** අභිරති පරිදි, කැමති පරිදි.

**යථාභුච්චං** අ-විද්‍යමාන පරිදි, සිදුවූ හැටියට.

**යථාභූත.** ති-සිඬ වූ පරිදි, විද්‍යමාන ලෙස, ඇති සැටි.

**යථාභූතඤාණ.** න ප්‍රත්‍යය සහිත නාමරූප පරිග්‍රහණ ඥානය.

**යථාහි.** අ-උපමායෙහි, යම්සේ.

**යථාවතො.** අ-සුදුසු ලෙස, සැහෙන පරිදි. ඇත්ත ලෙස.

**යථාරහ.** පු-(යථා + අරහ) සුදුසු පරිදි, යොග්‍ය පරිදි

**යථාසන්තික.** න-තමන්ට පැමිණි ආසනය නොවරදවා එහිම හිඳීම.

**යථාවජිත.** ති-කැමති පරදි, සිත්සේ.

**යථෙව.** අ-(යථා + එව) උපමායෙහි, යම්සේ.

**යදා.** අ-යම් කලෙක, යම් විටක.

**යදි.** අ-අනියමාර්ථයෙහි, ඉදින්, යම්හෙයකින්.

(18668)

**යදිදං.** අ-අනියමයෙහි, ඒ කවරේ ද, ඒ කුමක් ද.

**යදිවා.** අ-නොහොත්, හෙවත්.

**යදිච්ඡා.** ඉ-ඉච්ඡා ප්‍රවෘත්තිය, කැමති පරිදි.

**යදිච්ඡක.** ති-කැමැති පරිදි, ඉච්ඡානුරූප ලෙස,

**යන්ත්‍ර.** න-යන්ත්‍රය, යතුර.

**යන්ත.** d. චු-සංකුචිතෙ, හැකිලීමෙහි, යන්ත යති, හැකිළෙයි.

**යන්ත.** න-යන්ත්‍රය, යතුර.

**යන්තමන්ත.** න-යන්ත්‍ර හා මන්ත්‍ර.

**යන්ත නාලි.** න-යන්ත්‍රමය නාලිය, යන්ත්‍ර නලය.

**යන්ත සුත්ත.** න-මැසිමක, යන්ත්‍රයක යෙදූ නූල හෝ කම්බිය.

**යන්ත හත්ථි.** පු-යන්ත්‍රමය හත්ථියා, ඇතා.

**යන්තසුත්ත.** ති-මැසිමක යෙදුනු.

**යන්ත මුත්ත.** න-යන්ත්‍රයෙන් බන්ධනයෙන් මිදුනු සැර ආදිය.

**යන්ති.** ක්‍රි-(d. භූ යා, ගමනෙ, ගමන්හි + න්ති) යෙත්, යෙති.

**යන්තික.** ති-යන්ත්‍රයෙන් ගලපන ලද්ද.

**යන්තික.** පු-යාන්ත්‍රික, යන්ත්‍රවල නියුක්තයා

**යන්තෙති.** ක්‍රි-(d. චු. යන්ත, සංකොචනෙ, හැකිලීමෙහි + ති) යවයි, හකුළුවයි.

**යන්නූන.** අ-(යං + නූන) ඉතා යෙහෙකි.

**යප.** d. චු-යාපනෙ, යැපීමෙහි, යාපෙති, යපෙති, යැපෙයි, ජීවත් වෙයි, පවතියි.

**යපෙති.** ක්‍රි (d. චු. යප, යාපනෙ, යැපීමෙහි + ණෙ + ති) යැපෙයි, පොෂ්‍ය වෙයි.

**යභ.** d. භූ. මෙථුනෙ, මෙවුන්දම් සෙවීමෙහි, යභති, මෛථුන ධර්ම සෙවනය කරයි.

**යම.** පු-යමරජු, යුගලය, සංයමය.

**යම.** d. භූ-මන්දගමනෙ, ලැසිගමනෙහි, යමති, සෙමින් යෙයි.

**යම.** d. භූ-විරියෙ, වීර්‍ය්‍යයෙහි, වායමති, වෑයම් කෙරෙයි.

**යම.** d. භූ-අහිංසායං, අහිංසාවෙහි, යමති, හිංසා නොකරයි.

**යම.** d. භූ-වාරණෙ, නාසෙ, සද්දෙච, වැළකීමෙහි, නැසීමෙහි ශබ්ද කිරීමෙහි, සංයමති, සංසිඳෙයි.

**යම.** d. චු-අවිහිංසායං, අහිංසාවෙහි, යමෙති, යමයති, හිංසා නොකරයි.

**යමක.** න-යුගලය, යුග්මය, කුට්ටම.

**යමක කවාට.** න-යුග්ම කවාටය, කවුළු යුගලය, ජනේල කුට්ටම.

**යමකපාටිහීර.** න යමක ප්‍රාතිහාර්‍ය්‍යය, යුවල යුවලව රශ්මිමාලාවන් පවත්වන ලද ප්‍රාතිහාර්‍ය්‍යය.

**යමකපාටිහාරිය.** න-යමකපාටිහීරය.

**යමකපුත්ත.** පු-පුත්‍ර යුගලය, නිමුන් පුත් දෙදෙන.

**යමකප්පකරණ.** න-එනම් අභිධර්ම ප්‍රකරණය.

**යමකසාල.** පු-යුග්මශාල වෘක්ෂය, සල් රුක් දෙක, අතුපතරින් එකට බැඳුනු සල් රුක් දෙක.

**යමතග්ගි.** පූ-එනම් වේද කර්‍තෘ ඍෂිවරයා.

**යමදූත.** පු-යමයාගේ දූතයා, දෙවදූතයා.

**යමති.** ක්‍රි-(d. භූ. යම, නාසෙ, නැසීමෙහි + ති) නැසෙයි.

**යමපුරිස.** පු-යමරජුගේ සෙවක පුරිසයා, නිරිසතා.

**යමරාජ.** පු-යමරජු.

**යමල.** න-යුගල.

**යමලොක.** පු-අපාය, නිරය.

**යමවිසය.** පු-යමලොකය, යමයාගේ බලය.

**යමසාදන.** න-යමලොකය, යමයාගේ රාජධානිය.

**යමු.** d. භූ-පටිසෙධෙ, වැළැක්මෙහි, යමයති, වලකයි.

**යමුනා.** ඉ-එනම් මහ ගඟ.

**යව.** පු-යව ධාන්‍යය, ගෝධූම, එනම් වාතය.

**යවකුම්මාස.** පු-යවපිටියෙන් කළ පිට්ටු, යව පිඬු.

**යවක.** න-වී හෝ යව කුඹුර.

**යවන**. න-යොන් රට, අරාබි ආදි යවන රාජ්‍යයන්.

**යවන පුප්ඵ**. න-යොන් පුප්, සඳුන් මල්.

**යවස**. පු-තෘණ විශෙෂයක්, තණ වර්ගයක්, පිදුරු, ගව ආහාර.

**යවසී**. පු-කීර්ති ඇත්තා, යසස් ඇත්තා.

**යවසූක**. න-යව වී තණ්ඩුව, යව වී කොස්ස.

**යස**. පු. න-කීර්තිය, ගුණ ඝෝෂාව, ගුණ කථනය.

**යස දායක**. පු-යසස් දායකයා, සම්පත් දෙන්නා.

**යසපටි ලාභ**. පු-යසස් ලැබීම, කීර්ති ලාභය.

**යසවන්තු**. පු-යසස් ඇත්තා, සදකීර්ති ඇත්තා.

**යසස්සී**. පු-යසස් ඇත්තා

**යසු**. d. දි-උත්සාහ කිරීමෙහි, යසසති, උත්සාහ කරයි.

**යසො**. න-යසස, කීර්තිය, ප්‍රසිද්ධිය, උසස් තත්වය.

**යසොධරා**. ඉ-එනම් රාහුල මාතාව.

**යහිං**. අ-යම් තැනක.

## යා

**යා**. d. දි. ගමනෙ, යාමෙහි, යායති, යෙයි, පැමිණෙයි.

**යා**. d. භූ-ගමනෙ, යාමෙහි, යාති, යෙයි, පැමිණෙයි.

**යා**. ඉ-යම් සත්‍රියක් තොම, යමක් තොම.

**යාග**. පු-අශ්වමෙධාදි යාග, හෝම පූජා, දානය.

**යාග සම්පදා**. ඉ-යාග සම්පත්තිය.

**යාග පිණ්ඩ**. න-යාග දිනයන්හි දෙන පිඩු, දෙවදානය.

**යාගී**. පු-යාග කරන්නා, කපුවා.

**යාගු**. ඉ-කැඳ, හුලුකැඳ.

**යාච**. d. භූ-යාචනෙ, ඉල්වීමෙහි, යාචති, ඉල්වයි.

**යාච**. පු-යාඥුව, ඉල්ලීම.

**යාචක**. පු-යදියා, යාචකයා, ඉල්ලන්නා

**යාචති**. ක්‍රි-(d. භූ. යාච, යාචනෙ, ඉල්වීමෙහි + ති) ඉල්වයි, යාඥු කරයි.

**යාචන**. න-ඉල්ලීම, යාඥුව.

**යාචනක**. පු-යාඥු කරන්නා, ඉල්වන්නා, යදියා.

**යාචනා**. ඉ-යාඥුව, ඉල්ලීම.

**යාචයොග**. පු-ඉල්ලීමට හෝ යාඥුවට යොග්‍ය.

**යාචිත**. ති-ඉල්වන ලද, යාඥු කළ.

**යාචිතක**. පු-ඉල්වන්නා, යදියා.

**යාමිනී**. ඉ-රාත්‍රිය, රැය.

**යාජ**. න-බිලි පූජාව, දන්දීම, නිදහස.

**යාජක**. පු-යාග කරන්නා, පුදන්නා.

**යාජන**. න-යාගය, පිදීම.

**යාජිත**. ති-පුදන ලද, යාගකළ.

**යාජී**. පු-යාගකරන්නා, පුදන්නා.

**යාජෙති**. පු-පුදයි, යාගකරයි.

**යාත**. ති-ගිය, ගමන් කළ, පුරුද්ද, සිරිත.

**යාතනා**. ඉ-කම්කටුල.

**යාත්‍රා**. ඉ-ගමන, ප්‍රවෘත්තිය.

**යාති**. ක්‍රි-යෙයි, ගමනය කරයි.

**යාදිච්ඡක**. න-ඉච්ඡාපරිදි, ඇතිතාක්.

**යාදිස**. ති-යම්බඳු, යම් ආකාර, යාදිසක.

**යාථාව**. යථාභූත, සිදුවූ පරිදි, අවිපරීත.

**යාන**. න-ගමන, රථාදිය.

**යානසන්නිධි**. ඉ-යාන වාහන රැස්කර තැබීම.

**යානික**. පු-යානා ඇත්තා, යානාවෙන් හැසිරෙන්නා. සමථයානික, විපස්සනා යානික.

**යානිකත**. ති-යානාවක් මෙන් ආශ්‍රය කරණ ලද.

**යානී**. ති-යානා ඇත්තා.

**යාපෘ**. ති-යැපිය යුතු, පොෂ්‍යය විය යුතු.

(18769)

**යාප්‍යයාන**. න-සිවිගෙය, රත්සිවි ගෙය.

**යාපන**. න-යැපීම, සෑහීම.

**යාපනමත්ත**. ති-යැපිය යුතු පමණ, දිවි පැවැත්මට සෑහෙන පමණ, ජීවන ප්‍රමාණය.

**යාපෙති**. ක්‍රි-(d. භූ. යාප, යාපනෙ, යැපීමෙහි + ණෙ + ති) යැපෙයි, පොෂ්‍යය වෙයි.

**යාම**. පු-සංවරය, ප්‍රහරණ නම් වූ කාල විශෙෂය, කාලය ප්‍රථම යාමය මධ්‍යම යාමය පශ්චිම යාමය යන කාල පරිච්ඡෙදය.

**යාමකාලික**. ති-පූර්, මධ්‍යම, පශ්චිම යන යාම තුණට සීමා වූ කාලයට අයත්, (සිංහල පැය ගණනින් දවල් හෝ රෑ තිස් පැයින් තුණෙන් කොටසක් වූ දස පැය යාම නම් වේ.)

**යාති**. ක්‍රි-(d. භූ. යා, ගති පාපුණනෙසු, ගමින්හි + ති) යෙයි.

**යායී**. පු-යන්නා, ගමන් කරන්නා.

**යාව**. අ-පරිච්ඡෙද, සාකල්‍ය, ප්‍රකීණි, අවධි, අවධාරණ යනාදියෙහි.

**යාවක**. පු-ලාකඩ.

**යාවකීවං**. අ-යම්පමණ, යම්තාක්.

**යාවජීව**. න-ජීවිත සීමාව දක්වා, දිවිහිමියෙන්.

**යාවජීවික**. න-දිවි ඇතිතාක්, පණ තිබෙන තුරු.

**යාවත**. පු-යවන දෙසයට අයත්, තුරුක් තෙල්.

**යාවතක**. පු-යම් පමණ, යම්තාක්.

**යාවතතිය**. ති-තුන්වන වාරය දක්වා.

**යාවතා**. අ-පරිච්ඡෙදයෙහි, යම් පමණ.

**යාවතාව**. අ-ඒ තාක්, එපමණ.

**යාවතික**. ති-යම් පමණ, යම් ප්‍රමාණයක.

**යාවතිහං**. අ-බොහෝ දවස්, බොහෝ කල්.

**යාවත්තු**. පු-යම් පමණක්.

## යි-යූ

**යිට්ඨ**. ති-ඉටඨ, පුදනලද.

**යු**. d. චු-පටික්කූලෙ, පිළිකුල් කිරීමෙහි, යාවෙති, යාවයති, පිළිකුල් කෙරෙයි.

**යු**. d. භූ-මිස්සනෙ, ගමනෙව, මිශ්‍ර කිරීමෙහි හා යාමෙහි, යොති, යවති, මිශ්‍ර කෙරෙයි, යෙයි.

**යුග**. d. භූ-වාගෙ, හැරීමෙහි, යුඞ්ගති, හරියි.

**යුග**. පු-විය, වියදණ්ඩ, වියගස

**යුග**. න-කල්ප, යුග්මාර්ථය යුගලය, ජීවත් වන කාලය. ක්‍රෙතත් ත්‍රෙතත් ව්‍යාපර යන වර්ෂ ප්‍රමාණ කාල විශෙෂය.

**යුගකීල**. න-වියගසෙහි අග ගසන ඇණය.

**යුගග්ගහ**. පු-එකට එක කිරීම, යුගග්‍රාහය.

**යුගග්ගාහ**. පු-යුග ග්‍රහණය, එකට එක කිරීම.

**යුගනඞ්ගල**. න-වියගස හා නගුල

**යුගන්ත**.. පු-කපතැසීම, ලොක විනාශය, යුගාන්තය.

**යුගනද්ධ**. ති-එකට යෙදුනු, වියගසෙහි යොදන ලද.

**යුගනද්ධ**. ති-වියගසෙහි යොදනලද, රියෙහි බඳින ලද.

**යුගන්ධර**. පු-එනම් කුල පර්වතය, - රියකඳ, ඒරිය කඳ.

**යුගපත්ත**. පු-යුග්මපත්‍ර, කොබෝලීල.

**යුගමත්ත** න-විය දණ්ඩක ප්‍රමාණය.

**යුගල**. න-යුග්මය, යුවල

**යුගලක**. පු-යුග්මය.

**යුජ**. d. භූ-පමාදෙ, ප්‍රමාදයෙහි.

**යුජ**. d. භූ-යොගෙ, යෙදීමෙහි, යොජෙති, යොදයි.

**යුජ**. d. රු-යොගෙ, යෙදීමෙහි, යුඤ්ජති, අනුයුඤ්ජති, යෙදෙයි, යුක්තවෙයි.

**යුජ**. d. චු-යොගෙ, යෙදීමෙහි, යොජෙති, යොජයති, යොදයි.

**යුජ්ඣ**. න-යුද්ධය, සණ්ඩුව.

**යුජ්ඣති**. ක්‍රි-(d. භූ. යුජ්, යොගෙ, යෙදීමෙහි + ති) යුද්ධ කෙරෙයි, පහරදී ගණී.

(18814)

**යුජ්ඣන**. න-යුඬකිරීම, ගහගැණීම.

**යුඤ්ජති**. ක්‍රි-(d. රු යුජ්, යොගෙ, යෙදීමෙහි + ති) යොදයි,

**යුඤ්ජන**. න-යෙදීම, යොගය.

**යුට**. d. චු-සංසග්ගෙ, සංසර්ගයෙහි, යොටෙති, යොටයති, සංයොග කරයි.

**යුත**. d. භූ. කථායං, කථා කිරීමෙහි, යොතති, කථා කෙරෙයි.

**යුත්ත**. ති-යුක්ති සඹගත ක්‍රියාව, යෙදීම, යොදන ලද.

**යුත්තරූප**. න-සුදුසු ස්වභාවය, යුතුපරිදි.

**යුත්තක**. පු-යොදන ලද, යෙදීම.

**යුත්තපයුත්ත**. ති-යොදන ලද, විශෙෂයෙන් යොදන ලද.

**යුත්ති**. ඉ-යුක්තිය.

**යුඩ**. න-යුඩය, සංග්‍රාමය, ගහගැණීම, පොර බැදීම.

**යුඩ**. d. භූ-සම්පහාරෙ, ගහගැණීමෙහි, යොධති යුඩ කෙරේ.

**යුඩ**. d. දි-යුජ්ඣෙ, යුඩයෙහි, යුජ්ඣති, යුඩ කෙරෙයි.

**යුඩමණ්ඩල**. න-යුඩ භූමිය, සංග්‍රාම භූමිය.

**යුව**. ති-තරුණයා, යෞවනයා, ඉලන්දාරියා.

**යුවති**. ඉ-තරුණිය, යෞවනිය.

**යුවරාජ**. පු-උපරාජ, යුවරාජ, අනුරජ, දෙවෙනි රජ.

## යූ – යෙ – යො

**යූථ**. ති-සව ජතිය තිරිසනුන්ගේ සමූහය, රැල, රංචුව.

**යූථජෙට්ඨ**. පු-රැලේ ප්‍රධානියා, යූථ නායකයා

**යූථප**. පු-රංචුවේ ප්‍රධානයා, නායක ඇතා.

**යූථපති**. පු-රැලේ ප්‍රධානයා, රංචුවේ නායකයා

**යූපිකා**. ඉ-සිනිද්ද.

**යූප**. පු-ටැඹ, ප්‍රාසාදය, යාගසථම්භය.

**යූස**. d. භූ-පීඩායං, පෙළීමෙහි, යූසති, පෙළයි.

**යූසති**. ක්‍රි-(d. භූ. යූස, පීඩායං, පෙළීමෙහි + ති) පෙළයි.

**යෙන**. අ-යමෙකු විසින්, යම් හෙයකින්, ය ශබ්දය.

**යෙභුය්‍ය**. බොහෝ දෙය.

**යෙභුය්‍යෙන**. පු-බොහෝ සෙයින්.

**යෙභුය්‍යසිකා**. ඉ-එතම් විනය කර්මය.

**යෙවාපනක**. න-තවත් අනිත් ධර්මයන්, අභිධර්මයෙහි එන යෙවාපනක ධර්මයෝ. "යෙවාපන තස්මිං සමයෙ අඤ්ඤෙපි ධම්මා"

**යෙසු**. d. භූ-උස්සාහෙ, උත්සාහයෙහි, යෙසති, උත්සාහ කරයි, වීර්‍ය්‍ය කරයි.

**යොග**. පු-සංයොගය, කාමයොගාදිය, ධ්‍යාන, උපාය, යුක්තියෙදීම.

**යොගී**. පු-යොග ඇත්තා, භාවනාවෙහි යෙදී සිටින්නා.

**යොගක්ඛෙම**. පු-යොගක්ෂෙමය, නිවණ.

**යොගනිය**. පු-යෙදිය යුතු, බැඳිය යුතු.

**යොගිවත්ථ**. න-කළු තුඹ.

**යොග්ග**. පු-යොග්‍ය, සුදුසු, සමර්ථ.

**යොග්ග**. න-වාහනය, බලිවර්දයා.

**යොග්ගාචරිය**. පු-අසුන් පුරුදු කරන්නා. පුහුණු කරන්නා.

**යොජන**. න-යොදුන, සිව්ගව්ව, ක්‍රෝශ සතරක්.

**යොජනා**. ඉ-යෙදීම, මෙය මෙසේ කටයුතුයයි යෙදවීම.

**යොජනවල්ලි**. ඉ-වැල්මදට.

**යොජනික**. පු-යොදුනෙන් යුත්, යොදුනක් ඇති.

**යොජිත**. ති-යොදන ලද, යෙදූ.

**යොජිතක**. ති - යොදවන්නා, නියොග කරන්නා.

**යොජෙති**. ක්‍රි-(d. භූ. යුජ්, යොගෙ, යෙදීමෙහි + ණෙ + ති) යොදයි.

**යොට**. d. භූ-සම්බන්ධෙ, සම්බන්ධයෙහි, යොටති, සම්බන්ධ කෙරේ.

**යොධ.** පු-යොධයා, යුධ කරන්නා, භේවායා.

**යොත්ත.** න-වියගසෙහි බඳින ලනුව.

**යොත්තක.** න-යොත, රැණ, ලනුව.

**යොනි.** ඉ-සකන්ධ, භාග, මූත්‍රමාර්ගය, හෙතු, ප්‍රඥ, උත්පත්ති ස්ථාන, අණ්ඩජ ජලාබුජ සංසෙදජ ඖපපාතික යන යොනි සතර.

**යොනිජ.** පු-යොනියෙන් උපන්නහු, යොනියෙන් උපන්, උත්පත්තිස්ථානයෙහි හටගත්.

**යොනිසො.** අ-නුවනින්, කරුණු වශයෙන්.

**යොබ්බඤ්ඤ.** න-යෞවනය, තරුණ බව, ඉලන්දාරි ගතිය.

**යොබ්බන.** න-යෞවන, තරුණකම.

## ර

**රංසි.** ඉ-රශ්මිය, කාන්තිය=රැස.

**රංසිජාල.** න-රශ්මි මාලාව, රශ්මි ජාලාව.

**රංසික.** ති-රශ්මි ඇති, දීප්තිය ඇති.

**රංසිමන්තු.** පු-රශ්මි ඇත්තා, හිරු

**රක්ඛ.** d. භූ-පාලනෙ, රැකීමෙහි, රක්ඛති, රකී.

**රක්ඛ.** d. භූ-රක්ඛණෙ, රක්‍ෂා කිරීමේහි, රක්ඛති, රකී.

**රක්ඛක.** පු-ආරක්‍ෂා කරන්නා, රකින්නා.

**රක්ඛති.** ක්‍රි-(d. භූ. රක්ඛ, රක්ඛණෙ, රැකීමෙහි + ති) රකී, ආරක්‍ෂා කරයි.

**රක්ඛණ.** න-රැකීම, ආරක්‍ෂා කිරීම.

**රක්ඛණක.** පු-රකින්නා, ආරක්‍ෂා කාරයා.

**රක්ඛස.** පු-රාක්‍ෂසයා, රකුසා

**රක්ඛා.** ඉ-රක්‍ෂාව, රැකීම.

**රක්ඛිකා.** ඉ-රක්‍ෂා කරන්නී, රකින්නී.

**රක්ඛිත.** ති-ආරක්‍ෂාකළ, රකින ලද.

**රඛ.** d. භූ-ගමනෙ, යාමෙහි, රඞ්ඛති, යෙයි.

**රඛසා.** ඉ-නියපොතුවලින් සිරීම = එයින් හටගත් රෝගයක්.

**රඛි** d. භූ-ගමනෙ, යාමෙහි, රඞ්ඛති, යෙයි.

**රඟා.** ඉ-එනම් මාර දුහිතෘව.

**රගි.** d. භූ-ගමනෙ, යාමෙහි, රඞ්ගති, යෙයි.

**රගි.** d. භූ-සඞ්කායං, සැකයෙහි, රඞ්ගති, සැක කරයි.

**රඞ්ගු.** පු-මුව ජාතියක්, මෘග විශෙෂයක්.

**රඞ්ග.** පු-රැඟුම, සායම් පෙවීම, රඟමඩල, නෘත්‍යය.

**රඞ්ගකාර.** පු-සායම් පොවන්නා, රඟකරන්නා

**රඞ්ගජාත.** න-සායම් ජාතිය, සායම් වර්ගය, "යස්මිං යස්මිං **රඞ්ගජාතෙ** උපසංහරෙය්‍ය"

**රඞ්ගරත්ත.** ති-සායම් ඇලීම, සායම් පෙවීම.

**රඞ්ගජීවී.** පු-සායම් කිරීමෙන් ජීවත්වන්නා, සිත්තරා.

**රඞ්ඝි.** d. භූ-ගමන් නොවැලැක්මෙහි, රඞ්ඝති, ගමන් නොවලක්වයි.

**රච්ඡා.** ඉ-වීථිය, වීදිය.

**රච.** d. චු-පතියතනෙ, ප්‍රතියත්නයෙහි, රචෙති, රචයති, ප්‍රතියත්න කෙරේ, ප්‍රතිසංස්කරණය කරයි.

**රච.** d. භූ-ගන්ථනෙ, ග්‍රන්ථනය කිරීමෙහි. රචති, රචනා කෙරෙයි. ග්‍රන්ථනය කරයි,

**රචති.** ක්‍රි-(d. භූ. ගන්ථනෙ, රචනා කිරීමෙහි + ති) රචනා කරයි, ග්‍රන්ථනය කරයි, ගොතයි.

**රචනා.** ඉ-රචනාව, ග්‍රන්ථනය කිරීම.

**රචිත.** ති-රචනාකළ, ගොතන ලද.

**රජ්ජ.** න-රාජ්‍යය, රට.

**රජ්ජති.** ක්‍රි (d දි. රන්ජ, රාගෙ, ඇලීමෙහි + ති) ඇලෙයි, ආසා කෙරෙයි.

**රජ්ජන.** න-ඇලීම, ආසා කිරීම.

**රජ්ජසිරි.** ඉ-රාජ්‍යශ්‍රිය, රාජ ඓශ්වර්‍ය්‍යය, රජසිරි.

**රජ්ජු.** ඉ-රැන, යොත, රැහැණ, ලනුව.

**රජ්ජුගාහක.** පු-රැහැණ ගන්නා අය, අශ්වාචාර්‍ය්‍යයා.

**රජ.** පු. න-ඔසප්, මල්රේණු, = මකරන්ද, ප්‍රකෘතිජ ගුණය, ධූලි, රජස්.

**රජක්ඛ.** න-අක්ෂයෙහි රජස් ඇත්තා, චක්ෂු-රාදිනේත්‍රයයන්හි රාගාදී රජස් ඇත්තා, "අප්පරජක්ඛෙ මහා රජක්ඛෙ සත්තෙ පස්සති."

**රජක.** පු-සායම් පොවන්නා, යජකයා, රදවා.

**රජන.** න-රැඳීම, සායම් පෙවීම.

**රජනි.** බෙරුගස.

**රජනී.** ඉ-රාත්‍රිය, රෑ.

**රජත.** න-රිදී.

**රජති.** ක්‍රි-ඇලෙයි.

**රජස්සලා.** ඉ-ඔසප්වූ ස්ත්‍රිය, මල්වූ තැනැත්තී.

**රජි.** d. භූ-විජ්ඣනෙ, විදීමෙහි, රඤ්ජති, විදියි, හාරයි.

**රජොජල්ල.** න-රජස් හා දූලි.

**රඤ්ජ.** d. භූ-රාගෙ, රැඳීමෙහි, රඤ්ජති, ඇලෙයි, රැඳෙයි.

**රඤ්ජ.** d. දි-රාගෙ, ඇලීමෙහි, රජ්ජති, ඇලෙයි.

**රඤ්ජිත.** ති-ඇලෙන ලද, රඳන ලද.

**රඤ්ජති.** ක්‍රි-(d. භූ. රඤ්ජ, රාගෙ, රැඳීමෙහි + ති) රැඳෙයි, ඇලෙයි.

**රජනීය.** ති-රැඳිය යුතු, ඇලියයුතු, සායම් කටයුතු.

**රඤ්ජන.** න-ඇලීම, රැඳීම, රත්සඳුන්.

**රට්ඨ.** න-රට, රාජ්‍යය.

**රට්ඨක.** පු-රැටියා, රටහිමියා, රටේ ප්‍රධාන අය.

**රට්ඨපිණ්ඩ.** පු-රටවැසියාගේ පිණ්ඩාහාරය, රැටියාගේ ආහාරය.

**රට්ඨාධිප.** පු-රටේ අධිපතියා, භූ පාලයා.

**රට.** d. භූ-පරිභාසනෙ, පරිභාසනයෙහි.

**රඨ.** d. භූ-භාසනෙ, කීමෙහි, රඨති; බණියි, කියයි.

**රට්ඨික.** පු-රැටියා, රටවැසියා.

**රඩි.** d. භූ-පීඩායං, පෙළීමෙහි.

**රණ.** d. භූ-සද්දෙ, ශබ්දයෙහි, රණති, ශබ්ද කෙරෙයි.

**රණ.** d. භූ-ගමනෙ, ගමනයෙහි, රණති, යෙයි.

**රණ.** න-පාපය, යුද්ධය, විනාසය, ශබ්දය.

**රණති.** ක්‍රි-(d. භූ. රණ, සද්දෙ, ශබ්දයෙහි + ති) ශබ්ද කරයි.

**රණඤ්ජය.** න-යුද්ධයෙහි ජය සහිත වීම.

**රණංජහ.** න-පව්වලින් දුරුවීම, නපුරු කටයුතුවලින් බේරීම.

**රත්ත.** ති-රතු වස්තු, අනුරාග ඇත්තා, කොකුම්, රඳනා ලද්ද, රුධිරය.

**රත්තකම්බල.** න-රතුකම්බිලිය, රතු පැහැති කම්බිලි වස්ත්‍රය.

**රත්තගාවී.** ඉ-රතු දෙන, රතු එලදෙන.

**රත්තචන්දන.** න-රත් සඳුන්.

**රත්තචුණ්ණ.** න-සිත්දූරම්.

**රත්තඤ්ඤූ.** පු-චිර රාත්‍රි දන්නා අය. බොහෝ කල් දන්නා අය.

**රත්තන්ධකාරතිමිස.** න-රාත්‍රියෙහි බහලාන්ධ-කාරය.

**රත්තපදුම.** න-රත් පියුම.

**රත්තපා.** පු-පූඩාවා, ලේ බොන්නා.

**රත්තඵලා.** ඉ-කෙම්වැල, කෝවක්කා.

**රත්තඵලික.** පු-රතු පළිඟු.

**රත්තදලා.** ඉ-හුණිඳ, ඔළිඳ.

**රත්තමණි.** පු-රතු මැණික, පියුම්රා මිණ.

**රත්තවාලුකා.** ඉ-සිත්දූරම්.

**රත්තාතිසාර.** පු-ලේ අතිසාරය, ලොහිත-පක්ඛන්දිකාව.

**රත්ති.** ඉ-රාත්‍රිය, රෑ.

**රත්තිකා.** ඉ-හුණිඳ, ඔළිඳ.

**රත්තිච්ඡෙද.** පු-රාත්‍රිච්ඡේදය, දවස් ගණන සිඳී යාම.

**රත්තිචාරී.** පු-රෑ හැසිරෙන්නා, බකමූණා, සොරා, නිසාචරයා.

(18959)

**රත්තිභොජන.** න-රෑට කන ආහාරය, රෑ බොජුන.

**රත්තූපරත.** පු-රාත්‍රි භොජනයෙන් වෙන් වන ලද.

**රථ.** පු-රථය, රිය, ගැල, කරත්තය.

**රථක.** පු-කුඩා රථය, කුඩා රතයෙන් කෙළීම.

**රථකාර.** පු-රියකරුවා, සොම්මරු.

**රථකාරක.** පු-සොම්මරු, එනම් විල.

**රථකාරදහ.** පු-එනම් විල.

**රථගුත්ති.** ඉ-රථය වැසීමට සාදන අයෝමය රථාවරණය.

**රථත්ථර.** න-රථ පිට අතුරණ ඇතිරිය.

**රථපඤ්ජර.** පු-රිය මැදුර, රථ කූඩුව. චක්‍රාඬිත රිය ගෙය.

**රථයුග.** න-රථයෙහි වූ වියගස.

**රථාචාරී.** පු-රියදුරා, රිය පදවන්නා, රථාචාර්යයා.

**රථානීක.** න-රථාව්‍යූහය, රථ සමූදාව.

**රථාරොහ.** පු-රථයට නගින්නා, රථයෙහි සිට යුද්ධ කරන්නා.

**රථී.** පු-රථාරොහයා.

**රථී.** ඉ-වීථිය, වීදිය.

**රථික.** පු-රථාරොහයා.

**රථිකා.** ඉ-වීදිය.

**රථියා.** ඉ-වීදිය.

**රථූපත්ථර.** න-රිය වැස්ම, රථයේ වැස්ම.

**රථෙසභ.** පු-මහ රථය, උතුම් රතය.

**රද.** d. භූ-ලෙඛනෙ, ඉරි ඇඳීමෙහි, රදති, ඉරි අඳියි.

**රද.** d. භූ-ඛාදනෙ, කෑමෙහි, රදති, කයි.

**රද.** පු-දන්ත, දත්.

**රදති.** ක්‍රි-(d. භූ. රද, ඛාදනෙ, කෑමෙහි + ති) අනුභව කරයි, කයි.

**රදන.** න-දත්, දන්ත.

**රධ.** d. දි. පීඩනෙ, පෙළීමෙහි, රුජ්ඣති, පෙළයි, විරුජ්ඣති.

**රන්ධ.** d. චු-පාකෙ, පිසීමෙහි, රන්ධෙති, රන්ධයති, පිසයි.

**රන්ධ.** න-විවෘත කිරීම, විවරය, ගැලීම.

**රන්ධක.** පු-උයන්නා, පාචකයා.

**රන්ධති.** ක්‍රි-(d. චු. රන්ධ, පාකෙ, පිසීමෙහි + ති) පිසියි.

**රප.** d. භූ-වාක්‍යෙ, කීමෙහි, රපති, කියයි.

**රඵ.** d. භූ-ගමනෙ, යාමෙහි, රඵති, යෙයි.

**රභස.** පු-කරණ්ඩුතතරිය කරන්නා.

**රහ.** d. භූ-ඛරෙ, ක්‍රෑර බැව්හි, රහති, රළුකම් කෙරෙයි.

**රඹ.** d. භූ. සද්දෙ, ශබ්දයෙහි, රම්භති, ශබ්ද කෙරෙයි.

**රම්ම.** ති-රමණීය, සිත්කලු, ලක්ෂණ.

**රම්මක.** පු-බක් මාසය.

**රම්භා.** ඉ-කදලි, කෙහෙල්, එනම් දෙව්ගන.

**රමණ.** න-සිත් ඇලීම.

**රමණක.** ති-සිත් ඇලීම.

**රමණීය.** ති-සිත්කලු, සිත් ඇලවිය යුතු.

**රමති.** ක්‍රි-(d. භූ. රමු., උපරමෙ, ඇලීමෙහි + ති) ඇලෙයි.

**රමිත.** ති-ඇලෙන ලද.

**රමු.** d. භූ-කීඩායං, ක්‍රීඩාවෙහි, රමති, ඇලෙයි, විරමති.

**රය.** d. භූ-ගමනෙ, යාමෙහි, රයති, යෙයි.

**රය.** පු-වෙහෙස, විඩාව.

**රව.** පු-නාදය, හඬ, ඝොෂාව.

**රවක.** පු-හඬන්නා, නාද කරන්නා.

**රවති.** ක්‍රි-(d. භූ. රු, සද්දෙ, ශබ්ද කිරීමෙහි + ති) නාද කරයි. හඬයි.

**රවන.** න-නාද කිරීම, ශබ්ද කිරීම.

**රවි.** පු-සූර්යයා, හිරු, ඉරු.

**රවිකුල.** න-සූර්ය වංශය.

**රවිත.** ති-ශබ්දකළ, නාද කළ.

**රවිහංස.** පු-පක්ෂි විශෙෂයක්, ඇල්බෝ පක්ෂියා.

**රවි බන්ධු.** පු-රවිකුල බන්ධු, සූර්ය බන්ධු, සර්වඥයන් වහන්සේ.

**රශ්මි**. ඉ-රශ්මිය, කාන්තිය, රැහැණ.

**රශ්මිගාහ**. පු-රැහැණ ගන්නා, අශ්වාචාර්යයා.

**රස්ස**. පු-ලකුණ්ටකයා-කුරා.

**රස්ස**. ති-ලුහුඩු දෙය, හ්‍රස්ව ස්වර, ලඝු අක්ෂර.

**රස්ස ගවෙධුකා**. ඉ-කැලිය, ගස් කැලිය.

**රස්සඩ්ග**. පු-ජීවක.

**රස්සත්ත**. න-හ්‍රස්ව භාවය, ලුහුඩු බව.

**රස**. d. භූ. සද්දෙ. ශබ්ද කිරීමෙහි, රසති, ශබ්ද කරයි.

**රස**. d. භූ. අස්සාදෙ, ආස්වාදයෙහි, රසති, ආස්වාදනය කරයි, රස විඳියි.

**රස**. d. භූ. ස්නෙහෙ, ස්නෙහයෙහි, රසති, ස්නෙහ කරයි.

**රස**. d. චු-අස්සාදෙ, රස විඳීමෙහි, රසෙති, රසයති, රස විඳී.

**රස** d. චු-මුදුකරණෙ, මෘදු කිරීමෙහි, රසෙති රසයති, මෘදු කරයි, මොලොක් කරයි.

**රස**. ති-ද්‍රව, ආචාර, වීර්‍ය්‍ය, ෂට් රසය, රස දිය, ශෘඩ්ගාරාදි නව නාට්‍ය රසය, රසධාතු, කෘත්‍යය, සම්‍යක් යනාදියෙහි, මූල රස බන්ධ රසාදියෙහි, අර්ථ රසාදියෙහි.

**රසක**. පු-රස කරන්නා, අරක්කැමියා සූදයා.

**රසග්ග**. පු-අග්‍ර රසය, උතුම් රසය.

**රසග්ගසා**. ඉ-රස නහර.

**රසඤ්ජන**. න-ඇස ගාන රසාඤ්ජන, රසඳුන.

**රස තණ්හා**. ඉ-රස තෘෂ්ණාව.

**රසන**. න-ආශ්වාදය, දිව, ශබ්දය.

**රසනා**. ඉ-මෙවුල්දම, ජිහ්වාව, දිව.

**රසභෙද**. පු-කෂාය රසය, රස විකෘතිය.

**රසවතී**. ඉ-රස ඇත්තී, මුළුතැන් ගෙය.

**රස සඤ්ඤා**. ඉ-රස සංඥාව, රසය හැඳිනීම.

**රසහරනී**. ඉ-රසය හැරගණ යන්නී, රස නහර.

**රසාල**. පු-උක් ගස.

**රසාවී**. පු-රසදන්නා සුලු තැනැත්තා.

**රසා**. ඉ-දියමිතන.

**රසාතල**. න-නාලොව, පාතාලය.

**රසාරම්මණ**. න-රස අමුණ.

**රසිත**. න-මෙසනාදය, රසයෙන් යුත්.

**රසීයති**. ක්‍රි-(d. භූ. අස්සාදෙ, රසවිඳීමෙහි + ති) රස විඳියි.

**රසොන**. න-සුදුලූණු.

**රහ**. d. භූ-චාගෙ, ත්‍යාගයෙහි, රහති, හරියි, තැගිකරයි.

**රහ**. d. භූ-ගමනෙ, යාමෙහි, රහති, යෙයි.

**රහ**. d. චු-වජ්ජනෙ, රහෙති, රහයති හරියි, දුරුකරයි.

**රහ**. පු-විජන ස්ථානය, විවෙක ස්ථානය, රහස.

**රහති**. ක්‍රි-(d. භූ. ගමනෙ, ගමන්හි + ති) යෙයි, ගමන් කරයි.

**රහද**. d. භූ-අව්‍යත්ත සද්දෙ, නොවියත් ශබ්ද යෙහි, රහදති, නොවියත් ශබ්ද කෙරෙයි.

**රහද**. පු-විල.

**රහස්ස**. න-රහස.

**රහස්සක**. පු-රහස.

**රහස්සඞ්ග**. න-ස්ත්‍රී පුරුෂ නිමිති.

**රහස**. පු-අන්‍යයෙකුට නොදැන්විය යුත්ත.

**රහසි**. පු-රහස.

**රහයති**. ක්‍රි-(d. භූ. ගමනෙ, ගමන්හි + ති) රහසින් යෙයි.

**රහිත**. ති-තොර, නැති, අභාවය.

**රහො**. අ-රහස් තැන, රහස, අසම්මුඛයෙහි විවෙකයෙහි.

## රා

**රා**. d. භූ-ගාහෙ, ගැණීමෙහි, රහති, ගණී.

**රාබ**. d. භූ-සොසෙ. වියලීමෙහි, රාබති, වියලයි.

**රාග**. පු-වර්ණය, තෘෂ්ණාව, රැඳීම.

**රාගක්ඛය**. පු-රාගක්ෂය, රාගය ක්ෂය කිරීම, නිවණ. (19066)

**රාගචරිත**. පු-රාගචරිතයා, රාගය අධික කොට ඇත්තා.

**රාගාසනී**. පු-(රාග+අසනී) බුදුරජ.

**රාගානුසය**. පු-ප්‍රහීණ නොවී සන්තානයෙහි පවත්නා රාගය.

**රාගී**. පු-රාගය ඇත්තා, රාගියා.

**රාගුස්සද**. පු-රාගය උසස්ව ඇත්තා, අධික රාගියා.

**රාස**. d. භූ-සාමත්ථෙ, සාමර්ථ්‍යයෙහි, පොහොසත් බැව්හි. රාසති, පොහොසත් වෙයි, සමර්ථවෙයි.

**රාජ**. පු-රජ, ක්‍ෂත්‍රියයා, අධිපතියා, නායකයා

**රාජ**. d. භූ-ඔභාසෙ, බැබලීමෙහි, රාජති, බබලයි.

**රාජක**. පු-රජ, රාජය.

**රාජකකුධභණ්ඩ**. න-පඤ්චරාජකකුධභාණ්ඩ කඩුව, සෙසත, නළල්පට, මිරිවැඩිසඟල, වාලවිජනීය යන භාණ්ඩ පස.

**රාජකොට්ඨාස** පු-රජුගේ කොටස, රජුන්ට දියයුතු භාගය.

**රාජගහ**. න-රජගහනුවර.

**රාජඞ්ගන**. න-රජ මිදුල.

**රාජක්කුද**. පු-ක්‍ෂත්‍රියයා, අභිෂෙක නොකළ රජ.

**රාජකථා**. ඉ-රජුන් පිළිබඳ කථා

**රාජඛාද**. න-රාජභොජනය, රජුන් විසින් කෑ යුත්ත.

**රාජති**. ක්‍රි-(d. භූ. රාජ, දිත්තියං, දීප්තියෙහි +ති) බබලයි, දිලිසෙයි.

**රාජධානි**. ඉ-රාජධානිය, අගනුවර, රාජ මාලිගා පිහිටි ප්‍රධාන නුවර.

**රාජධම්ම**. පු-දශරාජධර්මය.

**රාජරුක්ඛ**. පු-ඇසළ ගස.

**රාජමුද්දා**. ඉ-රාජමුද්‍රාව, රාජබලය පිහිටි සටහන.

**රාජදූත**. පු-රජුන්ගේ දූතයා.

**රාජන්තෙපුර**. න-රජුන්ගේ ඇතුළු පුරය, ඇතුළු නගරය,

**රාජපොරිස**. න-රජපුරුෂයාට අයත්. රාජ පුරුෂයා, ආයුධ රහිතව රජුන්ට උපස්ථාන කරන්නා.

**රාජභොග්ග**. පු-රජුන්ට අයත් භොගය, රජුන් විසින් අනුභව කටයුතු.

**රාජයක්ඛ**. පු-රාජයක්ෂ්ම රොගය, ක්‍ෂය රොගය.

**රාජලිඞ්ග**. පු-රජුන්ගේ රාජත්වය පිළිබඳ ලක්‍ෂණය, පඤ්චරාජ කකුධ භාණ්ඩය.

**රාජවල්ලභ**. පු-රජුන්ට වල්ලභ වන, රජුන්ට විශ්වාස ඇත්තා, රාජහිතෛසියා.

**රාජවය්හ**. පු-රාජවාහන ඇතා, මඞ්ගල ඇතා.

**රාජවිභූති**. ඉ-රාජ ඓශ්වර්යය.

**රාජරාජ**. පු-වෙසමුණි රජු.

**රාජරුක්ඛ**. පු-රජරුක, රාජ වෘක්‍ෂය, නුග ගස.

**රාජහංස**. පු-රත්වූ පා හා තුඩු ඇති හංසයා.

**රාජාධිරාජ**. පු-අධිරාජයා, රජුන්ගේද රජ, මහරජ.

**රාජාගාර**. න-රජගෙය, රජ මැදුර.

**රාජායතන**. න-පියල්ගස.

**රාජාදනඵල**. පු-කිරිපලු ගස.

**රාජායතන**. න-රාජාදන, පියල්ගස.

**රාජාරහ**. න-අගිල්.

**රාජි**. ඉ-වනරෙඛාව, රෙඛාව, පඞ්ක්තිය.

**රාජිකා**. ඉ-රෙඛාව.

**රාජිත**. ති-බබලන ලද.

**රාජිමන්තු**. පු-රෙඛා ඇත්තා, රෙඛාසහිතයා.

**රාජුල**. පු-දියබරණ, දියබරියා.

**රාජූපභොග**. පු-රජුන්ගේ උපභොගය.

**රාජොරොධ**. පු-රජුගේ අන්තඃපුරය, බිසෝවරුන්ගේ වාසභවනය, රාජමෙහෙසියෝ.

**රාධ**. d. භූ-සාධනෙ, පෙළීමෙහි, රාධති, පෙළයි, සිත් ගණියි.

**රාධ**. d. දි-නිප්පාදනෙ, නිපදවීමෙහි, රාධති, නිපදවයි, ආරාධනා කරයි.

(19114)

**රාධිත**. ති-සෑදූ දෙය, සාදන ලද්ද.

**රාධෙති**. ක්‍රි-(d. භූ. රාධ, සංරාධෙ, සතුටු කිරීමෙහි+ණෙ+ති) සතුටු කරවයි.

**රාම**. පු-සිත්කලු, රාමයා.

**රාමනීය**. ති-සිත්කලු දෙය.

**රාමණෙය්‍යක**. පු-සිත්කලු දෙය.

**රාල**. පු-දුම්මල, යක්‍ෂධූම.

**රාව**. පු-හඬ, නාදය, ශබ්දය.

**රාසභ**. පු-කොටලුවා.

**රාසි**. පු-සමූහය, රැස, මෙෂාදී දොළොස් රාශි.

**රාසික**. පු රාසියෙන් යුත්, රාසියක් ඇති.

**රාසිවඩ්ඪක**. පු-අයකැමියා, භාණ්ඩාගාරිකයා.

**රාසු**. d. භූ-සද්දෙ, ශබ්දයෙහි, රාසති, ශබ්ද කෙරෙයි.

**රාහසෙය්‍යක**. පු-රහසට සුදුසු, විවේකයට යොග්‍ය.

**රාහු**. පු-එනම් අසුරයා, එනම් ග්‍රහයා.

**රාහුමුඛ**. න-කටේ තෙල්රෙදි ඔබා ගිනිදැල්වීම කරණ එනම් වධය.

**රාහුල**. පු-බෝසතාණන්ගේ එනම් පුත්කුමරා.

**රාහුලමාතා**. ඉ - රාහුල කුමරුගේ මව් වූ යසොධරා දේවිය, බිම්බා දේවිය.

## රි

**රි**. d. භූ-සන්තානෙ, සන්තානයෙහි, රෙති, සන්තානය කෙරේ.

**රි**. d. දි - වහනෙ, වහනයවීමෙහි, රීතිය, වහනයවෙයි.

**රි**. d. ක්‍රි-ගමනෙ, හෙසාරවෙච, ගමනෙහි හා අසුන්ගේ හේසාරවයෙහි, රිණාති, යෙයි, හේසාරවය කෙරෙයි.

**රික්ඛ**. සු - පීඩායං, පෙළීමෙහි, රික්ඛුණති, පෙළයි.

**රිඟි**. d. භූ-ගමනෙ, යාමෙහි, රිඞ්ගති, යෙයි.

**රිච**. d. චු-විනාභාවෙ, වෙන්වීමෙහි, රෙචෙති, රෙචයති, වෙන්වෙයි.

**රිච**. d. රු-රෙචනෙ, විරෙචනයෙහි, රිඤ්චති, විරෙචනය කරයි, පසුබසී.

**රිචි**. d. භූ-ගමනෙ, යාමෙහි, රිඤ්චති, යෙයි.

**රිඤ්චති**. ක්‍රි-බැහැරයෙයි.

**රිඤ්චන**. න-දුරලීම, ඉවත්කිරීම, බැහැර යාම.

**රිට්ඨ**. න-අනිෂ්ඨය, පාපය.

**රිත්ත**. ති-හිස්, තුච්ඡ, ඇතුළත කිසිත් නැති.

**රිත්තක**. ති-හිස්දෙය.

**රිත්තං**. අ-වර්ජනාර්ථයෙහි, හැරයි.

**රිත්තස්සාද**. පු-හිස්වූ ආස්වාද ඇති.

**රිත්තමුට්ඨි**. ඉ-හිස්මිට

**රිත්තහත්ථ**. පු-හිස් අත

**රිපු**. පු-සතුරා, හතුරා.

**රිඵ**. d. භූ-ගුණකථනෙ, ගුණකිරීමෙහි, රිඵති, ගුණ කියයි.

**රිස්ස**. න-පීඩාව, වෙහෙස.

**රිස්සති**. ක්‍රි-පෙළයි, පීඩාකරයි.

**රිස්සමාන**. ති-වෙහෙසන ලබන.

**රිස**. d. භූ-හෙඨනෙ, පෙළීමෙහි, රිස්සති, පෙළයි.

**රිස**. d භූ-ගමනෙ, යාමෙහි, රෙසති, යෙයි.

**රීරි**. පු-පිත්තල.

## රු

**රු**, d. භූ-ගතියං, යාමෙහි, රවති, විරවති, යෙයි.

**රු**. d. භූ-රොසෙ, රොෂයෙහි, රොති, රොස් කරයි.

**රු**. d. සු-තාඩනෙ, තැළීමෙහි, රුණෙති, රුණති, තවයි.

**රු**. d. භූ-සද්දෙ, ශබ්දකිරීමෙහි, රොති, ශබ්ද කරයි.

**රුක්ඛ**. d. භූ-ආවරණෙ, ආවරණය කිරීමෙහි, රුක්ඛති, ආවරණය කරයි.

**රුක්ඛ**. d. චු-එරුසෙ, පරුෂ බැව්හි, රුක්ඛෙති, රුක්ඛයති. පරුෂ කෙරෙයි, රළු කෙරෙයි.

**රුක්ඛ**. පු-වෘක්ෂය, රුස්සය, ගස.

**රුක්ඛ**. ති-රළු, නොසිනිඳු.

**රුක්ඛ ගහණ**. න-වෘක්ෂයන්ගෙන් ග්‍රහණය, රුක්වලින් ගැවසී ගත් පෙදෙස.

**රුක්ඛ ඵල**. න-ගස් පුලුත්.

**රුක්ඛන්තර**. න-වෘක්ෂ විශෙෂ, වරාගස.

**රුක්ඛ පවෙණී**. ඉ-වෘක්ෂ පරම්පරාව, ගස් පරපුර.

**රුක්ඛ සාඛා**. ඉ-ලී හැන්ද, ලීයෙන් තැනූ හැන්ද.

**රුක්ඛ භෙද**. පු-වෘක්ෂහෙද, වෘක්ෂ විශෙෂ.

**රුක්ඛ මූලික**. පු-වෘක්ෂ මූලයෙහි වාසය ඇති.

**රුක්ඛමූලිකඞ්ග**. න-වෘක්ෂ මූලයන්හි විසීමෙන් පුරණ අඞ්ගය.

**රුක්ඛ සුනඛ**. පු-ගස් බල්ලා, සතුන් වර්ගයක්,

**රුක්ඛ සුසිර**. න-රුක් සිදුර, ගස් බෙනය.

**රුක්ඛාදනී**. ඉ-වෘක්ෂ කන්නා, පිලිලය.

**රුච**. d. භූ-දිත්තියං, බැබලීමෙහි, රොචති, විරොචති, බබලයි.

**රුච**. d. දි-තුට්ඨියං, තුෂ්ටියෙහි, රුච්චති, තුටු වෙයි.

**රුච**. d. චු-රොචෙ, රුචියෙහි, රොචෙති, රොචයති, රුචිකරයි.

**රුචි**. ඉ-ඉච්ඡාව, කාන්තිය, ඇල්ම, කැමැත්ත, දෘෂ්ටිය.

**රුචික**. පු-රුචිය, රුචිකරන්නා.

**රුචිර**. ති-සිත්කලු දෙය.

**රුච්චති**. ක්‍රි-(d. දි. රුච, තුට්ඨියං, තුටුවීමෙහි + ති) රුචි කරයි.

**රුච්චන**. න-රුචිකිරීම, කැමතිවීම.

**රුච්චනක**. පු-රුචිකිරීම, රුච්චන.

**රුජ**. d. භූ-භඞ්ග, බිඳීමෙහි, රුජති, බිඳෙයි.

**රුජ**. d. චු-රොගෙ, රොගයෙහි, රුජති, රිදෙයි.

**රුජ**. d. දි-පීඩායං, පෙළීමෙහි, රොජෙති, රොජයති, පෙළයි.

**රුජ**. d. තු-රිදීමෙහි, බිඳීමෙහි.

**රුජා**. ඉ-රිදීම, රොගය, වෙදනාව.

**රුජක**. පු-වීණාවාදකයා, නලා පිඹින්නා.

**රුජති**. ක්‍රි-(d. චු-රුජ, රොගෙ, රොගයෙහි + ති) රිදෙයි, රොග කරයි.

**රුජන**. න-රිදීම, රුදාහැඟීම.

**රුට**. d. භූ-නාසෙ, නැසීමෙහි, රොටති, නසයි.

**රුඨ**. d. භූ-චොරෙ, සොරකමෙහි, රුණ්ඨති, සොරකම් කරයි.

**රුට්ඨ**. ති-වෙදනාකළ, තරහ ඇවිස්සූ.

**රුඨ**. d. භූ-තාඩනෙ, තැළීමෙහි, රොඨති, තළයි.

**රුඨති**. ක්‍රි-(d. භූ. රුඨ, උපඝාතෙ, නැසීමෙහි + ති) තළයි.

**රුණ්ණ**. න-රොදනය, හැඬීම.

**රුණු**. අ-රුණු යන අනුකරණ ශබ්දය, බර වැටීමක්.

**රුත**. න-ශබ්දය, නාදය.

**රුද්ද**. න-රෞද්‍ර, විරුඬ, එනම් නාට්‍යරසය.

**රුදති**. ක්‍රි-(d. භූ. රුද, අස්සු, විමොචනෙ, කඳුළු වැගිරීමෙහි + ති) හඬයි, අඬයි.

**රුදි**. d. භූ-කඳුලු හෙලීමෙහි, රුදති, රොදති, හඬයි.

**රුදිත**. ති-හඬන ලද, අස්සු විමොචනය කළ.

**රුධ**. ති-අවුරණ ලද, වටකළ.

**රුධ**. d. සු-නිප්ඵාදනෙ, නිපදවීමෙහි, රාධුණාති, නිපදවයි.

**රුධි**. d. රු-ආවරණෙ, ආවරණය කිරීමෙහි, රුන්ධති, වසයි.

**රුධි**. d. දි-ආවරණෙ, ආවරණය කිරමෙහි, රුජ්ඣති, ආවරණය කරයි, විරුජ්ඣති.

**රුන්ධති**. ක්‍රි-(d. රු. රුධි, ආවරණෙ, ඇව්රීමෙහි + ති) ආවරණය කරයි.

**රුප්ප**. d. භූ - නාසෙ, නැසීමෙහි, රුප්පති, නැසෙයි.

**රුප්පති**. ක්‍රි-(d. භූ. රුප, නාසෙ, නැසීමෙහි + ති) නසයි.

**රුෂන**. න-නැසීම, විනාශය.

**රුප**. d. දි-පීඩායං, පීඩාවෙහි, රුප්පති, පීඩා වෙයි.

**රුප**. d. චු-රොපනෙ, රොපනය කිරීමෙහි, රොපෙති, රොපයති, රොපනය කරයි.

**රුභි**. d. භූ-වාරණෙ, වැලැක්මෙහි, රුම්භති, වලක්වයි.

**රුම්භති**. ක්‍රි-(d. භූ. රුභි, වාරණෙ, වැලක් වීමෙහි + ති) වලකයි, ආවරණය කරයි.

**රුම්භන**. න-පීඩනාදියෙහි ආවරණය.

**රුය්හති**. ක්‍රි-(d. භූ. රුහ, ආරොහනෙ, නැඟීමෙහි + ති) ආරූඪවෙයි, නගියි.

**රුරු**. පු-එනම් මුවා.

**රුස**. d. භූ-රොසෙ; පෙළීමෙහි; රොසති, පෙළයි.

**රුස** d. චු-කොපෙ, කොපකිරීමෙහි, රොසෙති රොසයති=කිපෙයි.

**රුස**. d. භූ-ආලෙපෙ, ගැල්වීමෙහි

**රුහ**. d. භූ-පාතුභාවෙ, පහළවීමෙහි, රුහති, ආරුහති, නගියි, ආරූඪවෙයි.

**රුහ**. d. භූ-ජම්මනි, ඉපදීමෙහි, රුහති, නගියි.

**රුහා**. ඉ-ඊතණ, හීතණ.

**රුහිර**. න-රුධිරය, ලේ.

## රූ

**රූප**. න-රූපය, රූපස්කන්ධය, රූපභවය, රූපායතනය, විසැඳුණය, හෙතුව, ස්වභාව, ශබ්දය, සංස්ථානය, රූපධ්‍යානය, ශරීරය, සදෘශාදියෙහි.

**රූප**. d. චු-පකාසෙ, ප්‍රකාශකිරීමෙහි, රූපෙති, රූපයති, ප්‍රකාශකරයි.

**රූපක**. න-ප්‍රතිමාව, පිළිමය, රූපය.

**රූපක්ඛන්ධ**. පු-රූපසමූහය, රූපස්කන්ධය.

**රූපකාය**. පු-ස්කන්ධපඤ්චකයෙන්යුත් ශරීරය.

**රූපධාතු**. ඉ-රූපාවචරය, රූපභවය.

**රූපලොක**. පු-රූපය ඇති ලොක, රූපභවය.

**රූපාරම්මණ**. න-රූපය අරමුණු කිරීම.

**රූපාවචරසමාපත්ති**. ඉ-බ්‍රහ්මලොකයට සම්බන්ධ වූ ධ්‍යානයන් වඩා සිත එකඟ කිරීම.

**රූපසම්පත්ති**. ඉ-රූසපුව, රූපසම්පත්තිය.

**රූපික**. පු-රූපවත්, රූපයක් ඇති.

**රූපිය**. න-රිදී, රූ සටහන් නගා කළ රන් රිදී.

**රූපිමය**. ති-රිදියෙන් කළ, රිදියෙන් උපන්.

**රූපසිරි**. ඉ-රූපශ්‍රිය, රූපසම්පත්තිය.

**රූපී**. පු-රූප ඇත්තා, රූපවත්; රූප ඇති.

**රූපී**. න-රිදී, කලධෞතය.

**රූපූපග**. පු-රූපයෙන් යුත්, රූප ඇති.

**රූපූපජීවි**. පු-(රූප + උප + ජීවි) රූපයෙන් ජීවත්වන්නී, වෙසඟන.

**රූපූපාදානක්ඛන්ධ**. පු - උපාදානයෙන් යුත් රූපස්කන්ධය, කෙලෙස් සහිතයාගේ රූප ස්කන්ධය.

**රූහති**. ක්‍රි-(d. භූ. රුහ, ජම්මනි, ඉපදීමෙහි + ති) නගියි, පැනනගී, ආරූඪවෙයි.

**රූහන**. න-නැගීම, ආරූඪවීම.

**රූභි**. d. භූ-පටිසෙධෙ, වැලැක්මෙහි, රූම්භති, වලක්වයි.

**රූළ්හ**. ති-නගින ලද, නැගුනු.

**රූළ්හ**. පු - නැගුනු, හටගත්, ආරූළ්හ, පරූළ්හ.

**රූළ්හි**. අ-රූඪිශබ්ද, ආරූඪශබ්ද.

**රූළ්හි**. ඉ-නැගීම, බැසීම.

## රෙ-රො

**රෙ**. අ - නීචාමන්ත්‍රණයෙහි, කොල, බොල, අඩෙ.

**රෙ**. d. භූ-සද්දෙ, ශබ්දකිරීමෙහි, රායති, ශබ්ද කරයි.

**රෙබා**. ඉ-රෙබාව, ඉර, වන රෙබාව, වන රොද.

**රෙචන**. න-විරෙචනය, විරෙකය, පාචනය.

(19255)

**රෙණු**. පු-ධූලි, දූවිලි, රජස්.

**රෙණුක**. පු-හරේණු නම් ගන්ධ ද්‍රව්‍යය.

**රෙහ**. d. භූ-සද්දෙ, ශබ්දයෙහි, රෙහති, ශබ්ද කරයි.

**රෙවතී**. ඉ-එනම් නැකත.

**රෙසු**. d. භූ-අව්‍යත්තසද්දෙ, නොවියත් හඬෙහි, රෙසති, නොවියත් ශබ්ද, ශබ්ද කරයි.

**රොග**. පු-රෝගය, ආබාධය, ලෙඩේ.

**රොගනාශී**. පු-වෙද, වෛද්‍යයා, දෙස්තර

**රොගාතඞ්ක**. පු-රෝගාබාධය, ලෙඩේ.

**රොගී**. පු-රෝග ඇත්තා, ලෙඩා.

**රොචති**. ක්‍රි-(d. භූ. රුච, රොචනෙ, රුචි කිරීමෙහි + ති) රුචිකරයි, කැමති වෙයි.

**රොචන**. න-රුචි කිරීම, කොලහිඹුල් රුක.

**රොචනපපහා**. ඉ-ගොරදට බඳු පැහැය.

**රොණණ**. න-හැඬීම, ඇඬීම.

**රොදති**. ක්‍රි-(d භූ. රුද, අස්සු විමොචනෙ, කඳුළු හෙළීමෙහි + ති) හඬයි, අඬයි.

**රොදිත**. ති-හැඬීම, අඬන ලද.

**රොදන**. න-හැඬීම, ඇඬීම.

**රොධ**. න-ඉවුර,

**රොධන**. න-ආවරණය.

**රොප**. පු-රෝපනය, සිටවීම.

**රොපක**. පු-පැලැටි ආදිය සිටුවන්නා, සිටු-වන්නා.

**රොපන**. න-වැපිරීම, පැලසිටවීම.

**රොපාපෙති**. ක්‍රි-(d. භූ. රුප, රොපෙ, රෝපනය කිරීමෙහි + ණෙ + ති) සිටුවයි, රෝපනය කරවයි.

**රොපිත**. ති-රෝපනය කළ, සිටුවන ලද.

**රොරුව**. පු-එනම් මහ නිරය, රෞරවය.

**රොස**. d. භූ-හාසෙ, සිනාසීමෙහි, රොසති, සිනාසෙයි.

**රොස**. පු-වෛරය, කොපය.

**රොසති**. ක්‍රි-(d. භූ. රොස, හාසෙ, සිනාසී-මෙහි + ති) සිනාසෙයි.

**රොසක**. පු-කිපෙන්නා, වෛර කරන්නා.

**රොසන**. න-කිපීම, ක්‍රොධශීලීහු.

**රොසිත**. න-කිපුනු, කොපවන ලද.

**රොසී**. පු-කොප කරන්නා.

**රොසෙති**. ක්‍රි-(d. භූ. රුස, හිංසායං, හිංසා වෙහි + ණෙ + ති) කිපෙයි, අක්‍රොශකෙරෙයි.

**රොහඤ්ඤ**. ති-රතු, රත්නවර්ණය.

**රොහති**. ක්‍රි-(d. භූ. රුහ, ගතියං, ගමන්හි + ති) නැගෙයි, ආරූඪවෙයි.

**රොහිච්ච**. න-රොහිත භාවය, රත්නවර්ණ භාවය.

**රොහිණී**. ඉ-රතුදෙන, රෙහෙණ නැකත.

**රොහිත**. පු-රක්තවර්ණය, මත්ස්‍ය විශෙෂයක්, රේරු, මෘග ජාතියක්=රොහිතමුවා.

**රොහිත**. න-අශ්වගතියක්.

**රොහිතක**. පු-වල් එරබදු.

**රොහිතමච්ඡ**. පු-ගින්න, වන්හිය.

**රොහිණෙය්‍ය**. ති-රොහිණී නැකත පිළිබඳ.

**රොහිස**. පු-රොහිත මෘගයා.

**රොහී**. පු-වල් එරබදු.

**රොපෙති**. ක්‍රි-(d. භූ. රුප, රොපෙ, රොපනය කිරීමෙහි + ණෙ + ති) රොපනය කරයි, හිඳුවයි වපුරයි.

**රොම**. න-රොම, මයිල්.

**රොමක**. පු-රොමවත්, මයිල් ඇති.

**රොමඤ්ච**. පු-රොමොද්ගමය, මයිල් කෙළින් සිටීම.

# ල

**ලක්ඛ**. d. චු-පස්සනෙ, ලක්ඛණෙච, දැකීමෙහි සලකුණු කිරීමෙහි, ලක්ඛෙති, ලක්ඛයති, දකී, සලකුණු කරයි.

**ලක්ඛ**. න-ලක්‍ෂය, සියක් දහස, ඉලක්කය, සලකුණ.

**ලක්ඛඤ්ඤු**. පු-ලක්‍ෂණ දත් තැනැත්තා.

**ලක්ඛික**. පු-පින් ඇත්තා, දෛවය ඇත්තා.

**ලක්ඛිත**. ති-ලකුණුකළ, සලකුණුකළ, සට-හන් කළ.

(19307)

**ලක්ඛණ**. න-ලක්ෂණය, චිහ්නය, සලකුණ, ස්වභාවය, ශාස්ත්‍රය.

**ලක්ඛණාහත**. ති-සලකුණු තැබීමෙන් තසන ලද.

**ලක්ඛණකුසල**. පු-ලකුණු බලා කීමෙහිදක්ෂ, ශරීරලක්ෂණ බලා ඉෂ්ටානිෂ්ටඵල ප්‍රකාශ කිරීමෙහි සමර්ථයා.

**ලක්ඛණපටිග්ගහණ**. න-ලකුණු පිළිගැන්ම, ශරීරලක්ෂණ බලා සිදුවියහැකි යයි කියන පලාපල පිළිගැණීම.

**ලක්ඛණපාඨක**. පු-ශරීර ලක්ෂණ බලා පලාපල කියන ශාස්ත්‍රකාරයා.

**ලක්ඛණමන්ත**. ලක්ෂණ ශාස්ත්‍රය, මහා පුරිස ලක්ඛණාදිය, ප්‍රකාශක මන්ත්‍ර විධිය

**ලක්ඛණ සම්පත්ති**. පු-ලක්ෂණ සම්පත්තිය, මනා ශරීර ලක්ෂණය වූ සැපත.

**ලක්ඛණූපනිජ්ඣාන**. න-විදර්ශනා මාර්ග ඵල, විදර්ශනාව වනාහි තිලකුණු අනුව බැලීම ලක්ඛණූපනිජ්ඣාන නම්.

**ලක්ඛී**. පු-සෞභාව, සම්පත්තිය, ශ්‍රී කාන්තාව, ශ්‍රියාව.

**ලඛ**. d. භූ-ගමනෙ, යාමෙහි, ලඞ්ඛති, යෙයි

**ලක**. d. චු-අස්සාදෙ, ආස්වාදයෙහි, ලකෙති, ලකයති, ආස්වාදය කෙරෙයි.

**ලකාර**. පු-රුවල, නැවේ රුවල, "ල" යන අක්ෂරය.

**ලකුට**. න-තකුට, වාලධිය, වල්ගය.

**ලකුණ්ටක**. පු-කුරු-මිට්ටා.

**ලග්ග**. පු-ලග්න වස්තු, ඇලීම, එල්ලීම.

**ලග්ගකෙස**. පු-අවුල් හිසකෙස් ඇත්තා, හැඩපලු කෙස්.

**ලග්ගන**. න-එල්ලීම, ඇලීම.

**ලග්ගිත**. ති-එල්ලෙන ලද, ඇලුනු

**ලග**. d. භූ-ලග්ගනෙ, එල්ලීමෙහි, ලගති, ලග්ගති, එල්ලෙයි

**ලගති**. ක්‍රි-(d. භූ. ලග, ලග්ගනෙ, එල්ලීමෙහි + ති) ගැලෙයි, එල්ලෙයි.

**ලගි**. d. භූ-ගමනෙ, යාමෙහි, ලඞ්ගති, යෙයි, යයි.

**ලගුඩ(ළ)**. පු-මුද්ගරය, මුගුර.

**ලඝි**. d. භූ. ගමනෙ, ගමනෙහි, ලඞ්ඝති, උල්ලඞ්ඝති, යෙයි, පැනයෙයි.

**ලඝි**. d. චු-දිත්තියං, බැබලීමෙහි, ලඞ්ඝෙති ලඞ්ඝයති, බබලයි, දිලිසෙයි.

**ලඝිමා**. පු-අහස් ගමනාදියෙහි ශරීරය සැහැල්ලු බවට පැමිණවීම, පස්සම්භනය.

**ලඝු**. න-සැහැල්ලු, නොබර, ලඝු අක්ෂර, හ්‍රස්වස්වර.

**ලඞ්ඝි**. ඉ-කනයම, දෙරට දමන හරස් පොල්ල

**ලඞ්ඝ**. d. චු-උල්ලඞ්ඝනෙ, පැනයාමෙහි, පැන නැගීමෙහි, ලඞ්ඝෙති, ලඞ්ඝයති; පැනනගී, පැන යයි.

**ලඞ්ඝක**. පු-පැන යන්නා, පැන පැන යන්නා.

**ලඞ්ඝති**. ක්‍රි-යයි, පැන යයි.

**ලඞ්ඝන**. න-පැන යාම.

**ලඞ්ඝී**. පු-පැන යන්නා.

**ලඞ්ඝිත**. ති-පැනයන ලද.

**ලඞ්කා**. ඉ-ලංකාව, ලක්දිව.

**ලඞ්කිස්සර**. පු-ලංකාවට අධිපති, ලකිසුරු.

**ලච්ඡ**. d. භූ-ලාභෙ, ලැබීමෙහි, ලච්ඡති, ලබයි.

**ලච්ඡති**. ක්‍රි-(d. භූ. ලච්ඡ, ලාභෙ, ලැබීමෙහි + ති) ලබයි.

**ලජ්ජ**. d. භූ-ලජ්ජනෙ, ලජ්ජා වීමෙහි, ලජ්ජති, ලජ්ජාවෙයි.

**ලජ්ජති**. ක්‍රි-(d. භූ-ලජ්ජ, ලජ්ජනෙ; ලජ්ජා වීමෙහි + ති) ලජ්ජා වෙයි.

**ලජ්ජන**. න - ලජ්ජාවීම, ලජ්ජාවන.

**ලජ්ජනක**. න - ලජ්ජාවන තැනැත්තා.

**ලජ**. d. භූ - අපකාර වචනෙ, අපකාර වචනයෙහි, ලජ්ජති, නින්‍දා කරයි.

**ලජ්ජා**. ඉ-ලජ්ජාව, හිරිය.

**ලජ්ජිත**. න - ලජ්ජාවන ලද, ලජ්ජා ප්‍රාප්තයා.

**ලජ්ජිතබ්බ**. ති - ලජ්ජා වියයුතු, ලජ්ජාවීමට සුදුසු.

**ලජ්ජී**. පු - ලජ්ජා ඇත්තා.

**ලජ්.** d, භූ - දිත්තියං, දීප්තියෙහි, ලඤ්ජති, බබලයි.

**ලඤ්ච.** න - අල්ලස්, තෑගි.

**ලඤ්චක.** න. සලකුණ, ලකුණ.

**ලඤ්චන.** න - සලකුණ ලඤ්චක

**ලඤ්ජ.** න - අල්ලස, අත්ලස, සලකුණ, මුද්‍ර තැබීම.

**ලඤ්ජක.** පු - අත්ලස් දෙන්නා, සලකුණු දෙන්නා.

**ලඤ්ජිත.** ත - මුද්‍රකළ, සලකුණුකළ

**ලඤ්ජති.** ක්‍රි. (d. භූ - ලජි ලඤ්ඡණෙ, ලකුණු කිරිමෙහි + ති) අල්ලස් දෙයි. සලකුණු දෙයි.

**ලඤ්ජන.** න - සලකුණ, මුද්‍ර තැබීම.

**ලට්ඨි.** ඉ - වැල්මී. දණ්ඩ.

**ලට්ඨිකා.** ඉ - වැල්මී

**ලට්ඨිවන.** න - වැල්මී වනය, වැල්මී කැලය.

**ලට්ඨිවනුය්‍යාන.** න - ලට්ඨිවන නම් උයන

**ලට.** d. භූ - බාලනෙත, බාලබැව්හි, ලටති, බාලවේ.

**ලටුකික.** පු - කැටකිරළ පක්ෂියා, කැට-කුරුල්ල.

**ලටුකිකා.** ඉ - කැටකිරිල්ලි.

**ලටුවා.** ඉ - කැටකිරිල්ල.

**ලඩි.** d. චු - උක්ඛෙපෙ, උක්ෂේපයෙහි, ලණ්ඩෙති, ලණ්ඩයති, උක්ෂේප කරයි, ඔසවාදමයි.

**ලඩි.** d. භූ - පටික්කූලෙ, පිළිකුල් කිරීමෙහි, ලණ්ඩති, පිළිකුල් කරයි.

**ලණ්ඩ.** න - ලඩ, බෙටි, අසූචි කැට, අජ ලණ්ඩිකා, එළුබෙටි.

**ලණ්ඩක.** ති - සිත්කලු දෙය.

**ලද්ධ.** ති - ලබන ලද, ලැබූ.

**ලද්ධක.** ති - සිත්කලු දෙය.

**ලද්ධා.** ති - ලැබ, ලබා.

**ලද්ධි.** ඉ - ලබ්ධිය, දෘෂ්ටිය, ආගම.

**ලද්ධික.** ති - ලබ්ධි ඇත්තා, දෘෂ්ටි ඇත්තා.

**ලප.** d. භූ-වාක්‍යෙ, වාක්‍යයෙහි, ලපති, කියයි.

**ලප.** d, චු - ව්‍යත්තවචෙ, වියත් බසෙහි, ලපෙති, ලපයති, කියයි.

**ලපක.** පු - කියන්නා, ලාභසත්කාර කැමතිව විසමපත් කථා කියන්නා.

**ලපති.** ක්‍රි. (d. භූ - ලප, වාක්‍යෙ. වාක්‍ය-යෙහි + ති) කියයි.

**ලපන.** න - වචනය, කීම, මුඛය.

**ලපනක.** පු - කියන්නා.

**ලපනජ.** පු - දත්, දනත,

**ලපිත.** ති - කියන ලද, පවසන ලද.

**ලබ්භ.** න - ලැබිය යුත්ත. යුත්තාවු.

**ලබ්භා.** අ - ලැබිය යුතු යනාවුයෙහි.

**ලබ්භති.** ක්‍රි-(d. භූ. ලභ, ලාභෙ, ලැබීමෙහි + ති) ලබයි.

**ලබ්භන.** න - ලැබීම.

**ලබි.** d. භූ - ලම්බණෙ, එල්ලීමෙහි, ලම්බති, ආලම්බති, එල්බෙයි.

**ලබුජ.** පු - දෙල්ගස

**ලභ.** d. භූ - ලාභෙ, ලැබීමෙහි, ලභති, ලබ්භති, ලබයි.

**ලභ.** d. චු - සෙවන ගතියං, ගැවසීමෙහි, ලභෙති ලභයති, ගැවසෙයි.

**ලභති.** ක්‍රි-(d. භූ. ලභ, ලාභෙ ලැබීමෙහි + ති) ලබයි.

**ලභ.** d. දි - ලාභෙ, ලැබීමෙහි, ලභයති, ලබයි.

**ලභමාන.** ති - ලබන.

**ලම්බ.** d. භූ - ආරම්මණෙ, එල්ලීමෙහි ලම්බති එල්ලෙයි.

**ලම්බති.** ක්‍රි. (d. භූ - ලම්බ, ආරම්මණ, එල්ලී මෙහි + ති) එල්වයි, එල්බෙයි.

**ලම්බන.** න - එල්ලීම.

**ලම්බිත.** ති - එල්ලන ලද.

**ලම්බී.** ති - එල්ලෙන්නා.

**ලම්භති.** ක්‍රි. (d - ලභි, ලඤ්ඡනෙ, එල්ලීමෙහි + ති) එල්ලෙයි.

**ලම්භනිකා.** ඉ - ගැඩවිල් පස්.

**ලශ.** පු - දස අසුරුසණක් ගසන, නැටීමෙහි සාම්‍යය.

**ලල.** d. චු - ඉච්ඡායං, කැමැත්තෙහි, ලාලෙති; ලාලයති, කැමති වෙයි. රුචිවෙයි.

**ලලන.** න - ලීලෝපෙතවන, බබලන.

**ලලති.** ක්‍රි. (d. භූ - ලල, ඉච්ඡායං කැමැතිවීමෙහි + ති) ලීලෝපෙතවෙයි, බබලයි.

**ලලනා.** ඉ - විශිෂ්ට ස්ත්‍රිය, උත්තම ස්ත්‍රිය.

**ලලාට** න - තළල.

**ලලිත.** ති - ලීලෝපෙතවන ලද, ලීලාව.

**ලව.** පු - ස්වල්පය, සිඳීම.

**ලවක.** පු - සිඳින්නා, කපන්නා.

**ලවංග.** න - කරාබු නැටි.

**ලවණ** පු. න - ලුණු.

**ලවණොදක.** න - ලුණුදිය, එනම් සමුද්‍රය.

**ලවති** ක්‍රි-(d. කි. ලූ - ඡේදනෙ, සිඳීමෙහි + ති) කපයි, සිඳියි.

**ලවන.** පු. න - ධාන්‍යාදිය කැපීම.

**ලවාතබ්බ.** ති - කැප්ප විය යුත්ත.

**ලවිත්ත.** න - දෑකැත්ත.

**ලස** d. භූ. දිත්තියං, බැබලීමෙහි. ලසති, බබලයි, අභිලසති.

**ලස.** d. භූ - ආලිඞ්ගනෙ; වැලඳගැන්මෙහි, ලසති, වැලඳගණී.

**ලස.** d. චු - සිප්පයොගෙ, ශිල්පයොගයෙහි, ලාසෙති, ලාසයති, ශිල්ප හදරයි.

**ලසගති.** ති- ශීඝ්‍ර නොවූ ගමන්=යෑම්.

**ලසති.** ක්‍රි-(d. භූ - දිත්තිය, දීප්තියෙහි + ති) බබලයි, වැලඳගණී.

**ලසිකා.** ඉ - හිස්මොල, මොලය.

**ලසි.** d - ගමනවෙකල්ලෙ අශීඝ්‍රගමනෙහි.

**ලසුණ.** න - සුදුලූණු, රතුලූණු.

**ලශුණ.** (න) න - හෙළ රතු ලූණු.

**ලහු** අ. ශීඝ්‍රය, ඉෂ්ට, නිස්සාරවස්තු, සැහැල්ලු දෙය.

**ලහුං.** අ - ස්වීකාරයෙහි.

**ලහුං.** අ - ශීඝ්‍රාර්ථයෙහි, වහා, හනික, ඉක්මන.

**ලහුක.** ති-සැහැල්ලු දෙය, නොබර දෙය, වහා.

**ලහුට්ඨාන** න - සිරුරේ සැහැල්ලු බව, හොඳ සනීපය.

**ලහුපරිවත්තන.** න - වහාපෙරළෙන, යුහුව පෙරළෙන

**ලහුසො.** අ - සැහැල්ලු වසයෙන්.

**ලළ.** d. භූ - ලීලායං, ලීලායෙහි, ලළති, ලීලාවෙයි.

**ලළ.** d, චු - ලාලනෙ, නැලවීමෙහි, ලාළෙති, ලාළයති, නළවයි, උපලාළෙති.

## ලා

**ලා.** d. භූ - ගහණෙ ගැණීම, ලාති ගණී.

**ලාඛා** ඉ - ලාකඩ, ලතුදිය.

**ලාඛාපසාදන.** න - රත්ලොත්.

**ලාඛ.** d. භූ - සුතක්ඛ, වියලීමෙහි ලාඛති, වියළෙයි.

**ලාඛාරස.** පු - ලතාදිය, ලාකඩවතුර, ලාක්ෂා රසය.

**ලාඝ.** d. භූ. සාමත්ථෙය, සාමර්ථ්‍යයෙහි ලාඝති පොහොසත් වෙයි.

**ලාංගුලි.** ඉ - ලියනගලා.

**ලාජ** පු - විලඳ, පොරි.

**ලාජ.** d. භූ - අපකාරවචනෙ, අපකාරවචනයෙහි, ලාජති. අපකාර වචන කියයි.

**ලාජා.** ඉ - විලඳ පොරි.

**ලාප.** පු - කැටකුරුල්ලා.

**ලාපන.** න - කථා කිරීම, කීම.

**ලාපී.** ති - කියන්නා.

**ලාපු.** න - ලබු.

**ලාබු.** න - ලබු.

**ලාබුක.** න - ලබු.

**ලාභ.** d. චු - පෙසනෙ, යැවීමෙහි, ලාභෙති ලාභයති, යවයි.

**ලාභ.** පු - ලාභය, ලැබීම.

(19458)

**ලාඝී**. පු - ලබන සුළු, ලබන්නා

**ලාමක**. ති - හීනදෙය, නීච, පහත්.

**ලාමජ්ජක**. න - බබුස් තණ.

**ලායණ**. න - කැපීම, ගොයම් ආදිය කැපීම.

**ලාල**. ති - මෝඩ. අඥාන.

**ලාලක**. පු - කපන්නා, ධාන්‍ය කපන්නා

**ලාලාඝති.**
**ලාලප්පති.** } ක්‍රි. (d. භූ. ලප, ව්‍යක්තියං වාචායං ව්‍යක්ත් වචනයෙහි + ) බොහෝ කථා කරයි.

**ලාලප්පන**. න- නැවත නැවත කීම.

**ලාලප්පිත**. ති - නැවත නැවත කියන ලද.

**ලාලන**. න - නැලවීම, හුරතල් කිරීම.

**ලාලපන.**
**ලාලප්පන.** } න. විලාප කීම.

**ලාඝක**. පු - කපන්නා.

**ලායති**. ක්‍රි-(d භූ. ලෙ ඡේදනෙ කැපීමෙහි + ති) කපයි.

**ලායිත**. ති - කපන ලද.

**ලාලා**. ඉ - කෙළ, මුඛයෙහි ඇතිවන කෙළ.

**ලාලෙති**. ක්‍රි-(d. භූ - ලලා, ඉච්ඡායං කැමති වීමෙහි + ති) හුරතල් කරයි, නලවයි.

**ලාමක**. පු - කපන්නා.

**ලාස**. පු - උක්කුටිකරණය, අඬදනිව සිටීම, අභිලාෂාව.

**ලාසික.** පු - නටන්නා. නැට්ටුක්කාරයා.

## ලි - ලී

**ලික්ඛා**. ඉ-රථරේණු සයක ප්‍රමාණය, ලික්ෂාව

**ලි**. d. කි. ලිනෙ, ඇලීමෙහි, ලිනාති, ඇලෙයි

**ලිකුච**. පු-මිදෙල්ල, දෙහි.

**ලිකොචන**. පු-රුකගුණ, රුක්අගුණ ගස.

**ලිඛ**. d. භූ. ලෙඛනෙ, ලිවීමෙහි, ලිඛති, ලියයි; ඉරිගසයි, ඉරි අඳියි.

**ලිඛ.** d. භූ. ලෙඛනෙ, ලිවීමෙහි

**ලිඛති.** ක්‍රි-(d. භූ. ලිඛ, ලෙඛනෙ, ලිවීමෙහි + ති) ලියයි.

**ලිඛන**. න-ලිවීම.

**ලිඛිත**. ති-ලියනලද්ද, ලිවීම.

**ලිඛිතක**. පු-ලියන ලද්ද.

**ලිඟි**. d. භූ. ගමනෙ, යාමෙහි, ලිඞ්ගති, උල්ලඞ්ගති යෙයි.

**ලිඞ්ග**. d. චු-චිත්තකරණෙ, සිතියම් ඇඳීමෙහි, ලිඞ්ගෙති ලිඞ්ගයති, සිතියම් අඳියි.

**ලිඞ්ග**. න-ස්ත්‍රී පුරුෂ නිමිති, චිහ්නය.

**ලිඞ්ගන**. න-වැලඳගැන්ම, ආලිඞ්ගනය.

**ලිඞ්ගසම්පත්ති**. ඉ-පුරුෂාත්තමභාව ලාභය.

**ලිඞ්ගික**. පු-වැළඳ ගැන්ම.

**ලිඞ්ග විපල්ලාස**. පු-ලිඞ්ගවිපර්‍ය්‍යාසය, ස්ත්‍රීපුරුෂ අය පුරුෂස්ත්‍රීන්වීම, ස්ත්‍රීපුං නපුංසක ශබ්ද මාරු වී, විපර්‍ය්‍යාසව යෙදීම.

**ලිච්ඡවි**. පු-සැඟවුනා වූ හෝ සියුම් වූ සිවිය ඇත්තා, එ නම් රාජකුමාරවරු, විසාලා නුවර විසූ රාජ පරම්පරාවක්.

**ලිජ**. d, චු-පකාසෙ, ප්‍රකාශයෙහි, ලෙජෙති, ලෙජයති, ප්‍රකාශකෙරෙයි, බබලයි.

**ලිත්ත**. ති-ගල්වනලද, ගැල්වූදෙය.

**ලිත්තක**. න-විෂ පෙවි හීය.

**ලිප**. d. රු-ලිම්පනෙ, තැවරීමෙහි, ලිම්පති, තවරයි.

**ලිපි**. d. භූ-ලිම්පනෙ, ගැල්වීමෙහි, ලෙපති ගල්වයි.

**ලිපි**. න-ලිපිය, ලියමන.

**ලිපිකාර**. පු-ලියන්නා, ලෙඛකයා

**ලිම්පති**. ක්‍රි-(d. භූ. ලිපි, ලිම්පනෙ, තැවරීමෙහි + ති) තවරයි, ගල්වයි.

**ලිම්පන**. න-ගැලීවීම, තැවරීම.

**ලීන**. න-සැඟවුනු, අප්‍රකාශ, විවෘතනොවූ.

**ලිස**. d. දි-අප්පෙ, සවල්පාර්ථයෙහි, ලිස්සති, සවල්පවෙයි

**ලිසි**. d. දි-ඇලවීමෙහි, අඩුකිරීමෙහි

**ලිහ**. d. භූ-අස්සාදෙ, ලෙව්මෙහි, ලෙහති, ලොවි, ලෙවකයි.

(19510)

**ලීහති**. ක්‍රි-ලොවි, ලෙවකයි.

**ලී**. d. දි. ද්‍රවෙ, ඇලීමෙහි, ද්‍රව කිරීමෙහි, ලයති, ලීයති, දියවෙයි.

**ලීනත්‍ථ**. පු-සැඟවුනු අර්‍ථය, ගුප්තාර්‍ථය, දුෂ්කරාර්‍ථය.

**ලීනවිරිය**. පු-සැඟවුනු විරිය, කුසීත වීයර්‍ය්‍ය

**ලීයති**. ක්‍රි-(d. දි, ලී. සිලෙසනෙ, සැඟවීමෙහි + ති) සැඟවෙයි, රහසිගත වෙයි.

**ලීයන**. න-සැඟවීම, ගුප්තකිරීම.

**ලීනතා**. ඉ-සැඟවුනු බව.

**ලීසිතෙතත්ත**. න-සැඟවීම් බව, හැන්ගුම් බව.

**ලීල්හ**. ති-ලීලාව, විලාසය, ආකාරය.

**ලීළ්හ**. ති-ලීලාව.

**ලීලා**. ඉ-ලීලාව, ආකාරය, සවභාවය, ක්‍රියාව.

## ලු

**ලු**. d. කි-ඡෙදනෙ, සිඳීමෙහි, ලුනාති, සිඳියි, කපයි.

**ලුග්ග**. ති කැඩුනු, බිඳුනු, පැලුණු,

**ලුජ්**. d-දි. නාසෙ, නැසීමෙහි, ලුජ්ජති නැසෙයි.

**ලුජි**. d. චු. වචනෙ, වචනයෙහි, ලුඤ්චෙති ලුඤ්ච යති, කියයි.

**ලුඤ්ච**. d. භූ-හරණෙ, උඩ්ඪරණෙච, පහ කිරීමෙහි, ඉදිරීමෙහි, ලුඤ්චති, පහකරයි, උදුරයි.

**ලුඤ්චති** ක්‍රි-(d. භූ. ලුඤ්ච, හරණෙ, පහකිරී මෙහි + ති) පහකරයි. උදුරයි.

**ලුඤ්චන**. න-ඉදිරීම.

**ලුඤ්චිත**. ති-උදුරණ ලද, සිඳින ලද.

**ලුට**. d. නාසෙ, නැසීමෙහි, ලොටති, නසයි

**ලුට**. d. චු-භාසනෙ, කීමෙහි, ලොටෙති ලොටයති. කියයි.

**ලුඨි**. d. භූ-මොහෙ, ඇලලීමෙහි, ලොඨති, අලලයි

**ලුඨි**. d. භූ-චොරෙ, සොරකමෙහි, ලුණ්ටති, සොරකම් කරයි.

**ලුඨි**. d. චු-චොරියෙ, සොරකමෙහි, ලුණ්ටෙති ලුණ්ටයති සොරකම් කෙරේ.

**ලුඨ**. d. භූ.-තාඩනෙ, තැලීමෙහි, ලොඨති, තලයි.

**ලුඩි**. d. භූ-ආලසෙය අලසභාවයෙහි, ලුණ්ඩති, අලසවෙයි.

**ලුඩි**. d. භූ-ගමනෙ, යාමෙහි, ලුණ්ඩති, යෙයි.

**ලුඨති**. ක්‍රි-(d. භූ. ලුඨි, චොරෙ, සොරකම් කිරීමෙහි + ති) කොල්ලකයි.

**ලුත්ත**. ති-ලොප්කළ, මකාදමන ලද

**ලුත්තසමාස**. පු විභත්ති ලොප්කළ උසමාසය.

**ලුත**. ති-කැපූ, ඡෙදනය කළ.

**ලුපි** d. භූ-පීඩාගං පීඩාවෙහි, ලුණුති, පීඩාවෙයි කිලුට්වෙයි.

**ලුද්ද**. පු-ව්‍යාධයා, වැද්දා, වැදී.

**ලුද්ද**. ති-කකීශ රළු.

**ලුද්දක**. පු-වැද්දා, ව්‍යාධයා.

**ලුබ්ධ**. ති-ලොල් තැනැත්තා, ලොලයා.

**ලුබ්ධ**. පු-වැදී, ව්‍යාධ

**ලුන**. න-සිඳිම, කැපීම

**ලුනාති**. ක්‍රි-(d. භූ. ලූ, ඡෙදනෙ, සිඳීමෙහි + ති) කපයි, සිඳියි.

**ලුප**. d. රු-නාසෙ, නැසීමෙහි, සිඳීමෙහි, ලුම්පති, සිඳියි, නසයි.

**ලුප**. d. දි-අදසසනෙ, නො දැක්මෙහි, ලුමපති, නොදකියි.

**ලුබ්භති**. ක්‍රි-(d. දි. ලුභ, ගිඩෙ, ගජුවීමෙහි + ති) ලොබකරයි. ලොභඋපදවයි.

**ලුබ්භන**. න-ලොභවීම, ලොභකිරීම.

**ලුබි**. d. භූ-පීඩනෙ, පීඩාවෙහි, ලුම්බති, පීඩාවෙයි

**ලුබි**. d. චු-පීඩායං, පෙළීමෙහි, ලුම්බෙති, ලුම්බයති, පෙළයි.

**ලුභ**. d. දි-ආලයෙ, ඇලීමෙහි, ලුබ්භති, ඇලෙයි.

**ලුභ**. d. චු-මොහෙ, මුලාවීමෙහි, ලොභති, මුලාවෙයි.

**ලුම්පති.** ක්‍රි-(d. දි. ලුප, අදස්සනෙ, නොපෙනී යාමෙහි + ති) කොල්ලකයි. පැහැරගණියි.

**ලුම්පන.** න-කොල්ලකා ගැණීම, බලයෙන් පැහැර ගැන්ම.

**ලුම්පිත.** ති-කොල්ලකන ලද.

**ලුල.** d. භූ. මොහෙ, ඇලලීමෙහි, ලොලති, කලඹයි,

**ලූලාශ.** පු-මීසරක්, මීහරක්.

**ලුලිත.** ති-කැලඹුනු, කැලති, මඩවූ.

**ලුස.** d. චු. පීඩායං, පෙළීමෙහි, ලුසෙති, ලුසයති, පෙළයි.

## ලූ—ලෙ

**ලූක.** පු-(උලූක) බස්සා.

**ලූඛ.** ති-රළු, රූක්‍ෂවස්තු ජීර්ණදෙය.

**ලූඛ පුග්ගල.** පු-රූක්‍ෂපුද්ගලයා, රළුපුද්ගලයා.

**ලූඛචීවර.** න-රළුසිවුරු, මෘදුනොවන රළුසිවුරු

**ලූඛප්පමාණ.** ක්‍රි-රූක්‍ෂප්‍රමාණ, රළුගතිය ප්‍රමාණ කරණ

**ලූඛප්පසන්න.** ති-රූක්‍ෂප්‍රතිපදාවට පහදින්නා.

**ලූඛාජීවී.** පු-රූක්‍ෂජීවිකා ඇත්තා, රළුජීවිකා ඇත්තා.

**ලූතා.** ඉ-මකුළුවා.

**ලූන.** ති-කපන ලද, කැපීම.

**ලූයති.** ක්‍රි(-d. භූ ඡේදනෙ, සිඳීමෙහි + ති) කපයි සිඳයි.

**ලූයන.** න-සිඳීම, කැපීම.

**ලෙඛ.** ති-හසුන්පත, ලිවීම, දඬුආදිය ලියවූ කුඩු.

**ලෙඛ.** පු-දෙවියා.

**ලෙඛක.** පු-ලියන්නා, ලිපිකරුවා.

**ලෙඛන.** න-ලියමන, ලියවිල්ල.

**ලෙඛනී.** ඉ-පින්සලය, තෙල්කූර, පන්හිඳ, පැන්සලය, පෑන.

**ලෙඛා.** ඉ-රෙඛා, ඉරි, ලිවීම.

**ලෙඛ්‍ය.** න-ලිවීම.

**ලෙඩ්ඩු.** පු-මැටිකැට, හල්කැට.

**ලෙඩ්ඩුක.** න-ලෙඩ්ඩු-මැටිකැට.

**ලෙණ.** න-තිවණ, ගල්ලෙන, සැඟවිය යුතු තැන,

**ලෙපයාදි.** පු-ලිපි ආදිය.

**ලෙප.** පු-ලෙපය, ආලොපය.

**ලෙපක.** පු සුධාජීවීහු, ආලෙප කරන්නා.

**ලෙපති.** ක්‍රි. (d. භූ. ලෙප, සද්දෙ, ශබ්ද කිරීමෙහි + ති) සායම් ගෑම, ආලේප කරයි.

**ලෙපන.** න-ආලේපය, සායම් ආදියගෑම.

**ලෙය්‍ය.** න-ලෙවිය යුත්ත, ලෙවි කෑ යුතු දේ.

**ලෙස.** ති-ස්වල්පය, ටික, ඡායාව.

**ලෙසමත්ත.** ති-ස්වල්පමාත්‍රය, ඡායාමාත්‍රයක්

**ලෙහති.** ක්‍රි-(d. භූ. ලිහ, අස්සාදනෙ, රසවිඳීමෙහි + ති) ලෙවයි, ලොවියි.

**ලෙහනීය.** ති-ලෙවියයුත්ත, ලෙවකෑ යුත්ත.

## ලො

**ලොක.** පු-ලොකය, ජගත්, සත්වාවාසය. සත්වයා, විනාසවන ස්වභාව ඇති වස්තුව, ශරීරය.

**ලොක.** d. භූ. දස්සනෙ, දැකීමෙහි, ලොකති, බලයි.

**ලොක.** d. චු-දස්සනෙ, දැකීමෙහි, ලොකෙති ලොකයති, බලයි.

**ලොක.** d. චු-දිත්තියං, දීප්තියෙහි, ලොකෙති ලොකයති, බබලයි, දිලිසෙයි.

**ලොකගරු.** පු-ලොකොත්තම, බුදුරජ.

**ලොකනාථ.** පු-ලොකගරු, බුදුරජ, ලොකුත්තම, ලොක නායක.

**ලොකතන්ති.** ඉ-ලොක ප්‍රවේණිය, ලොක සම්මතය.

**ලොකධම්ම.** පු-ලොකස්වභාව, අෂ්ටලොක ධර්මය. ලෝක ධර්මය.

(19603)

**ලොකකඛ්‍යායිකා**. න-ලොකය පිළිබඳ කථා, ලොකසණ්ඨානාදි ප්‍රවෘත්ති පිළිබඳ කථා.

**ලොකකනත**. පු-ලොකයාගේ කෙළවර, නිවණ.

**ලොකකන්තගු**. පු-ලොකයේ කෙළවරට ගිය තැනැත්තා, බුදුරජ.

**ලොකජින**. පු-මුනීන්ද්‍ර, බුදුරජ.

**ලොකජි**. පු-බුදුරජ.

**ලොකජෙට්ඨ**. පු-ලොකශ්‍රෙෂ්ඨ, බුදුරජ.

**ලොකන්තරික**. න-චක්‍රවාට තුණක් එක්වූ තැන පිහිටන අන්ධකාරයෙන් පිරුණු දුක් බහුල එනම් නිරය.

**ලොකත්තය**. පු-ලොකත්‍රය, ත්‍රිවිධලොකය.

**ලොකත්තයවිදූ**. පු - ත්‍රිවිධ ලෝකයදත් තැනැත්තා.

**ලොකති**. ක්‍රි-(d භූ ලොක, දස්සනෙ, දකී මෙහි+ති) දකියි.

**ලොකදීප**. පු-ලෝකප්‍රදීපය, බුදුරජ.

**ලොකනායක**. පු-ලොකනායක.

**ලොකනිස්සරණ**. න-ලොකයෙන් එතෙරවීම, නිවණ.

**ලොකනිරොධ**. පු-ලොකනිරොධය, නිවණ

**ලොකපජ්ජොත**. පු-ලොකප්‍රදීපය, බුදුරජ.

**ලොකපාල**. පු-ලොකාරක්‍ෂාව, ලොවරැකීම.

**ලොකපාලධම්ම**. පු-ලොව ආරක්‍ෂාකරණ ධර්මි, හිරිඔතප් දෙක, ලජ්ජා භය දෙක.

**ලොකබ්‍යූහ**. න-ලොකය පිළියෙළ කිරීම, ලොක පෙළපාළිය.

**ලොකබ්‍යූහා**. පු-දෙව විශෙෂයක්.

**ලොකබන්ධු**. පු-ලොකගුරු, බුදුරජ.

**ලොකවජ්ජ**. න-ලොකවද්‍ය, ලොකයෙන් වන වරද, සාමාන්‍ය වරද.

**ලොකවට්ට**. න-සංසාර වෘත්තය.

**ලොකවිදූ**. පු - ලොකඥ, ලොකය දත් තැනැත්තා, බුදුරජ.

**ලොකවිවරණ**. න-එනම් ප්‍රාතිහාර්‍ය්‍යය, යමා මහපෙළහර.

**ලොකවොහාර**. පු-ලොකයෙහි ව්‍යවහාරය.

**ලොකාධිපතෙය්‍ය**. නි-ලොකාධිපතිභාවය.

**ලොකාමිස**. න-ලොකයාගේ පස්කම් රසයට හේතුවන දේ.

**ලොකායත**. න-විතණ්ඩශාස්ත්‍රය.

**ලොකායත මහාපුරිසලක්ඛණ**. න-ලොකායත ශාස්ත්‍රය හා මහාපුරුෂ ලක්‍ෂණ ප්‍රකාශ ශාස්ත්‍රය.

**ලොකායතික**. ති-විතණ්ඩ වාදයට අයත්, එනම් දර්‍ශනයට අයිති.

**ලොකිය**. ති-ලෞකික, ලොකයට අයත්, කෙලශ නිරොධය හැර අවශෙෂ ලොකය පිළිබඳ සියල්ල.

**ලොකුත්තර**. පු-ලොකොත්තර, පෘථග්ජන ලොකයෙන් එතරව පැවති, ලොකයෙන් උසස්ව පැවති ධර්මය.

**ලොකුත්තරදායාද**. පු-ලොකොත්තර දායාද්ද, නිවණ.

**ලොකුත්තරධම්ම**. පු-ලොකොත්තර ධර්මය, නිර්වාණධර්මය.

**ලොකෙස**. පු-ලොකෙශ්වර, බුදුරජ.

**ලොච**. d. භූ දස්සනෙ, දකීමෙහි, ලොචති, දකියි, ලොචනං.

**ලොච**. d. භූ-දස්සනෙ, දකීමෙහි, ලොචෙති ලොචයති, දකියි.

**ලොච**. d. චු-බැබලීමෙහි, ලොචෙති, ලොච යති, බබලයි.

**ලොචන**. න-දකීම, ඇස, ප්‍රඥාව.

**ලොටණ**. න-සෙලවීම, අවුල්කිරීම.

**ලොණ**. න-ලවණ, ලුණු.

**ලොණම්බිල**. න-ලුණු සහ ඇඹුල්.

**ලොණධූපන**. න-කුළුබඩු යොදා රසකිරීම.

**ලොණඵල**. න-ස්වාභාවික ලුණු.

**ලොණසක්ඛර**. න-ලුණු ගල.

**ලොණසොවීරක**. න-ලුණු සහිත ඇඹුල් කැඳ.

**ලොණික**. පු-ලුණු ඇති, ලුණු සහිත.

**ලොණිය**. පු-ලොණික.

**ලොද්ද**. පු-ලොත්.

**ලොහ**. පු-ලොබ, ලොභය.

(19653)

**ලොප.** පු-ලොපය, මැකීම, අභාවයට යාම.

**ලොභධම්ම.** පු-ලොභ සවභාවය, ලෝභය

**ලොභනීය.** පු-ලෝභකටයුතු, ලොභනෙය්‍ය.

**ලොභනෙය්‍ය.** පු-ලොභනීය, ලොභ කටයුතු.

**ලොභන.** න-ලොබකිරීම, ලෝභය.

**ලොම.** න-රොමය, මයිල්.

**ලොමක.** න-රෝමය, මයිල්, ලොම්.

**ලොමකූප.** න-රොමකූප, ලොම් පිහිටි සිදුරු.

**ලොමස.** න-ලොම්සහිත, මෘදු.

**ලොමසපාණක.** පු-බූපණුවා

**ලොමහංසන.** න-රොමොද්ගමය, ලොමු දැහැ ගැණීම.

**ලොමහට්ඨ.** පු-රොමොද්ගමය, ලොමු දැහැ ගැන්ම.

**ලොමි.** පු-ලොම් ඇත්තා, ලොම් සහිතයා.

**ලොභමූලක.** න-ලොභය මුල්කොට ඇති, ලොභය ප්‍රධානකොට.

**ලොල.** ති-ලොල්, ගිජු, කෑදර, සොඩ.

**ලොල.** පු-ලොල් තැනැත්තා, චඤ්චල දෙය.

**ලොලිත.** ති-සෙලවුනු, කැළඹුනු.

**ලොලතා.** ඉ-ලොල්බව.

**ලොලුප.** පු-අධික තෘෂ්ණා ඇත්තා.

**ලොලුප්පන.** න-ලොල්බව.

**ලොලෙති.** ක්‍රි-(d. භූ. ලුල, මඤ්දනෙ, මැඩීමෙහි + ණෙ + ති) සොලවයි, මඩවයි.

**ලොහ.** පු-න-යකඩ, අගිල්.

**ලොහකාරක.** පු-කඹුරා.

**ලොහමාසක.** න-කුඩා තඹ කාසියක්.

**ලොහකුම්භි.** ඉ-ලොහොකුඹු නිරය.

**ලොහපිට්ඨ.** පු-ලෝතුඩුවා.

**ලොහථාලක.** පු-ලොහොසැළිය.

**ලොහපාසාද.** පු-ලොහයෙන් කළ ප්‍රාසාදය.

**ලොහභෙද.** පු-ලොහවිශෙෂ, ලෝහජාති.

**ලොහමුග්ගර.** න-ලොහොමුගුර, යකඩ මුගුර.

**ලොහවාරක.** න-ලොහමය දිය බඳුන, දිය වත්කරණ ලොහ සැළිය.

**ලොහරූප.** න-තඹ හා බෙලෙක් මිශ්‍රණයෙන් කළ ප්‍රතිමාව.

**ලොහිත.** න-ලේ, රුධිරය, රත.

**ලොහිතකසිණ.** න-ලෝහිතවර්ණය අරමුණු කොට වඩන එනම් කසිණය.

**ලොහිතඞ්ක.** පු-පියුම්රාමිණි, පද්මරාග මැණික.

**ලොහිතක.** න-ලෝහිතවර්ණ ඇති, රතු පැහැති.

**ලොහිතචන්දන.** න-රත්සඳුන්, කොකුම්.

**ලොහිතපක්ඛන්දිකා.** ඉ-ලේ අතීසාරය.

**ලොහිතහොම.** න දකුණු දසරුවෙහි ලේ ගෙණ කරණ ලෝහිත හෝමය.

**ලොහිතාදි.** පු-රක්තාදිවර්ණය.

**ලොහිතුප්පාද.** පු-ලේ ඉපදවීම, ලේ සෙලවීම, පඤ්චානන්තරිය කර්මය.

## ව

**වංස.** පු-වංශය, කුලය, හුණරුක, හුණගස් වල කරණ ක්‍රීඩාවක්.

**වංසකළීර.** න උණ (ගස්) පැලැටිය.

**වංසජ.** පු-වංශයෙහි උපන්, කුලයෙහි හට ගත්.

**වංසරාග.** පු-රත්නභෙදයක්.

**වංසවණ්ණ.** පු-වෙරළුමිණ.

**වංසධරණ.** න-වංශය ධරණ, වංශයරකිත.

**වංසානුපාලක.** පු-වංශය හෝ පරම්පරාව පාලනය කරන්නා.

**වංසික.** න-අගිල්.

**වංසික.** පු-වංශයට අයිති, වංශානුගත.

**වක්ක.** d. චු-තාසෙ, තැතිගැණීමෙහි, වකෙකති, වක්කයති, තැතිගණී.

**වක්ක.** ති-වකුගඩුව, කුටිල, ඇද දේ.

**වක්කඞ්ග.** පු-වක්වූ අවයව ඇත්තා, පක්ෂියා.

(19106)

**වක්කපඤ්චක**. න-වක්කය පස්වෙනි කොට ඇති, පිළිකුල් භාවනාවෙහි, "මංසං නහාරු අට්ඨි අට්ඨිමිඤ්ජාවක්කං" යන පඤ්චකය.

**වක්කල**. න-රිටි සුඹුලු.

**වක්කලක**. පු-රිටිසුඹුලු වලින් සෑදූ ඇඳුම් අඳින්නා, තාපස වර්ගයක්.

**වක්කලි**. පු-එනම් භික්ෂුව.

**වක්ඛති**. ක්‍රි-(d. භූ. වච, වියත්තියං වාචායං, වියත් වචනයෙහි+ති) කියයි.

**වක**. d. භූ-ගාහෙ, ගැණීමෙහි, වකති, ගණියි.

**වක**. d. භූ-සොභා නාසෙසු, සොභාවෙහි හා නැසීමෙහි, වකති, බබලයි, නසයි.

**වක**. පු-කොක්නාවා, වෘකයා.

**වකධූප**. පු-සරලද්‍රව.

**වකි**. d. භූ-ගමනෙ, යාමෙහි, වඞ්කති යෙයි.

**වකි**. d. භූ-කුටිලෙ, කුටිල ගමනෙහි, වඞ්කති, වක්වයෙයි.

**වකි**. d. භූ-සඞ්කායං, සැකකිරීමෙහි, වඞ්කති, සැකකරයි.

**වග්ග**. පු-සමානයන්ගේ සමූහය, පඞ්ක්තිය, කැලෑසිය.

**වග්ග**. d. භූ - ගමනෙ, යාමෙහි, වග්ගති, යෙයි, වග්ගො.

**වග්ගබන්ධන**. න-පඞ්ක්ති බන්ධනය, කාණ්ඩ කාණ්ඩවීම.

**වග්ගවාදක**. පු-සමගිය බිඳීමට සුදුසු වචන කීම.

**වග්ගාරාම**. පු-වර්ගයෙහි ඇලීම.

**වග්ගකම්ම**. න-වර්ග වර්ගව ක්‍රියා කිරීම.

**වග්ගති**. ක්‍රි-(d. භූ. වග්ග, ගමනෙ, යෑමෙහි +ති) ගියේය.

**වග්ගික**. ති-වර්ගයට අයත්, කොටසට ඇතුළත්, වග්ගිය.

**වග්ගිය**. ති-වග්ගික, වර්ගයට අයිති, ඡබ්බග්ගික.

**වග්ගු**. න-සුන්දර, දක්ෂ, අභිරූප, මධුර, සිනිඳු, සොභන.

**වග්ගුලි** පු-වවුලා.

**වඝි**. d. භූ-ගමනෙ, යාමෙහි, වඞ්ඝති, යෙයි.

**වඞ්ක**. පු-බිලිකොක්ක, එනම් පර්වතය.

**වඞ්ක**. ති-වක්වූදෙය, කුටිල, බිලීකටුව.

**වඞ්කක**. න-කුඩා ළමයින් සෙල්ලම් කරණ නගුල, කුඩා නගුලෙන් සෙල්ලම් කිරීම, එයින් සීසෑම.

**වඞ්කදාඨ**. පු-නැමුණු දළ ඇත්තා, ඌරා.

**වඞ්කෙය්‍ය**. ති-ඇද සහිත වූ, දෑකැත්ත වැනි.

**වඞ්ග**. පු-එනම් ජනපදය, වංගදේශය, එනම් රෝගයක්.

**වච්ච**. පු-අමෙධ්‍යය, අසුචි, රූපය, පුරීෂමලය.

**වච්චමග්ග**. පු-මල මාර්ගය.

**වච්ච**. d. චු-අජ්ඣයනෙ, හැදෑරීමෙහි, වච්චෙති, වච්චයති, හදරයි.

**වච්චකුටි**. ඉ-වැසිකිළිය, වර්ච්ශ්කූපය, මල පහරණ තැන.

**වච්චකූප**. න-වච්චකුටිය, වැසිකිළිවල.

**වච්චට්ඨාන**. න-වර්ච්සථානය, මල පහකරණ තැන.

**වච්ච**. d. භූ-ඔභාසෙ, බැබලීමෙහි.

**වච්චදොණි**. ඉ-මළ මූත්‍ර කිරීමට පාවිච්චි කරණ භාජනය.

**වච්චසොධක**. පු-කසල සුඬකරන්නා.

**වච්ඡ**. පු-වස්සා, පැටියා.

**වච්ඡර**. න-වත්සරය, අවුරුද්ද, සංවච්ඡර.

**වච්ඡක**. පු-කෙළිඳගස, වත්සක.

**වච්ඡකසාලා**. ඉ-වසු ශාලාව, වස්සන් බඳින මඩුව.

**වච්ඡකාමා**. ඉ-වස්සා කෙරෙහි ගිජුවූ දෙන, වච්ඡගිද්ධිනී.

**වච්ඡගිද්ධිනී**. ඉ-වස්සා කෙරෙහි ගිජුවූ දෙන, වච්ඡකාමා.

**වච්ඡතර**. පු-තාඹුවස්සා, තාම්බා.

**වච්ඡති**. ක්‍රි-(d. භූ. වස, නිවාසෙ, වැසීමෙහි +ති) වසයි.

**වච්ඡල** පු-සෙනේ ඇත්තා, සෙනහ ඇත්තා.

**වච්ඡලා**. ඉ-වස්සා කෙරෙහි ගිජුවූ දෙන.

**වච්ඡනාභ**. පු-විෂභෙදයක්, වච්චනාවි.

(19756)

**වච්ඡු**. d. භූ-ඡේදනෙ, සිදීමෙහි.

**වඡි**. d. භූ-ඉච්ඡායං, කැමතිවීමෙහි, වඤ්ඡති, කැමතිවෙයි.

**වජ**. d. භූ-ගමනෙ, යාමෙහි, වජති, යෙයි.

**වජ**. d. චු-පරියෙසනාදිසු, සෙවීම් ආදියෙහි, වජ්ජෙති, වජ්ජයති, සොයයි, සකස් කරයි.

**වජ**. න-ගොවුද, ගාල.

**වජති**. ක්‍රි-(d. චු. වජ, ගතියං, යෑමෙහි + ති) යෙයි, ගමනය කෙරෙයි.

**වජන**. න-යාම, ගමන,

**වජිර**. න-දියමනතිය, මැණික් විදිනා කටුව, වජ්‍රායුධය.

**වජිර දුම**. පු-සිනුක් ගස.

**වජිරපාණී**. පු-වජ්‍රායුධයක් අතේ ඇත්තා, ශක්‍රයා.

**වජිරමෙත්තාබල**. පු-වජ්‍රෑපම මෛත්‍රි ඇත්තා, බුදුරජ.

**වජිර විමුකති**. ඉ බුදුරජ.

**වජිරායුධ**. පු-වජිරපාණීයා, ශක්‍රයා.

**වජිරූපම**. පු-විදුරට සමාන, දියමිනතියක් වැනි.

**වජ්ජ**. d. චූ-වජ්ජනෙ, හැරීමෙහි, වජ්ජෙති, වජ්ජයති, හරියි.

**වජ්ජ**. න-වද්‍යය, දෝෂය, වැරැද්ද.

**වජ්ජති**. ක්‍රි-(d. චූ. වජ්ජ, වජ්ජනෙ, හැරීමෙහි + ති) හරියි, බැහැර කෙරෙයි.

**වජ්ජන**. න-හැරීම, දුරු කිරීම, වාද්‍යය, වාදනය.

**වජ්ජනීය**. ති-බැහැර කටයුතු, ඉවත් කටයුතු.

**වජ්ජ භෙරී**. ඉ-වද බෙරය, වරද කළවුන්ට නිඥ එළවන පිණිස ගසනු ලබන බෙරය.

**වජ්ජා වජ්ජ**. න-(වජ්ජ + අවජ්ජ) කුඩු මහත් වරද, ලොකු කුඩා දොෂ.

**වජ්ජී**. පු-එනම් රට, වැදෑ රට,

**වජ්ජිත**. ති-දුරුකළ, පහරණ ලද, බැහැර කළ.

**වඤ්ක**. ති-වරද, භිඝ කැපීමට සුදුසු වරද ඇත්තා.

**වඤ්ක ඝාතක**. පු-භිස ගසා දමා නැසීමට සුදුසු වරද ඇත්තා.

**වඤ්ච**. d. චු වඤ්චනෙ, රැවටිල්ලෙහි, වඤ්චෙති, වඤ්චයති, රවටයි, වඤ්චා කරයි.

**වඤ්චක**. පු-වඤ්චාකාරයා, හිවලා, නරියා.

**වඤ්චන**. න-වඤ්චාව, රැවටිල්ල.

**වඤ්චති**. ක්‍රි-(d චු. වඤ්ච, වඤ්චනෙ, වංචා කිරීමෙහි + ති) වඤ්චා කරයි, රවටයි.

**වඤ්චනික**. පු-වඤ්චා කටයුතු, රැවටිය යුතු.

**වඤ්චනීය**. ති-වඤ්චනික, රැවටිය යුතු.

**වඤ්චිත** ති වඤ්චා කළ, රවටන ලද.

**වඤ්චු**. d. භූ-ගමනෙ, යාමෙහි, වඤ්චති, යෙයි.

**වඤ්ජුල**. පු-හෝපලු ගස, හොමු වගු

**වඤ්ඣක**. ති-වඳ, පල රහිත, පල හට නොගන්නා වෘක්ෂය.

**වඤ්ඣකා**. ඉ-වඳී, වඳ ස්ත්‍රිය.

**වට්ට**. ති-වැටුප්, ත්‍රෛභූමක සංසාර ප්‍රවෘත්තිය, කම්වට කෙලෙස්වට විවට යන තුණ, වටකුරු දෙය.

**වට්ටක**. පු-වටු පක්ෂියා, තිත්තිරයා, තිත් වටුවා.

**වට්ට කථා**. ඉ-සංසාර වෘතය පිළිබඳ කථා.

**වට්ටති**. ක්‍රි-(d. භූ. වටට, ආවත්තනෙ, වැටීමෙහි + ති) වටී, සුදුසුයි, සෑහෙයි.

**වට්ට දුකඛ**. ති-වෘතත දුඃඛය, සංසාර දුඃඛය.

**වට්ටන**. න-වත්තන, පෙරළීම, පරිවර්තණය, කරකැවීම.

**වට්ටනාවලි**. ඉ නවගුණවැල, ශුද්‍රාෂටක වැල.

**වට්ටනි**. ඉ මුද්ද, රවුම, බෝලය.

**වට්ට පටිඝාත**. ති වෘතතය නැසීම.

**වට්ටභය**. න-වෘතත භය, සසර බිය.

**වට්ටානුගත**. ති-වෘතතය අනුව එන ලද, සසර අනුව එන ලද.

**වට්ට විවට්ට**. න-වට විවට, ත්‍රෛභූමක සංසාර ප්‍රවෘත්තිය හා නිර්වාණය.

(19804)

**වට්ටි.** ඉ-වැටිය, පහත් තිරය, පත්තවට්ටි, පාත්‍රයෙහි මුව විට, චක්කවට්ටි, චක්කවත්ති ප්‍රවෘත්තිය.

**වට්ටිකා.** ඉ-වෘත්තිකා, වැටිය.

**වට්ටුල.** ති-වට දෙය.

**වට්ටූපච්ඡේද.** පු-සංසාර වෘත්තය සිඳීම.

**වට්ඨ.** ති-වර්ෂා කල, වසින ලද.

**වට.** d. භූ-වෙඨනෙ, වෙළීමෙහි, වටති, වෙළයි.

**වට.** d. භූ-භාජෙ, බෙදීමෙහි, වටති, බෙදයි.

**වට.** d. භූ-පරිභවෙ, පරිභවයෙහි, වටති, පරිභව කරයි.

**වට.** d. චු-ගන්ථනෙ, ග්‍රන්ථනයෙහි, ගන්ථෙති, ගන්ථයති, ගොතයි.

**වට** d. චු-භාජෙ, බෙදීමෙහි, වටෙති, වටයති, බෙදයි.

**වට.** පු-නුග රුක.

**වටක.** න-කර්ණාභරණයක්, වටංසකය, වටවූ දෙය.

**වටච්ඡාය.** ඉ-නුගරුක් සෙවන, මුදුන් මල්කඩ.

**වටංසක.** න-හිස පළඳින මල්දම, මුදුන් මල්කඩ, අවතංසකය.

**වටාකාරි.** ඉ-නැව් අවයවයක්.

**වටුම.** න-මාර්ගය, කුශලාකුශල කර්ම, වෘත්තය, වට දෙය.

**වඨ.** d. භූ-ථූලෙ, ස්ථූල බැව්හි, වඨති, ස්ථූල වෙයි, වඨරො.

**වඨ.** d. භූ-සහවාරෙ, සමග හැසිරීමෙහි, වණ්ඨති, එක්ව හැසිරෙයි.

**වඨර.** ති-සම්පූර්ණ දෙය, පිරිපුන් දෙය.

**වඩ්ඪ.** d. භූ-වඩ්ඪමානෙ, වැඩීමෙහි, වඩ්ඪති, වැඩෙයි.

**වඩ්ඪ.** d. චු-විකිරණෙ, විසුරුවීමෙහි, වඩ්ඪෙති, වඩ්ඪයති, විසුරුවයි.

**වඩ්ඪි.** ඉ-අභිවෘද්ධිය, වැඩීම, වෘද්ධිය.

**වඩ්ඪක.** පු-වඩුවා, තච්ඡකයා.

**වඩ්ඪති.** ක්‍රි (d. භූ. වඩ්ඪ, වඩ්ඪනෙ, වැඩීමෙහි + ති) වැඩෙයි.

**වඩ්ඪන.** න-වැඩීම, අභිවෘද්ධිය.

**වඩ්ඪනක.** පු-වැඩීම, වඩ්ඪන.

**වඩ්ඪමාන.** න-වැඩෙනු ලබන, එරඬු ගස, එඬරු.

**වඩ්ඪමානකච්ඡායා.** ඉ-වැඩෙනු ලබන සෙවන, එම කාලය, සවස් කාලය.

**වඩ්ඪික.** පු-වර්ධනය කරන්නා, එකතු කරන්නා.

**වඩ්ඪිත.** ති-වැඩෙන ලද, වෘද්ධියට පැමිණෙන ලද.

**වඩ්ඪි මූල.** න-වැඩෙන මිල, පොලිය.

**වඩි.** d. භූ-වෙඨනෙ, වෙළීමෙහි.

**වණ්ට.** d චු-කොට්ඨාසෙ, බෙදීමෙහි, වෙන් කිරීමෙහි, වණ්ටෙති, වණ්ටයති, බෙදයි, වෙන් කරයි.

**වණ්ට.** d. භූ-පුථක් කරණෙ, වෙන් කිරීමෙහි, වණ්ටති, වෙන් කරයි.

**වණ්ට.** න-නටුව, නැට්ට.

**වණ්ටක.** න-නැට්ට, වණ්ට.

**වණ්ටිත.** න-නැටි ඇති.

**වණ්ටෙති.** ක්‍රි-(d. භූ. වණ්ට, පුථක්කරණෙ, වෙන් කිරීමෙහි + ණෙ + ති) බෙදයි, වෙන් කරයි.

**වණ්ණ.** d. චු-පසංසායං, පැසසීමෙහි, වණ්ණෙති, වණ්ණයති, පසසයි, ප්‍රසංශා කරයි.

**වණ්ණ.** පු-සංස්ථාන, රූප, රූපායතන, හෙතු, ජවි, ප්‍රමාණ, ප්‍රශංසා, අක්ෂර, කීර්ති, ගුණ, ඇතුන් පිට අතුරණ චිත්‍ර කම්බිලිය,

**වණ්ණක.** න-විලෙපනය.

**වණ්ණක.** පු-සිරියල්.

**වණ්ණ කසින.** න-නීල, පීතාදි වර්ණ කසිනය.

**වණ්ණකාරක.** පු-වර්ණකාරකයා, සායම් කරන්නා.

**වණ්ණ දසක.** න-මනුෂ්‍යයාගේ ශරීර වර්ණය අධිකවූ, දශ අවුරුදු කාලය.

**වණ්ණපථ.** පු-වණ්ණුපථ, වැලි සහිත ප්‍රදේශයක්.

(19850)

**වණ්ණදාසි.** ඉ-වෙසඟන, වේසාවි.

**වණ්ණනා.** ඉ-වර්ණනාව, ගුණ කථනය.

**වණ්ණනීය.** ති-වර්ණනීය, වර්ණනා කටයුතු.

**වණ්ණභූමි.** ඉ-වර්ණනා භූමිය.

**වණ්ණවාදී.** පු-ගුණ කියන්නා.

**වණ්ණිත.** ති-වර්ණනා කළ, පසසන ලද

**වණ්ණපොක්ඛරතා.** ඉ-ශරීර වර්ණයාගේ මනාප බව, මනා ශරීර සටහන් ඇති බව, මටසිළුටු ශරීරාවයව ඇති බව.

**වණ්ණී.** ඉ-වර්ණ ඇත්ති.

**වණ්ණු.** ඉ-වැලි, වාලුකා.

**වණ්ණුපථ.** පු-වැලි මාර්ගය, වැලි කාන්තාර මාර්ගය.

**වණ්ණෙති.** ක්‍රි-(d. භූ. වණ්ණෙ, වණ්ණනෙ, වැනීමෙහි + ණෙ + ති) වර්ණනා කරයි.

**වණ.** පු-ව්‍රණය, වණය, ශරීරවල සෑදෙන වණ.

**වණ.** d. භූ-සද්දෙ, ශබ්දයෙහි, වණති, ශබ්ද කරයි.

**වණ.** d. භූ-ඤාණෙ, චින්තනෙ, සවණෙව, දැනීමෙහි සිතීමෙහි ශ්‍රවණයෙහි, වණති.

**වණ.** d. චු-සරීර චුණ්ණෙ, ශරීරය සුණු කිරීමෙහි, වණෙති, වණයති, ශරීරය සුණු කරයි.

**වණ කොලක.** න-තුවාල බඳින රෙදි කැබැල්ල.

**වණමුඛ.** පු-ව්‍රණ මුඛ.

**වණිජ්ජා.** ඉ-වෙළඳාම.

**වණිත.** ති-ව්‍රණිත, වණ කළ.

**වණිප්පථ.** පු-වෙළඳ මග, වෙළඳාම දියුණු වන පෙදෙස.

**වණිබ්බක.** පු-ගුණ කිය කියා ඉල්ලන්නා, යාචකයා.

**වණිබ්බ.** ඉල්ලීම.

**වත්ත.** න-පද්‍යය, මුඛය, ආචාරය.

**වත්ත.** d තු-වත්තනෙ, පැවතීමෙහි.

**වත්තති.** ක්‍රි-(d. තු. වත්ත, වත්තනෙ, පැවතීමෙහි + ති) පවතී, විද්‍යමාන වේ.

**වත්තනි.** ඉ-මාර්ගය, ප්‍රවෘත්තිය.

**වත්තභූ.** පු-වක්ත්‍රභූ, ශක්‍රයා.

**වත්තමාන.** පු-වර්තමාන, දැන් පවත්නා, අධුනාකාලය.

**වත්තමානක.** පු-වර්තමාන.

**වත්තපටිවත්තක.** න-වත් පිළිවෙත්.

**වත්තා.** ඉ-වාර්තාව, තොරතුර.

**වත්තාකී.** ඉ-හෙළබටු, එළබටු, වාර්තාක්ත.

**වත්තාවත්තක.** න-ලොකුකුඩාවත්.

**වත්තකානී.** ඉ-හෙලබටු. එලබටු.

**වත්ති.** ඉ-පැවැත්ම, ප්‍රවෘත්ති.

**වත්තික.** න-හස්ති ආශ්වාදීන්ගේ, ඇති පැවැත්ම.

**වත්තිත.** ති-පැවති, පවත්නා ලද.

**වත්තු.** ති-යහපත් වචන ඇත්තා.

**වත්ථ.** න-වස්ත්‍රය, පිළිය, රෙද්ද.

**වත්ථ.** d. චු-පීඩනෙ, පීඩාවෙහි, වත්ථෙති, වත්ථයති. පීඩාකරයි.

**වත්ථකොටි.** ඉ-වස්ත්‍ර යුගලය, වස්ත්‍රදෙක.

**වත්ථබ්බ.** ති-වියයුතු, ආරම්භකළයුතු, පටන් ගතයුතු.

**වත්ථගුය්හ.** පු-වස්ත්‍රයෙන් වැසිය යුතු ස්ත්‍රී පුරුෂ නිමිති.

**වත්ථච්ඡෙදනසත්ථ.** න-රෙදි කපන ශස්ත්‍රය කඩකතුර.

**වත්ථාදිලොම.** පු-වස්ත්‍රාදීන්ගේ රැල්.

**වත්ථි.** ඉ-වස්තිය, බඩට තෙල් ආදිය විදීම.

**වත්ථිකම්ම.** න-වස්ති කිරීම.

**වත්ථිකොස.** පු-වස්ති කොෂය.

**වත්ථු.** න-හෙතු, ද්‍රව්‍ය, භූමි විශෙෂ, වතු රත්නත්‍රය කථාවස්තු.

**වත්ථුකම්ම.** න-අභිනව ගෘහනිර්මාණය, අලුත් ගෙවල් සෑදීම.

**වත්ථුකාම.** පු-ක්ලේශ කාමයට වස්තුවන රූපශබ්දාදිය, රූපාදියෙහි පවත්නා ආසාව

**වත්ථුදෙවතා.** ඉ-ගෘහවස්තු ආදියට අරක්ගත් දෙවතාවා.

(19902)

**වක්ඛුපරිකිරණ.** න-චක්ඛුකම්යපිණිස නොයෙක් දේ ගෙන්වා ග්‍රහබලි විධාන කිරීම.

**වක්ඛුල.** න-මහකුර පැලැටිය.

**වක්ඛුලෙය්‍යක.** පු-මහකුර.

**වක්ඛුවිජ්ජා.** ඉ-අහසෙහි හා පොළොවේද ගුණා ගුණ ප්‍රකාශ කරණ වක්ඛුවිජ්ජාව, ගෛබිත් ශාස්ත්‍රය.

**වත.** අ-ඒකාන්ත නිශ්චිතාර්ථයෙහි

**වත.** න-ව්‍රත, ව්‍රතසීලය.

**වතපද.** න-ව්‍රතපද, සිල්පද.

**වතසමාදාන.** න-ව්‍රතසමාදානය.

**වතවන්තු.** පු-ව්‍රත ඇත්තා.

**වති.** ඉ-වැට, තෝරාගැණීම, "පුබ්බෙ සාමා නාම **වතියා** පන කාරිතත්තා සාමාවතී, නාම, ජාතා.".

**වතික.** පු-වත් ඇත්තා, ව්‍රතශීල ඇත්තා,

**වතිකා.** ඉ-වැට.

**වතු.** d. භූ. වත්තනෙ, පැවැත්මෙහි වත්තති පවත්තති, පවතී.

**වතු.** d. චු-කථනෙ, කීමෙහි, වතෙතති, වත්ත යති, කියයි.

**වඩ.** d. භූ-වඩ්ඪනෙ, වැඩීමෙහි, වඩති, වැඩෙයි වුඩ්ඪි, වුඩ්ඪො.

**වඩ.** d. චු-පූරණෙ, ඡේදනෙච, පිරීමෙහි සිඳීමෙහි, වඩෙති, වඩයති, පුරයි. සිඳියි.

**වඩ.** d. චු-කථනෙ, කීමෙහි, වඩෙති, වඩයති. පුරයි, සිඳියි.

**වඩ.** d. චු-කථනෙ, කීමෙහි, වඩෙති වඩයති කියයි.

**වඩ.** ති-වෘඩ, පරණ, මහලු.

**වඩක.** ති-මහලු, නාකියා, වෘඩයා.

**වඩ්ඪන.** න-වඩ්ඪනය, වැඩීම, දියුණුව.

**වඩව.** න-ප්‍රීතිය, සතුට,

**වඩාපචායන.** න-වෘඩයන් පිදීම, වැඩිසිටියන් පුදන.

**වද.** d. භූ. වචනෙ, කීමෙහි, උපවදති, ඔවදති.

**වද.** d. චු-කථනෙ, කීමෙහි, වාදෙති, වාදයති, කියයි.

**වද.** ති-යහපත් වචන ඇත්තා.

**වදඤ්ඤු.** පු-යහපත් වචන ඇත්තා, දන සිලියා, උතුම් වචන දන්නාසුළු තැනැත්තා,

**වදඤ්ඤුතා.** ඉ-වදඤ්ඤු භාවය.

**වදති.** ක්‍රි-(d. භූ. වද, වචනෙ, කීමෙහි + ති) කියයි, බෙණෙයි.

**වදන.** න-මූඛය, මුහුණ.

**වදන.** න-මූඛය, මුහුණ.

**වදන.** ති-කියූ, ජිතියා.

**වදාපන.** ති-කියවන, ශබ්ද කරවන.

**වදානිය.** ති-බොහෝ දෑ දෙන්නා.

**වදි.** d. චු-වන්දනෙ, වැඳීමෙහි, වාදෙති, වාදයති වඳියි, ස්තුති කරයි.

**වධ.** d චු-නාසෙ, නැසීමෙහි, වධෙති, වධයති, නසයි.

**වධ.** d. භූ-බන්ධනෙ හිංසායංච, බැඳීමෙහි, පෙළීමෙහි, වධති, බඳියි, පෙළයි.

**වධ.** පු-මැරීම, වධය, තැළීම.

**වධක.** පු-වධ කරන්නා, වදකරුවා, චෞර ඝාතකයා.

**වධට්ඨාන.** න-වධස්ථානය. වධභූමිය.

**වධති.** ක්‍රි-නසයි, මරයි, වධකරයි.

**වධිත.** ති-වධකළ, නැසූ,

**වධුකා.** ඉ-වධූ, භාර්‍යාව, බිරින්ද.

**වධූදන.** න-වධයෙහි නියුක්තයා.

**වධූ.** ඉ-යෙහෙළී, තරුණී, භාර්‍යාව.

**වධෙති.** ක්‍රි-(d. භූ. වධ, හිංසායං, හිංසාවෙහි + ණෙ + ති) වධ කරයි, මරයි.

**වනත.** ති-වමනය කළ, වැමැරූ, වමාරණ ලද.

**වන්ද.** d. භූ-අභිවාදනෙ, වැඳීමෙහි, වන්දති, වඳියි, ස්තුති කරයි.

**වන්දති.** ක්‍රි-(d. භූ. වදි, අභිවන්දනෙ, වැඳීමෙහි + ති) වඳියි, නමදියි.

**වන්දන.** න-වැඳීම, නමස්කාරය.

**වන්දනා.** ඉ-නමස්කාරය.

**වන්දක.** පු-වඳින්නා, නමස්කාර කරන්නා.

**වන්දකා.** ඉ-පිලිලය.

**වන්තකසාව.** පු-වමනය කළ කසට ඇත්තා.

**වන්තගමන.** න-වළකන ලද ගමන් ඇත්තා.

**වන්ත ලොකාමිස.** පු-වමනය කළ ලොකාමිස ඇති.

**වන්දිත.** ති-වඳනා ලද, නම කළ.

**වන.** න-මහා වෘක්ෂ ඇති වනය, ආරණ්‍යය, ජලය.

**වන.** d. භූ-සද්දෙ, ශබ්ද කිරීමෙහි, වනති, ශබ්ද කරයි.

**වන.** d. භූ-සෙවනෙ, සෙවනය කිරීමෙහි, වනති, සෙවනය කරයි, ආශ්‍රය කරයි.

**වන.** d. භූ-පීඩායං, පෙළීමෙහි, වනති, පෙළයි.

**වනකම්මික.** පු-වනාන්තරවල කටයුතු කරන්නා.

**වනකාක.** පු-වන කවුඩා, කැලෑ කාක්කා.

**වනකුක්කුට.** පු-වන කුකුළා, වලි කුකුළා.

**වනන්ත.** න-වනය, මහරුක් සහිත කුඩා ගස් ඇති කැලෑව.

**වනතිමිර.** න-තද ගනඳුර, මහත් අඳුර.

**වනතිත්තිකා.** ඉ දියමිත්ත වැල.

**වන ගහණ.** න-වන ග්‍රහණය, වන ගුම්බය.

**වන ගුම්බ.** පු-වනග්‍රහණය.

**වන චරක.** පු-වනයෙහි හැසිරෙන්නා, වැද්දා.

**වනථ.** පු-තෘෂ්ණාව, වනය, කැලෑව.

**වනදහන.** න-වනගින්න, ලැව්ගින්න.

**වනප්පති.** පු-මල් රහිත ඵල හටගන්නා ඇසටු නුග ආදි වෘක්ෂ වනයෙහි වූ මහගස්.

**වනප්පගුම්බ.** පු-වන ලැහැබ. වනසණ්ඩය.

**වන මල්ලිකා.** ඉ-වලිද්දා, ඉද්දා.

**වනමාලී.** පු-විෂ්ණු දෙව්රජ.

**වනස්පති.** පු-වනදෙවුරුක, වනප්පති.

**වනන්ත.** න-වන කෙළවර, අරණ්‍යාවසානය.

**වනපන්ත.** න-සිංහ ව්‍යාඝ්‍රාදීන් අධිගෘහීත වනය.

**වනපත්ථ.** පු-ගමින් නුදුරු සෙනාසනය, ගමින් ඈත පිහිටි සෙනසුන.

**වනරාජි.** ඉ-වනරේඛාව, වනරොද.

**වනසණ්ඩ.** ති-වන ලැහැබ, වනප්පගුම්බය.

**වනික.** පු-වනයට අයත්, වනයෙහි වසන්නා.

**වනිතා.** ඉ-කාන්තාව, ස්ත්‍රිය.

**වනිබ්බක.** පු-යාචකයා, ගුණ කිය කියා ඉල්වන්නා.

**වප්ප.** න - බීජ නික්ෂෙපයෙහි, වැපිරීමෙහි, ඉවුර.

**වප්ප.** d. භූ-පටිසෙධෙ, වැළකීමෙහි.

**වප.** පු-වැපිරීම, ධාන්‍ය ඉසීම.

**වප.** d. භූ-බීජනික්ඛෙපෙ, බිජු වැපිරීමෙහි, වපති, වපුරයි.

**වප්ඵ.** d. භූ-ගමනෙ, යාමෙහි, වප්ඵති, යෙයි.

**වපක්ඛස්සති.** ක්‍රි-ඇද දමයි.

**වපති.** ක්‍රි-(d. භූ. වප, බීජකස්සනෙ, වැපිරී-මෙහි + ති) වපුරයි, ධාන්‍ය ඉසියි.

**වපන.** න-වැපිරීම, බීජ රොපනය.

**වපා.** ඉ-මේදතෙල.

**වබ්බ.** d. භූ-ගමනෙ, යාමෙහි, වබ්බති, යෙයි.

**වභි.** d. චු-නින්දායං, ගැරහීමෙහි.

**වම්භ.** d. චු-විධංසනෙ, විධ්වංසනයෙහි, වම්භෙති, වම්භයති, විධ්වංසනය කරයි.

**වම්භිත.** ති-පිරිහෙළන ලද, නිගාකළ.

**වම්භන.** න-හෙළා දැකීම, පිරිහෙළීම.

**වම්භයිත.** ති-පිරිහෙළන ලද, හෙළාදක්නා ලද.

**වම්භෙති** ක්‍රි-(d. භූ. වම්භ, විධංසනෙ, නැති කිරීමෙහි + ණෙ + ති) පිරිහෙළයි.

**වම්ම.** න-වර්ම සන්නාහය, සැට්ටය.

**වම්මි.** න-රජුන්ට සැට්ට ලන ඇමතියා, සන්නාහසන්නද්ධයා.

**වම්මික.** පු-තුඹස, හුඹස.

**වම්මිත.** ති-සන්නාහ සන්නද්ධයා.

**වමෙමති.** ක්‍රි-(d. භූ. වමු, උග්ගිරණෙ, වැමෑරීමෙහි + ණෙ + ති) වමනය කරයි.

(20008)

**වමති**. ක්‍රි-(d. භූ. වමු, උග්ගරෙණ, වැමෑරී මෙහි + ති) වමනය කරයි.

**වමථු**. පු-වමනය, ජදිදිය, ඔක්කාරය

**වමිත**. ති-වමනය කළ, වැමෑරූ, වමාරණ ලද.

**වමු**. d. භූ-වමනෙ, වමනය කිරීමෙහි, වමති, වමනයකරයි.

**වය්හ**. පු-ඉසිලිය, ආධාරකටයුතු.

**වය**. d. භූ-ගමනෙ, යාමෙහි, වයති, යෙයි, වයො.

**වය**. පු. න-වයස, විනාශය.

**වයකල්‍යාණ**. පු-වයස්කල්‍යාණය, යහපත් වයස.

**වයප්පත්ත**. ති-වයසට පැමිණි, තරුණබවට පැමිණි, වෘඩ.

**වයට්ඨ**. පු-තරුණයා, වයස් ඇත්තා.

**වයස්ස**. පු-මිත්‍රයා, මිතුරා.

**වයස්සා**. ඉ-මිත්‍ර ස්ත්‍රිය, යාලු ස්ත්‍රිය.

**වර**. d. භූ-සංවරණෙ, සංවරණයෙහි, වරති, ආවරණය කරයි.

**වර**. d. චු-ඉච්ඡායං, කැමැත්තෙහි, වරෙති වරයති, කැමතිවෙයි, රුචිවෙයි.

**වර**. d. චු-වාරණෙ, වැළකීමෙහි, වාරෙති, වාරයති, වළක්වයි.

**වර**. ති-උතුම්, ශ්‍රෙෂ්ඨ, කොකුම්, කුඩකුම.

**වර**. න-සවල්පය, ප්‍රිය, නිවණ.

**වරක**. න-එනම් ධාන්‍යය.

**වරඞ්ග**. න-උතුම් අවයව, ස්ත්‍රී පුරුෂ නිමිති.

**වරඞ්ගනා**. ඉ-උතුම් ස්ත්‍රිය.

**වරක්ඛු**. පු-උත්තමාර්ථය කියන තැනැත්තා.

**වරණ**. පු-පවුර, ලුණුවරණ.

**වරද**. පු-උත්තමාර්ථය දෙන තැනැත්තා.

**වරත්ත**. න-වරපට, යොත, සමින් කළ යොත.

**වරත්තා**. ඉ-වරපට, හස්ත්‍යශ්වාදීන් බඳින සමින් කළ යොත, වරමඩු.

**වරත්‍රා**. ඉ-පොරොද්ද.

**වරපඤ්ඤ**. පු-උත්තමප්‍රාඥයා, බුදුරජ.

**වරවණ්ණිනී**. ඉ- උතුම් ස්ත්‍රිය.

**වරහ**. d. භූ-සද්දෙ, ශබ්දයෙහි, වරහති, ශබ්ද කරයි.

**වරහ**. d. චු-පීඩායං, පීඩාවෙහි, වරහෙති වරහයති, පීඩාකරයි, පීඩාවෙයි.

**වරාක**. පු-ලාමක, නීච.

**වරාහ**. පු-ඌරා, ඇතා.

**වරාහර**. පු-උත්තමාර්ථය ගෙණ දෙන තැනැත්තා.

**වරාරොහා**. ඉ-උතුම් ස්ත්‍රී.

**වරී**. ඉ-සෘතාවාරිය.

**වරුණ**. පු-එනම් දෙව්රජ, ලුණුවරණ ගස.

**වරූථ**. පු-අයොමය රථාවරණය.

**වරූථිනී**. ඉ-සෙනාව.

**වල**. d. භූ-සංවරණෙ, සංවරණයෙහි, වලති, වසයි.

**වල**. d. චු-පොසනෙ, පොෂ්‍යය කිරීමෙහි, වාලෙති වාලයති, පොෂ්‍යය කරයි.

**වලජ්**. d. භූ-පයොජනෙ, ප්‍රයොජන ගැන් මෙහි, වලඤ්ජති, ප්‍රයොජනගණී.

**වලඤ්ජ**. පු-වැලඳීම, ප්‍රයොජන ගැන්ම, මත්ස්‍ය විශෙෂයක්.

**වලඤ්ජන**. න-පරිභොගය, වැලඳීම.

**වලඤ්ජිත**. ති-පරිභොග කළ, වැලඳූ.

**වලඤ්ජති**. ක්‍රි-(d. භූ. වලජ්, පයොජනෙ, ප්‍රයෝජන ගැන්මෙහි + ති) පරිභොගකරයි, වලඳයි.

**වලය**. පු-වළල්ල.

**වලයිත**. ති-වලඳනාලද, වෙළනලද.

**වලාහක**. පු-මෙඝය, වලාකුළ.

**වලාහක අස්ස**. පු-එනම් අශ්වයා, අහසේ ගමන් කරණ අශ්ව විශෙෂයක්.

**වලි**. ඉ-ජරාවෙන් සිවිලවූ චර්මය, රැලිය, ඇඟ රැලිවැටීම.

**වලිත**. න-හටගත් රැලි ඇති.

**වලිතත්තච**. පු-ඇඟරැලි වැටුනේ, රැලි වැටුනු සම.

**වලින**. න-ඇඟරැලි වැටීම = වැටුනු.

**වලිර**. පු-විපරශා, වපර බැල්ම ඇත්තා.

**වලිමුඛ**. පු-වඳුරා, රිළවා.

**වල්ල**. d. භූ-සංවරණෙ, සංවරණයෙහි, වල්ලති, වසයි.

**වල්ලකී**. පු-වීණාව.

**වල්ලභ**. පු-ස්වාමිපුරුෂයා, ප්‍රියයා, අධිකෘතයා

**වල්ලරී**. ඉ-කැන, පොකුර

**වල්ලව**. පු-ගෝපාලයා, ගොපොල්ලා.

**වල්ලික**. න-කොකුම්.

**වල්ලිජාති**. ඉ-ලතාජති, වැල්වගී.

**වල්ලිභ**. පු-කොමඩු.

**වල්ලී**. ඉ-වැල, ලතාව.

**වල්ලූර**. පු- වැල් ඉරා, වියලිමස්, තීරු සිටින්නව කපා වියලන ලද ගෝන මුව මස් ආදිය.

**වවකට්ඨ**. න-විවේකය.

**වවක්ඛති**. ක්‍රි-ඉදිරියට අදියි.

**වවත්ථපෙති**. ක්‍රි-ව්‍යවස්ථා කෙරෙයි.

**වවත්ථා**. ඉ-ව්‍යවස්ථාව, නියමය.

**වවත්ථාපන**. න-නියමකිරීම, ව්‍යවස්ථා පිහිටු වීම.

**වවත්ථාන**. න-ව්‍යවස්ථාකිරීම, වවත්ථාපනය.

**වවත්ථාපිත**. ති-ව්‍යවස්ථාකළ, ව්‍යවස්ථා පත-වන ලද.

**වවත්ථිත**. ති-ව්‍යවස්ථාකළ, නියමකළ.

**වවත්ථිත විභාසා**. ඉ-ව්‍යවස්ථිත විභාෂා.

**වවත්ථෙති**. ක්‍රි-ව්‍යවස්ථාකරයි.

**වවස්සග්ග**. න-නිවණ.

**වවස්සජන**. න-හැරීම, ත්‍යාගය.

**වස**. d. භූ-වාසෙ, වාසය කිරීමෙහි, වසති, වාසය කරයි වාසො, නිවාසො.

**වස** d. භූ-මුදුකරණෙ, මෘදුකිරීමෙහි, මෘදු කරයි.

**වස**. d. භූ-දිත්තියං, බැබලීමෙහි, වච්ඡති, බබලයි.

**වස**. d. සද්දෙ, ශබ්දයෙහි, වස්සති, ශබ්ද කරයි.

**වස**. d. චු-සිනෙහෙ, සෙනහයෙහි, වාසෙති, වාසයති, තෙල් ආදිය ආලෙපකරයි.

**වස**. d. චු-උපවාසෙ, උපවාසයෙහි, වාසෙති, වාසයති.

**වස්ස**. d. භූ-තෙමනෙ, තෙමීමෙහි, වස්සති, තෙමෙයි, වගී.

**වස්ස**. d. චු-බලව බන්ධනෙ, ශක්ති බන්ධන යෙහි, වස්සෙති වස්සයති, තදින් බඳියි.

**වස්ස** න-වර්ෂාව, වැස්ස.

**වස්ස**. පු-තිරළුවා, වස්සාන සෘතුව.

**වස්ස**. පු. න-අවුරුද්ද, පුරුෂයා.

**වස්සකම්ම**. න-පණ්ඩක පුරුෂකිරීම, පිරි මින්ගේ බීජෝඩරණය කිරීම.

**වස්සග්ග**. පු-නිශ්චය.

**වස්සති**. ක්‍රි-(d. භූ. වස, පඝරණෙ, වැසී මෙහි + ති) වසී, වර්ෂාකරයි.

**වස්සවර**. පු-නපුංසකයා.

**වස්සවලාහක**. පු-මෙඝය, වලාකුළ, මෙඝයට අධිපති දෙවියා.

**වස්සවුට්ඨි**. ඉ-වර්ෂාජලය, වර්ෂාව.

**වස්සසත**. න-අවුරුදු සියය, සියක් අවුරුද්ද.

**වස්සසතික**. ති-වර්ෂ සියක් ඇති.

**වස්සාන**. න-වර්ෂා සෘතුව, වර්ෂාකාලය, වැසි කාලය.

**වස්සාභූ**. පු-මැඩියා, වර්ෂාභූ.

**වස්සාපනක**. පු-වර්ෂා කරවන්නා, වස්ස වලාහකයා.

**වස්සාවාස**. පු-වස්විසීම, වර්ෂාකාලයෙහි වාසය.

**වස්සාවාසික**. පු- වස් විසූවන්ට අයිති.

**වස්සික**. ති-වර්ෂාකාලයට අයත්, වර්ෂාසෘතුවට සුදුසු.

**වස්සිකී**. ඉ-දෑසමන්, සමන් පිච්ච.

**වස්සිත**. න-තිරිසනුන්ගේ හඬ, තිරිසන් නාදය.

**වස්සී**. ඉ-වැස්ස, පදෙසවස්සී, පැත්තකට වැසි වැසීම.

(20114)

**වස්සූපගමන**. න-වස් විසීමට පැමිණීම.

**වස්සූපනායිකා**. න-වස් එළඹීම, වස් විසීම

**වස්සොකසාරා**. ඉ-ශක්‍රපුරය, තව්තිසා භවනය.

**වස**. d. චු-නිවාසෙ, ඇඳීමෙහි, වාසෙති, වාසයති, අවඡාදනය කරයි, වස්ත්‍ර අඳියි.

**වස**. පු ප්‍රභූ බව, අධික බව, අයිති වස්තු, අභිලාෂය.

**වසන**. න-වස්ත්‍රය, අවඡාදනය, විසීම.

**වසති**. ක්‍රි-වාසය කරයි.

**වසන්ත**. න-එනම් සෘතුව.

**වසභ**. පු-වෘෂභයා, ගොනා.

**වසල**. පු-ශුද්‍රයා, රොඩියා, වසලයා.

**වසලක**. පු-ශුද්‍රයා, වසලයා, රොඩියා.

**වසවත්තන**. න-වසඟයෙහි පවත්වන

**වසවත්ති**. පු-වසවර්ති මාරයා, වසඟයෙහි පවත්වන්නා.

**වසා**. ඉ-වස්සා, පැටියා, නාඹුවස්සා, මස් තෙල, කෙලෙස්.

**වසි**. ඉ-වසඟවූ සත්‍රිය, වඳ දෙන.

**වසික**. පු-වසඟයට පැමිණියා, යටත් වූ තැනැත්තා.

**වසිත**. ති-වාසය කළ, විසූ,

**වසිතා**. ඉ-සෘධි විධියෙහි වසී භාවය.

**වසිප්පත්ත**. ති-වසඟයට පැමිණි.

**වසී**. පු-යතිහු, වසඟවූ, දමනය නොවූ, ලොකු වස්සා.

**වසීභූත**. ති-වසඟවන ලද, වසඟවූ, කීකරු වූ.

**වසු**. පු-දෙවතා විශෙෂයක්, රත්න, වස්තු.

**වසුන්ධර**. පු-එනම් පර්වතය.

**වසුදෙව**. පු-වෛෂ්ණුපිය, විෂ්ණු.

**වසුධා**. ඉ-භූමිය, පොළොව.

**වසුන්ධරා**. ඉ-භූමිය.

**වසුමතී**. ඉ-භූමිය, වසුන්ධරා.

**වහ** d. භූ-පාපුණනෙ, පැමිණවීමෙහි, වහති, පැමිණෙයි.

**වහ**. d. භූ-ඡාදනෙ, වැසීමෙහි, වහති, වසයි

**වහ**. පු-ගෙරීන්ගේ කඳ, ගවයාගේ පිට හා ග්‍රීවය.

**වහති**. ක්‍රි-(d. භූ. වහ, පාපුණනෙ, පැමිණවීමෙහි + ති) උසුලයි, වසයි.

**වහන**. න-ගලා බැසීම, කාන්දුවීම, ඉසිලීම.

**වළ**. d. භූ. විභාගෙ, විභාගයෙහි, වළති, විභාග කරයි.

**වළබා මුඛ**. වඩබා මුඛය.

**වළභා**. ඉ-අශ්වධෙනුව, වෙළඹ.

**වළභී**. පු-අශ්වයා.

**වළභිවත්‍රාදී**. පු-මතුමාලෙහි උඩ අතුරණ චක්‍ර දැරු ආදිය.

**වළින**. න-ආකූලත්වය, අවුල් බව.

**වංස**. පු-කුලය, ගොත්‍රය, උණගස.

**වංසකළීර**. පු-උණකිළිල, උණ මොටෙයියා.

## වා

**වා**. අ-සම්පිණ්ඩන, උපමා, සන්දෙහ, පද පූරණ, ව්‍යවස්ථිත විභාසා, විකල්ප, නිශ්චය, යනමෙහි.

**වා**. d. භූ-ගමනෙ බන්ධනෙ ච, ගමනෙහි, බැඳීමෙහි, වාති, යෙයි, බඳියි.

**වා**. d. දි-ගමනෙ වායනෙච, ගමනෙහි, හැමීමෙහි, වායති, යෙයි, හුලන් හමයි.

**වාක**. න-රුක් සුඹුලු, ගස්පොතු.

**වාක්‍ය**. න-වාක්‍යය, වගන්තිය, වචනය.

**වාක්‍යාරම්භ**. පු-වාක්‍යයාගේ පටන් ගැන්ම.

**වාක්‍යාලඞ්කාර**. පු-වාක්‍යයාගේ අලඞ්කාරය.

**වාකචීර**. න-මෘදු තෘණ, තීරු එකට වියා කරණ ලද සිවුර, පැදුරු ආකාරයෙන් කළ පැලලි සිවුර.

**වාකචීර**. න-තපසුන් අඳින ගස්පොතු වලින් සාදගත් රෙදි වර්ගයක්.

**වාකරා**. ඉ-වරදැල් වැද්ද.

**වාකරික**. පු-වැර දැල් වැද්ද

**වාගුරික**. පු-වාකරී, වරදැල් වැද්ද.

**වාචංයම**. පු-ධ්‍යානලාභීහු.

**වාචක**. පු-කියන්නා, කථිකයා.

(20167)

**වාචන**. න-කියවීම.

**වාචනක**. පු-කියවන්නා.

**වාචසික**. පු-වචනයෙන් හටගත්, වචනයෙන් උපන්.

**වාචා**. ඉ-තෙපුල, වචනය.

**වාචාභිලාප**. න නොකටයුතු කථා.

**වාචාල**. පු-වාචාලයා.

**වාචා වික්ඛෙප**. පු-වචන වික්ෂේපය.

**වාචිත**. ති-කියවන ලද.

**වාචික**. න-සන්දෙශ වචනය.

**වාචෙති**. ක්‍රි-(d. භූ. වච, වියත්තියං, වාචායං, වියත් වචනයෙහි + ණෙ + ති) කියයි.

**වාචලිඞ්ග**. න-විශෙෂ්‍යයට බඳු ලිඟු ලබන ශබ්ද.

**වාජ**. පු-ඊපත්‍රය, හීපත්‍රය, ඊය.

**වාජපෙය්‍ය**. න-එනම් යාගය.

**වාජිත**. ති-පිහාටුවලින් කළ.

**වාජින**. න-හස්තියා, ඇතා

**වාජී**. පු-අශ්වයා, අසු, සෛන්ධවයා.

**වාට**. න-වල, වැසූ ස්ථානය, ආවරණය කළ තැන.

**වාටක**. න-වැස්ම, ආවරණය.

**වාණිජ**. පු-වාණිජයා, වෙළෙන්ද, වෙළඳම.

**වාණිජක**. පු-වෙළෙන්ද.

**වාණිජ්ජ**. න-වෙළඳම.

**වාණී**. ඉ-තෙපුල, වචනය.

**වාත**. පු-වාතය, සුළඟ.

**වාත**. d. චු ගමනෙ, සුඛෙච, යාමෙහි හා සැපයෙහි, වාතෙති, වාතයති, යෙයි, සැප ශවයි.

**වාතක**. පු-වාතය, සුළඟ.

**වාත ඝාතක**. පු-වාතය නසන්නා, ඇසළ ගස.

**වාතණ්ඩ**. පු-අණ්ඩවාතය, වෘද්ධි රොගය, අණ්ඩ වායු රොගය.

**වාතපාන**. න-කවුළු දොර, ජනෙලය.

**වාත භක්ඛ**. පු-වාතය අනුභවකරන්නා.

**වාතභක්ඛක**. පු-වාතය අනුභව කරන්නා, හුළං බොන්නා.

**වාතමණ්ඩලික**. පු-සුළි සුළඟ.

**වාත මිග**. පු-වාත මෘගයා, වාතයෙන් වැටෙන ලද පත්‍ර ආදියේ ශබ්දයට බියවන මුව වර්ගයක්, වාතවෙගය වැනි ජව ඇති මෘග විශෙෂයක්.

**වාතවුට්ඨි**. ඉ-වාතය සහිත වර්ෂාව, වාතයෙන් විසුරුවන ලද ජලය ඇති වර්ෂාව.

**වාත සකුණ**. පු-එනම් පක්ෂියා.

**වාතාතප**. න-වාතය හා අව්ව.

**වාතාබාධ**. පු-වාත රොග, වාතගාය.

**වාතාහත**. පු-වාතයෙන් නසන ලද.

**වාති**. ක්‍රි-(d. භූ. වා, ගතියං, යෑමෙහි + ති) හමයි, විහිදෙයි.

**වාතික**. පු-වාතය ඇත්තා, වාත රොගියා

**වාතිඞ්ගන**. න-වම්බටු.

**වාතෙරිත**. ති-වාතයෙන් කම්පාවන ලද, වාතයෙන් සොලවන ලද.

**වාත්තා**. ඉ-වාර්තාව, වෘත්තාන්තය, තොරතුරු.

**වාත්තාකී**. ඉ-හෙළබටු.

**වාද**. පු-වාදය, විරුද්ධ වාදය, කීම.

**වාදක**. පු-කියන්නා, කථිකයා, වාද ඇත්තා, වාදනය කරන්නා.

**වාදන**. න-වැයීම, වාද්‍යය කිරීම, වාදනය කිරීම.

**වාදපථ**. පු-වාද මාර්ගය, වාදභූමිය, වාද පිළිවෙළ.

**වාදානුවාද**. පු-වාදය හා අනුවාදය, වාදය හා ප්‍රතිවිරුද්ධවාදය.

**වාදිත**. පු-අතතාදි වාද්‍යය, වයන ලද.

**වාදිතත**. න-ආතතාදිය.

**වාදිතත වාදන**. න-වීණාදීන් වයන දඬු ආදිය.

**වාදි**. පු-වාදසීලියා, වාදය ස්වභාව කොට ඇත්තා.

**වාදික**. පු-වාද ඇත්තා, වාදකයා, කථිකයා, කියන්නා.

**වාදිත**. ති-කියන ලද, වාද්‍යය කළ.

**වාදී**. පු-කියන සුළු තැනැත්තා, වාදියා.

**වාණ(න)**. න-තෘෂ්ණාව, ගෙත්තම් කිරීම, වියමන.

**වානපක්ඛ**. පු-වානප්‍රස්ථය, ආරාමය, අසපුව.

**වානය**. පු-මී ගස.

**වානර**. පු-වඳුරා, රිලවා.

**වානීර**. පු-හොඹුවගු.

**වානෙය්‍ය**. පු-දසපුර.

**වාපිත**. ති-වපුරණ ලද, ධාන්‍ය ඉසින ලද.

**වාපී**. ඉ-වැව, විල, තඩාගය.

**වාප්ප**. න-කොට්ටම්.

**වාම**. ති-වම්පස, විරුඬ, යහපත.

**වාමක**. පු-එනම් වෙදකතා ඍෂියා.

**වාමදෙව**. පු-එනම් ඍෂියා, ඊශ්වරයා.

**වාමන**. පු-දිගැත්හු, කුරා.

**වාමනක**. පු-මිට්ටා, වාමනයා.

**වාමන**. ති-ලුහුඬු දෙය.

**වාමී**. ඉ-වෙළඹ.

**වාය**. පු-වාතය, සුළඟ.

**වායති**. ක්‍රි-(d. භූ. වා, ගතියං, ගමන්හි + ති) හමයි, විහිදෙයි.

**වායන**. න-විවීම, ගෙතීම.

**වායන දණ්ඩ**. පු-වේමය, පිළිවියන දණ්ඩ.

**වායමති**. ක්‍රි-(d. භූ. වායම, ඊ හායං, වෑයමෙහි + ති) වෑයම් කරයි. වීර්‍ය්‍ය කරයි.

**වායමන**. න-වෑයම් කිරීම, උත්සාහ කිරීම.

**වායමිත**. ති-වෑයම්කළ, උත්සාහ කළ.

**වායස**. පු-කවුඩා, කපුටා.

**වායසවිජ්ජා**. ඉ-කපුටු ශාස්ත්‍රය.

**වායාම**. පු-වීර්‍ය්‍යය, ආයාසය.

**වායිත**. ති-වියන ලද, ගොතන ලද.

**වායිම**. ති-විසූ, වියනලද,

**වායු**. පු-වාතය, සුළඟ.

**වායුසඛ**. පු-ගින්නේ මිත්‍රයා, සුළඟ.

**වායොධාතු**. පු-වාතය, සුළඟ.

**වාර**. පු-දිනය, ප්‍රස්තාවය, වරක්, වාරයක්.

**වාරක**. පු-කළය.

**වාරඛග**. පු-හස්තියා, ඇතා

**වාරණ**. පු-ඇතා, වැලකීම, ඇත්කඳ ලිහිණියා.

**වාරණික**. ති-ඇතුන් පිළිබඳ.

**වාරනතික**. ති-හම්වලට අයත්, සම්වලට අඩංගු.

**වාරබාණ**. පු. න-සැට්ටය, හැට්ටය.

**වාරි**. න-ජලය, දිය.

**වාරිගොචර**. න-ජලය ගොචර කොට ඇත්තා මත්ස්‍යයා

**වාරිචර**. පු-වාරිගොචරයා.

**වාරිජ**. පු-දියෙහි උපන්නා. පද්මය, පියුම.

**වාරිද**. පු-ජලදායකයා, මෙඝය.

**වාරිධර**. පු-ජලය දරන්නා, සමුද්‍රය, මෙඝය.

**වාරිත**. ති-වලක්වනලද, ප්‍රතිෂෙධකළ.

**වාරිමගග**. පු-ජලමාර්ගය, දියයන ඇළදෙල ආදී මාර්ග පිහිලි සොරොව් ආදිය.

**වාරිවාහ**. පු-මෙඝය, වලාකුළ.

**වාරුණී**. ඉ-නිමිති කියන්නී, ශාස්ත්‍රකියන්නී, වාරුණී.

**වාරෙති**. ක්‍රි-(d. භූ. වර, ආවරණේ, ඇවුරීමෙහි + ණේ + ති) වළක්වයි.

**වාල**. පු-හිසකේ, අශ්වාදීන්ගේ රෝම, මයිල්

**වාල**. න-ඉරිවේරිය, ජලය.

**වාලකම්බල**. පු. න-රෝමවලින් තනන කම්බිලි රෙදි.

**වාලධි**. පු-තගුට, වලිගය

**වාලණ්ඩුපක**. න-හිස්වැස්ම,

**වාලණ්ඩුක**. න-රෝමාදියෙන් කළ බුරුසුව, කොස්ස.

**වාලරජ්ජු**. න-රෝමයෙන් කළ රැහැණ, කෙශමය යොත.

**වාලවීජනී**. ඉ-වල්විදුනා, චාමරය, සෙමර වල්ගය.

**වාලවෙධි**. පු-අඳුරෙහි අශ්ලොමයට විදීමට සමර්ථයා.

**වාලහත්ථ.** පු-වාලබිය.

**වාලිකා.** ඉ-වැලි.

**වාලි.** ඉ-වැලි, වාලුකා,

**වාලුකා.** ඉ-වැලි.

**වාලුකා කන්තාර.** න-සියුම් වැල්ලෙන් ගහණ දිය රහිත ප්‍රදේශය, කාන්තාර බලනු.

**වාමනනති.** ක්‍රි-පෙරළයි, පරිවර්තනය කරයි.

**වාස.** පු-වස්ත්‍රය, ගන්ධය, ගෘහය.

**වාසචුණ්ණ.** න-වත්සුණු, සුවඳ සුණු.

**වාසක.** පු-වසන්නා, නිවසන්නා.

**වාසති.** ක්‍රි-(d. දි. වස, සද්දෙ, ශබ්දයෙහි+ති) ශබ්ද කරයි, නාද කරයි, කෑගසයි.

**වාසධුර.** න-ජීවිතයේ වගකීම.

**වාසනන්ති.** ඉ-යොහොඹු.

**වාසනා.** ඉ-සුවඳ කැවීම, පෙර කළ කර්මයාගේ විපාකාවශේෂ තෙජස් ගතිය.

**වාසයොග.** පු-වත්සුණු, මුඛ චූර්ණය.

**වාසර.** පු-දිනය, දවස.

**වාසව.** පු-ශක්‍රයා.

**වාසාගාර.** න-ලගිනා ගෙය, වාසය කරණ ගෙය.

**වාසිජට.** පු-වෑයේකර.

**වාසි.** ඉ-වෑය, කරකැත්ත.

**වාසිත.** ති-සුවඳ කවන ලද.

**වාසිතක.** ති-වාසිත, සුවඳ කවන ලද.

**වාසී.** ති-වැසි, වාසය කරණ සුළු.

**වාසුකි.** පු-එනම් නාගරාජයා.

**වාසුදෙව.** පු-විෂ්ණු.

**වාසෙට්ඨ.** පු-එනම් වෙදකර්තෘ ඍෂියා.

**වාහ.** පු-ගැල, අශ්වයා, බාරි විස්සක් ප්‍රමාණ දේ බාරියක්=කිරියක් විසි අමුණකි.

**වාහක.** න-ගැලීම, ජල ප්‍රවාහය,

**වාහන.** න-රථාදී වාහනය.

**වාහනක.** න-වාහනය, රථපල්ලැක්කි ආදිය.

**වාහස.** පු-පිඹුරා, අජගරයා.

**වාහසා.** අ-නිසා, උදෙසා, සඳහා.

**වාහී.** පු-උසුලන්නා, බර ආදිය උසුලන තැනැත්තා.

**වාහිනී.** ඉ-නදිය, සෙනාව.

**වාහු.** d. භූ-උස්සාහෙ, උත්සාහ කිරීමෙහි, වාහති, උත්සාහ කරයි. වීර්‍ය්‍ය කරයි.

**වාල.** පු-සූයඝීයා, අශ්වරෝමය, රළු දෙය.

**වාලග්ගාහී.** පු-අහිගුණ්ඨිකයා, අහිතුණ්ඩිකයා.

**වාලමිග.** පු-සිංහව්‍යාඝ්‍රාදී චණ්ඩ මෘගාදීහු.

## වි

**වි.** අ-විවිධාර්ථ, අතිශය, අභාව, ඓශ්වර්‍ය්‍ය, අතික්‍රම, විරහ, විවාද, ප්‍රාදුර්භාව, සන්තොෂ කුත්සාර්ථ, දූර, අනභිමුඛත්ව, මොහ, අනවස්ථිති, ප්‍රධානත්ව, දක්ෂත්ව, භෙද, සභාගාර්ථ යනාදියෙහි.

**වි.** d. ක්‍රි-හිංසායං, හිංසාවෙහි, විනාති, හිංසා කරයි.

**විකත්තන.** පු-සාහසික යොධයා, යුධභූමියට පැමිණියා.

**වික්කන්දති.** ක්‍රි-(d. භූ. කදි, රොදනෙ, හැඬීමෙහි + ති) (වි + කන්ද + ති) හඬයි. අඬගසති.

**වික්කන්දන.** න - හැඬීම, අඬ ගැසීම, ආමන්ත්‍රණය.

**වික්කන්දිත.** ති-හඬනලද, අමන්ත්‍රණය කළ.

**වික්කම.** පු-වික්‍රමය, ශක්තිය, සම්පත්තිය, පදවික්ෂෙපය.

**වික්කය.** ති-විකිණිය යුතු දෙ, වෙළඳ බඩු.

**වික්කයික.** පු-විකුණන්නා.

**වික්කිණාති.** ක්‍රි-(d. කී. කී=දබ්බ විනිමයෙ, විකිණීමෙහි+ති) විකුණයි.

**වික්කෙතු.** පු-විකුණන්නා.

**වික්කෙය්‍ය.** පු-විකිණිය යුතු වස්තුව.

**වික්ඛන්දිත.** ති-කෑගසන ලද, අඬන ලද.

**වික්ඛම්භන.** න-විෂ්ඛම්භණය, යටත් කිරීම, පීඩා කිරීම, පළල.

**වික්ඛම්භති.** ක්‍රි-(d. භූ. ඛම්භ, පටිබන්ධෙ, බැඳීමෙහි+ති) විෂ්ඛම්භණය කරයි.

**(20332)**

**විකඛමහණීය**. ති-විෂ්ඛමහණය කටයුතු.

**විකඛමහිත**. ති-විෂ්ඛම්භණය කළ.

**විකඛලිත**. න-පැකිලීම, ඉබේටම හමුවීම,

**විකඛාසිතක**. න-සතුන් විසින් කාදමන ලද මළකඳ, අශුභ කර්මස්ථානවලින් එකක්.

**විකඛාලිත**. ති-සෝදනලද, සේදූ, පිරිසිදුකළ.

**විකඛාලෙති**. ක්‍රි-(d. භූ. චල, චලනෙ, සැලීමෙහි ණේ+ති) සෝදයි.

**විකඛිත්ත**. ති-දමන ලද, එහෙ මෙහෙ වීසි කරණ ලද.

**විකඛිත්තක**. ති-විවිධ දිසාවට දමන ලද, එහෙ මෙහෙ දමනලද.

**විකඛිපති**. ක්‍රි-දමයි, වීසිකරයි.

**විකඛිපන**. න-දැමීම, වීසිකිරීම.

**විකෙඛප**. පු-උඩඟු, දැමීම, වික්‍ෂෙපය, එක අරමුණක නොපිහිටන.

**විකෙඛපික**. ති-වික්‍ෂෙපිත.

**විකෙඛලික**. පු-නිත්දෙන් කුණු කෙළ වගුරු වන්නා.

**විකෙඛාභ**. පු-වික්‍ෂෝභය, මහා චලනය.

**විකෙඛාභිත**. ති-වික්‍ෂෝභකළ.

**විඛ**. d. චු-ආමසනෙ, ආමර්ශණයෙහි, විඛෙති විඛයති, ආමර්ශණය කරයි.

**විඛඩකත**. පු-කටුකිහිරි.

**විකච**. ති-මල් ගෙණ සිටි වෘක්‍ෂය, මල් ගෙණ සිටි ගස.

**විකට**. ති-මලමූත්‍රාදිය, විකාර ප්‍රාප්තයා.

**විකට භොජන** න-අසූචිභක්‍ෂණය, ගූථ භක්‍ෂණය.

**විකණ්ණ** ති-කොන් නැමුනු, නැමුනු කොන් ඇති,

**විකත**. පු-ලෙඩා.

**විකති**. ඉ-විකාරය.

**විකතිකා**. ඉ-සිංහ ව්‍යාඝ්‍රාදි රූපයෙන් විසිතුරු එළු ලොම් මුවා ඇතිරිය.

**විකත්ත**. ති-ඉරූ, කැබලිකළ.

**විකත්තන**. න-ඉරීම, කැබලිකිරීම.

**විකත්ථති**. ක්‍රි-(d. භූ. කත්ථ, සිලාඝනෙ, සතුති කිරීමෙහි+ති) පුච්චම් දෙඩයි.

**විකත්ථන**. න-විකල්පය, පක්‍ෂාන්තරය.

**විකත්ථන**. න-පුච්චම් දෙඩීම, බොරු ආඩම්බර කථාකීම.

**විකත්ථිත**. ති-ආඩම්බර කථා කළ.

**විකත්ථී**. පු-පුච්චම් දෙඩන්නා.

**විකත්ත**. ති-කොටස්වලට කැපූ, කපාදැමූ.

**විකත්තන** න-පිහිය.

**විකප්ප**. පු-විතර්කය, අදහස, සැකය, විකල්පය.

**විකප්පන**. න-දැක්වීම, විකල්පනය, දෙකින් එක.

**විකප්පිත**. ති-පිළියෙළකළ, නියමානුකූලව කළ.

**විකප්පී**. පු-විතර්ක කරන්නා, විකල්පනය කරන්නා.

**විකප්පිය**. ති-අදහස් කළ, පිළියෙල කළ.

**විකප්පෙති**. ක්‍රි-(d. චු. කප්ප, තක්කනෙ, තර්කනයෙහි+ති) තර්කනය කරයි, කල්පනා කරයි.

**විකම්පති**. ක්‍රි-(d. භූ. කම්ප, චලනෙ, සෙල වීමෙහි+ති) සැලෙයි.

**විකම්පී**. පු-සැලෙන්නා, චංචලවන්නා.

**විකසති**. ක්‍රි-(d. භූ. කස, ගතියං, යැමෙහි +ති) පුබුදුකරයි.

**විකසා**. ඉ-වැල්මදට.

**විකසිත**. ති-මල් ගෙණ සිටි වෘක්‍ෂය, ප්‍රබුඩ, පිපුණු.

**විකල**. පු-විකාර, වෙනසට පැමිණීම.

**විකලක**. ති-විකාරවූ, අඩුවූ.

**විකාර**. පු-විකෘතිය,ප්‍රකෘතිහුගේ, විපරිණාමය.

**විකාල**. පු-අකාලය, අවාරය, සවස්කාලය.

**විකාලභොජන**. න-ඉර අවරවූවායින් පසු වළඳන භොජනය.

**විකාසික**. ති-ප්‍රබුඩකළාහු, පිපීමකළාහු.

**විකාස**. පු-ප්‍රබෝධය, පුබුදුවීම, පිපීම.

**විකාසී**. පු-පුබුදුකරන්නා, ප්‍රබුඩකරන්නා.

(20384)

**වීකාසෙති**. ක්‍රි-(d. භූ. කාසු, දිත්තියං, දීප්ති යෙහි+ණෙ+ති) පුබුදු කෙරෙයි.

**විකිණ්ණ**. ත-විකිණි, විසුරුවනලද, ඉසින ලද.

**විකිරණ**. න-වරාංගස, අක්ෂිවෘක්ෂය.

**විකිරණ**. න-විසුරුවන, ණයදීමට සුදුසු නැකැත් යෙදීම.

**විකිරති**. ක්‍රි-(d. භූ. කිර, විකිරණෙ, විසුරු වීමෙහි+ති) විසුරුවයි, ඉසියි.

**විකුජ්ඣිත**. ති-තරහවූ, ක්‍රොධ කළ.

**විකුන්තිත**. ති-විරූප කළ, විකාර කළ.

**විකුබ්බණ**. න-විකුර්ණ, සෘද්ධිය.

**විකුබ්බති**. ක්‍රි-(d. භූ. කුබි, සද්දෙ, ශබ්දයෙහි +ති) විකුර්ණය කෙරෙයි.

**විකූජති**. ක්‍රි-(d. භූ. කූජ, සද්දෙ, ශබ්දයෙහි +ති) ශබ්ද කෙරෙයි.

**විකූජන**. න-ශබ්දකිරීම, නාදකිරීම.

**විකූජිත**. ති-ශබ්දකළ, නාදකළ.

**විකූල**. ති-නොසම, පැතලි සහිත, වලවල්, සහිත.

**විකොපන**. න-සුණුකිරීම, තැළීම පොඩි කිරීම.

**විකොපි**. පු-සුණුකෙළේ, තළන ලද්දේ, පොඩි කෙළේ.

**විකොපෙති**. ක්‍රි-(d. භූ. කුප, කොපෙ, කොපයෙහි+ණෙ+ති) විකෝපනය කරයි

**විග්ගය්හපරිකම්ම**. න-ඔවුනොවුන් සිරුරෙන් සිරුර ගටා ඇඟඉලීම.

**විග්ගහ**. පු-විරුද්ධ ග්‍රහණය, ඩබරය, ශරීරය, සමාස තද්ධිතාදීන්ගේ වාක්‍යය.

**විග්ගහිත**. ති-ගන්නා ලද, ගත්.

**විග්ගහික**. ති-විරුද්ධ ග්‍රහණයෙන් යුත්, ඩබර යෙන් යුත්.

**විග්ගාහික කථා**. ඉ-විරුද්ධ ග්‍රහණයෙන් යුත් කථා.

**විගච්ඡති**. ක්‍රි-(d. භූ. ගමු, ගතියං, යෑමෙහි +ති) පහවයෙයි.

**විගත**. ති-පහවන ලද, දුරුවනලද.

**විගම**. න-ඉවතයෑම, පහවයෑම.

**විගමන**. න-පහවයාම, දුරුවයාම

**විගය්හ**. පු-ගෙණ, ඇතුලත්ව.

**විඝටිත**. ති-ගලපනලද, එකට සම්බන්ධකළ.

**විඝාත**. ති-නසනලද, වෙහෙසකළ, පීඩාකළ, පීඩාව.

**විඝාටිත**. ති-ගලපනලද, සමත්තනලද.

**විඝාස** පු-කා ඉතිරි දෙය කෑම, ඉඳුල්කන්නා.

**විඝාසාද**. පු-කා ඉතිරිදෙය කන්නා, ඉඳුල් කන්නා.

**විච**. d. භූ-දි - විවෙචනෙ, පෘථක්කරණෙ ච, විවෙචනයෙහි, වෙන්කිරීමෙහි.

**විචක්ඛ**. ති-ප්‍රාඥ, පණ්ඩිත.

**විචක්ඛණ**. පු-ප්‍රාඥයා, පණ්ඩිතයා.

**විචය**. පු-සෙවීම, ප්‍රඥාව.

**විචයන**. න-සෙවීම, පරීක්ෂණය.

**විචරණ**. න-සංචාරණය, හැසිරීම.

**විචක්ඛු**. පු-අන්ධයා, ඇස්නැති.

**වීචක්ඛුක**. පු-අන්ධයා, ඇස් නැත්තා

**විචරති**. ක්‍රි-(d. භූ. චර, චරණෙ, හැසිරීමෙහි +ති) හැසිරෙයි.

**විචරිත**. ත-හැසුරුණු, හැසිරෙණලද

**විචාර**. පු-පරීක්ෂාව.

**විචාරක**. පු-පරීක්ෂා කරන්නා.

**විචාරණ**. න-පරීක්ෂාකිරීම, ඔබමොබ හැසි රීම.

**විචාරිත**. ති-හසුරුවනලද.

**විචාරිය**. පු-විචාරණය කොට.

**විචාරෙති**. ක්‍රි-(d. භූ. චර, චරණෙ, හැසිරී මෙහි+ණෙ+ති) හැසිරෙයි.

**විචිකිච්ඡති**. ක්‍රි-සැකකරයි.

**විචිකිච්ඡා**. ඉ-විචිකිච්ඡාව, සැකය.

**විචිණාති**. ක්‍රි-(d. කි, චි, චයෙ, රැස්කිරීමෙහි +ති) සොයයි, පරීක්ෂාකරයි.

**විචිකිච්ඡිත**. ති-විචිකිච්ඡා කළ.

**විචිකිච්ඡී**. පු-විචිකිච්ඡා ඇති.

**විචිණ්ණ**. ති-ක්‍රමය, පිළිවෙල, පටන්ගැන්ම.

(20437)

**විච්ත.** ති-වෙත්කල, අස්කල.

**විච්තක.** ති-විසිතුරු, විචිත්‍ර.

**විච්නන.** න-සෙවීම, බැලීම.

**විචුණ්ණ.** න-සුණුකල.

**විචුණ්ණිත.** ති-සුණුකල, චූර්ණකරණලද.

**විච්ඡ.** d. භූ-උපපත්තියං, ඉපදීමෙහි, විච්ඡති, උපදී.

**විච්ඡ.** d. චු-දිත්තියං, දීප්තියෙහි, විච්ඡෙති විච්ඡයති, බබලයි.

**විච්ඡික.** පු-ගෝනුස්සා.

**විච්ඡිද්දික.** පු-පහවූ ආසා ඇත්තා, ආසා නැත්තා.

**විච්ඡිද්ද.** න-විවිධවූ සිදුරු, නානාප්‍රකාර ඡිද්‍ර.

**විච්ඡිද්දක.** ති-විවිධ දිශාවෙන් හටගත් සිදුරු ඇති.

**විච්ඡින්දක.** පු-සිඳින්නා, සිඳීම.

**විච්ඡින්දති.** ක්‍රි-(d. රු. ඡිදි, විධාකරණෙ, කොටස් කිරීමෙහි+ති) සිඳියි, කපයි.

**විච්ඡින්දන.** න-සිඳීම, කැපීම.

**විච්ඡුරිත.** ති-බබලනලද, දිලිසෙනලද.

**විච්ඡෙද.** පු-සිඳීම, කැඩීම, නැවතීම.

**විජ්ජන්තරික.** න-විදුලියක් අතර, විදුලි එළි යක් පවත්නා අතර කාලය.

**විජ්ජති.** ක්‍රි-(d. දි, විද, සත්තායං, වීමෙහි +ති) විද්‍යමානවේ, ඇතිවේ.

**විජ්ජමාන.** ති-පවත්නා, තිබෙන.

**විජ්ජා.** ඉ-වෙදය, ශිල්පය, ත්‍රිවිද්‍යා ආදිය, විඳීනුයි ලබානුයි හෝ තමාට සතුරු මෝහා දිය විඳීනුයි හෝ විජ්ජා නම්.

**විජ්ජාචරණ.** න-අෂ්ටවිද්‍යා හා පසළොස් චරණ ධර්ම

**විජ්ජාධර.** පු-විද්‍යාව දරන්නා, එනම් දෙව විශෙෂය, විද්‍යාබලයෙන් සාධිකරණ තාපස කොටසක්.

**විජ්ජාකොට්ඨාස.** පු-විද්‍යා කොටස්, විද්‍යාභාග.

**විජ්ජාභාගිය.** පු-විද්‍යාව භජනය කරණ, විද්‍යා කොටස්වලට අයිති.

**විජ්ජාමය.** පු-විද්‍යාමය, විද්‍යාවෙන් උපන්, විද්‍යාවෙන් හටගත්.

**විජ්ජාවිමුත්ති.** ඉ-විද්‍යාව හා විමුක්තිය.

**විජ්ජු.** ඉ-විදුලිය.

**විජ්ජුතා.** ඉ-විදුලිය.

**විජ්ජුලට්ඨි.** ඉ-වක්‍රව රහිතව පවත්නා විදුලිය.

**විජ්ජුල්ලතා.** ඉ-විදුලිය.

**විජෙජාතති.** ක්‍රි-(d. දි. විජි, තෙජනෙ, බැබලීමෙහි+ති) බබලයි.

**විජෙජාතලති.** ක්‍රි-කඩු කරකවයි, කඩුහරඹ කරයි.

**විජෙජාතලන.** න-කඩු කරකවන, කඩු හරඹ කරණ.

**විජ්ඣති.** ක්‍රි-(d. දි, විධ, තාලනෙ, තැලී මෙහි+ති) විදියි.

**විජ්ඣන.** න-විදීම, වෙධනය.

**විජ්ඣාපෙති.** ක්‍රි-(d. දි, විධි, තාලනෙ, තැලී මෙහි+ණාපෙ+ති) විද්දවයි.

**විජ්ඣාපන.** න-විදුවන, විද්දවන.

**විජ්ඣාපිත.** ති-විදිනලද.

**විජ්ඣායති.** ක්‍රි-(d. භූ. ඣෙ, දය්හනෙ, දැවී මෙහි+ති) දැවෙයි, ක්ෂයවෙයි.

**විජන.** පු-ජනයන් රහිත, ජනසුන්‍ය, විවෙක ඇති.

**විජනට්ඨාන.** න-විජනස්ථාන, විවෙකස්ථානය.

**විජය.** පු-විශෙෂ ජය, මහත් ජය, දිනීම.

**විජයති.** ක්‍රි-(d. දි ජී, ජයෙ, දිනීමෙහි+ති) දිනයි, ජයගණී.

**විජහති.** ක්‍රි-(d. කි. ජී, අභිභවෙ, වැඩීමෙහි +ති) පහකරයි, දුරුකරයි.

**විජහන.** න-දුරුකරණ, පහකරණ.

**විජහිත.** ති-දුරුකල, පහකල.

**විජටන.** න-වෙළුහැරීම, අවුල් හැරීම.

**විජටිත.** ති-වෙළුහල, අවුල් අරිනලද, වෙළු අරිනලද.

**විජටෙති.** ක්‍රි-(d. භූ. ජට, සංඝාතෙ, නැසී මෙහි+ණෙ+ති) වෙළුහරියි, අවුල් හරයි.

**විජම්භති.** ක්‍රි-(d. භූ. ජභි, ගත්තවිනාමෙ, ඇඟමැලි කැඩීමෙහි+ති) විජෘම්භනය කරයි. වැජඹේ.

**විජම්භිත.** ති-විජෘම්භණය කළ, වැජඹුනු.

**විජම්භන.** න-විවිධ දිසාවන් බැලීම.

**විජම්භිකා.** ඉ-ඈනුම් හැරීම, ඇඟමැලි කැඩීම, අලසකම.

**විජාත.** ති-වදනලද, හටගත්, උපන්.

**විජාතා.** ඉ-දරු ලද්දී, වැදූ තැනැත්තී.

**විජාති.** ඉ-අන්‍යජාතිය.

**විජානන.** න-දැනීම, අවබොධය, දැනගැන්ම.

**විජානාති.** ක්‍රි-(d. භූ. ඤා, අවබොධෙ, දැනීමෙහි + ති) දැනීම, මනාව දනී.

**විජායති.** ක්‍රි-(d. දි, ජානි, පාතුභාවෙ, පහළ වීමෙහි + ති) වදයි, ප්‍රසූත කරයි.

**විජායන.** න-වැදීම.

**විජි.** d. භූ-භය චලනෙ, බියවීමෙහි හා සැලීමෙහි, වෙජති, බියවෙයි, සැලෙයි.

**විජි.** d. දි-භයචලනෙ, බියවීමෙහි හා සැලීමෙහි විජ්ජති, බියවෙයි, චලනය වෙයි.

**විජිගුච්ඡන.** න-පිළිකුල් කිරීම, ප්‍රතික්කූලය.

**විජිගුච්ඡිත.** ති-පිළිකුල් කළ, ප්‍රතිකූල කළ.

**විගුච්ඡති.** ක්‍රි-(d. භූ. ගුපු, ජිගුච්ඡනෙ, පිළිකුල් කිරීමෙහි + ති) පිළිකුල් කරයි.

**විජිත.** ති-දිනන ලද, ජයග්‍රහණය කළ රට

**විජිතාවී.** පු-දිනන සුලු තැනැත්තා.

**විඤ්ඤත්ති.** ඉ-විඤ්ඤප්තිය, හැඟවීම යාඥාව.

**විඤ්ඤාණ.** න-විඥානය, සිත, විශෙෂඥානය.

**විඤ්ඤාණඤ්චායතන.** න-එනම් අරූපාවචර භූමිය.

**විඤ්ඤාණකාය.** පු-ප්‍රඥාව, නුවණ,

**විඤ්ඤාණහාර.** පු-විඤ්ඤාණහාරය.

**විඤ්ඤාණක්ඛන්ධ.** පු-විඤ්ඤාණස්කන්ධය, ස්කන්ධ පසෙන් එකක්.

**විඤ්ඤාණට්ඨිති.** ඉ-විඤ්ඤාණයාගේ පැවැත්ම

**විඤ්ඤාණධාතු.** ඉ-විඤ්ඤාණ ධාතුව.

**විඤ්ඤාණවීථි.** ඉ-විඤ්ඤාණය පිළිබඳ චිත්ත වීථිය.

**විඤ්ඤාත.** ති-දැනගන්නාලද, අවබොධ කළ.

**විඤ්ඤාපක.** පු-හඟවන්නා, අවබොධ කරවන්නා.

**විඤ්ඤාපන.** න-හැඟවීම, දැන්වීම.

**විඤ්ඤාපි.** ති-හඟවනලද.

**විඤ්ඤාපෙති.** ක්‍රි-(d. භූ ඤා අවබොධෙ, අවබොධයෙහි + ණාපෙ + ති) හඟවයි, අව-බොධ කරයි.

**විඤ්ඤාය.** පු ක්‍රි-දැන, දැනගෙණ.

**විඤ්ඤුතා** ඉ-ප්‍රාඥභාවය, නුවණැති බව.

**විඤ්ඤුප්පසත්ථ.** පු-ප්‍රාඥයන් විසින් පසසන ලද,

**විඤ්ඤූ.** පු-ප්‍රාඥයා, පණ්ඩිතයා.

**විඤ්ඤෙය්‍ය.** න-එනම්සවරය, දැනගතයුතු.

**විට.** d. භූ-සද්දෙ, ශබ්දයෙහි වෙටති, ශබ්ද කරයි.

**විටඞ්ක.** පු-කොබෝගෙඩි වළල්ල.

**විටප.** පු-වෙළප, ශාඛාව පඳුර.

**විටපී.** පු-විටප ඇති, වෘක්ෂය.

**විටභි.** පු-වෙළෙප.

**විඩ.** පු-බලල්ලුණු.

**විඩොජ.** පු-ශක්‍රයා, සක්දෙව්රජ.

**විණ්හුක්කන්තා.** ඉ-කටරොළු.

**විණ්හුපද.** න-අහස.

**විතති.** ඉ-සන්තොෂය; වෙදනාව.

**විත්ථත.** ති-පතළ, ප්‍රකටදෙය.

**විත්ථම්භන.** න-ආධාරකිරීම, ශක්තිමත් කිරීම, ස්ථිර කිරීම.

**විත්ථම්භති.** ක්‍රි-(d. ථභි, ථම්භනෙ, ශක්තිමත් කිරීමෙහි + ති) ශක්තිමත් කරයි.

**විත්ථම්භිත.** ති-ශක්තිමත් කළ, ස්ථිරකළ,

**විත්ථායති.** ක්‍රි. (d. භූ. ථා, ගති නිවත්තිමහි= ගතිපැවතුම්හි + ති) ඇනසිටියි.

**විත්ථාර.** පු-ප්‍රපඤ්චය, විස්තාරය, විස්තරය.

**විත්ථාරික** පු-විස්තරකරන්නා, පතළකරන්නා

**විත්ථාරිත.** ති-විස්තර කළ,

**විත්ථාරෙති.** ක්‍රි-විස්තර කරයි.

(20542)

**විත්ථිණ්ණ.** ති-මහත, මහත්දෙය.

**විතක්ක.** පු-විතර්කය, කල්පනාව, සංකල්පය.

**විතක්කණ.** න-විතර්කණය කිරීම.

**විතක්කිත.** ති-විතර්කණය කළ.

**විතක්කෙති.** ක්‍රි-(d. චු. තක්ක, තක්කෙසු, තර්කයෙහි + ණෙ + ති) විතර්කණය කරයි.

**විතච්ඡිකා.** ඉ-එනම් කුෂ්ඨය.

**විතණ්ඩ.** න-තදින් ආරාවුල් කිරීම, දැඩිලෙස විවාද කිරීම.

**විතණ්ඩවාද.** න-විතණ්ඩවාදය, දැඩිලෙසවූ වාදය.

**විතණ්ඩසත්ථ.** න-විතණ්ඩවාදීන්ගේ ශාස්ත්‍රය.

**විතත.** න-දෙමුහුණක් ඇති තූර්යවිශේෂයක්, තම්මැට්ටම් ආදිය. විස්තාරය, පතළ.

**විතථ.** න-බොරුබස, අසත්‍යවචනය.

**විතරණ.** න-ත්‍යාගය, එතෙරවීම.

**විතාන.** න-වියන, විස්තීර්ණත්වය.

**විතිණ්ණ.** ති-තරණයකළ, එතෙර කළ.

**විතුදන.** න-විදීම, වෙධනය,

**විතුදති.** ක්‍රි-(d. භූ. තුද, ව්‍යථනෙ, විදීමෙහි + ති) වෙධනය කරයි. විදියි.

**විතුන්න.** න-කිඹුල්වැන්න.

**විථු.** d. භූ-යාචනෙ, ඉල්වීමෙහි, වෙථති, ඉල්වයි.

**විද්දසු.** පු-ප්‍රඥයා, පණ්ඩිතයා

**විද්දුම.** පු-පබුළු, පබළු, පුවාළ.

**විද්දෙස.** පු-වෛරය.

**විද්දෙසී.** පු-නොරටවැසියා, අමිත්‍රයා.

**විද්ධ.** ති-විදිනලද, වෙධනය කළ.

**විද්ධංස.** පු-විනාශය, නැසීම.

**විද්ධංසන.** න-විධ්වංසනය, නැසීම, විනාශය.

**විද්ධංසක.** ති-විසුරුවනලද, නසන ලද.

**විද්ධංසිත.** ති-විධ්වංසනයකළ, විසුරුවන ලද නැසූ.

**විද්ධංසති.** ක්‍රි-(d. චු. ධංස, විද්ධංසනෙ, නැසීමෙහි + ති) වධ්වංසනය කරයි.

**විද්ධංසෙති.** ක්‍රි-(d. චු. ධංස, විද්ධංසනෙ, නැසී-මෙහි + ණෙ + ති) විධ්වංසනය කරයි.

**විද්වා.** පු-පණ්ඩිතයා, ප්‍රාඥයා.

**විද.** d. චු-ලාභෙ, භොජනෙච, ලැබීමෙහි, අනුභවයෙහි, වෙදෙති, වෙදයති, ලබයි, වළඳයි.

**විද.** d. චු-චින්තනෙ, සිතීමෙහි, වෙදෙති, වෙදයති, සිතයි.

**විද.** d. භූ. ඤාණෙ, ඤාණයෙහි, විදති, දනී, වෙදෙ, විදූ.

**විද.** d. භූ. ලාභෙ, ලැබීමෙහි, වින්දති, ලබයි,

**විද.** d. රු-ලාභෙ, ලැබීමෙහි, වින්දති, ලබයි.

**විද.** d. රු-තොසෙ, සතුටෙහි, වින්දති, සතුටු වෙයි.

**විද.** d. දි-භාවෙ, වීමෙහි, විජ්ජති, වෙයි. ඇතිවෙයි.

**විදත්ථි.** ඉ-වියත, අගල් සතක දිග.

**විදංසක.** පු-විදහීම, විවෘත කිරීම, විවෘත කරන්නා.

**විදංසිත.** ති-විදහන ලද.

**විදංසෙති.** ක්‍රි-(d භූ. දංස, දංසනෙසු. විදහී මෙහි + ණෙ + ති) විදහයි, විවෘතකරයි.

**විදංසන.** න-විදහීම, විවෘත කිරීම.

**විදති.** ක්‍රි-(d. භූ. විදි, ලාභෙ, ලැබීමෙහි + ති) විදියි.

**විදහති.** ක්‍රි-(d. භූ. දහ, ධාරණෙ, දැරීමෙහි + ති) විදහයි.

**විදහන.** න-විදහීම, විවෘතකිරීම.

**විදාරන.** පු-පැළීම, දෙපළු කිරීම.

**විදාරණ.** න-පැළීම, විදාරණය කිරීම.

**විදාරිත.** ති-දෙපළුකළ, දෙකට පළනලද.

**විදාරිගන්ධ.** පු-අස්වැන්න.

**විදාරෙති.** ක්‍රි-(d. භූ. විදි, විදාරණෙ, දෙපලු කිරීමෙහි + ණෙ + ති) පළයි, දෙපළු කරයි.

**විදාලන.** න-විදාරණය, දෙපලු කිරීම.

**විදාලිත.** ති-පළනලද.

**විදාලෙති.** ක්‍රි-(d. භූ. විදි, විදාරණ, ණෙ + ති) පළයි.

(20596)

**විදි.** d. භූ-අවයවෙ, අවයවයෙහි, විඥති, අවයව ඇති කරයි.

**විදිත.** ති-දන්නා ලද අවබොධ කළ. පතළ දෙය.

**විදිතත්ත.** ති-දැනගත්, පළපුරුදු,

**විදිසා.** ඉ-අනුදිසාව.

**විදූ.** පු-ප්‍රාඥයා, පණ්ඩිතයා.

**විදුග්ග.** පු-දුර්ගීම, දුෂ්කර මාර්ගය, නදීවිදුර්ගාදිය.

**විදුර.** පු-පණ්ඩිතයා, ප්‍රාඥයා.

**විදූර.** න-ඈත, ඉතා දුර.

**විදුල.** පු-හොමුවගු.

**විදූසන.** න-දූෂ්‍ය කිරීම, කෙලසීම.

**විදූසිත.** ති-දූෂ්‍ය කළ, කෙලසන ලද.

**විදෙස.** පු-තොරට, අන්රට.

**විදෙහ.** පු-එනම් ජනපදය, එනම් රට.

**විධ.** d. දි-වෙධනෙ, විදීමෙහි, විජ්ඣති, විදියි.

**විධ.** පු. ඉ-උන්නතිය, ප්‍රකාරය, මාන්නය, තැබීම, කද, කොටස, ස්ත්‍රී අර්ථයෙහි ආකාරාන්තයි, විධා.

**විධ.** d. චු-කම්පනෙ, කම්පාවෙහි, වෙධෙති, වෙධයති, කම්පා වෙයි.

**විධංසක.** පු-නසින්නා, විධ්මනය කරන්නා.

**විධංසති.** ක්‍රි-(d. භූ. ධංස, සංයොගෙ, යෙදීමෙහි + ති) විනාශ කරයි.

**විධංසිත.** ති-විනාශ කළ.

**විධංසන.** න-විනාශය, නාස්තිය.

**විධවා.** ඉ-සැමියා නැත්තී. කතවැන්දුම්.

**විධා.** ඉ-වැටුප්, වියදම් මිළ.

**විධාතු.** පු-බ්‍රහමයා, බඹා.

**විධාන.** න-ක්‍රියාව, නියමය, නියොගය.

**විධායක.** පු-විදූන කරන්නා, විදූන රාළ.

**විධි.** පු-බ්‍රහමයා, ශුභ කර්මාදිය, ක්‍රියාව, විදිය. ආකාරය.

**විධු.** පු-විෂ්ණු, චන්ද්‍රයා.

**විධුනාති.** ක්‍රි-(d. භූ. ධූ, කම්පනෙ, කම්පාවීමෙහි + ති) කම්පා කෙරෙයි, විවිධ දිසාවට සොලවයි.

**විධුන්තුද.** පු-රාහු ග්‍රහයා.

**විධූම්භර.** පු-රාහු.

**විධුර.** පු. න-පණ්ඩිතයා, විවාදපන්නයා.

**විධූනික.** පු-ඉදිකටු ආදියෙන් විද කරණලද මල්දම්.

**විධූප.** පු-ගිනි රහිත, දුම් රහිත.

**විධූපන.** න-නැසීම, විධූපනය.

**විධූපිත.** ති-දවන ලද, දුම්ගස්සන ලද.

**විධූම.** පු-දුම් රහිත.

**විඥති.** ක්‍රි-(d. භූ විද, ලාභෙ, ලාභයෙහි + ති) විඳියි, අනුභව කරයි, රස බලයි.

**වින්‍යාස.** පු-ස්ථාපනය, රචනය, විස්තාරය, යුද පිණිස දෙශ විශෙෂයෙහි සෙනාව පිළිවෙලින් පිහිටුවීම.

**විනට්ඨ.** ති-නැසෙනලද, විනාශවන ලද.

**විනත.** ති-නැමුනු.

**විනතක.** පු-නැමුනු තැනැත්තා.

**විනදති.** ක්‍රි-(d. භූ. නද, අව්‍යක්ත සද්දෙ, අවියත් නදෙහි + ති) නාද කරයි.

**විනද්ධ.** පු-වෙළන ලද, ගොතනලද.

**විනද්ධති.** ක්‍රි. (d. නද, ගන්ථනෙ, ගෙතීමෙහි + ති) ගොතයි, වෙලයි.

**විනද්ධන.** න-වෙලීම, ගෙතීම.

**විනන්ධන.** න-බැඳීම, වෙළීම, ගෙතීම.

**විනතා.** ඉ-ගුරුළු මව.

**විනමන.** න-එහාට මෙහාට නැමීම.

**විනය.** පු-හික්මීම, විනය පිටකය.

**විනයති.** ක්‍රි-(d. භූ. නී, නයෙ, පැමිණවීමෙහි + ති) හික්මෙයි. පැමිණෙයි

**විනයධර.** පු-විනයධරන්නා, විනයපිටකය දරන්නා.

**විනයඤ්ඤු.** පු-විනය දන්නා, විනය ධර්මය දැනගත්තා.

**විනයන.** න-හික්මීම, හික්මවන.

**විනයපිටක.** න-ත්‍රිපිටකයෙන් විනයට අයත් කොටස, පාරාජිකා පරිවාර, පචිති, සුලුවග, මහවග යන පොත් සතර.

**විනලී.** ති-නල රහිත, සිදුරු රහිත.

**විනලීකත.** ති-නල රහිත කළ.

**විනස්සති.** ක්‍රි-(d. දි. නස, අදස්සනෙ, නොපෙණීමෙහි + ති) නැසෙයි, විනාශ වෙයි.

**විනස්සන.** න-නැසෙන, විනාශවන.

**විනා.** අ-වර්ජනාර්ථයෙහි, හැර, තොරව.

**විනාභාව.** පු-වෙන්වීම, තොරවීම.

**විනාමන.** පු-නැමීම.

**විනාම.** න-නැමීම.

**විනාමිත.** ක්‍රි-නමනලද.

**විනාමෙති.** ක්‍රි-(d. භූ. නමු, නමනෙ, නැමීමෙහි + ණෙ + ති) නමයි.

**විනායක.** පු-හික්මවන්නා, බුදුරජ.

**විනාස.** පු-නැසීම, විනාශය.

**විනාසන.** න-නැසීම, විනාශකිරීම.

**විනාසෙති.** ක්‍රි-(d. දි. නස, අදස්සනෙ, නොපෙනීමෙහි + ණෙ + ති) විනාශ කරයි, නසයි

**විනිච්චරති.** ක්‍රි-(d. භූ. චර, ඡෙදනෙ, සිඳීමෙහි + වි + නි + චර + ති) රැස් පතුරුවයි.

**විනිච්ඡය.** පු-විනිශ්චය, නිශ්චය.

**විනිච්ඡනන.** න-විනිශ්චය කිරීම.

**විනිච්ඡති.** ක්‍රි-විනිශ්චය කරයි.

**විනිච්ඡිනාති.** ක්‍රි-විනිශ්චය කරයි, නිශ්චය කරයි.

**විනිච්ඡිත.** ති-විනිශ්චය කළ, විසඳන ලද.

**විනිජ්ජිත.** ති-විනිශ්චය කරණ ලද,

**විනිග්ගත.** ති-විනිගීත, බැහැර ගිය, බැහැර කළ.

**විනිග්ගත.** ති-නික්මුණු.

**විනිධාය.** අ-පටන්, පටන් ගෙණ.

**විනිපාත.** න-නපුරුව පහළවන ස්ථානය, නිරය.

**විනිපාතික.** ති-විවසව පතිතවන්නා, නිරයෙහි උපදින්නා.

**විනිපාතෙති.** ක්‍රි-(d. භූ. පත, ගතියං, යෑමෙහි + ණෙ + ති) නපුරුව පතිත වෙයි, නිරයෙහි උපදියි.

**විනිබ්භුජන.** න-විනිබ්භොගය, වෙළු හැරීම, පතුරු ගෑසීම.

**විනිබ්භුජති.** ක්‍රි-(d. භූ. භුජ, කොටිල්ලෙ, කුටිල බැව්හි + ති) වෙළුහරියි. පතුරු ගලවයි

**විනිබ්භොග.** පු-වෙළු හැරීම, විනිබ්භුජනය.

**විනිබන්ධ.** ති-බඳනාලද, ගැටගසන ලද.

**විනිබද්ධ.** ති-බඳනා ලද.

**විනිම්මුත්ත.** ති-මිදුනු, මිදෙන ලද.

**විනිමය** න-මාරු කිරීම, හුවමාරු කිරීම,

**විනිමොචන.** න-මිදීම, ලෙහීම.

**විනියොග.** න-භුක්ති විඳීම, ඉල්ලීම,

**විනිවත්තන.** න-නැවැත්වීම, නැවතීම,

**විනිවිජ්ඣන.** න-විනිවිදීම, පසාකර විදීම.

**විනිවිජ්ඣති.** ක්‍රි-විනිවිදියි, පසාරු කරගණ යයි.

**විනිවිද්ධ.** ති-බඳනා ලද, බන්ධනය කළ.

**විනිවෙධන.** න-විදීම, විනිවිද යාමට විදීම.

**විනිවෙස.** පු-බැඳුම, බන්ධනය, ආශාවීම, සම්බන්ධ වීම.

**විනීත.** ති-ශික්ෂිතයා, සුවයෙන් උසුලන අශ්වයා.

**විනීවරණ.** න-ආවරණය.

**විනුදති.** ක්‍රි-(d. භූ. නුද, ඛෙපණෙසු, ක්ෂය කිරීමෙහි + ති) පහකෙරෙයි, කම්පා කෙරෙයි

**විනෙජන.** පු-හික්මීමට සුදුසු ජනයා, ධර්මාව බොධයට සුදුස්සා.

**විනෙතබ්බ.** ති-හික්මියයුතු.

**විනෙති.** ක්‍රි-හික්මෙයි.

**විනෙය්‍ය.** ක්‍රි-හික්මවා, හික්මෙන්නේය.

**විනොදක.** පු-ප්‍රීතිවන තැනැත්තා, ඉවත් වන්නා.

**විනොදන.** න-ප්‍රීතිවීම, ඉවත් කිරීම, බැහැර කිරීම.

**විනොදෙති.** ක්‍රි-(d. භූ. නුද, ඛෙපණෙසු, දැමීමෙහි + ණෙ + ති) විනොදනය වෙයි.

**විප්‍ප.** පු-බ්‍රාහමණ, බමුණා, විප්‍ර.

(20703)

**විප්පකත.** ති-අවසන් නොකළ, අඩාල කළ.

**විප්පකට්ඨක.** ති-දුර.

**විප්පකාර.** පු-විකාරය, සිහි මුලාව, වෙනස.

**විප්පකිණ්ණ.** ති-විසුරුවන ලද, ඉසුරුවන ලද

**විප්පකිරති.** ක්‍රි-විසුරුවයි, ඉසියි.

**විප්පකිරණ.** න-විසිරීම, ඉසිරවීම, ඉහිරීම.

**විප්පජහති.** ක්‍රි-(d. භූ. ජහ, ගත්තවිනාමෙ+ති) පහ කෙරෙයි, දුරු කෙරෙයි.

**විප්පජහන.** න-පහකිරීම, දුරුකිරීම.

**විප්පටික්කූල.** ති-විරුද්ධ, අසමාන.

**විප්පටි පජ්ජති.** ක්‍රි-(d. භූ. පද, ගතියං, යැමෙහි+ති) වරදවා පිළිපදියි.

**විප්පටිපත්ති.** ඉ-විරුද්ධ ප්‍රතිපදාව, වැරදි පිළිපැදීම.

**විප්පටිපාදන.** න-විරුඬ ප්‍රතිපාදනය, වරදවා කරණ සම්පාදනය, අවකල්පනය.

**විප්පටිපාදන.** න-අවකල්පනය කිරීම.

**විප්පටිසාර.** පු-පශ්චාත්තාපය, පසුතැවිල්ල, විපිළිසර,

**විප්පමුත්ත.** පු-මිදුනු, මිදෙන ලද.

**විප්පලපති.** ක්‍රි-(d. භූ ලප, ව්‍යත්තියං වාචායං, වියත් වචනයෙහි+ති) විලාප කියයි, නත්දෙඩයි.

**විප්පලපන.** න-විලාප කීම, නත්දෙඩීම.

**විප්පවුත්ථ.** පු-වෙන්ව වාසය කළ, ගණ සඞ්ඝණිකාවෙන් තොරව වාසය කළ.

**විප්පසන්න.** ති-අතිශයින් ප්‍රසන්න, ඉතා පැහැදුනු.

**විප්පසාදන.** න-විශෙෂ පැහැදීම, මනා පැහැදීම.

**විප්පසාදෙති.** ක්‍රි-(d. භූ. සාද, සාදනෙ, රස විඳීමෙහි+ණෙ+ති) විශෙෂයෙන් පහදියි.

**විප්පහීන.** ති-ප්‍රහීණය, නිරුඬය.

**විප්පහීන.** න-ප්‍රහීන කළ.

**විප්පලම්භති.** ක්‍රි-(*d*. භූ. ලම්භ, ගතියං යැමෙහි +ති) වංචා කරයි.

**විප්පලම්භන.** න-වංචාකිරීම, උසුලු විසුළු කිරීම

**විප්පයුත්ත.** ති-වෙන් කළ,

**විප්පයොග.** පු-වෙන් කිරීම, වෙන්වීම,

**විප්පලාස.** පු-විරුඬ වචනය.

**විප්පලුජ්ජති.** ක්‍රි-(d. දි. ලුජ, විනාසෙ විනාසයෙහි+ති) විනාශ වෙයි.

**විප්පලුජ්ජන.** න-විශෙෂයෙන් සුණු විසුණු වීම.

**විප්පවාස.** පු-නොපැමිණීම, අමතක කර දැමීම, සිතේ අමතක වීම.

**විප්පවුත්ථ.** ති-නොපැමිණි, නොවැසූ.

**විප්පහාන.** න-අත්හැර යැම, දීම.

**විප්ඵල.** න-නිෂ්ඵල, ඵලරහිත, විපාක නැති

**විප්ඵන්දන.** න-සැලීම, ගැහීම.

**විප්ඵන්දති.** ක්‍රි (d. භූ. ඵඳි, කිඤ්චිචලනෙ, සෙලවීමෙහි+ති) සැලෙයි, ගැහෙයි.

**විප්ඵන්දිත.** ති-සැලුනු, ගැහුනු.

**විප්ඵාර.** පු-පතල, විස්තාර.

**විප්ඵාරික.** ති-පතල, පතළ බව.

**විප්ඵාරිත.** ති-පතල, පැතුරුණු.

**විප්ඵුරණ.** න-විස්ඵන්දනය, චංචලය, සෙලවීම.

**විප්ඵුරති.** ක්‍රි-(d. භූ. ඵර, චලනෙසු, සෙලවීමෙහි+ති) චංචල වෙයි, සෙලවෙයි.

**විප්ඵුලිඞ්ග.** න-ගිනි පුපුර.

**විප්ඵාලිත.** ති-පළන ලද, දෙපළු කළ.

**විප්ඵාලෙති** ක්‍රි-(d. භූ. ඵල, හෙදනෙ බිඳීමෙහි+ණෙ+ති) පලයි, දෙපලුකරයි.

**විප්පොථිත.** ති-පොඩිකළ, විශෙෂයෙන් පොඩි කළ.

**විපක්ක.** පු-විපක්ෂ, විරුඬ, සතුරා, පැසුනු.

**විපක්ඛ.** පු-විපක්ෂ විරුඬ.

**විපක්ඛසෙවන.** න විපක්ෂ සෙවනය, සතුරු සෙවනය.

**විපක්ඛි.** පු-විපක්ෂ ඇත්තා, සතුරා.

**විපච්චති.** ක්‍රි-(d. භූ. පච පාකෙ, පිසීමෙහි +ති) විපාක වෙයි, පැසෙයි.

**විපච්චන.** න-පැසවන, විපාක දෙන.

(20755)

**විපච්චනක**. පු-විපාක දෙන, පැසවන.

**විපච්චනික**. ති-විරුඬ, සතුරු.

**විපච්චනීය**. පු-විරුඬ, සතුරු.

**විපජ්ජති**. ක්‍රි-(d. භූ. පද, ගතියං, යෑමෙහි + ති) වරදියි, විනාශ වෙයි.

**විපජ්ජන**. න-විනාශ වීම, වැරදීම.

**විපත්ති**. ඉ-විපත, විනාශය.

**විපථ**. පු-නොමග, අපායමාර්ගය, වැරදි මාර්ගය

**විපඤ්චන**. න-අවබෝධ කිරීම.

**විපඤ්චිත**. ති-අවබෝධ කළ.

**විපඤ්චෙති**. ක්‍රි- (d. දි. පච්, විත්ථාරෙ පළල් කිරීමෙහි + ණෙ + ති) අවබෝධ කරයි.

**විපතති**. ක්‍රි-පතිතවෙයි, වැටෙයි.

**විපන්න**. ති-වරදවා පැමිණි, වැරදි, සදොස්.

**විපන්නදිට්ඨි**. ඉ-මිථ්‍යාදෘෂ්ටිය, වැරදි දෘෂ්ටිය

**විපරක්කම**. පු-උත්තම පරාක්‍රමය.

**විපරාමොස**. පු-හිම තෘණාදියෙන් මාර්ග වසා ජනයා මුළා කිරීම.

**විපරාවත්ත**. ති-වෙනස් කළ, මාරුකළ.

**විපරිනත**. ති-පරිවර්තනය කරණ ලද, පෙරළෙන ලද.

**විපරිනමන**. න-නැමීම කරණ, අවනතකරණ.

**විපරිනාම**. පු-පෙරළීම, පරිවර්තනය.

**විපරියාස**. පු-විපර්‍යාසය, පරිවර්තනය.

**විපරියාදිකත**. ති-විපරියායකත, විපර්‍යාස කළ.

**විපරියෙස**. පු-විරුඬය, වැරැද්ද.

**විපරියෙසගාහ**. පු-විරුඬග්‍රහණය, වැරදි ගැන්ම.

**විපරිවත්ත**. ති-රවුමට කැරකැවුනු, වටේට කරකැවුනු.

**විපරිවත්තන**. න-විපර්‍යාසය, පෙරළීම.

**විපරිවත්තෙති**. ක්‍රි-(d. භූ. වතු, වත්තනෙ, පැවතීමෙහි + වි + පරි + තන + ණෙ + ති) වටේට පෙරළෙයි.

**විපල්ලත්ථ**. න-රියසක.

**විපල්ලාස**. පු-විපර්‍යාසය.

**විපල්ලාසයති**. ක්‍රි- (d. භූ. ලස, කීලනෙසු, සෙල්ලම් කිරීමෙහි + ති) වරදවා ගනු ලබයි.

**විපල්ලාසගාහ** පු-වරදවා ගැන්ම, වැරදි ග්‍රහණය.

**විපරීත**. පු-විපර්‍යාස.

**විපරීකත**. ති-විපර්‍යාසකරණ ලද.

**විපස්සක**. පු-විදර්ශනා කරන්නා, බලන්නා.

**විපස්සති**. (ක්‍රි. d. භූ. දිස, පෙක්ඛණෙ, බැලීමෙහි + වි + දිස් = ස්ස + ති) බලයි.

**විපස්සන**. න-බැලීම, නිරීක්ෂණය.

**විපස්සනා**. ඉ-විදර්ශනාව, ප්‍රඥ විශෙෂයක්.

**විපස්සනාපඤ්ඤා**. ඉ-විදර්ශනාප්‍රඥව.

**විපස්සනාධුර**. විදර්ශනාධුරය.

**විපස්සනාකම්මට්ඨාන**. න-විදර්ශනා කර්මස්ථානය.

**විපස්සි**. පු-බලන්නා, පණ්ඩිතයා, එනම් බුදුරජ.

**විපාක**. පු-ඵලය, විපාකය, ආනිසංසය.

**විපාචන**. න-තැසීම, පිසීම, පැසීම.

**විපාචෙති**. ක්‍රි-(d. භූ. පච, පාකෙ, පිසීමෙහි + ණෙ + ති) පැසවයි, පිසයි.

**විපාටන** න-විදාරණය, දෙපලු කිරීම.

**විපාටෙති** ක්‍රි-(d. භූ. පට, ගතියං, යෑමෙහි + ණෙ + ති) විදාරණය කරයි, පලයි, උදුරයි

**විපාතන**. න-පැළීම, තැසීම.

**විපාදිකා**. ඉ-පයපොළු.

**විපිට්ඨි**. ඉ-පිටිපස.

**විපින**. න-වනය, අරණ්‍ය, කැලෑව.

**විපුබ්බක** පු-විවිධදසාවෙන් සැරව වැගිරීම.

**විපුබ්බකසඤ්ඤා**. ඉ-ශරීරයාගේ විවිධ ආසාවන්ගෙන් වැගිරෙන පූයා අනුව ශරීරය පිළිකුල් වශයෙන් සැලකීම.

**විපුල**. පු-මහත්, විසාල, විශාල.

**විඵල**. න-පලනැති. පලරහිත, ප්‍රයෝජන නැති, අල්ප.

**විභූ**. d. භූ. අනුභවෙ, අනුභව කිරීමෙහි විභූති, අනුභව කරයි.

(20809)

**විභ්‍රාන්ත**. ති-භ්‍රාන්ත, නැතිගත්.

**විභ්‍රම**. පු-භ්‍රාන්තිය, ලීලාව, ඉවතයාම.

**විබ්භමති**. ක්‍රි-(d. භූ. හමු අනවට්ඨානෙ, නොනැවතීමෙහි + ති) තපස් භාවයෙන් ගිහිවෙයි, සිවුරු හරියි.

**විබ්භමන**. න-තාපස භාවයෙන් ඉවත්ව ගිහි බවට යාම, සිවුරු හැර යාම.

**විබ්බ**. පු-බන්ධන මොක්ෂය, බන්ධනයෙන් මිදීම

**විබන්ධන**. න-බන්ධන මොක්ෂය.

**විබාධක**. පු-බාධාව, බාධකයා.

**විබාධති**. ක්‍රි-(d භූ. නිවාරණෙ, වැළැක්මෙහි + ති) බාධාකරයි, පෙළයි.

**විබාධන**. න-පෙළීම, බාධා කිරීම.

**විබුධ**. පු-දෙවියා පණ්ඩිතයා ප්‍රාඥයා.

**විභජ්ජ**. බෙදීම, කොටස් කිරීම.

**විභජ්ජවාද**. පු-බුද්ධවචනය, සර්වඥදේශනාව

**විභජ්ජවාදී**. පු-විභජ්ජවාද ඇත්තා, බුදුරජ.

**විභඞ්ග**. න-බෙදීම, වර්ග කිරීම, කොටස් කිරීම.

**විභත්ත**. ති-බෙදන ලද, විභාග කළ.

**විභත්ති**. ඉ-බෙදීම, ප්‍රථමා ද්‍විතියාදි විභත්ති,

**විභත්තික**. පු-විබතට අයත්, විභත්ති පිළිබඳ

**විභජන**. න-බෙදීම, කොටස් කිරීම.

**විභජිත**. ති-බෙදූ, බෙදන ලද, කොටස් කළ.

**විභව**. පු ධනය, අභාවය.

**විභවතණ්හා**. ඉ-උච්ඡේද දෘෂ්ටි සහගත රාගය

**විභවදිට්ඨි**. ඉ-විභව තණ්හා.

**විභංකර**. පු-සූර්යයා, හිරු.

**විභාග**. පු-බෙදීම, පරීක්ෂණය.

**විභාජන**. න-බෙදීම, වෙන් කිරීම.

**විභාත**. ති-අලුයම, ප්‍රත්‍යූෂය.

**විභාති**. ක්‍රි-(d. භූ. භා. දිත්තියං, දීප්තියෙහි + ති) බබලයි, දිලිසෙයි.

**විභාධති**. ක්‍රි-(d. භූ. බාධ නිවාරණෙ, වැළැක් මෙහි + ති) බාධා කරයි, පෙළයි.

**විභාවනීය**. න-පැහැදිලි කිරීම, විස්තර කිරීම.

**විභාවන**. න-වැඩීම, දියුණු කිරීම.

**විභාවරී**. ඉ-රාත්‍රිය, රැය.

**විභාවිත**. ති-වඩනා ලද = වර්ධනය කළ = වැඩූ

**විභාවසු**. පු-වහ්නිය, ගින්න, සූර්යයා.

**විභාවිනී** පු-වර්ධනය කරන්නී, පුරවන්නී.

**විභාවී**. පු-පණ්ඩිතයා = ප්‍රාඥයා.

**විභාසිත**. ති-බබලන ලද, දීප්තිමත්.

**විභිංසනක**. ති-මහාභයජනක, මහාබිය එළවන.

**විභින්න**. ති-බිඳිනා ලද, බිඳිනු.

**විභීටක**. පු-බුළුගස, විභීතක.

**විභීතක**. පු-බුළුගස, විභුටක.

**විභූ**. පු-අධිපතියා = ප්‍රධානියා, ප්‍රභූ නිතර පවත්නා.

**විභූත**. ති-ප්‍රකට, ප්‍රසිද්ධ.

**විභූති**. ඉ-ඓශ්වර්යය, යසඉසුරු.

**විභූසන**. න-ආභරණය, සැරසීම.

**විභූසිත**. ති-සැරසෙනලද = අලඞ්කාර කරණ ලද.

**විභූසෙති**. ක්‍රි-සරසයි, අලඞ්කාර කරයි.

**විභෙදිකා**. ඉ-තල්ගස.

**විමටට**. පු-පහරදීම, ප්‍රහාරදානය.

**විමට්ඨ**. ති-මුදු, මොළොක්.

**විමජ්ජති**. ක්‍රි-(d දි, මද, උම්මාදෙ, උමතු වීමෙහි + ති) මැදීම කරයි, මාජීනය කරයි.

**විමජ්ජන**. න-මැදීම.

**විමති**. ඉ-විමතිය, විචිකිච්ඡාව.

**විමද**. ති-මදයෙන් වෙන්වූ, අහංකාර කමින් වෙන්වූ.

**විමද්දන**. න-විනාශ කිරීම, කඩාබිඳ දැමීම.

**විමන**. න-දුෂ්ටසිත් ඇත්තා, නපුරු සිත් ඇත්තා.

**විමරියාදිකත**. න-නිදහස් කරණව, භාර දෙනව.

**විමල**. පු-නිර්මල, පිරිසිදු, නිර්මල ජලය.

(20866)

**විමාන.** න-දෙවප්‍රාසාදය, මාළිගාව, මහල් ගෙය.

**විමානිත.** න-සුළුකොට සැලකීම, අවමානයෙන් සැලකීම.

**විමානෙති.** ක්‍රි-(d. මාන, පූජායං, පිදීමෙහි + ණෙ + ති) අවමන් කෙරෙයි.

**විමුඛ.** පු-පරාම්මුඛය, ඉවත බැලීම.

**විමුච්චති.** ක්‍රි-(d. භූ. මුච, මොචෙ, මිදීමෙහි + ති) (වි + මුච + ති) මිදෙයි.

**විමුච්චන.** න-මොචනය, මිදීම, බැම්ලිහීම.

**විමුත්ත.** ති-මිදෙනලද, මොචනයකළ, ලිහන ලද.

**විමුත්ති.** ඉ-විමුක්තිය, බන්ධන මොචනය, නිවණ, මාර්ගයෙන් පැමිණිය යුතු අග්‍රීත් ඵලය.

**විමුත්තිඤාණ.** න-ප්‍රත්‍යවෙක්‍ෂ ඥානය.

**විමොක්ඛ.** පු-විමොක්‍ෂය, මිදීම, නිවණ.

**විමොඛ.** පු-විමොක්ඛය, විමොක්‍ෂය.

**විමොචන.** න-මිදීම, බන්ධනයෙන් මිදීම.

**විමොචෙති.** ක්‍රි-(d. භූ. මුච, මොචෙ, මිදීමෙහි + ණෙ + ති) මුදයි, මොචනය කරයි.

**විමොහිත.** ති-රැවටූ, මූලාකළ.

**විම්හය.** පු-විස්මය, පුදුමය, කුතුහලය.

**විම්හාපක.** පු-විස්මයට පමුණුවන්නා.

**විම්හාපන.** න-පුදුමයට පැමිණවීම.

**විම්හාපෙති.** ක්‍රි (d. භූ. හා, ගතිසු, ගමන්හි + ණෙ + ති) විස්මයට පමුණුවයි.

**විම්හිත.** ති-විස්මිත, විස්මයට පැමිණෙන ලද.

**වියත්ත.** ති-ව්‍යක්ත=පටු=දක්‍ෂ=නිපුණ.

**වියත්ති.** ඉ-පැහැදිළිකම, වෙනස්කම.

**වියාඛ්‍යාත.** ති-ප්‍රකාශකළ, ප්‍රකටකළ.

**වියාකරණ.** න - ව්‍යාකරණය, විවරණය, වියරණ.

**වියාපන්න.** පු-විපතට පැමිණි, හානියට පැමිණි.

**වියාවත්ත.** ති-විපරිවර්තිත, පරිවර්තනය වන ලද,

**වියොග.** පු-වියොගය, විරාගය, වෙන්වීම, එනම් ශෘඞ්ගාර භෙදය.

**විරජ.** පු-පහවූ රජස් ඇති, නිර්මල, පරිසුඬ.

**විරත්ත.** පු-නො ඇලුන, විරත, විරක්ත.

**විරත.** ති-විරක්ත, නො ඇලුනු.

**විරජ්ජති.** ක්‍රි-(d. දි, රන්ජ, රාගෙ, ඇලීමෙහි + ති) නො ඇලෙයි, නො රුදෙයි.

**විරජ්ජන.** න-නො ඇලීම, නොරුඳීම.

**විරජ්ඣති.** ක්‍රි-(d දි, රධ, හිංසායං, හිංසාවෙහි + ති) වරදියි, වරද්දයි.

**විරජ්ඣන.** න-වැරදවීම, වැරදීම.

**විරද්ධ.** පු-වරද්දනලද, වැරැද්දූ.

**විරති.** ඉ-විරමණය, වැලකීම.

**විරමති.** ක්‍රි-(d. භූ. රමු, උපරමෙ, ඇලීමෙහි + ති) වෙන්වෙයි.

**විරමන.** න-වෙන්වීම, වියොගය.

**විරල.** ති-තුණීදෙය, ඝනනොවන දේ.

**විරහ.** පු-වියොගය, ස්ත්‍රී පුරුෂයන්ගේ වියොගය.

**විරහිත.** ති-රහිත, නැති.

**විරාග.** පු-නො ඇලීම, නිවණ, ආය්‍යීමාර්ගය.

**විරාගී.** පු-රාග රහිතයා, නො ඇලෙන්නා,

**විරාජ.** ති-බබලන, දිලිසෙන.

**විරාජති.** ක්‍රි-(d. භූ. රාජ, දිත්තියං, දීප්තියෙහි + ති) බබලයි, දිලිසෙයි.

**විරාජිත.** ති-බබලනලද, දිලිසෙනලද.

**විරාජෙති.** ක්‍රි-(d. භූ. රාජ, දිත්තියං, දීප්තියෙහි + ති) බබලයි, දිලිසෙයි.

**විරාධිත.** ති-වලකනලද, වරද්දනලද.

**විරාධෙති.** ක්‍රි-(d. භූ. රාධ, ආවරණෙ, වැළැක්මෙහි + ණෙ + ති) වලකයි, වරදයි.

**විරාම.** පු-නැවැත්ම, නවතින තැන.

**විරාව.** පු-හඬ, නාදය, ඝොෂාව.

**විරිච්චති.** ක්‍රි-(d. දි, රිච, විරෙචනෙ, පාචනවිමෙහි + ති) විරෙචනය වෙයි, පාචනයවෙයි.

**විරිච්චන.** න-විරෙචනය, පාචනය.

(20918)

**විරිච්**. පු-බ්‍රහ්මයා.

**විරිය**. පු-ශක්තිය, බලය, ආනුභාවය.

**විරියඞ්ග**. න-වීර්‍ය්‍යාඞ්ගය, වීර්‍ය්‍යයාගේ කොටස්.

**විරුද්ධ.** ති-වැරදි, සදොස්.

**විරුද්ධ ගබ්භකරණ.** න-නස්නා ගැබ නොනස්නා පිණිස බෙහෙත් දීම.

**විරුජ්ඣති**. ක්‍රි-(d දි, රුධි, ආවරණෙ, ඇවිරීමෙහි+ති) විරුද්ධවෙයි.

**විරුජ්ඣන**. න-විරුද්ධවීම, පටහැනිවීම.

**විරුත.** පු-මෘගාදීන්ගේ හඬ, මෘගාදී නාදය.

**විරූප.** න-අවලක්ෂණ රූපය, කැතරූපය.

**විරූපක්ඛ**. පු-නාගාධිපති එනම් වරම්රජ, නාගකොටසක්, විෂ්ණු දෙවිරද, ඊශ්වරයා.

**විරූළ්හ.** ති-වැඩීම, උසස්වීම.

**විරූළ්හක.** පු-කුම්භාණ්ඩාධිපති, එනම් වරම් රජ, නාගකොටසක්.

**විරූහති**. ක්‍රි-(d. භූ. රුහ, ජම්මනි, ඉපදීමෙහි +ති) වැඩෙයි. වර්ධනයවෙයි.

**විරේක**. පු-විරේචනය, අධෝවිරේචනය.

**විරේචන**. න-විරේචනය, පාචනය.

**විරෝචන**. න-බැබලීම, බබලන

**විරෝචති**. ක්‍රි-(d. භූ. රුච, දිත්තියං, දීප්තියෙහි+ති) බබලයි, දිලිසෙයි.

**විරෝධ**. පු-වෛරය, වෛෂය.

**විරෝධන**. න-වෛරකිරීම.

**විරෝධි.** පු-විරෝධ ඇත්තා, සතුරා, අමිත්‍රයා.

**විරෝධිත.** පු-විරෝධය.

**විරෝධොක්ති**. ඉ-විරුද්ධ වචනය, විරුද්ධකීම.

**විලක්ඛණ**. න-අවලක්ෂණය, විරූපය.

**විලඞ්ග**. පු-බිලඞ්ග, කාඩි, ඇඹුල්දිය.

**විලඞ්ඝක**. පු-අත් පා ආදියෙන් සලකුණු හඟවන්නා.

**විලපති**. ක්‍රි-(d. භූ. ලප, ව්‍යත්තියං, වාචායං, ව්‍යක්ත වචනයෙහි+ති) විලාපකියයි, වැලපීම කරයි.

**විලපන.** න-විලාපකීම.

**විලම්බ**. ති-එල්ලෙන, එල්බෙන.

**විලම්බති.** ක්‍රි-(d. භූ. ලම්බ, ගතියං, යෑමෙහි +ති) එල්ලෙයි.

**විලම්බී**. ති-එල්ලෙන, එල්බෙන.

**විලය.** න-කුඩා කොටස්වලට බෙදීයාම, විසිර යාම.

**විලසති.** ක්‍රි-(d. භූ. ලස, කීලනෙසු, සෙල්ලම් කිරීමෙහි+ති) සෙල්ලම් කරයි.

**විලසිත**. ති-සෙල්ලම් සහිත, ප්‍රීති සහිත.

**විලාක.** ති-හීන් ඉඟටියක් ඇති.

**විලාප.** පු-වැලපීම, විලාපකීම.

**විලාස**. පු-ආකාරය, ක්‍රීඩාව, ක්‍රියාව,

**විලාසී.** පු-ඇලුම් කටයුතු ගති ඇත්තා, විලාසී ගති ඇත්තාවූ.

**විලාර**. පු-බිලාර, බළලා

**විලී**. d දි-විදිනභාවෙ, දියවීමෙහි, විලීසති, දියවෙයි.

**විලීනසෙනහ.** පු-වුරුණුතෙල.

**විලිඛති.** ක්‍රි-(d. භූ. ලිඛ, ලෙඛන, ලිවීමෙහි +ති) ලියයි, ඉරි අඳියි, ඉරිගසයි.

**විලිඛන**. න-ඉරිගෑසීම, ලිවීම.

**විලිඛිත**. ති-ඉරි අඳිනලද, ලියනලද.

**විලිත්ත**. ති-ආලෙපකළ, විලෙපනයකළ.

**විලිම්පති**. ක්‍රි-(d. භූ. ලිප, ලිම්පනෙ, ආලෙප කිරීමෙහි+ති) ආලෙපකරයි.

**විලිම්පන**. න-ආලෙපනය, තැවරීම.

**විලිම්පිත**. ති-ආලෙපනය කළ.

**විලීයති**. ක්‍රි-(d. කී, ලී, සිලෙසනෙ, දියවීමෙහි+ති) දියවෙයි.

**විලීයන**. න-දියවීම.

**විලුඞ්ග**. පු-ඒ මේ අතින් එල්ලෙන.

**විලුත්ත**. ති-සොරකම්කළ, විනාශකළ.

**විලුම්පති**. ක්‍රි-(d රු. ලුප, අවච්ඡෙදනෙ, සිඳීමෙහි+ති) විලුම්පනය කරයි. මංකොල්ලකයි.

**විලුම්පන.** න-විලුම්පනය කිරීම.

**විලූන**. න-සිඳිනලද, කපනලද.

**විලෙඛ**. පු-ඉරි ඇඳීම.

(20973)

**විලොකන.** න-බැලීම, හාත්පස බැලීම.

**විලොකිත** ති-බලනලද, බැලූ.

**විලොචන.** න-ඇස, බැලීම.

**විලොප.** න-කොල්ලකෑම, සොරකම් කිරීම.

**විලොපක.** පු-කොල්ලකමින් ජීවත්වන්නා, සොරකමින් ජීවත්වන්නා.

**විලොලන.** න-සොරකම් කිරීම, කොල්ලකෑම.

**විළාර.** පු-බිලාර, බළලා.

**විවජ්ජන.** න-දුරුකරණ, බැහැරකරණ.

**විවජ්ජිත.** ති-දුරුකළ, බැහැරකළ.

**විවජ්ජෙති.** ක්‍රි-(d. චු. වජ්,ගතියං යෑමෙහි + ණෙ + ති) දුරුකරයි, බැහැරකරයි.

**විවට්ට.** පු-විභවය, නිවණ, සිවුරේ වස් අත්ත,

**විවට්ටකප්ප.** පු-විවෘතී කල්පය,

**විවට්ටන.** න-විවර්තනය, පෙරලීම.

**විවට්ටෙති.** ක්‍රි-(d. භූ. වට්ට, ආවට්ටනෙ, පෙරලීමෙහි + ණෙ + ති) පෙරලෙයි.

**විවට.** ති-විවෘත, වැසුම් ඇරිය.

**විවටච්ඡද.** ති-විවෘතකළ, වැසුම් හැරිය.

**විවදති.** ක්‍රි-(d. භූ. වද, වියත්තියං වාචායං, වියත් වචනයෙහි + ති) විවාද කරයි.

**විවදන.** න-විරුඬවචනය, වෙන්වීමට සුදුසු නැකත් බලාකීම.

**විවර.** න-සිදුර, රන්ධ්‍රය.

**විවරණ.** න-ප්‍රකාශය වැසුම් හැරීම.

**විවරති.** ක්‍රි-(d. භූ. වර, ආවරණෙ, වැසීමෙහි + ති) වැසුම් හරියි, විවෘත කරයි.

**විවාදක.** පු-විවාද කරන්නා, වාදකාරයා.

**විවාදියති.** ක්‍රි-(d. භූ. වද, වියත්තියං වාචායං වියත් වචනයෙහි + ති) වාදකරයි.

**විවාදමූල.** න-විවාදයට මුල් කාරණය.

**විවාහ.** පු-පාණිග්‍රහණය, කාරබන්ධනය, කුමාරිකාවක් (සත්‍රියක් කුමාරයෙකුට) (පුරුෂයෙකුට) ගෙණඒම.

**විවිච්ච.** අ-වෙන්ව, තුරන්ව, විනා.

**විවිච්ඡා.** ඉ-මසුරුකම, තද ලෝභකම,

**විවිත්ත.** ති-විවික්ත, වෙන්වන ලද.

**විවිධ.** ති-නානාප්‍රකාර, අනෙකවිධ, නන් අයුරු.

**විවෙක.** පු-කාය චිත්තාදීන්ගේ විවෙකය, ජනසම්බාධාදියෙන් වෙන්වීම, පරීක්ෂණය, නිවණ.

**විවෙචන.** න-නිශ්චයකිරීම, විවෙචනය කිරීම,

**විවෙචෙති.** ක්‍රි (d. භූ. වච, වියත්තියං වාචායං, වියත් වචනයෙහි + ණෙ + ති) විවෙචනය කරයි.

**විවෙස.** ති-විශිෂ්ඨ, උසස්.

**විස.** d. භූ-පවෙසනෙ, ප්‍රවෙශ කිරීමෙහි, විසති, පවිසති, ප්‍රවෙශවෙයි, ඇතුළත්කරයි.

**විස.** d. ති-විප්පයොගෙ, විප්‍රයොගයෙහි, විසාති, විප්‍රයොගවෙයි.

**විස.** d. දි. පෙරණෙ, උත්සාහ යෙහි, විස්සති, උත්සාහ කරයි.

**විසකණ්ඨ** (ණ්ඨක) න උක්සකුරු.

**විසංයුත්ත.** ති-වෙන්ව යෙදුනු.

**විසංයොග.** පු-විවෙකය, වෙන්ව යෙදීම.

**විසංවාද.** පු-මිථ්‍යාවාද අනිත්‍යාදිය නිත්‍යයයි කීම.

**විසංසෙට්ඨ.** පු-වෙන්ව සිටීම, සංසට්ඨනොවන

**විසඤ්ඤුත්ත.** ති වෙන්ව යෙදුනු.

**විසඤ්ඤිතා.** ඉ-විසඤ්ඤීබව, මූර්ඡා බව, මුලාව.

**විසට.** ති-පතළ, පැතුරුණු, ව්‍යාප්ත වසතු.

**විසඩක.** ති-නිභීය, බයනැති, සැකනැති.

**විසත්ත.** පු-පැටළුනු, අවුල්වන ලද, එතුනු.

**විසත්තිකා.** ඉ-තෘෂ්ණාව.

**විසති.** න-ජීවත්වන තැන, නිවස, ගෙය.

**විසද.** ති-සුද, පරිව්‍යක්ත, ලග්නනොවන.

**විසදත්ත.** න-විස්පෂ්ට භාවය.

**විසදකිරියා.** ඉ-පැහැදිලි කිරීම.

**විසධර.** පු-විෂ ධරන්නා=සර්පයා.

**විසත්ත.** ති-ගිලුනු, ගැලුනු

**විසප්පන.** න-පැතිරීම, පතළවීම.

**විසභාග.** පු-සභාගනොවන, ලබ්ධි ආදියෙන් සමනොවන.

**විසභාගාරම්මණ**. න-ක්ලේශොත්පත්තියට හෙතුවන අරමුණු.

**විසම**. පු-සමනොවන, අසම, දුෂ්ට. නපුරු

**විසය**. පු-සතතයෙන් සෙවුනා ලබන දේ, රූපශබ්දාදිය, ජනපදය, ප්‍රදෙශය, ගොචරය, බලය.

**විසය්හ**. ති-හැකි, පුළුවන්, ශක්තිමත්.

**විසයී**. න-චක්ෂුරාදි ඉන්ද්‍රියය.

**විසවන**. න-උපදවන, රැස්වන.

**විසවිජ්ජා**. ඉ-විසබානා, විසබදිනා, මන්ත්‍ර, විෂපිළිබඳ විද්‍යාව.

**විසර**. පු-සමූහය. රැස.

**විසංඛාර**. පු-සංඛාරවිරහිත, නිර්වාණය.

**විසංහිත**. න-විධ්වංසනය කළ = විනාශකළ.

**විසජ්ජ**. අ-හැර අත්හැර.

**විසජ්ජති** ක්‍රි-(d. භූ. සජි, සංසගගාදිසු, සංසර්ගයෙහි + ති) විසදයි, විසර්ජනයකරයි.

**විසජ්ජන**. න-හැරීම, දුරුකිරීම, අත්හැරීම

**විසල්ල**. ති-දුකින් හෝ වේදනාවෙන් මිදුනු,

**විසලිත්ත**. ති-විසතැවුරුණු, විෂපෙවූ හීය.

**විසා**. ඉ-ඉවඳ, එනම් නැකත.

**විසාඛා**. ඉ-විසාතකත, එනම් ඇත්තී.

**විසාණ**. ති-ඇඳ් දළ, සිව්වුන්ගේ අං.

**විසාද**. පු-ඛෙදය, වෙහෙස.

**විසාර**. පු-මත්ස්‍යයා, මාලුවා.

**විසාරද**. ති-ප්‍රාඥයා, අතිශයින් ප්‍රගල්භයා, තැතිගැසීම් රහිත බැවින් උදාරභාවයට පැමිණි තැනැත්තා.

**විසාල**. ති-මහත්, පළල, පතළ.

**විසාලතා**. ඉ-පුළුල්බව, පළල්බව.

**විසාලා**. ඉ-තියඹරා, එනම් රාජධානිය.

**විසිඛ**. පු-ශරීරය, ඊය,

**විසිඛා**. ඉ-වීදිය, වීථිය, මහමග.

**විසිට්ඨ**. ති-අතිශ්‍රෙෂ්ඨ, ඉතා උතුම්.

**විසීදති**. ක්‍රි-(d. භූ. සිද, සීදනෙ, ගිලීමෙහි + ති) ගැලෙයි, ගිලාබසියි.

**විසීවති**. ක්‍රි-(d. කි. සි. පාකෙ, පැසීමෙහි + ණෙ + ති) දියවෙයි, උණුවෙයි.

**විසීවන**. න-දියවීම, උණුවීම,

**විසු**. d. භූ-සෙවනෙ, ඉසීමෙහි, වෙසති, ජලය ඉසී.

**විසුං**. අ-වෙන්කිරීමෙහි, වෙන්ව

**විසුක්ඛ**. ති-ඉතා විය ලුනු, අතිශයින්වියලීගිය.

**විසුද්ධ**. ති-පිරිසිදු, නිර්මල.

**විසුද්ධි**. ඉ-ඉතාපිරිසිදු වස්තුව, නිර්වාණය.

**විසුජ්ඣන**. න-පිරිසිදුවීම, පිරිසිදුවන.

**විසුද්ධිදෙව**. පු-බුදුරජ.

**විසූක**. න-විසුලු, කෝලම් රූපාදිය.

**විසූකදස්සන**. න-විසුලුදේ දැක්ම, කෝලම් බැලීම.

**විසූචිකා**. ඉ-ඉදිකටුවලින් ශරීරය විදින්නාක් මෙන් වෙදනා උපදවන බලවත් අතීසාර රෝගයක්.

**විසෙනි**. නිකෙලෙස්, කෙලෙස් රහිත.

**විසෙස**. පු-වෙනස්, අතිරෙක.

**විසෙසන**. න-වෙනස් කිරීම; වෙනස දැක්වීම.

**විසෙසිත**. ති-වෙනස් කළ, වෙසෙසනලද.

**විසෙසක**. පු-තිලකය.

**විසෙවිත**. ති-සෙවනය කළ, ආශ්‍රය කළ.

**විසෙවන**. න-විශෙෂසෙවනය, නිත්‍යාශ්‍රය.

**විසෙසාධිගම**. පු-විසෙසාවබොධය, මාර්ගඵලාදී අධිගමය.

**විසොක**. ති-සොවින් තොර, ශොකයෙන් තොර.

**විසොධන** න-සුඩකිරීම, පාරිසුද්ධිකරණය.

**විසොධිත**. ති-පිරිසිදුකළ, සුඩකළ.

**විසොසති**. ක්‍රි-(d. භූ. සුසං, සොසනෙ, විය ලීමෙහි + ති) වියලයි, වේලයි.

**විස්ස**. පු-මිනීදුම් ආදිය, දුගඳ, විසම.

**විස්සග්ග**. පු-සංසර්ගවිරහිත, හරණලද බැහැර කළ.

**විස්සජ්ජක**. පු-විසඳන්නා, විසර්ජනය කරන්නා.

**විස්සජ්ජති**. ක්‍රි-(d. භූ. සජ්ජා, ගතියං, ත්‍යාගෙහි + ති) වීසඳයි, පැණවිසඳයි.

**විස්සජ්ජන**. න-විසඳීම, පැණවිසඳීම, ත්‍යාගය.

**විස්සජ්ජිත**. ති-විසඳන ලද, විසර්ජිතයකළ.

**විස්සට්ඨ**. ති-හරණලද, මුදනලද, ගෙතන ලද.

**විස්සත්‍ථ**. පු-නිසැක, බියනැති, විස්වාසික.

**විස්සභෙසජ්ජ**. න-වියලි ඉඟුරු, සිඩිගුරු.

**විස්සම්භ**. පු-විශ්වාසය, විශ්‍රම්භය.

**විස්සමන**. න-විඩා හැරීම, වෙහෙස හැරීම, විශ්‍රාම ගැණීම.

**විස්සමෙති**. ක්‍රි-(d. භූ. සමු, උපසමෙ, සංසිඳීමෙහි + ණෙ + ති) විශ්‍රාම කෙරෙයි, විඩා සංසිඳුවයි.

**විස්සවන**. න-වැගිරෙණ, උතුරායන=උතුරණ

**විස්සසති**. ක්‍රි-(d. භූ. විස, දි, පෙරණෙ, ප්‍රේරණයෙහි + ති) විස්වාස කරයි.

**විස්සසා**. ඉ-ජරාව.

**විස්සානන**. න-ත්‍යාගය, නැගිදීම.

**විස්සාස**. පු-විශ්වාසය.

**විස්සාසී**. පු-විශ්වාස ඇත්තා.

**විස්සුත**. ති-ප්‍රසිඞ, ප්‍රකට, පතල.

**විස්සුස්සන**. න-වියලීම, ඉතා වියලීම.

**විහඟ**. පු-අහසෙහි යන්නා=පක්ෂියා.

**විහඞ්ග**. පු-අහසෙහි යන්නා = පක්ෂියා.

**විහඞ්ගම**. පු-අහසෙහි යන්නා=සියොතා විහඟ

**විහගාධිප**. පු-අහසෙහි අධිපතියා, ගුරුළුරාජයා=ගුරුළා.

**විහත**. ති-නසන ලද, මරණ ලද.

**විහනන**. න-නැසීම, ඝාතනය.

**විහඤ්ඤති**. ක්‍රි-(d. භූ. හන, ඝාතෙ, නැසීමෙහි + ති) නැසෙයි=මැරෙයි.

**විහත්‍ථ**. පු-ආකුල, අවුල්වූ.

**විහරණ**. න-වාසය=වැසීම=පැවැත්ම.

**විහරති**. ක්‍රි-(d. භූ. හර, හරණෙ, හැරීමෙහි + ති) වෙසේ, වාසය කෙරේ.

**විහායස**. පු-ආකාශය, අහස, ගුවන.

**විහායිත**. න-ත්‍යාගය, තෑග්ග.

**විහාර**. පු-දිව්‍ය විහාරාදිය, තථාගතාවාසය=බුඩාලය, ඉරියාපථ පැවැත්වීම, වාසස්ථානය ක්‍රීඩා.

**විහිංසන**. න-වෙහෙස=හිංසාව, පීඩාව.

**විහිංසා**. ඉ-වෙහෙස, පීඩාව.

**විහිංසාධාතු**. ඉ-විහිංසාව පිළිබඳව චිත්තයාගේ පැවැත්ම.

**විහිත**. ති-කරණ ලද, කළ.

**විහීන**. න-නීච, අධම.

**විහෙඨ**. පු-හිරිහැරය, කරදරය, පීඩාව.

**විහෙඨන**. න-හිරිහැරවීම, පීඩාව.

**විහෙස**. පු-වෙහෙස, විඩාව.

**විහෙසන**. න-හිරිහැරය, කරදරය.

**විළඞ්ග**. න-වළඟසාල්, විඩඞ්ග.

## වී

**වී**. d. කි. තනතු, සන්තාන, නූල් කැටීමෙහි, විවීමෙහි, විනාති, වියයි, නූල්කටියි.

**වී**. d. භූ-චලනාදිසු, සැලීම් ආදියෙහි, වෙති, සැලෙයි, අනුභව කරයි.

**වීච්ඡා**. ඉ-විප්සාව, ආසාව, කැමැත්ත.

**වීචි**. ඉ-රැළ, සිදුර.

**වීජ**. d. භූ-වීජනෙ, පවන් සැලීමෙහි, පවන් සලයි.

**වීජති**. ක්‍රි-(d. භූ. වීජ, වීජනෙ, පවන් සැලීමෙහි + ති) පවන් සලයි.

**වීජන**. න-පවන් සැලීම, පවන් ගැසීම.

**වීජනී**. ඉ-විජිනිපත, පවන් අත්ත, වටාපත, අවාන.

**වීණා**. ඉ-වීණාව, වෙණ.

**වීණාගුණ**. පු-වීණා තත්.

**වීණාදෙණී**. ඉ-වීණාකඳ, වීණා ඔරුව.

**වීණාවාදන**. න-වෙණ වැයීම, වීණා ගැම

**වීණාවාදී**. පු-වෙණ වයන්නා, වීණා ගායකයා

**වීත.** න-විගත, පහවකලද, වියමන.

**වීතරාග.** පු-පහකළ රාග ඇත්තා, බුදුරජ, රහත්හු.

**වීතතණ්හ.** පු-පහවූ තෘෂ්ණා ඇත්තා, බුදුරජ රහත්හු.

**වීතදර.** පු-පහවූ දරථ ඇත්තා

**වීතදරථ.** පු-පහවූ දරථ ඇත්තා.

**වීතදොස.** පු-පහවූ දොස ඇත්තා, දොස් නැත්තා.

**විතික්කම.** පු-ව්‍යතික්‍රමය, ඉක්මවීම, සිඳීම.

**වීතිනාම.** කල්යැවීම, කල්ගත කිරීම.

**වීතිනාමෙති.** ක්‍රි-කල්ගෙවයි, කල් යවයි, පසුකරයි.

**වීතිපතන.** න-වීතිනාමය, ඉක්මවීම.

**වීතිපතති.** ක්‍රි-(d. භූ. පත පතනෙ, වැටීමෙහි + ති) ඉක්මවයි, කල්යවයි, ඉක්මවයි.

**වීතිවත්තන.** න-ඉක්මවීම, පසුකිරීම.

**වීතිසාරෙතබ්බා.** අ-කටයුතු නිමවා, කටයුතු ඉවරකර.

**වීතිසාරෙති.** ක්‍රි-(d. භූ. සර, චින්තායං, සිතීමෙහි + ණෙ + ති) කටයුතු නිමවයි කටැට් ඉවරකරයි.

**වීථි.** ඉ-මාර්ගය, වීදිය, පෙළ.

**වීථිචිත්ත.** න-වීථිචිත්තය,

**වීහ** d. භූ-ගුණකථනෙ, ගුණ කීමෙහි, වීහති ගුණ කියයි.

**වීමංසන.** න-සෙවීම = පරීක්ෂණය.

**වීමංසා.** ඉ-තීරණප්‍රඥව.

**වීර.** d. චු-වික්කමෙ වික්‍රමයෙහි, වීරෙති, වීරයති, වික්‍රමය කරයි.

**වීර.** පු-එනම් නාට්‍ය රසය, ශූරයා, සාහසික යොධයා.

**වීරඞ්ගරූප.** පු-දෙවපුත්‍රයන් වැනි ශරීර ඇත්තා.

**වීරුං.** ති-බොහෝ පත්‍ර ඇතිවැල.

**වීස.** d. භූ-සද්දෙ, ශබ්ද කිරීමෙහි, වීසති, ශබ්ද කරයි.

**වීසති.** ක්‍රි-ශබ්ද කරයි.

**වීසති.** ඉ-විංසති, විස්සයි, 20.

**වීහි.** ඉ-වී, ධාන්‍යය.

**වීළ.** d. චු-ලජ්ජායං, ලජ්ජාවීමෙහි.

**වීළිත.** ති-ව්‍රීඩිත, ලජ්ජා ප්‍රාප්තයා, ලජ්ජාවට පැමිණියහු.

## වු

**වු.** d. භූ. ඡාදනෙ, වැසීමෙහි, වුණොති වසයි

**වුච්චති.** ක්‍රි-(d. භූ. වද, වචනෙ, කීමෙහි + ති) කියනු ලැබේ.

**වුච්චමාන.** පු-කියනු ලබන, කියන, කියන්නේ.

**වුට්ඨාන.** න-නැගීම, උස්වීම.

**වුට්ඨි.** ඉ-වැස්ස=වර්ෂාව.

**වුට්ඨිත.** ති-නැගී සිටි, අවදිවූ, 'පටිසල්ලානා වුට්ඨිතො.'

**වුට්ඨිනිප්පජ්ජනක.** පු-අහස්දියෙන් නිපන් ශස්‍යවත් ප්‍රදෙශය.

**වුඩ්ඪ.** පු-වෘද්ධ, ප්‍රාඥ, පණ්ඩිත, වැඩි.

**වුති.** ඉ-ආවරණය.

**වුත්ති.** ඉ-හිසකේ බෑම, ජීවිකාවෘත්තිය, බීජ රොපණය, වපසමකිරීම, කීම, බන්ධන මුක්තිය, අධ්‍යයන ආදිය.

**වුත්ත.** ති-කියන ලද, දෙසන ලද.

**වුත්තාන්ත.** පු-වෘත්තාන්තය=වාර්තාව.

**වුද්ධි.** ඉ-වැඩීම, වෘද්ධිරොගය, අභිවෘද්ධිය.

**වෘද්ධිරොග** පු-වෘද්ධිරොගය, අණ්ඩවාතරොගය.

**වුධු.** d. භූ-වුඩ්ඪියං, වැඩීමෙහි.

**වුය්හන.** න-ඉවසීම.

**වුය්හමාන.** පු-උසුලනු ලබන.

**වුල.** d. චු-නිමජ්ජනෙ, ගැලීමෙහි, වොලෙති, වොලයති, ගැලෙයි.

**වුස** පු-ගොණා,

**වුසිත.** ති-වාසය කළ, වැඩනිමවන ලද, "වුසිතං බ්‍රහ්මචරියං"

**වුසීමත.** ති-වැසූ, වාසය ඇති, වාසය කළ.

(21187)

## වූ – වෙ

**වූපසන්ත**. ති-සංසිඳුනු = සංසුන්.

**වූපසම**. පු-සංසිඳීම.

**වූපකට්ඨ**. ති-හුදකලා විහරණ ඇති, තනිව වසන.

**වූපසමන**. න-සංසිඳීම, උපසමනයවීම.

**වූළ්හ**. ති-ගසාගෙණ ගිය, රැගෙණ ගිය.

**වෙ**. අ-ඒකාන්ත, පදපූරණයෙහි

**වෙ**. d භූ-තන්තුසන්තානෙ වීමෙහි, වායති, වියයි.

**වෙ**. d. භූ-සුක්ඛෙ, වියලීමෙහි, වායති, වියලයි.

**වෙක්ඛ**. d. භූ-ඔලොකනෙ, බැලීමෙහි, වෙක්ඛති, බලයි.

**වෙකටික**. පු-විකට අනුභව කරන්නා, විකට නම් අසුචිය.

**වෙක්ඛති**. ක්‍රි-(d. භූ. වෙක්ඛ, ඔලොකනෙ, බැලීමෙහි+ති) බලයි, නිරීක්ෂණය කරයි.

**වෙකල්ල**. න-විකලබව.

**වෙකුණ්ඨ**, පු-වෛකුණ්ඨ, විෂ්ණු.

**වෙග**. පු-ජවය, ප්‍රවාහය.

**වෙගසා**. ති-ජවයෙන්, ප්‍රවාහයෙන්.

**වෙගී**. පු-ශීඝ්‍ර ජව ඇත්තා, ඉක්මන් ගමන් ඇත්තා,

**වෙචිකිච්ඡී**. ති-විචිකිච්ඡා ඇත්තා,

**වෙචිත්ත**. න-සිතේ කලබල ගතිය, නොසන් සුන් සිත.

**වෙජයන්ත**. පු-ශක්‍රයාගේ පහය, ශක්‍රයාගේ රථය.

**වෙජයන්තිකා**, ඉ-තිට්ට

**වෙජ්ජ**. පු=වෛද්‍ය, වෙදකම් කරන්නා.

**වෙජ්ජකම්ම**. න-වෙදකම, වෙදකම් කිරීම.

**වෙඤ්ජන**. ඉලක්කය.

**වෙට**. d. චු-ඡේදනෙ, සිඳීමෙහි, වෙටෙති, වෙටයති, සිඳියි.

**වෙටෙති**. කි. d. ඡේදනෙ, සිඳීමෙහි+ති සිඳියි.

**වෙඨ**. d. චු-වෙඨනෙ, වෙළීමෙහි, වෙඨෙති, වෙඨති, වෙළයි.

**වෙඨ**. d. භූ-වෙඨනෙ, වෙළීමෙහි, වෙඨති, වෙළයි,

**වෙඨන්ත**. පු-වීණාදණ්ඩ.

**වෙඨන**. න-වෙළුම, නලල් පට, හිස් වෙළුම

**වෙඨිත**. ති-වෙළන ලද, ඔතන ලද්ද.

**වෙණ**. පු-කුළුපොත්තා, හුණබට ආදියෙන් භාණ්ඩ සාදන්නා.

**වෙණී**. පු-දෙවදළිය, ගැවසූ කෙශය.

**වෙණවික**. පු-කුළුපොත්තා.

**වෙණික**. පු-වීණාගායන්නා, වේණ වයන්නා.

**වෙණු**. පු-හුණගස, උණගස.

**වෙණුගුම්බ**. න-හුණ කැලය, හුණ අකුල.

**වෙණුධම**. පු-කුලල් පිඹින්නා.

**වෙණුබලි**. න-හුණලී වලට ගෙවිය යුතු බදු මුදල

**වෙදන**. ති-විඳීම.

**වෙතන**. න-කුලිය, බැලකුලිය.

**වෙතන**. න-වැටුප්, කුලිය.

**වෙතනික**. පු-බැලයා, වැටුප් පිණිස මෙහෙ කරන්නා.

**වෙතරණී**. ඉ-එනම් නිරය.

**වෙතස** පු-හොමූවගු.

**වෙතාල**. න-සතතාල, මන්ත්‍ර බලයෙන් මෘත ශරීර නැගිටවීම.

**වෙතාලික**. පු-වන්දිභට්ටයා.

**වෙත්ත**. න- වේවැල

**වෙත්තලතා**. ඉ-වේවැල.

**වෙතුල්ල** }<br>**වෙතුල්‍ය** } න-වෙතස් මත දරණ නිකායක්

**වෙතුල්ලවාද**. න-වෛතුල්‍යවාදය.

**වෙද**. පු-ඥානය, සොම්නස, චතුර්වේදය.

**වෙදගු**. පු – වෙදයාගේ එතෙරට ගිය තැනැත්තා.

**වෙදනා**. ඉ-තුෂ්ටිය, පීඩාව, විඳීම.

**වෙදජාත**. පු-හටගත් වෙද ඇත්තා.

**වෙදබන්ධු**. පු-වෙදය සභාග කොට ඇත්තා, බ්‍රාහමණයා.

**වෙදසිත**. න-වෙදනාව, විඳිනා ලද්ද

**වෙදනීය**. ති-විඳයුතු, අනුභව කටයුතු.

**වෙදන්තගු**. පු-වෙදයාගේ කෙළවරට ගියාහු, රහත්හු.

**වෙදල්ල**. න-නවාඞ්ග ශාස්තෘ ශාසනයෙන් එකක්.

**වෙදි**. ඉ-වේදිකාව, යාගපිළිවෙල.

**වෙදිකා**. ඉ-වේදිකාව, පිළ.

**වෙදිතබ්බ**. ති දැනගතයුත්ත, දතයුත්ත.

**වෙදියමාන**. න-විඳිනු ලබන.

**වෙදී**. පු-විඳින්නා, විඳින තැනැත්තා.

**වෙදෙහ**. පු-එනම් රට,

**වෙදෙහි**. පු-වෙළෙන්ද.

**වෙදෙහික**. පු-වෙළෙන්ද.

**වෙධ**. පු-විදීම, බ්‍රහමයා.

**වෙධන**. න-කම්පාව, වෙලීම.

**වෙධවෙර**. පු-වැන්දඹුවගේ පුතා,

**වෙධිත**. ති-විඳින ලද, විදපු.

**වෙධී**. පු-වෙධනය කරන්නා, විඳින්නා.

**වෙනතෙය්‍ය**. පු-ගුරුළා, විනතාවගේ පුත්‍රයා

**වෙනයික**. පු-හික්මවන්නා, ශික්ෂණය කරවන්නා.

**වෙනෙය්‍ය**. පු-හික්මවිය යුතු, ශික්ෂණය කළ යුතු.

**වෙපචිත්ති**. පු-එනම් අසුරයා.

**වෙපක්ක**. ති-පැසුණු, මේරූ.

**වෙපුල්ල**. පු-විපුල බව, රජගහ නුවර පිහිටි එනම් පර්වතය.

**වෙභාර**. පු-රජගහ නුවර පිහිටි එනම් පර්වතය.

**වෙභඞ්ග**. ති-බිඳිය යුතු, කැඩියයුතු.

**වෙභඞ්ගික**. ති-බිඳියයුතු, කැඩිය යුතු දේට අයත්.

**වෙභව්‍ය**. සිතා බැලීම, විවේචනය.

**වෙභූතික**. පු-විනාශකාරී=කේලම් කියන්නා.

**වෙභූතිය** පු-වෙභූතික.

**වෙම**. පු-පිලි වියන හරස් දණ්ඩ.

**වෙමක**. පු-රෙදි වියන හරස් දණ්ඩ.

**වෙමජ්ඣ** න-අතර, මැද, මධ්‍යය.

**වෙමත්තා**. න-විමති බව, වෙනස.

**වෙමතික**. ති-සැක ඇති, නිශ්චයක් නැති.

**වෙමාතික**. ති-විමති භාවය ඇති.

**වෙමාතික**. පු-වෙන මවක් ඇත්තා.

**වෙමාන** න-නොවීම, අභාවය.

**වෙමානික**. ති-සුරංගනාවන් ඇති තැන.

**වෙය්‍යග්ඝ**. පු-ව්‍යාඝ්‍ර සමින් වළඳනා ලද රථය, ව්‍යාඝ්‍ර සංචාර ඇති දේශය.

**වෙය්‍යත්ත**. ති-දක්ෂ භාවය ඇති.

**වෙය්‍යාවච්ච**. න-වතාවත්, වත් පිළිවෙත්.

**වෙය්‍යාබාධික** පු-තදින් රෝගාතුර වී ඇත්තා, "ව්‍යාබාධතො උප්පන්නත්තං **වෙය්‍යාබාධිකො**."

**වෙය්‍යාවතික**. පු-වත්පිළිවෙත් ඇත්තා, වතාවත් කරන්නා.

**වෙර**. න-අකුසලය, වෙෂය, වෛරය.

**වෙරක**. පු-සතුරා.

**වෙරජ්ජ**. න-නොයෙක් රාජධානි, නොයෙක් පළාත්.

**වෙරමණ**. න-විරමණය

**වෙරමණී**. ඉ-වෙන්වීම, තුරන් වීම, අහක් වීම.

**වෙරම්බ**. පු-එනම් වාතය.

**වෙරික**. පු-සතුරන් ඇත්තා

**වෙරී**. ඉ-සතුරා.

**වෙල්ල**. d. භූ. චූ-සංහරණෙ, එක් කිරීමෙහි, වෙල්ලති, එක්කරයි.

**වෙල්ල**. ති-වලඟසාල්.

**වෙල්ලි**. ඉ-කෘශවූ ඉඟටියක් ඇති කාන්තාව, ඉඟටියෙහි රන් පැලැඳි කාන්තාව.

**වෙල්ලිත.** ති-කුටිල ද, කම්පිත ද, වලඳනා ලද.

**වෙලා.** ඉ-කාලය, වෙල=ඉවුර, සීමාව, සමූහය.

**වෙලාම.** පු. එනම් සූත්‍රය.

**වෙලායති.** ක්‍රි-(d. භූ. වෙලු, ගතියං, යෑමෙහි +ති) සීමාව ඉක්මවා යයි.

**වෙලුරිය.** පු-වෛදූර්‍ය මාණික්‍යය.

**වෙලුව.** ති-වේවැල් වලින් කළ.

**වෙවචන.** න-පරියාය වචනය=සමානාර්ථ ඇති ශබ්දය.

**වෙවණ්ණිය.** න-වෙනස් පාට, වෙනස් කුල ගොත්‍ර නැති බව, මැලවුනු ගතිය.

**වෙවාහික.** පු-මංගල්‍ය සඳහා පැමිණෙන අමුත්තා.

**වෙවිච්ච.** න-තද මසුරු කම, ආත්මාර්ථ භාවය.

**වෙස්ස.** පු-වෛශ්‍යයා.

**වෙස්ම.** න-ගෙය, ගෘහය.

**වෙස්මන.** න-ගෙයකට ඇතුල් වීම.

**වෙස්සානර.** පු-ගින්න, ගින්දර.

**වෙස්සවන.** පු-වෛශ්‍රවණ නම් වරම් රජ.

**වෙස්සාමිත්ත.** පු-එනම් වෙදකතෘ ඍෂිවරයා.

**වෙස.** පු-වේශය, ආකල්පය.

**වෙසම.** පු-විසම බව, අසමාන භාවය.

**වෙසඛ.** පු-වෙසක් මාසය, විසා නැකතින් යුත්.

**වෙසාරජ්ජ.** න-විසාරද බව, වෛසාරද්‍යය.

**වෙසාලී.** පු-විසාලා මහනුවර, විසාල භාවය ඇති.

**වෙසාසී.** පු-යම රජු.

**වෙසියා.** ඉ-වෛශ්‍යාව, වෙසඟන.

**වෙසියාන.** පු-වෛශ්‍යයා, ගොවිකුල ඇත්තා.

**වෙසී.** ඉ-නගර සොභිනිය, වෙසඟන.

**වෙසු.** d. භූ-දානෙ, දීමෙහි, වච්ඡති, පවච්ඡති, දෙයි.

**වෙහ.** d. භූ-අඬගෑමෙහි, සිනාසීමෙහි.

**වෙහාස.** පු-අන්තරීක්ෂය, අහස.

**වෙහාසය.** පු-අහස, ගගන තලය.

**වෙහාසට්ඨ.** ති-අහසෙහි පිහිටි, ආකාසස්ථ.

**වෙහු.** d. භූ-උස්සාහෙ, උත්සාහයෙහි, වෙහති, උත්සාහ කරයි.

**වෙළු.** ඉ-උණ ගස, හුණ ගස.

**වෙළුක.** පු-ඇතුන්ගේ පා විදිනා කටුව.

**වෙළුගුම්බ.** පු-හුණ ලෑහැබ, උණ කැලෑව.

**වෙළුරිය.** න-වෛරළු මිණ, වෛරෝඩි ගල.

## වො

**වො.** අ-ප්‍රථමා විතීයා කරණ සම්ප්‍රදාන සාමි යන විභක්තීන්ගේ බහු වචනය, පද පූරණයෙහි වූ නිපාතයක්.

**වොකාර.** න-වෙනස, සුළු දෙය.

**වොකාර.** පු-හීන, රූපාදී ස්කන්ධ.

**වොකිණ්ණ.** පු-ගැවසීගත්, සමූහයක් හා එකට විසීම.

**වොක්කමන.** න-පසු බැසීම, ඉක්මවීම, පැත්තකට හැරීම.

**වොච්ඡජ්ජති.** ක්‍රි-(d. රු. ඡිදි, විධාකරණෙ, දෙපලු කිරීමෙහි+ති) සිඳියි, කපයි.

**වොචරිත.** ති-පරීක්ෂා කළ, විනිවිද ගිය.

**වොඩ්ඪූතන.** න-ඉසිලීම, ඉහිලීම, උද්වහනය කිරීම.

**වොඩ්ඪූන.** අ-උසුලා, උහුලා, උද්වහනය කොට.

**වොට්ඨපන.** න-පිහිටුවීම, විෂයය පිහිටුවීම, අධිෂ්ඨානය.

**වොදක.** න-ජලය සහිත, දිය සහිත.

**වොදාන.** න-පිරිසිදු කිරීම.

**වොදානීය.** ති-පිරිසිදු කිරීමෙහි දක්ෂ.

**වොදාස.** ති-ආහාරය පිළිබඳ ස්ථිර නියමයක් ඇති.

**වොදිට්ඨ.** ති-හොඳට අවබොධ කළ, පිරිසිදු කළ.

(21346)

**වොනත.** ති-නැවුනු,

**වොභින්දති.** ක්‍රි-(d. භූ. භිදි, විධාරණෙ, දෙපලු කිරීමෙහි + ති) බිඳියි, කඩයි

**වොභින්දන.** න-කැඩීම, බිඳීම.

**වොස්ස.** පු-පණ්ඩකයා, නපුංසකයා.

**වොස්සකම්ම.** න-පුරුෂයා පණ්ඩක කිරීම, නපුංසක කිරීම.

**වොස්සග්ග.** ති-හරණ ලද දෙය, ත්‍යාග කිරීම, හැරීම.

**වොස්සග්ගපරිනාමී.** න-ත්‍යාගය පිළිබඳ මුහුකුරා යෑම.

**වොස්සට්ඨ.** වස්සට්ඨ, හරණ ලද, බැහැර කළ.

**වොරොපන.** න-(දිවි) තොර කිරීම, නැසීම, ඉවත් කිරීම.

**වොරොපිත.** ති-(දිවි) තොරකළ. නැසූ.

**වොරොපෙති.** ක්‍රි-(d. චු. රුපු, නාසෙ, නැසීමෙහි + ති) නසයි, මරයි.

**වොලොකන.** න-අවලොකනය, බැලීම

**වොලොකෙති.** ක්‍රි-(d. චු. ලොක දස්සනෙ, දැකීමෙහි, + ති) දකියි, පරීක්‍ෂා කරයි.

**වොසාන.** න-අවසානය, අන්තිමය, කෙළවර.

**වොසාරනීය.** ති කල්පනා කටයුතු, සිහි කටයුතු.

**වොස්සග්ග.** න දීම, පරිත්‍යාගය.

**වොසිත.** ති-නිමි, සමාප්ත කළ, අවසන් කළ.

**වොහරති.** ක්‍රි-(d. භූ. හර, හරණෙ, යැවීමෙහි + ති) ව්‍යවහාර කරයි.

**වොහාර.** පු-ශබ්දය, ව්‍යවහාරය, වෙළඳාම, ගණුදෙනුව, චෙතනාව.

**වොහාරික.** පු-විනිසකරු, විනිශ්චයකාරයා, නීතිඥයා.

## ව්‍ය

**ව්‍යග්ඝ.** පු-ව්‍යාඝ්‍රයා.

**ව්‍යග්ඝ පුච්ඡී.** ඉ-ව්‍යාඝ්‍රවාලධිය, එඬරු ගස.

**ව්‍යග්ඝී.** ඉ-ව්‍යාඝ්‍ර ධෙනුව, කටුවැල්බටු.

**ව්‍යග්ඝීනස.** පු-උකුස්සා

**ව්‍යඤ්ජක.** පු-සරඹ කිරීම, යුධ පුරුදු කිරීම.

**ව්‍යඤ්ජන.** න-ස්ත්‍රී පුරුෂාදි නිමිති, ගාත්‍රාක්‍ෂර, ව්‍යඤ්ජනාක්‍ෂර, සූප=බ්‍යඤ්ජන, ලක්‍ෂණ, ලකුණු, පද

**ව්‍යඩම්බක** පු-එරඬු.

**ව්‍යත්ත.** ති-ව්‍යක්ත, වියත්, දක්‍ෂ.

**ව්‍යත්ත.** ති-පතළ, ව්‍යාප්ත දෙය.

**ව්‍යධති.** ක්‍රි (d. භූ විධ, කම්පනෙ, සැලීමෙහි + ති) සැලෙයි.

**ව්‍යධති.** ක්‍රි-(d. චු. විධ, කම්පනෙ, සැලීමෙහි + ති) චංචල වෙයි.

**ව්‍යත්තය.** පු-විපර්‍ය්‍යාසය.

**ව්‍යථා.** ඉ-අරළු.

**ව්‍යපිත.** ති-පීඩිත, පොඩිකළ.

**ව්‍යධ.** පු-විදීම, වෙධනය.

**ව්‍යන්ති.** ඉ-අවසානය, කෙළවර.

**ව්‍යන්තිකත.** ති-අවසන් කළ, කෙළවර කළ.

**ව්‍යන්තිකරණ.** න-කෙළවර කිරීම, අවසන් කිරීම

**ව්‍යප්ප.** පු-උපුල් කොළ.

**ව්‍යප්ඵ.** පු-නිෂ්ඵල, ප්‍රයොජන රහිත.

**ව්‍යපගච්ඡති.** ක්‍රි-(d. භූ. ගමු, ගතියං, යෑමෙහි + ති) පහව යෙහි, ඉවත්ව යෙයි.

**ව්‍යපගත.** ති-පහවගිය, ඉවත්ව ගිය.

**ව්‍යපනුජ්ජ.** අ-නසා, විනාශ කොට.

**ව්‍යපනුදති.** ක්‍රි-(d භූ. නුද, පෙරණෙ, සුණු කිරීමෙහි + ති) එලවයි.

**ව්‍යපහඤ්ඤති.** ක්‍රි. d. භූ හන, හිංසායං, හිංසාවෙහි + නසයි.

**ව්‍යප්පනා.** ඉ-සිත යෙදීම, ඇහුම්කන් දීම.

**ව්‍යම්හ.** න-දෙව්විමන, දේව විමානය.

**ව්‍යය.** පු-වස්තු විනාශය, නැසීම, විනාශය.

**ව්‍යය්‍යග්ඝී.** පු-ව්‍යාඝ්‍ර සමින් කළ පලඳනා දරන්නා.

**ව්‍යග්ගතති.** න-දක්‍ෂකම, නිපුණ බව.

(21496)

**ව්‍යත්තතතිය**. න-නිපුණත්වය, දක්‍ෂකම.

**ව්‍යඤ්ජනික**. පු-නිමිති දන්නා, ශාස්ත්‍ර කියන්නා.

**ව්‍යවධාන**. න-ව්‍යවධානය, වෙන් කිරීම.

**ව්‍යවසාන**. ති-තීරණය, යෝජනාව.

**ව්‍යවසිත**. ති-තීරණය කළ, යෝජිත.

**ව්‍යවස්ථා**. ඉ-ව්‍යවස්ථාව, නීතිය.

**ව්‍යවාද**. පු-විරුඬවාදය, අන්‍යොන්‍යප්‍රතිවිරුඬ වාදය.

**ව්‍යවාය**. පු-මෛථුනය, මෙවුම්දම.

**ව්‍යසන**. න-කාමක්‍රොධ දෙකින් උපන් විකාරය, විපත.

**ව්‍යාකත**. ති-ප්‍රකාශ කරණ ලද, ප්‍රකාශ කළ

**ව්‍යාකරණ**. න-ශබ්ද ශාස්ත්‍රය, වියරණ, විශෙෂ ප්‍රකාශය, නියමයෙන් ප්‍රකාශ කිරීම.

**ව්‍යාකාර**. න-දැක්වීම, පිළියෙල කිරීම, දීප්තිය.

**ව්‍යාකුල**. පු-වියවුල, ආකුල දෙය, අවුල් සහිත

**ව්‍යාඛ්‍යා**. ඉ-අර්ථවිවරණය, අටුවාව, සන්නය.

**ව්‍යාඛ්‍යාත**. ති-අටුවා කළ, විවරණය කළ

**ව්‍යාඛ්‍යාන**. න-අර්ථවිවරණය, අටුවාව සන්නය.

**ව්‍යාවික්ඛත**. න-ප්‍රකාශකිරීම, කීම.

**ව්‍යාධ**. පු-වැද්දා, විදින්නා.

**ව්‍යාධි**. ඉ-රොගය, උපුල් කොළ.

**ව්‍යාපක**. න-සබඳකිරීම, සම්පූර්ණ කිරීම.

**ව්‍යාපන්න** ති-විපතට පැමිණි, විකාරයට පැමිණි.

**ව්‍යාධිඝාත**. පු-ඇසළ ගස.

**ව්‍යාධිගත**. පු-ලෙඩා, රොගියා, ව්‍යාධි ඇත්තා.

**ව්‍යාපන්න**. ති-විපතට පැමිණි, හානියට පැමිණෙන ලද.

**ව්‍යාපජ්ජන**. න-විපතට පැමිණීම.

**ව්‍යාපජ්ඣ**. ති-කරදර කළ, හිංසාකළ.

**ව්‍යාපාර**. න-ව්‍යාපාරය, රැකියාව, සේවය.

**ව්‍යාපාද**. පු-වෛරය, දශවිධ ආඝාත වස්තුව නිත්‍යයාගේ පැවති ආඝාතය.

**ව්‍යාපාදෙති**. ක්‍රි-(d. භූ. පද, ගතියං, යෑමෙහි + ණෙ + ති) වෛරකරයි.

**ව්‍යාබාධ**. පු-රොගය, ව්‍යාධිය.

**ව්‍යාභඞ්ගී**. ඉ-කඳ, කාජය.

**ව්‍යාම**. පු-රියන් සතර, බඹය.

**ව්‍යායතක**. ති-පළල් කළ, දීඝ කළ.

**ව්‍යායක**. ති-පළල් කළ.

**ව්‍යායාම**. පු-උත්සාහය, වීර්‍ය්‍යය.

**ව්‍යාසික**. පු-දිරීමට අයත් වන්නා.

**ව්‍යාරම්භ**. න-උත්සාහ කිරීම, ප්‍රයත්න කිරීම.

**ව්‍යාරොස**. පු-වෛරය.

**ව්‍යාවට**. පු-ව්‍යාවෘත, යෙදී බැඳී විසීම, යෙදීම සිටීම.

**ව්‍යාස**. පු-ප්‍රපඤ්චය, විස්තරය, එනම් සෘෂිය

**ව්‍යාසත්ත**. ති-නපුරු කොට ඇලෙන ලද, නොනිසි ලෙස ඇලුනු,

**ව්‍යාසිත්ත**. ති-වත්කළ,

**ව්‍යාලික**. න-වරද, වැරද්ද, දෙෂය.

**ව්‍යාවිද්ධ**. ති-එහාට මෙහාට යන, චංචලවන

**ව්‍යාසිඤ්චති**. ක්‍රි-(d. භූ. සිඤ්ච, සිඤ්චනෙ, ඉසිමෙහි + ති) අපිරිසිදු කරයි, නරක්කරයි.

**ව්‍යාසෙක**. ති-මිශ්‍රකළ, හාමුකළ.

**ව්‍යාහරති**. ක්‍රි (d. භූ හර + හරණෙ, හැරීමෙහි + ති) කථා කරයි, ශබ්ද කරයි.

**ව්‍යූහ**. පු-විනිවිද නොගිය වීථිය, සෙනාවින්‍යාසය, සමූහය.

**ව්‍යූහන**. න-රැස්කිරීම, ගෙණයෑම, ගසාගෙණ යෑම.

**ව්‍යූහති**. ක්‍රි-(d. භූ. ඌහ, සඤ්චයෙ, රැස් කිරීමෙහි + ති) ගෙණයයි, අස්කරයි.

**ව්‍යූහති**. ක්‍රි-(d. භූ ඌහ, විතක්කෙ, විතර්කයෙහි + එකට) සිටියි.

**ව්‍යූළ්හ**. ති-ගසාගෙණ ගිය, ගෙණගිය.

**වෙ‍ෙව්‍යාමකෙස**. පු-ඊශ්වරයා.

**වෙ‍ෙව්‍ය**. d. භූ. නිවාරණෙ, වැළැක්මෙහි, ව්‍යය යති, වලකයි,

**වෙ‍ෙව්‍ය**. d. භූ-පවත්තනෙ, පැවැත්මෙහි, වෙ‍ෙව්‍යති පවත්වයි.

**වෙ‍ෙව්‍ය**. d. භූ-ආමන්තනෙ, කැඳවීමෙහි, වෙහති, අවෙහති, කැඳවයි, ආමන්ත්‍රණය කරයි.

**වෙ‍ෙව්‍යාසික**. ති-සම්පූර්ණ කළ, කෙළවර කළ.

(21453)

# ස

**ස.** පු-නෑයා, ඥතියා.

**ස.** න-තමා.

**ස.** පු. න-ධනය, තමාසතු දෙය.

**සං.** අ-සමොධාන, සංක්ෂෙප, සමන්තාදර්ථ, සමාධි, සම්මාශබ්දාර්ථ, සහාර්ථ, අල්පාර්ථ, අභිමුඛ්‍යාර්ථ, සඞ්ගතාර්ථ, සංවරණවූ භව, පූජා, නැවත නැවත කිම යනාදී අර්ථයන්හි.

**සං.** අ-සනෙතාෂ, තමාවිසින් යනාර්ථය.

**සංඛ.** d. භූ-සලක්ඛණෙ, සලකුණු කිරීමෙහි, සංඛති, සලකුණු කරයි.

**සංඛට.** ති-අල්පාවකාශය, මඳ ඉඩකඩ.

**සංකපිර.** න-කසළ ගොඩ, කහල.

**සංකථා.** ඉ-සාකච්ඡාව.

**සංකන්දන.** පු-ශක්‍රයා, සක්රජ.

**සංකප්ප.** පු-කල්පනාව, සංකල්පය.

**සංකම.** පු-දුර්ගස්ථානය, සංක්‍රමණය.

**සංකමන.** න-සංක්‍රමණය.

**සංකර.** පු-ඊශ්වරයා, මහදෙවියා, කසළ.

**සංකලිත.** ති-පිඩුකර තබන ලද, සමුච්චයකළ

**සංකස්ස.** න-එනම් නුවර.

**සංකස්සර.** පු-සැක කටයුතු හැසිරීම.

**සංකස** d. භූ. නිසීදනෙ, හිඳීමෙහි සංකසායති. හිඳියි.

**සංකාරකූට.** පු-කසළ ගොඩ.

**සංකාරධාන.** න-කසළ ගොඩ.

**සංකාස.** ති-සදෘශය, සමාන.

**සංකාර පුඤ්ජ.** පු-කසළගොඩ.

**සංකිණ.** න-ණය ගැණිමට සුදුසු නැකැත් කිම.

**සංකිලිට්ඨ.** ති-කෙලෙසන ලද, කිළුටු කළ.

**සංකිලෙසික.** ති-කෙලෙසන ලද.

**සංකිත.** ති-සැකකළ.

**සංකිත්තන.** න-නම් කිරීම, කිත්තීය, සැක-කිරීම.

**සංකිත්ති.** ඉ-ප්‍රසිද්ධිය, උසස් කීර්තිය.

**සංකිරණ.** න-රැස්, හිරු රැස්.

**සංකිය.** ති-සැකකළ යුතු.

**සංකියති.** ක්‍රි-(d. සවා. කි. ඤණෙ, ඤණ-යෙහි + ති) සැක කරයි.

**සංකිලිට්ඨ.** ති-අපිරිසිදු, කෙලෙසුන්ගෙන් අපවිත්‍ර.

**සංකිලිස්සති.** ක්‍රි-(d. දි. කිලිස, උපතාපෙ, දෙවීමෙහි + ස්සති) කෙලෙසන්නේය.

**සංකිලිස්සන.** න-කෙලෙසීම, අපිරිසිදු වීම.

**සංකිලෙස** පු-කෙලෙස්.

**සංකිලෙසික.** ති-කෙලෙස් ඇති,

**සංකිළති.** ක්‍රි-(d. භූ. කිළ, කීළෙසං, කෙළි-යෙහි + ති) කෙළියි, සෙල්ලම් කරයි.

**සංකී.** පු-සැක ඇත්තා.

**සංකි.** ති-පතළ, මිශ්‍ර.

**සංකුචිත.** ති-වකුටු වන ලද, හැකිලෙන ලද.

**සංකුල.** ති-පෙර පසු විරුදු බස, ගැවසී ගද්දෙය.

**සංකුපිල.** පු-ඇදව යන්නා.

**සංකුපික.** පු-ඇදට යන්නා.

**සංකුඩ.** ති-කිපුණු.

**සංකුලි.** ඉ-ආයුධ විශෙෂයක්.

**සංකුසුචිත.** ති-හොඳට පිපුණු මල්වලින් යුත්

**සංකුල්‍ය.** න-එකිනෙකට පැටලුනු එකිනෙකා නැසීම සවභාව කොට ඇති ආයුධය.

**සංකුල.** න-පෙරපසු විරුද්ධ වචනය, ගැවසී ගත් දෙය.

**සඞ්කුක.** ති-සැකයට පත් කළ.

**සංකොච.** න-කොකුම්.

**සංකොචෙති.** ක්‍රි-(d. භූ. කුච්, සංකොචෙ, හැකිලීමෙහි + ති) හැකිලෙයි.

**සංකොචන.** න-හැකිලීම, වකුටුවීම.

**සංකෙත.** න-සලකුණ, ලකුණ, වින්තය.

**සංකෙතන.** න - සලකුණු කිරීම, ලකුණු කිරීම.

(21507)

**සංඛෙළායති.** ක්‍රි-(d. භූ. කීළ කීළායං සෙල්ලම් කිරීමෙහි+ති) සෙල්ලම් කරයි.

**සංඛ.** පු. න-සක්, හක්ගෙඩි, තළල් ඇට, ගොප් ඇට.

**සංඛතාල** න-සක්හඬ.

**සංඛධම.** න-හක් පිඹීම.

**සංඛනාභි.** ඉ-සක් නැබ.

**සංඛත.** ති-ප්‍රත්‍යයොත්පන්නධර්ම, සංස්කාරයන් විසින් කළ, සංස්කාරයන්ගෙන් උපන්.

**සංඛතට්ඨ.** පු-සංඛතාර්ථය.

**සංඛතධම්ම.** පු-පරිස්කෘත ධර්මය.

**සංඛත ලක්ඛණ.** න-ප්‍රත්‍යයොත්පන්න ධර්මයන්ගේ උත්පාද ස්ථිතිභඞ්ගයන ලක්ෂණත්‍රය.

**සංඛනඛ.** පු-සක් බෙල්ලා.

**සඞ්ඛපත්ත.** පු-සක්පත.

**සංඛමුණ්ඩික.** පු-සක්ගෙඩියක් මෙන් වූ හිස ඇත්තා.

**සංඛමුත්ත.** තී-මාඬ්චුවලින් මිදුනු, හැකිල්ලෙන් මිදුණු.

**සංඛය.** න-විනාශය - නැතිවීම, වියදම් කරණව.

**සංඛල.** ති-ඇතුන් බඳින දම.

**සංඛලික.** න-විලංගුව, මාඬ්චුව, නිගලය.

**සංඛලිකා.** දම්වැල, ඇටවැල, පෙළ.

**සංඛා.** ඉ-ප්‍රඥා, භාග, ප්‍රණීත, ගණන, ප්‍රඥප්ති, ආදියෙහි.

**සංඛා.** ඉ-සැකය.

**සංඛාත.** එකඟ වූ, සැළකුව, අවබෝධය.

**සංඛාර.** පු-සංස්කාරය, ප්‍රත්‍යයොත්පන්නයා, පුණ්‍යාභි සංස්කාරාදිය, සව්‍යාපාරත්වය, කායසංස්කාරාදිය = කාය ප්‍රයොගාදිය, භූම්‍යාදි සංස්කාරය.

**සංඛාර.** න-කසළ, අසුචි මල ආදිය.

**සංඛාරකූට.** න-කසළගොඩ, කුණුගොඩ.

**සංඛාරලොක.** පු-ලෝකය, සංස්කාරලොකය.

**සංඛාරධාන.** කසලගොඩ, කුණුගොඩ.

**සංඛාරුපෙක්ඛා.** ඉ-සංස්කාරයන් ගැණ ඇති මැදිහත්කම.

**සංඛෙප.** පු-සංක්ෂෙපය, ලුහුඬු.

**සංඛෙය්‍ය.** පු-ගණනින් යුක්ත, ගුණකටයුතු, ගණන් කටයුතු.

**සංඛ්‍යා.** ඉ-සඞ්ඛ්‍යාව, ගණන, යුද්ධය, විචාරය.

**සංඛ්‍යාභෙද.** පු-සංඛ්‍යා විශෙෂය.

**සංඛ්‍යාත.** ති-පරිමිතදේ, නියමිතදේ.

**සංග.** පු-සංගතිය, ඇලීම.

**සංගත.** ති-සංගතාර්ථ.

**සංගණිකා.** ඉ-සමාගම, පතිවිධ ක්‍රමය, රැස්වීම.

**සංගම.** පු-සමාගම, එකතුවීම.

**සංගර.** පු-චිත්‍රාකාරය, අල්ලස්දීම, බලය, රාසිය, විජිත, යුද්ධය, ප්‍රතිපදැව.

**සංගහ.** පු-අනුකම්පා, සංක්ෂෙපය, ගැණීම.

**සංගාම.** පු-යුද්ධය, සංග්‍රාමය.

**සංගාම.** d. චු-යුද්ධෙ, යුද්ධයෙහි, සංගාමෙති, සංගාමයති, යුද්ධකෙරෙයි, සංගාමො.

**සංඝ.** පු-ප්‍රාණීන්ගේ සමූහය, සමූහය, භික්ෂු සමූහය.

**සංඝ.** d සු-පීඩණෙ, පෙළීමෙහි, සඞ්ඝුණාති, පෙළයි

**සංඝට්ටන.** න-ඝට්ටනය, ගැටීම, ගැලපීම.

**සංඝාට** පු-දූව වළල්ල.

**සංඝාටි.** ඉ-දෙපට සිව්ර, දුපට්ට චීවරය.

**සංඝාත.** පු-සමූහයා, එනම් නිරය නසන ලද.

**සංඝාරාම.** පු-සඞ්ඝාරාම, භික්ෂූන්ගේ අසපුව.

**සංජග්ඝන.** න-මහ සිනාව.

**සංදස්සන.** න-මනාකොට, කරුණු දක්වීම.

**සංපති.** අ-එකෙණෙහි, දැන්.

**සංභාවිත.** ති-භාවිතාකළ, මනාව වඩනා ලද.

**සංයත.** ති-දමනය වන ලද, දමනය කළ.

**සංයත.** න-තබන ලද.

**සංයතත්ත.** පු-දමනය කරණ ලද ආත්මය.

**සංයම.** පු-හික්මීම, සීතලය, සංවරණය, සංසිඳීම.

(21560)

**සංයමන.** න-සංයමය.

**සංයමී.** ති-සංයත.

**සංයත්තික.** පු-නැව් වෙළෙන්ද, නාවික වාණිජයා.

**සංයම.** න-වැලකීම, ආත්ම සංයමය.

**සංයාචිකා.** ඉ-ඉල්ලීම, යාචනය කිරීම'

**සංයාචිත.** ති-තමන් විසින් ඉල්වා ගත්තා ලද.

**සංයුග.** පු-යුද්ධය.

**සංයුත.** පු-යෙදුනු.

**සංයුත්ත.** ති-යෙදුනු, බැඳුනු

**සංයූහති.** ක්‍රි-(d. භූ. ඌහ, සංචයෙ, රැස්කිරීමෙහි + ති) බෝලයක් මෙන් ගුලියක් කරයි.

**සංයූළ්හ.** පු-ගෙතීම, පිඩුකිරීම.

**සංයොග.** පු-යෙදීම.

**සංයොජන.** න-එකට බැඳීම, ඇඳීම.

**සංයොජනිය.** පු-එකට බැඳිය යුතු, ඇඳිය යුතු.

**සංයොජිත.** ති-එකට බඳිනලද, ඇඳනලද.

**සංරම්භ.** ති-වේගවත් ලෙස, සැර සහිත.

**සංරාව.** පු-හඬ, නාදය.

**සංරාග.** පු-රාගය, කැමැත්ත, ආශාව.

**සංරූළ්හ.** ති-සුවකළ, සුවපත් කළ.

**සංලීනක.** ති-දල්වන ලද.

**සංවච්ඡර.** පු-න-හවුරුද්ද, අවුරුද්ද.

**සංවට්ට.** පු-කප නැස්ම, කල්පවිනාශය.

**සංවට්ට විවට්ට.** පු-ලෝක විනාශය, හා ලෝකය ඇතිවීමේ කාලය.

**සංවඩ්ඪන.** න-වැඩීම.

*සංවණ්ණනා.* න-වණ්ණනාව, අර්ථකථාව.

**සංවණ්ණිත.** ති-වණ්ණනා කරණ ලද.

**සංවදන.** න-නැකත් බලා සමගි කරවීම, යහපත් වචනය, යහපත් මුහුණ.

**සංවත්තති.** ක්‍රි-(d. භූ. වතු, වත්තනෙ, පැවැතීමෙහි + ති) පවතියි.

**සංවත්තන.** න-පැවැත්ම.

**සංවත්තනික.** ති-පවත්නා, විද්‍යමානවන.

**සංවධන.** න-සංවඪීනය, වැඩීම.

**සංවර.** පු-සංවරණය, ආවරණය.

**සංවරණ.** න-ආවරණය.

**සංවර පාතිමොක්ඛ.** පු-සංවර ප්‍රාතිමෝක්ෂය.

**සංවර විනය.** පු-සංවර විනය.

**සංවර සීල.** න-සංවර සීලය.

**සංවරී.** ඉ-රාත්‍රිය.

.**සංවරීමුඛ.** න-රාත්‍රි මුඛය.

**සංවසථ.** පු-ගම, ග්‍රාමය.

**සංවාස.** පු-සමගි වාසය, වාසයකිරීම.

**සංවාසක.** පු-සමග වාසය කරන්නා.

**සංවාසත්ථෙනක.** පු-සමගි වාසය සොරකම් කරන්නා, එවැනි පාපී පුද්ගලයා.

**සංවාසිය.** පු-සමග වසන්නා.

**සංවිග්ග.** පු-කලකිරුණු, උකටලී වූ.

**සංවිජ්ජති.** ක්‍රි (d. දි, විද, සත්තායං, වීමෙහි + ති) විද්‍යමාන වෙයි.

**සංවිජ්ජමාන.** ත-විද්‍යමානවන, දක්නට ඇති.

**සංවිද.** ති-ප්‍රතිඥාව:

**සංවිදති.** ක්‍රි-(d. භූ. විද, ඤාණෙ, දැනුමෙහි + ති) දතියි.

**සංවිදහති.** ක්‍රි-(d. භූ. විද, ඤාණෙ, ඤාණයෙහි + ති) පිළියෙල කරයි, නියොග කරයි.

**සංවිදහන.** න-නියොගය, විධානය.

**සංවිදිත.** ති-දන්නා ලද.

**සංවිභජන.** න-බෙදීම, කොටස් කිරීම.

**සංවිධාන.** න-සංවිධාන කිරීම, පිළියෙලකිරීම.

**සංවිධායක.** පු-සංවිධාන කරන්නා, පිළියෙල කරන්නා.

**සංවිධාවහාර.** පු-සංවිධාන වී කරණ සොරකම.

**සංවිභජති.** ක්‍රි-(d. භූ. භජ, භාගෙ, බෙදීමෙහි + ති) බෙදයි, කොටස් කරයි.

**සංවිභත්ත.** ති-බෙදන ලද, බෙදූ.

**සංවිභාග.** පු-බෙදීම.

**සංවිභාගී.** පු-බෙදන්නා.

**සංවිරූළ්හ.** ති-හොඳට වැඩී ගිය, යසට වැඩුණු.

**සංවිහිත.** ති-පිළියෙළ කළ, සම්පාදනය කළ, සැපයූ.

**සංවුත.** ති-සංවරණය කළ, වටකළ දෙය.

**සංවුතින්ද්‍රිය.** න-සංසිඳුනු ඉන්ද්‍රිය ඇත්තා.

**සංවෙග.** පු-හිරිඔතප්=ලජ්ජාවීම, කළකිරීම, සංවේගය.

**සංවෙජන.** න-කැළඹීම, සසල වීම.

**සංවෙජනීය.** පු-සංවේග කටයුතු.

**සංවෙජිත.** ති-කළඹනලද, සසල වන ලද.

**සංවෙජෙති.** ක්‍රි-(d. දි. විද, සත්තායං, වීමෙහි + ණෙ + ති) සංවේග කරයි.

**සංවෙඨිත.** ති-නැතිගත්වනලද.

**සංවෙල්ලි.** ඉ-තුවාලයක් වටේ ඔතන රෙදි කැබැල්ල.

**සංවෙල්ලිත** ති-ඔතනලද (රෙදි කැබැල්ල)

**සංවෙල්ලිය.** පු-තුවාල ඔතන රෙදි කැබැල්ල

**සංවෙසන.** න-හොවීම, සැතැප්පවීම.

**සංවොහාර** පු-ගණුදෙනුව, වෙළඳාම.

**සංව්‍යූළ්හ.** ති-(ජලයෙන්) ගසාගෙණ ගිය.

**සංස.** d. දි-සුසසනෙ, විය‍ළීමෙහි, සුසසති, වියලෙයි, සුසසමානො.

**සංස.** d. භූ-පසංසනෙ, සතුතියෙහි, සංසති, පසංසති, සතුති කෙරෙයි.

**සංස.** d. භූ-ගුණෙ, ගුණ කිමෙහි, සංසති, ගුණකියයි.

**සංසග්ග.** පු-සම්ගමය, සංසර්ගය.

**සංසට්ඨ.** ති-සම්ප්‍රයුක්ත, ගනන ලද.

**සංසති.** ක්‍රි-(d. භූ. සංස, කථනෙ, කීමෙහි + ති) ප්‍රකාශ කරයි.

**සංසතත.** ති-ගතනලද, අතන ලද, මිශ්‍රකළ.

**සංසද.** පු-රැස්වීම, සභාවාරය.

**සංසන්දති.** ක්‍රි-(d. භූ. සන්ද, පසවනෙ, පැව-තීමෙහි + ති) එක්ව දුවයි, ආශ්‍රය කරයි.

**සංසප්පන.** න-එතීම, පැත පැත යෑම, බඩගා යෑම.

**සංසප්පනියපරියාය.** න-භය ප්‍රදර්ශනය කිරීම.

**සංසප්පි.** පු-බඩගා යන්නා, එති එතී යන්නා.

**සංසන්දන.** ගැලපීම, සැසඳීම.

**සංසය.** පු-සැකය.

**සංසයිත.** න-සැකය, කුකුස.

**සංසයත්ථ.** පු-සංසයාර්ථය.

**සංසරණ.** න-සැරිසැරීම, සංචාරණය.

**සංසරති** ක්‍රි-(d. භූ. සර, ගතියං, යෑමෙහි + ති) සැරිසරයි.

**සංසරිත.** ති-(සසර) සැරිසරණලද, ඇවිද්ද.

**සංසම.** පු-ප්‍රතිඥාව.

**සංසාර.** පු-සසර, සැරිසැරීම.

**සංසාදන.** න-එකට එක ගැලපීම.

**සංසාමන.** න-නමා තැබීම, තැන්පත් කර තැබීම.

**සංසාමෙති.** ක්‍රි-(d. භූ. සාම, සනාචනෙ, ප්‍රිය කිරීමෙහි + ති, ණෙ + ති) තමා තබයි.

**සංසාම.** න-නැමීම, සෙනාසනාදිය තැන්පත් කර තැබීම.

**සංසාරචක්ක.** න-සංසාර චක්‍රය, ඉපද ඉපද මැරීම.

**සංසාරසාගර.** පු-සසර නැමැති සයුර,

**සංසිජ්ඣන.** න-සම්පූර්ණ කිරීම.

**සංසිත.** ති-සසර සැරිසැරූ, ඇවිද්ද.

**සංසිද්ධි.** ඉ-සමෘද්ධිය, ජය, සතුටු දායක සිද්ධිය.

**සංසිබ්බිත.** ති-මසනලද, එකට එකතු කරණ ලද.

**සංසීදති.** ක්‍රි-(d. භූ. සිද, සීදනෙ, සංසිඳී-මෙහි + ති) සංසිඳෙයි.

**සංසීදන.** න-සංසිඳීම.

**සංසීන.** ති-විනාශ කළ, ඇද වැටුනු.

**සංසුද්ධ.** ති-පිරිසිදු, පවිත්‍ර.

**සංසුද්ධගහණික.** පු-පිරිසිදු කුලයෙහි උපන්නා.

**සංසුම්භන.** න-වැදීම, පෑගීම, පැරදවීම.

**සංසෙද.** පු-ඩහදිය, අපවිත්‍ර.

**සංසෙදජ.** පු-කුණුවලින් උපන් අය.

**සංසෙදයොනි.** ඉ-කුණු කසලවලින් ඉපදීම.

**සංසේවන.** න-සෙවනය, ආශ්‍රය.

**සංසෙවිත.** ති-සේවනය කළ.

**සංහත.** ති-නසන ලද, විනාශ කරණලද.

**සංහති.** ඉ-සමූහය, රාසිය.

**සංහනන.** න-නැසීම, විනාශ කිරීම.

**සංහනති.** ක්‍රි-(d. භූ. හන, හිංසායං, හිංසාවෙහි + ති) නසයි, මරයි.

**සංහාර.** පු-සංක්ෂෙපය, විනාශය.

**සංහරණ.** න-හැකිළීම, ඇකිළීම.

**සංහසති.** ක්‍රි-(d. භූ. හස, හසනෙ, සිනාසීමෙහි + ති) සිනාසෙයි.

**සංහානි.** ඉ-හානිය, පිරිහීම, විනාශය.

**සංහිත.** ති-එකතු කළ, සම්බන්ධ කළ.

**සංහිතා.** ඉ-සන්ධිය, අතරක් නොදක්වා සන්ධි කිරීම.

**සංහියති.** ක්‍රි-(d. සව, හි, ගතියං, යැමෙහි + ති) සන්ධි කරයි.

**සංහිරති.** ක්‍රි-(d. භූ. හර, හරණෙ, හැරීමෙහි + ති) ඇද දමයි.

**සක්ක.** d. භූ-ගමනෙ, යාමෙහි, සක්කති, යෙයි

**සක්ක.** d. චු-ළුබ්බගෙ, තැති ගැණීමෙහි, සක්කෙති, සක්කයති, තැතිගණී.

**සක්ක.** ති-හැකි, පුළුවන්, යොග්‍ය, කෙළිඳ ගස.

**සක්ක.** පු-ශක්‍රයා, ශාක්‍ය ජනපදය, ශාක්‍ය වංශිකයා.

**සක්කච්ච.** අ-සකස් කොට යනාර්ථයෙහි.

**සක්කච්චකාරී.** පු-සකස්කොට ක්‍රියාකරන්නා

**සක්කත.** ති-සත්කාර කළ.

**සක්කපාදප.** පු-දෙවදුර ගස.

**සක්කපුර.** න-ශක්‍ර පුරය, තව්තිසා දෙව්ලොව

**සක්කරණ.** න-සත්කාර කිරීම.

**සක්කතච්භය.** පු-බකමූණ.

**සක්කරොති.** ති-සත්කාර කරයි.

**සක්කා.** අ-හැකිය යනාර්ථයෙහි.

**සක්කායදිට්ඨි.** ඉ-ආත්ම දෘෂ්ටිය.

**සක්කාර.** පු-සත්කාරය, මනාකාරය.

**සක්කොති.** ක්‍රි-හැකි වෙයි.

**සක්ඛර.** න-හකුරු, බොලුකැට.

**සක්ඛරා.** ති-ඉක්ෂුවිකාරය=හකුරු, කැබිලිති, බොරලු.

**සක්ඛරිකා.** ඉ-සකුරු, හකුරු.

**සක්ඛරිල්ල.** ති-ගල් සහිත, බොරළු සහිත.

**සක්ඛලි.** ඉ-කර්ණද්වාරය, කණ්දෙර.

**සක්ඛලිකා.** ති-කණ්දෙරට අයත්.

**සක්ඛි.** ඉ-සාක්ෂිය, ප්‍රත්‍යක්ෂය.

**සක්ඛිදිට්ඨ** ති-මුහුණට මුහුණ බැලූ.

**සක්ඛිපුට්ඨ.** ති-සාක්ෂ්‍ය විචාළ, සාක්ෂ්‍ය ඇසූ.

**සක.** d. භූ-ගමනෙ, යාමෙහි, සකකති, යෙයි

**සක.** d. සු-සත්තිමහි, සමර්ථබැව්හි, සක්කුණති, සමර්ථවෙයි, හැකිවෙයි.

**සක.** d. තු-සාමර්ථයෙ, බැව්හි, සක්කොති, හැකි වෙයි.

**සක.** පු-සවකීය, තමාට අයිති දෙය.

**සකට.** පු-ගැල, රථය, යාල.

**සකටමග්ග.** පු-රථ මාර්ගය, ගැල් මාවත.

**සකටගොපක.** පු-ගැල් රකින්නා.

**සකටවාහ.** න-ගැල් බරක්.

**සකටව්‍යූහ.** න-පිළිවෙලට තැබූ කරත්ත සමූහය, රථ සේනාව.

**සකදාගාමී.** පු-එකවරක් එන තැනැත්තා, උත්පත්ති වශයෙන් මනුෂ්‍ය ලෝකයට එක වාරයක් එන තැනැත්තා.

**සකට්ඨාන.** න-සවකීය ස්ථානය,

**සකරණීය.** පු-කටයුතු සහිත, ක්‍රියා සහිත.

**සකල.** පු. න-අංශය, භාගය.

**සකල.** ති-සියලු, සර්ව.

**සකලි.** පු-මත්ස්‍යයා.

**සකලික.** න-පතුර, ගල් පතුර.

**සකලිකහීර.** න-මස්කැර.

**සකාය**. අ. තමා අයත්.

**සකාස**. ති-සමීපය.

**සකිඤ්චන**. න-කිඤ්චන සහිත, හිරිහැර සහිත.

**සකිං**. අ-වරක්, වාරයක්, විටක්.

**සකි**. d. භූ-සඞ්කායං, සැකයෙහි, සඞ්කති, සැක කරයි.

**සකිපරි**. පු-කවුඩා, කපුටුවා.

**සකිය**. සවකිය, තමා අයත්, තමා පිළිබඳ.

**සකුණ**. පු-පක්ෂියා, කුරුල්ලා.

**සකුණක**. පු-කුරුල්ලා,

**සකුණකුලාවක**. න-පක්ෂි කූඩුව.

**සකුණග්ඝික**. ති-උකුසු විශෙෂයක්.

**සකුණරුත**. න-පක්ෂි නාදය.

**සකුණවිජ්ජා**. ඉ-විපාද චතුසපාදී සතුන්ගේ හඬ අසා දෙෂාදෙෂ කියන්නාවූ එනම් විද්‍යාව.

**සකුණී**. පු-පක්ෂියා.

**සකුනත**. පු-සොෂටකුකකුට පක්ෂියා.

**සකුල**. පු-මත්ස්‍ය වර්ගයක්, මාලු ජාතියක්.

**සකුලකබක**. පු-සුදුහීතණ.

**සකුලාදනී**. ඉ-කුළු දෙන.

**සක්‍යකුල**. න-ශාක්‍ය කුලය.

**සක්‍යපුඞ්ගව**. පු-බුදුරජ, ශාක්‍යවංශොත්තමයා

**සක්‍යපුත්තික**. පු-ශාක්‍ය පුත්‍රයා, ශාක්‍ය මුනි පුත්‍රයා.

**සකකපුතත**. පු-ශාක්‍ය බුඩ පුතා.

**සක්‍යපුත්තිය**. පු-සක්‍ය පුත්තිකයා.

**සක්‍යමුනි**. පු-ගෞතම මුනිරජ.

**සඛ**. පු-මිත්‍රයා, යහලුවා.

**සඛි**. පු-විශ්වාසයා, මිත්‍රයා.

**සඛිල**. න-මෘදු, මොලොක්.

**සඛී** ඉ-යහලු සත්‍රී, මිත්‍ර සත්‍රී.

**සගග**. පු-සවර්ගලොකය, පරිත්‍යාගය, සවභාවය, මැවීම, පරිච්ඡෙදය.

**සගගභවන**. පු න-දෙව්ලොව, දිව්‍ය ලොකය.

**සගගභුවන**. න-දෙව්ලොව.

**සගගලොක**. පු-දෙව්ලොව.

**සගගවාසි**. පු-සවර්ගවාසියා, දෙවියා.

**සගග සංවතතනික**. ති-සවර්ගය, පිණිස පවත්නා.

**සගගී**. පු-දෙවියා, සවර්ගී වාසියා.

**සගබභ**. පු-සමාන ගබ් ඇත්තා, සහෝදරයා.

**සගි** d. භූ-ගතියං, යාමෙහි, සඞ්ගති, යෙයි, සඞ්ගා.

**සගුණ**. පු-න-නැවීම, පොටවල් කීපයකට නැවීම.

**සගුළ** න-සීනි සහිත කේක් ගෙඩිය.

**සගොතත**. පු-සමාන ගොත්‍ර ඇත්තා, නෑයා.

**සඞ්කට**. ති-අල්පාවකාශය, මද අවකාශය.

**සඞ්කටීර**. න-කසළගොඩ.

**සඞ්කථා**. ඉ-සාකච්ඡාව, සමගි කථාව.

**සඞ්කපප**. පු-විතර්කය.

**සඞ්කම**. පු-දුර්ගමසථානය.

**සඞ්කසස**. න-එනම් නුවර.

**සඞ්කන්දන**. පු-ශක්‍රයා, සක්රජ.

**සඞ්කර**. පු-ඊශ්වරයා.

**සඞ්කලන**. න-එකතුකිරීම, මිශ්‍රකිරීම.

**සඞ්කා**. ඉ-සැකය, විචිකිච්ඡාව.

**සඞ්කාර**. පු-කසළ.

**සඞ්කාරකූට**-(ක). න-කසළගොඩ.

**සඞ්කාරඨාන**. න-කසළගොඩ.

**සඞ්කාරයකඛ**. පු-කුණෙන් වැගිරුණ යකා.

**සඞ්කාස**. ති-සදෘශයා, සමානයා.

**සඞ්කාසන**. න-සංක්ෂෙපයෙන් ප්‍රකාශකිරීම.

**සඞ්කිණණ**. ති-සඞ්කීර්ණ, පතල, මිශ්‍ර.

**සඞ්කු**. ති-ආයුධ විශෙෂයක්, උල, කණු.

**සඞ්කුල**. ති-පෙර පසු විරුදුබස, ගැවසීගත් දෙය.

**සඞ්කුපථ**. න-කටු කොහොල් සහිත මාර්ගය.

**සඞ්කොච**. පු-කොකුම්.

**සඞ්ඛ.** පු. න-සක්, තලල් ඇට, ගොප් ඇට. ගණන.

**සඞ්ඛත.** පු-සංස්කාරයන් විසින් කරණ ලද, ප්‍රත්‍යයොත්පන්න ධම්.

**සඞ්ඛත.** ති-සඞ්ඛට, රචිත, ග්‍රන්ථනය කළ.

**සඞ්ඛනාභි.** පු-සක්බෙල්ලා.

**සඞ්ඛත ලක්ඛණ.** න-ප්‍රත්‍යයොත්පන්න ධම්-යන්ගේ සවභාව ලක්‍ෂණය, උත්පාදය, විනාශය, විපරිනාමය යන ලක්‍ෂණත්‍රය.

**සඞ්ඛල.** ති-ඇතුත් බඳින දම.

**සඞ්ඛලිකා.** න-මාංචුව, හැකිල්ල.

**සඞ්ඛ්‍යා.** ඉ-සඞ්ඛ්‍යාව, ගණන.

**සඞ්ඛ්‍යාත.** ති-පරිමිත දෙය.

**සඞ්ඛ්‍යාන.** න-ගණන, සඞ්ඛ්‍යාව.

**සඞ්ඛෙය්‍ය.** පු-ගණනින් යුක්ත.

**සඞ්ඛා.** ඉ-ප්‍රඥා, භාග, පණත, ගණන.

**සඞ්ඛාත.** න-ගණන.

**සඞ්ඛාය.** පු-සිතා, සලසා, කල්පනාකොට.

**සඞ්ඛාර ලොක.** පු-ද්‍රව්‍යමය, ලොකය, සංස්කාර ලොකය.

**සඞ්ඛාර.** පු-ප්‍රත්‍යයොත්පන්න ධම්, පුණ්‍යාභි සංස්කාරාදිය සව්‍යාපාරත්වය, කාය සංස්-කාරාදිය, භූම්‍යාදි සංස්කාරය.

**සඞ්ඛාරුපෙක්ඛා.** ඉ-සංස්කාරයන් ගැණ ඇති මැදිහත්කම.

**සඞ්ඛිත්ත.** ති-සංක්‍ෂෙපකළ.

**සඞ්ඛෙප.** පු-සංක්‍ෂෙපය, ලුහුඬුකිරීම.

**සඞ්ග.** පු-සංගතිය, ඇල්ම.

**සඞ්ගණිකා.** ඉ-සමාගම, රැස්වීම, පතිවිධ ක්‍රමය.

**සඞ්ගණිකාරාම.** න-සමූහයා හා ඇසුරු කිරීමට ඇති ආශාව.

**සඞ්ගත.** ති-සංගතාථ.

**සඞ්ගම.** පු-සමාගම, එක්රැස්වීම.

**සඞ්ගර.** පු-චිත්‍රාකාරය, අල්ලස්දීම, බලය, රාසිය, විපත, යුද්ධය, ප්‍රතිඥාව.

**සඞ්ගහ.** පු අනුකම්පාව, සංක්‍ෂෙපය, ගැණීම යන මෙහි.

**සඞ්ගහවත්ථු.** ඉ-අනුන්ගේ සිත් ගැණීමට හේතුවන දාන ප්‍රිය වචන අර්ථචය්‍යා සමානාත්මතා යන සතර, සඞ්ගහ වස්තු.

**සඞ්ගහන.** න-සඞ්ග්‍රහකිරීම.

**සඞ්ගහිත.** ති-සඞ්ග්‍රහකළ.

**සඞ්ගාණිකවිහාර.** පු-සමූහයා හා ජීවත්වීම.

**සඞ්ගාම.** d. චු-යුද්ධ, යුද්ධ කිරීමෙහි, සඞ්ගාමෙති, සඞ්ගාමයති, යුද්ධකෙරෙයි.

**සඞ්ගාමවිජිත.** ති-දිනනලද සඞ්ග්‍රාම ඇත්තා.

**සඞ්ගාමයොධ.** පු-සඞ්ග්‍රාමයෙහි යෙදුනු යොධයා.

**සඞ්ගාමාවචර.** පු-සඞ්ග්‍රාමයෙහි හැසිරෙන්නා.

**සඞ්ගායික.** ති-සංගායකයන් හා ඇති සම්බන්ධය

**සඞ්ගායති.** ක්‍රි-(d. භූ. ගා, සද්දෙ, ශබ්දයෙහි + ති) සංගායනා කරයි.

**සඞ්ගාහික.** ති-සංගායකයනට අයත්.

**සඞ්ගීත.** ති-සංගායනා කළ, ගායනා කළ.

**සඞ්ගීති.** ඉ-තූය්‍යීය, සංගායනාව.

**සඞ්ගීතිකාරක.** පු-සංගයනාවතට අයත් මහ ථෙරවරු.

**සඞ්ඝකම්ම.** න-පොහෝ කිරීම් ආදි විනය (සඞ්ඝ) කම්.

**සඞ්ඝගත.** ති-සඞ්ඝයාට අයත්, සංඝික කළ.

**සඞ්ඝට්ටන.** න-ගැටීම.

**සඞ්ඝත්ථෙර.** පු-සංඝයාගේ වැඩි මහළු මහ තෙර.

**සඞ්ඝභත්ත.** න-සංඝයා උදෙසා දෙන බත.

**සඞ්ඝ භෙද.** පු සංඝයා භෙද කිරීම, එනම් ආනන්තරිය කර්මය.

**සඞ්ඝරාජ.** පු සංඝයාගේ රජු.

**සඞ්ඝරාජි.** ඉ-සංඝභෙදය, සංඝයා භෙදකිරීම.

**සඞ්ඝංසන.** න-එකට වැදීම, වැදීම.

**සඞ්ඝටිත.** ති ගැසූ, තට්ටුකළ, ශබ්දකළ.

**සඞ්ඝට්ටන.** න-ගැටීම, එකට එකතුවීම.

**සඞ්ඝරණ.** න-එක්රැස්වීම, රාශීභූතවීම.

**සඞ්ඝාට.** පු-දූව වලල්ල.

**සඞ්ඝාටි.** ඉ-සඟල සිවුර, දෙපට සිවුර.

**සඞ්ඝාටික.** පු-සිවුරක් පොරවන්නා.

**සඞ්ඝාත.** පු-සමූහය, ගැසීම, එනම් නිරය

**සඞ්ඝානුස්සති.** ඉ-එනම් කර්මස්ථානය.

**සඞ්ඝාදිසෙස.** පු-එනම් විනය කර්මය.

**සඞ්ඝික.** පු-සඟසතු, සඞ්ඝයාට අයිති.

**සඞ්ඝී.** පු-සමූහයා ඇත්තා, පිරිවර ඇත්තා.

**සංඝුට්ඨ.** ති-ප්‍රතිරාවය කළ, ප්‍රකාශ කළ.

**සච්ච.** න-නිර්වාණ, ආර්‍ය්‍යමාර්ගය, විරතිය, දිවිරීම, සත්‍ය වචන, අවිපරීතාර්ථ, ආර්‍ය්‍ය-සත්‍ය, දෘෂ්ටිසත්‍යය.

**සච්චකාර.** පු-අත්තිකාරම, ඇඞ්වාන්ස් දීම.

**සච්චද්දස.** පු-සර්ඥ.

**සච්චනාම.** පු-සර්ඥ

**සච්චානුබොධ.** පු-සත්‍යාවබොධය.

**සච්චාපන.** න-අත්තිකාරම.

**සච්ඡන්ද.** ති-සෙච්ඡාව පවත්වන්නා.

**සච්ඡි.** පු-ප්‍රත්‍යක්ෂයෙහි, ඉන්ද්‍රිය ගොචරයෙහි

**සච්ඡිකත.** ති-ප්‍රත්‍යක්ෂකළ.

**සච්ඡිකරණ.** න-ප්‍රත්‍යක්ෂ කිරීම.

**සච්ඡිකරණීය.** ති-ප්‍රත්‍යක්ෂ කටයුතු.

**සච්ඡිකිරිය.** ති-ප්‍රත්‍යක්ෂ කිරීම.

**සච.** d. භූ යොගෙ, යෙදීමෙහි, සචති, යෙදෙයි.

**සච.** d. භූ-වියතෙත, වියත්බසෙහි, සචති, කියයි.

**සචිත්ත** න-සවකීය චිත්තය, සිය සිත.

**සචිපති** පු-ශක්‍රයා.

**සචිව.** පු-විශ්වාස ඇමතියා.

**සචෙ.** අ-අනියමාර්ථයෙහි, ඉදින්, එහෙයින්.

**සචෙතන.** ති-සිත් සහිත, චෙතනා සහිත.

**සජ්ජ.** d. භූ-ගමනෙ, යාමෙහි, සජ්ජති, යෙයි.

**සජ්ජ.** d. භූ-සජ්ජනෙ, ඇඳීමෙහි, සැපයීමෙහි, සජ්ජති, අඳියි, සපයයි.

**සජ්ජ.** d. භූ-විසජ්ජනෙ, හැරීම් ආදියෙහි, සජ්ජති, හරියි.

**සජ්ජ.** d. චු-සජ්ජනෙ, සෑදීමෙහි, සජ්ජෙති, සජ්ජයති, සාදයි.

**සජ්ජ.** ති-සන්නාහසන්නද්ධයා, සැරසුනු.

**සජ්ජන.** පු-සත්පුරුෂයා, ආඪ්‍ය කුල ඇත්තා

**සජ්ජන.** න-සෑදීම.

**සජ්ජා.** ඉ-ආසනය, කවිච්චිය, සැටිය.

**සජ්ජිත.** ති-සැරසූ, පිළියෙළ කළ

**සජ්ජු.** පු-එකෙණෙහි, සමාන කාලය.

**සජ්ජුලස.** පු-දුම්මල.

**සජ්ඣ.** න-රිදී.

**සජ්ඣායක.** පු-හදාරන්නා, ඉගෙණගන්නා.

**සජ්ඣායන.** න-හැදෑරීම, ඉගණීම.

**සජ්ඣායිත.** ති-හදාළ, ඉගෙණගත්.

**සජ්ඣු.** න-රිදී.

**සඤ්චය.** පු-රැස් කිරීම.

**සඤ්චරණ.** න-හැසිරීම, ඇවිදීම.

**සඤ්චරිත්ත.** න-ඉදිරියට හා පිටුපසට යෑම, මෛථුනය.

**සඤ්චාර.** න-හැසිරීම, යෑම, පසුකර යෑම.

**සඤ්චාලිත.** ති-චංචල වූනු, සෙල්ලුනු.

**සඤ්චිච්ච.** ති-දැනගණ, කැමැත්තෙන්ම.

**සඤ්චිත.** ති-රැස්කළ, රාශිභූත කළ.

**සඤ්චිනාති.** ක්‍රි-(d. කි. චි. චයෙ, රැස්කිරීමෙහි+ති) රැස්කරයි.

**සංචුණ්ණිත.** ත-කුඩු කරණ ලද, අඹරණ ලද.

**සඤ්චෙතනා.** ඉ-සිතුවිල්ල, චෙතනාව.

**සඤ්චෙතනික.** ති-අභිප්‍රාය සහිත, අදහස් සහිත.

**සඤ්චොදිත.** ති-චෝදනා කරණ ලද.

**සඤ්ඡින්න.** ති-සිඳින ලද, කඩන ලද.

**සඤ්ඡින්දති.** ක්‍රි-(d. භූ. ඡිදි, ඡේදනෙ, සිඳීමෙහි+ති) සිඳියි, බිඳියි.

**සඤ්ජග්ගති.** ක්‍රි (d. භූ. ජග්ග, රක්ඛණෙසු, රැකීමෙහි+ති) රකියි.

**සඤ්ජනන.** න-ඉපදීම.

(21905)

**සඤ්ජාත.** ති-උපන්, හටගත්.

**සඤ්ජාති.** ඉ-උත්පත්තිය, නිපදවීම, පිටත ඒම.

**සඤ්ජාතිදෙස.** පු-උත්පත්ති දෙශය.

**සඤ්ජම්භ.** ඉ-තීරු කිරීම, කෙවිටි කිරීම.

**සඤ්ජානන.** න-ප්‍රඥව, හැඳිනීම.

**සඤ්ජානාති.** ක්‍රි-(d. භූ. ඤා, අවබොධෙ, අවබොධයෙහි + ති) හඳුනාගනියි, දැනගනියි.

**සඤ්ජ.** d. භූ-සඞ්ග, ඇලීමෙහි, සඤ්ජති; ඇලෙයි, සතෙතා.

**සඤ්ජ.** d. භූ-පරිසඞ්ග වැළඳගැන්මෙහි, සඤ්ජති, වැළඳගනී.

**සඤ්ජායති.** ක්‍රි-(d. දි. ජනි, පාතුභාවෙ, පහළ වීමෙහි + ති) උපදියි, හටගණී. උපදී.

**සඤ්ජීව.** පු-එනම් නිරය.

**සඤ්ජීවන.** න-ජීවත්වීම.

**සඤ්ඣා.** ඉ-සවස, සවස් කාලය.

**සඤ්ඣාඝන.** න-සවස් වේලෙහි, වලාකුල්.

**සඤ්ඤත.** ති-කැමැති කළ, සලස්වන ලද.

**සඤ්ඤත්ති.** න-දැන්වීම, ඒත්තු ගැණීම, සංසිඳීම.

**සඤ්ඤා.** ඉ-හැඳිනීම, නාමය, චෙතනාව.

**සඤ්ඤාභව.** පු-එනම් භවය.

**සඤ්ඤාවිමොක්ඛ.** න-සංඥවෙන් වෙන්වීම.

**සඤ්ඤාගත.** ති-දැනගත්, පෙණුන.

**සඤ්ඤාභව.** න-සංඥ භවය, සංඥ ලොකයෙහි පැවැත්ම.

**සඤ්ඤාමය.** ති-සංඥවෙන් නිපන්.

**සඤ්ඤාවෙදයිතනිරොධ.** පූ-සංඥවෙන් හා වේදනාවෙන් වෙන්වීම,

**සඤ්ඤාවිරත්ත.** ති-සංඥවෙන් වෙන්වුනු.

**සඤ්ඤාපෙති.** ක්‍රි-(d. භූ. ඤා, අවබොධෙ, දැනීමෙහි + ණෙ + ති) දන්වයි, උගන්වයි.

**සඤ්ඤාණ.** න-දැනීම, නුවණ, ඥනය.

**සඤ්ඤාපන.** න-දැන්වීම, නිවේදනය.

**සඤ්ඤි.** න-දන්නාලද, දැනගත්.

**සඤ්ඤී.** ති-දැනගත්, අවබෝධ කරගත්.

**සඤ්ඤීවාද.** පු-මරණෙන් පසු සිත පවතීයයි කියන කොටසක්, එනම් වාදය.

**සඤ්ඤීභාව.** පු එනම් භවය.

**සඤ්ඤොජන.** න-ඇඳීම, සක්කායදිට්ඨි ආදි දශවිධ නීවරණයන්ට භාවිත කරණ නාමයක්.

**සට.** d. චු හිංසාදුනසත්තිසු, පීඩාවෙහි ශක්තියෙහි දූනයෙහි, සටෙති සටයති, පෙළයි, ශක්තිමත් කරයි, දෙයි.

**සට්ඨි.** ඉ-සැට, හැට, 60.

**සට්ඨිහායන.** පු-ඇතා, ඇතා සැට වශියක් ආයු ඇත්තෙකි.

**සට.** d. භූ-හණනෙ, බැණීමෙහි, සටති, බණියි.

**සට.** d. භූ-පීඩා, ගමනතිසෙඩන විකිරණ අවයවෙසු, පීඩාවෙහි, ගමන් වැලැක්මෙහි, විසිරීමෙහි අවයයයෙහි, සටති, පීඩාවෙයි.

**සඨ.** පු-සඨබව, කපටිබව.

**සඨ.** d. භූ-බලක්කාරෙ, බලාත්කාරයෙහි, සඨති, බලාත්කාරකම් කරයි.

**සඨ.** d. භූ-කෙරාටිකෙ, කෛරාටික වීමෙහි, සඨති, කපටි වෙයි.

**සඨ.** d. චු-පටිසංඛරණෙ, සකස් කිරීමෙහි, ගමනෙ, යාමෙහි, සඨති, සඨයති, සකස් කරයි, යෙයි.

**සඨ.** d. චු-ගුණකථනෙ, ගුණකීමෙහි, සඨෙති, සඨයති, ගුණ කියයි.

**සඨ.** d. චු-අසම්භාසනෙ, මනාකොට නොබිණීමෙහි, සඨෙති සඨයති, මනාව නොබිණියි.

**සඨ.** d. චු-කෙරාටිකෙ, කෛරාටික වීමෙහි, සඨෙති සඨයති, සඨෙති, සඨයති, කෛරාටිකවෙයි.

**සඨ.** පු-කපටියා, කෛරාටිකයා.

**සඨිල.** ති-බුරුල්, ලිහුණු.

**සඩි.** d. භූ-රුජායං, රුදාවෙහි, සණ්ඩති, රිදේ.

**සඩි.** d. භූ-පඳුරුලීමෙහි, ගොඩකිරීමෙහි, සෙලවීමෙහි.

**සණ්ඨ.** පු-බට වශීයක්.

**සණ්ඨපන.** න-තැබීම, පිහිටුවීම.

**සණ්ඨාන.** න-විහණය, ආකෘතිය, සලකුණ.

**සණ්ඨිති.** ඉ-සථිතිය, පිහිටීම.

**සණ්ඩ.** පු-සමූහය, රංචුව, රැල.

**සණ්ඩාස.** පු-අඬුව.

**සණ්හ.** තී-මොලොක්, මෘදු.

**සණ්හිකා.** ඉ-හෙණ්ඩුව, අංගුව.

**සණ්හෙති.** ක්‍රි-(d. භූ. හන, ගතියං, යෑමෙහි + ණෙ + ති) පීරයි.

**සණ.** d. භූ. දනෙ, දීමෙහි, සණති, දෙයි.

**සණ.** d. භූ-අව්‍යත්තසද්දෙ, අව්‍යක්ත ශබ්ද යෙහි, සණති, ශබ්ද කෙරෙයි.

**සණ.** d. චු-දනෙ, දීමෙහි, සණෙති, සණයති, දෙයි.

**සණ.** පු-හණ.

**සණධොවික.** තී-හණ සේදීම.

**සණති.** ක්‍රි-(d. භූ. දා, දනෙ, දිමෙහි + ති) දෙයි, දානය කරයි.

**සණික.** දි-වහා, ඉක්මන.

**සත්ත.** d. චු ගමනෙ, යාමෙහි, සත්තෙති, සත්තයති, යෙයි.

**සත්ත.** පු-සත්වයා, සතා - 7.

**සත්ත.** න-ද්‍රව්‍යය, අත්බව, ජීවිතය, ශක්තිය, විද්‍යමානත්වය.

**සත්ත.** තී-ඇලුනු.

**සත්තකි.** ඉ-මෙවුල්දම.

**සත්තරතන.** න-සප්තවිධ රත්නය.

**සත්තක්ඛත්තුං.** අ-සත්වරක්, හත්වාරයක්.

**සත්තති.** ඉ-සැත්තෑවයි, 70.

**සත්තධඤ්ඤ.** න-සප්තවිධ ධාන්‍යය, වී, මුං ආදි සත් වැදෑරුම් ධාන්‍යය.

**සත්තධා.** අ-සත් පරිද්දකින්, සප්ත ප්‍රකාර-යකින්.

**සත්තපණ්ණි.** රුක්අත්තන ගස.

**සත්තම.** තී-සත්වෙනි, සත්වන, ප්‍රශස්තයා.

**සත්තමහාසර.** පු-සප්තවිධ මහවිල්.

**සත්තරතන.** න-හස්ති රත්නය, අශ්ව, ඉත්ථි, ගහපති, මණි, චක්කරත්නය යන පස.

**සත්තරස.** අ-දහහත, 17.

**සත්තලා.** ඉ-සත්පෙති දෑ සමන්.

**සත්තලොක.** පු-සත්වාවාසය,

**සත්තව.** පු-සතුරා, හතුරා.

**සත්තවිඤ්ඤාණට්ඨිති.** ඉ-සප්ත විඥානස්ථිති,

**සත්තාච්චි.** පු-වහ්නිය, ගින්න,

**සත්තානුසය.** පු-කාමානුසය ආදි අනුසය සත

**සත්තාහ.** න-සතිය, සද්දිනය.

**සත්ති.** ඉ-ආයුධය, පක්ෂියා, ශක්තිය, අශ්වයා.

**සත්තිධර.** පු-ඛද කුමරු, අඩයටි දරන්නා.

**සත්තු.** පු-අක්සුණු, අගහලා, බැදි හාල්කුඩු, අමිත්‍රයා.

**සත්තුක.** පු-සතුරා, හතුරා, විරුද්ධකාරයා.

**සත්තුත්තම.** පු-සත්වොත්තම, සම්ඳු.

**සත්තුවලා.** ඉ-සෑම් ගස්.

**සත්තුස්සද.** පු-සප්තස්ථානයකින් උස්, කරුණු සතකින් උසස්.

**සත්ථ.** පු-ලොහය, සමූහය.

**සත්ථක.** පු-වෙළෙන්දා, ගැල්වලින් ගොස් වෙළඳාම් කරන්නා.

**සත්ථකනිසාදන.** න-පිහියා මුවාත තබන ගල.

**සත්ථවාහ.** පු-ගැල්වලින් බඩු ගෙණ ගොස් වෙළඳාම් කරන්නා.

**සත්ථවාහක.** පු-බුදුරජ.

**සත්ථාවාහ.** පු-සාර්ථවාහකයා, වෙළඳ නායකයා

**සත්ථාර.** පු-ශාස්තෘන් වහන්සේ, බුදුරජ.

**සත්ථාදි.** පු-සත්වරජස් යනාදිය.

**සත්ථි.** න-ආයුධය, ශස්ත්‍රය.

**සත්ථි.** ඉ-ශක්තිය, අඩයටිය.

**සත්ථි.** පු. න-කලවය.

**සත්ථු.** පු-ශාස්තෘ, බුදුරජ.

**සත්ථුක.** පු-ගුරුවරයෙකු ඇත්තා.

(22010)

**සත්ථුඅන්වය.** පු-ශාසනා පරම්පරාව.

**සත්ථුවණ්ණ.** පු-සම්බුදු ශරීරවර්ණය, රත්රන්, සවර්ණවර්ණ.

**සත.** න-සියය, බොහෝ.

**සතක.** සියයක් ඇති.

**සතක්කු.** විදුලිය, සතක්කකු.

**සතකොටි.** පු-සියක් කෝටිය.

**සතක්ඛත්තුං** අ-සියක්වර.

**සතඞ්ග.** පු-යුද්ධරථය.

**සතත.** න-නිරන්තරය.

**සතධා.** අ-සත්ප්‍රකාරයකින්, සත් පරිද්දකින්

**සතපත්ත.** පු-විල් ලිහිණියා.

**සතපත්ත.** න-පෙතිසියය, පියුම.

**සතපදී.** ඉ-පාසියයක් ඇත්තා, කත්වෑයා, පත්තෑයා.

**සතපබ්බ.** පු-පුරුක් සියයක් ඇති, හුණගස.

**සතපබ්බිකා.** ඉ-වදකසා, ගිතණ.

**සතපාස.** පු-කණේරුගස.

**සතපුඤ්ඤ.** න-ඉතා බොහෝවූ පුන්‍ය බලය.

**සතපුඤ්ඤලක්ඛණ.** න-බුදුරජ.

**සතාසිත.** ති-භයකළ, බියගැන්වූ.

**සතපොරිස.** න-පුරුෂ ප්‍රමාණ සතක්, සත් බඹයක්.

**සතභිසජ.** පු-සියාවස නැකත.

**සතමූලී.** ඉ-සාතාවාරිය.

**සතරංසි.** පු-සියක්රැස් ඇත්තා, ඉරු.

**සතලක්ඛගුණ.** න-සියක් ලක්ෂගුණය, සියක් ලක්ෂයෙන් වැඩි කිරීම.

**සතවඞ්ක.** පු-මත්ස්‍ය විශෙෂයක්.

**සතවිරියා.** ඉ-සුදු හී තණ.

**සතසහස්ස.** න-සියක් දහස.

**සතාවරී.** ඉ-සතාවාරිය.

**සති.** ඉ-ස්මෘතිය, සිහිය.

**සතික.** පු-සියයක් ඇති.

**සතින්ද්‍රිය.** න-ස්මෘතෙන්ද්‍රියය.

**සතිපට්ඨාන.** න-සිහිය පිහිටවීම.

**සතිම.** අ-සියවැනි, 100 වැනි.

**සතිලක.** පු-කලු හීතණ.

**සතිවිනය.** න-එනම් විනය කර්මය.

**සතිවොස්සග්ග.** පු-සිහිමුලාව.

**සතිසංවර.** න-සතිසංවරය, සිහිය ඇතිකිරීම.

**සතී.** ඉ-පතිව්‍රතා ඇත්තී

**සතුල්ලපකායික** පු-එනම් සත්වලොකය.

**සතෙකිච්ඡ.** පු-පිළියම් සහිත, පිළියම් කළහැකි.

**සතෙරතා.** ඉ-විදුලිය.

**සඨ.** d. භූ-සාවිල්ලෙය. සිථිල භාවයෙහි, සඨති ලිහිල්වේ.

**සඨ.** d. චු-බන්ධෙ, බැඳීමෙහි, සඨෙති, සඨයති, බඳියි.

**සඨ.** d. චු-දුබ්බලෙ, දුර්වලබැව්හි සඨෙති සඨයති දුර්වල කරයි.

**සද්ද.** d. භූ-පීඩායං, පීඩාවෙහි සද්දති පීඩා කරයි.

**සද්ද.** d. භූ. නීච, සද්දෙ, පහත් ශබ්දයෙහි සද්දති, ශබ්දකරයි.

**සද්ද** d. චු-සද්දෙ, ශබ්ද කිරීමෙහි, සද්දෙති, සද්දයති, ශබ්දකරයි.

**සද්ද.** පු-ශබ්දය, හඬ, නාදය.

**සද්දග්ගහ.** පු-ශබ්ද ග්‍රහණය, කණ.

**සද්දන.** න-ශබ්ද කිරීම.

**සද්දර.** පු-කෙලෙස් දරථ සහිත.

**සද්දලා** පු-තෘණවලින් නිල්වූ ප්‍රදෙශය, හීතණ.

**සද්දහන.** න-ඇදහීම, ශ්‍රද්ධාව.

**සද්දූ.** d. භූ-සොසනෙ, වියලීමෙහි, නිල්-වීමෙහි.

**සද්දූල.** පු-ශාදූර්ල, දිවියා කොටියා.

**සද්දූල.** ති-උතුම්දෙය.

**සද්දායති.** ක්‍රි-(d. චු. සද්දෙ, සද්දනෙ, ශබ්ද කිරීමෙහි + ති) ශබ්දකරයි.

**සද.** d භූ-රසස්සාදෙ, රසවිඳීමෙහි, සදති, රසවිඳියි.

**සද.** d. භූ-විකිරණේ, ගතිතිසෙධෙ, විසිරීමෙහි ගමන් වැලක්මෙහි, සිදති, විසිරෙයි, ගමන් වලකියි, පසිදති.

**සද**. d. චු-අස්සාදෙ ආශ්වාදයෙහි, සාදෙති. සාදයති, ආශ්වාදය කෙරෙයි, අස්සාදයති.

**සදත්ථ**. පු-ස්වකීය අර්ථය, ආත්මාර්ථය, තමාගේ ප්‍රයොජනය.

**සදන**. න-ගෙය, වාසස්ථානය.

**සදා**. අ-සතතයෙහි, සැමකල්හි.

**සදාගති**. ඉ-සුලඟ, වාතය.

**සදාතන**. ඉ-නොනස්නා දෙය, විනාශ නොවන දෙය.

**සදාරතුට්ඨි**. පු-ස්වදාරාසන්තොෂය, සියබිරින්ද හා සතුටුවීම.

**සදිස**. ති-සමාන, සදෘශ, වැනි, වාගෙ.

**සදිසත්ත**. ති-සදෘශබව, සමානභාවය.

**සදුම**. පු. න-ගෙය, ගෘහය.

**සදෙවක**. පු-දෙවියන් සහිත.

**සදෙස**. පු-ස්වකීය දෙශය, සමීපය.

**සද්ධ**. d. චු-තොසෙ, සතුටෙහි, සද්ධෙති සද්ධයති. සතුටුවෙයි.

**සද්ධං**. අ-අනුකූලත්වයෙහි, අනුකූලබැව්හි.

**සද්ධ**. ති-ශ්‍රද්ධාසහිතයා, ඇදහීම ඇත්තා.

**සද්ධ**. න-මතක බත, මළවුන් පිණිස දෙනබත

**සද්ධම්ම**. පු-සද්ධර්මය, සත්පුරුෂ ධර්මය, බුද්ධ ධර්මය.

**සද්ධා**. ඉ-ශ්‍රද්ධාව, තුනුරුවන් කෙරෙහි ඇදහිල්ල

**සද්ධානුසාරී**. පු-එනම් පුද්ගලයා.

**සද්ධාබල**. න-ශ්‍රද්ධාබලය.

**සද්ධාවිමුත්ති**. ඉ-ශ්‍රද්ධා විමුක්තිය.

**සද්ධාසික**. පු-ඇදහීම ඇති.

**සද්ධායිත**. ති-ඇදහීම කළ හැකි.

**සද්ධාලු**. පු-ශ්‍රද්ධාබහුලයා.

**සද්ධිවිහාරික**. පු-සමග හැසිරෙන්නා, සමග යන්නා]

**සද්ධින්ද්‍රිය**. න-ශ්‍රද්ධෙන්ද්‍රියය.

**සද්ධෙය්‍ය**. ති-ඇදහිය යුතු, විස්වාශකටයුතු.

**සන්ත**. ති-පූජ්‍ය, විද්‍යමාන, පසස්නාලද සත්‍යය, සත්පුරුෂ ශාන්ත.

**සන්ත**. d. චු-අනුකූලෙ, අනුකූලක්‍රියායෙහි සන්තෙති, සන්තයති, අනුකූල ක්‍රියාකරයි.

**සන්ත**. d. චු-සන්තෙ, සංසිද්දිමෙහි, සන්තෙති සන්තයති, සංසිඳෙයි.

**සන්ත**. පු-තාට්‍යරසය.

**සන්ත**. ති-ශාන්ත, සුසිලං.

**සන්ත**. න-නිවණ.

**සන්තක**. ති-අයිති, අයත්.

**සන්තක**. න-දේපොල, වස්තුව.

**සන්තත**. න-නිරන්තරය.

**සන්තති**. ඉ-වංශය, පරම්පරාව.

**සන්තත්ත**. ති-තවනලද, රත්කළ දෙය, බියගැත්වූ, අවුල් කළ.

**සන්තප්පන**. න-සන්තර්පණය, තෘප්තියට පැමිණීම, සෑහීමටයාම.

**සන්තප්පති**. ක්‍රි-d. භූ. තප්ප, සන්තප්පෙ, සන්තර්පණය, සන්තර්පණය කරයි, තෘප්තියට. පැමිණෙයි.

**සන්තප්පති**. ක්‍රි-(d. භූ. තප්ප, තප්පනෙ, තැවීමෙහි + ති) තවයි.

**සන්තපති**. ක්‍රි-(d. භූ තප, තපනෙ, තැවීමෙහි + ති) තවයි, රත්කරයි.

**සන්තවා**. ඉ-පොත්ත.

**සන්තජ්ජෙති**. ක්‍රි-(d චු. සන්ත, සන්තජ්ජනෙ, තැතිගැත්වීමෙහි + ණෙ + ති) තර්ජනය කරයි.

**සන්තරමාන**. පු-ඉක්මන, ඉක්මන්ගමන.

**සන්තස්සති**. ක්‍රි-සතුටුවෙයි. සන්තොෂවෙයි.

**සන්තාන**. පු-කප්රුක, වංශය, ප්‍රබන්ධය, අභ්‍යන්තරය.

**සන්තානක**. පු-පුත්‍රයා, පුතා, "පුතෙන සන්තානකෙ බ්‍රෑමි."

**සන්තාප**. පු-තැවීම, උණුසුම් කිරීම.

**සන්තාස**. පු-සන්ත්‍රාසය, තැතිගැණීම.

**සන්තාරණ**. න එතර කිරීම, එගොඩ කිරීම. පරතෙරට යාම.

**සන්තාසනීය**. පු-තැතිගැන්මට සුදුසු.

**සන්ති**. ක්‍රි-වෙත්

**සනති.** ඉ-නිර්මාණය, කල්‍යාණය, සන්සිඳීම.

**සන්තික.** ති-සමීපය, ළඟ.

**සන්තිකට්ඨ.** ති-සමීපය.

**සන්තිට්ඨති.** ක්‍රි-සිටියි, පිහිටයි.

**සන්තිකම්ම.** න-ශාන්තිකර්මය, දෙවියන්ට ආර බාරවීම.

**සන්තිපද.** න-ශාන්තපදය, නිවණ.

**සන්තුස්සන.** න-සතුටුවීම.

**සන්තුට්ඨ.** පු-සතුට, සන්තොෂය.

**සන්තුට්ඨි.** ඉ-සන්තොෂය, සතුටු ඇති.

**සන්තුසිත.** පු-සන්තොෂය, එනම් දෙව්ලොව.

**සන්තුස්සිත.** පු-සතුටුවූවන ලද, තුටුවූවනලද.

**සන්තොස.** පු-සතුට, ප්‍රීතිය.

**සන්ථ.** d චු ගන්ථනෙ, ගෙතීමෙහි, සන්ථෙති. සන්ථයති, ගොතයි.

**සන්ථත.** න-අතුල, අතුරණ ලද.

**සන්ථම්භන.** න-තැති ගැණීම.

**සන්ථරණ.** න-ඇතිරීම, වස්ත්‍රාදිය ආස්තරණය කිරීම.

**සන්ථව.** පු-පුරුද්ද, එකට වාසය, මෙවුම්දම

**සන්ථාගාර.** න-රාජ්‍යානුශාසනාකරණ මන්දිරය ආවාසය.

**සන්ථාන.** න-සලකුණ, ලකුණ.

**සන්ථාර.** පු-ඇතිරීම, පැතිරවීම, ආමිස සන්ථාර

**සන්ථාරක.** න-වැස්ම, ආවරණය.

**සන්ථුත** ති-ආශ්‍රිත, පළපුරුදු.

**සන්ද.** ති-අතර නැති දෙය, ඝනදෙය.

**සන්දච්ඡායා.** ඉ-සාන්ද්‍රච්ඡායාව, ඝනසෙවන.

**සන්දති.** ක්‍රි-(d. භූ. සන්ද, පසවනෙ, ගැලීමෙහි + ති) දියදහරා ගලා බසී.

**සන්දන.** න-රථය, ස්පන්දන

**සන්දමානික.** පු-රථාවාහීයා, රියදුරා,

**සන්දස්සක.** පු-කරුණු දක්වන්නා.

**සන්දස්සන.** න-දැක්වීම, කරුණු දැක්වීම.

**සන්දහති.** ක්‍රි-(d. භූ. සන්ද, පසවනෙ, ගැලීමෙහි + ති) එකට එකතු කරයි.

**සන්දහන.** න-තැබීම, ගැල්වීම.

**සන්දාන.** න-දම, යොත, රැන.

**සන්දානිත.** ති-බඳනා ලද දෙය.

**සන්දාලන.** න-කැඩීම, සිඳීම.

**සන්දාලෙති.** ක්‍රි. (d. භූ. දල, විසාරණෙ, පලල් කිරීමෙහි + ණෙ + ති) කඩයි, බිඳියි.

**සන්දාව.** පු-පලායාම, පැනයාම.

**සන්දිට්ඨ.** පු-දෘෂ්ට මිත්‍රයා, දිටුමිත්, දිටු පමණ වූ මිත්‍රයා.

**සන්දිට්ඨි.** ඉ-ස්වකීය දෘෂ්ටිය, ස්වකීයලබ්ධිය.

**සන්දිට්ඨික.** පු-මෙලොව ලබනලද ඵලය, තමා විසින්ම දක්ක යුත්ත.

**සන්දිට්ඨිපරාමාසී.** පු-ස්වකීය ලබ්ධිය පරාමර්ශනය කොට ගත් තැනැත්තා, ස්වකීය ලබ්ධිය ස්ථිරව ගත්තහු.

**සන්දිද්ධ.** ති-තැවරූ, ගෑ.

**සන්දු.** d. භූ-පස්සවනෙ, වහනය වීමෙහි, සන්දති, වහනය වෙයි.

**සන්දෙස.** පු-සංදෙශය, උතුමන්ට යවන ලිපි පනිවිඩ.

**සන්දෙසහර.** පු-සන්දෙශ ගෙණයන්නා, දූතය

**සන්දෙහ.** පු-විචිකිච්ඡාව, සැකය.

**සන්දෙසොත්ති.** ඉ-සන්දෙශ වචනය.

**සන්දොහ.** පු-සමූහය.

**සන්දූස.** න-අපවිත්‍ර කිරීම, දූෂ්‍ය කිරීම.

**සන්ධන.** න-ස්වකීය ධනය, තමාගේ ධනය.

**සන්ධවන.** න-තැවීම, රත් කිරීම,

**සන්ධවති.** ක්‍රි-(d. භූ. ධම, සද්දෙ, ශබ්ද කිරීමෙහි + ති) පිඹියි.

**සන්ධාන.** න-මිත්‍රකම, එකඟකම.

**සන්ධාපන** න-මිශ්‍ර කිරීම, එකට එකතු කිරීම,

**සන්ධාය.** අ-සඳහා, නිසා.

**සන්ධාරක.** පු-දරන්නා, උසුලන්නා.

**සන්ධාරණ.** න-දැරීම, ඉසිලීම.

**සන්ධාවන.** න-දිවීම, ධාවනය.

**සන්ධාවති.** ක්‍රි-(d. භූ. ධාවු, ගතියං, යෑමෙහි + ති) දුවයි, ධාවනය කරයි.

(22180)

**සන්ධි**. ඉ-ඝටනය, දෙකක් එකාබද්ධ කොට ගැළපීම, ගෘහසන්ධිය, ප්‍රතිසන්ධිය, පිළිසිඳ ගැණීම.

**සන්ධි**. පු-සම්මුඛය, සන්නිධානය, රැස් කර ගැන්ම.

**සන්ධිච්ඡේද**. පු-සන්ධි සිඳින්නා, ගෘහසන්ධි සිඳින්නා, ගෙවල් උමං බිඳින්නා.

**සන්ධිභෙද**. පු-ගෘහ සන්ධි බිඳින්නා, ගෙවල් බිඳින්නා.

**සන්ධිමුඛ**. න-බිත්ති බිඳ ගෙවල්වලට ඇතුළු වීමේ විවරය.

**සන්ධික**. පු-ගෘහ සන්ධිවල ගැවසෙන්නා.

**සන්ධුනන**. න-සෙලවීම, කම්පාවීම;

**සන්ධුනාති**. ක්‍රි-(d කි. ධු කම්පනෙ, සැලීමෙහි + ති) කම්පා වෙයි, සැලෙයි.

**සන්ධොත**. පු-ධෝවනය කළ, සෝදන ලද.

**සන්ධොවති**. ක්‍රි-(d භූ. ධෝවු, ධොවනෙ, සේදීමෙහි + ති) සෝදයි, ධොවනය කරයි.

**සනනකද්දු**. පු-පියාගස, පියල්ගස.

**සනන්ධ**. ති-සන්නාහසන්නද්ධයා, සැරසුණු.

**සන්නාහ**. පු-කවචය, සැට්ටය.

**සන්නිකාශ**. ති-සදෘශ, සමාන.

**සන්නික්ඛෙපන** න-බැහැර කිරීම, අහක් කිරීම.

**සන්නිගණ්හාති**. ක්‍රි-(d. භූ. ගහ, උපාදානෙ, ගැනීමෙහි + ති) වළක්වයි.

**සන්නිධිකාර**. පු-රැස්කර තබා ගැණීම.

**සන්නිධාන**. පු-ප්‍රයුක්ත, විධාන, පිහිටුවීම.

**සන්නිධි පරිභොග**. පු-රැස්කොට තබාගණ පරිභොග කිරීම, අද පිළිගද්දෙය හෙට අනිද්දාට තබාගණ වැළඳීම.

**සන්නිචය**. පු- (සං + නිචය) රැස් කිරීම, එකතු කර ගැන්ම.

**සන්නිචිත**. ති-රැස්කළ, රැස්වන ලද.

**සන්නිට්ඨාන**. න-නිගමනය, වියදම් කිරීම, නිශ්චය කිරීම.

**සන්නිපතිත**. ති රැස්වන ලද, රාසිභූතවන ලද.

**සන්නිපතන**. න-රැස්වීම, එකතුවීම.

**සන්නිපාත**. පු-රැස්වීම, සමූහයක් එක තැනකට එකතු වීම.

**සන්නිපාතිකා**. ඉ-එනම් රොගය,

**සන්නිපාතිත**. ති-රැස්වීම ඇති.

**සන්නිභ**. ති-සදෘශ, සමාන, වාගේ.

**සන්නිරුම්භති**. ක්‍රි-නිරුද්ධ කරයි.

**සන්නිරුම්භන**. න-නිරුද්ධ කිරීම, නිරොධ කරණය.

**සන්නියොජන**. න-නියොග කිරීම, අණකිරීම

**සන්නියොජෙති**. ක්‍රි-(d. භූ. යුජ, යොගෙ, යෙදීමෙහි + ණෙ + ති) නියොග කරයි.

**සන්නියානන**. න-පාවාදීම, සන්නියාතන කිරීම.

**සන්නිවට්ට**. න-ආපසු යෑම, පෙරළා යෑම.

**සන්නිවසති**. ක්‍රි-(d. භූ. වස, නිවාසෙ වැසීමෙහි + ති) වාසය කරයි.

**සන්නිවසන**. න-වාසය කිරීම, විසීම.

**සන්නිවාරණ**. න-ආවරණය, වැලකීම.

**සන්නිවාස**. පු-සමගි වාසය, එකට විසීම.

**සන්නිවුත්ථ**. න-එකට විසීම, ඇසුරු කිරීම.

**සන්නිවෙස**. පු-සටහන, පිහිටවීම.

**සන්නිහරෙති**. ක්‍රි-වළක්වයි, වලකයි.

**සන්නිසීදති**. ක්‍රි-(d. භූ. සද, ගතියං, ගෑමෙහි + ති) හිඳී, ඉඳී.

**සන්නිසීදන**. න-හිඳීම, ඉඳගැන්ම.

**සන්නිස්සිත**. ති-ආශ්‍රය කළ.

**සන්නිසින්න** පු-රැස්වහුන්, එකතුව සිටිය.

**සන්නිහිත**. පු-සන්නිවෙසය.

**සන්නික්ඛිත**. ති-තැන්පත් කළ, බහා තැබූ.

**සන්නීත**. ති-මිශ්‍රකළ, එකට එකතු කළ.

**සනෙනති**. ක්‍රි-(d. භූ. නී. නයෙ, පැමිණ වීමෙහි + ණෙ + ති) මිශ්‍ර කරයි.

**සන්න්‍යාස**. පු-සන්නිවෙසය,

**සනති**. d. භූ සෙවනෙ, සෙවය කිරීමෙහි සනති, සෙවය කරයි.

(22231)

**සනති.** ක්‍රි-(d. භූ. සනති, සෙවනෙ, සෙවනය කිරීමෙහි + ති) සෙවනය කරයි, "සනතෙව බ්‍රහ්මචරියං"

**සනන්තන.** පු-තොනස්තාදෙශ, පුරාණදෙශ.

**සනං.** අ-සතතයෙහි, නිතර.

**සනිත.** ති-ධ්වනි යුක්ත වස්තු.

**සනිකං.** අ-අතිශීඝ්‍රාත්මයෙහි සෙමින් යනාත්ම යෙහි.

**සනු.** d. න. දානෙ, දීමෙහි, සනොති, දෙයි.

**සප්ප.** d. භූ-ගමනෙ, ගමනයෙහි, සප්පති, යෙයි.

**සප්ප.** පු-සර්පයා, නයිපොලොන් ආදී සර්ප ජාතිය.

**සප්පච්චය.** පු-(ස + පච්චය) ප්‍රත්‍යය සහිත.

**සප්පඤ්ඤ.** පු-ප්‍රඥා සහිතයා, පණ්ඩිතයා.

**සප්පටිඝ.** පු-ප්‍රතිඝසහිත, ද්වෙෂ සහිත.

**සප්පටිපුග්ගල.** පු-ප්‍රතිපුද්ගල සහිත.

**සප්පටිභාග.** පු-ප්‍රතිභාග සහිත.

**සප්පරාජ.** පු-නාගරාජයා, වාසුකී නාගරාජයා අනන්ත නාරජ.

**සප්පතිස්ස.** පු-නීච වෘත්තිය, පහත් පැවැත්ම.

**සප්පතිස්සව.** පු-පහත් පැවතුම් ඇත්තා.

**සප්පවිස.** පු-සර්පවිෂය, නයිවිෂය.

**සප්පදාඨා.** ඉ-සර්පදළු.

**සප්පාටිහාරිය.** න-ප්‍රාතිහාර්‍ය්‍ය සහිත, සප්පාටිහීර

**සප්පාටිහීර.** න-ප්‍රාතිහාර්‍ය්‍ය සහිත, සප්පාටිහාරිය.

**සප්පාණක.** පු-පණුවන් සහිත.

**සප්පාය.** පු-ෂට්ප්‍රාය, සැප ඇති.

**සප්පි.** න-ගිතෙල්, එළගිතෙල්.

**සප්පීතික.** ති-ප්‍රීති සහිත.

**සප්පුරිස** පු-සත්පුරුෂයා, ලෝවැඩ කරන්නා.

**සප.** d. භූ-සාමග්ගියෙ, සාමග්‍රියෙහි, සපති, සමගිවෙයි.

**සප.** d. භූ. අක්කොසෙ, අක්‍රොශයෙහි, සපති, බණියි.

**සපච.** පු-චණ්ඩාලයා, සැඩොලා.

**සපජාපතික.** ති-ඉන්ද්‍රයා සහිත.

**සපත්ත.** පු-සතුරා, විරුද්ධකාරයා.

**සපත්තභාර.** න-පියාපත් සහිත බර,

**සපත්නී.** ඉ-විරුද්ධකාරී, සැතිරි.

**සපත්නි.** පු-සමානපතියා, ස්ත්‍රීන් කීපදෙනෙකුට සමාන අයිති ඇති පුරුෂයා.

**සපතිකා.** ඉ-ස්වාමියෙක් සහිත ස්ත්‍රිය.

**සපතී.** ඉ-තරඟකාරී බිරිඳ, සමාන පතියෙකු ඇති ස්ත්‍රිය.

**සපථ.** පු-දිවිරීම, සාපකිරීම.

**සපදාන.** න-පිළිවෙළ, පටිපාටිය, පිළිවෙළින් ගමනය.

**සපදානචාර.** පු-ගෙපිළිවෙළින් හැසිරීම.

**සපදි.** අ-එකණෙහි, එකක්ෂණයෙහි.

**සපන.** න-දිවිරීම, සපථ කිරීම.

**සපරිග්ගහ.** පු-පරිග්‍රහ සහිත, අයිතිවාසිකම් සහිත.

**සපරිදණ්ඩ.** පු-දඬුවම් සහිත.

**සපරි.** ඉ-පෙට්ටියායයි ප්‍රසිද්ධ මාලුවා.

**සපාක.** පු-චණ්ඩාලයා, රොඩියා.

**සපිණ්ඩ.** පු-සහලේ නෑයා, සමාන ලේ ඇත්තා

**සඵ.** න-ගවාදීන්ගේ කුර.

**සඵල.** න-පල සහිත, ප්‍රයොජන සහිත, විපාක සහිත.

**සබල.** පු-කබුරුවන් පැහැය, කබර.

**සබ්බ.** චු-පරිමණ්ඩලෙ, පිරිමඬුලු බැවිහි, සබ්බෙති, සබ්බයති, පිරිමඬුලු ඇති කෙරේ.

**සබ්බ.** d. භූ-මණ්ඩණෙ, සැරසීමෙහි,

**සබ්බ.** d. භූ-ගමනෙ, යාමෙහි, සබ්බති, යෙයි.

**සබ්බ.** d. භූ-පීඩායං, පෙළීමෙහි, සබ්බති, පෙළයි.

**සබ්බ.** ති-සියල්ල, සකල, සර්ව.

**සබ්බ.** පු-ඊශ්වරයා, මහ දෙවියා.

**සබ්බකාරක.** ති-සියල්ල කරණ.

**සබ්බකාලික.** ති-සැම වේලෙහි ප්‍රයෝජන ඇති,

**සබ්බතො.** අ-හාත්පසින්, සර්වප්‍රකාරයෙන්.

**සබ්බතොභද්ද.** පු-කොසඹ ගස.

(22289)

**සබ්බත්‍ර.** අ-සියලු තන්හි, සෑම තැන.

**සබ්බඤ්ඤූ.** පු-සර්වඥ, සියල්ල දත් තැනැත්තා.

**සබ්බඤ්ඤුතඤාණ.** න-සර්වඥතාඥානය, සියල්ල දැනගන්නා නුවණ.

**සබ්බඤ්ඤුතා.** ඉ-සර්වඥතා ඥානය.

**සබ්බත්ථතා.** සෑමතන්හි පැතිරීම් බව.

**සබ්බථා.** අ-සියලු ආකාරයෙන්, සෑම විධියෙන්.

**සබ්බදස්සාවී.** පු-සියල්ල දක්නා සුළු තැනැත්තා, බුදුරජ.

**සබ්බදා.** අ-සියලු කාලයෙහි, සෑමදාම.

**සබ්බධි.** ඉ-සෑම තන්හි, සෑම තැනම.

**සබ්බභුම්ම.** පු-සක්විතිරජ, එතම් දිගතා.

**සබ්බ්‍යවඨ.** පු-රියදුරා, රථාචාර්‍යයා.

**සබ්බරස.** පු-දුම්මල, සියලු රසය.

**සබ්බවිදූ.** පු-සියල්ල දත් තැනැත්තා, සර්වඥයන් වහන්සේ.

**සබ්බසො.** අ-සර්වප්‍රකාරයෙන්, හාත්පසින්.

**සබ්බානුභූති.** ඉ-සුදු ත්‍රසතවැලු.

**සබ්බාභිභූ.** පු-සියල්ල මැඩ පවත්වන තැනැත්තා, බුදුරජ.

**සබ්බාසව.** පු-සියලු ආශ්‍රව, සියලු කෙලෙස්.

**සබ්බීති.** ඉ-සියලු උවදුරු, සර්වෝපද්‍රව.

**සබ්බූපාදාන** න-සියලු උපාදාන, කාමෝපාදානාදි සියල්ල.

**සබ්‍රහ්මක.** පු-බ්‍රහ්මයා සහිත.

**සබ්‍රහ්මචාරී.** පු-සමාන බ්‍රහ්මචරියාව ඇත්තා, සබ්රම් සොරහු, සමාන බඹසර ඇත්තා.

**සබ්භි.** පු-සත්පුරුෂයා.

**සභග්ගත.** පු-සභාවට පැමිණි.

**සභා.** ඉ-සභාව, සබය, සාලාව.

**සභාග.** ති-සමාන, එකසමාන.

**සභාගවුත්ති.** ඉ-සමාන පැවැත්ම.

**සභාජ.** d. චු-පීතිසෙවනෙසු, ප්‍රීතියෙහි හා සෙවනයෙහි, සභාජෙති සභාජයති, ප්‍රීති වෙයි, සෙවනයකරයි.

**සභාධම්ම.** පු-සුවසේ උත්නවුත් නොසෙල්වා එක් පසකින් ඇතුල් වීම.

**සභාපති.** පු-සභාවේ අධිපතියා, සභානායකයා.

**සභාව.** පු-ස්වභාවය, ගතිය.

**සභාවධම්ම.** පු-ස්වභාව ධර්මය, ස්වභාව ගතිය.

**සභොග.** පු-භොග සහිත.

**සභ්‍ය.** ති-සභාවෙහි නියුක්ත, සභාවට සුදුසු, ආඪ්‍ය කුල ඇත්තා.

**සම්පග්ගහ.** පු-ග්‍රහණය, ගැණීම.

**සම්පකම්පන.** න-අතිශයින් කම්පා වීම, අතිශය චලනය.

**සම්පකොප.** න-අතිශයින් කොප වීම.

**සම්පක්ඛන්දති.** ක්‍රි-(d. භූ. ඛදි, පක්ඛන්දනෙ, දිවීමෙහි + ති) දුවයි, පැන දුවයි.

**සම්පක්ඛන්දන.** න-පැන දිවීම, දිවීම.

**සම්පචුර.** ති-බහුල, බොහෝ.

**සම්පජඤ්ඤ.** න-මනා ප්‍රඥ ඇති බව.

**සම්පජ්ජති.** ක්‍රි-(d. භූ. පද, ගතියං, යැමෙහි + ති) (සං + පද=ජ්ජ + ති) සම්පාදනය වෙයි.

**සම්පජාන.** න-දැනීම, මනා දැනීම.

**සම්පජානන.** න-මනා දැනීම, ජානනය.

**සම්පජානකාරී.** පු-මනා ප්‍රඥාවෙන් යුත් ක්‍රියා කරන්නා.

**සම්පජානමුසා.** ඉ-දැන දැන බොරුකීම.

**සම්පජානාති.** ක්‍රි-දැනගනී, අවබොධකරගනී.

**සම්පජ්ජලන.** න-දිලිසීම, බැබලීම.

**සම්පජ්ජලිත.** ති-දිලිසෙනලද, බබලන ලද.

**සම්පටිච්ඡන.** න-ස්වීකාරය, පිළිගැණීම, ප්‍රතිග්‍රහණය.

**සම්පටිච්ඡිත.** ති-පිළිගත්, පිළිගන්නා ලද.

**සම්පටිවෙධ.** පු-මනා ප්‍රතිවෙධය, මනාවබොධය.

**සම්පත්ත.** ති-පැමිණෙනලද, පැමිණි, සම්ප්‍රාප්ත.

**සම්පත්ති.** ඉ-සැපත, සම්පත්තිය, සමෘද්ධිය, ගුණොත්කර්ෂය.

**සම්පත්ථනා.** ඉ-මනා ප්‍රාර්ථනාව, හොඳ පැතීම.

**සම්පති.** අ-දැන්, අධුනාකාලයෙහි.

**සම්පදා.** ඉ-සම්පත්තිය, සමෘද්ධිය.

(22845)

**සම්පදූති.** ති-දෙයි, දානය කරයි.

**සම්පදාන.** න-සම්ප්‍රදානය, දීම.

**සම්පදාලන.** න-පැළීම, දෙපලුකිරීම.

**සම්පදාලෙති.** ක්‍රි-(d. භූ. දල, විදාරණෙ, දෙපලු කිරීමෙහි+ණෙ+ති) පලයි, දෙපලු කරයි.

**සම්පදාසීල.** න-වර්ධනය වූ සිල් ඇතිබව.

**සම්පදිත්ත.** ති - දිලිසෙන ලද, ගිනිගෙණ බබලන ලද.

**සම්පදුට්ඨ.** ති-දූෂ්‍යවනලද, කෙලසනලද.

**සම්පදුස්සති.** ක්‍රි-(d. දි. දුස, අප්පීතියං, නොසතුටු බවෙහි + ති) දූෂ්‍ය කරයි. කෙලසයි.

**සම්පදෝස.** න-නපුරුකම, දරුණු බව.

**සම්පද්දුත.** ති-දිව්ව, දුවගිය.

**සම්පධූපායති.** ක්‍රි-(d. භූ ධූප, සන්තාපෙ, තැවීමෙහි+ති) තද දුම් පිටකරයි.

**සම්පධූපෙයති.** ක්‍රි-(d. භූ. ධූප, සන්තාපෙ, තැබීමෙහි+ණෙ+ති) තද දුම් පිටකරවයි.

**සම්පප්පලාප.** පු-නිෂ්ඵල කථා, දෙලොවට වැඩ නැති කථා.

**සම්පභාසති.** ක්‍රි-(d. භූ. භාස, ව්‍යත්තිං වාචායං ව්‍යත් වචනයෙහි+) කියයි. තෙපලයි.

**සම්පමොහ.** පු-මූලාව.

**සම්පයොග.** පු-එක්ව යෙදීම.

**සම්පරායික.** ති-පරලොවදී ලබන පලය.

**සම්පරාය.** පු-පරලොව, මතුභවය.

**සම්පමද්දති.** ක්‍රි-(d. භූ මද්ද, මද්දනෙ, වැසී-මෙහි+ති) මඩියි, මර්දනය කරයි.

**සම්පමද්දිත.** ති-මඩනාලද, පොඩිකළ.

**සම්පමූළ්හ.** පු-මූලාවූ තැනැත්තා.

**සම්පමොදති.** ක්‍රි-(d. භූ. මුද, මොදනෙ, සතුටුවීමෙහි+ති) ප්‍රමුදිතවෙයි, සතුටු වෙයි.

**සම්පමොදිත.** ති-ප්‍රමුදිතවන ලද.

**සම්පවාරණ.** න-පැවරීම, ආරාධනය.

**සම්පවෙධති.** ක්‍රි-(d. භූ. විධ, කම්පනෙ, සැලී-මෙහි+ති) වෙවුලයි, සෙලවෙයි.

**සම්පවෙධන.** න-වෙව්ලීම, චලනය, කම්පාවීම.

**සම්පයාත.** ති-පිටත්ව ගිය, ඉදිරියට ගිය,

**සම්පයුත්තපච්චය.** පු-සම්ප්‍රයුක්ත ප්‍රත්‍යය.

**සම්පයොජෙති.** ක්‍රි-(d. භූ. යුජ, යොගෙ, යෙදීමෙහි+ති) යොදයි.

**සම්පරිකඩ්ඪති.** ක්‍රි-(d. භූ. කඩ්ඪ, කඩ්ඪනෙ, ඇදීමෙහි+ති) ආපසු අදියි.

**සම්පරිකිණ්ණ.** ති-ගැවසීගත්, පිරිවැරූ.

**සම්පරිතාප.** පු-තාපය, තැවීම, වියලීම.

**සම්පරිවත්තති.** ක්‍රි-(d භූ. වතු, වත්තනෙ, පැවතීමෙහි+ති) පෙරලෙයි.

**සම්පරිවත්තන.** න-පෙරලීම.

**සම්පරිවාසිත.** ති-වසන ලද.

**සම්පලිබොධ.** පු-පරිබොධය, පීඩාව.

**සම්පලිභග්ග.** ති-බිඳිනාලද, සිඳිනාලද.

**සම්පභුඤ්ජති.** ක්‍රි-(d භූ. භුඤ්ජ, භුඤ්ජනෙ, බුදීමෙහි+ති) අනුභවකරයි, වළඳයි.

**සම්පලිමට්ඨ.** ති-සපර්‍ශකළ, අතටගත්, විනාශ කළ.

**සම්පලිවෙඨන.** න-වෙළීම, එතීම.

**සම්පලිවෙඨිත.** ති-වෙළන ලද, ඔතනලද.

**සම්පවඞ්ක.** පු-වක, ඇදය, මහත් ඇදය.

**සම්පවායති.** ක්‍රි-(d. භූ. වා, ගතියං, යෑමෙහි +ති) හුලඟ හමයි, සුවඳදිය විහිදෙයි.

**සම්පවාරෙති.** ක්‍රි (d. චු. වර, ඉච්ඡායං, කැමැත්තෙහි+ණෙ+ති) පවරයි, ආරාධනා කරයි.

**සම්පවෙධති.** ක්‍රි-(d. භූ. විධ, කම්පනෙ, සැලී මෙහි+ති) වෙවුලයි, සෙලවෙයි.

**සම්පවෙධන.** න-වෙව්ලීම, චලනය, කම්පාව.

**සම්පස්සන.** න-දැකීම, දර්ශනය.

**සම්පස්සිත.** ති-දක්නා ලද, දුටු.

**සම්පසාදන.** න-පැහැදීම, ප්‍රසන්න කිරීම.

**සම්පසාරණ.** න-දිග හැරීම, දික්කිරීම.

**සම්පසාරෙති.** ක්‍රි-(d භූ. සර, ගතියං, යෑමෙහි +ණෙ+ති) (සං+ප+සර=ගතියං) දිග හරියි.

**සම්පසීදති.** ක්‍රි - (d. භූ. සිද, සෙනාහෙ, සෙනාහයෙහි+ති) (සං+ප+සීද+ති) පහ-දියි, ප්‍රසන්නවෙයි.

(21397)

**සම්පසීදන**. න-ප්‍රසන්නවීම, පැහැදීම.

**සංපහංසන**. න-සතුටුවීම.

**සම්පහංසිත**. ති-සතුටුවන ලද.

**සම්පහාර**. පු-ප්‍රහාරය, පහර.

**සම්පාත**. ති-වැටීම, හෙළීම.

**සම්පාදන**. න-පිළියෙළ කිරීම, සකස් කිරීම, ලැස්ති කිරීම.

**සම්පාදක**. පු-පිළියෙළ කරන්නා, කළමනාකාරයා

**සම්පාදිත**. ති-ප්‍රතිපාදනයකළ, පිළියෙළ කළ.

**සම්පාදෙති**. ක්‍රි-සම්පාදනය කරයි, සාදයි.

**සම්පාපක**. පු-පමුණුවන්නා, ගෙණයන්නා.

**සම්පාපන**. න-පැමිණවීම, එලවීම.

**සම්පාපුණාති**. ක්‍රි-(d. භූ. පුණ, නිපුණෙ, නිපුණයෙහි + ති) පමුණුවයි, එලවයි.

**සම්පායති**. ක්‍රි-(d. භූ. පායි, වුද්ධියං, වැඩීමෙහි + ති) එකඟවෙයි.

**සම්පුචිත**. ති-ඇකිලුනු, රැලිවැටුනු.

**සම්පුණ්ණ**. පු-සම්පූර්ණ, පිරුණු.

**සම්පිණ්ඩන**. න-පිඩුකිරීම, කැටිකිරීම, සමුච්චය කිරීම.

**සම්පිණ්ඩිත**. ති-පිඩුකළ, කැටිකළ.

**සම්පිය**. ති-මිත්‍රලෙස, යහළු පරිදි.

**සම්පිණෙති**. ක්‍රි - (d. භූ. පිණ, පිණනෙ, පිණවීමෙහි + ණෙ + ති) පිණවයි.

**සම්පීළිත**. ති-පීඩාකළ, වෙහෙසකළ

**සම්ඵ**. න-සුළු, කුඩා.

**සම්ඵප්පලාප**. පු-හිස්වචන, තේරුමක් නැති වදන්.

**සම්ඵස්ස**. පු-ස්පර්ශය, පහස.

**සම්ඵුට්ඨ**. පු-ස්පර්ශකළ.

**සම්ඵුල්ල**. න-පිපුණු, ප්‍රබොධවන ලද.

**සම්ඵුසති**. ක්‍රි-(d භූ. ඵුස, සමඵස්සෙ, ස්පර්ශයෙහි + ති) ස්පර්ශකරයි, ගටයි.

**සම්ඵුසන**. න-ස්පර්ශකිරීම, හැපීම.

**සම්ඵුල්ලිත**. පු-මල් ගෙණසිටි වෘක්ෂය, පිපෙන ලද.

**සම්බ**. d. චු - සම්බන්ධයෙහි, සම්බෙති, සම්බයති, සම්බන්ධවෙයි, බඳියි.

**සම්බධ**. පු-බඳනාලද, සම්බන්ධකළ.

**සම්බන්ධ**. පු-සමගි බන්ධනය, එකට එක බැඳීම.

**සම්බජ්ඣති**, ක්‍රි-(d. චු. බධ, බන්ධනෙ, බැඳීමෙහි + ති) (සං + බධ + ති) බඳියි.

**සම්බන්ධන**. න-බැඳීම, සමගි බන්ධනය.

**සම්බර**. පු-එනම් අසුරයා.

**සම්බරි**. ඉ-ඉන්ද්‍රජාලය.

**සම්බල**. ති-මාර්ගෝපකරණ, මග වියදම.

**සම්බහුල**. ති-බොහෝ දෙය.

**සම්බහුලික**. ති-බොහෝ දෙනාට අයත්.

**සම්බහන**. න-උතුරුසළුව, උත්තරසාටකය.

**සම්බාධ**. පු - නිරවකාශය, ගුහ්‍ය වූ දෙය, හිරිහැරය.

**සම්බාහන**. න-මැඩීම, මිරිකීම, පොඩිකිරීම.

**සම්බාහති**. ක්‍රි-(d. භූ. බාහ, නිවාරණෙ, වැළැක්මෙහි + ති) සම්බාහනය කරයි, මඩියි.

**සම්බුක**. පු-රත්වන් බෙල්ලා.

**සම්බුජ්ඣන**. න-අවබොධය.

**සම්බුජ්ඣති**. ක්‍රි-(d. භූ. බුධ, බොධනෙ, අවබොධයෙහි + ති) අවබොධකරයි, දැන ගණියි.

**සම්බොජ්ඣඞ්ග**. න-සතර මාර්ගඥනයයි කියන ලද බොධියට අඞ්ගවන ධර්ම, සත්තිස් බෝ පැකිදම්.

**සම්බොධ ධම්ම**. පු-සර්වඥයන් වහන්සේ.

**සම්බොධන**. න-ආමන්ත්‍රණය, ආලපනය.

**සම්බොධි**. ඉ-සර්වඥතා ඥානය, බුද්ධ ඥානය, සම්බොධිය.

**සම්බුද්ධ**. පු-මනාව අවබොධකළ නැනැත්තා, බුදුරජ.

**සම්බුද්ධි**. ඉ-සවකීය බුද්ධිය.

**සම්භ**. d. භූ-විස්සාසෙ, විස්වාශයෙහි, සම්භවති, සම්භවෙයි.

(22449)

**සමභජති.** ක්‍රි-(d. භූ. භජ. සෙවායං, සෙවනය කිරීමෙහි + ති) භජනය කරයි.

**සමභත්ත.** පු-දැඩිමිත්‍රයා, දෘඪමිත්‍රයා.

**සමභත්ති.** ඉ-දැඩි මිත්‍රබැව් ඇත්තා.

**සමභත.** ති-රැස්කරණලද, රාශීභූත කරණ ලද.

**සමභම.** පු-ගෞරවය, භීතිය, කලකිරීම.

**සමභව.** පු-උත්පත්තිය, හෙතුව, ඇල්ම, ශුක්‍රධාතුව.

**සමභාවනා.** ඉ-ප්‍රසංශාව, සතුතිය, බුහුමන් කිරීම.

**සමභාර.** පු-රාශිය, සමූහය.

**සමභාවනීය.** ති-සම්භාවනා කටයුතු, ගරු කටයුතු.

**සමභාසා.** ඉ-සම්‍යග් කථාව.

**සම්භින්න.** පු-බිඳුනු, භග්නකළ.

**සම්භීත.** ති-බියවනලද, බියවූ.

**සම්භුනාති.** ක්‍රි-(d. කි, භූ, පත්තියං, පැමිණ වීමෙහි + ති) උපදවයි.

**සම්භූ.** d. භූ-පීඩායං, පෙළීමෙහි, සම්භති සම්භවති, පෙලයි, පීඩාකරයි.

**සම්භූ.** d. සු-පාපුණනෙ, පැමිණවීමෙහි, සම්භුණති, පැමිණේ.

**සම්භුණාති.** ක්‍රි-(d. දි, භුන, පත්තියං, පැමිණ වීමෙහි + ති) පැමිණෙයි.

**සම්භූ.** පු-බ්‍රහමයා, විෂ්ණු, ඊශ්වරයා.

**සම්භූත.** පු-හටගත්, උපන්.

**සම්භෙද.** පු-ගංමුවදොර, මෛථ්‍ය, බිඳීම.

**සම්භොග.** පු-ශෘඞ්ගාරභෙදය, පරිභොගය, වලඳුජනය.

**සම්ම.** අ-යහලුව, මිතුර, කාංසතාලය, කයිතාලම.

**සම්මග්ගත.** පු-මනාව පැමිණි, යහපත්ව පිළිපැදි.

**සම්මජ්ජන.** න-හැමදීම, ඇමදීම.

**සම්මට්ඨ.** පු-සමතලා කරණ ලද.

**සම්මදඤ්ඤ.** පු-(සම්මා + අඤ්ඤ) මනාකොට දැන.

**සම්මජ්ජනී.** ඉ-මුස්න, මුසන.

**සම්මජ්ජති.** ක්‍රි-(d. භූ. මජ්ජ, මජ්ජනෙ, මර්දනයෙහි + ති) හමදියි, සම්මාර්ජනය කරයි.

**සම්මජ්ජිත.** ති-අමදිනලද, අතුගාදමනලද.

**සම්මත.** පු-සම්මතකළ, ව්‍යවස්ථාකළ.

**සම්මතාල.** පු-කුළුතාලම.

**සම්මත්ත.** ති-මත්වූ, උම්මත්ත, අතිශය ප්‍රීතියටපත්.

**සම්මති.** ඉ-ලොකසම්මතය, ලොකව්‍යවහාරය.

**සම්මද.** පු-සන්තොෂය, සතුට.

**සම්මන්නන.** න-සම්මතකිරීම, ව්‍යවස්ථාකිරීම.

**සම්මප්පධාන.** න-ප්‍රධාන වීර්‍ය්‍යය, චතුරඞ්ග වීර්‍ය්‍යය.

**සම්මසන.** න-සපත්කිරීම, සම්මර්ශනය, සිහි-කිරීම.

**සම්මසති.** ක්‍රි-සම්මර්ශනය කරයි, සිහිකරයි.

**සම්මසිත.** පු-සම්මර්ශනය කළ, ආවර්ජනය කළ.

**සම්මා.** අ-ප්‍රසංශායෙහි, මනාකොට.

**සම්මා.** ඉ-වියදණ්ඩ අග ගසන පෙත්ත.

**සම්මාකම්මන්ත.** පු-මනාකර්මාන්ත, නිරවද්‍ය කර්මය.

**සම්මාදිට්ඨි.** ඉ-සම්‍යග් දෘෂ්ටිය, නිවරදි දැක්ම.

**සම්මාඤාණ.** න-සම්‍යග් ඥනය, නිවරදි දැක්ම.

**සම්මාදස්සන.** න-මනා දැක්ම, හරි දැක්ම.

**සම්මාපණිධි.** ඉ-සම්‍යග් ප්‍රණිධිය.

**සම්මාපධාන.** න-සම්‍යග් වීර්‍ය්‍යය.

**සම්මාපාස.** පු-එනම් යාගය.

**සම්මාවාචා.** ඉ-සම්‍යග් වචනය, යහපත් වචනය.

**සම්මා වායාම.** පු-ප්‍රධන් වීර්‍ය්‍යය, චතුර්විධ වීර්‍ය්‍යය, සම්‍යග්වීර්‍ය්‍යය.

**සම්මාවිමුත්ති.** ඉ-සම්‍යග් විමුක්තිය.

**සම්මාසමාධි.** ඉ-සම්‍යග් සමාධිය.

**සම්මාසංකප්ප.** පු-සම්‍යග් සංකල්පනාව.

(22502)

**සම්මාසති.** ඉ-සම්‍යග් ස්මෘතිය.

**සම්මාසම්බුද්ධ.** පු-සම්මා සම්බුදුරජ.

**සම්මාසම්බෝධි.** ඉ - මනාකොට තෙමේම බෝධිය ලත් තැනැත්තා, සම්බුදුරජ.

**සම්මිජ්ජන.** න-අතපය ආදිය හකුළුවකිරීම.

**සම්මිඤ්ජිත.** ති-හකුළුවූකළ, හකුළුවන ලද.

**සම්මිලාත.** පු-මලානික වන ලද.

**සම්මිස්සතා.** ඉ-මිශ්‍රභාවය.

**සම්මුඛ.** පු-අභිමුඛය, මුහුණ ඉදිරිපිට.

**සම්මුඛීභාව.** පු-සම්මුඛවීම, මුහුණට මුහුණ එල්ලවීම.

**සම්මුච්ඡිත.** ති-මූර්ඡා වනලද, මුලාවනලද.

**සම්මුජ්ජනී.** ඉ-මුසුන, මුස්න.

**සම්මුට්ඨ.** ති-මුලාවනලද.

**සම්මුති.** ඉ-අනුදැනීම, ව්‍යවහාරය.

**සම්මුතිදේව.** පු-දෙවියෙක් යයි සම්මතකරගත් තැනැත්තා, නරදෙවියා, රජු.

**සම්මුදිත.** ති-ප්‍රමුදිත වන ලද, අතිශයින් පිනවන ලද.

**සම්මුය්හති.** ක්‍රි-(d. භූ. මුහ, වෛචිත්‍යෙ, මුලාවෙහි+ති) මුලාවෙයි.

**සම්මුය්හන.** න-මුලාවීම, මුලාව.

**සම්මුසා.** පු-ක්‍රි. කැමතිව, සතුටුව.

**සම්මූළ්හ.** පු-මුලාව.

**සම්මෝද.** පු-සතුට.

**සම්මෝදන.** න-සතුටුවීම.

**සම්මෝහ.** පු-සම්මෝහය, මුලාව.

**සම්මෝදනීය.** පු-සතුටුවිය යුතු.

**සම්මෝදිත.** ති-සතුටුවන ලද.

**සම්මෝස.** න-මුලාවීම, මංමුලාවීම.

**සම්මෝහ.** පු-මුලාවීම, රැවටීම.

**සම.** d. චු-දස්සනෙ, බැලීමෙහි, සාමෙති, සාමයති, බලයි.

**සම.** d. භූ-ඔලොකනෙ, බැලීමෙහි, සමති, බලයි.

**සම.** d. චු-විතක්කෙ, විතර්කයෙහි, සමෙති, සමයති විතර්කකරයි, තර්කනය කරයි.

**සම.** ති-සදෘශ, සමාන.

**සම.** පු-සන්සිඳීම, ශ්‍රමය, වෙහෙස.

**සම.** අ-සහාර්ථයෙහි, සමානයෙහි.

**සමග්ග.** ති-සමගි, සියලු.

**සමඞ්ගා.** ඉ-වැල්මදට.

**සමඞ්ගී.** යුක්ත, යෙදුන, ගැවසීගත්, සමඞ්ගිතා

**සමජ්ජ.** න-නෘත්‍යය, නැටීම.

**සමචරිය.** පු-සමවූ පැවැත්ම.

**සමචාරී.** ති-සමව හැසිරෙන්නා.

**සමචිත්ත.** න-සමාන සිත් ඇත්තා.

**සමජාතික.** පු-සමාන ජාති ඇත්තා.

**සමජ්ජා.** ඉ-පිරිස.

**සමජ්ජාභිචරණ.** න-නෘත්‍ය කිරීමෙහි හැසිරීම.

**සමඤ්ඤා.** ඉ-නම, සංඥාව, ප්‍රඥප්තිනාමය

**සමඤ්ඤාත.** ති-ප්‍රකට, ප්‍රසිද්ධ.

**සමණ.** පු-ශ්‍රමණයා, භික්ෂුව, සන්සිඳවනලද කෙලෙස් ඇත්තා, සන්නාසියා.

**සමණක.** පු-ශ්‍රමණ ආකාර ඇත්තා.

**සමණකුත්තක.** පු-ශ්‍රමණ වෙශ ඇත්තා, ශ්‍රමණකයා.

**සමණින්ද.** පු-ශ්‍රමණේන්ද්‍රයා, බුදුරජ.

**සමණිස්සර.** පු-මුනිරජ, බුදුරජ.

**සමණුද්දෙස.** පු-ශ්‍රමණපුත්‍රයා, සාමණේරනැත හෙරණ.

**සමතල.** න-සමතලාව, සමබිම.

**සමතික්කම.** පු-ඉක්මවීම, ඉවත්වයාම.

**සමතිත්තික.** පු-මුවවිට දක්වා දිය පිරුණු.

**සමතිත්ථ.** න-සමානතීර්ථ.

**සමතිමඤ්ඤති.** ක්‍රි-(d. භූ. මන, ඤාණෙ, අවබොධයෙහි+ති) (සං+අති+මඤ්ඤ+ති) ඉක්මවා හඟියි.

**සමතිවිජ්ඣති.** ක්‍රි-(d. දි. විධ, තාළනෙ, තැලීමෙහි+ති) විනිවිද යාමට විදියි.

**සමතිවිජ්ඣන.** න-විනිවිදයාම, පසාවීමට විදීම.

**සමතිවත්තති.** ක්‍රි-(d. භූ. වතු, වත්තනෙ, පැවත්මෙහි+ති) විනිවිද පවතියි

(22560)

**සමත්තිවිජ්ඣන**. න-විනිවිදයාම, පසාකරගණ විදයාම.

**සමත්ත**. ති-නිෂ්ඨාප්‍රාප්ත, නිමාවට පැමිණි, සකල, සියලු, හාත්පස.

**සමත්ථ**. ති-සමර්ථ, යෝග්‍ය, පොහොසත්, සඞ්ගත.

**සමත්ථිත**. ති-සමර්ථවනලද, යෝග්‍යවනලද,

**සමත්ථිය**. ති-පොහොසත්, හැකි

**සමථ**. පු-සමාධිය, සන්සිදීම.

**සමථයාන**. න-ධ්‍යාන මාර්ගාදිය උපදවමින් නිවණ් යන.

**සමථයානික**. පු-ධ්‍යාන මාර්ගාදිය උපදවමින් නිවණ්යන්නා.

**සමභිගච්ඡති**. ක්‍රි-(d. භූ. ගමු, ගතියං යැමෙහි + ති) ලබයි, පැමිණෙයි.

**සමභිගත**. ති-ලබනලද, පැමිණෙන ලද.

**සමභිගණ්හාති**. ක්‍රි-(d. භූ ගහ, උපාදානෙ ගැණීමෙහි + ති) ගණීයි.

**සමන**. පු-යමයා, යමරජ.

**සමනන්තර**. අනතුරු, ඊට ඉක්බිති, ඊළඟ

**සමනුපස්සති**. ක්‍රි-(d. භූ. දිස, පෙක්ඛණෙ, බැලීමෙහි + ති) බලයි, දකියි.

**සමනුපස්සන**. න-දැකීම, මනා දර්ශනය.

**සමනුග්ගාහති**. ක්‍රි-(d. භූ. ගහ, උපාදානෙ, ගැණීමෙහි + ති) ගණීයි.

**සමනුග්ගාහණ**. න-ගැණීම.

**සමනුභාසති**. ක්‍රි-(d. භූ. භූස, භාසනෙ, කීමෙහි + ති) කරුණු දක්වා කියයි.

**සමනුභාසන**. න කීම, කරුණු දක්වා කීම.

**සමනුඤ්ඤ** න-අනුමැතිය.

**සමනුඤ්ඤාත**. ති-අනු දත්නාලද,

**සමනුයුඤ්ජති**. ක්‍රි-(d දි, යුජ, යොගෙ, යෙදීමෙහි + ති) යොදයි.

**සමනුයුඤ්ජන**. න-යෙදීම.

**සමනුයුඤ්ජිත** ති-යොදන ලද.

**සමනුමඤ්ඤති**. ක්‍රි-(d. දි, මන, ඤාණෙ, අවබොධයෙහි + ති) අනු දනියි.

**සමනුමොදති**. ක්‍රි-(d. භූ. මුද, මොදනෙ, සතුටුවීමෙහි + ති) අනුමෝදන්වෙයි.

**සමන්ත**. ති-හාත්පස.

**සමන්තචක්ඛු**. පු-සමතැස් ඇත්තා, බුදුරජ.

**සමන්තදුග්ධා**. ඉ-සීනුක් ගස.

**සමන්තතො**. අ-හාත්පසින්, වටේට.

**සමන්තභද්ද**. පු-සමන්තභද්‍ර, බුදුරජ.

**සමන්තපාසාදී**. පු-හාත්පසින් පහදවන්නා, සියල්ල පහද වන්නා.

**සමන්තා**. අ-හාත්පස, ඒකාංසය.

**සමන්නාගත**. ති-යුක්ත, යෙදුනු.

**සමන්නාහත**. ති-හාත්පසින් තසන ලද.

**සමන්නානෙති**. ක්‍රි-(d. භූ. නී. නයෙ, පැමිණ වීමෙහි + ණෙ + ති) පමුණුවයි.

**සමන්නාහරති**. ක්‍රි-(සමං + අනු + ආහරති,) කල්පනාකරයි,

**සමන්නාහාර**. න-යොමුකිරීම, එක්තැන් කිරීම

**සමන්නෙසති**. ක්‍රි-(d. භූ. එස, එසනෙ, සෙවීමෙහි + ණෙ + ති) මනාව පරීක්ෂාකර බලයි.

**සමන්නෙසන**. න-ගවෙසනය, සෙවීම.

**සමන්වෙසති**. ක්‍රි-(d. භූ. එස, එසනෙ, සෙවීමෙහි + ණෙ + ති) (සම් + අනු + එසති) සොයයි, මනාව බලයි.

**සමන්වෙසන**. න-මනාව බැලීම, සම්‍යග් දර්ශනය

**සමප්පිත**. ති-සන්තර්පණය කළ, සැතැපවූ.

**සමප්පන** න-සන්තර්පණය, තෘප්තියට පැමිණ වීම

**සමප්පෙත**. ති-අතටදුන්, බාරදුන්.

**සමපෙක්ඛන**. න-බැලීම, නිරීක්ෂණය.

**සමබ්භාහත**. ති-ගැසූ, පහරදුන්.

**සමභිජානන**. න-කල්පනා කිරීම, සිතාබැලීම දැනීම.

**සමය**. පු-සාමාග්‍රිය, රාශිය, හෙතුව, ක්ෂය, අවබොධය, කාලය, ප්‍රහාණිය, ලාභය, ලබ්ධිය

**සමර**. න-යුද්ධය.

**සමරියාද**. ති-සම්පය.

**සමවයස්ස**. පු-සමාන වයස් ඇත්තා.

(22613)

**සමල**. ති-ගූථය, අසුචි බැහැර කරණ පණාලිය

**සමලඞ්කරොති**. ක්‍රි-(d. භූ. කර කරණෙ, කිරීමෙහි + ති) අලංකාර කරයි.

**සමවයසඨෙසන**. න-ආශාව අත්හැර දැමීම,

**සමවට්ඨිත**. ති-ලැස්තිවූ,

**සමවත්තක්ඛන්ධ** පු-රවුම් උරහිස් ඇත්තා, බුදුරජ.

**සමවධාන**. න-එකගවීම, එකමුතුවීම,

**සමවසරති**. ක්‍රි-d. භූ. සර, ගතියං, යැමෙහි, එක්වෙයි.

**සමවාය**. පු-සමූහය, සමය.

**සමවාහිත**. ති-එක්වූ.

**සමවාපක**. න-ගබඩා කාමරය.

**සමවෙක්ඛති**. ක්‍රි-(d. භූ. වක්ඛ සංවරෙ, සංවරයෙහි + ති) පරීක්ෂාකර බලයි.

**සමවෙපාක**. න-මනාව පැසීම.

**සමවිහය**. පු-නාමය.

**සමස්සසති**. ක්‍රි-(d. භූ. සස, පාණනෙ, ජීවත් වීමෙහි + ති) ප්‍රාණවත් වෙයි. අලුත්වෙයි.

**සමස්සාස**. න-ප්‍රාණවත් කිරීම, අළුත් කිරීම

**සමස්සිත**. ති-ඉදිරියට ඇලවූනු.

**සමසිප්පි**. පු-සමාන සිල්පීහු.

**සමා**. ඉ-හවුරුද්ද.

**සමාකිණ්ණ**. ති-සමාකීර්ණ, ගැවසීගත්.

**සමාකුල**. අතිශයින් ආකුල.

**සමාගච්ඡති**. ක්‍රි-(d. භූ. ගමු, ගතියං, යැමෙහි + ති) රැස්වෙයි,

**සමාගත**. පු-පැමිණි, සම්ප්‍රාප්ත.

**සමාචරති**. ක්‍රි-(d. භූ. චර. චරණෙ, හැසිරීමෙහි + ති) හැසිරෙයි.

**සමාචාර**. පු-හැසිරීම.

**සමාගත**. ති-රැස්වූ, පැමිණි,

**සමාගම**. පු-සඞ්ගමය, සමිතිය, එක්රැස්වීම.

**සමාතප**. න-උත්සාහවත්කම, ධෛර්‍යයීමත් භාවය.

**සමාදපක**. පු-සමාදන් කරවන්නා.

**සමාදපන**. න-සමාදන්කරවීම.

**සමාදපෙති**. ක්‍රි-(d. භූ. දප, මොහනෙසු, මොහනයෙහි + ණෙ + ති) සමාදන් කරවයි.

**සමාදන**. න-සමාදන් කරවීම, ගැණීම.

**සමාදහති**. ක්‍රි-(d. භූ, දහ, ධාරණෙ, දැරීමෙහි + ති) එක් තැන්කරයි, දවයි.

**සමාදහන**. න-දැවීම, රැස්කිරීම.

**සමාදාන**. න-ගැණීම, සමාදන්වීම.

**සමාදානවිරති**. ඉ-ශික්ෂාපද සමාදානයන් අකුශලයෙන් වෙන්වීම.

**සමාදින්න**. ති-ගත්තා ලද, ග්‍රහණයකළ.

**සමාදියති**. ක්‍රි-(d. භූ. දාන, දීමෙහි + ති) සමාදන් වෙයි.

**සමාධාන**. න-එකට තැබීම, සවිකිරීම.

**සමාධි**. ඉ-සමාධිය, සිතඑක්තැන් කිරීම.

**සමාධින්ද්‍රිය**. න-සමාධි නැමැති ඉන්ද්‍රිය.

**සමාධිපරික්ඛන්ධ**. පු-සමාධි ස්කන්ධය.

**සමාධිපරික්ඛාර**. න-සමාධිය ලබා ගැණීමට උවමනා ප්‍රත්‍යය.

**සමාධිබල**. න-සමාධි නැමැති බලය.

**සමාධිභාවනා**. ඉ-සමාධි භාවනාව.

**සමාධිසම්බොජ්ඣඞ්ග**. පු-සමාධිසම්බොජ්ඣඞ්ගය

**සමාධික**. ති-බහුල, බොහෝ.

**සමාධියති**. ක්‍රි-(d. භූ. ධා, ධාරණෙ, දැරීමෙහි + ති) සමාධියට සමවදියි.

**සමාන**. න-අභින්නාර්ථය, සදෘශ, විද්‍යමානදෙය

**සමානත්ත**. න-සමානත්වය, සමානබව,

**සමානත්තතා**. ඉ-සමානාත්මභාවය, තමා හා සමානව සැලකීම් බව.

**සමානිය**. ති-සමානව, සමලෙස.

**සමානීත**. ති-ගෙණ ආ, ගෙණ එන ලද, බේරණ ලද.

**සමාපන**. න-පරිසමාප්තිය, අවසානය.

**සමානවස්සික**. පු-සමානවස් ඇත්තා.

**සමානවාස**. පු-සදෘශවාසය, එකගවාසය.

**සමානසංවාසක**. පු-ශික්ෂාලබ්ධි ආදියෙන් සමාන පැවතුම් ඇත්තා.

(22669)

**සමානසීමා**. ඉ-සමාන සීමාව, එකම සීමාවට අයිති.

**සමාපත්ති**. ඉ-අෂ්ටසමාපත්තිය, පැමිණීම.

**සමාපටිපත්ති**. ඉ-සමාන වූ ප්‍රතිපත්තිය.

**සමාපජ්ජිත**. ති-සමවදනා ලද, ඇතුළත් වන ලද.

**සමාපත්තිභාවනා**. ඉ-අෂ්ටසමාපත්ති ලාභය පිණිස කරණ භාවනාව.

**සමාපත්තිකුසලතා**. ඉ-සමාපත්තියෙහි දක්ෂ බව.

**සමාපජ්ජන**. න-සමවැදීම, ඇතුළත් වීම.

**සමාපන්න**. පු-පැමිණි, අවත් ප්‍රාප්ත.

**සමාස**. පු-සංක්ෂෙපය, සමාස විධිය.

**සමායාති**. ක්‍රි-(d. භූ, යා ගතියං ගමන්හි + ති) එකට එක් වෙයි.

**සමායුත**. ති-සංයුක්ත, එකමුතු,

**සමායොග**. පු-සම්‍යයොගය, මනාව යෙදීම.

**සමාරක්ඛ**. න-අඬංගු කිරීම.

**සමාරද්ධ**. ති-ආරම්භ කළ, ඇරඹූ.

**සමාරම්භ**. න-ආරම්භ කිරීම, ඇරඹීම.

**සමාරභති**. ක්‍රි-(d. භූ. රභ, රාභස්සෙ උත්සාහයෙහි + ති) පටන් ගනියි.

**සමාරූහන**. න-නැගීම.

**සමාරූළ්හ**. ති-නැගුනු, ඇතුල් වුනු.

**සමාරොචන**. න-සුදුසු ලෙස ආරෝචනය කිරීම.

**සමාරොපන**. න-නැගීම, නෙත්ති ප්‍රකරණයෙහි එන හාරයන් ගෙන් එකක්.

**සමාලපති**. ක්‍රි-(d. භූ. ලප, ආලාපෙ කථා වෙහි + ති) කථා කරයි.

**සමාලපන**. න-කථා කිරීම, බිණීම.

**සමාලපිත**. පු-කියනල ලද, ප්‍රකාශිත.

**සමාසන්න**. ආසන්න කාරණය, කිට්ටු, සමීප, ළඟ.

**සමාසාදෙති**. ක්‍රි-(-d. භූ. සාද සාදනෙ, රස විඳීමෙහි + ණෙ + ති) ලබා ගනියි.

**සමාසෙවන**. න-සෙවනය, ආශ්‍රය.

**සමාහත**. ති-ගසන ලද, පහර දෙන ලද.

**සමාහරණ**. න-රැස්කිරීම.

**සමාහිත**. ති-එකඟවන ලද, සංසිඳුවන ලද

**සමාහිතත්ත**. න-එකඟ බව, සංසිඳවන බව

**සමාහාර**. පු-පිඬු කිරීම, රැස් කිරීම, සමුච්චය

**සමිජ්ඣති**. ක්‍රි-(d. භූ. ඉධ, සිඬියං සිදු වීමෙහි + ති) සමෘඬ වෙයි, සිදුවෙයි.

**සමිජ්ඣන**. න-සමෘඬවීම, සම්පූර්ණවීම, සිදු වීම.

**සමිජ්ඣිට්ඨ**. ති-ආඥා කළ, අයදුම් කළ.

**සමිජ්ඣිත**. ති-සිදුවන ලද, සමෘඬවන ලද.

**සමිත**. ති-සංසිඳුවන ලද.

**සමිතාවී**. පු-කෙලෙසුන් සන්සිඳුවන ලද තැනැත්තා, චතුරාර්‍ය්‍ය සත්‍ය ධර්‍මයන් අව බොධ කළ තැනැත්තා.

**සමිති**. ඉ-සමූහය, සඞ්ගමය.

**සමිධා**. ඉ-දර.

**සමිද්ධ**. ති-සමෘඬ, කායික සිඬියට පැමිණි.

**සමිද්ධික**. පු-සමෘඬිමත් තැනැත්තා, පොහොසතා.

**සමිහිත**. ති-රැස්කළ, රචිත.

**සමී**. ඉ-සැම ගස,

**සමීචි**. ඉ-හරි, පරිපාටිය, අනුක්‍රමය.

**සමීප**. ති-සමීපය, ළඟ.

**සමීපග**. ති-ළඟ තිබෙන, ළඟ ඇති.

**සමීපචාරී**. පු-සමීපයෙහි හැසිරෙන්නා.

**සමීපට්ඨ**. පු-සමීපස්ථ, ළඟ පිහිටි.

**සමීර**. න-සුළඟ, වාතය.

**සමීරණ**. පු-සුළඟ, වාතය, මුරුවා.

**සමීරති**. ක්‍රි-(d. භූ. ඊර, කම්පනෙ කම්පන යෙහි + ති) කම්පනය වෙයි, සෙලවෙයි.

**සමීරිත**. ති-සැලුනු, සෙලවුනු.

**සමීහිත**. පු-බලවත් උත්සාහය, ව්‍යාපාරය.

**සමු**. d. භූ-හක්ඛණෙ, කෑමෙහි, සමති කයි.

**සමු**. d. දි-සානෙත, සංසඳීමෙහි, බැගෑපත් වීමෙහි, සමමති, උපසමමති, සන්සිඳෙයි.

(22784)

**සමු.** d. චු. ලාලනෙ දසසනෙව. නැලවීමෙහි දැකීමෙහි.

**සමුක්කංසති.** ක්‍රි-(d. භූ. කස, ගතියං, යෑමෙහි+ති) සතුති කරයි.

**සමුක්කට්ඨ.** ති-උත්කෘෂ්ට, උච්ච, උසස්.

**සමුක්කංචන.** න-උසස් කොට කථා කිරීම,

**සමුග්ග.** පු-කරඬුව, පෑස.

**සමුග්ගණ්හාති.** ක්‍රි-(d. භූ. ගහ, උපාදානෙ, අල්වාගැනීමෙහි+ති) අල්වා ගනියි.

**සමුග්ගත.** ති-නැගුණු, හටගත්.

**සමුග්ගම.** ති-උපන්න, උදාවුනු.

**සමුග්ගහිත.** ති-අල්වාගත්.

**සමුග්ගිරති.** ක්‍රි-(d. භූ. ගිර, නිගිරණෙ, වැගිරීමෙහි+ති) විසි කරයි.

**සමුග්ගිරණ.** න-විසි කිරීම, බැහැර කිරීම.

**සමුග්ඝාටන.** න-වැසුම් හැරීම, පියන් පත හැරීම.

**සමුග්ඝාත.** පු-මුලින්ම උදුරා දැමීම, විනාශ කිරීම.

**සමුග්ඝාතික.** පු-අස්කර දැමීම, විනාශ කිරීම.

**සමුක්ඛේපන.** න-හාත්පසින් උසස් කොට කල්පනා කිරීම, හාත් පසින් උක්ෂෙපණය කිරීම.

**සමුච්චය.** පු-පිඬුකිරීම, රාශිකරණය.

**සමුච්ඡක.** න-ඇඹිදීම, ඇඹිලීම.

**සමුච්ඡති.** ක්‍රි-(d. භූ. උච, සද්දෙ, ශබ්දකිරීමෙහි+ති) උපදියි.

**සමුච්ඡිත.** ති-ඉපදුන, මතුවුනු, නැගුනු.

**සමුච්ඡේද.** පු-මූලොච්ඡේදනය, මුලිනිදිරීම.

**සමුච්ඡේදප්පහාණ.** න-මුල්සිඳ නැසීම, මාර්ගී පටිපාටියෙන් කෙලෙසුන් නැසීම.

**සමුච්ඡේදවිමුත්ති.** ඉ-අර්හත් ඵල විමුක්තිය.

**සමුච්ඡේදමරණ.** න-නැවත උත්පත්තියක් නැති මරණය, රහතුන් වහන්සේලාගේ මරණය.

**සමුච්ඡේද විසුද්ධි.** ඉ-ඒ ඒ මාර්ගයන්ගෙන් නැසිය යුතු කෙලෙසුන් නසා පිරිසිදු බවට පැමිණීම.

**සමුච්ඡින්දති.** ක්‍රි-(d. රු. ඡිදි, ද්විධා කරණෙ, දෙපලු කිරීමෙහි+ති) සිඳියි.

**සමුච්ඡින්න.** පු-සමුච්ඡේද කළ, උපුත් මුල් කළ.

**සමුචිත.** පු-රැස්කළ, තැන්පත් කළ.

**සමුජ්ඣිත.** ති-හරණ ලද, බැහැර කරණ ලද

**සමුට්ඨහති.** ක්‍රි-(d. භූ. ඨා ගතිනිවුත්තියං, ගති පැවැත්මෙහි+ති) හටගණී, නගී, උපදී.

**සමුට්ඨාන.** න-නැගීම, හට ගැණීම.

**සමුට්ඨානික.** පු-පහළවීම, ඇති කිරීම.

**සමුට්ඨාපක.** පු-හේතුවීම, අවසථා ඇතිවීම.

**සමුට්ඨිත.** ති-ඇතිවීම, පැවතීම, පහළවීම.

**සමුජ්ජල.** ති-දීප්තිමත්, බබලන.

**සමුජ්ජු.** ති-සෘජු, සම්පූර්ණ.

**සමුස්සුක.** ති-රැස්කළ, තැන්පත් කළ.

**සමුත්තරණ.** න-එතෙර වීම, එතෙරට යෑම

**සමුත්තෙජන.** න-තියුණු කිරීම, මුවහත් කිරීම.

**සමුත්තෙජෙති.** ක්‍රි-(d. භූ. තෙජ, නිසානෙ තියුණු කිරීමෙහි+ති) තියුණු කරයි.

**සමුද්ද.** පු-සමුද්‍රය, සාගරය, මුහුද.

**සමුද්දක්ඛායික.** පු-සාගර ඇතිවීම පිළිබඳ කථාව. ලොකොත්පත්තිය.

**සමුද්දනන.** ඉ-කපුගස, සමුදානන.

**සමුද්දවීචි.** ඉ-මුහුදු රළ.

**සමුදය.** පු-උත්පත්තිය, හෙතුව, රාශිය.

**සමුදයසච්ච.** න-දුක් හටගැණීමේ හේතුව පිළිබඳ සත්‍යය, තෘෂ්ණාව.

**සමුදාගම.** න-පටන් ගැන්ම, ආරම්භය.

**සමුදාය.** පු-සමූහය, ගණන.

**සමුදාගච්ඡති.** ක්‍රි-(d. භූ. ගමු ගතියං, යෑමෙහි+ති) ලබා ගනියි.

**සමුදාගත.** ති-පහළවුනු, ලැබුනු.

**සමුදාචරණ.** න-හැසිරීම, පැවැත්ම.

**සමුදාචරති.** ක්‍රි-(d. භූ. චර, චරණෙ, හැසිරීමෙහි+ති) හැසිරෙයි.

(22775)

**සමුදාචාර**. පු-හැසිරීම, පුරුද්ද, භාවිතය.

**සමුදාචිණ්ණ**. ති-පුරුදු කළ, පුහුණු කළ.

**සමුදානීත**. ති-එකතු කළ, ලබාගත්.

**සමුදාවත**. ති-වලක්වන ලද.

**සමුදාහාර**. පු-කථාව, කථා ව්‍යවහාරය.

**සමුදික්ඛති**. ක්‍රි (d. භූ දික්ඛ, උපනයනෙ, එලවීමෙහි + ති) බලයි.

**සමුදිත**. ති-උදාවූනු, මතුවූනු, උතන්දුවූනු, එකාබද්ධවූනු.

**සමුදීරණ**. න-සෙලවීම, ගමනෙහි යෙදීම.

**සමුදීරිත**. ති-තෙපළූ, දෙඩූ, උච්චාරණය කළ.

**සමුදෙති**. ක්‍රි-(d. භූ. උද, පාතුභාවෙ, පහළ වීමෙහි + ණෙ + ති) පහළවෙයි.

**සමුද්ධරති**. ක්‍රි-(d. භූ. ධර, ධාරණෙ. දැරීමෙහි + ති) දරයි, ගෙණයයි.

**සමුද්ධරණ**. න-දැරීම, ගෙණ යෑම, ගසාගෙණ යෑම.

**සමුන්නහන**. න-නැසීම, ආදශීතය.

**සමුන්නමන**. නැගීම, ඇලවීම, උන්නතිය.

**සමුන්නද්ධ**. පු-නගන ලද ධජාදිය.

**සමුපගච්ඡති**. ක්‍රි-d. ගමු + ගතියං යෑමෙහි + ති, යෙයි.

**සමුපසොභති**. ක්‍රි-(d. භූ. සං + උප + සුභ, දිත්තියං, දීප්තියෙහි + ති) අලංකාර වෙයි.

**සමුපසොභන**. න-අලංකාරය, සොභනය.

**සමුපාගත**. ති-පැමිණි, ලගාවූනු.

**සමුපාදික**. පු-නිශ්චල, ශාන්ත.

**සමුප්පජ්ජති**. ක්‍රි-(d. භූ. සං + උ + පද, ගතියං, යෑමෙහි + ති) නගියි, උපදියි.

**සමුප්පජ්ජන**. න-ඉපදීම, ඇතිවීම, නැගීම.

**සමුප්පත්ති**. ඉ-ඉපැත්ම, උත්පත්තිය.

**සමුප්පන්න**. පු-උපන්, හටගත්.

**සමුප්පාද**. පු-හටගැන්ම, ඇතිවීම,

**සමුප්පාටන**. න-මූලොද්ධරණය, ඉදිරීම.

**සමුප්පාටිත**. ති-උද්ධරණයකළ, උදුරණ ලද.

**සමුපෙක්ඛා**. ඉ-ප්‍රඥාව, පැණ.

**සමුබ්බහති** ක්‍රි (d. භූ. සං + උ + වහ, පාපුණන, පැමිණවීමෙහි + ති), ගෙණයයි, උසුලයි.

**සමුබ්භූත**. පු-ඇතිවූ, පහළවූ.

**සමුල්ලපන**. න-කථාකිරීම, සල්ලාපය, කථාව.

**සමුල්ලපති**. ක්‍රි-(d. භූ. සං + උ + ලප, ලපනෙ, කීමෙහි + ති) කියයි, කථාකරයි.

**සමුල්ලාප**. පු-සමගි කථාව, සල්ලාපය.

**සමුස්සය**. පු-රාශිය, ශරීරය.

**සමුස්සාපිත**. ති-ඔසවනලද, උස්සනලද.

**සමුස්සාහිත**. පු-ගොමුකළ, එසවූ.

**සමුස්සිත**. ති-ඔසවන ලද, උස්කරණලද.

**සමුස්සුත**. ති-එසවූ, උස්කළ.

**සමූපබ්බූළ්හ**. පු-සම්පිණ්ඩිත, රාශීභූත, රැස් කළ.

**සමූලක**. පු-මුල් සහිත, කරුණු සහිත.

**සමූහ**. පු-සමූහය, රාශිය, සඞ්ඝයා, රැස.

**සමූහත**. ති-නසනලද, උදුරණලද.

**සමූහනන**. න-ඉදිරීම, හාත්පසින් නැසීම.

**සමූහෙති**. ක්‍රි-(d. භූ. හා, ගතියං, යෑමෙහි + ණෙ + ති) එකතු කරයි, රැස් කරයි.

**සමෙක්ඛති**. ක්‍රි-(d. චු. කමු, ඉච්ඡායං, කැමැති වීමෙහි + ති) බලයි, කල්පනා කරයි.

**සමෙච්ච**. අ-දැන, අවබොධ කොට.

**සමෙති**. ක්‍රි-(d. භූ. සමු, උපසමෙ, සංසිඳීමෙහි + ණෙ + ති) රැස් වෙයි, එක්වෙයි.

**සමෙරිත**. ති-වංචලවූ, සෙලවුනු.

**සමොකිණ්ණ**. ති-ගැවසුනු, ආශ්‍රිත.

**සමොකිරණ**. න-ගැවසීම.

**සමොතත**. ති-විසුරුවනලද, පතුරුවනලද.

**සමොතරති**. ක්‍රි-(d. භූ. තර, තරණෙ, එතර වීමෙහි + ති) බසියි, පහත් වෙයි.

**සමොදහති**. ක්‍රි-(d. භූ. දහ, ධාරණෙ, දැරීමෙහි + ති) එකතු කරයි, සපයයි.

**සමොදහන**. න-එකතු කිරීම, රැස් කිරීම.

**සමොධාන**. න-එකතු කිරීම, රැස් කිරීම, සම්බන්ධ කිරීම.

**සමෝධානපරිවාස.** පු-ශාසනික පිළිවෙතක්, පිරිවෙස් පිරිමාදියෙහිදී අනුගමනය කළයුතු පිළිවෙතක්,.

**සමෝධාන.** න-සංස්ථානය, වින්‍යාසය, පිළිවෙළට තැබීම.

**සමෝධානතා.** ඉ-එක්වීම, සංයෝගවීම, සම්බන්ධවීම, රාශිභූත වීම.

**සමෝරොධ.** පු-අවහිරය, බාධාව.

**සමෝසරණ.** න-එකරැස්වීම, එකරාශිවීම.

**සමෝසරති.** ක්‍රි-(d. භූ. සර, චින්තායං, සිතීමෙහි + ති) රැස්වෙයි, එක්කාසුවෙයි.

**සමෝහිත.** පු-මනාකොට පිහිටුවන ලද, යහපත්ව තැබූ

**සයං.** අ-තමා විසින්, තමාගේ යනාර්ථයෙහි.

**සයංකත.** පු-තමාම කළ.

**සයංජාත.** පු-තමාම හෝ ඉබේ හටගත්, ස්වයංජාත.

**සයංපභා.** ඉ-තමාගේම ප්‍රභාව, දේව වර්ගයක්.

**සයංවර.** පු-කාන්තාවක් තමන් විසින්ම තමාගේ හිමියා සොයාගැණීම.

**සයංවසී** පු-තමාට වසඟවූ, නිදහස්.

**සයංසිද්ධ.** පු-ඉබේම සිදුවූ.

**සය.** පු-අත; හස්තය.

**සයථාපි.** අ-යම්සේ, සෙය්‍යථාපි.

**සයති.** ක්‍රි-(d. භූ. සි, සයෙ, නිදාගැණීමෙහි + ති) සයනය කරයි.

**සයණ්ඩු.** පු-ඉදිබුවා, සොළය.

**සයනං.** න-යහන, සැතපෙන ස්ථානය, මඤ්චාදිය.

**සයනිගහ.** න-ලගින ගෙය, නිදන ඔවරකය සයනිඝර.

**සයනිඝර.** න-සැතපෙන ගෙය, නිදනඔවරකය.

**සයම්භූ.** පු-බුදුරජ, බ්‍රහ්මයා.

**සයංවරා.** ඉ-ස්වෙච්ඡාවෙන් වල්ලභයන් සොයන්නී.

**සයාන.** පු-නිදන, නිද්‍රාවට පැමිණි.

**සයාපිත.** ති-නිදිකරවනලද, නිදිකළ.

**සයිත.** ති-සයනය කළ, නිදාගත්.

**සර.** d. භූ-ගමනෙ, යාමෙහි, සරති, යෙයි, සංසරති, සංසාරො.

**සර.** d. භූ-සද්දෙ නාපෙච, ශබ්දයෙහි නැවීමෙහි, සරති, ශබ්දකරයි, නැවෙයි.

**සර.** d. භූ-අනුස්සරණෙ, සිහිකිරීමෙහි, සරති, අනුස්සරති, සිහිකරයි, සිතයි.

**සර.** d. චු-ආකෙඛපෙ, ආක්ෂෙපයෙහි, සරෙති, සරයති, අක්ෂෙපය කරයි.

**සර.** පු-අා ආදී ස්වරාක්ෂර, නාදය, සැරය, වෙගය, බිහිබට.

**සර.** පු. න-විල, තඩාගය.

**සරක.** පු-රාබොන ඔඩම, රාබොන බඳුන.

**සරකුත්ති.** ඉ-ස්වරභෙදය, වචන ශබ්දකිරීමේ ලීලාව, ගීත භාෂණය.

**සරබ.** පු-බොහොඩා, කටුස්සා.

**සරණ.** න-නිවණ, හිංසාව, ගෘහය, රක්ෂා කරන්නා, රක්ෂණය, පිහිට, සිහිකිරීම.

**සරණාගමන.** න-තිසරණයට පැමිණීම, සරණ ගැණීම.

**සරණීය.** පු-සිහිකටයුතු, කල්පනාකටයුතු.

**සරතුණ්ඩ.** පු-ඊතලයක් මෙන් තියුණුවූ හොට

**සරදණ්ඩ.** පු-ඊදණ්ඩ, ඊ මිට,

**සරභඞ්ග.** පු-ස්වර භෙදය,

**සරති.** ක්‍රි-(d. භූ. සර, සරණේ, සිහිකිරීමෙහි + ති) සිහිකරයි.

**සරද.** පු-හවුරුද්ද, සංවත්සරය, සරත් සෘතුව

**සරදසමය.** පු-සරත් කාලය.

**සරජ.** ති-දූලි සහිත, දූවිලිවලින් ගැවසුනු.

**සරදුබ්භූත.** ති-සරත් කාලයෙහි උපන්නා.

**සරපරිත්තාණ.** න-යුද්ධාදියෙහිදී තමා ඇඟ ඊසැර නොවැටෙන පරිදි පිරිවානා මන්ත්‍රය, සන්නාහය.

**සරබූ.** පු-හූනා, හිකනලා.

**සරභ.** පු-එනම් මෘගයා.

**සරභපල්ලඞ්ක.** පු-සරභ මෘගාකාරපර්‍යඞ්කය.

**සරභපාද.** පු-සරභ මෘගාකාර පාද ඇත්තා.

(22881)

**සරභඤ්ඤ.** න-මිහිරි කොට කීම, මධුර කොට ගැයීම,

**සරභාණ.** න-මිහිරි ලෙස කීම හා ගායනය,

**සරභූ.** ඉ-පඤ්චමහා නදීන්ගෙන් එකක්වූ එනම් නදිය.

**සරමණ්ඩල.** න-සප්ත ස්වරාදිවූ ස්වරමඬල, ශබ්ද රාශිය, ෂඩ්ජ, ඍෂභ, ගන්ධාර, මධ්‍යම, පඤ්චම, ධෛවත, නිෂාද යනු ඒ සප්ත ස්වරයි.

**සරල.** පු-හොරගස.

**සරලද්දව.** පු-සිරිවටු.

**සරලා.** ඉ-සුදු ත්‍රස්තවාලු.

**සරව්‍ය.** න-ඉලක්කය, ලක.

**සරස.** අ-හරහට, සරසට.

**සරසර.** න-රූප ශබ්ද ආදිය අනුකරණ, විධියෙන් දක්වීම.

**සරසී.** ඉ-විල, තඩාගය.

**සරභ්‍යාස.** පු-දුනුසිප් ඉගැන්ම.

**සරස්සතී.** ඉ-එනම් ගංගාව.

**සරස්වතී.** ඉ-එනම් ගංගාව.

**සරපරිත්තතා.** ඉ-ස්වල්ප ස්වරය.

**සරහස්ස.** ති-රහස් සහිත

**සරාග.** පු-රාග සහිත, ඇලුම් සහිත.

**සරාව.** පු-මලාව, පැන් බොන බඳුන, පූකුරුව.

**සරාවතී.** ඉ-එනම් ගංගාව, නදිය.

**සරාසන.** න-දුන්න.

**සරි.** අ-සමාන, සදෘශ.

**සරික්ඛ.** පු-සමාන, සදෘශ, වැනි.

**සරික්ඛක.** පු-සමාන, සදෘශ.

**සරිතක.** න-ගල් සුණු.

**සරිතා.** ඉ-නදිය, ගංගාව.

**සරිත.** න-විසිරී පැතිරීම.

**සරිස.** ති-සමාන, සම.

**සරිසප.** පු-සිරිංසප නම් වෘක්ෂය.

**සරීර.** න-ශරීරය, දෙහය, කය.

**සරීරී.** පු-ශරීර ඇත්තා, සත්‍වයා.

**සරීර කිච්ච.** න-සිරුරු කිස, අවමඟල කටයුතු.

**සරීරට්ඨක.** න-ශරීරයේ ඇට සැකිල්ල.

**සරීරදබ්‍ය.** න-සිරුරේ ගැලපීම, අඞ්ගසම්පූර්ණ ශරීරය, ලක්ෂණ ශරීරය

**සරීරධාතු.** ඉ-ශාරීරිකධාතු, බුදුන්ගේ ශාරීරික ධාතු.

**සරීරපරිකම්ම.** න-සිරුරු පිරිකම්, සිරුරට උවමනා දේ පිළියෙල කිරීම.

**සරීරවලඤ්ජන.** න-සිරුරු කිස.

**සරීරසණ්ඨාන.** න-සිරුරේ ලකුණු, ශරීරයේ හැඩීම.

**සරූප.** න-ස්වභාවය, ගතිය, ආකාරය.

**සරෝජ.** න-විලෙන් නිපන්, පියුම්.

**සරෝජයෝනි.** පු-බ්‍රහ්මයා, පියුම යෝනිකොට ඇත්තා.

**සරෝජිනී.** ඉ-පියුම් විල, තඩාගය.

**සරෝරුහ.** න-පද්මය, පියුම.

**සරෝවතී.** ඉ-තෙපුල වචනය.

**සල.** d. භූ-තුරිතගමනෙ, වහා යාමෙහි, සලති, වහා යෙයි.

**සල.** d. භූ-චලනෙ, සංවරෙච, සැලීමෙහි, සංවරයෙහි, සලති, සැලෙයි, සංවරණය කරයි.

**සල.** d. භූ-කම්පනෙ, කම්පා වීමෙහි, සලති, කම්පාවෙයි.

**සල.** න-ඉත්තෑ කුරු.

**සලභ.** පු-පලගැටියා, මේරු ආදී සත්තු.

**සලක්ඛණ.** න-අඞ්ග ලක්ෂණ, අඟ ලකුණු.

**සලන.** න-සෙලවීම, චංචල වීම,

**සලයති.** ක්‍රි-(d. භූ. සල, චලනෙ, සෙලවීමෙහි + ති) සෙලවෙයි.

**සලල.** පු-එනම් වෘක්ෂය.

**සලාක.** න-ඒ තෝමර ආදිවූ තිස්සගතිය ආයුධ, 734, මනොරථපූර.

**සලාකා.** ඉ-කුසපත්, තුණ්ඩු කැලි, කූරු, ඉරටු, ඊල.

(22935)

**සලාකහත්ථ.** පු-අතේ සායම් ගාගණ කැමති කැමති රූපාදියක් බිත්ති ආදියෙහි දක්-වීමෙන් කරණ ක්‍රීඩාවක්, ඉරටා කූරු සායම් භාජනයක ඔබා කැමති රූපාදියක් බිත්ති ආදියෙහි දක්වා කරණ සෙල්ලම.

**සලාකග්ග.** පු-කුසපත් වලින් ආහාර බෙදා දීමේ ස්ථානය, (කාමරය)

**සලාකගාහ.** පු-කුසපත් ගැණීම.

**සලාකභත්ත.** න-කුසපත් වලින් බෙදා දෙන ආහාර.

**සලාඹු.** පු-නොපැසුනු ගෙඩිය.

**සලාක වාතපාන.** න-ලී කෝටුවලින් තැනූ වා කවුළුව.

**සලාක හත්ථ.** න-බුරුසු අත, ක්‍රීඩා විශෙෂයක්.

**සලාකාවුත්ථ.** න-තණපත්වලින් ජීවත්වීම.

**සලායතන.** න-චක්ඛු ආදී ආයතන සය.

**සලිල.** න-ජලය, වතුර.

**සලිල ධාරා.** ඉ-දිය දහර, ජල ධාරාව.

**සලිලප්පාය.** පු-ජල බහුල භූමිය, දෙනියාය.

**සලිලවුට්ඨි.** ඉ-වැහිවරුෂාව, වැස්ස.

**සලිලබ්භම.** පු-දිය සුලිය, දියසලාව.

**සල්ල.** d. භූ-සීඝගමනෙ, වහා යාමෙහි, සල්ලති, වහා යෙයි.

**සල්ල.** න-ඉත්තෑකූරු.

**සල්ල.** පු-උල, හුල, ශරීරය, කුකුරුමුවන් ගස.

**සල්ලක.** පු-ඉත්තෑවා.

**සල්ලකත්ත.** පු-ශල්‍ය වෛද්‍යවරයා.

**සල්ලකත්තිය.** පු-ශල්‍ය වෛද්‍ය විධිය.

**සල්ලකත්තී.** ඉ-මිනි සොදා මස් ආදිය හැර සන්ධි හැඳින ශල්‍යවෛද්‍යයන් විසින් කළමනා වෙදකම.

**සල්ලබන්ධන.** න-ඊතලය, හිර බැඳුම.

**සල්ලසන්ථන.** න-වේදනාවෙන් මුදවීම, වේදනාවෙන් මිදීම.

**සල්ලක්ඛණ.** න-සැලකීම, සලකුණ.

**සල්ලක්ඛිත.** ති-සලකන ලද, සලකුණු කළ.

**සල්ලක්ඛෙති.** ක්‍රි-(චු, ලක්ඛ, දස්සනෙ, දැකීමෙහි + ණෙ + ති) දකියි, කල්පනා කරයි.

**සල්ලකී.** පු-ඉඳු සල් රුක, ඉන්ද්‍රසාල වෘක්ෂය.

**සල්ලවෙජ්ජ.** පු-සල්ලවෛද්‍යයා, ශල්‍යවෛද්‍ය වරයා.

**සල්ලපති.** ක්‍රි-(d. භූ. ලප, ලපනෙ, කථා කිරීමෙහි + ති) සල්ලාප කරයි, කථා කරයි.

**සල්ලපන.** න-සමගි කථාව, කථාව.

**සල්ලහුක.** පු-සැහැල්ලු දෙය, තොබර දෙය.

**සල්ලාප.** පු-සමගි කථාව, සතුටුසාමීචි කථාව

**සල්ලිත්ත.** ති-ආලෙප කළ, ගාන ලද,

**සල්ලිඛිත.** ති සිදුරු සහිත, සිදුරු කළ.

**සල්ලීන.** ති-අලස, හෙමින් ක්‍රියා කරණ.

**සල්ලෙඛ.** පු-කෙලෙස් සිඳීම, කෙලෙස් නැසීම, කෙලෙස් තුනී කිරීම.

**සව.** d. භූ-ගමනෙ, යාමෙහි, සවති, යෙයි.

**සව.** ති-වැසීම, ඡාදනය.

**සවඞ්ක.** පු-ඉස්සා, මාළු වර්ගයක්.

**සවක්ක.** ති-හොඳට පැසුණු.

**සවණ්ණ.** න-සුවර්ණ නැකත.

**සවණ.** න-ශ්‍රවණය, කණීය, යාග කිරීම, ඇසීම.

**සවණීය.** පු-සවරයෙහි එනම් අංගය, ඇසිය යුතු.

**සවති.** ක්‍රි-(d. භූ. සව, ගතියං, යෑමෙහි + ති) ගලයි, ගලා බසියි.

**සවන්තී.** ඉ-නදිය.

**සව්‍ය.** ති-මෘත ශරීරය, මළකඳ.

**සවය.** පු-මිත්‍රයා.

**සවර.** පු-අශීලාචාර.

**සවස.** න-කෙනෙකුගේ සිත.

**සවාසනා.** ඉ-වාසනා සහිත.

**සවිඝාත.** පු-වෙහෙස සහිත, පීඩා සහිත.

**සවිචාර.** ති-විචාර සහිත, ප්‍රථම ධ්‍යානයේ ඇති විශෙෂ ගුණයක්.

**සවිජ්ජුක.** ති-විදුලිය සහිත,

**සවිඤ්ඤාණ.** ති }
**සවිඤ්ඤාණක.** ති } විඥානය සහිත, සිතක් ඇති.

**සවිතක්ක.** පු-විතර්කය සහිත, ප්‍රථම ධ්‍යානයේ ඇති විශෙෂ ගුණයක්,

**සවිධ.** ති-ලඟ, අසල, සමීප.

**සවිධ.** න-සමීපය, අසල්වාසී කම.

**සවිතු.** පු-හිරු, සූර්‍ය්‍යයා.

**සවිභත්තික.** ති-බෙදුම් සහිත.

**සවුපාදාන.** න-උපාදාන සහිත, උපාදාන පක්‍ෂ සහිත.

**සවෙර.** න-ක්‍රොධය, තරහ.

**සවෙස.** පු-සමීපය, වෙත, ලඟ.

**සස.** පු-සාවා, හාවා.

**සස.** d. භූ-ජීවනෙ, ජීවත්වීමෙහි, සසති, ජීවත් වෙයි, අස්සසති, පස්සසති.

**සසක්කං.** අ-ඒකාන්තයෙන් යථාර්ථයෙහි.

**සසක.** පු-සාවා, හාවා.

**සසඞ්ක.** පු-සසලපය, චන්ද්‍රයා, සඳ.

**සසධර.** පු-චන්ද්‍රයා, සස ලාඤ්ඡනය.

**සසත.** න-කූකුරුමූවන්, සුළඟ.

**සසති.** ක්‍රි-(d. භූ. සස, පාණනෙ, ජීවත් වීමෙහි+ති) ජීවත් වෙයි.

**සසන.** න-වධය, මැරීම.

**සසම්භාර.** පු-සම්භාර සහිත, කෙසාදි කොටස් සහිත.

**සසි.** පු-චන්ද්‍රයා, හඳ, මාතෙල්.

**සසුර.** පු-අඹුසැමි දෙදෙනාගේ පියවරු, මසිලනුවෝ, මාමා.

**සස්ස.** න-සස්‍යය, ගොයම්.

**සස්සත.** පු-ශාස්වතය, නොනස්නා දෙය.

**සස්සු.** ඉ-අඹුසැමි දෙදෙනාගේ මව්වරු, නැන්දා.

**සසු.** d. භූ-පීඩා ගමන ජීවනාදීසු, පෙළීම, ගමන ජීවත්වීම යනාදියෙහි.

**සසූ.** ඉ-සස්සු, නැන්දා.

**සංස.** d. භූ-පසංසනෙ, පැසසීමෙහි, සංසති, පසංසති, ප්‍රශංසාකරයි.

**සහ.** d. භූ-ඛමායං, ඉවසීමෙහි, සහති, ඉවසයි. සහො, අසය්හො.

**සහ.** d. දි. සත්තියං, ශක්තියෙහි, සය්හති, ශක්ති ඇතිවෙයි.

**සහ.** d. චු-ඛන්තියං, ක්‍ෂාන්තියෙහි, සහෙති සහයති, ඉවසයි.

**සහ** අ-සමග යනාර්ථයෙහි, එක්ක, කැටුව.

**සහ.** පු-මී අඹ.

**සහ.** න-ශක්තිය, බලය.

**සහකාර.** පු-මී අඹරුක.

**සහගත** ති-අරමුණ, සම්ප්‍රයුක්ත, ව්‍යතිමිශ්‍ර, ආශ්‍රය, තද්භවය.

**සහජ** පු-සමග උපන් තැනැත්තා, සහෝ-දරයා.

**සහජ.** පු-සහෝදරයා, ලග්නයෙන් තුන්වන ස්ථානය, පරම්පරාගත තැනැත්තා.

**සහජාත.** ති-සමග උපන්නා, එක්ව උපන්නා.

**සහජාත.** පු-එකට උපන් තැනැත්තා.

**සහධම්මික** පු-සමානධර්ම ඇත්තා, කරුණු සහිත, ධර්මසහිත, සහධර්මියා.

**සහධම්මිය.** පු-සහධම්මික, සහධාර්මික.

**සහධම්මිනී.** ඉ-සමාන ධර්ම ඇත්තී, භාර්‍ය්‍යාව.

**සහත්ථ** පු-ස්වකීය හස්තය, සිය අත.

**සහත්ථික.** පු-තම අත, සිය අත.

**සහචර.** පු-අනුචරයා, සමග හැසිරෙන්නා, මිත්‍රයා, වයස්‍යයා

**සහන.** න ඉවසීම, ක්‍ෂාන්තිය.

**සහභාවී.** පු-ස්වකීය සෙවණට ඇත්තා.

**සහභූ.** පු-එකට උපන් තැනැත්තා, එක්තරා දෙවි කොටසක්,

**සහයොග.** පු-උදව්ව, ආධාරය.

**සහවත්ථු.** ඉ-එකට වාසය කිරීම, එකට ජීවත් වීම.

**සහවාස.** පු-සමග වාසය ඇත්තා, එකට වසන්නා.

**සහව්‍ය.** න-යහළුකම, මිත්‍රකම.

**සහව්‍යත.** න-යහළු බව, මිත්‍ර භාවය.

**(23042)**

**සහසා**. අ-වහා, හනික, තර්කණයක් නැතිව ප්‍රවෘත්ත ක්‍රියායෙහි.

**සහස්ස**. න-දහස, සහශ්‍රය, 1000.

**සහස්සක්ඛ**. පු-ඇස් දහසක් ඇත්තා, ශක්‍රයා, ශක්‍රයා වනාහි මොහොතකින් දහසක් අර්ථ සිතයි, එහෙයින් ඔහුට සහස්සක්ඛ (ඇස් දහසක්) ඇත්තායයි කියනු ලැබේ.

**සහස්සබාහු**. පු-දහසක් අත් ඇත්තා, අර්ජුන.

**සහස්සරංසි**. පු-දහසක් රැස් ඇත්තා, සූර්‍ය්‍යයා

**සහස්සවිරියා**. ඉ-සහස්‍රවීර්‍ය්‍යා, හීතණ.

**සහසිඩ**. දහසිත්යුත්, දහසක් ඇති.

**සහවාස**. පු-සමගවාසය, එකට විසීම.

**සහසෙය්‍යා**. ඉ-එකට සයනය කිරීම.

**සහාය**. පු-මිත්‍රයා, අනුචරයා.

**සහාජනෙත්ත**. න-එකට උපන් බව, සහොදරත්වය.

**සහායක**. පු-මිත්‍රයා, යාලුවා.

**සහිත**. න-ඉවසන ලද.

**සළ**. d. භූ-අව්‍යක්තසද්දෙ, නොවියත් හඬෙහි, සළති, මද ශබ්දකෙරෙයි.

## සා

**සා**. d. භූ-සාමත්ථියෙ, පොහොසත් බැව්හි, සාති, සමර්ථවෙයි.

**සා**. d. දි-තනුකරණෙ, තුනීකිරීමෙහි, සායති, තුනීකරයි.

**සා**. d. දි-සායනෙ, රසවිඳීමෙහි, සායති, රසවිඳී.

**සා**. d. දි-නිට්ඨාපනෙ, නිමීමෙහි.

**සා**. පු-බල්ලා, සුනඛයා.

**සාක**. පු-පලා, මූලාදි දශය.

**සාකච්ඡා**. ඉ-සාකච්ඡාව, සමගිකථාව, යහපත් කථාව, සංසන්දනය.

**සාකටික**. පු-රියදුරා, රථාචාර්‍ය්‍යයා.

**සාකටිකකුල**. න-රථකාර කුලය.

**සාකල්‍ය**. න-මොලොක් වචනයෙන් සතුටු කිරීම.

**සාකවත්ථු**. පු-එලවලු ගොවිතැන් කිරීමේ ඉඩම.

**සාකාර**. ති-ලක්ෂණ සහිත, ආකාර සහිත.

**සාකිය**. පු-ශාක්‍ය රජනු, ශාක්‍ය වංශිකයන්ට අයිති.

**සාකුණික**. පු-පක්ෂීන් මරා ජීවත්වන්නා.

**සාකුන්තික**. පු-සාකුණික, බලනු.

**සාක්ඛරප්පභෙද**. පු- අක්ෂර විභාග සහිත.

**සාකෙත**. න-එනම් නුවර, සාකෙත නගරය.

**සාඛ**. d. භූ-ව්‍යාප්තියං, ව්‍යාපතියෙහි, සාඛති, පැතිරෙයි.

**සාඛල්‍ය**. }
**සාඛල්ල**. } න-යහළුකම, මිත්‍ර භාවය.

**සාඛා**. ඉ-ශාඛාව, අත්ත.

**සාඛානගර**. න-අතුනගර, කුඩා නගරය.

**සාඛාමිග**. පු-සාඛා මෘගයා, වඳුරා.

**සාඛී**. ඉ-වෘක්ෂය.

**සාගත**. ති-යහපත් පැමිණීම, සුභ ප්‍රාර්ථනය.

**සාගර**. පු-සාගරය, සමුද්‍රය, මහ සයුර.

**සාගල**. න-එනම් නුවර, සාගල පුරය.

**සාගාර**. ති-ගෙයක වැසීම.

**සාඞ්වච්ඡර**. පු-සංවත්සරය ප්‍රකාශ කරන්නා, නැකැත්තා.

**සාඞ්ගන**. න-අඞ්ගන සහිත.

**සාචියොග**. පු-කුටිලයොගය, වංචාවෙහි යෙදීම.

**සාජීව**. පු-සමාන ජීවත්වීම.

**සාචර්යක**. පු-සමානාචාර්‍ය්‍යයන් ඇත්තා.

**සාට**. න-ඇඳුම, වස්ත්‍රය.

**සාටක**. න-වස්ත්‍රය, සළුව.

**සාටිකා**. ඉ-නාන ඇඳුම, ජල සාටිකාව.

**සාඨෙය්‍ය**. න-සට බව.

**සාණ**. න-වැහැරි, හණවස්ත්‍ර

**සාණවාක**. න-වැහැරි, හණ රෙදි.

**සාණි**. ඉ-තිරය, කඩතුරාව.

**සාණිකා**. ඉ-තිරය, කඩතුරාව.

**සාච්ච**. පු-සත්‍යය, සැබෑව, ඇත්ත.

(23098)

**සාත.** න-සැපය, සතුට.

**සාතක.** පු-එනම් පක්ෂියා.

**සාතකුම්භ.** න-රත්රන්, රත්රන් විශෙෂයක්.

**සාතච්චකාරී.** පු-සාකච්ඡා කොට කරන්නා.

**සාතච්චකිරියා.** පු-සතත ක්‍රියාව.

**සාතතික.** ති-සතතයෙන් පැවති.

**සාතත්ත.** න-මධුර භාවය, මිහිරි බව.

**සාතව.** න-කල්‍යාණ කර්මය.

**සාතරූප.** න-සැප ස්වභාව.

**සාතසුඛ.** ති-ත්‍රිවිධ ධ්‍යාන පිළිබඳ සැපය.

**සාති.** ඉ-සා නැකත.

**සාතිය.** පු-සැප ඇති, සුඛ සහිත.

**සාතිරෙක.** න-අතිරෙකයක් සහිත.

**සාතිසාර.** ති-බලහත්කාර ලෙස.

**සාතොදක.** න-මිහිරි ජලය, පිරිසිදු ජලය.

**සාතොදික.** න-මිහිරි ජලය ඇති.

**සාත්ථ.** ති-තේරුම් සහිත.

**සාත්ථක.** ති-ප්‍රයෝජනවත්.

**සාත්ථික.** ති-සාර්ථකලෙස.

**සාථලික.** / **සාත්ථලික.** } ති-උනන්දු නැති, අලස ලෙස, නිදිමත සහිත.

**සාද.** d. භූ-අස්සාදනාදිසු, රසවිඳීම් ආදියෙහි, සාදති ආස්වාදනය කරයි.

**සාදන.** න-ගෙය, නිවාසය, ස්ථානය, මන්දිරය.

**සාදර.** ති-ආදරසහිත, ගෞරව සහිත.

**සාදරිය.** න-ගෞරවය දක්වීම, ආදරය දක්වීම.

**සාදීන.** ති-(ස+ආදීන) ලෞකික, රාගාධික, බලවත් හැඟීමෙන් යුත්.

**සාදියති** ක්‍රි-(d.-භූ. දා, දානෙ, දීමෙහි+ති) ඉවසයි, පිළිගණියි.

**සාදියන.** න-ඉවසීම, ප්‍රතිග්‍රහණය.

**සාදිස.** පු-සමාන, සමානකොට සැළකීම.

**සාදුකණ්ට.** පු-කටුකිහිරිය, නොකටු.

**සාදු.** ති-මිහිරි, මධුර, රස.

**සාදුතා.** ඉ-මිහිරිබව, සාධුභාවය.

**සාදූදක.** න-එනම් මුහුද, මිහිරි ජලය.

**සාදෙති.** ක්‍රි-(d. භූ. සීද, සීදනෙ, ගිලීමෙහි +ණෙ+ති) ගිලෙයි, ගසාගෙණ යයි.

**සාධ.** d. භූ-උප්පාදනෙ, නිපදවීමෙහි, සාධති, නිපදවයි.

**සාධ.** d. දි-සංසිඞ්යෙ, සංසිඞියෙහි, සාධයති, සිදුකරයි, සාධනය.

**සාධ.** d. සු-නිප්ඵාදනෙ, නිපදවීමෙහි, සාධුණාති නිපදවයි.

**සාධක.** ති-නිදසුන, උදාහරණය, නිදර්ශනය.

**සාධන.** න-සම්භාරය, සිඞිය, කර්තෘ කර්මභාව යන කාරකතුණ.

**සාධාරණ.** න-අප්‍රතිනියත දෙය, සාමාන්‍ය දෙය, පොදු, අපක්ෂපාත, මැදහත්.

**සාධික.** පු-අධිකයක් සහිත, වැඩියක් සහිත.

**සාධිකපොරිස.** පු-පුරුෂප්‍රමාණයකින් අධික, බඹයකට අධික.

**සාධිත.** ති-සිදුකළ, සිඞකළ.

**සාධිය.** පු-සිඞකටයුතු, සිදුකළයුතු.

**සාධු.** d. භූ නිඥ්ඥිතසද්දෙ, පහත් ශබ්දයෙහි, සාධති, පහත් ශබ්දකරයි.

**සාධු.** d. භූ කිළිනෙන, තෙත්බැවිහි, සාධති, තෙත් කෙරෙයි.

**සාධු.** පු-යහපත, අභිවෘද්ධිය.

**සාධු.** පු-ස්වීකාරයෙහි, මනා යහපත් සාධු යනාර්ථයෙහි.

**සාධු.** ති-සුන්දර, තතපයඝීය, ආරාධන, ස්වීකාරය, සත්පුරුෂ, සනතුෂ්ටි.

**සාධුකං.** පු-මනාකොට, යහපත් ලෙස.

**සාධුකම්‍යතා.** ඉ-දක්ෂකමට ඇති ආශාව, සමර්ථවීමෙහි ඇති ආශාව.

**සාධුකාර.** පු-එනම් අනුකරණ ශබ්දය, මනා ක්‍රියාව.

**සාධුකීළන.** න-සාධු ක්‍රීඩාව, යහපත් ක්‍රීඩාව, උත්සව කෙළිය.

**සාධුඵල**. න-මිහිරි ඵලය.

**සාධුරූප**. න-මනාරූපය, මනාසටහන.

**සාධුපුරිස**. පු-සත්පුරුෂයා, ශ්‍රෙෂ්ඨපුරුෂයා.

**සාධුසම්මත**. පු-ශ්‍රෙෂ්ඨයයි සම්මතකරණ ලද.

**සාධෙති**. ක්‍රි-(d. භූ. සාධ, සංසිඩියං, සිදු-වීමෙහි + ණෙ + ති) සිදුකෙරෙයි.

**සාන**. d. භූ-තිබ්ණෙ, තියුණුකිරීමෙහි, සානති, තියුණු කරයි.

**සාන**. පු-කරගල, සුනඛයා, වස්ත්‍රවිශෙෂයක්, ඝණවස්ත්‍ර.

**සානට්ඨාන**. න-නැලවිල්ල, සැතැප්පවීම.

**සානු**. පු-පර්වතයෙහි සම ප්‍රදෙශය, පර්වත මස්තකය.

**සානුචර**. ති-අනුචරයන් සහිත, පිරිවර සහිත.

**සානුවජ්ජ**. පු-(ස + අනුවජ්ජ) උපවාදසහිත.

**සානුසෙති**. ක්‍රි-(d. භූ. සං + අනු - සී, සයෙ, නිදීමෙහි + ණෙ + ති) සිත සම්පූර්ණකෙරෙයි.

**සාප**. පු-අක්‍රොශය, දිවිරීම, දෙවොල්ඇදීම, පලිගැණීම.

**සාපත්තික**. පු-ආපත්තිසහිත, වැරදි සහිත.

**සාපතෙය්‍ය**. න-ධනය, වස්තුව.

**සාපද**. පු-ව්‍යාඝ්‍රාදී චණ්ඩවර්ගයා, චණ්ඩ සත්ව-වර්ගයා.

**සාපදෙස**. ති-කරුණු සහිත, හේතු සහිත.

**සාපානදොණි**. ඉ-සුනඛයන්ට වතුර දෙන ඔරුව.

**සාපෙක්ඛ**. පු-<br>**සාපෙඛ**. පු-} අපෙක්ෂා ඇත්තා, බලා-පොරොත්තුවන්නා.

**සාබන්ධන**. න-බලුදම, බල්ලන් බඳින රැන.

**සාම**. d. චු-ලාලනෙ, නැලවීමෙහි, සාමෙති සාමයති, නලවයි.

**සාම**. පු-එනම් වෙදය, නැලවිල්ල.

**සාම**. ති-නිල් රන්වන් වස්තු, නිල්වස්තු.

**සාමං**. අ-තමාවිසින් යනාර්ථයෙහි "සාමං වායිතං"

**සාමග්ගි**. ති-සමගිබව, සාමාග්‍රිය.

**සාමග්ගිය**. න-සමගිය, එකඟකම, අනු-කූලතාව.

**සාමග්ගී**. ඉ-සමගිය, සම්පූර්ණබව, රැස්වීම.

**සාමච්ච**. ති-ඇමැතිවරුන් සහිත.

**සාමඤ්ඤ**. න-අප්‍රතිනියතදෙය, සාමාන්‍යය, ශ්‍රමණභාවයාගේ අර්ථය.

**සාමඤ්ඤත්ථ**. පු-සාමාන්‍යාර්ථය.

**සාමඤ්ඤෙව**. අ-(සාම + එව) තමාව.

**සාමණක**. ති-ශ්‍රමණයන්ට අවශ්‍ය, ශ්‍රමණ භාවයට සුදුසු.

**සාමණෙර**. පු-ශ්‍රමණ පුත්‍රයා, හෙරණ, සාමණෙර තැන.

**සාමණෙරි**. ඉ-සාමණේරිය, හෙරණී.

**සාමණෙර පබ්බජ්ජා**. ඉ-හෙරණ පැවිද්ද.

**සාමත්ථ**. ති-හැකි, පුළුවන්, දක්ෂ, නිපුණ.

**සාමත්ථිය**. න-ශක්තිය, බලය.

**සාමන්ත**. ති-සමීපය, ලඟ, එකපැත්ත, හාත්පස.

**සාමන්තජප්පන**. න-සමීපකොට කථාකිරීම, ලංකොට දෙඩීම.

**සාමයික**. ති-තමාඅයත්, තමාපිළිබඳ.

**සාමල**. පු-කලුපැහැය.

**සාමලතා**. ඉ-එනම් වැල් වර්ගයක්.

**සාමා**. ඉ-පුවඟු, ත්‍රස්තවාලු, ඉරමුසු.

**සාමාක**. පු-ඌරුහැල්.

**සාමාජික**. පු-සභාවෙහි නියුක්තයා, සාමා-ජිකයා, සභිකයා.

**සාමාධික**. න-සිත එකඟ කිරීමෙහි නියුක්ත වීම.

**සාමායික**. ති-මිත්‍රලෙස, එකඟලෙස, සුදුසු සෘතුවට ඇතිවන, තාවකාලික.

**සාමි**. පු-ස්වාමියා, අධිපතියා, වල්ලභයා.

**සාමික**. පු-ස්වාමිපුරුෂයා, වල්ලභයා.

**සාමිනී**. ඉ-ස්වාමිදුව.

**සාමිය**. පු-ස්වාමිපුරුෂයා, හිමියා.

**සාමිස**. ති-ආහාර, මස් සහිත, මද සහිත. (23204)

**සාමිභගිනි**. ඉ-ස්වාමිපුරුෂයාගේ සහෝදරී, නෑනා.

**සාමිභාතා**. පු-ස්වාමියාගේ සහෝදරයා, මස්සිනා.

**සාමිස**. පු-ආමිස සහිත, ආමිස බලනු.

**සාමීචිකම්ම**. න-සුදුසුදේකීම, සුවදුක් පිළිබඳ කථාව.

**සාමීචිපටිපදා**. ඉ-යහපත් ප්‍රතිපදාව, මනා පිළිපැදීම.

**සාමීචිපටිපන්නක**. පු-මනාවපිළිපන්, යහපත් මගට බටු.

**සාමීචිපටිපන්න**. ති-මනාවපිළිපන්, යහපත්ව පිළිපන්.

**සාමීප්‍ය**. පු-සමීපත්වය, සමීපභාවය.

**සාමී**. පු-ඉසුරු ඇත්තා.

**සාමීචි**. ති-යහපත්, සුදුසු.

**සාමුක්කංසික**. ති-තමා උසස්කොට පවත්නා, තමා අයත් "සාමුක්කංසික ධම්මදෙසනා"

**සාමුද්ද**. න-මුහුදු ලුණු, මුහුදට අයිති.

**සාමුද්දික**. ති-මුහුදු යන, සමුද්‍ර යාත්‍රික.

**සාමෙති**. ක්‍රි-(d. භූ. සමු, උපසමෙ, සංසිදී-මෙහි + ණෙ + ති) සංසිඳෙයි.

**සාම්‍ය**. න-සාම්‍යගුණය, සමගුණය.

**සාම්‍යාවස්ථා**. ඉ-සත්ව රජස් තමස් යන ගුණයන්ගේ ඌනාතිරික්ත රහිතාවස්ථාව.

**සායං**. අ-සවස්කාලය, සවස.

**සාය**. d. භූ-සාදනෙ, ලෙවිමෙහි, සායති, ලෙවකයි.

**සායක**. පු-කරඬුව, ශරීරය.

**සාය**. පු-සවස, හැන්දෑවරුව.

**සායණ්හ**. න-සවස, සැන්දෑව, සවස්කාලය.

**සායණ්හසමය**. පු-සවස්කාලය, හවස් කාලය.

**සායන**. න-රසවිඳීම, රසානුභවය.

**සායති**. ක්‍රි-(d. භූ. සාය, සදනෙ, රස බැලීමෙහි + ති) ලෙවකයි.

**සායික**. න-නිදීම, විවෙක ගැනීම.

**සායිත**. ති-දිවින් රසවිඳිනා ලද.

**සායි**. න-දිගාවීම, සයනය කිරීම.

**සාර**. d. චු-දුබ්බල්‍යෙ, දුර්වලබැව්හි, සාරෙති සාරයති, දුර්වලකරයි.

**සාර**. පු-ශක්තිය, ස්ථිරාවයව, හරය, අහස. අරටුව.

**සාර**. ති-උත්තම, ශ්‍රේෂ්ඨ.

**සාරගන්ධ**. පු-සඳුන් දෙවදුරු ආදී හරයෙන් සුවඳ හමන දේ.

**සාරගබ්භ**. පු-සාරගර්භය, සාරවස්තු ගබඩාව.

**සාරඞ්ග**. පු-සියොතා, පක්ෂියා, මෘගයා.

**සාරජ්ජති**. ක්‍රි-(d. දි, රන්ජ, රාගෙ, පාට කිරීමෙහි + ති) ඇලෙයි. ආලේපකරයි.

**සාරජ්ජන**. න-ඇලීම, ආලය කිරීම.

**සාරණ**. න-සිහිකිරීම, කල්පනා කිරීම.

**සාරත්ත**. න-ඇලීම්බව.

**සාරථී**. පු-රථාචාර්‍යයා, රියදුරා.

**සාරද**. ති - සරත් කාලොත්පන්න, සරද සමයෙහිවූ.

**සාරදික**. ති-සරත් කාලයට අයත්.

**සාරදී**. ඉ-ලියතගලාවැල.

**සාරද්ධ**. ති-තරහ, ක්‍රොධය, කෝපය.

**සාරන**. න-යෑම. ගමන් කිරීම.

**සාරමෙය**<br>**සාරමෙය්‍ය**. } පු-බල්ලා.

**සාරම්භ**. පු-කරණුත්තරියකරණය, කළ එකට වැඩියක් කිරීම.

**සාරම්භකථා**. ඉ-තරහ හෝ උදාරම් කථාව, අහංකාර කථා.

**සාරම්භී**. පු - වේගයෙන් හෝ ඉක්මනින් යන්නා, අපරීක්ෂාකාරී තැනැත්තා.

**සාරස**. පු-විල්ලිහිණියා, මීපැණි.

**සාරසුවණ්ණ**. පු-ශ්‍රේෂ්ඨ රත්රන්, පවුම් රත්රන්.

**සාරාග**. පු-රාගය සහිත.

**සාරාගී**. පු-රාගසහිතයා, රාග ඇත්තා.

**සාරාණීය**. පු-සිහිකයුතු, කල්පනාකටයුතු.

(23257)

**සාරාණීයධම්ම**. පු-ශිෂ්ඨ කථාව, සිහිකටයුතු දහැම් කථාව.

**සාරි**. ති-ඇවිදින, සංචාරයකරණ, හැසිරෙන.

**සාරිපුත්ත**. පු-සාරීබැමිණියගේ පුතා, එනම් මහ රහතන් වහන්සේ, බුදුන්වහන්සේගේ දකුණත් සව්වා.

**සාරිඵලක**. පු-දූපෝරුව.

**සාරිබා**. ඉ-ඉරමුසුවැල.

**සාරීරික**. පු-ශරීරයට අයිති, ශරීරය පිළිබඳ.

**සාරූප්ප**. න-සමානරූපසවභාවය, සාරූප්‍ය.

**සාරෙති**. ක්‍රි-(d. භූ. සර, ගතියං, යැමෙහි + ණෙ + ති)ගමන්කරවයි, යවයි.

**සාල**. පු-මස්සිනා, පවුර, සල්රුක, වෘක්ෂය

**සාලපණ්ණි**. ඉ-අස්වැන්න.

**සාලමාලක**. න-සල්ගස්වලින් වටවූ ස්ථානය.

**සාලරුක්ඛ**. පු-සල්රුක.

**සාලව**. පු-ලොත්, ලොධ්‍ර.

**සාලවන**. න-සල්වනය.

**සාලක**. පු-මස්සිනා.

**සාලකකිමි**. පු-කෘමිවර්ගයක්.

**සාලය**. ති-ඇලීම් සහිත, රාගාන්විත.

**සාලලට්ඨි**. ඉ-සල්රුක, ශාලවෘක්ෂය.

**සාලා**. ඉ-ශාලාව, ගෘහය.

**සාලාකිය**. පු-සැත්කටුලාකරණ, වෙදකම, ශල්‍යකර්මය.

**සාලි**. හැල් වී. ඇල්ධාන්‍ය.

**සාලික්ඛෙත්ත**. න-ඇල්කෙත, ඇල්හේන.

**සාලිකා**. ඉ-ශාරිකා, සැළලිහිණියා.

**සාලිසූක**. න-ඇල්වී තණ්ඩුව, ඇල්වීකොස්ස.

**සාලූක**. න උපුල් අල.

**සාලූකපාන**. න-උපුල් අලවලින් සාද පානය.

**සාලූර**. පු-බෙල්ලා, මැඩියා.

**සාලෙය්‍ය**. ති-හාල්වලට අයිති.

**සාලෙය්‍යක**. පු-එනම් ජනපදවැසියා.

**සාලොක**. න - දර්ශනය, පෙනුම, දැකීම, "සාලොකෙ තිට්ඨන්ති"

**සාලොහිත**. පු-සහලේනෑයා, නෑදෑයා.

**සාලව**. න-කෑමජාතියක්, සැලඩ් වර්ගයක්.

**සාළික**. පු-කුරුළු වර්ගයක්, මයිනා.

**සාව**. පු-කබුරුවන් පැහැය, බාලයා.

**සාව**. න-යුෂ, ඉස්ම, ඔජස.

**සාවක**. පු ශ්‍රාවකයා, ශාස්තෲන් වහන්සේගේ ගෝලයා, බාලයා.

**සාවකසඞ්ඝ**. පු-ශ්‍රාවකසඞ්ඝයා.

**සාවකත්ත**. න-ශ්‍රාවකභාවය, ගෝලබව.

**සාවජ්ජ**. න-වරද සහිත, දෝෂ සහිත.

**සාවණ**. පු-ශ්‍රාවණ, නිකිණිමාසය.

**සාවයන**. න-ඇස්වීම, ශ්‍රවණයකරවීම.

**සාවත්ථි**. ඉ-එනම් පුරය.

**සාවසෙස**. ති-ඉතුරු ඇති, අසම්පූර්ණ.

**සාවිකා**. ඉ-ශ්‍රාවිකාව, ශිෂ්‍යාව.

**සාවිත්ති**. ඉ-එනම් සෘග්වෙදය.

**සාවෙති**. ක්‍රි-(d. භූ. සු-සවනෙ, ඇස්වීමෙහි + ණෙ + ති) අස්වයි.

**සාස**. d භූ-අනුසිට්ඨියං, අනුශාසනාකිරීමෙහි, සාසති, අනුසාසති, අනුශාසනාකරයි.

**සාස**. පු-ආස්වාශය, ස්වාශය, හුස්ම ඉහළට ඇදීම.

**සාසති**. ක්‍රි-(d. සු, සවනෙ, ඇස්වීමෙහි + ති) අනුශාසනා කරයි.

**සාසන**. න-ආඥාව, ආගම, ලබ්ධිය, හසුන්පත්, අනුශාසනාකිරීම.

**සාසනන්තරධාන**. න-බුද්ධ ධර්මය (ශාසනය) අතුරුදහන්වීම,

**සාසඞ්ක**. පු-සැකසහිත කුකුස් සහිත.

**සාසප**. පු-අබ, සිදුහත් බිජු.

**සාසපකුට්ඨ**. න-අබකුඩු.

**සාසව**. පු-ආශ්‍රවසහිත, කෙලෙස්සහිත.

**සාහත්ථික**. ති-සියතින්, තමාගේ ම අතින්.

**සාහස**. න-බලාත්කාරය, දණ්ඩනය, දරුණු.

**සාහසකිරියා**. ඉ - බලාත්කාරය, අඩන් තේට්ටම.

(23315)

**සාහසප්පිය**. පු-දරුණු ක්‍රියාවට කැමැත්තහු

**සාහසා**. පු-තර්කයක් නැතුව ප්‍රවෘත්ත ක්‍රියායෙහි, වහා, හනික.

**සාහසික**. පු-දරුණු, චණ්ඩ, නපුරු.

**සාහසියකම්ම**. න තිරිසන් ක්‍රියාව, භයානක ක්‍රියාව.

**සාහු**. අ-ස්වීකාරයෙහි, සාදු, යහපති.

**සාහුණෙය්‍ය**. පු-ආහුණෙය්‍යත් සහිත

**සාල**. පු-වෘක්ෂය, සල්රුක, සාල

**සාලිකා**. ඉ-සැලලිහිණියා, ශාරිකා.

**සාළුර**. පු-බල්ලා, සාලූර.

## සි

**සි**. d. භූ-සයෙ, සයනය කිරීමෙහි, සෙති, සයති, සයනයකරයි.

**සි**. d. භූ සෙවනෙ, සේවනයකිරීමෙහි, සෙවති, සේවනයකරයි, සෙවතා, සේවකො.

**සි**. d. කි-බන්ධනෙ, බැඳීමෙහි, සිනාති, බඳියි, සීමා, සීසං.

**සි**. d. චු-බන්ධනෙ, බැඳීමෙහි, සීයතෙ, බඳිනු ලැබේ..

**සි**. d. භූ-ගමනෙ, යාමෙහි, වඩ්ඪනෙ, වැඩීමෙහි, සෙති අතිසෙති යෙයි, වැඩෙයි.

**සි**. අ-නාමාඛ්‍යාත විභක්තිප්‍රත්‍යය ධාතු යන මෙහි.

**සිංසක**. න-ජලජ පැලෑටි වර්ගයක්.

**සිංසපා**. ඉ-ඇට්ටේරිය.

**සික**. d. චු-ආමසනෙ, ආමර්ශණයෙහි, සිකෙති සිකයති, ආමර්ශණයකරයි.

**සික්කා**. ඉ-සාල්ල, උඩහල්ල.

**සිකතා**. ඉ-වැලි.

**සික්ඛ**. d. භූ-සික්ඛතෙ, හික්මීමෙහි, සික්ඛති, හික්මෙහි, සික්ඛා, සික්ඛාපදං.

**සික්ඛණ**. න-හික්මීම, ශික්ෂණය.

**සික්ඛති**. ක්‍රි-(d. භූ. සික්ඛතෙ, හික්මීමෙහි + ති) හික්මෙයි.

**සික්ඛමානා**. ඉ-උපසම්පදා පිණිස හික්මෙන සාමණේරිය.

**සික්ඛා**. ඉ-ශික්ෂාව, වෙදාඞ්ගය.

**සික්ඛාපච්චක්ඛාන**. න-ශික්ෂාප්‍රත්‍යාඛ්‍යානය.

**සික්ඛාසමාදාන**. න-ශික්ෂාපද සමාදන්වීම.

**සික්ඛාසාජීව**. පු-ශික්ෂාවෙන් සමානව ජීවත් වීම.

**සික්ඛාපක**. පු-හික්මවන්නා, ආචාර්‍ය්‍යවරයා.

**සික්ඛාපද**. න-ශික්ෂාපද, හික්මියයුතු ව්‍යවස්ථා, හික්මිය යුතු කාරණා, සිකපද.

**සික්ඛාපන**. න-හික්මවීම, ශික්ෂණයකිරීම.

**සික්ඛිත**. ති-හික්මෙනලද, පුරුදුකළ, දක්ෂවූ.

**සික්ඛිතබ්බ**. ති-හික්මිය යුතු, ඉගෙණගත යුතු.

**සිඛණ්ඩ**. පු-චූඩාව, මොනරපිල.

**සිඛණ්ඩක**. පු-චූලාව, කුඩුම්බිය, චූඩාව.

**සිඛණ්ඩිනී**. ඉ-හුනිඳ, ඔලිඳ.

**සිඛණ්ඩී**. පු-චූලා ඇත්තා, මොනරා.

**සිඛර**. න-මස්තකය, මුදුන, වෘක්ෂාග්‍රය, විදින කටුව.

**සිඛරණී**. ඉ-ගැහැණු ජාතියක්.

**සිඛරී**. පු-පර්වතය, වෘක්ෂය.

**සිඛා**. ඉ-කොණ්ඩය, ගිනි දැල්ල, ප්‍රධාන, කෙලවර, මයුර.

**සිඛාබන්ධ**. පු-රත්නුල් ආදියෙන් විසිතුරු කොට කොණ්ඩා බඳින (ලද) බැඳීම

**සිඛී**. පු-මොනරා, ගින්න.

**සිග්ගු**. පු-මුරුගා, පලා.

**සිඟාල**. පු-සිවලා, කැණහිලා.

**සිඟාලක**. පු-සිවලාට අයිති. සිවලාට අයත්.

**සිඟාලික**. ති-සිවලාට අයත්.

**සිඝ**. d. භූ-චුම්බනෙ, ඉඹීමෙහි, සිඞ්ඝති, උපසිඞ්ඝති, ඉඹී.

**සිඞ්ග**. න-ප්‍රධානාංශ, පර්වතශිඛර, අඟ, අං.

**සිඞ්ගධනු**. න-අංවලින් තැනූ දුන්න.

(23365)

**සිඞ්ගධමක**. න-අඟින් තැනූ නළාවක්.

**සිඞ්ගාර**. පු-එනම් නාට්‍ය රසය.

**සිඞ්ගාරී**. ඉ-රූහැසියා, රූසියා.

**සිඞ්ගිනී**. ඉ-දෙන, ධෙනු.

**සිඞ්ගී**. ඉ-විෂ්ණු, රත්රන් විශෙෂයක්, ඖෂධිය, සුඟු.

**සිඞ්ගීනාද**. න-රත්රන්, රන්.

**සිඞ්ගීවණ්ණ**. ති-රන් පැහැති, සුවර්ණ වර්ණ පැහැයක් ඇති.

**සිඞ්ගීක**. පු-ජීවක.

**සිඞ්ගික**. ති-අඟක් ඇති.

**සිඞ්ගිලොණ**. න-අඟක ලුණු දැමීම.

**සිඞ්ගිල**. පු-අඟක් වැනි හොටක් ඇති පක්ෂියා.

**සිඞ්ගීසුවණ්ණ**. න-රත්රන්, රන්.

**සිඞ්ගිවෙර**. න-ඉඟුරු.

**සිඞ්ගු**. ඉ-මාළු වර්ගයක්.

**සිඞ්ඝාට**. පු-ගොකටු.

**සිඞ්ඝාටක**. පු-කෙකටියඅල, මාර්ගසන්ධිය.

**සිඞ්ඝති**. ක්‍රි-(d. භූ. සිඝි, ආඝානෙ, චුම්බනයෙහි + ති) චුම්බනය කෙරේ.

**සිච**. d. භූ-සෙචනෙ, වැගිරීමෙහි, සෙචති, වැගිරෙයි, සෙකො.

**සිච**. d. රු-සෙචනෙ, වැගිරීමෙහි, සිඤ්චති, වැගිරෙයි.

**සිජ්ජමාන**. න-තැම්බීම, කැකෑරීම.

**සිජ්ඣති**. ක්‍රි-(d. භූ. සිජ්, අව්‍යක්තශබ්දෙ, අවියත් බැව්හි + ති) සිදුවෙයි.

**සිඤ්චති**. ක්‍රි-(d. භූ. සිච, සෙචනෙ, ඉසීමෙහි + ති) ඉසියි.

**සිඤ්චන**. න-ඉසීම, සෙකය.

**සිඤ්ජනී**. ඉ-දුනුදිය, දුනු ලනුව.

**සිත්ථ**. න-බත් මිටක්.

**සිට්ඨි**. ඉ-ආඥාව, ඇඟවීම, නියොගය.

**සිට**. d. භූ-අනාදරෙ, අනාදරයෙහි, සෙටති, අනදර කරයි.

**සිත**. න-මඳසිනාව, මන්දහාස්‍යය.

**සිත**. d. භූ-සෙතකරණෙ, සෙවතවර්ණකිරී=මෙහි, සුදුපාට කරයි, සෙතවජ්ජතං.

**සිත**. ති-බඳනා ලද්ද, ආශ්‍රිත, ධවල, සුදු පැහැය.

**සිතත**. පු-අලසයා.

**සිතකාර**. න-සිනාසීම, හිනැහීම.

**සිතඞ්ග**. පු-කපුරු.

**සිතසිව**. න-සෛන්ධව ලුණු.

**සිත්ත**. ති-ඉසින ලද, සෙවනය කරණ ලද.

**සිත්ථ**. න-මීඉටි, බත්තුල.

**සිත්ථක**. න-මීඉටි, බත්තුල.

**සිද** d. භූ-කාමෙපාකෙච, කාමාධ්‍යාසයෙහි පිසීමෙහි.

**සිද**. d. දි-පාකෙ, පිසීමෙහි.

**සිද**. d. භූ-සොධනෙ, සුධකිරීමෙහි, සෙදති, සුධකරයි.

**සිදි**. d. භූ-සීතලෙ, සිහිල් බැව්හි, සිඳති, සිහිල් කරයි.

**සිපිල**. න-තද, ශක්තිමත්.

**සිද්ධ**. පු-එනම් දෙවයෝනිය, සිදුවූ දෙය.

**සිද්ධත්ථ**. පු-සිද්ධාර්ථකුමාරයා, බුදුරජ, අබ, සිද්ධවූ අර්ථය.

**සිද්ධත්ථක**. න-සුදු අබ.

**සිද්ධන්න**. න-ලබ්ධිය.

**සිද්ධි**. ඉ-සිද්ධිය, නිවණ.

**සිද්ධික**. ති-සඵලවීම් සහිත, සාඵකලෙස. සිදුවෙයි.

**සිධ**. d. දි-සංසිද්ධියං, නිපදවීමෙහි, සිජ්ඣති සිදුවෙයි.

**සිධු**. d. භූ-ගමනෙ, යාමෙහි, සෙධති, යෙයි, නිසෙධති, පටිසෙධති.

**සිධු**. ති-සුරා.

**සින්දි**. ඉ-ඉඳි, හිඳි.

**සින්දුක**. පු-නිකගස.

**සින්දුවාර**. න-නික.

**සින්දූර**. න-සීනි පිටි.

**සින්ධව**. පු-අශ්වයා, ලුණු.

**සින්ධව**. පු-සින්ධු දෙශයේ උපන් අශ්වයා.

**සින්ධු**. පු-එනම් දෙශය, ඉන්දියා දෙශය

**සින්ධු**. ඉ-එනම් නදිය.

**සින්ධුසඞ්ගම**. පු-නදීසමුද්‍ර දෙදෙනාගේ සඞ්ගම ස්ථානය, නදිය සමුද්‍රයට වැටෙන තැන, මෝය.

**සින්ධූර**. න-සහිඳ ලුණු.

**සිනන** ති-දහඩියෙන් තෙත්වූ.

**සිනා**. d. දි-සිනානෙ, ස්නානයෙහි, සිනාති, ස්නානයකරයි.

**සිනාත**. ති-ස්නානයකළ, සොඩාහරිණ ලද.

**සිනාති**. ක්‍රි-(d. දි, සිනානෙ, ස්නානයෙහි +ති) ස්නානයකරයි.

**සිනා**. න-නෑම, ස්නානයකිරීම.

**සිනානී**. ඉ-නහන සුනු.

**සිනිද්ධ**. පු-සිනිඳු, මොලොක්, ස්නෙහඇත්තා, මිත්‍රයා.

**සිනිහ**. d. දි-පීතියං, ප්‍රීතියෙහි, සිනියහති, ප්‍රීති උපදවයි ස්නෙහො-සිනීහො.

**සිනිය්හති**. ක්‍රි-(d. දි, සිනහ, පීතියං, ප්‍රීති-යෙහි+ති) ප්‍රීති උපදවයි.

**සිනෙරු**. පු-මහමෙර, මෙරුපර්වතය.

**සිනෙහ**. d. චු-සිනිඬෙ, සිනිඳුකිරීමෙහි, මෘදු, සිනෙහෙති, සිනෙහයති, මෘදුකරයි.

**සිනෙහ**. පු-ප්‍රේමය, තෛලය.

**සිනෙහ**. පු-ස්නෙහය, ආදරය.

**සිනෙහන්වය**. පු-ප්‍රේමය අනුව යන,

**සිනෙහබින්දු**. න-තෙල් බින්දුව.

**සිනෙහක**. පු-මිත්‍රයා, යහළුවා.

**සිනෙහිත**. ති-ලොභ, ගිජු, මසුරු, ආශා කරණ.

**සිනොති**. ක්‍රි-(d. කි. සි, බන්ධනෙ, බැඳීමෙහි +ති) බඳියි.

**සිපාටිකා**. ඉ - එක පාටින් යුත් වහන, (සෙරෙප්පු)

**සිප්ප**. න-ශිල්පය.

**සිප්පසාලා**. ඉ-ශිල්පශාලාව, කම්මල් ආදිය,

**සිප්පට්ඨාන**. න-ශිල්පස්ථානය, ශිල්ප පුහුණු වන තැන.

**සිප්පක**. න-ශිල්පය, කර්මාන්තය.

**සිප්පි**. පු-ශිල්පීහු, ශිල්පදත්තහු.

**සිප්පික**. පු-ශිල්පියා, ශිල්පඥයා.

**සිප්පී**. ඉ-බෙල්ලා, සිප්පි බෙල්ලා.

**සිළා**. ඉ-අරළු, හරිතකී.

**සිබ්බ**. න-හිස්කබලේ මූට්ටුව.

**සිබ්බති**. ක්‍රි-(d. දි, සිවු, සිබ්බනෙ, මැසීමෙහි +ති) හිවයි, මහයි.

**සිබ්බන**. න-මැහීම.

**සිබ්බනී**. ඉ-ඉදිකටුව, මහන්නී, තෘෂ්ණාව.

**සිබ්බිනී**. ඉ-ඉදිකටුව, මහන්නී, තණ්හාව.

**සිබ්බිත**. ති-මහනලද, මැහූ.

**සිම්බලි**. පු. ඉ-ඉඹුල් රුක.

**සිම්බලිවන**. න-ඉඹුල් වනය.

**සියා**. ක්‍රි-(d. භූ. දිස, භුවි, වීමෙහි, අස+සියා ආ) වන්නේය

**සියුං**. ක්‍රි-(d. භූ. දිස, භූවි, වීමෙහි දිස+සියුං ආදෙශ) වන්නාහුය.

**සෙය්‍යති**. ක්‍රි-(d. භූ. සී, සයෙ, නිදීමෙහි+ති) නිදයි.

**සිර**. පු න-ශ්‍රෙෂ්ඨ, මුදුන.

**සිරා**. ඉ-නහර.

**සිරාජාල**. න-නහර දැල.

**සිරි**. ඉ-ශ්‍රියාව, සිරිය, ශ්‍රී.

**සිරිළලි**. ඉ-බෙරුගස.

**සිරිමා**. පු-ශ්‍රියාවත්, ශ්‍රීමත්, සිරි ඇති.

**සිරිය**. පු-තොප්පිය, හිස්වැසුම, තලප්පාව.

**සිරිංසප**. පු-සර්පයා, බිම හැසිරෙණ සත්ව වර්ගයක්, දලඹු විශෙෂයක්.

**සිරිවාස**. පු-සරල ද්‍රව.

**සිරිකර**. පු-විෂ්ණු.

**සිරිකණ්ඨ**. පු-සිරිකත බොටුවේ ඇත්තා, ඊශ්වරයා.

**සිරිගබ්භ**. පු-යහන් ගබඩාව, සිරි යහන් ගැබ.

**සිරිඝන**. පු-සර්‍වඥයන් වහන්සේ.

**සිරිඳ**. පු-වෙසමුනි රජ.

**සිරිපති**. පු-ශ්‍රීපති, විෂ්ණු.

**සිරිවිලාස**. පු-ගර්‍වය, විභූතිය, අලංකාරය.

**සිරිවිවාද**. පු-සිරියහන් ගැබ පිළිබඳ විවාදය.

**සිරිසයන**. න-ශ්‍රී යහනය.

**සිරී**. ඉ-සොභාව, සම්පත්තිය, ශ්‍රීදෙවිය.

**සිරිස**. පු-මහරි රුක.

**සිරිවෙඨ**. පු-සරලද්‍රව.

**සිරිසඤ්ඤද**. පු-ලවඟ, දේවකුසුම.

**සිරිව්හාන**. න-ශ්‍රී දේවිය කැඳවීම.

**සිරොවෙඨන**. න - හිස්වෙළුම, නළල්පට, තලප්පාව.

**සිරොධරා**. ඉ-ග්‍රීවය, බෙල්ල.

**සිරොරුහ**. පු-කෙශය.

**සිරොමණි**. පු-සිළුමිණ.

**සිල**. d. භූ-උඤ්ඡෙ, සෙවීමෙහි, සිලති, සොයයි.

**සිල**. d. භූ-සමාධිමහි, සමාධියෙහි, සීලති, සමාදන් වෙයි.

**සිලාඝ**. d. භූ-කත්ථනෙ, ගුණකීමෙහි, සිලාඝති, ස්තුති කරයි, ගුණ කියයි.

**සිලාඝති**. ක්‍රි-(d. භූ. සිලාඝ, කත්ථනෙ, ගුණ කීමෙහි + ති) ගුණ කියයි, සතුති කරයි.

**සිලාඝන**. න-සතුති කිරීම.

**සිලාපොක්ඛරණී**. ඉ-ගල් පොකුණ.

**සිලාගු**. පු-පණුවුල්ලා.

**සිලාමය**. පු-ශෛලමය, ගලින් තිපන්.

**සිලිට්ඨ**. න-සිළුටු, මට්ටම, ගොරොසු නොවන

**සිලිස**. d. දි. ආලිඞ්ගනෙ, වැළඳ ගැන්මෙහි, සිලිස්සති, වැළඳ ගැණීමෙහි, සිලෙසො.

**සිලිස**. d. භූ-දහෙ, දැවීමෙහි, සිලෙසති, දවයි.

**සිලුච්චය**. පු-පර්‍වතය, පර්‍වත මුදුන, මස්තකය.

**සිලුත්ත**. පු-ගැරඬියා, ගැඩවිලා.

**සිලෙස**. d. චු-ආලිඞ්ගනෙ, වැළඳ ගැන්මෙහි, ඌනෙ, අඩුකිරීමෙහි, සිලෙසෙති, සිලෙසයති, වැළඳ ගණියි, අඩුකරයි.

**සිලෙස**. පු-එක්වීම, වැළඳ ගැන්ම, එනම් අලඞ්කාරය.

**සිලෙසුම**. පු-සෙම, සෙලසමාව.

**සිලොක**. පු-යසස, වර්ණ ගුණ කීර්ත්තනය, ශ්ලොකය.

**සිලොක**. d. භූ-රාසි කරණෙ, රැස්කිරීමෙහි, සිලොකයති, රැස්කෙරෙයි, සිලොකො.

**සිව**. පු-මහදෙවියා, ඊශ්වරයා.

**සිව**. න-උතුම්, ඉෂට, නිවණ, සැපය.

**සිවවිජ්ජා**. ඉ-සොහොනෙහි වාසය කරණ විද්‍යාව, සිවල් රුක විද්‍යාව, සිවලුන්ගේ නාදයෙන් ඇතිවන ඵලාඵල කීමේ විද්‍යාව.

**සිවා**. ඉ-කැණහිලා, නරියා.

**සිවාටිකා**. ඉ-පොත්ත, කුඩා හෙප්පුව.

**සිවි**. පු-එනම් රට.

**සිවිකා**. ඉ-සිවිගෙය, රන්සිවිගෙය.

**සිවු**. d. දි-තන්තුසන්තානෙ, නූල් ගැළපීමෙහි විවීමෙහි සිබ්බති, සිවයි, වියයි.

**සිවු** d. දි-ගමනෙ, සුසොසව, ගමනෙහිද වියලීමෙහිද සිබ්බති, යෙයි, වියලයි.

**සිසි**. d. භූ-චුම්බනෙ, ඉඹීමෙහි.

**සිසිර**. න-එනම් සෘතුව, හිම, සීතලය.

**සිස**. d. භූ-පීඩනෙ, පෙළීමෙහි, සිසසති, පෙළයි.

**සිස**. d. චු-අසබ්බප්පයොගෙ, අසර්‍ව ප්‍රයොගයෙහි, සෙසෙති සෙසයති, ඉතුරු කරයි. සෙසො.

**සිස්ස**. පු-ශිෂ්‍යයා, ගෝලයා.

**සිස්සති**. ක්‍රි-(d. චු. සිස, අසබබපපයොගෙ, අසර්‍ව ප්‍රයොගයෙහි + ති) අවසෙස වෙයි, ඉතුරු වෙයි.

**සිංස**. d. භූ-ඉච්ඡායං, කැමති වීමෙහි, ආසිංසති, කැමැති වෙයි.

(23525)

## සී

**සීකර**. පු-වාතයෙන් විසුරුවන ලද ජලය.

**සීඝ**. d. හ-දිත්තියං, බැබලීමෙහි, සීඝනොති, බබලයි.

**සීඝ**. න-ශීඝ්‍ර, වහා, හනික.

**සීඝවාහන**. පු-සීඝ්‍ර වාහනය, මොටෝරථාදිය,

**සීඝසර**. පු-වහා යන ජලධාරාව.

**සීත**. න-සීතල, සිසිල.

**සීතල**. න-සිහිල, ශීතලය.

**සීතරංසි**. පු-සිහිල් රැස් ඇත්තා, චන්ද්‍රයා.

**සීතා**. ඉ-හීවිට.

**සීතාලුක**. ති-සීතලට අවනතවන, සීතලට නැමෙන.

**සීතා ලොලි**. ඉ-නගුල් පහරින් ඇතිවන මඩ.

**සීති**. න-රුවල.

**සීතිභූත**. පු-සිහිල්වූ, ශීතලවනලද.

**සීදති**. ක්‍රි-(d. භූ. සීද, සීදනෙසු, ගිලීමෙහි + ති) ගිලා බසියි.

**සීදන්ත**. න-එනම් සාගරය.

**සීදන**. න-ගිලා බැසීම.

**සීදිස්සති**. ක්‍රි-(d. භූ. සීද, සීදනෙසු, ගිලීමෙහි + ස්සති) ගිලා බසින්නේය.

**සීන**. න-විනාශය, (ජලය ආදිය) මිදීම.

**සීපද**. න-බරවා රෝගය.

**සීපදික**. පු-බරවා රෝග ඇත්තා.

**සීභ**. d. භූ-ථොමනෙ, ගුණකීමෙහි, සීභති, ගුණ කියයි.

**සීමන්ත**. පු-ස්ත්‍රීන්ගේ කෙස් මැද පඩිති මාගීය.

**සීමන්තරික**. ති-සීමා අතර.

**සීමන්තනී**. ඉ-ස්ත්‍රිය, කාන්තාව.

**සීමා**. ඉ-අවධිය, ඉම, සීමාව, සතුතිය.

**සීමාසම්භෙද**. පු-සීමා භෙදය, ආචාරබිඳීම.

**සීර**. පු-නගුල.

**සීරඞ්ග**. න-නගුලිස.

**සීල**. d. චු ධාරණෙ, දැරීමෙහි, සීලෙති, සීලයති දරයි.

**සීල**. d. භූ-සමාධිමහි, සමාධියෙහි, සීලති, සමාධියට පැමිණෙයි.

**සීල**. න-සවභාවය, යහපත් පැවැත්ම, ශීලය.

**සීලකථා**. ඉ-ශීලය පිළිබඳ කථා කිරීම.

**සීලක්ඛන්ධ**. පු-සීල රාශිය, සිල්කඳ, සිල්රැස.

**සීලගන්ධ**. පු-සිල් සුවඳ.

**සීලබ්බත**. න-ශීල හා ව්‍රත.

**සීලබ්බතුපාදාන**. න-මිථ්‍යා ශීල ව්‍රතයන් ගෙන් ශුද්ධිය ලැබෙයයි ගැණීම.

**සීලමය**. පු-සිල්මුවා, සීලයෙන්ම සිදුවූ.

**සීලවත**. න-සීලබ්බත.

**සීලභෙද**. පු-සිල් බිඳීම, සීල විනාශය.

**සීලවන්ත**. පු-සිල්වත්, සිල් ඇති.

**සීලවිපත්ති**. ඉ-සීල භෙදය.

**සීලවිපන්න**. ති-සිල් විපතට පැමිණි, දුශ්ශීල.

**සීලසංවර**. පු-ශීලසංවරණය, ශීලසංරක්ෂණය

**සීලවිසුද්ධි**. ඉ-පිරිසිදු සීලය.

**සීලසම්පත්ති**. ඉ-පිරිසිදු සීලය.

**සීලවා**. පු-සිල් ඇත්තා, සිල්වතා.

**සීලවතී**. ඉ-සිල් ඇත්තී.

**සීලාචාර**. පු-සීලයෙහි හැසිරීම.

**සීලික**. පු-සිල් සවභාවය ඇත්තා.

**සීලිය**. න-වයඝීාව, කල්කිරියාව, හැසිරීම.

**සීලී**. පු-සිල්බව ඇත්තා.

**සිවථිකා** ඉ-අමුසොහොන, සොහොන.

**සීස**. න-හිය, මුදුන, මස්තකය.

**සීසකථාහ**. න-හිස් කබල.

**සීසච්ඡවි**. න-හිසේ සම.

**සීසචොල**. න-හිසේ බඳින රෙද්ද, තලප්පාව

**සීසවෙධනා**. ඉ-හිසේ කැක්කුම.

**සීහ**. පු-සිංහයා, සමාසව පරපදව සිටි කල්හි උත්තමාඪීයෙහි, හොඹුවගු.

(23583)

**සීහනාද**. න-සිංහස්වරය, අභීතනාදය, නිර්භීය නාදය.

**සීහකුණ්ඩල**. න-වටිනා කර්ණාභරණයක්.

**සීහචම්ම**. න-සිංහහම.

**සීහතෙල**. න-සිංහතෙල්.

**සීහප්පපාත**. පු-එනම් විල.

**සීහපතාක** න-සිංහකොඩිය.

**සීහපඤ්ජර**. න-මහාවාත පානය, කවුළුදෙර ජනෙලය.

**සීහපුච්ඡ**. ඉ-සිංහවාලධිය, පුස්වැන්න. පොල් පලා.

**සීහපොතක**. පු-සිංහපැටියා.

**සීහසෙය්‍යා**. ඉ-සිංහයාගේ සයනය, සිංහයාගේ සයනය වැනි සයනය, දකුණුපයපිට වංපය තබා දකුණු අතපිට හිසතබා දකුණු ඇලයෙන් සයනය කිරීම.

**සීහරථ**. පු-සිංහයන් විසින් අදිනු ලබන රථය.

**සීහවික්කීළිත**. පු-සිංහවික්‍රීඩිත.

**සීහස්සර**. පු-සිංහස්වරය.

**සීහල**. පු-සිංහලය, සිංහලද්වීපය, ලක්දිව.

**සීහලකුද්දල**. න-සිංහල උදැල්ල.

**සීහලදීප**. න-ලක්දිව, තාම්බපණ්ණිය.

**සීහලභාසා**. ඉ-හෙළ දිව්බස, සිංහල බස.

**සීහලක**. ති-සිහලට අයත්.

**සීහාසන**. න-සිංහාසනය, රාජාසනය.

**සීහුණ්ඩ**. පු-උක්ගස.

**සීල**. d. චු-කම්පනෙ, චලනයෙහි, සෙළෙති, සෙළයති, සැළෙයි

## සු

**සු**. අ-සොභන, සැප, අවිපරීතාර්ථ, සුභාර්ථ, සුන්දරාර්ථ, සමෘධිය යන මෙහි.

**සු**. d. භූ-ගමනෙ, යාමෙහි සවති, යෙයි.

**සු**. d භූ-සන්දනෙ, වහනය විමෙහි, සවති, වහනය වෙයි, වැගිරෙයි.

**සු**. d. භූ පසවෙ, ප්‍රශවයෙහි, සවති, පසවති. ප්‍රසූත කරයි.

**සු** d භූ-ගබ්භපරිපාකෙ, ගැබ්මිහිකිරීමෙහි, සූති, ගැබ් මුහු කරයි.

**සු** d. භූ. චුණ්ණෙ, සුණුකිරීමෙහි, සූති සුණු කරයි

**සූ**. d. දි. පසවෙ, ප්‍රශවයෙහි, සූයති, පසූයති, ප්‍රසූත කරයි.

**සු** d. සු සවණෙ, ශ්‍රවණයෙහි, සුණෙති සුණාති අසයි.

**සු**. d. සු-පීඩා බන්ධන සිනානෙසු, පෙළීම බන්ධනය ස්නාන යන මෙහි, සුණෙති.

**සු**. d. සු-පගබ්භෙ, බුහුටි බැව්හි, සුණෙති, බුහුටි වෙයි.

**සු**. d. කි-පීඩායං, පෙළීමෙහි, සුනාති, පෙළයි.

**සුක**. d. භූ. ගමනෙ, ගමනයෙහි, සොකති. යෙයි.

**සුංසුමාර**. පු-කිඹුලා.

**සුංසුමාරගිර**. න-එනම් රට.

**සුක** පු-ගිරවා

**සුකට**. න-මනාකොටකළ කර්මය, සුකෘත, සුකත.

**සුකත**. න-මනාව කළ කර්මය, කුශල කර්මය, සුකට.

**සුකති**. ති-කෘතපුණ්‍යයා, කළපින් ඇත්තා.

**සුකණ්ඩ**. පු-රතුලූණු.

**සුකර**. පු-සුවසේ කටයුතු, පහසු, ලේසි.

**සුකිත්තිත**. ති-මනාකොට කීර්තනය කළ, මොනවට කියන ලද.

**සුකුමාර**. ති-සිව්මැලි, මොලොක්දෙය, සුවසේ වැඩුනු.

**සුකුසල**. න-ඉතාදක්ෂ, අතිසමර්ථ,

**සුක්ක**. ති-සුදු, නිමල්, සිකුරා.

**සුක්ක**. න-පුණ්‍ය, ශුක්ල, ශුක්‍ර

(23629)

**සුක්කකාක**. පු-සුදු කවුඩා, කොකා.

**සුක්කධම්ම**. පු-නිර්මල ධර්මය, කුශල ධර්මය.

**සුක්කපක්ඛ**. පු-ශුක්ල පක්ෂය, හඳමෝරණ පක්ෂය.

**සුක්කසිස්ස**. පු- අසුරයා.

**සුක්ඛ** d. භූ-අනාදරෙ, අනාදරයෙහි, සුක්ඛති, අනාදර කරයි.

**සුක්ඛ**. ති-වියලුනු, වේලුනු.

**සුක්ඛන**. න-පලවා හැරීම. පදවා හැරීම.

**සුක්ඛිත**. ති-සුශික්ෂිත, මනාව හික්මෙනලද.

**සුඛ**. d. භූ-සුඛෙ, සැපකිරීමෙහි, සුඛති සුඛෙති සුඛයති සුඛාපෙති, සැප ඇති කරයි.

**සුඛ**. d. චු-සැපකිරීමෙහි, සුඛෙති සුඛයති. සැප කරයි.

**සුඛ**. ති-සැපය, පිණවීම.

**සුඛකාම**. ති-සැප කැමති, සුව කැමැති.

**සුඛවාහී**. පු-සුවයෙන් උසුලන අශ්වයා.

**සුඛවිහාර**. න-සැප විහරණය.

**සුඛල්ලිකානුයොග**. න-සැපවත් ජීවිතයක් ගතකිරීම.

**සුඛායති**. ක්‍රි-(d. භූ. සුඛ, තං ක්‍රියායං, සුඛ වෙදනාවෙහි+ති) ප්‍රීතිවෙයි, සැප විඳියි.

**සුඛිත**. ති-සුවපත්වන ලද.

**සුඛී**. පු-සුව ඇත්තා.

**සුඛුද්ද**. පු-සුඛුද්‍රය, සුව උපදවන.

**සුඛුම**. ති-සුක්ෂම, සියුම්දෙය, අල්පාර්ථයෙහි.

**සුඛුමාල**. පු-සුකුමාර, සිව්මැලි, සුවසේ වැඩුනු

**සුඛෙති**. ක්‍රි-(d. භූ. සුඛ තංක්‍රියායං, සුඛවෙදනාවෙහි+ණෙ+ති) සැප එලවයි.

**සුඛෙත්ත**. න-මනාක්ෂෙත්‍රය, හොඳ කුඹුර.

**සුඛෙධිත**. ති-සුවසේ වැඩුනු.

**සුගත**. පු-යහපත් ගමන් ඇත්තා, බුදුරජ.

**සුගතවිනය**. න-සුගතයන් වහන්සේගේ විනය ධර්මය.

**සුගති**. ඉ-මනාගතිය, සවර්ගතිය.

**සුගන්ධ**. පු-මනාගඳ, සුවඳ.

**සුගන්ධි**. පු-සුවඳ ඇති, සුගන්ධවත්.

**සුග්ගහණ**. න-මනාග්‍රහණය.

**සුග්ගත**. පු-සම්‍යග්ගත, මනාව පැමිණෙන ලද.

**සුග්ගති**. ඉ-සුගතිය.

**සුග්ගහිත**. පු-මනාකොට ගන්නා ලද, මනාව ගන්නා ලද.

**සුඝර**. ති-හොඳ නිවසක් ඇති, යහපත් ගෙයක් ඇති.

**සුච**. d. භූ-සොකෙ, සොක කිරීමෙහි, සොචති, සොක කරයි.

**සුචරිත**. න-යහපත් හැසිරීම, කුසලය.

**සුචි**. ති-පවිත්‍ර, නිර්මල, ධවල, සුදු පැහැය.

**සුචිකම්ම**. න-පවිත්‍ර ක්‍රියා, සුචරිත ක්‍රියා පින්කම්.

**සුචිණ්ණ**. ති-මනාකොට පුරුදු කරණ ලද්ද.

**සුචින්තිත**. ති-මනාකොට සිතන ලද.

**සුචිත්ත**. ති-නානාවර්ණ, විචිත්‍ර, නොයෙක් වර්ණවත් කොටස්වලින් යුත්.

**සුච්ඡන්න**. පු-මනාකොට වසන ලද.

**සුජ**. න-යාගසැන්ද.

**සුජන**. පු-යහපත් ජනයා, සත්පුරුෂ ජනයා

**සුජාත**. ති-මනාව හටගන්නා ලද.

**සුජාති**. ඉ-යහපත් ජාතිය.

**සුඞ්ක**. න-සුංකම, බදු අයකිරීම.

**සුඞ්කගහණ**. න-සුංකම් ගැණීම, බදු ගැණීම.

**සුඞ්කඝාත**. පු-සුංකම් නැසීම, රේන්ද මුදල් නොදීම.

**සුඞ්කඝාතට්ඨාන**. න-සුංකම් අය කරණ තැන.

**සුඞ්කික**. පු-අයබදු අය කරන්නා. රේගු නිලධාරියා.

**සුඞ්කිය**. න-බිරිඳට වැටුප් ගෙවීම.

**සුජ්ඣති**. ක්‍රි-(d. දි, සුධ, සොචෙය්‍ය, පිරිසිදු බැව්හි+ති) පිරිසිදු වෙයි. සුධ වෙයි.

**සුජ්ඣන**. න-පිරිසිදුවීම, සුධිය.

**සුජම්පති**. පු-සුජාතාවගේ හිමියා, සක්දෙව් රජ.

**සුජාතා**. ඉ-සුජාතාව, හෝම්හැන්ද.

**සුඤ්ඤ**. ති-සිස්දෙය, තුච්ඡදෙය, නිබ්බාණය, ඵස්ස විමොක්ඛ සමාධි සමපත්ති අනුපස්සනා.

**සුඤ්ඤතා**. ඉ-සූන්‍යතාව, හිස් බව.

**සුඤ්ඤාගාර**. න-සූන්‍යගෘහය, ගිහියන්ගෙන් තොරවූ ගෙය, මාගමුන් විරහිත ගෙය.

**සුට්ට**. d. චු-අනාදරෙ, අනාදරයෙහි, සුට්ටෙති සුට්ටයති. අනාදර කෙරෙයි.

**සුට්ඨු**. අ-අතිශය, ප්‍රශස්ත, යහපත්, ප්‍රශංසා

**සුට්ඨුතා**. ඉ-මනාබව.

**සුඨ**. d. භූ-ගමනාවරණෙ, ගමන්වැලක්මෙහි, සොඨති, ගමන් වලකී.

**සුඨු**. d. චු-ආලස්‍යෙ, අලස බැව්හි, සොඨෙති සොඨයති. අලස වෙයි.

**සුඨි** d. භූ-සුකෙක, වියලීමෙහි, සුණ්ඨති, වියලයි.

**සුඨි**. d. චු-සොකෙ, වියලීමෙහි, සුණ්ඨෙති, සුණ්ඨයති, වියලෙයි, වේලෙයි.

**සුණ්ඨී**. ඉ-වියලි ඉඟුරු.

**සුණ්හා**. ඉ-යෙහෙළී, ලේලි.

**සුණ**. පු-සුනඛයා, බල්ලා.

**සුණ**. d. භූ-වජ්ජනෙ, පහ කිරීමෙහි, සුණති, පහ කරයි.

**සුණන**. න-ශ්‍රවණය, ඇසීම.

**සුණිසා**. ඉ යෙහෙළි, ලේලි.

**සුත්ත** න-ජිනවචනය, සිද්ධාන්තය, හුය, වියරණෙහි ප්‍රකාශිත සූත්‍රය, නවාඞ්ග ශාස්තෘ ශාසනයෙන් එකක් වූ සූත්‍රාඞ්ග ධර්මය.

**සුත්ත**. d. චු-මොචනෙ, මිදීමෙහි, සුත්තෙති සුත්තයති, මිදෙයි.

**සුත්ත**. ති-නිද්‍රොපගතයා, නිදාගැන්මට පැමිණියා.

**සුත්තගුළ**. න-නූල් බෝලය.

**සුත්තන්ත** පු-සූත්‍රාන්තය, සූත්‍රපිටකය, බුද්ධ වචනය.

**සුත්තප්පබුද්ධ**. පු-නිදා පිබිදි තැනැත්තා.

**සුත්තන්තික**. පු-සූත්‍ර හදාරන්නා, සූත්‍රපිටකය හදාරණ තැනැත්තා.

**සුත්තකාර**. පු-රෙදි වියන්නා, පෙහෙකරුවා

**සුත්තජාල**. පු-නූල් දැල, මදුරු දැල.

**සුත්තභික්ඛා**. ඉ-නූල් සිඟමනේ යෑම.

**සුත්තමය**. ති-නූල්වලින් තැනූ.

**සුත්තරජ්ජුක**. නූල් පට.

**සුත්තලූඛ**. පු-ඝනව වියූ (රෙදි)

**සුත්තවාද**. පු-සර්වාස්තිවාදී කොටසක්.

**සුත්තවිභඞ්ග**. පු-විනය පිටකය.

**සුත්තක**. පු-නූල, කෙන්ද, පටිය, තන්ත්‍රිය, වැල.

**සුත්ති**. ඉ-බෙල්ලා, සිප්පි බෙල්ලා

**සුත්වා**. අ-අසා, ශ්‍රවණය කොට.

**සුත්තවෙඨන**. න-පිළි වියන හරස් දණ්ඩ.

**සුත**. ති-ගමන, ප්‍රසිද්ධ, නිශ්චිත, උපචිත, අනුයොග තෙන් දෙය.

**සුත**. පු-පුත්‍රයා, දරුවා.

**සුත**. න-ශ්‍රොත්‍ර විඥෙය වූ ශබ්දය, ශාස්ත්‍රය, අසන ලද,

**සුතමඞ්ගල**. න-අසන ලද්ද මංගල යයි ගැණීම.

**සුතහීන**. පු-බිහිරා, බධිරයා, බීරා.

**සුති**. ඉ-ශබ්දය, වේදය, වැහීම.

**සුථ**. d. භූ-පීඩායං, පීඩාවෙහි, සොථති, පීඩා කරයි.

**සුදං**. අ-පද පූරණයෙහි යෙදෙන නිපාතයකි.

**සුදත්ත**. පු-එනම් තැනැත්තා, අනේපිඩු සිටුතුමා.

**සුදස්සන**. න-මනා දර්ශනය, දර්ශනීය වස්තු.

**සුදස්සන**. පු-එනම් කූට පර්වතය, හිමවත්හි සුදර්ශන නම් පර්වත කූටය.

**සුදන්ත**. පු-මනාකොට දැමුනු.

**සුදිට්ඨ**. පු-මනාකොට දක්නා ලද.

**සුදුජ්ජය**. පු-ඉතා දුකසේ දිනිය යුතු.

**සුදුත්තර** ති-ඉතා අමාරුවෙන් එතෙර විය යුතු.

**සුදුද්දස**. න-අතිශයින් නොදතහැකි වස්තුව, නිවණ.

(23786)

**සුද්ද**. පු-ශුද්‍රයා, අනන්තවර්ණියා, නීචයා.

**සුදින්න**. ති-මනා කොට දෙන ලද

**සුදුල්ලභ**. පු-ඉතාමත් දුර්ලභ, නොලැබිය හැකි.

**සුදෙසිත**. ති-මනාකොට දෙශනා කරණ ලද, මොනවට දෙසූ.

**සුධ**. ති-පිරිසිදු, අමිශ්‍ර.

**සුධපීති**. ඉ-සුද්ධාවාසයන්හි ඇති ප්‍රීතිය.

**සුධබුධි**. ඉ-කෙලෙසුන්ගෙන් වෙන්වූ බුද්ධිය.

**සුධසංඛාරපුඤ්ජ**. පු-හුදු සංස්කාර රාශිය.

**සුධාවාස**. පු-පඤ්චවු සුධාවාසය, අවිහය, අතප්පය, සුදස්සය, සුදස්සීය, අකනිට්ඨක යන අනාගාමි පුද්ගලය උපදින තැන්.

**සුධන්ත**. පු-රජහුගේ අන්තඃපුරය, රාජාවරොධය.

**සුධන්තපරිවාස**. පු-භික්ෂූන්ට නියම විනය ක්‍රමයක්.

**සුධාජීව**. පු-පිරිසිදු ආජීවය, ශික්ෂාපද නොඉක්මවා දැහැමින් ජීවත් වීම.

**සුධි**. ඉ-ශුද්ධිය, පාරිශුද්ධිය.

**සුධිමග්ග**. පු-පිරිසිදු මාර්ගය, විසුද්ධි මාර්ගය.

**සුධික**. ති-පවිත්‍රත්වය පිළිබඳ, පිරිසිදු කම පිළිබඳ.

**සුධිකපටිපදා**. ඉ-පව් වලින් පිරිසිදුවීමේ ප්‍රතිපදාව.

**සුධොදනි**. පු-සුධොදන මහාරාජ පුත්‍රයා, ගෞතම බුදු රජ.

**සුධ**. d. දි-සුධෙ, පිරිසිදු කිරීමෙහි, සුජ්ඣති විසුජ්ඣති, පිරිසිදු වෙයි.

**සුධා**. ඉ-අමෘතය, ආලොකය, දෙවියන්ගේ ආහාරය, මී, ගඟ, විදුලිය, ජලය, සුණු.

**සුධාඞ්ග**. න-කපුරු, චන්ද්‍රයා.

**සුධාකම්ම**. න-සුණු පිරියම් කිරීම.

**සුධාධවල**. න-අමෘතය මෙන් සුදු, කපුරු මෙන් සුදු.

**සුධාසී**. පු-දෙවියෝ.

**සුධානිධි**. ඉ-චන්ද්‍රයා, කපුරු.

**සුධී**. පු-ප්‍රාඥයා, පණ්ඩිතයා, යහපත් ප්‍රඥා ඇත්තා.

**සුධාභොජන**. න-අමෘත භොජනය, දිව බොජුන්.

**සුධාංසු**. පු-ධවල රශ්මි ඇත්තා, චන්ද්‍රයා.

**සුධාහාර**. පු-අමෘතාහාරය, ගුරුළා.

**සුධොත**. පු-මනාකොට පිරිසිදු කරණ ලද.

**සුන**. d. භූ සද්දෙ, ශබ්දයෙහි, සුනති, ශබ්ද කරයි.

**සුන**. පු-සුණඛයා, බල්ලා.

**සුනඛ**. පු-සුණඛයා, බල්ලා.

**සුනඛරක්ඛ**. පු-බල්ලන් ආරක්ෂකයා.

**සුනඞ්ගවෙල්ලිත**. ති-කොණ්ඩයේ අග ලක්ෂණට සැරසීම් සහිත.

**සුනන්දී**. ඉ-ප්‍රීතිවීම, සතුටුවීම.

**සුනහාත**. ති-යසට ස්නානය කළ.

**සුනාසිර**. පු-ශක්‍රයා, සක්දෙව්රද.

**සුනිම්මල**. ති-පවිත්‍ර, පිරිසිදු, නිර්මල.

**සුනිසන්නක**. න-කිඹුල්වැන්න.

**සුනිසිත**. ති-මනාකොට මුවහත් කළ.

**සුනීත**. පු-මනාව හික්මෙන ලද, මනාව පමුණුවන ලද.

**සුන්දර**. ති-සිත්කලු දෙය.

**සුන්දරී**. ඉ-ස්ත්‍රිය, යහපත් ස්ත්‍රිය, සුන්දරිය.

**සුප්ප**. පු-කුල්ල, නිද්‍රාව.

**සුප්පක**. න-සෙල්ලම් කුඩයක්.

**සුප්පකණ්ණ**. පු-කුලුවැනි කණ් ඇත්තා, ඇතා.

**සුප්පකාස**. ති-මනා ප්‍රකාශය.

**සුප්පගබ්භ**. පු-අතිශයින් ප්‍රගල්භයා.

**සුප්පතිට්ඨිත**. ති-මනාකොට පිහිටි, යහපත් ලෙස පිහිටි.

**සුප්පටිවිද්ධ**. ති-මනාව ප්‍රතිවෙධනය කළ.

**සුප්පටිපන්න**. පු-මනාව පිළිපන්, සුපටිපන්න.

**සුප්පණීත**. පු-අතිශය ප්‍රනීත, එතම දිගැතා.

**සුප්පබුද්ධ**. පු-මනාකොට ප්‍රබොධ වන ලද.

**සුප්පභාත**. න-හොඳ උදය, යහපත් උදෑසන.

(23790)

**සුප්පමුත්ත**. ති-මනාකොට මිදුනු, හොඳට මිදුනු.

**සුප්පමෙය්‍ය**. පු-ප්‍රමාණ රහිත, අප්‍රමාණ.

**සුප්පයුත්ත**. ති-මනා කොට යොදන ලද, හොඳට යෙදූ.

**සුප්පවායිත**. ති-මනා කොට වියන ලද, හොඳට වියූ.

**සුප්පවුත්ථ**. පු-මනා කොට වාසය කරණ ලද, හොඳට වසන ලද.

**සුප්පසන්න**. පු-මනා ප්‍රසන්න, මනාව පැහැදුනු.

**සුප**. d. භූ-සයනෙ, සැතපීමෙහි, සුපති. නිදයි.

**සුප**. d. චු-මාණනෙ, මැණීමෙහි, සුපෙති, සුපයති, මණියි.

**සුප**. d. තු-සයනෙ, නිදීමෙහි, සුපති, නිදයි.

**සුපණ්ණ**. පු-ගුරුළා, ගරුඬ පක්ෂියා.

**සුපණ්ණසාලා**. ඉ-ලක්ෂණ පැල, කදිම කුටිය.

**සුපති**. ක්‍රි-(d. භූ. සුප, සයනෙ, නිදීමෙහි +ති) නිදයි

**සුපථ**. පු-යහපත් මාර්ගය.

**සුපනිහිත**. ති-මනා කොට පිහිටුවන ලද.

**සුපතිත්ථ**. න-හොඳ තීර්ථය, මනා තොටුපොල.

**සුපන**. න-සැතපීම, නිද්‍රාව.

**සුපබ්බාණ**. පු-දෙවියෝ.

**සුපාපික**. ති-නපුරු, පව්කාර, කෲර, අධම.

**සුපිණ**. න-සවප්නය, නින්ද.

**සුපායිත**. ති-හොඳට පෙවූ, මනා කොට එක් කළ

**සුපාසිය**. ති-පහසුවෙන් ඉදිකටුවට නූල් ඇතුල් කළ.

**සුපිත**. ති-සයනය කළ, නිදා ගත්.

**සුපිණ පාඨක**. පු-ස්වප්නයෙහි ශුභාශුභ කියන්නා.

**සුපීත**. ති-මනාව පානය කළ, මොනවට බොන ලද.

**සුපොසිත**. පු-මනාව පොෂිකරණ ලද, හොඳහැටි පොෂි කළ.

**සුබ්බච**. පු-සුවච, කීකරු.

**සුබ්බත**. පු-මනාව්‍රත ඇත්තා, යහපත් හැසිරීම් ඇති.

**සුබ්බුට්ඨි**. ඉ-(සු + වුට්ඨි) මනා වර්ෂාව.

**සුභ**. d-ඔභාසෙ, බැබලීමෙහි, සොභති, බබලයි, හොබියි.

**සුභ**. d. රු-හිංසායං, ගැසීමෙහි, සුම්භති, ගසති, පරිසුම්භති.

**සුභ**. ති-සිත්කලු දෙය, කල්‍යාණය.

**සුභකිණ්ණ**. (ණ්හ) එනම් බඹලොව.

**සුභග**. ති-ප්‍රිය දෙය, එනම් උයන, වාසනාවත්.

**සුභගකරණ**. න-ප්‍රීතිමත් කිරීම, ආදරය කරණ.

**සිභට්ඨායී**. පු-යස හා කීර්තියෙන් යුත් තැනැත්තා.

**සුභ ධාතු**. ඉ-ශොභාව පිළිබඳ ද්‍රව්‍ය මූලය.

**සුභනිමිත්ත**. න-සුභාරම්මණය. යහපත් අරමුණ.

**සුභසඤ්ඤා**. ඉ-සුභසංඥාව.

**සුභාවිත**. ති-මනාකොට වඩනා ලද, මොනවට භාවිතා කළ.

**සුභාසිත**. ති-මනාකොට කියන ලද, මනා කොට වදාළ වචනය.

**සුම්භ**. d. භූ-දිත්තියං, බැබලීමෙහි, සුම්භති, බබලයි, හිංසා කරයි.

**සුම්භති**. ක්‍රි-(d. භූ. සුම්භ, දිත්තියං, බැබලීමෙහි + ති) බබලයි, හිංසා කරයි.

**සුම්භිත**. ති-බබලන ලද

**සුම්භන** න-බැබලීම, හිංසාව.

**සුමති**. ඉ-යහපත් ප්‍රාඥයා, මනාමැටි.

**සුමන**. න-සතුටු සිත් ඇත්තා, දෙවියා.

**සුමනා**. ඉ-දෑසමන්.

**සුමරති**. ක්‍රි-(d. භූ. සර, චින්තායං, සිහි කිරීමෙහි + ති) සරති, සිහිකරයි.

**සුමෙධ**. පු-ප්‍රාඥ, මනා ප්‍රඥ ඇත්තා, එනම් ඇත්තා.

**සුමෙරු**. පු-මහමෙර, මෙරුපර්වතය.

(23840)

**සුසිට්ඨ.** ති-මනාකොට පුදනලද.

**සුර.** d. භූ-යසෙ, ඔභාසෙච, ඓශ්වය්‍ය්‍යීයෙහි, බැබලීමෙහි සුරති, ඉසුරු ඇතිවෙයි, බබලයි.

**සුර.** පු-දෙවියා.

**සුරජෙට්ඨ.** පු-සුරජ්‍යෙෂ්ඨ, බ්‍රහ්මයා.

**සුරත.** ති-මනාව ඇලෙනලද, මෛථුනිදම.

**සුරදිෂ.** න-අසුරයා.

**සුරදීසිකා.** ඉ-අහස්ගඟ. සුරගඟ.

**සුරනදී.** ඉ-අහස් ගඟ.

**සුරනාථ.** පු-සුරපති, ශක්‍රයා.

**සුරපති.** පු-සුරනාථ, සක්රදෙ.

**සුරපථ.** පු-දෙවමාර්ගය, අහස.

**සුරභි** ති-සුගන්ධය, සුවඳ.

**සුරරිපු** පු-සුරශත්‍රු, අසුරයා.

**සුරලොක.** පු-දෙව්ලොව, සුරභවනය.

**සුරා.** ඉ-රා, මත්පැන්.

**සුරාමත.** න-මත්පැන් බීමෙන් වන මත් ගතිය,

**සුරාගෙහ.** න-රාබොන ගෙය, තැබෑරුම.

**සුරාධුත්ත.** පු-සුරාධූර්ත්තයා, සුරාසොඬා

**සුරාබිටක්ක.** පු-සුරාවට ඇබ්බැහි වූ තැනැත්තා.

**සුරාපාන.** න-රහමෙරපීම, මත්පැන් පානය.

**සුරාපීත.** ති-රා බොනලද,

**සුරාජන.** න-සුරාපානය සහිත උත්සවය.

**සුරාමද.** පු-රා මදය, රා මද, මත්පැන් මත.

**සුරාමෙරය.** න-සුරාව හා මෙරය.

**සුරාවිෂාක.** න-සුරා බොන භාජනය, රා පොල් කටුව.

**සුරාමණ්ඩ.** න-සුරා මණ්ඩි, රා මණ්ඩි.

**සුරාසොණ්ඩ.** පු-සුරාසොඬා, මත්පැන්හි ඇළුණු තැනැත්තා,

**සුරානක්ඛත්ත.** න-සුරා නැකැත්කෙළිය, සුරාපාන උත්සවය.

**සුරිය.** පු-සූය්‍ය්‍යීයා, හිරු, ඉර.

**සුරියත්ථඞ්ගමන.** න-ඉර බැසීම, ඉර අවරට යෑම.

**සුරියකන්ත.** න-එනම් මැණික.

**සුරියග්ගාහ.** පු-සූය්‍ය්‍යීග්‍රහණය, හිරු රාහු ගැන්ම

**සුරියමණ්ඩල.** න-සූය්‍ය්‍යීමණ්ඩලය.

**සුරියවත්තික.** පු-හිරුදෙවියා පුදන්නා,

**සුරියසිඤ්ජසඞ්ගම.** පු-සූය්‍ය්‍යීචන්ද්‍ර සඞ්ගමය, සූය්‍ය්‍යී චන්ද්‍ර දෙදෙනාගේ එක්වීම, අවපසළොස්වක් දින.

**සුරියුග්ගමන.** න-හිරු උදාව, ඉර පෑයීම.

**සුරියාවත්ත.** සූය්‍ය්‍යීකාන්ත නම් ප්‍රසිද්ධ මල්වර්ගය අභි-252.

**සුරු.** අ-සුරු සුරු යන අනුකරණ ශබ්දය.

**සුරුසම්බ.** පු-වජ්‍රායුධය.

**සුරුඞ්ග.** න-අනතර් භෞම මාර්‍ගය, පොළොව යට පිහිටි මඟ.

**සුරුසුරුකාර.** පු-සුරුසුරු යන අනුකරණ ශබ්ද කිරීම.

**සුලල.** d. චු-සජ්ජනෙ, සැරසීමෙහි, සුලෙලති සුලලයති, සරසයි.

**සුල** d. භූ-රුජායං, රිදීමෙහි, සුලති, රිදෙයි.

**සුලබ.** ති-මනාකොට ලබන ලද,

**සුලසී.** ඉ-බෙහෙත් පැලෑටි විශෙෂයක්.

**සුව.** පු-ගිරා පක්ෂියා, ගිරව,

**සුබච.** පු-කීකරු, සුබබච,

**සුවණ්ණ.** පු-සවර්ණය, වර්ණසම්පත්තිය, පස් කලඳක බර, ගුරුලා.

**සුවණ්ණ.** න-කාඤ්චන, රත්රන්, යහපත් වර්ණය.

**සුවණ්ණක.** පු-ඇසළ ගස.

**සුවණ්ණකාර.** පු-රන්කරුවා, තවම් දන්නා, රිදී රන් වැඩ කරන්නා.

**සුවණ්ණජනක.** න-රන් ඔටුන්න, සුවර්ණ කිරීටය.

**සුවණ්ණපාදුකා.** ඉ-රන්මිරිවැඩි සඟල.

**සුවණ්ණමය.** ති-රත්රන්වලින් කළ, රන්මුවා.

**සුවණ්ණපක්ඛ.** පු-රත්වත් පක්ෂි ඇත්තා, ගුරුලා.

**සුවණ්ණපට්ට.** න-රන්පට.

**සුවණ්ණි.** අ-ආසිංසනයෙහි, ඉෂ්ටාර්ථය, යහපත.

**සුවණ්ණවීථි.** ඉ-රන්වීදිය, ශක්‍රයාගේ නගරය

**සුවණ්ණමෙණ්ඩක.** පු-රන් එළුවා.

**සුවණ්ණසිවිකා.** ඉ-රන්සිවි ගෙය.

**සුවණ්ණහංස.** පු-රන්වන් හංසයා, රණහස.

**සුවල්ලි.** ඉ-බෝදිගස්.

**සුවාණ (න).** පු-බල්ලා.

**සුවාණදෝණි.** ඉ-බල්ලන්ට කෑම දෙන බඳුන.

**සුවාණපිණ්ඩ.** න-බල්ලන්ට දෙන කෑම පිඩ.

**සුවාණවමථු.** න-බලු වමනය.

**සුවිජාන.** න-මනාකොට දැනීම.

**සුවිඤ්ඤාපය.** පු-මනාකොට හැඟවිය හැකි.

**සුවිදිත.** ති-මනාව දන්නාලද, හොඳට දැනගත්

**සුවිලිත්ත.** ති-මනාකොට ආලෙපකරණ ලද මනාව ගල්වන ලද.

**සුවෙ.** අ-සෙට, හෙට, හෙට දවස.

**සුදි.** d. භූ-සොභතෙ, සොබාවෙහි, සුන්දති, සොබාමත් වෙයි.

**සුසංවුත.** පු-මනාසංවෘත කරණ ලද, මනාකොට සංවරණය කරණ ලද.

**සුසද්දල.** පු-මනාකොට වැඩුනු තිල්තෘණ ඇතිභූමිය.

**සුසමා.** ඉ-උතුම් සොභාව, ශ්‍රෙෂ්ඨ කාන්තිය

**සුසමාරුළ්හ.** පු-මනාව පටන් ගන්නා ලද.

**සුසමාහිත.** පු-මනාව සංසිඳුවන ලද.

**සුසවි.** ඉ-කරවිල.

**සුසාන.** න-සොහොන, කැරකෝප්පුව,

**සුසානගොපක.** පු-සොහොන් රකින්නා, සොහොන්ගොව්වා.

**සුසානික.** පු සොහොනෙහි රැකියාවක් කරන්නා, සොහොන් පල්ලා.

**සුංක.** න-සුංකම්, අයබදු.

**සුසික්ඛිත.** ති-මනාව හික්මුණු, හොඳට හික්මුණු.

**සුසිර.** න-සිදුර, සිදුරු සහිතදේ, තූර්‍ය්‍යවිශේෂයක්.

**සුසි.** ඉ-සිදුර, පැල්ම, විවරය.

**සුසීත** න-රත්වන් සඳුන්, අධික සීතලය

**සුසු.** ති-තරුණයා, පැටියා, ළපැටියා.

**සුසුනාග.** පු-ඇත් පැටියා, ළදරු ඇතා.

**සුසුක.** පු-කිඹුලා, බාලයා, මත්ස්‍ය විශෙෂයක්

**සුසිලොම.** න-ඉදිකටු වැනි ලොම් ඇත්තා, එනම් යකා.

**සුසජ.** පු-සුහද, සුහෘදයා

**සුසෙනිකා.** ඉ-කලුත්‍රාසනවාලු.

**සුසෙන.** පු-කරඹ ගස.

**සුස්සති.** ක්‍රි-(d. දි. සුස, සොසනෙ, වියලීමෙහි + ති) වියලෙයි, වේලෙයි.

**සුස්සන.** න-වේලීම වියලීම.

**සුස්සූස.** ති-ඇසීමට කැමැති, ඉගෙණීමට ආශා ඇති.

**සුස්සූසා.** ඉ-අසනු කැමැත්ත, පාරිචය්‍යාව අත්පා මෙහෙකිරීම.

**සුස්සුත.** පු-මනාකොට අසනලද, මනාව ශ්‍රවණය කළ.

**සුහතා.** ඉ-ප්‍රීතිමත් භාවය, ප්‍රීතිය, සතුට.

**සුහද.** පු-මිත්‍රයා, සුහෘදයා, යාලුවා.

**සුහිත.** න-තෘප්තියට පැමිණි, මනා හිත ක්‍රියා.

## සූ

**සූක.** න-නන්ඩුව, කොස්ස, සාලිසූක. යවසූකාදිය.

**සූකර.** පු-ඌරා, හූරා.

**සූකරඅන්තක.** පු-බඳපටි-හවඩි හා මෙඛලා දම ආදි ආභරණ විශෙෂයක්.

**සූකරපොතක.** පු-ඌරු පැටවා, ඌරු තාම්බා

**සූකරමංස.** න-ඌරු මස්.

**සූකරමද්දව.** පු-ඌරෙකුගේ මෘදු මාංසය, ඌරන් ලැගි තැන හටගන්නා හතු වර්‍ගයක්, එනම් බෙහෙතක්. (23949)

**සූකරසාලි.** ඉ-ඌරුහැල්, කැලේ හැදෙන ඇල්වී විශෙෂයක්.

**සූකරික.** පු-ඌරන් මරා ජීවත් වන්නා, ඌරු වැද්දා.

**සූකසාලික.** නි-ඌරු හැල් වලට අයිති.

**සූච.** d. චු-පිසුණෙ, කේලාම් කීමෙහි,

**සූච.** d. චු. පිසුණෙ, කේලාම් කීමෙහි, සූචෙති සූචයති, පිසුණු කියයි.

**සූච.** d. චු ගන්ථනෙ, ග්‍රන්ථනයෙහි, සූචෙති සූචයති, ග්‍රන්ථනය කරයි. ගොතයි

**සූචක.** පු-කේලාම් කියන්නා

**සූචන.** න-දැක්වීම, ප්‍රදර්ශනය කිරීම.

**සූචි.** ඉ-ඉඳිකටුව, හිඳිකටුව.

**සූචිකාරක.** පු-ඉඳිකටු සාදන්නා

**සූචිඝටිකා.** ඉ-යතුර හා උඩ අගුල.

**සූචිඝර.** න-ඉඳිකටු ගුලාව, ඉඳිකටු තැන්පත් කරණ භාජනය.

**සූචිනාලිකා.** ඉ-ඉඳිකටු දැමීමට උණ ලීවලින් සාදනුලබන බම්බු වර්ගයක්.

**සූචිමුඛ.** පු-ඉඳිකටු වැනි මුඛ ඇත්තා, මදුරුවා

**සූචිමුඛසාණ.** ඉ-ඉඳිකටු වැනි මුහුණක් ඇත්තා.

**සූචිලොම.** පු-සූචිලෝමයා, සූචි රෝමයා.

**සූචිලොමයක්ඛ.** පු-එනම් යක්ෂයා.

**සූචිලොමවත්ත.** පු-ඉඳිකටුවක් වැනි කටක් ඇත්තා.

**සූචිලොමවාණිජක.** පු-ඉඳිකටු වෙළෙන්දා.

**සූචිකා.** ඉ-යතුර.

**සූජු.** නි-සෘජු, කෙළින්, අවංක.

**සූණ.** ඉ-මස් ලොඹුව, මස් තබා කපන කොටය.

**සූත.** පු-රියදුරා, වන්දිභට්ටයා, රසදිය.

**සූති.** ඉ-ප්‍රසූතිය, දරුවන් වැදීම.

**සූතිඝර.** න-තිඹිරිගෙය, වදනා ගෙය, පසූතිඝර

**සූද.** d. භූ-පග්ඝරණ, වැගිරීමෙහි, සූදති, වැගිරෙයි.

**සූද.** d. චු-පග්ඝරණෙ, වැගිරීමෙහි, සූදෙති සූදයති, වැගිරෙයි.

**සූද.** පු-අරක්කැමියා, සූදයා

**සූදක.** පු-සූදයා, අරක්කැමියා, කෝකියා.

**සූන.** පු-බල්ලා, සුනඛයා.

**සූනු.** පු-පුත්‍රයා, පුතා.

**සූප.** පු-ව්‍යඤ්ජනය, මාලුව, කොමු

**සූපකාර.** පු-අරක්කැමියා, හතන කාරයා.

**සූපව්‍යඤ්ජන.** න ව්‍යඤ්ජන, මාලුව.

**සූපධාපිත.** නි-මනාකොට පරීක්ෂා කළ ප්‍රසිද්ධ ප්‍රකට.

**සූපික.** පු-අරක්කැමියා, උයන්නා.

**සූර.** d. චු-වික්කමෙ, වික්‍රමයෙහි, සූරෙති, සූරයති, වික්‍රමකම් කරයි.

**සූර.** පු-සූරයා, වියසීවන්තයා, හිරු ඉරු, යොධයා.

**සූරකථා.** ඉ-සූරයන් පිළිබඳ කථා.

**සූරත.** නි-කරුණා සමපන්නයා, කුළුණු ගුණැත්තා.

**සූරභාව.** පු-ශූරබව, දක්ෂභාවය.

**සූරසුත.** පු-හිරුපුත්‍රයා, අරුණ.

**සූරකාක.** පු-කෛරාටික කපුටා.

**සූල.** d. භූ-රුජායං, රුදුවෙහි, සූලති රිදෙයි සූලං.

**සූල.** න-උල, රුජාව, රුදුව, ආයුධ විශෙෂයක්.

**සූලි.** පු-ඊශ්වරයා, මහදෙවියා.

**සූපෙය්‍ය.** න-සුප්, බොන හොද්ද.

**සූපෙය්‍යසාක.** න-ව්‍යඤ්ජන පිණිස ගන්නා පලා වර්ග.

**සූපෙය්‍යපණ්ණ.** න-ව්‍යඤ්ජන සඳහා ගන්නා කොළ වර්ග.

**සූරි.** නි-දක්ෂ, ව්‍යක්ත.

**සූරිය.** නි-වික්‍රමය, නිර්භීතකම, ධෛර්‍යය.

**සුසුයති.** ක්‍රි-(d. භූ. සු. සද්දෙ ශබ්දකිරීමෙහි + ති) සුසු යන ශබ්ද කරයි.

(24000)

## සෙ

**සෙ.** d. භූ-ඛයෙ, ක්‍ෂයවීමෙහි, සියති, ක්‍ෂය වෙයි.

**සෙ.** d. භූ-පාකෙ, පිසීමෙහි, සෙති, පිසයි.

**සෙ.** d. භූ-ගමනෙ, යාමෙහි, සෙති, යයි.

**සෙ.** d. භූ-ඛයෙ, ක්‍ෂය වීමෙහි, සායති, ක්‍ෂය වෙයි.

**සෙක්ඛ.** පු-ශෛක්‍ෂයා, හික්මෙන්නා.

**සෙක.** පු-ජීවක ද්‍රව්‍යය.

**සෙක.** d. භූ-ගමනෙ, යාමෙහි, සෙකති, යෙයි.

**සෙඛ.** d. භූ-සෙවනෙ ඉසීමෙහි, සෙවති, ඉසියි.

**සෙඛ.** පු-හික්මීම සහිත පුද්ගලයා, රහත් ඵලය හැර ඉතිරි මගපලයන්ට පැමිණි පුද්ගලයා, සප්තවිධ ආගයීයා.

**සෙඛර.** පු-මුදුන් මල්කඩ, කිරීටයෙහි පළඳින මල්කඩ.

**සෙඛබල.** න-ශෛක්‍ෂබලය.

**සෙඛරා.** ඉ-මුදුන් මල්කඩ.

**සෙඛරිකා.** පු-සැබෝගස.

**සෙඛරික.** පු-සැබෝ.

**සෙඛසම්මත.** පු-ශෛක්‍ෂයයි සම්මත කරගත්තා ලද.

**සෙඛියධම්ම.** පු-ශෛක්‍ෂධර්මය.

**සෙඛිය.** පු-හික්මියයුතු, හික්මීමට සුදුසු

**සෙගාලක.** පු-සිවලුන්ට අයිති, සිවලුන් පිළිබඳ.

**සෙචනක.** පු-ඉසින්නා, සේවකයා.

**සෙචන.** න-ඉසීම, දිය ඉසීම.

**සෙච්ඡාචාරී.** පු-(සක+ඉච්ඡාචාරී) සෙච්ඡා චාරියා, සිය කැමැත්තෙන් හැසිරෙන්නා.

**සෙට්ඨ.** ති-ශ්‍රෙෂ්ඨ, උතුම්, බුදුරජ

**සෙට්ඨතර.** පු-ශ්‍රෙෂ්ඨතර, අතිශයින් උතුම්.

**සෙටකී.** ඉ-අලු, ඡාරිකා.

**සෙට්ඨි.** පු-සිටුවරයා, සිටාණෝ, සිටුහු.

**සෙණි.** පු-උකුස්සා.

**සෙණිමොක්ඛ.** පු-සෙණ ශ්‍රෙෂ්ඨයා, සෙණාධිපතියා.

**සෙණිය.** පු-සෙණා ඇත්තා.

**සෙණි.** ඉ-සමාන ශිල්පීන්ගේ සමූහය, තුරු පෙළ.

**සෙත.** පු-සුදු, රිදී.

**සෙතක.** ති-සුදු, විනිවිද පෙනෙන

**සෙතකම්ම.** න-සුදුහුණු ගෑම, සුදුපාට කිරීම.

**සෙතකුට්ඨ.** පු-සේවත කුෂ්ඨය, කබර.

**සෙතකෙතු.** පු-සර්ඥයන් වහන්සේ.

**සෙතගෙරු.** න-පැලෑටි වර්ගයක්.

**සෙතච්ඡත්ත.** න-සුදු කුඩය, රජුන්ගේ සේසත.

**සෙතපච්ඡාද.** පු-රථ මතුයෙහි එලන ඇතිරිලි.

**සෙතච්ඡද්ද.** පු-හංසයා.

**සෙතට්ටි=ටකිකා.** ඉ-ශස්‍ය රෝග විශෙෂයක්, ගොයම් පැල සුදුපාට වී වේලී යන ගොයම් රෝගයක්.

**සෙතම්බ.** පු-ඇවඹ ගස.

**සෙතකම්බල.** න-සුදු ඇතිරිල්ල, සුදු කම්බිලිය.

**සෙතු.** පු-වියර, නියර, කාරණය, හෙතුව.

**සෙතුකාරක.** පු-පාලම් සාදන්නා.

**සෙතුඝාත.** පු-හෙතු නැසීම, පාලම් කඩා දමන්නා.

**සෙතොදික.** ති-සුදු ජලය ඇති.

**සෙද.** පු-ඩහදිය, දැඩිය.

**සෙදක.** න-දහඩිය දැමීම, විනිවිද පෙනීම.

**සෙදගත.** ති-දහඩියෙන් වැසුණු.

**සෙදමල.** න-දැඩියමල.

**සෙදයූස.** න-දහඩිය.

**සෙදජ.** ති-සංසෙදජ යොනියෙහි උපන්නහු, දැඩිය කුණු ආදියෙන් උපදනා සත්ව වර්ගයා.

(24052)

**සෙදජල.** න-ඝර්මජලය, දහඩිය, දහජලය.

**සෙදජල්ලිකා.** ඉ-දහඩිය හා කුණු.

**සෙදාවක්ඛිත්ත.** පු-ඩහදියෙන් වැකුණු.

**සෙදිත.** ති-තෙත්වූ.

**සෙදෙති.** ක්‍රි-(d. චු. සෙද, පග්ඝරණෙ, වැගිරීමෙහි + ණෙ + ති) තෙත් වෙයි.

**සෙන.** න-සයනය, නිදන ආසනය.

**සෙනක.** පු-රථාචාර්‍ය්‍යයා, කරත්ත කාරයා.

**සෙනා.** ඉ-සේනාව.

**සෙනාගුත්ත.** පු-යුද්ධ පිළිබඳ අමාත්‍යවරයා.

**සෙනානායක.** පු-සෙනාධිපතියා.

**සෙනානී.** ඉ-සෙනාධිපතියා, සෙනානායක.

**සෙනාපච්ච.** පු-ජෙනරාල් වරයෙකුගේ තනතුර ඇත්තා.

**සෙනාසන.** න-සෙනසුන, ආවාසය, ගෙය.

**සෙනාසනගාහාපක.** පු-සෙනසුන් භාර කාරය.

**සෙනාසනචාරිකා.** ඉ-සෙනසුන්හි හැසිරෙන්නා.

**සෙනාසනපඤ්ඤාපක.** පු-සෙනසුන් පන වන්නා.

**සෙනාපති.** පු-සෙනානායකයා, සේනාධිපතියා, සෙනෙවියා.

**සෙනාපතික.** පු-සෙනෙවියා, සෙනාධිනායකයා.

**සෙනාබ්‍යූහ.** පු-සේනා පිළියෙල කරණ තැන, යුද්ධසේනාසරඩකරණ තැන.

**සෙනිය.** පු-සේනා ඇත්තා, පිරිවර ඇත්තා.

**සෙනෙසික.** පු-වාටුකාරයා, චංචාකාරයා.

**සෙපණ්ණි.** ඉ-ඇද්දෙමට ගස.

**සෙඵාලිකා.** ඉ-සේපාලිකා ගස.

**සෙම්හ.** පු. න-ශ්ලෙෂ්මාව, සෙම.

**සෙම්හික.** පු-සෙම අධික තැනැත්තා.

**සෙමාන.** පු-සයනය කරණ, නිදන.

**සෙමානක.** පු-සයනය කරණ තැනැත්තා, නිදන්නා.

**සෙයසි.** ඉ-දියමිතන, ඇත්වගපුල්.

**සෙය්‍ය.** ති-අතිශයින් ප්‍රශස්ත, ඉතා පැසසිය යුතු.

**සෙය්‍ය.** පු-ධර්මය, මඞ්ගලය.

**සෙය්‍යක.** පු-සයනය කරන්නා.

**සෙය්‍යථා.** අ-එසේ, මෙසේ, යම්සේ.

**සෙය්‍යථාපි.** අ-උපමායෙහි, යම්සේ.

**සෙය්‍යථාපිනාම.** අ-යම්සේ නම්.

**සෙය්‍යථීදං.** අ-ඒ කවරේද.

**සෙය්‍යා.** ඉ-සයනය, සෙනාසනය, සයන ක්‍රියාව.

**සෙරික.** පු-දෙව්ලොව, දෙව් විමන.

**සෙරිතා.** ඉ-සෙවච්ඡා භාවය.

**සෙරිවිහාර.** පු-සෙවච්ඡා විහරණය.

**සෙරිවිහාරසුඛ.** පු-සෙවච්ඡා විහරණ සැපය.

**සෙරිසක.** න-ශාලාවක නමක්, සිරීස ලීවලින් තැනූවක්.

**සෙරිස්සක.** පු-එනම් විමානයෙහි උපන් තැනැත්තා.

**සෙරී.** පු-සෙවච්ඡා විහරණ ඇත්තා, කැමති හැසුරුම් ඇත්තා.

**සෙරෙය්‍යක.** පු-කටුකරඬු.

**සෙල.** d. භූ-ගතියං, යාමෙහි, සෙලති, යෙයි.

**සෙල.** පු-පර්වතය, කන්ද, ගල.

**සෙලගුල.** න-ගල් බෝලය.

**සෙලන.** න-නාදය, යොධාදීන්ගේ සිංහනාදය, මුඛයෙන් කරණ ක්‍රීඩා ශබ්දය, උරුසන් බෑම.

**සෙලමය.** පු-ශෛලමය, ගලින්ම කරණ ලද.

**සෙලක.** න-තඹ වර්ගයක්.

**සෙලිත.** ති-කෑගැසීම, ශබ්දය, ඝොෂා සහිත.

**සෙලු.** පු-ලෝලු

**සෙවක.** පු-සේවකයා, සේවය කරන්නා.

**සෙවති.** ක්‍රි-(d. භූ. සෙවු, සෙවනෙ, සේවනය කිරීමෙහි + ති) සේවනය කරයි, ආශ්‍රය කරයි.

**සෙවන.** න-සේවනය, ආශ්‍රය කිරීම.

**සෙවා**. ඉ-සේවාව, සේවනය, ගැවසීම.

**සෙවාල**. පු-සෙවෙල්, දියසෙවෙල්.

**සෙවාලපණක**. ති-නිශ්ශබ්දතාවය, නිසල.

**සෙවිත**. ති-සේවනය කළ, ආශ්‍රය කළ, ඇසුරු කළ.

**සෙවිතබ්බ**. ති-සෙවිය යුතු, ආශ්‍රය කටයුතු.

**සෙවු**. d. භූ-සෙවනෙ, සේවනයෙහි, සෙවති, සේවනය කරයි.

**සෙව්‍ය**. පු-බබුස්තණ.

**සෙස**. පු-සෙසු, අවසෙෂ, ඉතුරු, අනන්තනා රජ.

## සො

**සො**. d. දි-අන්තකරණෙ, කෙළවර කිරීමෙහි සියති, කෙළවර කරයි.

**සො**. d. භූ-නිසානෙ, සිදීමෙහි, සියති, සිඳියි.

**සොක**. පු-ශොකය, ව්‍යසනයක් නිසා වියලීම.

**සොකග්ගි**. පු-සොකාග්නිය, සෝක නැමති ගින්න.

**සොකපරිදෙව**. පු-ශොකය, පරිදෙවය.

**සොකසල්ල**. න-ශොක නමැති උල.

**සොකික**. පු-සෝක ඇත්තා,

**සොකබ්‍ය**. න-ප්‍රීතිය, සතුට, වාසනාව.

**සොඛුම්ම**. න-සුඛුම භාවය, සියුම් බව.

**සොගන්ධික**. න-හෙල්මැලි, එනම් සඞ්ඛ්‍යා විශෙෂය, පදුම සියක් ලක්‍ෂය, පදුම බලනු.

**සොචක**. පු-සෝක කරන්නා.

**සොචිත**. ති-සෝක කළ, සෝකයට පත්.

**සොචති**. ක්‍රි-(d. භූ. සුච, සොකෙ, සොකයෙහි + ති) සෝක කරයි.

**සොචිය**. ති-ඛෙද ජනක, නින්දිත.

**සොචෙය්‍ය**. න-පිරිසිදුකම, පවිත්‍රතාව, පවිත්‍ර භාවය.

**සොණ්ණ**. පු-සවර්ණය, රත්රන්.

**සොණ්ණාලඞ්කාර**. න-සවර්ණාලඞ්කාරය.

**සොණ්ණභිඞ්කාර**. පු-රන් කෙණ්ඩිය.

**සොණ්ණධජ**. පු-සවර්ණධ්වජ, රන්දද.

**සොණ්ණවාලුකා**. ඉ-සවර්ණවාලුකා, රන් වැලි.

**සොණ**. d. භූ-වණ්ණෙ, ගමනෙච, පාට කිරීමෙහිද, ගමනෙහිද සොණති, වර්ණ කෙරෙසි, යෙයි.

**සොණ**. d. භූ-රාසිකරණෙ, රැස් කිරීමෙහි, සොණති, රැස්කරයි.

**සොණ**. පු-රක්තවර්ණය, සුනඛයා, වෘක්‍ෂ විශෙෂයක්.

**සොණරතන**. න-රක්ත මාණික්‍යය, රතුමිණ.

**සොණිත**. න-රුධිරය, ලේ.

**සොණි**. ඉ-උකුල, කටිප්‍රදෙශය.

**සොණ්ණ**. න-රත්රන්.

**සොණ්ඩ**. න-ගිජු, ලෝල, සත්‍රී සුරාදීයෙහි ලොල්.

**සොණ්ඩ**. පු-ඇත්සොඬ, ඇතාගේ අත.

**සොණ්ඩ**. ඉ-පානාගාරය, ඇත්සොඬ.

**සොණ්ඩක**. පු-සුරා සොඬා, සුරාපානය කරන්නා.

**සොණ්ඩි**. න-ගලේ පිහිටි වතුර වල, ගල්වල, ගල් පොකුණ.

**සොණ්ඩික**. පු-සුරා වෙළෙන්දා.

**සොණ්ඩිකා**. ඉ-ගල් පොකුණ.

**සොණ්ඩිකාකිලඤ්ජ**. න-රා පෙරණ කොස්ස. රා පෙරහණ.

**සොණ්ඩී**. ඉ-ගල් පොකුණ.

**සොත**. න-කර්ණය, ජලප්‍රවාහය, ගලා යන දිය දහරාව.

**සොතඤ්ජන**. න-නෙත්‍රාඤ්ජනය.

**සොතද්වාර**. න-ශ්‍රොතද්වාරය, කර්ණය.

**සොතධාතු**. ඉ-ශ්‍රොත්‍ර ධාතුව, කණ.

**සොතවිඤ්ඤාණ**. න-ශ්‍රොත්‍ර විඥානය.

**සොතවිඤ්ඤෙය්‍ය**. න-කණින් දැනගතයුත්ත.

**සොතගත**. ති-ගින්නෙන් හෝ අව්වෙන් වියලුණු, දැවුණු.

**සොතසාති.** ඉ-සුළුබුරුද.

**සොතානුගත.** පු-ශ්‍රොතස අනුව ගිය.

**සොතාපත්ති.** ඉ-සෝවාන් ඵලයට පැමිණීම, ශ්‍රොත නැමැති නිවණ් මගට පැමිණීම.

**සොතාපත්තිඵල.** න-සෝවාන් පලය.

**සොතාවධාන.** න-කණ්නැමීම, කථාවකට කණ් යොමු කිරීම.

**සොතාපන්න.** න-මාර්ගඥාන ශ්‍රොතසට පැමිණි.

**සොතායතන.** න-ශ්‍රොතායතනය, කණ.

**සොත්ථි.** අ-මඞ්ගලය, අභිසිඞ්ය.

**සොත්ථිය.** පු-බ්‍රාහමණයා, බමුණා, අභිවෘඞි දායකයා.

**සොත්ථික.** පු-අභිවෘඞිදායකයා

**සොථ.** පු-සොථය, ඉදිමුම.

**සොදර.** පු-සහෝදරයා, සොහොයුරා.

**සොදරිය.** පු-සහෝදරයා, එකම මවු කුසින් උපන්නා.

**සොධන.** න-සුඬ කිරීම, පිරිසිදු කිරීම.

**සොධනී.** ඉ-මුසුනු, ඇමදීම කරණ මුස්න, සුඬකරන්නා.

**සොන.** පු-බල්ලා.

**සොනක.** පු-තොට්ල ගස.

**සොපධික.** පු-(ස + උපධික) උපධි සහිතයා, පඤ්චස්කන්ධය ඇත්තා,

**සොපාණ.** න-හිණ, ඉණිමග.

**සොපාදි.** ඉ-(ස + උපාදි) උපාදි සහිත.

**සොපාදිසෙස.** පු-(ස + උපාදිසෙස) කෙලෙසුන් නසා උපදියයි කියන ලද පස් කඳ ශරීර යෙන් යුත් තැනැත්තා.

**සොපාදිසෙසනිබ්බාණ.** න-සියලු කෙලෙසුන් නසා ස්කන්ධ පරිනිර්වාණයට නොපැමිණි රහත්හුගේ නිවණ.

**සොපාණ.** න-හින, හිණිමග.

**සොපානකිලිඞගර.** න-අඩිතැබීමේ ශබ්දය.

**සොපාණපන්ති.** ඉ-තරප්පු පේළිය, පියගැට පෙළ.

**සොපාණපාද.** න හිණිමන් මුල.

**සොපාණඵලක.** න-ඉණිමං පුවරුව.

**සොප්ප.** න-නිද්‍රාව, නින්ද.

**සොප්පති.** ක්‍රි-(d. භූ. සුප, සයනෙ, නිදීමෙහි + ති) නිදයි.

**සොබ්භ.** පු-හෙබ, දියඇළ, වැව, සිදුර.

**සොබ්භානු.** පු-රාහු.

**සොභග්ග.** පු-සුභග භාවය.

**සොභඤ්ජන.** න-මුරුංගා ගස.

**සොභති.** ක්‍රි-(d. භූ. සුභ, දිත්‍යයං, දීප්තියෙහි + ති) අලංකාර කරයි, සරසයි.

**සොභන.** ති-සිත්කලු දෙය.

**සොභමාන.** පු-හොබන.

**සොභග්‍යතා.** ඉ-සුභග භාවය.

**සොභනගර.** ඉ-අභිචාරිකාව, ගණිකාව.

**සොභනගරක.** න-ක්‍රීඩා විශෙෂයක්, සුරංගනා දර්ශනයක්.

**සොභා.** ඉ-සොභාව, කාන්තිය, දීප්තිය, බැබලීම.

**සොම්ම.** ති-ප්‍රීතිකරණ, ශාන්ත, සුන්දර.

**සොම.** පු-චන්ද්‍රයා, ඖෂධ වර්ගයක්.

**සොමනස්ස.** න-සොම්නස, යහපත් සිත් ඇති බව.

**සොමනස්සසුඛ.** න-සොම්නස් සැපය.

**සොමනස්සින්ද්‍රිය.** න-අධිපති භාවයට පැමිණි සොම්නස.

**සොමනස්සිත.** න-සොම්නසින් යුත්.

**සොමරුක්ඛ.** න-එක්තරා ගස් වර්ගයක්.

**සොමවක්ක.** පු-හෙළකිහිරි.

**සොමවල්ලිකා.** ඉ-බෝදි ගස්.

**සොවග්ගික.** පු-සවර්ගීය පිණිස පවතින, සග සැප පිණිස පවතින.

**සොවචස්ස.** න-සුවච, කීකරු බව.

**සොවචස්සතා.** ඉ-සුවච භාවය, කීකරුබව.

**සොවණ්ණමය.** පු-සවර්ණමය, රුවනින් නිපන්.

**සොවණ්ණ.** න-රත්රන්.

(24212)

**සොවණණය**. ති-රත්රන්.

**සොවජජික**. සුඛිභාවය.

**සොවජජිකාලඞකාර**. න-සෝව්වැස් ලකුණ.

**සොවිදලල**. පු-රජුන්ට සැව්ට ලන ඇමතියා.

**සොවීර**. න-කාඩිදිය.

**සොවීරක**. න-කාඩිදිය.

**සොස**. පු-ක්‍ෂයරොගය.

**සොසන**. න-වියලීම, ක්‍ෂයවීම.

**සොසති**. ක්‍රි-(d. භූ. සුස, සොසනෙ, වියලීමෙහි + ති) වියලයි, වේලයි.

**සොසාරිත**. ති-(සු + ඔසාරිත) කලින් සිටි තත්ත්‍වයට හෝ පදවියට පත් කළ.

**සොසානික**. පු-සොහොනෙහි වසන්නා.

**සොසානිකඞග**. න-සොහොනෙහි විසීමෙන් රකින අඞගය, තෙලෙස් ධූතාංග වලින් එකක්.

**සොහද**. න-සුහෘදයා.

**සොහිච්ච**. න-තෘප්තිය.

## සවා

**සවාකඛාත**. පු-මොනවට කියනලද, මනාව දෙසූ.

**සවාකාර**. පු-යහපත් ආකාරය, ස්වීය ගතිය.

**සවාගත**. පු-මනාකොට පැමිණි.

**සවාතන**. න-සෙට, හෙට දවස.

**සවාතිවතන** ති-(සු + අති + වතන) ලෙහෙසියෙන් ජයගත හැකි.

**සවාන**. න-බල්ලා.

**සවාමි**. පු-සවාමියා, හිමියා.

**සවාසසු**. අ-(සො + අසසු) එසේ වේවා.

**සවාහං**. අ-(සො + අහං) ඒ මම.

**ස්නිහ**. d දී-පීතනෙ, පිනායාමෙහි, ප්‍රීතියෙහි, සිනිහයති, පිනායයි.

**සෙනහ**. පු-අධිකප්‍රීතිය, තෙලය. ආදරය.

**සෙව**. අ-හෙට, සෙට දිනය.

## හ

**හ**. අ-පද පූරණයෙහි.

**හං**. අ-පුදුමය අඟවන නිපාතයක්, අසහනාවී යෙහි.

**හංධි**. අ-ආශ්‍චය්‍යී හඟවන නිපාත පදයක්

**හංස**. d. භූ-පීතියං, ප්‍රීතියෙහි, හංසති, පහංසති, ප්‍රීතිවෙයි, හංසිත, පීති වනලද.

**හංස**. d. භූ. හංසන පීතිසු, ලොමු දැහැගැන්මෙහි හා ප්‍රීතියෙහි, හංසති, ලොමුදැහැගණියි.

**හංස**. පු-හංසයා.

**හංසන**. න-ලොමුදැහැගැණීම, කිපීම, පහංසන.

**හංසක**. පු-නුරුවලා.

**හංසපොතක**. පු-හංස පැටියා, ලැපැටි හංසයා.

**හචච**. අ-නූනං, ගටා.

**හජ්ජ**. ති-ප්‍රිය දෙය.

**හඤ්ඤති**. ක්‍රි-(d. දී, හන, හිංසායං, හිංසා කිරීමෙහි + ති) නසයි.

**හට්ඨ**. ති-තුෂ්ටිය, තුෂ්ටිප්‍රාප්තයා, සතුටට පැමිණි අය, හට්ඨ තුට්ඨ, හට්ඨ පහට්ඨ ලොමහට්ඨජාත.

**හට්ඨචිත්ත**. ති-සතුටුසිත් ඇත්තා.

**හට**. d. භූ-දිත්තියං, බැබලීමෙහි, හටති, බබලයි.

**හට**. ති-ගෙණෙනලද, නසනලද.

**හඨ**. d. භූ-බලක්කාරෙ, බලකිරීමෙහි, හඨති, බලකරයි.

**හඨ**. පු-බලාත්කාරය.

**හණු**. d. න - අපනයනෙ, පහකිරීමෙහි, හණෙති, හණුතෙ, පහකරයි.

**හත**. ති-නසනලද.

**හතවිකඛිතක**. ති-විසිරීගිය, තැසූ.

**හතන්තරාය.** පු-බාධා ඉවත් කරන්නා.

**හත්ථ.** පු-අත, රියන, සමූහය, ඇත්සොඬ, හතේනැකත

**හත්ථක.** පු-එනම් තැනැත්තා, අතපුරා.

**හත්ථකුක්කුච්ච.** න-අත්කුකුස, අතින් නපුරු කොට කරණ ලද්ද අතින් ඉරි ඇඳීම් ආදී විකාරකිරීම.

**හත්ථකම්ම.** න-අත්කම්, අතින්කරණවැඩ, අත්වැඩ.

**හත්ථගත.** පු-අතට පැමිණි

**හත්ථග්ගහණ.** න-හස්තග්‍රහය, අත අල්ලා ගැන්ම.

**හත්ථතල.** න-හස්තතලය, අල්ල.

**හත්ථපජ්ජොතික.** න-අත්වල තෙල්රදි ඔතා ගිනිදල්වා කරණ එනම් වධය.

**හත්ථපසාරණ.** න-අත දිගහැරීම.

**හත්ථපාස.** පු-අත්පස, දෙරියන් සමාරක් පමණ දුර.

**හත්ථපාද.** න-අතපය.

**හත්ථප්පත්ත.** ති-අතටපැමිණි, හස්තප්‍රාප්ත.

**හත්ථවට්ටක.** න-අත්කරත්තය.

**හත්ථසාර.** පු-අතින් ගෙණ යා හැකි සාර වස්තුව.

**හත්ථවිකාර.** පු-අතින් කරණ උසුලු විසුලු ආදිය.

**හත්ථාපලෙඛ.** පු-අතින් පිසදැමීම.

**හත්ථාභිජප්පන.** න-අත්පෙරළීම පිණිස මන්ත්‍ර පිරවීම.

**හත්ථාරොහ.** පු-ඇතරුවා හස්තිපාලකයා.

**හත්ථාලඞ්කාර.** න-හස්ත්‍යාලඞ්කාරය, ඇතුන් සැරසීම.

**හත්ථි.** පු-ඇතා, අලියා.

**හත්ථිකර.** පු-ඇත්සොඬ, ඇත්කර.

**හත්ථිකලභ.** පු-ඇත්පොව්වා, ඇත්පැටියා.

**හත්ථිකන්තවීණා.** ඉ-හස්තිකාන්ත වීණාව.

**හත්ථිකන්තවීණා.** ඉ-හස්තිකාන්ත වීණාව, මේ වීණා හඬින් ඇතුන් ප්‍රීතියට පත්වෙයි,

**හත්ථිනඛ.** පු-එනම් ගෘහවිශෙෂය, කනුමුල්හි ඇත්හිස ඇතිවන සේ හැදූ මන්දිරය.

**හත්ථිනිකා.** ඉ-කුඩා ඇතින්නී.

**හත්ථිනී.** ඉ-ඇතින්නී, ඇත්දෙන.

**හත්ථිරව.** පු-හස්තිරාවය, ඇත්හඬ.

**හත්ථිකුම්භ.** පු-ඇත්කුඹ.

**හත්ථිකුල.** න-ඇත්කුලය, හස්තිවංශය.

**හත්ථික්ඛන්ධ.** පු-ඇත්කඳ, හස්තිපෘෂ්ඨය.

**හත්ථිගොපක.** පු-ඇත්ගොව්වා.

**හත්ථිඝටා.** ඉ-ඇත්සමූහය, ඇත්රැළ, යුද පිණිස ගෙණ යන ඇත්සමූහය.

**හත්ථිච්ඡාප.** පු-කිරිබොන ඇත්පැටියා.

**හත්ථිදම්ම.** පු-ඇතුන් දමනය කරන්නා, හස්ත්‍යාචාර්යයා.

**හත්ථිප.** පු-ඇත්ගොව්වා, කුරුනෑකයා.

**හත්ථිපාකාර.** න-හස්තිප්‍රාකාරය, ප්‍රාකාරයක් මෙන් සිටුවනලද ඇත්වළල්ල, හස්තිරූප-යෙන් යුක්ත කොට කොටකරණ ලද ප්‍රාකාරය.

**හත්ථිප්පභින්න.** පු-නපුරු ඇතා, භයංකර හස්තියා

**හත්ථිභණ්ඩ.** පු-ඇතරුවා, ඇත්ගොව්වා.

**හත්ථිමාරක.** පු-ඇත්මරුවා, හස්තිමාරකයා.

**හත්ථිමෙණ්ඩ.** පු-ඇත්ගොව්වා.

**හත්ථියාන.** න-ඇත්යානාව.

**හත්ථිරූපක.** න-ඇත් පිළිරුව, සෙල්ලම් පිණිස තැනූ ඇත්රුව.

**හත්ථිලණ්ඩ.** න-ඇත්බෙටි, ඇත් ඉලැත්තිය.

**හත්ථිලිඞ්ග.** න-ඇත්කඳ ලිහිණියා,

**හත්ථිලිඞ්ගසකුණ.** පු-ඇත්කඳ ලිහිණියා.

**හත්ථිසිප්ප.** පු-හස්තිශිල්පය, ඇතුන් හික්මවන ශිල්පය.

**හත්ථිසිරොපිණ්ඩ.** පු-හස්තිකුම්භය, ඇත්කුඹ.

**හත්ථිසොණ්ඩ විහඞ්ගම.** පු-ඇත්සොඬ බඳු සොඬ ඇති පක්ෂිවිශෙෂයක්.

**හද.** d. චු-උච්චාරෙ, මල උත්සර්ගයෙහි, හදෙති හදයති, මලපහකරයි.

(24310)

**හද.** d. භූ-උච්චාරෙ, මලපහකිරීමෙහි, හදති, මලපහකරයි.

**හදය.** න-හෘදය, හෘදයවස්තුව, සිත, ලය, මතස.

**හදයමංස.** පු-හෘදයමාංශය, කැවුත්ත

**හදයවක්ඛන.** න-හෘදය වංචාව.

**හදයවත්ථු.** පු-හෘදයවස්තුව, කැවුත්ත.

**හදයඞ්ගම.** ති-සිත්කලු, සිත්කලුවවත.

**හදයසන්තාප.** පු-හෘදය තැවුලිය.

**හදයාලු.** පු-ප්‍රශස්ත සිත් ඇත්තා.

**හදයී.** පු-උතුම් සිත් ඇත්තා, සිත් ඇත්තා.

**හන.** d. භූ-හිංසායං, පෙළීමෙහි, හනති, පෙළයි, නසයි.

**හන** d. දි - පීඩායං, පෙළීමෙහි, හඤ්ඤති, නසයි.

**හනති.** ක්‍රි-(d. භූ. හන, හිංසායං, පෙළීමෙහි ති) පෙළයි, නසයි.

**හනු.** ඉ-හනුව, හක්ක.

**හනු සංචලන.** න-හනුව සෙලවීම.

**හනුකා.** ඉ-හනුව, හක්ක.

**හනුකටඨි.** ඉ-හනු ඇටය.

**හන්තාර.** පු-නසන්නා, මරන්නා.

**හන්ද.** අ-වාක්‍යාරම්භ, බැගෑ, හාස, අනුකම්පා නියොග, යනමෙහි.

**හම්භො.** අ-ආමන්ත්‍රණයෙහි, පින්වත, නිදු-කාණෙනි.

**හම්මිය.** න-සඳලු සහිත ගෙය.

**හම.** d. භූ-ගමනෙ, යාමෙහි, හමමති, යෙයි.

**හය.** පු-අශ්වයා, අසු.

**හය.** d. භූ-ගතියං, යාමෙහි, හයති, යෙයි.

**හයපොතක.** පු-අශ්වපැටියා, අශ්වපොතකයා.

**හයවාහී.** ති-අසුන් විසින් අදනාලද.

**හයානික.** න-පුරුෂයන් තුන්දෙනෙකු හා අශ්වයෙකුගෙන් යුත් සමූහය, එබඳු ඇණිය.

**හර.** d. භූ-හරණෙ, හැරීමෙහි, ගෙණයාමෙහි, හරති, හැරගණී, ගෙණයයි, විහරති, විහාරෙ.

**හර.** d. දි-හරණෙ, පහකිරීමෙහි, හරති, පහකරයි.

**හර.** d. භූ-ආදානෙ, ගැණීමෙහි, හරති ගණියි, ආහාරෙ, අවහාරෙ.

**හර.** පු-ඊශ්වරයා, මහදෙවියා.

**හරණ.** න-හැරීම, ගෙනඒම, අත්හැරීම.

**හරණක.** න-බඩු තැනින් තැනට ගෙණ යෑම.

**හරණී.** ඉ-හැරගෙණයන්නී, පතුරුවන්නී, රසහරණීයහස්සති.

**හරති.** ක්‍රි (d. හර, හරණෙ, ගෙණයෑමෙහි + ති) හැරගෙණ යයි.

**හරායමාන.** ති-ගෙණයනු ලබන.

**හරි.** පු-විෂ්ණු, සිංහයා, ස්වර්ණය, නිල්වස්තු.

**හරිචන්දන.** න-රන්වන් සඳුන්.

**හරිණ** පු-මෘගයා, මුවා, මිග

**හරිත.** පු-පලාවන් පැහැය, වෙරළුමිණ.

**හරිතපණ්ණ.** න-එළවලු

**හරිතත්ත.** න-නිල්වන්බව.

**හරිතාමය.** පු- වාව්කර, රත්රන්

**හරිතාල.** න-හිරියල්.

**හරිතුපත්ථත.** ති-නිල්වන් තණවලින් වැසුනු.

**හරිනෙතක.** න-බකමූණු, මහමුහුනු.

**හරිහය.** පු- ශක්‍රයා, සක්දෙව්රජ.

**හරිය.** d. භූ-ගම, නගෙලසොඤ්ඤසු, ගමනයෙහි හා ගිලන් බැව්හි, හරියති, යෙයි ගිලන්-වෙයි.

**හරීත.** ති-කොළපාට, කහපාට.

**හරීතක.** න-පලා.

**හරීතකී.** ඉ-අරළු.

**හරෙ.** d. භූ-ලජ්ජායං, ලජ්ජාවෙහි, හරායති, ලජ්ජා වෙයි, අට්ටීයති හරායති,

**හරෙ.** අ-නීචාමන්ත්‍රණයෙහි, කොල, බොල, අඩෝ.

**හරෙණුක**. පු-කලතණ.

**හල**. d. භූ-ලෙඛනෙ, ඉරි ඇඳීමෙහි, හලති, ඉරිඅඳියි.

**හල**. න-නගුල.

**හලං**. අ-සුදුසුයි. අලං, "හලංදානිපකාසිතුං"

**හලපඛනි**. ඉ-ඍිවිට.

**හලා**. ඉ-සුරා, රා.

**හලාහල**. පු-දරුණු සුරා, විෂභෙදයක්, කෝලාහලය.

**හලිද්ද**. න-වියලිකහ, හරත්කහ.

**හලිද්දරාග**. න-වියලි කහපාට.

**හලිද්දි**. ඉ-වියලිකහ, හරත්කහ.

**හලිද්දුහ**. පු-රත්වන් පැහැය.

**හලිප්පියා**. ඉ- සුරා, රා, මත්පැන.

**හව**. පු-ආභවානය, කැඳවීම, ආමන්ත්‍රණය.

**හවි**. න-යාගද්‍රව්‍යය, ගිතෙල.

**හවිභොජක**. පු-දෙවියා.

**හව්‍ය**. න-යාගද්‍රව්‍යය, යාගයට හිතදේ.

**හවෙ**. අ-එකාන්තයෙන් යනාර්ථයෙහි, නිශ්චයෙන්.

**හස**. d, භූ-හසනෙ, සිනාවෙහි, හසති, සිනාසෙයි.

**හස**. d භූ-සද්දෙ, ශබ්දයෙහි, හසති ශබ්දකරයි.

**හසන**. න-සිනාව, සිනාසීම.

**හසති**. ක්‍රි-(d. භූ. හස, සද්දෙ, ශබ්දයෙහි + ති). සිනාසෙයි, හිනාවෙයි.

**හසමාන**. ති-සිනාසෙන, සිනාසෙනු ලබන.

**හසිත**. න-සිනාව, හිනාව.

**හසිතුප්පාද**. පු-සිනාඉපිදවීම, හිනාව උපදවන.

**හස්ස**. පු-සිනාව, හාස්‍යරසය.

## හා

**හා**. අ-විෂාද, දුඃඛ, ශොක, අසසන යනාදියෙහි.

**හා**. d. භූ-චාගෙ, ත්‍යාගයෙහි, ජහති, අත්හරියි, පරිත්‍යාගකරයි.

**හා**. d. දි-හානියං, පිරිහීමෙහි, හායති, පිරිහෙයි.

**හාටක**. න-රත්රත්.

**හාතබ්බ**. ති-පිරිහියයුතු.

**හාතුන**. ති-අත්හල, පරිත්‍යාගකල,

**හාන**. පු-පිරිහීම.

**හානගාමී**. පු-පිරිහීමටයතසුලු.

**හානභාගිය**. පු-පිරිහීම්පක්ෂයෙහිවූ.

**හානි**. ඉ-හානිය, විනාශය, පිරිහීම.

**හාපිත**. ති-විනාශවන ලද, පිරිහෙන ලද.

**හාපෙති**. ක්‍රි-(d. දි, හා, හානියං, පිරිහීමෙහි + ණෙ + ති) පිරිහෙයි, විනාශවෙයි.

**හායන**. න-අවුරුද්ද, සංවත්සරය, පිරිහීම, විනාශය.

**හාර**. පු-මුතුහර, ගැණීම, ග්‍රහණය.

**හාරක**. පු-මුතුහර, ග්‍රහණය කරන්නා.

**හාරති=හරති**. ක්‍රි-(d. භූ. හර, හරණෙ, හැර ගැණීමෙහි + ති) හැරගණී.

**හාරහාරිනී**. ති-ඉතාගිජු හෝ කෑදර, ගසාකන, අතිලෝභී.

**හාරිය**. ති-හැරිය යුතු, ඉවත කටයුතු.

**හරී**. ති-සිත්කලුදෙය, ගෙණයන්නා.

**හාලිද්ද-හලිද්දු**. න-වියලිකහ, අරත්කහ.

**හාස**. පු-සිනාව, සතුට.

**හාසකර**. පු-සිනාසෙන්නා.

**හාසක්ඛය**. න-සිනා නැවත්වීම.

**හාසධම්ම**. න - විනොදය, කෙළිසෙල්ලම, සරදම.

**හාසනිය**. ති-ප්‍රීතිය හා සතුට ගෙණ දෙන.

**හාසු.** ති-ඉක්මන්, සීඝ්‍ර

**හාසුපඤ්ඤ.** පු-සිනා බහුලකොට ඇති ප්‍රඥ ඇත්තා, ඥනවන්තයා.

**හාසෙන්ති.** ක්‍රි-(d. භූ. හස, හසනෙ, සිනාසීමෙහි + ණෙ + ති) සිනාසෙයි.

**හාසි.** d. භූ-ආලිඞ්ගනෙ, වැළඳගැන්මෙහි, හාසති, වැළඳගණී.

**හාව.** පු-සත්‍රීන්ගේ ශෘඞ්ගාරභිප්‍රාවෙන් උපන් ක්‍රියාව, කාම චෙතනාවෙන්යුත් ශරීරාවයව විකාරය.

## හි

**හි.** අ-හෙතු, විශෙෂාර්‍ථ, ආධාර පදපූරණ විස්මය යනාදියෙහි.

**හිංසන.** න-හිංසාකිරීම, වධය, මැරීම.

**හිංසා.** ඉ-වධය, මරණ.

**හිංසාසීල.** පු-හිංසාස්වභාවකොට ඇත්තා වධකයා.

**හික්ක.** d. භූ- අව්‍යත්තෙසද්දෙ, අව්‍යක්ත ශබ්ද යෙහි, හික්කති, අව්‍යක්ත ශබ්දකරයි.

**හික්ක.** d. චු-පීඩායං, පෙළීමෙහි, හික්කෙති හික්කයති, පෙළයි, පීඩාකරයි.

**හිංසති.** ක්‍රි-(d. භූ. හිසි, හිංසායං, හිංසාවෙහි + ති) හිංසා කරයි.

**හිංකාර.** පු-හිං යන අනුකර ශබ්ද කිරීම.

**හිඞ්ගු.** ඉ-සිරියල්.

**හිඞ්ගුනියාස.** පු-කොසඹ.

**හිඞ්ගුරාජ.** පු-පක්ෂියෙක්.

**හිඞ්ගුලක.** න-සාදිලිංගම්, එවැනි රතු පැහැය.

**හිඞ්ගුලි.** ඉ-සාදිලිංගම්, එබිවු රතු පැහැය.

**හිණ්ඩි.** d. භූ-ගතියං, යාමෙහි, හිණ්ඩති ආහිණ්ඩති යෙයි, හැසිරෙයි.

**හිණ්ඩන.** න-ඇවිදීම, ආහිණ්ඩණය.

**හිණ්ඩති.** ක්‍රි-(d. භූ. හිඩි, ගතියං, යෑමෙහි + ති) ඇවිදියි. ආහිණ්ඩති.

**හිත.** න-අභිවෘද්ධිය, අර්‍ථය, හිතාර්‍ථය.

**හිතකාරී.** පු-අභිවෘද්ධිකාරයා, හිතානුකම්පියා.

**හිතානුකම්පී.** පු - හිතයෙන් අනුකම්පා කරන්නා.

**හිතෙසී.** පු - වැඩකැමැත්තා, අභිවෘද්ධිය කැමැත්තා.

**හිත්වා.** අ-හැර, බැහැරකර, අත්හැර.

**හින්තාල.** පු-කිතුල්ගස.

**හින්දගු.** පු-ඉන්ද්‍රගෙන් හටගත් තැනැත්තා.

**හිනති.** ක්‍රි-(d. භූ. හි, උපතාපෙසු, තැවීමෙහි + ති) හිංසාකරයි, නසයි.

**හිම.** පු-සීතලය, වැහි, මිරිදිය.

**හිමපාත.** පු-හිමවැටීම, පිණිවැටීම.

**හිමපාතසමය.** පු - හිම වැටෙන කාලය, අන්තරට්ඨක හිමපාතසමය බලනු.

**හිමංසු.** පු-සීතල රශ්මි ඇත්තා, චන්ද්‍රයා.

**හිමරංසි.** පු-චන්ද්‍රයා, හිමංසු.

**හිමවන්තු.** පු-න-හිමවත් පර්‍වතය, හිමාලය.

**හිමවාත.** න-හිම සහිත වාතයක්.

**හිමවාලුකා.** ඉ-කපුරු.

**හිමාචල.** පු-හිමවත් පර්‍වතය, හිමාලය.

**හිමාලය.** පු-හිමආලය, හිමවත, හිමාචලය.

**හිමාවහ.** පු-කපුරු.

**හිරඤ්ඤ.** න-සුවර්‍ණය, ධනය, රන්.

**හිරඤ්ඤගබ්භ.** පු-බ්‍රහ්මයා.

**හිරි.** d. දි-ලජ්ජා, චොදනාසු, ලජ්ජාවෙහි හා චොදනාවෙහි, හිරීයති, ලජ්ජාවෙයි.

**හිරි.** ඉ-ලජ්ජාව, පාපයට ලජ්ජාව.

**හිරිඔත්තප්ප.** න-පාපයට බය හා පාපයට ලජ්ජාව, හිරි ඔතප් දෙක.

**හිරිකොපීන.** න-ලජ්ජාව.

**හිරිනිසෙධ.** න-ලජ්ජාවෙන් වැලක්වීම.

**හිරිබල.** න-ශ්‍රී බලය, බලබවට පත් හිරිය.

**හිරික.** පු-හිරි ඇත්තා.

**හිරිමා.** පු-හිරි ඇත්තා.

**හිරිවෙර.** න-ඉරිවේරිය.

**හිරියති.** ක්‍රි-(d. දි, හිරි, ලජ්ජායං, ලජ්ජාවෙහි + ති) ලැජ්ජාවෙයි.

**හිස.** d. රු-පීඩායං, පීඩාවෙහි, හිංසති, පෙළයි, විහිසි.

**හිසි.** d. භූ පීඩායං, පෙළීමෙහි, හිංසති, පෙළයි, හිංසා

**හිසි.** d. චු-පීඩායං පෙළීමෙහි, හිංසෙති, හිංසයති, පෙළයි.

**හිසු.** d. භූ-සද්දෙ, ශබ්දයෙහි, හිසති, ශබ්ද කරයි.

**හිල.** d. තු-ලීලාවිලාසාදීසු, ලීලාවිලාසාදියෙහි හිලාදති, හෙලෙති.

**හිළ.** d. භූ-අනාදරෙ, අනාදරකිරීමෙහි හිළති අනාදරකරයි.

**හිළ.** d. දි-සුඛෙ, සැපවිඳීමෙහි, හිළාදති, සැපවිඳියි

**හිළාද.** d. භූ-සුඛෙ, සැපයෙහි, හිළාදති, සැප විඳියි.

## හී – හු

**හීන.** න-ලාමක, නීච, පහත්ගතිය.

**හීනධාතු.** ඉ-දොළොස් අකුසල්සිත්, ලාමක බව.

**හීනවාද.** න-හීනවාදය, මිථ්‍යාධර්මය.

**හීනවිරිය.** න-හීනවූ වීය්‍ය්‍යය, අඩුවූ වීය්‍ය්‍යය.

**හීයති.** ක්‍රි-(d දි, හා, වාගෙ, අත්හැරීමෙහි + ති) අත්හරියි.

**හීයන.** න-අත්හැරීම.

**හීනකාය.** පු-හීනාත්මය, පහත් උත්පත්තිය.

**හීනජච්ච.** න-හීනජාතිය, නීචසත්ත්වවර්ගයා.

**හීනාධිමුත්ත.** න-හීනවූ කැමැත්ත.

**හීයමාන.** පු-ක්ෂයවනු ලබන.

**හීය්‍යො.** අ-ඊයේ දවස, ඊයේ.

**හීළ.** d. චු-නින්‍දායං, නින්‍දාකිරීමෙහි, හිළෙති හීළයති, නින්‍දාකෙරෙයි.

**හීළති.** ක්‍රි-(d. චු, හීළ, නින්‍දායං, නින්‍දාවෙහි + ති) නින්‍දාකරයි.

**හීළන.** න-නින්‍දාව, ගැරහීම.

**හීළිත.** ති-නින්‍දාකළ, ගැරහූ.

**හු.** d. භූ-දානෙ, දීමෙහි, හුති, දෙයි.

**හූ.** d. භූ-එකෙණෙහි කිරීමෙහි, හුතො, හුතවා.

**හූ.** d. භූ-සත්තායං, වීමෙහි, හොති, වෙයි, පහොති, පහුතො.

**හුජ.** d. භූ-ගතියං, යෑමෙහි, හුඩති, යෙයි.

**හුඩි.** d. භූ-රාසී කරණෙ, රැස්කිරීමෙහි, හුණ්ඩති, රැස්කෙරෙයි.

**හුංකාර.** න-කෙඳිරීම, ගෙරවීම, තරහ ඇඟවීම.

**හුංකරොති.** ක්‍රි-ශබ්ද කරයි, ගොරවයි, කෙඳිරිගායි.

**හුක්කු.** - නරිහඬ, ශෘගාලනාදය.

**හුත.** න-යාගය, දානය, පුදනලද්ද.

**හුතාවහ.** පු-ගින්න, වහ්නිය.

**හුතාසන.** න-ගින්න.

**හුති.** ඉ-ආග්වානය, කැඳවීම.

**හුත්ත.** න-වෛදික ගොත්‍රය, වේදයේ එන පූජාව.

**හුනිතබ්බ.** ති-පිදියයුතු, යාගකටයුතු.

**හුවෙය්‍ය.** ක්‍රි-වන්නේ නම්, සිදුවන්නේ නම්.

(24502)

**හුරං.** අ-පරලොව.

**හුර.** d. භූ-කොටිල්ලෙ, කුටිලභාවයෙහි, හුරති, කුටිලවෙයි.

**හුරාහුරං.** න-සමිතියෙන් සමිතිය.

**හුල.** d. භූ-චලනෙ, සැලවීමෙහි, හුලති, සැලෙයි.

**හුල.** d. භූ-කම්පනෙ, කම්පාවීමෙහි, හුලති, කම්පාවෙයි.

**හුසා.** ඉ-යෙහෙළි, ලේලි.

**හුහුංක.** ති-හුං හුං යයි කියන.

**හුහුංකජාතික.** පු-ගෙරවීම් සහිත සවභාවය ඇත්තා.

**හුළ.** d. භූ-ගමනෙ, යාමෙහි, හුළති, යෙයි.

**හුළ.** d. භූ-රාසිකරණෙ, රැස්කිරීමෙහි, හුළති, රැස්කරයි.

## හෙ

**හෙ.** අ-ආමන්ත්‍රණයෙහි.

**හෙට්ඨසීසක.** පු-පහතට හිස තමාගෙණ ඇත්තා.

**හෙට්ඨා.** අ-යට, යටභාගය, අධොභාගය.

**හෙට්ඨිම.** ති-යට දිසාවට අයිති.

**හෙට්ඨිමතල.** න-යටපැත්ත, යටභාගය.

**හෙඨ.** d. භූ-විහෙඨනෙ, පෙළීමෙහි, හෙඨෙති, පෙළයි, විහෙඨෙති, විහෙඨනං.

**හෙඨ.** d. චු-පීඩායං, පෙළීමෙහි, හෙඨෙති හෙඨයති, පෙළයි.

**හෙඨන.** න-පෙළීම, පීඩාව.

**හෙඨෙති.** ක්‍රි-(d. භූ. හෙඨ, විහෙඨනෙ, පෙළීමෙහි + ණෙ + ති) පෙළයි, වෙහෙසයි.

**හෙතුපච්චය.** පු-හෙතුව හා ප්‍රත්‍යය.

**හෙතු.** පු-වාක්‍යාවයව, ලොභාදි මූලකාරණා.

**හෙතුක.** පු-හෙතුඇති, හෙතුසහිත.

**හෙතුත්ත.** න-හෙතුභාවය.

**හෙතුසො.** අ-හෙතුවශයෙන්, කරුණු වශයෙන්.

**හෙතුයෙ.** ක්‍රි-වෙයි, සිදුවෙයි.

**හෙම.** පු-රත්රන්, හේමනම් ඇත්කුලය.

**හෙමදුඨක.** පු-දිඹුල්.

**හෙමජාල.** න-රන්දැල.

**හෙමවණ්ණ.** පු-සවර්ණවර්ණය, රන්වන් පැහය.

**හෙමවතික.** ති-හිමවතට අයිති.

**හෙමවතක.** ති-හිමාලයෙහි වූ.

**හෙමතී** ඉ-අරළු, වදකහ.

**හෙමන්ත.** පු-හෙමන්ත සෘතුව, උඳුවප් දුරුතු යන දෙමස හෝ උඳුවප් දුරුතු නවම් මැදින් දින යන හතර මාසය.

**හෙමන්තික.** පු-හෙමන්ත සෘතුවට අයිති.

**හෙරඤ්ඤික.** පු-රත්රන් බලන්නා, රන් කරුවා.

**හෙලා.** ඉ-ස්ත්‍රීන්ගේ ශෘඞගාරාභිප්‍රායෙන් උපන් ක්‍රියා.

**හෙස්සති.** ක්‍රි-(d. භූ. හු. සත්තායං වීමෙහි + ස්සති) වන්නේය, භවිස්සති.

**හෙසා.** ඉ-අශ්වයන්ගේ නාදය, හෙසාරව නාදය.

**හෙසාරව.** පු-අශ්වයන්ගේ සතුටු නාදය, හෙසාරවය.

**හෙසු.** d. භූ. ගමනෙ, යාමෙහි, හෙසති, යෙයි

**හෙසු.** d. භූ. මන්දසද්දෙ, නොවියත් ශබ්දයෙහි, හෙසති, මඳ ශබ්ද කරයි.

**හෙහි.** අ-වන්නේය.

**හෙළ.** d. භූ-වෙඨනෙ, වෙළීමෙහි, හෙළති, වෙළයි.

## හො

**හොති.** ක්‍රි-(d. භූ. හු, සත්තායං + ති) වෙයි, සිදුවෙයි.

**හොතබ්බ.** ති-යාග ද්‍රව්‍යය, යාග කටයුතුදේ.

**හොතන.** න-පිදීම, පූජා කිරීම. "අග්ගි හොතන"

**හොම.** පු-යාගය, පූජාව.

**හොමදබ්බි.** ඉ-යාග සැන්ද.

**හොරා.** ඉ-ඔරලෝසුව, දිනඝටිකායන්ත්‍රය.

**හොරාපාඨක.** පු-දෛවඥයා, හෝරා ශාස්ත්‍රඥයා.

**හොළ.** d. භූ. අනාදරගතිසු, අනාදරයෙහි, හොළති, අනාදර කරයි.

**ළි**-අහසින් යාමෙහි, ළෙති, අහසින් යයි.

**(24554)**